බෞද්ධ මහා සම්මේලනයේ ත්‍රිපිටක ග්‍රන්ථමාලා: 7 වෙනි ග්‍රන්ථය

සූත්‍ර පිටකයෙහි

දීඝ නිකාය

දෙවෙනි කාණ්ඩය

කොළඹ විද්‍යෝදය පිරිවෙණේ ආචාර්ය ධූරන්ධර

පලන්නොරුවේ විමලධම්ම

නායක ස්ථවිරපාදයාණන් වහන්සේ

විසින් ප්‍රණීත සිංහල අනුවාදය සහිතයි

පෙල සකස්කළේ ලංකා විශ්වවිද්‍යාලයේ

පාලි අංශයේ මහාචාර්ය

ගුණපාල මලලසේකර මහතාය

ප්‍රකාශකයෝ:

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ

ත්‍රිපිටක මුද්‍රණය භාර මණ්ඩලය

ශ්‍රී බුද්ධ වර්ෂ 2496 ක්‍රිස්තු වර්ෂ 1952

Buddhist Congress Tri-Pitaka Series, Vol. VII.

DĪGHA NIKĀYA

OF THE

SUTTA PITAKA

Part II

With a Sinhala Translation by the

Venerable Palannoruvē Vimaladhamma Nāyaka Thera

of the Tutorial Staff of the Vidyodaya Pirivena, Colombo.

Pali Text Edited by

G. P. MALALASEKERA

D. Litt. (London), Ph.D., M. A.

Professor of Pali and Dean of the Faculty of Oriental Studies,
University of Ceylon

COLOMBO

THE BUDDHIST CONGRESS TRI-PITAKA TRUST

(*Incorporated*)

B. E. 2496 — 1952 A. C.

පටුන

		පිටුව
සුද්ධි පත්‍රය		.. xiii—xviii
උප ග්‍රන්ථය		.. xix
සඞ්කෙත නිරූපන		.. xxi
බෞද්ධ මහා සම්මෙලනයේ ත්‍රිපිටක මුද්‍රණය භාර මණ්ඩලය		.. xxii
Pali Alphabet in Sinhala and Roman Characters		xxiii
6.	මහාලි සුත්තං	510 — 579
7.	ජාලිය සුත්තං	580 — 633
8.	කස්සප සීහනාද සුත්තං ..	634 — 731
9.	පොට්ඨපාද සුත්තං	732 — 815
10.	සුභ සුත්තං	816 — 881
11.	කෙවට්ට සුත්තං	882 — 959
12.	ලොහිච්ච සුත්තං	960 — 1035
13.	තෙවිජ්ජ සුත්තං	1036 — 1107

ශුද්ධි පත්‍රය

පළමුවෙනි කාණ්ඩය

පිට	පේළි	අශුද්ධ	ශුද්ධ
මෙටටල	7	උපප්‍රධානාචාර්ය	ආචාර්ය
Title	9	,Vice-Principal	of the Tutorial Staff of
iv	14	=Siamese printed edition	S=Siamese printed edition
vii	22	උපප්‍රධානාචාර්ය	ආචාර්ය
xiv	13	,Vice—Principal,	of its Tutorial Staff
xvi	9	Sāmaññayathā	Sāmaññaphala, *yathā*
34	—	අඞ්ක 11 දරණ අධෝලිපිය ඉවත් කරනු.	
41	5	වශයෙහි	වශගයෙහි
43	29	වීර්යය	වීර්ය
46	11	කිලත්තචිත්තා	කිලන්තචිත්තා
47	25	මහණෙනි යන්නෙන් පටන්ගන්නේ අළුත් ඡේදයකි.	
50	අධෝ. 1	B.	B. P. S.
51	34	අනත්තානත්ත	අනත්තානන්ත
124	17	හනෙත්ත	හනෙත්ත[7]
,,	21	පක්කමිං[12]	පක්කමිං[11]
,,	25	පක්කාමි	පක්කාමිං
128	16	සාමඤ්ඤු	සාමඤ්ඤ
154	අධෝ. 9	එරුපිං P.	එරුපිං P. V.
,,	,, 11	—	11. පටිවිරතො V.
156	,, 4	P. S.	P. S. V.
158	,, 15	සීහල පොත්වෙනසු	W. සු
159	27	ඇනීමය	ඇඹීමය
160	අධෝ. 6	B. V.	B.
,,	,, 12	P. W.	P. W. V.
166	19	මෙණ්ඩලක්ඛණං[11]	මෙණ්ඩලක්ඛණං
,,		11 වෙනි අධෝලිපිය ඉවත් කරණු.	
,,	අධෝ. 14	B. V.	B.
194	,, 1	W.	W. P.
215	6	භාග්‍යවතුන්වහන්සේ යන්නෙන් පටන් ගන්නේ අළුත් ඡේදයකි.	
217	25	දරුව යන්නෙන් පටන්ගන්නේ අළුත් ඡේදයකි.	
218	අධෝ. 5	පිවට්ටිජ්දෙ	විවට්ටච්ඡදෙ
224	5	චත්තරෙ	චත්තාරෙ

පිට	පෙළ	අසුද්ධ	සුද්ධ
225	5	කපිලමාසතු	කපිලමසතු
236	අධො. 8	භොජ්ජෙයෙනුං	භොජ්ජෙය්‍යුං
248	7	මුට්ඨියුඞං[9]	මුට්ඨියුඞං
,,	20	අනුයුතෙනා	අනුයුත්තා
,,	24	පච්චත්ථරං	පච්චත්ථරණං
,,		9 වෙනි අධොලිපිය ඉවත් කරණු	
303	12	භාවය	භාවය[2]
330	අධො. 16	විස්හති	විසහති
331	19	බමුණු	බමුණ
340	අධො. 7	සො°	7. සො°
374	,, 10	මන්තං W.	මන්නං V.
434	10	අකංසු[20]	අකංසු
,,	10	න තෙ	න තෙ[20]
438	27	බො[1]	බො
,,	29	අප්පසමාරබ්භතරා[3]	අප්පසමාරබ්භතරො[11]
440	20	බො බ්‍රාහමණ[8]	බො[8] බ්‍රාහමණ
446	9	ඉමෙහි ච	ඉමෙහි ච[5]
,,	අධො. 5	—	5. ච ඉති නත්‍ථි V.
448	7	බ්‍රාහමචරියං	බ්‍රහමචරියං
450	8	විරතො	පිරතො[11]
,,	අධො. 9	°රූපිං P.	°රූපිං P. V.
,,	,, 11	—	11. පටිවිරතො V.
452	6	ආමකධඤ්ඤපටිග්ගහණා	ආමකධඤ්ඤපටිග්ගහණා[6]
,,	11	වලවා	වලවා[6]
,,	12	දූතෙය්‍ය හිණ	දූතෙය්‍යපහිණ
,,	අධො. 4	විරතො P. S.	විරතො P. S. V.
454	,, 15	දිස්සති V. W.	දිස්සති W.
456	,, 6	පඤ්ඤා° B. V.	පඤ්ඤා B.
,,	,, 12	P. W.	P. W. V.
462	1	සමණ බ්‍රාහමණ	සමණබ්‍රාහමණා
,,	19	මෙණ්ඩලක්ඛණං[11]	මෙණ්ඩලක්ඛණං
,,		11 වෙනි අධොලිපිය ඉවත් කරණු.	
,,	අධො. 14	B. V.	B.
463	—	මේ පිටේ අංකය 463 මුද්‍රණයවී නැත.	
464	13	ඒවං පාකං	එවං විපාකං
,,	අධො 5	B.	B. V.
466	18	පච්චක්ඛජ්ජාතං[16]	පච්චක්ඛජ්ජාතං
	අධො 11	11. වත්ථුබලිකම්ම V. යනු ඉවත් කරණු.	

පිට	පේළි	අශුද්ධ	ශුද්ධ
466	අධො. 11	වත්‍ථු පරිකම්මං B.	11. වත්‍ථුපරිකම්මං B. V.
,,	,, 14	B. V.	B.
,,	,, 15	B.	B. V.
,,	,, 16	මේ අධොලිපිය ඉවත් කරණු	
,,	,, 17	B. P. V.	B. P.
,,	,, 19	B. S.	B. S. V.
,,	,, 20	B. V.	B.
468	,, 1	සබ්බො P. S.	සබ්බො P. S. බොසො බ්‍රා° V.
470	9	නානුබඤ්ජ-	නානුබ්‍යඤ්ජ-
480	10	නහානීයපිණ්ඩි	නහානීයපිණ්ඩි
,,	21	උපසම්පිජ්ජ	උපසම්පජ්ජ
,,	අධො. 2	B.	B. V.
482	25	සුංබන	සුබෙන
,,	අධො. 4	අනුපමවිජ්ජෙය	අනුපමවිඡ්ජෙය
,,	,, 8	B.	B. V.
484	6	සබ්බාවතං	සබ්බාවතං[12]
,,	අධො. 2	B.	B. V.
,,	,, 12	—	12. සබ්බාවන්තං V.
485	9	බ්‍රාහමණය යන්නෙන් පටන්ගන්නේ අළුත් ඡේදයකි.	
490	4	සමාහතෙ	සමාහිතෙ
,,	5	විගතුපකති	විගතූපක්කි
,,	24	බ්‍රාහමලොකාපි	බ්‍රහමලොකාපි
494	5	පරිසුඬ	පරිසුඬෙ
,,	28	සමාහිතං චිත්තනත	සමාහිතං චිත්තනති
496	12	වීතරාගං[6]	වීතරාගං[7]
,,	අධො. 4	අකනි B. S. ආනෙඤ්ජ P.	අකනි B. S.
,,	,, 5	—	5. ආනෙඤ්ජ P.
,,	,, 7	6. චිත්තං B. (සබ්බත්‍ථ)	7. චිත්තං B. (සබ්බත්‍ථ)
498	,, 13	පච්ජං P.	පච්ඡං P.
500	13	තත්‍රාපාසිං	තත්‍රාපාසිං[7]
,,	පිටුවෙහි පහල අධො ලිපි අඞ්ක	5 6 7	6 7 5
508	අධො. 9	19	9

දෙවෙනි කාණ්ඩය

පිට	පෙළ	අසුද්ධ	සුද්ධ
516	27	තංක.සස	තංකි.සස
574	අධො. 5	කම්මූපගෙ	කම්මූපගෙ
,,	,, 9	සංරපී	සංසරපී
580	අධො. 8	පච්ජා	පච්ඡා
582	,, 7	හොතිසමණො ගොතමො	සමණො ගොතමො සච්චවාදී
600	13	හාරිකෙන[5]	හාරිකෙන[2]
,,	16	බො[6]	බො[3]
,,	17	කෙන[5] (දෙපලක)	කෙන[2] (දෙපලේම)
642	3, 19	සඞ්ඛාති.	සඞ්ඛාති.[2]
644	8	විඤ්ඤූ	විඤ්ඤූ
650	18	අබ්‍යාපජ්ඣං[1]	අබ්‍යාපජ්ඣං[2]
,,	19	ආසවානඤ්ච[2]	ආසවානඤ්ච[3]
664	අධො. 8	හෙතීති	හොතීති
675	3	තෙපල්	තෙපුල්
688	අධො. 10	සිරවිහායනං	සිරව්හායනං
732	1	පොට්ඨපාදසුත්තං	9. පොට්ඨපාද සුත්තං
740	21	සීලසම්ං.	සීලසම්ං.
890	11	මාණව	කෙවට්ට
891	13	මාණවකය	කෙවට්ටය
1001	16	කෙවට්ටය	ලොහිච්චය
1028	අධො. 4	පච්ජාං	පච්ඡාං
1035	12	වලකා—	වලකා)

1043 මෙම පිටෙහි අන්තිම තිබෙන ඉර සහ "1. උපග්‍රන්ථය බලනු" යන වචන ඉවත් කරණු.

මුද්‍රණයේදී සිදුවූ ඔරහත් යෙදීමාදී තැන්හි ඇති දෝෂ ඉහත නොදක්වන ලදී. පෙළේ හෝ පරිවර්තනයෙහි යම් දෝසක් දක්නට ලැබේ නම් ඒ බව ප්‍රකාශකයන්ට දන්වා එවන සේ අයදිමු.

Misprints such as in the use of brackets, punctuation, quotation marks etc., have not all been included in the above list. The General Editor and the publishers will be grateful if readers will be so good as to point out any errors in the text or the translation.

මෙම පොතේ 1 වෙනි කාණ්ඩයේ 24 වෙනි පිටේ 25 වෙනි ඡේදයේ හවෙනි පෙළේ **මුද්දා, ගණනා, සඞ්ඛානං** යන වචන තුන ගැන එම කාණ්ඩයේ උපග්‍රන්ථයෙහි ii වෙනි iii වෙනි පිටුවල දක්වා තිබෙන කරුණු පිළිබඳව ගොමිල—මාවරල ඇහැළකන්දේ ශ්‍රී ජිනරතන මෙධඞ්කරාරාමාධිපති ගල්ඇටුඹේ ධම්මරතන ස්ථවිරයන් වහන්සේ ප්‍රකාශකයන් වෙත මෙසේ දන්වා එවා තිබේ:—

මේ වචන තුන ගැන දක්වා තිබෙන තේරුම් අසම්පූර්ණය. ඒ සම්බන්ධව අටුවා ටීකාදියෙහි පෙනෙන්නේ මෙසේය:

(1) **මුද්දා** ති අඞ්ගුලිපබ්බෙසු සඤ්ඤං ඨපෙත්වා හත්ථමුද්දා **ගණනා** ති අච්ඡිද්ද ගණනා. **සඞ්ඛානං** ති පිණ්ඩගණනා. යාය ඛෙත්තං ඔලොකෙත්වා ඉධ එත්තකා වීහි භවිස්සන්ති; රුක්ඛං ඔලොකෙත්වා ඉධ එත්තකානි ඵලානි භවිස්සන්ති; ආකාසං ඔලොකෙත්වා ඉමෙ ආකාසෙ සකුණා එත්තකං නාම භවිස්සන්ති ති ජානන්ති.

—පපඤ්චසූදනියේ හේවාවිතාරණ මුද්‍රණයේ දෙවෙනි කාණ්ඩයෙහි (මහා දුක්ඛක්ඛන්ධ සූත්‍ර වර්ණනාවේ) 46 වෙනි පිට.

ඉහත දැක්වූ අටුවා පාඨයට ටීකාව මෙසේය:

(2) **සඤ්ඤං ඨපෙත්වා** ති ඉමස්මිං අඞ්ගුලිපබ්බෙ ගහිතෙ සතං හොති, ඉමස්මිං සහස්සන්ති ආදිනා සඤ්ඤාණං කත්වා ගණනා. **අච්ඡිද්දගණනා** ති එකං ද්වෙ ති ආදිනා නවන්තාවිධිනා නිරන්තර ගණනා. **පිණ්ඩගණනා** ති සඞ්කලෙනුප්පාදනා පිණ්ඩගණනා. තෙනාහ ඛෙත්තං ඔලොකෙත්වාති ආදිනන්ති.

(3) **මුද්දා** ති හත්ථමුද්දා ගණනා. **ගණනා** ති අච්ඡිද්දකාදි අවසෙස ගණනා.

—සමන්තපාසාදිකා විනය අටුවාවෙහි හේවාවිතාරණ මුද්‍රණයේ (පාචිත්තිය මුසාවාද වග්ගයේ ඔමසවාද සික්ඛාපද වණ්ණනාවෙහි) 538 වෙනි පිට.

(4) **හත්ථමුද්දා ගණනා** ති අඞ්ගුලිසඞ්කොචනෙනෙව ගණනා. **අච්ඡිද්දක ගණනා** නාම එකට්ඨාන දසට්ඨානාදිසු සාරියො ඨපෙත්වා අනුක්කමෙන ගණනා. ආදි සද්දෙන සංකලන පටිප්පාදන වොකලන භාගහාරාදි වසෙන පවත්තා පිණ්ඩ ගණනා ගහිතා. යස්ස සා පගුණා සො රුක්ඛම්පි දිස්වා එත්තකානි එත්ථ පණ්ණානී ති ජානාති.

—විමති විනෝදනී විනය අටුවා ටීකාවේ 298 හා 299 වෙනි පිටු.

(5) **මුද්දා** ති අච්ඡිද්ද ගණනා. **ගණනා** ති පිණ්ඩ ගණනා ති අඞ්ගුත්තර වණ්ණනා නායො. මුද්දා ති අඞ්ගුලි පබ්බසු සඤ්ඤං ඨපෙත්වා හත්ථමුද්දාය ගණනා එක වෙ තීනීති ආදි වසෙන අච්ඡිද්දගණනා ති.

—මනොරථපූරණී ටීකා.

(6) **ගණනාය** වා ති පිණ්ඩගණනාය. **සඞ්ඛානෙනා** ති අච්ඡිද්දවසෙන මනො ගණනාය. උභයථාපි පිණ්ඩගණනා මෙව දස්සෙති.

—සුමඞ්ගල විලාසිනියෙහි සම්පසාදනීය සූත්‍රවණ්ණනාව (P.T.S.ed.p.894).

(7) **සඞ්ඛානෙනා** ති ගණනාය.

—මැදුම්සඟි අටුවාවේ හේවාවිතාරණ මුද්‍රණයේ 4 වෙනි කාණ්ඩයේ (ගණකමොග්ගල්ලාන සූත්‍ර වණ්ණනාවෙහි) 48 වෙනි පිට.

ඉහත ගෙනහැර දැක්වූ පාඨයන්හි පෙනෙන අන්දමට—

(1) **මුද්දා** යන්නෙහි තේරුම: මේ ඇඟිලි පුරුක ඇල්ලූ කල සියයක් වෙයි, මේ ඇඟිලි පුරුක ඇල්ලූ කල දහසක් වෙයි, මේ ඇඟිලි පුරුක ඇල්ලූ කල ලක්‍ෂයක් වෙයි ආදී වශයෙන් සලකුණු කොට ගණිත් ගන්නා ක්‍රමයකි. අදත් මැණික් වෙළඳාම් ආදියෙහිදී ගණුදෙනු කරන්නවුන්ගේ හොඳහිත රැකීම පිණිස පවත්වාගෙන එනු ලබන ගණිත් ව්‍යවහාර ක්‍රමයකි.

(2) **ගණනා** යන්නෙහි තේරුම: අතරක් නැතිව ගණින් කිරීමයි. එනම්, එක දෙක ආදී වශයෙන් නවය අවසන් කොට ඇති දූනට ප්‍රකටව පවත්නා ගණිත් ව්‍යවහාර ක්‍රමයයි.

(3) **සඞ්ඛානං** යන්නෙහි තේරුම: ගොඩවල් වශයෙන් ගණින් කිරීමයි හෙවත් රාශි වශයෙන් ගණින් කිරීමයි. වී ගොඩක් දෙස බලා මෙහි මෙතෙක් වී අමුණු ගණනෙක, මෙතෙක් බුසල් ගණනෙක ආදී වශයෙන් කරනු ලබන සාමාන්‍ය ගණිත් ගැණීමයි. ගසක් දෙස බලා මේ ගසේ මෙපමණ ගෙඩි ඇත; කුරුළු සමූහයක් දෙස බලා මෙපමණ කුරුල්ලන් ඇත යනාදී වශයෙන් සාමාන්‍ය ජනයා අතර දුනුදු මේ ව්‍යවහාරය පවතී.

උප ග්‍රන්ථය

6. මහාලි සූත්‍රය

513 වෙනි පිට

1. නාගිත ස්ථවිරයන් කලක් බුදුරජාණන් වහන්සේට උපස්ථායකව ක්‍රියා කළ බවද ඔහු ස්ථූලව අලස වූ බැවින් තමන්ට අයත් කටයුතු ස්වකීය බෑණනුවන් වූ සීහ සාමණේරයන් ලවා කරවාගත් බවද අටුවාවෙහි සඳහන් වේ.

2. මහාලි නම්වූ ලිච්ඡවි රජුට (ක්‍ෂත්‍රියයාට) බෙදුනු උඩු තොලක් ඇති බැවින් ඔට්ඨද්ධ යන (විකට) නාමය දෙන ලදැයි අටුවාවෙහි දැක්වේ.

515 වෙනි පිට

1. නාගිත තෙරුන්ගේ බෑණනුවන් වූ සීහ සාමණේරයන් වහන්සේ සත් ඇවිරිදි වයසෙහි පැවිදිවූ බවද ස්වකීය ගති පැවතුම් නිසා බුදු රදුන්ගේ සිත් දිනාගත් බවද අටුවාවෙහි දැක්වේ.

8. කස්සප සීහනාද සූත්‍රය

647 වෙනි පිට

1. අචේලක (නග්න) තාපසයන් පිළිබඳව මේ සූත්‍රයේ දැක්වෙන විස්තරය මැදුම් සඟියේ මහා සීහනාද, මහා සච්චක, කන්දරක හා ඝොටමුඛ යන සූත්‍රයන්හිද පුග්ගල පඤ්ඤත්තියෙහිද දක්නා ලැබේ.

727 වෙනි පිටුවේ අධෝලිපිය

මේ සම්බන්ධයෙන් දීඝනිකායෙහි 25 වෙනි සූත්‍රය වන උදුම්බරික සීහනාද සූත්‍රයද බැලිය යුතුයි.

733 වෙනි පිටෙහි අධෝලිපිය (9. පොට්ඨපාද සූත්‍රය)

දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ 19 වෙනි පිටුවට ලියන ලද උප ග්‍රන්ථය බලනු.

මෙම පොතේ 1 වෙනි කාණ්ඩය පිළිබඳ පැලෑනේ සිරි වජිරඤාණ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ විවේචනයක් 1948 අගෝස්තු 10 වෙනිදා දිනමිණ පත්‍රයේද, R. නාමින් භවතෙකුගේ විවේචනයක් එම මස 15 වෙනිදා ඔබ්සර්වර් පත්‍රයේද, යක්කඩුවේ සිරි පඤ්ඤාරාම ස්වාමීන් වහන්සේගේ දීර්ඝ විවේචනයක් 1948 සැප්තැම්බර 18 සහ 25, ඔක්තෝම්බර 2 සහ 9 දිනවල ලංකාදීප පත්‍රයේද පළවී ඇත.

සඞ්කෙත නිරූපන

ABBREVIATIONS

B. බුරුම අකුරෙන් මුද්‍රිත දීඝනිකාය
Burmese printed edition

C. සුමඞ්ගලවිලාසිනී නාම දීඝනිකායට්ඨකථා
Commentary (Sumaṅgalavilāsinī) published by the Hewavitarne Bequest

Ca. C. පොතේ අධොලිපි
Foot-notes in C.

Ce. ඉංග්‍රීසි අකුරෙන් මුද්‍රිත අට්ඨකථාව
Pali Text Society's edition of the Commentary

P. එංගලන්තයේ පාලි පොත් සමාගම මගින් ඉංග්‍රීසි අකුරෙන් මුද්‍රිත දීඝනිකාය
Dīgha Nikāya edited by T. W. Rhys Davids and J. Estlin Carpenter, published by the Pali Text Society, England

Pa. P. පොතේ අධොලිපි
Foot-notes in P.

S. සියම් අකුරෙන් මුද්‍රිත දීඝනිකාය
Siamese printed edition

Sa. සියම් මුද්‍රිත පොතේ අධොලිපි
Foot-notes in S.

V. වැලිතර ඤාණාවාස ස්ථවිරයන් වහන්සේ විසින් ශුද්ධකරණ ලදුව සිංහල අකුරෙන් මුද්‍රිත දීඝනිකාය
Ceylon edition by the Ven'ble Välitara Ñāṇāvāsa Thera

Va. V. පොතේ අධොලිපි
Foot-notes in V.

W. පරලෝසැපත් ආර්තර් ද සිල්වා මැතිතුමාගේ අනුමැතිය පිට සකස් කරණ ලදුව සිංහල අකුරෙන් මුද්‍රිත දීඝනිකාය
Ceylon edition with Sinhala translation published by the late W. Arthur de Silva.

සමස්ත ලංකා බෞද්ධ සම්මේලනයේ ත්‍රිපිටක මුද්‍රණය භාර මණ්ඩලය

(ලියා පදිංචි කරණලදී)

THE BUDDHIST CONGRESS TRI-PITAKA TRUST

(INCORPORATED)

ලියා පදිංචි කරණලද භාරකාරවරු:

ශ්‍රීමත් ටිකිරිබණ්ඩා පානබොක්කේ
මහ අදිකාරම්
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා
එච්. ඩබ්ලිව්. අමරසූරිය
ජේ. ආර්. ජයවර්ධන
ගුණපාල මලලසේකර
ඩී. ටී. ආර්. ගුණවර්ධන

Incorporated Trustees:
(66 Ward Place, Colombo)

Sir Tikiri Banda Panabokke, Kt.,
First Adigar
Sir Ernest de Silva, Kt.
H. W. Amarasuriya
J. R. Jayewardene
G. P. Malalasekera
D. T. R. Gunawardena

කාර්‍යාධිකාරි මණ්ඩලය:

මුදලි තැන්පත් පී. ඩී. රත්නතුංග
(සභාපති)
මහාචාර්‍ය ගුණපාල මලලසේකර
වෛද්‍යාචාර්‍ය එච්. කේ. ටී. ද සිල්වා
මුදලි තැන්පත් රොබට් මලල්ගොඩ
පී. එච්. ද සොයිසා

සමස්ත ලංකා බෞද්ධ සම්මේලනයේ
සභාපති (සිය නිලය නිසා)

සමස්ත ලංකා බෞද්ධ සම්මේලනයේ
ගරු ලේකම් (සිය නිලය නිසා)

Board of Management:

Mudaliyar P. D. Ratnatunga
(*Chairman*)
Dr. G. P. Malalasekera
Dr. H. K. T. de Zylva
Mudaliyar Robert Malalgoda
P. H. de Zoysa

President of the All-Ceylon
Buddhist Congress (*Ex-officio*)

Hony. Secretary of the All-Ceylon
Buddhist Congress (*Ex-officio*)

ලිපුම්:-

කොළඹ 6 වැල්ලවත්තේ
පල්ලිය පාරේ අංක 32

Address: 32, Chapel Lane,
Wellawatta, Colombo 6

ප්‍රධාන සම්පාදක:

මහාචාර්‍ය ගුණපාල මලලසේකර
ඩී. ලිට්. (ලන්ඩන්), පීඑච්. ඩී.,
ඇම්. ඒ.

General Editor:

Dr. G. P. Malalasekera,
D. Litt. (London), Ph. D., M. A.

PALI ALPHABET
IN SINHALA SCRIPT

VOWELS

අ a   ආ ā   ඉ i   ඊ ī   උ u   ඌ ū   එ e   ඔ o

CONSONANTS

ක ka	ඛ kha	ග ga	ඝ gha	ඞ ṅa
ච ca	ඡ cha	ජ ja	ඣ jha	ඤ ña
ට ṭa	ඨ ṭha	ඩ ḍa	ඪ ḍha	ණ ṇa
ත ta	ථ tha	ද da	ධ dha	න na
ප pa	ඵ pha	බ ba	භ bha	ම ma

ය ya   ර ra   ල la   ව va   ස sa   හ ha   ළ ḷa   (අ) ං ṁ

VOWELS IN COMBINATION

ක ka   කා kā   කි ki   කී kī   කු ku   කූ kū   කෙ ke   කො kō
ඛ kha   ඛා khā   ඛි khi   ඛී khī   ඛු khu   ඛූ khū   ඛෙ khe   ඛො khō
ග ga

CONJUNCT - CONSONANTS

ක්ක kka	ජ්ඣ jjha	ත්ව tva	ම්ඵ mpha
ක්ඛ kkha	ඤ්ච, ච ñca	ද්ද dda	ම්බ mba, ඹ m̆ba
ක්‍ය kya	ඡ, ඤ්ඡ ñcha	ද්ධ, ධ ddha	ම්භ mbha
ක්‍රි kri	ජ, ඤ්ජ ñja	ද්‍ර dra	ම්ම mma
ක්ව kva	ඤ්ඣ ñjha	ද්ව, ද්ව dva	ම්හ mha
ඛ්‍ය khya	ඤ්ඤ ñña	ධ්ව dhva	ය්‍ය, ය්ය yya
ඛ්ව khva	ට්ට ṭṭa	න්ත nta	ය්හ yha
ග්ග gga	ට්ඨ, ඨ ṭṭha	න්ථ ntha	ල්ල lla
ග්ඝ ggha	ඩ්ඩ ḍḍa	න්ද nda, ඳ n̆da	ල්‍ය lya
ග්‍ර gra	ඩ්ඪ ḍḍha	න්ධ ndha	ල්හ lha
ඞ්ක ṅka	ණ්ට ṇṭa	න්න nna, න්හ nha	ව්හ vha
ඞ්ඛ ṅkha	ණ්ඨ ṇṭha	ප්ප ppa	ස්ස ssa
ඞ්ග ṅga	ණ්ඩ ṇḍa, ඬ ṅ̆ḍa	ප්ඵ ppha	ස්ම sma
ඞ්ඝ ṅgha	ණ්ණ ṇṇa	බ්බ bba	ස්ව sva
ච්ච cca	ණ්හ ṇha	බ්භ bbha	හ්ම hma
ච්ඡ ccha	ත්ත tta	බ්‍ර bra	හ්ව hva
ජ්ජ jja	ත්ථ ttha	ම්ප mpa	ළ්හ ḷha

දීඝනිකායො

දීඝනිකාය

දීඝනිකායො

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස

සීලක්ඛන්ධවග්ගො

6. මහාලි සුත්තං.

1. එවං මෙ සුත්තං: එකං සමයං භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං[1].

තෙන ඛො පන සමයෙන සම්බහුලා කොසලකා[2] ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා වෙසාලියං පටිවසන්ති කෙනචිදෙව කරණීයෙන. අස්සොසුං ඛො තෙ කොසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා: සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං.

තං ඛො පන භවන්තං[3] ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: ඉති පි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං[4] කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතීති.

---

1. කුටාගාර° P.
2. කොසලා S. (සබ්බත්ථ)
3. භගවන්තං P.
4. සව්‍ය° P.

දීඝ නිකාය

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස

සීලක්ඛන්ධවග්ගය

6. මහාලි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදි. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විශාලා මහනුවර සමීපයෙහි මහා වනයෙහි වූ කූටාගාරශාලා නම් සඞ්ඝාරාමයෙහි වැඩවාසය කරණසේක.

එසමයෙහි වනාහි කොසොල් රට වාසීවූ බොහෝ බ්‍රාහමණ දූතයෝද, මගධරට වාසීවූ බොහෝ බ්‍රාහමණ දූතයෝද කිසියම් කටයුත්තක් සඳහා විශාලාමහනුවර වාසය කරති. ‘ශාක්‍යපුත්‍රවූ, ශාක්‍ය කුලයෙන් පැවිදිවූ, ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ විශාලා මහනුවර සමීපයෙහි මහා වනයෙහි වූ කූටාගාර නම් සංඝාරාමයෙහි වැඩවාසය කරණසේකැ’යි කොසොල් රට වාසීවූ ද, මගධ රට වාසීවූ ද, ඒ බ්‍රාහමණ දූතයෝ ඇසුවාහුය.

ඉදින් ඒ භවත් ගෞතමයන් පිළිබඳව මෙබඳු කීර්ත්ති-ශබ්දයක් උස්ව නැගුණේ වෙයි—කෙසේදයත්: “ඒ භාග්‍යවතුන් වහන්සේ සියලු කෙලෙසුන් කෙරෙන් දුරු වූ සේක, සියලු ධර්මයන් (අනුන්ගේ උපදෙශයක් නැතිව) මනාව දත්සේක. (අෂ්ට) විද්‍යා (පසළොස්) චරණ ධර්මයන්ගෙන් සම්පූර්ණසේක, යහපත් ගමන් ඇතිසේක, (තුන්) ලොව දන්නා සේක, සීලාදී ගුණයන්ගෙන් තමහට වඩා වැඩිහිටියෙකු තබා සමානයෙකුත් නැතිසේක, පුරුෂයන් දමනය කිරීමෙහි හෙවත් හික්මවීමෙහි ඉතා සමර්ථසේක, දෙව් මිනිසුන්ට අනුශාසනා කරණසේක, චතුස්සත්‍යයධර්මයන් අවබොධ කළ සේක. උන්වහන්සේ දෙවියන් සහිතවූ, මරුන් සහිතවූ, බඹුන් සහිතවූ, මේ ලොකය ද මහණබමුණන් දෙව්මිනිසුන් සහිතවූ සත්ත්වසමූහයාද තෙමේ ම (පරෝපදේශ රහිතව) දැන අවබොධ කොට (ප්‍රත්‍යක්ෂ කොට) ප්‍රකාශ කරණසේක. උන්වහන්සේ මුල යහපත්වූද, මැද යහපත්වූද, අග යහපත්වූද අර්ථ සහිතවූද (සිථිලධනිතාදි) අක්ෂර සම්පත්තියෙන් යුක්තවූද, ධර්මදෙශනා කරණසේක, (සර්වප්‍රකාරයෙන්) හාත්පසින් සම්පූර්ණවූද, පිරිසිදු වූද, බ්‍රහමචර්‍ය්‍යාව හෙවත් උතුම් හැසිරීම ප්‍රකාශ කරණසේක. එබඳු ගුණයන්ගෙන් යුක්තවූ රහතුන්ගේ දර්ශනය (දැකීම) ද හිත සැප එළවන්නේය” (කියාහි).

2. අථ ඛො තෙ කොසලකා ච බ්‍රාහමණදූතා මාගධකා ච බ්‍රාහමණදූතා යෙන මහාවනං කූටාගාරසාලා තෙනුපසඞ්කමිංසු. තෙන ඛො පන සමයෙන ආයස්මා නාගිතො භගවතො උපට්ඨාකො හොති. අථ ඛො තෙ කොසලකා ච බ්‍රාහමණදූතා මාගධකා ච බ්‍රාහමණදූතා යෙනායස්මා නාගිතො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං නාගිතං එතදවොචුං : කහං නු ඛො භො නාගිත එතරහි සො භවං ගොතමො විහරති? දස්සනකාමා හි මයං තං භවන්තං[1] ගොතමන්ති.

අකාලො ඛො ආවුසො භගවන්තං දස්සනාය පටිසල්ලීනො භගවාති.

අථ ඛො තෙ කොසලකා ච බ්‍රාහමණදූතා මාගධකා ච බ්‍රාහමණදූතා තත්ථෙව එකමන්තං නිසීදිංසු : දිස්වා ච මයං තං භවන්තං[2] ගොතමං ගමිස්සාමාති.

3. ඔට්ඨද්ධොපි ලිච්ඡවි මහතියා ලිච්ඡවිපරිසාය සද්ධිං යෙන මහාවනං කූටාගාරසාලා යෙනායස්මා නාගිතො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං නාගිතං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො ඔට්ඨද්ධො පි ලිච්ඡවි ආයස්මන්තං නාගිතං එතදවොච : කහං නු ඛො භන්තෙ නාගිත එතරහි සො භගවා විහරති අරහං සම්මාසම්බුද්ධො? දස්සනකාමා හි මයං තං භගවන්තං අරහන්තං සම්මාසම්බුද්ධන්ති.

අකාලො ඛො මහාලි භගවන්තං දස්සනාය පටිසල්ලීනො භගවාති. ඔට්ඨද්ධොපි ලිච්ඡවි තත්ථෙව එකමන්තං නිසීදි : දිස්වා ච[3] අහං තං භගවන්තං ගමිස්සාමි අරහන්තං සම්මා-සම්බුද්ධන්ති.

1. භවං W. භගවන්තං B. භවං ඉති නත්ථි P.
2. භගවන්තං P.
3. දිස්වාවාහං S

2. ඉක්බිති ඒ කොසොල්රටවාසීවූද මගධරටවාසීවූද බ්‍රාහමණදූතයෝ මහාවනයෙහි වූ කූටාගාර නම් විහාරය යම් තැනෙක්හිද එතනට පැමිණියාහුය. ඒ කාලයෙහි ආයුෂ්මත් නාගිත ස්ථවිර තෙමේ[1] භාග්‍යවතුන්වහන්සේට උපස්ථාන කරන්නේ වෙයි. ඉක්බිති ඒ කොසොල්රටවාසීවූද මගධරට වාසීවූද බ්‍රාහමණදූතයෝ ආයුෂ්මත් නාගිත ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතනට පැමිණියාහුය. පැමිණ ආයුෂ්මත් නාගිත ස්ථවිරයන්වහන්සේට මෙසේ කීවාහුය: "පින්වත් නාගිතයෙනි, මේ කාලයෙහි ඒ භාග්‍යවත් ගෞතමයන් වහන්සේ කොහි වැඩවසනසේක්ද? අපි ඒ භවත් ගෞතමයන් වහන්සේ දකිනු කැමැත්තෝ වම්හ" (කියායි).

(ඊට නාගිත තෙරණුවෝ) "පින්වතුනි, දූන් භාග්‍යවතුන් වහන්සේ දැකීමට කාලය නොවෙයි, භාග්‍යවතුන් වහන්සේ (අරමුණු සැප විඳීමෙන් තුරන්ව) චිත්ත විවෙකයෙන් වැඩවසන සේකැ"(යි කීහ).

ඉක්බිති කොසොල් රටවැසිවූද, මගධ රට වැසිවූද, බ්‍රාහමණ දූතයෝ, 'අපි ඒ භාග්‍යවත් ගෞතමයන් වහන්සේ දැකම යමුය'යි එහිම එක් පසෙක හිඳගත්තාහුය.

3. (අඩවූ උඩුතොල් ඇති බැවින්) ඔට්ඨද්ධ[2] යයි ප්‍රසිද්ධ (මහාලි නම්) ලිච්ඡවි (උපාසක) තෙමේද මහත්වූ ලිච්ඡවි (රජ) පිරිස සමග මහාවනයෙහි කූටාගාරශාලාව යම්තැනකද ආයුෂ්මත් නාගිත ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් නාගිත තෙරුන් වනාකොට වැඳ එකත්පසෙක සිටියේය. එකත්පස්ව සිටියාවූ ඔට්ඨද්ධ නම් ලිච්ඡවි තෙමේද ආයුෂ්මත් නාගිත තෙරුන්ට මෙසේ කීයේය: "ස්වාමීනි, නාගිත ස්ථවිරයන් වහන්ස, දූන් ඒ භාග්‍යවත් අර්හත් සම්බුදුරජාණන් වහන්සේ කොතැන්හි වැඩ සිටිනසේක් ද? අපි ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ දකිනු කැමැත්තෙමු."

"මහාලිය, දූන් භාග්‍යවතුන් වහන්සේ දැකීමට කාලය නොවේ. භාග්‍යවතුන් වහන්සේ ධ්‍යාන සැප අනුභව කරණ සේක".

ඔට්ඨද්ධ නම් ලිච්ඡවි තෙමේද 'මම ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේ දැකම යන්නෙමි'යි එහිම එකත්පසක ඉඳගත්තේය.

---

1. 2. උපග්‍රන්ථය බලනු.

4. අථ ඛො සීහො සමණුද්දෙසො යෙනායස්මා නාගිතො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං නාගිතං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො සීහො සමණුද්දෙසො ආයස්මන්තං නාගිතං එතදවොච: එතෙ භන්තෙ කස්සප සම්බහුලා කොසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා ඉධූපසඞ්කන්තා භගවන්තං දස්සනාය. ඔට්ඨද්ධොපි ලිච්ඡවී මහතියා ලිච්ඡවිපරිසාය සද්ධිං ඉධූපසඞ්කන්තො භගවන්තං දස්සනාය. සාධු භන්තෙ කස්සප ලභතං එසා ජනතා භගවන්තං දස්සනායාති.

තෙන හි සීහ ත්වඤ්ඤෙව[2] භගවතො ආරොචෙහීති. එවං භන්තෙති ඛො සීහො සමණුද්දෙසො ආයස්මතො නාගිතස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො සීහො සමණුද්දෙසො භගවන්තං එතදවොච: එතෙ භන්තෙ සම්බහුලා කොසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා ඉධූපසඞ්කන්තා භගවන්තං දස්සනාය. ඔට්ඨද්ධොපි ලිච්ඡවී මහතියා ලිච්ඡවිපරිසාය සද්ධිං ඉධූපසඞ්කන්තො භගවන්තං දස්සනාය. සාධු භන්තෙ ලභතං එසා පරිසා[3] භගවන්තං දස්සනායාති.

තෙන හි සීහ විහාරපච්ඡායාය[4] ආසනං පඤ්ඤපෙහීති.

එවං භන්තෙති ඛො සීහො සමණුද්දෙසො භගවතො පටිස්සුත්වා විහාරපච්ඡායාය[4] ආසනං පඤ්ඤපෙසි. අථ ඛො භගවා විහාරා නික්ඛම්ම විහාරපච්ඡායාය[4] පඤ්ඤත්තෙ[5] ආසනෙ නිසීදි.

5. අථ ඛො තෙ කොසලකා ච බ්‍රාහ්මණදූතා මාගධකා ච බ්‍රාහ්මණදූතා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදිංසු සම්මොදනියං[6] කථං සාරණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. ඔට්ඨද්ධොපි ලිච්ඡවි මහතියා ලිච්ඡවිපරිසාය සද්ධිං යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ඔට්ඨද්ධො[7] ලිච්ඡවි භගවන්තං එතදවොච:

---

1. සිංහො Pa.
2. ත්වං යෙව P.
3. ජනතා P.
4. °යායං B. S. Pa.
5. පඤ්ඤත්තාසනෙ S.
6. °නියං B.
7. ඔට්ඨද්දොපි S.

4. ඉක්බිති සීහ[1] නම් සාමණේරයන් වහන්සේ ආයුෂ්මත් නාගිත ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද, එතනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් නාගිත තෙරුන් වැඳ එකත්පසක සිටියේය. එකත්පසක සිටියාවූ සීහ සාමණේරයන් වහන්සේ ආයුෂ්මත් නාගිත තෙරුන්ට මෙය දැන්වීය: "කාශ්‍යප ගොත්‍ර ඇති ස්වාමීනි, මේ බොහෝවූ කොසොල්රට වැසිවූද, මගධ රට වැසිවූද, බ්‍රාහ්මණ දූතයෝ භාග්‍යවතුන් වහන්සේ දැකීම පිණිස මෙහි පැමිණියාහුය: ඔට්ඨද්ධ නම් ලිච්ඡවි තෙමේද මහත්වූ ලිච්ඡවි පිරිස සමග භාග්‍යවතුන් වහන්සේ දැකීම පිණිස මෙහි පැමිණියේ වෙයි. කාශ්‍යප ගොත්‍ර ඇති ස්වාමීනි, මේ ජන සමූහ තෙමේ භාග්‍යවතුන් වහන්සේ දක්නට ලබන සේක්නම් එය ඉතා මැනවි."

"එසේ නම් සීහය, තෝ ම භාග්‍යවතුන් වහන්සේට සැළ කරව" (යි නාගිත තෙර කියේය). "ස්වාමීනි, එසේය"යි සීහ සාමණේරයන්වහන්සේ ආයුෂ්මත් නාගිත ස්ථවිරයන් වහන්සේට පිළිවදන් දී, භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද, එතනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් (පසඟ පිහිටුවා) වැඳ එකත්පසක සිටියේය. එකත්පසක සිටියාවූ සීහ සාමණේර තෙමේ භාග්‍යවතුන් වහන්සේට, "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ දක්නා පිණිස කොසොල්රට වැසිවූද, මගධරට වැසිවූද, මේ බොහෝවූ බ්‍රාහ්මණ දූතයෝ මෙහි පැමිණියාහුය. භාග්‍යවතුන් වහන්සේ දක්නා පිණිස ඔට්ඨද්ධ නම් ලිච්ඡවිතෙමේද විශාලවූ ලිච්ඡවි පිරිස සමග මෙහි පැමිණියේය. ස්වාමීනි, මේ පිරිස් භාග්‍යවතුන් වහන්සේ දක්නට ලබන්නාහු නම් ඉතා යහපතැ"(යි කීය).

"සීහය, එසේ නම් විහාරසෙවනැල්ලෙහි අස්නක් පනවව"යි [බුදුහු වදාළසේක].

'එසේය'යි පිළිවදන්දී සීහ සාමණේර තෙමේ විහාර සෙවනැල්ලෙහි අස්නක් පැනවීය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ විහාරයෙන් නික්ම විහාරසෙවනැල්ලෙහි පැනවූ ආසනයෙහි වැඩහුන්නේය.

5. ඉක්බිති කොසොල්රට වැසිවූද, මගධරට වැසිවූද බ්‍රාහ්මණ දූතයෝ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතනට පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ හා සතුටු වූහ. සතුට එලවන්නාවූ සිහිකටයුතුවූ කථාකොට අවසන එකත්පසක හුන්නාහුය. ඔට්ඨද්ධ නම් ලිච්ඡවි තෙමේද මහත්වූ ලිච්ඡවි පිරිස සමග භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසක හුන්නේය. එකත්පසක හුන්නාවූ ඔට්ඨද්ධ නම් ලිච්ඡවි තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේය:

1. උපග්‍රන්ථය බලනු.

පුරිමානි භන්තෙ දිවසානි පුරිමතරානි සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො යෙනාහං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා මං එතදවොච: යදග්ගෙ අහං මහාලි භගවන්තං උපනිස්සාය විහරමි[1] න චිරං තීණි වස්සානි දිබ්බානි හි ඛො රූපානි පස්සාමි පියරූපානි කාමූපසංහිතානි[2] රජනීයානි[3]. නො ච ඛො දිබ්බානි සද්දානි සුණාමි පියරූපානි කාමූපසංහිතානි රජනීයානීති. සන්තානෙව නු ඛො භන්තෙ සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො දිබ්බානි සද්දානි නාස්සොසි[4] පියරූපානි කාමූපසංහිතානි රජනීයානි[5] නො[6] උදාහු අසන්තානීති?

සන්තානෙව ඛො මහාලි සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො දිබ්බානි සද්දානි නාස්සොසි පියරූපානි කාමූපසංහිතානි රජනීයානි නො අසන්තානීති.

6. කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො යෙන සන්තානෙව සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො දිබ්බානි සද්දානි නාස්සොසි පියරූපානි කාමූපසංහිතානි රජනීයානි නො අසන්තානීති?

ඉධ මහාලි භික්ඛුනො පුරත්ථිමාය දිසාය එකංසභාවිතො සමාධි හොති දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං නො ච ඛො දිබ්බානං සද්දානං සවනාය[7] පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. සො පුරත්ථිමාය දිසාය එකංසභාවිතෙ සමාධිම්හි දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං නො ච ඛො දිබ්බානං සද්දානං සවනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං පුරත්ථිමාය දිසාය දිබ්බානි රූපානි පස්සති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි නො ච ඛො දිබ්බානි සද්දානි සුණාති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි. තං කිස්ස හෙතු? එවං හෙතං මහාලි හොති භික්ඛුනො පුරත්ථිමාය දිසාය එකංසභාවිතෙ සමාධිම්හි දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං නො ච ඛො දිබ්බානං සද්දානං සවනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං.

---

1. විහරිස්සාමි P. W.
2. °සඤ්හිතානි B.S.V.(සබ්බත්ථ).
3. °නියානි B. S. (සබ්බත්ථ)
4 නස්සොසි Pa; න අස්සොසි S. (සබ්බත්ථ)
5. රජනියානි තානි S.
6. නො ති න දිස්සති B. S. V.
7. සවණාය V. W. (සබ්බත්ථ)

"ස්වාමීනි, පෙරදින සහ ඊට බොහෝ අතීත දිනයන්හිද (එක දිනකට පෙරද) සුනක්ඛත්ත ලිච්ඡවිපුත්‍ර තෙම මා යම් තැනෙක්හිද එතනට පැමිණියේය. පැමිණ මට මෙය කීයේය: 'මහාලිය, මම යම් දිනක පටන් මේ තුන් අවුරුද්දක් මුලුල්ලෙහි භාග්‍යවතුන් වහන්සේ ඇසුරුකොට වාසය කෙළෙම්ද, ඒ කාලය තුළ ප්‍රිය එලවන්නාවූ, කම් සැප විඳීමට යෝග්‍යවූ, රාගය උපදවන්නාවූ, දිව්‍ය රූපයන් පමණක් දුටුයෙමි. එසේ නමුත් සතුට උපදවන්නාවූ, කම් සැප විඳීමට යෝග්‍ය වූ, රාගය උපදවන්නාවූ දිව්‍යමයවූ ශබ්ද නො ඇසුයෙමි'යි (කීයායි). ස්වාමීනි,සුනක්ඛත්ත ලිච්ඡවි පුත්‍ර තෙමේ සැබැවින් ඇත්තාවූම,ප්‍රිය ජනකවූ, කම් සැප විඳීමට යොග්‍ය, රාගය උපදවන දිව්‍ය ශබ්ද නො ඇසුවේද? නො එසේ නම් නැත්තාවූ දිව්‍ය ශබ්දයන් (දිව්‍ය ශබ්දයන් නැති නිසා) නො ඇසුවේද?"

"මහාලිය, සුනක්ඛත්ත ලිච්ඡවිපුත්‍ර තෙමේ ඇත්තාවූම, ප්‍රිය ජනකවූ, කම් සැප විඳීමට යොග්‍ය, රාගය උපදවන දිව්‍ය ශබ්ද නො ඇසුවේය. නැත්තාවූ, ප්‍රිය ජනකවූ, කම් සැපට යොග්‍ය, රාගය උපදවන දිව්‍ය ශබ්ද නො ඇසුවේ නොවේ."

6. "ස්වාමීනි, යම්හෙයකින් සුනක්ඛත්ත ලිච්ඡවිපුත්‍ර තෙමේ නැත්තාවූම නොව, ඇත්තාවූම, ප්‍රිය ජනකවූ, කම් සැප විඳීමට යොග්‍යවූ, රාගය උපදවන්නාවූ, දිව්‍ය ශබ්ද නො ඇසුයේ නම් ඊට හේතුව කවරේද, ප්‍රත්‍යය කවරේද?"

"මහාලිය, මේ සාසනයෙහි යම් මහණෙකුට පෙර දික්හි එක් කොටසක් සම්බන්ධවම වඩන ලද්දවූ, ප්‍රිය ජනක වූ, කම් සැප විඳීමට යොග්‍ය වූ රාග ජනකවූ දිව්‍ය රූපයන්ගේ දර්ශනය පිණිස සමාධියක් වේද, (ඒ සමාධිය) ප්‍රියජනකවූ, කම්සැපට යොග්‍යවූ, රාගජනකවූ දිව්‍ය ශබ්දයන්ගේ ඇසීම පිණිස නොම වේද, ඒ මහණතෙම එක කොටසක් සම්බන්ධව වඩන ලද සමාධියෙහි (හෙවත් එය පාදක කොටගෙණ) පෙරදික්හි ප්‍රිය රූපවූ, කම් සැප විඳීමට යොග්‍යවූ, රාගජනකවූ දිව්‍ය රූප දකී. (එහෙත්) ප්‍රියවූ, කම්සැපට යොග්‍යවූ, රාගජනකවූ දිව්‍ය ශබ්ද නො අසයි. ඊට හෙතුව කවරේද? මහාලිය, ඒ මහණ පූර්වදිශාවෙහි එකකොටසක් සම්බන්ධව ප්‍රියවූ, කම් සැපට යොග්‍යවූ, රාග ජනකවූ දිව්‍ය ශබ්දයන් ඇසීමට නොව එබඳුවූ දිව්‍ය රූපයන් දැකීම පිණිස වඩන ලද සමාධිය නිමිතිකොට ගෙණ, හෙතෙම වනාහි ප්‍රිය වූ, කම් සැපට යොග්‍යවූ, රාග ජනක වූ දිව්‍යරූප දකී. (එහෙත්) එබඳු වූ දිව්‍ය ශබ්ද නො අසයි. මෙය එසේම වේ.

7. පුනචපරං මහාලි භික්ඛුනො දක්ඛිණාය දිසාය—පෙ—පච්ඡිමාය දිසාය—පෙ—උත්තරාය දිසාය—පෙ—උද්ධමධො තිරියං එකංසභාවිතො සමාධි හොති දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං නො ච ඛො දිබ්බානං සද්දානං සවනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. සො උද්ධමධො තිරියං එකංසභාවිතෙ සමාධිම්හි දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං නො ච ඛො දිබ්බානං සද්දානං සවනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං උද්ධමධො තිරියං දිබ්බානි රූපානි පස්සති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි නො ච ඛො දිබ්බානි සද්දානි සුණාති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි. තං කිස්ස හෙතු? එවං හෙතං[1] මහාලි හොති භික්ඛුනො උද්ධමධො තිරියං එකංසභාවිතෙ සමාධිම්හි දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං නො ච ඛො දිබ්බානං සද්දානං සවනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං.

8. ඉධ මහාලි භික්ඛුනො පුරත්ථිමාය දිසාය එකංසභාවිතො සමාධි හොති දිබ්බානං සද්දානං සවනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං නො ච ඛො දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. සො පුරත්ථිමාය දිසාය එකංසභාවිතෙ සමාධිම්හි දිබ්බානං සද්දානං සවනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං නො ච ඛො දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං පුරත්ථිමාය දිසාය දිබ්බානි සද්දානි සුණාති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි නො ච ඛො දිබ්බානි රූපානි පස්සති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි. තං කිස්ස හෙතු? එවං හෙතං මහාලි හොති භික්ඛුනො පුරත්ථිමාය දිසාය එකංසභාවිතෙ සමාධිම්හි දිබ්බානං සද්දානං සවනාය[2] පියරූපානං කාමූපසංහිතානං රජනීයානං නො ච ඛො දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං.

---

1. එවං හෙතු Pa. 2. සවනායාති නත්ථි W.

7. "මහාලිය, නැවතද අන් කරුණක් ඇත්තේය. යම් මහණෙක්හට ප්‍රිය ස්වභාව ඇති, කම් සැප විඳීම්ට යොග්‍යවූ, රාගය උපදවන්නාවූ, දිව්‍යරූප දක්නා පිණිස දකුණු, පැදුම්, උතුරු, උඩ-යට-සරස යන දිශාවන්හි එක කොටසක් සම්බන්ධවම වඩන ලද්දවූ සමාධියක් වේද, එබඳු දිව්‍ය ශබ්ද අසනු පිණිස නොවඩන ලද්දවූ සමාධියක් වේද, ඒ මහණ තෙම -පෙ- උඩ යට සරසෙහි ප්‍රියවූ, කම් සැපට යොග්‍යවූ, රාගජනකවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිස නොව, ප්‍රියවූ, කම් සැපට යොග්‍යවූ රාගජනකවූ දිව්‍ය රූපයන් දක්නා පිණිසය යන එක කොටසක් සම්බන්ධව වඩන ලද සමාධියෙහි (හෙවත් එය පාදක කොටගෙණ) උඩ යට සරසෙහි යහපත් ස්වභාව ඇති කම් සැප විඳීමට යොග්‍ය රාගය උපදවන දිව්‍යරූපයන් දකී, එබඳු දිව්‍ය ශබ්ද නො අසයි. ඊට හේතුව කවරේද? මහාලිය, ඒ මහණහට ඇත්තේ උඩ යට සරසෙහි ප්‍රියවූ, කම්සැපට යොග්‍යවූ, රාගජනකවූ දිව්‍ය ශබ්ද අසනු පිණිස නොව උඩ, යට, සරස, යහපත්, මන වඩන, රාගජනක දිව්‍ය රූපයන් දක්නා පිණිසය යන එක කොටසක් සම්බන්ධව වඩනලද සමාධියකි. ඒ නිමිති කොට ගෙණ මේ කාරණය මෙසේම වේ.

8. "මහාලිය, මේ සාසනයෙහි යම් මහණෙකුට පෙරදික්හි එක් කොටසක් සම්බන්ධවම වඩන ලද්දවූ, ප්‍රිය ස්වභාව ඇති, කම් සැප විඳීමට යොග්‍යවූ, රාගය උපදවන්නා වූ දිව්‍ය ශබ්ද යන්ගේ ශ්‍රවණය පිණිස වඩන ලද්දවූ එහෙත් එබඳුවූ රූප දැකීමට නොවඩන ලද්දවූ සමාධියක් වේද, ඒ මහණ තෙම පෙරදික්හි මනාහි යහපත්වූ, කම් සැප විඳීමට යොග්‍ය වූ, රාගය උපදවන්නාවූ, දිව්‍ය රූපයන් දක්නා පිණිස නොව එබඳුවූ දිව්‍ය ශබ්දයන් අසනු පිණිසය යන එක කොටසක් පිළිබඳව වඩන ලද සමාධියෙහි (හෙවත් එය පාදක කොට ගෙණ) පෙරදික්හි, කැමතිවූ ස්වභාව ඇති, කාමාස්වාදයට යොග්‍යවූ, රාගජනකවූ දිව්‍ය ශබ්දයන් අසයි, එසේ නමුත් එබඳු ස්වරූප ඇති දිව්‍යරූප නොදකී. ඊට හේතුව කවරේදයත්? මහාලිය, ඒ මහණ මනාහි දිව්‍ය රූපයන් දක්නා පිණිස නොව දිව්‍ය ශබ්දයන් අසනු පිණිසය යන එක කොටසක් සම්බන්ධව වඩන ලද සමාධිය නිමිතිකොට ගැණීම නිසාය. මේ කාරණය මෙසේම වේ.

9. පුනචපරං මහාලි භික්ඛුනො දක්ඛිණාය දිසාය—පෙ[1]—පච්ඡිමාය දිසාය—පෙ—[1]උත්තරාය දිසාය—පෙ—[1]උද්ධමධො තිරියං එකංසභාවිතො සමාධි හොති දිබ්බානං සද්දානං සවනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං නො ච ඛො දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. සො උද්ධමධො තිරියං එකංසභාවිතෙ සමාධිම්හි දිබ්බානං සද්දානං සවනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං නො ච ඛො දිබ්බානං රූපානං දස්සනාය පිය-රූපානං කාමූපසංහිතානං රජනීයානං උද්ධමධො තිරියං දිබ්බානි සද්දානි සුණාති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි නො ච ඛො දිබ්බානි රූපානි පස්සති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි. තං කිස්ස හෙතු? එවං හෙතං[2] මහාලි හොති භික්ඛුනො උද්ධමධො තිරියං එකංසභාවිතෙ සමාධිම්හි දිබ්බානං සද්දානං සවනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං නො ච ඛො දිබ්බානං රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං.

10. ඉධ මහාලි භික්ඛුනො පුරත්ථිමාය දිසාය උභයංසභාවිතො සමාධි හොති දිබ්බානඤ්ච රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං දිබ්බානඤ්ච[3] සද්දානං සවනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. සො පුරත්ථිමාය දිසාය උභයංසභාවිතෙ සමාධිම්හි දිබ්බානඤ්ච[3] රූපානං දස්සනාය[4] පියරූපානං කාමූපසංහිතානං රජනීයානං දිබ්බානඤ්ච සද්දානං සවනාය[5] පියරූපානං කාමූපසංහිතානං රජනීයානං පුරත්ථිමාය දිසාය දිබ්බානි ච රූපානි පස්සති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි දිබ්බානි ච[3] සද්දානි සුණාති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි. තං කිස්ස හෙතු? එවං හෙතං මහාලි හොති භික්ඛුනො පුරත්ථිමාය දිසාය උභයංසභාවිතෙ සමාධිම්හි දිබ්බානඤ්ච[3] රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං දිබ්බානඤ්ච සද්දානං සවනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං.

---

1. —පෙ—ති නත්ථි B.
2. එවං හෙතු Pa.
3. ච ඉති නත්ථි P. W.
4. දස්සනාය—පෙ—පිය° S.
5. සවනාය—පෙ—පිය° S.

9. "මහාලිය, තවද කරුණක් ඇත්තේය. යම් මහණෙකුට යහපත් සවභාව ඇති, කම් සැප විඳීමට යොගය, ඇලුම් කට යුතුවූ සවභාව ඇති, දිව්‍ය ශබ්දයන් අසනු පිණිස දකුණු දික්හි- පැදුම් දික්හි- උතුරු දික්හි- උඩ යට සරස යන දිශාවන්හි එක් කොටසක් පිළිබඳව වඩන ලද්දවූ සමාධියක් වේද, ප්‍රියවූ, කාමාසවාදයට යොගයවූ, රාගජනකවූ දිව්‍ය රූපයන් දක්නා පිණිස නොවඩන ලද්දවූ සමාධියක් වේද හෙතෙම —පෙ— උඩ යට සරසෙහි යහපත් වූ, කාමාසවාදයට යොගය වූ, රාගජනකවූ දිව්‍ය රූපයන් දක්නා පිණිස නොව, යහපත්වූ, කාමාසවාදයට යොගයවූ, රාගජනකවූ, දිව්‍ය ශබ්දයන් අසනු පිණිසය යන එක් කොටසක් පිළිබඳව වඩන ලද සමාධියෙහි (හෙවත් එය පාදක කොට ගෙණ) යහපත්වූ කාමාසවාදයට යොගයවූ, රාග ජනකවූ දිව්‍ය ශබ්දයන්ම අසයි. එබඳුවූ දිව්‍යමය රූපයන් නොදකී. ඊට හේතු කවරේද යත්:

"මහාලිය, ඒ මහණ විසින් දකුණු,පැදුම්, උතුරු, උඩ යට සරස යන දිසාවන්හි යහපත්වූ, කාමාසවාදයට යොගයවූ, රාගජනකවූ දිව්‍යරූපයන් දක්නා පිණිස නොව යහපත්වූ, කාමාසවාදයට යොගයවූ, රාගජනකවූ දිව්‍ය ශබ්දයන් අසනු පිණිසම එක් කොටසක් පිළිබඳව සමාධිය වඩන ලද්දේය. එහෙයින් මෙය මෙසේම වේ.

10. "මහාලිය, මේ සාසනයෙහි යම් මහණෙක්හට පෙරදික්හි ප්‍රියවූ සවභාව ඇති, කම් සැප විඳීමට යොගයවූ, රාගය උපදවන්නාවූ, දිව්‍යරූපයන් දක්නා පිණිසද, ප්‍රියවූ, කාමාසවාදයට යොගයවූ, රාග ජනකවූ දිව්‍ය ශබ්දයන් අසනු පිණිසද යන දෙකොටස පිණිසම වඩන ලද සමාධියක් වේද, ඒ පැවිදිතෙමේ පෙරදික්හි යහපත් සවභාව ඇති, කාමාසවාදයට යොගයවූ, රාගජනකවූ දිව්‍යරූපයන් දක්නා පිණිසද, ඉෂ්ටවූ, කාමාසවාදයට යොගයවූ, රාගජනකවූ දිව්‍ය ශබ්දයන් අසනු පිණිසදැයි යන දෙකොටස පිණිස වඩන ලද්දවූ සමාධියෙහි හෙවත් එය පාදක කොට ගෙණ පෙරදික්හි යහපත්වූ, කාමාසවාදයට යොගයවූ, රාගජනකවූ දිව්‍ය රූපයන් දකී, එබඳුමවූ දිව්‍ය ශබ්දයන් අසයි. ඊට හෙතු කවරේදයත්: ඒ මහණහට පෙරදික්හි යහපත්වූ, කාමාසවාදයට යොගයවූ, රාගජනකවූ දිව්‍යරූපයන් දක්නා පිණිසද, එබඳුමවූ දිව්‍ය ශබ්දයන් අසන පිණිසදැයි යන දෙකරුණ ම පිණිස වඩන ලද සමාධිය ඇති හෙයිනි. මේ මෙසේම වේ.

11. පුනචපරං මහාලි භික්ඛුනො දක්ඛිණාය දිසාය—පෙ[1]—පච්ඡිමාය දිසාය—පෙ[1]—උත්තරාය දිසාය—පෙ[1]—උද්ධමධො තිරියං උභයංසභාවිතො සමාධි හොති දිබ්බානඤ්ච රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං දිබ්බානඤ්ච සද්දානං සවනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං. සො උද්ධමධොතිරියං උභයංසභාවිතෙ සමාධිම්හි දිබ්බානඤ්ච රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං දිබ්බානඤ්ච සද්දානං සවනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං උද්ධමධොතිරියං දිබ්බානි රූපානි පස්සති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි දිබ්බානි ච සද්දානි සුණාති පියරූපානි කාමූපසංහිතානි රජනීයානි. තං කිස්ස හෙතු? එවං හෙතං මහාලි හොති භික්ඛුනො උද්ධමධොතිරියං උභයංසභාවිතෙ සමාධිම්හි දිබ්බානඤ්ච රූපානං දස්සනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං දිබ්බානඤ්ච සද්දානං සවනාය පියරූපානං කාමූපසංහිතානං රජනීයානං.

අයං ඛො මහාලි හෙතු අයං පච්චයො යෙන සන්තානෙව සුනක්ඛත්තො ලිච්ඡවිපුත්තො දිබ්බානි සද්දානි නාස්සොසි පියරූපානි කාමූපසංහිතානි රජනීයානි නො අසන්තානීති[2].

12. එතාසං නූන භන්තෙ සමාධිභාවනානං සච්ඡිකිරියා හෙතු භික්ඛූ භගවති[3] බ්‍රහ්මචරියං චරන්තීති?

න ඛො මහාලි එතාසං සමාධිභාවනානං සච්ඡිකිරියාහෙතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්ති. අත්ථි ඛො මහාලි අඤ්ඤෙ ච[4] ධම්මා උත්තරිතරා ච පණීතතරා ච යෙසං සච්ඡිකිරියාහෙතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්තීති.

13. කතමෙ පන තෙ භන්තෙ ධම්මා උත්තරිතරා ච පණීතතරා ච යෙසං සච්ඡිකිරියාහෙතු භික්ඛූ භගවති බ්‍රහ්මචරියං චරන්තීති.[5]

---

1. —පෙ—ති නත්ථි B.
2. නොසන්තානීති B.
3. භගවති භික්ඛූ W.
4. ච P. W.; ච ඉති නත්ථි S.
5. චරන්ති P. W.

11. "මහාලිය, නැවතද පැවිද්දෙක්හට දකුණු දික්හි, පැළ දික්හි, උතුරු දික්හි, උඩ යට අනු දික්හි ප්‍රිය ස්වභාව ඇති, කම් සැප විඳීමට යොග්‍යවූ, රාගය උපදවන්නාවූ දිව්‍ය රූපයන් දක්නා පිණිසද එබඳුම වූ දිව්‍ය ශබ්දයන් අසනු පිණිස දූයි යන දෙකොටසම පිළිබඳව වඩන ලද්දවූ සමාධියක් වේද, ඒ සමාධියෙහි හෙවත් එය පාදක කොට ගෙණ හෙතෙම උඩ යට හා දිසා අනුදිසාවන්හි යහපත්වූ, කාමාස්වාදයට යොග්‍යවූ, ප්‍රිය ජනකවූ දිව්‍යරූපයන් දකී, එබඳුවූ දිව්‍ය ශබ්දයන්ද අසයි. ඊට කාරණා කිමයත්: මහාලිය, ඒ පැවිදිහට —පෙ— උඩ යට දිසා අනුදිසාවන්හි යහපත් ස්වභාව ඇති, කාමස්වාදයට යොග්‍යවූ, රාගය උපදවන්නාවූ දිව්‍යරූපයන් දක්නා පිණිසද, එබඳුමවූ දිව්‍ය ශබ්දයන් අසනු පිණිසදූ යි, යන දෙකොටසම පිණිස වඩන ලද සමාධිය ඇති හෙයිනි. ඒ නිමිතිකොට මෙය මෙසේම වේ.

"මහාලිය, යම් හෙයකින් සුනක්ඛත්ත ලිච්ඡවිපුත්‍ර තෙම නැත්තාවූ නොව ඇත්තාවූම, ප්‍රිය ස්වභාව ඇති, කාමාස්වාදයට යොග්‍යවූ, රාගය උපදවන්නාවූ දිව්‍ය ශබ්දයන් නෑසීද මේ ඊට හෙතුවයි. (දිව්‍යරූපයන් දැකීම පිණිස පමණක්වූ එක කොටසක් පිණිස වඩන ලද සමාධියයි.) මේ ඊට ප්‍රත්‍යයයි."

12. "ස්වාමීනි, මේ (දෙකරුණෙහිම පුරුදු කරණ ලද්දවූ) සමාධීන් අවබොධ කරගැණීම හෙතු කොට ගෙණ ම භික්‍ෂූහු භාග්‍යවතුන් කෙරෙහි (බ්‍රහ්මචර්‍ය්‍යාව) උතුම් හැසිරීම කෙරෙද්ද?" "මහාලිය, මේ සමාධීන් අවබොධ කරගැණීම හෙතුකොටගෙණම පැවිද්දෝ මා කෙරෙහි (මාගේ ශාසනයෙහි) උතුම් හැසිරීම (බ්‍රහ්මචර්‍ය්‍යාව) නොකෙරෙති. මහාලිය, යම් ධර්මකෙනෙකුන් අවබොධ කරගැණීම පිණිසම පැවිද්දෝ මා කෙරෙහි උතුම් හැසිරීම කෙරෙද්ද, එසේවූ (මීට වඩා) ඉතා උසස්වූද, ඉතා ප්‍රණීතවූද වෙනත් ධර්මයෝ ඇත්තාහුමය."

13. "ස්වාමීන් වහන්ස, යම් ධර්මකෙනෙකුන් අවබෝධ කර ගැණීම සඳහා භික්‍ෂූහු භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි උතුම් හැසිරීම කෙරෙද්ද, මීට වඩා අතිශයින් උසස්වූද අතිශයින් ප්‍රණීතවූද ඒ ධර්මයෝ කවරහුද?"

ඉධ මහාලි භික්ඛු තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො හොති අවිනිපාතධම්මො නියතො සම්බොධිපරායනො.[1] අයං පි ඛො මහාලි ධම්මො උත්තරිතරො ච පණීතතරො ච යස්ස සච්ඡිකිරියාහෙතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්ති.

පුනචපරං මහාලි භික්ඛු තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමී හොති සකිදෙව[2] ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරොති. අයම්පි ඛො මහාලි ධම්මො උත්තරිතරො ච පණීතතරො ච යස්ස සච්ඡිකිරියාහෙතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්ති.

පුනචපරං මහාලි භික්ඛු පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකො හොති තත්ථ-පරිනිබ්බායී අනාවත්තිධම්මො තස්මා ලොකා. අයම්පි ඛො මහාලි ධම්මො උත්තරිතරො ච පණීතතරො ච යස්ස සච්ඡිකිරියාහෙතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්ති.

පුනචපරං මහාලි භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. අයම්පි ඛො මහාලි ධම්මො උත්තරිතරො ච පණීතතරො ච යස්ස සච්ඡිකිරියාහෙතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්ති.

---

1. °යණො V. 2. සකිං දෙව B.

"මහාලිය, මේ සාසනයෙහි මහණතෙමේ (සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස යන) ත්‍රිවිධ සංයොජනයන් සියලු ආකාරයෙන් (සමුච්ඡේදප්‍රහාණයෙන්) දුරුකිරීමෙන් සොවාන් වේද, සතර අපායයන්හි නුපදනා සවභාව ඇත්තේ වේද, මාර්ගධර්ම නියමයෙන් නියතවූයේ වේද (මතු මාර්ගත්‍රය සංඛ්‍යාත සම්බොධිය නිසැකව ලැබෙනසේ පරම ගතිකොට ඇත්තේවේද), මහාලිය, යම් ධර්මයක් සාක්ෂාත් කිරීම පිණිස භික්ෂූහු මා කෙරෙහි උතුම් හැසිරීම කෙරෙද්ද, මේ ඒ (සෝවාන් බැව් සංඛ්‍යාතවූ) ධර්මයයි. ඒ (තෙල සමාධීන්ට වඩා) අතිශයින් උසස් වේ, අතිශයින් ප්‍රණීත ද වේ.

"මහාලිය, තවද අන් කරුණක් ඇත්තේය. මහණතෙම ත්‍රිවිධ සංයෝජනයන් ක්ෂයකිරීමෙන්, රාගද්වෙෂමොහයන්ගේ තුනීබැවින් සකෘදාගාමි වේද, එකවරක් පමණක් මේ (කාම) ලෝකයට උත්පත්තිවශයෙන් පැමිණ (සියලු සසර) දුක කෙළවර කෙරේද, මහාලිය, යම් ධර්මයක් අවබොධ කිරීම පිණිස භික්ෂූහු මා කෙරෙහි උතුම් හැසිරීම කෙරෙත් නම් මේ (සකෘදාගාමිභාව සඞ්ඛ්‍යාතවූ) ධර්මය එයයි. ඒ ධර්මය (තෙල සමාධීන්ට වඩා) අතිශයින් උසස්වේ, අතිශයින් ප්‍රණීත ද වේ.

"මහාලිය, තවද අන් කරුණක් ඇත. මහණතෙමේ (ඔරම්භාගියවූ) කාමභවය භජනයකරන්නාවූ පඤ්චවිධ බන්ධනයන් හාත්පසින් ක්ෂයකිරීමෙන් ඕපපාතිකවේද (බ්‍රහ්මයොනියක පමණක් උපදනා සවභාව ඇත්තේ වේද), එහිම (ශුද්ධාවාස බ්‍රහ්මලොකයේදීම) පිරිනිවන්පානා සවභාවය ඇත්තේවේද, (පිළිසිඳ ගැණීම් වශයෙන් ඒ බ්‍රහ්මලොකයෙන්) නැවත මෙහි නොඑන සවභාව ඇත්තේවේද, මහාලිය, යම් ධර්මයක් අවබොධ කිරීම පිණිස භික්ෂූහු මා කෙරෙහි උතුම් හැසිරීම කෙරෙත් නම්, මේ ද (අනාගාමිභාවසඞ්ඛ්‍යාතවූ) ඒ ධර්මයයි. ඒ වනාහි (තෙල සමාධීන්ට වඩා) අතිශයින් උසස්වේ, අතිශයින් ප්‍රණීත ද වේ.

"මහාලිය, තවද අන් කරුණක් ඇත. මහණතෙමේ ආශ්‍රවයන් සහමුලින් වනසාලීමෙන්, ආශ්‍රවරහිතවූ, සියලු කෙලෙස් බැඳුම්වලින් මිදුනාවූ, අර්හත්ඵල චිත්තයද් එසේවූ අර්හත්ඵලප්‍රඥාවද මෙම අත්බැව්හි තෙමේම විශිෂ්ට ඥාණයෙන් අවබොධකොට ලබාගෙණ වෙසේද, මහාලිය, යම් ධර්මයක් සාක්ෂාත් කිරීම පිණිස භික්ෂූහු මා කෙරෙහි උතුම් හැසිරීම කෙරෙත්නම්, මේ (අර්හත්ඵල විමුක්තිසංඛ්‍යාත ධර්මය)ද එයයි. ඒ වනාහි (තෙල සමාධීන්ට වඩා) අතිශයින් උසස්වේ, අතිශයින් ප්‍රණීත ද වේ.

ඉමෙ ඛො තෙ[9] මහාලි ධම්මා උත්තරිතරා ච පණීතතරා ච යෙසං සච්ඡිකිරියාහෙතු භික්ඛූ මයි බ්‍රහ්මචරියං චරන්තීති.

14. අත්ථි පන[1] භන්තෙ මග්ගො අත්ථි පටිපදා එතෙසං ධම්මානං සච්ඡිකිරියායාති?

අත්ථි ඛො මහාලි මග්ගො අත්ථි පටිපදා එතෙසං ධම්මානං සච්ඡිකිරියායාති.

කතමො පන භන්තෙ මග්ගො කතමා පටිපදා එතෙසං ධම්මානං සච්ඡිකිරියායාති?

අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො—සෙය්‍යථිදං[2] සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. අයං ඛො මහාලි මග්ගො අයං පටිපදා එතෙසං ධම්මානං සච්ඡිකිරියාය.

15. එකමිදාහං මහාලි සමයං කොසම්බියං විහරාමි ඝොසිතාරාමෙ. අථ ඛො ද්වෙ පබ්බජිතා මණ්ඩිස්සො[3] ච පරිබ්බාජකො ජාලියො ච දාරුපත්තිකන්තෙවාසී යෙනාහං තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා මම[4] සද්ධිං සම්මොදිංසු සම්මොදනීයං කථං සාරණීයං වීතිසාරෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො තෙ ද්වෙ පබ්බජිතා මං එතදවොචුං: කින්නු ඛො ආවුසො ගොතම[5] තං ජීවං තං සරීරං උදාහු අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති?

තෙන හාවුසො සුණාථ සාධුකං මනසිකරොථ භාසිස්සාමීති.[6]

[8]එවමාවුසොති ඛො තෙ ද්වෙ පබ්බජිතා මම පච්චස්සොසුං. අහං[7] එතදවොචං:[8]

---

1. අත්ථි නු ඛො භ° S.
2. සෙය්‍යථිදං B. V.
3. මණිස්සො S; මුණ්ඩිස්සො B.V.
4. මයා B, S. V.
5. භො ගොතම P.
6. භාසිස්සාමි S.
7. අථ ඛො වාහං P. W.
8. එවමාවුසො .... එතදවොචාති අයං ඡෙදො නත්ථි S.
9. තෙ ති නත්ථි P.

"මහාලිය, යම් ධර්මකෙනෙකුන් අවබෝධකිරීම පිණිස භික්ෂූහු මා කෙරෙහි උතුම්වූ හැසිරීම (බ්‍රහ්මචර්‍ය්‍යාව) කෙරෙද්ද, ඒ (තෙල සමාධීන්ට වඩා) අතිශයින් උසස්වූ ද, අතිශයින් ප්‍රණීතවූද ධර්මයෝ මොවුහුය."

14. "ස්වාමීනි, තෙල (සෝවාන් ඵලආදි) ධර්මයන් ප්‍රත්‍යක්‍ෂ කරගැණීමට මාර්‍ගයක් නම් ඇද්ද, පිළිපැදීමක් නම් ඇද්ද?"

"මහාලිය, තෙල (සෝවාන් ඵලආදි) ධර්මයන් ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස මාර්‍ගයක් ඇත්තේමය, පිළිපැදීමක් ඇත්තේමය".

"ස්වාමීනි, තෙල ධර්මයන් ප්‍රත්‍යක්‍ෂකිරීම පිණිසවූ ඒ මාර්‍ගය කවරේද, ඒ ප්‍රතිපත්තිය කවරිද?"

"මේ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්‍ගය මැයි. ඒ කවරේද? සම්‍යක්-දෘෂ්ටිය, සම්‍යක්සංකල්පනාව, සම්‍යක්වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක්ආජීවය, සම්‍යක්ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය, සම්‍යක්සමාධිය (යන අටයි). මහාලිය, ඒ (අතිශයින් උතුම්වූ අතිශයින් ප්‍රණීතවූ සෝවාන් ඵල ආදි) ධර්මයන් අවබෝධකරගැණීම පිණිස මෙයම මාර්‍ගය වේ, මෙයම පිළිපැදීම වේ.

15. "මහාලිය, මම එක්කාලයෙක්හි කොසඹෑනුවර සමීප-යෙහි (ඝෝසිත සිටුවිසින් කරවා පිළිගන්වන ලද) ඝෝසිතා-රාමයෙහි වාසයකෙළෙමි. ඉක්බිත්තෙන් මුණ්ඩිස්ස නම් පිරිවැජ් තෙමේද (ලීයෙන්කළ පාත්‍රයක් ගෙණ පිඬුසිඟායන්නාවූ පරිබ්‍රාජයෙකුගේ අතවැසියෙක් බැවින්) දාරුපත්තිකන්තෙ-වාසී යයි ප්‍රසිඬවූ ජාලිය නම්පිරිවැජ්තෙමේද මවෙත එළඹු-නාහ. එළඹ මා හා සමඟ සුවදුක් විචාරමින් සමව සතුටුවූහ. සතුටු වියයුතුවූ සිහිකටයුතුවූ සුවදුක් විචාරීම් ආදි කථාව කොට නිමවා එකත්පසෙක සිටියහ. එකත්පසෙක සිටියාවූ ඒ දෙපැවිද්දෝ, 'කිමෙක්ද ආයුෂ්මත් ගෞතමයෙනි, ජීවිතයත් හේ ම ද? ශරීරයත් හේ ම ද? නොහොත් ජිවිතය අනිකක් ද? ශරීරය අනිකක්දැ'යි යන මෙය මා විචාළහ.

"'ඇවැත්නි, එසේ නම් අසව්, යහපත් සේ මෙනෙහි කරව්. මම කියන්නෙමි'යි (ඔවුන්ට කීමි).

"'එසේය, ඇවැත්නි' යි ඒ දෙපැවිද්දෝ මට පිළිතුරු දුන්හ. මම මෙසේ කීවෙමි:

16. ඉධාවුසො තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි[1] සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා[2]. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං[3] කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති.

17. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ[4] පච්චාජාතො[5]. සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසංචික්ඛති: සම්බාධො ඝරාවාසො රජොපථො[6] අබ්භොකාසො පබ්බජ්ජා. නයිදං[7] සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සංඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති[8].

18. සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති[8]. සො[9] එවං පබ්බජිතො සමානො පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු[12] වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු කායකම්මවචීකම්මෙන[10] සමන්නාගතො කුසලෙන පරිසුද්ධාජීවො සීලසම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ[11] සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො සන්තුට්ඨො.

---

1. °සාරථි B. S.
2. භගවාති S.
3. සව්‍ය° P.
4. අඤ්ඤතරස්මිං වා පච්චා° W.
5. පච්ජා° S., පච්චා° Sa.
6. රජාපථො S. C. රජො° Sa. රජ° Pa.
7. න ඉදං C. P.
8. පබ්බජ්ජ° P. (සබ්බථ)
9. සො ඉති න දිස්සති P.
10. කායවචීක° Sa.
11. භොජනෙමත්තඤ්ඤු ඉති P. Sa. C. සු න දිස්සති.
12. අනු° W

16. “‘ඇවැත්නි, අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, (අෂ්ට) විද්‍යා (පසළොස්) චරණධර්මයන්ගෙන් යුක්තවූ, යහපත්ගති ඇත්තාවූ සියලු ලෝකයන් දන්නාසුලුවූ, ශ්‍රේෂ්ඨවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි රියැදුරෙකු වැනිවූ, දෙව්මිනිසුන්ට ශාස්තෘවූ, සිව්සස් දම් අවබොධ කළාවූ, භාග්‍යවත්වූ, තථාගත කෙනෙක් මෙලොව උපදනාහ. ඒ තථාගත තෙමේ දෙවියන් සහිතවූ, මාරයන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, මහණබමුණන් සහිතවූ, දෙව් මිනිසුන් (රජුන් හා මිනිසුන්) සහිතවූ, සත්ත්වවර්ගයා සවකීය විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කෙරේ. ඒ තථාගතයන් වහන්සේ මුල යහපත්වූ, මැද යහපත්වූ, කෙළවර යහපත්වූ අර්ථ සහිතවූ, (දශවිධ ව්‍යඤ්ජන නොපිරිහෙළා වදාරණ හෙයින්) බ්‍යඤ්ජන සහිතවූ, සියලු ලෙසින් සම්පූර්ණවූ, පිරිසිදුවූ, සකලශාසනමාර්ගී බ්‍රහ්මචර්‍ය්‍යාව ගෙන හැර දක්වති.

17. “‘ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපතිපුත්‍රයෙක් හෝ අන් කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක් හෝ අසයි. හෙතෙම ඒ දහම් අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කෙරෙයි. හෙතෙම ඒ ශ්‍රද්ධාලාභයෙන් යුක්ත වූයේ මෙසේ සලකන්නේය: ගෘහවාසය පීඩා සහිතයි. රාගාදි රජස් ගැවසි මාර්ගයෙකි. පැවිද්ද වනාහි අභ්‍යාකාසය මෙනි (කිසිවක් නොමැති අවකාශය මෙන් නිදහස්ය). ගිහි ගෙයි වසන්නහු විසින් සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, සියලු ආකාරයෙන් පිරිසිදුවූ, සංඛලිඛිතවූ[1] (ලියවූ සකක් වැනි) මෙම බඹසර හැසිරෙන්ට නොහැක්කේය. මම කෙස් දැළිරැවුලු හරවා, කසාවත් හැඳ, ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වන්නෙම්නම් ඒකාන්තයෙන් ඉතා මැනවැ(යි කියායි.)

18. “‘හෙතෙම පසු කාලයෙක සවල්පවූ හෝ බොහෝවූ භොග රාශිය හැර, සවල්පවූ හෝ බොහෝවූ නෑපිරිස් හැර, කෙස් දැළිරැවුලු හරවා, කසාවස්ත්‍රයන් හැඳ, ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වේ. මෙසේ පැවිදිවූ හෙතෙම පාතිමොක්ඛ සංවරයෙන් යුක්ත වූයේ, ආචාර ගොචර දෙකින් යුක්ත වූයේ, සවල්පවූත් අකුසල් විෂයෙහි භය දක්නාසුලු වූයේ, යහපත්වූ කාය වාක් කර්මයෙන් යුක්ත වූයේ, ශික්ෂාපද සමාදන්ව එහි මොනවට හික්මෙයි. පිරිසිදුවූ දිවි පැවැතුම් ඇත්තේ වෙයි. (ත්‍රිවිධ) ශීලයෙන් යුක්ත වූයේ වෙයි. ඉන්ද්‍රිය විෂයෙහි වැසූ දොරටු ඇත්තේ වෙයි. බොජුනෙහි පමණ දන්නේ වෙයි. මනා සිහියෙන් හා සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයි. (සිව්පසය පිළිබඳ යථාලාභ) සන්තොෂයෙන් යුක්ත වෙයි.

---

1. දීඝනිකායේ පළමුවෙනි කාණ්ඩයේ උපග්‍රන්ථයේ x වෙනි පිට බලනු.

19. කථඤ්ච ආවුසො භික්ඛු සීලසම්පන්නො හොති? ඉධ ආවුසො භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බ-පාණභූතහිතානුකම්පී විහරති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති. ඉදම්පිස්ස හොති සීලස්මිං. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී[1] විරතො මෙථුනා ගාමධම්මා. ඉදම්පිස්ස හොති සීලස්මිං.

මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති සච්චවාදී සච්චසන්ධො ථෙතො[2] පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. ඉදම්පිස්ස හොති සීලස්මිං. පිසුණං වාචං[3] පහාය පිසුණාය වාචාය පටිවිරතො හොති. ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය. අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා[4] සමග්ගාරාමො[5] සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති[9]. ඉදම්පිස්ස හොති සීලස්මිං.

ඵරුසං[6] වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා[7] හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා තථාරූපං[8] වාචං භාසිතා හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා හොති[9] කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං[10]. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. අනාචාරී B.
2. ඛෙතො S; ථෙතො Sa.
3. පිසුණාවාචං P. W
4. අනුප්පා° P.
5. සමග්ගරාමො B. Ca.
6. ඵරුසාවාචං P. W.
7. පෙමණියා B.
8. °රූපිං P.
9. හොතීති න දිස්සති. P.
10. °සඤ්හිතං B. V.

19. "'ඇවැත්නි, මහණ තෙමේ කෙසේ නම් සීලසම්පන්න වේද? ඇවැත්නි, මේ සස්නෙහිවූ මහණතෙමේ ප්‍රාණවධය හැර ඉන් වැළැක්කේ වේ. බහා තබන ලද දඬු ඇත්තේ, බහා තබන ලද අවි ඇත්තේ, පව් කිරීමෙහි ලජ්ජා ඇත්තේ, කරුණාවත් වූයේ, සියලු ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පීව වෙසේ. මෙසේ මේ (ප්‍රාණ වධයෙන් වෙන්වීමේ සීලය)ද ඒ මහණහුගේ එක් සීලයක් වේ.

"'(හෙතෙම) නොදුන් දෙය ගැනීමෙන් වෙන්ව, එයින් විශෙෂයෙන් වැළැක්කේ, දුන් දෙයම ගන්නේ, දුන් දෙයම කැමැති (බලාපොරොත්තු) වන්නේ, සොර නොවූ, පිරිසිදුවූ (ආත්මභාවයෙන්) සිතින් යුක්තව වාසය කෙරේ. මෙසේ ඒ (අදත්තාදානයෙන් වෙන්වීමේ සීලය) ද ඒ මහණහුගේ එක් සීලයෙකි. අබ්‍රහ්මචය‍ර්‍යාව හැර, බඹසර නොවන හැසිරීමෙන් දුරුවූ පැවතුම් ඇත්තේ, ස්ත්‍රීපුරුෂ සංසග්‍ය‍ නම්වූ ග්‍රාමධම්යෙන් වෙන් වූයේ බ්‍රහ්මචාරී වේ. මෙසේ ඒ (කාමාසවාද විරතිය පිළිබඳවූ සීලය) ද ඒ මහණහුගේ සීලයෙකි.

"'බොරු කීමෙන් දුරුව, ඉන් විශෙෂයෙන් වැළැක්කේ, සැබෑ තෙපුල්කියන්නේ, සැබැවින් සැබව ගළපන සුලුවූයේ, ස්ථිර කථා ඇත්තේ, ඇදහිය යුතු තෙපුල් ඇත්තේ, ලෝකයා අතර විරුද්ධ කථා ඇති නොකෙරේ. මෙසේ බොරු කීමෙන් වැළකීම ද ඒ මහණහුගේ සීලයෙකි. පිසුණු බස් හැර, ඉන් වෙසෙසින් වැළැක්කේ, මෙතැනින් අසා මොවුන් බිඳවීම පිණිස එතැන නොකියන සුලුවූයේ, එතැනින් අසා මොවුන් බිඳවීම පිණිස මෙතැන නොකියන සුලුවූයේ, මෙසේ හෙද වූවන් ගළපන්නේ, සමගිවූවන්ගේ සමගිය තහවුරු කිරීමට අනුබල දෙන්නේ, සමගියෙහි ඇලුම් බහුල කොට ඇත්තේ, සමගියෙහි ඇලුනේ, සමගිකම්හි සතුටුවන සුලුවූයේ, සමගිය ඇති කරණ තෙපුල් කියන්නේය. මේ ද ඒ මහණහුගේ සීලයෙකි.

"'පරුෂ වචනය හැර ඉන් වෙසෙසින් වැළැක්කේ, යම් වචනයක් නිදොස් වේද, කන්කලු ද, අර්ථ වශයෙන් ප්‍රෙමණීයද, මනාසේ සිතට වදනා හෙයින් සිත්කලු ද, පුරවාසීන්ගේ කථාමෙන් යහපත් ද, බොහෝ දෙනාට ප්‍රිය ද, බොහෝ දෙනාගේ මන වඩන්නේ ද, එබඳු තෙපුල්ම කියන්නේ වේ. මෙසේ ඒ රළු වචනයෙන් වෙන්වීම ද ඒ මහණහුගේ එක් සීලයෙකි. හිස්වූ ප්‍රලාප කථා හැර ඉන් වෙසෙසින් වැළැක්කේ, කාලයට සුදුසු කථා කරන්නේ, සිදුවූ (සැබෑවූ) තෙපුල්ම කියන්නේ, අර්ථයෙන් යුක්තවූ, (නවලොවුතුරු) දහම් ඇසුරු කළ, විනය ඇසුරු කළ තෙපුල් කියන්නේ, සුදුසු කල්හි, උපමා හා කරුණු සහිතවූ, (පරිච්ඡෙද) සීමා ඇති, අර්ථ හෙවත් අභිවෘද්ධියෙන් යුත්, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේ. මෙසේ ඒ (හිස් කථාවෙන් වැළැක්ම) ද ඒ මහණහුගේ එක් සීලයෙකි.

20. බීජගාමභූතගාමසමාරම්භා[1] පටිවිරතො හොති[2]. එකභත්තිකො හොති රත්තූපරතො[3] පටිවිරතො[4] විකාලභොජනා. නච්චගීතවාදිතවිසූකදස්සනා[5] පටිවිරතො හොති. මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතො හොති. උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ජාතරූපරජතපටිග්ගහණා[6] පටිවිරතො හොති. ආමකධඤ්ඤපටිග්ගහණා පටිවිරතො හොති. ආමකමංසපටිග්ගහණා[6] පටිවිරතො හොති. ඉත්ථිකුමාරිකපටිග්ගහණා[6] පටිවිරතො හොති. දාසිදාසපටිග්ගහණා[6] පටිවිරතො හොති. අජෙළකපටිග්ගහණා[6] පටිවිරතො හොති. කුක්කුටසූකරපටිග්ගහණා[6] පටිවිරතො හොති. හත්ථිගවාස්සවළවාපටිග්ගහණා[7] පටිවිරතො හොති. ඛෙත්තවත්ථුපටිග්ගහණා[6] පටිවිරතො හොති. දූතෙය්‍යපහිණගමනානුයොගා[8] පටිවිරතො හොති. කයවික්කයා පටිවිරතො හොති. තුලාකූටකංසකූටමාණකූටා[9] පටිවිරතො හොති. උක්කොටනවඤ්චනනිකතිසාචියොගා[10] පටිවිරතො හොති. ඡෙදනවධබන්ධනවිපරාමොසආලොපසහසාකාරා[11] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

21. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං බීජගාමභූතගාමසමාරම්භං[12] අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං[13] මූලබීජං ඛන්ධබීජං ඵළුබීජං[14] අග්ගබීජං බීජබීජමෙව[17] පඤ්චමං— ඉති[16] එවරූපා බීජගාමභූතගාමසමාරම්භා[15] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

22. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං සන්නිධිකාරපරිභොගං අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං අන්නසන්නිධිං[18] පානසන්නිධිං වත්ථසන්නිධිං යානසන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං— ඉති වා ඉති එවරූපා සන්නිධිකාරපරිභොගා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. °සමාරබ්භා B. V.
2. හොති—පෙ—එක° B. V.
3. රත්තූපරතො B.
4. විරතො° P. S. C.
5. °විසූක° B.
6. °ප්පටිග්ගහණා V. (සබ්බත්ථ)
7. °ගවස්ස° B.V. °වලව° V.W.වළුව° B.
8. °පහීණ° W.
9. °කූට° B.
10. සාචි B. V.
11. °සහස° B.
12. °සමාරබ්භං V.
13. සෙය්‍යථිදං B. V. (සබ්බත්ථ)
14. එල° S. ඵලු° C. P.
15. බීජබීජං එව B.S.V.
16. ඉති වා ඉති V. S.
17. °සමාරබ්භා V.
18. °න්නිධි S. (සබ්බත්ථ)

20. “ ‘තණ, ගස්, වැල්[1] සිඳීම් බිඳීම් ආදි විකොපනයෙන් වැළැක්කේ, එක් වේලේ වළඳන බොජුන් ඇත්තේ, රාත්‍රි-භොජනයෙන් හා විකල් බොජුනෙන් වැළැක්කේය. නැටීම්, ගී කීම්, බෙර ආදිය වැයීම්, විසුලූ දැකීම් යන මෙයින් වැළැක්කේය. මල්, ගඳ, විලවුන් පැළඳීම, ඉන් සැරසීම, උනුතැන් පිරවීමෙන් අලඞ්කාර කිරීම යන මෙයින් වැළැක්කේය. උස් අසුන් මහ අසුන් යන මෙයින් වැළැක්කේය. රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් වැළැක්කේය. අමුවූ ධාන්‍ය වර්ග පිළිගැන්මෙන් තොරවූයේ, අමුමස් පිළිගැන්මෙන් තොරවූයේ ද ස්ත්‍රීන් හා කුමරියන් පිළිගැන්මෙන් තොරවූයේද වේ. දැසිදසුන් පිළිගැන්මෙන් තොර වූයේ, එළුවන් හා තිරළුවන් පිළිගැන්මෙන් තොර වූයේ, කුකුළන්, හූරන්, ඇතුන්, ගවයන්, අසුන්, වෙළඹුන්, කෙත්, වත්, යන මේ පිළිගැන්මෙන්ද තොර වූයේය. ගිහීන්ගේ දූත මෙහෙවරය, ගෙන්ගෙට යන පහත් මෙහෙවරය යන මෙයින් වැළැක්කේය. ගනු දෙනු කිරීමය. තුලා ආදියෙන් වඤ්චා කිරීමය, රන් හා තොරන් මුසුකොට වඤ්චා කිරීමය, වී ආදිය මැනීමෙන් වඤ්චා කිරීමය, හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය, උපායෙන් අනුන් රැවටීමය, යකඩ ආදි ලොහ රන් රිදී යයි අඟවා වඤ්චා කිරීමය, නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයොගය යන මෙයින් වැළැක්කේය. කැපීමය, මැරීමය, බැඳීමය, සැඟවී සිට වස්තු පැහැර ගැන්ම (මංකොල්ල)ය, නියම්ගම් ආදිය පැහැරීමය, බලාත්කාර-කමින් වස්තු පැහැරගැන්මය යන මෙයින් ද වැළැක්කේය. මේ විරතිය ද ඒ මහණහුගේ එක් සීලයෙකි.

21. “ ‘ඇතම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් අනුභව කොට මූලබීජය, ඛන්ධබීජය, ඵළු (පුරුක්) බීජය, දලු (අග්‍ග) බීජය, පස්වැනිවූ බීජබීජය යන මේ බීජගාම භූතගාම සමාරම්භයෙහි යෙදී වෙසෙත්. මෙබඳු වූ බීජගාම භූතගාමයන් සිඳීම් බිඳීම් ආදියෙන් වැළැක්කේ වේ නම් මෙද ඒ මහණහුගේ එක් සීලයක් වේ.

22. “ ‘එසේම යම් ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැ-යෙන් දෙන ලද බොජුන් අනුභව කොට ආහාර වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයොජන ගැන්මය, පාන වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයොජන ගැන්මය, නොඉටන ලද සිවුරු ආදිය එසේ තැන්පත් කොට තැබීමය, යාන සංඛ්‍යාත වහන් තබා එසේ ප්‍රයොජන ගැන්මය, දෙකකින් වැඩි සයන ලැබ පසුවට තබා ප්‍රයොජන ගැන්මය, සුගන්ධයන් ලැබ එලෙස තබා ප්‍රයොජන ගැන්මය, තල සහල් ආදි ආමිසයන් තැන්පත් කොට තබා ප්‍රයොජන ගැන්ම යයි කියන ලද සන්නිධිකාරපරිභොගයෙහි යෙදී වෙසෙත්. මෙබඳුවූ සන්නිධිකාර පරිභොගයෙන් වැළකී වෙසේ නම් මෙද ඒ මහණහුගේ එක් සීලයක් වේ.

---

1. දීඝනිකායේ පළමුවන ඛාණ්ඩයේ උපග්‍රන්ථයේ x වෙනි පිට බලනු.

23. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං[1] අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීදං නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වෙතාලං[2] කුම්භථූනං[3] සොභනගරකං[4] චණ්ඩාලං වංසං ධොපනං[5] හත්ථියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං[6] උසභයුද්ධං අජයුද්ධං මෙණ්ඩයුද්ධං[7] කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං[8] නිබ්බුද්ධං උය්‍යොධිකං බලග්ගං සෙනාබ්‍යූහං අනීකදස්සනං[9] ඉති වා ඉති එවරූපා විසූකදස්සනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

24. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං ජූතප්පමාදට්ඨානානුයොගං[10] අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීදං[11] අට්ඨපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං[12] ඛලිකං ඝටිකං සලාකහත්ථං අක්ඛං පඞ්ගචීරං වඞ්කකං[13] මොක්ඛචිකං චිඞ්ගුලකං[14] පත්තාළ්හකං[15] රථකං ධනුකං අක්ඛරිකං මනෙසිකං[16] යථාවජ්ජං— ඉති වා ඉති එවරූපා ජූතප්පමාදට්ඨානානුයොගා[17] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. විසූක° B.
2. වෙතාළං B. S. V.
3. කුම්භථූණං B. S. °ථූණං P.
4. සොභනකරකං W. C.
   සොභනඝරකං V.
5. ධොවනං S.
6. මහිංස° B.
7. මෙණ්ඩක° B. P. W.
8. සිංහලපොත්ථකෙසු න දිස්සති
9. අනීක° P. V. W.
10. °ජූතපමාද° P.
11. සෙය්‍යථිදං B. V. (සබ්බත්ථ)
12. පන්ති° V.
13. වඞ්කං Va.
14. චිඞ්ගුලිකං B. V. ජිඞ්ගුලිකං S.
15. පත්තා° B. V.
16. මානෙ° S; මනෙ°Sa.
17. ජූතපමාද° P.

23. " 'එසේම යම් ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා, නැටීමය, ගී කීමය, බෙර ආදිය වැයීමය, රඟමඬුලු සැරසීමය, (රාමායනාදි) කථා ඇසීමය, කයිතාලම් හා අත්ලෙන් අත්ල ගැසීමය, මන්ත්‍ර පිරවීමෙන් මළමිනී නැංවීමය, සතරැස් හෝ කළබෙර ගැසීමය, ශෝභන (ප්‍රතිභාන) චිත්‍ර විචිත්‍රය,[1] සණ්ඩදෙවුන් කෙළිය, හුණගස් ඔසවා නැටීමය, මිනීඇට සෝදා තැබීමය, ඇතුන් හා යුද කිරීමය, අසුන් හා යුද කිරීමය, මීවුන් හා යුද කිරීමය, උසභයන් හා යුද කිරීමය, අජයුද්ධය, මෙණ්ඩක යුද්ධය, කුක්කුට යුද්ධය, වට්ටක යුද්ධය, දණ්ඩ යුද්ධය, තොරතුරු ඇසීමය, මල්ලව යුද්ධය, (සාමාන්‍ය) යුද්ධය, ඇත් අස් ආදීන් ගණන් කිරීමය, සෙනා සන්නිවෙසය, ඇත් අස් ආදීන් දැකීමය, යන විපරීත දර්ශනයෙහි යෙදී වෙසෙත්. මෙසේ මෙබඳුවූ විසුලූ දැක්මෙන් වැළකේ නම් මෙද ඒ මහණහුගේ එක් සීලයක් වේ.

24. " 'එසේම යම් ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා(දූ පෝරු ආදියෙහි කෙළීම්වූ) අට්ඨපද ක්‍රීඩාවය, දශපද ක්‍රීඩාවය, දූ පෝරු ආදියෙහි මෙන් ආකාශයෙහි ක්‍රීඩාකිරීමය, බිම මණ්ඩල වශයෙන් සාදා පැන පැන ක්‍රීඩා කිරීමය, දූ කැට නොසොල්වා නියෙන් ගසා ක්‍රීඩා කිරීමය, ජසඇටින් දාදු කෙළීමය, සිං කෙළීමය, භිත්ති ආදියෙහි ඉරටමිටි ගසා ඇත් අස් ආදි රූප දක්වා කෙළීමය, පන්දු කෙළීමය, පත් කුලල් පිඹීමය, ගම් දරුවන් මෙන් ක්‍රීඩා නගුල් ගෙන සීසෑම් ව්‍යාජයෙන් කෙළීමය, කරනම් ගැසීමය, තල්පත් ආදියෙන් කත්තන්ගුරුවා තනා ක්‍රීඩා කිරීමය, කොළ නැළියෙන් වැලි ආදිය මැණ කෙළීමය, කුඩා රථයෙන් කෙළීමය, කුඩා දුන්නෙන් කෙළීමය, අහසෙහි හෝ පිටෙහි හෝ අකුරු ඇඳ කෙළීමය, සිතූ දේ කියවීම් කීම් ආදියෙන් කෙළීමය, (ගොළු බිහිරි ආදීන්ගේ) ඒ ඒ දෝෂ රූප දක්වා කෙළීමය, යන මෙබඳුවූ ප්‍රමාදයට කාරණාවූ දූ කෙළීමෙහි යෙදී වාසය කෙරෙත්. මෙසේ මෙ බඳුවූ දූ කෙළියෙන් වැළැක්කේ නම් මෙද ඒ මහණහුගේ එක් සීලයෙකි.

---

1. දිඝනිකායේ පළමුවන කාණ්ඩයේ 15 වෙනි පිටේ අධොලිපිය බලනු.

25. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං උච්චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීදං ආසන්දිං පල්ලඞ්කං ගොනකං[1] චිත්තකං පටිකං පටලිකං තූලිකං[2] විකතිකං උද්දලොමිං එකන්තලොමිං කට්ටිස්සං[3] කොසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං[4] අස්සත්ථරං[4] රථත්ථරං[4] අජිනප්පවෙණිං කාදලිමිගපවරපච්චත්ථරණං[5] සඋත්තරච්ඡදං උභතොලොහිතකූපධානං— ඉති වා ඉති එවරූපා උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

26. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං මණ්ඩනවිභූසනට්ඨානානුයොගං[6] අනුයුත්තා විහරන්ති-සෙය්‍යථීදං[7] උච්ඡාදනං පරිමද්දනං නහාපනං[8] සම්බාහනං ආදාසං අඤ්ජනං මාලා විලෙපනං[9] මුඛචුණ්ණකං[10] මුඛාලෙපනං[11] හත්ථබන්ධං[12] සිඛාබන්ධං දණ්ඩකං[13] නාළිකං[14] ඛග්ගං[15] ඡත්තං චිත්‍රූපාහනං උණ්හීසං මණිං වාලවීජනිං[16] ඔදාතානි වත්ථානි දීඝදසානි— ඉති වා ඉති එවරූපා මණ්ඩනවිභූසනට්ඨානානුයොගා[6] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

27. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං තිරච්ඡානකථං අනුයුත්තා විහරන්ති—සෙය්‍යථීදං[7] රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං පුරිසකථං [කුමාරකථං කුමාරිකථං][17] සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානකථාය පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ගොණ° S. C.
2. තූලි° B.
3. කට්ටි° B. V. කච° S.
4. °ත්ථරණං B. V.
5. කදලි° B.P.V. කාදල° W.
6. °විභූ° P. °විභූසණ° W.
7. සෙය්‍යථිදං B. V.
8. න්හාපනං B. V.
9. මාලාගන්ධවි° S. B.
10. මුඛචුණ්ණං S. B. V.
11. මුඛලෙපනං B. V.; °විලෙපං S. මුඛාලෙපං Sa.
12. °බද්ධං W.
13. දණ්ඩං B. S. V.
14. නාළිකං W.; නාලකං V.
15. අසිං V; අසිං ඛග්ගං S.
16. වාල° P. W.
17. ඉදං මරම්මපොත්ථකෙසු යෙව දිස්සති

25. "'එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, දික්හගලා ප්‍රවුය, පලස්ය, සතරඟුලෙන් දිග ලොම් ඇති ඇතිරිය, විසිතුරු එළු ලොම් ඇති ඇතිරිය, එළු ලොම්මුවා සුදු ඇතිරිය, එළු ලොම්මුවා ඝනපුප් ඇතිරිය, සිංහාදි රූපයෙන් විසිතුරු එළු ලොම් ඇතිරිය, එක් පිට ලොම් ඇති එළු ලොම් ඇතිරිය, දෙපිට ලොම් ඇති එළු ලොම් ඇතිරිය, රත්කසු කම් කොට කැටි තිහිරි හුයින් කළ පසතුරුණුය, එක්විට නිළියන් සොළොස්දෙනා කෙළනා එළු ලොම් මුවා මහ ඇතිරිය, ඇතුන් පිට අතුරණ ඇතිරිය, අසුන් පිට අතුරණ ඇතිරිය, රථ පිට අතුරණ ඇතිරිය, අඳුන් දිවිසමින් කළ පසතුරුණුය, කෙසෙල් මුව සමින් කළ උතුම් පසතුරුණුය, දෙපස තබන ලද රත්කන්වයින් ඇති ආසනය, යන මෙබඳු උස් අසුන් මහ අසුන් පරිභොග කෙරෙත්. මෙසේ මෙබඳු වූ උසසුන් මහ අසුන්හි හිඳීම් ආදියෙන් වැළැක්කේ නම් මෙද ඒ මහණහුගේ එක් සීලයෙකි.[1]

26. "'එසේම යම් ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා ඇඟ සුවඳ ඉලීමය, පිරිමැදීමය, නෑවීමය, මැඩීමය, කැඩපත් පරිහරණය, අඳුන් තෙල් පරිහරණය, මල් හා විලවුන්, මූවසුණු, මුඛාලෙප, හස්තාභරණ යන මේ දේ දැරීම හා පැළඳීමය, රන් හු ආදියෙන් සිබා (කුඩුම්බි) බැඳීමය, විසිතුරු දඬු ගෙන හැසිරීමය, බෙහෙත් නල දසරු වෙහි එල්වාගෙන ඇවිදීමය, කඩු උරෙහි එල්වා ගෙන ඇවිදීමය, ඡත්‍රධාරීව ඇවිදීමය, විසිතුරු වහන් පයලා ඇවිදීමය, නළල් පට බැඳීමය, සිබා මාණික්‍ය පැළඳීමය, වල්විදුනා දැරීමය, දික්වූ දහවලු ඇති සුදුවත් ඇඳීමය යි මෙසේ වූ සැරසීම් හා උණුතැන් පිරවීමෙහි නිතර නිතර යෙදෙත්. මෙබඳු වූ සැරසීම්, අලඞ්කාර කිරීම් ආදියෙහි යෙදීමෙන් වැළැක්කේ නම් මෙද ඒ මහණහුගේ එක් සීලයකි.

27. "'එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ—මහ ඇමතියන් පිළිබඳ—සෙනා පිළිබඳ—භය පිළිබඳ—යුද්ද පිළිබඳ—ආහාර පිළිබඳ—පාන වර්ග පිළිබඳ—වස්ත්‍ර පිළිබඳ—සයන පිළිබඳ—මාලා—ගන්ධ ද්‍රව්‍යයන්—නෑයන්—යානාවන්—ගම්—නියම්ගම්-නුවර-දනව්—ස්ත්‍රීන්—පුරුෂයන්—[කුමරකුමරියන්]—යොධයන්—වීථි—ඝටවෙටිකාවන් හෝ තිත්ථයන්—මළ නෑයන් යන ආදීන් පිළිබඳ කථාය, නොයෙක් ආකාරවූ ව්‍යර්ථ කථාය, ලොකාඛ්‍යායික (විතණ්ඩ) කථාය, මුහුද පිළිබඳ කථාය, භවාභව කථාය යන මෙබඳු තිරිසන් කථාවෙහි යෙදී වෙසෙත්. මෙබඳු වූ තිරච්ඡාන කථාවෙන් වැළැක්කේ නම් මෙද ඒ මහණහුගේ එක් සීලයෙකි.

---

1. මෙහි ඇතුළත් දෙ ගැණ ඇතැම් තොරතුරු දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ බ්‍රහ්මජාල සූත්‍රයෙන් බලා දත යුතුයි.

28. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විග්ගාහිකකථං අනුයුත්තා විහරන්ති— සෙය්‍යථීදං[1] න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි, අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡාපටිපන්නො ත්වමසි අහමස්මි සම්මාපටිපන්නො. සහිතං මෙ අසහිතං තෙ. පුරෙ වචනීයං පච්ඡා අවච පච්ඡාවචනීයං පුරෙ අවච. අවිචිණ්ණං[2] තෙ විපරාවත්තං ආරොපිතො තෙ වාදො නිග්ගහිතොසි[3] චර වාදප්පමොක්ඛාය නිබ්බෙඨෙහි වා සචෙ පහොසීති—ඉති වා ඉති එවරූපාය විග්ගාහිකකථාය පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

29. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං දූතෙය්‍යපහිණගමනානුයොගමනුයුත්තා විහරන්ති— සෙය්‍යථීදං[1] රඤ්ඤං රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං කුමාරානං: ඉධ ගච්ඡ අමුත්‍රාගච්ඡ ඉදං හර අමුත්‍ර ඉදං ආහාරාති— ඉති වා ඉති එවරූපා දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

30. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ කුහකා ච හොන්ති ලපකා ච නෙමිත්තිකා[4] ච නිප්පෙසිකා ච ලාභෙන[5] ලාභං නිජ්ජිගිංසිතාරො[6] ච[7]— ඉති[8] වා ඉති එවරූපා කුහනලපනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. සෙය්‍යථිදං B. V.
2. ආවිණ්ණං W. C.
3. නිග්ගහීතො ත්වමසි B V. නිග්ගහීතොසි P.W.
4. නිමිත්තකා Sa.
5. ලාභෙන ච ලාභං S.
6. නිජිගිසිතාරො B.
7. ච ඉති න දිස්සති P.S.W.
8. ඉතිඑවං P. W.

28. “ ‘එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා, ‘ඔබ මේ ධම්විනය නොදන්නෙහිය, මම මේ ධම්විනය දනිමි.’ ‘ඔබ මේ ධම්විනය කුමකැයි දන්නෙහි ද? ඔබ වරදවා පිළිපන්නෙහිය, මම මනාකොට පිළිපන්නේ වෙමි.’ ‘මාගේ වදන් සිලිටුය හෝ අර්ථ සහිතය, ඔබගේ වචනය එසේ නොවෙයි.’ ‘පළමු කියයුත්ත පසුව කියෙහිය, පසුව කියයුත්ත පළමුව කියෙහිය. යමක් ඔබ බොහෝ කල් පුරුදු කරණ ලද නම් ඒ සියල්ල ව්‍යර්ථ විය. ඔබට වාදාරෝපනය කරණ ලදී. නිග්‍රහ කරණ ලද්දෙහිය (වාදයෙන් පැරදුනෙහිය). වාදයෙන් මිදෙනු පිණිස ක්‍රියා කරව. ඉදින් හැක්කෙහි නම් වාදයෙන් ගැලවෙව හෙවත් ඒ නිවේධනය කරව’ යන ආදි විග්‍රාහික හෙවත් දෝෂාරෝපණ කථාවෙහි යෙදී වෙසෙත්. මෙසේ මෙබඳු විග්‍රාහික කථාවෙන් වැළැක්කේ නම් මෙද ඒ මහණහුගේ එක් සීලයෙකි.

29. “ ‘එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා, රජුන්ගේ, රජමහඇමතියන්ගේ, ක්ෂත්‍රියන්ගේ, බමුණන්ගේ, ගැහැවියන්ගේ සහ කුමරුන්ගේ ද හසුන් ගෙණ, ‘මෙතනින් අසවල් තැනට යා, අසවල් තැනින් මෙහි එව, මෙය ගෙණ යා, එතැනින් අසවල් දෙය ගෙණෙව’යි (අණවන ලදුව) දූතභාවයෙහි හා හසුන් ගෙණ යෑමෙහි යෙදී වෙසෙත්. මෙබඳු දූත භාවය, හසුන් ගෙණයෑම යන මෙයින් වැළැක්කේ නම් මෙද ඒ මහණහුගේ එක් සීලයෙකි.

30. “ ‘එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා, කුහකයෝ ද, සිව්පසය උදෙසා කථා කරන්නෝ ද, නිමිතිකරන්නෝ නොහොත් ලාභ සත්කාර සඳහන් කරවන්නෝ ද, පරලාභාදිය උදෙසා කියන්නෝ ද,[1] ලාභයකින් ලාභයක් සොයන්නෝ ද වෙත්. මෙබඳු වූ කුහනලපනාදියෙන් වැළැක්කේ වේ නම් මෙද ඒ මහණහුගේ එක් සීලයෙකි.

---

1. දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ 21 වෙනි පිටුවේ 1 වෙනි අඩොලිපිය බලනු.

31. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති සෙය්‍යථීදං[2] අඞ්ගං නිමිත්තං උප්පාදං[3] සුපිණං[4] ලක්ඛණං මූසිකච්ඡින්නං අග්ගිහොමං දබ්බිහොමං ථුසහොමං කණහොමං තණ්ඩුලහොමං සප්පිහොමං තෙලහොමං මුඛහොමං ලොහිතහොමං අඞ්ගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා[5] සිවවිජ්ජා භූතවිජ්ජා භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා විච්ඡිකවිජ්ජා මූසිකාවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං[6] සරපරිත්තානං මිගචක්කං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

32. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති සෙය්‍යථීදං[2] මණිලක්ඛණං දණ්ඩලක්ඛණං[7] වත්ථලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං[8] ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරිලක්ඛණං දාසලක්ඛණං දාසිලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං[11] උසභලක්ඛණං ගොලක්ඛණං[10] අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං[19] කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං ගොධාලක්ඛණං කණ්ණිකාලක්ඛණං[12] කච්ඡපලක්ඛණං මිගලක්ඛණං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා[13] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ජීවිතං B. V.
2. සෙය්‍යථිදං B. V.
3. උප්පාතං B. °පාටං S.
4. සුපිනං B. P. සුපිණකං C.
5. ඛෙත්ත° B. S. V.
6. පක්ඛ° W. C.
7. සත්ථලක්ඛණං B. V.
8. ආයුධ° B. W.
9. මහිංස° B.
10. ගොණ° B.
11. මෙණ්ඩක° V.
12. කණ්ණිකා° B. S.
13. මිච්ඡාජීවා ඉති න දිස්සති P.

31. "'එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, අඞ්ග (සමුද්‍රිකා) ශාස්ත්‍රය, නිමිති ශාස්ත්‍රය, (අසනිපාතාදි මහ නිමිති බලා කියන) උත්පාද ශාස්ත්‍රය, ස්වප්න ශාස්ත්‍රය, ලක්‍ෂණ ශාස්ත්‍රය, (මීයන් කැපූ වස්ත්‍රාදිය බලා කියන) මූසික ශාස්ත්‍රය, අග්නිහෝමය, දබ්බිහෝමය, ථුස හෝමය, තණ්ඩුල—කණ—සප්පි—තෙල—මුඛ—ලෝහිත හෝමය, අඞ්ග විද්‍යා, වාස්තු විද්‍යා, නීති ශාස්ත්‍රය, සොහොණෙහි ශාන්ති කරන්නාවූ හෝ සිවල් රුත විද්‍යා, භූත විද්‍යා, අහි විද්‍යා, විෂ විද්‍යා, විච්ඡික විද්‍යා, මූසික විද්‍යා, සකුණ විද්‍යා, වායස විද්‍යා, ජීවන කාලය කීම වූ පක්ඛජ්ඣානය, ශරපරිත්‍රාණය (ආයුධ වැළැක්ම), තිරිසන් සතුන්ගේ ශබ්ද දැනීම වශයෙන් පැවති මන්ත්‍රය යන තිරශ්චීන විද්‍යා[1] හේතුකොට ගෙන මිථ්‍යාජීවයෙන් ජීවිකා කෙරෙත්. මෙසේ මෙබඳු තිරශ්චීන විද්‍යා හෙතුවෙන් කරණ ලාමක ජීවිකාවෙන් වැළැක්කේ වේද මෙද ඒ මහණහුගේ එක් සීලයකි.

32. "'එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, මිණි ලක්‍ෂණය, වස්ත්‍ර ලක්‍ෂණය, දණ්ඩ—බඩන—ද්‍රුනු—ආයුධ—ඉත්ථි—පුරිස—කුමාර—කුමාරි—දාස—දාසි—හත්ථි—අස්ස—මහිස—උසභ—ගො—අජ—මෙණ්ඩක—කුක්කුට—වට්ටක—ගොධා—කර්ණිකා—කච්ඡප—මිග ලක්‍ෂණය යන මෙබඳු තිරශ්චීන විද්‍යාවන්[1] කරණකොට ගෙණ වැරදි ජීවිකාව කෙරෙත්. මෙසේ වූ තිරශ්චීන විද්‍යාවන් නිසා කරණ වැරදි ජීවිකාවෙන් වැළැක්කේ නම් මෙද ඒ මහණහුගේ එක් සීලයෙකි.

1. දීඝනිකායේ පළමුවෙනි කාණ්ඩයේ 21 වෙනි පිට බලනු.

33. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති සෙය්‍යථීදං[2] රඤ්ඤං නිය්‍යානං භවිස්සති රඤ්ඤං අනිය්‍යානං භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං ජයො භවිස්සති බාහිරානං රඤ්ඤං[3] පරාජයො භවිස්සති. බාහිරානං රඤ්ඤං ජයො භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං පරාජයො භවිස්සති. ඉති ඉමස්ස ජයො භවිස්සති ඉමස්ස පරාජයො භවිස්සති— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

34. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති— සෙයථීදං[2] චන්දග්ගාහො භවිස්සති සුරියග්ගාහො[4] භවිස්සති නක්ඛත්තග්ගාහො භවිස්සති. චන්දිමසුරියානං[4] පථගමනං භවිස්සති චන්දිමසුරියානං[4] උප්පථගමනං භවිස්සති. නක්ඛත්තානං පථගමනං භවිස්සති නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති. උක්කාපාතො භවිස්සති. දිසාඩාහො[5] භවිස්සති. භූමිචාලො භවිස්සති. දෙවදුන්දුභි[6] භවිස්සති. චන්දිමසුරියනක්ඛත්තානං[4] උග්ගමනං ඔගමනං[7] සංකිලෙසං වොදානං භවිස්සති. එවංවිපාකො චන්දග්ගාහො භවිස්සති. එවංවිපාකො සුරියග්ගාහො[4] භවිස්සති. එවංවිපාකො නක්ඛත්තග්ගාහො භවිස්සති. එවංවිපාකං[8] චන්දිමසුරියානං[4] පථගමනං භවිස්සති. එවංවිපාකං[8] චන්දිමසුරියානං[4] උප්පථගමනං භවිස්සති. එවංවිපාකං[8] නක්ඛත්තානං පථගමනං භවිස්සති. එවංවිපාකං[8] නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති. එවංවිපාකො උක්කාපාතො භවිස්සති. එවංවිපාකො දිසාඩාහො[5] භවිස්සති. එවංවිපාකො භූමිචාලො භවිස්සති. එවංවිපාකො දෙවදුන්දුභි[6] භවිස්සති. එවංවිපාකං චන්දිමසුරියනක්ඛත්තානං[4] උග්ගමනං ඔගමනං[7] සඞ්කිලෙසං වොදානං භවිස්සති—ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ජීවිතං B. V.
2. සෙය්‍යථිද° B. V.
3. රඤ්ඤං ඉති න දිස්සති B. V.
4. °සූරි° B.
5. °දාහො W.
6. °ද්‍රුභි B. V.
7. ඔග්ගමනං B. S. V.
8. °විපාකො P.

33. " 'එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන්වලඳා අසවල් දින රජුන්ගේ බැහැර යෑම වන්නේය, අසවල් දින රජුන්ගේ ඇතුළු නුවරට යෑම වන්නේය. අසවල් දින ඇතුළුනුවර රජුන්ගේ ආක්‍රමණය වන්නේය. බැහැරරජුන්ගේ බැහැරට යෑම වන්නේය. බැහැරරජුන්ගේ ඇතුළු නුවරට ඒම වන්නේය. ඇතුළුනුවර රජුන්ගේ ආපසු යෑම වන්නේය. ඇතුළුනුවර රජුන්ට ජය වන්නේය. බැහැර රජුන්ගේ පරාජය වන්නේය. බැහැරරජුන්ගේ ජය වන්නේය. ඇතුළුනුවර රජුන්ගේ පරාජය වන්නේය. මෙසේ මොහුට ජය වන්නේය, මෙසේ පරාජය වන්නේ යයි කියා මෙසේ තිරශ්චීනවිද්‍යා හෙතුකොට ලාමක ජීවිකා කෙරෙත්. මෙබඳු වූ තිරච්ඡාන විජ්ජා හෙතුවෙන් කරණ මිච්ඡාජීවයෙන් වැළැක්කේ නම් මෙද ඒ මහණහුගේ එක් සීලයෙක් වේ.

34. " 'එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වලඳා: චන්‍ද්‍රග්‍රහණය වන්නේය, සූය්‍ය්‍ර්‍යග්‍රහණය—තාරකා සමාගමය—සඳහිරු දෙදෙනාගේ නියම මාර්‍ගගමන—සඳහිරු දෙදෙනාගේ අමාර්‍ගගමන—තාරකාවන්ගේ මාර්‍ගගමන—තාරකාවන්ගේ අමාර්‍ගගමන වන්නේය, උල්කාපාතය වන්නේය, දිසා දැවීම—පොළොව කම්පාව—අහස ගිගුරුම—සඳ, හිරු, තාරකා යන මොවුන්ගේ නැගීම හා අස්තයට යෑම ද කෙලෙසීම ද පිරිසිදු වීම ද වන්නේය. චන්‍ද්‍රග්‍රහණය මෙබඳු විපාක ඇතිවන්නේය, සූය්‍ර්‍යග්‍රහණය—තාරකා සමාගමය— චන්‍ද්‍රසූය්‍ර්‍යයන්ගේ මාර්‍ගයෙහි ගමන— ඔවුන්ගේ නොමග ගමන— තාරකාවන්ගේ මාර්‍ගයෙහි ගමන— තාරකාවන්ගේ නොමග ගමන — උල්කාපාතය — දිගුන් දැවීම — භූමි චලනය — අහස් ගිගුරුම — සඳ, හිරු, තාරකාවන්ගේ නැගීම, බැසීම, කිලිටිවීම හා පිරිසිදුවීම මෙබඳු විපාක ඇති වන්නේ යයි කියා මෙසේ තිරච්ඡානවිජ්ජා හෙතුවෙන් කරණ මිථ්‍යාජීවිකාවෙන් ජීවිකා කෙරෙත්. මෙසේ වූ තිරශ්චීනවිද්‍යා හෙතුකොටගෙණ කරණ ලාමක ජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඒ මහණහුගේ එක් සීලයෙකි.

35. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති— සෙය්‍යථීදං[2] සුබ්බුට්ඨිකා[3] භවිස්සති දුබ්බුට්ඨිකා[4] භවිස්සති. සුභික්ඛං භවිස්සති දුබ්භික්ඛං භවිස්සති ඛෙමං භවිස්සති භයං භවිස්සති. රොගො භවිස්සති ආරොග්‍යං භවිස්සති. මුද්දා ගණනා[5] සංඛානං කාවෙය්‍යං ලොකායතං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

36. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති— සෙය්‍යථීදං[2]: ආවාහනං[6] විවාහනං[6] සංවදනං[7] විවදනං[7] සංකිරණං විකිරණං සුභගකරණං[8] දුබ්භගකරණං[9] විරුද්ධගබ්භකරණං ජිව්හානිබන්ධනං[10] හනුසංහනනං හත්ථාභිජප්පනං හනුජප්පනං[24] කණ්ණජප්පනං ආදාසපඤ්හං කමාරිපඤ්හං[11] දෙවපඤ්හං ආදිච්චුපට්ඨානං මහතුපට්ඨානං අබ්භුජ්ජලනං සිරිව්හායනං[12] —ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

37. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති— සෙය්‍යථීදං[2]: සන්තිකම්මං පණිධිකම්මං භූතකම්මං[13] භූරිකම්මං[13] වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකිරණං[14] ආචමනං නහාපනං[15] ජුහනං[16] වමනං විරෙචනං උද්ධවිරෙචනං[17] අධොවිරෙචනං සීසවිරෙචනං කණ්ණතෙලං නෙත්තතප්පණං[18] නත්ථුකම්මං අඤ්ජනං පච්චඤ්ජනං[19] සාලාකියං සල්ලකත්තියං[20] දාරකතිකිච්ඡා[21] මූලභෙසජ්ජානං අනුප්පදානං[22] ඔසධීනං පටිමොක්ඛො[23] ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ජීවිතං B. V.
2. සෙය්‍යථිද° B.V.
3. සුවු° V.; සුවුට්ඨිකං B.
4. දුබ්බුට්ඨිකං B.
5. ගණනං B.
6. °හණං C.
7. °රණං B. V.; °රතං S.
8. සුභාගක° B.
9. දුබ්භාග°B.
10. °නිබන්ධනං B. V. S.
11. කුමාරික° V. C.
12. සිරව්හායනං P. W.
13. භූරි° භූතිකම්මං P.
14. වත්ථුබලිකම්මං V, °වත්ථුපරිකම්මං B.
15. න්හාපනං B. V.
16. ජුහනං Sa. ජුවණං C.
17. උද්ධංවි° B. V.
18. නෙත්තපානං B; නෙත්තප්පානං S.; නෙත්තතප්පනං Sa. C.
19. පච්ච° V.
20. °තිකං B. P. V. W.
21. °තිකිච්ඡං S.
22. අනුප්පදනං B. S.
23. පති° B. V.
24. හනුජප්පනං ඉති න දිස්සති P.S.W.

35. “ ‘එසේම ඇතැම් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා: මනා වැසි ඇතිවන්නේය, නපුරු වැසි—යහපත් භික්ෂා—දුර්භික්ෂා—තිභීය—භය—රොග—නීරෝගීබව ඇතිවන්නේයයි කීමද, ඇඟිල්ල ඇල්ලීමය, ගිණීමය, පුඩුගණනය, කාව්‍ය කිරීමය, විතණ්ඩ ශාස්ත්‍ර ඉගෙණීම' යයි මෙසේ තිරශ්චීන විද්‍යාවන් කරණකොට මිථ්‍යා ජීවිකා කෙරෙත්. මෙසේවූ තිරශ්චීන විද්‍යා හෙතුවෙන් වන මිථ්‍යා ජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඒ මහණහුගේ එක් සීලයෙකි.

36. “ ‘එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා, ආවාහ කරවීමය, විවාහ කරවීමය, සමගිය පිළිබඳ කථා කිරීමය, වියොගය පිළිබඳ කථා කිරීමය, ධන රැස්කිරීමය, වියදම් කිරීමය, සුභග කරණය (යහපත් ශ්‍රී කිරීමය), දුර්භගකරණය, ගර්භවිශරාධි කරණය, දිව තද කිරීමය, හනු බැඳීමය, අත් පෙරළීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, ශබ්ද නොඇසීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, කැඩපත්හි දෙවතාරොපණය කොට පැණ පිළිවිසීමය, කුමරියගේ සිරුරෙහි දෙවතාරොපණය කොට පැණ පිළිවිසීමය, දෙවදාසියගේ සිරුරෙහි යකුන් අරොපණය කොට පැණ පිළිවිසීමය, හිරු වැඳීමය, මහබඹුට උවටැන් හෝ නැමදුම් කිරීමය, මුවින් ගිනි දැල් පිට කිරීමය, ශ්‍රී දෙවිය කැඳවීම යයි කියන මෙබඳු තිරශ්චීන විද්‍යාවෙන් මිථ්‍යාජීවිකා කෙරෙත්. මෙබඳුවූ තිරච්ඡාන විජ්ජාවෙන් කරණ මිථ්‍යාජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඒ මහණහුගේ එක් සීලයෙකි.

37. “ ‘එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා, ශාන්ති ප්‍රතිඥත කර්මය,[1] කායශී සමෘද්ධියෙන් පසු කළයුතු ප්‍රණිධිකර්මය, මන්ත්‍ර ප්‍රයොග කිරීමය, භූරිකර්මය, පණ්ඩකයා පුරුෂයකු කිරීමය, පුරුෂයා පණ්ඩකයකු කිරීමය, ගෙවල් නොකළ බිම ගෙවල් කිරීමය, ගෙට සුදුසු තැන බලිකම් විධානය, දියෙන් මුව සුද්ධ කිරීමය, නැහැවීමය, ගිනි පිදීමය, වමන කරවීමය, විරෙක කරවීමය, ඌර්ධ්ව විරෙකය, අධොවිරෙකය, සිරොවිරෙකය, කන් තෙලය, නෙත්‍රතර්පණය, නස්‍ය කිරීමය, ක්ෂාරවූ අඳුන් තැනීමය, සිසිල් බෙහෙත් අඳුන් සෑදීමය, සැත් කටු ලා කටයුතු වෙදකර්මය, ශල්‍යකර්මය, ළදරුවන් පිළිබඳ වෙදකර්මය, මූලික බෙහෙත් දීමය (බෙහෙත් ද්‍රව්‍යයෙන් කටයුතු ශරීර චිකිත්සාය), සැර බෙහෙත් දී පසුව එහි බල හැරීමය යන මෙබඳු තිරශ්චීන විද්‍යා කරණකොට හෝ මිථ්‍යාජීවයෙන් ජීවිකා කෙරෙත්. මෙබඳුවූ මිථ්‍යාජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඒ මහණහුගේ එක් සීලයෙකි.

---

1. මේ ආදියෙහි විස්තර දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ බ්‍රහ්මජාල සූත්‍රයෙන් බලා දත යුතුයි.

38. අථ[1] ඛො සො ආවුසො භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සෙය්‍යථාපි ආවුසො ඛත්තියො මුද්ධාභිසිත්තො[2] නිහතපච්චාමිත්තො න කුතොචි භයං සමනුපස්සති යදිදං පච්චත්ථිකතො එවමෙව ඛො ආවුසො භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති. එවං ඛො ආවුසො භික්ඛු සීලසම්පන්නො හොති.

39. කථඤ්ච ආවුසො භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති? ඉධ ආවුසො භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී[3]. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං[4] තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා—පෙ—ඝානෙන ගන්ධං ඝායිත්වා—පෙ—ජිව්හාය රසං සායිත්වා—පෙ—කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා—පෙ—මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී[3]. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං[4] තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති මනින්ද්‍රියං මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං[5] පටිසංවෙදෙති. එවං ඛො ආවුසො භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති.

---

1. ස ඛො P. S.
2. මුද්ධාව° P.
3. නානුව්‍ය° P.W.
4. අන්වාස්ස° P. W.
5. අව්‍යා° P. W.

38. “ ‘ඇවැත්නි, මෙසේ සීලසම්පන්නවූ මහණහට (අසංවරය මුල්කොට උපදනාවූ) භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ඔහුගේ සීලසංවරය හෙතුකොටගෙණ කිසිතැනකදී නොඋපදනේය. කුමක් මෙන්ද යත්:—ඇවැත්නි, ක්ෂත්‍රියාභිෂෙකයෙන් මුදුනෙහි අභිෂෙක ලද්දවූ, නැසූ පසමිතුරන් ඇති, ක්ෂත්‍රිය රජෙක් කිසියම් සතුරෙකුගෙන් කිසි භයක් නොදක්නේද, එපරිද්දෙන්ම ඇවැත්නි, සීලසම්පන්නවූ මහණ තෙමේ (අසංවර හෙතුවෙන් උපදනාවූ) භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු සීලසංවරය හෙතුකොට කිසි තැනකදී නොදක්නේය (ඔහුට කිසිවකින් බියක් නැත). ආර්‍යවූ (ශ්‍රෙෂ්ඨවූ) මේ සීල රාශියෙන් යුක්තවූ ඒ මහණ තෙමේ, ස්වසන්තානයෙහි පිරිසිදුවූ (කායික චෛතසික) සැපය විඳියි. ඇවැත්නි, මෙසේ දක්වූ (ත්‍රිවිධ) ශීලයෙන් යුක්තවූ මහණ තෙමේ සීලසම්පන්න නම් වේ.

39. “ ‘ඇවැත්නි, මහණ තෙමේ කෙසේ නම් ඉන්ද්‍රියයන්හි වැසූ දොරටු ඇත්තේ ද? ඇවැත්නි, මේ සස්නෙහි (මනාසේ පිළිපන්)මහණ තෙමේ, ඇසින් රූපයක් දැක නිමිත්තග්‍රාහී නොවේ (එහි නොඇලේ). අනුබ්‍යඤ්ජන වශයෙන් නොගන්නේ එහි විස්තර සෙවීමට නොපෙළඹේ. චක්ඛුන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට යමක් හෙතුකොටගෙණ අභිධ්‍යාදෞර්මනස්සාදි (දැඩි ආශාව හා කලකිරීමාදි) ලාමක වූ අකුශල ධර්මයෝ වහනය වන්නාහු ද (ස්වසන්තානයට ඇතුල් වන්නාහු ද), එබඳු දෙයින් වැළකීම පිණිස හෙතෙම පිළිපදී. හෙතෙම තමාගේ චක්ඛුන්ද්‍රිය රකී, චක්ඛුන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කනින් ශබ්දයක් අසා—[ඇස පිළිබඳ කී නයින් දත යුතුයි]—නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කොට —පෙ— දිවෙන් රසයක් විඳ —පෙ— කයින් ස්පර්ශකටයුත්තක් ස්පර්ශකොට —පෙ— සිතින් ධර්මයක් (කරුණක්) දැන එහි නිමිති නොගන්නේය (එහි නොඇලෙන්නේය), අනුබ්‍යඤ්ජන වශයෙන් නොගන්නේය (එහි නොපෙළඹෙන්නේය). මනෙන්ද්‍රියයෙහි (සිතෙහි) අසංවරව වසන්නහුට යමක් නිසා අභිජ්ඣා දෞර්මනස්සාදි ලාමක අකුශල ධර්මයෝ වහනය වෙත් ද (ස්වකීය සන්තානයට වදිත් ද), එබඳු දෙයින් වැළකීම පිණිස හෙතෙම පිළිපදී. හෙතෙම මනෙන්ද්‍රිය රකී, මනෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. එබඳුවූ මහණ තෙමේ ආර්‍ය වූ (උතුම් වූ) ශීල රාශියෙන් යුක්ත වූයේ, අභ්‍යන්තරයෙහි පිරිසිදුවූ (අසම්මිශ්‍ර වූ) අබ්‍යාසේක සුඛය විඳියි. ඇවැත්නි, මෙසේ වූ මහණ තෙමේ ඉන්ද්‍රියයන්හි වසන ලද දොරටු ඇත්තේ වේ.

40. කථඤ්ච ආවුසො භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති? ඉධ ආවුසො භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති සම්මිඤ්ජිතෙ[1] පසාරිතෙ සම්පජානකාරී හොති සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති. උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති. ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති. එවං ඛො ආවුසො භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති.

41. කථඤ්ච ආවුසො භික්ඛු සන්තුට්ඨො හොති?

ඉධ ආවුසො භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන[2] චීවරෙන කුච්ඡිපරිහාරිකෙන[2] පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. සෙය්‍යථාපි ආවුසො පක්ඛී සකුණො යෙන යෙනෙව ඩෙති සපත්තභාරොව ඩෙති එවමෙව ඛො[3] ආවුසො භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන[2] චීවරෙන කුච්ඡිපරිහාරිකෙන[2] පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. එවං ඛො ආවුසො භික්ඛු සන්තුට්ඨො හොති.

---

1. සමිඤ්ජිතෙ B. V. 2. °පරිහාරියෙන V.

3. ඛො ඉති න දිස්සති P.

40. "'ඇවැත්නි, මහණ තෙමේ කෙසේ නම් සතිසම්පජඤ්ඤයෙන් (සිහියෙන් හා මනා ප්‍රඥාවෙන්) යුක්ත වූයේ වේද?

"'ඇවැත්නි, මේ සස්නෙහි (මනාව පිළිපන්) මහණ තෙම ඉදිරියට යැමෙහි ද, ආපසු යැමෙහි ද, යහපත් වූ නුවණින් දැන ඒ ක්‍රියා කරන්නේය. ඉදිරි බැලීමෙහි ද, අනුදික් (වටපිට) බැලීමෙහි ද, නුවණින් දැන බලන්නේය. අත් පා හැකිලීමෙහි ද දිගු කිරීමෙහි ද මනා නුවණින් දැන එසේ කරන්නේය. සඟළය, පාත්‍රය, සිවුරුය යන මේ දේ දැරීමෙහිදී මනා නුවණින් දැන ඒ ඒ දැරීම් ආදිය කරන්නේය. අනුභව කිරීමය, පානය කිරීමය, කෑමය, රස විඳීමය යන මෙහි ද මනා නුවණින් යෙදී (දැන) ඒ ඒ අනුභව කිරීමාදිය කරන්නේය. මල මූත්‍ර පහකිරීම් ද නුවණින් (ආදීනව) සලකා කරන්නේය. යෑම්, සිටීම්, හිඳීම්, සැතපීම්, නිදි තොරකිරීම්, කථාකිරීම්, නිශ්ශබ්ද ව සිටීම් යන මේ දේ මනා නුවණින් දැන කරන්නේය. ඇවැත්නි, මෙසේ කරන්නාවූ මහණ තෙමේ සිහියෙන් යුක්තාවූයේ යහපත් නුවණින් යුක්ත වූයේ වෙයි. (මෙකී සියලු ඉරියව් පිළිබඳව ආදීනව හා ආනිසංසයන් ද, ශරීරය පිළිබඳ අනිත්‍යතාදි ස්වභාවයන්ද නුවණින් සලකා ඒ ඒ කෘත්‍යයන්හි යෙදේ යි සේයි.)

41. "'ඇවැත්නි, මහණතෙමේ කෙසේ නම් ප්‍රත්‍යයන් පිළිබඳ යථාලාභසන්තොෂයෙන් සතුටු වූයේ වේද?

"'ඇවැත්නි, මේ සස්නෙහි (මනාව පිළිපන්) මහණතෙමේ කායපරිහරණයට ප්‍රමාණවූ (යත්නම් කය වැසීමට තරම්වූ) සිවුරෙන් ද කායපරිහරණයට ප්‍රමාණවූ පිණ්ඩපාත භොජනයෙන් ද සතුටු වූ සිත් ඇත්තේ වෙ. ඒ මහණතෙමේ යම් යම් තැනකට යේ නම් අටපිරිකර (කය පිළිබඳ වූ දේ) පමණක් රැගෙණ යේ. ඇවැත්නි, යම් සේ පියාපත් ඇති පක්ෂියෙක් යම් යම් තැනෙක පියාඹා යේ නම් ඒ සියලු තැන පියාපත් බර පමණකින් යුක්තව පියාඹා යේ ද, ඇවැත්නි, එපරිද්දෙන්ම භික්ෂු තෙමේ ද කාය පරිහරණයට ප්‍රමාණවූ සිවුරෙන් ද කුක්ෂි පරිහරණයට ප්‍රමාණවූ පිණ්ඩපාත භොජනයෙන් ද සතුටු වන්නේ වේ. ඒ මහණ තෙමේ යම් යම් තැනක යේ නම් කායපටිබද්ධවූ අටපිරිකර පමණක් රැගෙණ බැහැර යේ. ඇවැත්නි, මෙසේ වූ මහණ තෙමේ (යම්තම් ලත් දෙයින්) ඉතරීතරසන්තොෂයෙන් යුක්තවේ.

42. සො ඉමිනා ච[1] අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො, ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං[2] වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

43. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. බ්‍යාපාදපදොසං[3] පහාය අබ්‍යාපන්නචිත්තො[4] විහරති සබ්බපාණභූතහිතානුකම්පී බ්‍යාපාදපදොසා[3] චිත්තං පරිසොධෙති. ථීනමිද්ධං[5] පහාය විගතථීනමිද්ධො[5] විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො ථීනමිද්ධා චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

44. සෙය්‍යථාපි ආවුසො පුරිසො ඉණං[6] ආදාය කම්මන්තෙ පයොජෙය්‍ය තස්ස තෙ කම්මන්තා සමිජ්ඣෙය්‍යුං. සො යානි ච පොරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තීකරෙය්‍ය[7]. සියා චස්ස[8] උත්තරිං අවසිට්ඨං දාරභරණාය[9] තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ ඉණං ආදාය කම්මන්තෙ පයොජෙසිං[10] තස්ස මෙ තෙ කම්මන්තා සමිජ්ඣිංසු. සොහං යානි ච පොරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තීඅකාසිං. අත්ථි ච මෙ උත්තරිං අවසිට්ඨං දාරභරණායාති[9]. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං[12] අධිගච්ඡෙය්‍ය[13] සොමනස්සං.

---

1. චකාරො නත්ථි W.
2. සුසාණං C.
3. ව්‍යා° P. W.
4. අව්‍යා° P. W.
5. ථින° B.
6. ඉනං C.
7. ව්‍යන්ති° P. C.
8. තස්ස Sa.
9. දුරු° P. W.
10. පයොජෙමි B.
11. ව්‍යන්තිං අ° B. ව්‍යන්ති° P. W.
12. පාමුජ්ජං P. W. C.
13. අධිගච්ඡෙ C. P.

42. "'ආයසීවූ හෙවත් උතුම්වූ මේ සීලසමූහයෙන් යුක්තවූ ද, උතුම්වූ මේ ඉන්ද්‍රියසංවරයෙන් යුක්තවූ ද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවූ ද, මේ උතුම් ඉතරීතර-සන්තොෂයෙන් යුක්තවූ ද, ඒ (යොගාවචර) මහණ තෙමේ (මනුෂ්‍ය වාසයෙන් දුනු පන්සියයකින් ඔබ්බෙහි වූ) අරණ්‍යය ද (ජනයාගෙන් තොරවූ) වෘක්ෂ මූලය ද, පර්වත පෙදෙස් ද, කඳුරැලි ගිරිගුහාවන් හෝ මහා මගද, සොහොන් ද, ඉතා දුරවූ වනසෙනසුන් ද, අභ්‍යාවකාශ (බොහෝ ඉඩකඩ ඇති) තැන් සහ පිදුරු ගුහා ද යන මේ (ජනයාගෙන් හිස්වූ) සෙනසුන් ඇසුරු කෙරෙයි. ඒ මහණ තෙමේ පසුබත් කාලයෙහි පිණ්ඩපාත භොජනයෙන් වැළැක්කේ, පර්‍ය්‍යඞ්කය බැඳ, උඩුකය ඇද නොවන සේ තබා, නිවණෙහිම සිත එලවා, ඒ නිවණම අරමුණු වසයෙන් සිත ඉදිරියෙහි පිහිටුවා ගෙණ හිඳී.

43. "'ඒ මහණ තෙමේ ලොකයෙහි (පඤ්චුපාදානසකන්ධ යන්හි) අභිධ්‍යාව (ලොභය) පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේ. ඒ අභිධ්‍යාවෙන් සිත (වෙන්කොට) පිරිසිදු කෙරේ. සිත කෙලසන්නාවූ ක්‍රොධය පහකොට, ක්‍රොධයෙන් දූෂිතවූ සිත් නැත්තේ, ප්‍රාණීවූ සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේව වෙසේ. ව්‍යාපාද දූෂණයෙන් සිත (වෙන් කොට) පිරිසිදු කෙරේ. කායචිත්ත දෙදෙනාගේ අලස බව යයි කියන ලද ථීනමිද්ධය දුරුකොට කය—සිත පිළිබඳ පහ වූ අලස බැව් ඇත්තේ, ආලොකසංඥා (පිරිසිදු හැඟීම්) ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥා ඇත්තේතක්ව වෙසේ. ථීනමිද්ධනීවරණයෙන් සිත පිරිසිදු කෙරේ. උඩඟු බව හා කුකුස (උද්ධච්චකුක්කුච්චය) දුරුකොට, සංසිඳුනු සිත් ඇතිව (අනුද්ධතව) වාසය කෙරේ. අධ්‍යාත්මයෙහි (ඇතුළත) සංසිඳුනු සිත් ඇත්තේ, උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසිදු කෙරේ. (බුද්ධාදි අටතැන්හි සැකකිරීම ලකුණුකොට ඇති) විචිකිච්ඡාව දුරුකොට, එතර කළ (පහකළ) විචිකිච්ඡා ඇත්තේ කුශලධර්ම විෂයෙහි 'ඒ කෙසේ ද මේ කෙබඳුද්ද'යි යන සැක නැතිව වෙසේ; විචිකිච්ඡායෙන් සිත පිරිසිදු කෙරේ.

44. "'ඇවැත්නි, යම්සේ පුරුෂයෙක් ණය ගෙණ කර්මාන්ත-යන්හි යොදන්නේ ද, ඔහුගේ ඒ කර්මාන්තයෝ දියුණු වන්නාහු නම් ඔහුගේ ඒ පරණ ණය මුදල් සියල්ලම ගෙවන්නේය. ඔහුගේ අඹුදරුවන් පුස්නා පිණිස වැඩි යමක් ඉතුරු වූයේ නම් ඔහට මෙබඳු අදහසක් වන්නේය. කෙසේද යත්: 'මම වනාහි පළමුවෙන් ණය ගෙණ කර්මාන්තයන්හි යෙදුවෙමි. ඒ මාගේ කර්මාන්තයෝ සමෘද්ධවූහ. ඒ මම පැරණි ණය ගෙවූයෙමි. අඹු දරුවන් පොෂ්‍යකිරීම පිණිස අතිරේක මුදලක් ද මට ඇත්තේය' කියායි. හෙතෙම ඒ ණය නැති බව මුල්කොට ගෙණ බලවත් සතුටක් ලබන්නේය. සොම්නසට ද පැමිණෙන්නේය.

45. සෙය්‍යථාපි ආවුසො පුරිසො ආබාධිකො අස්ස දුක්ඛිතො බාළ්හගිලානො භත්තං චස්ස නච්ඡාදෙය්‍ය [1] න චස්ස කායෙ බලමත්තා. සො අපරෙන සමයෙන තම්හා ආබාධා මුච්චෙය්‍ය භත්තඤ්චස්ස ඡාදෙය්‍ය සියා චස්ස කායෙ බලමත්තා. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ ආබාධිකො අහොසිං දුක්ඛිතො බාළ්හගිලානො භත්තං ච මෙ නච්ඡාදෙසි න චස්ස [2] මෙ ආසි කායෙ බලමත්තා. සොම්හි එතරහි තම්හා ආබාධා මුත්තො භත්තඤ්ච මෙ ඡාදෙති අත්ථි ච මෙ [3] කායෙ බලමත්තාති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං [4] අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

46. සෙය්‍යථාපි ආවුසො පුරිසො බන්ධනාගාරෙ බද්ධො අස්ස. සො අපරෙන සමයෙන තම්හා බන්ධනාගාරා [5] මුච්චෙය්‍ය සොත්ථිනා අබ්බයෙන [6]. න චස්ස කිඤ්චි භොගානං වයො. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ බන්ධනාගාරෙ බද්ධො අහොසිං. සොම්හි එතරහි තම්හා බන්ධනාගාරා [5] මුත්තො සොත්ථිනා අබ්බයෙන [6]. නත්ථි ච මෙ කිඤ්චි භොගානං වයොති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං [4] අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

47. සෙය්‍යථාපි ආවුසො පුරිසො දාසො අස්ස අනත්තාධිනො [7] පරාධිනො [7] න යෙනකාමංගමො. සො අපරෙන සමයෙන තම්හා දාසබ්‍යා [8] මුච්චෙය්‍ය අත්තාධීනො [7] අපරාධීනො භුජිස්සො යෙනකාමංගමො. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ දාසො අහොසිං අනත්තාධීනො [7] පරාධීනො [7] න යෙනකාමංගමො. සොම්හි එතරහි තම්හා දාසබ්‍යා [8] මුත්තො අත්තාධීනො [7] අපරාධීනො [7] භුජිස්සො යෙනකාමංගමොති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං [4] අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

---

1. නාච්ඡාදෙය්‍ය S.
2. න ච මෙ P. W.
3. අත්ථි ච කායෙ P.
4. පාමුජ්ජං P. W. C.
5. බන්ධාගාරා B. බන්ධනා P. S. W.
6. අව්‍යයෙන P. W.
7. °ධිනො B.
8. දාසව්‍යා P. W. C.

45. " 'ඇවැත්නි, යම්සේ වනාහි මහත් රෝගයෙන් පෙළෙන (ආබාධ ඇත්තාවූ), දුක් ඇත්තාවූ, දූඹි ගිලන්බව ඇති පුරුෂයෙක් වත්තේ ද, ඔහට බත් (ආහාර) රුචි නොවත්තේ ද, ඔහුගේ ශරීරයෙහි කිසි ශක්තියක් නැත්තේ ද වෙයි. ඒ පුරුෂ තෙම පසු කාලයක ඒ ආබාධයෙන් මිදෙන්නේ නම්, ඔහුට ආහාර රුචිය ඇති වන්නේ නම්, ඔහුගේ ශරීර බලය ද ඇති වන්නේ නම්, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. කෙබඳු ද යත්: 'මම වනාහි පෙර ආබාධ ඇත්තාවූ, දුක් ඇති, දූඹි ගිලන් බැව් ඇති කෙනෙක් වීමි. මට බත් රුචිය ද නොවීය. ශරීර-බලය ද නැතිවිය. ඒ මම පළමු තිබූ ආබාධයෙන් මිදුනෙමි. මට ආහාර රුචිය ද ඇත්තේය. කාය බලය ද තිබේය' කියායි. හෙතෙම ඒ කාරණය මුල්කොට බලවත් සතුටක් ලබන්නේය, සොම්නසට ද පැමිණෙන්නේය.

46. " 'ඇවැත්නි, යම්සේ පුරුෂයෙක් සිරගෙයි බැඳුනේ වේද, හෙතෙම පසු කලෙක වියදම් නැතිව (පීඩා රහිතව) සැපසේ ඒ සිරගෙයින් මිදෙන්නේය. ඔහුගේ භොගයන් පිළිබඳ කිසිත් වියදමක් ද නොවන්නේය. ඔහුට මෙබඳු අදහසක් වන්නේය එනම්: 'මම වූකලී පෙර සිරගෙයි බැඳුනෙක් වූයෙමි. ඒ මම දැන් වියදම් නැතිව (පීඩා රහිතව) සැපසේ ඒ සිරගෙයින් මිදුනෙමි. මගේ භොගයන් පිළිබඳ කිසි වියදමක් ද නො වූයේය' කියායි. ඒ පුරුෂ තෙම සිරගෙයින් මිදීම නිමිති කොට බලවත් සතුටක් ලබන්නේය, සොම්නසට ද පැමිණෙන්නේය.

47. " 'ඇවැත්නි, යම්සේ සිය කැමැත්තෙන් යමක් කරන්ට නොහැකි (අධිපති භාවයක් නැත්තාවූ), අනුන්ගේ කැමැති පරිදි පවත්නාවූ (අනුන්ට යටහත්වූ), තමා කැමැති ගමනක් ඒ වූ පරිදි යා නොහැකි, වැඩකරුවෙක් වන්නේ ද, හෙතෙම පසු කලෙක ඒ දාසභාවයෙන් මිදෙන්නේ, තමාම අධිපතිකොට ඇත්තේ, පරාධීන නො වූයේ, අනුන්ට යටත් නොව තමා ගෙන්ම යැපෙන්නෙන්, සිය අදහස් පරිදි ඒ ඒ තැන යා හැකි වන්නේ ද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය, එනම්: 'මම වනාහි පෙර සියකැමැති පරිදි යමක් කරන්ට නොහැකි, අනුන්ට යටත් පැවතුම් ඇති, මා අදහස් පරිදි කිසි තැනෙක යා නොහැකි දාසයෙක් වීමි. ඒ මම දැන් ඒ දාසභාවයෙන් මිදුනෙක්මි. ආත්මාධීනවූයෙමි, පරාධීන නොවූයෙමි, මෙරමා-හට යටත් නොව මා සපයාගත් දෙයින්ම යැපෙන්නෙමි, මා අදහස් පරිදි ඒ ඒ කැමැති තැනෙක යා හැක්කෙක් ද වෙමි'යි කියා යි. හෙතෙම ඒ දාසභාවයෙන් මිදීම හෙතුකොට බලවත් සතුටක් ලබන්නේය, එසේ සොම්නසට ද පැමිණෙන්නේ ය.

48. සෙය්‍යථාපි ආවුසො පුරිසො සධනො සභොගො කන්තාරද්ධානමග්ගං[1] පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං. සො අපරෙන සමයෙන තං කන්තාරං නිත්ථරෙය්‍ය සොත්ථිනා ගාමන්තං අනුපාපුණෙය්‍ය ඛෙමං අප්පටිභයං. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ සධනො සභොගො කන්තාරද්ධානමග්ගං[1] පටිපජ්ජිං දුබ්භික්ඛං සප්පටිභයං. සොම්හි එතරහි තං කන්තාරං තිණ්ණො[2] සොත්ථිනා ගාමන්තං අනුප්පත්තො ඛෙමං අප්පටිභයන්ති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං[3] අධිගච්ඡෙය්‍ය[4] සොමනස්සං.

49. එවමෙව ඛො ආවුසො භික්ඛු යථා ඉණං යථා රොගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං එවං[5] ඉමෙ පඤ්චනීවරණෙ අප්පහීනෙ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි ආවුසො ආනණ්‍යං යථා ආරොග්‍යං යථා බන්ධනාමොක්ඛං යථා භුජිස්සං යථා ඛෙමන්තභූමිං එවමෙව ඛො ආවුසො භික්ඛු ඉමෙ පඤ්චනීවරණෙ පහීනෙ අත්තනි සමනුපස්සති.

50. තස්සිමෙ පඤ්චනීවරණෙ පහීනෙ අත්තනි සමනුපස්සතො පාමොජ්ජං[3] ජායති පමුදිතස්ස පීති ජායති පීතිමනස්ස කායො පස්සම්භති පස්සද්ධකායො සුඛං වෙදෙති[6] සුඛිනො චිත්තං සමාධියති.

---

1. කන්තාර °අද්ධානං B. S. Pa.
2. නිත්ථිණ්ණො P.W. නිත්ථින්නො Pa.
3. පාමුජ්ජං P. W. C.
4. අධිගච්ඡෙ C. P.
5. එවංති න දිස්සති P. W. S.
6. පටිසංවෙදෙති S.

48. "'ඇවැත්නි, යම්සේ ධනවත්වූ භොගසම්පත් ඇති පුරුෂයෙක් ආහාර දුර්ලභවූ, භය සහිතවූ, නිරුදකවූ දීර්ඝමාර්ගයකට දුරුකතරමගකට පැමිණෙන්නේ ද, හෙතෙම මද කලකින් ඒ කාන්තාරමාර්ගය ඉක්මවා යන්නේ, සැපවත්වූ, (සොර සතුරන් ගෙන්) ප්‍රතිභය රහිත වූ ගම්මානයකට ක්‍රමයෙන් පැමිණෙන්නේ ද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: —'මම වනාහි පෙර ධනවත් වූයෙමි, භොගසම්පත් සහිත වූයෙමි, දුර්ලභ භික්‍ෂා ඇති, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාරමාර්ගයකට පිළිපන්නෙක් වූයෙමි. එසේ වූ මම දැන් එම කාන්තාරමාර්ගය තරණය කෙළෙමි. සැපවත්වූ, ප්‍රතිභය රහිතවූ ගමකට සැපසේ ක්‍රමයෙන් පැමිණියෙමි'යි කියායි. ඒ පුරුෂ තෙමේ ඒ කතරමග එතර කිරීම නිමිතිකොට බලවත් සතුටක් ලබන්නේය, එසේම සොම්නසට ද පැමිණෙන්නේය.

49. "'ඇවැත්නි, ණය යම්සේ ද, රෝගය යම්සේ ද, බන්ධනාගාරය යම්සේ ද, දසභාවය යම්සේ ද, දුරුකතරමග යම්සේ ද, එපරිද්දෙන් මහණ තෙමේ ප්‍රහීණ නොවූ (පහ නොකළ) පඤ්චනීවරණයන් තමා කෙරෙහි ලා නුවණින් දකී. ඇවැත්නි, ණය නැති බව යම්සේ ද, නිරෝගී බව යම්සේ ද, සිරගෙන් මිදීම යම්සේ ද, මෙරමාහට යටත් නැති බව යම්සේ ද, අභය භූමිය යම්සේ ද, එපරිද්දෙන් ම ඇවැත්නි, මහණ තෙමේ ප්‍රහීණවූ මේ පඤ්චනීවරණ ධර්මයන් තමා විෂයෙහි ලා දක්නේය.

50. "'ප්‍රහීණවූ මේ පඤ්චනීවරණයන් තමා කෙරෙහි නැතැයි නුවණින් දක්නාවූ ඒ මහණහට සතුටු ආකාරය උපදී. සතුටු වූවහුට (සියල් සිරුර කලඹමින්) ප්‍රීතිය උපදී ප්‍රීති සහගත සිත් ඇත්තහුගේ නාමකය (සන්තානය) සංසිඳෙයි, සංසිඳුනු කය ඇති (කය පිළිබඳ මැඩලූ දැහ ඇති) තැනැත්තේ කායික චෛතසික සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධියට (එකඟ බවට) එළඹෙයි.

51. සො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං[1] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො[2] කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුට්ඨං[3] හොති.

52. සෙය්‍යථාපි ආවුසො දක්ඛො න්හාපකො[4] වා න්හාපකන්තෙවාසී[4] වා කංසථාලෙ න්හානීයචුණ්ණානි[5] ආකිරිත්වා උදකෙන පරිප්ඵොසකං පරිප්ඵොසකං[6] සන්දෙය්‍ය[7] සායං[8] න්හානීයපිණ්ඩි[4] ස්නෙහානුගතා ස්නෙහපරෙතා සන්තරබාහිරා ඵුට්ඨා[9] ස්නෙහෙන[10] න ච පග්ඝරණී.[11]

එවමෙව ඛො ආවුසො භික්ඛු ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො[2] කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුට්ඨං[3] හොති.

යො නු ඛො[12] ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති කල්ලං නු ඛො තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති?

යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති කල්ලං තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

53. පුන චපරං ආවුසො භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං[13] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො[2] කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්ඵුට්ඨං[3] හොති.

---

1. පඨමං ඣානං V. B. Pa.
2. සබ්බවතො V.
3. අප්ඵුටං S; අප්ඵුතං P. C. අඵුටං B. V.
4. ස්නා° W. නහා° P.
5. ස්නානිය° W. න්හානිය° B. නහානියP.
6. S. සකිදෙව වුත්තං
7. සන්නෙය්‍ය P. W. C.
8. සාස්ස P.
9. °ඵුටා B. V. ඵුතා P.
10. සිනෙ° P. W.
11. පග්ඝුරණී B.
12. යොනු ඛො B.V.
13. දුතියං ඣානං V. W.

51. "'ඒ මහණතෙමේ වස්තුකාම ක්ලේශකාමයන්ගෙන් වෙන් වූයේම, අකුශල ධර්මයන් කෙරෙන් ද වෙන් වූයේම, (අරමුණෙහි සිත පැමිණවීම නම්) විතර්ක සහිතවූ, (අරමුණ පිරිමැදීම්, එහි හැසිරීම් සංඛ්‍යාත) විචාර සහිතවූ, සිතෙහි විවෙකයෙන් (නීවරණයන් දුරුවීම් හේතුවෙන්) උපන් ප්‍රීතියම සැපකොට ඇති, පඨමජ්ඣාන කුසල චිත්තය තමාගේ සන්තාන-යෙහි ඉපදවීම් වසයෙන් ඊට පැමිණ එම ධ්‍යානයෙහි වාසය කෙරේ. ඒ මහණ තෙමේ විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ (සකල) ශරීරයම තෙමයි (සැපවත් කෙරෙයි සේයි), හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි (සැමතන්හි පතුරවයි). ඒ මහණහුගේ සම්පූර්ණ ශරීරයෙහි සවල්පවූ ස්ථානයක් වුව ද ප්‍රථමධ්‍යාන සැප-යෙන් (විවේකයෙන් උපන් ප්‍රීති සැපයෙන්) නොපහස්නා ලද්දේ නොවේ (සකල ශරීරයෙහිම පඨමජ්ඣාන සැපය පැතිරේ යයි සේයි).

52. "'ඇවැත්නි, යම්සේ වනාහි දක්‍ෂවූ ස්නාන ද්‍රව්‍ය සපයන්නෙක් හෝ ඔහුගේ අතවැස්සෙක් හෝ ස්නානයට ගන්නාවූ සුණු ලෝහමය තලියෙක බහා, දිය ඉසිමින්, අතින් අනමින් (පිරිමදිමින්) පිඩුකරන්නේ ද, එවිට ඒ මේ ස්නාන-චූර්ණපිණ්ඩය දියෙන් යුක්ත වේ, ජලය හාත්පසින් කාවැදුණේ වේ. එහි ඇතුලත හා පිටත ද සියලු තන්හිම ජලයෙන් පහස්නා ලද්දේ වේ, එහෙත් බිඳු වශයෙන් ජලය ඉන් නො වැගිරේ.

"'ඇවැත්නි, එපරිද්දෙන් ඒ මහණ තෙමේ, විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ ශරීරය තෙමයි (පැතුරුණු සැප ඇත්තක් කරයි), හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි (සැමතන්හි පතුරුවයි). ඒ මහණහුගේ සියලු කොටස් ඇති ශරීරයෙහි සවල්පවූ තැනක් වත් විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් (ප්‍රථමධ්‍යානයෙන්) නොපහස්නා ලද්දේ නොවේ.

"'ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනීද මෙසේ දකීද, ඒ මහණහට හේම ජීවය, හේම ශරීරයයි හෝ ජීවය අනෙ-කෙක ශරීරය අනෙකකැයි හෝ යන මෙය කියන්නට වටීද'(යි ඇසීමි).

"'ඇවැත්නි, යම් ඒ මහණෙක්තෙම මෙසේ දනීද, මෙසේ දකීද, ඔහට ඒම ජීවය ඒම ශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට වටීය' (යි ඒ පැවිද්දෝ කීහ).

"'ඇවැත්නි, මම වූකලී මෙය මෙසේ දනිමි. මෙසේ දකිමි. එතෙකුදු වුවත් මම ඒම ජීවය ඒම ශරීරය යි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැ යි හෝ නොකියමි' යි (ඔවුන්ට දුන්වීමි).

54. සෙය්‍යථාපි ආවුසො උදකරහදො ගම්භීරො[1] උබ්භිදො-දකො[2] තස්ස නෙවස්ස පුරත්ථිමාය දිසාය උදකස්ස ආයමුඛං[3] න දක්ඛිණාය දිසාය උදකස්ස ආයමුඛං[3] න පච්ඡිමාය දිසාය උදකස්ස ආයමුඛං[3] න උත්තරාය දිසාය උදකස්ස ආයමුඛං[3] දෙවො[4] ච කාලෙන කාලං සම්මා ධාරං නානුපවෙච්ඡෙය්‍ය[5]. අථ ඛො තම්හා ච[6] උදකරහදා සීතා[7] වාරිධාරා උබ්භිජ්ජිත්වා තමෙව උදකරහදං සීතෙන වාරිනා අභිසන්දෙය්‍ය පරිසන්දෙය්‍ය පරිපූරෙය්‍ය පරිප්ඵරෙය්‍ය. නාස්ස කිඤ්චි සබ්බාවතො[8] උදකරහදස්ස සීතෙන වාරිනා අප්ඵුටං[9] අස්ස.

එවමෙව ඛො ආවුසො භික්ඛු ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො[8] කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්ඵුටං[9] හොති.

55. පුනච පරං ආවුසො භික්ඛු පීතියා ච විරාගා[10] උපෙක්ඛකො[11] ච විහරති සතො[12] සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යං තං අරියා ආචික්ඛන්ති: උපෙක්ඛකො[11] සතිමා සුඛවිහාරීති තතියජ්ඣානං[13] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො[8] කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං[9] හොති.

---

1. ගම්භීරො ඉති න දිස්සති P.W.
2. උබ්භිතොදකො S. B. V.
3. උදකස්සායº P. W.
4. දෙවො වා නං කාº S. දෙවෙ ච න කාලෙන කාලං B. V.
5. අනුපවෙච්ඡෙය්‍ය B. V. P. W. අනුප්පවෙං S. නානුපº C.
6. තම්හා වා S.
7. සීතවාරිº P. C.
8. සබ්බවතො V.
9. අඵුටං B.V; අප්ඵුටං S.; අප්ඵුතං P.
10. විරාගා ච P.
11. උපෙඛකො P.
12. සතො ච P. S.
13. තතියංඣානං V. W.

53. "'ඇවැත්නි, නැවතද (අතික්කකියම්). යොගී) මහණ තෙමේ, විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් අධ්‍යාත්මයෙහි මනා පැහැදීම කරන්නාවූ, සිත පිළිබඳ එකඟ බව ඇති, විතර්ක විචාර නැති, සමාධියෙන් හටගත් ප්‍රීතිසැපය ඇති ද්‍විතියජ්ඣාන කුසල චිත්තයට පැමිණ වෙසේ. ඒ මහණ තෙමේ මෙ කය සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් තෙමයි (සියලු තැන පතල සැප ඇත්තක් කෙරේ), හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කරයි. ඒ මහණහුගේ සියලු කොටස් ඇති ශරීරයෙහි සවල්පවූ තැනක් වුවද ද්‍විතියධ්‍යානයෙන් නො පහස්නා ලද්දේ නොවේ.

54. "'ඇවැත්නි, යම්සේ ඇතුළතම හටගත් (පොළොව බිඳ නික්මෙන) ජලය ඇති දියවිලක් වේ ද, ඒ විල පිළිබඳ පෙර දිගින් ද, අපරදිගින් ද, උතුරු දිගින් ද, දකුණු දිගින් ද දිය එන මගක් නැත්තේ වේ ද, මෙඝය ද කලින් කල මනාසේ වැසි වර්ෂණය නො කරන්නේ ද, එසේ වූ ඒ විලෙන් සිහිල් දිය දහර පොළොව බිඳ නැගී ඒ මුළු විලම සිහිල් දියෙන් පතුරුවයි, හාත්පසින් වගුරුවයි, සම්පූර්ණයෙන් පුරවයි, එහි හැම තැන දියෙන් ස්පර්ශ කෙරෙයි. ඒ සියලු විලෙහිම සීත ජලය නො පැතිර පවත්නා තැනක් නම් නැත්තේය.

"'ඇවැත්නි, එපරිද්දෙන් මේ මහණ තෙමේ මේ මුළු ශරීරයම සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් සියලු තැන පතුරුවන ලද්දක් කෙරේ, ප්‍රීති සැපයෙන් හාත්පසින් වගුරුවයි, සම්පූර්ණයෙන් පුරවයි, ඉන් සැමතැනම ස්පර්ශ කෙරෙයි. ඒ මහණහුගේ සම්පූර්ණ ශරීරයෙහි සවල්පවූ එක ස්ථානයකුදු (ද්‍විතියධ්‍යාන) සැපයෙන් නො පහස්නා ලද්දේ නොවේ.

55. "'ඇවැත්නි, යළිදු, ඒ මහණ තෙමේ ප්‍රීතියෙහි නො ඇල්මෙන් මැදහත්බැව් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් නුවණ ඇත්තේ කයින්ද සැපයක් විඳියි. යම් ධ්‍යානයක් පිළිබඳව (ඒ ධ්‍යානයට සමවැදුනු තැනැත්තා) උපෙක්ෂා ඇත්තේය, සිහි ඇත්තේය, සැපවිහරණ ඇත්තේ යයි ආර්‍ය්‍යයෝ කියත් ද ඒ තෘතියජ්ඣාන කුසල චිත්තයට පැමිණ වාසය කෙරේ. ඒ මහණ තෙමේ මේ සකල ශරීරයම ප්‍රීතියෙන් මිදුණාවූ සැපයෙන් තෙමයි. හෙවත් සියලු තැන පැතිර පවත්නා සැප ඇත්තක් කෙරේ ඒ සැපතින් හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, එයින් සැමතැනම ස්පර්ශ කෙරෙයි. ඒ මහණහුගේ සියලු ශරීරයෙහි සවල්පවූ එක තැනක් වුවද නිප්පීතික සුඛයෙන් (හෙවත් තෘතිය ධ්‍යානසුඛයෙන්) නො පහස්නා ලද්දේ නොවේ.

56. සෙය්‍යථාපි ආවුසො උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි[1] උදකානුග්ගතානි අන්තොනිමුග්ගපොසීනි[2] තානි යාව චග්ගා[3] යාව ච මූලා සීතෙන වාරිනා අභිසන්නානි[4] පරිසන්නානි[4] පරිපූරානි පරිප්ඵුටානි[5] නාස්ස කිඤ්චි සබ්බාවතං[6] උප්පලානං වා පදුමානං වා පුණ්ඩරීකානං වා සීතෙන වාරිනා අප්ඵුටං[7] අස්ස.

එවමෙව ඛො ආවුසො භික්ඛු ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො[8] කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං[7] හොති.

යො නු ඛො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති කල්ලං නු ඛො තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති?

යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති කල්ලං[9] තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

57. පුනචපරං ආවුසො භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා[10] අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං[11] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති නාස්ස කිඤ්චි සබ්බාවතො[8] කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුටං[7] හොති.

---

1. සංවුඩ්ඪානි B. V. Pa. සංවද්ධානි S.
2. °පොසීනි B. S.
3. යාව ච් අග්ගා S.
4. °සන්නානි P. W.
5. පරිප්ඵුටානි S. V. °ඵුතානි B.
6. °වතං V.
7. අඵුටං B. අප්ඵුටං S. අප්ඵුතං P.
8. සබ්බවතො V.
9. න කල්ලං S.
10. අත්ථගමා P.
11. චතුත්ථං ඣානං B. V. W.

56. " 'ඇවැත්නි, යම්සේ උපුල් විලක හෝ හෙල පියුම් විලක හෝ රත් පියුම් විලක හෝ දියෙහි හටගත්, දියෙහි වැඩුනු, දියෙන් උඩට නොනැගුනු, දියතුළම ගැලී වැඩෙන්නාවූ සමහර උපුල් හෝ සමහර හෙල පියුම් හෝ සමහර රත් පියුම් හෝ වෙද් ද, ඒ උපපලාදීහු අග දක්වාත්, මුල දක්වාත්, සිහිල් ජලයෙන් තෙමුනාහු, හාත්පසින් තෙමුනාහු, සම්පූර්ණයෙන් වැගුරුණාහු, හාත්පසින් පහස්නා ලද්දහු වෙත් ද, ඒ උපුල්, හෙල පියුම්, රත් පියුම්, යන මොවුන්ගෙන් එකකුත් ජලයෙන් නො පහස්නා ලද්දේ නොවේ ද, ඇවැත්නි, එපරිද්දෙන් ඒ මහණතෙමේ මේ සකල ශරීරයම නිෂ්පීතික සුඛයෙන් සියලු තැන පැතිර පවත්නා සැප ඇත්තක් කෙරෙයි, ඉන් හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි. ඒ මහණහුගේ සම්පූර්ණ ශරීරයෙහි සවල්පවූ එක තැනක්වත් නිෂ්පීතික තෘතියධ්‍යානයෙන් නො පහස්නා ලද්දේ නොවේ.

" 'ඇවැත්නි, යම් මහණෙක් මෙසේ දනීද මෙසේ දකීද, ඒ මහණහට හේම ජීවය, හේම ශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට වටීද"(යි ඇසීමි).

" 'ඇවැත්නි, යම් ඒ මහණෙක්තෙම මෙසේ දනීද, මෙසේ දකීද, ඔහට එම ජීවය එම ශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට වටිය'(යි ඒ පැවිද්දෝ කීහ).

" 'ඇවැත්නි, මම වූකලී මෙය මෙසේ දනිමි. මෙසේ දකිමි. එතෙකුදු වුවත් මම එම ජීවය එම ශරීරය යි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැ යි හෝ නොකියමි' යි (ඔවුන්ට දැන්වීමි).

57. " 'නැවත ද ඇවැත්නි, ඒ මහණතෙමේ සැප දුරුකිරීමෙන් ද, දුක් දුරුකිරීමෙන් ද පළමුකොටම සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැතිව යාමෙන් දුක් නොවූ, සැප නොවූ, උපෙක්ඛා-සති යන මොවුන්ගේ පිරිසිදු බැව් ඇති, චතුර්ථධ්‍යාන (කුසල) චිත්තයට පැමිණ වෙසේ. ඒ මහණ තෙමේ මේ සකල ශරීරයම (කෙලෙස් නැති බැවින්) පිරිසිදුවූ, (අතිශයින් බබලන හෙයින්) පරියොදාතවූ, (ධ්‍යාන) සිතින් පතුරුවා හුන්නේ වේ (පතුරුවන්නේය). ඒ ධ්‍යානලාභි මහණහුගේ සර්වාඞ්ගයෙහි සවල්පවූ එක තැනකුදු පිරිසිදුවූ, අතිශයින් බබලන්නාවූ (චතුර්ථ ධ්‍යාන) චිත්තයෙන් නො පහස්නා ලද්දේ නොවේ.

58. සෙය්‍යථාපි ආවුසො පුරිසො ඔදාතෙන වත්ථෙන සසීසං පාරුපිත්වා නිසින්නො අස්ස නාස්ස කිඤ්චි සබ්බාවතො[1] කායස්ස ඔදාතෙන වත්ථෙන අප්ඵුට්ඨං[2] අස්ස. එවමෙව ඛො ආවුසො භික්ඛු ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති නාස්ස කිඤ්චි සබ්බාවතො[1] කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුට්ඨං[2] හොති.

යො නු ඛො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති කල්ලං නු ඛො තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති?

යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති කල්ලං තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

59. [පුන ච පරං ආවුසො භික්ඛු][3] සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[4] ඤාණදස්සනාය චිත්තං අභිනීහරති[5] අභිනින්නාමෙති. සො එවං පජානාති: අයං ඛො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො[6] මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො[7] අනිච්චුච්ඡාදනපරිමද්දනභෙදනවිද්ධංසනධම්මො. ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං[8] එත්ථ පටිබද්ධන්ති.

---

1. සබ්බවතො V.
2. අඵුටං B.V. අප්ඵුතං P. අප්ඵුටං S.
3. පුන ච පරං භික්ඛූති ඉදං මරම්මපොත්ථකෙසු යෙව ආගතං
4. ආනෙඤ්ජ° P. C.
5. අභිනි° B.
6. චාතුමහා° B. V.
7. °කුමාසූප° B, කුම්මාසූපං P. S.
8. නිස්සිතං S.

58. " 'ඇවැත්නි, යම්සේ කිසියම් පුරුෂයෙක් පිරිසිදුවූ සුදු වතකින් හිස සිට (දෙපා දක්වා) පොරවා උන්නේ වේද, ඔහුගේ සකල ශරීරයෙහි එකම තැනකුදු සුදුවතින් නො වසන (නොහොත් උණුසුම් නොකරණ) ලද්දේ නොවේ. ඇවැත්නි, එපරිද්දෙන්ම ධ්‍යානලාභී මහණතෙමේ මේ සියලු ශරීරයම පිරිසිදුවූ, අතිශයින් බබලන්නාවූ චතුර්ථධ්‍යාන චිත්තයෙන් පතුරුවා හුන්නේ වේ. ඒ මහණහුගේ සර්වාංගයෙහි සවල්පවූද එක් තැනක්වත් පිරිසිදුවූ, බබලන්නාවූ චතුර්ථධ්‍යාන චිත්තයෙන් නො පහස්නා ලද්දේ නොවේ (චතුර්ථධ්‍යාන චිත්තයෙන් සකල ශරීරයම පතුරුවන ලද්දේය කී සේයි).

" 'ඇවැත්නි, යම් පැවිද්දෙක් තෙමේ මෙසේ දනීද, මෙසේ දකීද, ඔහට ඒම ජීවය ඒම ශරීරයයි හෝ ජීවය අනිකක ශරීරය අනිකකැ යි හෝ යන මෙය කියන්නට වටීදැ'(යි ඇසීම්).

" 'ඇවැත්නි, යම් ඒ මහණෙක් තෙම මෙසේ දනීද, මෙසේ දකීද, එසේවූ ඥානදර්ශන ඇති මහණහට ඒම ජීවය ඒම ශරීර යයි හෝ ජීවය අනිකක ශරීරය අනිකකැයි හෝ යන මෙය කියන්නට වටීය' (යි ඒ පැවිද්දෝ කීහ).

" 'ඇවැත්නි, මම වූ කලී මෙය මෙසේ දනිමි, මෙසේ දකිමි. එතකුදු වුවත් මම ඒම ජීවය ඒම ශරීරය යි හෝ ජීවය අනිකක ශරීරය අනිකකැයි හෝ නොකියමි' (යි ඔවුන්ට දැන්වීමි).

59. " '[මැලිඳු, ඇවැත්නි, ඒ මහණතෙමේ] මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි, උපකෙලශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි, (කම්මණ්‍ය) කර්මයට සුදුසුව සිටි කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය ඉපදවීම පිණිස සිත එලවා තබයි, ඒ සඳහා වෙසෙසින් සිත නමයි. ඒ මහණ තෙමේ මෙසේ දැන ගණී, කෙසේ ද යත්: 'මාගේ මේ ශරීරය වනාහි ආකාර ඇත්තේය (රූපයෙන් යුක්තය), සතර මහාභූතයන්ගේ හේතු වෙන් හටගත්තේය, (මව්පියන් නිසා) මව් පිය දෙදෙනාගේ ශුක්‍ර ශ්‍රොණිතයෙන් හටගත්තේය, බත්කොමු (කුම්මාස) ආදී ආහාරයෙන් වඩනා ලද්දේය. අනිත්‍ය බවය, දුගඳ නැසීම පිණිස සුණු ආදිය ගැල්වීමෙන් ඉලීමය, අඟපසඟ ආබාධ දුරලීම පිණිස පිරිමැදීමය, බිඳීමය, විනාශය යන මේ දේ සවභාවකොට ඇත්තේය. මාගේ මේ විඥානය වනාහි කය ඇසුරු කෙළේ වෙයි, මෙහිම බැඳුනේ වෙයි' කියා යි

60. සෙය්‍යථාපි ආවුසො මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අච්ඡො විප්පසන්නො අනාවිලො[1] සබ්බාකාරසම්පන්නො තත්‍ර ‘ස්ස[2] සුත්තං ආවුතං නීලං[3] වා පීතං[4] වා ලොහිතං[5] වා ඔදාතං වා පණ්ඩුසුත්තං[6] වා. තමෙනං[7] චක්ඛුමා පුරිසො හත්ථෙ කරිත්වා පච්චවෙක්ඛෙය්‍ය: අයං ඛො මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අච්ඡො විප්පසන්නො අනාවිලො[1] සබ්බාකාර-සම්පන්නො තත්‍රිදං සුත්තං ආවුතං නීලං[3] වා පීතං[4] වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩුසුත්තං[6] වාති.

එවමෙව ඛො ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ—පෙ—ඤාණදස්සනාය චිත්තං අභිනීහරති[8] අභිනින්නාමෙති. සො එවං පජානාති අයං ඛො මෙ කායො රූපි—පෙ—ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති.

61. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[9] මනොමයං කායං අභිනිම්මිනාය[10] චිත්තං අභිනීහරති[8] අභිනින්නාමෙති. සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං[11] අහිනින්ද්‍රියං[12].

62. සෙය්‍යථාපි ආවුසො පුරිසො මුඤ්ජම්හා ඊසිකං[13] පබ්බාහෙය්‍ය[14] තස්ස එවමස්ස: අයං මුඤ්ජො අයං ඊසිකා[13]. අඤ්ඤො මුඤ්ජො අඤ්ඤා ඊසිකා[13] මුඤ්ජම්හාත්වෙව ඊසිකා[13] පබ්බාළ්හාති[14].

---

1. ඉදං න දිස්සති S.
2. තත්‍රසුත්තං P. W.
3. නිලං B.
4. පිතං B.
5. ලොහිතකං B.
6. පණ්ඩුරසු° S.
7. තමෙව ච° P.
8. අභිනි° B.
9. ආනෙජ්ජ° P. C.
10. මනොමයං අභිනිම්මිතනාය S.
11. °පච්චඞ්ගං S.
12. අභින්තින්ද්‍රියං C.
13. ඉසි° P. S. W. C.
14. පබා° P. W. S.

60. "'ඇවැත්නි, යම්සේ වනාහි යහපත්වූ, පිරිසිදු ආකරයෙන් උපන්නාවූ, අටැස්වූ, (පාෂාණාදි දෙස් බැහැර කිරීමෙන්) මොනවට සකස් කරණ ලද්දවූ, නිර්මලවූ, විශෙෂයෙන් ප්‍රසන්නවූ, නොකැලැල්වූ, සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, වෙරළුමිණක් (වෛඩූර්‍ය මැණිකක්) වේද, එහි නිල්වූ හෝ පීතවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ හුයක් (නූලක්) අමුණන ලද්දේද, ඒ මේ මැණික ඇස් ඇති පුරුෂයෙක් අතට ගෙණ මෙසේ සලකා බලන්නේය, කෙසේද යත්: 'මේ වෛඩූර්‍ය මැණික වනාහි මනාසේ කාන්තිමත් හෙයින් යහපත් වේ, පිරිසිදු ආකරයෙන් උපන්නේය, අටැස් ඇත්තේය, (දෙස් දුරුකිරීමෙන්) මනාකොට සකස් කරණ ලද්දේය, නිර්මලය, විශෙෂයෙන් ප්‍රසන්නය, නොකැලැල්ය, සියලු ආකාරයෙන් සම්පූර්ණය. ඒ මැණිකෙහි මේ නීලවර්ණවූ හෝ පීතවර්ණවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ හුයක් අමුණන ලද්දේය' කියායි.

"'ඇවැත්නි, එපරිද්දෙන්ම යොගීවූ මේ මහණ තෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, —පෙ— විදර්ශනාඥානය පිණිස සිත එලවා නබයි, ඒ සඳහා විශෙෂයෙන් සිත නමයි. ඒ මහණ තෙමේ මෙසේ දන්නේය, කෙසේද යත්: 'මාගේ මේ ශරීරය වනාහි ආකාරවත් (රූපයෙන් යුක්ත) වේ, —පෙ— මාගේ මේ විඥානය වනාහි මේ කය ඇසුරු කොළේ වෙයි, මෙහිම බැඳී සිටියේය' කියා යි.

61. "'ඒ මහණ තෙමේ මෙසේ ධ්‍යානයෙන් සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් නැතිවූ කල්හි, උපකෙලශ පහවූ කල්හි, මෘදුවූ කල්හි, යොග කර්මයට සුදුසුව සිටි කල්හි, නො සැලෙන බවට පැමිණි කල්හි, මනොමයවූ කයක් (රූපයක්) මනාකොට නිපදවීම පිණිස සිත එලවා නබයි, වෙසෙසින් නමයි. ඒ මහණ තෙමේ ආකාර වත්වූ, මනොමයවූ (ධ්‍යාන සිතින් නිපදවනලද), සියලු අඟපසඟ ඇති, අවිකලවූ ඉඳුරන් ඇති, මේ කයින් අන්‍යවූ කයක් මොනවට නිමවයි.

62. "'ඇවැත්නි, යම්සේ වනාහි පුරුෂයෙක් තෙම මුදු තණගසින් තණබඩය උද්ධරණය කරන්නේ ද: මේ තණගසය, මේ තණබඩය, තණගස අනිකෙක, තණබඩය අනිකෙක, තණගසින්ම තණබඩය ඇදගන්නා ලද්දේය, තනන ලද්දේය යන වැටහීම ඔහට පහළ වන්නේය.

සෙය්‍යථා[1] වා පන ආවුසො පුරිසො අසිං[2] කොසියා පබ්බාහෙය්‍ය[3]. තස්ස එවමස්ස: අයං අසි අයං කොසි. අඤ්ඤො අසි අඤ්ඤො[4] කොසි. කොසියාත්වෙව අසි පබ්බාළ්හොති[3].

සෙය්‍යථා වා[1] පන ආවුසො පුරිසො අහිං කරණ්ඩා උද්ධරෙය්‍ය. තස්ස එවමස්ස: අයං අහි අයං කරණ්ඩා අඤ්ඤො අහි අඤ්ඤො කරණ්ඩා කරණ්ඩා ත්වෙව අහි උබ්භතොති[5].

එවමෙව ඛො ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— ආනෙඤ්ජප්පත්තෙ[6] මනොමයං කායං[7] අභිනිම්මිනාය[8] චිත්තං අභිනීහරති[9] අභිනින්නාමෙති. සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං[10] අහීනින්ද්‍රියං.

63. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[6] ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති[9] අභිනින්නාමෙති. සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති එකොපි හුත්වා බහුධා හොති බහුධාපි හුත්වා එකො හොති ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ. පථවියා[11] පි උම්මුජ්ජනිමුජ්ජං[12] කරොති සෙය්‍යථාපි උදකෙ. උදකෙපි අභිජ්ජමානො[13] ගච්ඡති සෙය්‍යථාපි පථවියං[11]. ආකාසෙ පි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙපි චන්දිමසූරියෙ[14] එවං මහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරිමසති[15] පරිමජ්ජති යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.

---

1. සෙය්‍යථාපි පන P. W.
2. අසිං කොසියං W. අසිකොසියා P.V.
3. පවා° P. W. S.
4. අඤ්ඤො P. W.
5. උද්ධරිතො S.
6. ආනෙඤ්ජ° P.
7. කායං ති න දිස්සති S.
8. °නිම්මිනනාය S.
9. °නිහරති B.
10. °පච්චඞ්ගං S.
11. පඨ° B. V.
12. °නිම්මුජ්ජං P. W.
13. අභෙජ්ජ° W.
14. °සූරියෙ B.
15. පරා° B. V. W.

" 'ඇවැත්නි, යම්සේ වනාහි පුරුෂයෙක් කඩුව කොපුවෙන් ඉවත් කරන්නේ ද ඔහුට මෙබඳු අදහසක් වන්නේය, එනම්: මේ කඩුවය, මේ (කඩු) කොපුවය, කඩුව අනිකෙක, කොපුව අනිකෙක, කොපුවෙන් කඩුව ඉවත්කරණ ලද්දේය කියායි.

" 'ඇවැත්නි, යම්සේ පුරුෂයෙක් සපියකු සැවයෙන් පහ කරන්නේද[1] (වෙන්කොට සලකන්නේද), ඕහට මේ සපීයාය, මේ සැවය, සපියා එකෙකි, සැව අනිකකි, සැවයෙන් සපියා වෙන්කරණ ලද්දේය යි වැටහීමක් ඇතිවන්නේය.

" 'ඇවැත්නි, එසේම භික්ෂුව මෙසේ සිත සමාධිගතවූ කල්හි, —පෙ— සිතින් උපදවන කය මැවීම පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට ඊට නමයි. හේ තෙමේ මේ කයින් රූ ඇති, සිතින් මවන ලද, සියලු අඟපසඟ ඇති, නොපිරිහුනු ඉන්ද්‍රිය ඇති වෙන කයක් මවයි.

63. " 'හේ තෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඩගණ රහිත වූ කල්හි, උප ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍ය භාවයට පැමිණි කල්හි, ඍද්ධිවිධි පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි (ඊට නැඹුරු කෙරෙයි). හේ තෙමේ නොයෙක් අයුරු ඇති ඍද්ධිවිධි වෙන් වෙන් කොට අනුභව කෙරෙයි. එකෙක්ව බොහෝ සේ වෙයි. බොහෝ සේ ව එකෙක් වෙයි. ප්‍රකට බවට, මුවහ බවට, අහසෙහි මෙන් බිත්තිය සරසට, පවුර සරසට, පර්වත සරසට නොගැටෙමින් යෙයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම් මතුවීම් කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබෙද ගමන් කෙරෙයි. පක්ෂියකු මෙන් අහසෙහි ද පලඟින් යෙයි. මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභාව ඇති සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි, බඹ ලොව තෙක් කයින් වසඟ බව පවත්වයි.

---

1. මෙසේ කරන්නේ සිතින් පමණකැයි අටුවායි.

64. සෙය්‍යථාපි ආවුසො දක්ඛො කුම්භකාරෙ වා කුම්භකාරන්තෙවාසී වා සුපරිකම්මකතාය මත්තිකාය යං යදෙව භාජනවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය. සෙය්‍යථා වා[1] පන ආවුසො දක්ඛො දන්තකාරො වා දන්තකාරන්තෙවාසී වා සුපරිකම්මකතස්මිං දන්තස්මිං යං යදෙව දන්තවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය. සෙය්‍යථා වා[1] පන ආවුසො දක්ඛො සුවණ්ණකාරෙ වා සුවණ්ණකාරන්තෙවාසී වා සුපරිකම්මකතස්මිං සුවණ්ණස්මිං යං යදෙව සුවණ්ණවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය[2]. එවමෙව ඛො ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[3] ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති[4] අභිනින්නාමෙති. සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති එකො පි හුත්වා බහුධා හොති —පෙ— ඉමෙපි චන්දිමසුරියෙ[5] එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරිමසති[6] පරිමජ්ජති. යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.[7]

65. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[3] දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති[4] අභිනින්නාමෙති. සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය[8] උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච.

66. සෙය්‍යථාපි ආවුසො පුරිසො අද්ධානමග්ගපටිපන්නො[9] සො සුණෙය්‍ය භෙරිසද්දම්පි මුදිඞ්ගසද්දම්පි[10] සඞ්ඛපණවදෙණ්ඩිමසද්දම්පි[11] තස්ස එවමස්ස: භෙරිසද්දො ඉතිපි මුදිඞ්ගසද්දො[10] ඉතිපි සඞ්ඛපණවදෙණ්ඩිමසද්දො[12] ඉතිපි. එවමෙව ඛො ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති[4] අභිනින්නාමෙති.

සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය[8] උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච.

---

1. සෙය්‍යථාපි පන° P. W.
2. අභිනිප්පාදෙය්‍ය W.
3. ආනෙජ්ජ° P.
4. °නිහරති B.
5. °සූරියෙ B.
6. පරා° B.
7. කායෙනෙව සං° W.
8. °මානුස° B. V. Pa.
9. °මග්ගප්පටි° B. V.
10. මුතිඞ්ග° P. W.
11. °දෙන්දිම° B; සඞ්ඛසද්දම්පි පණවසද්දම්පි දෙන්දිමස° S
12. සංඛසද්දෙ ඉතිපි පණවසද්දෙ ඉතිපි දෙන්දිමස° S.

64. "'ඇවැත්නි, දක්‍ෂ කුඹල්කරුවෙක් හෝ කුඹල් කරු අතවැසියෙක් හෝ යහපත් සේ පදම්කළ මැටියෙන් කැමති කැමති බඳුන් වගීයන් යම්සේ කරන්නේ ද, නිපදවන්නේ ද, ඇවැත්නි, දළ කැටයම් කරුවෙක් හෝ දළ කැටයම් කරුගේ අතවැසියෙක් හෝ සකස් කළ දළයෙහි යම්සේ කැමති කැමති දළකැටයම් වගීයක් කරන්නේද, නිපදවන්නේද; ඇවැත්නි දක්‍ෂ රන්කරුවෙක් හෝ රන්කරු අතවැසියෙක් හෝ පදම්කළ රණින් කැමති කැමති රන් අබරණ ජාතින් යම්සේ කරන් නේද, නිපදවන්නේද—ඇවැත්නි, එසේම භික්‍ෂුව සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත වූ කල්හි, කෙලශයන් පහ වූ කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍යභාවයට පැමිණි කල්හි, සෘද්ධිවිධි පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ නොයෙක් සෘද්ධිවිධි වෙන් වෙන් කොට අනුභව කෙරෙයි: එකෙක්ව බොහෝ සේ වෙයි, —පෙ— මේ මහත් සෘද්ධි ඇති, මහත් ආනුභාව ඇති, සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි. බඹලොව තෙක් කයින් වසඟබව කෙරෙයි.

65. "'හේ තෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වරවූ කල්හි, අඞ්ගණ රහිතවූ කල්හි, උපකෙලශයන් පහව ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍යභාවයට පැමිණි කල්හි, දිව්‍යශ්‍රොතඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි (ඊට නැඹුරු කෙරෙයි). ඒ භික්‍ෂුව පිරිසුදු වූ, මිනිස් බව ඉක්මවූ, දිව්‍ය ශ්‍රොතඥානයෙන් දිව්‍යමය වූද, මනුෂ්‍යමය වූ ද, දුරෙහි වූ ද සමීපයෙහි වූ ද දෙවැදෑරුම් ශබ්දයන් අසයි.

66. "'ඇවැත්නි, දික් මඟට පිවිසි පුරුෂයෙක් බෙර හඬද, මිහිඟු බෙර හඬද, සක්, පණාබෙර, ගැටබෙර හඬද යම්සේ අසාද, ඔහුට මේ බෙර හඬයයිද, මිහිඟුබෙර හඬයයිද, සක්, පණාබෙර, ගැටබෙර හඬ යයිද සිතෙන්නේය. ඇවැත්නි, එලෙසින්ම භික්‍ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසුදුවූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත වූ කල්හි, පහ වූ උපකෙලශ ඇති කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍යභාවයට පැමිණි කල්හි, දිව්‍යශ්‍රොතඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට ඊට නමයි. හේ තෙමේ මෙසේ පිරිසිදුවූ මිනිස්කණ ඉක්ම වූ දිව්‍ය ශ්‍රොතඥානයෙන් දිව්‍යමය වූ ද, මනුෂ්‍යමය වූ ද, දුරෙහි වූ ද, සමීපයෙහි වූ ද දෙවැදෑරුම් ශබ්දයන් අසයි.

67. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[7] චෙතොපරියඤාණාය චිත්තං අභිනීහරති[1] අභිනින්නාමෙති. සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති

සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති වීතරාගං[2] වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති සඞ්ඛිත්තං වා චිත්තං සඞ්ඛිත්තං චිත්තන්ති පජානාති වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

සෙය්‍යථාපි ආවුසො ඉත්ථි වා පුරිසො වා දහරො වා යුවා මණ්ඩනජාතිකො[3] ආදාසෙ වා පරිසුද්ධෙ පරියොදාතෙ අච්ඡෙ වා උදකපත්තෙ[4] සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො සකණිකං[5] වා සකණිකන්ති[5] ජානෙය්‍ය අකණිකං වා අකණිකන්ති[6] ජානෙය්‍ය. එවමෙව ඛො මහාලි භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— ආනෙඤ්ජප්පත්තෙ[7] චෙතොපරියඤාණාය චිත්තං අභිනීහරති[1] අභිනින්නාමෙති.

සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති—

සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති—පෙ—

අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

---

1. °ණිහරති B.
2. විත° B. (සබ්බත්ථ)
3. මණීඩනක° S.C.
4. උදප° W.
5. සකනි° B.
6. අකනි° B.
7. ආනෙඡ්ජ° P.

67. " 'හේ තෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත වූ කල්හි, පහවූ උපක්ලේශ ඇති කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍යභාවයට පැමිණි කල්හි, සිත් පිරිසිඳින ඥාණය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි (ඊට නැඹුරු කෙරෙයි). හේ තෙමේ අන්‍ය සත්ත්වයන්ගේ, අන්‍ය පුද්ගලයන්ගේ සිත(තමන් ගේ) සිතින් පිරිසිඳ දනියි.

" 'රාග සහිත සිත සරාග සිත යයි දනියි. රාගය පහ වූ සිත වීතරාග සිතයයි දනියි. ද්වේෂ සහිත සිත සද්වේෂ සිතයයි දනියි. ද්වේෂය පහවූ සිත වීතද්වේෂ සිතය යි දනියි. මෝහ සහිත සිත සමෝහ සිතය යි දනියි, මෝහය පහ වූ සිත වීතමෝහ සිත යයි දනියි. හැකුළුනු සිත හැකුළුනු සිතයයි දනියි, විසුරුණු සිත විසුරුණු සිතයයි දනියි. මහත් බවට ගිය සිත මහත් බවට ගිය සිතයයි දනියි. මහත්බවට නොගිය සිත මහත්බවට නොගිය සිත යයි දනියි. උතුරුසහිත (කාමාවචර) සිත උතුරුසහිත සිතයයි දනියි. අනුත්තර (රූපාවචර අරූපාවචර) සිත අනුත්තර සිත යයි දනියි. සමාධි ගත වූ සිත සමාධිගතවූ සිත යයි දනියි, සමාධිගත නො වූ සිත සමාධිගත නො වූ සිතය යි දැනගණී. (ක්ලේශයෙන්) මිදුනු සිත මිදුනු සිතයයි දැනගණී, නොමිදුනු සිත නොමිදුනු සිතයයි දැනගණී.

" 'ඇවැත්නි, සැරසෙන සුලු ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ දහරයෙක් හෝ තරුණයෙක් හෝ පිරිසිදු, නොකිලිටි කැඩපතෙක හෝ පිරිසිදු දිය බඳුනෙක්හි හෝ තමාගේ මුව නිමිත්ත (මුඛ ශෝභාව) පරීක්‍ෂා කරන්නේ, යම්සේ කැලල් සහිත නම් කැලල් සහිත යයි දැනගණීද, කැලල් රහිත නම් කැලල් රහිත යයි දැනගණීද,

" 'ඇවැත්නි, එසේම භික්‍ෂුව මෙසේ සිත එකඟ වූ කල්හි, සිත් පිරිසිඳින ඥාණය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ තෙමේ අන්‍ය සත්ත්වයන්ගේ, අන්‍ය පුද්ගලයන්ගේ සිත (තමන්ගේ) සිතින් පිරිසිඳ දනියි, සරාග සිත සරාග සිත යයි දනියි. —පෙ— නොමිදුනු සිත නොමිදුනු සිතයයි දැනගනියි.

68. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[1] පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති[2] අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙ-නිවාසං අනුස්සරති සෙය්‍යථීදං[3] එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසම්පි[4] ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි[5] ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ: අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උදපාදිං[6]. තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසං-වෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නො ති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

69. සෙය්‍යථාපි ආවුසො පුරිසො සකම්හා ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය තම්හාපි ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය. සො[7] තම්හා[8] ගාමා සකඤ්ඤෙව[9] ගාමං පච්චාගච්ඡෙය්‍ය.[10] තස්ස එවමස්ස: අහං ඛො සකම්හා ගාමා අමුං ගාමං අගච්ඡිං[11] තත්‍ර[12] එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හීඅහොසිං. තම්හාපි ගාමා අමුං ගාමං අගච්ඡිං[11]. තත්‍රාපි[12] එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හීඅහොසිං. සොම්හි තම්හා ගාමා සකඤ්ඤෙව[9] ගාමං පච්චාගතො[10] ති.

---

1. ආනෙජ්ජං P.
2. °නිහරති B.
3. සෙය්‍යථිදං B. V.
4. වීසතිම්පි P. W.
5. සතංපි ජාතියො සහස්සංපි ජා°– සතසහස්සංපි ජා° අනෙකෙපි S.
6. උප්පාදිං W.
7. P. W. සු සොති න දිස්සති.
8. තම්හාපි ගාමා P.
9. සකංයෙව B.P.
10. පච්ඡාං° P.
11. අගඤ්ජිං S. ආගඤ්ජිං P. ආගච්ඡිං Pa.
12. තත්‍රාහං B. S. තත්‍රාපි B. Pa. W

68. " 'හේ තෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඩගණ රහිතවූ කල්හි, උපක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කර්මණ්‍යවූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍යභාවයට පැමිණි කල්හි, පූර්වේනිවාසානුස්මෘතිඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට (ඊට) නමයි. හේ තෙමේ නොයෙක් විදියේ පෙර විසීම් සිහි කෙරෙයි. කෙසේදයත්: එක් ජාතියක් ද, දෙ ජාතියක් ද, තුන් ජාතියක් ද, සිවු ජාතියක් ද, පස් ජාතියක් ද, දස ජාතියක් ද, විසි ජාතියක් ද, තිස් ජාතියක් ද, සතළිස් ජාතියක් ද පණස් ජාතියක් ද, සියක් ජාතියක් ද, දහස් ජාතියක් ද, සියක් දහස් ජාතියක් ද, නොයෙක් සංවෘත කල්පයන් ද, නොයෙක් විවෘත කල්පයන් ද, නොයෙක් සංවෘත – විවෘත කල්පයන් ද 'අසුවල් තැන වීමි, මෙනම් ඇත්තෙම්, මේ ගොත්‍ර ඇත්තෙම්, මේ පැහැ ඇත්තෙම්, මේ අහර ඇත්තෙම්, මේ සැපදුක් වින්දෙමි, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතවූයෙම්, අසුවල් තැන උපන්මි; එහිදු මෙනම් ඇත්තෙම්, මේ ගොත්‍ර ඇත්තෙම්, මේ පැහැ ඇත්තෙම්, මේ අහර ඇත්තෙම්, මේ සැපදුක් වින්දෙම්, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතවූයෙම් මෙහි උපන්මි'යි මෙසේ ආකාර සහිතව, උද්දෙසීම් සහිතව, නොයෙක් විදියේ පෙර විසීම් සිහිකෙරෙයි.

69. " 'ඇවැත්නි, පුරුෂයෙක් යම්සේ තම ගමින් අන් ගමකට යන්නේ ද, ඒ ගමිනුත් අන් ගමකට යන්නේ ද, ඒ ගමිනුත් තමන්ගේ ගමට එන්නේ ද, 'මම සිය ගමින් අසුවල් ගමට ගියෙමි, එහි මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි, මෙසේ බිණීමි, මෙසේ තුෂ්ණීම්භූත වීමි; එගමිනුදු අසුවල් ගමට ගියෙමි, එහි ද මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි, මෙසේ බිණීමි, මෙසේ තුෂ්ණීම්භූත වීමි; ඒ මම ඒ ගමින් සිය ගමටම පැමිණියෙමි'යි හෙතෙම දන්නේද,

70. එවමෙව ඛො ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති[1] අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති— සෙය්‍යථීදං එකම්පි ජාතිං —පෙ— ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

71. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[2] සත්තානං චුතූපපාතඤාණාය[3] චිත්තං අභිනීහරති[1] අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[4] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ[5] සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා.[6] ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති[6]. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[4] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ[5] සත්තෙ පජානාති.

72. සෙය්‍යථාපි ආවුසො මජ්ඣෙ සිංඝාටකෙ පාසාදො[7] තත්ථ චක්ඛුමා පුරිසො ඨිතො පස්සෙය්‍ය මනුස්සෙ ගෙහං පවිසන්තෙපි නික්ඛමන්තෙපි රථියා[8] වීථිසඤ්චරන්තෙ[9] පි මජ්ඣෙ[10] සිංඝාටකෙ නිසින්නෙපි[11]. තස්ස එවමස්ස: එතෙ මනුස්සා ගෙහං පවිසන්ති එතෙ නික්ඛමන්ති එතෙ රථියා[8] වීථිසඤ්චරන්ති[12]. එතෙ[13] මජ්ඣෙ සිංඝාටකෙ නිසින්නාති.

---

1. °නිහරති B.
2. ආනෙජ්ජ° P.
3. චුතූප° B.
4. උප්පජ්ජ°. W.
5. °කම්මුපගෙ B.
6. උප්පන්නා W.
7. පාසාදෙ Pa.
8. රථියාපි රථිං සඤ්ච° V. රථියායපි B.
9. වීථි සං° P.W; විථිං සංරථි° B.S.V; වීතිසං° Ce; විදිසංචරන්තෙ Ch.B.
10. මජ්ඣෙපි P. W.
11. නිසින්නෙ P. W.
12. වීථිං P. W; විථිං° B. S. රථිං සං° V.
13. එතෙ මනුස්සා B.

70. " 'ඇවැත්නි, එපරිද්දෙන්ම භික්‍ෂුව මෙසේ සිත එකඟ වූ කල්හි, —පෙ— අකම්පයභාවයට පැමිණි කල්හි පූර්වේනිවාසානුස්මෘතිඥනය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ නොයෙක් පූර්වේනිවාස සිහි කෙරෙයි. කෙසේදයත්: එක් ජාතියක් ද, —පෙ— ආකාර සහිතව, උද්දෙසීම් සහිතව නොයෙක් විදියේ පූර්වේනිවාස සිහි කෙරෙයි.

71. "හෙතෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඩගණ රහිත කල්හි, උපක්ලේශ පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කර්මණ්‍යවූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්පයමානභාවයට පැමිණි කල්හි සත්ත්වයන්ගේ චුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි (ඊට නැඹුරු කෙරෙයි). හේ පිරිසුදු වූ, මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින්, චුතවන උපදින සත්ත්වයන් දකී. හීන ප්‍රණීත, සුවණී දුර්වණී, සුගත දුර්ගත, කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දනී: 'මේ පින්වත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්තයහ, වාග්දුශ්චරිතයෙන් යුක්තයහ, මනොදුශ්චරිතයෙන් යුක්තයහ, ආර්‍ය්‍යයන්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය, මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන් වූවෝය. ඔවුහු කාබුන්මරණින් මතු අපාය වූ, දුර්ගතිය වූ, විනිපාතය වූ, නිරයට පැමිණෙත්'; නැත හොත්,'මේ පින්වත් සත්ත්වයෝ කායසුචරිතයෙන් යුක්තයහ, වාක් සුචරිතයෙන් යුක්තයහ, මනඃ සුචරිතයෙන් යුක්තයහ, ආර්‍ය්‍යයන්ට නොබණින්නෝය, සම්‍යග්දෘෂ්ටිකයෝය, සම්‍යග්දෘෂ්ටිකර්ම සමාදන් වූවෝය. ඔවුහු කාබුන්මරණින් මතු සුගතිය වූ, ස්වර්ග ලෝකයට පැමිණියෝ'යි මෙසේ පිරිසුදු වූ, මිනිස් ඇස ඉක්ම වූ, දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී; හීන ප්‍රණීත, සුවර්ණී දුවණී, සුගත දුර්ගත, කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දනී.

72. " 'ඇවැත්නි, යම්සේ මංසලකාමැද පහයක් වේ ද, එහි ඇස් ඇති පුරුෂයෙක් සිටියේ ගෙට පිවිසෙන, ගෙයින් නික්මෙන, වීථියෙහි හැසිරෙණ, මංසල හිඳින මනුෂ්‍යයන් දකනේ ද, ඔහුට මෙසේ සිතෙයි: 'මේ මිනිස්සු ගෙට පිවිසෙති, මොහු නික්මෙති, මොහු වීථියෙහි හැසිරෙති, මොහු මංසල හිඳිති'යි කියායි.

73. එවමෙව ඛො ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ—පෙ—සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති[1] අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[2] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා[2]. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති.[2] ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[2] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

යො නු ඛො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති කල්ලං නු ඛො තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති?

යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති කල්ලං තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

74. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[3] ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති[1] අභිනින්නාමෙති.

සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයො ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධො ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධගාමිනීපටිපදා ති[4] යථාභූතං පජානාති. ඉමෙ ආසවා ති යථාභූතං පජානාති. අයං ආසවසමුදයො ති යථාභූතං පජානාති. අයං ආසවනිරොධො ති යථාභූතං පජානාති. අයං ආසවනිරොධගාමිනීපටිපදා ති යථාභූතං පජානාති.

---

1. නීහරති B. 2. උප්ප° W. 3. ආනෙජ්ජං P. 4. °ගාමිනිං B.

73. " 'ඇවැත්නි, එසේ ම භික්‍ෂුව මෙසේ සිත එකඟවූ කල්හි,—පෙ—සත්ත්වයන්ගේ චුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ මිනිස් ඇස ඉක්ම වූ දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී. 'මේ පින්වත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්තය, වාග්දුශ්චරිතයෙන් යුක්තය, මනොදුශ්චරිතයෙන් යුක්තය, ආර්‍ය්‍යයන්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය, මිථ්‍යාදෘෂ්ටිකර්‍ම සමාදන් වූවෝය. ඔවුහු කාබුන් මරණින් මතු අපාය වූ, දුගතිය වූ, විනිපාතය වූ, නිරයට පැමිණෙත්'. නැත හොත්, 'මේ පින්වත් සත්ත්වයෝ කායසුචරිතයෙන් යුක්තය, වාක්සුචරිත යෙන් යුක්තය, මනඃ සුචරිතයෙන් යුක්තය, ආර්‍ය්‍යයන්ට නොබණින්නෝ ය, සම්‍යග්දෘෂ්ටිකයෝය, සම්‍යග්දෘෂ්ටිකර්‍ම සමාදන් වූවෝය. ඔවුහු කාබුන් මරණින් මතු සුගතිය වූ; ස්වර්‍ග ලොකයට පැමිණියෝ'යි. මෙසේ පිරිසුදු වූ, මිනිස් ඇස ඉක්ම වූ දිව ඇසින් චුතවන, උපදින සත්ත්වයන් දකී; හීන ප්‍රණීත, සුවර්‍ණ දුර්වර්‍ණ, සුගත දුර්ගත, කර්‍මය ලෙස පැමිණි සත්ත්වයන් දනී.

" 'ඇවැත්නි, යම් පැවිද්දෙක් තෙමේ මෙසේ දනීද, මෙසේ දකීද, ඔහට ඒම ජීවය ඒම ශරීරයයි හෝ ජීවය අනිකක ශරීරය අනිකකැ යි හෝ යන මෙය කියන්නට වටීදැ'(යි ඇසීමි).

" 'ඇවැත්නි, යම් ඒ මහණෙක්තෙම මෙසේ දනීද, මෙසේ දකීද, එසේවූ ඥානදර්ශන ඇති මහණහට ඒම ජීවය ඒම ශරීර යයි හෝ ජීවය අනිකක ශරීරය අනිකකැ යි හෝ යන මෙය කියන්නට වටීය' (යි ඒ පැවිද්දෝ කීහ).

" 'ඇවැත්නි, මම වූ කලී මෙය මෙසේ දනිමි, මෙසේ දකිමි. එතකුදු වුවත් මම ඒම ජීවය ඒම ශරීරය යි හෝ ජීවය අනිකක ශරීරය අනිකකැ යි හෝ නොකියමි' (යි ඔවුන්ට දැන්වීමි).

74. " 'ඇවැත්නි, හේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඩගණ රහිත කල්හි, උපක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කර්‍මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍යමානභාවයට පැමිණි කල්හි ආශ්‍රවයන්ගේ ක්‍ෂයඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට නමයි.

" 'හේ තෙමේ මේ දුකයයි තතු ලෙස දැනගණී, මේ දුක් ඉපදීමේ හෙතුවය යි තතු ලෙස දැනගණී, මේ දුඃඛනිරොධයයි තතු ලෙස දැනගණී, මේ දුඃඛ නිරොධගාමී ප්‍රතිපදාව යයි තතු ලෙස දැනගණී, මේ ආශ්‍රවයෝයයි තතු ලෙස දැනගණී, මේ ආශ්‍රවසමුදයයි තතු ලෙස දැනගණී, මේ ආශ්‍රවනිරොධයයි තතු ලෙස දැනගණී, මේ ආශ්‍රවනිරොධගාමී ප්‍රතිපදාවයයි තතු ලෙස දැනගණී.

තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති භවාසවාපි චිත්තං විමුච්චති අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති[1] ඤාණං හොති. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති.

75. සෙය්‍යථාපි ආවුසො පබ්බතසඞ්ඛෙපෙ උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො. තත්ථ චක්ඛුමා පුරිසො තීරෙ ඨිතො පස්සෙය්‍ය සිප්පිසම්බුකම්පි[2] සක්ඛරකඨලම්පි[3] මච්ඡ-ගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පි. තස්ස එවමස්ස: අයං ඛො උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො. තත්‍රිමෙ සිප්පිසම්බුකා[2] පි සක්ඛරකඨලා[3] පි මච්ඡගුම්බාපි චරන්ති පි[4] තිට්ඨන්ති[5] පීති. එවමෙව ඛො ආවුසො භික්ඛු සමාහිතෙ චිත්තෙ —පෙ— ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති[6] අභිනින්නාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති —පෙ— අයං ආසවනිරොධගාමිනීපටිපදාති යථාභූතං පජානාති.

තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති භවාසවාපි චිත්තං විමුච්චති අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති.

යො ඛො[7] ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති කල්ලං නු ඛො තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති?

යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති න කල්ලං තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

ඉදමවොච භගවා. අත්තමනො ඔට්ඨද්ධො ලිච්ඡවි භගවතො භාසිතං අභිනන්දීති.

මහාලිසුත්තං නිට්ඨිතං ඡට්ඨං.

---

1. විමුත්තමිතීති B.
2. සිප්පික° B. S. සිප්පිය° V.
3. °කථ° B.
4. චරන්තාපි B. V.
5. තිට්ඨන්තා B. V.
6. °නිහරති B.
7. යො නු ඛො P. S. W.

" 'මෙසේ දක්නා මෙසේ දන්නා ඔහුගේ සිත කාමාශ්‍රවයන් කෙරෙන් ද මිදේ, භවාශ්‍රවයන් කෙරෙන් ද සිත මිදේ, අවිද්‍යාශ්‍රවයන් කෙරෙන් ද සිත මිදේ. මිදුනු කල්හි 'මිදුනේය' යන සිතවෙයි. 'ජාතිය ක්‍ෂය වීය, බ්‍රහ්මචය්‍ර්‍යය වැස නිමවන ලදී, කටයුතු කරණලදී, මේ අත්බැව්න් පසු අනික් අත්බවෙක් නැතැ'යි ද දැනගණී.

75. " 'ඇවැත්නි, යම්සේ පර්වත මස්තකයෙක පිරිසුදු, විප්‍රසන්න, නොකැළඹුනු, දිය විලක් වේ ද, එහි ඉවුරේ ඇස් ඇති පුරුෂයෙක් සිටියේ සිප්පිබෙල්ලන් හා සක්බෙල්ලන් ද, කැටකැබලිති ද, එහා මෙහා යන්නාවූ හා නැවති සිටින මසුන් රැන් ද, හැසිරෙන්නවුන් ද, නැවති තිබෙන දෑද දක්නේ ද, ඔහුට මෙසේ සිතෙන්නේය: 'මේ දිය විල පිරිසුදුය, අතිශයින් ප්‍රසන්නය, නොකැළඹුනේය. එහි මේ සිප්පි බෙල්ලන් හා සක් බෙල්ලන් ද, කැටකැබලිති ද, මසුන් රැන් ද හැසිරෙත්, නැවතී සිටිත්ය' කියායි. ඇවැත්නි, එලෙසින් ම භික්‍ෂුව මෙසේ සිත එකඟ වූ කල්හි, —පෙ— ආශ්‍රවක්‍ෂයඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට නමයි. හේ තෙමේ මේ දුකයයි තතු ලෙස දැනගණී, —පෙ— මේ ආශ්‍රව නිරොධගාමී ප්‍රතිපදාවයයි තතු ලෙස දැනගණී.

" 'මෙසේ දක්නා, මෙසේ දන්නා ඔහුගේ සිත කාමාශ්‍රවයන් කෙරෙන් ද, භවාශ්‍රවයන් කෙරෙන් ද මිදේ, අවිද්‍යාශ්‍රවයන් කෙරෙන්ද සිත මිදේ. මිදුනු කල්හි 'මිදුනේය' යන සිත වෙයි. 'ජාතිය ක්‍ෂය වීය, බ්‍රහ්මචය්‍ර්‍යය වැස නිමවන ලදී, කටයුතු කරණ ලදී, මේ අත්බැව්න් පසු අනික් අත්බවෙක් නැතැ'යි ද දැනගණී.

" 'ඇවැත්නි, යම් මහණෙක්තෙම මෙසේ දනීද, මෙසේ දකීද එබඳු වූ (රහත්) මහණහට 'එම ජීවය එම ශරීරය' යි හෝ 'ජීවය අනිකක, ශරීරය අනිකකැ'යි හෝ යන මෙය කියන්නට වටීදැ' (යි ඇසීමි).

" 'ඇවැත්නි, යම් ඒ මහණෙක් තෙම මෙසේ දනීද, මෙසේ දකීද ඒ රහත් මහණහට 'ඒම ජීවය ඒම ශරීරය'යි හෝ 'ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ'යි හෝ යන මෙය කියන්නට නොවටීය' (යි ඒ පැවිද්දෝ කීහ).

" 'ඇවැත්නි, මම වූකලී මෙය මෙසේ දනිමි, මෙසේ දකිමි. එතකුදුවුවත් මම 'ඒම ජීවය ඒම ශරීරය' යි හෝ 'ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැ' යි හෝ නොකියමි (යි ඔවුන්ට දැන්වීමි)." '

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාලසේක. සතුටු සිත් ඇත්තාවූ ඔට්ඨද්ධ (යයි ප්‍රසිද්ධ වූ මහාලි) ලිච්ඡවිතෙමේ භාග්‍ය-වතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්තේය.

සවැනි වූ මහාලි සූත්‍රය නිමියේය.

7. ජාලිය සුත්තං.

1. එවං මෙ සුතං: එකං සමයං භගවා කොසම්බියං විහරති ඝොසිතාරාමෙ. තෙන ඛො පන සමයෙන ද්වෙ[1] පබ්බජිතා මණ්ඩිස්සො[2] ච පරිබ්බාජකො ජාලියො ච දාරුපත්තිකන්තෙවාසී යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදිංසු. සම්මොදනීයං කථං සාරාණීයං[3] වීතිසාරෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො තෙ ද්වෙ පබ්බජිතා භගවන්තං එතදවොචුං: කිං නු ඛො ආවුසො ගොතම තං ජීවං තං සරීරං උදාහු අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති?

තෙනහාවුසො සුණාථ සාධුකං මනසිකරොථ භාසිස්සාමීති.

එවමාවුසොති ඛො තෙ ද්වෙ පබ්බජිතා භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

2. ඉධාවුසො තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි[4] සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා[5]. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං[6] කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති.

3. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ[7] පච්චාජාතො[8]. සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසංචික්ඛති: සම්බාධො ඝරාවාසො රජොපථො[9] අබ්භොකාසො පබ්බජ්ජා. නයිදං[10] සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සංඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති[11].

---

1. අථ ඛො මෙ P.
2. මුණ්ඩිසො V.
3. සාරණීයං B. V.
4. °සාරථි B. S.
5. භගවාති S.
6. සව්‍ය° P.
7. අඤ්ඤතරස්මිං වා පච්චා° W.
8. පච්ජා° S., පච්චා° Sa.
9. රජාපථො S. C. රජො° Sa. රජ° Pa.
10. න ඉදං C. P.
11. පබ්බජ්ජෙය්‍යන්ති P.

7. ජාලිය සූත්‍රය

1. මේ සූත්‍රය මා විසින් මෙසේ අසනලදි. එක්කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසඹෑනුවර ඝොසිතාරාමයෙහි වාසයකරණසේක. එ කල්හි මණ්ඩිස්ස නම් පරිබ්‍රාජකතෙමේ ද දාරුපත්තික නමැත්තහුගේ අතැවැසිවූ ජාලිය නම් පරිබ්‍රාජක තෙමේ ද භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළඹ භාග්‍යවතුන්වහන්සේ සමග සතුටු වූහ. සතුටුවියයුතුවූ, සිහි කටයුතුවූ කථා කොට නිමවා එක්පසෙක හිඳ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ: "කෙසේද, ඇවැත් ගෞතමයනි, ජීවයත් එයම ද, ශරීරයත් එයම ද? (දෙකම එකක් ද?) නොහොත් ජීවය අනෙකක් ද, ශරීරය අනෙකක් ද?"

"ඇවැත්නි, එසේ නම් අසව්, මනාකොට මෙනෙහි කරව්, කියන්නෙමි"(යි බුදුහු වදාළෝ).

"ආයුෂ්මත, එසේය," යි ඒ දෙපැවිද්දෝ භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළසේක:

2. "ඇවැත්නි, අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, (අෂ්ට) විද්‍යා (පස ළොස්) චරණධර්මයන්ගෙන් යුක්තවූ, යහපත්ගති ඇත්තාවූ, සියලු ලෝකයන් දන්නාසුලුවූ, ශ්‍රේෂ්ඨවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි රියැදුරෙකු වැනිවූ, දෙව්මිනිසුන්ට ශාස්තෲවූ, සිව්සස් දම් අවබොධ කළාවූ, භාග්‍යවත්වූ, තථාගත කෙනෙක් මෙලොව උපදනාහ. ඒ තථාගත තෙමේ දෙවියන් සහිත වූ, මාරයන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, මහණබමුණන් සහිතවූ, දෙව් මිනිසුන් (රජුන් හා මිනිසුන්) සහිතවූ, සත්ත්වවර්ගයා සවකීය විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කෙරේ. ඒ තථාගතයන් වහන්සේ මුල යහපත්වූ, මැද යහපත්වූ, කෙළවර යහපත්වූ අර්ථ සහිතවූ, (දශවිධ ව්‍යඤ්ජන නොපිරිහෙළා වදාරණ හෙයින්) ව්‍යඤ්ජන සහිතවූ, සියලු ලෙසින් සම්පූර්ණවූ, පිරිසිදුවූ, සකලශාසනමාර්ග බ්‍රහ්මචර්යාව ගෙන හැර දක්වති.

3. "ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපතිපුත්‍රයෙක් හෝ අන් කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක් හෝ අසයි. හෙතෙම ඒ දහම් අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කෙරෙයි. හෙතෙම ඒ ශ්‍රද්ධාලාභයෙන් යුක්ත වූයේ මෙසේ සලකන්නේය: ගෘහවාසය පීඩා සහිතයි. රාගාදි රජස් ගැවසි මාර්ගයෙකි. පැවිද්ද වනාහි අභ්‍යාකාසය මෙනි (කිසිවක් නොමැති අවකාශය මෙන් නිදහස්ය). ගිහිගෙයි වසන්නහු විසින් සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, සියලු ආකාර යෙන් පිරිසිදුවූ, සංඛලිඛිතවූ[1] (ලියවූ සකක් වැනි) මෙම බඹසර හැසිරෙන්ට නොහැක්කේය. මම කෙස් දැළිරැවුළු හරවා, කසාවත් හැඳ, ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වන්නෙම්නම් ඒකාන්තයෙන් ඉතා මැනවැ(යි කියායි).

---

1. දීඝනිකායේ පළමුවෙනි කාණ්ඩයේ උපග්‍රන්ථයේ x වෙනි පිට බලනු.

4. සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති[1]. සො[2] එවං පබ්බජිතො සමානො පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු[3] වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු කායකම්මවචීකම්මෙන[4] සමන්නාගතො කුසලෙන පරිසුද්ධාජීවො සීලසම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ[5] සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො සන්තුට්ඨො.

5. කථඤ්ච ආවුසො භික්ඛු සීලසම්පන්නො හොති? ඉධ ආවුසො භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති. ඉදම්පිස්ස හොති සීලස්මිං. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී[6] විරතො මෙථුනා ගාමධම්මා. ඉදම්පිස්ස හොති සීලස්මිං.

මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති[7] සච්චවාදී සච්චසන්ධො ථෙතො[8] පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. ඉදම්පිස්ස හොති සීලස්මිං. පිසුණං වාචං[9] පහාය පිසුණාය වාචාය පටිවිරතො හොති. ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය. අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා[10] සමග්ගාරාමො[11] සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති[12]. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. පබ්බජ්ජති P.
2. සො ඉති න දිස්සති P.
3. අනු° W
4. කායවචීක° Sa.
5. භොජනෙමත්තඤ්ඤූ ඉති P. Sa. C සු න දිස්සති.
6. අනාචාරී B.
7. පටිවිරතො හොති සමණො ගොතමො P.
8. ඪෙතො S; ථෙතො Sa.
9. පිසුණාවාචං P. W.
10. අනුප්පා° P.
11. සමග්ගරාමො B. Ca.
12. හොතීති න දිස්සති P.

4. ''හෙතෙම පසු කාලයෙක සවල්පවූ හෝ බොහෝවූ භොග රැශිය හැර, සවල්පවූ හෝ බොහෝවූ නෑපිරිස් හැර, කෙස් දැළිරැවුලු හරවා, කසාවසත්‍රයෙන් හැඳ, ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වේ. මෙසේ පැවිදිවූ හෙතෙම පාතිමොක්ඛ-සංවරයෙන් යුක්ත වූයේ, ආචාර ගොචර දෙකින් යුක්ත වූයේ, සවල්පවූත් අකුසල් විෂයෙහි භය දක්නාසුලු වූයේ, යහපත්වූ කාය වාක් කර්මයෙන් යුක්ත වූයේ, ශික්ෂාපද සමාදන්ව එහි මොනවට හික්මෙයි; පිරිසිදුවූ දිවි පැවැතුම් ඇත්තේ වෙයි; (ත්‍රිවිධ) ශීලයෙන් යුක්තවූයේ වෙයි; ඉන්ද්‍රියවිෂයෙහි වැසූ දොරටු ඇත්තේ වෙයි; බොජුනෙහි පමණ දන්නේ වෙයි; මනා සිහියෙන් හා සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයි; (සිව්පසය පිළිබඳ යථාලාභ) සන්තොෂයෙන් යුක්ත වෙයි.

5. ''ඇවැත්නි, මහණ තෙමේ කෙසේනම් සීලසම්පන්න වේද? ඇවැත්නි, මේ සස්නෙහිවූ මහණතෙමේ ප්‍රාණවධය හැර ඉන් වැළැක්කේ වේ; බහා තබන ලද දඬු ඇත්තේ, බහා තබන ලද අවි ඇත්තේ, පව් කිරීමෙහි ලජ්ජා ඇත්තේ, කරුණාවත් වූයේ, සියලු ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පිව වෙසේ. මෙසේ මේ (ප්‍රාණ වධයෙන් වෙන්වීමේ සීලය) ද ඒ මහණහුගේ එක් සීලයක් වේ.

''(හෙතෙම) නොදුන් දෙය ගැනීමෙන් වෙන්ව, එයින් විශෙෂයෙන් වැළැක්කේ, දුන් දෙයම ගන්නේ, දුන් දෙයම කැමැති (බලාපොරොත්තු) වන්නේ, සොර නොවූ, පිරි-සිදුවූ (ආත්මභාවයෙන්) සිතින් යුක්තව වාසය කෙරේ. මෙසේ ඒ (අදත්තාදානයෙන් වෙන්වීමේ සීලය) ද ඒ මහණහුගේ එක් සීලයෙකි. අබ්‍රහ්මචර්‍ය්‍යාව හැර, බඹසර නොවන හැසිරීමෙන් දුරුවූ පැවතුම් ඇත්තේ, ස්ත්‍රීපුරුෂසංසර්ගය නම්වූ ග්‍රාම-ධර්මයෙන් වෙන් වූයේ බ්‍රහ්මචාරී වේ. මෙසේ ඒ (කාමාසවාද විරතිය පිළිබඳවූ සීලය) ද ඒ මහණහුගේ සීලයෙකි.

''බොරු කීමෙන් දුරුව, ඉන් විශෙෂයෙන් වැළැක්කේ, සැබෑ තෙපුල් කියන්නේ, සැබැවින් සැබව ගළපන සුලුවූයේ, ස්ථිර කථා ඇත්තේ, ඇදහිය යුතු තෙපල් ඇත්තේ, ලෝකයා අතර විරුද්ධ කථා ඇති නොකෙරේ. මෙසේ (බොරු කීමෙන් වැළකීම) ද ඒ මහණහුගේ සීලයෙකි. පිසුණු බස් හැර, ඉන් වෙසෙසින් වැළැක්කේය. මෙතැනින් අසා මොවුන් බිඳවීම පිණිස එතැන නොකියන සුලුවූයේය. එතැනින් අසා මොවුන් බිඳවීම පිණිස මෙතැන නොකියන සුලුවූයේය. මෙසේ හෙද වූවන් ගළපන්නේ, සමගිවූවන්ගේ සමගිය තහවුරු කිරීමට අනුබල දෙන්නේ, සමගියෙහි ඇලුම් බහුල කොට ඇත්තේ, සමගිකම්හි ඇලුනේ, සමගිකම්හි සතුටුවන සුලුවූයේ, සමගිය ඇති කරණ තෙපුල් කියන්නේය. මේ ද ඒ මහණහුගේ සීලයෙකි.

ඵරුසං[1] වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති. යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා[2] හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා තථාරූපං[3] වාචං භාසිතා හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා හොති[4] කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං[5]. ඉදම්පිස්ස හොති සීලස්මිං.

6. බීජගාමභූතගාමසමාරම්භා[6] පටිවිරතො හොති[7]. එකභත්තිකො හොති රත්තූපරතො[8] පටිවිරතො[9] විකාලභොජනා. නච්චගීතවාදිතවිසූකදස්සනා[10] පටිවිරතො හොති. මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතො හොති. උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ජාතරූපරජතපටිග්ගහණා[11] පටිවිරතො හොති. ආමකධඤ්ඤපටිග්ගහණා[11] පටිවිරතො හොති. ආමකමංසපටිග්ගහණා[11] පටිවිරතො හොති. ඉත්ථිකුමාරිකපටිග්ගහණා[11] පටිවිරතො හොති. දාසිදාසපටිග්ගහණා[11] පටිවිරතො හොති. අජෙළකපටිග්ගහණා[11] පටිවිරතො හොති. කුක්කුටසූකරපටිග්ගහණා[11] පටිවිරතො හොති. හත්ථිගවාස්සවලවාපටිග්ගහණා[12] පටිවිරතො හොති. ඛෙත්තවත්ථුපටිග්ගහණා[11] පටිවිරතො හොති. දූතෙය්‍යපහිණගමනානුයොගා[13] පටිවිරතො හොති. කයවික්කයා පටිවිරතො හොති. තුලාකූටකංසකූටමානකූටා[14] පටිවිරතො හොති. උක්කොටනවඤ්චනනිකතිසාචියොගා[15] පටිවිරතො හොති. ඡෙදනවධබන්ධනවිපරාමොසආලොපසහසාකාරා[16] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

7. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං බීජගාමභූතගාමසමාරම්භං[17] අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං[18] මූලබීජං ඛන්ධබීජං ඵළුබීජං[19] අග්ගබීජං බීජබීජමෙව[20] පඤ්චමං— ඉති[21] එවරූපා බීජගාමභූතගාමසමාරම්භා[22] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ඵරුසාවාචං P. W.
2. පෙමනියා B.
3. °රූපිං P.
4. හොතීති න දිස්සති. P.
5. °සඤ්හිතං B.
6. °සමාරබ්භා B. V.
7. හොති—පෙ—එක° B. V.
8. රත්තූපරතො B.
9. විරතො P. S. C.
10. °විසුක° B.
11. °ජපටිග්ගහණ V. (සබ්බත්ථ)
12. °ගවස්ස° B.V. °වලව° V.W. °වළව° B.
13. °පහීණ° W.
14. °කූට° B.
15. °සාචි° B. V.
16. °සහස° B.
17. °සමාරබ්භං V.
18. සෙය්‍යථිදං B. V. (සබ්බත්ථ)
19. ඵල° S. ඵලු° C.,P.
20. බීජබීජං එව B.S.V.
21. ඉති වා ඉති V. S.
22. °සමාරබ්භා V.

"එරුෂ වචනය හැර ඉන් වෙසෙසින් වැළැක්කේ, යම් වචනයක් නිදෙස් වේද, කන්කලු ද, අර්‍ථ වශයෙන් ප්‍රෙමණීයද, මනාපෙස් සිතට වදනා හෙයින් සිත්කලු ද, පුරවාසීන්ගේ කථාමෙන් යහපත් ද, බොහෝ දෙනාට ප්‍රිය ද, බොහෝ දෙනාගේ මන වඩන්නේ ද, එබඳු තෙපුල්ම කියන්නේ වේ. මෙසේ (ඒ රළුවචනයෙන් වෙන්වීම ද) ඒ මහණහුගේ එක් සීලයෙකි. හිස්වූ ප්‍රලාප කථා හැර ඉන් වෙසෙසින් වැළැක්කේ, කාල යට සුදුසු කථා කරන්නේ, සිදුවූ (සැබෑවූ) තෙපුල්ම කියන්නේ- අර්‍ථයෙන් යුක්තවූ, (නවලොවුතුරු) දහම් ඇසුරු කළ, විනය ඇසුරු කල තෙපුල් කියන්නේ, සුදුසු කල්හි, උපමා හා කරුණු සහිතවූ, (පරිච්ඡේද) සීමා ඇති, අර්‍ථ හෙවත් අභිවෘද්ධියෙන් යුත්, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේ. මෙසේ ඒ (හිස්කථාවෙන් වැළැක්ම) ද ඒ මහණහුගේ එක් සීලයෙකි.

6. "තණ, ගස්, වැල්[1] සිඳීම් බිඳීම් ආදි විකොපනයෙන් වැළැක්කේ, එක් වේලේ වළඳන බොජුන් ඇත්තේ, රාත්‍රි- භොජනයෙන් හා විකල් බොජුනෙන් වැළැක්කේය. නැටීම්, ගී කීම්, බෙර ආදිය වැයීම්, විසුලු දැකීම් යන මෙයින් වැළැක්- කේය. මල්, ගඳ, විලවුන් පැළඳීම, ඉන් සැරසීම, උනුතැන් පිරවීමෙන් අලඞ්කාර කිරීම යන මෙයින් වැළැක්කේය. උස් අසුන් මහ අසුන් යන මෙයින් වැළැක්කේය. රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් වැළැක්කේය. අමුවූ ධාන්‍ය වර්‍ග පිළිගැන්මෙන් තොරවූයේ, අමුමස් පිළිගැන්මෙන් තොරවූයේ ද ස්ත්‍රීන් හා කුමරියන් පිළිගැන්මෙන් තොරවූයේද වේ. දාසිදසුන් පිළිගැන්මෙන් තොර වූයේ, එළුවන් හා නිරළුවන් පිළිගැන්මෙන් තොර වූයේ, කුකුළන්, හූරන්, ඇතුන්, ගවයන්, අසුන්, වෙළඹුන්, කෙත්, වත්, යන මේ පිළිගැන්මෙන්ද තොර වූයේය. ගිහීන්ගේ දූත මෙහෙවරය, ගෙන්ගෙට යන පහත් මෙහෙවරය යන මෙයින් වැළැක්කේය. ගනු දෙනු කිරීමය, තුලා ආදියෙන් වඤ්චා කිරීමය, රන් හා නොරන් මුසුකොට වඤ්චා කිරීමය, වී ආදිය මැනීමෙන් වඤ්චා කිරීමය, හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය, උපායෙන් අනුන් රැවටීමය, යකඩ ආදි ලොහ රන් රිදී යයි අඟවා වඤ්චා කිරීමය, නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයොගය යන මෙයින් වැළැක්කේය. කැපීමය, මැරීමය, බැඳීමය, සැඟවී සිට වස්තු පැහැර ගැන්ම (මංකොල්ල)ය, නියම්ගම් ආදිය පැහැරීමය, බලාත්කාර- කමින් වස්තු පැහැරගැන්මය යන මෙයින් ද වැළැක්කේය. මේ (විරතිය) ද ඒ මහණහුගේ එක් සීලයෙකි.

7. "ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් අනුභව කොට මූලබීජය, ඛන්ධබීජය, එළු (පුරුක්) බීජය, දලු (අග්‍ර) බීජය, පස්වැනිවූ බීජබීජය යන මේ බීජගාම- භූතගාමසමාරම්භයෙහි යෙදී වෙසෙත්. (මෙබඳු වූ බීජගාම භූතගාමයන් සිඳීම් බිඳීම් ආදියෙන් වැළැක්කේ වේ නම්) මෙද ඒ මහණහුගේ එක් සීලයක් වේ.

---

1. දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ උපග්‍රන්ථයේ x වෙනි පිට බලනු.

8. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං සන්නිධිකාරපරිභොගං අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං අන්නසන්නිධිං[1] පානසන්නිධිං වත්ථසන්නිධිං යානසන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං— ඉති වා ඉති එවරූපා සන්නිධිකාරපරිභොගා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

9. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං[2] අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීදං නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වෙතාලං[3] කුම්භථූනං[4] සොභනගරකං[5] චණ්ඩාලං වංසං ධොපනං[6] හත්ථියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං[7] උසභයුද්ධං අජයුද්ධං මෙණ්ඩයුද්ධං[8] කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යොධිකං බලග්ගං සෙනාබ්‍යූහං අනීකදස්සනං[9] — ඉති වා ඉති එවරූපා විසූකදස්සනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

10. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං ජූතප්පමාදට්ඨානානුයොගං[10] අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීදං[11] අට්ඨපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං[12] ඛලිකං ඝටිකං සලාකහත්ථං අක්ඛං පඞ්ගචීරං වඞ්කකං[13] මොක්ඛචිකං චිඞ්ගුලකං[14] පත්තාළ්හකං[15] රථකං ධනුකං අක්ඛරිකං මනෙසිකං[16] යථාවජ්ජං— ඉති වා ඉති එවරූපා ජූතප්පමාදට්ඨානානුයොගා[17] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. °නිධි S. (සබ්බත්ථ)
2. විසූකං° B.
3. වෙතාළං B. S. V.
4. කුම්භට්ඨූණං B. S. °ථූණං W.
5. සොභනකරකං W. C.
   සොභනඝරකං V.
6. ධොවනං S.
7. මහිංස° B.
8. මෙණ්ඩක° B. P. W
9. අනික° B.
10. ජූතපමාද° P.
11. සෙය්‍යථිදං B. V. (සබ්බත්ථ)
12. පන්ති° V.
13. වඞ්කං Va.
14. චිඞ්ගුලිකං B.V.P.
15. පත්ථා° B. V.
16. මානෙ° S; මනො°Sa.
17. ජූතපමාද° P.

8. "එසේම යම් ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් අනුභව කොට ආහාර වශී දෙවෙනි දිනට තබා ප්‍රයොජන ගැන්මය, පාන වශී දෙවෙනි දිනට තබා ප්‍රයොජන ගැන්මය, නොඉටන ලද සිවුරු ආදිය එසේ තැන්පත් කොට තැබීමය, යාන සංඛ්‍යාත වහන් තබා එසේ ප්‍රයොජන ගැන්මය, දෙකකින් වැඩි සයන ලැබ පසුවට තබා ප්‍රයොජන ගැන්මය, සුගන්ධයන් ලැබ එලෙස තබා ප්‍රයොජන ගැන්මය, තල සහල් ආදි ආමිසයන් තැන්පත් කොට තබා ප්‍රයොජන ගැන්ම යයි කියන ලද සන්නිධිකාරපරිභොගයෙහි යෙදී වෙසෙත්. මෙබඳුවූ සන්නිධිකාරපරිභොගයෙන් වැළකී වෙසේ නම් මෙද ඒ මහණහුගේ එක් සීලයක් වේ.

9. "එසේම යම් ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා, නැටීමය, ගී කීමය, බෙර ආදිය වැයීමය, රඟමඬුලු සැරසීමය, (රාමායනාදි) කථා ඇසීමය, කයිතාලම් හා අත්ලෙන් අත්ල ගැසීමය, මන්ත්‍ර පිරවීමෙන් මළමිනී නැංවීමය, සතරැස් හෝ කළබෙර ගැසීමය, ශොභන (ප්‍රතිභාන) චිත්‍ර විචිත්‍රය,[1] සණ්ඩෙවුන් කෙළිය, හුණගස් ඔසවා නැටීමය, මිනීඇට සෝදා තැබීමය, ඇතුන් හා යුද කිරීමය, අසුන් හා යුද කිරීමය, මීවුන් හා යුද කිරීමය, උසභයන් හා යුද කිරීමය, අජයුද්ධය, මෙණ්ඩක යුද්ධය, කුක්කුට යුද්ධය, වට්ටක යුද්ධය, දණ්ඩ යුද්ධය, තොරතුරු ඇසීමය, මල්ලව යුද්ධය, (සාමාන්‍ය) යුද්ධය, ඇත් අස් ආදීන් ගණන් කිරීමය, සෙනාසන්නිවෙසය, ඇත් අස් ආදීන් දැකීමය, යන විපරිත දර්ශනයෙහි යෙදී වෙසෙත්. මෙසේ මෙබඳුවූ විසුලු දැක්මෙන් වැළකේ නම් මෙද ඒ මහණහුගේ එක් සීලයක් වේ.

10. "එසේම යම් ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා (දූ පෝරු ආදියෙහි කෙළීම්වූ) අට්ඨපද ක්‍රීඩාවය, දශපද ක්‍රීඩාවය, දූ පෝරු ආදියෙහි මෙන් ආකාශයෙහි ක්‍රීඩා කිරීමය, බිම මණ්ඩල වශයෙන් සාදා පැන පැන ක්‍රීඩා කිරීමය, දූ කැට නොසොල්වා නියෙන් ගසා ක්‍රීඩා කිරීමය, පසඇටින් දදු කෙළීමය, සිං කෙළීමය, භිත්ති ආදියෙහි ඉරටපිටි ගසා ඇත් අස් ආදි රූප දක්වා කෙළීමය, පන්දු කෙළීමය, පත් කුලල් පිඹීමය, ගම් දරුවන් මෙන් ක්‍රීඩා නඟුල් ගෙන සීසෑම් ව්‍යාජයෙන් කෙළීමය, කරනම් ගැසීමය, තල්පත් ආදියෙන් කත්නත්ගුරුවා තනා ක්‍රීඩා කිරීමය, කොළ නැළියෙන් වැලි ආදිය මැන කෙළීමය, කුඩා රථයෙන් කෙළීමය, කුඩා දුන්නෙන් කෙළීමය, අහසෙහි හෝ පිටෙහි හෝ අකුරු ඇඳ කෙළීමය, සිතූ දේ කියවීම් කීම් ආදියෙන් කෙළීමය, (ගොළු බිහිරි ආදීන්ගේ) ඒ ඒ දොෂ රූප දක්වා කෙළීමය, යන මෙබඳුවූ ප්‍රමාදයට කාරණාවූ දූ කෙළීමෙහි යෙදී වාසය කෙරෙත්. මෙසේ මෙ බඳුවූ දූ කෙළියෙන් වැළැක්කේ නම් මෙද ඒ මහණහුගේ එක් සීලයෙකි.

---

1. දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ 15 වෙනි පිටේ අධොලිපිය බලනු.

11. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං උච්චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති – සෙය්‍යථීදං ආසන්දිං පල්ලඞ්කං ගොනකං[1] චිත්තකං පටිකං පටලිකං තූලිකං[2] විකතිකං උද්දලොමිං එකන්තලොමිං කට්ටිස්සං[3] කොසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං[4] අස්සත්ථරං[4] රථත්ථරං[4] අජිනප්පවෙණිං කාදලිමිගපවරපච්චත්ථරණං[5] සඋත්තරච්ඡදං උභතොලොහිතකූපධානං— ඉති වා ඉති එවරූපා උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

12. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං මණ්ඩනවිභූසනට්ඨානානුයොගං[6] අනුයුත්තා විහරන්ති-සෙය්‍යථීදං[7] උච්ඡාදනං පරිමද්දනං නහාපනං[8] සම්බාහනං ආදාසං අඤ්ජනං මාලා විලෙපනං[9] මුඛචුණ්ණකං[10] මුඛාලෙපනං[11] හත්ථබන්ධං[12] සිඛාබන්ධං දණ්ඩකං[13] නාළිකං[14] ඛග්ගං[15] ඡත්තං චිත්‍රූපාහනං උණ්හීසං මණිං වාලවීජනිං[16] ඔදාතානි වත්ථානි දීඝදසානි— ඉති වා ඉති එවරූපා මණ්ඩනවිභූසනට්ඨානානුයොගා[6] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

13. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං තිරච්ඡානකථං අනුයුත්තා විහරන්ති—සෙය්‍යථීදං[7] රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං පුරිසකථං [කුමාරකථං කුමාරිකථං][17] සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානකථාය පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ගොණකං S. C.
2. තූලිකං B.
3. කට්ටි° B. V. කටි° S.
4. °ත්ථරණං B. V.
5. කදලි° B.P.V. කාදල° W.
6. °විභූ° P. °විභූසණ° W.
7. සෙය්‍යථිදං B. V.
8. න්හාපනං B. V.
9. මාලාගන්ධවි° S. B.
10. මුඛචුණ්ණං S. B. V.
11. මුඛලෙපනං B. V.; °විලෙපං S. මුඛාලෙපං Sa
12. °බද්ධං W.
13. දණ්ඩං B. S. V.
14. නාලිකං W.; නාලකං V.
15. අසිං V; අසිං ඛග්ගං S.
16. වාල° P. W.
17. ඉදං මරම්මපොත්ථකෙසු යෙව දිස්සති

11. "එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, දික්හගලා පුටුය, පලස්ය, සතරඟුලෙත් දිග ලොම් ඇති ඇතිරිය, විසිතුරු එළු ලොම් ඇති ඇතිරිය, එළු ලොම්මුවා සුදු ඇතිරිය, එළු ලොම්මුවා ඝනපුප් ඇතිරිය, සිංහාදි රූපයෙන් විසිතුරු එළු ලොම් ඇතිරිය, එක් පිට ලොම් ඇති එළු ලොම් ඇතිරිය, දෙපිට ලොම් ඇති එළු ලොම් ඇතිරිය, රත්කසුකම් කොට කැටි තිහිරි හුයින් කළ පසතුරුණුය, එක්විට නිළියන් සොළොස්දෙනා කෙළනා එළු ලොම් මුවා මහ ඇතිරිය, ඇතුන් පිට අතුරණ ඇතිරිය, අසුන් පිට අතුරණ ඇතිරිය, රථ පිට අතුරණ ඇතිරිය, අඳුන් දිවිසමින් කළ පසතුරුණුය, කදලිමුව සමින් කළ උතුම් පසතුරුණුය, දෙපස තබන ලද රත්කන්වයින් ඇති ආසනය, යන මෙබඳු උස් අසුන් මහ අසුන් පරිභොග කෙරෙත්. මෙසේ මෙබඳු වූ උසසුන් මහ අසුන්හි හිඳීම් ආදියෙන් වැළැක්කේ නම් මෙද ඒ මහණහුගේ එක් සීලයෙකි.[1]

12. "එසේම යම් ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා, ඇඟ සුවඳ ඉලීමය, පිරිමැදීමය, නැවීමය, මැඩීමය, කැඩපත් පරිහරණය, අඳුන් තෙල් පරිහරණය, මල් හා විලවුන්, මූවසුණු, මුඛාලෙප, හස්තාභරණ යන මෙ දේ දැරීම හා පැළඳීමය, රන් හු ආදියෙන් සිබා (කුඹුම්බි) බැඳීමය, විසිතුරු දඬු ගෙන හැසිරීමය, බෙහෙත් නළ දසරු වෙහි එල්වාගෙන ඇවිදීමය, කඩු උරෙහි එල්වා ගෙන ඇවිදීමය, ඡත්‍රධාරීව ඇවිදීමය, විසිතුරු වහන් පයලා ඇවිදීමය, නලල්-පට බැඳීමය, සිබාමාණික්‍ය පැළඳීමය, වල්විදුනා දැරීමය, දික්වූ දහවලු ඇති සුදුවත් ඇඳීමය යි මෙසේ වූ සැරසීම් හා උතුතැන් පිරවීමෙහි නිතර නිතර යෙදෙත්. මෙබඳු වූ සැරසීම්, අලඞ්කාර කිරීම් ආදියෙහි යෙදීමෙන් වැළැක්කේ නම් මෙද ඒ මහණහුගේ එක් සීලයකි.

13. "එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ—මහ ඇමතියන් පිළිබඳ—සේනා පිළිබඳ—භය පිළිබඳ—යුද පිළිබඳ—ආහාර පිළිබඳ—පාන වර්ග පිළිබඳ—වස්ත්‍ර පිළිබඳ—සයන පිළිබඳ—මාලා—ගන්ධ ද්‍රව්‍යයන්—නෑයන්—යානාවන්—ගම්—නියම්ගම්-නුවර-දනව්—ස්ත්‍රීන්—පුරුෂයන්—[කුමරකුමරියන්]—යොධයන්—වීථි—ඝටවෙටිකාවන් හෝ තීර්ථයන්—මළ නෑයන් යන ආදීන් පිළිබඳ කථාය, නොයෙක් ආකාරවූ ව්‍යර්ථ කථාය, ලොකාඛ්‍යායික (විතණ්ඩ) කථාය, මුහුද පිළිබඳ කථාය, භවාභව කථාය යන මෙබඳු තිරිසන් කථාවෙහි යෙදී වෙසෙත්. මෙබඳු වූ තිරච්ඡානකථාවෙන් වැළැක්කේ නම් මෙද ඒ මහණහුගේ එක් සීලයෙකි.

---

1. මෙහි ඇතුළත් දේ ගැණ ඇතැම් තොරතුරු දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ බ්‍රහ්මජාල සූත්‍රයෙන් බලා දත යුතුයි.

14. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විග්ගාහිකකථං අනුයුත්තා විහරන්ති— සෙය්‍යථීදං[1] න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි, අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡාපටිපන්නො ත්වමසි අහමස්මි සම්මාපටිපන්නො. සහිතං මෙ අසහිතං තෙ. පුරෙ වචනීයං පච්ඡා අවච පච්ඡාවචනීයං පුරෙ අවච. අවිචිණ්ණං[2] තෙ විපරාවත්තං ආරොපිතො තෙ වාදො නිග්ගහීතොසි[3] චර වාදප්පමොක්ඛාය නිබ්බෙඨෙහි වා සචෙ පහොසීති—ඉති වා ඉති එවරූපාය විග්ගාහිකකථාය පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

15. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං දූතෙය්‍ය-පහිණගමනානුයොගමනුයුත්තා විහරන්ති— සෙය්‍යථීදං[1] රඤ්ඤං රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං කුමාරානං: ඉධ ගච්ඡ අමුත්‍රාගච්ඡ ඉදං හර අමුත්‍ර ඉදං ආහරාති— ඉති වා ඉති එවරූපා දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

16. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ කුහකා ච හොන්ති ලපකා ච නෙමිත්තිකා[4] ච නිප්පෙසිකා ච ලාභෙන[5] ලාභං නිජ්ගිංසිතාරො[6] ච[7]— ඉති[8] වා ඉති එවරූපා කුහනලපනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. සෙය්‍යථිදං B. V.
2. ආචිණ්ණං W. C.
3. නිග්ගහීතො ත්වමසි B V. නිග්ගහීතොසි P.W.
4. නිමිත්තකා Sa.
5. ලාභෙන ච ලාභං S.
6. නිජිගිසිතාරො B.
7. ච ඉති න දිස්සති P.S.W.
8. ඉතිඑවං P. W.

14. "එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා 'ඔබ මේ ධම්විනය නොදන්නෙහිය, මම මේ ධම්විනය දනිමි.' 'ඔබ මේ ධම්විනය කුමකැයි දන්නෙහි ද? ඔබ වරදවා පිළිපන්නෙහිය, මම මනාකොට පිළිපන්නේ වෙමි.' 'මාගේ වදන් සිලිටුය හෝ අර්ථ සහිතය, ඔබගේ වචනය එසේ නොවෙයි.' 'පළමු කිය යුත්ත පසුව කියෙහිය, පසුව කිය යුත්ත පළමුව කියෙහිය, යමක් ඔබ බොහෝ කල් පුරුදු කරණ ලද නම් ඒ සියල්ල ව්‍යර්ථ විය. ඔබට වාදාරොපනය කරණ ලදී; නිග්‍රහ කරණ ලද්දෙහිය (වාදයෙන් පැරදුනෙහිය). වාදයෙන් මිදෙනු පිණිස ක්‍රියා කරව. ඉදින් හැක්කෙහි නම් වාදයෙන් ගැළවෙව හෙවත් ඒ නිෂේධනය කරව' යන ආදී විග්‍රාහික හෙවත් දොෂාරොපණ කථාවෙහි යෙදී වෙසෙත්. මෙසේ මෙබඳු විග්‍රාහික කථාවෙන් වැළැක්කේ නම් මෙද ඒ මහණහුගේ එක් ශීලයෙකි.

15. "එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, රජුන්ගේ, රජමහ ඇමතියන්ගේ, ක්‍ෂත්‍රියයන්ගේ, බමුණන්ගේ, ගැහැවියන්ගේ සහ කුමරුන්ගේද හසුන් ගෙණ, 'මෙතනින් අසවල් තැනට යා, අසවල් තැනින් මෙහි එව, මෙය ගෙණ යා, එතැනින් අසවල් දෙය ගෙණෙව' යි (ඇණවන ලදුව) දූතභාවයෙහි හා හසුන් ගෙණ යැමෙහි යෙදී වෙසෙත්. මෙබඳු දූත භාවය, හසුන් ගෙණයෑම යන මෙයින් වැළැක්කේ නම් මෙද ඒ මහණහුගේ එක් ශීලයෙකි.

16. "එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා, කුහකයෝ ද, සිව්පසය උදෙසා කථා කරන්නෝ ද, නිමිතිකරන්නෝ නොහොත් ලාභ සත්කාර සඳහන් කරවන්නෝ ද, පරලාභාදිය උදෙසා කියන්නෝ ද,[1] ලාභයකින් ලාභයක් සොයන්නෝ ද වෙත්. මෙබඳු වූ කුහනලපනාදියෙන් වැළැක්කේ වේ නම් මෙද ඒ මහණහුගේ එක් ශීලයෙකි.

---

1. දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ 21 වෙනි පිටේ 1 වෙනි අධොලිපිය බලනු.

17. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති: සෙය්‍යථීදං[2] අඞ්ගං නිමිත්තං උප්පාදං[3] සුපිණං[4] ලක්ඛණං මූසිකච්ඡින්නං[14] අග්ගිහොමං දබ්බිහොමං ථුසහොමං කණහොමං තණ්ඩුලහොමං සප්පිහොමං තෙලහොමං මුඛහොමං ලොහිතහොමං අඞ්ගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා[5] සිවවිජ්ජා භූතවිජ්ජා භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා විච්ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං[6] සරපරිත්තානං මිගචක්කං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

18. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති සෙය්‍යථීදං[2] මණිලක්ඛණං වත්ථලක්ඛණං දණ්ඩලක්ඛණං[7] අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං[8] ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරිලක්ඛණං දාසලක්ඛණං දාසිලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං[9] උසභලක්ඛණං ගොලක්ඛණං[10] අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං[11] කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං ගොධාලක්ඛණං කණ්ණිකාලක්ඛණං[12] කච්ඡපලක්ඛණං මිගලක්ඛණං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා[13] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

19. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති සෙය්‍යථීදං[2] රඤ්ඤං නිය්‍යානං භවිස්සති රඤ්ඤං අනිය්‍යානං භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං ජයො භවිස්සති බාහිරානං රඤ්ඤං[15] පරාජයො භවිස්සති. බාහිරානං රඤ්ඤං ජයො භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං පරාජයො භවිස්සති. ඉති ඉමස්ස ජයො භවිස්සති ඉමස්ස පරාජයො භවිස්සති— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ජීවිතං B. V.
2. සෙය්‍යථිදං B. V.
3. උප්පාතං B. °පාටං S.
4. සුපිනං B. P. සුපිණකං C.
5. ඛෙත්ත° B. S. V.
6. පක්ඛ° W. C.
7. සත්ථලක්ඛණං B. V.; දණ්ඩ° වත්ථ° P. W.
8. ආයුධ° B. W.
9. මහිංස° B.
10. ගොණ° B.
11. මෙණ්ඩක° V. W.
12. කණ්ණික° B. S.
13. මිච්ඡාජීවා ඉති න දිස්සති P.
14. මූසිකා° P. W.
15. රඤ්ඤං ඉති න දිස්සති B. V.

17. "එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, අඞ්ග (සමුද්‍රිකා) ශාස්ත්‍රය, නිමිති ශාස්ත්‍රය, (අසනිපාතාදි මහ නිමිති බලා කියන) උත්පාද ශාස්ත්‍රය, ස්වප්න ශාස්ත්‍රය, ලක්ෂණ ශාස්ත්‍රය, (මීයන් කැපූ වස්ත්‍රාදිය බලා කියන) මූසික ශාස්ත්‍රය, අග්නිහෝමය, දබ්බිහෝමය, ථුස හෝමය, තණ්ඩුල—කණ—සප්පි—තෙල—මුඛ—ලෝහිත හෝමය, අඞ්ග විද්‍යා, වාස්තු විද්‍යා, නීති ශාස්ත්‍රය, සොහොනෙහි ශාන්ති කරන්නාවූ විද්‍යාව හෝ සිවල්රුත විද්‍යා, භූත විද්‍යා, අහි විද්‍යා, විෂ විද්‍යා, විච්ඡික විද්‍යා, මූසික විද්‍යා සකුණ විද්‍යා, වායස විද්‍යා, ජීවන කාලය කීම වූ පක්කජ්ඣානය, ශරපරිත්‍රාණය (ආයුධ වැළැක්ම), තිරිසන් සතුන්ගේ ශබ්ද දැනීම වශයෙන් පැවති මන්ත්‍රය යන තිරශ්චින විද්‍යා[1] හෙතුකොට ගෙන මිථ්‍යාජීවයෙන් ජීවිකා කෙරෙත්. මෙසේ මෙබඳු තිරශ්චිනවිද්‍යා හෙතුවෙන් කරණ ලාමකජීවිකාවෙන් වැළැක්කේ වේද මෙද ඒ මහණහුගේ එක් සීලයකි.

18. "එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, මිණි ලක්ෂණය, වස්ත්‍ර ලක්ෂණය, දණ්ඩ—ඛඩ්ග—දුනු—ආයුධ—ඉත්ථි—පුරිස—කුමාර—කුමාරි—දාස—දාසි—හත්ථි—අස්ස—මහිස—උසභ—ගො—අජ—මෙණ්ඩ—කුක්කුට—වට්ටක—ගොධා—කණ්ණිකා—කච්ඡප—මිග ලක්ෂණය යන මෙබඳු තිරච්ඡාන විද්‍යාවන්[1] කරණකොට ගෙණ වැරදි ජීවිකාව කෙරෙත්. මෙසේ වූ තිරශ්චීන විද්‍යාවන් නිසා කරණ වැරදි ජීවිකාවෙන් වැළැක්කේ නම් මෙද ඒ මහණහුගේ එක් සීලයෙකි.

19. "එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා අසවල් දින රජුන්ගේ බැහැර යෑම වන්නේය, අස්වල් දින රජුන්ගේ ඇතුළු නුවරට යෑම වන්නේය. අසවල් දින ඇතුළුනුවර රජුන්ගේ ආක්‍රමණය වන්නේය. බැහැර රජුන්ගේ බැහැරට යෑම වන්නේය. බැහැර රජුන්ගේ ඇතුළු නුවරට ඒම වන්නේය. ඇතුළුනුවර රජුන්ගේ ආපසු යෑම වන්නේය. ඇතුළුනුවර රජුන්ට ජය වන්නේය. බැහැර රජුන්ගේ පරාජය වන්නේය. බැහැර රජුන්ට ජය වන්නේය. ඇතුළුනුවර රජුන්ට පරාජය වන්නේය. මෙසේ මොහුට ජය වන්නේය, මෙසේ පරාජය වන්නේ යයි කියා මෙසේ තිරශ්චීනවිද්‍යා හෙතුකොට ලාමක ජීවිකා කෙරෙත්. මෙබඳු වූ තිරච්ඡාන විජ්ජා හෙතුවෙන් කරණ මිච්ඡාජීවයෙන් වැළැක්කේ නම් මෙ ද ඒ මහණහුගේ එක් සීලයෙක් වේ.

---

1. දීඝනිකායේ පළමුවෙනි කාණ්ඩයේ 21 වෙනි පිට බලනු.

20. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති— සෙය්‍යථීදං[2] චන්දග්ගාහො භවිස්සති සූරියග්ගාහො[3] භවිස්සති නක්ඛත්තග්ගාහො භවිස්සති. චන්දිමසූරියානං[3] පථගමනං භවිස්සති චන්දිමසූරියානං[3] උප්පථගමනං භවිස්සති. නක්ඛත්තානං පථගමනං භවිස්සති නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති. උක්කාපාතො භවිස්සති. දිසාඩාහො[4] භවිස්සති. භූමිචාලො භවිස්සති. දෙවදුන්දුභි[5] භවිස්සති. චන්දිමසූරියනක්ඛත්තානං[3] උග්ගමනං ඔගමනං[6] සඞ්කිලෙසං වොදානං භවිස්සති. එවංවිපාකො චන්දග්ගාහො භවිස්සති. එවංවිපාකො සූරියග්ගාහො[3] භවිස්සති. එවංවිපාකො නක්ඛත්තග්ගාහො භවිස්සති. එවංවිපාකං[7] චන්දිමසූරියානං[3] පථගමනං භවිස්සති. එවංවිපාකං[7] චන්දිමසූරියානං[3] උප්පථගමනං භවිස්සති. එවංවිපාකං[7] නක්ඛත්තානං පථගමනං භවිස්සති. එවංවිපාකං[7] නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති. එවංවිපාකො උක්කාපාතො භවිස්සති. එවංවිපාකො දිසාඩාහො[4] භවිස්සති. එවංවිපාකො භූමිචාලො භවිස්සති. එවංවිපාකො දෙවදුන්දුභි[5] භවිස්සති. එවංවිපාකං චන්දිමසූරියනක්ඛත්තානං[3] උග්ගමනං ඔගමනං[6] සඞ්කිලෙසං වොදානං භවිස්සති—ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

21. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති— සෙය්‍යථීදං[2] සුබ්බුට්ඨිකා[8] භවිස්සති දුබ්බුට්ඨිකා[9] භවිස්සති. සුභික්ඛං භවිස්සති දුබ්භික්ඛං භවිස්සති ඛෙමං භවිස්සති භයං භවිස්සති. රොගො භවිස්සති ආරොග්‍යං භවිස්සති. මුද්දා ගණනා[10] සංඛානං කාවෙය්‍යං ලොකායතං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ජීවිතං B. V.
2. සෙය්‍යථිදං B. V.
3. °සුරි° B.
4. °දාහො W.
5. °දුදුභි B. V.
6. ඔග්ගමනං B. S. V.
7. °විපාකො P.
8. සුවු° V.; සුවුට්ඨිකා B.
9. දුබ්බුට්ඨිකා B.
10. ගණනං B.

20. "එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා: චන්ද්‍රග්‍රහණය වන්නේය. සූර්‍ය්‍යග්‍රහණය—තාරකා සමාගමය—සඳහිරු දෙදෙනාගේ නියම මාර්‍ගගමන—සඳහිරු දෙදෙනාගේ අමාර්‍ගගමන—තාරකාවන්ගේ මාර්‍ගගමන—තාරකාවන්ගේ අමාර්‍ගගමන වන්නේය, උල්කාපාතය වන්නේය, දිසා දැවීම—පොළොව කම්පාව—අහස ගිගුරුම—සඳ, හිරු, තාරකා යන මොවුන්ගේ නැගීම හා අස්තයට යෑම ද කෙලෙසීම ද පිරිසිදු වීම ද වන්නේය. චන්ද්‍ර ග්‍රහණය මෙබඳු විපාක ඇතිවන්නේය, සූර්‍ය්‍යග්‍රහණය—තාරකා සමාගමය— චන්ද්‍රසූර්‍ය්‍යයන්ගේ මාර්‍ගයෙහි ගමන— ඔවුන්ගේ නොමග ගමන— තාරකාවන්ගේ මාර්‍ගයෙහි ගමන— තාරකාවන්ගේ නොමග ගමන — උල්කාපාතය — දිගුන් දැවීම — භූමි චලනය — අහස් ගිගුරුම — සඳ, හිරු, තාරකාවන්ගේ නැගීම, බැසීම, කිලිටිවීම හා පිරිසිදුවීම මෙබඳු විපාක ඇති වන්නේ යයි කියා මෙසේ තිරශ්චානවිජ්ජා හෙතුවෙන් කරණ මිථ්‍යාජිවිකාවෙන් ජීවිකා කෙරෙත්. මෙසේ වූ තිරශ්චීනවිද්‍යා හෙතුකොටගෙණ කරණ ලාමක ජිවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඒ මහණහුගේ එක් සීලයෙකි.

21. "එසේම ඇතැම් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා: මනා වැසි ඇතිවන්නේය, නපුරු වැසි—යහපත් භික්‍ෂා—දුර්භික්‍ෂා—නිර්භය—භය—රොග—නීරෝගීබව ඇතිවන්නේයයි කීමද, ඇඟිල්ල ඇල්ලීමය, ගිණීමය, පුඩුගණනය, කාව්‍ය කිරීමය, විතණ්ඩ ශාස්ත්‍ර ඉගෙණීම යයි මෙසේ තිරශ්චීන විද්‍යාවන් කරණකොට මිථ්‍යා ජීවිකා කෙරෙත්. මෙසේවූ තිරශ්චීන විද්‍යා හෙතුවෙන් වන මිථ්‍යා ජිවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඒ මහණහුගේ එක් සීලයෙකි.

22. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති — සෙය්‍යථීදං[2]: ආවාහනං[3] විවාහනං[3] සංවදනං[4] විවදනං සංකිරණං විකිරණං සුභගකරණං[5] දුබ්භගකරණං[6] විරුද්ධගබ්භකරණං ජිව්හානිබන්ධනං[7] හනුසංහනනං හත්ථාභිජප්පනං[8] කණ්ණජප්පනං ආදාසපඤ්හං කුමාරිපඤ්හං[9] දෙවපඤ්හං ආදිච්චුපට්ඨානං මහතුපට්ඨානං අබ්භුජ්ජලනං සිරිව්හායනං[10] —ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

23. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති — සෙය්‍යථීදං: සන්තිකම්මං පණිධිකම්මං භූතකම්මං[11] භූරිකම්මං වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකිරණං[12] ආචමනං නහාපනං[13] ජුහනං[14] වමනං විරෙචනං උද්ධවිරෙචනං[15] අධොවිරෙචනං සීසවිරෙචනං කණ්ණතෙලං නෙත්තතප්පණං[16] නත්ථුකම්මං අඤ්ජනං පච්චඤ්ජනං[17] සාලාකියං සල්ලකත්තියං[18] දාරකතිකිච්ඡා[19] මූලභෙසජ්ජානං අනුප්පදානං[20] ඔසධීනං පටිමොක්ඛො[21] ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ජීවිතං B. V.
2. සෙය්‍යථිද° B.V.
3. °හණං C.
4. °රණං B.V.; රනං S.
5. සුභාගක° B.
6. දුබ්භාග°B.
7. °නිබන්ධනං B. V. S.
8. හත්ථා° හනුජප්පනං කණ්ණ° B. V.
9. කුමාරික° V. C.
10. සිරව්හායනං P. W.
11. භූරි° (භූතිකම්මං) P.
12. වත්ථුබලිකම්මං V., °වත්ථුපරිකම්මං B. °පවිකිර° P.
13. න්හාපනං B. V.
14. ජූහනං Sa. ජුහණං C.
15. උද්ධං වි° B. V.
16. නෙත්තපානං B; නෙත්තප්පානං S.; නෙත්තතප්පනං Sa. C.
17. පච්ච° V.
18. °තිකං P. V. W.
19. °තිකිච්ඡං S.
20. අනුප්පදනං B. S.
21. පති° B. V.

22. “එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා, ආවාහ කරවීමය, විවාහ කරවීමය, සමගිය පිළිබඳ කථා කිරීමය, වියොගය පිළිබඳ කථා කිරීමය, ධන රැස්කිරීමය, වියදම් කිරීමය, සුභග කරණය (යහපත් ශ්‍රී කිරීමය), දුර්භගකරණය, ගර්භවිරෝධි කරණය, දිව තද කිරීමය, හනු බැඳීමය, අත් පෙරළීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, ශබ්ද නොඇසීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, කැඩපත්හි දෙවතාරොපණය කොට පැණ පිළිවිසීමය, කුමරියගේ සිරුරෙහි දෙවතාරොපණය කොට පැණ පිළිවිසීමය, දෙවදාසියගේ සිරුරෙහි යකුන් අරොපණය කොට පැණ පිළිවිසීමය, හිරු වැඳීමය, මහබඹුට උවටැන් හෝ නැමදුම් කිරීමය, මුවින් ගිනි දැල් පිට කිරීමය, ශ්‍රී දෙවිය කැඳවීම යයි කියන මෙබඳු තිරශ්චීන විද්‍යාවෙන් මිථ්‍යාජීවිකා කෙරෙත්. මෙබඳුවූ තිරච්ඡාන විජ්ජාවෙන් කරණ මිථ්‍යාජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඒ මහණහුගේ එක් සීලයෙකි.

23. “එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා ශාන්ති ප්‍රතිඥාත කර්මය,[1] කායාර්ථ සමෘද්ධියෙන් පසු කළයුතු ප්‍රණිධිකර්මය, මන්ත්‍ර ප්‍රයොග කිරීමය, භූරිකර්මය, පණ්ඩකයා පුරුෂයකු කිරීමය, පුරුෂයා පණ්ඩකයකු කිරීමය, ගෙවල් නොකළ බිම ගෙවල් කිරීමය, ගෙට සුදුසු තැන බලිකර්ම විධානය, දියෙන් මුව සුද්ධ කිරීමය, නැහැවීමය, ගිනි පිදීමය, වමන කරවීමය, විරෙක කරවීමය, ඌර්ධ්ව විරෙකය, අධොවිරෙකය, සිරොවිරෙකය, කන් තෙලය, නෙත්‍රතර්පණය, නස්‍ය කිරීමය, ක්ෂාරවූ අඳුන් තැනීමය, සිසිල් බෙහෙත් අඳුන් සෑදීමය, සැත් කටු ලා කටයුතු වෛද්‍යකර්මය, ශල්‍යකර්මය, ළදරුවන් පිළිබඳ වෛද්‍යකර්මය, මූලික බෙහෙත් දීමය (බෙහෙත් ද්‍රව්‍යයෙන් කටයුතු ශරීර චිකිත්සාය), සැර බෙහෙත් දී පසුව එහි බල හැරීමය යන මෙබඳු තිරශ්චීන විද්‍යා කරණකොට හෝ මිථ්‍යාජීවයෙන් ජීවිකා කෙරෙත්. මෙබඳුවූ මිථ්‍යාජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඒ මහණහුගේ එක් සීලයෙකි.

---

1. මේ ආදියෙහි විස්තර දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ බ්‍රහ්මජාල සූත්‍රයෙන් බලා දත යුතුයි.

24. අථ[1] ඛො සො ආවුසො භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සෙය්‍යථාපි ආවුසො ඛත්තියො මුද්ධාභිසිත්තො[2] නිහතපච්චාමිත්තො න කුතොචි භයං සමනුපස්සති යදිදං පච්චත්ථිකතො. එවමෙව ඛො ආවුසො භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති. එවං ඛො ආවුසො භික්ඛු සීලසම්පන්නො හොති.

25. කථඤ්ච ආවුසො භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති? ඉධ ආවුසො භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී[3]. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං[4] තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා—පෙ—ඝාණෙන ගන්ධං ඝායිත්වා—පෙ—ජිව්හාය රසං සායිත්වා—පෙ—කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා—පෙ—මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී[3]. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං[4] තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති මනින්ද්‍රියං මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං[5] පටිසංවෙදෙති. එවං ඛො ආවුසො භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති.

---

1. ස ඛො P. S. W.
2. මුද්ධාව° P. C.
3. නානුව්‍ය° P. W.
4. අන්වාස්ස° P. W.
5. අව්‍ය° P. W.

24. "ඇවැත්නි, මෙසේ සීලසම්පන්නාවූ මහණහට (අසංවරය මුල්කොට උපදනාවූ) භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ඔහුගේ සීලසංවරය හෙතුකොටගෙණ කිසිතැනකදී නොඋපදනේය. කුමක් මෙන්ද යත්:— ඇවැත්නි, ක්‍ෂත්‍රියාභිෂේකයෙන් මුදුනෙහි අභිෂේක ලද්දාවූ, නැසූ පසමිතුරන් ඇති, ක්‍ෂත්‍රිය රජෙක් කිසියම් සතුරෙකුගෙන් කිසි භයක් නොදක්නේද, එපරිද්දෙන්ම ඇවැත්නි, සීලසම්පන්නාවූ මහණ තෙමේ (අසංවර හෙතුවෙන් උපදනාවූ) භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු සීලසංවරය හෙතුකොට කිසි තැනකදී නොදක්නේය (ඔහුට කිසිවකින් බියක් නැත). ආර්‍ය්‍යවූ (ශ්‍රෙෂ්ඨවූ) මේ සීල රාශියෙන් යුක්තවූ ඒ මහණ තෙමේ, ස්වසන්තානයෙහි පිරිසිදුවූ (කායික චෛතසික) සැපය විඳිහී. ඇවැත්නි, මෙසේ දක්වූ (ත්‍රිවිධ) ශීලයෙන් යුක්තවූ මහණ තෙමේ සීලසම්පන්න නම් වේ.

25. "ඇවැත්නි, මහණ තෙමේ කෙසේ නම් ඉන්ද්‍රියයන්හි වැසූ දොරටු ඇත්තේ ද? ඇවැත්නි, මේ සස්නෙහි (මනාසේ පිළිපන්) මහණ තෙමේ, ඇසින් රූපයක් දැක නිමිත්තග්‍රාහී නොවේ. (එහි නොඇලේ). අනුබ්‍යඤ්ජන වශයෙන් නොගන්නේ එහි විසතර සෙවීමට නොපෙළඹේ. චක්ඛුන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට යමක් හෙතුකොටගෙණ අභිධ්‍යාදෞර්මනස්සාදි (දූෂි ආසාව හා කලකිරීමාදි) ලාමක වූ අකුශල ධර්මයෝ වහනය වන්නාහු ද (ස්වසන්තානයට ඇතුල් වන්නාහු ද), එබඳු දෙයින් වැළැක්ම පිණිස හෙතෙම පිළිපදී. හෙතෙම තමාගේ චක්ඛුන්ද්‍රිය රකී, චක්ඛුන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කනින් ශබ්දයක් අසා— [ඇස පිළිබඳ කී නයින් දත යුතුයි]—නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණයකොට —පෙ— දිවෙන් රසයක් විඳ —පෙ— කයින් ස්පර්‍ශකටයුත්තක් ස්පර්‍ශකොට —පෙ— සිතින් ධර්මයක් (කරුණක්) දැන එහි නිමිති නොගන්නේය (එහි නොඇලෙන්නේය), අනුබ්‍යඤ්ජන වශයෙන් නොගන්නේය (එහි නොපෙළඹෙන්නේය). මනෙන්ද්‍රියයෙහි (සිතෙහි) අසංවරව වසන්නහුට යමක් නිසා අභිජ්ඣා දෞර්මනස්සාදි ලාමක අකුශල ධර්මයෝ වහනය වෙත් ද (ස්වකීය සන්තානයට වදිත් ද), එබඳු දෙයින් වැළැක්ම පිණිස හෙතෙම පිළිපදී. හෙතෙම මනෙන්ද්‍රිය රකී, මනෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. එබඳුවූ මහණ තෙමේ ආර්‍ය්‍ය වූ (උතුම් වූ) ශීල රාශියෙන් යුක්ත වූයේ, අභ්‍යන්තරයෙහි පිරිසිදුවූ (අසම්මිශ්‍ර වූ) අධිචිත්ත සුඛය විඳිහී. ඇවැත්නි, මෙසේ වූ මහණ තෙමේ ඉන්ද්‍රියයන්හි වසන ලද දොරටු ඇත්තේ වේ.

26. කථඤ්ච ආවුසො භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති?

ඉධ ආවුසො භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති සම්මිඤ්ජිතෙ[1] පසාරිතෙ සම්පජානකාරී හොති සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති. උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති. ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති. එවං ඛො ආවුසො භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති.

27. කථඤ්ච ආවුසො භික්ඛු සන්තුට්ඨො හොති?

ඉධ ආවුසො භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන[5] චීවරෙන කුච්ඡිපරිහාරිකෙන[5] පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. සෙය්‍යථාපි ආවුසො පක්ඛී සකුණො යෙන යෙනෙව ඩෙති සපත්තභාරොව ඩෙති එවමෙව ඛො[6] ආවුසො භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන[5] චීවරෙන කුච්ඡිපරිහාරිකෙන[5] පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. එවං ඛො ආවුසො භික්ඛු සන්තුට්ඨො හොති.

---

1. සම්මිඤ්ජිතෙ B. V.
2. °පරිහාරියෙන V.
3. ඛො ඉති න දිස්සති P.

26. "ඇවැත්නි, මහණ තෙමේ කෙසේ නම් සතිසම්ප-ජඤ්ඤයෙන් (සිහියෙන් හා මනා ප්‍රඥාවෙන්) යුක්ත වූයේ වේද?

"ඇවැත්නි, මේ සස්නෙහි (මනාව පිළිපන්) මහණ තෙම ඉදිරියට යෑමෙහි ද, ආපසු යෑමෙහි ද, යහපත් වූ නුවණින් දැන ඒ ක්‍රියා කරන්නේය. ඉදිරි බැලීමෙහි ද, අනුදික් (වටපිට) බැලීමෙහි ද, නුවණින් දැන බලන්නේය. අත් පා හැකිලීමෙහි ද දිගු කිරීමෙහි ද මනා නුවණින් දැන එසේ කරන්නේය. සඟලය, පාත්‍රය, සිවුරුය යන මේ දේ දැරීමෙහිදී මනා නුවණින් දැන ඒ ඒ දැරීම් ආදිය කරන්නේය. අනුභව කිරීමය, පානය කිරීමය, කෑමය, රස විඳීමය යන මෙහි ද මනා නුවණින් යෙදී (දැන) ඒ ඒ අනුභව කිරීමාදිය කරන්නේය. මල මූත්‍ර පහකිරීම් ද නුවණින් (ආදීනව) සලකා කරන්නේය. යෑම්, සිටීම්, හිඳීම්, සැතපීම්, නිදි නොරකිරීම්, කථාකිරීම්, නිශ්ශබ්ද ව සිටීම් යන මේ දේ මනා නුවණින් දැන කරන්නේය. ඇවැත්නි, මෙසේ කරන්නාවූ මහණ තෙමේ සිහියෙන් යුක්තවූයේ යහපත් නුවණින් යුක්ත වූයේ වෙයි. (මෙකී සියලු ඉරියව් පිළිබඳව ආදීනව හා ආනිසංසයන් ද, ශරීරය පිළිබඳ අනිත්‍යතාදි සවභාවයන්ද නුවණින් සලකා ඒ ඒ කෘත්‍යයන්හි යෙදේ යි සේයි.)

27. "ඇවැත්නි, මහණතෙමේ කෙසේ නම් ප්‍රත්‍යයන් පිළිබඳ යථාලාභසන්තොෂයෙන් සතුටු වූයේ වේද?

"ඇවැත්නි, මේ සස්නෙහි (මනාව පිළිපන්) මහණතෙමේ කායපරිහරණයට ප්‍රමාණවූ (යත්තම් කය වැසීමට තරම්වූ) සිවුරෙන් ද කායපරිහරණයට ප්‍රමාණවූ පිණ්ඩපාත භොජන යෙන් ද සතුටු වූ සිත් ඇත්තේ වේ. ඒ මහණතෙමේ යම් යම් තැනකට යේ නම් අටපිරිකර (කය පිළිබඳ වූ දේ) පමණක් රැගෙණ යේ. ඇවැත්නි, යම් සේ පියාපත් ඇති පක්ෂියෙක් යම් යම් තැනෙක පියාඹා යේ නම් ඒ සියලු තැන පියාපත් බර පමණකින් යුක්තව පියාඹා යේ ද, ඇවැත්නි, එපරිද්දෙන්ම භික්ෂු තෙමේ ද කාය පරිහරණයට ප්‍රමාණවූ සිවුරෙන් ද කුච්ඡි පරිහරණයට ප්‍රමාණවූ පිණ්ඩපාත භොජනයෙන් ද සතුටු වන්නේ වේ. ඒ මහණ තෙමේ යම් යම් තැනක යේ නම් කාය-පටිබද්ධවූ අටපිරිකර පමණක් රැගෙණ බැහැර යේ. ඇවැත්නි, මෙසේ වූ මහණ තෙමේ (යම්තම් ලත් දෙයින්) ඉතරීතර-සන්තොෂයෙන් යුක්තවේ.

28. සො ඉමිනා ච[1] අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං[2] වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

29. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. බ්‍යාපාදපදොසං[3] පහාය අබ්‍යාපන්නචිත්තො[4] විහරති සබ්බපාණභූතහිතානුකම්පී බ්‍යාපාදපදොසා[3] චිත්තං පරිසොධෙති. ථීනමිද්ධං[5] පහාය විගතථීනමිද්ධො[5] විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො ථීනමිද්ධා චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

30. සෙය්‍යථාපි ආවුසො පුරිසො ඉණං[6] ආදාය කම්මන්තෙ පයොජෙය්‍ය තස්ස තෙ කම්මන්තා සමිජ්ඣෙය්‍යුං. සො යානි ච පොරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තීකරෙය්‍ය[7]. සියා චස්ස[8] උත්තරිං අවසිට්ඨං දාරභරණාය[9]. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ ඉණං ආදාය කම්මන්තෙ පයොජෙසිං[10] තස්ස මෙ තෙ කම්මන්තා සමිජ්ඣිංසු. සොහං යානි ච පොරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තීඅකාසිං.[11] අත්ථි ච මෙ උත්තරිං අවසිට්ඨං දාරභරණායාති[9]. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං[12] අධිගච්ඡෙය්‍ය.[13] සොමනස්සං.

---

1. චකාරො නත්ථි W.
2. සුසාණං C.
3. ව්‍යා° P. W.
4. අව්‍යා° P. W.
5. ථින° B.
6. ඉනං C.
7. ව්‍යන්තිං° P.C. °ව්‍යන්ති W. බ්‍යන්තිං B.
8. තස්ස Sa.
9. දාරු° P. W.
10. පයොජෙමි B.
11. ව්‍යන්තිං අ° B. ව්‍යන්ති° P. W.
12. පාමුජ්ජං P. W. C.
13. අධිගච්ඡෙ C. P.

28. "ආයසීවූ හෙවත් උතුම්වූ මේ සීලසමූහයෙන් යුක්තවූ ද, උතුම්වූ මේ ඉන්ද්‍රියසංවරයෙන් යුක්තවූ ද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවූ ද, මේ උතුම් ඉතරීතර-සන්තොෂයෙන් යුක්තවූ ද, ඒ (යොගාවචර) මහණ තෙමේ (මනුෂ්‍ය වාසයෙන් දුනු පන්සියයකින් ඔබ්බෙහි වූ) අරණ්‍යය ද (ජනයාගෙන් තොරවූ) වෘක්‍ෂ මූලය ද, පර්වත පෙදෙස් ද, කඳුරැලි ගිරිගුහාවන් හෝ මහා උමගද, සොහොන් ද, ඉතා දුරවූ වනසෙනසුන් ද, අභ්‍යාවකාශ (බොහෝ ඉඩකඩ ඇති) තැන් සහ පිදුරු ගුහා ද යන මේ (ජනයාගෙන් හිස්වූ) සෙනසුන් ඇසුරු කෙරෙයි. ඒ මහණ තෙමේ පසුබත්කාලයෙහි පිණ්ඩපාත භොජනයෙන් වැළැක්කේ, පයසීඞ්කය බැඳ, උඩුකය ඇද නොවන සේ තබා, නිවණෙහිම සිත එලවා, ඒ නිවණම අරමුණු වසයෙන් සිත ඉදිරියෙහි පිහිටුවා ගෙණ හිඳී.

29. "ඒ මහණ තෙමේ ලොකයෙහි (පඤ්චුපාදනසකන්ධයන්හි) අභිධ්‍යාව (ලොභය) පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේ. ඒ අභිධ්‍යාවෙන් සිත (වෙන්කොට) පිරිසිදු කෙරේ. සිත කෙලසන්නාවූ ක්‍රොධය පහකොට, ක්‍රොධයෙන් දූෂිතවූ සිත් නැත්තේ, ප්‍රාණිවූ සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේව වෙසේ. ව්‍යාපාද දූෂණයෙන් සිත (වෙන් කොට) පිරිසිදු කෙරේ. කායචිත්ත දෙදෙනාගේ අලසබව යයි කියන ලද ථීනමිද්ධය දුරුකොට කය—සිත පිළිබඳ පහ වූ අලසබැව් ඇත්තේ, ආලොකසංඥා (පිරිසිදු හැඟිම්) ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥා ඇත්තෙක්ව වෙසේ. ථීනමිද්ධනීවරණයෙන් සිත පිරිසිදු කෙරේ. උඩඟු බව හා කුකුස (උද්ධච්චකුක්කුච්චය) දුරුකොට, සංසිඳුනු සිත් ඇතිව (අනුද්ධතව) වාසය කෙරේ. අධ්‍යාත්මයෙහි (ඇතුලත) සංසිඳුනු සිත් ඇත්තේ, උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසිදු කෙරේ. (බුද්ධාදී අටතැන්හි සැකකිරීම ලකුණුකොට ඇති) විචිකිච්ඡාව දුරුකොට, එතර කල (පහකල) විචිකිච්ඡා ඇත්තේ කුශලධම් විෂයෙහි 'ඒ කෙසේ ද මේ කෙබඳුද'යි යන සැක නැතිව වෙසේ, විචිකිච්ඡායෙන් සිත පිරිසිදු කෙරේ.

30. "ඇවැත්නි, යම්සේ පුරුෂයෙක් ණය ගෙණ කර්මාන්ත-යන්හි යොදන්නේ ද, ඔහුගේ ඒ කර්මාන්තයෝ දියුණු වන්නාහු නම් ඔහුගේ ඒ පරණ ණය මුදල් සියල්ලම ගෙවන්නේය. ඔහුගේ අඹුදරුවන් පුස්නා පිණිස වැඩි යමක් ඉතුරු වුයේ නම් ඔහට මෙබඳු අදහසක් වන්නේය. [කෙසේද යත්:] 'මම වනාහි පළමුවෙන් ණය ගෙණ කර්මාන්තයන්හි යෙදුවෙමි. ඒ මාගේ කර්මාන්තයෝ සමෘද්ධවූහ. ඒ මම පැරණි ණය ගෙවූයෙමි. අඹුදරුවන් පොෂ්‍යකිරීම පිණිස අතිරේක මුදලක් ද මට ඇත්තේය' කියායි. හෙතෙම ඒ ණය නැති බව මුල්කොට ගෙණ බලවත් සතුටක් ලබන්නේය, සොම්නසට ද පැමිණෙන්නේය.

34. සෙය්‍යථාපි ආවුසො පුරිසො සධනො සභොගො කන්තාරද්ධානමග්ගං[1] පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං. සො අපරෙන සමයෙන තං කන්තාරං නිත්ථරෙය්‍ය සොත්ථිනා ගාමන්තං අනුපාපුණෙය්‍ය ඛෙමං අප්පටිභයං. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ සධනො සභොගො කන්තාරද්ධානමග්ගං[1] පටිපජ්ජිං දුබ්භික්ඛං සප්පටිභයං. සොම්හි එතරහි තං කන්තාරං තිණ්ණො[2] සොත්ථිනා ගාමන්තං අනුප්පත්තො ඛෙමං අප්පටිභයන්ති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං[3] අධිගච්ඡෙය්‍ය[4] සොමනස්සං.

35. එවමෙව ඛො ආවුසො භික්ඛු යථා ඉණං යථා රොගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං එවං[5] ඉමෙ පඤ්චනීවරණෙ අප්පහීනෙ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි ආවුසො යථා[6] ආනණ්‍යං යථා[6] ආරොග්‍යං යථා බන්ධනාමොක්ඛං යථා භුජිස්සං යථා ඛෙමන්තභූමිං එවමෙව ඛො ආවුසො භික්ඛු ඉමෙ පඤ්චනීවරණෙ පහීනෙ අත්තනි සමනුපස්සති.

36. තස්සිමෙ පඤ්චනීවරණෙ පහීනෙ අත්තනි සමනුපස්සතො පාමොජ්ජං[3] ජායති පමුදිතස්ස පීති ජායති පීතිමනස්ස කායො පස්සම්භති පස්සද්ධකායො සුඛං වෙදෙති[7] සුඛිනො චිත්තං සමාධියති.

---

1. කන්තාරං අද්ධාන° B. S. Pa.
2. නිට්ඨිණ්ණො P.W. නිට්ඨිත්තො Pa.
3. පාමුජ්ජං P. W. C.
4. අධිගච්ඡෙ P. C.
5. එවං ති න දිස්සති P. W. S.
6. යථා ති නත්ථි B.P.
7. පටිසංවෙදෙති S.

34. "ඇමැත්නි, යම්සේ ධනවත්වූ භොගසම්පත් ඇති පුරුෂයෙක් ආහාර දුලීභවූ, භය සහිතවූ, නිරුදකවූ දීඝීමාගීය-කට දුරුකතර මගකට පැමිණෙන්නේ ද,හෙතෙම මඳ කලකින් ඒ කාන්තාරමාගීය ඉක්මවා යන්නේ, සැපවත්වූ, (සොර සතුරන් ගෙන්) ප්‍රතිභය රහිත වූ ගම්මානයකට ක්‍රමයෙන් පැමිණෙන්-නේ ද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: 'මම වනාහි පෙර ධනවත් වූයෙම්, භොගසම්පත් සහිත වූයෙම්, දුලීභ භික්‍ෂා ඇති, භය සහිතවූ, දීඝීවූ කාන්තාරමාගීයකට පිළිපන්නෙක් වූයෙමි. එසේ වූ මම දැන් එම කාන්තාරමාගීය තරණය කෙළෙමි. සැපවත්වූ, ප්‍රතිභය රහිතවූ ගමකට සැපසේ ක්‍රමයෙන් පැමිණියෙමි'යි කියාහි. ඒ පුරුෂ තෙමේ ඒ කතරමග එතර කිරීම නිමිතිකොට බලවත් සතුටක් ලබන්නේය, එසේම සොම්නසට ද පැමිණෙන්නේය.

35. "ඇමැත්නි, ණය යම්සේද, රෝගය යම්සේ ද, බන්ධනා-ගාරය යම්සේ ද, දසභාවය යම්සේ ද, දුරුකතරමග යම්සේ ද, එපරිද්දෙන් මහණ තෙමේ ප්‍රහීණ නොවූ (පහ නොකළ) පඤ්චනීවරණයන් තමා කෙරෙහි ලා නුවණින් දකී. ඇමැත්නි, ණය නැති බව යම්සේ ද, නිරෝගී බව යම්සේ ද, සිරගෙන් මිදීම යම්සේ ද, මෙරමාහට යටත් නැති බව යම්සේ ද, අභය භූමිය යම්සේ ද, එපරිද්දෙන් ම ඇමැත්නි, මහණ තෙමේ ප්‍රහීණවූ මේ පඤ්චනීවරණ ධම්යන් තමා විෂයෙහි ලා දක්නේය.

36. "ප්‍රහීණවූ මේ පඤ්චනීවරණයන් තමා කෙරෙහි නැතැ යි නුවණින් දක්නාවූ ඒ මහණහට සතුටු ආකාරය උපදී. සතුටු වූවහුට (සියල් සිරුර කලඹමින්) ප්‍රීතිය උපදී, ප්‍රීති සහගත සිත් ඇත්තහුගේ නාමකය (සන්තානය) සංසිඳෙයි, සංසිඳුනු කය ඇති (කය පිළිබඳ මැඩලූ දුහ ඇති) තැනැත්තේ කායික චෛතසික සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධියට (එකඟ බවට) එළඹෙයි.

37. සො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං[1] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො[2] කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං[3] හොති.

38. සෙය්‍යථාපි ආවුසො දක්ඛො න්හාපකො[4] වා න්හාපකන්තෙවාසී[4] වා කංසථාලෙ න්හානීයචුණ්ණානි[5] ආකිරිත්වා උදකෙන පරිප්ඵොසකං පරිප්ඵොසකං[6] සන්නෙය්‍ය[7] සායං[8] න්හානීයපිණ්ඩි[4]. ස්නෙහානුගතා ස්නෙහපරෙතා සන්තරබාහිරඵුටා[9] ස්නෙහෙන[10] න ච පග්ඝරණී.[11]

එවමෙව ඛො ආවුසො භික්ඛු ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො[2] කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං[3] හොති.

39. යො නු ඛො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති කල්ලං නු ඛො තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති ?

යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති කල්ලං[12] තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති:

අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

---

1. පඨමං ඣානං Pa.
2. සබ්බපච්ඡතො V.
3. අප්ඵුටං, අප්ඵුතං, P. C. අඵුටං B. V.
4. ස්නා° W. නහා° P.
5. ස්නානීය° W. න්හානීය° B. නහානීය P.
6. S. සකිදෙව ඵුත්තං.
7. සන්නෙය්‍ය P. W. C.
8. සාය්ස P.
9. °ඵුටා B. V. °ඵුතා P.
10. සිනෙ° P. W.
11. පග්ඝරණී B.
12. න කල්ලං S.

37. "ඒ මහණතෙමේ වස්තුකාම ක්ලේශකාමයන්ගෙන් වෙන් වූයේම, අකුශල ධර්මයන් කෙරෙන් ද වෙන් වූයේ ම, (අරමුණෙහි සිත පැමිණවීම නම්) විතර්ක සහිතවූ, (අරමුණ පිරිමැදීම්, එහි හැසිරීම් සංඛ්‍යාත) විචාර සහිතවූ, සිතෙහි විවෙකයෙන් (නීවරණයන් දුරුවීම් හේතුවෙන්) උපන් ප්‍රීතියම සැපකොට ඇති, පඨමජ්ඣාන කුසල චිත්තය තමාගේ සන්තාන-යෙහි ඉපදවීම් වසයෙන් ඊට පැමිණ එව ධ්‍යානයෙහි වාසය කෙරේ. ඒ මහණ තෙමේ විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ (සකල) ශරීරයම තෙමයි (සැපවත් කෙරෙයි සේයි), හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි (සැම තන්හි පතුරවයි). ඒ මහණහුගේ සම්පූර්ණ ශරීරයෙහි සවල්පවූ ස්ථානයක් වුව ද ප්‍රථමධ්‍යාන සැප-යෙන් (විවේකයෙන් උපන් ප්‍රීති සැපයෙන්) නොපහස්නා ලද්දේ නොවේ (සකල ශරීරයෙහිම පඨමජ්ඣාන සැපය පැතිරේ යයි සේයි).

38. "ඇවැත්නි, යම්සේ වනාහි දක්‍ෂවූ ස්නාන ද්‍රව්‍ය සපයන්නෙක් හෝ ඔහුගේ අතවැස්සෙක් හෝ ස්නානයට ගන්නාවූ සුණු ලෝහමය තලියෙක බහා දිය ඉසිමින් අතින් අනමින් (පිරිමදිමින්) පිඬුකරන්නේ ද, එවිට මේ ස්නාන චූර්ණපිණ්ඩය දියෙන් යුක්ත වේ, ජලය හාත්පසින් කාවැදුනේ වේ. එහි ඇතුළත හා පිටත ද සියලු තන්හිම ජලයෙන් පහස්නා ලද්දේ වේ. එහෙත් බින්දු වසයෙන් ජලය ඉන් නො වැගිරේ.

"ඇවැත්නි, එපරිද්දෙන් ඒ මහණ තෙමේ, විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ ශරීරය තෙමයි (පැතුරුණු සැප ඇත්තක් කරයි), හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි (සැමතන්හි පතුරුවයි). ඒ මහණහුගේ සියලු කොටස් ඇති ශරීරයෙහි සවල්පවූ තැනක් වත් විවෙකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් (ප්‍රථමධ්‍යානයෙන්) නොපහස්නා ලද්දේ නොවේ.

39. "ඇවැත්නි, යම් භික්‍ෂුවක්තෙම මෙසේ දනීද, මෙසේ දකීද, ඒ භික්‍ෂුහට හේම ජීවය හේම ශරීරයයි හෝ, ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට සුතුද?"

"ඇවැත්නි, යම් ඒ මහණෙක්තෙම මෙසේ දනීද, මෙසේ දකීද, ඔහට හේම ජීවය හේම ශරීරය යි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැ යි හෝ යන මෙය කියන්නට වටී."

"ඇවැත්නි, මම මෙය මෙසේ දනිමි, මෙසේ දකිමි. එහෙත් මම හේම ජීවය හේම ශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ නොකියමි.

40. පුනච පරං ආවුසො භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං[1] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො[2] කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්ඵුටං[3] හොති.

41. සෙය්‍යථාපි ආවුසො උදකරහදො ගම්භීරො[4] උබ්භිදොදකො[5] තස්ස නෙවස්ස පුරත්ථිමාය දිසාය උදකස්ස ආයමුඛං[6] න දක්ඛිණාය දිසාය උදකස්ස ආයමුඛං[6] න පච්ඡිමාය දිසාය උදකස්ස ආයමුඛං[6] න උත්තරාය දිසාය උදකස්ස ආයමුඛං[6] දෙවො[7] ච කාලෙන කාලං සම්මා ධාරං නානුප්පවෙච්ඡෙය්‍ය[8]. අථ ඛො තම්හා ච[9] උදකරහදා සීතා[10] වාරිධාරා උබ්භිජ්ජිත්වා තමෙව උදකරහදං සීතෙන වාරිනා අභිසන්දෙය්‍ය පරිසන්දෙය්‍ය පරිපූරෙය්‍ය පරිප්ඵරෙය්‍ය. නාස්ස කිඤ්චි සබ්බාවතො[2] උදකරහදස්ස සීතෙන වාරිනා අප්ඵුටං[3] අස්ස.

එවමෙව ඛො ආවුසො භික්ඛු ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො[2] කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්ඵුටං[3] හොති.

42. යො නු[11] ඛො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති කල්ලං නු ඛො තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති?

යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති කල්ලං තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

---

1. දුතියං ඣානං P.
2. සබ්බවතො V.
3. අප්ඵුටඩං W; අප්ඵුටං B. අප්ඵුතං P.C.
4. ගම්භීරො ඉති න දිස්සති P.W.
5. උබ්භිතොදකො B. S. V.
6. උදකස්සායං° P. W.
7. දෙවො වා නං කා° S. දෙවො ච න කාලෙන කා·· B. V.
8. අනුපවෙච්ඡෙය්‍ය B. V. P. W. අනුප්පවෙ° S. නානුප° C.
9. තම්හා වා S,
10. සීතවාරි° P. C.
11. යො ඛො P. V.

40. "ඇවැත්නි, නැවතද (අනිකක් කියමි). (යොගී)මහණ තෙමේ විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් අධ්‍යාත්මයෙහි මනා පැහැදීම කරන්නාවූ, සිත පිළිබඳ එකඟ බව ඇති, විතර්ක විචාර නැති, සමාධියෙන් හටගත් ප්‍රීතිසැපය ඇති ද්‍විතියජ්ඣාන කුසල චිත්තයට පැමිණ වෙසේ. ඒ මහණ තෙමේ මේ කය සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් තෙමයි (සියලු තැන පතළ සැප ඇත්තක් කෙරේ), හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කරයි. ඒ මහණහුගේ සියලු කොටස් ඇති ශරීරයෙහි ස්වල්පවූ තැනක් වුවද ද්‍විතියධ්‍යානයෙන් නො පහස්නා ලද්දේ නොවේ.

41. "ඇවැත්නි, යම්සේ ඇතුළතම හටගත් (පොළොව බිඳ නික්මෙන) ජලය ඇති දියවිලක් වේ ද, ඒ විල පිළිබඳ පෙර දිගින් ද, අපරදිගින් ද, උතුරු දිගින් ද, දකුණු දිගින් ද දිය එන මගක් නැත්තේ වේ ද, මෙඝය ද කලින් කල මනාසේ වැසි වර්ෂණය නො කරන්නේ ද, එසේ වූ ඒ විලෙන් සිහිල් දිය දහර පොළොව බිඳ නැගී ඒ මුළු විලම සිහිල් දියෙන් පතුරුවයි, හාත්පසින් වගුරුවයි, සම්පූර්ණයෙන් පුරවයි, එහි හැම තැන දියෙන් ස්පර්ශ කෙරෙයි. ඒ සියලු විලෙහිම සීත ජලය නො පැතිර පවත්නා තැනක් නම් නැත්තේය.

"ඇවැත්නි, එපරිද්දෙන් මේ මහණ තෙමේ මේ මුළු ශරීරයම සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් සියලු තැන පතුරුවන ලද්දක් කෙරේ, ප්‍රීති සැපයෙන් හාත්පසින් වගුරුවයි, සම්පූර්ණයෙන් පුරවයි, ඉන් සැමතැනම ස්පර්ශ කෙරෙයි. ඒ මහණහුගේ සම්පූර්ණ ශරීරයෙහි ස්වල්පවූ එක ස්ථානයකුදු (ද්‍විතියධ්‍යාන) සැපයෙන් නො පහස්නා ලද්දේ නොවේ.

42. "ඇවැත්නි, යම් භික්ෂුවක්තෙම මෙසේ දනීද, මෙසේ දකීද, ඒ භික්ෂුහට හේම ජීවය හේම ශරීරයයි හෝ, ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට සුදුද?"

"ඇවැත්නි, යම් ඒ මහණෙක්තෙම මෙසේ දනීද, මෙසේ දකීද, ඕහට හේම ජීවය හේම ශරීරය යි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැ යි හෝ යන මෙය කියන්නට වටී."

"ඇවැත්නි, මම මෙය මෙසේ දනිමි, මෙසේ දකිමි. එහෙත් මම හේම ජීවය හේම ශරීරය යි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ නොකියමි.

43. පුනච පරං ආවුසො භික්ඛු පීතියා ච විරාගා[1] උපෙක්ඛකො[2] ච විහරති සතො[3] සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො[2] සතිමා සුඛවිහාරීති තතියජ්ඣානං[4] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො[5] කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං[6] හොති.

44. සෙය්‍යථාපි ආවුසො උප්පලිනියං වා[7] පදුමිනියං වා[7] පුණ්ඩරීකිනියං වා[7] අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි[8] උදකානුග්ගතානි අන්තොනිමුග්ගපොසීනි[9] තානි යාව චග්ගා[10] යාව ච මූලා සීතෙන වාරිනා අභිසන්නානි[11] පරිසන්නානි[11] පරිපූරානි පරිප්ඵුටානි[12] නාස්ස කිඤ්චි සබ්බාවතං[5] උප්පලානං වා[13] පදුමානං වා පුණ්ඩරීකානං වා සීතෙන වාරිනා අප්ඵුටං[6] අස්ස.

එවමෙව ඛො ආවුසො භික්ඛු ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො[5] කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං[6] හොති.

45. යො නු ඛො[14] ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති කල්ලං නු ඛො තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති?

යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති කල්ලං තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

---

1. විරාගා ච P.
2. උපෙඛකො P.
3. සතො ච P. S.
4. තතියං ඣානං V. W.
5. සබ්බවතො V.
6. අඵුටං B.V; අප්ඵුටං S.; අප්ඵුතං P.
7. වාති න දිස්සති P.
8. සංවුඩ්ඪානි B. V; සංවඩ්ඪානි S.
9. °පොසීනි B.
10. යාව ච අග්ගා S.
11. °සන්නානි P. W.
12. පරිප්ඵුට්ඨානි P.
13. වාති නත්ථි V.
14. යො ඛො B. V.

43. "ඇවැත්නි, යලිදු, ඒ මහණ තෙමේ ප්‍රීතියෙහි නො ඇල්මෙන් මැදහත්බැව් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් නුවණ ඇත්තේ කයින්ද සැපයක් විඳියි. යම් ධ්‍යානයක් පිළිබඳව (ඒ ධ්‍යානයට සමවැදුනු තැනැත්තා) උපෙක්‍ෂා ඇත්තේය, සිහි ඇත්තේය, සැපවිහරණ ඇත්තේ යයි ආයඞීයෝ කියත් ද ඒ තෘතියජ්ඣාන කුසල චිත්තයට පැමිණ වාසය කෙරේ. ඒ මහණ තෙමේ මේ සකල ශරීරයම ප්‍රීතියෙන් මිදුණාවූ සැපයෙන් තෙමයි, හෙවත් සියලු තැන පැතිර පවත්නා සැප ඇත්තක් කෙරේ. ඒ සැපතින් හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, එයින් සැමතැනම ස්පර්ශ කෙරෙයි. ඒ මහණහුගේ සියලු ශරීරයෙහි සවල්පවූ එක තැනක් වුවද නිප්පීතික සුඛයෙන් (හෙවත් තෘතිය ධ්‍යානසුඛයෙන්) නො පහස්නා ලද්දේ නොවේ.

44. "ඇවැත්නි, යම්සේ උපුල් විලක හෝ හෙල පියුම් විලක හෝ රත් පියුම් විලක හෝ දියෙහි හටගත්, දියෙහි වැඩුනු, දියෙන් උඩට නොනැගුනු, දියතුලම ගැලී වැඩෙන්නාවූ සමහර උපුල් හෝ සමහර හෙල පියුම් හෝ සමහර රත් පියුම් හෝ වෙද් ද, ඒ උප්පලාදීහු අග දක්වාත්, මුල දක්වාත්, සිහිල් ජලයෙන් තෙමුනාහු, හාත්පසින් තෙමුනාහු, සම්පූර්ණයෙන් වැගුරුණාහු, හාත්පසින් පහස්නා ලද්දාහු වෙත් ද, ඒ උපුල්, හෙල පියුම්, රත් පියුම් යන මොවුන්ගෙන් එකකුත් ජලයෙන් නො පහස්නා ලද්දේ නොවේ ද, ඇවැත්නි, එපරිද්දෙන් ඒ මහණ තෙමෙ මේ සකල ශරීරයම නිප්පීතික සුඛයෙන් සියලු තැන පැතිර පවත්නා සැප ඇත්තක් කෙරෙයි, ඉන් හාත්පසින් තෙමයි. සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි. ඒ මහණහුගේ සම්පූර්ණ ශරීරයෙහි සවල්පවූ එක තැනක්වත් නිප්පීතික(තෘතියජ්ඣාන)සුඛයෙන් නො පහස්නා ලද්දේ නොවේ.

45. "ඇවැත්නි, යම්කිසි භික්‍ෂුවක් මෙසේ දනීද, මෙසේ දකීද, ඒ භික්‍ෂුවහට හේම ජීවය හේම ශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට වටීද?"

"ඇවැත්නි, යම් ඒ භික්‍ෂුවක්තෙම මෙසේ දනීද, මෙසේ දකීද, ඔහුට හේම ජීවය හේම ශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට සුදුසුය".

"ඇවැත්නි, මම වනාහී මෙය මෙසේ දනිමි, මෙසේ දකිමි. එසේ ද වුවත් මම හේම ජීවය හේම ශරීරයයි හෝ, ජීවය අනෙකෙක, ශරීරය අනෙකෙකැයි හෝ නොකියමි.

46. පුනචපරං ආවුසො භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා[1] අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං[2] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුටං[4] හොති.

47. සෙය්‍යථාපි ආවුසො පුරිසො ඔදාතෙන වත්ථෙන සසීසං පාරුපිත්වා නිසින්නො අස්ස නාස්ස කිඤ්චි සබ්බාවතො[3] කායස්ස ඔදාතෙන වත්ථෙන අප්ඵුටං[4] අස්ස. එවමෙව ඛො ආවුසො භික්ඛු ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති නාස්ස කිඤ්චි සබ්බාවතො[3] කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුටං[4] හොති.

48. යො නු ඛො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති කල්ලං නු ඛො තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති?

යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති කල්ලං තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරිරන්ති වාති.

අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

---

1. අත්ථගමා P.
2. චතුත්ථං ඣානං B. V.W.
3. සබ්බවතො V.
4. අඵුටං B. අප්ඵුටං S. අප්ඵුතං P.

46. "නැවත ද ඇවැත්නි, ඒ මහණතෙමේ සැප දුරුකිරීමෙන් ද, දුක් දුරුකිරීමෙන් ද පළමුකොටම සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැතිව යාමෙන් දුක් නොවූ, සැප නොවූ, උපෙක්ඛා හා සති යන මොවුන්ගේ පිරිසිදු බැව් ඇති, චතුත්ථජ්ඣාන චිත්තයට පැමිණ වෙසේ. ඒ මහණ තෙමේ මේ සකල ශරීරයම (කෙලෙස් නැති බැවින්) පිරිසිදුවූ, (අතිශයින් බබලන හෙයින්) පරියොදාතවූ, (ධ්‍යාන) සිතින් පතුරුවා හුන්නේ වේ (පතුරුවන්නේය). ඒ ධ්‍යානලාභී මහණහුගේ සර්වාඞ්ගයෙහි සවල්පවූ එක තැනකුදු පිරිසිදුවූ, අතිශයින් බබලන්නාවූ (චතුර්ථ ධ්‍යාන) චිත්තයෙන් නො පහස්නා ලද්දේ නොවේ.

47. "ඇවැත්නි, යම්සේ පුරුෂයෙක් පිරිසිදුවූ සුදුවතකින් හිස සිට (දෙපා දක්වා) පොරවා උන්නේ වේද, ඔහුගේ සකල ශරීරයෙහි එකම තැනකුදු සුදුවතින් නො වසන (නොහොත් උණුසුම් නොකරණ) ලද්දේ නොවේ. ඇවැත්නි, එපරිද්දෙන්ම ධ්‍යානලාභී මහණ තෙමේ මේ සියලු ශරීරයම පිරිසිදුවූ, අතිශයින් බබලන්නාවූ (චතුත්ථජ්ඣාන) චිත්තයෙන් පතුරුවා හුන්නේ වේ. ඒ මහණහුගේ සර්වාඞ්ගයෙහි සවල්පවූද එක් තැනක්වත් පිරිසිදුවූ බබලන්නාවූ (චතුත්ථජ්ඣාන) චිත්තයෙන් නො පහස්නා ලද්දේ නොවේ (චතුර්ථධ්‍යාන චිත්තයෙන් සකල ශරීරයම පතුරුවන ලද්දේය කී සේයි).

48. "ඇවැත්නි, යම් භික්ෂුවක්තෙම මෙසේ දනීද මෙසේ දකීද, ඔහුට හේම ජීවය හේම ශරීරයයි හෝ, ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට සුදුසු ද?"

"ඇවැත්නි, යම් ඒ භික්ෂුවක්තෙම මෙසේ දනීද, මෙසේ දකීද, ඔහුට හේම ජීවය හේම ශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්ට වටිනේය."

"ඇවැත්නි, මම වනාහි මෙය මෙසේ දනිමි, මෙසේ දකිමි. එසේ වුවත් මම හේම ජීවය හේම ශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය නොකියමි.

49. [පුනචපරං ආවුසො][1] සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඤාණදස්සනාය චිත්තං අභිනීහරති[2] අභිනින්නාමෙති. සො එවං පජානාති: අයං ඛො මෙ කායො රූපි චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදනපරිමද්දනභෙදනවිද්ධංසන-ධම්මො.' ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති.

50. සෙය්‍යථාපි ආවුසො මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අච්ඡො විප්පසන්නො අනාවිලො සබ්බාකාරසම්පන්නො තත්‍ර 'සස[3] සුත්තං ආවුතං නීලං[4] වා පිතං[5] වා ලොහිතං[6] වා ඔදාතං වා පණ්ඩුසුත්තං[7] වා. තමෙනං[8] චක්ඛුමා පුරිසො හත්ථෙ කරිත්වා පච්චවෙක්ඛෙය්‍ය: අයං ඛො මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අච්ඡො විප්පසන්නො අනාවිලො සබ්බාකාර-සම්පන්නො තත්‍රිදං සුත්තං ආවුතං නීලං[4] වා පිතං[5] වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩුසුත්තං[7] වාති.

එවමෙව ඛො ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ—පෙ—ඤාණදස්සනාය චිත්තං අභිනීහරති[2] අභිනින්නාමෙති. සො එවං පජානාති අයං ඛො මෙ කායො රූපි—පෙ—ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති.

1. ඉදං න දිස්සති S.
2. අභිනි° B.
3. තත්‍රසුත්තං P. W.
4. නිලං B.
5. පීතං B.
6. ලොහිතකං B.
7. පණ්ඩුරසු° S.
8. තමෙව ච° P.

49. "[මැලිද්‍ර, ඇවැත්නි,] ඒ මහණතෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි, උපක්ලේශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි, (කම්මඤ්ඤ) කර්මයට සුදුසුව සිටි කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය ඉපදවීම පිණිස සිත එලවා තබයි, ඒ සඳහා වෙසෙසින් සිත නමයි. ඒ මහණ තෙමේ මෙසේ දැන ගණී, කෙසේ ද යත්: 'මාගේ මේ ශරීරය වනාහි ආකාර ඇත්තේය (රූපයෙන් යුක්තය), සතර මහාභූතයන්ගේ හේතු-වෙන් හටගත්තේය, (මව්පියන් නිසා) මව් පිය දෙදෙනාගේ ශුක්‍ර ශ්‍රෝණිතයෙන් හටගත්තේය, බත්කොමු (කුම්මාස) ආදි ආහාරයෙන් වඩනා ලද්දේය, අනිත්‍ය බවය, දුගඳ නැසීම පිණිස සුණු ආදිය ගැල්වීමෙන් ඉලීමය, අඟපසඟ ආබාධ දුරලීම පිණිස පිරිමැදීමය, බිඳීමය, විනාශය යන මේ දේ සවභාවකොට ඇත්තේය. මාගේ මේ විඤ්ඤාණය වනාහි කය ඇසුරු කොළේ වෙයි, මෙහිම බැඳුනේ වෙයි' කියායි.

50. "ඇවැත්නි, යම්සේ වනාහි යහපත්වූ, පිරිසිදු ආකාර-යෙන් උපන්නාවූ, අටැස්වූ, (පාෂාණාදි දොස් බැහැර කිරීමෙන්) මොනවට සකස් කරණ ලද්දාවූ, නිර්මලවූ, විශේෂයෙන් ප්‍රසන්නවූ, නොකැලැල්වූ, සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, වෙරළුමිණක් (වෛඩූර්‍ය මාණිකයක්) වේද, එහි නිල්වූ හෝ පීතවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ හුයක් (නූලක්) අමුණන ලද්දේද, ඒ මේ මාණික ඇස් ඇති පුරුෂයෙක් අතට ගෙණ මෙසේ සලකා බලන්නේය, කෙසේද යත්: 'මේ වෛඩූර්‍ය මාණික වනාහි මනාසේ කාන්තිමත් හෙයින් යහපත් වේ, පිරිසිදු ආකාරයෙන් උපන්නේය, අටැස් ඇත්තේය,(දොස් දුරුකිරීමෙන්) මනාකොට සකස් කරණ ලද්දේය, නිර්මලය, විශේෂයෙන් ප්‍රසන්නය, නොකැලැල්ය, සියලු ආකාරයෙන් සම්පූර්ණය. ඒ මාණිකෙහි මේ නීලවර්ණවූ හෝ පීතවර්ණවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ හුයක් අමුණන ලද්දේය' කියායි.

"ඇවැත්නි, එපරිද්දෙන්ම යොගීවූ මේ මහණ තෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, —පෙ— විදර්ශනාඥානය පිණිස සිත එලවා තබයි, ඒ සඳහා විශේෂයෙන් සිත නමයි. ඒ මහණ තෙමේ මෙසේ දන්නේය, කෙසේද යත්: 'මාගේ මේ ශරීරය වනාහි ආකාරවත් (රූපයෙන් යුක්ත) ය, —පෙ— මාගේ මේ විඤ්ඤාණය වනාහි මේ කය ඇසුරු කොළේ වෙයි, මෙහිම බැඳී සිටියේය' කියා යි.

51. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[1] මනොමයං කායං අභිනිම්මිනාය[2] චිත්තං අභිනීහරති[3] අභිනින්නාමෙති. සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං[4] අභිනින්ද්‍රියං[5].

52. සෙය්‍යථාපි ආවුසො පුරිසො මුඤ්ජම්හා ඊසිකං[6] පබ්බාහෙය්‍ය[7] තස්ස එවමස්ස: අයං මුඤ්ජො අයං ඊසිකා[6]. අඤ්ඤො මුඤ්ජො අඤ්ඤා ඊසිකා[6] මුඤ්ජම්හාත්වෙව ඊසිකා[6] පබ්බාළ්හාති[7].

සෙය්‍යථා[8] වා පන ආවුසො පුරිසො අසිං[9] කොසියා පබ්බාහෙය්‍ය[7]. තස්ස එවමස්ස: අයං අසි අයං කොසි. අඤ්ඤො අසි අඤ්ඤා[10] කොසි. කොසියා ත්වෙව අසි පබ්බාළ්හොති[7].

සෙය්‍යථා වා[8] පන ආවුසො පුරිසො අහිං කරණ්ඩා උද්ධරෙය්‍ය තස්ස එවමස්ස: අයං අහි අයං කරණ්ඩො අඤ්ඤො අහි අඤ්ඤො කරණ්ඩො. කරණ්ඩා ත්වෙව අහි උබ්භතොති[11].

එවමෙව ඛො ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— ආනෙඤ්ජප්පත්තෙ[12] මනොමයං කායං[13] අභිනිම්මිනාය[14] චිත්තං අභිනීහරති[3] අභිනින්නාමෙති. සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං[4] අභිනින්ද්‍රියං.

1. ආනෙජ්ජ° P. C.
2. මනොමයං අභිනිම්මිනතාය S.
3. °නිහරති B.
4. පච්චඞ්ගං S.
5. අභිත්තින්ද්‍රියං C.
6. ඉසි° P. S. W. C.
7. පවා° P. W. S.
8. සෙය්‍යථාපි පන P. W.
9. අසිකොසියං W. අසිකොසියා P. V.
10. අඤ්ඤො P. W.
11. උද්ධරිතො S.
12. ආනෙජ්ජ° P.
13. කායං ති න දිස්සති S.
14. °නිම්මිනතාය S.

51. "ඒ මහණ තෙමේ මෙසේ ධ්‍යානයෙන් සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් නැතිවූ කල්හි, උපකෙලශ පහවූ කල්හි, මෘදුවූ කල්හි, යොග කර්මයට සුදුසුව සිටි කල්හි, නො සැලෙන බවට පැමිණි කල්හි, මනොමයවූ කයක් (රූපයක්) මතාකොට නිපදවීම පිණිස සිත එලවා තබයි, වෙසෙසින් නමයි. ඒ මහණ තෙමේ ආකාරවත්වූ, මනොමයවූ (ධ්‍යාන සිතින් නිපදවනලද), සියලු අඟපසඟ ඇති, අවිකලවූ ඉඳුරන් ඇති, මේ කයින් අන්‍යවූ කයක් මොනවට නිමවයි.

52. "ඇවැත්නි, යම්සේ වනාහි පුරුෂයෙක් තෙම මුඳු තණගසින් තණබඩය උද්ධරණය කරන්නේ ද: මේ තණගසය, මෙ තණබඩයය, තණගස අනිකෙක, තණබඩය අනිකෙක, තණගසින්ම තණබඩය ඇදගන්නා ලද්දේය, යන වැටහීම ඔහට පහළ වන්නේය.

"ඇවැත්නි, යම්සේ වනාහි පුරුෂයෙක් කඩුව කොපුවෙන් ඉවත් කරන්නේ ද ඔහුට මෙබඳු අදහසක් වන්නේය, එනම්: මෙ කඩුවය, මේ (කඩු) කොපුවය, කඩුව අනිකෙක, කොපුව අනිකෙක, කොපුවෙන්ම කඩුව ඉවත්කරණ ලද්දේය කියායි.

"ඇවැත්නි, යම්සේ පුරුෂයෙක් සර්පයකු සැවයෙන් පහ කරන්නේද[1] (වෙන්කොට සලකන්නේද), ඔහට මේ සර්පයාය, මේ සැවය, සර්පයා එකෙකි, සැව අනිකකි, සැවයෙන්ම සර්පයා වෙන්කරණ ලද්දේය යි වැටහීමක් ඇතිවන්නේය.

"ඇවැත්නි, එසේම භික්ෂුව මෙසේ සිත සමාධිගතවූ කල්හි, —පෙ— සිතින් උපදවන කයක් මැවීම පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට ඊට නමයි. හේ තෙමේ මේ වනාහි කයින් රූ ඇති, සිතින් මවන ලද, සියලු අඟපසඟ ඇති, නොපිරිහුනු ඉන්‍ද්‍රියයන් ඇති වෙන කයක් මවයි.

---

1. මෙසේ කරන්නෙත් සිතින් පමණකැයි අටුවාසි.

53. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[1] ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති[2] අභිනින්නාමෙති. සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති එකොපි හුත්වා බහුධා හොති බහුධාපි හුත්වා එකො හොති ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ. පඨවියා[3] පි උම්මුජ්ජනිමුජ්ජං[4] කරොති සෙය්‍යථාපි උදකෙ. උදකෙපි අභිජ්ජමානො[5] ගච්ඡති සෙය්‍යථාපි පඨවියං[3]. ආකාසෙ පි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙපි චන්දිමසූරියෙ[6] එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරිමසති[7] පරිමජ්ජති යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.

54. සෙය්‍යථාපි ආවුසො දක්ඛො කුම්භකාරො වා කුම්භකාරන්තෙවාසී වා සුපරිකම්මකතාය මත්තිකාය යං යදෙව භාජනවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය. සෙය්‍යථා වා[8] පන ආවුසො දක්ඛො දන්තකාරො වා දන්තකාරන්තෙවාසී වා සුපරිකම්මකතස්මිං දන්තස්මිං යං යදෙව දන්තවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය. සෙය්‍යථා වා[8] පන ආවුසො දක්ඛො සුවණ්ණකාරො වා සුවණ්ණකාරන්තෙවාසී වා සුපරිකම්මකතස්මිං සුවණ්ණස්මිං යං යදෙව සුවණ්ණවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය[9]. එවමෙව ඛො ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[1] ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති[2] අභිනින්නාමෙති. සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති එකො පි හුත්වා බහුධා හොති —පෙ— ඉමෙපි චන්දිමසූරියෙ[6] එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරිමසති[7] පරිමජ්ජති. යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.[10]

55. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[1] දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති[2] අභිනින්නාමෙති. සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය[11] උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච.

---

1. ආනෙජ්ජං P.
2. °නිහරති B.
3. පථ° B. V.
4. °නිම්මුජ්ජං P. W.
5. අභෙජ්ජ° W.
6. °සුරියෙ B.
7. පරා° B. V. W.
8. සෙය්‍යථාපි පන° P. W.
9. අභිනිප්පාදෙය්‍ය W.
10. කායෙනෙව සං° W.
11. °මානුස° B. V. Pa.

53. "හේ තෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත වූ කල්හි, උපක්ලේශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍ය භාවයට පැමිණි කල්හි, ඍද්ධිවිධි පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි (ඊට නැඹුරු කෙරෙයි). හේ තෙමේ නොයෙක් අයුරු ඇති ඍද්ධිවිධි වෙන් වෙන් කොට අනුභව කෙරෙයි. එකෙක්ව බොහෝ සේ වෙයි. බොහෝ සේ ව එකෙක් වෙයි. ප්‍රකට බවට, මුවහ බවට, අහසෙහි මෙන් බිත්තිය සරසට, පවුර සරසට, පව්ව සරසට නොගැටෙමින් යෙයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම් මතුවීම් කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබෙදා ගමන් කෙරෙයි. පක්ෂියකු මෙන් අහසෙහි ද පලඟින් යෙයි. මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභාව ඇති සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි, බඹලොව තෙක් කයින් වසඟ බව පවත්වයි.

54. "ඇවැත්නි, දක්ෂ කුඹල්කරුවෙක් හෝ කුඹල්කරු-අතවැසියෙක් හෝ යහපත් සේ පදම්කළ මැටියෙන් කැමති කැමති බඳුන් වර්ගයන් යම්සේ කරන්නේ ද, නිපදවන්නේ ද, ඇවැත්නි, දළ කැටයම් කරුවෙක් හෝ දළකැටයම්කරුගේ අතවැසියෙක් හෝ සකස් කළ දළයෙහි යම්සේ කැමති කැමති දළකැටයම් වර්ගයක් කරන්නේද, නිපදවන්නේද, ඇවැත්නි, දක්ෂ රන්කරුවෙක් හෝ රන්කරුඅතවැසියෙක් හෝ පදම්කළ රණින් කැමති කැමති රන් අබරණ ජාතීන් යම්සේ කරන්නේද, නිපදවන්නේද—ඇවැත්නි, එසේම භික්ෂුව සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත වූ කල්හි, කෙලෙශයන් පහ වූ කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍යභාවයට පැමිණි කල්හි, ඍද්ධිවිධි පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ නොයෙක් ඍද්ධිවිධි වෙන් වෙන් කොට අනුභව කෙරෙයි: එකෙක්ව බොහෝ සේ වෙයි, —පෙ— මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභාව ඇති, සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි, බඹලොව තෙක් කයින් වසඟබව කෙරෙයි.

55. "හේ තෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වරවූ කල්හි, අඞ්ගණ රහිතවූ කල්හි, උපකෙලශයන් පහව ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍යභාවයට පැමිණි කල්හි, දිව්‍යශ්‍රොත්‍රඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි (ඊට නැඹුරු කෙරෙයි). ඒ භික්ෂුව පිරිසුදු වූ, මිනිස්-බව ඉක්මවූ, දිව්‍ය ශ්‍රොත්‍රඥානයෙන් දිව්‍යමය වූද, මනුෂ්‍යමය වූද, දුරෙහි වූ ද සමීපයෙහි වූ ද දෙවැදෑරුම් ශබ්දයන් අසයි.

56. සෙය්‍යථාපි ආවුසො පුරිසො අද්ධානමග්ගපටිපන්නො[1] සො සුණෙය්‍ය භෙරිසද්දම්පි මුදිඞ්ගසද්දම්පි[2] සඞ්ඛපණවදෙණ්ඩිමසද්දම්පි[3] තස්ස එවමස්ස: භෙරිසද්දො ඉතිපි මුදිඞ්ගසද්දො[2] ඉතිපි සඞ්ඛපණවදෙණ්ඩිමසද්දො[4] ඉතිපි. එවමෙව ඛො ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනිහරති[5] අභිනින්නාමෙති.

සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච.

57. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[6] චෙතොපරියඤාණාය චිත්තං අභිනීහරති[5] අභිනින්නාමෙති. සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති.

සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති වීතරාගං[7] වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති සඞ්ඛිත්තං වා චිත්තං සඞ්ඛිත්තං චිත්තන්ති පජානාති වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

සෙය්‍යථාපි ආවුසො ඉත්ථී වා පුරිසො වා දහරො වා යුවා මණ්ඩනජාතිකො[8] ආදාසෙ වා පරිසුද්ධෙ පරියොදාතෙ අච්ඡෙ වා උදකපත්තෙ[9] සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො සකණිකං[10] වා සකණිකන්ති[9] ජානෙය්‍ය අකණිකං වා අකණිකන්ති[11] ජානෙය්‍ය.

---

1. °මග්ගප්පටි° B. V.
2. මුතිඞ්ග° P.W.
3. °දෙන්ඩිම° B; සඞ්ඛසද්දම්පි පණවසද්දම්පි දෙන්ඩිමස° S.
4. සංඛසද්දො ඉතිපි පණවසද්දො ඉතිපි දෙන්ඩිමස° S.
5. °නීහරති B.
6. ආනෙඤ්ජ° P.
7. විත° B. (සබ්බත්ථ)
8. මණ්ඩනක° S. C.
9. උදප° W.
10. සකනි° B.
11. අකනි° B.

56. "ඇවැත්නි, දික් මගට පිවිසි පුරුෂයෙක් බෙර හඬද, මිහිඟු බෙර හඬද, සක්, පණාබෙර, ගැටබෙර හඬද යම්සේ අසාද, ඔහුට මේ බෙර හඬයයිද, මිහිඟුබෙර හඬයයිද, සක්, පණාබෙර, ගැටබෙර හඬ යයිද සිතෙන්නේය. ඇවැත්නි, එලෙසින්ම භික්ෂුව මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදුවූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත වූ කල්හි, පහ වූ උපකෙලශ ඇති කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍යභාවයට පැමිණි කල්හි, දිව්‍යශ්‍රොතඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට ඊට නමයි.

"හේ තෙමේ මෙසේ පිරිසිදුවූ මිනිස්කණ ඉක්ම වූ දිව්‍ය ශ්‍රොතඥානයෙන් දිව්‍යමය වූ ද, මනුෂ්‍යමය වූ ද, දුරෙහි වූ ද, සමීපයෙහි වූ ද දෙවැද්දෑරුම් ශබ්දයන් අසයි.

57. "හේ තෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත වූ කල්හි, පහවූ උපකෙලශ ඇති කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍යභාවයට පැමිණි කල්හි, සිත් පිරිසිඳින ඥාණය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි (ඊට නැඹුරු කෙරෙයි). හේ තෙමේ අන්‍ය සත්ත්වයන්ගේ, අන්‍ය පුද්ගලයන්ගේ සිත (තමන් ගේ) සිතින් පිරිසිඳ දනියි.

"රාග සහිත සිත සරාග සිත යයි දනියි. රාගය පහ වූ සිත වීතරාග සිත යයි දනියි. ද්වෙෂ සහිත සිත සද්වෙස සිත යයි දනියි. ද්වෙෂය පහවූ සිත වීතද්වෙෂ සිත යයි දනියි. මොහ සහිත සිත සමොහ සිත යයි දනියි, මොහය පහ වූ සිත වීතමොහ සිත යයි දනියි. හැකුළුනු සිත හැකුළුනු සිත යයි දනියි, විසුරුණු සිත විසුරුණු සිත යයි දනියි. මහත් බවට ගිය සිත මහත් බවට ගිය සිත යයි දනියි. මහත් බවට නොගිය සිත මහත් බවට නොගිය සිත යයි දනියි. උතුරුසහිත (කාමාවචර) සිත උතුරුසහිත සිත යයි දනියි. අනුත්තර (රූපාවචර අරූපාවචර) සිත අනුත්තර සිත යයි දනියි. සමාධිගත වූ සිත සමාධිගත වූ සිත යයි දනියි, සමාධිගත නො වූ සිත සමාධිගත නො වූ සිත යයි දැනගණී. (කෙලශයෙන්) මිදුනු සිත මිදුනු සිත යයි දැනගණී, නොමිදුනු සිත නොමිදුනු සිත යයි දැනගණී.

"ඇවැත්නි, සැරසෙන සුලු ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ දහරයෙක් හෝ තරුණයෙක් හෝ පිරිසිදු, නොකිලිටි කැඩපතෙක හෝ පිරිසිදු දිය බඳුනෙක්හි හෝ තමාගේ මුව නිමිත්ත (මුඛ ශොභාව) පරීක්‍ෂා කරන්නේ, යම්සේ කැලල් සහිත නම් කැලල් සහිත යයි දැනගණීද, කැලල් රහිත නම් කැලල් රහිත යයි දැනගණීද,

එවමෙව ඛො ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— ආනෙඤ්ජප්පත්තෙ[1] චෙතොපරියඤාණාය චිත්තං අභිනීහරති[2] අභිනින්නාමෙති.

සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති—

සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති —පෙ— අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

58. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[1] පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති[2] අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති සෙය්‍යථීදං[3] එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසම්පි[4] ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි[5] ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ: අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උදපාදිං[6]. තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නොති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

59. සෙය්‍යථාපි ආවුසො පුරිසො සකම්හා ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය තම්හාපි ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය. සො[7] තම්හා[8] ගාමා සකඤ්ඤෙව[9] ගාමං පච්චාගච්ඡෙය්‍ය.[10] තස්ස එවමස්ස: අහං ඛො සකම්හා ගාමා අමුං ගාමං අගච්ඡිං[11] තත්‍ර[12] එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හීඅහොසිං. තම්හාපි ගාමා අමුං ගාමං අගච්ඡිං[11]. තත්‍රාපි[12] එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හීඅහොසිං. සොම්හි තම්හා ගාමා සකඤ්ඤෙව[9] ගාමං පච්චාගතො[10] ති.

1. අනෙජප්ප° P.
2. °නීහ ති B.
3. සෙය්‍යථිද° B. V.
4. වීසතිම්පි P. W.
5. සතංපි ජාතියො සහස්සංපි ජා° සතසහස්සංපි ජා° අනෙකෙපි S.
6. උප්පාදිං W.
7. සොහි න දිස්සති P. W.
8. තම්හාපි ගාමා P.
9. සකංයෙව B. P.
10. පච්ජා° P.
11. අගඤ්ජිං S. ආගඤ්ජිං P. ආගච්ඡිං Pa.
12. තත්‍රාහං B. S. තත්‍රාපි B. Pa. W.

"ඇවැත්නි, එසේම භික්ෂුව මෙසේ සිත එකඟ වූ කල්හි, සිත් පිරිසිඳින ඥාණය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ තෙමේ අන්‍ය සත්ත්වයන්ගේ, අන්‍ය පුද්ගලයන්ගේ සිත (තමන්ගේ) සිතින් පිරිසිඳ දනියි. සරාග සිත සරාග සිත යයි දනියි. —පෙ— නොමිදුනු සිත නොමිදුනු සිත යයි දැනගනියි.

58. "හේ තෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත වූ කල්හි, උපක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කර්මණ්‍යවූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍ය භාවයට පැමිණි කල්හි, පූර්වේනිවාසානුස්මෘතිඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට (ඊට) නමයි. හේ තෙමේ නොයෙක් විදියේ පෙර විසීම් සිහි කෙරෙයි. කෙසේදයත්: එක් ජාතියක් ද, දෙ ජාතියක් ද, තුන් ජාතියක් ද, සිවු ජාතියක් ද, පස් ජාතියක් ද, දස ජාතියක් ද, විසි ජාතියක් ද, තිස් ජාතියක් ද, සතළිස් ජාතියක් ද, පණස් ජාතියක් ද, සියක් ජාතියක් ද, දහස් ජාතියක් ද, සියක් දහස් ජාතියක් ද, නොයෙක් සංවෘත කල්පයන් ද, නොයෙක් විවෘත කල්පයන් ද, නොයෙක් සංවෘත විවෘත කල්පයන් ද 'අසුවල් තැන විමි, මෙනම් ඇත්තෙම්, මේ ගොත්‍ර ඇත්තෙම්, මෙ පැහැ ඇත්තෙම්, මේ අහර ඇත්තෙම්, මේ සැපදුක් වින්දෙම්, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙම් විමි. ඒ මම එයින් චුතවූයෙම්, අසුවල් තැන උපන්මි; එහිදු මෙනම් ඇත්තෙම්, මේ ගොත්‍ර ඇත්තෙම්, මේ පැහැ ඇත්තෙම්, මේ අහර ඇත්තෙම්, මෙ සැපදුක් වින්දෙම්, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙම් විමි. ඒ මම එයින් චුතවූයෙම් මෙහි උපන්මි'යි මෙසේ ආකාර සහිතව, උදෙසීම් සහිතව, නොයෙක් විදියේ පෙර විසීම් සිහිකෙරෙයි.

59. "ඇවැත්නි, පුරුෂයෙක් යම්සේ තම ගමින් අන් ගමකට යන්නේ ද, ඒ ගමිනුත් අන් ගමකට යන්නේ ද, ඒ ගමිනුත් තමන් ගමට එන්නේ ද, 'මම සිය ගමින් අසුවල් ගමට ගියෙමි, එහි මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි, මෙසේ බිණිමි, මෙසේ තුෂ්ණිම්භූත විමි. එගමිනුදු අසුවල් ගමට ගියෙමි, එහි ද, මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි, මෙසේ බිණිමි, මෙසේ තුෂ්ණිම්භූත විමි. ඒ මම ඒ ගමින් සිය ගමටම පැමිණියෙමි'යි හෙතෙම දන්නේ ද,

60. එවමෙව ඛො ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති[1] අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති—සෙය්‍යථීදං එකම්පි ජාතිං —පෙ— ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

61. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනීයෙ ඨිතෙ. ආනෙඤ්ජප්පත්තෙ[2] සත්තානං චුතූපපාතඤාණාය[3] චිත්තං අභිනීහරති[1] අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[4] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ[5] සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා.[6] ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති[6]. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[4] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

62. සෙය්‍යථාපි ආවුසො මජ්ඣෙ සිංඝාටකෙ පාසාදෙ[7] තත්ථ චක්ඛුමා පුරිසො ඨිතො පස්සෙය්‍ය මනුස්සෙ ගෙහං පවිසන්තෙපි නික්ඛමන්තෙපි රථියා[8] වීථිසඤ්චරන්තෙ[9] පි මජ්ඣෙ[10] සිංඝාටකෙ නිසින්නෙපි[11]. තස්ස එවමස්ස: එතෙ මනුස්සා ගෙහං පවිසන්ති එතෙ නික්ඛමන්ති එතෙ රථියා[8] වීථිසඤ්චරන්ති[12] එතෙ[13] මජ්ඣෙ සිංඝාටකෙ නිසින්නාති.

---

1. °නිහරති B.
2. ආනෙජ්ජ° P.
3. චුතුප° B.
4. උප්පජ්ජං W.
5. කම්මුපගෙ B.
6. උප්පන්නා W.
7. පාසාදෙ Pa.
8. රථියාපි රථිං සඤ්ච° V, රථියායපි B.
9. වීථි සං° P. W; වීථිං සංචරිං B. S; සං° V. ඒතිසං° Ce; විදිසංචරන්තෙ Ca. B.
10. මජ්ඣෙපි P. W.
11. නිසින්නෙ P. W.
12. වීථි° P. W, වීථිං° B.S. රථිං සං° V.
13. එතෙ මනුස්සා B.

60. "ඇවැත්නි, එපරිද්දෙන්ම භික්ෂුව මෙසේ සිත එකඟ වූ කල්හි, —පෙ— පූර්වේනිවාසානුස්මෘතිඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ නොයෙක් පූර්වේනිවාස සිහි කෙරෙයි. කෙසේදයත්: එක් ජාතියක් ද, —පෙ— නොයෙක් ආකාරවූ පූර්වේනිවාස සිහි කෙරෙයි.

61. "හෙතෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත කල්හි, උපක්ලේශ පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කර්මණ්‍යවූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍යමානභාවයට පැමිණි කල්හි සත්ත්වයන්ගේ චුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි (ඊට නැඹුරු කෙරෙයි). හේ පිරිසුදු වූ, මිනිස් ඇස ඉක්මවූ, දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී. හීන ප්‍රණීත, සුවර්ණ දුර්වර්ණ, සුගත දුර්ගත, කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දනී: 'මේ පින්වත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්තය, වාග්දුශ්චරිතයෙන් යුක්තය, මනොදුශ්චරිතයෙන් යුක්තය, ආර්‍ය්‍යයන්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය, මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන් වූවෝය. ඔවුහු කාබුන් මරණින් මතු අපාය වූ, දුර්ගතිය වූ, විනිපාතය වූ, නිරයට පැමිණෙත්'. නැතහොත්, 'මේ පින්වත් සත්ත්වයෝ කායසුචරිතයෙන් යුක්තය, වාක් සුචරිතයෙන් යුක්තය, මනඃසුචරිතයෙන් යුක්තය, ආර්‍ය්‍යයන්ට, නොබණින්නෝ ය, සම්‍යග්දෘෂ්ටිකයෝ ය, සම්‍යග්දෘෂ්ටිකර්ම සමාදන් වූවෝය, කාබුන් මරණින් මතු සුගතිය වූ, ස්වර්ග ලොකයට පැමිණියෝ'යි මෙසේ පිරිසුදු වූ මිනිස් ඇස ඉක්ම වූ දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී, හීන ප්‍රණීත, සුවර්ණ; දුර්වර්ණ, සුගත දුර්ගත, කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දනී.

62. "ඇවැත්නි, යම්සේ මංසලක පහයක් වේ ද, එහි ඇස් ඇති පුරුෂයෙක් සිටියේ ගෙට පිවිසෙන, ගෙයින් නික්මෙන, වීථියෙහි හැසිරෙණ, මංසල හිඳින මනුෂ්‍යයන් දක්නේ ද, ඔහුට මෙසේ සිතෙයි: 'මේ මිනිස්සු ගෙට පිවිසෙති, මොහු නික්මෙති, මොහු වීථියෙහි හැසිරෙති, මොහු මංසල හිඳිති'යි කියායි.

63. එවමෙව ඛො ආවුසො භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ—පෙ—සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති[1] අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[2] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[2] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

64. යො ඛො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති කල්ලං නු ඛො තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති?

යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති කල්ලං තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි, අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

65. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[3] ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති.

1. °නිහරාති B. 2. උප්පජ්ජ° W.
3. අනෙජ්ජ B.

63. "ඇවැත්නි, එසේ ම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, —පෙ— සත්ත්වයන්ගේ චුති උත්පත්ති ඥානගත්තා නුවණ පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ මිනිස් ඇස ඉක්ම වූ දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී. හීන ප්‍රණීත, සුවණී දුවණී, සුගත දුගීත, කර්ම්ය ලෙස පැමිණි සත්ත්වයන් දකී: 'මේ පින්වත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්තය, වාග්දුශ්චරිතයෙන් යුක්තය, මනොදුශ්චරිතයෙන් යුක්තය, ආයඝියන්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය, මිථ්‍යාදෘෂ්ටිකර්ම් සමාදන් වූවෝය. ඔවුහු කාබුන් මරණින් මතු අපාය වූ, දුගීතිය වූ, විනිපාතය වූ, නිරයට පැමිණෙත්'; නැත හොත්, 'මේ පින්වත් සත්ත්වයෝ කායසුචරිතයෙන් යුක්තය, වාක්සුචරිත යෙන් යුක්තය, මනඃ සුචරිතයෙන් යුක්තය, අායඝියන්ට නොබණින්නෝ ය, සම්‍යග්දෘෂ්ටිකයෝය, සම්‍යග්දෘෂ්ටිකර්ම් සමාදන් වූවෝය. ඔවුහු කාබුන් මරණින් මතු සුගතිය වූ, සවගී ලොකයට පැමිණියෝ'යි කියායි. මෙසේ පිරිසුදු වූ, මිනිස් ඇස ඉක්ම වූ දිව ඇසින් චුතවන, උපදින සත්ත්වයන් දකී; හීන ප්‍රණීත, සුවණී දුවණී, සුගත දුගීත, කර්ම්ය ලෙස පැමිණි සත්ත්වයන් දනී.

64. "ඇවැත්නි, යම් භික්ෂුවක්තෙම මෙසේ දනීද, මෙසේ දකීද, ඔහුට හේම ජීවය හේම ශරීරයයි හෝ, ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්නට සුදුසු ද?"

"ඇවැත්නි, යම් ඒ භික්ෂුවක්තෙම මෙසේ දනීද, මෙසේ දකීද, ඔහුට හේ ජීවය හේම ශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය කියන්ට වටනේමය."

"ඇවැත්නි, මම වනාහි මෙය මෙසේ දනිමි, මෙසේ දකිමි. එසේ වුවත් මම හේම ජීවය හේම ශරීරයයි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැයි හෝ යන මෙය නොකියමි.

65. "හේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞගණ රහිත කල්හි, උපක්ලෙශ යන් පහව ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍යමාන භාවයට පැමිණි කල්හි ආශ්‍රවයන්ගේ ක්‍ෂය ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට නමයි.

සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයො ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධො ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති [3] යථාභූතං පජානාති. ඉමෙ ආසවාති යථාභූතං පජානාති. අයං ආසවසමුදයොති යථාභූතං පජානාති. අයං ආසවනිරොධොති යථාභූතං පජානාති. අයං ආසවනිරොධගාමිනීපටිපදා [3] ති යථාභූතං පජානාති.

තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති භවාසවාපි චිත්තං විමුච්චති අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති [4] ඤාණං හොති. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති.

66. සෙය්‍යථාපි ආවුසො පබ්බතසඞ්ඛෙපෙ උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො. තත්ථ චක්ඛුමා පුරිසො තීරෙ ඨිතො පස්සෙය්‍ය සිප්පිසම්බුකම්පි [5] සක්ඛරකඨලම්පි [6] මච්ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පි. තස්ස එවමස්ස: අයං ඛො උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො. තත්‍රිමෙ සිප්පිසම්බුකා [5] පි සක්ඛරකඨලා [6] පි මච්ඡගුම්බාපි චරන්ති පි [7] තිට්ඨන්ති[8] පීති. එවමෙව ඛො ආවුසො භික්ඛු සමාහිතෙ චිත්තෙ —පෙ— ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති [2] අභිනින්නාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති —පෙ— අයං ආසවනිරොධගාමිනීපටිපදා ති යථාභූතං පජානාති.

තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති භවාසවාපි චිත්තං විමුච්චති අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති.

---

1. ආනෙජ්ජ B.
2. °නිහරති B.
3. ගාමිනි P.
4. විමුත්තම්හීති B.
5. සිප්පික° B. S. සිප්පිය° V.
6. °කථ° B.
7. චරන්තාපි B. V.
8. තිඨන්තා B. V.

"හේ තෙමේ මේ දුක යයි තතු ලෙස දැනගණී, මේ දුක් ඉපදීමේ හෙතුව යයි තතු ලෙස දැනගණී, මෙ දුඃඛනිරොධ යයි තතු ලෙස දැනගණී, මේ දුඃඛ නිරොධගාමී ප්‍රතිපදාව යයි තතු ලෙස දැනගණී. මේ ආශ්‍රවයෝ යයි තතු ලෙස දැනගණී, මේ ආශ්‍රව සමුදයයි තතු ලෙස දැනගණී, මේ ආශ්‍රව නිරොධ යයි තතු ලෙස දැනගණී, මේ ආශ්‍රවනිරොධගාමී ප්‍රතිපදාව යයි තතු ලෙස දැනගණී.

"'මෙසේ දක්නා මෙසේ දන්නා ඔහුගේ සිත කාමාශ්‍රවයෙන් කොරෙන් ද මිදේ, භවාශ්‍රවයෙන් කෙරෙන් ද සිත මිදේ, අවිද්‍යාශ්‍රවයෙන් කෙරෙන් ද සිත මිදේ. මිදුනු කල්හි 'මිදුනේය' යන සිතවෙයි. 'ජාතිය ක්‍ෂය වීය, බ්‍රහමචය්‍ර්‍යය වැස නිමවන ලදී, කටයුතු කරණලදී, මේ අත්බැවින් පසු අනික් අත්බවෙක් නැතැ'යි ද දැනගණී.

66. "'ඇවැත්නි, යම්සේ පර්‍වත මස්‍තකයෙක පිරිසුදු, විප්‍රසන්න, නොකැළඹුනු, දිය විලක් වේ ද, එහි ඉවුරේ ඇස් ඇති පුරුෂයෙක් සිටියේ සිප්පිබෙල්ලන් හා සක්බෙල්ලන් ද, කැටකැබලිති ද, එහා මෙහා යන්නාවූ හා නැවති සිටින මසුන් රැන් ද, හැසිරෙන්නවුන් ද, නැවති තිබෙන දෑද දක්නේ ද, ඔහුට මෙසේ සිතෙන්නේය: 'මේ දිය විල පිරිසුදුය, අතිශයින් ප්‍රසන්නය, නොකැළඹුනේය. එහි මේ සිප්පි බෙල්ලන් හා සක් බෙල්ලන් ද, කැටකැබලිති ද, මසුන් රැන් ද හැසිරෙත්, නැවති සිටිත්ය' කියායි. ඇවැත්නි, එලෙසින් ම භික්‍ෂුව මෙසේ සිත එකඟ වූ කල්හි, —පෙ— ආශ්‍රවක්‍ෂයඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට නමයි. හේ තෙමේ මේ දුකයයි තතු ලෙස දැනගණී, —පෙ— මේ ආශ්‍රවනිරොධගාමී ප්‍රතිපදාවයයි තතු ලෙස දැනගණී.

"'මෙසේ දක්නා, මෙසේ දන්නා ඔහුගේ සිත කාමාශ්‍රවයෙන් කෙරෙන් ද, භවාශ්‍රවයෙන් කෙරෙන් ද මිදේ, අවිද්‍යාශ්‍රවයෙන් කොරෙන්ද සිත මිදේ. මිදුනු කල්හි 'මිදුනේය' යන සිත වෙයි. 'ජාතිය ක්‍ෂය වීය, බ්‍රහමචය්‍ර්‍යය වැස නිමවන ලදී, කටයුතු කරණ ලදී, මේ අත්බැවින් පසු අනික් අත්බවෙක් නැතැ'යි ද දැනගණී.

67. යො නු ඛො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති කල්ලං නු ඛො තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති?

යො සො ආවුසො භික්ඛු එවං ජානාති එවං පස්සති න කල්ලං තස්සෙතං වචනාය තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

අහං ඛො පනෙතං ආවුසො එවං ජානාමි එවං පස්සාමි. අථ ච පනාහං න වදාමි තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වාති.

ඉදමවොච භගවා. අත්තමනා තෙ ද්වෙ පබ්බජිතා භගවතො භාසිතං අභිනන්දුන්ති.

ජාලියසුත්තං නිට්ඨිතං සත්තමං.[1]

1. ජාලිය සුත්තන්තං P.

67. "ඇවැත්නි, යම් මහණෙක්තෙම මෙසේ දනීද, මෙසේ දකීද එබඳු වූ (රහත්) මහණහට 'ඒම ජීවය ඒම ශරීරය' හි හෝ 'ජීවය අනිකක, ශරීරය අනිකකැ'හි හෝ යන මෙය කියන්නට වටීදැ' (හි ඇසීම්).

"ඇවැත්නි, යම් ඒ භික්ෂුවක්තෙම මෙසේ දනීද, මෙසේ දකීද, ඒ භික්ෂුහට හේම ජීවය හේම ශරීරය හි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැහි හෝ යන මෙය කියන්ට නොවටනේය."

"ඇවැත්නි, මම වනාහි මෙය මෙසේ දනිමි, මෙසේ දකිමි. එසේවුවත් මම හේම ජීවය හේම ශරීරය හි හෝ ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැහි හෝ යන මෙය නොකියමි."

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රධර්මය වදාළසේක. සතුටු සිත් ඇත්තාවූ ඒ දෙපැවිද්දෝ භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගත්හ.

සත්වැනි ජාලිය සූත්‍රය නිමියේය.

8. කස්සප සීහනාද සුත්තං[1]

1. එවං මෙ සුතං. එකං සමයං භගවා උජුඤ්ඤායං[2] විහරති කණ්ණකත්ථලෙ[3] මිගදායෙ අථ ඛො අචෙලො කස්සපො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි සම්මොදනීයං[4] කථං සාරාණීයං[5] වීතිසාරෙත්වා එකමන්තං අට්ඨාසි.

2. එකමන්තං ඨිතො ඛො අචෙලො කස්සපො භගවන්තං එතදවොච: සුතම්මෙ[6] තං භො ගොතම සමණො ගොතමො සබ්බං තපං ගරහති සබ්බං තපස්සිං ලූඛාජීවිං[7] එකංසෙන උපක්කොසති උපවදතීති. යෙ තෙ භො ගොතම එවමාහංසු සමණො ගොතමො සබ්බං තපං ගරහති සබ්බං තපස්සිං ලූඛාජීවිං එකංසෙන උපක්කොසති උපවදතීති කච්චි තෙ භොනො[8] ගොතමස්ස වුත්තවදිනො න ච භවන්තං ගොතමං අභූතෙන අබ්භාචික්ඛන්ති ධම්මස්ස චානුධම්මං[9] බ්‍යාකරොන්ති[10] න ච කොචි සහධම්මිකො වාදානුවාදො ගාරය්හං ඨානං ආගච්ඡති? අනබ්භක්ඛාතුකාමා හි මයං භවන්තං ගොතමන්ති.

3. යෙ තෙ කස්සප එවමාහංසු සමණො ගොතමො සබ්බං තපං ගරහති සබ්බං තපස්සිං ලූඛාජීවිං එකංසෙන උපක්කොසති උපවදතීති න මෙ තෙ වුත්තවාදිනො. අබ්භාචික්ඛන්ති ච පන මං තෙ[11] අසතා අභූතෙන. ඉධාහං කස්සප එකච්චං තපස්සිං ලූඛජීවිං පස්සාමි දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන[12] කායස්ස භෙදා පරම්මරණා[13] අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නං[14] ඉධ පනාහං කස්සප එකච්චං තපස්සිං ලූඛ ජීවිං පස්සාමි දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන[12] කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නං.[14]

---

1. මහාසීහ° V.
2. උරුඤ්ඤායං V.; උජ්ජුකාය, උජඤ්ඤායං, උජ්ජුඤ්ඤායං Pa.
3. කන්න° Pa; කණ්ණථලෙ V.
4. °නියං B.
5. සාර° V.
6. සුතමෙතං V.
7. °ජීවිං තං එකංසෙන Pa.
8. භො P.
9. ච අනු° S.
10. ව්‍යා° P. C.
11. න ච පන මං තෙ B.
12. ඉතො පරං —පෙ— කාරෙ දිස්සති [P.V.W
13. පරං මරණා B. S.(සබ්බත්ථ)
14. උප්ප° P. W. (සබ්බත්ථ)

8. කස්සප සීහනාද සූත්‍රය

1. (මේ සූත්‍රය) මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ උජුඤ්ඤා නම් නුවර මෘගයන්ට අභය පිණිස දෙන ලද කණ්ණකත්ථල නම් වනලැහැබෙහි වැඩවසන සේක. එකල අචෙල කස්සප[1] නම් තැනැත්තේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූයේය. සතුටු විය යුතුවූ සිහිකට යුතුවූ කථා කොට නිමවා එකත්පසෙක සිටියේය.

2. එකත්පසෙක සිටියාවූ අචෙලකාශ්‍යප තෙමේ භාග්‍යවතුන්වහන්සේට මේ වචනය සැලකෙළේය:

පින්වත් ගෞතමය, ‘ශ්‍රමණ භවත් ගෞතම තෙමේ සියලු තපසට ගරහයි, රූක්‍ෂාජීවවෘත්ති (රළුවූ දිවිපෙවෙත්) ඇති සියලු තපස්වීන්ට එකාන්තයෙන් හෙළාදකියි, අවඥාපූර්වක අපවාද කෙරෙයි’ යන මේ කාරණය මා විසින් අසන ලද්දේය. පින්වත් ගෞතමය, ‘ශ්‍රමණ භවත් ගෞතම තෙමේ සියලු තපසට ගරහයි, රූක්‍ෂාජීවවෘත්ති ඇති සියලු තපස්වීන්ට එකාන්තයෙන් හෙළාදකියි, අවඥාපූර්වක අපවාද කෙරේය’යි යම් කෙනෙක් මෙසේ කියත් නම් කිමෙක්ද? ඔවුහු පින්වත් ගෞතමයන් විසින් කියන ලද්දක්ම කියත්තෝද නැතහොත් පින්වත් ගෞතමයන් හට බොරුවෙන් අභිභවනය කොට නිඥාවශයෙන් කියත්තෝද? (ඔවුහු) පින්වත් ගෞතමයන් විසින් කියනලද කාරණයට අනුව කරුණු කියද්ද? නැතහොත් ඔබගේ වාදය (ධර්මය) නොහොත් අනුවාදය (ඒ අනුව ලැබිය හැකි නිගමනය) කරුණු සහිතව ප්‍රාඥයන් විසින් ගැරහීමට හේතු නැද්ද?[2] අපි පින්වත් ගෞතමයන්හට බොරුවෙන් අභිභවනය කොට කියන්නට (චෝදනාකරන්නට) නොකැමැත්තම්හ.

3. කාශ්‍යපය, ‘ශ්‍රමණගෞතම තෙමේ සියලු තපසට ගරහයි, රූක්‍ෂාජීවවෘත්ති ඇති සියලු තපස්වීන්ට එකාන්තයෙන් පරිභව කෙරෙයි, අවඥාපූර්වක අපවාද කෙරේය’යි ඒ යම් කෙනෙක් මෙසේ කීවෝද, ඔවුහු මා කීවක් කියත්තෝ නොවෙත්. ඔවුහු මට අසත්‍යයෙන් බොරුවෙන් අභිභවනය (චෝදනා) කොට කියත්තෝ වෙත්. කාශ්‍යපය, මම මේ ලොකයෙහි (තණ, ගොම අනුභව කිරීම් ආදී) රූක්‍ෂාජීවවෘත්ති ඇති, කායභෙද සංඛ්‍යාත මරණයෙන් පසු අපාය නම්වූ නරක ගති ඇති, දුකට හේතුවූ හෙයින් දුර්ගති නම්වූ, විවසව පතිත වන්නාවූ (නොවැටී සිටින්නට නොහැකි) නරකයෙහි උපදින්නාවූ ඇතැම් තපස්වී කෙනෙකු මිනිසැස ඉක්ම පවත්නා, පිරිසිදු වූ දිවැසින් දකිමි. කාශ්‍යපය, මම මේ ලොකයෙහි රූක්‍ෂාජීවවෘත්ති ඇති ඇතැම් තපස්වී කෙනෙකු කායභෙදසංඛ්‍යාත මරණයෙන් පසු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදින බවද, මිනිසැස ඉක්මවූ පිරිසිදුවූ දිවැසින් දකිමි.

---

1. අචෙල යනු නිර්වස්ත්‍ර යන අර්ථයි. 2. මේ වාක්‍යයෙහි අර්ථ සුගම නොවේ. විමසිය යුතුයි.

5. ත්‍යාහං උපසඞ්කමිත්වා එවං වදාමි: යෙසු නො ආවුසො ඨානෙසු න සමෙති[1] තිට්ඨන්තු තානි ඨානානි. යෙසු ඨානෙසු සමෙති තත්ථ විඤ්ඤූ සමනුයුඤ්ජන්තං[2] සමනුගාහන්තං[2] සමනුභාසන්තං[2] සත්ථාරා වා සත්ථාරං සඞ්ඝෙන වා සඞ්ඝං: යෙ ඉමෙසං භවතං ධම්මා අකුසලා අකුසලසඞ්ඛාතා සාවජ්ජා සාවජ්ජසඞ්ඛාතා අසෙපිතබ්බා අසෙවිතබ්බසඞ්ඛාතා නාලමරියා[3] නාලමරියසඞ්ඛාතා[3] කණ්හා[4] කණ්හසඞ්ඛාතා[4] කො ඉමෙ ධම්මෙ අනවසෙසං පහාය වත්තති සමණො වා[5] ගොතමො[6] පරෙ වා පන භොන්තො ගණාචරියාති?

6. ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා එවං වදෙය්‍යුං: යෙ ඉමෙසං භවතං ධම්මා අකුසලා අකුසලසඞ්ඛාතා සාවජ්ජා සාවජ්ජසඞ්ඛාතා අසෙවිතබ්බා අසෙවිතබ්බසඞ්ඛාතා නාලමරියා නාලමරියසඞ්ඛාතා[3] කණ්හා[4] කණ්හසඞ්ඛාතා[4] සමණො ගොතමො ඉමෙ ධම්මෙ අනවසෙසං පහාය වත්තති යං වා පන භොන්තො පරෙ ගණාචරියාති.

ඉතිහ කස්සප විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා අම්හෙව තත්ථ යෙභුය්‍යෙන පසංසෙය්‍යුං.

---

1. සමෙන්ති S. (සබ්බත්ථ)
2. °න්තා V.
3. න අලමරි° B.Pa.S.C. (සබ්බත්ථ)
4. කි° P.
5. වා ති නත්ථි S.
6. ගොතමො වා Pa.

5. මම ඔවුන් කරා එළඹ මෙසේ කියමි: 'ඇවැත්නි, යම් කාරණයන්හි අපේ ධර්මය සම නොවේද ඒ කාරණයෝ නවතිත්වා (පසෙක වෙත්වා). යම් කාරණයන්හි සමවේද, එහි (ඒ පිළිබඳව) මේ පින්වතුන්ගේ යම් ධර් කෙනෙක් අකුශල් හුද, අකුශල් යයි වෙන්කොට තබනලද්දාහුද, සාවද්‍යයෝ ද, සාවද්‍යයයි වෙන්කොට තබන ලද්දාහුද, සේවනය නොකට යුත්තෝද, සේවනය නොකට යුත්තෝයයි වෙන්කොට තබන ලද්දාහුද, ආර්යකරණයට (උතුම්යයි කියන්නට) නොපොහො-සත්හුද, ආර්යකරණයට නොපොහොසත්හුයයි වෙන්කොට තබන ලද්දාහුද, කෘෂ්ණ ධර්මයෝ වෙත්ද, කෘෂ්ණ ධර්මයෝ යයි වෙන්කොට තබන ලද්දාහුද, කවරෙක්නු නම් මේ ධර්මයන් නිරව ශෙෂව(සම්පූර්ණයෙන්) දුරුකොට පවතිත්ද?(එසේ පවතිත්තේ) ශ්‍රමණ ගෞතම ද, නැතහොත් අන්‍යවූ පින්වත් ගණාචාර්යයෝ දැයි නුවණැත්තෝ මෙසේ (අන්‍ය)ශාස්තෘවරයෙකු සමග (සසඳාබලා) ගෞතම ශාස්තෘවරයා හෝ පින්වත් අන්‍ය ගණාචාර්ය ශ්‍රාවක සංඝයා සමග ගෞතම ශ්‍රාවක සංඝයා හෝ (ලබ්ධි වශයෙන්) විචාරත්වා, (කරුණු වශයෙන්) ප්‍රශ්න කෙරෙත්වා, සලකත්වා.

6. කාශ්‍යපය, නුවණැත්තෝ මෙසේ ලබ්ධි විචාරන්නාහු කරුණු විචාරන්නාහු, සලකා බලන්නාහු මේ භවතුන්ගේ යම් ධර් කෙනෙක් අකුශල්හුද අකුශල්හුයයි වෙන්කොට තබන ලද්දාහුද, සාවද්‍යයෝද සාවද්‍යයයි වෙන්කොට තබන ලද්දාහුද, සේවනය නොකටයුත්තෝද සේවනය නොකටයුත්තෝයයි වෙන්කොට තබන ලද්දාහුද, ආර්යකරණයට (උතුම්යයි කියන් නට) නොපොහොසත්හුද ආර්යකරණයට නොපොහොසත්හු යයි වෙන්කොට තබන ලද්දාහුද, කෘෂ්ණ ධර්මයෝ වෙත්ද කෘෂ්ණ ධර්මයෝයයි වෙන්කොට තබනලද්දාහුද, ගෞතම ශ්‍රමණ තෙම වනාහි මේ ධර්මයන් නිරවශෙෂයෙන් දුරුකොට පවතී, පින්වත් වූ අන්‍ය ගණාචාර්යයෝ (ඒ අකුශලයන්) සවල්පමාත්‍ර වශයෙන් දුරුකොට පවතිත්යයි කියන්නට යම් කරුණක් ඇතිවේද එබඳු කරුණක් මෙහි විද්‍යමාන වේමය (එබන්දක් යුක්ති සහගතව කියන්නට අවකාශ ඇත්තේමය).

කාශ්‍යපය, මෙසේ නුවණැත්තෝ ලබ්ධි විචාරන්නාහු, කරුණු විචාරන්නාහු, හැම ලෙසින් සලකා බලන්නාහු ඒ කාරණය පිළිබඳව බෙහෙවින් අපටම පසසන්නෝය.

7. අපරම්පි නො කස්සප විඤ්ඤූ සමනුයුඤ්ජන්තං[1] සමනුගාහන්තං[1] සමනුභාසන්තං[1] සත්ථාරා වා සත්ථාරං සඞ්ඝෙන වා සඞ්ඝං: යෙ ඉමෙසං භවතං ධම්මා කුසලා කුසලසඞ්ඛාතා අනවජ්ජා අනවජ්ජසඞ්ඛාතා සෙවිතබ්බා සෙවිතබ්බසඞ්ඛාතා අලමරියා අලමරියසඞ්ඛාතා සුක්කා සුක්කසඞ්ඛාතා කො ඉමෙ ධම්මෙ අනවසෙසං සමාදාය වත්තති සමණො වා[2] ගොතමො පරෙ වා පන භොන්තො ගණාචරියාති.

8. ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා එවං වදෙය්‍යුං: යෙ ඉමෙසං භවතං ධම්මා කුසලා කුසලසඞ්ඛාතා අනවජ්ජා අනවජ්ජසඞ්ඛාතා සෙවිතබ්බා සෙවිතබ්බසඞ්ඛාතා අලමරියා අලමරියසඞ්ඛාතා සුක්කා සුක්කසඞ්ඛාතා සමණො ගොතමො ඉමෙ ධම්මෙ අනවසෙසං සමාදාය වත්තති යං වා පන භොන්තො පරෙ ගණාචරියාති.

ඉතිහ කස්සප විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා අම්හෙව[3] තත්ථ යෙභුය්‍යෙන පසංසෙය්‍යුං.

9. අපරම්පි නො කස්සප විඤ්ඤූ සමනුයුඤ්ජන්තං[1] සමනුගාහන්තං[1] සමනුභාසන්තං[1] සත්ථාරා වා සත්ථාරං සඞ්ඝෙන වා සඞ්ඝං: යෙ ඉමෙසං භවතං ධම්මා අකුසලා[4] අකුසලසඞ්ඛාතා[4] සාවජ්ජා සාවජ්ජසඞ්ඛාතා අසෙවිතබ්බා අසෙවිතබ්බසඞ්ඛාතා නාලමරියා නාලමරියසඞ්ඛාතා කණ්හා[5] කණ්හසඞ්ඛාතා[5] කො

---

1. °න්තා V.
2. වා ති නත්ථි S.
3. අහමෙව Pa
4. කුස° S.
5. කි° P.

7. කාශ්‍යපය, අනිකෙක්ද ඇත. නුවණැත්තෝ ලබ්ධි විචාරන්නාහු, කරුණු විචාරන්නාහු, හාත්පස විමසන්නාහු, අන්‍ය ශාස්තෘවරයකු සමඟලා (සසඳා) ගෞතම් ශාස්තෘවරයා හෝ අන්‍ය ශාස්තෘශ්‍රාවක සංඝයා සමඟලා ගෞතම ශාස්තෘශ්‍රාවක සංඝයා හෝ විචාරත්වා. මේ භවතුන්ගේ යම් ධර්ම කෙනෙක් කුශල්හු වෙත්ද කුශල්හුයයි වෙන්කොට තබන ලද්දාහුද, අනවද්‍යයෝද අනවද්‍යයෝයයි වෙන්කොට තබන ලද්දාහුද, සේවනය කටයුත්තෝද සේවනය කටයුත්තෝයයි වෙන්කොට තබන ලද්දාහුද, ආර්‍ය්‍යකරණයට (උතුම්බවට පැමිණෙන්නට) පොහොසත්හුද ආර්‍ය්‍යකරණයට පොහොසත්හුයයි වෙන්කොට තබන ලද්දාහුද, ශුක්ල (පිරිසිදු) ධර්මයෝද ශුක්ල ධර්මයෝ යයි වෙන්කොට තබන ලද්දාහුද, කාශ්‍යපය, කවරෙක්හු මේ ධර්මයන් නිරවශේෂයෙන් සමාදන්ව පවතිත්ද, (එසේ පවතින්නෝ) ගෞතම ශ්‍රමණයෝ ද නැතහොත් අන්‍ය පින්වත් ගණාචාර්‍ය්‍යයෝ දැයි ලබ්ධි විචාරත්වා, කරුණු විචාරත්වා, හාත්පස විමසත්වා.

8. (එවිට) මේ පින්වතුන්ගේ යම් ධර්ම කෙනෙක් කුශල්හුද කුශල්හුයයි වෙන්කොට තබන ලද්දාහුද, අනවද්‍යයෝද අනවද්‍ය යෝයයි වෙන්කොට තබන ලද්දාහුද, සේවනය කටයුත්තෝද සේවනය කටයුත්තෝ යයි වෙන්කොට තබන ලද්දාහුද, ආර්‍ය්‍ය කරණයට පොහොසත්හුද ආර්‍ය්‍යකරණයට පොහොසත්හුයයි වෙන්කොට තබන ලද්දාහුද, ශුක්ල (පිරිසුදු) ධර්මයෝද ශුක්ල ධර්මයෝයයි වෙන්කොට තබන ලද්දාහුද, ගෞතම ශ්‍රමණතෙම වනාහි මේ ධර්මයන් නිරවශේෂයෙන් සමාදන්ව පවති, පින්වත් වූ අන්‍යගණාචාර්‍ය්‍යයෝතුමූ (ඒ ධර්මයන්) සවල්පමාත්‍රයක් සමාදන්ව පවතිත්යයි කියන්නට යම් කරුණක් ඇතිවේද, එබඳු කරුණක් මෙහි වනාහි විද්‍යමාන වේමය (එවැන්නක් සකරුණෙන් කියන්නට අවකාශ ඇත්තේමය).

කාශ්‍යපය, මෙසේ මේ කාරණයෙහි නුවණැත්තෝ ලබ්ධි විචාරන්නාහු, කරුණු විචාරන්නාහු, හාත්පස විමසන්නාහු, ඒකාරණයෙහි අපටම බෙහෙවින් පසසන්නෝය.

9. කාශ්‍යපය, අනිකෙක්ද ඇත. නුවණැත්තෝ මේ භවතුන්-ගේ යම් ධර්මකෙනෙක් අකුශල්හුද අකුශල් යයි වෙන්කොට තබන ලද්දාහුද, සාවද්‍යයෝද සාවද්‍යයෝ යයි වෙන්කොට තබන ලද්දාහුද, සේවනය නොකටයුත්තෝද සේවනය නොකට යුත්තෝයයි වෙන්කොට තබන ලද්දාහුද, ආර්‍ය්‍යකරණයට නොපොහොසත්හුද ආර්‍ය්‍යකරණයට නොපොහොසත්හුයයි වෙන්කොට තබනලද්දාහුද, කෘෂ්ණධර්මයෝද කෘෂ්ණධර්මයෝයයි වෙන්කොට තබනලද්දාහුද,

ඉමෙ ධම්මෙ අනවසෙසං පහාය වත්තති ගොතමසාවක-සඞ්ඝො වා පරෙ[1] වා පන භොන්තො ගණාචරියසාවක-සඞ්ඝාති.

10. ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං විඤ්ඤූ සමනු-යුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා එවං වදෙය්‍යුං: යෙ ඉමෙසං භවතං ධම්මා අකුසලා අකුසලසඞ්ඛාතා සාවජ්ජා සාවජ්ජසඞ්ඛාතා අසෙවිතබ්බා අසෙවිතබ්බසඞ්ඛාතා නාලමරියා නාලමරියසඞ්ඛාතා[3] කණ්හා[4] කණ්හසඞ්ඛාතා[4] ගොතමසාවක-සඞ්ඝො ඉමෙ ධම්මෙ අනවසෙසං පහාය වත්තති යං වා පන භොන්තො පරෙ ගණාචරියසාවකසඞ්ඝාති.

ඉතිහ කස්සප විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා අම්හෙව තත්ථ යෙභුය්‍යෙන පසංසෙය්‍යුං.

11. අපරම්පි නො කස්සප විඤ්ඤූ සමනුයුඤ්ජන්තං[5] සමනුගාහන්තං[5] සමනුභාසන්තං[5] සත්ථාරා වා සත්ථාරං සඞ්ඝෙන වා සඞ්ඝං: යෙ ඉමෙසං භවතං ධම්මා කුසලා කුසලසඞ්ඛාතා අනවජ්ජා අනවජ්ජසඞ්ඛාතා සෙවිතබ්බා සෙවිතබ්බසඞ්ඛාතා අලමරියා අලමරියසඞ්ඛාතා සුක්කා සුක්කසඞ්ඛාතා කො ඉමෙ ධම්මෙ අනවසෙසං සමාදාය වත්තති ගොතමසාවකසඞ්ඝො වා පරෙ වා පන භොන්තො ගණාචරියසාවකසඞ්ඝාති.

---

1. අපරෙ Pa.
2. °සංඝෙඝාති Pa. W.
3. න අලමරිය° B. S.
4. කි° P.
5. °න්තා V.

කවරෙක් මේ ධර්මයන් නිරවශෙෂව දුරුකොට පවත්නේද, (එසේ පවතින්නේ) ගෞතම ශ්‍රාවක සංඝයාද නැතහොත් පින්වත්වූ අන්‍යගණාචාර්ය ශ්‍රාවක සංඝයා දැයි, පින්වත්වූ (අන්‍යගණාචාර්ය) ශාස්තෘවරයෙකු සමග ලා (සසඳා) ගෞතම ශාස්තෘවරයාද, පින්වත් අන්‍ය (ගණාචාර්ය) ශාස්තෘන්ගේ ශ්‍රාවක සංඝයා සමග ලා ගෞතම ශ්‍රාවක සංඝයාද ලබ්ධි වශයෙන් විචාරත්වා, කරුණු වශයෙන් විචාරත්වා, හාත්පසින් විමසත්වා.

10. කාශ්‍යපය, එහි මෙබඳු කාරණයක් ඇත්තේය:—යම් හෙයකින් නුවණැත්තෝ ලබ්ධි විචාරන්නාහු කරුණු විචාරන්නාහු හාත්පස විමසන්නාහු වෙත් නම් ඔවුහු ඒකාන්තයෙන් මෙසේ කියත්මය (කෙසේද යත්:) මේ පින්වතුන්ගේ යම් ධර්මකෙනෙක් අකුශල්හුද අකුශල්හු යයි වෙන්කොට තබනලද්දාහුද, සාවද්‍යයෝද සාවද්‍යයෝයයි වෙන්කොට තබන ලද්දාහුද, සේවනය නොකට යුත්තෝද සේවනය නොකට යුත්තෝයයි වෙන්කොට තබන ලද්දාහුද, ආර්යකරණයට නොපොහොසත්හුද ආර්යකරණයට නොපොහොසත්හුයයි වෙන්කොට තබන ලද්දාහුද, කෘෂ්ණධර්මයෝද කෘෂ්ණධර්මයෝ යයි වෙන්කොට තබන ලද්දාහුද, ගෞතම ශ්‍රාවක සංඝතෙම වනාහි ඒ මේ ධර්මයන් නිරවශෙෂයෙන් දුරුකොට පවතී, පින්වත්වූ අන්‍යගණාචාර්ය-යන්ගේ ශ්‍රාවකසංඝතෙම (ඒ ධර්මයන්) සවල්පමාත්‍ර වශයෙන් දුරුකොට පවතිය (කියාහි).

කාශ්‍යපය, මෙසේ මේ කාරණයෙහි නුවණැත්තෝ ලබ්ධි විචාරන්නාහු කරුණු විචාරන්නාහු හැමලෙසින් සලකන්නාහු අපටම ඒකාරණය පිළිබඳව බෙහෙවින් පසසන්නාහුය.

11. කාශ්‍යපය, අනිකෙක්ද ඇත. මේ භවතුන්ගේ යම් ධර්මකෙනෙක් කුශල්හුද කුශල්හුයයි වෙන්කොට තබන ලද්දාහුද, අනවද්‍යයෝද අනවද්‍යයෝ යයි වෙන්කොට තබන ලද්දාහුද, සේවනය කටයුත්තෝද සේවනය කටයුත්තෝ යයි වෙන්කොට තබන ලද්දාහුද, ආර්යකරණයට (උතුම් බවට පැමිණවීමට) පොහොසත්හුද ආර්යකරණයට පොහොසත්හු යයි වෙන්කොට තබන ලද්දාහුද, ශුක්ල (පිරිසුදු) ධර්මයෝද ශුක්ල ධර්මයෝයයි වෙන්කොට තබන ලද්දාහුද, කවරෙක් මේ ධර්මයන් නිරවශෙෂයෙන් සමාදන්ව පවතිත්ද? (එසේ පවතින්නේ) ගෞතම ශ්‍රාවක සංඝයාද නැතහොත් පින්වත්වූ අන්‍යගණාචාර්ය ශ්‍රාවක සංඝයාදැයි පින්වත්වූ අන්‍යගණාචාර්ය ශාස්තෘවරයෙකු සමග ලා (සසඳා) ගෞතම ශාස්තෘවරයා හෝ අන්‍ය ශාස්තෘ ශ්‍රාවක සංඝයා සමග ලා ගෞතම ශ්‍රාවක සංඝයා හෝ ලබ්ධි වශයෙන් විචාරත්වා, කරුණු වශයෙන් විචාරත්වා, හැම ලෙසින් සලකත්වා.

12. ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා එවං වදෙය්‍යුං: යෙ ඉමෙසං භවතං ධම්මා කුසලා කුසලසඞ්ඛාතා අනවජ්ජා අනවජ්ජසඞ්ඛාතා සෙවිතබ්බා සෙවිතබ්බසඞ්ඛාතා අලමරියා අලමරියසඞ්ඛාතා සුක්කා සුක්කසඞ්ඛාතා ගොතමසාවකසඞ්ඝො ඉමෙ ධම්මෙ අනවසෙසං සමාදාය වත්තති යං වා පන භොන්තො පරෙ[1] ගණාචරියසාවකසඞ්ඝාති.[2]

ඉතිහ කස්සප විඤ්ඤූ සමනුයුඤ්ජන්තා සමනුගාහන්තා සමනුභාසන්තා අම්හෙ ව තත්ථ යෙභුය්‍යෙන පසංසෙය්‍යුං.

13. අත්ථි කස්සප මග්ගො අත්ථි පටිපදා යථා[3] පටිපන්නො සාමඤ්ඤෙව[4] ඤස්සති සාමං දක්ඛීති[5]: සමණො ව[6] ගොතමො කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදීති.

කතමො ච කස්සප මග්ගො කතමා[7] පටිපදා යථා පටිපන්නො[8] සාමඤ්ඤෙව[9] ඤස්සති සාමං දක්ඛීති:[5] සමණො ව ගොතමො කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදීති? අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො සෙය්‍යථීදං[10] සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි. අයං ඛො කස්සප මග්ගො අයං පටිපදා යථා පටිපන්නො සාමඤ්ඤෙව[4] ඤස්සති සාමං දක්ඛීති[5]: සමණො ව[11] ගොතමො කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදීති.

---

1. පරෙ වා P. W.
2. °සංඝාති Pa.
3. යථා වා Pa.
4. සාමංයෙව B. P.
5. දක්ඛිති V.; දක්ඛති W. Pa.
6. වකාරො නත්ථි P. S.
7. කතමා ච S.
8. °පන්නොව Va.
9. සාමංයෙව B. P. W.
10. °ථිදං B. V.
11. ව කාරො නත්ථි B. S.

12. කාශ්‍යපය, තුවණැත්තෝ එසේ ලබ්ධි විචාරත්නම් කරුණු විචාරත්නම්, භාත්පසින් විමසත්නම්, මේ පින්වතුන්ගේ යම් ධර්ම කෙනෙක් කුශල්හුද කුශල්හුයයි වෙන්කොට තබන ලද්දාහුද, අනවද්‍යයෝද අනවද්‍යයෝයයි වෙන්කොට තබන ලද්දාහුද, සේවනය කට යුත්තෝද සේවනය කට යුත්තාහු යයි වෙන්කොට තබන ලද්දාහුද, ආර්‍ය්‍යකරණයට පොහොසත්හුද ආර්‍ය්‍යකරණයට පොහොසත්හු යයි වෙන්කොට තබන ලද්දාහුද, ශුක්ල ධර්මයෝද ශුක්ල ධර්මයෝයයි වෙන්කොට තබන ලද්දාහුද, ඒ මේ ධර්මයන් ගෞතම ශ්‍රාවක සංඝතෙම නිරවශෙෂ කොට සමාදන්ව පවතී, පින්වත්වූ අන්‍යගණාචාර්‍ය්‍ය ශ්‍රාවක සමූහයෝ ඉන් ස්වල්පමාත්‍රයක් පමණක් සමාදන්ව පවතිත්යයි මෙසේ කියන්නාහුය. යම් මෙබඳු මේ කාරණයෙක් ඇද්ද මේ කාරණය වනාහි මෙහි විද්‍යමාන වේමය (මෙබන්දක් නම් නිසැක වේමය).

කාශ්‍යපය, මෙසේ මේ කාරණයෙහි නුවණැත්තෝ ලබ්ධි විචාරන්නාහු, කරුණු විචාරන්නාහු, ලබ්ධි හා කරුණු විචාරන්නාහු ඒ කාරණය පිළිබඳව අපටම බෙහෙවින් පසසන්නාහුය.

13. කාශ්‍යපය, ‘ගෞතම ශ්‍රමණතෙමේ ම කිය යුතු කල් සලකා කියන්නේය, සත්‍යය කියන්නේය, අර්ථනිශ්‍රිතවම කියන්නේය, (නවලොකොත්තර) ධර්ම නිශ්‍රිතවම කියන්නේය, (සංවරය හා ප්‍රහාණය සඳහාවූ) විනය නිශ්‍රිතවම කියන්නේය’යි තමන් විසින්ම දතහැකි, තමන් විසින්ම දක්ක හැකි යම් පිළිපැදීමක් වේද, එබඳුවූ (ලොකොත්තර) මාර්ගයක් ඇත්තේය, එබඳුවූ (පූර්වභාග) ප්‍රතිපදාවක් ඇත්තේය.

කාශ්‍යපය, ‘ගෞතම ශ්‍රමණතෙම වනාහි කිය යුතු කල් සලකා කියන්නේය, සත්‍යය කියන්නේය, අර්ථනිශ්‍රිතවම කියන්නේය, (නවලොකොත්තර) ධර්ම නිශ්‍රිතවම කියන්නේය, (සංවර ප්‍රහාණ) විනය නිශ්‍රිතවම කියන්නේය’යි තමන් විසින්ම දතහැකි තමන් විසින්ම දක්ක හැකි යම් පිළිපැදීමක් වේද, එබඳුවූ (ලොකොත්තර) මාර්ගය කවරේද? (පූර්වභාග) ප්‍රතිපදාව කවරීද? ඒ වූකලී මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයම වෙයි. ඒ කවරේද? සම්‍යග්දෘෂ්ටිය, සම්‍යක්සංකල්පය, සම්‍යග්වචනය, සම්‍යක්කර්මාන්තය, සම්‍යග්ආජීවය, සම්‍යග්ව්‍යායාමය, සම්‍යක්ස්මෘතිය, සම්‍යක්සමාධිය යන මේයි. කාශ්‍යපය, ‘ගෞතම ශ්‍රමණතෙම වනාහි කියයුතු කල් සලකා කියන්නේය, සත්‍යය කියන්නේය, අර්ථනිශ්‍රිතවම කියන්නේය, (නවලොකොත්තර) ධර්මනිශ්‍රිතවම කියන්නේය, (සංවරප්‍රහාණ) විනය නිශ්‍රිතවම කියන්නේය’යි යම්සේ පිළිපැදෙන් තමන් විසින්ම දතහැකි තමන් විසින්ම දක්ක හැකි යම් පිළිපැදීමක් වේද, මේ තාක් ඒ (ලොකොත්තර) මාර්ගය වෙයි, මේ (පූර්වභාග) ප්‍රතිපදාව වෙයි.

14. එවං වුත්තෙ අචෙලො කස්සපො භගවන්තං එතදවොච: ඉමෙපි[1] ඛො ආවුසො ගොතම තපොපක්කමා එකෙසං[2] සමණබ්‍රාහ්මණානං සාමඤ්ඤසඞ්ඛාතා ච බ්‍රහ්මඤ්ඤසඞ්ඛාතා[3] ච: අචෙලකො[4] හොති මුත්තාචාරො හත්ථාපලෙඛනො න එහිභද්දන්තිකො[5] න තිට්ඨභද්දන්තිකො නාභිහටං[6] න උද්දිස්සකටං[7] න නිමන්තණං[8] සාදියති. සො න කුම්භිමුඛා පටිග්ගණ්හාති[9] න කලොපිමුඛා[10] පටිග්ගණ්හාති[9] න එලකමන්තරං[11] න දණ්ඩමන්තරං න මුසලමන්තරං න ද්වින්නං භුඤ්ජමානානං න ගබ්භිනියා න පායමානාය න පුරිසන්තරගතාය න සංකිත්තීසු[12] න යත්ථ සා උපට්ඨිතො හොති න යත්ථ මක්ඛිකා සණ්ඩසණ්ඩචාරිනී න මච්ඡං න මංසං න සුරං න මෙරයං න ථුසොදකං පිවති.

සො එකාගාරිකො වා හොති එකාලොපිකො ද්වාගාරිකො වා හොති ද්වාලොපිකො සත්තාගාරිකො වා හොති සත්තාලොපිකො එකිස්සා පි දත්තියා යාපෙති ද්වීහි පි දත්තීහි යාපෙති සත්තහි පි දත්තීහි යාපෙති එකාහිකම්පි ආහාරං ආහාරෙති ද්වීහිකම්පි[13] ආහාරං ආහාරෙති සත්තාහිකම්පි ආහාරං ආහාරෙති ඉති එවරූපං අද්ධමාසිකම්පි[14] පරියායභත්තභොජනානුයොගමනුයුත්තො විහරති.

---

1. පිකාරො න දිස්සති P. W.
2. එතෙසං B. V. Pa.
3. බ්‍රාහ්ම° P.
4. අචෙලකො ච S.
5. °භද්දත්තිකො B. Pa. (සබ්බත්ථ)
6. °හතං S.
7. °කතං B. S.
8. °නං B. P. S.
9. පවිග° P.; පතිග° W.
10. කළොපි° B. P. V.
11. එළක° B. P. S.
12. සංකිත්තිසු P. W.
13. ද්වාහි° B. S. V.
14. අඩ්ඪ° S.

14. මෙසේ වදාළ කල්හි අචේල කාශ්‍යපතෙම භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකෙළේය: ආයුෂ්මත් ගෞතමයෙනි, මේ තපඃකර්මයෝ සමහර මහණබමුණන්ගේ ශ්‍රමණකර්මසංඛ්‍යාවටද බ්‍රාහ්මණකර්ම සංඛ්‍යාවටද වැටෙත්.[1] (කෙබඳු තපඃකර්මයෝදයත්:) (තාපසයා) අචේලක හෙවත් නග්නවූයේ වෙයි; හරණ ලද ආචාර ඇත්තේ වෙයි; අතලෝනේ වෙයි (නොහොත් මල පහරා අතින් මල මග පිසින්නේ වෙයි); පිඬු ගැනීම පිණිස ‘එව ස්වාමීනි’යි කීකල්හි නොඑන්නේ වෙයි; ‘සිටුව මැනව ස්වාමීනි’යි කීකල්හි නොසිටින්නේ වෙයි; (පිඬු සිඟීමට යුතු) කාලයට පළමු ගෙණවුත් එලවූ ආහාර නොගණී; තමන් උදෙසා (විශේෂයෙන් පිළියෙල) කළ ආහාර නොගණී; විශේෂයෙන් කැඳවා දෙන අහර නොගණී; සැළිමුවින් (සැළියෙන්) නගාදෙන ආහාර නොපිළිගණී; පැසමුවින් (පැසින) නගාදෙන ආහාර නොපිළිගණී; එළිපත අතරෙහි තබා දෙනු ලබන්නක් නොගණී; දඬු(දර ආදිය) අතරෙහි තබාදෙනුලබන්නක් නොගණී; මොහොල් අතරෙහි තබා දෙනු ලබන්නක් නොගණී; ආහාර අනුභවකරන්නාවූ දෙදෙනෙකු අතරෙන් එකෙකු නැගිට දෙන අහර නොගණී; ගැබිනියක් දෙන අහර නොගණී; කිරි පොවන්නියගෙන් නොගණී; පුරුෂයකු අතරට පැමිණි (රති ක්‍රීඩාවෙහි යෙදුනු) ස්ත්‍රියගෙන් නොගණී; සමාදන්කොට පිසූ දෙයින් නොගණී; යම්තැනෙක්හි බල්ලෙක් අහර පිණිස එළඹ සිටියේ ද එහි ඔහට නොදී තමහට එලවූ අහර නොගණී; සැළිමුව ආදී යම් තැනෙක්හි රැස්වූ මැස්සන් ඉවත්කොට ඉන් නගා ගෙණ දුන් අහර නොගණී; මසුන් නොගණී; මාංස නොගණී. සුරා නොගණී; මෙරය නොගණී; (සර්වධාන්‍යසම්භාරයෙන් කළ) ථූසෝදක නම් කාඩි විශේෂය පානය නොකෙරයි.

හෙතෙම එක් ගෙයකම අහර ලැබ නවත්නේ හෝ එක් පිඩකින් පමණක් ජීවත්වන්නේ හෝ වෙයි. ගෙවල් දෙකකින් අහර ලැබ නවත්නේ හෝ පිඩු දෙකකින් ජීවත්වන්නේ හෝ වෙයි. ගෙවල් සතකින් අහර ලැබ නවත්නේ හෝ පිඩු සතකින් පමණක් ජීවත්වන්නේ හෝ වෙයි. අහර දෙතුන් පිඩක් පමණ ගන්නා (දැමිය හැකි) “දත්ති” නම් වූ කුඩා භික්‍ෂාදාන පාත්‍රයක බතින් යැපෙන්නේ වෙයි. “දත්ති” නම් වූ පාත්‍රවයක බතින් යැපෙන්නේ වෙයි. “දත්ති” පාත්‍ර සතක බතින් හෝ යැපෙන්නේ වෙයි. දිනක් හැර දිනක අහර අනුභවකරන්නේ වෙයි; දෙදිනක් හැර දිනක අහර අනුභව කරන්නේ වෙයි; සත් දිනක් හැර දිනක අහර අනුභවකරන්නේ වෙයි; මෙසෙයින් අඩමසක් හැර දිනක අහර දැයි මෙබඳුවූ වාරබත් අනුභව කිරීමෙහි යෙදෙමින් වාසය කෙරෙයි.

1. උපශ්‍රත්වය බලනු.

ඉමෙ හි[1] බො ආවුසො ගොතම තපොපක්කමා එකෙසං සමණබ්‍රාහ්මණානං සාමඤ්ඤසඞ්ඛාතා ච බ්‍රහ්මඤ්ඤසඞ්ඛාතා[2] ච: සාකභක්ඛො වා හොති සාමාකභක්ඛො වා[3] හොති නීවාරභක්ඛො[4] වා හොති දද්දුලභක්ඛො[5] වා හොති[6] හටභක්ඛො[7] වා හොති කණභක්ඛො[8] වා හොති ආචාමභක්ඛො වා හොති පිඤ්ඤාකභක්ඛො[9] වා හොති තිණභක්ඛො වා හොති ගොමයභක්ඛො වා හොති වනමූලඵලාහාරො යාපෙති පවත්තඵලභොජී.

15. ඉමෙ හි[1] බො ආවුසො ගොතම තපොපක්කමා එකෙසං[10] සමණබ්‍රාහ්මණානං සාමඤ්ඤසඞ්ඛාතා ච බ්‍රහ්මඤ්ඤසඞ්ඛාතා ච: සාණානි පි ධාරෙති මසාණානි පි ධාරෙති ඡවදුස්සානි පි ධාරෙති පංසුකූලානිපි ධාරෙති තිරීටානි[11] පි ධාරෙති අජිනානිපි[12] ධාරෙති අජිනක්ඛිපම්පි[13] ධාරෙති කුසචීරම්පි ධාරෙති වාකචීරම්පි ධාරෙති ඵලකචීරම්පි ධාරෙති කෙසකම්බලම්පි ධාරෙති වාලකම්බලම්පි ධාරෙති උලූකපක්ඛිකම්පි[14] ධාරෙති. කෙසමස්සුලොචකො පි හොති කෙසමස්සුලොචනානුයොගමනුයුත්තො උබ්භට්ඨකො[15] පි හොති ආසනපටික්ඛිත්තො උක්කුටිකොපි හොති උක්කුටිකප්පධානමනුයුත්තො කණ්ටකාපස්සයිකො[16] පි හොති කණ්ටකාපස්සෙ සෙය්‍යං කප්පෙති ඵලකසෙය්‍යම්පි කප්පෙති ථණ්ඩිලසෙය්‍යම්පි[17] කප්පෙති එකපස්සයිකො පි හොති රජොජල්ලධරො අබ්භොකාසිකොපි[18] හොති යථාසන්ථතිකො වෙකටිකො පි හොති විකටභොජනානුයොගමනුයුත්තො අපානකො[19] පි හොති අපානකත්තමනුයුත්තො[20] සායතතියකම්පි[21] උදකොරොහණානුයොගමනුයුත්තො විහරතීති.

---

1. ඉමෙ පි B.
2. බ්‍රාහ්ම° P.
3. වාති නත්ථි P.
4. නිවාර° B. S.
5. දද්දුල° Pa.
6. ඉතො පරං නියාමභක්ඛො වා හොතී ති අතිරෙකපාඨො [දිස්සති S.
7. හත° S.
8. කණිණ° S.
9. පිඤ්ඤාක° B.
10. එතෙසං B. S.
11. තිරි° Pa.
12. අජිනම්පි B.; ආජිනානිපි V
13. ආජින°V.; අජිනපක්ඛිකම්පි Va.
14. °පක්ඛම්පි S. V. W.
15. °ට්ඨිකො Va.
16. කණ්ඩ° B.; කණ්ඩකං S.
17. තණ්ඩිල° B. S. Pa.
18. පිකාරො නත්ථි S.
19. අපත° P. V. W. S
20. ආපානත්° P. V. W.; අපානමනු[යුත්තො S
21. සායංත° S. V.

ආයුෂ්මත් ගෞතමය, ඇතැම් මහණ බමුණන්ගේ ශ්‍රමණ ධර්ම සංඛ්‍යාතවූද, බ්‍රාහ්මණ ධර්ම සංඛ්‍යාතවූද වෙනත් තපඃ කර්මයෝ ද වෙත්. (එනම්: තවුසා) නොපිසූ (අමු) පලා අනුභව කරන්නේ හෝ වෙයි; බඹහමු නම් තෘණ ධාන්‍ය අනුභව කරන්නේ හෝ වෙයි; ස්වයංජාත (කැලෑහි උපන්) ධාන්‍ය අනුභවකරන්නේ හෝ වෙයි; සම්කරුවන් ලියාලූ සම්කසට අනුභවකරන්නේ හෝ වෙයි; සෙවෙල් කන්නේ හෝ වෙයි; කුඩු කන්නේ හෝ වෙයි; සැළිසෝදලූ තැන දඹු බත් (දංකොඩ) කන්නේ හෝ වෙයි; මුරුවට කන්නේ හෝ වෙයි; තණ කන්නේ හෝ වෙයි; ගොම කන්නේ හෝ වෙයි; වනමුල් ඵල ආහාර කොට ඇත්තේ ස්වයංපතිත (නටුවෙන් ගිලිහී වැටෙන) ඵල අනුභව කිරීමෙන් යැපෙයි.

15. ආයුෂ්මත් ගෞතමය, මොව්හුද (පහත දක්වන දේද) මේ මහණබමුණන්ගේ ශ්‍රමණධර්ම සංඛ්‍යාතවූ ද, බ්‍රාහ්මණධර්ම සංඛ්‍යාතවූද තපඃකර්මයෝ වෙත්: (තවුසා) හණවැහැරි රෙදිද දරයි; හණවැහැරි මුසු රෙදිද දරයි; මිනියෙන් බැහැරකළ රෙදිද නොහොත් එරුතණ ආදියෙන් කළ රළු රෙදිද දරයි; පාංසුකූල රෙදි ද දරයි; ටිරීටුඹුලු ද දරයි; අඳුන්දිවිසම් ද දරයි; මැදින් පලා සකස්කළ අඳුන් දිවිසම්ද දරයි; කුසවැහැරිද දරයි; නියඳ වැහැරිද දරයි; පෝරු(පතුරු)වැහැරිද දරයි; කෙහෙයෙන් කළ කම්බිලිද දරයි; අස්ලොමින් කළ කම්බිලිද දරයි; බකමූහුණු පියාපතින් කළ නිවාසනද දරයි; ඉසකේ රැවුල් ඉදිරීමෙහි යෙදුනේ ඉසකේ රැවුල් උදුරන්නේ ද වෙයි; ආසන ප්‍රතික්ෂෙප කෙළේ නැගිට සිටින්නේ ද වෙයි. උක්කුටික වීර්‍ය්‍යයෙහි යෙදුනේ උක්කුටික වූයේ ද වෙයි (ඇවිදින විටද උක්කුටිකව පැන පැන ඇවිදී); කටුමත්තෙහි හොවින්නේ කටුමත්තෙහි හිඳීම්, හැසිරීම් ආදියද කෙරෙයි; පෝරුමත්තෙහි ශයනය කරන්නේද වෙයි; පිල්කඩ පිට (නොහොත් උස්වූ බිම් පෙදෙස්හි) ශයනය කරන්නේ ද වෙයි; එක් ඇලයකින් ශයනය කරන්නේද වෙයි; දූවිලි දරන්නේද වෙයි; එලිමහ ංන් වසන්නේද වෙයි; පලමු අතුළ පරිදි වෙනස් නොකොට අස්නෙහි ඉන්නේද වෙයි (තමාට ලැබෙන කවර අස්නක් වුවද පිළිගණී); අසූචි අනුභවයෙහි යෙදුනේ අසූචි අනුභව කරන්නේද වෙයි; සිහිල්දිය නොබීමෙහි යෙදුනේ දුරු කළ සිහිල් දිය පිම් ඇත්තේද වෙයි; උදය දවල් සවස යන තුන් කල්හි 'පව්සෝද හරිමි'යි දියේ ගැලීමෙහි යෙදී වාසය කෙරෙයි.

16. අචෙලකො චෙ පි කස්සප හොති මුත්තාචාරො හත්ථාපලෙඛනො න එහිභදන්තිකො න තිට්ඨභදන්තිකො නාභිහටං න උද්දිස්සකටං න නිමන්තණං සාදියති. සො න කුම්භිමුඛා පටිග්ගණ්හාති න කළොපිමුඛා පටිග්ගණ්හාති න එළකමන්තරං න දණ්ඩමන්තරං න මුසලමන්තරං න ද්වින්නං භුඤ්ජමානානං න ගබ්භිනියා න පායමානාය න පුරිසන්තරගතාය න සංකිත්තීසු න යත්ථ සා උපට්ඨිතො හොති න යත්ථ මක්ඛිකා සණ්ඩසණ්ඩචාරිනී න මච්ඡං න මංසං න සුරං න මෙරයං න ථුසොදකං පිවති. සො එකාගාරිකො වා හොති එකාලොපිකො ද්වාගාරිකො වා හොති ද්වාලොපිකො සත්තාගාරිකො වා හොති සත්තාලොපිකො එකිස්සා පි දත්තියා යාපෙති ද්වීහි පි දත්තීහි යාපෙති සත්තහි පි දත්තීහි යාපෙති එකාහිකම්පි ආහාරං ආහාරෙති ද්වීහිකම්පි ආහාරං ආහාරෙති සත්තාහිකම්පි ආහාරං ආහාරෙති ඉති එවරූපං අඩ්ඪමාසිකම්පි පරියායභත්තභොජනානුයොගමනුයුත්තො විහරති. තස්ස චායං සීලසම්පදා චිත්තසම්පදා පඤ්ඤාසම්පදා අභාවිතා හොති අසච්ඡිකතා. අථ ඛො සො ආරකා ව[1] සාමඤ්ඤා ආරකා ව[1] බ්‍රහ්මඤ්ඤා.

යතො ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ඣං[1] මෙත්තචිත්තං භාවෙති ආසවානඤ්ච[2] ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉතිපි බ්‍රාහ්මණො ඉතිපි.

1. ච S. 2. අවෙරං° P. අබ්‍යාපජ්ජං B. V. 3. ආසවානං ඛයා W.

16. (එවිට බුදුහු:) කාශ්‍යපය, ඉදින් (යමෙක්) නග්න වූයේ හෝ වේද, හරණ ලද ආචාර ඇත්තේ, අත්හි ආහාර තිමිකල අතලෝනේ (නොහොත් මලපහරා අතින් මල මග පිසින්නේ), කැඳවූවිට නොඑන්නේ, සිටුවමැනව කීකල්හි නොසිටින්නේ, කලින් එලවූ ආහාර නොගන්නේ, උදෙසා කළ ආහාර හෝ කැඳවා දෙන ආහාර නොපිළිගන්නේ, සැළමුවින් හෝ පැසමුවින් ගෙනදුන් අහර හෝ, එලිපත අතරෙහි, දඬු අතරෙහි, මොහොල් අතරෙහි, අහර අනුභව කරන්නවුන් අතරෙහි තබා දෙනලද අහර හෝ, ගැබින්නන්, කිරිපොවන්නියන් හෝ රතිකෙළියෙහි යෙදුනු ස්ත්‍රීන් දුන් අහර හෝ නොගන්නේ, සමාදම්කොට පිසූදේ නොගන්නේ, බල්ලකු හෝ මැස්සන් සමූහයක් එලවා දුන් අහර නොගන්නේ, මස්මාංශ, සුරාමේරය හෝ කාඩිදිය නොගන්නේ, එක්ගෙයකින් හෝ එක් පිඩකින්, ගෙවල් දෙකකින් හෝ පිඩු දෙකකින්, ගෙවල් සතකින් හෝ පිඩු සතකින් පමණක් හෝ යැපෙන්නේ, "දත්ත්" නම් වූ කුඩා පාත්‍රයකින්, දෙකකින් හෝ සතකින් හෝ ලත් බතින් යැපෙන්නේ, එක් දිනක්, දෙදිනක්, සත්දිනක් ආදී වශයෙන් අඩමසක් දක්වා නිරාහාරව සිට එක් දිනක ලැබෙන වාරබතින් ජීවත්වේද, කාශ්‍යපය, (එබන්දකු විසින් එපමණකින්) මේ ශීලසම්පත්තියද මේ චිත්තසම්පත්තියද මේ ප්‍රඥසම්පත්තියද නොවඩන ලද්දේය, අවබොධ නොකරණ ලද්දේය. වැලිදු, හෙතෙම ශ්‍රමණ කම්යෙන් දුරුවූයේම වෙයි, බ්‍රාහමණ කම්යෙන් දුරුවූයේම වෙයි.

කාශ්‍යපය, යම් හෙයකින් භික්ෂු තෙම වෛෂ හෙවත් වෛර රහිතවූ දෙම්නස් හෙවත් ව්‍යාපාද රහිතවූ මෙත්සිත් වඩා ද, ආශ්‍රවක්‍ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ (චෙතො විමුත්ති නම්වූ) මාර්ග ඵල සමාධිය ද (ප්‍රඥා විමුත්ති නම්වූ) මාර්ග ඵල ප්‍රඥාවද ඉහාත්මභාවයෙහිම තෙමේම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂකොට ඊට පැමිණ වාසය කෙරේද, කාශ්‍යපය, එබඳුවූ භික්ෂුතෙම මේ කාරණයෙන් ශ්‍රමණයයිද මේ කාරණයෙන් බ්‍රාහමණයයිද කියනු ලැබේ.

17. සාකභක්ඛො චෙපි කස්සප හොති සාමාකභක්ඛො වෙ පි කස්සප හොති නීවාරභක්ඛො වා හොති දද්දුලභක්ඛො වා හොති හටභක්ඛො වා හොති කණභක්ඛො වා හොති ආචාමභක්ඛො වා හොති පිඤ්ඤාකභක්ඛො වා හොති තිණභක්ඛො වා හොති ගොමයභක්ඛො වා හොති වනමූලඵලාහාරො යාපෙති පවත්තඵලභොජී. තස්ස චායං සීලසම්පදා චිත්තසම්පදා පඤ්ඤාසම්පදා අභාවිතා හොති අසච්ඡිකතා. අථ ඛො සො ආරකා ව[1] සාමඤ්ඤා ආරකා ව[1] බ්‍රහ්මඤ්ඤා.

යතො ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ඣං[2] මෙත්තචිත්තං භාවෙති ආසවානඤ්ච[3] ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉතිපි බ්‍රාහ්මණො ඉතිපි.

18. සාණානි චෙපි කස්සප ධාරෙති මසාණානිපි ධාරෙති ඡවදුස්සානි පි ධාරෙති පංසුකූලානි පි ධාරෙති තිරීටානි පි ධාරෙති අජිනානි පි ධාරෙති අජිනක්ඛිපම්පි ධාරෙති කුසචීරම්පි ධාරෙති වාකචීරම්පි ධාරෙති ඵලකචීරම්පි ධාරෙති කෙසකම්බලම්පි ධාරෙති වාලකම්බලම්පි ධාරෙති උලූකපක්ඛිකම්පි ධාරෙති කෙසමස්සුලොචකො පි හොති කෙසමස්සුලොචනානුයොගමනුයුත්තො උබ්භට්ඨකො පි හොති ආසනපටික්ඛිත්තො උක්කුටිකො පි හොති උක්කුටිකප්පධානමනුයුත්තො කණ්ටකාපස්සයිකො පි හොති කණ්ටකාපස්සෙ සෙය්‍යං කප්පෙති ඵලකසෙය්‍යම්පි කප්පෙති ථණ්ඩිලසෙය්‍යම්පි කප්පෙති එකපස්සයිකො පි හොති රජොජල්ලධරො අබ්භොකාසිකො පි හොති යථාසන්ථතිකො වෙකටිකො පි හොති විකටභොජනානුයොගමනුයුත්තො අපානකො පි හොති අපානකත්තමනුයුත්තො සායතතියකම්පි උදකොරොහණානුයොගමනුයුත්තො විහරති. තස්ස චායං සීලසම්පදා චිත්තසම්පදා පඤ්ඤාසම්පදා අභාවිතා හොති අසච්ඡිකතා. අථ ඛො සො ආරකා ව[1] සාමඤ්ඤා ආරකා ව[1] බ්‍රහ්මඤ්ඤා.

---

1. ච S. 2. අව්‍යාං° P අබ්‍යාපජ්ජං B. V. 3. ආසවානං ඛයා W.

17. කාශ්‍යපය, ඉදින් (භික්ෂුවක්) නොපිසූ පලා අනුභව කරන්නේ වේද, බඩ හඬු නම් තෘණ ධාන්‍ය හෝ ස්වයංජාත ධාන්‍ය හෝ සම් කරුවන් ලියාලූ සම්කසට හෝ සෙවෙල් හෝ කුඩු හෝ දංකොඩ හෝ මුරුවට හෝ තණ හෝ ගොම හෝ වන මුල් ඵල ආහාර කොට ඇත්තේ ස්වයංපතිත ඵල අනුභව කිරීමෙන් යැපේද, ඔහු විසිනුත් මේ ශීලසම්පත්තියද, මේ චිත්ත සම්පත්තියද මේ ප්‍රඥාසම්පත්තියද නොවඩන ලද්දේය, සාක්ෂාත් නොකරණ ලද්දේය. වැලිදු, හෙතෙම ශ්‍රමණ කම්යෙන් දුරුවූයේම වෙයි, බ්‍රාහමණ කම්යෙන් දුරුවූයේම වෙයි.

කාශ්‍යපය, යම් හෙයකින් භික්ෂුතෙම වෛර හෙවත් වෛර රහිතවූ දෞර්මනස්‍ය හෙවත් ව්‍යාපාද රහිතවූ මෙත් සිත් වඩාද, ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ ඵලසමාධියද ඵල ප්‍රඥාවද මේ අත්බැව්හිම තෙමේම විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කෙරේද, කාශ්‍යපය, මෙසේවූ භික්ෂු තෙම ශ්‍රමණයයි ද බ්‍රාහමණයයිද කියනු ලැබේ.

18. කාශ්‍යපය, ඉදින් (භික්ෂුවක්) හණවැහැරි රෙදි දරාද හණ වැහැරි මුසු මළරෙදි දරාද, මළ වස්ත්‍ර නොහොත් එරුතණ ආදියෙන් කළ දළරෙදි හෝ පංශුකූල රෙදි හෝ රිටි සුඹුළු හෝ අඳුන් දිවිසම් හෝ අඳුන් දිවිසම් තීරුවලින් කළ වස්ත්‍ර හෝ කුස වැහැරි, නියඳ වැහැරි, පතුරු වැහැරි ආදිය හෝ කෙස් කම්බිලි, අස්ලොම් කම්බිලි, බකමූහුණු පියාපතින් කළ වස්ත්‍ර හෝ දරාද, ඉසකේ රැවුල් උදුරන්නේද, ආසන ප්‍රතික්ෂෙප කොට නැගිටම සිටින්නේද, හැම්විට උක්කුටිකයෙන්ම සිටින්නේද, කටුමත්තෙහි නිදන්නේද, පෝරු මත්තෙහි හෝ උස්බිමෙහි නිදන්නේද, එක් ඇලයකින්ම හොවින්නේද, ඇඟ ධූලි තවරන්නේද,එළිමහනෙහිම වසන්නේද,දුන් කවර අසුන වුවත් එසේම (වෙනස් නොකොට) පිළිගන්නේද, අශුචි බුදින්නේද සිසිල් දිය නොබොන්නේද, ත්‍රිසන්ධ්‍යායෙහි 'පව්සෝද හරිම්'යි දියේ ගැලීමෙහි යෙදෙමින් වාසය කෙරේද,(එබඳු) භික්ෂුව විසින් මේ ශීලසම්පත්තියද, මේ චිත්තසම්පත්තියද, මේ ප්‍රඥාසම්පත්තියද, නොවඩන ලද්දේය, සාක්ෂාත් නොකරණ ලද්දේය. වැලිදු, හෙතෙම ශ්‍රමණ කම්යෙන් දුරුවූයේ ම වෙයි, බ්‍රාහමණ කම්යෙන් දුරුවූයේ ම වෙයි.

යතො ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ඣං[1] මෙත්ත-චිත්තං භාවෙති ආසවානඤ්ච[2] ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉතිපි බ්‍රාහ්මණො ඉතිපීති.

19. එවං වුත්තෙ අචෙලො කස්සපො භගවන්තං එතදවොච: දුක්කරං භො ගොතම සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති[3].

පකති ඛො එසා කස්සප ලොකස්මිං දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති. අචෙලකො චෙපි කස්සප හොති මුත්තාචාරො හත්ථාපලෙඛනො න එහිභද්දන්තිකො න තිට්ඨ-භද්දන්තිකො නාභිහටං න උද්දිස්සකටං න නිමන්තණං සාදියති. සො න කුම්භිමුඛා පටිග්ගණ්හාති න කලොපිමුඛා පටිග්ගණ්හාති න එළකමන්තරං න දණ්ඩමන්තරං න මුසලමන්තරං න ද්වින්නං භුඤ්ජමානානං න ගබ්භිනියා න පායමානාය න පුරිසන්තරගතාය න සංකිත්තීසු න යත්ථ සා උපට්ඨිතො හොති න යත්ථ මක්ඛිකා සණ්ඩසණ්ඩචාරිනී න මච්ඡං න මංසං න සුරං න මෙරයං න ථුසොදකං පිවති.

සො එකාගාරිකො වා හොති එකාලොපිකො ද්වාගාරිකො වා හොති ද්වාලොපිකො සත්තාගාරිකො වා හොති සත්තාලො-පිකො එකිස්සා පි දත්තියා යාපෙති ද්වීහි පි දත්තීහි යාපෙති සත්තහිපි දත්තීහි යාපෙති එකාහිකම්පි ආහාරං ආහාරෙති ද්වීහිකම්පි ආහාරං ආහාරෙති සත්තාහිකම්පි ආහාරං ආහාරෙති. ඉති එවරූපං අඩ්ඪමාසිකම්පි පරියායභත්තභොජනානුයොග-මනුයුත්තො විහරති. ඉමාය ච කස්සප මත්තාය ඉමිනා ච[4] තපොපක්කමෙන සාමඤ්ඤං වා අභවිස්ස බ්‍රහ්මඤ්ඤං වා දුක්කරං සුදුක්කරං නෙතං අභවිස්ස කල්ලං වචනාය දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති.

---

1. අව්‍යා° P. අබ්‍යාපජ්ජං B. V.
2. ආසවානං ඛයා W.
3. බ්‍රාහ්ම° W.
4. චකාරෙ නත්ථි V.

කාශ්‍යපය, යම් හෙයකින් භික්ෂුතෙම වෛෂ හෙවත් වෛර රහිතවූ, දෞර්මනස්‍ය හෙවත් ව්‍යාපාද රහිතවූ මෙත්සිත් වඩාද, ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ ඵලසමාධියද ඵල ප්‍රඥාවද මේ අත් බැව්හිම,තෙමේම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කෙරේද, කාශ්‍යපය, ඒ භික්ෂුතෙම ශ්‍රමණයයිද බ්‍රාහමණයයිද කියනු ලැබේ.

19. මෙසේ වදාළකල්හි අචේල කාශ්‍යප තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කියේය: පින්වත් ගෞතමය, ශ්‍රමණ කර්මය දුෂ්කරය, බ්‍රාහමණ කර්මය දුෂ්කරය.

කාශ්‍යපය, ශ්‍රමණ කර්මය දුෂ්කරය, බ්‍රාහමණ කර්මය දුෂ්කරය යන මේ කථා තොමෝ ලෝකයෙහි ප්‍රකෘති (සාමාන්‍ය) කථාව වෙයි. කාශ්‍යපය, ඉදින් (යමෙක්) නග්න හෝ වේද, හරණලද ආචාර ඇත්තේ අතෙහි අහර ඉවරවූ කල අතලෝනේ (නොහොත් මලපහරා අතින් මලමග පිසින්නේ), කැඳවූවිට නොඑන්නේ, සිටුව මැනව කීකල්හි නොසිටින්නේ, කලින් එලවූ ආහාර නොගන්නේ, උදෙසා කළ ආහාර හෝ කැඳවා දෙන ආහාර නොපිළිගන්නේ, සැළමුවින් හෝ පැසමුවින් ගෙනදුන් අහර හෝ, එලිපත අතරෙහි, දඬු අතරෙහි, මොහොල් අතරෙහි, අහර අනුභව කරන්නවුන් අතරෙහි තබාදෙනලද අහර හෝ, ගැබිනියන්, කිරිපොවන්නියන්, හෝ රතිකෙළියෙහි යෙදුනු ස්ත්‍රීන් දුන් අහර හෝ නොගන්නේ, සමාදම්කොට පිසූදේ නොගන්නේ, බල්ලෙකු හෝ මැස්සන් සමූහයක් එලවා දුන් අහර නොගන්නේ, මස්මාංශ, සුරාමේරය හෝ කාඩිදිය නොගන්නේ,

එක් ගෙයකින් හෝ එක් පිඩකින්, ගෙවල් දෙකකින් හෝ පිඩු දෙකකින්, ගෙවල් සතකින් හෝ පිඩු සතකින් පමණක් හෝ යැපෙන්නේ, "දත්ති" නම් වූ කුඩා පාත්‍රයකින්, දෙකකින් හෝ සතකින් හෝ ලත් බතින් යැපෙන්නේ, එක් දිනක්, දෙදිනක්, සත්දිනක් ආදි වශයෙන් අඩමසක් දක්වා නිරාහාරව සිට එක් දිනක ලැබෙන වාර බතින් ජීවත්වේද, කාශ්‍යපය, මෙබඳුවූ (සුළු) ප්‍රතිපත්ති ක්‍රමයක් නිසා, තපස් කර්මයක් නිසා, ශ්‍රමණ කර්මය හෝ බ්‍රාහමණ කර්මය දුෂ්කරවූවක්, ඉතා දුෂ්කරවූවක් වන්නේද (එබන්දකු විසින් එපමණකින් එසේ යයි සලකනු ලබන්නේද), එපමණකින් ශ්‍රමණ කර්මය දුෂ්කරය, බ්‍රාහමණ කර්මය දුෂ්කරය, යන මේ වචනය කීමට සුදුසු නොවේ.

20. සක්කා ච පනෙතං අභවිස්ස කාතුං ගහපතිනා වා ගහපතිපුත්තෙන වා අන්තමසො කුම්භදාසියාපි: හන්දාහං අචෙලකො හොමි මුත්තාචාරො හත්ථාපලෙඛනො න එහිභදන්තිකො න තිට්ඨභදන්තිකො නාභිහටං න උද්දිස්සකතං න නිමන්තණං සාදියාමි. අහං න කුම්භිමුඛා පටිග්ගණ්හාමි න කළොපිමුඛා පටිග්ගණ්හාමි න එළකමන්තරං න දණ්ඩමන්තරං න මුසලමන්තරං න ද්වින්නං භුඤ්ජමානානං න ගබ්භිනියා න පායමානාය න පුරිසන්තරගතාය න සංකිත්තීසු න යත්ථ සා උපට්ඨිතො හොති න යත්ථ මක්ඛිකා සණ්ඩසණ්ඩචාරිනී න මච්ඡං න මංසං න සුරං න මෙරයං න ථුසොදකං පිවාමි. අහං එකාගාරිකො වා හොමි එකාලොපිකො ද්වාගාරිකො වා හොමි ද්වාලොපිකො සත්තාගාරිකො වා හොමි සත්තාලොපිකො එකිස්සා පි දත්තියා යාපෙමි ද්වීහි පි දත්තීහි යාපෙමි සත්තාහි පි දත්තීහි යාපෙමි එකාහිකම්පි ආහාරං ආහාරෙමි ද්වීහිකම්පි ආහාරං ආහාරෙමි සත්තාහිකම්පි ආහාරං ආහාරෙමි. ඉති එවරූපං අඩ්ඪමාසිකම්පි[1] පරියායභත්තභොජනානුයොගමනුයුත්තො විහරාමීති.

යස්මා ච ඛො කස්සප අඤ්ඤත්‍රෙව ඉමාය මත්තාය අඤ්ඤත්‍ර ඉමිනා තපොපක්කමෙන සාමඤ්ඤං වා හොති බ්‍රහ්මඤ්ඤං වා දුක්කරං සුදුක්කරං තස්මා එතං කල්ලං වචනාය දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති. යතො ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ඣං මෙත්තචිත්තං භාවෙති ආසවානඤ්ච[2] ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉතිපි බ්‍රාහ්මණො ඉතිපි.

20. (මක්නිසාද යත්:) එසේ නම් 'මම නග්නවූයේ හරණලද ආචාර ඇත්තෙම් අත්හි අහර ඉවරවූ කල අතලෙවනේ (නොහොත් මල පහරා අතින් මල මග පිසින්නේ) වෙමි, කැඳවූ විට නොඑන්නේ, සිටුව මැනව කීකල්හි නොසිටින්නේ, කලින් එලවූ ආහාර නොගන්නේ, උදෙසා කළ ආහාර හෝ කැඳවා දෙන ආහාර නොපිළිගන්නේ, සැළමුවින් හෝ පැසමුවින් ගෙනදුන් අහර හෝ, එලිපත අතරෙහි, දඬු අතරෙහි, මොහොල් අතරෙහි, අහර අනුභව කරන්නවුන් අතරෙහි තබාදෙනලද අහර හෝ, ගැබිනියන්, කිරිපොවන්නියන්, හෝ රතිකෙළියෙහි යෙදුනු ස්ත්‍රීන් දුන් අහර හෝ නොගන්නේ, සමාදම්කොට පිසුදේ නොගන්නේ, බල්ලෙකු හෝ මැස්සන් සමූහයක් එලවා දුන් අහර නොගන්නේ, මස්මාංශ, සුරාමේරය හෝ කාඩිදිය නොගන්නේ, එක්ගෙයකින් හෝ එක් පිඩකින්, ගෙවල් දෙකකින් හෝ පිඩු දෙකකින්, ගෙවල් සතකින් හෝ පිඩු සතකින් පමණක් හෝ යැපෙන්නේ, "දත්තී" නම් වූ කුඩා පාත්‍රයකින්, දෙකකින් හෝ සතකින් හෝ ලත් බතින් යැපෙන්නේ, එක් දිනක්, දෙදිනක්, සත්දිනක් ආදි වශයෙන් අඩමසක් දක්වා නිරාහාරව සිට එක් දිනක ලැබෙන වාර බතින් ජීවත්වෙමි'යි (කියමින්) ගෘහපතියකු විසින් හෝ ගෘහපති පුත්‍රයකු විසින් හෝ යටත් පිරිසෙහින් කුම්භදාසියක විසින් (එබන්දකු විසින් එපමණකින්) වුවද මේ ශ්‍රමණකර්මය හෝ බ්‍රාහමණකර්මය හෝ කළ හැකි වන්නේය.

කාශ්‍යපය, යම් හෙයකින් මේ මදවූ ප්‍රතිපත්ති ක්‍රමයෙන් තොරවම මේ තපස් කර්මයෙන් තොරවම (ඊට වෙනස් වූ) නියම ශ්‍රමණකර්මය හෝ බ්‍රාහමණකර්මය දුෂ්කරවේය, ඉතා දුෂ්කරවේය යි (කියනු ලැබේ ද) එලෙසින් නම් ශ්‍රමණකර්මය දුෂ්කරය, බ්‍රාහමණ කර්මය දුෂ්කරයයි මේ වචනය කීමට සුදුසු වෙයි. කාශ්‍යපය, යම් හෙයකින් භික්ෂුතෙම වෛෂ හෙවත් වෛර රහිතවූ දෞර්මනස්‍ය හෙවත් ව්‍යාපාද රහිතවූ මෙත් සිත් වඩාද, ආශ්‍රවක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ එලසමාධියද එලප්‍රඥාවද ඉහාත්මභාව යෙහිම තෙමේම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කෙරේද, කාශ්‍යපය, එබඳු භික්ෂුතෙම ශ්‍රමණයයිද බ්‍රාහමණයයිද කියනු ලැබේ.

21. සාකභක්ඛො චෙපි කස්සප හොති සාමාකභක්ඛො චෙ පි කස්සප හොති නීවාරභක්ඛො වා හොති දද්දුලභක්ඛො වා හොති හටභක්ඛො වා හොති කණභක්ඛො වා හොති ආචාමභක්ඛො වා හොති පිඤ්ඤාකභක්ඛො වා හොති තිණභක්ඛො වා හොති ගොමයභක්ඛො වා හොති වනමූලඵලාහාරො යාපෙති පවත්තඵලභොජී. ඉමාය ච කස්සප මත්තාය ඉමිනා තපොපක්කමෙන සාමඤ්ඤං වා අභවිස්ස බ්‍රහ්මඤ්ඤං වා දුක්කරං සුදුක්කරං නෙතං අභවිස්ස කල්ලං වචනාය දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති. සක්කා ච පනෙතං අභවිස්ස ඤාතුං ගහපතිනා වා ගහපතිපුත්තෙන වා අන්තමසො කුම්භදාසියාපි: හන්දාහං සාකභක්ඛො වා හොමි සාමාකභක්ඛො වා නීවාරභක්ඛො වා හොමි දද්දුලභක්ඛො වා හොමි හටභක්ඛො වා හොමි කණභක්ඛො වා හොමි ආචාමභක්ඛො වා හොමි පිඤ්ඤාකභක්ඛො වා හොමි තිණභක්ඛො වා හොමි ගොමයභක්ඛො වා හොමි වනමූලඵලාහාරො යාපෙමි පවත්තඵලභොජීති.

යස්මා ච ඛො කස්සප අඤ්ඤත්‍රෙව ඉමාය[1] මත්තාය අඤ්ඤත්‍ර ඉමිනා[2] තපොපක්කමෙන සාමඤ්ඤං වා හොති බ්‍රහ්මඤ්ඤං වා දුක්කරං සුදුක්කරං තස්මා එතං කල්ලං වචනාය දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති. යතො ඛො[3] කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ඣං මෙත්තචිත්තං භාවෙති ආසවානඤ්ච[4] ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉතිපි බ්‍රහ්මණො ඉතිපි.

---

1. ඉමාය ච S.
2. ඉමිනා ච S.
3. යස්මා ච ඛො V.
4. චකාරො නත්ථි V.

21. කාශ්‍යපය, ඉදින් (යමෙක්) නොපිසූ පලා අනුභව කරන්නේ, බඹහමු නම් තෘණ ධාන්‍ය හෝ ස්වයංජාත ධාන්‍ය හෝ සම් කරුවන් ලියාලූ සම්කසට හෝ සෙවෙල් හෝ කුඩු හෝ දංකොඩ හෝ මුරුවට හෝ තණ හෝ ගොම හෝ ස්වයං–පතිත ඵල අනුභව කරන සුලුවූයේ වනමුල් ඵල ආහාරකොට ඇත්තේ යැපේද, කාශ්‍යපය, මේ බඳුවූ (සුළු) ප්‍රතිපත්ති ක්‍රම යක් නිසා හෝ තපස් කර්මයක් නිසා හෝ ශ්‍රමණ කර්මය හෝ බ්‍රාහ්මණ කර්මය දුෂ්කරවූවක්, ඉතා දුෂ්කරවූවක් වන්නේද (එසේ සලකනු ලබන්නේද), එපමණකින් ශ්‍රමණකර්මය දුෂ්කරය, බ්‍රාහ්මණ කර්මය දුෂ්කරය යන මේ වචනය කීමට සුදුසු නොවේ. (මක්නිසාද යත්:) කාශ්‍යපය, එසේ නම්, ‘මම නොපිසූ පලා අනුභව කරන්නේ, බඹ හමු නම් තෘණ ධාන්‍ය හෝ ස්වයංජාත ධාන්‍ය හෝ සම් කරුවන් ලියාලූ සම්කසට හෝ සෙවෙල් හෝ කුඩු හෝ දංකොඩ හෝ මුරුවට හෝ තණ හෝ ගොම හෝ ස්වයංපතිත ඵල අනුභවකරන සුලු වූයේ වනමුල් ඵල අහර කොට යැපෙමි’යි කියා ගෘහපතියකු විසින් හෝ ගෘහපති පුත්‍රයකු විසින් හෝ යටත්පිරිසෙයින් කුම්භදාසියක විසින් හෝ චූවද මේ තපස් කර්මය කළ හැකි වන්නේය.

කාශ්‍යපය, යම්හෙයකින් මේ මදවූ ප්‍රතිපත්ති ක්‍රමයෙන් තොරවම, මේ තපස් කර්මයෙන් තොරවම, (නියම) ශ්‍රමණ කර්මය හෝ බ්‍රාහ්මණ කර්මය දුෂ්කර වූයේය, ඉතා දුෂ්කරවූයේය කියා නම්, එසේ වූ ශ්‍රමණ කර්මය දුෂ්කරය බ්‍රාහ්මණ කර්මය දුෂ්කරය යන මේ වචනය කීමට සුදුසු වෙයි. කාශ්‍යපය, යම්හෙයකින් භික්ෂුතෙම වෛර හෙවත් වෛර රහිතවූ, දෞර්මනස්‍ය හෙවත් ව්‍යාපාද රහිතවූ මෙත් සිත් වඩාද, ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිත වූ ඵල සමාධියද, ප්‍රඥාවද, ඉහාත්මභාවයෙහි ම තෙමේම විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කෙරේද, කාශ්‍යපය, එබඳු භික්ෂුතෙම ශ්‍රමණයයිද බ්‍රාහ්මණ යයිද කියනු ලැබේ.

22. සාණානි පෙපි කස්සප ධාරෙති මසාණානිපි ධාරෙති ඡවදුස්සානි පි ධාරෙති පංසුකූලානි පි ධාරෙති තිරීටානි පි ධාරෙති අජිනානි පි ධාරෙති අජිනක්ඛිපම්පි ධාරෙති කුසචීරම්පි ධාරෙති වාකචීරම්පි ධාරෙති ඵලකචීරම්පි ධාරෙති කෙසකම්බ-ලම්පි ධාරෙති වාලකම්බලම්පි ධාරෙති උලූකපක්ඛිකම්පි ධාරෙති කෙසමස්සුලොචකො පි හොති කෙසමස්සුලොචනානුයොගමනු-යුත්තො උබ්භට්ඨකො පි හොති ආසනපටික්ඛිත්තො උක්කුටිකො පි හොති උක්කුටිකප්පධානමනුයුත්තො කණ්ටකාපස්සයිකො පි හොති කණ්ටකාපස්සෙ සෙය්‍යං කප්පෙති ඵලකසෙය්‍යම්පි කප්පෙති ථණ්ඩිලසෙය්‍යම්පි කප්පෙති එකපස්සයිකො පි හොති රජොජල්ලධරො අබ්භොකාසිකො පි හොති යථාසන්ථතිකො වෙකටිකො පි හොති විකටභොජනානුයොගමනුයුත්තො අපානකො පි හොති අපානකත්තමනුයුත්තො සායතතියකම්පි උදකොරොහණානුයොගමනුයුත්තො විහරති. ඉමාය ච කස්සප මත්තාය ඉමිනා තපොපක්කමෙන සාමඤ්ඤං වා අභවිස්ස බ්‍රහ්මඤ්ඤං වා දුක්කරං සුදුක්කරං නෙතං අභවිස්ස කල්ලං වචනාය දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති. සක්කා ච පනෙතං අභවිස්ස කාතුං ගහපතිනා වා ගහපතිපුත්තෙන වා අන්තමසො කුම්භදාසියාපි: හන්දාහං සාණානිපි ධාරෙමි මසාණානිපි ධාරෙමි ඡව දුස්සානි පි ධාරෙමි පංසුකූලානි පි ධාරෙමි තිරීටානි පි ධාරෙමි අජිනානි පි ධාරෙමි අජිනක්ඛි-පම්පි ධාරෙමි කුසචීරම්පි ධාරෙමි වාකචීරම්පි ධාරෙමි ඵලකචීරම්පි ධාරෙමි කෙසකම්බලම්පි ධාරෙමි වාලකම්බලම්පි ධාරෙමි උලූකපක්ඛිකම්පි ධාරෙමි කෙසමස්සුලොචකො පි හොමි කෙසමස්සුලොචනානුයොගමනුයුත්තො උබ්භට්ඨකො පි හොමි ආසනපටික්ඛිත්තො උක්කුටිකො පි හොමි උක්කුටිකප්ප-ධානමනුයුත්තො කණ්ටකාපස්සයිකො පි හොමි කණ්ටකාපස්සෙ සෙය්‍යං කප්පෙමි ඵලකසෙය්‍යම්පි කප්පෙමි ථණ්ඩිලසෙය්‍යම්පි කප්පෙමි එකපස්සයිකො පි හොමි රජොජල්ලධරො අබ්භො-කාසිකො පි හොමි යථාසන්ථතිකො වෙකටිකො පි හොමි විකටභොජනානුයොගමනුයුත්තො අපානකො පි හොමි අපානකත්තමනුයුත්තො සායතතියකම්පි උදකොරොහණානු-යොගමනුයුත්තො විහරාමීති.

22. කාශ්‍යපය, ඉදින් (යමෙක්) හණවැහැරිරෙදි දරාද, හණවැහැරිමුසු රෙදි දරාද, ඡව වස්ත්‍ර නොහොත් එරුතණ ආදියෙන් කළ දළරෙදි හෝ පංශුකූල රෙදි හෝ රිටි සුඹුළු හෝ අඳුන් දිවිසම් හෝ අඳුන් දිවිසම් තීරුවලින් කළ වස්ත්‍ර හෝ කුස වැහැරි, තියඳ වැහැරි, පතුරු වැහැරි ආදිය හෝ කෙස් කම්බිලි, අස්ලොම් කම්බිලි, බකමූහුණු පියාපතින් කළ වස්ත්‍ර හෝ දරාද, ඉසකේ රැවුල් උදුරන්නේද, ආසන ප්‍රතික්ෂේපකොට නැගිටම සිටින්නේද, හැමවිට උක්කුටිකයෙන්ම සිටින්නේද, කටුමත්තෙහි නිදන්නේද, පෝරු මත්තෙහි හෝ උස්බිමෙහි නිදන්නේද, එක් ඇලයකින්ම හොවින්නේද, ඇඟ ධූලි තවරන්නේද, එලිමහනෙහිම වසන්නේද, දුන් කවර අසුන වුවත් එසේම (වෙනස් නොකොට) පිළිගන්නේද, අශුචි බුදින්නේද, සිසිල් දිය නොබොන්නේද, ත්‍රිසන්ධ්‍යායෙහි පව්සේදීම කරන් නෙම්සි දියේ ගැලීමෙහි යෙදෙමින් වාසය කෙරේද, කාශ්‍යපය, මේ මදවූ ප්‍රතිපත්තික්‍රමයෙන් මේ තපස් කර්‍මයෙන් ශ්‍රමණ කර්‍මය හෝ බ්‍රාහ්මණ කර්‍මය හෝ දුෂ්කරවූවක් ඉතා දුෂ්කරවූවක් යයි කියාද එපමණකින් ශ්‍රමණ කර්‍මය දුෂ්කරය බ්‍රාහ්මණ කර්‍මය දුෂ්කරයයි මේ වචනය කීමට සුදුසු නොවන්නේය. (මක්නිසාද යත්) එසේනම් 'මම හණවැහැරි රෙදිද දරමි, හණවැහැරි මුසු රෙදිද දරමි, ඡව වස්ත්‍ර නොහොත් එරුතණ ආදියෙන් කළ දළ රෙදි හෝ පංශුකූල රෙදි හෝ රිටි සුඹුළු හෝ අඳුන් දිවිසම්, හෝ අඳුන් දිවිසම් තිරුවලින් කළ වස්ත්‍ර හෝ කුස වැහැරි, තියඳ වැහැරි, පතුරු වැහැරි ආදිය හෝ කෙස් කම්බිලි, අස් ලොම් කම්බිලි, බකමූහුණු පියාපතින් කළ වස්ත්‍ර හෝ දරමි ඉසකේ රැවුල් උදුරන්නේ, ආසන ප්‍රතික්ෂේප කොට නැගිටම සිටින්නේ, හැමවිට උක්කුටිකයෙන්ම සිටින්නේ, කටු මත්තෙහි නිදන්නේ, පෝරු මත්තෙහි හෝ උස්බිමෙහි නිදන්නේ, එක් ඇලයකින්ම හොවින්නේ, ඇඟ ධූලි තවරන්නේ, එලිමහනෙහිම වසන්නේ, දුන් කවර අසුන වුවත් එසේම (වෙනස් නොකොට) පිළිගන්නේ, අශුචි බුදින්නේ, සිසිල් දිය නොබොන්නේ, 'ත්‍රිසන්ධ්‍යායෙහි පව්සේදීම පිණිස දියේ ගැලීමෙන් වෙසෙමි'යි කියා ගෘහපතියෙකු විසින් හෝ ගෘහපති පුත්‍රයකු විසින් හෝ යටත්පිරිසෙයින් කුම්භදාසියක විසින් හෝ වුවද මේ ශ්‍රමණ කර්‍මය කළ හැකි වන්නේය.

යස්මා ච ඛො කස්සප අඤ්ඤත්‍රෙව ඉමාය[1] මත්තාය අඤ්ඤත්‍ර ඉමිනා[2] තපොපක්කමෙන සාමඤ්ඤං වා හොති බ්‍රහ්මඤ්ඤං වා දුක්කරං සුදුක්කරං තස්මා එතං කල්ලං වචනාය දුක්කරං සාමඤ්ඤං දුක්කරං බ්‍රහ්මඤ්ඤන්ති. යතො[3] ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ඣං මෙත්තචිත්තං භාවෙති ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉතිපි බ්‍රාහ්මණො ඉතිපීති.

23. එවං වුත්තෙ අචෙලො කස්සපො භගවන්තං එතද-වොච: දුජ්ජානො භො ගොතම සමණො දුජ්ජානො බ්‍රාහ්මණොති.

පකති ඛො එසා කස්සප ලොකස්මිං දුජ්ජානො සමණො දුජ්ජානො බ්‍රාහ්මණොති. අචෙලකො චෙපි කස්සප හොති මුත්තාචාරො හත්ථාපලෙඛනො න එහිභදන්තිකො න තිට්ඨ-භදන්තිකො නාභිහටං න උද්දිස්සකටං න නිමන්තණං සාදියති. සො න කුම්භිමුඛා පටිග්ගණ්හාති න කළොපිමුඛා පටිග්ගණ්හාති න එළකමන්තරං න දණ්ඩමන්තරං න මුසලමන්තරං න ද්වින්නං භුඤ්ජමානානං න ගබ්භිනියා න පායමානාය න පුරිසන්තරගතාය න සංකිත්තීසු න යත්ථ සා උපට්ඨිතො හොති න යත්ථ මක්ඛිකා-සණ්ඩසණ්ඩචාරිනී න මච්ඡං න මංසං න සුරං න මෙරයං න ථුසොදකං පිවති. සො එකාගාරිකො වා හොති එකාලොපිකො ද්වාගාරිකො වා හොති ද්වාලොපිකො සත්තාගාරිකො වා හොති සත්තාලොපිකො එකිස්සා පි දත්තියා යාපෙති ද්වීහි පි දත්තීහි යාපෙති සත්තහි පි දත්තීහි යාපෙති එකාහිකම්පි ආහාරං ආහාරෙති ද්වීහිකම්පි ආහාරං ආහාරෙති සත්තාහිකම්පි ආහාරං ආහාරෙති ඉති එවරූපං අඩ්ඪමාසිකම්පි පරියායභත්තභොජනානුයොගමනුයුත්තො විහරති. ඉමාය ච

1. ඉමාය ච S. 2. ඉමිනා ච S.
3. යස්මා ච ඛො V.

කාශ්‍යපය, යම් හෙයකින් මේ මදවූ ප්‍රතිපත්ති ක්‍රමයෙන් තොරවම මේ තපස් කර්මයෙන් තොරවම ශ්‍රමණ කර්මය හෝ බ්‍රාහමණ කර්මය හෝ දුෂ්කරවූයේය, ඉතා දුෂ්කරවූයේය කියා නම්, එසේ වූ ශ්‍රමණ කර්මය දුෂ්කරය, බ්‍රාහමණ කර්මය දුෂ්කරයයි යන මේ වචනය කීමට සුදුසු වෙයි. කාශ්‍යපය, යම් හෙයකින් භික්ෂු තෙම මෛත්‍ර හෙවත් වෛර රහිතවූ දෞර්මනස්‍ය හෙවත් ව්‍යාපාද රහිත වූ මෛත්සිත් වඩාද ආශ්‍රවයන්ගේ ක්‍ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ ඵල සමාධියද ඵල ප්‍රඥාවද ඉහාත්මභාවයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් ප්‍රත්‍යක්‍ෂකොට දැන ඊට පැමිණ වාසය කෙරේද, කාශ්‍යපය, එබඳු භික්ෂු තෙම ශ්‍රමණයයිද බ්‍රාහමණයයි ද කියනු ලැබේ.

23. මෙසේ වදාළ කල්හි අචෙල කාශ්‍යපතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකෙළේය: පින්වත් ගෞතමය, ශ්‍රමණ තෙම දුකසේ හැඳින ගත යුතු වෙයි, බ්‍රාහමණතෙම දුකසේ දැන ගත යුතු වෙයි.

කාශ්‍යපය, 'ශ්‍රමණතෙම දුකසේ දැනගත යුතුය, බ්‍රාහමණ තෙම දුකසේ දැනගත යුතුය' යන මේ කථා තොමෝ ලොකයෙහි ප්‍රකෘති (සාමාන්‍ය) කථාවයි. කාශ්‍යපය, ඉදින් (භික්ෂු තෙම) නග්න හෝ වේද, හරණලද ආචාර ඇත්තේ, අතලෙව්නේ (නොහොත් මලපහරා අතින් මල මග පිසින්නේ), කැඳවූවිට නොඑන්නේ, සිටුව මැනව කීකල්හි නොසිටින්නේ, කලින් එලවූ ආහාර නොගන්නේ, උදෙසා කළ ආහාර හෝ කැඳවා දෙන ආහාර නොපිළිගන්නේ, සැළමුවින් හෝ පැස මුවින් ගෙනදුන් අහර හෝ, එලිපත අතරෙහි, දඬු අතරෙහි, මොහොල් අතරෙහි, අහර අනුභව කරන්නවුන් අතරෙහි තබා දෙනලද අහර හෝ, ගැබිනියන්, කිරිපොවන්නියන් හෝ රති කෙළියෙහි යෙදුණු ස්ත්‍රීන් දුන් අහර හෝ නොගන්නේ, සමාදම්කොට පිසූදේ නොගන්නේ, බල්ලෙකු හෝ මැස්සන් සමූහයක් එලවා දුන් අහර නොගන්නේ, මස්මාංශ, සුරාමෙරය හෝ කාඩිදිය නොගන්නේ, එක් ගෙයකින් හෝ එක් පිඬකින් ගෙවල් දෙකකින් හෝ පිඬු දෙකකින්, ගෙවල් සතකින් හෝ පිඩු සතකින් පමණක් හෝ යැපෙන්නේ "දත්ති" නම් වූ කුඩා පාත්‍රයකින්, දෙකකින් හෝ සතකින් ලත් බතින් යැපෙන්නේ, එක් දිනක්, දෙදිනක්, සත්දිනක් ආදි වශයෙන් අඩමසක් දක්වා නිරාහාරව සිට එක් දිනක ලැබෙන වාර බතින් ජීවත් වේද,

කස්සප මත්තාය ඉමිනා[1] තපොපක්කමෙන සමණො වා අභවිස්ස බ්‍රාහ්මණො වා දුජ්ජානො සුදුජ්ජානො නෙතං අභවිස්ස කල්ලං වචනාය දුජ්ජානො සමණො දුජ්ජානො බ්‍රාහ්මණොති. සක්කා ච පන[2] සො අභවිස්ස ඤාතුං[3] ගහපතිනා වා ගහපති-පුත්තෙන වා අන්තමසො කුම්භදාසියාපි: අයං[4] අචෙලකො හොති[5] මුත්තාචාරො හත්ථාපලෙඛනො න එහිභදන්තිකො න තිට්ඨ-භදන්තිකො නාභිහටං න උද්දිස්සකතං න නිමන්තණං සාදියති. සො න කුම්භිමුඛා පටිග්ගණ්හාති න කළොපිමුඛා පටිග්ගණ්හාති න එළකමන්තරං න දණ්ඩමන්තරං න මුසලමන්තරං න ද්වින්නං භුඤ්ජමානානං න ගබ්භිනියා න පායමානාය න පුරිසන්තරගතාය න සංකිත්තීසු න යත්ථ සා උපට්ඨිතො හොති න යත්ථ මක්ඛිකා-සණ්ඩසණ්ඩචාරිනී න මච්ඡං න මංසං න සුරං න මෙරයං න ථුසොදකං පිවති. සො එකාගාරිකො වා හොති එකාලොපිකො වාගාරිකො වා හොති වාලොපිකො සත්තාගාරිකො වා හොති සත්තාලොපිකො එකිස්සා පි දත්තියා යාපෙති විහි පි දත්තීහි යාපෙති සත්තහි පි දත්තීහි යාපෙති එකාහිකම්පි ආහාරං ආහාරෙති ද්වීහිකම්පි ආහාරං ආහාරෙති සත්තාහිකම්පි ආහාරං ආහාරෙති ඉති එවරූපං අඩ්ඪමාසිකම්පි පරියායභත්ත-භොජනානුයොගමනුයුත්තො විහරතීති.

යස්මා ච ඛො කස්සප අඤ්ඤත්‍රෙව ඉමාය[6] මත්තාය අඤ්ඤත්‍ර ඉමිනා[7] තපොපක්කමෙන සමණො වා හොති[8] බ්‍රාහ්මණො වා දුජ්ජානො සුදුජ්ජානො තස්මා එතං කල්ලං වචනාය දුජ්ජානො සමණො දුජ්ජානො බ්‍රාහ්මණොති. යතො ච[9] ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ඣං මෙත්තචිත්තං භාවෙති ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤා-විමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉතිපි බ්‍රාහ්මණො ඉතිපීති.

---

1. ඉමිනා ච S.
2. සො පන B; පනෙතං S.
3. ඤාතුං Pa.
4. අයං පි අචෙලො S.
5. හොතීති නත්ථි P.S.W.
6. ඉමාය ච S.
7. ඉමිනා ච S.
8. හොතීති නත්ථි W.
9. චකාරො නත්ථි P.S.W.

කාශ්‍යපය, (එබන්දකු විසින් එපමණකින්) මෙබඳු වූ ප්‍රති- පත්ති ක්‍රමයෙන් හා මෙබඳු තපස් කර්මයෙන් ශ්‍රමණ තෙම හෝ බ්‍රාහ්මණ තෙම හෝ දුකසේ දැනගත යුතුය, ඉතා දුකසේ දැන ගතයුතු යයි කියනු ලැබේද, එපමණකින්ම ‘ශ්‍රමණතෙම දුකසේ දැනගත යුත්තේය, බ්‍රාහ්මණ තෙම දුකසේ දැනගත යුත්තේය’ යන මේ වචනය කීමට සුදුසු නොවේ. ‘මේ තෙම නග්න වූයේය, හරණලද ආචාර ඇත්තේය අතලෙව්නේ(නොහොත්, මලපහරා අතින් මලමග පිසින්නේ), කැඳවූවිට නොඑන්නේ, සිටුව මැනව කීකල්හි නොසිටින්නේ,කලින් එලවූ ආහාර නොගන්නේ, උදෙසා කල ආහාර හෝ කැඳවා දෙන ආහාර නොපිළිගන්නේ, සැලමුවින් හෝ පැසමුවින් ගෙනදුන් අහර හෝ, එලිපත අතරෙහි, දඬු අතරෙහි, මොහොල් අතරෙහි, අහර අනුභව කරන්නවුන් අතරෙහි තබා දෙනලද අහර හෝ, ගැබිත්තන්, කිරි පොවන්නියන්, හෝ රතිකෙළියෙහි යෙදුනු ස්ත්‍රීන් දුන් අහර හෝ නොගන්නේ, සමාදම්කොට පිසූදේ නොගන්නේ, බල්ලෙකු හෝ මැස්සන් සමූහයක් එලවා දුන් අහර නොගන්නේ, මස්මාංශ, සුරාමේරය හෝ කාඩිදිය නොගන්නේ, එක් ගෙයකින් හෝ එක් පිඬකින්, ගෙවල් දෙකකින් හෝ පිඬු දෙකකින්, ගෙවල් සතකින් හෝ පිඬු සතකින් පමණක් හෝ යැපෙන්නේ, “දත්ති” නම් වූ කුඩා පාත්‍රයකින්, දෙකකින් හෝ සතකින් හෝ ලත් බතින් යැපෙන්නේ, එක් දිනක්, දෙදිනක්, සත් දිනක් ආදි වශයෙන් අඩමසක් දක්වා නිරාහාරව සිට එක් දිනක ලැබෙන වාර බතින් ජීවත් වන්නේය’යි කාශ්‍යපය, ගෘහපතියකු විසින් හෝ ගෘහපති පුත්‍රයකු විසින් හෝ යටත් පිරිසෙයින් කුම්භදාසියක විසින් හෝ දැනගත හැකි (හඳුනාගත හැකි) වන්නේය (එබන්දකු හඳුනාගැනීම දුෂ්කර නොවේ).

කාශ්‍යපය, ඉදින් මේබඳුවූ සුළු ප්‍රතිපත්තියෙන් තොරවම මෙබඳු සුළු තපස් කර්මයෙන් තොරවම ශ්‍රමණයා හෝ බ්‍රාහ්මණයා හෝ දුකසේ දැනගත යුත්තේය ඉතා දුකසේ දැනගත යුත්තේය කියා නම් එවිට ‘ශ්‍රමණ තෙම දුකසේ දැනගත යුතුය, බ්‍රාහ්මණ තෙම දුකසේ දැනගත යුතුය’ යන මේ වචනය කියන්නට වටී. කාශ්‍යපය, යම්හෙයකින් භික්ෂු තෙම වෛෂ හෙවත් වෛර රහිත වූ, දෞර්මනස්‍ය හෙවත් ව්‍යාපාද රහිත වූ මෙත් සිත් වඩාද, ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ ඵල සමාධියද ඵල ප්‍රඥාවද මේ අත්බැව්හිදීම තමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කෙරේද, කාශ්‍යපය, එබඳු භික්ෂුතෙම (නියම වශයෙන්) ශ්‍රමණයයිද බ්‍රාහ්මණයයිද කියනු ලැබේ.

24. සාකභක්ඛො චෙපි කස්සප හොති සාමාකභක්ඛො චෙපි කස්සප හොති නීවාරභක්ඛො වා හොති දද්දුලභක්ඛො වා හොති හටභක්ඛො වා හොති කණභක්ඛො වා හොති ආචාමභක්ඛො වා හොති පිඤ්ඤාකභක්ඛො වා හොති තිණභක්ඛො වා හොති ගොමයභක්ඛො වා හොති වනමූලඵලාහාරො යාපෙති පවත්තඵලභොජී ඉමාය ච කස්සප මත්තාය ඉමිනා[1] තපොපක්කමෙන සමණො වා අභවිස්ස බ්‍රාහ්මණො වා දුජ්ජානො සුදුජ්ජානො නෙතං අභවිස්ස කල්ලං වචනාය දුජ්ජානො සමණො දුජ්ජානො බ්‍රාහ්මණොති. සක්කා ච පනෙසො[2] අභවිස්ස ඤාතුං ගහපතිනා වා ගහපතිපුත්තෙන වා[3] අන්තමසො කුම්භදාසියාපි: අයං සාකභක්ඛො වා හොති සාමාකභක්ඛො වා[4] නීවාරභක්ඛො වා හොති දද්දුලභක්ඛො වා හොති හටභක්ඛො වා හොති කණභක්ඛො වා හොති ආචාමභක්ඛො වා හොති පිඤ්ඤාකභක්ඛො වා හොති තිණභක්ඛො වා හොති ගොමයභක්ඛො වා හොති වනමූලඵලාහාරො යාපෙති පවත්තඵලභොජීති.

යස්මා ච ඛො කස්සප අඤ්ඤත්‍රෙව ඉමාය[5] මත්තාය අඤ්ඤත්‍ර ඉමිනා[5] තපොපක්කමෙන සමණො වා හොති බ්‍රාහ්මණො වා දුජ්ජානො සුදුජ්ජානො තස්මා එතං කල්ලං වචනාය දුජ්ජානො සමණො දුජ්ජානො බ්‍රාහ්මණොති.

යතො ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ඣං මෙත්තචිත්තං භාවෙති ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉතිපි බ්‍රාහ්මණො ඉතිපි.

---

1. ඉමිනා ච S.
2. පන සො W.
3. ගහපති වා ගහපති පුත්තො වා W.
4. වා ති නත්‍ථි B. S.
5. ඉමාය ච S.

24. කාශ්‍යපය, ඉදින් යමෙක් නොපිසූ පලා අනුභව කරන්නේ බඩහමු නම් තෘණ ධාන්‍ය හෝ ස්වයංජාත ධාන්‍ය හෝ සම් කරුවන් ලියාලූ සම්කසට හෝ සෙවෙල් හෝ කුඩු හෝ දංකොඩ හෝ මුරුවට හෝ තණ හෝ ගොම හෝ ස්වයංපතිත ඵල අනුභව කරන සුලුවූයේ වනමුල් ඵල ආහාරකොට යැපේද, මෙ බඳුවූ සුළු ප්‍රතිපත්ති ක්‍රමයෙන් මේ සුළු තපස් ක්‍රමයෙන් ශ්‍රමණයා හෝ බ්‍රාහමණයා හෝ දුකසේ දුනගතයුතුය, ඉතා දුකසේ දුනගතයුතුය කියතොත්, එපමණකින්ම 'ශ්‍රමණ තෙම දුකසේ දූනගත යුත්තේය, බ්‍රාහමණතෙම දුකසේ දූනගත යුත්තේය' යන මේ වචනය කියන්නට සුදුසු නොවෙයි. (මක්නිසාද යත්:) 'මේ තෙම නොපිසූ පලා අනුභව කරන්නේය, බඩ හමු නම් තෘණ ධාන්‍ය හෝ ස්වයංජාත ධාන්‍ය හෝ සම් කරුවන් ලියාලූ සම්කසට හෝ සෙවෙල් හෝ කුඩු හෝ දංකොඩ හෝ මුරුවට හෝ තණ හෝ ගොම හෝ ස්වයංපතිත ඵල අනුභවකරන සුලුවූයේ වනමුල් ඵල ආහාරකොට ඇත්තේව යැපෙයි' කියා එබන්දෙක් ගෘහපතියකු විසින් හෝ ගෘහපති පුත්‍රයකු විසින් හෝ යටත් පිරිසෙයින් කුම්භදාසියක විසින් හෝ වුවද හැඳිනගත හැකි වන්නේය.

කාශ්‍යපය, යම්හෙයකින් මේ සුළුවූ ප්‍රතිපත්ති ක්‍රමයෙන් තොරවම, මේ තපස් කර්මයෙන් තොරවම (නියම) ශ්‍රමණයා හෝ බ්‍රාහමණයා හෝ දුකසේ දූනගත යුතුය, ඉතා දුකසේ දූනගත යුතුය කියා නම්, එවිට 'ශ්‍රමණතෙම දුකසේ දූනගත යුතුය, බ්‍රාහමණ තෙම ඉතා දුකසේ දූනගත යුතුය' යන මේ වචනය කියන්නට වටී.

කාශ්‍යපය, යම්හෙයකින් භික්ෂුතෙම වෛෂ හෙවත් වෛර රහිතවූ, දෞර්මනස්‍ය හෙවත් ව්‍යාපාද රහිතවූ මෙත් සිත් වඩාද, ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ ඵල සමාධියද ඵල ප්‍රඥාවද මේ අත්බැව්හිම තෙමේම විශිෂ්ට ඥානයෙන් දූන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කෙරේද, කාශ්‍යපය, එබඳු භික්ෂූ තෙම ශ්‍රමණයයි ද බ්‍රාහමණයයිද කියනු ලැබේ.

25. සාණානි චෙපි කස්සප ධාරෙති මසාණානිපි ධාරෙති ඡවදුස්සානි පි ධාරෙති පංසුකූලානි පි ධාරෙති තිරීටානි පි ධාරෙති අජිනානි පි ධාරෙති අජිනක්ඛිපම්පි ධාරෙති කුසචීරම්පි ධාරෙති වාකචීරම්පි ධාරෙති ඵලකචීරම්පි ධාරෙති කෙසකම්බලම්පි ධාරෙති වාලකම්බලම්පි ධාරෙති උලූකපක්ඛිකම්පි ධාරෙති කෙසමස්සුලොචකො පි හොති කෙසමස්සුලොචනානුයොගමනුයුත්තො උබ්භට්ඨකො පි හොති ආසනපටික්ඛිත්තො උක්කුටිකො පි හොති උක්කුටිකප්පධානමනුයුත්තො කණ්ටකාපස්සයිකො පි හොති කණ්ටකාපස්සෙ සෙය්‍යං කප්පෙති ඵලකසෙය්‍යම්පි කප්පෙති ථණ්ඩිලසෙය්‍යම්පි කප්පෙති එකපස්සයිකො පි හොති රජොජල්ලධරො අබ්භොකාසිකො පි හොති යථාසන්ථතිකො වෙකටිකො පි හොති විකටභොජනානුයොගමනුයුත්තො අපානකො පි හොති අපානකත්තමනුයුත්තො සායතතියකම්පි උදකොරොහණානුයොගමනුයුත්තො විහරති. ඉමාය ච කස්සප මත්තාය ඉමිනා[1] තපොපක්කමෙන සමණො වා අභවිස්ස[2] බ්‍රාහ්මණො වා දුජ්ජානො සුදුජ්ජානො නෙතං අභවිස්ස කල්ලං වචනාය දුජ්ජානො[3] සමණො දුජ්ජානො[3] බ්‍රාහ්මණොති.

සක්කා ච පනෙසො අභවිස්ස ඤාතුං ගහපතිනා වා ගහපතිපුත්තෙන වා අන්තමසො කුම්භදාසියාපි: අයං සාණානිපි ධාරෙති මසාණානිපි ධාරෙති ඡවදුස්සානි පි ධාරෙති පංසුකූලානි පි ධාරෙති තිරීටානි පි ධාරෙති අජිනානි පි ධාරෙති අජිනක්ඛිපම්පි ධාරෙති කුසචීරම්පි ධාරෙති වාකචීරම්පි ධාරෙති ඵලකචීරම්පි ධාරෙති කෙසකම්බලම්පි ධාරෙති වාලකම්බලම්පි ධාරෙති උලූකපක්ඛිකම්පි ධාරෙති කෙසමස්සුලොචකො පි හොති කෙසමස්සුලොචනානුයොගමනුයුත්තො උබ්භට්ඨකො පි හොති ආසනපටික්ඛිත්තො උක්කුටිකො පි හොති උක්කුටිකප්පධානමනුයුත්තො කණ්ටකාපස්සයිකො පි හොති කණ්ටකාපස්සෙ සෙය්‍යං කප්පෙති ඵලකසෙය්‍යම්පි කප්පෙති ථණ්ඩිලසෙය්‍යම්පි කප්පෙති එකපස්සයිකො පි හොති රජොජල්ලධරො අබ්භොකාසිකො පි හොති යථාසන්ථතිකො වෙකටිකො පි හොති විකටභොජනානුයොගමනුයුත්තො අපානකො පි හොති අපානකත්තමනුයුත්තො සායතතියකම්පි උදකොරොහණානුයොගමනුයුත්තො විහරතීති.

---

1. ඉමිනා ච S.
2. සමණො වා බ්‍රාහ්මණො වා අභවිස්ස P.W.
3. න දුජ්ජානො W.

25. කාශ්‍යපය, ඉදින් යමෙක් හණ වැහැරි රෙදි දරාද, හණ වැහැරි මුසු රෙදි දරාද, ඡව වස්ත්‍ර නොහොත් එරුතණ ආදියෙන් කළ දළරෙදි හෝ පාංශුකූල රෙදි හෝ රිටි සුඹුළු හෝ අඳුන් දිවිසම් හෝ අඳුන් දිවිසම් තිරුවලින් කළ වස්ත්‍ර හෝ කුස වැහැරි, නියඳ වැහැරි, පතුරු වැහැරි ආදිය හෝ කෙස් කම්බිලි, අස්ලොම් කම්බිලි, බකමූහුණු පියාපතින් කළ වස්ත්‍ර හෝ දරාද, ඉසකේ රැවුල් උදුරන්නේද, ආසන ප්‍රතික්ෂෙප කොට නැගිටම සිටින්නේද, හැමවිට උක්කුටිකයෙන්ම සිටින්නේද, කටුමත්තෙහි නිදන්නේද, පෝරු මත්තෙහි හෝ උස්බිමෙහි නිදන්නේද, එක් ඇලයකින්ම හොවින්නේද, ඇඟ ධූලි තවරන්නේද, එලිමහනෙහිම වසන්නේද, දුන් කවර අසුන වුවත් එසේම (වෙනස් නොකොට) පිළිගන්නේද, අශුචි බුදින්නේද, සිසිල් දිය නොබොන්නේද, ත්‍රිසන්ධ්‍යායෙහි 'පව් සෝදා හරින්නෙමි'යි දියේ ගැලීමෙහි යෙදී වාසය කෙරේද, කාශ්‍යපය, මේ (සුළුවූ) ප්‍රතිපත්ති ක්‍රමයෙන්ද මේ තපස් කර්මයෙන්ද ශ්‍රමණයා හෝ බ්‍රාහ්මණයා හෝ දුකසේ දැනගත යුතු වේනම් ඉතා දුකසේ දැනගත යුතු වේනම් එපමණකින්ම 'ශ්‍රමණතෙම දුකසේ දැන ගත යුතුය, බ්‍රාහ්මණ තෙම දුකසේ දැන ගත යුතුය' යන මේ වචනය කියන්නට නොවටී.

(මක්නිසාදයත්) 'මේ තෙම හණ වැහැරි රෙදි දරයි හණ වැහැරි මුසු රෙදි දරයි, ඡව වස්ත්‍ර නොහොත් එරුතණ ආදියෙන් කළ දළරෙදි හෝ පාංශුකූල රෙදි හෝ රිටි සුඹුළු හෝ අඳුන් දිවිසම් හෝ අඳුන් දිවිසම් තිරුවලින් කළ වස්ත්‍ර හෝ කුස වැහැරි, නියඳ වැහැරි, පතුරු වැහැරි ආදිය හෝ කෙස් කම්බිලි, අස්ලොම් කම්බිලි, බකමූහුණු පියාපතින් කළ වස්ත්‍ර හෝ දරයි, ඉසකේ රැවුල් උදුරන්නේද, ආසන ප්‍රතික්ෂෙප කොට නැගිටම සිටින්නේද, හැමවිට උක්කුටිකයෙන්ම සිටින්නේද, කටුමත්තෙහි නිදන්නේද, පෝරු මත්තෙහි හෝ උස්බිමෙහි නිදන්නේද, එක් ඇලයකින්ම හොවින්නේද, ඇඟ ධූලි තවරන්නේද, එලිමහනෙහිම වසන්නේද, දුන් කවර අසුන වුවත් එසේම (වෙනස් නොකොට) පිළිගන්නේද, අශුචි බුදින්නේද, සිසිල් දිය නොබොන්නේද වෙයි ත්‍රිසන්ධ්‍යායෙහි පව් සෝදා හරිමියි දියේ ගැලීමෙහි යෙදී වාසය කෙරෙහි'කියා එබන්දකු ගෘහපතියෙකු විසින් හෝ ගෘහපති පුත්‍රයෙකු විසින් හෝ යටත් පිරිසෙහිත් කුම්භදාසියක විසිත් හෝ හඳුනාගත හැකි වන්නේය.

යස්මා ච ඛො කස්සප අඤ්ඤත්‍රෙව ඉමාය[1] මත්තාය අඤ්ඤත්‍ර ඉමිනා[2] තපොපක්කමෙන සමණො වා හොති බ්‍රාහ්මණො වා දුජ්ජානො සුදුජ්ජානො තස්මා එතං කල්ලං වචනාය දුජ්ජානො සමණො දුජ්ජානො බ්‍රාහ්මණොති.

යතො[3] ඛො කස්සප භික්ඛු අවෙරං අබ්‍යාපජ්ඣං මෙත්තචිත්තං භාවෙති ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති අයං වුච්චති කස්සප භික්ඛු සමණො ඉතිපි බ්‍රාහ්මණො ඉතිපීති.

26. එවං වුත්තෙ අචෙලො කස්සපො භගවන්තං එතදවොච: කතමා පන සා භො ගොතම සීලසම්පදා කතමා චිත්තසම්පදා කතමා පඤ්ඤාසම්පදාති?

ඉධ කස්සප තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි[4] සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා.[5] සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති.

තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ[6] පච්චාජාතො.[7] සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසංචික්ඛති: සම්බාධො ඝරාවාසො රජොපථො[8] අබ්භොකාසො පබ්බජ්ජා.

1. ඉමාය ච S.
2. ඉමිනා ච S.
3. යතො ච ඛො S.
4. °සාරථි B. S.
5. භගවාති S.
6. අඤ්ඤතරස්මි වා පච්චා° W.
7. පච්ජා° S; පච්චා Sa.
8. රජාපථො S. C. රජො° Sa.

කාශ්‍යපය, යම්හෙයකින් මේ සුළුවූ ප්‍රතිපත්ති ක්‍රමයෙන් තොරවම මේ මදවූ තපස් කර්මයෙන් තොරවම ශ්‍රමණයා හෝ බ්‍රාහමණයා හෝ දුකසේ දැන ගත යුතු වේ නම් ඉතා දුකසේ දැන ගත යුතු වේනම්, එබඳුවූ ශ්‍රමණතෙම දුකසේ දැන ගත යුත්තේය, බ්‍රාහමණ තෙම දුකසේ දැන ගත යුත්තේය යන මේ වචනය කියන්නට වටී.

කාශ්‍යපය, යම් හෙයකින් භික්ෂු තෙම වෛෂ හෙවත් වෛර රහිත වූ දෞර්මනස්‍ය හෙවත් ව්‍යාපාද රහිත වූ මෙත් සිත් වඩාද ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ ඵල සමාධියද ඵල ප්‍රඥාවද මේ අත්බැව්හිම තෙමේම විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කෙරේද, කාශ්‍යපය, එබඳු භික්ෂුතෙම ශ්‍රමණ යයිද බ්‍රාහමණ යයිද කියනු ලැබේ.

26. මෙසේ වදාළ කල්හි අචේල කාශ්‍යප තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය: පින්වත් ගෞතමය, ඒ ශීලසම්පත්තිය කවරේද, චිත්ත සම්පත්තිය කවරේද, ප්‍රඥා සම්පත්තිය කවරේද?

කාශ්‍යපය, අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, අෂ්ටවිද්‍යා පසළොස් චරණධර්මයන් ගෙන් යුක්තවූ, යහපත් ගති ඇත්තාවූ, සියලු ලෝකයන් දත්තා සුළුවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි ශ්‍රේෂ්ඨවූ, රියැදුරෙකු වැනිවූ, දෙවිමිනිසුන්ට ශාස්තෘවූ, සිව්සස් දම් අවබෝධ කළාවූ, භාග්‍යවත් වූ, තථාගත කෙනෙක් මෙලොව උපදනාහ. ඒ තථාගත තෙමේ දෙවියන් සහිත වූ, මාරයන් සහිතවූ, බ්‍රහමයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, දෙවිමිනිසුන් (රජුන් හා මිනිසුන්) සහිතවූ, සත්ත්වවර්ගයා සවකීය විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කෙරේ. ඒ තථාගතයන් වහන්සේ මුල යහපත්වූ, මැද යහපත්වූ, කෙළවර යහපත්වූ (සතර සතිපට්ඨානාදිය ඇසුරු කළ හෙයින්) අර්ථ සහිතවූ, (දශවිධ ව්‍යඤ්ජන නොපිරිහෙළා වදරණ හෙයින්) ව්‍යඤ්ජන සහිතවූ, සියලු ලෙසින් සම්පූර්ණවූ, පිරිසුදුවූ, සකල ශාසනමාර්ගී බ්‍රහමචර්‍යාව ගෙන හැර දක්වති.

ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ අන් කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක් හෝ අසයි. හෙතෙම ඒ දහම් අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කෙරෙයි. හෙතෙම ඒ ශ්‍රද්ධා ලාභයෙන් යුක්ත වූයේ මෙසේ සලකන්නේය: ගෘහවාසය පීඩා සහිතයි. රාගාදි රජස ගැවසි මාර්ගයෙකි. පැවිද්ද විතාපී අබ්භෝකාසය මෙනි (කිසිවක් නොමැති අවකාසය මෙන් නිදහස්ය).

නයිදං[1] සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සංඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති.[2]

සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති[3]. සො[4] එවං පබ්බජිතො සමානො පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු කායකම්මවචීකම්මෙන සමන්නාගතො කුසලෙන පරිසුද්ධාජීවො සීලසම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො සන්තුට්ඨො.

27. කථඤ්ච කස්සප භික්ඛු සීලසම්පන්නො හොති? ඉධ කස්සප භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බ-පාණභූතහිතානුකම්පී විහරති. ඉදම්පිස්ස හොති සීලසම්පදාය.

අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති. ඉදම්පිස්ස හොති සීලසම්පදාය. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී[5] විරතො මෙථුනා ගාමධම්මා. ඉදම්පිස්ස හොති සීලසම්පදාය.

---

1. න ඉදං C.
2. පබ්බජ්ජෙය්‍යන්ති P.
3. පබ්බජ්ජති P.
4. සො ඉති න දිස්සති P.
5. අනාචාරී B.

ගිහිගෙහි වසන්නහු විසින් සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, සියලු ආකාරයෙන් පිරිසිදුවූ ලියවූ සකක් වැනි (සංඛ-ලිඛිතවූ) මෙම බඹසර හැසිරෙන්ට නොහැක්කේය. මම කෙස් දැළිරැවුලු හරවා කසාවත් හැඳ, ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවන්නෙම් නම් (ඒකාන්තයෙන්) ඉතා මැනවැයි කියායි.

හෙතෙම පසු කාලයෙක සවල්පවූ හෝ බොහෝවූ භොග රාශිය හැර, සවල්පවූ හෝ බොහෝවූ නෑපිරිස් හැර, කෙස් දැළිරැවුලු හරවා, කසාවිසත්‍රයන් හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වේ. මෙසේ පැවිදිවූ හෙතෙම පාතිමොක්ඛ සංවරයෙන් යුක්ත වූයේ, ආචාර ගොචර දෙකකින් යුක්ත වූයේ, සවල්පවූත් අකුසල් විෂයෙහි භය දක්නාසුලු වූයේ, යහපත්වූ කාය වාක් කර්මයන් යුක්ත වූයේ ශික්ෂාපද සමාදන්ව එහි මොනවට හික්මෙයි. පිරිසිදුවූ දිවි පැවැතුම් ඇත්තේ වෙයි. (ත්‍රිවිධ) ශීලයෙන් යුක්ත වූයේ වෙයි. ඉන්ද්‍රිය විෂයෙහි වැසූ දොරටු ඇත්තේ වෙයි. බොජුනෙහි පමණ දන්නේ වෙයි. මනා සිහියෙන් හා සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයි. (සිව්පසය පිළිබඳ යථාලාභ) සන්තොෂයෙන් යුක්ත වෙයි.

27. කාශ්‍යපය, මහණ තෙමේ කෙසේනම් සීලසම්පන්න වේද? කාශ්‍යපය, මේ සස්නෙහිවූ මහණතෙමේ ප්‍රාණවධය හැර ඉන් වැළැක්කේ වේ. බහා තබන ලද දඬු ඇත්තේ, බහා තබන ලද අවි ඇත්තේ, පව් කිරීමෙහි ලජ්ජා ඇත්තේ, කරුණාවත් වූයේ, සියලු ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පිව වෙසේ. මෙසේ මේ (ප්‍රාණ වධයෙන් වෙන්වීමේ සීලය) ද ඒ මහණහුගේ සීලසම්පත්තිය පිණිස වේ.

(හෙතෙම) නොදුන් දෙය ගැනීමෙන් වෙන්ව, එයින් විශෙෂයෙන් වැළැක්කේ, දුන් දෙයම ගන්නේ, දුන් දෙයම කැමැති (බලාපොරොත්තු) වන්නේ, සොර නොවූ, පිරි-සුදුවූ (ආත්මභාවයෙන්) සිතින් යුක්තව වාසය කෙරේ. මෙසේ ඒ (අදත්තාදානයෙන් වෙන්වීමේ සීලය) ද ඒ මහණහුගේ සීලය පිණිස වේ. අබ්‍රහ්මචර්‍ය්‍යාව හැර, බඹසර නොවන හැසිරීමෙන් දුරුවූ පැවතුම් ඇත්තේ, ස්ත්‍රීපුරුෂසංසර්ගය නම්වූ ග්‍රාම-ධර්මයෙන් වෙන් වූයේ බ්‍රහ්මචාරී වේ. මෙසේ ඒ (ග්‍රාමාසවාද විරතිය පිළිබඳවූ සීලය) ද ඔහුගේ සීලසම්පත්තිය පිණිස වේ.

මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති[1] සච්චවාදී සච්චසන්ධො ථෙතො[2] පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. ඉදම්පිස්ස හොති සීලසම්පදාය. පිසුණං වාචං[3] පහාය පිසුණාය වාචාය පටිවිරතො හොති. ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය. අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා[4] සමග්ගාරාමො[5] සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති[6]. ඉදම්පිස්ස හොති සීලසම්පදාය.

ඵරුසං[7] වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති. යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා[8] හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා තථාරූපං[9] වාචං භාසිතා හොති. ඉදම්පිස්ස හොති සීලසම්පදාය. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා හොති[6] කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං[10]. ඉදම්පිස්ස හොති සීලසම්පදාය.

28. බීජගාමභූතගාමසමාරම්භා[11] පටිවිරතො හොති[12]. එකභත්තිකො හොති රත්තූපරතො[13] පටිවිරතො[14] විකාලභොජනා. නච්චගීතවාදිතවිසූකදස්සනා[15] පටිවිරතො හොති. මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතො හොති. උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ජාතරූපරජතපටිග්ගහණා[16] පටිවිරතො හොති.

---

1. පටිවිරතො හොති සමණො ගොතමො P.
2. ඨෙතො S; ථෙතො Sa.
3. පිසුණාවාචං P. W.
4. අනුප්පා° P.
5. සමග්ගරාමො B. Ca.
6. හොතිති න දිස්සති P.
7. ඵරුසාවාචං P. W.
8. පෙමනියා B.
9. °රූපිං P.
10. °සඤ්හිතං B.
11. °සමාරබ්භා B. V.
12. හොති—පෙ—එක° B. V.
13. රත්තූපරතො B.
14. විරතො P. S. C.
15. °විසූක° B.
16. °ප්පටිග්ගහණා V. (සබ්බත්ථ)

බොරු කීමෙන් දුරුව, ඉන් විශේෂයෙන් වැළැක්කේ, සැබෑ තෙපුල් කියන්නේ, සැබැවින් සැබව ගළපන සුලුවූයේ, ස්ථිර කථා ඇත්තේ, ඇදහිය යුතු තෙපල් ඇත්තේ, ලෝකයා අතර විරුද්ධ කථා ඇති නොකෙරේ. මෙසේ (බොරු කීමෙන් වැළකීම) ද ඒ මහණහුගේ සීලය පිණිස වේ. පිසුණු බස් හැර, ඉන් වෙසෙසින් වැළැක්කේය. මේතැනින් අසා මොවුන් බිඳවීම පිණිස එතැන නොකියන සුලුවූයේය. එතැනින් අසා මොවුන් බිඳවීම පිණිස මෙතැන නොකියන සුලුවූයේය. මෙසේ හෙද වූවන් ගළපන්නේ, සමගිවූවන්ගේ සමගිය තහවුරු කිරීමට අනුබල දෙන්නේ, සමගියෙහි ඇලුම් බහුල කොට ඇත්තේ, සමගිකම්හි ඇලුනේ, සමගිකම්හි සතුටුවන සුලුවූයේ, සමගිය ඇති කරණ තෙපුල් කියන්නේය. මේ ද ඔහුගේ සීලසම්පත පිණිස වේ.

ඵරුෂ වචනය හැර ඉන් වෙසෙසින් වැළැක්කේ, යම් වචනයක් නිදෙස් වේද, කන්කලු ද, අර්ථ වශයෙන් ප්‍රෙමණීයද, මනාසේ සිතට වදනා හෙයින් සිත්කලු ද, පුරවාසීන්ගේ කථා මෙන් යහපත් ද, බොහෝ දෙනාට ප්‍රිය ද, බොහෝ දෙනාගේ මන වඩන්නේ ද, එබඳු තෙපුල්ම කියන්නේ වේ. මෙසේ (ඒ රළුවචනයෙන් වෙන්වීම ද) ඒ මහණහුගේ සීලය පිණිස වේ. හිස්වූ ප්‍රලාප කථා හැර ඉන් වෙසෙසින් වැළැක්කේ, කාල-යට සුදුසු කථා කරන්නේ, සිදුවූ (සැබෑවූ) තෙපුල්ම කියන්නේ-අර්ථයෙන් යුක්තවූ, (නවලොවුතුරු) දහම් ඇසුරු කළ, විනය ඇසුරු කළ තෙපුල් කියන්නේ, සුදුසු කල්හි උපමා හා කරුණු සහිතවූ,(පරිච්ඡේද) සීමා ඇති, අර්ථ හෙවත් අභිවෘද්ධියෙන් යුත්, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේ. මේ (හිස්කථාවෙන් වැළැක්ම) ද ඔහුගේ සීලසම්පත පිණිස වේ.

28. තණ, ගස්, වැල් සිඳීම් බිඳීම් ආදි විකොපනයෙන් වැළැක්කේ, එක් වේලේ වළඳන බොජුන් ඇත්තේ, රාත්‍රි-භොජනයෙන් හා විකල් බොජුනෙන් වැළැක්කේය. නැටීම්, ගී කීම්, බෙර ආදිය වැයීම්, විසුලු දැකීම් යන මෙයින් වැළැක්-කේය. මල්, ගඳ, විලවුන් පැළඳීම, ඉන් සැරසීම, උනුතැන් පිරවීමෙන් අලඞකාර කිරීම යන මෙයින් වැළැක්කේය. උස් අසුන් මහ අසුන් යන මෙයින් වැළැක්කේය. රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් වැළැක්කේය.[1]

1. දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ උපග්‍රන්ථයේ x වෙනි පිට බලනු.

ආමකධඤ්ඤපටිග්ගහණා[1] පටිවිරතො හොති. ආමකමංසපටිග්ගහණා [1] පටිවිරතො හොති. ඉත්ථිකුමාරිකපටිග්ගහණා [1] පටිවිරතො හොති. දාසිදාසපටිග්ගහණා[1] පටිවිරතො හොති. අජෙළකපටිග්ගහණා[1] පටිවිරතො හොති. කුක්කුටසූකරපටිග්ගහණා [1] පටිවිරතො හොති. හත්ථිගවාස්සවළවාපටිග්ගහණා[2] පටිවිරතො හොති. ඛෙත්තවත්ථුපටිග්ගහණා [1] පටිවිරතො හොති. දූතෙය්‍යපහිණගමනානුයොගා[3] පටිවිරතො හොති. කයවික්කයා පටිවිරතො හොති. තුලාකූටකංසකූටමානකූටා[4] පටිවිරතො හොති. උක්කොටනවඤ්චනනිකතිසාචියොගා [5] පටිවිරතො හොති. ඡෙදනවධබන්ධනවිපරාමොසආලොපසහසාකාරා [6] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලසම්පදාය.

29. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං බීජගාමභූතගාමසමාරම්භං [7] අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං[8] මූලබීජං ඛන්ධබීජං ඵළුබීජං [9] අග්ගබීජං බීජබීජමෙව[10] පඤ්චමං— ඉති [11] එවරූපා බීජගාමභූතගාමසමාරම්භා[12] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලසම්පදාය.

30. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං සන්නිධිකාරපරිභොගං අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං අන්නසන්නිධිං [13] පානසන්නිධිං වත්ථසන්නිධිං යානසන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං— ඉති වා ඉති එවරූපා සන්නිධිකාරපරිභොගා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලසම්පදාය.

---

1. °ප්පටිග්ගහණ V.(සබ්බත්ථ)
2. °ගවස්ස°B.V.°වලව°V.W.°වළුව°B.
3. °පහීණ° W.
4. °කූට° B.
5. °සාචි° B. V.
6. °සහස° B.
7. °සමාරබ්භ• V.
8. සෙය්‍යථිදං B. V. (සබ්බත්ථ)
9. ඵල° S. ඵලු° C. P.
10. බීජබීජං එව B.S.V.
11. ඉති වා ඉති V. S.
12. °සමාරබ්භා V.
13. °නිධි S. (සබ්බත්ථ).

අමුවූ ධාන්‍යවර්ග පිළිගැන්මෙන් තොරවූයේ, අමුමස් පිළිගැන්මෙන් තොරවූයේ ද ස්ත්‍රීන් හා කුමරියන් පිළිගැන්මෙන් තොර වූයේද වේ. දූසිදසුන් පිළිගැන්මෙන් තොර වූයේ, එළුවන් හා නිරළුවන් පිළිගැන්මෙන් තොර වූයේ, කුකුළන්, හූරන්, ඇතුන්, ගවයන්, අසුන්, වෙළඹුන්, කෙත්, වත්, යන මේ පිළිගැන්මෙන්ද තොර වූයේය. ගිහියන්ගේ දූත මෙහෙවරය, ගෙන්ගෙට යන පහත් මෙහෙවරය යන මෙයින් වැළැක්කේය. ගනු දෙනු කිරීමය, තුලා ආදියෙන් වඤ්චා කිරීමය, රන් හා නොරන් මුසුකොට වඤ්චා කිරීමය, වී ආදිය මැනීමෙන් වඤ්චා කිරීමය, හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය, උපායෙන් අනුන් රැවටීමය, යකඩ ආදී ලෝහ රන් රිදී යයි අඟවා වඤ්චා කිරීමය, නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයෝගය යන මෙයින් වැළැක්කේය. කැපීමය, මැරීමය, බැඳීමය, සැඟවී සිට වස්තු පැහැර ගැන්ම (මංකොල්ල)ය, නියම්ගම් ආදිය පැහැරීමය, බලාත්කාරකමින් වස්තු පැහැරගැන්මය යන මෙයින් ද වැළැක්කේය. මේ (විරතිය) ද ඔහුගේ සීල සම්පත පිණිස වේ.

29. ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් අනුභව කොට මූලබීජය, ඛන්ධබීජය, එළි (පුරුක්) බීජය, දලු (අග්ග) බීජය, පස්වැනිවූ බීජබීජය යන මේ බීජගාමභූතගාමසමාරම්භයෙහි යෙදී වෙසෙත්. (මෙබඳු වූ බීජගාම භූතගාමයන් සිඳීම් බිඳීම් ආදියෙන් වැළැක්කේ වේ නම්) මෙද ඔහුගේ සීල සම්පත පිණිස වේ.

30. එසේම යම් ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් අනුභව කොට ආහාර වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයෝජන ගැන්මය, පාන වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයෝජන ගැන්මය, නොඇඳට ලද සිවුරු ආදිය එසේ තැන්පත් කොට තැබීමය, යාන සංඛ්‍යාත වහන් තබා එසේ ප්‍රයෝජන ගැන්මය, දෙකකින් වැඩි සයන ලැබ පසුවට තබා ප්‍රයෝජන ගැන්මය, සුගන්ධයන් ලැබ එලෙස තබා ප්‍රයෝජන ගැන්මය තල සහල් ආදී ආමිසයන් තැන්පත් කොට තබා ප්‍රයෝජන ගැන්ම යයි කියන ලද සන්නිධිකාරපරිභොගයෙහි යෙදී වෙසෙත්. මෙබඳුවූ සන්නිධිකාරපරිභොගයෙන් වැළකී වෙසේ නම් මෙද ඔහුගේ සීල සම්පත පිණිස වේ.

31. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූක-දස්සනං[1] අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීදං නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වෙතාලං[2] කුම්භථූනං[3] සොභ-නගරකං[4] චණ්ඩාලං වංසං ධොපනං[5] හත්ථියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං[6] උසභයුද්ධං අජයුද්ධං මෙණ්ඩයුද්ධං[7] කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යොධිකං බලග්ගං සෙනාබ්‍යූහං අනීකදස්සනං[8] — ඉති වා ඉති එවරූපා විසූකදස්සනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලසම්පදාය.

32. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං ජූතප්පමා-දට්ඨානානුයොගං[9] අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීදං[10] අට්ඨපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං[11] බලිකං ඝටිකං සලාකහත්ථං අක්ඛං පඞ්ගචීරං වඞ්කකං[12] මොක්ඛචිකං විඞ්ගුලකං[13] පත්තාළ්හකං[14] රථකං ධනුකං අක්ඛරිකං මනෙසිකං[15] යථාවජ්ජං — ඉති වා ඉති එවරූපා ජූතප්පමාදට්ඨානානුයොගා[16] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලසම්පදාය.

---

1. විසූක° B.
2. වෙතාළං B. S. V.
3. කුම්භත්ථූණං B. S. °ථූණං V.
4. සොභනකරකං W. C. සොභනඝරකං V.
5. ධොවනං S.
6. මහිංසං° B.
7. මෙණ්ඩක° B. P. W.
8. අනික° B.
9. ජූතපමාද° P.
10. සෙය්‍යථිදං B. V. (සබ්බත්ථ)
11. පත්ති° V.
12. වඩ්කං Va.
13. විඞ්ගුලිකං B.V.P.
14. පත්තා° B. V.
15. මානෙ° S; මනො°Sa.
16. ජූතපමාද° P.

31. එසේම යම් ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා, නැටීමය, ගී කීමය, බෙර ආදිය වැයීමය, රඟමඬුලු සැරසීමය, (රාමායනාදි) කථා ඇසීමය, කයිතාලම් හා අත්ලෙන් අත්ල ගැසීමය, මන්ත්‍ර පිරවීමෙන් මළමිනී නැංවීමය, සතරැස් හෝ කළබෙර ගැසීමය, ශෝභනා (ප්‍රතිභාන) චිත්‍ර විචිත්‍රය,[1] සණ්ඩෙවුන් කෙළිය, හුණගස් ඔසවා නැටීමය, මිනීඇට සෝදා තැබීමය, ඇතුන් හා යුද කිරීමය, අසුන් හා යුද කිරීමය, මීවුන් හා යුද කිරීමය, උසභයන් හා යුද කිරීමය, අජයුද්ධය, මෙණ්ඩක යුද්ධය, කුක්කුට යුද්ධය, වට්ටකා යුද්ධය, දණ්ඩ යුද්ධය, තොරතුරු ඇසීමය, මල්ලව යුද්ධය, (සාමාන්‍ය) යුද්ධය, ඇත් අස් ආදීන් ගණන් කිරීමය, සෙනා සන්නිවෙසය, ඇත් අස් ආදීන් දකීමය, යන විපරීත දර්ශනයෙහි යෙදී වසෙත්. මෙසේ මෙබඳුවූ විසුලු දැක්මෙන් වැළකේ නම් මෙද ඔහුගේ සීලසම්පත පිණිස වේ.

32. එසේම යම් ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා (දූ පෝරු ආදියෙහි කෙළීම්වූ) අට්ඨපද ක්‍රීඩාවය, දශපද ක්‍රීඩාවය, දූ පෝරු ආදියෙහි මෙන් ආකාශයෙහි ක්‍රීඩාකිරීමය, බිම මණ්ඩල වශයෙන් සාදා පැන පැන ක්‍රීඩා කිරීමය, දූ කැට නොසොල්වා නියෙන් ගසා ක්‍රීඩා කිරීමය, පසඇටින් දුදු කෙළීමය, සිං කෙළීමය, හිත්ති ආදියෙහි ඉරටම්ටි ගසා ඇත් අස් ආදි රූප දක්වා කෙළීමය, පන්දු කෙළීමය, පත් කුලල් පිඹීමය, ගම් දරුවන් මෙන් ක්‍රීඩා නඟුල් ගෙන සීසෑම් ව්‍යාජයෙන් කෙළීමය, කරනම් ගැසීමය, තල්පත් ආදියෙන් කත්නත්ගුරුවා තනා ක්‍රීඩා කිරීමය, කොළ නැළියෙන් වැලි ආදිය මැන කෙළීමය, කුඩා රථයෙන් කෙළීමය, කුඩා දුන්නෙන් කෙළීමය, අහසෙහි හෝ පිටෙහි හෝ අකුරු ඇඳ කෙළීමය, සිතූ දේ කියවීම් කීම් ආදියෙන් කෙළීමය, (ගොළු බිහිරි ආදීන්ගේ) ඒ ඒ දෘෂ රූප දක්වා කෙළීමය, යන මෙබඳුවූ ප්‍රමාදයට කාරණාවූ දූ කෙළීමෙහි යෙදී වාසය කෙරෙත්. මෙසේ මෙබඳුවූ දූ කෙළියෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලසම්පත පිණිස වේ.

---

1. දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ 15 වෙනි පිටේ අඩොළිපිය බලනු.

33. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං උච්චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති – සෙය්‍යථීදං ආසන්දිං පල්ලඞ්කං ගොනකං[1] චිත්තකං පටිකං පටලිකං තූලිකං[2] විකතිකං උද්දලොමිං එකන්තලොමිං කට්ඨිස්සං[3] කොසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං[4] අස්සත්ථරං[4] රථත්ථරං[4] අජිනප්පවෙණිං කාදලිමිගපවරපච්චත්ථරණං[5] සඋත්තරච්ඡදං උභතොලොහිතකූපධානං— ඉති වා ඉති එවරූපා උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලසම්පදාය.

34. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං මණ්ඩනවිභූසනට්ඨානානුයොගං[6] අනුයුත්තා විහරන්ති-සෙය්‍යථීදං[7] උච්ඡාදනං පරිමද්දනං නහාපනං[8] සම්බාහනං ආදාසං අඤ්ජනං මාලා විලෙපනං[9] මුඛචුණ්ණකං[10] මුඛාලෙපනං[11] හත්ථබන්ධං[12] සිඛාබන්ධං දණ්ඩකං[13] නාලිකං[14] ඛග්ගං[15] ඡත්තං චිත්‍රූපාහනං උණ්හීසං මණිං වාලවීජනිං[16] ඔදාතානි වත්ථානි දීඝදසානි— ඉති වා ඉති එවරූපා මණ්ඩනවිභූසනට්ඨානානුයොගා[6] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලසම්පදාය.

35. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං තිරච්ඡානකථං අනුයුත්තා විහරන්ති—සෙය්‍යථීදං[7] රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං පුරිසකථං [කුමාරකථං කුමාරිකථං][17] සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානකථාය පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලසම්පදාය.

---

1. ගොණකං S. C.
2. තූලිකං B.
3. කට්ථි° B. V. කට්ටි° S.
4. °ත්ථරණං B. V.
5. කදලි° B.P.V. කාදල° W.
6. °විභූ° P. °විභූසණ° W.
7. සෙය්‍යථිදං B. V. (සබ්බත්ථ)
8. න්හාපනං B. V.
9. මාලාගන්ධවි° S. B.
10. මුඛචුණ්ණං S. B. V.
11. මුඛලෙපනං B. V.; °විලෙපං S. මුඛාලෙපං Sa
12. °බද්ධං W.
13. දණ්ඩං B. S. V.
14. නාලිකං W.; තාලකං V.
15. අසිං V; අසිං ඛග්ගං S.
16. වාල° P. W.
17. ඉදං මරම්මපොත්ථකෙසු යෙව දිස්සති

33. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, දික්හගලා පුටුය, පලස්ය, සතරඟුලෙන් දිග ලොම් ඇති ඇතිරිය, විසිතුරු එළු ලොම් ඇති ඇතිරිය, එළු ලොම්මුවා සුදු ඇතිරිය, එළු ලොම්මුවා ඝනපුප් ඇතිරිය, සිංහාදි රූපයෙන් විසිතුරු එළු ලොම් ඇතිරිය, එක් පිට ලොම් ඇති එළු ලොම් ඇතිරිය, දෙපිට ලොම් ඇති එළු ලොම් ඇතිරිය, රත්කසුකම් කොට කැටි තිඟිරි හුයින් කළ පසතුරුණුය, එක්විට තිළියන් සොළොස්දෙනා කෙළනා එළු ලොම් මුවා මහ ඇතිරිය, ඇතුන් පිට අතුරණ ඇතිරිය, අසුන් පිට අතුරණ ඇතිරිය, රථ පිට අතුරණ ඇතිරිය, අඳුන් දිවිසමින් කළ පසතුරුණුය, කදලිමුව සමින් කළ උතුම් පසතුරුණුය, දෙපස තබන ලද රත්කන්වයින් ඇති ආසනය, යන මෙබඳු උස් අසුන් මහ අසුන් පරිභොග කෙරෙත්. මෙසේ මෙබඳු වූ උසසුන් මහ අසුන්හි හිඳීම් ආදියෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලසම්පත පිණිස වේ.[1]

34. එසේම යම් ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා, ඇඟ සුවඳ ඉලීමය, පිරිමැදීමය, නෑවීමය, මැඩීමය, කැඩපත් පරිහරණය, අඳුන් තෙල් පරිහරණය, මල් හා විලවුන්, මුවසුණු, මුඛාලෙප, හස්තාභරණ යන මේ දේ දැරීම හා පැළඳීමය, රන් හු ආදියෙන් සිබා (කුඩුම්බි) බැඳීමය, විසිතුරු දඬු ගෙන හැසිරීමය, බෙහෙත් නළ දසරු වෙහි එල්වාගෙන ඇවිදීමය, කඩු උරෙහි එල්වා ගෙන ඇවිදීමය, ඡත්‍රධාරිව ඇවිදීමය, විසිතුරු වහන් පයලා ඇවිදීමය, නලල්පට බැඳීමය, සිබාමාණික්‍ය පැළඳීමය, වල්විදුනා දැරීමය, දික්වූ දහවලු ඇති සුදුවත් ඇඳීමය යි මෙසේ වූ සැරසීම් හා උතුතැන් පිරවීමෙහි නිතර නිතර යෙදෙත්. මෙබඳු වූ සැරසීම්, අලඞ්කාර කිරීම් ආදියෙහි යෙදීමෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලසම්පත පිණිස වේ.

35. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ—මහ ඇමතියන් පිළිබඳ—සේනා පිළිබඳ—භය පිළිබඳ—යුද පිළිබඳ—ආහාර පිළිබඳ—පාන වර්‍ග පිළිබඳ—වස්ත්‍ර පිළිබඳ—සයන පිළිබඳ—මාලා—ගන්ධ ද්‍රව්‍යයන්—නෑයන්—යානාවන්—ගම්—නියම්ගම්-නුවර-දනව්—ස්ත්‍රීන්—පුරුෂයන්—[කුමරකුමරියන්]—යොධයන්—වීථි—ඝටචෙටිකාවන් හෝ තීර්ථයන්—මළ නෑයන් යන ආදීන් පිළිබඳ කථාය, නොයෙක් ආකාරවූ ව්‍යර්ථ කථාය, ලොකාඛ්‍යායික (විතණ්ඩ) කථාය, මුහුද පිළිබඳ කථාය, භවාභව කථාය යන මෙබඳු තිරිසන් කථාවෙහි යෙදී වෙසෙත්. මෙබඳු වූ තිරච්ඡානකථාවෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලසම්පත පිණිස වේ.

---

1. මෙහි ඇතුළත් දේ ගැන ඇතැම් තොරතුරු දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ බ්‍රහ්මජාල සූත්‍රයෙන් බලා දත යුතුයි.

36. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විග්ගාහිකකථං අනුයුත්තා විහරන්ති— සෙය්‍යථීදං[1] න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි, අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡාපටිපන්නො ත්වමසි අහමස්මි සම්මාපටිපන්නො. සහිතං මෙ අසහිතං තෙ. පුරෙවචනීයං පච්ඡා අවච පච්ඡාවචනීයං පුරෙ අවච. අවිචිණ්ණං[2] තෙ විපරාවත්තං ආරොපිතො තෙ වාදො නිග්ගහීතොසි[3] චර වාදප්පමොක්ඛාය නිබ්බෙඨෙහි වා සචෙ පහොසීති— ඉති වා ඉති එවරූපාය විග්ගාහිකකථාය පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලසම්පදාය.

37. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං දූතෙය්‍ය-පහිණගමනානුයොගමනුයුත්තා විහරන්ති— සෙය්‍යථීදං[1] රඤ්ඤං රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං කුමාරානං: ඉධ ගච්ඡ අමුත්‍රාගච්ඡ ඉදං හර අමුත්‍ර ඉදං ආහරාති— ඉති වා ඉති එවරූපා දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලසම්පදාය.

38. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ කුහකා ච හොන්ති ලපකා ච නෙමිත්තිකා[4] ච නිප්පෙසිකා ච ලාභෙන[5] ලාභං නිජිගිංසිතාරො[6] ච[7]— ඉති[8] වා ඉති එවරූපා කුහනලපනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලසම්පදාය.

---

1. සෙය්‍යථිදං B. V.
2. ආවිණ්ණං W. C.
3. නිග්ගහීතො ත්වමසි B V. නිග්ගහීතොසි P.W.
4. නිමිත්තකා Sa.
5. ලාභෙන ච ලාභං P.S.
6. නිජිගිසිතාරො B.
7. ච ඉති න දිස්සති P.S.W.
8. ඉතිඑවං P. W.

36. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා 'ඔබ මේ ධම්විනය නොදන්නෙහිය, මම මේ ධම්විනය දනිමි.' 'ඔබ මේ ධම්විනය කුමකැයි දන්නෙහි ද? ඔබ වරදවා පිළිපන්නෙහිය, මම මනාකොට පිළිපන්නේ වෙමි.' 'මාගේ වදන් සිලිටුය හෝ අර්ථ සහිතය, ඔබගේ වචනය එසේ නොවෙයි.' 'පළමු කිය යුත්ත පසුව කීයෙහිය, පසුව කිය යුත්ත පළමුව කියෙහිය, යමක් ඔබ බොහෝ කල් පුරුදු කරණ ලද නම් ඒ සියල්ල ව්‍යර්ථ විය. ඔබට වාදාරොපනය කරණ ලදී; නිග්‍රහ කරණ ලද්දෙහිය (වාදයෙන් පැරදුනෙහිය). වාදයෙන් මිදෙනු පිණිස ක්‍රියා කරව. ඉදින් හැක්කෙහි නම් වාදයෙන් ගැලවෙව හෙවත් ඒ නිවේඨනය කරම' යන ආදි විග්‍රාහික හෙවත් දෝෂාරොපණ කථාවෙහි යෙදී වෙසෙත්. මෙසේ මෙබඳු විග්‍රාහික කථාවෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලසම්පත පිණිස වේ.

37. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා රජුන්ගේ, රජමහ ඇමතියන්ගේ, ක්ෂත්‍රියයන්ගේ, බමුණන්ගේ, ගැහැවියන්ගේ සහ කුමරුන්ගේද හසුන් ගෙණ, 'මෙතනින් අසවල් තැනට යා, අසවල් තැනින් මෙහි එව, මෙය ගෙණ යා, එතැනින් අසවල් දෙය ගෙණෙව' යි (ඇණවන ලදුව) දූතභාවයෙහි හා හසුන් ගෙණ යැමෙහි යෙදී වෙසෙත්. මෙබඳු දූත භාවය, හසුන් ගෙණයෑම යන මෙයින් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලසම්පත පිණිස වේ.

38. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා කුහකයෝ ද, සිව්පසය උදෙසා කථා කරන්නෝ ද, නිමිතිකරන්නෝ නොහොත් ලාභ සත්කාර සඳහන් කරවන්නෝ ද, පරලාභාදිය උදෙසා කියන්නෝ ද,[1] ලාභයකින් ලාභයක් සොයන්නෝ ද වෙත්. මෙබඳු වූ කුහනලපනාදියෙන් වැළැක්කේ වේ නම් මෙද ඔහුගේ සීලසම්පත පිණිස වේ.

---

1. දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ 21 වෙනි පිටේ 1 වෙනි අධොලිපිය බලනු.

39. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති: සෙය්‍යථීදං[2] අඞ්ගං නිමිත්තං උප්පාදං[3] සුපිණං[4] ලක්ඛණං මූසිකච්ඡින්නං[14] අග්ගිහොමං දබ්බිහොමං ථුසහොමං කණහොමං තණ්ඩුලහොමං සප්පිහොමං තෙලහොමං මුඛහොමං ලොහිතහොමං අඞ්ගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා[5] සිවවිජ්ජා භූතවිජ්ජා භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා විච්ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං[6] සරපරිත්තානං මිගචක්කං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලසම්පදාය.

40. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති සෙය්‍යථීදං[2] මණිලක්ඛණං වත්ථලක්ඛණං දණ්ඩලක්ඛණං[7] අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං[8] ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරිලක්ඛණං දාසලක්ඛණං දාසිලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං[9] උසභලක්ඛණං ගොලක්ඛණං[10] අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං[11] කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං ගොධාලක්ඛණං කණ්ණිකාලක්ඛණං[12] කච්ඡපලක්ඛණං මිගලක්ඛණං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා[13] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලසම්පදාය.

41. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති සෙය්‍යථීදං[2] රඤ්ඤං නිය්‍යානං භවිස්සති රඤ්ඤං අනිය්‍යානං භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං ජයො භවිස්සති බාහිරානං රඤ්ඤං[15] පරාජයො භවිස්සති. බාහිරානං රඤ්ඤං ජයො භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං පරාජයො භවිස්සති. ඉති ඉමස්ස ජයො භවිස්සති ඉමස්ස පරාජයො භවිස්සති— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලසම්පදාය.

---

1. ජීවිතං B. V.
2. සෙය්‍යථිදං B. V.
3. උප්පාතං B. °පාටං S.
4. සුපිනං B. P. සුපිණකං C.
5. ඛෙත්ත° B. S. V.
6. පක්ඛ° W. C.
7. සත්ථලක්ඛණං B. V.; දණ්ඩ° වත්ථු° P. W.
8. ආයුධ° B. P.
9. මහිංස° B.
10. ගොණ° B.
11. මෙණ්ඩක° V. W.
12. කණ්ණික° B. S.
13. මිච්ඡාජීවා ඉති න දිස්සති P.
14. මූසිකා° P. W.
15. රඤ්ඤං ඉති න දිස්සති B. V.

39. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, අඞ්ග (සමුද්‍රිකා) ශාස්ත්‍රය, නිමිති ශාස්ත්‍රය, (අසනිපාතාදි මහ නිමිති බලා කියන) උත්පාද ශාස්ත්‍රය, ස්වප්න ශාස්ත්‍රය, ලක්‍ෂණ ශාස්ත්‍රය, (මීයන් කෑ වස්ත්‍රාදිය බලා කියන) මූසික ශාස්ත්‍රය, අග්නිහෝමය, දබ්බිහෝමය, ථුස හෝමය, තණ්ඩුල—කණ—සප්පි—තෙල—මුඛ—ලොහිත හෝමය, අඞ්ග විද්‍යා, වාස්තු විද්‍යා, නීති ශාස්ත්‍රය, සොහොණෙහි ශාන්ති කරන්නාවූ විද්‍යාව හෝ සිවල් රුත විද්‍යා, භූත විද්‍යා, අහි විද්‍යා, විෂ විද්‍යා, විච්ඡික විද්‍යා, මූසික විද්‍යා සකුණ විද්‍යා, වායස විද්‍යා, ජීවන කාලය කීම වූ පක්කජ්ඣානය, ශරපරිත්‍රාණය (ආයුධ වැළැක්ම), තිරිසන් සතුන්ගේ ශබ්ද දැනීම වශයෙන් පැවති මන්ත්‍රය යන තිරශ්චින විද්‍යා[1] හෙතුකොට ගෙන මිථ්‍යාජීවයෙන් ජීවිකා කෙරෙත්. මෙසේ මෙබඳු තිරශ්චීනවිද්‍යා හෙතුවෙන් කරණ ලාමකජීවිකාවෙන් වැළැක්කේ වේද මෙද ඔහුගේ සීලසම්පත පිණිස වේ.

40. එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, මණි ලක්‍ෂණය, වස්ත්‍ර ලක්‍ෂණය, දණ්ඩ—බන්ධ—දුනු—ආයුධ—ඉත්ථි—පුරිස—කුමාර—කුමාරි—දාස—දාසි—හත්ථි—අස්ස—මහිස—උසභ—ගො—අජ—මෙණ්ඩ—කුක්කුට—වට්ටක—ගොධා—කණ්ණිකා—කච්ඡප—මිග ලක්‍ෂණය යන මෙබඳු තිරච්ඡාන විද්‍යාවන්[1] කරණකොට ගෙණ වැරදි ජීවිකාව කෙරෙත්. මෙසේ වූ තිරශ්චීන විද්‍යාවන් නිසා කරණ වැරදි ජීවිකාවෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලසම්පත පිණිස වේ.

41. එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා අසවල් දින රජුන්ගේ බැහැර යෑම වන්නේය, අසවල් දින රජුන්ගේ ඇතුළු නුවරට යෑම වන්නේය. අසවල් දින ඇතුළුනුවර රජුන්ගේ ආක්‍රමණය වන්නේය, බැහැර රජුන්ගේ බැහැරට යෑම වන්නේය. බැහැර රජුන්ගේ ඇතුළු නුවරට එම වන්නේය. ඇතුළුනුවර රජුන්ගේ ආපසු යෑම වන්නේය. ඇතුළුනුවර රජුන්ට ජය වන්නේය. බැහැර රජුන්ට පරාජය වන්නේය. බැහැර රජුන්ට ජය වන්නේය. ඇතුළුනුවර රජුන්ට පරාජය වන්නේය. මෙසේ මොහුට ජය වන්නේය, මෙසේ පරාජය වන්නේ යයි කියා මෙසේ තිරශ්චීනවිද්‍යා හෙතුකොට ලාමක ජීවිකා කෙරෙත්. මෙබඳු වූ තිරච්ඡාන විජ්ජා හෙතුවෙන් කරණ මිච්ඡාජීවයෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලසම්පත පිණිස වේ.

---

1. දීඝනිකායේ පළමුවෙනි කාණ්ඩයේ 21 වෙනි පිට බලනු.

42. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති— සෙය්‍යථීදං[2] චන්දග්ගාහො භවිස්සති සුරියග්ගාහො[3] භවිස්සති නක්ඛත්තග්ගාහො භවිස්සති. චන්දිමසුරියානං[3] පථගමනං භවිස්සති චන්දිමසුරියානං[3] උප්පථගමනං භවිස්සති. නක්ඛත්තානං පථගමනං භවිස්සති නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති. උක්කාපාතො භවිස්සති. දිසාඩාහො[4] භවිස්සති. භූමිචාලො භවිස්සති. දෙවදුන්දුභි[5] භවිස්සති. චන්දිමසුරියනක්ඛත්තානං[3] උග්ගමනං ඔගමනං[6] සඞ්කිලෙසං වොදානං භවිස්සති. එවංවිපාකො චන්දග්ගාහො භවිස්සති. එවංවිපාකො සුරියග්ගාහො[3] භවිස්සති. එවංවිපාකො නක්ඛත්තග්ගාහො භවිස්සති. එවංවිපාකං[7] චන්දිමසුරියානං[3] පථගමනං භවිස්සති. එවංවිපාකං[7] චන්දිමසුරියානං[3] උප්පථගමනං භවිස්සති. එවංවිපාකං[7] නක්ඛත්තානං පථගමනං භවිස්සති. එවංවිපාකං[7] නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති. එවංවිපාකො උක්කාපාතො භවිස්සති. එවංවිපාකො දිසාඩාහො[4] භවිස්සති. එවංවිපාකො භූමිචාලො භවිස්සති. එවංවිපාකො දෙවදුන්දුභි[5] භවිස්සති. එවංවිපාකං චන්දිමසුරියනක්ඛත්තානං[3] උග්ගමනං ඔගමනං[6] සඞ්කිලෙසං වොදානං භවිස්සති—ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලසම්පදාය.

43. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති— සෙය්‍යථීදං[2] සුබ්බුට්ඨිකා[8] භවිස්සති දුබ්බුට්ඨිකා[9] භවිස්සති. සුභික්ඛං භවිස්සති දුබ්භික්ඛං භවිස්සති. ඛෙමං භවිස්සති භයං භවිස්සති. රොගො භවිස්සති ආරොග්‍යං භවිස්සති. මුද්දා ගණනා[10] සංඛානං කාවෙය්‍යං ලොකායතං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලසම්පදාය.

---

1. ජීවිතං B. V.
2. සෙය්‍යථිද° B. V.
3. °සූරි° B.
4. °දාහො W.
5. °දුද්‍රභි B. V.
6. ඔග්ගමනං B. S. V.
7. °විපාකො P.
8. සුවු° V.; සුවුඨිකා B.
9. දුබ්බුට්ඨිකං B.
10. ගණනං B.

42. එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා: චන්ද්‍රග්‍රහණය වන්නේය, සූය්‍ය්‍ය්‍යග්‍රහණය—තාරකා සමාගමය—සඳහිරු දෙදෙනාගේ නියම මාර්‍ගගමන—සඳහිරු දෙදෙනාගේ අමාර්‍ගගමන—තාරකාවන්ගේ මාර්‍ගගමන—තාරකාවන්ගේ අමාර්‍ගගමන වන්නේය, උල්කාපාතය වන්නේය, දිසා දැවීම—පොළොව කම්පාව—අහස ගිගුරුම—සඳ, හිරු, තාරකා යන මොවුන්ගේ නැගීම හා අස්තයට යෑම ද කෙලෙසීම ද පිරිසිදු වීම ද වන්නේය. චන්ද්‍රග්‍රහණය මෙබඳු විපාක ඇතිවන්නේය, සූය්‍ය්‍ය්‍යග්‍රහණය—තාරකා සමාගමය— චන්ද්‍රසූය්‍ය්‍යයන්ගේ මාර්‍ගයෙහි ගමන— ඔවුන්ගේ නොමග ගමන— තාරකාවන්ගේ මාර්‍ගයෙහි ගමන— තාරකාවන්ගේ නොමග ගමන — උල්කාපාතය — දිගුන් දැවීම — භූමිචලනය — අහස් ගිගුරුම — සඳ, හිරු, තාරකාවන්ගේ නැගීම, බැසීම, කිලිටිවීම හා පිරිසිදුවීම මෙබඳු විපාක ඇති වන්නේයයි කියා මෙසේ තිරච්ඡානවිජ්ජා හෙතුවෙන් කරණ මිථ්‍යාජීවිකාවෙන් ජීවිකා කෙරෙත්. මෙසේ වූ තිරශ්චීනවිද්‍යා හෙතුකොටගෙණ කරණ ලාමක ජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඔහුගේ සීලසම්පත පිණිස වේ.

43. එසේම ඇතැම් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා: මනා වැසි ඇතිවන්නේය, නපුරු වැසි—යහපත් භික්‍ෂා—දුර්භික්‍ෂා—නිර්භය—භය—රෝග—නීරෝගීබව ඇතිවන්නේයයි කීමද, ඇඟිල්ල ඇල්ලීමය, ගිණීමය, පුඩුගණනය, කාව්‍ය කිරීමය, විතණ්ඩ ශාස්ත්‍ර ඉගෙණීම යයි මෙසේ තිරශ්චීන විද්‍යාවන් කරණකොට මිථ්‍යා ජීවිකා කෙරෙත්. මෙසේවූ තිරශ්චීන විද්‍යා හෙතුවෙන් වන මිථ්‍යා ජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඔහුගේ සීලසම්පත පිණිස වේ.

44. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡාන-විජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති — සෙය්‍යථීදං[2]: ආවාහනං[3] විවාහනං[3] සංවදනං[4] විවදනං සංකිරණං විකිරණං සුභගකරණං[5] දුබ්භගකරණං[6] විරුද්ධගබ්භකරණං ජිව්හානිබන්ධනං[7] හනුසංහනනං හත්ථාභිජප්පනං[8] කණ්ණජප්පනං ආදාසපඤ්හං කුමාරිපඤ්හං[9] දෙවපඤ්හං ආදිච්චුපට්ඨානං මහතුපට්ඨානං අබ්භුජ්ජලනං සිරිව්හායනං[10] —ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලසම්පදාය.

45. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡාන-විජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති — සෙය්‍යථීදං: සන්තිකම්මං පණිධිකම්මං භූතකම්මං[11] භූරිකම්මං වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකිරණං[12] ආචමනං නහාපනං[13] ජුහනං[14] වමනං විරෙචනං උද්ධවිරෙචනං[15] අධොවිරෙචනං සීසවිරෙචනං කණ්ණතෙලං නෙත්තතප්පණං[16] නත්ථුකම්මං අඤ්ජනං පච්චඤ්ජනං[17] සාලාකියං සල්ලකත්තියං[18] දාරක-තිකිච්ඡා[19] මූලභෙසජ්ජානං අනුප්පදානං[20] ඔසධීනං පටි-මොක්ඛො[21] — ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලසම්පදාය.

---

1. ජීවිතං B. V.
2. සෙය්‍යථිද° B.V.
3. °හණං C.
4. °රණං B.V.; රතං S.
5. සුභාගක° B.
6. දුබ්භාග°B.
7. °නිබන්ධනං B. V. S.
8. හත්ථා° හනුජප්පනං කණ්ණ° B. V.
9. කුමාරික° V. C.
10. සිරව්හායනං P. W.
11. භූරි° (භූතිකම්මං) P.
12. වත්ථුබලිකම්මං V., °වත්ථුපරිකම්මං B. °පවිකිර° P.
13. න්හාපනං B. V.
14. දූහනං Sa. ජූහණං C.
15. උද්ධං වි° B. V.
16. නෙත්තපානං B; නෙත්තප්පානං S.; නෙත්තතප්පනං Sa. C.
17. සච්ච° V.
18. °තිකං P. V. W.
19. °තිකිච්ඡං S.
20. අනුප්පදනං B. S.
21. පති° B. V.

44. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා, ආවාහ කරවීමය, විවාහ කරවීමය, සමඟිය පිළිබඳ කථා කිරීමය, වියෝගය පිළිබඳ කථා කිරීමය, ධන රැස්කිරීමය, වියදම් කිරීමය, සුභග කරණය (යහපත් ශ්‍රී කිරීමය), දුර්භගකරණය, ගර්භවිරොධී කරණය, දිව තද කිරීමය, හනු බැඳීමය, අත් පෙරළීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, ශබ්ද නොඇසීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, කැඩපත්හි දෙවතාරොපණය කොට පැණ පිළිවිසීමය, කුමරියගේ සිරුරෙහි දෙවතාරොපණය කොට පැණ පිළිවිසීමය, දෙවදාසියගේ සිරුරෙහි යකුන් අරොපණය කොට පැණ පිළිවිසීමය, හිරු වැඳීමය, මහබඹුට උවටැන් හෝ නැමදුම් කිරීමය, මුවින් ගිනි දැල් පිට කිරීමය, ශ්‍රී දෙවිය කැඳවීම යයි කියන මෙබඳු තිරශ්චීන විද්‍යාවෙන් මිථ්‍යාජීවිකා කෙරෙත්. මෙබඳුවූ තිරච්ඡාන විජ්ජාවෙන් කරණ මිථ්‍යාජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඔහුගේ සීලසම්පන්න පිණිස වේ.

45. එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා ශාන්ති ප්‍රතිඥාත කර්මය,[1] කායශී සමාධියෙන් පසු කළයුතු ප්‍රණිධිකර්මය, මන්ත්‍ර ප්‍රයොග කිරීමය, භූරිකර්මය, පණ්ඩකයා පුරුෂයකු කිරීමය, පුරුෂයා පණ්ඩකයකු කිරීමය, ගෙවල් නොකළ බිම ගෙවල් කිරීමය, ගෙට සුදුසු තැන බලිකම් විධානය, දියෙන් මුව සුද්ධ කිරීමය, නැහැවීමය, ගිනි පිදීමය, වමන කරවීමය, විරෙක කරවීමය, ඌර්ධ්ව විරෙකය, අධොවිරෙකය, සිරොවිරෙකය, කන් තෙලය, නෙත්‍රතර්පණය, නස්‍ය කිරීමය, ක්ෂාරවූ අඳුන් තැනීමය, සිසිල් බෙහෙත් අඳුන් සෑදීමය, සැත් කටු ලා කටයුතු වෙදකර්මය, ශල්‍යකර්මය, ළදරුවන් පිළිබඳ වෙදකර්මය, මූලික බෙහෙත් දීමය (බෙහෙත් ද්‍රව්‍යයෙන් කටයුතු ශරීර චිකිත්සාය), සැර බෙහෙත් දී පසුව එහි බල හැරීමය යන මෙබඳු තිරශ්චීන විද්‍යා කරණකොට හෝ මිථ්‍යාජීවයෙන් ජීවිකා කෙරෙත්. මෙබඳුවූ මිථ්‍යාජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඔහුගේ සීලසම්පන්න පිණිස වේ.

---

1. මෙ ආදියෙහි විස්තර දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ බ්‍රහ්මජාල සූත්‍රයෙන් බලා දත යුතුයි.

46. අථ[1] ඛො සො කස්සප භික්ඛු එවංසීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සෙය්‍යථාපි ආවුසො ඛත්තියො මුද්ධාභිසිත්තො[2] නිහතපච්චාමිත්තො න කුතොචි භයං සමනුපස්සති යදිදං පච්චත්ථිකතො එවමෙව ඛො කස්සප භික්ඛු එවංසීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති. එවං ඛො කස්සප භික්ඛු සීලසම්පන්නො හොති. අයං ඛො සා කස්සප සීලසම්පදා.

47. කථඤ්ච කස්සප භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති? ඉධ කස්සප භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී[3]. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාසවෙය්‍යුං[4] තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා—පෙ—ඝාණෙන ගන්ධං ඝායිත්වා—පෙ—ජිව්හාය රසං සායිත්වා—පෙ—කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා—පෙ—මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී[3]. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාසවෙය්‍යුං[4] තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති මනින්ද්‍රියං මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං[5] පටිසංවෙදෙති. එවං ඛො කස්සප භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති.

---

1. ස ඛො P. S. W.
2. මුද්ධාව° P. C.
3. නානුව්‍ය° P. W.
4. අන්වාස්ස° P. W.
5. අව්‍යා° P. W.

46. කාශ්‍යපය, මෙසේ සීලසම්පන්නවූ මහණහට (අසංවරය මුල්කොට උපදනාවූ) භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ඔහුගේ සීලසංවරය හෙතුකොටගෙණ කිසිතැනකදී නොඋපදනේය. කුමක් මෙන්ද යත්:— කාශ්‍යපය, ක්‍ෂත්‍රියාභිෂෙකයෙන් මුදුනෙහි අභිෂෙක ලද්දාවූ, නැසූ පසමිතුරන් ඇති, ක්‍ෂත්‍රිය රජෙක් කිසියම් සතුරෙකුගෙන් කිසි භයක් නොදක් නේද, එපරිද්දෙන්ම කාශ්‍යපය, සීලසම්පන්නවූ මහණ තෙමේ (අසංවර හෙතුවෙන් උපදනාවූ) භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු සීලසංවරය හෙතුකොට කිසි තැනකදී නොදක්නේය (ඔහුට කිසිවකින් බියක් නැත). ආර්‍ය්‍යවූ (ශ්‍රෙෂ්ඨවූ) මේ සීල රාශියෙන් යුක්තවූ ඒ මහණ තෙමේ, ස්වසන්තානයෙහි පිරිසිදුවූ (කායික චෛතසික) සැපය විඳියි. කාශ්‍යපය, මෙසේ දක්වූ (ත්‍රිවිධ) ශීලයෙන් යුක්තවූ මහණ තෙමේ සීලසම්පන්න නම් වේ. කාශ්‍යපය, මේ වනාහි සීල සම්පත්තිය නම් වේ.

47. කාශ්‍යපය, මහණ තෙමේ කෙසේ නම් ඉන්ද්‍රියයන්හි වැසූ දොරටු ඇත්තේ ද? කාශ්‍යපය, මේ සස්නෙහි (මනාසේ පිළිපන්) මහණ තෙමේ, ඇසින් රූපයක් දැක නිමිත්තග්‍රාහී නොවේ (එහි නොඇලේ). අනුව්‍යඤ්ජන වශයෙන් නොගන්නේ එහි විස්තර සෙවීමට නොපෙළඹේ. චක්ඛුන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට යමක් හෙතුකොටගෙණ අභිජ්ඣාදෞමනස්සාදි (දූෂි ආසාව හා කලකිරීමාදි) ලාමක වූ අකුශල ධර්මයෝ වහනය වන්නාහු ද (ස්වසන්තානයට ඇතුල් වන්නහු ද), එබඳු දෙයින් වැලකීම පිණිස හෙතෙම පිළිපදී. හෙතෙම තමාගේ චක්ඛුන්ද්‍රිය රකී, චක්ඛුන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කනින් ශබ්දයක් අසා— [ඇස පිළිබඳ කී නයින් දත යුතුයි]—නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණයකොට —පෙ— දිවෙන් රසයක් විඳ —පෙ— කයින් ස්පර්ශකටයුත්තක් ස්පර්ශකොට —පෙ— සිතින් ධර්මයක් (කරුණක්) දැන එහි නිමිති නොගන්නේය (එහි නොඇලෙන්නේය), අනුව්‍යඤ්ජන වශයෙන් නොගන්නේය (එහි නොපෙළඹෙන්නේය). මනෙන්ද්‍රියයෙහි (සිතෙහි) අසංවරව වසන්නහුට යමක් නිසා අභිජ්ඣා දෞමනස්සාදි ලාමක අකුශල ධර්මයෝ වහනය වෙත් ද (ස්වකීය සන්තානයට වදිත් ද), එබඳු දෙයින් වැලකීම පිණිස හෙතෙම පිළිපදී. හෙතෙම මනෙන්ද්‍රිය රකී, මනෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. එබඳුවූ මහණ තෙමේ ආර්‍ය්‍ය වූ (උතුම් වූ) ශීල රාශියෙන් යුක්ත වූයේ, අභ්‍යන්තරයෙහි පිරිසිදුවූ (අසම්මිශ්‍ර වූ) අව්‍යාසේක සුඛය විඳියි. කාශ්‍යපය, මෙසේ වූ මහණ තෙමේ ඉන්ද්‍රියයන්හි වසන ලද දොරටු ඇත්තේ වේ.

48. කථඤ්ච කස්සප භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති?

ඉධ කස්සප භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති සම්මිඤ්ජිතෙ[1] පසාරිතෙ සම්පජානකාරී හොති සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති. උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති. ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති. එවං ඛො කස්සප භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති.

49. කථඤ්ච කස්සප භික්ඛු සන්තුට්ඨො හොති?

ඉධ කස්සප භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන චීවරෙන කුච්ඡිපරිහාරිකෙන[2] පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. සෙය්‍යථාපි කස්සප පක්ඛී සකුණො යෙන යෙනෙව ඩෙති සපත්තභාරොව ඩෙති. එවමෙව ඛො[3] කස්සප භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන[2] චීවරෙන කුච්ඡිපරිහාරිකෙන[2] පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. එවං ඛො කස්සප භික්ඛු සන්තුට්ඨො හොති.

---

1. සමිඤ්ජිතෙ B. V.   2. °පරිහාරියෙන V.

3. ඛො ඉති න දිස්සති P.

48. **කාශ්‍යපය,** මහණ තෙමේ කෙසේ නම් සතිසම්පජඤ්ඤයෙන් (සිහියෙන් හා මනා ප්‍රඥාවෙන්) යුක්ත වූයේ වේද?

කාශ්‍යපය, මේ සස්නෙහි (මනාව පිළිපන්) මහණ තෙම ඉදිරියට යෑමෙහි ද, ආපසු යෑමෙහි ද, යහපත් වූ නුවණින් දැන ඒ ක්‍රියා කරන්නේය. ඉදිරි බැලීමෙහි ද, අනුදික් (වටපිට) බැලීමෙහි ද, නුවණින් දැන බලන්නේය. අත් පා හැකිලීමෙහි ද දිගු කිරීමෙහි ද මනා නුවණින් දැන එසේ කරන්නේය. සඟලය, පාත්‍රය, සිවුරුය යන මේ දේ දැරීමෙහිදී මනා නුවණින් දැන ඒ ඒ දැරීම් ආදිය කරන්නේය. අනුභව කිරීමය, පානය කිරීමය, කෑමය, රස විඳීමය යන මෙහි ද මනා නුවණින් යෙදී (දැන) ඒ ඒ අනුභව කිරීමාදිය කරන්නේය. මල මූත්‍ර පහකිරීම් ද නුවණින් (ආදීනව) සලකා කරන්නේය. යෑම්, සිටීම්, හිඳීම්, සැතපීම්, නිදි තොරකිරීම්, කථාකිරීම්, නිශ්ශබ්ද ව සිටීම් යන මේ දේ මනා නුවණින් දැන කරන්නේය. **කාශ්‍යපය,** මෙසේ කරන්නාවූ මහණ තෙමේ සිහියෙන් යුක්තවූයේ යහපත් නුවණින් යුක්ත වූයේ වෙයි. (මෙකී සියලු ඉරියව් පිළිබඳව ආදීනව හා ආනිසංසයන් ද, ශරීරය පිළිබඳ අනිත්‍යතාදි ස්වභාවයන්ද නුවණින් සලකා ඒ ඒ කෘත්‍යයන්හි යෙදේ යි සේයි.)

49. **කාශ්‍යපය,** මහණතෙමේ කෙසේ නම් ප්‍රත්‍යයන් පිළිබඳ යථාලාභසන්තොෂයෙන් සතුටු වූයේ වේද?

කාශ්‍යපය, මේ සස්නෙහි (මනාව පිළිපන්) මහණතෙමේ කායපරිහරණයට ප්‍රමාණවූ (යත්තම් කය වැසීමට තරම්වූ) සිවුරෙන් ද කුසපරිහරණයට ප්‍රමාණවූ පිණ්ඩපාත භොජනයෙන් ද සතුටු වූ සිත් ඇත්තේ වේ. ඒ මහණතෙමේ යම් යම් තැනකට යේ නම් අටපිරිකර (කය පිළිබඳ වූ දේ) පමණක් රැගෙණ යේ. ඇවැත්නි, යම් සේ පියාපත් ඇති පක්ෂියෙක් යම් යම් තැනෙක පියාඹා යේ නම් ඒ සියලු තැන පියාපත් බර පමණකින් යුක්තව පියාඹා යේ ද, **කාශ්‍යපය,** එපරිද්දෙන්ම භික්ෂු තෙමේ ද කාය පරිහරණයට ප්‍රමාණවූ සිවුරෙන් ද කුච්ඡි පරිහරණයට ප්‍රමාණවූ පිණ්ඩපාත භොජනයෙන් ද සතුටු වන්නේ වේ. ඒ මහණ තෙමේ යම් යම් තැනක යේ නම් කායපටිබද්ධවූ අටපිරිකර පමණක් රැගෙණ බැහැර යේ. **කාශ්‍යපය,** මෙසේ වූ මහණ තෙමේ (යම්තම් ලත් දෙයින්) ඉතරීතරස න්තොෂයෙන් යුක්තවේ.

50. සො ඉමිනා ච[1] අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං[2] වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

51. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. බ්‍යාපාදපදොසං[3] පහාය අබ්‍යාපන්නචිත්තො[4] විහරති සබ්බපාණභූතහිතානුකම්පී බ්‍යාපාදපදොසා[3] චිත්තං පරිසොධෙති. ථීනමිද්ධං[5] පහාය විගතථීනමිද්ධො[5] විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො ථීනමිද්ධා චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

52. සෙය්‍යථාපි කස්සප පුරිසො ඉණං[6] ආදාය කම්මන්තෙ පයොජෙය්‍ය තස්ස තෙ කම්මන්තා සමිජ්ඣෙය්‍යුං. සො යානි ච පොරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තීකරෙය්‍ය[7]. සියා චස්ස[8] උත්තරිං අවසිට්ඨං දාරභරණාය[9]. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ ඉණං ආදාය කම්මන්තෙ පයොජෙසිං[10] තස්ස මෙ තෙ කම්මන්තා සමිජ්ඣිංසු. සොහං යානි ච පොරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තිඅකාසිං.[11] අත්ථි ච මෙ උත්තරිං අවසිට්ඨං දාරභරණායාති[9]. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං[12] අධිගච්ඡෙය්‍ය[13] සොමනස්සං.

---

1. චකාරො නත්ථි W.
2. සුසාණං C.
3. ව්‍යා° P. W.
4. අව්‍යා° P. W.
5. ථින° B.
6. ඉනං C.
7. ව්‍යන්තිං° P.C. °ව්‍යන්ති W. බ්‍යන්තිං B.
8. තස්ස Sa.
9. දුරා° P. W.
10. පයොජෙමි B.
11. ව්‍යන්තිං අ° B. ව්‍යන්ති° P. W.
12. පාමුජ්ජං P. W. C.
13. අධිගච්ඡෙ C. P.

50. ආර්‍යවූ මෙවත් උතුම්වූ මේ සීලසමූහයෙන් යුක්තවූ ද, උතුම්වූ මේ ඉන්ද්‍රියසංවරයෙන් යුක්තවූ ද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවූ ද, මේ උතුම් ඉතරීතර-සන්තොෂයෙන් යුක්තවූ ද, ඒ (යොගාවචර) මහණ තෙමේ (මනුෂ්‍ය වාසයෙන් දුනු පන්සියයකින් ඔබ්බෙහි වූ) අරණ්‍යය ද, (ජනයාගෙන් තොරවූ) වෘක්‍ෂමූලය ද, පර්‍වත පෙදෙස් ද, කඳුරැලි ගිරිගුහාවන් හෝ මහා උමගද, සොහොන් ද, ඉතා දුරවූ වනසෙනසුන් ද, අභ්‍යාවකාශ (බොහෝ ඉඩකඩ ඇති) තැන් සහ පිදුරු ගුහා ද යන මේ (ජනයාගෙන් හිස්වූ) සෙනසුන් ඇසුරු කෙරෙයි. ඒ මහණ තෙමේ පසුබත්කාලයෙහි පිණ්ඩපාත භොජනයෙන් වැළැක්කේ, පර්‍ය්‍යඞ්කය බැඳ, උඩුකය ඇද නොවන සේ තබා, නිවණෙහිම සිත එලවා, ඒ නිවණම අරමුණු වසයෙන් සිත ඉදිරියෙහි පිහිටුවා ගෙණ හිඳී.

51. ඒ මහණ තෙමේ ලොකයෙහි (පඤ්චුපාදනස්කන්ධයන්හි) අභිධ්‍යාව (ලොභය) පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේ. ඒ අභිධ්‍යාවෙන් සිත (වෙන්කොට) පිරිසිදු කෙරේ. සිත කෙලසන්නාවූ ක්‍රොධය පහකොට, ක්‍රොධයෙන් දූෂිතවූ සිත් නැත්තේ, ප්‍රාණීවූ සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේව වෙසේ. ව්‍යාපාද දූෂණයෙන් සිත (වෙන් කොට) පිරිසිදු කෙරේ. කායචිත්ත දෙදෙනාගේ අලසබව යයි කියන ලද ථීනමිද්ධය දුරුකොට කය—සිත පිළිබඳ පහ වූ අලසබැව් ඇත්තේ, ආලොකසංඥ (පිරිසිදු හැඟීම්) ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥ ඇත්තෙක්ව වෙසේ. ථීනමිද්ධනීවරණයෙන් සිත පිරිසිදු කෙරේ. උඩඟුබව හා කුකුස (උද්ධච්චකුක්කුච්චය) දුරුකොට, සංසිඳුනු සිත් ඇතිව (අනුද්ධතව) වාසය කෙරේ. අධ්‍යාත්මයෙහි (ඇතුළත) සංසිඳුනු සිත් ඇත්තේ, උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසිදු කෙරේ. (බුද්ධාදි අටතැන්හි සැකකිරීම ලකුණුකොට ඇති) විචිකිච්ඡාව දුරුකොට, එතර කළ (පහකළ) විචිකිච්ඡා ඇත්තේ කුශලධර්ම විෂයෙහි 'ඒ කෙසේ ද මේ කෙබඳුද්ද'යි යන සැක නැතිව වෙසේ, විචිකිච්ඡායෙන් සිත පිරිසිදු කෙරේ.

52. **කාශ්‍යපය**, යම්සේ පුරුෂයෙක් ණය ගෙණ කර්මාන්ත-යන්හි යොදන්නේ ද, ඔහුගේ ඒ කර්මාන්තයෝ දියුණු වන්නාහු නම් ඔහුගේ ඒ පරණ ණය මුදල් සියල්ලම ගෙවන්නේය. ඔහුගේ අඹුදරුවන් පුස්නා පිණිස වැඩි යමක් ඉතුරු වූයේ නම් ඔහට මෙබඳු අදහසක් වන්නේය. [කෙසේද යත්:] 'මම වනාහි පළමුවෙන් ණය ගෙණ කර්මාන්තයන්හි යෙදුවෙමි. ඒ මාගේ කර්මාන්තයෝ සමෘද්ධවූහ. ඒ මම පැරණි ණය ගෙවූයෙමි. අඹුදරුවන් පොෂ්‍යකිරීම පිණිස අතිරේක මුදලක් ද මට ඇත්තේය' කියායි. හෙතෙම ඒ ණය නැති බව මුල්කොට ගෙණ බලවත් සතුටක් ලබන්නේය, සොම්නසට ද පැමිණෙන්නේය.

53. සෙය්‍යථාපි කස්සප පුරිසො ආබාධිකො අස්ස දුක්ඛිතො බාළ්හගිලානො භත්තං චස්ස නච්ඡාදෙය්‍ය[1] න චස්ස කායෙ බලමත්තා. සො අපරෙන සමයෙන තම්හා ආබාධා මුච්චෙය්‍ය භත්තඤ්චස්ස ඡාදෙය්‍ය සියා චස්ස කායෙ බලමත්තා. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ ආබාධිකො අහොසිං දුක්ඛිතො බාළ්හගිලානො භත්තං ච මෙ නච්ඡාදෙසි න චස්ස[2] මෙ ආසි කායෙ බලමත්තා. සොම්හි එතරහි තම්හා ආබාධා මුත්තො භත්තඤ්ච මෙ ඡාදෙති අත්ථි ච මෙ[3] කායෙ බලමත්තාති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය[4] සොමනස්සං.

54. සෙය්‍යථාපි කස්සප පුරිසො බන්ධනාගාරෙ බද්ධො අස්ස. සො අපරෙන සමයෙන තම්හා බන්ධනාගාරා[5] මුච්චෙය්‍ය සොත්ථිනා අබ්බයෙන[6]. න චස්ස කිඤ්චි භොගානං වයො. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ බන්ධනාගාරෙ බද්ධො අහොසිං. සොම්හි එතරහි තම්හා බන්ධනාගාරා[5] මුත්තො සොත්ථිනා අබ්බයෙන[6]. නත්ථි ච මෙ කිඤ්චි භොගානං වයොති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය[4] සොමනස්සං.

55. සෙය්‍යථාපි කස්සප පුරිසො දාසො අස්ස අනත්තාධීනො[7] පරාධීනො[7] න යෙනකාමඞ්ගමො. සො අපරෙන සමයෙන තම්හා දාසබ්‍යා[8] මුච්චෙය්‍ය අත්තාධීනො[7] අපරාධීනො භුජිස්සො යෙනකාමඞ්ගමො. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ දාසො අහොසිං අනත්තාධීනො[7] පරාධීනො[7] න යෙනකාමඞ්ගමො. සොම්හි එතරහි තම්හා දාසබ්‍යා[8] මුත්තො අත්තාධීනො[7] අපරාධීනො[7] භුජිස්සො යෙනකාමඞ්ගමොති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය[4] සොමනස්සං.

---

1. නජ්ජාදෙය්‍ය S.
2. න ච මෙ P. W.
3. අත්ථි ච කායෙ P.
4. පාමුජ්ජං අධිගච්ඡෙ P. W. C.
5. බන්ධාගාරා B. බන්ධනා P. S. W.
6. අව්‍යයෙන P. W.
7. °ධීනො B.
8. දාසව්‍යා P. W. C.

53. කාශ්‍යපය, යම්සේ වනාහි මහත් රෝගයෙන් පෙළෙන (ආබාධ ඇත්තාවූ), දුක් ඇත්තාවූ, දැඩි ගිලන්බව ඇති පුරුෂයෙක් වන්නේ ද, ඔහට බත් (ආහාර) රුචි නොවන්නේ ද, ඔහුගේ ශරීරයෙහි කිසි ශක්තියක් නැත්තේ ද වෙයි. ඒ පුරුෂ තෙම පසු කාලයක ඒ ආබාධයෙන් මිදෙන්නේ නම්, ඔහුට ආහාර රුචිය ඇති වන්නේ නම්, ඔහුගේ ශරීරබලය ඇති වන්නේ නම්, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. (කෙබඳු ද යත්:) 'මම වනාහි පෙර ආබාධ ඇත්තාවූ, දුක් ඇති, දැඩි ගිලන් බැව් ඇති කෙනෙක් වීමි. මට බත් රුචිය ද නොවීය. ශරීර-බලය ද නැතිවිය. ඒ මම පළමු තිබූ ආබාධයෙන් මිදුනෙමි. මට ආහාරරුචිය ද ඇත්තේය. කාය බලය ද තිබේය' කියායි. හෙතෙම ඒ කාරණය මුල්කොට බලවත් සතුටක් ලබන්නේය, සොම්නසට ද පැමිණෙන්නේය.

54. කාශ්‍යපය, යම්සේ පුරුෂයෙක් සිරගෙහි බැඳුනේ වේද, හෙතෙම පසු කලෙක වියදම් නැතිව (පීඩා රහිතව) සැපසේ ඒ සිරගෙයින් මිදෙන්නේය. ඔහුගේ භොගයන් පිළිබඳ කිසිත් වියදමක් ද නොවන්නේය. ඔහුට මෙබඳු අදහසක් වන්නේය (එනම්:) 'මම වූකලී පෙර සිරගෙහි බැඳුනෙක් වූයෙමි. ඒ මම දැන් වියදම් නැතිව (පීඩා රහිතව) සැපසේ ඒ සිරගෙයින් මිදුනෙමි. මගේ භොගයන් පිළිබඳ කිසි වියදමක් ද නොවූයේය' කියායි. ඒ පුරුෂ තෙම සිරගෙයින් මිදීම නිමිති කොට බලවත් සතුටක් ලබන්නේය, සොම්නසට ද පැමිණෙන්නේය.

55. කාශ්‍යපය, යම්සේ සිය කැමැත්තෙන් යමක් කරන්ට නොහැකි (අධිපති භාවයක් නැත්තාවූ), අනුන්ගේ කැමැති පරිදි පවත්නාවූ (අනුන්ට යටයත්වූ), තමා කැමැති ගමනක් ඒ වූ පරිදි යා නොහැකි, වැඩකරුවෙක් වන්නේ ද, හෙතෙම පසු කලෙක ඒ දාසභාවයෙන් මිදෙන්නේ, තමාම අධිපතිකොට ඇත්තේ, පරාධීන නො වූයේ, අනුන්ට යටත් නොව තමා-ගෙත්ම යැපෙන්නේ, සිය අදහස් පරිදි ඒ ඒ තැන යා හැකි වන්නේ ද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. (එනම්:) 'මම වනාහි පෙර සියකැමැති පරිදි යමක් කරන්ට නොහැකි, අනුන්ට යටත් පැවතුම් ඇති, මා අදහස් පරිදි කිසි තැනෙක යා නොහැකි දාසයෙක් වීමි. ඒ මම දැන් ඒ දාසභාවයෙන් මිදුනෙක්මි. ආත්මාධීන වූයෙමි, පරාධීන නොවූයෙමි, මෙරමා-හට යටත් නොව මා සපයාගත් දෙයින්ම යැපෙන්නෙමි, මා අදහස් පරිදි ඒ ඒ කැමැති තැනෙක යා හැක්කෙක් ද වෙමි'යි කියායි. හෙතෙම ඒ දාසභාවයෙන් මිදීම හෙතුකොට බලවත් සතුටක් ලබන්නේය, එසේ සොම්නසට ද පැමිණෙන්නේය.

56. සෙය්‍යථාපි කස්සප පුරිසො සධනො සභොගො කන්තාරද්ධානමග්ගං[1] පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං. සො අපරෙන සමයෙන තං කන්තාරං නිත්ථරෙය්‍ය සොත්ථිනා ගාමන්තං අනුපාපුණෙය්‍ය ඛෙමං අප්පටිභයං. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ සධනො සභොගො කන්තාරද්ධානමග්ගං[1] පටිපජ්ජිං දුබ්භික්ඛං සප්පටිභයං. සොම්හි එතරහි තං කන්තාරං නිත්ථිණ්ණො[2] සොත්ථිනා ගාමන්තං අනුප්පත්තො ඛෙමං අප්පටිභයන්ති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං[3] අධිගච්ඡෙය්‍ය[4] සොමනස්සං.

57. එවමෙව ඛො කස්සප භික්ඛු යථා ඉණං යථා රොගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං එවං[5] ඉමෙ පඤ්චනීවරණෙ අප්පහීනෙ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි කස්සප යථා[6] ආනණ්‍යං යථා[6] ආරොග්‍යං යථා බන්ධනාමොක්ඛං යථා භුජිස්සං යථා ඛෙමන්තභූමිං එවමෙව ඛො කස්සප භික්ඛු ඉමෙ පඤ්චනීවරණෙ පහීනෙ අත්තනි සමනුපස්සති.

58. තස්සිමෙ පඤ්චනීවරණෙ පහීනෙ අත්තනි සමනුපස්සතො පාමොජ්ජං[3] ජායති පමුදිතස්ස පීති ජායති පීතිමනස්ස කායො පස්සම්භති පස්සද්ධකායො සුඛං වෙදෙති[7] සුඛිනො චිත්තං සමාධියති.

---

1. කන්තාරං අද්ධාන° B. S. Pa.
2. නිට්ඨිණ්ණො P.W. නිට්ඨිත්තො Pa.
3. පාමුජ්ජං P. W. C.
4. අධිගච්ඡෙ P. C.
5. එවං ති න දිස්සති P. W. S.
6. යථා ති නත්ථි B.P. (සබ්බත්ථ)
7. පටිසංවෙදෙති S.

56. කාශ්‍යපය, යම්සේ ධනවත්වූ භොගසම්පත් ඇති පුරුෂයෙක් ආහාර දුලීභවූ, භය සහිතවූ, නිරුදකවූ දීර්ඝමාර්ග-කට(දුරුකතර මගකට)පැමිණෙන්නේ ද,හෙතෙම මඳ කලකින් ඒ කාන්තාරමාර්ගය ඉක්මවා යන්නේ, සැපවත්වූ, (සොර සතුරන් ගෙන්) ප්‍රතිභය රහිත වූ ගම්මානයකට ක්‍රමයෙන් පැමිණෙන්-නේ ද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: 'මම වනාහි පෙර ධනවත් වූයෙමි, භොගසම්පත් සහිත වූයෙමි, දුලීභ භික්‍ෂා ඇති, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාරමාර්ගයකට පිළිපන්නෙක් වූයෙමි. එසේ වූ මම දැන් එම කාන්තාරමාර්ගය තරණය කෙළෙමි. සැපවත්වූ, ප්‍රතිභය රහිතවූ ගමකට සැපසේ ක්‍රමයෙන් පැමිණියෙමි'යි කියායි. ඒ පුරුෂ තෙමේ ඒ කාතරමග එතර කිරීම නිමිතිකොට බලවත් සතුටක් ලබන්නේය, එසේම සොම්නසට ද පැමිණෙන්නේය.

57. කාශ්‍යපය, ණය යම්සේ ද, රෝගය යම්සේ ද, බන්ධනා-ගාරය යම්සේ ද, දාසභාවය යම්සේ ද, දුරුකතරමග යම්සේ ද, එපරිද්දෙන් මහණ තෙමේ ප්‍රහීණ නොවූ (පහ නොකළ) පඤ්චනීවරණයන් තමා කෙරෙහි ලා නුවණින් දකී. කාශ්‍යපය ණය නැති බව යම්සේ ද, නීරෝගී බව යම්සේ ද, සිරගෙන් මිදීම යම්සේ ද, මෙරමාහට යටත් නැති බව යම්සේ ද, අභය භූමිය යම්සේ ද, එපරිද්දෙන් ම කාශ්‍යපය, මහණ තෙමේ ප්‍රහීණවූ මේ පඤ්චනීවරණ ධර්මයන් තමා විෂයෙහි ලා දක්නේය.

58. ප්‍රහීණවූ මේ පඤ්චනීවරණයන් තමා කෙරෙහි නැතැයි නුවණින් දක්නාවූ ඒ මහණහට සතුටු ආකාරය උපදී. සතුටු වූවහුට (සියල් සිරුර කලඹමින්) ප්‍රීතිය උපදී, ප්‍රීති සහගත සිත් ඇත්තහුගේ නාමකය(සන්තානය) සංසිඳෙයි, සංසිඳුනු කය ඇති (කය පිළිබඳ මැඩලූ දුක ඇති) තැනැත්තේ කායික චෛතසික සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධියට (එකඟ බවට) එළඹෙයි.

59. සො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං[1] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො[2] කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං[3] හොති.

60. සෙය්‍යථාපි කස්සප දක්ඛො න්හාපකො[4] වා න්හාපකන්තෙවාසී[4] වා කංසථාලෙ න්හානීයචුණ්ණානි[5] ආකිරිත්වා උදකෙන පරිප්ඵොසකං පරිප්ඵොසකං[6] සන්නෙය්‍ය[7] සායං[8] න්හානීයපිණ්ඩි[4] සෙනහානුගතා සෙනහපරෙතා සන්තරබාහිරඵුටා[9] සෙනහෙන[10] න ච පග්ඝරණී.[11]

61. එවමෙව බො කස්සප භික්ඛු ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො[2] කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං[3] හොති. ඉදම්පිස්ස හොති චිත්තසම්පදාය.

---

1. පඨමං ඣානං Pa.
2. සබ්බවතො V.
3. අප්ඵුටං, V.C. අප්ඵුතං, P. අඵුටං B. V.
4. ස්නා° W. නහා° P.
5. ස්නානීය° W. න්හානීය° B. නහානීය P.
6. සකිදෙව වුත්තං S.
7. සන්නෙය්‍ය P. W. C.
8. සාස්ස P.
9. °ඵුටා B. V. °ඵුතා P.
10. සිනෙහ° P. W.
11. පග්ඝුරණී B.
12. න කල්ලං S.

59. ඒ මහණතෙමේ වස්තුකාම ක්ලේශකාමයන්ගෙන් වෙන් වූයේම, අකුශල ධර්මයන් කෙරෙන් ද වෙන් වූයේ ම, (අරමුණෙහි සිත පැමිණවීම නම්) විතර්ක සහිතවූ, (අරමුණ පිරිමැදීම්, එහි හැසිරීම් සංඛ්‍යාත) විචාර සහිතවූ, සිතෙහි විවේකයෙන් (නීවරණයන් දුරුවීම් හේතුවෙන්) උපන් ප්‍රීතියම සැපකොට ඇති, පඨමජ්ඣාන කුසල චිත්තය තමාගේ සන්තාන-යෙහි ඉපදවීම් වසයෙන් ඊට පැමිණ එම ධ්‍යානයෙහි වාසය කෙරේ. ඒ මහණ තෙමේ විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ (සකල) ශරීරයම තෙමයි (සැපවත් කෙරෙයි සේයි), හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි (සැම තන්හි පතුරවයි). ඒ මහණහුගේ සම්පූර්ණ ශරීරයෙහි සවල්පවූ ස්ථානයක් වුව ද ප්‍රථමධ්‍යාන සැප-යෙන් (විවේකයෙන් උපන් ප්‍රීති සැපයෙන්) නොපහස්නා ලද්දේ නොවේ (සකල ශරීරයෙහිම පඨමජ්ඣාන සැපය පැතිරේ යයි සේයි).

60. කාශ්‍යපය, යම්සේ වනාහි දක්ෂවූ ස්නාන ද්‍රව්‍ය සපයන්නෙක් හෝ ඔහුගේ අතවැස්සෙක් හෝ ස්නානයට ගන්නාවූ සුණු ලෝහමය තලියෙක බහා දිය ඉසිමින් අතින් අතමින් (පිරිමදිමින්) පිඩුකරන්නේ ද, එවිට මේ ස්නාන චූර්ණපිණ්ඩය දියෙන් යුක්ත වේ, ජලය හාත්පසින් කාවැදුනේ වේ. එහි ඇතුළත හා පිටත ද සියලු තන්හිම ජලයෙන් පහස්නා ලද්දේ වේ. එහෙත් බිඳු වසයෙන් ජලය ඉන් නො වැගිරේ.

61. කාශ්‍යපය, එපරිද්දෙන් ඒ මහණ තෙමේ, විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ ශරීරය තෙමයි (පැතුරුණු සැප ඇත්තක් කරයි), හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි (සැමතන්හි පතුරුවයි). ඒ මහණහුගේ සියලු කොටස් ඇති ශරීරයෙහි සවල්පවූ තැනක් වත් විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් (ප්‍රථමධ්‍යානයෙන්) නොපහස්නා ලද්දේ නොවේ. මෙද ඔහුගේ චිත්තසම්පත පිණිස වේ.

62. පුනච පරං කස්සප භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං[1] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො[2] කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්ඵුටං[3] හොති.

63. සෙය්‍යථාපි කස්සප උදකරහදො ගම්භීරො[4] උබ්භිදොදකො[5] තස්ස නෙවස්ස පුරත්ථිමාය දිසාය උදකස්ස ආයමුඛං[6] න දක්ඛිණාය දිසාය උදකස්ස ආයමුඛං[6] න පච්ඡිමාය දිසාය උදකස්ස ආයමුඛං[6] න උත්තරාය දිසාය උදකස්ස ආයමුඛං[6] දෙවො[7] ච කාලෙන කාලං සම්මා ධාරං නානුප්පවෙච්ඡෙය්‍ය[8]. අථ ඛො තම්හා ච[9] උදකරහදා සීතා[10] වාරිධාරා උබ්භිජ්ජිත්වා තමෙව උදකරහදං සීතෙන වාරිනා අභිසන්දෙය්‍ය පරිසන්දෙය්‍ය පරිපූරෙය්‍ය පරිප්ඵරෙය්‍ය නාස්ස කිඤ්චි සබ්බාවතො[2] උදකරහදස්ස සීතෙන වාරිනා අප්ඵුටං[3] අස්ස.

64. එවමෙව ඛො කස්සප භික්ඛු ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො[2] කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්ඵුටං[3] හොති. ඉදම්පිස්ස හොති චිත්තසම්පදාය.

---

1. දුතියං ඣානං P.
2. සබ්බවතො V.
3 අඵුට්ඨං W; අඵුටං B, අප්ඵුතං P.C.
4. ගම්භීරො ඉති න දිස්සති P.W.
5. උබ්භිතොදකො B. S. V.
6. උදකස්සායº P. W.
7. දෙවො වා නං කාº S.
දෙවො ච න කාලෙන කාලං B. V.
8. අනුපවෙච්ඡෙය්‍ය B. V. P. W.
අනුප්පවෙº S. නානුපº C.
9. තම්හා වා S.
10. සීතවාරිº P. C.

62. කාශ්‍යපය, නැවතද (අනිකක් කියමි). (යොගී)මහණ තෙමේ විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් අධ්‍යාත්මයෙහි මනා පැහැදීම කරන්නාවූ, සිත පිළිබඳ එකග බව ඇති, විතර්ක විචාර නැති, සමාධියෙන් හටගත් ප්‍රීතිසැපය ඇති ද්විතීයධ්‍යාන කුසල චිත්තයට පැමිණ වෙසේ. ඒ මහණ තෙමේ මේ කය සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් තෙමයි (සියලු තැන පතල සැප ඇත්තක් කෙරේ), හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කරයි. ඒ මහණහුගේ සියලු කොටස් ඇති ශරීරයෙහි සවල්පවූ තැනක් වුවද ද්විතියධ්‍යානයෙන් නො පහස්නා ලද්දේ නොවේ.

63. කාශ්‍යපය, යම්සේ ඇතුලතම හටගත් (පොලොව බිඳ නික්මෙන) ජලය ඇති දියවිලක් වේ ද, ඒ විල පිළිබඳ පෙර දිගින් ද, අපරදිගින් ද, උතුරු දිගින් ද, දකුණු දිගින් ද දිය එන මගක් නැත්තේ වේ ද, මෙඝය ද කලින් කල මනාසේ වැසි වර්ෂණය නො කරන්නේ ද, එසේ වූ ඒ විලෙන් සිහිල් දිය දහර පොලොව බිඳ නැගී ඒ මුළු විලම සිහිල් දියෙන් පතුරුවයි, හාත්පසින් වගුරුවයි, සම්පූර්ණයෙන් පුරවයි, එහි හැම තැන දියෙන් ස්පර්ශ කෙරෙයි. ඒ සියලු විලෙහිම සීත ජලය නො පැතිර පවත්නා තැනක් නම් නැත්තේය.

64. කාශ්‍යපය, එපරිද්දෙන් මේ මහණ තෙමේ මේ මුළු ශරීරයම සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් සියලු තැන පතුරුවන ලද්දක් කෙරේ, ප්‍රීති සැපයෙන් හාත්පසින් වගුරුවයි, සම්පූර්ණයෙන් පුරවයි, ඉන් සැමතැනම ස්පර්ශ කෙරෙයි. ඒ මහණහුගේ සම්පූර්ණ ශරීරයෙහි සවල්පවූ එක ස්ථානයක්වුදු (ද්විතියධ්‍යාන) සැපයෙන් නො පහස්නා ලද්දේ නොවේ. මෙ ද ඔහුගේ චිත්ත සම්පත පිණිස වේ.

65. පුනච පරං කස්සප භික්ඛු පීතියා ච විරාගා[1] උපෙක්ඛකො[2] ච විහරති සතො[3] සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො[2] සතිමා සුඛවිහාරීති තතියජ්ඣානං[4] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො[5] කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං[6] හොති.

66. සෙය්‍යථාපි කස්සප උප්පලිනියං වා[7] පදුමිනියං වා[7] පුණ්ඩරීකිනියං වා[7] අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි[8] උදකානුග්ගතානි අන්තොනිමුග්ගපොසීනී[9] තානි යාව චග්ගා[10] යාව ච මූලා සීතෙන වාරිනා අභිසන්නානි[11] පරිසන්නානි[11] පරිපූරානි පරිප්ඵුටානි[12] නාස්ස කිඤ්චි සබ්බාවතං[5] උප්පලානං වා[13] පදුමානං වා පුණ්ඩරීකානං වා සීතෙන වාරිනා අප්ඵුටං[6] අස්ස.

67. එවමෙව ඛො කස්සප භික්ඛු ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො[5] කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං[6] හොති. ඉදම්පිස්ස හොති චිත්තසම්පදාය.

---

1. විරාගා ච P.
2. උපෙඛකො P.
3. සතො ච P. S.
4. තතියං ඣානං V. W.
5. සබ්බවතො V.
6. අඵුටං B.V; අප්ඵුටං S.; අප්ඵුතං P.
7. වානි න දිස්සති P.
8. සංවුඩ්ඪානි B. V; සංවඩ්ඪානි S.
9. °පොසීනි B.
10. යාව ච අග්ගා S.
11. °සන්නානි P.W.
12. පරිප්ඵුට්ඨානි P.
13. වානි නත්ථි V.

65. කාශ්‍යපය, යළිදු, ඒ මහණ තෙමේ ප්‍රීතියෙහි නො ඇල්මෙන් මැදහත්බැව් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් නුවණ ඇත්තේ කයින්ද සැපයක් විඳියි. යම් ධ්‍යානයක් පිළිබඳව (ඒ ධ්‍යානයට සමවැදුනු තැනැත්තා) උපෙක්‍ෂා ඇත්තේය, සිහි ඇත්තේය, සැපවිහරණ ඇත්තේ යයි ආර්‍යයෝ කියත් ද, ඒ තෘතියජ්ඣාන කුසල චිත්තයට පැමිණ වාසය කෙරේ. ඒ මහණ තෙමේ මේ සකල ශරීරයම ප්‍රීතියෙන් මිදුණාවූ සැපයෙන් තෙමයි, හෙවත් සියලු තැන පැතිර පවත්නා සැප ඇත්තක් කෙරේ. ඒ සැපතින් හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, එයින් සැමතැනම ස්පර්ශ කෙරෙයි. ඒ මහණහුගේ සියලු ශරීරයෙහි සවල්පවූ එක තැනක් වුවද නිෂ්ප්‍රීතික සුඛයෙන් (හෙවත් තෘතීය ධ්‍යානසුඛයෙන්) නො පහස්නා ලද්දේ නොවේ.

66. කාශ්‍යපය, යම්සේ උපුල් විලක හෝ හෙල පියුම් විලක හෝ රත් පියුම් විලක හෝ දියෙහි හටගත්, දියෙහි වැඩුනු, දියෙන් උඩට නොනැගුනු, දියතුළම ගැලී වැඬෙන්නාවූ සමහර උපුල් හෝ සමහර හෙල පියුම් හෝ සමහර රත් පියුම් හෝ වෙද් ද, ඒ උප්පලාදීහු අග දක්වාත්, මුල දක්වාත්, සිහිල් ජලයෙන් තෙමුනාහු, හාත්පසින් තෙමුනාහු, සම්පූර්ණයෙන් වැගුරුණාහු, හාත්පසින් පහස්නා ලද්දාහු වෙත් ද, ඒ උපුල්, හෙල පියුම්, රත් පියුම් යන මොවුන්ගෙන් එකකුත් ජලයෙන් නො පහස්නා ලද්දේ නොවේ ද,

67. කාශ්‍යපය, එපරිද්දෙන් ඒ මහණ තෙමේ මේ සකල ශරීරයම නිෂ්ප්‍රීතික සුඛයෙන් සියලු තැන පැතිර පවත්නා සැප ඇත්තක් කෙරෙයි, ඉන් හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි. ඒ මහණහුගේ සම්පූර්ණ ශරීරයෙහි සවල්පවූ එක තැනක්වත් නිෂ්ප්‍රීතික (තෘතියජ්ඣාන) සුඛයෙන් නො පහස්නා ලද්දේ නොවේ. මෙද ඔහුගේ චිත්තසම්පත්ති පිණිස වේ.

68. පුනචපරං කස්සප භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා[1] අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං[2] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුටං[4] හොති.

69. සෙය්‍යථාපි කස්සප පුරිසො ඔදාතෙන වත්ථෙන සසීසං පාරුපිත්වා නිසින්නො අස්ස නාස්ස කිඤ්චි සබ්බාවතො[3] කායස්ස ඔදාතෙන වත්ථෙන අප්ඵුටං[4] අස්ස.

70. එවමෙව ඛො කස්සප භික්ඛු ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති නාස්ස කිඤ්චි සබ්බාවතො[3] කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුටං[4] හොති. ඉදම්පිස්ස හොති චිත්තසම්පදාය අයං ඛො සා කස්සප චිත්තසම්පදා.

71. සො[5] එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනීයෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ඤාණදස්සනාය චිත්තං අභිනීහරති[6] අභිනින්නාමෙති. සො එවං පජානාති: අයං ඛො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදනපරිමද්දනභෙදනවිද්ධංසනධම්මො. ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති.

---

1. අත්ථගමා P.
2. චතුත්ථං ඣානං B. V.W.
3. සබ්බවතො V.
4. අඵුටං B. අප්ඵුටං S. අප්ඵුතං P.
5. පුනචපරං සො S.
6. අභිනි° B.

68. කාශ්‍යපය, නැවත ද, ඒ මහණතෙමේ සැප දුරුකිරී-මෙන් ද, දුක් දුරුකිරීමෙන් ද පළමුකොටම සොම්නස් දෙම්නස් දෙදෙනාගේ නැතිව යාමෙන් දුක් නොවූ, සැප නොවූ, උපෙක්ඛා හා සති යන මොවුන්ගේ පිරිසිදු බැව් ඇති, චතුර්ථජ්ඣාන චිත්තයට පැමිණ වෙසේ. ඒ මහණ තෙමේ මේ සකල ශරීරයම (කෙලෙස් නැති බැවින්) පිරිසිදුවූ, (අතිශයින් බබලන හෙයින්) පරියොදතවූ, (ධ්‍යාන) සිතින් පතුරුවා හුන්නේ වේ (පතුරුවන්නේය). ඒ ධ්‍යානලාභී මහණහුගේ සර්වාංගයෙහි සවලපවූ එක තැනකුදු පිරිසිදුවූ, අතිශයින් බබලන්නාවූ (චතුර්ථ ධ්‍යාන) චිත්තයෙන් නො පහස්නා ලද්දේ නොවේ.

69. කාශ්‍යපය, යම්සේ පුරුෂයෙක් පිරිසිදුවූ සුදුවතකින් හිස සිට (දෙපා දක්වා) පොරවා උන්නේ වේද, ඔහුගේ සකල ශරීරයෙහි එකම තැනකුදු සුදුවතින් නො වසනා (නොමහාත් උණුසුම් නොකරණ) ලද්දේ නොවේ.

70. කාශ්‍යපය, එපරිද්දෙන්ම ධ්‍යානලාභී මහණ තෙමේ මේ සියලු ශරීරයම පිරිසිදුවූ, අතිශයින් බබලන්නාවූ (චතුර්ථජ්ඣාන) චිත්තයෙන් පතුරුවා හුන්නේ වේ. ඒ මහණහුගේ සර්වාංගයෙහි සවලපවූද එක් තැනක්වත් පිරිසිදුවූ බබලන්නාවූ (චතුර්ථජ්ඣාන) චිත්තයෙන් නො පහස්නා ලද්දේ නොවේ (චතුර්ථධ්‍යාන චිත්තයෙන් සකල ශරීරයම පතුරුවන ලද්දේය කී සේයි. මෙ ද ඔහුගේ චිත්තසම්පත්ති පිණිස වේ. කාශ්‍යපය, මේ වනාහි චිත්තසම්පත්තිය නම් වේ.

71. ඒ මහණතෙමේ මෙසේ සිතඑකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි, උපකෙලශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි, (කර්මණ්‍ය) කර්මයට සුදුසුව සිටි කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය ඉපදවීම පිණිස සිත එලවා තබයි, ඒ සඳහා වෙසෙසින් සිත නමයි. ඒ මහණ තෙමේ මෙසේ දන ගණී, කෙසේ ද යත්: 'මාගේ මේ ශරීරය වනාහි ආකාර ඇත්තේය (රූපයෙන් යුක්තය), සතර මහාභූතයන්ගේ හේතු-වෙන් හටගත්තේය, (මව්පියන් නිසා) මව් පිය දෙදෙනාගේ ශුක්‍ර ශ්‍රොණිතයෙන් හටගත්තේය, බත්කොමු (කුම්මාස) ආදී ආහාරයෙන් වඩනා ලද්දේය. අනිත්‍ය බවය, දුගඳ නැසීම පිණිස සුණු ආදිය ගැල්වීමෙන් ඉලීමය, අඟපසඟ ආබාධ දුරලීම පිණිස පිරිමැදීමය, බිඳීමය, විනාශය යන මේ දේ සවභාවකොට ඇත්තේය. මාගේ මේ විඥානය වනාහි කය ඇසුරු කොළේ වෙයි, මෙහිම බැඳුනේ වෙයි' කියායි.

72. සෙය්‍යථාපි කස්සප මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අච්ඡො විප්පසන්නො අනාවිලො සබ්බාකාරසම්පන්නො තත්‍ර'ස්ස [1] සුත්තං ආවුතං නීලං[2] වා පිතං [3] වා ලොහිතං [4] වා ඔදාතං වා පණ්ඩුසුත්තං [5] වා. තමෙනං [6] චක්ඛුමා පුරිසො හත්ථෙ කරිත්වා පච්චවෙක්ඛෙය්‍ය: අයං ඛො මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අච්ඡො විප්පසන්නො අනාවිලො සබ්බාකාරසම්පන්නො තත්‍රිදං සුත්තං ආවුතං නිලං [2] වා පිතං [9] වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩුසුත්තං [5] වාති.

එවමෙව ඛො කස්සප භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ—පෙ—ඤාණදස්සනාය චිත්තං අභිනීහරති [7] අභිනින්නාමෙති. සො එවං පජානාති අයං ඛො මෙ කායො රූපී—පෙ—ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති. ඉදම්පිස්ස හොති පඤ්ඤාසම්පදාය.

73. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ [8] මනොමයං කායං අභිනිම්මිනාය [9] චිත්තං අභිනීහරති [7] අභිනින්නාමෙති. සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං[10] අභිනින්ද්‍රියං.[11]

74. සෙය්‍යථාපි කස්සප පුරිසො මුඤ්ජම්හා ඊසිකං [12] පබ්බාහෙය්‍ය [13] තස්ස එවමස්ස: අයං මුඤ්ජො අයං ඊසිකා[12]. අඤ්ඤො මුඤ්ජො අඤ්ඤා ඊසිකා[12] මුඤ්ජම්හාත්වෙව ඊසිකා [12] පබ්බාළ්හාති [13].

---

1. තත්‍රසුත්තං P. W.
2. නිලං B.
3. පිතං B.
4. ලොහිතකං B.
5. පණ්ඩුරසු° S.
6. තමෙව ච° P.
7. °නිහරති B.
8. ආනෙජ්ජ° P. C.
9. මනොමයං අභිනිම්මිනනාය S.
10. පච්චඞ්ගං S.
11. අභින්තින්ද්‍රියං C.
12. ඉසි° P. S. W. C.
13. පවා° P. W. S.

72. කාශ්‍යපය, යම්සේ වනාහි යහපත්වූ, පිරිසිදු ආකාරයෙන් උපන්නාවූ, අටැස්වූ, (පාෂාණාදි දෙස් බැහැර කිරීමෙන්) මොනවට සකස් කරණ ලද්දාවූ, නිර්මලවූ, විශෙෂයෙන් ප්‍රසන්නවූ, නොකැලැල්වූ, සියලු ආකාරයෙන් සම්පූණිවූ, වෙරළුම්ණික් (වෛඩූර්‍ය මැණිකක්) වේද, එහි නිල්වූ හෝ පිතවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ හුයක් (නූලක්) අමුණන ලද්දේද, ඒ මේ මැණික ඇස් ඇති පුරුෂයෙක් අතට ගෙණ මෙසේ සලකා බලන්නේය, කෙසේද යත්: ‘මේ වෛඩූර්‍ය මැණික වනාහි මනාසේ කාන්තිමත් හෙයින් යහපත් වේ, පිරිසිදු ආකාරයෙන් උපන්නේය, අටැස් ඇත්තේය, (දෙස් දුරුකිරීමෙන්) මනාකොට සකස් කරණ ලද්දේය, නිර්මලය, විශෙෂයෙන් ප්‍රසන්නය, නොකැලැල්ය, සියලු ආකාරයෙන් සම්පූණිය. ඒ මැණිකෙහි මේ නීලවණිවූ හෝ පීතවණිවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ හුයක් අමුණන ලද්දේය’ කියාහි.

කාශ්‍යපය, එපරිද්දෙන්ම යොගීවූ මේ මහණ තෙමේ මෙසේ සිත එකගවූ කල්හි, —පෙ— විදශීනාඥානය පිණිස සිත එලවා තබයි, ඒ සඳහා විශෙෂයෙන් සිත නමයි. ඒ මහණ තෙමේ මෙසේ දන්නේය, කෙසේද යත්: ‘මාගේ මේ ශරීරය වනාහි ආකාරවත් (රූපයෙන් යුක්ත) ය, —පෙ— මාගේ මේ විඤ්ඤාණය වනාහි මේ කය ඇසුරු කෙරේ වෙයි, මෙහිම බැඳී සිටියේය’ කියා යි. මෙ ද ඔහුගේ ප්‍රඥාසම්පත පිණිස වේ.

73. ඒ මහණ තෙමේ මෙසේ ධ්‍යානයෙන් සිත එකගවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් නැතිවූ කල්හි, උපකෙලශ පහවූ කල්හි, මෘදුවූ කල්හි, යොග කර්මයට සුදුසුව සිටි කල්හි, නො සැලෙන බවට පැමිණි කල්හි, මනොමයවූ කයක් (රූපයක්) මනාකොට නිපදවීම පිණිස සිත එලවා තබයි, වෙසෙසින් නමයි. ඒ මහණ තෙමේ ආකාරවත්වූ, මනොමයවූ (ධ්‍යාන සිතින් නිපදවනලද), සියලු අඟපසඟ ඇති, අවිකලවූ ඉඳුරන් ඇති, මේ කයින් අන්‍යවූ කයක් මොනවට නිමවයි.

74. කාශ්‍යපය, යම්සේ වනාහි පුරුෂයෙක් තෙම මුඳු තණගසින් තණබඩය උද්ධරණය කරන්නේ ද, ඔහුට මේ අදහස් වන්නේය: මේ තණගසය, මේ තණබඩය, තණගස අනිකෙක, තණබඩය අනිකෙක, තණගසින්ම තණබඩය ඇදගන්නා ලද්දේය, (යන වැටහීම ඔහට පහළ වන්නේය).

සෙය්‍යථා[1] වා පන කස්සප පුරිසො අසිං[2] කොසියා පබ්බාහෙය්‍ය[3] තස්ස එවමස්ස: අයං අසි අයං කොසි අඤ්ඤො අසි අඤ්ඤා[4] කොසි. කොසියා ත්වෙව අසි පබ්බාළ්හොති[3].

සෙය්‍යථා වා[1] පන කස්සප පුරිසො අහිං කරණ්ඩා උද්ධරෙය්‍ය තස්ස එවමස්ස: අයං අහි අයං කරණ්ඩො අඤ්ඤො අහි අඤ්ඤො කරණ්ඩො. කරණ්ඩා ත්වෙව අහි උබ්භතොති[5].

එවමෙව ඛො කස්සප භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— ආනෙඤ්ජප්පත්තෙ[6] මනොමයං කායං[7] අභිනිම්මිනාය[8] චිත්තං අභිනීහරති[9] අභිනින්නාමෙති. සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං[10] අහීනින්ද්‍රියං.[11] ඉදම්පිස්ස හොති පඤ්ඤාසම්පදාය.

75. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[6] ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති[9] අභිනින්නාමෙති. සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති එකොපි හුත්වා බහුධා හොති බහුධාපි හුත්වා එකො හොති ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ. පඨවියා[12] පි උම්මුජ්ජනිමුජ්ජං[13] කරොති සෙය්‍යථාපි උදකෙ. උදකෙපි අභිජ්ජමානො[14] ගච්ඡති සෙය්‍යථාපි පඨවියං[12]. ආකාසෙ පි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙපි චන්දිමසූරියෙ[15] එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරිමසති[16] පරිමජ්ජති යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.

---

1. සෙය්‍යථාපි පන P. W.
2. අසිකොසියං W. අසිකොසියා P. V.
3. පවා P. W. S.
4. අඤ්ඤො P. W.
5. උද්ධරිතො S.
6. ආනෙජ්ජ° P.
7. කායං ති න දිස්සති S.
8. °නිම්මිනනාය S.
9. °නිහරති B.
10. °පච්චඞ්ගං S.
11. අහින්නින්ද්‍රියං C. අහි°P.
12. පථ° B. V.
13. °නිම්මුජ්ජං P. W.
14. අභෙජ්ජ° W.
15. °සූරියෙ B.
16. පරා° B. V. W.

කාශ්‍යපය, යම්සේ වනාහි පුරුෂයෙක් කඩුව කොපුවෙන් ඉවත් කරන්නේ ද ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: මේ කඩුවය, මේ (කඩු) කොපුවය, කඩුව අනිකෙක, කොපුව අනිකෙක, කොපුවෙන්ම කඩුව ඉවත්කරණ ලද්දේය කියාහි.

කාශ්‍යපය, යම්සේ පුරුෂයෙක් සපියකු සැවයෙන් පහ කරන්නේද[1] (වෙන්කොට සලකන්නේද), ඔහට මේ සපියාය, මේ සැවය, සපියා එකෙකි, සැව අනිකකි, සැවයෙන්ම සපියා වෙන්කරණ ලද්දේය යි වැටහීමක් ඇතිවන්නේය.

කාශ්‍යපය, එසේම භික්ෂුව මෙසේ සිත සමාධිගතවූ කල්හි, —පෙ— නොසැලෙනබවට පැමිණි කල්හි සිතින් උපදවන කයක් මැවීම පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට ඊට නමයි. හේ තෙමේ මේ කයින් රූ ඇති, සිතින් මවන ලද, සියලු අඟපසඟ ඇති, නොපිරිහුනු ඉන්ද්‍රියයන් ඇති වෙන කයක් මවයි. මෙ ද ඔහුගේ ප්‍රඥසම්පත පිණිස වේ.

75. හේ තෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත වූ කල්හි, උපක්ලේශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍ය භාවයට පැමිණි කල්හි, ඍද්ධිවිධි පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි (ඊට නැඹුරු කෙරෙයි). හේ තෙමේ නොයෙක් අයුරු ඇති ඍද්ධිවිධි වෙන් වෙන් කොට අනුභව කෙරෙයි. එකෙක්ව බොහෝ සේ වෙයි. බොහෝ සේ ව එකෙක් වෙයි. ප්‍රකට බවට, මුවහ බවට, අහසෙහි මෙන් බිත්තිය සරසට, පවුර සරසට, පව්ව සරසට නොගැටෙමින් යෙයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම් මතුවීම් කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබෙදා ගමන් කෙරෙයි. පක්ෂියකු මෙන් අහසෙහි ද පලඟින් යෙයි. මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභාව ඇති සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි, බඹලොව තෙක් කයින් වසඟ බව පවත්වයි.

---

1. මෙසේ කරන්නේ සිතින් පමණකැයි අටුවාහි.

78. සෙය්‍යථාපි කස්සප පුරිසො අද්ධානමග්ගපටිපන්නො.[1] සො සුණෙය්‍ය භෙරිසද්දම්පි මුදිඞ්ගසද්දම්පි[2] සඞ්ඛපණවදෙණ්ඩිමසද්දම්පි[3] තස්ස එවමස්ස: භෙරිසද්දො ඉතිපි මුදිඞ්ගසද්දො[2] ඉතිපි සඞ්ඛපණවදෙණ්ඩිමසද්දො[4] ඉතිපි. එවමෙව ඛො කස්සප භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති[5] අභිනින්නාමෙති.

සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච. ඉදම්පිස්ස හොති පඤ්ඤාසම්පදාය.

79. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[6] චෙතොපරියඤාණාය චිත්තං අභිනීහරති[5] අභිනින්නාමෙති. සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති.

සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති වීතරාගං[7] වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති සඞ්ඛිත්තං වා චිත්තං සඞ්ඛිත්තං චිත්තන්ති පජානාති වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

සෙය්‍යථාපි කස්සප ඉත්ථී වා පුරිසො වා දහරො වා යුවා මණ්ඩනජාතිකො[8] ආදාසෙ වා පරිසුද්ධෙ පරියොදාතෙ අච්ඡෙ වා උදකපත්තෙ[9] සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො සකණිකං[10] වා සකණිකන්ති[9] ජානෙය්‍ය අකණිකං[11] වා අකණිකන්ති[11] ජානෙය්‍ය.

---

1. °මග්ගප්පටි° B. V.
2. මුතිඞ්ග° P.W.
3. °දෙන්ඩිම° B; සඞ්ඛසද්දම්පි පණවසද්දම්පි දෙන්ඩිමස° S.
4. සංඛසද්දො ඉතිපි පණවසද්දො ඉතිපි දෙන්ඩිමස° S.
5. °නිහරති B.
6. ආනෙජ්ජ° P.
7. විත° B. (සබ්බත්ථ)
8. මණීඩනක° S. C.
9. උදප° W.
10. සකනි° B.
11. අකනි° B.

78. කාශ්‍යපය, දික් මගට පිවිසි පුරුෂයෙක් බෙර හඬද, මිහිඟු බෙර හඬද, සක්, පණාබෙර, ගැටබෙර හඬද යම්සේ අසාද, ඔහුට මේ බෙර හඬයයිද, මිහිඟුබෙර හඬයයිද, සක්, පණාබෙර, ගැටබෙර හඬ යයිද සිතෙන්නේය. කාශ්‍යපය, එලෙසින්ම භික්‍ෂුව මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදුවූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත වූ කල්හි, පහ වූ උපක්ලෙශ ඇති කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍යභාවයට පැමිණි කල්හි, දිව්‍යශ්‍රොත්‍රඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට ඊට නමයි.

හේ තෙමේ මෙසේ පිරිසිදුවූ මිනිස්කණ ඉක්ම වූ දිව්‍ය ශ්‍රොත්‍රඥානයෙන් දිව්‍යමය වූ ද, මනුෂ්‍යමය වූ ද, දුරෙහි වූ ද, සමීපයෙහි වූ ද දෙවැද්දෑරුම් ශබ්දයන් අසයි. මේ ද ඔහුගේ ප්‍රඥා සම්පත පිණිස වේ.

79. හේ තෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත වූ කල්හි, පහවූ උපක්ලෙශ ඇති කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍යභාවයට පැමිණි කල්හි, සිත් පිරිසිඳින ඥාණය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි (ඊට නැඹුරු කෙරෙයි). හේ තෙමේ අන්‍ය සත්ත්වයන්ගේ, අන්‍ය පුද්ගලයන්ගේ සිත (තමන් ගේ) සිතින් පිරිසිඳ දනියි.

රාග සහිත සිත සරාග සිත යයි දනියි. රාගය පහ වූ සිත වීතරාග සිත යයි දනියි. ද්වෙෂ සහිත සිත සද්වෙස සිත යයි දනියි. ද්වෙෂය පහවූ සිත වීතද්වෙෂ සිත යයි දනියි. මොහ සහිත සිත සමොහ සිත යයි දනියි, මොහය පහ වූ සිත වීතමොහ සිත යයි දනියි. හැකුළුනු සිත හැකුළුනු සිත යයි දනියි, විසුරුණු සිත විසුරුණු සිත යයි දනියි. මහත් බවට ගිය සිත මහත් බවට ගිය සිත යයි දනියි. මහත් බවට නොගිය සිත මහත් බවට නොගිය සිත යයි දනියි. උතුරුසහිත (කාමාවචර) සිත උතුරුසහිත සිත යයි දනියි. අනුත්තර (රූපාවචර අරූපාවචර) සිත අනුත්තර සිත යයි දනියි. සමාධි ගත වූ සිත සමාධිගත වූ සිත යයි දනියි, සමාධිගත නො වූ සිත සමාධිගත නො වූ සිත යයි දැනගණී. (ක්ලෙශයෙන්) මිදුනු සිත මිදුනු සිත යයි දැනගණී, නොමිදුනු සිත නොමිදුනු සිත යයි දැනගණී.

කාශ්‍යපය, සැරසෙන සුලු ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ දහරයෙක් හෝ තරුණයෙක් හෝ පිරිසිදු, නොකිලිටි කැඩපතෙක හෝ පිරිසිදු දිය බඳුනෙක්හි හෝ තමාගේ මූව නිමිත්ත (මූබ ශොභාව) පරීක්‍ෂා කරන්නේ, යම්සේ කැලල් සහිත නම් කැලල් සහිත යයි දැනගණීද, කැලල් රහිත නම් කැලල් රහිත යයි දැනගණීද,

එවමෙව ඛො කස්සප භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— ආනෙඤ්ජප්පත්තෙ[1] චෙතොපරියඤාණාය චිත්තං අභිනීහරති[2] අභිනින්නාමෙති. සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති —පෙ— අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

80. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[1] පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති[2] අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති සෙය්‍යථීදං[3] එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසම්පි[4] ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි[5] ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ: අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උප්පාදිං[6]. තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නොති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

81. සෙය්‍යථාපි කස්සප පුරිසො සකම්හා ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය තම්හාපි ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය. සො[7] තම්හා[8] ගාමා සකඤ්ඤෙව[9] ගාමං පච්චාගච්ඡෙය්‍ය.[10] තස්ස එවමස්ස: අහං ඛො සකම්හා ගාමා අමුං ගාමං අගච්ඡිං[11] තත්‍ර[12] එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හීඅහොසිං. තම්හාපි ගාමා අමුං ගාමං අගච්ඡිං[11]. තත්‍රාපි[12] එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හීඅහොසිං. සොම්හි තම්හා ගාමා සකඤ්ඤෙව[9] ගාමං පච්චාගතො[10] ති.

1. ආනෙජ්ජ° P.
2. °නීහති B.
3. සෙය්‍යථිද° B. V.
4. වීසතිම්පි P. W.
5. සතංපි ජාතියො සහස්සංපි ජා° සතසහස්සංපි ජා° අනෙකෙපි S.
6. උප්පාදිං W.
7. සො ති න දිස්සති P. W.
8. තම්හාපි ගාමා P.
9. සකංයෙව B. P.
10. පච්ඡා° P.
11. අගඤ්ඡිං S. ආගඤ්ඡිං P. ආගච්ඡිං Pa.
12. තත්‍රාහං B. S. තත්‍රාපි B. Pa. W.

කාශ්‍යපය, එසේම භික්ෂුව මෙසේ සිත එකඟ වූ කල්හි, —පෙ— නොසැලෙනබවට පැමිණි කල්හි, සිත් පිරිසිඳින ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ තෙමේ අන්‍ය සත්ත්වයන්ගේ, අන්‍ය පුද්ගලයන්ගේ සිත (තමන්ගේ) සිතින් පිරිසිඳ දනියි. සරාග සිත සරාග සිත යයි දනියි. —පෙ— නොමිදුනු සිත නොමිදුනු සිත යයි දැනගනියි.

80. හේ තෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත වූ කල්හි, උපක්ලේශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කර්මණ්‍යවූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍ය භාවයට පැමිණි කල්හි, පූර්වේනිවාසානුස්මෘතිඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට (ඊට) නමයි. හේ තෙමේ නොයෙක් විදියේ පෙර විසීම් සිහි කෙරෙයි. කෙසේදයත්: එක් ජාතියක් ද, දෙ ජාතියක් ද, තුන් ජාතියක් ද, සිවු ජාතියක් ද, පස් ජාතියක් ද, දස ජාතියක් ද, විසි ජාතියක් ද, තිස් ජාතියක් ද, සතළිස් ජාතියක් ද, පණස් ජාතියක් ද, සියක් ජාතියක් ද, දහස් ජාතියක් ද, සියක් දහස් ජාතියක් ද, නොයෙක් සංවෘත කල්පයන් ද, නොයෙක් විවෘත කල්පයන් ද, නොයෙක් සංවෘත විවෘත කල්පයන් ද 'අසුවල් තැන වීමි, මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මේ පැහැ ඇත්තෙමි, මේ අහර ඇත්තෙමි, මේ සැපදුක් විත්දෙමි, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙමි වීමි. ඒ මම එයින් චුතවූයෙමි, අසුවල් තැන උපන්මි. එහිදු මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මේ පැහැ ඇත්තෙමි, මේ අහර ඇත්තෙමි, මේ සැපදුක් විත්දෙමි, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙමි වීමි. ඒ මම එයින් චුතවූයෙමි මෙහි උපන්මි'යි මෙසේ ආකාර සහිතව, උදෙසීම් සහිතව, නොයෙක් විදියේ පෙර විසීම් සිහිකෙරෙයි.

81. කාශ්‍යපය, පුරුෂයෙක් යම්සේ තම ගමින් අන් ගමකට යන්නේ ද, ඒ ගමිනුත් අන් ගමකට යන්නේ ද, ඒ ගමිනුත් තමන් ගමට එන්නේ ද, 'මම සිය ගමින් අසුවල් ගමට ගියෙමි, එහි මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි, මෙසේ බිණිමි, මෙසේ තුෂ්ණීම්භූත වීමි. එගමිනුදු අසුවල් ගමට ගියෙමි, එහි ද, මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි, මෙසේ බිණිමි, මෙසේ තුෂ්ණීම්භූත වීමි. ඒ මම ඒ ගමින් සිය ගමටම පැමිණියෙමි'යි හෙතෙම දන්නේ ද,

82. එවමෙව ඛො කස්සප භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති[1] අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති—සෙය්‍යථීදං එකම්පි ජාතිං —පෙ— ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

83. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනීයෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[2] සත්තානං චුතූපපාතඤාණාය[3] චිත්තං අභිනීහරති[1] අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[4] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ[5] සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා.[6] ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති[6]. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[4] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

84. සෙය්‍යථාපි කස්සප මජ්ඣෙ සිංඝාටකෙ පාසාදො[7] තත්‍ර චක්ඛුමා පුරිසො ඨිතො පස්සෙය්‍ය මනුස්සෙ ගෙහං පවිසන්තෙපි නික්ඛමන්තෙපි රථියා[8] වීතිසඤ්චරන්තෙ[9] පි මජ්ඣෙ[10] සිංඝාටකෙ නිසින්නෙපි[11]. තස්ස එවමස්ස: එතෙ මනුස්සා ගෙහං පවිසන්ති එතෙ නික්ඛමන්ති එතෙ රථියා[8] වීථිසඤ්චරන්ති[12] එතෙ[13] මජ්ඣෙ සිංඝාටකෙ නිසින්නාති.

---

1. °නිහරති B.
2. ආනෙජ්ජ° P.
3. චුතුප° B.
4. උප්පජ්ජං W.
5. කම්මූපගෙ B.
6. උප්පන්නා W.
7. පාසාදෙ Pa.
8. රථියාපි රථිං සඤ්ච° V. රථියායපි B.
9. වීථි සං° P. W; වීථිං සංරථිං B. S; සං° V. වීතිසං° Ce; වීදිසංචරන්තෙ Ca. B.
10. මජ්ඣෙපි P. W.
11. නිසින්නෙ P. W.
12. වීථි° P. W. වීථිං° B.S. රථිං සං° V.
13. එතෙ මනුස්සා B.

82. කාශ්‍යපය, එපරිද්දෙන්ම භික්‍ෂුව මෙසේ සිත එකඟ වූ කල්හි, —පෙ— නොසැලෙන බවට පැමිණි කල්හි පූර්වේනිවාසානුස්මෘතිඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට නමයි. හේ නොයෙක් පූර්වේනිවාස සිහි කෙරෙයි. කෙසේදයත්: එක් ජාතියක් ද,—පෙ—මෙසේ ආකාර සහිතව උදෙසීම් සහිතව නොයෙක් ආකාරවූ පූර්වේනිවාස සිහි කෙරෙයි.

83. හෙතෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිතවූ කල්හි, උපක්ලේශ පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කර්මණ්‍යවූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි,අකම්පයමානභාවයට පැමිණි කල්හි සත්ත්වයන්ගේ චුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි (ඊට නැඹුරු කෙරෙයි). හේ පිරිසුදු වූ, මිනිස් ඇස ඉක්මවූ, දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී. හීන ප්‍රණීත, සුවර්‍ණ දුර්වර්‍ණ, සුගත දුර්ගත, කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දනී: ‘මේ පින්වත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්තය, වාග්දුශ්චරිතයෙන් යුක්තය, මනොදුශ්චරිතයෙන් යුක්තය, ආර්‍ය්‍යයන්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය, මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන් වූවෝය. ඔවුහු කාබුන් මරණින් මතු අපාය වූ, දුර්ගතිය වූ, විනිපාතය වූ, නිරයට පැමිණියාහුය’. නැතහොත්, ‘මේ පින්වත් සත්ත්වයෝ කායසුචරිතයෙන් යුක්තය, වාක්සුචරිතයෙන් යුක්තය,මනඃසුචරිතයෙන් යුක්තය,ආර්‍ය්‍යයන්ට නොබණින්නෝ ය, සම්‍යග්දෘෂ්ටිකයෝ ය, සම්‍යග්දෘෂ්ටිකර්ම සමාදන් වූවෝය, කාබුන් මරණින් මතු සුගතිය වූ, ස්වර්‍ග ලොකයට පැමිණියෝ’යි මෙසේ පිරිසුදු වූ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී, හීන ප්‍රණීත, සුවර්‍ණ, දුර්වර්‍ණ, සුගත දුර්ගත, කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දනී.

84. කාශ්‍යපය, යම්සේ මංසලක පහයක් වේ ද, එහි ඇස් ඇති පුරුෂයෙක් සිටියේ ගෙට පිවිසෙන, ගෙයින් නික්මෙන, වීථියෙහි හැසිරෙණ, මංසල හිඳින මනුෂ්‍යයන් දක්නේ ද, ඔහුට මෙසේ සිතෙයි: ‘මේ මිනිස්සු ගෙට පිවිසෙති, මොහු නික්මෙති, මොහු වීථියෙහි හැසිරෙති, මොහු මංසල හිඳිති’යි කියායි.

85. එවමෙව ඛො, කස්සප භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ—පෙ—සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති[1] අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජ-මානෙ[2] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති.

86. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[2] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති. ඉදම්පිස්ස හොති පඤ්ඤාසම්පදාය.

87. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනීයෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[3] ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති.

1. °නිහරති B.   2. උප්පජ්ජ° W.

3. ආනෙජ්ජ B.

85. කාශ්‍යපය, එසේ ම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, —පෙ— සත්ත්වයන්ගේ චුති උත්පත්ති ඥානයට නුවණ පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ මිනිස් ඇස ඉක්ම වූ දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී. හීන ප්‍රණීත, සුවර්ණ දුර්වර්ණ, සුගත දුර්ගත, කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දකී: ‘මේ පින්වත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්තය, වාග්දුශ්චරිතයෙන් යුක්තය, මනොදුශ්චරිතයෙන් යුක්තය, ආර්‍ය්‍යයන්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය, මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන් වූවෝය. ඔවුහු කාබුන් මරණින් මතු අපාය වූ, දුර්ගතිය වූ, විනිපාතය වූ, නිරයට පැමිණියෝය’. නැත හොත්, ‘මේ පින්වත් සත්ත්වයෝ කායසුචරිතයෙන් යුක්තය, වාක්සුචරිතයෙන් යුක්තය, මනඃ සුචරිතයෙන් යුක්තය, ආර්‍ය්‍යයන්ට නොබණින්නෝ ය, සම්‍යග්දෘෂ්ටිකයෝය, සම්‍යග්දෘෂ්ටිකර්ම සමාදන් වූවෝය. ඔවුහු කාබුන් මරණින් මතු සුගතිය වූ, ස්වර්ග ලොකයට පැමිණියෝ’යි කියායි.

86. මෙසේ පිරිසුදු වූ, මිනිස් ඇස ඉක්ම වූ දිව ඇසින් චුතවන, උපදින සත්ත්වයන් දකී; හීන ප්‍රණීත, සුවර්ණ දුර්වර්ණ, සුගත දුර්ගත, කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දනී.

87. හේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත කල්හි, උපක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්පයමාන භාවයට පැමිණි කල්හි ආශ්‍රවයන්ගේ ක්ෂය ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට නමයි.

සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයො ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධො ති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධගාමිනීපටිපදා ති[1] යථාභූතං පජානාති. ඉමෙ ආසවා ති යථාභූතං පජානාති. අයං ආසවසමුදයො ති යථාභූතං පජානාති. අයං ආසවනිරොධො ති යථාභූතං පජානාති. අයං ආසවනිරොධගාමිනීපටිපදා[1] ති යථාභූතං පජානාති.

තස්ස එවං ජානතො[2] එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති භවාසවාපි චිත්තං විමුච්චති අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති[3] ඤාණං හොති. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති.

88. සෙය්‍යථාපි කස්සප පබ්බතසඞ්ඛෙපෙ උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො. තත්ථ චක්ඛුමා පුරිසො තීරෙ ඨිතො පස්සෙය්‍ය සිප්පිසම්බුකම්පි[4] සක්ඛරකඨලම්පි[5] මච්ඡගුම්බම්පි[6] චරන්තම්පි තිට්ඨන්තම්පි. තස්ස එවමස්ස: අයං ඛො උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො. තත්‍රිමෙ සිප්පිසම්බුකා[4] පි සක්ඛරකඨලා[5] පි මච්ඡගුම්බා පි[6] චරන්ති පි[7] තිට්ඨන්ති[8] පීති. එවමෙව ඛො කස්සප භික්ඛු සමාහිතෙ චිත්තෙ —පෙ— ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති[9] අභිනින්නාමෙති. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති —පෙ— අයං ආසවනිරොධගාමිනීපටිපදා[1] ති යථාභූතං පජානාති.

තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති භවාසවාපි චිත්තං විමුච්චති අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති. ඉදම්පිස්ස හොති පඤ්ඤාසම්පදාය. අයං ඛො කස්සප පඤ්ඤාසම්පදා.

---

1. ගාමිනි P.
2. පජානතො Pa.
3. විමුත්තම්හීති B.
4. සිප්පික° B. S. සිප්පිය° V.
5. °කථ° B.
6. °කුම්භම්පි Pa.
7. චරන්තාපි B. V.
8. තිට්ඨන්තා B.V.
9. °නීහරති B.

හේ තෙමේ මේ දුක යයි තතු ලෙස දැනගණී, මේ දුක් ඉපදීමේ හෙතුව යයි තතු ලෙස දැනගණී, මේ දුඃඛනිරොධ යයි තතු ලෙස දැනගණී, මේ දුඃඛ නිරොධගාමී ප්‍රතිපදාව යයි තතු ලෙස දැනගණී. මේ ආශ්‍රවයෝ යයි තතු ලෙස දැනගණී, මේ ආශ්‍රව සමුදයයි තතු ලෙස දැනගණී, මේ ආශ්‍රව නිරොධ යයි තතු ලෙස දැනගණී, මේ ආශ්‍රවනිරොධගාමී ප්‍රතිපදාව යයි තතු ලෙස දැනගණී.

මෙසේ දක්නා මෙසේ දන්නා ඔහුගේ සිත කාමාශ්‍රවයන් කෙරෙන් ද මිදේ, භවාශ්‍රවයන් කෙරෙන් ද සිත මිදේ, අවිද්‍යාශ්‍රවයන් කෙරෙන් ද සිත මිදේ. මිදුනු කල්හි 'මිදුනේය' යන සිතවෙයි. 'ජාතිය ක්‍ෂය වීය, බ්‍රහමචයර්‍යය වැස නිමවන ලදී, කටයුතු කරණලදී, මේ අත්බැවින් පසු අනික් අත්බවෙක් නැතැ'යි ද දැනගණී.

88. කාශ්‍යපය, යම්සේ පර්වත මස්තකයෙක පිරිසුදු, විප්‍රසන්න, නොකැලඹුනු, දිය විලක් වේ ද, එහි ඉවුරේ ඇස් ඇති පුරුෂයෙක් සිටියේ සිප්පිබෙල්ලන් හා සක්බෙල්ලන් ද, කැටකැබලිති ද, එහා මෙහා යන්නාවූ හා නැවති සිටින මසුන් රැන් ද, හැසිරෙන්නවුන් ද, නැවති තිබෙන දෑද දක්නේ ද, ඔහුට මෙසේ සිතෙන්නේය: 'මේ දිය විල පිරිසුදුය, අතිශයින් ප්‍රසන්නය, නොකැලඹුනේය. එහි මේ සිප්පි බෙල්ලන් හා සක් බෙල්ලන් ද, කැටකැබලිති ද, මසුන් රැන් ද හැසිරෙත්, නැවති සිටිත්ය' කියායි. කාශ්‍යපය, එලෙසින් ම භික්‍ෂුව මෙසේ සිත එකඟ වූ කල්හි, —පෙ— ආශ්‍රවක්‍ෂයඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට නමයි. හේ තෙමේ මේ දුකයයි තතු ලෙස දැනගණී, —පෙ— මේ ආශ්‍රවනිරොධගාමී ප්‍රතිපදාවයයි තතු ලෙස දැනගණී.

මෙසේ දක්නා, මෙසේ දන්නා ඔහුගේ සිත කාමාශ්‍රවයන් කෙරෙන් ද, භවාශ්‍රවයන් කෙරෙන් ද මිදේ, අවිද්‍යාශ්‍රවයන් කෙරෙන්ද සිත මිදේ. මිදුනු කල්හි 'මිදුනේය' යන සිත වෙයි. 'ජාතිය ක්‍ෂය වීය, බ්‍රහමචයර්‍යය වැස නිමවන ලදී, කටයුතු කරණ ලදී, මේ අත්බැවින් පසු අනික් අත්බවෙක් නැතැ'යි ද දැනගණී. මෙ ද ඔහුගේ ප්‍රඥාසම්පත්ත පිණිස වේ. කාශ්‍යපය, මේ වනාහි ප්‍රඥාසම්පත්තිය යි.

ඉමාය ච කස්සප සීලසම්පදාය චිත්තසම්පදාය පඤ්ඤාසම්පදාය අඤ්ඤා සීලසම්පදා චිත්තසම්පදා පඤ්ඤාසම්පදා උත්තරිතරා වා පණීතතරා වා නත්ථි.

89. සන්ති කස්සප එකෙ සමණබ්‍රාහ්මණා සීලවාදා. තෙ අනෙකපරියායෙන සීලස්ස වණ්ණං[1] භාසන්ති. යාවතා කස්සප අරියං පරමං සීලං නාහං තත්ථ අත්තනො සමසමං සමනුපස්සාමි කුතො භිය්‍යො[2]? අථ ඛො අහමෙව තත්ථ භිය්‍යො[2] යදිදං අධිසීලං.

සන්ති කස්සප එකෙ සමණබ්‍රාහ්මණා තපොජිගුච්ඡාවාදා[3] තෙ අනෙකපරියායෙන තපොජිගුච්ඡාය වණ්ණං භාසන්ති. යාවතා කස්සප අරියා පරමා තපොජිගුච්ඡා නාහං තත්ථ අත්තනො සමසමං සමනුපස්සාමි කුතො භිය්‍යො? අථ ඛො අහමෙව තත්ථ භිය්‍යො[2] යදිදං අධිජෙගුච්ඡං.

සන්ති කස්සප එකෙ සමණබ්‍රාහ්මණා පඤ්ඤාවාදා. තෙ අනෙකපරියායෙන පඤ්ඤාය වණ්ණං භාසන්ති. යාවතා කස්සප අරියා පරමා පඤ්ඤා නාහං තත්ථ අත්තනො සමසමං සමනුපස්සාමි කුතො භිය්‍යො? අථ ඛො අහමෙව තත්ථ භිය්‍යො යදිදං අධිපඤ්ඤා[4].

සන්ති කස්සප එකෙ සමණබ්‍රාහ්මණා විමුත්තිවාදා. තෙ අනෙකපරියායෙන විමුත්තියා වණ්ණං භාසන්ති. යාවතා කස්සප අරියා පරමා විමුත්ති නාහං තත්ථ අත්තනො සමසමං සමනුපස්සාමි කුතො භිය්‍යො? අථ ඛො අහමෙව තත්ථ භිය්‍යො යදිදං අධිමුත්ති[5].

---

1. සීලවණ්ණං S.
2. භීය්‍යො P. W. (සබ්බත්ථ)
3. °ජිගුච්ඡ° S.
4. °පඤ්ඤං B.
5. අධිවිමුත්ති B. V.

කාශ්‍යපය, මේ ශීලසම්පත්තියටද මේ චිත්ත සම්පත්තියටද, මේ ප්‍රඥාසම්පත්තියටද අතිශයින් උතුම්වූ හෝ අතිශයින් උත්කෘෂ්ටවූ හෝ අන්‍ය ශීලසම්පත්තියක්ද චිත්තසම්පත්තියක්ද ප්‍රඥාසම්පත්තියක්ද නැත්තේය.

89. කාශ්‍යපය, ශීලවාදීවූ සමහර මහණබමුණු කෙනෙක් වෙති. ඔවුහු නොයෙක් කාරණයෙන් ශීලයෙහි ගුණ කියත්. කාශ්‍යපය, යම් පමණ (ආයසීවූ) නිරුපක්ලේශීවූ, උතුම්වූ ශීලයෙක් වේද, ඒ ශීලගුණයෙන මට සමවූවෙකු නොදක් නෙමි, ඉන් වැඩිවූවෙක් කොයින් වේද? එසේ වූ යම් මේ අධිශීලයක් හෙවත් උත්තම ශීලයක් වේද, ඒ ශීලයෙහි මම ම උතුම් වෙමි.

කාශ්‍යපය, තපස හෙවත් කෙලෙස් තැවීමෙන් කෙලෙශයන්ට ගරහන්නාවූ සමහර මහණ බමුණු කෙනෙක් ඇත්තාහ. ඔවුහු නොයෙක් කාරණයෙන් කෙලෙස් තැවීම් කෙලෙස් ගැරහීමෙහි ගුණ කියත්. කාශ්‍යපය, යම් පමණ නිර්දෝෂවූද උතුම්වූද කෙලෙස් තැවීම් හා කෙලෙස් ගැරහීම් වෙත්ද, මම ඒ පිළිබඳව මට සමයක්හු නොදක්නෙමි. (මට වඩා) උතුම් වූවෙක් කොයින් වේද? එසේවූ, යම් ඒ උත්කෘෂ්ටවූ තපොජිගුච්ඡාවක් (තපසින් කෙලෙස් ගැරහීමක්) වේද, මම ම එහි උතුම්වූයේ වෙමි.

කාශ්‍යපය, ප්‍රඥාවාදීවූ සමහර මහණ බමුණු කෙනෙක් ඇත්තාහ. ඔවුහු නොයෙක් කාරණයෙන් (සම්මසස්සනා — විපස්සනා සඞ්ඛ්‍යාතවූ) ප්‍රඥායෙහි ගුණ කියත්. කාශ්‍යපය, යම් පමණ (මාර්ගඵල සම්ප්‍රයුක්ත) නිකෙලශීවූ උතුම්වූ ප්‍රඥාවක් වේද, ඒ ප්‍රඥාවෙහි මට සමවූවෙකු නොදක්නෙමි. (මට වඩා) උතුම් වූවෙක් කොයින් වේද? එසේ කල, (මාර්ගඵල සම්ප්‍රයුක්ත) යම් අධිප්‍රඥාවෙක් වේද, එහි මම ම උතුම් දුයේ වෙමි.

කාශ්‍යපය, (තදඞ්ග — විෂ්කම්භන) විමුක්තිවාදීවූ සමහර මහණ බමුණු කෙනෙක් ඇත. ඔවුහු නොයෙක් අයුරින් විමුක්තියෙහි ගුණ කියත්. කාශ්‍යපය, යම් පමණ නිර්දොෂවූ උතුම්වූ, විමුක්තියක් වේද, ඒ විමුක්තියෙන් මට සමවූවක්හු නොදක්නෙමි. (මට වඩා) උතුම් වූවෙක් කොයින් වේද? එසේ කල, යම් අධිමුක්තියක් වේද, එහි මම ම උතුම්වූයේ වෙමි.

90. ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං: සීහනාදං ඛො සමණො ගොතමො නදති තඤ්ච ඛො සුඤ්ඤාගාරෙ නදති නො පරිසාසූති. තෙ මාහෙවන්තිස්සු[1] වචනීයා. සීහනාදඤ්ච සමණො ගොතමො නදති පරිසාසු ච නදතීති — එවමස්සු කස්සප වචනීයා.

ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං: සීහනාදඤ්ච සමණො ගොතමො නදති පරිසාසු ච නදති නො ච ඛො විසාරදො නදතීති. තෙ මාහෙවන්තිස්සු වචනීයා. සීහනාදඤ්ච සමණො ගොතමො නදති පරිසාසු ච නදති විසාරදො ච නදතීති—එවමස්සු කස්සප වචනීයා.

91. ඨානං ඛො පනෙතං කස්සප විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං: සීහනාදඤ්ච සමණො ගොතමො නදති පරිසාසු ච නදති විසාරදො ච නදති නො ච ඛො නං පඤ්හං පුච්ඡන්ති —පෙ— පඤ්හඤ්ච නං පුච්ඡන්ති නො ච ඛො නෙසං පඤ්හං පුට්ඨො බ්‍යාකරොති—පෙ—පඤ්හඤ්ච නෙසං පුට්ඨො බ්‍යාකරොති නො ච ඛො පඤ්හස්ස වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙති —පෙ— පඤ්හස්ස ච වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙති නො ච ඛො සොතබ්බං මඤ්ඤන්ති. —පෙ— සොතබ්බඤ්චස්ස මඤ්ඤන්ති නො ච ඛො සුත්වා චස්ස පසීදන්ති —පෙ— සුත්වා චස්ස පසීදන්ති —පෙ— නො ච ඛො[2] පසන්නා පසන්නාකාරං කරොන්ති —පෙ— පසන්නා[3] ච පසන්නාකාරං ච[4] කරොන්ති නො ච ඛො තථත්තාය පටිපජ්ජන්ති —පෙ— තථත්තාය ච පටිපජ්ජන්ති නො ච ඛො පටිපන්නා ආරාධෙන්තීති.

1. මෙවන්ති අස්සු P. W.
2. අයං පන ඡෙදො සබ්බෙසු යෙව පොත්ථකෙසු ව්‍යාකුලො ව දිස්සති.
3. පසන්නා ති නත්ථි B. V.
4. චකාරො නත්ථි P. W..

90. කාශ්‍යපය, මෙබඳු කරුණක් ඇත. (එනම්:) 'ගෞතම ශ්‍රමණතෙම අභීතවූ සිංහනාද කෙරෙයි, ඒ නාදයද ජනශූන්‍ය ස්ථානයෙහි හෙවත් හුදකලාව ඉඳ කෙරෙයි, (අටවැදෑරුම්) පිරිස් මැද නොකෙරේය'යි අන්‍යතීර්ථක පරිව්‍රාජකයෝ (අන්තොටු පිරිවැජ්ජෝ) මෙසේ කියන්නාහුය. ඒ එසේ නොවේයයි ඔවුන්ට කිය යුතුය. කාශ්‍යපය, 'ගෞතම ශ්‍රමණ තෙම අභීතවූ සිංහනාද ද කෙරෙයි, (අටවැදෑරුම්) පිරිස් මැද ද නාද කෙරේය'යි ඔවුන්ට දත්විය යුතුයි.

කාශ්‍යපය, (තවත්) කාරුණෙක් ඇත. (එනම්:) 'ගෞතම ශ්‍රමණ තෙම සිංහනාද ද කෙරෙයි, (අටවැදෑරුම්) පිරිස්හි ද නාද කෙරෙයි, එහෙත් විසාරදව නාද නොකෙරේය'යි අන්‍යතීර්ථක පරිව්‍රාජකයෝ කියන්නාහුය. එසේ කල්හි 'ඒ එසේ නොවේය'යි ඔවුන්ට දත්විය යුතුයි. කාශ්‍යපය, 'ගෞතම ශ්‍රමණතෙම අභීතවූ සිංහනාද ද කෙරෙයි, (අටවැදෑරුම්) පිරිස්හිද නාද කෙරෙයි, විසාරදව (නිර්භීතව)ද නාද කෙරේය'යි (ඔවුන්ට) කිය යුතුයි.

91. කාශ්‍යපය, (තවත්) කාරුණෙක් ඇත. (එනම්:- අන්‍යතීර්ථක පරිව්‍රාජකයෝ මෙසේ කියත්: 'ගෞතම ශ්‍රමණ තෙම අභීතවූ සිංහනාද ද කෙරෙයි, (අටවිධ) පිරිස්හිද නාද කෙරෙයි, විසාරදව ද නාද කෙරෙයි, ඒ ගෞතම ශ්‍රමණයන් අතින් (පණ්ඩිත දිව්‍ය මනුෂ්‍යයෝ) ප්‍රශ්න නොවිචාරත්—පෙ—ඒ ගෞතම ශ්‍රමණයන්ගෙන් (පණ්ඩිත දිව්‍ය මනුෂ්‍යයෝ) ප්‍රශ්නද විචාරත්. ඔවුන් විසින් ප්‍රශ්න විචාරණ ලද්දේ හෝ නො විසඳයි. —පෙ— ඔවුන් විසින් ප්‍රශ්න විචාරණ ලද්දේ විසඳයි. ප්‍රශ්න විසඳීමෙන් සිත් නොගණී. —පෙ— ප්‍රශ්න විසඳීමෙන් සිත් ගැණීම ද කෙරෙයි. මොහුගේ වචන ඇසිය යුතුයයි නොහඟිත්. —පෙ— මොහුගේ වචන ඇසිය යුතුයයි ද හඟිත්, අසා නොපහදිත්. —පෙ— අසා ද පහදිත්. පහන් ආකාරයක් නොදක්වත්.—පෙ— පහන් ආකාරයක්ද කෙරෙත්. දෙසූ ධර්මය ප්‍රතිපත්ති පූරණය පිණිස පිළිනොපදිත්. —පෙ— දෙසූ ධර්මය අනුව පිළිපැදීමද කෙරෙත්. දෙසූ ධර්මයෙසේ පිළිපදින්නාහු (ගෞතම ශ්‍රමණයන් ගේ) සිත් නොගණිති (කියති).[1]

1. උප ග්‍රන්ථය බලනු.

තෙ මාහෙවන්තිස්සු වචනීයා. සීහනාදඤ්ච සමණො ගොතමො නදති පරිසාසු ච නදති විසාරදො ච නදති පඤ්හඤ්ච නං පුච්ඡන්ති පඤ්හඤ්ච නෙසං පුට්ඨො බ්‍යාකරොති පඤ්හස්ස ච[1] වෙය්‍යාකරණෙන චිත්තං ආරාධෙති සොතබ්බඤ්චස්ස මඤ්ඤන්ති සුත්වා චස්ස[2] පසීදන්ති පසන්නා ච පසන්නාකාරං කරොන්ති තථත්තාය ච පටිපජ්ජන්ති පටිපන්නා ච ආරාධෙන්තීති එවමස්සු කස්සප වචනීයා.

92. එකමිදාහං කස්සප සමයං රාජගහෙ විහරාමි ගිජ්ඣකූටෙ පබ්බතෙ. තත්‍ර මං අඤ්ඤතරො තපබ්‍රහ්මචාරී[3] නිග්‍රොධො නාම[4] අධිජෙගුච්ඡෙ පඤ්හං පුච්ඡි[5]. තස්සාහං අධිජෙගුච්ඡෙ පඤ්හං පුට්ඨො බ්‍යාකාසිං[6]. බ්‍යාකතෙ[6] ච පන මෙ අත්තමනො අහොසි පරං විය මත්තායාති.

93. කො හි භන්තෙ භගවතො ධම්මං සුත්වා න අත්තමනො අස්ස පරං විය මත්තාය? අහම්පි[7] භන්තෙ භගවතො ධම්මං සුත්වා අත්තමනො පරං විය මත්තාය. අභික්කන්තං භන්තෙ අභික්කන්තං භන්තෙ. සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං[8] වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති[9] — එවමෙව[10] භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො.[11] එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. ලභෙය්‍යාහං භන්තෙ භගවතො සන්තිකෙ පබ්බජ්ජං ලභෙය්‍යං උපසම්පදන්ති.

---

1. චකාරො නත්ථි S.
2. සුත්වා ච ප° P.
3. තපසබ්‍ර° P; තපො° W.; තෙසබ්‍ර°. Pa. S. වෙසබ්‍ර°; සබ්‍ර° Pa.
4. නාම පරිබ්බාජකො අධි° S.
5. අපුච්ඡි B. V.
6. ව්‍යා° P. W.
7. අහං පි හි B.
8. නිකු° B.
9. දක්ඛන්තීති V. දක්ඛන්ති B. S.
10. එවමෙවං P. W.
11. දෙසිතො S.

‘ඒ එසේ නොකියයුතුය’යි ඔවුන්ට දත්විය යුතු. ‘ගෞතම ශ්‍රමණ තෙම අභීතවූ සිංහනාද ද කෙරෙයි, (අෂ්ටවිධ) පර්ෂත්හිද නාද කෙරෙයි, විසාරදවද නාද කෙරෙයි, ඒ ගෞතම ශ්‍රමණයන් අතින් පණ්ඩිත දිව්‍ය මනුෂ්‍යයෝ ප්‍රශ්නද විචාරත්. ඔවුන් විසින් ප්‍රශ්න විචාරණ ලද්දේ හෝ ප්‍රශ්න විසඳීමද කෙරෙයි. ප්‍රශ්න විසඳීමෙන් සිත් ගැණීමද කෙරෙයි. මොහුගේ වචන ඇසිය යුතුයයි ද හඟිත්; අසාද පහදිත්; පහන් ආකාරද දක්වත්; දෙසූ ධර්මය අනුව පිළිපදිත්. දෙසූ ධර්මය අනුව පිළිපදින්නාහු ගෞතම ශ්‍රමණයන්ගේ සිත් ගණිත්’ යි කාශ්‍යපය, මෙසේ ඔවුන්ට කියයුත්තේය.

92. කාශ්‍යපය, මම එක් කාලයෙක්හි මෙහි රජගහ නුවර සමීපයෙහිවූ ගිජුකුළු පර්වතෙහි විසුයෙමි. එහි නිග්‍රොධ නම්වූ තපෝ බ්‍රහ්මචාරියෙක් (බඹසර රකින තවුසෙක්) අධිජේගුච්ඡ වීය්‍යීයෙහි (උග්‍රතපස පිළිබඳව) මා ප්‍රශ්න විචාළේය. ඔහු විසින් අධිජේගුච්ඡ වීය්‍යීයෙහි ප්‍රශ්න විචාරණ ලද්දවූ මම ඒ විසඳුයෙමි. මා විසින් විසඳනුලැබූ කල්හි හේ මා කෙරෙහි ඉතා මහත්සේ සතුටු සිත් ඇත්තේ වූයේය.

93. සවාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා කවරෙක් නම් ඉතා මහත්සේ සතුටු සිත් ඇත්තේ නොවන්නේද? සවාමීනි, මමද භාග්‍යවතුන් වහන්සේගේ ධර්මය අසා ඉතා බොහෝසේ සතුටු සිත් ඇත්තෙක් වීමි. සවාමීනි, දම් දෙසුම ඉතා මැනව, සවාමීනි, ඒ ඉතා මැනව. සවාමීනි, යටිකුරු කරණ ලද්දක් උඩුකුරු කරන්නේ හෝ වසන ලද්දක් විවෘත කරන්නේ හෝ මංමුලාවූවෙකුට මාර්ගය කියන්නේ, හෝ ‘ඇස් ඇත්තෝ රූපයන් දකිත්වා’යි අඳුරෙහි තෙල් පහනක් දරන්නේ හෝ යම්සේද, එපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් කාරණයෙන් ධර්මය ප්‍රකාශ කරණ ලද්දේය. සවාමීනි, ඒ මම භාග්‍යවතුන් වහන්සේද ධර්මයද භික්ෂුසංඝයාද සරණකොට යමි. සවාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගේ සමීප යෙහි පැවිද්ද ලබන්නෙමි. උපසම්පදාවද ලබන්නෙමි” (යි කාශ්‍යපතෙම සැලකෙළේය).

94. යො ඛො කස්සප අඤ්ඤතිත්ථියපුබ්බො ඉමස්මිං ධම්ම-විනයෙ ආකඞ්ඛති පබ්බජ්ජං[1] ආකඞ්ඛති උපසම්පදං සො චත්තාරො මාසෙ පරිවසති චතුන්නං මාසානං අච්චයෙන අරද්ධචිත්තා භික්ඛූ පබ්බාජෙන්ති උපසම්පාදෙන්ති භික්ඛුභාවාය. අපි ච මෙත්ථ[2] පුග්ගලවෙමත්තතා විදිතාති.

සචෙ භන්තෙ අඤ්ඤතිත්ථියපුබ්බා[3] ඉමස්මිං ධම්මවිනයෙ ආකඞ්ඛන්තා[4] පබ්බජ්ජං ආකඞ්ඛන්තා උපසම්පදං චත්තාරො මාසෙ පරිවසන්ති[5] චතුන්නං මාසානං අච්චයෙන ආරද්ධචිත්තා භික්ඛූ පබ්බාජෙන්ති උපසම්පාදෙන්ති භික්ඛුභාවාය අහං චත්තාරි වස්සානි පරිවසිස්සාමි චතුන්නං වස්සානං අච්චයෙන ආරද්ධචිත්තා භික්ඛූ පබ්බාජෙන්තු උපසම්පාදෙන්තු භික්ඛුභාවායාති.

95. අලත්ථ ඛො අචෙලො කස්සපො භගවතො සන්තිකෙ පබ්බජ්ජං අලත්ථූපසම්පදං. අචිරූපසම්පන්නො ඛො පනායස්මා කස්සපො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං බ්‍රහ්මචරියපරියො-සානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ච[6] ඛො පනායස්මා කස්සපො අරහතං අහොසීති.

කස්සපසීහනාද සුත්තං[7] නිට්ඨිතං අට්ඨමං.

---

1. පබ්බජං P.
2. අපි චෙත්ථ W.
3. °පුබ්බො S.
4. ආකඞ්ඛන්ති B.V. ආකඞ්ඛති S.
5. °වසති S.
6. ච කාරෙ නත්ථි B. V.
7. මහා සීහනාද° B. V. °සුත්තන්ත P. නි° අ° ති න දිස්සති P. W.

94. කාශ්‍යපය, කලින් අන්‍යතීර්ථිකව සිටි යමෙක් මේ ශාසනයෙහි පැවිද්ද කැමැතිවේද, උපසම්පදාව කැමැතිවේද හෙතෙම සාරමසක් පිරිවෙස් කෙරේ (පරීක්‍ෂාකළ යුත්තේ වේ). සාරමසක්හුගේ ඇවෑමෙන් ඔහු කෙරෙහි සතුටුවූ භික්‍ෂූහු ඔහු පැවිදි කෙරෙත්. භික්‍ෂුභාවය පිණිස උපසම්පදා කෙරෙත්. එතකුදුවුවත් මෙහි පුද්ගල නානත්වය (ඒ ඒ පුද්ගලයන් කෙරෙහි විශෙෂයක් දක්විය යුතු බව) මවිසින් දන්නාලද්දේය (හි වදාළසේක).

ස්වාමීනි, ඉදින් පළමු අන්‍යතීර්ථකවූවෝ මේ සාසනයෙහි පැවිද්ද කැමැති වෙත්ද, උපසම්පදාව කැමැති වෙත්ද, ඔහුතුමූ සාරමසක් පිරිවෙස් කෙරෙත්ද, සාරමසක්හුගේ ඇවෑමෙන් සතුටු කරණ ලද සිත්ඇති භික්‍ෂූහු ඔහු පැවිදි කෙරෙත්ද, භික්‍ෂුභාවය පිණිස උපසම්පදාව කෙරෙත්ද, මම සිව්වසක් පිරිවෙස් කරමි. සිව් වසක්හුගේ ඇවෑමෙන් සතුටු කරණලද භික්‍ෂූහු මා පැවිදි කෙරෙත්වා! භික්‍ෂුභාවය පිණිස උපසම්පදා කෙරෙත්වා (හි කීයේය).

95. අචෙල කාශ්‍යපතෙම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි ප්‍රව්‍රජ්‍යාව ලැබුයේමය, උපසම්පදාවද ලැබුයේමය. උපසම්පදාවූ නොබෝකල් ඇති ආයුෂමත් කාශ්‍යප තෙම හුදකලාවූයේ, සමූහයාගෙන් තොරවූයේ, අප්‍රමාදවූයේ, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ, හරණලද ආත්මාලය ඇතිව වාසය කරන්නේ, යමක් (යම් යහපතක්) සඳහා කුලපුත්‍රයෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි මනාකොට පැවිදිවෙත්ද, බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි කෙළවරවූ, නිරුත්තරවූ ඒ අර්හත්වය නොබෝ කලකින්ම තෙමේම ඉහාත්මයෙහි විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂකොට ඊට පැමිණ වාසය කෙළේය. "ජාතිය ක්‍ෂයවීය, (මාර්ග) බ්‍රහ්මචරියාව වැස නිමවන ලද්දේය, (සියලු) කටයුතු කොට නිමවන ලද්දේය, මේ භවයෙන් පසු අනිකක් නැත්තේය" යි (හෙතෙම ප්‍රත්‍යක්‍ෂ ලෙස) දත්තේය. ආයුෂමත් කාශ්‍යප තෙම රහතන්වහන්සේලා අතරෙහි කෙනෙක් වූයේය (රහත්බව ලැබීය).

අටවෙනිවූ කස්සප සීහනාද සූත්‍රය නිමියේය.

පොට්ඨපාදසුත්තං.

1. එවං මෙ සුතං. එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන පොට්ඨපාදො පරිබ්බාජකො සමයප්පවාදකෙ තින්දුකාචීරෙ[1] එකසාලකෙ මල්ලිකාය[2] ආරාමෙ පටිවසති මහතියා පරිබ්බාජකපරිසාය සද්ධිං තිංසමත්තෙහි[3] පරිබ්බාජකසතෙහි.

2. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය[4] සාවත්ථිං පිණ්ඩාය පාවිසි. අථ ඛො භගවතො එතදහොසි: අතිප්පගො ඛො තාව සාවත්ථියං පිණ්ඩාය චරිතුං යන්නූනාහං යෙන[5] සමයප්පවාදකො තින්දුකාචීරො එකසාලකො මල්ලිකාය[6] ආරාමො යෙන පොට්ඨපාදො පරිබ්බාජකො තෙනුපසඞ්කමෙය්‍යන්ති. අථ ඛො භගවා යෙන සමයප්පවාදකො තින්දුකාචීරො එකසාලකො මල්ලිකාය[6] ආරාමො තෙනුපසඞ්කමි.

3. තෙන ඛො පන සමයෙන පොට්ඨපාදො පරිබ්බාජකො මහතියා පරිබ්බාජකපරිසාය සද්ධිං නිසින්නො හොති උන්නාදිනියා උච්චාසද්දමහාසද්දාය අනෙකවිහිතං තිරච්ඡානකථං කථෙන්තියා සෙය්‍යථීදං[7] රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං[8] ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං [පුරිසකථං][9] සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං ඉති වා[10] ඉති.

---

1. තින්දුකා° V.; තිණ්ඩුකා° S. Pa.
2. මල්ලිකාරාමෙ S.
3. තිමත්තෙහි P.
4. °චීවරං ආදය B.
5. යෙනාති නත්ථි V.
6. මල්ලිකාරාමො S. B.
7. සෙය්‍යථිදං B. V. S.
8. ගන්ධකථං මාලාකථං V.
9. පුරිසකථං ති නත්ථි P. W.
10. ඉතීති න දිස්සති B. V. S.

9. පොට්ඨපාද සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ ජේතවන නම් උයනෙහි අනේපිඩු මහසිටුහු විසින් කරවන ලද අරමෙහි වැඩ වෙසෙනසේක. එසමයෙහි පොට්ඨපාද නම් පරිබ්‍රාජක තෙම (බමුණු-නිගණ්ඨ ආදීන් එක් රැස්ව තම තමන් ගත් සමයයන් පවසන බැවින්) සමයප්‍රවාදක නම් වූ, (තිඹිරිරුක් පෙළින් වට වූ හෙයින්) තින්දුකාචීර නම් වූ, (පසුව බොහෝ ශාලා වුවද පළමු එකම ශාලාවක් වූ හෙයින්) එකශාලක නම් වූ කෝසල මල්ලිකාවගේ උයනෙහි හෙවත් මල්ලිකාරාමයෙහි තුන් දහසක් පිරිවැජියන් ඇති මහත් පිරිවැජි පිරිස සමග වාසය කෙරේ.

2. ඉක්බිති (දිනක්) පෙරවරුයෙහි භාග්‍යවතුන් වහන්සේ හැඳ පොරවා පාසිවුරු දරා සැවැත්නුවරට පිඩු පිණිස පිවිසි සේක. එවිට භාග්‍යවතුන්ට මෙබඳු අදහසක් ඇතිවිය: ‘තවම සැවැත්හි පිඩු පිණිස හැසිරීමට කල් වැඩිය. එබැවින් යම් තැනෙක්හි පොට්ඨපාද පරිබ්‍රාජකයා වේද, ඒ සමයප්‍රවාදක-තින්දුකාචීර-එකශාලක මල්ලිකාරාමයට එළඹෙන්නෙම් නම් ඉතා මැනව’ (කියාහ). ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සමය ප්‍රවාදක-තින්දුකාචීර-එකශාලක මල්ලිකාරාමයට එළඹි සේක.

3. එවේලෙහි පොට්ඨපාද පරිබ්‍රාජක තෙම උස්මහත් හඬින් උසස් කොට නාද කරන්නාවූ, නානාවිධ තිරශ්චීන කථා කියන්නාවූ මහත් පරිබ්‍රාජක පිරිස සමග හුන්නේ වේ. ඒ කථා නම්:- රාජ කථාය, චෞර කථාය, මහාමාත්‍ර කථාය, සේනා කථාය, භය කථාය, යුද්ධ කථාය, අන්න කථාය, පාන කථාය, වස්ත්‍රකථාය, ශයන කථාය, මාලාකථාය, ගන්ධකථාය, ඥාතිකථාය, යාන කථාය, ග්‍රාම කථාය, නිගම කථාය, නගර කථාය, ජනපද කථාය, ස්ත්‍රී කථාය, පුරුෂ කථාය, ශූර කථාය, වීථි කථාය, කුම්භස්ථාන කථාය, පූර්වප්‍රේත කථාය, නානාත්ව කථාය, ලෝකාඛ්‍යායිකකථාය, සමුද්‍රාඛ්‍යායිකකථාය, ඉතිභවාභව කථාය යන මොහුයි.[1]

---

1. උපග්‍රන්ථය බලනු.

4. අද්දසා[1] ඛො පොට්ඨපාදො පරිබ්බාජකො භගවන්තං දූරතොව ආගච්ඡන්තං. දිස්වාන[2] සකං[3] පරිසං සණ්ඨපෙසි:[4] අප්පසද්දා භොන්තො හොන්තු මා භොන්තො සද්දමකත්ථ. අයං සමණො ගොතමො ආගච්ඡති අප්පසද්දකාමො ඛො සො[5] ආයස්මා අප්පසද්දස්ස වණ්ණවාදී. අප්පෙව නාම අප්පසද්දං පරිසං විදිත්වා උපසඞ්කමිතබ්බං මඤ්ඤෙය්‍යාති. එවං වුත්තෙ තෙ පරිබ්බාජකා තුණ්හී අහෙසුං.

5. අථ ඛො භගවා යෙන පොට්ඨපාදො පරිබ්බාජකො තෙනුපසඞ්කමි. අථ ඛො පොට්ඨපාදො පරිබ්බාජකො භගවන්තං එතදවොච: එතු ඛො භන්තෙ භගවා ස්වාගතං[6] භන්තෙ භගවතො. චිරස්සං ඛො භන්තෙ භගවා ඉමං පරියායමකාසි යදිදං ඉධාගමනාය. නිසීදතු භන්තෙ භගවා ඉදමාසනං පඤ්ඤත්තන්ති.

නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. පොට්ඨපාදොපි[7] ඛො පරිබ්බාජකො අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො පොට්ඨපාදං පරිබ්බාජකං භගවා එතදවොච: කාය නුත්ථ[8] පොට්ඨපාද එතරහි කථාය සන්නිසින්නා කා ච පන වො අන්තරා කථා විප්පකතාති?

6. එවං වුත්තෙ පොට්ඨපාදො පරිබ්බාජකො භගවන්තං එතදවොච: තිට්ඨතෙසා භන්තෙ කථා යාය මයං එතරහි කථාය සන්නිසින්නා. නෙසා භන්තෙ කථා භගවතො දුල්ලභා භවිස්සති පච්ඡාපි සවණාය. පුරිමානි භන්තෙ දිවසානි පුරිමතරානි නානාතිත්ථියානං සමණබ්‍රාහ්මණානං කුතූහලසාලාය[9] සන්නිසින්නානං[10] සන්නිපතිතානං අභිසඤ්ඤානිරොධෙ[11] කථා උදපාදි: කථං නු ඛො භො අභිසඤ්ඤානිරොධො හොතීති?

---

1. අද්දස B. V.
2. දිස්වා P. W.
3. සකපරිසං S.
4. සණ්ඨාපෙසි P. W.
5. සො පන P.W. ඛොපනායස්මා අප්ප° S.
6. සාගතං P. W.
7. පිකාරො නත්ථි P. W.
8. නොත්ථ B. S.
9. කොතූ° B. S. V.
10. නිසින්නානං B.
11. °නිරොධ B. V.

4. පොට්ඨපාද පරිබ්‍රාජක තෙම දුරින්ම වඩනා භාග්‍යවතුන් වහන්සේ දුටුයේය. දැක, "පින්වත්නි! නෑ නොගසවු. නිශශබ්ද වවු. මේ ගෞතම ශ්‍රමණ තෙමේ එයි. ඒ ආයුෂ්මත් තෙමේ නිශ්ශබ්ද භාවය කැමැත්තේ, නිශ්ශබ්දතාව වණිනා කරණ සුලුවූයේ වෙයි. පිරිස නිශශබ්ද වූ බව දැන මෙහි එළඹිය යුතුයැයි සිතත්තේ නම් (සිතා ආවේ නම්) ඉතා යෙහෙසැ"යි කියා සිය පිරිස හික්මවා ලූයේ ය. (පොට්ඨපාද) මෙසේ කී කල්හි ඒ පරිබ්‍රාජකයෝ නිශශබ්ද වූහ.

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පොට්ඨපාද පරිබ්‍රාජකයා යම් තැනෙකද--එතැනට එළඹියේක. එකල්හි පොට්ඨපාද පරිබ්‍රාජක තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකළේය: "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, වඩනා සේක්වා. ඔබවහන්සේගේ මෙහි පැමිණීම ඉතා මැනවි. භාග්‍යවතුන් වහන්සේ මෙහි වැඩිසේක් ඉතා දිඝී කාලයකිනි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මේ අස්න පණවන ලදී, වැඩ හිඳිනා සේක්වා."

පණවන ලද අසුනෙහි භාග්‍යවතුන් වහන්සේ වැඩහුන්සේක. පොට්ඨපාද පරිබ්‍රාජක තෙමේත් එක්තරා පහත් අසුනක් ගෙණ එකත් පසෙක හිඳගත්තේය. එකත්පසෙක හුන්නාවූ පොට්ඨපාද පිරිවැජියාට භාග්‍යවතුන් වහන්සේ, "පොට්ඨපාදය, දැන් මා එන්නාට පළමු දැනමත්හු කිනම් කථාවකින් යුක්තව උන්නාහුද? දැනමතුන් විසින් අතුරෙහි නැවැත්වීමෙන් අඩාල් කරණ ලද්දේ කවර කථාවක්දැ"යි විචාළසේක.

6. මෙසේ විචාළ කල්හි පොට්ඨපාද තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළේය: ස්වාමීනි, දැන් අපි යම් කථාවක් කරමින් හිටියමුනම් ඒ කථාව පසෙක තිබියේවා, පසුවද පින්වතුන් වහන්සේට ඒ කථාව ඇසීම දුලබ නොවන්නේය. (එබැවින් අපට ප්‍රයෝජනවත් වෙන කථාවක් කරමු) ස්වාමීනි, ඉතා පූර්වවූ දවස්හි, පසුගිය කාලයෙහි, ('මෙතෙම කුමක් කියාද', 'මෙතෙම කුමක් කියාදැ'යි ඇසුමට කුහුල් උපදවන කථා පවත්වන බැවින්) කුතුහල නම්වූ ශාලාවෙහි රැස්ව හුන්නාවූ නානා තීර්ථකයන්ගේත්, ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේත් සංඥානිරෝධය වනුයේ කෙසේදැයි කියා (සංඥා නිරෝධය) චිත්තයාගේ ක්‍ෂණික නිරෝධය පිළිබඳ කථාවෙක් උපන.

තත්‍රෙකච්චෙ අහෙතු එවමාහංසු[1]: අප්පච්චයා[2] පුරිසස්ස සඤ්ඤා උප්පජ්ජන්තිපි නිරුජ්ඣන්තිපි. යස්මිං සමයෙ උප්පජ්ජන්ති සඤ්ඤී තස්මිං සමයෙ හොති යස්මිං සමයෙ නිරුජ්ඣන්ති අසඤ්ඤී තස්මිං සමයෙ හොතීති. ඉත්ථෙකෙ අභිසඤ්ඤානිරොධං පඤ්ඤපෙන්ති.[3]

තමඤ්ඤො එවමාහ: න ඛො පන මෙ තං[4] භො එවං භවිස්සති. සඤ්ඤා හි භො පුරිසස්ස අත්තා සා[5] ච ඛො උපෙතිපි අපෙතිපි. යස්මිං සමයෙ උපෙති සඤ්ඤී තස්මිං සමයෙ හොති යස්මිං සමයෙ අපෙති අසඤ්ඤී තස්මිං සමයෙ හොතීති ඉත්ථෙකෙ අභිසඤ්ඤානිරොධං පඤ්ඤපෙන්ති. තමඤ්ඤො එවමාහ: න ඛො පන මෙ තං භො එවං භවිස්සති. සන්ති හි භො සමණබ්‍රාහ්මණා මහිද්ධිකා මහානුභාවා. තෙ ඉමස්ස පුරිසස්ස සඤ්ඤං උපකඩ්ඪන්තිපි අපකඩ්ඪන්තිපි[6]. යස්මිං සමයෙ උපකඩ්ඪන්ති සඤ්ඤී තස්මිං සමයෙ හොති යස්මිං සමයෙ අපකඩ්ඪන්ති අසඤ්ඤී තස්මිං සමයෙ හොතීති. ඉත්ථෙකෙ අභිසඤ්ඤානිරොධං පඤ්ඤපෙන්ති. තමඤ්ඤො එවමාහ: න ඛො පන මෙ තං භො එවං භවිස්සති. සන්ති හි භො දෙවතා[7] මහිද්ධිකා මහානුභාවා. තා[8] ඉමස්ස පුරිසස්ස සඤ්ඤං උපකඩ්ඪන්තිපි අපකඩ්ඪන්තිපි. යස්මිං සමයෙ උපකඩ්ඪන්ති සඤ්ඤී තස්මිං සමයෙ හොති යස්මිං සමයෙ අපකඩ්ඪන්ති අසඤ්ඤී තස්මිං සමයෙ හොතීති. ඉත්ථෙකෙ අභිසඤ්ඤානිරොධං පඤ්ඤපෙන්ති.

තස්ස මය්හං භන්තෙ භගවන්තංයෙව ආරබ්භ සති උදපාදි: අහො නූන භගවා[9] අහො නූන සුගතො යො ඉමෙසං ධම්මානං සුකුසලොති. භගවා[10] භන්තෙ කුසලො භගවා පකතඤ්ඤූ අභිසඤ්ඤානිරොධස්ස. කථං නු ඛො භන්තෙ අභිසඤ්ඤානිරොධො හොතීති?

---

1. එවං ආහංසු B.
2. අපච්චයා P.
3. පඤ්ඤ° P. W. (සබ්බත්ථ)
4. න ඛො නාමෙතං P. W. (සබ්බත්ථ)
5. සො S.
6. උපක්ක° අපක්ක° S. (සබ්බත්ථ)
7. දෙවා S.
8. තෙ S.
9. භගවා සුගතො W.
10. භ°... කුසලො ති නත්ථි P.W.

එහිලා කෙණෙක් මෙසේ කිහ: "හෙතු ප්‍රත්‍යය රහිතවම සංඥාව (සිත) උපදනේත් වේ, නිරුද්ධ වනුයේත් වේ. යම් කලෙක සංඥාවෝ උපදිත්ද, එකල්හි පුරුෂයා සංඥී (සංඥාව ඇත්තේ) වේ. යම් කලෙක සංඥාවෝ නිරුද්ධ වෙත්ද, එකල්හි පුරුෂයා අසංඥී (සංඥාව නැත්තේ) වේ." සමහරු මෙසේ සංඥා නිරෝධය දක්වත්.

ඔහුට අනෙකෙක් මෙසේ කියයි: "පින්වත, මෙකරුණ මෙසේ නොවේ. සංඥාව වනාහි පුරුෂයාගේ ආත්මයයි. එද වනාහි (පුරුෂයා කරා) එළඹෙත්තේත් (ඔහු කෙරෙන්) පහවත්තේත් වේ. යම් විටක එළඹේ ද එවිට (පුරුෂයා) සංඥී වේ, යම් විටක පහවේද එවිට (පුරුෂයා) අසංඥී වේ,"යි මෙසේ කෙණෙක් සංඥා නිරෝධය පණවති. ඔහුට අනෙකෙක් මෙසේ කියයි: "මෙකරුණ මෙසේ නොවෙයි. පින්වත, (ලෝකයෙහි) මහත් සෘද්ධ්‍යනුභාව ඇති මහණ බමුණෝ ඇත්තාහ. ඔවුහු සංඥාව පුරුෂයාගේ ඇතුළතට අදිත්නෝත් පිටතට අදිත්නෝත් වෙති. යම් කලෙක ඇතුළතට අදිත්ද, එකල්හි (පුරුෂ තෙම) සංඥී වේ, යම් කලෙක පිටතට අදිත්ද එකල්හි (පුරුෂ තෙම) අසංඥී වේ,"යි කෙණෙක් මෙසේ සංඥා නිරෝධය පණවති. ඔහුට අනෙකෙක් මෙසේ කියයි: "පින්වත, මේ කාරණය මෙසේ නොවේ. ලෝකයෙහි මහත් සෘද්ධ්‍යනුභාව සහිත දෙවියෝ ඇත්තාහ. ඔවුහු සංඥාව පුරුෂයාගේ ඇතුළතටද අදිත්. පිටතට ද අදිත්. යම් කලෙක ඇතුළතට අදිත් ද; එකල්හි (පුරුෂ තෙම) සංඥී වේ; යම් කලෙක පිටතට අදිත් ද, එකල්හි (පුරුෂ තෙම) අසංඥී වේ"යි කෙණෙක් මෙලෙස සංඥා නිරෝධය පණවති.

එවේලෙහි, 'යමෙක් මේ (සිත පිළිබඳ නිරෝධ) ධර්ම විෂයයෙහි ඉතාමත් දක්‍ෂයා වේද, අහෝ ඒ භාග්‍යවත් සුගතයන් වහන්සේ මෙහි ඇත්නම්!' කියා භාග්‍යවතුන් වහන්සේම අරබයා මට සිහි උපන (ඔබ වහන්සේ මට මතක් විය). භාග්‍යවතුන් වහන්සේ පියවිත්ම සංඥා නිරෝධ කථාව දන්නා සේක· (එබැවින් වදාළ මැනවි). ස්වාමීනි, කෙසේ නම් සංඥා නිරෝධය වේද?

7. තත්‍ර පොට්ඨපාද යෙ තෙ සමණබ්‍රාහ්මණා එවමාහංසු: අහෙතූ අප්පච්චයා පුරිසස්ස සඤ්ඤා උප්පජ්ජන්තිපි[1] නිරුජ්ඣන්තිපීති[2] ආදිතො[3] ව තෙසං අපරද්ධං. තං කිස්ස හෙතු? සහෙතූ හි පොට්ඨපාද සප්පච්චයා පුරිසස්ස සඤ්ඤා උප්පජ්ජන්තිපි[1] නිරුජ්ඣන්තිපි[2]. සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජන්ති[1] සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣන්ති[2].

8. කා ච සික්ඛාති භගවා අවොච:

ඉධ පොට්ඨපාද තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි[4] සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා.[5] සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති.

9. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ[6] පච්චාජාතො.[7] සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසංචික්ඛති: සම්බාධො ඝරාවාසො රජොපථො[8] අබ්භොකාසො පබ්බජ්ජා.

---

1. උප්පජ්ජති B. V. උප්පජ්ජතිපි S.
2. නිරුජ්ඣති B. V. නිරුජ්ඣතිපි S.
3. ආදිසො P.
4. °සාරථි B. S.
5. භගවාති S.
6. අඤ්ඤතරස්මිං වා පච්චා° W.
7. පච්ජා° S; පච්චා Sa.
8. රජාපථො S. C. රජො° Sa.

7. පොට්ඨපාදය, මෙහිලා යම් ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් 'හේතු-ප්‍රත්‍යය රහිතවම පුරුෂයාගේ සංඥා උපදී. හේතු-ප්‍රත්‍යය රහිතවම පුරුෂයාගේ සංඥා නවතිත්'යයි මෙසේ කිවාහුද, ඔවුන්ට පටන් ගැන්මෙහිම වැරදුනේය. එට හේතු කවරේද? පොට්ඨපාදය, හේතු-ප්‍රත්‍යය සහිතවම පුරුෂයාගේ සංඥා උපදිනුයේත් නිරුද්ධ වනුයේත් වේ. ශික්ෂාහේතුයෙන් ඇතැම් සංඥාවෝ උපදිත්, ශික්ෂාහේතුයෙන් ඇතැම් සංඥාවෝ නිරුද්ධ වෙත්.

8. එහි 'ශික්ෂා' නම් කවරිදයත්: භාග්‍යවතුන් වහන්සේ මෙසේ විදළ සේක.

පොට්ඨපාදය, මේ ලෝකයෙහි අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, අෂ්ටවිද්‍යා පසළොස් චරණධර්මයන් ගෙන් යුක්තවූ, යහපත් ගති ඇත්තාවූ, සියලු ලෝකයන් දත්තා සුලුවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි ශ්‍රෙෂ්ඨවූ රියැදුරෙකු වැනිවූ, දෙවිමිනිසුන්ට ශාස්තෘවූ, සිව්සත් දම් අවබෝධ කළාවූ, භාග්‍යවත් වූ, තථාගත කෙනෙක් මෙලොව උපදනාහ. ඒ තථාගත තෙමේ දෙවියන් සහිත වූ, මාරයන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, දෙවිමිනිසුන් (රජුන් හා මිනිසුන්) සහිතවූ, සත්ත්වවර්ගයා සවකීය විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කෙරේ. ඒ (තථාගතයන් වහන්සේ) මුල යහපත්වූ, මැද යහපත්වූ, කෙළවර යහපත්වූ, (සතර සතිපට්ඨානාදිය ඇසුරු කළ හෙයින්) අර්ථ සහිතවූ, (දශවිධ ව්‍යඤ්ජන නොපිරිහෙළා වදරණ හෙයින්) ව්‍යඤ්ජන සහිතවූ, සියලු ලෙසින් සම්පූර්ණවූ, පිරිසුදුවූ, සකල ශාසනමාර්ග බ්‍රහ්මචර්‍යාව ගෙන හැර දක්වති.

9. ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපතිපුත්‍රයෙක් හෝ අන් කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක් හෝ අසයි. හෙතෙම ඒ දහම් අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කෙරෙයි. හෙතෙම ඒ ශ්‍රද්ධාලාභයෙන් යුක්ත වූයේ මෙසේ සලකන්නේය: ගෘහවාසය පීඩා සහිතයි. රාගාදි රජස ගැවසී මාර්ගයෙකි. පැවිද්ද විනාහි අභ්‍යවකාසය මෙනි (කිසිවක් නොමැති අවකාසය මෙන් නිදහස්ය).

නයිදං[1] සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සංඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති.[2]

10. සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති[3]. සො[4] එවං පබ්බජිතො සමානො පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු කායකම්මවචීකම්මෙන සමන්නාගතො කුසලෙන පරිසුද්ධාජීවො සීලසම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො සන්තුට්ඨො.

11. කථඤ්ච පොට්ඨපාද භික්ඛු සීලසම්පන්නො හොති? ඉධ පොට්ඨපාද භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බ-පාණභූතහිතානුකම්පී විහරති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති. ඉදම්පිස්ස හොති සීලස්මිං. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී[5] විරතො මෙථුනා ගාමධම්මා. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. න ඉදං C.
2. පබ්බජ්ජෙය්‍යන්ති P.
3. පබ්බජ්ජති P.
4. සො ඉති න දිස්සති P.
5. අනාචාරී B.

ගිහිගෙහි වසන්නහු විසින් සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, සියලු ආකාරයෙන් පිරිසිදුවූ, ලියවූ සකක් වැනි (සංඛ-ලිඛිතවූ), මෙම බඹසර හැසිරෙන්නට නොහැක්කේය. මම කෙස් දැලිරැවුලු හරවා, කසාවත් හැඳ, ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවන්නෙම් නම් (ඒකාන්තයෙන්) ඉතා මැනවැයි කියායි.

10. හෙතෙම පසු කාලයෙක සවල්පවූ හෝ බොහෝවූ භෝග රාශිය හැර, සවල්පවූ හෝ බොහෝවූ නෑපිරිස් හැර, කෙස් දැලිරැවුලු හරවා, කසාවිසනුයන් හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වේ. මෙසේ පැවිදිවූ හෙතෙම පාතිමොක්ඛසංවරයෙන් යුක්ත වූයේ, ආචාර ගොචර දෙකින් යුක්ත වූයේ, සවල්පවූත් අකුසල් විෂයෙහි භය දක්නාසුලු වූයේ, යහපත්වූ කාය වාක් කර්මයෙන් යුක්ත වූයේ, ශික්ෂාපද සමාදන්ව එහි මොනවට හික්මෙයි. පිරිසිදුවූ දිවි පැවැතුම් ඇත්තේ වෙයි. (ත්‍රිවිධ) ශීලයෙන් යුක්ත වූයේ වෙයි. ඉන්ද්‍රිය විෂයෙහි වැසූ දෙරටු ඇත්තේ වෙයි. බොජුනෙහි පමණ දන්නේ වෙයි. මනා සිහියෙන් හා සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයි. (සිව්පසය පිළිබඳ යථාලාභ) සන්තොෂයෙන් යුක්ත වෙයි.

11. පොට්ඨපාදය, මහණ තෙමේ කෙසේනම් සීලසම්පන්න වේද? පොට්ඨපාදය, මේ සස්නෙහිවූ මහණතෙමේ ප්‍රාණවධය හැර ඉන් වැලැක්කේ වේ. බහා තබන ලද දඬු ඇත්තේ, බහා තබන ලද අවි ඇත්තේ, පව් කිරීමෙහි ලජ්ජා ඇත්තේ, කරුණාවත් වූයේ, සියලු ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පිව වෙසේ. මෙසේ මේ (ප්‍රාණ වධයෙන් වෙන්වීමේ සීලය) ද ඒ මහණහුගේ සීලය පිණිස වේ.

(හෙතෙම) නොදුන් දෙය ගැනීමෙන් වෙන්ව, එයින් විශෙෂයෙන් වැලැක්කේ, දුන් දෙයම ගන්නේ, දුන් දෙයම කැමැති (බලාපොරොත්තු) වන්නේ, සොර නොවූ, පිරිසුදුවූ (ආත්මභාවයෙන්) සිතින් යුක්තව වාසය කෙරේ. මෙසේ ඒ (අදත්තාදානයෙන් වෙන්වීමේ සීලය) ද ඒ මහණහුගේ සීලය පිණිස වේ. අබ්‍රහ්මචර්‍ය්‍යාව හැර, බඹසර නොවන හැසිරීමෙන් දුරුවූ පැවතුම් ඇත්තේ, ස්ත්‍රීපුරුෂසංසර්‍ගය නම්වූ ග්‍රාමධර්මයෙන් වෙන් වූයේ බ්‍රහ්මචාරී වේ. මෙසේ ඒ (කාමාසවාද විරතිය පිළිබඳවූ සීලය) ද ඔහුගේ සීලය පිණිස වේ.

12. මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති[1] සච්චවාදී සච්චසන්ධො ථෙතො[2] පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. ඉදම්පිස්ස හොති සීලස්මිං. පිසුණං වාචං[3] පහාය පිසුණාය වාචාය පටිවිරතො හොති. ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය. අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා[4] සමග්ගාරාමො[5] සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති[6]. ඉදම්පිස්ස හොති සීලස්මිං.

ඵරුසං[7] වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති. යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා[8] හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා තථාරූපං[9] වාචං භාසිතා හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා හොති[6] කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං[10]. ඉදම්පිස්ස හොති සීලස්මිං.

13. බීජගාමභූතගාමසමාරම්භා[11] පටිවිරතො හොති[12]. එකභත්තිකො හොති රත්තූපරතො[13] පටිවිරතො[14] විකාලභොජනා. නච්චගීතවාදිතවිසූකදස්සනා[15] පටිවිරතො හොති. මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතො හොති. උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ජාතරූපරජතපටිග්ගහණා[16] පටිවිරතො හොති.

---

1. පටිවිරතො සමණො ගොතමො P.
2. ඨෙතො S; ථෙතො Sa.
3. පිසුණාවාචං P. W.
4. අනුප්පා° P.
5. සමග්ගරාමො B. Ca.
6. හොතීති න දිස්සති P.
7. ඵරුසාවාචං P. W
8. පෙමනීයා B
9. °රූපිං P.
10. °සඤ්හිතං B.
1 . °සමාරබ්භා B. V.
12. හොති—පෙ—එක° B·V.
13. රත්තූපරතො B.
14. විරතො P. S. C.
15. °විසූක° B.
16. °ජාතපටිග්ගහණා V. (සබ්බත්ථ)

12. බොරු කීමෙන් දුරුව, ඉන් විශෙෂයෙන් වැළැක්කේ, සැබෑ තෙපුල් කියන්නේ, සැබැවින් සැබව ගළපන සුලුවූයේ, ස්ථිර කථා ඇත්තේ, ඇදහිය යුතු තෙපුල් ඇත්තේ, ලෝකයා අතර විරුද්ධ කථා ඇති නොකෙරේ. මෙසේ (බොරු කීමෙන් වැළකීම) ද ඒ මහණහුගේ සීලය පිණිස වේ. පිසුණු බස් හැර, ඉන් වෙසෙසින් වැළැක්කේය. මෙතැනින් අසා මොවුන් බිඳවීම පිණිස එතැන නොකියන සුලුවූයේය. එතැනින් අසා ඔවුන් බිඳවීම පිණිස මෙතැන නොකියන සුලුවූයේය. මෙසේ හෙද වූවන් ගළපන්නේ, සමගිවූවන්ගේ සමගිය තහවුරු කිරීමට අනුබල දෙන්නේ, සමගියෙහි ඇලුම් බහුල කොට ඇත්තේ, සමගිකම්හි ඇලුනේ, සමගිකම්හි සතුටුවන සුලුවූයේ, සමගිය ඇති කරණ තෙපුල් කියන්නේය. මේ ද ඔහුගේ සීලය පිණිස වේ.

පරුෂ වචනය හැර, ඉන් වෙසෙසින් වැළැක්කේ, යම් වචනයක් නිදොස් වේද, කන්කලු ද, අර්ථ වශයෙන් ප්‍රෙමණීයද, මනාසේ සිතට වදනා හෙයින් සිත්කලු ද, පුරවාසීන්ගේ කථා මෙන් යහපත් ද, බොහෝ දෙනාට ප්‍රිය ද, බොහෝ දෙනාගේ මන වඩන්නේ ද, එබඳු තෙපුල්ම කියන්නේ වේ. මෙසේ (ඒ රළුවචනයෙන් වෙන්වීම ද) ඒ මහණහුගේ සීලය පිණිස වේ. හිස්වූ ප්‍රලාප කථා හැර, ඉන් වෙසෙසින් වැළැක්කේ, කාලයට සුදුසු කථා කරන්නේ, සිදුවූ (සැබෑවූ) තෙපුල්ම කියන්නේ, අර්ථයෙන් යුක්තවූ, (නවලොවුතුරු) දහම් ඇසුරු කළ, විනය ඇසුරු කළ තෙපුල් කියන්නේ, සුදුසු කල්හි උපමා හා කරුණු සහිතවූ, (පරිච්ඡෙද) සීමා ඇති, අර්ථ හෙවත් අභිවෘද්ධියෙන් යුත්, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේ. මේ (හිස්කථාවෙන් වැළැක්ම) ද ඔහුගේ සීලය පිණිස වේ.

13. තණ, ගස්, වැල් සිඳීම් බිඳීම් ආදි විකොපනයෙන් වැළැක්කේ, එක් වේලේ වළඳන බොජුන් ඇත්තේ, රාත්‍රිභොජනයෙන් හා විකල් බොජුනෙන් වැළැක්කේය. නැටීම්, ගී කීම්, බෙර ආදිය වැයීම්, විසුලු දැකීම් යන මෙයින් වැළැක්කේය. මල්, ගඳ, විලවුන් පැළඳීම, ඉන් සැරසීම, උනුතැන් පිරවීමෙන් අලඞ්කාර කිරීම යන මෙයින් වැළැක්කේය. උස් අසුන් මහ අසුන් යන මෙයින් වැළැක්කේය. රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් වැළැක්කේය.[1]

1. දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ උපග්‍රන්ථයේ x වෙනි පිට බලනු.

ආමකධඤ්ඤපටිග්ගහණා[1] පටිවිරතො හොති. ආමකමංසපටිග්ගහණා[1] පටිවිරතො හොති. ඉත්ථිකුමාරිකපටිග්ගහණා[1] පටිවිරතො හොති. දාසිදාසපටිග්ගහණා පටිවිරතො හොති. අජෙළකපටිග්ගහණා[1] පටිවිරතො හොති. කුක්කුටසූකරපටිග්ගහණා[1] පටිවිරතො හොති. හත්ථිගවාස්සවළවාපටිග්ගහණා[2] පටිවිරතො හොති. ඛෙත්තවත්ථුපටිග්ගහණා[1] පටිවිරතො හොති. දූතෙය්‍යපහිණගමනානුයොගා[3] පටිවිරතො හොති. කයවික්කයා පටිවිරතො හොති. තුලාකූටකංසකූටමාණකූටා[4] පටිවිරතො හොති. උක්කොටනවඤ්චනනිකතිසාචියොගා[5] පටිවිරතො හොති. ඡෙදනවධබන්ධනවිපරාමොසආලොපසහසාකාරා[6] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

14. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං බීජගාමභූතගාමසමාරම්භං[7] අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං[8] මූලබීජං ඛන්ධබීජං ඵළුබීජං[9] අග්ගබීජං බීජබීජමෙව[10] පඤ්චමං— ඉති[11] එවරූපා බීජගාමභූතගාමසමාරම්භා[12] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

15. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං සන්නිධිකාරපරිභොගං අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං අන්නසන්නිධිං[13] පානසන්නිධිං වත්ථසන්නිධිං යානසන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං— ඉති වා ඉති එවරූපා සන්නිධිකාරපරිභොගා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. °ප්පටිග්ගහණ V. (සබ්බත්ථ)
2. °ගවස්ස° B. V. °වලව° V. W. °වළව° B.
3. °පහීණ° W.
4. °කූට° B.
5. °සාචි° B. V.
6. °සහස° B.
7. °සමාරබ්භං V.
8. සෙය්‍යථිදං B. V. (සබ්බත්ථ)
9. ඵල° S. ඵලු° C. P.
10. බීජබීජං එව B. S. V.
11. ඉති වා ඉති V. S.
12. °සමාරබ්භා V.
13. °නිධි S. (සබ්බත්ථ)

අමුවූ ධාන්‍යවර්‍ග පිළිගැන්මෙන් තොරවූයේ, අමුමස් පිළිගැන් මෙන් තොරවූයේ ද ස්ත්‍රීන් හා කුමරියන් පිළිගැන්මෙන් තොර වූයේ ද වේ. දාසිදාසුන් පිළිගැන්මෙන් තොර වූයේ, එළුවන් හා නිරළුවන් පිළිගැන්මෙන් තොර වූයේ, කුකුළන්, හූරන්, ඇතුන්, ගවයන්, අසුන්, වෙළඹුන්, කෙත්, වත්, යන මේ පිළිගැන්මෙන්ද තොර වූයේය. ගිහියන්ගේ දූත මෙහෙවරය, ගෙන්ගෙට යන පහත් මෙහෙවරය යන මෙයින් වැළැක්මක්ය. ගනු දෙනු කිරීමය, තුලා ආදියෙන් වඤ්චා කිරීමය, රන් හා තොරන් මුසුකොට වඤ්චාකිරීමය, වී ආදිය මැනීමෙන් වඤ්චා කිරීමය, හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය, උපායෙන් අනුන් රැවටීමය, යකඩ ආදි ලෝහ රන් රිදී යයි අඟවා වඤ්චා කිරීමය, නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයෝගය යන මෙයින් වැළැක්කේය. කැපීමය, මැරීමය, බැඳීමය, සැඟවී සිට වස්තු පැහැර ගැන්ම (මංකොල්ල)ය, නියම්ගම් ආදිය පැහැරීමය, බලාත්කාර-කමින් වස්තු පැහැරගැන්මය යන මෙයින් ද වැළැක්කේය. මේ (විරතිය) ද ඔහුගේ සීලය පිණිස වේ.

14. ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් අනුභව කොට මූලබීජය, ඛන්ධබීජය, එළි (පුරුක්) බීජය, දලු (අග්‍ර) බීජය, පස්වැනිවූ බීජබීජය යන මේ බීජගාම-භූතගාමසමාරම්භයෙහි යෙදී වෙසෙත්. (මෙබඳු වූ බීජගාම භූතගාමයන් සිඳීම් බිඳීම් ආදියෙන් වැළැක්කේ වේ නම්) මෙද ඔහුගේ සීලය පිණිස වේ.

15. එසේම යම් ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැ-යෙන් දෙන ලද බොජුන් අනුභව කොට, ආහාර වර්‍ග දෙවෙනි දිනට තබා ප්‍රයොජන ගැන්මය, පාන වර්‍ග දෙවෙනි දිනට තබා ප්‍රයොජන ගැන්මය, නොඉටන ලද සිවුරු ආදිය එසේ තැන්පත් කොට තැබීමය, යාන සංඛ්‍යාත වහන් තබා එසේ ප්‍රයොජන ගැන්මය, දෙකකින් වැසි සයන ලැබ පසුවට තබා ප්‍රයොජන ගැන්මය, සුගන්ධයන් ලැබ එලෙස තබා ප්‍රයොජන ගැන්මය, තල සහල් ආදි ආමිසයන් තැන්පත් කොට තබා ප්‍රයොජන ගැන්ම යයි කියන ලද සන්නිධිකාරපරිභොගයෙහි යෙදී වෙසෙත්. මෙබඳුවූ සන්නිධිකාරපරිභොගයෙන් වැළකී වෙසේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

16. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං[1] අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීදං නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වෙතාලං[2] කුම්භථූනං[3] සොභනගරකං[4] චණ්ඩාලං වංසං ධොපනං[5] හත්ථියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං[6] උසභයුද්ධං අජයුද්ධං මෙණ්ඩයුද්ධං[7] කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යොධිකං බලග්ගං සෙනාබ්‍යූහං අනීකදස්සනං[8] — ඉති වා ඉති එවරූපා විසූකදස්සනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

17. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං ජූතප්පමාදට්ඨානානුයොගං[9] අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීදං[10] අට්ඨපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං[11] ඛලිකං ඝටිකං සලාකහත්ථං අක්ඛං පඞ්ගචීරං වඞ්කකං[12] මොක්ඛචිකං චිඞ්ගුලකං[13] පත්තාළ්හකං[14] රථකං ධනුකං අක්ඛරිකං මනෙසිකං[15] යථාවජ්ජං— ඉති වා ඉති එවරූපා ජූතප්පමාදට්ඨානානුයොගා[16] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. විසුක° B.
2. වෙතාළං B. S. V.
3. කුම්භථූණං B. S. °ථූණං V.
4. සොභනකරකං W. C.
   සොභනඝරකං V.
5. ධොවනං S.
6. මහිංස° B.
7. මෙණ්ඩක° B. P. W.
8. අනික° B.
9. ජූතපමාද° P.
10. සෙය්‍යථිදං B. V. (සබ්බත්ථ)
11. පත්ති° V.
12. වඞ්කං Va.
13. චිඞ්ගුලිකං B.V.P.
14. පණ්ණා° B. V.
15. මානෙ° S; මනෙ°Sa.
16. ජූතපමාද° P.

16. එසේම යම් ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා, නැටීමය, ගී කීමය, බෙර ආදිය වැයීමය, රඟමඬුලු සැරසීමය, (රාමායනාදි) කථා ඇසීමය, කයිතාලම් හා අත්ලෙන් අත්ල ගැසීමය, මන්ත්‍ර පිරවීමෙන් මළමිනී නැංවීමය, සතරැස් හෝ කළබෙර ගැසීමය, ශොභන (ප්‍රතිභාන) චිත්‍ර විචිත්‍රය,[1] සණ්ඩෙවුන් කෙළිය, හුණගස් ඔසවා නැටීමය, මිනීඇට සෝදා නැබීමය, ඇතුන් හා යුද කිරීමය, අසුන් හා යුද කිරීමය, මීවුන් හා යුද කිරීමය, උසභයන් හා යුද කිරීමය, අජයුද්ධය, මෙණ්ඩක යුද්ධය, කුක්කුට යුද්ධය, වට්ටක යුද්ධය, දණ්ඩ යුද්ධය, තොරතුරු ඇසීමය, මල්ලව යුද්ධය, (සාමාන්‍ය) යුද්ධය, ඇත් අස් ආදීන් ගණන් කිරීමය, සෙනා සන්නිවෙසය, ඇත් අස් ආදීන් දැකීමය, යන විපරීත දර්‍ශනයෙහි යෙදී වෙසෙත්. මෙසේ මෙබඳුවූ විසුලු දැක්මෙන් වැළකේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

17. එසේම යම් ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා (දූ පෝරු ආදියෙහි කෙළීම්වූ) අට්ඨපද ක්‍රීඩාවය, දශපද ක්‍රීඩාවය, දූ පෝරු ආදියෙහි මෙන් ආකාශයෙහි ක්‍රීඩා කිරීමය, බිම මණ්ඩල වශයෙන් සාදා පැන පැන ක්‍රීඩා කිරීමය, දූ කැට නොසොල්වා නියෙන් ගසා ක්‍රීඩා කිරීමය, පසඇටින් දුදු කෙළීමය, සිං කෙළීමය, භිත්ති ආදියෙහි ලෙරටපිටි ගසා ඇත් අස් ආදි රූප දක්වා කෙළීමය, පත්දු කෙළීමය, පත් කුළල් පිඹීමය, ගම් දරුවන් මෙන් ක්‍රීඩා නගුල් ගෙන සීසෑම් ව්‍යාජයෙන් කෙළීමය, කරනම් ගැසීමය, තල්පත් ආදියෙන් කත්තන්ගුරුවා තනා ක්‍රීඩා කිරීමය, කොළ නැළියෙන් වැලි ආදිය මැන කෙළීමය, කුඩා රථයෙන් කෙළීමය, කුඩා දුන්නෙන් කෙළීමය, අහසෙහි හෝ පිටෙහි හෝ අකුරු ඇඳ කෙළීමය, සිතූ දේ කියවීම් කීම් ආදියෙන් කෙළීමය, (ගොළු බිහිරි ආදීන්ගේ) ඒ ඒ දෙෂ රූප දක්වා කෙළීමය, යන මෙබඳුවූ ප්‍රමාදයට කාරණාවූ දූ කෙළීමෙහි යෙදී වාසය කෙරෙත්. මෙසේ මෙබඳුවූ දූ කෙළිමයෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

---

1. දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ 15 වෙනි පිටේ අඩොල්පිය බලනු.

18. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං උච්චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීදං ආසන්දිං පල්ලඞ්කං ගොනකං[1] චිත්තකං පටිකං පටලිකං තූලිකං[2] විකතිකං උද්දලොමිං එකන්තලොමිං කට්ටිස්සං[3] කොසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං[4] අස්සත්ථරං[4] රථත්ථරං[4] අජිනප්පවෙණිං කාදලිමිගපවරපච්චත්ථරණං[5] සඋත්තරච්ඡදං උභතොලොහිතකූපධානං— ඉති වා ඉති එවරූපා උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

19. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං මණ්ඩනවිභූසනට්ඨානානුයොගං[6] අනුයුත්තා විහරන්ති-සෙය්‍යථීදං[7] උච්ඡාදනං පරිමද්දනං නහාපනං[8] සම්බාහනං ආදාසං අඤ්ජනං මාලා විලෙපනං[9] මුඛචුණ්ණකං[10] මුඛාලෙපනං[11] හත්ථබන්ධං[12] සිඛාබන්ධං දණ්ඩකං[13] නාළිකං[14] ඛග්ගං[15] ඡත්තං චිත්‍රුපාහනං උණ්හීසං මණිං වාලවීජනිං[16] ඔදාතානි වත්ථානි දීඝදසානි— ඉති වා ඉති එවරූපා මණ්ඩනවිභූසනට්ඨානානුයොගා[6] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

20. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං තිරච්ඡානකථං අනුයුත්තා විහරන්ති—සෙය්‍යථීදං[7] රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං පුරිසකථං [කුමාරකථං කුමාරිකථං][17] සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානකථාය පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ගොණකං S. C.
2. තූලිකං B.
3. කට්ටි° B. V. කටි° S.
4. °ත්ථරණං B. V.
5. කදලි° B.P.V. කාදල° W.
6. °විභූ° B. °විභූසණ° W.
7. සෙය්‍යථිදං B. V. (සබ්බත්ථ)
8. න්හාපනං B. V.
9. මාලාගන්ධවි° S. B.
10. මුඛචුණ්ණං S. B. V.
11. මුඛලෙපනං B. V.; °විලෙපං S. මුඛාලෙපං Sa
12. °බද්ධං W.
13. දණ්ඩං B. S. V.
14. නාලිකං W.; තාලකං V.
15. අසිං V; අසිං ඛග්ගං S.
16. වාල° P. W.
17. ඉදං මරම්මපොත්ථකෙසු යෙව දිස්සති

18. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, දික්හගලා පුටුය, පළස්ය, සතරඟුලෙන් දිග ලොම් ඇති ඇතිරිය, විසිතුරු එළු ලොම් ඇති ඇතිරිය, එළු ලොම්මුවා සුදු ඇතිරිය, එළු ලොම්මුවා ඝනපුප් ඇතිරිය, සිංහාදි රූපයෙන් විසිතුරු එළු ලොම් ඇතිරිය, එක් පිට ලොම් ඇති එළු ලොම් ඇතිරිය, දෙපිට ලොම් ඇති එළු ලොම් ඇතිරිය, රන්කසුකම් කොට කැටි තිඹිරි හුයින් කළ පසතුරුණුය, එක්විට නිළියන් සොළොස්දෙනා කෙළනා එළු ලොම් මුවා මහ ඇතිරිය, ඇතුන් පිට අතුරණ ඇතිරිය, අසුන් පිට අතුරණ ඇතිරිය, රථ පිට අතුරණ ඇතිරිය, අඳුන් දිවිසමින් කළ පසතුරුණුය, කදලිමුව සමින් කළ උතුම් පසතුරුණුය, දෙපස තබන ලද රත්කන්වයින් ඇති ආසනය, යන මෙබඳු උස් අසුන් මහ අසුන් පරිභොග කෙරෙත්. මෙසේ මෙබඳු වූ උසසුන් මහ අසුන්හි හිඳීම් ආදියෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ **සීලය පිණිස** වේ.[1]

19. එසේම යම් ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා, ඇඟ සුවඳ ඉලීමය, පිරිමැදීමය, නෑවීමය, මැඩිමය, කැඩපත් පරිහරණය, අඳුන් තෙල් පරිහරණය, මල් හා විලවුන්, මූවසුණු, මුඛාලෙප, හස්තාභරණ යන මේ දේ දැරීම හා පැළඳීමය, රන් හු ආදියෙන් සිඛා (කුඩුම්බි) බැඳීමය, විසිතුරු දඬු ගෙන හැසිරීමය, බෙහෙත් නළ දසරු වෙහි එල්වාගෙන ඇවිදීමය, කඩු උරෙහි එල්වා ගෙන ඇවිදීමය, ඡත්‍රධාරීව ඇවිදීමය, විසිතුරු වහන් පයලා ඇවිදීමය, නළල්පට බැඳීමය, සිඛාමාණික්‍ය පැළඳීමය, වල්විදුනා දැරීමය, දික්වූ දහවලු ඇති සුදුවත් ඇඳීමය යි මෙසේ වූ සැරසීම් හා උතුතැන් පිරවීමෙහි නිතර නිතර යෙදෙත්. මෙබඳු වූ සැරසීම්, අලඞ්කාර කිරීම් ආදියෙහි යෙදීමෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ **සීලය පිණිස** වේ.

20. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ—මහ ඇමතියන් පිළිබඳ—සේනා පිළිබඳ—භය පිළිබඳ—යුද පිළිබඳ—ආහාර පිළිබඳ—පාන වර්ග පිළිබඳ—වස්ත්‍ර පිළිබඳ—සයන පිළිබඳ—මාලා, ගන්ධ ද්‍රව්‍යයන්—නෑයන්—යානාවන්—ගම්—නියම්ගම්-නුවර-දනව්—ස්ත්‍රීන්—පුරුෂයන්—[කුමරකුමරියන්]—යොධයන්—වීථි—ඝටවෙට්කාවන් හෝ තීර්ථයන්—මළ නෑයන් යන ආදීන් පිළිබඳ කථාය, නොයෙක් ආකාරවූ ව්‍යර්ථ කථාය, ලොකාඛ්‍යායික (විතණ්ඩ) කථාය, මුහුද පිළිබඳ කථාය, භවාභවකථාය යන මෙබඳු තිරිසන් කථාවෙහි යෙදී වෙසෙත්. මෙබඳු වූ තිරච්ඡානකථාවෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ **සීලය පිණිස** වේ.

1. මෙහි ඇතුළත් දේ ගැණ ඇතැම් තොරතුරු දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ බ්‍රහ්මජාල සූත්‍රයෙන් බලා දත යුතුයි.

21. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විග්ගාහිකකථං අනුයුත්තා විහරන්ති— සෙය්‍යථීදං[1] න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි, අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡාපටිපන්නො ත්වමසි අහමස්මි සම්මාපටිපන්නො. සහිතං මෙ අසහිතං තෙ. පුරෙ වචනීයං පච්ඡා අවච පච්ඡාවචනීයං පුරෙ අවච. අධිචිණ්ණං[2] තෙ විපරාවත්තං ආරොපිතො තෙ වාදො නිග්ගහීතොසි[3] චර වාදප්පමොක්ඛාය නිබ්බෙඨෙහි වා සචෙ පහොසීති— ඉති වා ඉති එවරූපාය විග්ගාහිකකථාය පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

22. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං දූතෙය්‍ය-පහිණගමනානුයොගමනුයුත්තා විහරන්ති— සෙය්‍යථීදං[1] රඤ්ඤං රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං කුමාරානං: ඉධ ගච්ඡ අමුත්‍රාගච්ඡ ඉදං හර අමුත්‍ර ඉදං ආහරාති— ඉති වා ඉති එවරූපා දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

23. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ කුහකා ච හොන්ති ලපකා ච නෙමිත්තිකා[4] ච නිප්පෙසිකා ච ලාභෙන[5] ලාභං නිජ්ජිගිංසිතාරො[6] ච[7]— ඉති[8] වා ඉති එවරූපා කුහනලපනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. සෙය්‍යථිදං B. V.
2. ආචිණ්ණං W. C.
3. නිග්ගහීතො ත්වමසි B V. නිග්ගහීතොසි P.W.
4. නිමිත්තකා Sa.
5. ලාභෙන ච ලාභං P.S.
6. නිජිගිසිතාරො B.
7. ච ඉති න දිස්සති P.S.W.
8. ඉතිඑවං P. W.

21. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා 'ඔබ මේ ධර්මවිනය නොදන්නෙහිය, මම මේ ධර්මවිනය දනිමි.' 'ඔබ මේ ධර්මවිනය කුමකැයි දන්නෙහි ද? ඔබ වරදවා පිළිපන්නෙහිය, මම මනාකොට පිළිපන්නේ වෙමි.' 'මාගේ වදන් සිලිටුය හෝ අර්ථ සහිතය, ඔබගේ වචනය එසේ නොවෙයි.' 'පළමු කිය යුත්ත පසුව කීයෙහිය, පසුව කිය යුත්ත පළමුව කීයෙහිය, යමක් ඔබ බොහෝ කල් පුරුදු කරණ ලද නම් ඒ සියල්ල ව්‍යර්ථ විය. ඔබට වාදාරොපනය කරණ ලදී; නිග්‍රහ කරණ ලද්දෙහිය (වාදයෙන් පැරදුනෙහිය). වාදයෙන් මිදෙනු පිණිස ක්‍රියා කරව. ඉදින් හැක්කෙහි නම් වාදයෙන් ගැළවෙව හෙවත් ඒ නිෂේධනය කරව' යන ආදි විග්‍රාහික නොහොත් දෝෂාරෝපණ කථාවෙහි යෙදී වෙසෙත්. මෙසේ මෙබඳු විග්‍රාහික කථාවෙන් වැළැක්මේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

22. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා රජුන්ගේ, රජමහ ඇමතියන්ගේ, ක්ෂත්‍රියයන්ගේ, බමුණන්ගේ, ගැහැවියන්ගේ සහ කුමරුන්ගේද හසුන් ගෙණ, 'මෙතනින් අසවල් තැනට යා, අසවල් තැනින් මෙහි එව, මෙය ගෙණ යා, එතැනින් අසවල් දෙය ගෙණෙව' යි (අණවන ලදුව) දූතභාවයෙහි හා හසුන් ගෙණ යෑමෙහි යෙදී වෙසෙත්. මෙබඳු දූත භාවය, හසුන් ගෙණයෑම යන මෙයින් වැළැක්මේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

23. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා කුහකයෝ ද, සිව්පසය උදෙසා කථා කරන්නෝ ද, නිමිතිකරන්නෝ නොහොත් ලාභ සත්කාර සඳහන් කරවන්නෝ ද, පරලාභාදිය උදෙසා කියන්නෝ ද,[1] ලාභයකින් ලාභයක් සොයන්නෝ ද වෙත්. මෙබඳු වූ කුහනලපනාදියෙන් වැළැක්මේ වේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

---

1. දිඝනිකායේ පළමුවන කාණ්ඩයේ 21 වෙනි පිටේ 1 වෙනි අධෝලිපිය බලද.

24. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති. සෙය්‍යථීදං[2] අඞ්ගං නිමිත්තං උප්පාදං[3] සුපිණං[4] ලක්ඛණං මූසිකච්ඡින්නං[14] අග්ගිහොමං දබ්බිහොමං ථුසහොමං කණහොමං තණ්ඩුලහොමං සප්පිහොමං තෙලහොමං මුඛහොමං ලොහිතහොමං අඞ්ගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා[5] සිවවිජ්ජා භූතවිජ්ජා භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා විච්ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං[6] සරපරිත්තානං මිගචක්කං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

25. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති. සෙය්‍යථීදං[2] මණිලක්ඛණං වත්ථලක්ඛණං[7] දණ්ඩලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං[8] ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරිලක්ඛණං දාසලක්ඛණං දාසිලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං[9] උසභලක්ඛණං ගොලක්ඛණං[10] අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං[11] කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං ගොධාලක්ඛණං කණ්ණිකාලක්ඛණං[12] කච්ඡපලක්ඛණං මිගලක්ඛණං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා[13] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

26. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති. සෙය්‍යථීදං[2] රඤ්ඤං නිය්‍යානං භවිස්සති රඤ්ඤං අනිය්‍යානං භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං ජයො භවිස්සති බාහිරානං රඤ්ඤං[15] පරාජයො භවිස්සති. බාහිරානං රඤ්ඤං ජයො භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං පරාජයො භවිස්සති. ඉති ඉමස්ස ජයො භවිස්සති ඉමස්ස පරාජයො භවිස්සති— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ජීවිතං B. V.
2. සෙය්‍යථිදං B. V.
3. උප්පාතං B. °පාටං S.
4. සුපිනං B. P. සුපිණකං C.
5. ඛෙත්ත° B. S. V.
6. පක්ඛ° W. C.
7. සත්ථලක්ඛණං B. V.; දණ්ඩ° වත්ථ° P. W.
8. ආයුධ° B. P.
9. මහිංස° B.
10. ගොණ° B.
11. මෙණ්ඩක° V. W.
12. කණ්ණික° B. S.
13. මිච්ඡාජීවා ඉති න දිස්සති P.
14. මූසිකා° P. W.
15. රඤ්ඤං ඉති න දිස්සති B. V.

24. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, අඞ්ග (සාමුද්‍රිකා) ශාස්ත්‍රය, නිමිති ශාස්ත්‍රය, (අසනිපාතාදී මහ නිමිති බලා කියන) උත්පාද ශාස්ත්‍රය, ස්වප්න ශාස්ත්‍රය, ලක්ෂණ ශාස්ත්‍රය, (මීයන් කැපූ වස්ත්‍රාදිය බලා කියන) මූසික ශාස්ත්‍රය, අග්නිහෝමය, දබ්බිහෝමය, ථුස හෝමය, තණ්ඩුල—කණ—සප්පි—තෙල—මුඛ—ලොහිත හෝමය, අඞ්ග විද්‍යා, වාස්තු විද්‍යා, නීති ශාස්ත්‍රය, සොහොනෙහි ශාන්ති කරන්නාවූ විද්‍යාව හෝ සිවල් රුත විද්‍යා, භූත විද්‍යා, අහි විද්‍යා, විෂ විද්‍යා, විච්ඡික විද්‍යා, මූසික විද්‍යා, සකුණ විද්‍යා, වායස විද්‍යා, ජීවන කාලය කීම වූ පක්කජ්ඣානය, ශරපරිත්‍රාණය (ආයුධ වැළැක්ම), තිරිසන් සතුන්ගේ ශබ්ද දැනීම වශයෙන් පැවති මන්ත්‍රය යන තිරශ්චීන විද්‍යා[1] හෙතුකොට ගෙන මිථ්‍යාජීවයෙන් ජීවිකා කෙරෙත්. මෙසේ මෙබඳු තිරශ්චීනවිද්‍යා හෙතුවෙන් කරණ ලාමකජීවිකාවෙන් වැළැක්කේ වේද මෙද ඔහුගේ සීලය පිණිස වේ.

25. එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, මණි ලක්ෂණය, වස්ත්‍ර ලක්ෂණය, දණ්ඩ—ඛඩ්ග—දුනු—ආයුධ—ඉත්ථි—පුරිස—කුමාර—කුමාරි—දාස— දාසි—හත්ථි—අස්ස— මහිස—උසභ—ගො—අජ—මෙණ්ඩ— කුක්කුට—වට්ටක —ගොධා— කණ්ණිකා —කච්ඡප—මිග ලක්ෂණය යන මෙබඳු තිරච්ඡාන විද්‍යාවන්[1] කරණකොට ගෙණ වැරදි ජීවිකාව කෙරෙත්. මෙසේ වූ තිරශ්චින විද්‍යාවන් නිසා කරණ වැරදි ජීවිකාවෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ **සීලය පිණිස වේ.**

26. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා 'අසවල් දින රජුන්ගේ බැහැර යෑම වන්නේය, අසවල් දින රජුන්ගේ ඇතුළු නුවරට යෑම වන්නේය. අසවල් දින ඇතුළුනුවර රජුන්ගේ ආක්‍රමණය වන්නේය, බැහැර රජුන්ගේ බැහැරට යෑම වන්නේය. බැහැර රජුන්ගේ ඇතුළු නුවරට ඒම වන්නේය, ඇතුළුනුවර රජුන්ගේ ආපසු යෑම වන්නේය, ඇතුළුනුවර රජුන්ට ජය වන්නේය, බැහැර රජුන්ට පරාජය වන්නේය. බැහැර රජුන්ට ජය වන්නේය. ඇතුළුනුවර රජුන්ට පරාජය වන්නේය. මෙසේ මොහුට ජය වන්නේය, මෙසේ පරාජය වන්නේය' යි කියා මෙසේ තිරශ්චීනවිද්‍යා හෙතුකොට ලාමක ජීවිකා කෙරෙත්. මෙබඳු වූ තිරච්ඡාන විජ්ජා හෙතුවෙන් කරණ මිච්ඡාජීවයෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

1. දීඝනිකායේ පළමුවෙනි කාණ්ඩයේ 21 වෙනි පිට බලනු.

27. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති— සෙය්‍යථීදං[2] චන්දග්ගාහො භවිස්සති සුරියග්ගාහො[3] භවිස්සති නක්ඛත්තග්ගාහො භවිස්සති. චන්දිමසුරියානං[3] පථගමනං භවිස්සති චන්දිමසුරියානං[3] උප්පථගමනං භවිස්සති. නක්ඛත්තානං පථගමනං භවිස්සති නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති. උක්කාපාතො භවිස්සති. දිසාඩාහො[4] භවිස්සති. භූමිචාලො භවිස්සති. දෙවදුන්දුභි[5] භවිස්සති. චන්දිමසුරියනක්ඛත්තානං උග්ගමනං ඔගමනං[6] සඞ්කිලෙසං වොදානං භවිස්සති. එවංවිපාකො චන්දග්ගාහො භවිස්සති. එවංවිපාකො සුරියග්ගාහො[3] භවිස්සති. එවංවිපාකො නක්ඛත්තග්ගාහො භවිස්සති. එවංවිපාකං[7] චන්දිමසුරියානං[3] පථගමනං භවිස්සති. එවංවිපාකං[7] චන්දිමසුරියානං[3] උප්පථගමනං භවිස්සති. එවංවිපාකං[7] නක්ඛත්තානං පථගමනං භවිස්සති. එවංවිපාකං[7] නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති. එවංවිපාකො උක්කාපාතො භවිස්සති. එවංවිපාකො දිසාඩාහො[4] භවිස්සති. එවංවිපාකො භූමිචාලො භවිස්සති. එවංවිපාකො දෙවදුන්දුභි[5] භවිස්සති. එවංවිපාකං චන්දිමසුරියනක්ඛත්තානං[3] උග්ගමනං ඔගමනං[6] සඞ්කිලෙසං වොදානං භවිස්සති— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

28. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති— සෙය්‍යථීදං[2] සුබ්බුට්ඨිකා[8] භවිස්සති දුබ්බුට්ඨිකා[9] භවිස්සති. සුභික්ඛං භවිස්සති දුබ්භික්ඛං භවිස්සති. ඛෙමං භවිස්සති භයං භවිස්සති. රොගො භවිස්සති ආරොග්‍යං භවිස්සති. මුද්දා ගණනා[10] සංඛානං කාවෙය්‍යං ලොකායතං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ජීවිතං B. V.
2. සෙය්‍යථිදං° B. V.
3. °සූරි° B.
4. °දාහො W.
5. °දුදුභි B. V.
6. ඔග්ගමනං B. S. V.
7. °විපාකො P.
8. සුවු° V.; සුවුඨිකා B.
9. දුබ්බුට්ඨිකා B.
10. ගණන B.

27. එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා: චන්ද්‍රග්‍රහණය වන්නේය. සූර්‍යග්‍රහණය—තාරකා සමාගමය—සඳහිරු දෙදෙනාගේ නියම මාර්ගගමන—සඳහිරු දෙදෙනාගේ අමාර්ගගමන—තාරකාවන්ගේ මාර්ගගමන—තාරකාවන්ගේ අමාර්ගගමන වන්නේය, උල්කාපාතය වන්නේය, දිසා දැවීම—පොළොව කම්පාව—අහස ගිගුරුම—සඳ, හිරු, තාරකා යන මොවුන්ගේ නැගීම හා අස්තයට යෑම ද කෙලෙසීම ද පිරිසිදු වීම ද වන්නේය. චන්ද්‍රග්‍රහණය මෙබඳු විපාක ඇතිවන්නේය, සූර්‍යග්‍රහණය—තාරකා සමාගමය— චන්ද්‍රසූර්‍යයින්ගේ මාර්ගයෙහි ගමන— ඔවුන්ගේ නොමග ගමන— තාරකාවන්ගේ මාර්ගයෙහි ගමන— තාරකාවන්ගේ නොමග ගමන — උල්කාපාතය — දිගුන් දැවීම — භූමි චලනය — අහස් ගිගුරුම — සඳ, හිරු, තාරකාවන්ගේ නැගීම, බැසීම, කිලිටිවීම හා පිරිසිදුවීම මෙබඳු විපාක ඇති වන්නේ යයි කියා මෙසේ තිරච්ඡානවිජ්ජා හෙතුවෙන් කරණ මිථ්‍යාජීවිකාවෙන් ජීවිකා කෙරෙත්. මෙසේ වූ තිරශ්චීනවිද්‍යා හෙතුකොටගෙණ කරණ ලාමක ජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඔහුගේ සීලය පිණිස වේ.

28. එසේම ඇතැම් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා: මනා වැසි ඇතිවන්නේය, නපුරු වැසි—යහපත් භික්ෂා—දුර්භික්ෂා—නිභීය—භය—රෝග—නීරෝගීබව ඇතිවන්නේයයි කීමද, ඇඟිලල ඇල්ලීමය, ගිණීමය, පුඩුගණනය, කාව්‍ය කිරීමය, විතණ්ඩ ශාස්ත්‍ර ඉගෙණීම යයි මෙසේ තිරශ්චීන විද්‍යාවන් කරණකොට මිථ්‍යා ජීවිකා කෙරෙත්. මෙසේවූ තිරශ්චීන විද්‍යා හෙතුවෙන් වන මිථ්‍යා ජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඔහුගේ සීලය පිණිස වේ.

29. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති — සෙය්‍යථීදං[2]: ආවාහනං[3] විවාහනං[3] සංවදනං[4] විවදනං සංකිරණං විකිරණං සුභගකරණං[5] දුබ්භගකරණං[6] විරුද්ධගබ්භකරණං ජිව්හානිබන්ධනං[7] හනුසංහනනං හත්ථාභිජප්පනං[8] කණ්ණජප්පනං ආදාසපඤ්හං කුමාරිපඤ්හං[9] දෙවපඤ්හං ආදිච්චුපට්ඨානං මහතුපට්ඨානං අබ්භුජ්ජලනං සිරිව්හායනං[10] —ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

30. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති — සෙය්‍යථීදං:[2] සන්තිකම්මං පණිධිකම්මං භූතකම්මං[11] භූරිකම්මං වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකිරණං[12] ආචමනං නහාපනං[13] ජුහනං[14] වමනං විරෙචනං උද්ධවිරෙචනං[15] අධොවිරෙචනං සීසවිරෙචනං කණ්ණතෙලං නෙත්තතප්පණං[16] නත්ථුකම්මං අඤ්ජනං පච්චඤ්ජනං[17] සාලාකියං සල්ලකත්තියං[18] දාරකතිකිච්ඡා[19] මූලභෙසජ්ජානං අනුප්පාදනං[20] ඔසධීනං පටිමොක්ඛො[21] — ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ජීවිතං B. V.
2. සෙය්‍යථිද° B.V.
3. °හණං C.
4. °රණං B.V.; °රනං S.
5. සුභාගක° B.
6. දුබ්භාග°B.
7. °නිබන්ධනං B. V. S.
8. හත්ථා° හනුජප්පනං කණ්ණ° B. V.
9. කුමාරික° V. C.
10. සිරව්හායනං P. W.
11. භූරි°(භූතිකම්මං) P.
12. වත්ථුබලිකම්මං V., °වත්ථුපරිකම්මං B. °පවිකිරණං P.
13. න්හාපනං B. V.
14. ජුහනං Sa. ජුහණං C.
15. උද්ධං වි° B. V.
16. නෙත්තපානං B; නෙත්තප්පානං S.; නෙත්තතප්පනං Sa. C.
17. සච්ච° V.
18. °තිකං P. V. W.
19. °තිකිච්ඡං S.
20. අනුප්පදනං B. S.
21. පති°B.V.

29. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා, ආවාහ කරවීමය, විවාහ කරවීමය, සමගිය පිළිබඳ කථා කිරීමය, වියොගය පිළිබඳ කථා කිරීමය, ධන රැස්කිරීමය, වියදම් කිරීමය, සුභග කරණය (යහපත් ශ්‍රී කිරීමය), දුර්භගකරණය, ගර්භවිශරාධි කරණය, දිව තද කිරීමය, හනු බැඳීමය, අත් පෙරළීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, ශබ්ද නොඇසීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, කැඩපත්හි දෙවතාරොපණය කොට පැණ පිළිවිසීමය, කුමරියගේ සිරුරෙහි දෙවතාරොපණය කොට පැණ පිළිවිසීමය, දෙවදාසියගේ සිරුරෙහි යකුන් ආරොපණය කොට පැණ පිළිවිසීමය, හිරු වැඳීමය, මහබඹුට උවටැන් හෝ නැමදුම් කිරීමය, මුවින් ගිනි දැල් පිට කිරීමය, ශ්‍රී දෙවිය කැඳවීම යයි කියන මෙබඳු තිරශ්චීන විද්‍යාවෙන් මිථ්‍යාජීවිකා කෙරෙත්. මෙබඳුවූ තිරශ්චීන විජ්ජාවෙන් කරණ මිථ්‍යාජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඔහුගේ සීලය පිණිස වේ.

30. එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා ශාන්ති ප්‍රතිඥාත කර්මය,[1] කායික සමාධියෙන් පසු කළයුතු ප්‍රණිධිකර්මය, මන්ත්‍ර ප්‍රයොග කිරීමය, භූරිකර්මය, පණ්ඩකයා පුරුෂයකු කිරීමය, පුරුෂයා පණ්ඩකයකු කිරීමය, ගෙවල් නොකළ බිම ගෙවල් කිරීමය, ගෙට සුදුසු තැන බලිකම් විධානය, දියෙන් මුව සුද්ධ කිරීමය, නැහැවීමය, ගිනි පිදීමය, වමන කරවීමය, විරෙක කරවීමය, ඌර්ධ්ව විරෙකය, අධොවිරෙකය, සිරොවිරෙකය, කන් තෙලය, නෙත්‍රතර්පණය, නස්‍ය කිරීමය, ක්ෂාරවූ අඳුන් තැනීමය, සිසිල් බෙහෙත් අඳුන් සෑදීමය, සැත් කටු ලා කටයුතු වෙදකර්මය, ශල්‍යකර්මය, ළදරුවන් පිළිබඳ වෙදකර්මය, මූලික බෙහෙත් දීමය (බෙහෙත් ද්‍රව්‍යයෙන් කටයුතු ශරීර චිකිත්සාය), සැර බෙහෙත් දී පසුව එහි බල හැරීමය යන මෙබඳු තිරශ්චීන විද්‍යා කරණකොට හෝ මිථ්‍යාජීවයෙන් ජීවිකා කෙරෙත්. මෙබඳුවූ මිථ්‍යාජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඔහුගේ සීලය පිණිස වේ.

---

1. මේ ආදියෙහි විස්තර දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ බ්‍රහ්මජාල සූත්‍රයෙන් බලා දත යුතුයි.

31. අථ[1] ඛො සො පොට්ඨපාද භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සෙය්‍යථාපි පොට්ඨපාද රාජා ඛත්තියො මුද්ධාභිසිත්තො[2] නිහතපච්චාමිත්තො න කුතොචි භයං සමනුපස්සති යදිදං පච්චත්ථිකතො එවමෙව ඛො පොට්ඨපාද භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති. එවං ඛො පොට්ඨපාද භික්ඛු සීලසම්පන්නො හොති.

32. කථඤ්ච පොට්ඨපාද භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති? ඉධ පොට්ඨපාද භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී[3]. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාසවෙය්‍යුං[4] තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා—පෙ— ඝාණෙන ගන්ධං ඝායිත්වා—පෙ—ජිව්හාය රසං සායිත්වා—පෙ— කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා—පෙ—මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී[3]. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාසවෙය්‍යුං[4] තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති මනින්ද්‍රියං මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං[5] පටිසංවෙදෙති. එවං ඛො පොට්ඨපාද භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති.

---

1. ස ඛො P. S. W.
2. මුද්ධාව° P. C.
3. නානුව්‍ය° P. W.
4. අන්වාස්ස° P. W.
5. අව්‍යා° P. W.

31. පොට්ඨපාදය, මෙසේ සීලසම්පන්නවූ මහණහට (අසංවරය මුල්කොට උපදනාවූ) භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ඔහුගේ සීලසංවරය හෙතුකොටගෙණ කිසිතැනකදී නොඋපදනේය. කුමක් මෙන්ද යත්:—පොට්ඨපාදය, ක්‍ෂත්‍රියාභිෂේකයෙන් මුදුනෙහි අභිෂේක ලද්දවූ, නැසූ පසමිතුරන් ඇති, ක්‍ෂත්‍රිය රජෙක් කිසියම් සතුරෙකුගෙන් කිසි භයක් නොදක්නේද, එපරිද්දෙන්ම පොට්ඨපාදය, සීලසම්පන්නවූ මහණතෙමේ (අසංවර හෙතුවෙන් උපදනාවූ) භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු සීලසංවරය හෙතුකොට කිසි තැනකදී නොදක්නේය (ඔහුට කිසිවකින් බියක් නැත). ආර්‍යවූ (ශ්‍රෙෂ්ඨවූ) මේ සීල රාශියෙන් යුක්තවූ ඒ මහණ තෙමේ, ස්වසන්තානයෙහි පිරිසිදුවූ (කායික චෛතසික) සැපය විඳිති. පොට්ඨපාදය, මෙසේ දක්වූ (ත්‍රිවිධ) ශීලයෙන් යුක්තවූ මහණ තෙමේ සීලසම්පන්න නම් වේ.

32. පොට්ඨපාදය, මහණ තෙමේ කෙසේ නම් ඉන්‍ද්‍රියයන්හි වැසූ දොරටු ඇත්තේ ද? පොට්ඨපාදය, මේ සස්නෙහි (මනාසේ පිළිපන්) මහණ තෙමේ, ඇසින් රූපයක් දුක නිමිත්තග්‍රාහී නොවේ (එහි නොඇලේ). අනුබ්‍යඤ්ජන වශයෙන් නොගන්නේ එහි විස්තර සෙවීමට නොපෙලඹේ. චක්‍ෂුරින්‍ද්‍රියයෙහි අසංවරව වසන්නහුට යමක් හෙතුකොටගෙණ අභිජ්ඣාදෞර්මනස්සාදි (දූෂි ආසාව හා තලකිරීමාදි) ලාමක වූ අකුශල ධර්මයෝ වහනය වන්නාහු ද (ස්වසන්තානයට ඇතුල් වන්නාහු ද), එබඳු දෙයින් වැලකීම පිණිස හෙතෙම පිළිපදී. හෙතෙම තමාගේ චක්‍ෂුරින්‍ද්‍රිය රකී, චක්‍ෂුරින්‍ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කනින් ශබ්දයක් අසා— [ඇස පිළිබඳ කී නයින් දත යුතුයි]—නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණයකොට —පෙ— දිවෙන් රසයක් විඳ —පෙ— කයින් ස්පර්ශකටයුත්තක් ස්පර්ශකොට —පෙ— සිතින් ධර්මයක් (කරුණක්) දුන එහි නිමිති නොගන්නේය (එහි නොඇලෙන්නේය), අනුබ්‍යඤ්ජන වශයෙන් නොගන්නේය (එහි නොපෙලඹෙන්නේය). මනින්‍ද්‍රියයෙහි (සිතෙහි) අසංවරව වසන්නහුට යමක් නිසා අභිජ්ඣා දෞර්මනස්සාදි ලාමක අකුශල ධර්මයෝ වහනය වෙත් ද (ස්වකීය සන්තානයට වදිත් ද), එබඳු දෙයින් වැලකීම පිණිස හෙතෙම පිළිපදී. හෙතෙම මනින්‍ද්‍රිය රකී, මනින්‍ද්‍රියයෙහි සංවරයට පැමිණේ. එබඳුවූ මහණ තෙමේ ආර්‍යවූ (උතුම් වූ) ශීල රාශියෙන් යුක්ත වූයේ, අභ්‍යන්තරයෙහි පිරිසිදුවූ (අසම්මිශ්‍රවූ) අධිචිත්ත සුඛය විඳිති. පොට්ඨපාදය, මෙසේ වූ මහණ තෙමේ ඉන්‍ද්‍රියයන්හි වසන ලද දොරටු ඇත්තේ වේ.

33. කථඤ්ච පොට්ඨපාද භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති?

ඉධ පොට්ඨපාද භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති සම්මිඤ්ජිතෙ[1] පසාරිතෙ සම්පජානකාරී හොති සඞ්ඝාටි-පත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති. ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති. එවං ඛො පොට්ඨපාද භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති.

34. කථඤ්ච පොට්ඨපාද භික්ඛු සන්තුට්ඨො හොති?

ඉධ පොට්ඨපාද භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන[2] චීවරෙන කුච්ඡිපරිහාරිකෙන[2] පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. සෙය්‍යථාපි පොට්ඨපාද පක්ඛී සකුණො යෙන යෙනෙව ඩෙති සපත්තභාරොව ඩෙති එවමෙව ඛො[3] පොට්ඨපාද භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරි-කෙන[2] චීවරෙන කුච්ඡිපරිහාරිකෙන[2] පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. එවං ඛො පොට්ඨපාද භික්ඛු සන්තුට්ඨො හොති.

---

1. සම්ඤ්ජිතෙ B. V.
2. °පරිහාරියෙන V.
3. ඛො ඉති න දිස්සති P.

33. පොට්ඨපාදය, මහණ තෙමේ කෙසේ නම් සතිසම්පජඤ්ඤයෙන් (සිහියෙන් හා මනා ප්‍රඥාවෙන්) යුක්ත වූයේ වේද?

පොට්ඨපාදය, මේ සස්නෙහි (මනාව පිළිපන්) මහණ තෙම ඉදිරියට යෑමෙහි ද, ආපසු යෑමෙහි ද, යහපත් වූ නුවණින් දැන ඒ ක්‍රියා කරන්නේය. ඉදිරි බැලීමෙහි ද, අනුදික් (වටපිට), බැලීමෙහි ද, නුවණින් දැන බලන්නේය. අත් පා හැකිලීමෙහි ද දිගු කිරීමෙහි ද මනා නුවණින් දැන එසේ කරන්නේය. සඟළය පාත්‍රය, සිවුරුය යන මේ දේ දැරීමෙහිදී මනා නුවණින් දැන ඒ ඒ දැරීම් ආදිය කරන්නේය. අනුභව කිරීමය, පානය කිරීමය, කෑමය, රස විඳීමය යන මෙහි ද මනා නුවණින් යෙදී (දැන) ඒ ඒ අනුභව කිරීමාදිය කරන්නේය. මළ මූත්‍ර පහකිරීම් ද නුවණින් (ආදීනව) සලකා කරන්නේය. යෑම්, සිටීම්, හිඳීම්, සැතපීම්, නිදි තොරකිරීම්, කථාකිරීම්, නිශ්ශබ්ද ව සිටීම් යන මේ දේ මනා නුවණින් දැන කරන්නේය. පොට්ඨපාදය, මෙසේ කරන්නාවූ මහණ තෙමේ සිහියෙන් යුක්තවූයේ යහපත් නුවණින් යුක්ත වූයේ වෙයි. (මෙකී සියලු ඉරියව් පිළිබඳව ආදීනව හා ආනිසංසයන් ද, ශරීරය පිළිබඳ අනිත්‍යතාදි සවභාවයන්ද නුවණින් සලකා ඒ ඒ කෘත්‍යයන්හි යෙදේ හි සේයි.)

34. පොට්ඨපාදය, මහණතෙමේ කෙසේ නම් ප්‍රත්‍යයන් පිළිබඳ යථාලාභසන්තොෂයෙන් සතුටු වූයේ වේද?

පොට්ඨපාදය, මේ සස්නෙහි (මනාව පිළිපන්) මහණතෙමේ කායපරිහරණයට ප්‍රමාණවූ (යත්තම් කය වැසීමට තරම්වූ) සිවුරෙන් ද කුසපරිහරණයට ප්‍රමාණවූ පිණ්ඩපාත භොජනයෙන් ද සතුටු වූ සිත් ඇත්තේ වේ. ඒ මහණතෙමේ යම් යම් තැනකට යේ නම් අටපිරිකර (කය පිළිබඳ වූ දේ) පමණක් රැගෙණ යේ. පොට්ඨපාදය, යම් සේ පියාපත් ඇති පක්ෂියෙක් යම් යම් තැනෙක පියාඹා යේ නම් ඒ සියලු තැන පියාපත් බර පමණකින් යුක්තව පියාඹා යේද, පොට්ඨපාදය, එපරිද්දෙන්ම භික්‍ෂු තෙමේ ද කාය පරිහරණයට ප්‍රමාණවූ සිවුරෙන් ද කුච්ඡි පරිහරණයට ප්‍රමාණවූ පිණ්ඩපාත භොජනයෙන් ද සතුටු වන්නේ වේ. ඒ මහණ තෙමේ යම් යම් තැනක යේ නම් කායපටිබද්ධවූ අටපිරිකර පමණක් රැගෙණ බැහැර යේ. පොට්ඨපාදය මෙසේ වූ මහණ තෙමේ (යම්තම් ලත් දෙයින්) ඉතරීතරසන්තොෂයෙන් යුක්තවේ.

35. සො ඉමිනා ච[1] අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං[2] වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

36. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. බ්‍යාපාදපදොසං[3] පහාය අබ්‍යාපන්නචිත්තො[4] විහරති සබ්බපාණභූතහිතානුකම්පී බ්‍යාපාදපදොසා[3] චිත්තං පරිසොධෙති. ථීනමිද්ධං[5] පහාය විගතථීනමිද්ධො[5] විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො ථීනමිද්ධා චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

37. සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසො ඉණං[6] ආදාය කම්මන්තෙ පයොජෙය්‍ය තස්ස තෙ කම්මන්තා සමිජ්ඣෙය්‍යුං. සො යානි ච පොරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තීකරෙය්‍ය[7]. සියා චස්ස[8] උත්තරිං අවසිට්ඨං දාරභරණාය[9]. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ ඉණං ආදාය කම්මන්තෙ පයොජෙසිං[10] තස්ස මෙ තෙ කම්මන්තා සමිජ්ඣිංසු. සොහං යානි ච පොරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තිඅකාසිං.[11] අත්ථි ච මෙ උත්තරිං අවසිට්ඨං දාරභරණායාති[9]. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං[12] අධිගච්ඡෙය්‍ය[13] සොමනස්සං.

---

1. චකාරෙ නත්ථි W.
2. සුසාණං C.
3. ව්‍යා° P. W.
4. අව්‍යා° P. W.
5. ථින° B.
6. ඉනං C.
7. ව්‍යන්ති° P.C. °ව්‍යන්තී° W. බ්‍යන්තිං° B.
8. තස්ස Sa.
9. දාර° P. W.
10. පයොජෙමි B.
11. ව්‍යන්තිං අ° B. ව්‍යන්ති° P. W.
12. පාමුජ්ජං P. W. C.
13. අධිගච්ඡෙ C. P.

35. ආර්‍යවූ මෙවත් උතුම්වූ මේ සීලසමූහයෙන් යුක්තවූ ද, උතුම්වූ මේ ඉන්ද්‍රියසංවරයෙන් යුක්තවූ ද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවූ ද, මේ උතුම් ඉතරීතර-සන්තොෂයෙන් යුක්තවූ ද, ඒ (යොගාවචර) මහණ තෙමේ (මනුෂ්‍ය වාසයෙන් දුනු පන්සියයකින් ඔබ්බෙහි වූ) අරණ්‍යය ද, (ජනයාගෙන් තොරවූ) වෘක්‍ෂමූලය ද, පර්වත පෙදෙස් ද, කඳුරැලි ගිරිගුහාවන් හෝ මහා උමඟද, සොහොන් ද, ඉතා දුරවූ වනසෙනසුන් ද, අභ්‍යාවකාශ (බොහෝ ඉඩකඩ ඇති) තැන් සහ පිදුරු ගුහා ද යන මේ (ජනයාගෙන් හිස්වූ) සෙනසුන් ඇසුරු කෙරෙයි. ඒ මහණ තෙමේ පසුබත්කාලයෙහි පිණ්ඩපාත භොජනයෙන් වැලැක්කේ, පර්‍ය්‍යඞ්කය බැඳ, උඩුකය ඇද නොවන සේ තබා, නිවණෙහිම සිත එලවා, ඒ නිවණම අරමුණු වසයෙන් සිත ඉදිරියෙහි පිහිටුවා ගෙණ හිඳී.

36. ඒ මහණ තෙමේ ලොකයෙහි (පඤ්චුපාදනස්කන්ධ යන්හි) අභිධ්‍යාව (ලොභය) පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේ. ඒ අභිධ්‍යාවෙන් සිත (වෙන්කොට) පිරිසිදු කෙරේ. සිත කෙලසන්නාවූ ක්‍රොධය පහකොට, ක්‍රොධයෙන් දූෂිතවූ සිත් නැතතේ, ප්‍රාණීවූ සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේව වෙසේ. ව්‍යාපාද දූෂණයෙන් සිත (වෙන් කොට) පිරිසිදු කෙරේ. කායචිත්ත දෙදෙනාගේ අලසබව යයි කියන ලද ථීනමිද්ධය දුරුකොට කය—සිත පිළිබඳ පහ වූ අලසබැව් ඇත්තේ, ආලොකසංඥ (පිරිසිදු හැඟීම්) ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥ ඇත්තෙක්ව වෙසේ. ථීනමිද්ධනීවරණයෙන් සිත පිරිසිදු කෙරේ. උඩඟු බව හා කුකුස (උද්ධච්චකුක්කුච්චය) දුරුකොට, සංසිඳුනු සිත් ඇතිව (අනුද්ධතව) වාසය කෙරේ. අධ්‍යාත්මයෙහි (ඇතුළත) සංසිඳුනු සිත් ඇත්තේ, උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසිදු කෙරේ. (බුද්ධාදී අටතැන්හි සැකකිරීම ලකුණුකොට ඇති) විචිකිච්ඡාව දුරුකොට, එතර කල (පහකල) විචිකිච්ඡා ඇත්තේ කුශලධර්ම විෂයෙහි 'ඒ කෙසේ ද මේ කෙබඳුද'යි යන සැක නැතිව වෙසේ, විචිකිච්ඡායෙන් සිත පිරිසිදු කෙරේ.

37. පොට්ඨපාදය, යම්සේ පුරුෂයෙක් ණය ගෙණ කර්මාන්ත-යන්හි යොදන්නේ ද, ඔහුගේ ඒ කර්මාන්තයෝ දියුණු වන්නාහු නම් ඔහුගේ ඒ පරණ ණය මුදල් සියල්ලම ගෙවන්නේය. ඔහුගේ අඹුදරුවන් පුස්නා පිණිස වැඩි යමක් ඉතුරු වූයේ නම් ඔහට මෙබඳු අදහසක් වන්නේය. [කෙසේද යත්:] 'මම වනාහි පළමුවෙන් ණය ගෙණ කර්මාන්තයන්හි යෙදුවෙමි. ඒ මාගේ කර්මාන්තයෝ සමෘද්ධවූහ. ඒ මම පැරණි ණය ගෙවූයෙමි. අඹුදරුවන් පොෂ්‍යකිරීම පිණිස අතිරේක මුදලක් ද මට ඇත්තේය' කියායි. හෙතෙම ඒ ණය නැති බව මුල්කොට ගෙණ බලවත් සතුටක් ලබන්නේය, සොම්නසට ද පැමිණෙන්නේය.

38. සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසො ආබාධිකො අස්ස දුක්ඛිතො බාළ්හගිලානො භත්තං චස්ස නච්ඡාදෙය්‍ය [1] න චස්ස කායෙ බලමත්තා. සො අපරෙන සමයෙන තම්හා ආබාධා මුච්චෙය්‍ය භත්තඤ්චස්ස ඡාදෙය්‍ය සියා චස්ස කායෙ බලමත්තා. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ ආබාධිකො අහොසිං දුක්ඛිතො බාළ්හගිලානො භත්තං ච මෙ නච්ඡාදෙසි න චස්ස [2] මෙ ආසි කායෙ බලමත්තා. සොම්හි එතරහි තම්හා ආබාධා මුත්තො භත්තඤ්ච මෙ ඡාදෙති අත්ථි ච මෙ [3] කායෙ බලමත්තාති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය [4] සොමනස්සං.

39. සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසො බන්ධනාගාරෙ බද්ධො අස්ස. සො අපරෙන සමයෙන තම්හා බන්ධනාගාරා [5] මුච්චෙය්‍ය සොත්ථිනා අබ්බයෙන [6]. න චස්ස කිඤ්චි භොගානං වයො. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ බන්ධනාගාරෙ බද්ධො අහොසිං සොම්හි එතරහි තම්හා බන්ධනාගාරා [5] මුත්තො සොත්ථින
අබ්බයෙන [6]. නත්ථි ච මෙ කිඤ්චි භොගානං වයොති. සෙ
තතොනිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය [4] සොමනස

40. සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසො දාසො අස්ස අනත
ධීනො [7] පරාධීනො [7] න යෙනකාමංගමො. සො අප
සමයෙන තම්හා දාසබ්‍යා [8] මුච්චෙය්‍ය අත්තාධීනො [7] අපරා
භුජිස්සො යෙනකාමංගමො. තස්ස එවමස්ස: අහං ඛො
දාසො අහොසිං අනත්තාධීනො [7] පරාධීනො [7] න
කාමංගමො. සොම්හි එතරහි තම්හා දාසබ්‍යා [8]
අත්තාධීනො [7] අපරාධීනො [7] භුජිස්සො යෙනකාම
සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං අධි
සොමනස්සං.

---

1. න ඡාදෙය්‍ය S.
2. න ච මෙ P. W.
3. අත්ථි ච කායෙ P.
4. පාමුජ්ජං අධිගච්ඡෙ P. W. C.
5. බන්ධාගාරා B.
6. අව්‍යයෙන P.
7. °ධිනො B.
8. දාසව්‍යා P

38. පොට්ඨපාදය, යම්සේ වනාහි මහත් රෝගයෙන් පෙළෙන (ආබාධ ඇත්තාවූ), දුක් ඇත්තාවූ, දැඩි ගිලන්බව ඇති පුරුෂයෙක් වන්නේ ද, ඔහට බත් (ආහාර) රුචි නොවන්නේ ද, ඔහුගේ ශරීරයෙහි කිසි ශක්තියක් නැත්තේ ද වෙයි. ඒ පුරුෂතෙම පසු කාලයක ඒ ආබාධයෙන් මිදෙන්නේ නම්, ඔහුට ආහාර රුචිය ඇති වන්නේ නම්, ඔහුගේ ශරීරබලය ඇති වන්නේ නම්, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. (කෙබඳු ද යත්:) 'මම වනාහි පෙර ආබාධ ඇත්තාවූ, දුක් ඇති, දැඩි ගිලන් බැව් ඇති කෙනෙක් වීමි. මට බත් රුචිය ද නොවීය. ශරීර-බලය ද නැතිවිය. ඒ මම පළමු තිබූ ආබාධයෙන් මිදුනෙමි. මට ආහාරරුචිය ද ඇත්තේය. කාය බලය ද තිබේය' කියායි. හෙතෙම ඒ කාරණය මුල්කොට බලවත් සතුටක් ලබන්නේය, සොම්නසට ද පැමිණෙන්නේය.

39. පොට්ඨපාදය, යම්සේ පුරුෂයෙක් සිරගෙයි බැඳුනේ වේද, හෙතෙම පසු කලෙක වියදම් නැතිව (පීඩා රහිතව) සැපසේ ඒ සිරගෙයින් මිදෙන්නේය. ඔහුගේ භොගයන් පිළිබඳ කිසිත් වියදමක් ද නොවන්නේය. ඔහුට මෙබඳු අදහසක් වන්නේය (එනම්:) 'මම වූකලී පෙර සිරගෙයි බැඳුනෙක් වූයෙමි. ඒ මම දැන් වියදම් නැතිව (පීඩා රහිතව) සැපසේ ඒ සිරගෙයින් මිදුනෙමි. මගේ භොගයන් පිළිබඳ කිසි වියදමක් ද නොවූයේය' කියායි. ඒ පුරුෂ තෙම සිරගෙයින් මිදීම නිමිති කොට බලවත් සතුටක් ලබන්නේය, සොම්නසට ද පැමිණෙන්නේය.

40. පොට්ඨපාදය, යම්සේ සිය කැමැත්තෙන් යමක් කරන්ට නොහැකි (අධිපති භාවයක් නැත්තාවූ), අනුන්ගේ කැමැති පරිදි පවත්නාවූ (අනුන්ට යටහත්වූ), තමා කැමැති ගමනක් ඒ වූ පරිදි යා නොහැකි, වැඩකරුවෙක් වන්නේ ද, හෙතෙම පසු කලෙක ඒ දසභාවයෙන් මිදෙන්නේ, තමාම අධිපතිකොට ඇත්තේ, පරාධීන නො වූයේ, අනුන්ට යටත් නොව තමාගෙන්ම යැපෙන්නේ, සිය අදහස් පරිදි ඒ ඒ තැන යා හැකි වන්නේ ද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. (එනම්:) 'මම වනාහි පෙර සියකැමැති පරිදි යමක් කරන්ට නොහැකි අනුන්ට යටත් පැවතුම් ඇති, මා අදහස් පරිදි කිසි තැනෙක ය
නොහැකි දසයෙක් වීමි. ඒ මම දැන් ඒ දසභාවයෙ
මිදුනෙක්මි. ආත්මාධීන වූයෙමි, පරාධීන නොවූයෙමි, මෙර
හට යටත් නොව මා සපයාගත් දෙයින්ම යැපෙන්නෙමි,
අදහස් පරිදි ඒ ඒ කැමැති තැනෙක යා හැක්කෙක් ද වේ
කියායි. හෙතෙම ඒ දසභාවයෙන් මිදීම හෙතුකොට බ
සතුටක් ලබන්නේය, එසේ සොම්නසට ද පැමිණෙන්

41. සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසො සධනො සභොගො කන්තාරද්ධානමග්ගං[1] පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං. සො අපරෙන සමයෙන තං කන්තාරං නිත්ථරෙය්‍ය සොත්ථිනා ගාමන්තං අනුපාපුණෙය්‍ය ඛෙමං අප්පටිභයං. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ සධනො සභොගො කන්තාරද්ධානමග්ගං[1] පටිපජ්ජිං දුබ්භික්ඛං සප්පටිභයං. සොම්හි එතරහි තං කන්තාරං තිණ්ණො[2] සොත්ථිනා ගාමන්තං අනුප්පත්තො ඛෙමං අප්පටිභයන්ති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං[3] අධිගච්ඡෙය්‍ය[4] සොමනස්සං.

42. එවමෙව ඛො පොට්ඨපාද භික්ඛු යථා ඉණං යථා රොගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං එවං[5] ඉමෙ පඤ්චනීවරණෙ අප්පහීනෙ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි පොට්ඨපාද යථා[6] ආනණ්‍යං යථා ආරොග්‍යං යථා බන්ධනාමොක්ඛං යථා භුජිස්සං යථා ඛෙමන්තභූමිං එවමෙව ඛො පොට්ඨපාද භික්ඛු ඉමෙ පඤ්චනීවරණෙ පහීනෙ අත්තනි සමනුපස්සති.

43. තස්සිමෙ පඤ්චනීවරණෙ පහීනෙ අත්තනි සමනුපස්සතො පාමොජ්ජං[3] ජායති පමුදිතස්ස පීති ජායති පීතිමනස්ස කායො පස්සම්භති පස්සද්ධකායො සුඛං වෙදෙති[7] සුඛිනො චිත්තං සමාධියති.

---

1. කන්තාරං අද්ධාන° B. S. Pa.
2. නිත්ථිණ්ණො P.W. නිත්ථින්නො Pa.
3. පාමුජ්ජ- P. W. C.
4. අධිගච්ඡෙ P. C.
5. එවං ති න දිස්සති P. W. S.
6. යථා ති නත්ථි B.P. (සබ්බත්ථ)
7. පටිසංවෙදෙති S.

41. පොට්ඨපාදය, යම්සේ ධනවත්වූ, භොගසම්පත් ඇති පුරුෂයෙක් ආහාර දුලීභවූ, භය සහිතවූ, නිරුදකවූ දීර්ඝමාර්ගයකට (දුරුකතරමගකට) පැමිණෙන්නේ ද, හෙතෙම මඳකලකින් ඒ කාන්තාරමාර්ගය ඉක්මවා යන්නේ, සැපවත්වූ, (සොර සතුරන්ගෙන්) ප්‍රතිභය රහිත වූ ගම්මානයකට ක්‍රමයෙන් පැමිණෙන්නේ ද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: 'මම වනාහි පෙර ධනවත් වූයෙමි, භොගසම්පත් සහිත වූයෙමි, දුලීභ භික්ෂා ඇති, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාරමාර්ගයකට පිළිපන්නෙක් වූයෙමි. එසේ වූ මම දූත් එම කාන්තාරමාර්ගය තරණය කෙලෙමි. සැපවත්වූ, ප්‍රතිභය රහිතවූ ගමකට සැපසේ ක්‍රමයෙන් පැමිණියෙමි'යි කියායි. ඒ පුරුෂ තෙමේ ඒ කතරමග එතර කිරිම නිමිතිකොට බලවත් සතුටක් ලබන්නේය, එසේම සොම්නසට ද පැමිණෙන්නේය.

42. පොට්ඨපාදය, ණය යම්සේ ද, රෝගය යම්සේ ද, බන්ධනාගාරය යම්සේ ද, දාසභාවය යම්සේ ද, දුරුකතරමග යම්සේ ද, එපරිද්දෙන් මහණ තෙමේ ප්‍රහීණ නොවූ (පහ නොකළ) පඤ්චනීවරණයන් තමා කෙරෙහිලා නුවණින් දකී. පොට්ඨපාදය, ණය නැති බව යම්සේ ද, නීරෝගී බව යම්සේ ද, සිරගෙන් මිදීම යම්සේ ද, මෙරමාහට යටත් නැති බව යම්සේ ද, අභය භූමිය යම්සේද, එපරිද්දෙන්ම පොට්ඨපාදය, මහණ තෙමේ ප්‍රහීණවූ මේ පඤ්චනීවරණ ධර්මයන් තමා විෂයෙහි ලා දක්නේය.

43. ප්‍රහීණවූ මේ පඤ්චනීවරණයන් තමා කෙරෙහි නැතැයි නුවණින් දක්නාවූ ඒ මහණහට සතුටු ආකාරය උපදී. සතුටු වූවහුට (සියල් සිරුර කලඹමින්) ප්‍රීතිය උපදී, ප්‍රීති සහගත සිත් ඇත්තහුගේ නාමකය (සන්තානය) සංසිඳෙයි, සංසිඳුනු කය ඇති (කය පිළිබඳ මැඩ ලූ දහ ඇති) තැනැත්තේ කායික චෛතසික සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධියට (එකඟ බවට) එළඹෙයි.

44. තස්සිමෙ පඤ්චනීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සතො පාමොජ්ජං[1] ජායති, පමුදිතස්ස පීති ජායති පීතිමනස්ස කායො පස්සම්භති පස්සද්ධකායො සුඛං වෙදෙති[2] සුඛිනො චිත්තං සමාධියති.

45. සො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං[3] උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා කාමසඤ්ඤා සා නිරුජ්ඣති. විවෙකජපීතිසුඛසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයෙ හොති විවෙකජ-පීතිසුඛසුඛුමසච්චසඤ්ඤී යෙව තස්මිං සමයෙ[4] හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජන්ති[5] සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣන්ති[6]. අයං[7] සික්ඛාති භගවා අවොච.

46. පුනචපරං පොට්ඨපාද භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං[8] උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා විවෙකජපීතිසුඛසුඛුමසච්චසඤ්ඤා[9] සා නිරුජ්ඣති. සමාධිජපීතිසුඛසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයෙ හොති. සමාධිජපීතිසුඛසුඛුමසච්චසඤ්ඤී යෙව තස්මිං සමයෙ හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජන්ති[5] සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣන්ති[6]. අයං[7] සික්ඛාති භගවා අවොච.

---

1. පාමුජ්ජං P. W. C.
2. පටිසංවෙදෙති S.
3. පඨමං ඣානං B. V.
4. සමයෙ ති නත්ථි S.
5. උප්පජ්ජති B. S. V.
6. නිරුජ්ඣති B. S. V.
7. අයම්පි B.S.
8. දුතියං ඣානං B. V.
9. විවෙකජං පීතිසුඛං සුඛුම° P.

44. මෙසේ තමා කෙරෙහි ලා පඤ්චනීවරණයන් ප්‍රහීණ වූ බව දක්නා මහණ හට ප්‍රමෝද්‍යය (සතුටු ආකාරය) උපදී. ප්‍රමුදිතයාහට ප්‍රීතිය උපදී. ප්‍රීත සිත් ඇත්තාගේ නාමකායය (සන්තානය) පහ වූ දුහ ඇත්තේ සන්සුන් වේ. සන්සුන් වූ සිතැත්තේ කය පිළිබඳ වූත් සිත පිළිබඳ වූත් සුවය විඳී. (නෛෂ්ක්‍රම්‍ය සුඛයෙන්) සුව ඇත්තහුගේ සිත (උපචාර වශයෙනුත් අර්පණා වශයෙනුත්) එකඟ වේ.

45. මෙසේ ඒ යෝගාවචර තෙම (සියලු) කාමවස්තූන්ගෙනුත් වෙන්වූයේ (තෘෂ්ණාදි) සංක්ලේශ ධර්මයන්ගෙනුත් වෙන්වූයේ, (අරමුණට සිත නැංවීමම ලක්ෂණ කොට ඇති) විතර්කය සහිත වූ, (අරමුණ පිරිමැදීම ලක්ෂණ කොට ඇති) විචාරය සහිත වූ විවේකයෙන් (නීවරණයන්ගෙන් වෙන් වීමෙන්) හටගත් සියලු කය පැතිර සිටිනා ප්‍රීති සුඛ දෙකින් යුක්තවූ ප්‍රථම ධ්‍යානය ඉපදවීම් වශයෙන් ඊට පැමිණ වාසය කෙරේ. (මේ ක්‍රමයෙන් ප්‍රථමධ්‍යාන ලාභි වූ) ඒ මහණහට (තද්ධ්‍යානලාභයට) පූර්වභාගයෙහි යම් කාම සංඥාවක් වීද, ඒ නිරුද්ධ වේ. ඒ අවස්ථායෙහි විවේකයෙන් උපන් ප්‍රීති සුඛ යුක්තවූ, (කාමච්ඡන්දාදීන්ගේ ප්‍රහාණයෙන්) සූක්ෂ්ම වූ ලබන ලද සංඥාවක් ඇති වේ. (ඒ මහණ තෙමේ) ඒ අවස්ථාවෙහි විවේකයෙන් හටගත් ප්‍රීතිසුඛ ඇති, සියුම් සත්‍ය සංඥා ඇත්තේ වෙයි. මෙසේත් ශික්ෂා (සඞ්ඛ්‍යාත ප්‍රථම ධ්‍යාන) හේතුයෙන් ඇතැම් සංඥාවෝ උපදිති, ශික්ෂාවෙන් ඇතැම් සංඥාවෝ නිරුද්ධ වෙති. මේ වනාහි (පළමුකොට ප්‍රථමධ්‍යාන සඞ්ඛ්‍යාත) එක් ශික්ෂාවකැයි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

46. පොට්ඨපාදය, නැවතද මහණ තෙම විතර්ක, විචාරයන් සංසිඳුවීමෙන්, එම හේතුයෙන්ම (හෙවත් විතර්ක-විචාර නැතිවූ බැවින්) චිත්තයාගේ පැහැදීම කරන්නා වූ, (ශ්‍රේෂ්ඨව හෝ එකලාව පහලවන බැවින්, නැතහොත් තෙමේ ශ්‍රේෂ්ඨව සම්ප්‍රයුක්ත ධර්මයන් නඟා සිටුවන බැවින්) 'එකොදි' යැයි කියන ලද, සිතෙහි සමාධිය වඩන්නාවූ, විතර්ක රහිතවූ විචාර රහිතවූ, සමාධියෙන් හටගත්, ප්‍රීතියෙන් හා සුඛයෙන් යුක්තවූ ද්විතිය ධ්‍යානයට පැමිණ වාසය කෙරේ. එසමයෙහි ඔහට (ද්විතියධ්‍යාන ලාභයට) පූර්වභාගයෙහි යම් විවේකජ ප්‍රීතිසුඛ යුක්ත සූක්ෂ්මසංඥාවක් වීද, ඒ නිරුද්ධ වේ. සමාධියෙන් උපන් ප්‍රීති සුඛ යුක්ත (ඖදරිකාඞ්ගයන්ගේ ප්‍රහාණය කිරීම් වශයෙන්) සූක්ෂ්ම වූ සංඥාවක් නියම වශයෙන් පහල වේ. එසමයෙහි ඒ තෙම සමාධිජ ප්‍රීති සුඛ යුක්ත සූක්ෂ්ම සංඥා ඇත්තේ ම වේ. මෙසේ ද ශික්ෂා සඞ්ඛ්‍යාත ද්විතියධ්‍යාන, හේතුයෙන් ඇතැම් සංඥාවෝ උපදිති, ඇතැම් සංඥාවෝ නිරුද්ධ වෙති. මේ (ද්විතීයධ්‍යාන සඞ්ඛ්‍යාත) ශික්ෂාවයැයි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

47. පුනචපරං පොට්ඨපාද භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො[1] ච විහරති සතො ච සම්පජානො ච සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යන්තං අරියා ආචික්ඛන්ති: උපෙක්ඛකො[1] සතිමා සුඛවිහාරීති තතියජ්ඣානං[2] උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා සමාධිජපීතිසුඛසුඛුමසච්චසඤ්ඤා[3] සා නිරුජ්ඣති. උපෙක්ඛාසුඛසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයෙ හොති. උපෙක්ඛාසුඛසුඛුමසච්චසඤ්ඤී යෙව තස්මිං සමයෙ හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජන්ති[4] සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣන්ති.[5] අයං[6] සික්ඛාති භගවා අවොච.

48. පුනචපරං පොට්ඨපාද භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා[7] අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං[8] චතුත්ථජ්ඣානං[9] උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා උපෙක්ඛාසුඛසුඛුමසච්චසඤ්ඤා සා නිරුජ්ඣති. අදුක්ඛමසුඛසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයෙ හොති. අදුක්ඛමසුඛසුඛුමසඤ්ඤීයෙව තස්මිං සමයෙ හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජන්ති[4] සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣන්ති.[5] අයං[6] සික්ඛාති භගවා අවොච.

---

1. උපෙඛකො P. W.
2. තතියං ඣානං B. V.
3. සමාධිජ· පීතිසුඛ· සුඛුම° P.
4. උප්පජ්ජති B. S. V.
5. නිරුජ්ඣති B. S. V.
6. අයම්පි B. S.
7. අත්ථගමා P. W.
8. උපෙඛා° P. W.
9. චතුත්ථං ඣානං P. B. V.

47. පොට්ඨපාදය, නැවතද භික්ෂුතෙම ප්‍රීතිහුගේ ද නො ඇල්මෙන් ධ්‍යානොපෙක්ෂාවෙන් (මැදහත් බැවින්) යුක්ත වූයේ මනා සිහි නුවණ ඇත්තේද වෙයි. කයින්ද සැපයක් විඳියි. යම් ධ්‍යානයක් පිළිබඳව (ඊට සම්වැදුණු තැනැත්තා) උපෙක්ෂා ඇත්තේය, සිහි ඇත්තේය, සැප විහරණ ඇත්තේයයි (බුද්ධාදි) ආර්‍ය්‍යයෝ කියත්ද, එසේවූ තුන්වැනි ධ්‍යානයට පැමිණ වාසය කෙරේ. එසමයෙහි ඔහුට (තෘතීයධ්‍යාන ලාභයට) පූර්වභාගයෙහි යම් සමාධියෙන් හටගත් ප්‍රීති සුඛ යුක්ත සූක්ෂම සංඥාවක් වීද, ඒ නිරුද්ධ වේ. උපෙක්ෂා සුඛ යුක්ත සූක්ෂම සංඥාවක් පහළ වේ. ඒ අවස්ථායෙහි හෙතෙම උපෙක්ෂා - සුඛ යුක්ත සූක්ෂම සංඥාවක් ඇත්තේ ම වේ. මෙසේ ද ශික්ෂා හේතුයෙන් ඇතැම් සංඥාවෝ උපදිත්. ඇතැම් සංඥාවෝ නිරුද්ධවෙත්. මේ (තෘතීයධ්‍යාන සඞ්ඛ්‍යාත) ශික්ෂාව යැයි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

48. පොට්ඨපාදය, නැවතද මහණ තෙම (කායික) සුඛයාගේද (කායික) දුක්ඛයාගේ ද දුරුවීමෙන්, පෙරම (හෙවත් ප්‍රථම ද්විතීය තෘතීය ධ්‍යානයන්ගේ උපචාරක්ෂණයෙහිම) සොම්නස් දොම්නස් දෙදෙනාගේ දුරුවීම වූ හෙයින්, දුක් නොවූ, සැප නොවූ, උපෙක්ෂාවෙන් හටගත් සමෘතියගේ පිරිසුදු බව ඇත්තාවූ, චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කෙරේ. එසමයෙහි ඔහුට පෙර (චතුර්ථධ්‍යාන ලාභයට පූර්වභාගයෙහි) යම් උපෙක්ෂා-සුඛ යුක්ත සූක්ෂම සංඥාවක් වීද, ඒ නිරුද්ධ වේ. දුක් නොවූ සැප නොවූ, සූක්ෂම සංඥාවක් උපදී. ඒ අවස්ථායෙහි දුක් නොවූ සැප නොවූ සූක්ෂම සංඥාවක් ඇත්තේ ම වේ. මෙසේ ද ශික්ෂා හේතුයෙන් ඇතැම් සංඥාවෝ උපදිත්, ඇතැම් සංඥාවෝ නිරුද්ධ වෙත්. මේ (චතුර්ථධ්‍යාන සඞ්ඛ්‍යාත) ශික්ෂාවයැ යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

49. පුනචපරං පොට්ඨපාද භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා[1] පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා[2] නානත්තසඤ්ඤානං අමනසිකාරා අනන්තො ආකාසොති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා රූපසඤ්ඤා සා නිරුජ්ඣති. ආකාසානඤ්චායතනසුඛසුඛුමසච්චසඤ්ඤා[3] තස්මිං සමයෙ හොති. ආකාසානඤ්චායතනසුඛසුඛුමසච්චසඤ්ඤී[4] යෙව තස්මිං සමයෙ හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උපපජ්ජන්ති[5] සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣන්ති.[6] අයං[7] සික්ඛාති භගවා අවොච.

50. පුනචපරං පොට්ඨපාද භික්ඛු සබ්බසො ආකාසානඤ්චායතනං සමතික්කම්ම අනන්තං විඤ්ඤාණන්ති විඤ්ඤාණඤ්චායතනං උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා ආකාසානඤ්චායතනසුඛුමසච්චසඤ්ඤා සා නිරුජ්ඣති. විඤ්ඤාණඤ්චායතනසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයෙ හොති. විඤ්ඤාණඤ්චායතනසුඛුමසච්චසඤ්ඤීයෙව තස්මිං සමයෙ හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උපපජ්ජන්ති[5]. සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣන්ති[6]. අයං[7] සික්ඛාති භගවා අවොච.

1. සමතික්කම්ම Pa.
2. අත්ථංගමා P. W.
3. සුඛ ඉති නත්ථි B. S. V.
4. සුඛ ඉති නත්ථි B. P. S. V.
5. උප්පජ්ජති B. S. V.
6. නිරුජ්ඣති B. S. V.
7. අයම්පි B. S.

49. පොට්ඨපාදය, නැවතද භික්ෂුතෙම සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන්ගේ (හෙවත් සංඥා ශීර්ෂයෙන් කියනලද රූපාවචර ධ්‍යානයන්ගේ හා තදාරම්මණයින්ගේත්) ඉක්මීමෙන් ද, (චක්ෂුරාදී වස්තූන්ගේ හා රූපාදී ආරම්මණයන්ගේත් පටිඝාත යෙන් උපන් බැවින) පටිඝසඤ්ඤා යයි කියන ලද (රූප, ශබ්ද, ගන්ධ, රස, ස්ප්‍රෂ්ටව්‍ය) සංඥාවන්ගේ නැතිකිරීමෙන් ද, (නානා ස්වභාව ගෝචරයෙහි පවත්නා බැවින් හා ඔවුනොවුන් විසදෘශ බැවින්) 'නානත්ත සඤ්ඤා' නම් වූ (කාමාවචර කුශල සංඥා අටය, අකුශල සංඥා දොළසය, කාමාවචර කුශල විපාක සංඥා එකොළොසය, අකුශල විපාක සංඥා දෙකය, කාමාවචර ක්‍රියා සංඥා එකොළොසය යන සූසාළිස්) සංඥාවන්ගේ මෙනෙහි නොකිරීමෙන්, 'ආකාශය අනන්තයැ'යි ආකාශානඤ්චායතන-යට පැමිණ (හෙවත් ආකාශානඤ්චායතනය උපදවා) වාසය කෙරේ. එසමයෙහි ඔහුට (ආකාශානඤ්චායතන ධ්‍යානලාභයට) පූර්වයෙහි යම් රූප සංඥාවක් වීද, ඒ නිරුද්ධ වේ. ආකාශානඤ්චායතන සූක්ෂම සංඥාව පහළ වේ. එවිට හෙතෙම ආකාශානඤ්චායතන සූක්ෂම සංඥාව ඇත්තේ වේ. මෙසේ ද ශික්ෂා හේතුයෙන් ඇතැම් සංඥාවෝ පහළ වෙත්, ඇතැම් සංඥාවෝ නිරුද්ධ වෙත්. මේ (ආකාශානඤ්චායතනධ්‍යාන සංඛ්‍යාත) ශික්ෂාවයැ යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

50. පොට්ඨපාදය, නැවතද (යෝගී) භික්ෂුතෙම සර්ව ප්‍රකාරයෙන් (ධ්‍යාන ආරම්මණ වශයෙන් ද්විප්‍රකාර වූ) ආකාශානඤ්චායතනය (නැතිකිරීමෙනුත් නොමෙනෙහි කිරීමෙනුත්) සමතික්‍රමණය කොට (ඉක්මවා), (අනන්තආකාශයෙහි පැතිර පැවැති) 'විඤ්ඤාණය අනන්තයැ' යි විඥානඤ්චායතන ධ්‍යානයට පැමිණ වාසය කෙරේ. ඔහුට (විඥානඤ්චායතන ධ්‍යාන ලාභයට) පූර්වයෙහි යම් (ආකාශානඤ්චායතන) සූක්ෂම සංඥාවක් වීද, ඒ නිරුද්ධ වේ. එසමයෙහි විඥානඤ්චායතන සූක්ෂම සංඥාව පහළවේ. එවිට හෙතෙම විඥානඤ්චායතන සූක්ෂම සංඥාව ඇත්තේම වේ. මෙසේද ශික්ෂා හේතුයෙන් ඇතැම් සංඥාවෝ පහළ වෙත්, ඇතැම් සංඥාවෝ නිරුද්ධ වෙත්. මේ (විඥානඤ්චායතන සංඛ්‍යාත) ශික්ෂාවයැ යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

51. පුන චපරං පොට්ඨපාද භික්ඛු සබ්බසො විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම නත්ථි කිඤ්චීති ආකිඤ්චඤ්ඤායතනං උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා විඤ්ඤාණඤ්චායතනසුඛුමසච්චසඤ්ඤා සා නිරුජ්ඣති. ආකිඤ්චඤ්ඤායතනසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයෙ හොති. ආකිඤ්චඤ්ඤායතනසුඛුමසච්චසඤ්ඤීයෙව තස්මිං සමයෙ හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජන්ති[1] සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣන්ති.[2] අයං[3] සික්ඛාති භගවා අවොච.

52. යතො ඛො පොට්ඨපාද භික්ඛු ඉධ සකසඤ්ඤී හොති සො තතො අමුත්‍ර තතො අමුත්‍ර අනුපුබ්බෙන සඤ්ඤග්ගං ඵුසති. තස්ස සඤ්ඤග්ගෙ ඨිතස්ස එවං හොති: චෙතයමානස්ස මෙ පාපියො[4] අචෙතයමානස්ස මෙ සෙය්‍යො. අහඤ්චෙව ඛො පන චෙතෙය්‍යං අභිසඞ්ඛරෙය්‍යං ඉමා ච මෙ සඤ්ඤා නිරුජ්ඣෙය්‍යුං අඤ්ඤා ච ඔළාරිකා සඤ්ඤා උප්පජ්ජෙය්‍යුං. යන්නූනාහං න[5] චෙතෙය්‍යං න[6] අභිසඞ්ඛරෙය්‍යන්ති. සො න චෙව චෙතෙති න[6] අභිසඞ්ඛරොති. තස්ස අචෙතයතො අනභිසඞ්ඛරොතො[7] තා චෙව සඤ්ඤා නිරුජ්ඣන්ති අඤ්ඤා ච ඔළාරිකා සඤ්ඤා න උප්පජ්ජන්ති. සො නිරොධං ඵුසති. එවං ඛො පොට්ඨපාද අනුපුබ්බාභිසඤ්ඤානිරොධසම්පජානසමාපත්ති හොති.

53. තං කිම්මඤ්ඤසි[8] පොට්ඨපාද? අපි නු[9] තෙ ඉතො පුබ්බෙ එවරූපා අනුපුබ්බාභිසඤ්ඤානිරොධසම්පජානසමාපත්ති සුතපුබ්බාති?

---

1. උප්පජ්ජති B. S. V.
2. නිරුජ්ඣති B. S. V.
3. අයම්පි B. S.
4. පාපියො Pa.
5. න චෙව S.
6. න ච S.
7. න අභි° V. අනභිසංඛරතො W.
8. තං කිං ම° B. S.
9. නු ඛො S.

51. පොට්ඨපාදය, නැවත ද භික්ෂුතෙම සර්වප්‍රකාරයෙන් විඥානානඤ්චායතනයද ඉක්මවා (ඒ විඥානය නො අවිජ්ජනුයේ, මෙනෙහි නොකරණුයේ, නො පස්විකනුයේ, හුදෙක් ඒ විඥානයාගේ නාස්තිභාවයම, ශූන්‍යභාවයම ගෙණ) 'කිසිවක් නැතැයි' මෙනෙහි කරණුයේ ආකිංචන්‍යායතනධ්‍යානයට පැමිණ විහරය කෙරේ. ඔහුට පෙර යම් විඥානානඤ්චායතන සූක්‍ෂ්ම සංඥාවක් වීද, ඒ නිරුද්ධ වේ. එසමයෙහි ආකිංචන්‍යායතන සූක්‍ෂ්ම සංඥාව පහළ වේ. එවිට හෙතෙම ආකිංචන්‍යායතන සූක්‍ෂ්ම සංඥා ඇත්තේම වේ. මෙසේත් ශික්‍ෂා හේතුයෙන් ඇතැම් සංඥා කෙණෙක් උපදිත්, ඇතැම් සංඥා කෙණෙක් නිරුද්ධ වෙත්. මේ (ආකිංචන්‍යායතන) ශික්‍ෂාවයැ යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක.

52. පොට්ඨපාදය, මේ ශාසනයෙහි යම් මහණෙක් තෙම (තමා උපදවා ගත් ප්‍රථමධ්‍යාන සංඥා වශයෙන්) සවසංඥාව ඇත්තේ වෙයි. හෙතෙම එයින් අන්‍යවූ (මේ ද්විතීයධ්‍යානයෙහි)ද, එයින් අන්‍යවූ (තෘතීය ධ්‍යානයෙහිදැයි මෙසේ ඒ ඒ ධ්‍යාන සංඥාවන්ගෙන් සංඥාවත්ව) පිළිවෙළින් සංඥාග්‍රය (ආකිඤ්චඤ්ඤා-යතනය) සපර්ශී කෙරේ (හෙවත් ආකිඤ්චඤ්ඤායතනයට පැමිණේ). සංඥාග්‍රයෙහි සිටියා වූ ඒ මහණ හට මෙබඳු අදහසෙක් වෙයි. 'සිතන්නාවූ හෙවත් ධ්‍යානයට සමවදින්නාවූ මාගේ ඒ සමවැදීම ලාමක වේ. ධ්‍යානයට සම නො වදින්නාවූ මාගේ ඒ සම නොවැදීම උතුම් වේ. ඉදින් මම වනාහි මතුයෙහි ධ්‍යානයට සම වදින්නෙම් නම්, මතු සමවත් පිණිස ඇලුම් කෙරෙම් නම්, මාගේ මේ (ආකිංචන්‍යායතන) සංඥාවෝ නිරුද්ධ වන්නාහ· අන්‍ය වූ ඖදාරික (භවාඞ්ග) සංඥාවෝ පහළවන්නාහ. මම ධ්‍යානයට සම නොවදින්නෙම් නම්, ඊට කැමැත්ත ද නූපදවන්නෙම් නම් ඉතා යෙහෙක.' (මෙසේ සිතා) ඔහු නොසිතයි හෙවත් ධ්‍යානයට නො සම වදී, මතු සමවත් පිණිස ඇලුම් ද නොකෙරේ. එසේ ධ්‍යානයට නො සමවදින්නාවූ ඇලුම් නොකරන්නාවූ ඔහුගේ ඒ පැවැති (ධ්‍යාන) සංඥාවෝත් නිරුද්ධ වෙත්, අන්‍ය වූ ඖදාරික සංඥාවෝත් පහළ නොවෙත්. මෙසේ ඒ භික්ෂු තෙම (සංඥාවේදයිත) නිරෝධය සපර්ශී කෙරේ. පොට්ඨපාදය, මෙපරිදි වනාහි ඒ යහපත් නුවණ ඇති භික්ෂුනු-ගේ අනුපූර්ව නිරෝධසමාපත්තිප්‍රතිලාභය වේ.

53. පොට්ඨපාදය, නුඹගේ අදහස කුමක්ද? නුඹ විසින් මීට පෙරත් මෙබඳු වූ, නුවණැත්තනු විසින් පිළිවෙළින් සම වැදිය යුතු වූ, සංඥා නිරෝධයෙක් ඇසූ විරූද?

නො හෙතං භන්තෙ. එවං ඛො අහං භන්තෙ භගවතො භාසිතං ආජානාමි[1]: යතො ඛො පොට්ඨපාද, භික්ඛු ඉධ[2] සකසඤ්ඤී හොති සො තතො අමුත්‍ර තතො අමුත්‍ර අනුපුබ්බෙන සඤ්ඤග්ගං ඵුසති. තස්ස සඤ්ඤග්ගෙ ඨිතස්ස එවං හොති: චෙතයමානස්ස මෙ පාපියො. අචෙතයමානස්ස මෙ සෙය්‍යො. අහඤ්චෙව ඛො පන චෙතෙය්‍යං අභිසඞ්ඛරෙය්‍යං ඉමා ච මෙ සඤ්ඤා නිරුජ්ඣෙය්‍යුං අඤ්ඤා ච ඔළාරිකා සඤ්ඤා උප්පජ්ජෙය්‍යුං. යන්නූනාහං න[3] චෙතෙය්‍යං න[4] අභිසඞ්ඛරෙය්‍යන්ති. සො න චෙව චෙතෙති න[4] අභිසඞ්ඛරොති. තස්ස අචෙතයතො අනභිසඞ්ඛරොතො[4] තා චෙව සඤ්ඤා නිරුජ්ඣන්ති අඤ්ඤා ච ඔළාරිකා සඤ්ඤා න උප්පජ්ජන්ති. සො නිරොධං ඵුසති. එවං ඛො පොට්ඨපාද අනුපුබ්බාභිසඤ්ඤානිරොධසම්පජානසමාපත්ති හොතීති.

එවං ඛො පොට්ඨපාදාති.

54. එකං යෙව[5] නු ඛො භන්තෙ භගවා සඤ්ඤග්ගං පඤ්ඤපෙති උදාහු පුථූපි සඤ්ඤග්ගෙ පඤ්ඤපෙතීති?

එකම්පි ඛො අහං පොට්ඨපාද[6] සඤ්ඤග්ගං පඤ්ඤපෙමි පුථූපි සඤ්ඤග්ගෙ පඤ්ඤපෙමීති.

යථා කථං පන භන්තෙ භගවා එකම්පි සඤ්ඤග්ගං පඤ්ඤපෙති පුථූපි සඤ්ඤග්ගෙ පඤ්ඤපෙතීති?

යථා යථා ඛො පොට්ඨපාද නිරොධං ඵුසති තථා තථාහං[7] සඤ්ඤග්ගං පඤ්ඤපෙමි. එවං ඛො අහං පොට්ඨපාද එකම්පි සඤ්ඤග්ගං පඤ්ඤපෙමි පුථූපි සඤ්ඤග්ගෙ පඤ්ඤපෙමීති.

55. සඤ්ඤා නු ඛො භන්තෙ පඨමං උප්පජ්ජති පච්ඡා ඤාණං උදාහු ඤාණං පඨමං උප්පජ්ජති පච්ඡා සඤ්ඤා උදාහු සඤ්ඤා ච ඤාණඤ්ච අපුබ්බං අචරිමං උප්පජ්ජන්තීති?

---

1. භගවතා ධම්මං දෙසිතං අනුජානාමීති S.
2. ඉධාති නත්ථි S.
3. න චෙව B. S.
4. නාභි° B.
5. එකඤ්චෙව S. එකඤ්ඤෙව B.
6. පොට්ඨපාද අහං S.
7. තථා අහං S.

"නැත, ස්වාමීනි. 'පොට්ඨපාදය, මේ ශාසනයෙහි යම් මහණෙක් තෙම තමා උපදවාගත් ප්‍රථමධ්‍යානසංඥා වශයෙන් ස්වසංඥාව ඇත්තේ වේද හෙතෙම එයින් අන්‍යවූ මේ ද්විතිය ධ්‍යානයෙහිද, එයින් අන්‍යවූ තෘතියධ්‍යානයෙහිදැ යි පිළිවෙලින් සංඥාග්‍රය ස්පර්ශ කෙරේ. සංඥාග්‍රයෙහි සිටි ඔහුට මෙසේ සිතෙයි. ධ්‍යානයට සමවදින්නාවූ මාගේ ඒ (සමවැදීම) ලාමක වේ. සම නොවදින්නාවූ මාගේ නොසම වැදීම උතුම් වේ. මම සම වදින්නෙම් නම්, මතු සමවත් පිණිස කැමති වන්නෙම් නම් මාගේ මේ සංඥාවෝ නිරුද්ධ වන්නාහ, අන්‍යවූ ඖදාරික සංඥාවෝ උපදින්නාහ මම සමනොවදින්නෙම් නම්, මතු සමවත් නො කැමැති වන්නෙම් නම් ඉතා මැනව. (මෙසේ සිතා) හෙතෙම ධ්‍යානයට සමනොවදියි. මතු සමවත් කැමැති නොවෙයි. ධ්‍යානයට සම නොවදින්නාවූ, මතු සමවත් නොපතන්නාවූ ඔහුගේ ඒ (ධ්‍යාන) සංඥාවෝ නිරුද්ධ වෙත්, අන්‍යවූ ඖදාරික (භවාඞ්ග) සංඥාවෝ ද නූපදිත්. හෙතෙම නිරෝධය ලබයි. පොට්ඨපාදය, මෙපරිදි වනාහි යහපත් නුවණින් ලැබිය යුතු ඒ අනුපූර්ව නිරෝධ සමාපත්ති ප්‍රතිලාභය වේය'යි මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කළ සේ මම දනිමි."

"ඒ එසේය, පොට්ඨපාදය."

54. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ එකම සංඥාග්‍රයක් පණවන සේක්ද නැතහොත් බොහෝ වූ සංඥාග්‍රයන් පණවන සේක්ද?"

"පොට්ඨපාදය, මම එකම සංඥාග්‍රයකුත් පණවමි, බොහෝ වූ සංඥාග්‍රයනුත් පණවමි."

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කෙසේ නම් එක් සංඥා-ග්‍රයකුත් පණවන සේක්ද? (කෙසේ) බොහෝ වූ සංඥාග්‍රය-නුත් පණවන සේක්ද?"

"පොට්ඨපාදය, (කසිණ වශයෙන් හෝ ධ්‍යාන වශයෙන් එනම්, පඨවිකසිණාදි යම් යම් කසිණයකින් හෝ ප්‍රථම ධ්‍යානාදී යම් යම් ධ්‍යානයකින් සමවතට එක්වරක් හෝ වැඩි වාර ගණනක් සමවදනේ) යම් යම්සේ සංඥා නිරෝධය ස්පර්ශ කෙරේද, (එකල්හි සංඥාග්‍ර එකකැයි හෝ වැඩියකැයි හෝ සමවැදීම් වාරගණනකින්) ඒ ඒවූ පරිදි මම සංඥාග්‍ර පණවමි. එහෙයින් පොට්ඨපාදය, මේ ක්‍රමයෙන් මම එක් සංඥාග්‍රයකුත් බොහෝ වූ සංඥාග්‍රයනුත් පණවමි."

55. "ස්වාමීනි, ප්‍රථමකොට සංඥාව ඉපිද පසුව ඥානය උපදීද? නැතහොත් පළමු ඥානය ඉපිද පසුව සංඥා උපදීද? එසේත් නැතහොත් සංඥාවත් ඥානයත් පෙරපසු නොව එකවිටම උපදීද?"

සඤ්ඤා ඛො පොට්ඨපාද පඨමං උප්පජ්ජති පච්ඡා ඤාණං සඤ්ඤුප්පාදා ච පන ඤාණුප්පාදො හොති. සො එවං පජානාති: ඉදප්පච්චයා කිර මෙ ඤාණං උදපාදීති. ඉමිනා[1] ඛො එතං පොට්ඨපාද පරියායෙන වෙදිතබ්බං යථා[2] සඤ්ඤා පඨමං උප්පජ්ජති පච්ඡා ඤාණං සඤ්ඤුප්පාදා ච පන ඤාණුප්පාදො හොතීති.

56. සඤ්ඤා නු ඛො භන්තෙ පුරිසස්ස අත්තා උදාහු අඤ්ඤා සඤ්ඤා අඤ්ඤා අත්තාති?

කං[3] පන ත්වං පොට්ඨපාද අත්තානං පච්චෙසීති?

ඔළාරිකං ඛො අහං භන්තෙ අත්තානං පච්චෙමි රූපිං චාතුම්මහාභූතිකං[4] කබලීකාරභක්ඛන්ති[5].

ඔළාරිකො ච හි තෙ පොට්ඨපාද අත්තා අභවිස්ස රූපී චාතුම්මහාභූතිකො[4] කබලීකාරභක්ඛො[5]. එවං සන්තං ඛො තෙ පොට්ඨපාද අඤ්ඤා ච[6] සඤ්ඤා භවිස්සති[7] අඤ්ඤා අත්තා[8] තදමිනාපෙතං[9] පොට්ඨපාද පරියායෙන වෙදිතබ්බං යථා අඤ්ඤා ච සඤ්ඤා භවිස්සති අඤ්ඤා අත්තා.

තිට්ඨතෙවායං[10] පොට්ඨපාද ඔළාරිකො අත්තා රූපී චාතුම්මහාභූතිකො[4] කබලීකාරභක්ඛො[5]. අථ ඉමස්ස පුරිසස්ස අඤ්ඤා ච[6] සඤ්ඤා උප්පජ්ජන්ති[11] අඤ්ඤා ච සඤ්ඤා නිරුජ්ඣන්ති.[12] ඉමිනා[13] ඛො එතං පොට්ඨපාද පරියායෙන වෙදිතබ්බං යථා අඤ්ඤා ච සඤ්ඤා භවිස්සති අඤ්ඤා අත්තාති.

57. මනොමයං ඛො අහං භන්තෙ අත්තානං පච්චෙමි සබ්බඞ්ගපච්චඞ්ගිං[14] අහීනින්ද්‍රියන්ති.

මනොමයො ච හි තෙ පොට්ඨපාද අත්තා අභවිස්ස සබ්බඞ්ගපච්චඞ්ගී අහීනින්ද්‍රියො එවං සන්තම්පි ඛො තෙ පොට්ඨපාද අඤ්ඤා ච සඤ්ඤා භවිස්සති අඤ්ඤා අත්තා. තදමිනාපෙතං[9] පොට්ඨපාද පරියායෙන වෙදිතබ්බං යථා අඤ්ඤා ච සඤ්ඤා භවිස්සති අඤ්ඤා අත්තා. තිට්ඨතෙවායං[10] පොට්ඨපාද මනොමයො අත්තා සබ්බඞ්ගපච්චඞ්ගී අහීනින්ද්‍රියො. අථ ඉමස්ස පුරිසස්ස අඤ්ඤා ච[6] සඤ්ඤා උප්පජ්ජන්ති[11] අඤ්ඤා ච[6] සඤ්ඤා නිරුජ්ඣන්ති.[12] ඉමිනාපි ඛො එතං පොට්ඨපාද පරියායෙන වෙදිතබ්බං යථා අඤ්ඤා ච සඤ්ඤා භවිස්සති අඤ්ඤා අත්තාති.

---

1. ඉමිනා ච ඛො එතං B. S.
   ඉමිනාපෙතං P.
2. තථා Pa.
3. කිං P. S.
4. චාතුමහා° B. V.
5. කබළි° V; කබලිංකාරාහාර° P.S.
6. ච S.
7. අභවිස්ස B.V.
8. අත්තාති B.V.W.
9. තදිමිනා° P. S. (සබ්බත්‍ථ)
10. තිට්ඨතෙවායං B. V.
    තිට්ඨතෙව අයං S. (සබ්බත්‍ථ)
11. උප්පජ්ජති S.
12. නිරුජ්ඣති S.
13. ඉමිනාපි ඛො P. W.
14. °පච්චඞ්ගං S.

"පොට්ඨපාදය, සංඥාව වනාහි ප්‍රථමකොට උපදී, ඥානය පසුව උපදී. සංඥාවගේ පහළවීමෙන් අනතුරුව වනාහි ඥානයාගේ පහළවීම වේ. ඒ (මහණ) තෙම මාගේ මේ ඥානය සංඥාව හේතුකොට ගෙන උපන්නේයයි දනියි. පොට්ඨපාදය, සංඥාව පළමුකොට උපදී, ඉක්බිති ඥානය උපදී සංඥාව ඉපදීමෙන් වනාහි ඥානය ඉපදේ යන මේ කාරණය මෙලෙසින් දත යුතුයි."

56. "ස්වාමීනි, සංඥාව පුරුෂයාගේ ආත්මය වේද? නැත හොත් සංඥාව ආත්මයෙන් අනිකක්ද? ආත්මය සංඥාවෙන් අනිකක්ද?"

"පොට්ඨපාදය, මෙහිලා තුඹ කුමක් නම් ආත්මයයි හඟනේද?"

"ස්වාමීනි, ඔළාරික වූ, චාතුම්මහාභූතික රූපයක් ඇති, කබලීකාරාහාරය අනුභව කරන්නේ ආත්ම යැයි හඟිමි."

"ඉදින් පොට්ඨපාදය, කබලීකාරාහාරය අනුභව කරන්නාවූ ඔළාරික වූ, චාතුම්මහාභූතිකරූපියා ආත්මය වේයැයි තුඹගේ හැඟීම නම්, එකල්හි පොට්ඨපාදය, ඔබ ගන්නා සංඥාව අනිකක්ම වන්නේය, ආත්මය අනිකක්ම වන්නේය. එහෙයින් පොට්ඨපාදය, මේ කාරණයෙනුදු 'සංඥාව අනෙකකි, ආත්මය අනෙකකැ'යි දතයුතු.

"ඔළාරිකවූ, කබලීකාරාහාරය අනුභව කරන්නා වූ චාතුර්මහාභූතික රූපිවූ ඒ මේ ආත්මය පසෙකැ තිබියේවා. එසේ කල්හි (තුඹ කියන්නේ සැබවක් නම්) මේ පුරුෂයාහට උපදනා සංඥාවෝ අන්‍ය වෙති, නිරුද්ධවන සංඥාවෝ ඉන් අන්‍ය වෙත්. පොට්ඨපාදය, මේ කාරණයෙනුදු 'සංඥාව අනෙකකි, ආත්මය අනෙකකැ'යි මෙසේ දතයුතු."

57. "එසේ නම් ස්වාමීනි, මම 'ආත්මය' සියල් අඟපසඟ ඇති, නො පිරිහුණු ඉඳුරන් ඇති, මනස පිළිබඳවූවක් (හෙවත් මනෝමය ධර්මයක්) කොට සලකමි."

"පොට්ඨපාදය, 'ආත්මය' සියලු අඟපසඟ හා නොපිරිහුණු ඉඳුරන් ඇති, මනොමය වූවකැයි තුඹගේ හැඟීම වේ නම් එසේ කල්හිදු සංඥාව අනෙකක් වන්නේය, ආත්මය අනෙකක්ම වන්නේය. පොට්ඨපාදය, මේ කාරණයෙනුදු සංඥාව අනෙකකි, ආත්මය අනෙකකැයි දතයුතුයි. පොට්ඨපාදය, ඒ සර්වාඞ්ග ප්‍රත්‍යඞ්ගී අහීනෙන්ද්‍රිය මනොමය ආත්මය සිටීයේවා (ඒ එසේ යයි සිතමු), එකල්හි මේ පුරුෂයාට අන්‍ය වූම සංඥාවෝ උපදිත්. අන්‍යවූම සංඥාවෝ නිරුද්ධ වෙත් (උපදින සංඥා නිරුද්ධ වන සංඥා නොව ඉන් අන්‍ය වූවෝයි). එහෙයින් මේ කරුණිනුදු පොට්ඨපාදය, සංඥාව අනෙකක, ආත්මය අනෙකකැයි දතයුතු."

58. අරූපිං[1] ඛො අහං භන්තෙ අත්තානං පච්චෙමි සඤ්ඤාමයන්ති.

අරූපී ච තෙ පොට්ඨපාද අත්තා අභවිස්ස සඤ්ඤාමයො එවං සන්තම්පි ඛො තෙ පොට්ඨපාද[2] අඤ්ඤා ච සඤ්ඤා භවිස්සන්ති අඤ්ඤා අත්තා. තදමිනාපෙතං[2] පොට්ඨපාද පරියායෙන වෙදිතබ්බං යථා අඤ්ඤා ච සඤ්ඤා භවිස්සති අඤ්ඤා අත්තා. තිට්ඨතෙවායං පොට්ඨපාද අරූපි අත්තා සඤ්ඤාමයො. අථ ඉමස්ස පුරිසස්ස අඤ්ඤා ච සඤ්ඤා උප්පජ්ජන්ති[3] අඤ්ඤා ච සඤ්ඤා නිරුජ්ඣන්ති.[4] ඉමිනාපි ඛො එතං පොට්ඨපාද පරියායෙන වෙදිතබ්බං යථා අඤ්ඤා ච සඤ්ඤා භවිස්සති අඤ්ඤා අත්තාති.

59. සක්කා පනෙතං භන්තෙ මයා ඤාතුං සඤ්ඤා පුරිසස්ස අත්තාති වා අඤ්ඤා[5] සඤ්ඤා අඤ්ඤා[6] අත්තාති වාති?

දුජ්ජානං ඛො එවං පොට්ඨපාද තයා අඤ්ඤදිට්ඨිකෙන අඤ්ඤඛන්තිකෙන අඤ්ඤරුචිකෙන අඤ්ඤත්‍රායොගෙන[7] අඤ්ඤත්‍රාචරියකෙන[8]: සඤ්ඤා පුරිසස්ස අත්තාති වා අඤ්ඤා[9] සඤ්ඤා අඤ්ඤා අත්තාති වාති.[9]

සචෙ තං භන්තෙ මයා දුජ්ජානං අඤ්ඤදිට්ඨිකෙන අඤ්ඤඛන්තිකෙන අඤ්ඤරුචිකෙන අඤ්ඤත්‍රායොගෙන[7] අඤ්ඤත්‍රාචරියකෙන[8]: සඤ්ඤා පුරිසස්ස අත්තාති වා අඤ්ඤා[9] සඤ්ඤා අඤ්ඤා අත්තාති වා කිං පන භන්තෙ සස්සතො ලොකො? ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති?[10]

අබ්‍යාකතං[11] ඛො එතං[12] පොට්ඨපාද මයා: සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති.

කිං පන භන්තෙ අසස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති?

---

1. අරූපී B.S.V
2. පො° පරියායෙන වෙදිතබ්බං යථා අඤ්ඤාව සඤ්ඤා භවිස්සති අඤ්ඤා අත්තා. තිට්ඨතෙවායං W.
3. උප්පජ්ජති S.
4. නිරුජ්ඣති S.
5. අඤ්ඤා ච S.
6. අඤ්ඤා ච S.
7. අඤ්ඤත්‍ර ආයොගෙන S.
8. අඤ්ඤත්‍රාචරියකෙන S.
9. අඤ්ඤාව B. V. අඤ්ඤාව S.
10. ඉතිකාරො නත්ථි S.
11. අව්‍යා° P. (සබ්බත්ථ)
12. එතන්ති නත්ථි P. W.

58. "එසේ නම් ස්වාමීනි, මම 'ආත්මය' අරූපී වූ සංඥාව පිළිබඳ වූවක් (හෙවත් සංඥාමය ධර්මයක්) ලෙස සලකමි."

"පොට්ඨපාදය, 'ආත්මය' අරූපීවූ සංඥාමය ධර්මයකැයි තුඹගේ හැඟීම වේනම් එසේ කල්හිත් සංඥාව අනිකක් වන්නේය, ආත්මය අනිකක් වන්නේය. මේ කාරණයෙන් ද පොට්ඨපාදය, සංඥාව අනෙකකි, ආත්මය අනෙකකැයි කියා දතයුතුය. පොට්ඨපාදය, ඒ අරූපී සංඥාමය ආත්මය සිටිත්වා (ඒ එසේ යයි සිතමු). එකල්හි මේ පුරුෂයාට අන්‍යවූම සංඥාවෝ උපදිත්, අන්‍යවූම සංඥාවෝ නිරුද්ධ වෙත්. එබැවින් පොට්ඨපාදය, මෙ කරුණින්දු සංඥාව අනෙකක, ආත්මය අනෙකකැයි දතයුතු."

59. "ස්වාමීනි, සංඥාවම පුරුෂයාගේ ආත්මය වේද, එසේ නැතහොත් සංඥාව අනෙකක් හා ආත්මය අනෙකක් වේද? යන මේ කාරණය මට අවබෝධ කරගතහැකිද?"

"පොට්ඨපාදය, අන්‍ය ලබ්ධි ඇති, අනිකක් කැමති වූ, අනිකක් රුචි වූ, වෙනස් පිළිවෙතක පිහිටියාවූ, අන්‍ය තීර්ථායතනයක ඇදුරු වූ තුඹ විසින් සංඥාව පුරුෂයාගේ ආත්මයය කියා හෝ සංඥාව අනෙකක්ය, ආත්මය අනෙකක්ය කියා හෝ මේ කාරණය අවබෝධ නො කටහැක්කේය."

"ස්වාමීනි, අන්‍ය ලබ්ධි ඇති, අනිකක් කැමැතිවන, අන්‍යරුචිකවූ, අන්‍ය ප්‍රතිපත්තිකයක යෙදුනු, අන්‍ය තීර්ථායතනයක ඇදුරුවූ, මා විසින් සංඥාවම පුරුෂයාගේ ආත්මයය කියා හෝ සංඥාව අනෙකක්ය, ආත්මය අනෙකක්ය කියා හෝ නොදත හැකි නම්, ඒ එසේ වේවා. කිමෙක්ද? ස්වාමීනි, ලොකය (ආත්මය) ශාස්වතද? ලොකය ශාස්වතය යන මේ මතයම සත්‍ය වේද? අන්‍ය මතයෝ හිස්වෙත්ද (අසත්‍ය වෙත්ද)?"

"පොට්ඨපාදය, 'ලොකය (ආත්මය) ශාස්වතය, යන මේ මතය පමණක් සත්‍යය, අන්‍ය මතයෝ අසත්‍ය වෙති'යි යන්නක් මවිසින් ප්‍රකාශ නොකරණ ලදී."

"කිමෙක්ද? ස්වාමීනි, ලොකය අශාස්වත ද? මේ මතය පමණක් සත්‍යද? අන්‍ය මතයෝ අසත්‍ය වෙත්ද?"

එතම්පි ඛො පොට්ඨපාද මයා අබ්‍යාකතං[1] අසස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති.

කිං පන භන්තෙ අන්තවා ලොකො —පෙ—

කිං පන භන්තෙ අනන්තවා ලොකො? —පෙ— —පෙ— තං ජීවං තං සරීරං ? —පෙ—

—පෙ— අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං ? —පෙ—

—පෙ— හොති තථාගතො පරම්මරණා —පෙ—

—පෙ—න හොති තථාගතො පරම්මරණා ? —පෙ—

—පෙ—හොති ච න ච හොති තථාගතො පරම්මරණා?-පෙ-

කිං පන භන්තෙ නෙව හොති න න හොති තථාගතො පරම්මරණා? ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති?

එතම්පි ඛො පොට්ඨපාද මයා අබ්‍යාකතං[1] නෙව හොති න න හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝ-මඤ්ඤන්ති.

60. කස්මා පනෙතං[2] භන්තෙ භගවතා අබ්‍යාකතන්ති ?[1]

න හෙතං පොට්ඨපාද අත්ථසංහිතං න ධම්මසංහිතං නාදි-බ්‍රහ්මචරියකං[3] න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තති.[4] තස්මා තං මයා අබ්‍යාකතන්ති.

---

1. අව්‍යාකතං මයා P.
2. පනෙතං ති නත්ථි P.
3. න ආදී P. C.
4. සංවත්තන්ති Pa.

"පොට්ඨපාදය, ලොකය අශාස්වතය, මේ මතයම සත්‍යය සෙසු මතයෝ අසත්‍යය යන මෙයද මා ප්‍රකාශ නොකළ කරුණකි."

"එසේ නම් ස්වාමීනි, කිම? ලෝකය (ආත්මය) අන්තවත්ද හෙවත් කෙළවර ඇත්තේද? —පෙ—[1]

"කිමෙක් ද, ස්වාමීනි ලොකය අනන්තද (කෙළවරක් නැත්තේද?) -පෙ- ජීවය (ප්‍රාණය)ත් හේමය, ශරීරයත් හේමය (හෙවත් ජීවයත් ශරීරයත් එකක්මය) යන මේ මතය සත්‍යද -පෙ-

"—පෙ— ජීවය අනිකකි, ශරීරය අනිකකි' යන මේ මතයම සත්‍යද —පෙ—

"—පෙ— සත්ත්වයා හෙවත් ජීවාත්මය මරණින් මතු උපදනේය' යන මතයම සත්‍යද? —පෙ—

"—පෙ— සත්ත්වයා මරණින් මතු නූපදනේය යන මේ මතයම සත්‍යද? —පෙ—

"—පෙ—සත්ත්වයා මරණින් මතු උපදනේත් වේ, නූපදනේත් වේ, යන මේ මතයම සත්‍යද? —පෙ—

"කිමෙක්ද? ස්වාමීනි, සත්වයා මරණින් මතු උපදනේත් නොවේ, නූපදනේත් නොවේ යන මේ මතයම සත්‍යද? සෙසු මත අසත්‍යද?"

"පොට්ඨපාදය, සත්ත්වයා මරණින් මතු උපදනේත් නොවේ, නූපදනේත් නොවේ, යන මතය සත්‍යය, අනික් මත අසත්‍යය යන මෙයද මා ප්‍රකාශ නොකළ කාරණයකි."

60. "ස්වාමීනි, මේ කාරණය කුමක් නිසා භාග්‍යවතුන් වහන්සේ විසින් නො වදාරණ ලදද?"

"පොට්ඨපාදය, මේ කරුණු ආත්මාර්ථ-පරාර්ථ නිශ්‍රිත වූයේ නො වෙයි, (නවලොවුතුරා) දහම් ඇසුරු කොට නො පෙයි, (ශික්ෂාත්‍රය සඞ්ඛ්‍යාත) ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාවගේ ආදිය වූ අධිශීල මාත්‍රයකුදු නො වෙයි, සසර කෙරෙහි කලකිරීම පිණිස හෝ එහි නො ඇලීම පිණිස හෝ සංසාර නිරොධය පිණිස හෝ සංසාර ව්‍යුපසමනය පිණිස හෝ එය ප්‍රත්‍යක්ෂ වැ දැනගැනීම පිණිස හෝ, මැනවින් අවබොධ කිරීම පිණිස හෝ, (අමෘත මහා) නිර්වාණයාගේ ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස හෝ නො පවතී. මවිසින් මේ කරුණු ගැන ප්‍රකාශ නොකරණ ලද්දේ එහෙයිනි."

---

1. මේ වාක්‍යයන්හි – පෙ— යන්නෙන් දක්වනු ලබන්නේ ඒ ඒ වෙන් වශයෙන් සඳහන් මතයන් බුදුන් විසින් අනුමත කරනු ලබන බව හෝ අනුමත නො කරනු ලබන බව හෝ කීම අයුතු බවයි.

61. කිං පන භන්තෙ භගවතා බ්‍යාකතන්ති[1]?

ඉදං දුක්ඛන්ති ඛො[2] පොට්ඨපාද මයා බ්‍යාකතං අයං දුක්ඛසමුදයොති ඛො පොට්ඨපාද මයා බ්‍යාකතං අයං දුක්ඛනිරොධොති ඛො පොට්ඨපාද මයා බ්‍යාකතං අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති ඛො පොට්ඨපාද මයා බ්‍යාකතන්ති.

62. කස්මා පනෙතං භන්තෙ භගවතා බ්‍යාකතන්ති?

එතං හි ඛො[3] පොට්ඨපාද අත්ථසංහිතං එතං ධම්මසංහිතං එතං ආදිබ්‍රහ්මචරියකං එතං නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති තස්මා එතං[4] මයා බ්‍යාකතන්ති.

එවමෙතං භගවා එවමෙතං සුගත. යස්සදානි භන්තෙ භගවා කාලං මඤ්ඤතීති.

අථ ඛො භගවා උට්ඨායාසනා පක්කාමි.[5]

63. අථ ඛො තෙ පරිබ්බාජකා අචිරපක්කන්තස්ස භගවතො පොට්ඨපාදං පරිබ්බාජකං සමන්තතො වාචාසන්නිතොදකෙන[6] සඤ්ඣබ්භරිං[7] අකංසු: එවමෙව පනායං භවං පොට්ඨපාදො යඤ්ඤදෙව[8] සමණො ගොතමො භාසති තං තදෙවස්ස අබ්භනුමොදති: එවමෙතං භගවා එවමෙතං සුගතාති. න ඛො පන මයං කිඤ්චි සමණස්ස ගොතමස්ස එකංසිකං ධම්මං දෙසිතං ආජානාම[9] සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා අන්තවා ලොකොති වා අනන්තවා ලොකොති වා තං ජීවං තං සරීරන්ති වා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා හොති තථාගතො පරම්මරණාති වා න හොති තථාගතො පරම්මරණාති වා හොති ච න ච හොති තථාගතො පරම්මරණාති වා නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වාති.[10]

---

1. ව්‍යා°P. (සබ්බත්ථ)
2. ඛො ති නත්ථි P.
3. ඛොති නත්ථි B. S. V.
4. තං P.
5. පක්කමි B. V.
6. °කෙහි W; වාචාය සන්නිතොදකෙන B. V; °පතොදකෙන S.
7. °භරියං P. °භරිමකංසු B. S. W.
8. යංයදෙව P.
9. ආජානාමි V. W.
10. ඉතිකාරො නත්ථි V.

61. "ස්වාමීනි, කුමක් වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලදද?"

"පොට්ඨපාදය, මවිසින් මේ (තෘෂ්ණාව හැර සෙසු ත්‍රෛභූමක සකන්ධයෝ) 'දුක්ඛය' යැයි ප්‍රකාශ කරන ලදී. මේ (තෘෂ්ණාව) දුක්ඛසමුදය හෙවත් දුක් හටගැනීමේ හේතුව යැ යි ප්‍රකාශ කරන ලදී. මේ (දුක්ඛ - දුක්ඛ සමුදය දෙදෙනාගේ නො පැවැත්ම) දුක්ඛ නිරෝධයයැයි ප්‍රකාශ කරන ලදී. මේ (සම්‍යක් දෘෂ්ට්‍යාදි ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය) දුක්ඛනිරෝධ ගාමිනීපටිපදාව හෙවත් දුක් නැති කිරීමේ පිළිවෙත යැයි ප්‍රකාශ කරන ලදී."

62. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මෙකරුණ කුමක් හෙයින් වදාළ සේක්ද?"

"පොට්ඨපාදය, මෙ කරුණ වනාහි අර්ථ නිඃශ්‍රිතය, ධර්ම නිඃශ්‍රිතය, ආදි බ්‍රහ්මචර්‍ය්‍යිකය, නිර්වේදය පිණිස, විරාගය පිණිස, නිරෝධය පිණිස, ව්‍යුපශමය පිණිස, අභිඥාව පිණිස, සම්‍යගවබෝධය පිණිස, නිර්වාණය පිණිස පවත්තේ වේ. මේ කරුණු මවිසින් ප්‍රකාශ කරන ලද්දේ එහෙයිනි."

"භාග්‍යවතුන් වහන්ස, ඒ එසේමය, සුගතයන් වහන්ස, ඒ එසේමය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ යම් ගමනකට කැමැති සේක්නම් දැන් ඊට කාලය භගනා සේක්වා (ඔබ වහන්සේට පිඩු පිණිස හැසිරීමට මේ සුදුසු කාලයයි)".

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හුනස්නෙන් නැගිට වැඩිසේක.

63. භාග්‍යවතුන් වහන්සේ වැඩි නොබෝ වේලාවකින් ඒ පරිබ්‍රාජකයෝ පොට්ඨපාද පිරිවැජ්ජා වටකොටගෙණ, වචන නමැති කෙවිට්ටවලින් අතරක් නැතිව මතුමත්තෙහි පහර දීම (හෙවත් භාග්‍යවතුන් වහන්සේගේ කථාවත් පොට්ඨපාදයාගේ අනුමෝදනයත් පිළිබඳ දෝෂාරෝපණය) කළාහුය: "මේ භවත් පොට්ඨපාද තෙම ගෞතම ශ්‍රමණ තෙම යමක් කීයේද, ඔහුගේ ඒ කීම 'භාග්‍යවතුන් වහන්ස, ඒ එසේමය, සුගතයන් වහන්ස, ඒ එසේමයැ'යි සතුටින් අනුමෝදත් විය. අපි වනාහි ගෞතම ශ්‍රමණයන් විසින් ලෝකය ශාස්වතය කියා හෝ ලෝකය අශාස්වතය කියා හෝ, ලෝකය අන්තවත්ය කියා හෝ ලෝකය අනන්තවත්ය කියා හෝ, ජීවයත් ශරීරයත් එකක්මය කියා හෝ ජීවය අනිකෙක, ශරීරය අනිකෙක කියා හෝ, සත්ත්වයා මරණින් මතු වේය කියා හෝ, සත්ත්වයා මරණින් මතු නොවේය කියා හෝ සත්ත්වයා මරණින්මතු වන්නේත් වේ නොවන්නේත් වේ කියා හෝ, සත්ත්වයා මරණින් මතු වන්නේත් නොවේ නොවන්නේත් නොවේ කියා හෝ, එකාන්ත කොට කිසි ධර්මයක් දේශනා කරන ලද බවක් නො දනිමු."

64. එවං වුත්තෙ පොට්ඨපාදෙ පරිබ්බාජකො තෙ පරිබ්බාජකෙ එතදවොච: අහම්පි ඛො භො න කිඤ්චි සමණස්ස ගොතමස්ස එකංසිකං ධම්මං දෙසිතං ආජානාමි සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා. අපි ච සමණො ගොතමො භූතං තච්ඡං තථං පටිපදං පඤ්ඤපෙති[1] ධම්මට්ඨිතතං[2] ධම්මනියාමතං. භූතං ඛො පන තච්ඡං තථං පටිපදං පඤ්ඤපෙන්තස්ස[1] ධම්මට්ඨිතතං ධම්මනියාමතං කථං හි නාම මාදිසො විඤ්ඤූ සමණස්ස ගොතමස්ස සුභාසිතං සුභාසිතතො නාබ්භනුමොදෙය්‍යාති ?[3]

65. අථ ඛො ද්වීහතීහස්ස අච්චයෙන චිත්තො ච හත්ථිසාරිපුත්තො පොට්ඨපාදො ච පරිබ්බාජකො යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා චිත්තො හත්ථිසාරිපුත්තො භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. පොට්ඨපාදො පන පරිබ්බාජකො භගවතා සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං[4] වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො පොට්ඨපාදො පරිබ්බාජකො භගවන්තං එතදවොච: තදා මං භන්තෙ තෙ[5] පරිබ්බාජකා අචිරපක්කන්තස්ස භගවතො සමන්තතො වාචාසන්නිතොදකෙන සඤ්ඣබ්භරිං අකංසු: එවමෙව පනායං භවං[6] පොට්ඨපාදො යඤ්ඤදෙව සමණො ගොතමො භාසති තං තදෙවස්ස අබ්භනුමොදති: එවමෙතං භගවා එවමෙතං සුගතාති. න ඛො පන මයං කිඤ්චි සමණස්ස ගොතමස්ස එකංසිකං ධම්මං දෙසිතං ආජානාම: සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා අන්තවා ලොකොති වා අනන්තවා ලොකොති වා තං ජීවං තං සරීරන්තිවා අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති වා හොති තථාගතො පරම්මරණාතිවා න හොති තථාගතො පරම්මරණාති වා හොති ච න ච හොති තථාගතො පරම්මරණාති වා නෙව හොති න න හොති තථාගතො පරම්මරණාතිවාති.[7] එවං වුත්තාහං භන්තෙ තෙ[8] පරිබ්බාජකෙ එතදවොචං: අහම්පි ඛො භො න කිඤ්චි සමණස්ස ගොතමස්ස එකංසිකං ධම්මං දෙසිතං ආජානාමි සස්සතො ලොකොති වා අසස්සතො ලොකොති වා – පෙ – නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති වා. අපි ච සමණො ගොතමො භූතං තච්ඡං තථං පටිපදං පඤ්ඤපෙති[9] ධම්මට්ඨිතතං[2] ධම්මනියාමතං.

---

1. පඤ්ඤා° P. S.(සබ්බත්ථ)
2. ධම්මට්ඨිතං P. W.
3. න අබ්භ° B. S.
4. සාරනියං B. V.
5. තෙති නත්ථි P. W.
6. භවං ති නත්ථි P.
7. ඉතිති නැවති P.
8. තෙති නැවති B.
9. පඤ්ඤා °P.

64. මෙසේ කී කල්හි පොට්ඨපාද තෙම ඒ පරිබ්‍රාජකයන්ට මෙසේ කීය: "පින්වත්නි, මමද ගෞතම ශ්‍රමණයින් විසින් 'ලෝකය ශාශ්වතය' කියා හෝ 'ලෝකය අශාශ්වතය' කියා හෝ, —පෙ— 'සත්ත්වයා මරණින් මතු වන්නේත් නොවේ නොවන්නේත් නොවේ' කියා හෝ ඒකාන්ත ධර්මයක් දේශනා කරන ලද බවක් නොදනිමි. එහෙත් ශ්‍රමණ ගෞතමයා ස්වභාවයෙන් විද්‍යමානවූ, සත්‍යවූ, වෙනස් නොවන සුලු වූ, (නව ලොවුතුරා) දහම්හි පිහිටියාවූ, (සෝවාන් ආදී ලොවුතුරු) ධර්මයන් කරා පමුණුවන සුලුවූ, ප්‍රතිපදාවක් පණවයි. එසේ විද්‍යමානවූ, සත්‍යවූ, තථ්‍යවූ, ධර්මයෙහි සිටියාවූ, ධර්ම නියාමකවූ පිළිවෙතක් පණවන්නාවූ ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ සුභාෂිතය සුභාෂිතයක් වශයෙන් මා වැනි නුවණැත්තකු විසින් අනුමෝදන් නොවිය හැක්කේ කෙසේද?"

65. ඉක්බිති දෙතුන් දිනක්හුගේ ඇවෑමෙන් හස්ත්‍යාචාර්ය පුත්‍රවූ චිත්‍ත තෙමේද, පොට්ඨපාද පරිව්‍රාජක තෙමේද භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හි නම් එතන්හි එළඹියාහුය. එළඹ, හස්ත්‍යාචාර්ය පුත්‍ර චිත්‍ත තෙමේ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්නේය. පොට්ඨපාද පරිබ්‍රාජක තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමග පිළිසඳර කථාවෙන් සතුටුවිය. සතුටු විය යුතුවූ, සිහිකටයුතුවූ ඒ පිළිසඳර කථාව නිමවා එකත්පසෙක හුන්නේය. එකත් පසෙක හුන්නාවූ ඒ පොට්ඨපාද පරිබ්‍රාජක තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකළේය: "ස්වාමීනි, එදා ඔබවහන්සේ වැඩි නොබෝ වේලාවකින් පරිබ්‍රාජකයෝ මා වට කොටගෙණ, 'මේ පින්වත් පොට්ඨපාදයා ගෞතම ශ්‍රමණයෝ යමක් යමක් පවසත් නම් 'ඒ එසේමය භාග්‍යවතුන් වහන්ස, ඒ එසේමය සුගතයන් වහන්සැ'යි අනුමෝදන් වේ. අපි වනාහි ඔහු විසින් ලෝකය ශාශ්වතය කියා හෝ ලෝකය අශාශ්වතය කියා හෝ ලෝකය අන්තවත්ය කියා හෝ ලෝකය අනන්තය කියා හෝ, ජීවයම ශරීරය කියා හෝ ජීවය අනිකෙක ශරීරය අනිකෙක කියා හෝ, සත්ත්වයා මරණින්මතු පවතින්නේය කියා හෝ සත්ත්වයා මරණින්මතු නොපවත්නේය කියා හෝ, සත්ත්වයා මරණින්මතු පවත්නේත්වේ නොපවත්නේත් වේ කියා හෝ, මරණින්මතු සත්ත්ව තෙම වන්නේත් නොවෙයි නොවන්නේත් නොවෙයි කියා හෝ ඒකාන්තකොට ධර්මයක් දේශනා කරන ලද බවක් නොදනිමු"යි වචන නමැති කෙවිටි පහරවලින් මා වෙහෙසූහ. එකල්හි මම ඒ පරිබ්‍රාජකයන්ට: "මම ද ගෞතම ශ්‍රමණයන් විසින් 'ලෝකය ශාශ්වතය කියා හෝ ලෝකය අශාශ්වතය කියා හෝ —පෙ— මරණින් පසු සත්ත්ව තෙමේ වන්නේත් නොවේ නොවන්නේත් නොවේ' කියා හෝ දේශනා කරන ලද ඒකාන්ත ධර්මයක් නොදනිමි. එහෙත් ශ්‍රමණගෞතමයා විද්‍යමානවූ, සත්‍යවූ, තථ්‍යවූ, ධර්මයෙහි පිහිටියාවූ, ධර්ම නියාමක වූ ප්‍රතිපදාවක්

භූතං ඛො පන තච්ඡං තථං පටිපදං පඤ්ඤපෙන්තස්ස[1] ධම්මට්ඨිතතං[2] ධම්මනියාමතං කථං හි නාම මාදිසො විඤ්ඤූ සමණස්ස ගොතමස්ස සුභාසිතං සුභාසිතතො නාබ්භනු-මොදෙය්‍යාති ?[3]

66. සබ්බෙව ඛො එතෙ පොට්ඨපාද පරිබ්බාජකා අන්ධා අචක්ඛුකා ත්වංයෙව[4] නෙසං එකො චක්ඛුමා. එකංසිකාපි හි ඛො[5] පොට්ඨපාද මයා ධම්මා දෙසිතා පඤ්ඤත්තා අනෙකංසිකාපි හි ඛො පොට්ඨපාද මයා ධම්මා දෙසිතා පඤ්ඤත්තා.

කතමෙ ච තෙ පොට්ඨපාද මයා අනෙකංසිකා ධම්මා දෙසිතා පඤ්ඤත්තා ? සස්සතො ලොකොති වා ඛො[5] පොට්ඨපාද මයා අනෙකංසිකො ධම්මො දෙසිතො පඤ්ඤත්තො අසස්සතො ලොකොති වා ඛො පොට්ඨපාද මයා අනෙකංසිකො ධම්මො දෙසිතො පඤ්ඤත්තො අන්තවා ලොකොති වා ඛො පොට්ඨපාද – පෙ – අනන්තවා ලොකොති වා ඛො පොට්ඨපාද – පෙ – තං ජීවං තං සරීරන්ති ඛො පොට්ඨපාද – පෙ – අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරන්ති ඛො පොට්ඨපාද – පෙ – හොති තථාගතො පරම්මරණාති ඛො පොට්ඨපාද – පෙ – න හොති තථාගතො පරම්මරණාති ඛො පොට්ඨපාද – පෙ – හොති ච න ච හොති තථාගතො පරම්මරණාති ඛො පොට්ඨපාද – පෙ – නෙව හොති න න හොති තථාගතො පරම්මරණාති ඛො පොට්ඨපාද මයා අනෙකංසිකො ධම්මො දෙසිතො පඤ්ඤත්තො.[6]

67. කස්මා[7] ච තෙ පොට්ඨපාද මයා අනෙකංසිකා ධම්මා දෙසිතා පඤ්ඤත්තා ? න හෙතෙ පොට්ඨපාද අත්ථසංහිතා න ධම්මසංහිතා න ආදිබ්‍රහ්මචරියකා න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තන්ති. තස්මා තෙ මයා අනෙකංසිකා ධම්මා දෙසිතා පඤ්ඤත්තා.

---

1. පඤ්ඤා° P.
2. ධම්මට්ඨිතං P. W.
3. න අබ්භ° B. S.
4. ත්වඤ්ඤෙව S.
5. ඛොති නත්ථි P.
6. ඉමස්මිං ඡෙදෙ –පෙ– ති B.S. පොත්වල කොපු න දිස්සති
7. තස්මා Pa කස්මා එතෙ S.

පණවයි. එවැනි විද්‍යමානවූ, සත්‍යවූ, තථ්‍යවූ, ධර්මයෙහි පිහිටියාවූ, ධර්මනියාමක වූ පිළිවෙතක් පණවන්නාවූ එතුමත්ගේ සුභාෂිතය සුභාෂිතයක් වශයෙන් මා වැනි නුවණැත්තකු විසින් අනුමෝදන් නොවිය හැක්කේ කෙසේද?" යි කීවෙමි.

66. "පොට්ඨපාදය, මේ සියලු පරිබ්‍රාජකයෝ සම්පූර්ණයෙන් ම පැණැස් නැත්තෝය, එහෙයින්ම අන්ධයෝය. ඔවුන් අතුරෙන් තුඹ පමණක් (සුභාෂිත දුර්භාෂිත සඤ්ජානනයෙහි සමර්ථ වූ බැවින්) ඇස් ඇත්තෙහිය. පොට්ඨපාදය, මා විසින් ඒකාන්ත කොට දෙශනා කරන ලද, පණවන ලද ධර්මයෝත් ඇත්තාහ. ඒකාන්ත කොට දෙශනා නොකරන ලද, නොපණවන ලද ධර්මයෝත් ඇත්තාහ.

"පොට්ඨපාදය, මවිසින් ඒකාන්ත කොට දෙශනා නොකරන ලද, නො පණවනලද ධර්මයෝ කවරහුද? පොට්ඨපාදය ලෝකය ශාස්වතය කියා ඒකාන්ත ධර්මයක් මවිසින් නොදෙසන ලදී, නොපණවන ලදී. පොට්ඨපාදය, ලෝකය අශාස්වතය කියා ඒකාන්ත ධර්මයක් මවිසින් නො දෙසන ලදී, නොපණවන ලදී. පොට්ඨපාදය, ලෝකය අන්තවත්යැයි —පෙ— පොට්ඨපාදය, ලෝකය අනන්තවත්යැයි —පෙ— පොට්ඨපාදය, හෙම ජීවය හෙම ශරීරයැ යි —පෙ— පොට්ඨපාදය, ජීවය අනෙකකි, ශරීරය අනෙකකි යි —පෙ— පොට්ඨපාදය, සත්ත්වතෙම මරණින්මතු වේයැයි —පෙ— පොට්ඨපාදය, සත්ත්වතෙම මරණින්මතු නොවේයැයි —පෙ— පොට්ඨපාදය, සත්ත්වතෙම මරණින්මතු වන්නේත් වේ නොවන්නේත් වේයැ යි —පෙ— පොට්ඨපාදය, සත්ත්වතෙම මරණින්මතු වන්නේත් නොවේ නොවන්නේත් නොවේයැ යි ඒකාන්ත ධර්මයක් මවිසින් නො දෙසන ලදී, නොපණවන ලදී.

67. "පොට්ඨපාදය,. මවිසින් කුමක් හෙයින් ඒ ධර්මයෝ ඒකාන්තකොට නො දෙසන ලද්දාහු, නොපණවන ලද්දාහු වෙත්ද? පොට්ඨපාදය, මේ ධර්මයෝ අර්ථනිඃශ්‍රිතයෝ නොවෙත්, ධර්මනිඃශ්‍රිතයෝ නොවෙත්, ආදිබ්‍රහ්මචර්යයීක නොවෙත්, නිර්වේදයට, විරාගයට, නිරොධයට, ව්‍යුපශමයට, අභිඥාවට, අවබොධයට, නිර්වාණයට හේතුවූවෝ නො වෙත්. පොට්ඨපාදය, එහෙයින් මේ ධර්මයෝ මවිසින් ඒකාන්තකොට දෙශනා නොකරන ලද්දාහුය, නොපණවන ලද්දාහුය.

කතමෙ ච තෙ පොට්ඨපාද මයා එකංසිකා ධම්මා දෙසිතා පඤ්ඤත්තා? ඉදං දුක්ඛන්ති ඛො පොට්ඨපාද මයා එකංසිකො ධම්මො දෙසිතො පඤ්ඤත්තො. අයං දුක්ඛසමුදයොති ඛො පොට්ඨපාද මයා එකංසිකො ධම්මො දෙසිතො පඤ්ඤත්තො. අයං දුක්ඛනිරොධොති ඛො පොට්ඨපාද මයා එකංසිකො ධම්මො දෙසිතො පඤ්ඤත්තො. අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති ඛො පොට්ඨපාද මයා එකංසිකො ධම්මො දෙසිතො පඤ්ඤත්තො.

කස්මා ච තෙ පොට්ඨපාද මයා එකංසිකා ධම්මා දෙසිතා පඤ්ඤත්තා? එතෙ පොට්ඨපාද[1] අත්ථසංහිතා එතෙ ධම්මසංහිතා එතෙ ආදිබ්‍රහ්මචරියකා එතෙ නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තන්ති. තස්මා තෙ මයා එකංසිකා ධම්මා දෙසිතා පඤ්ඤත්තා.

68. සන්ති[2] පොට්ඨපාද එකෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: එකන්තසුඛී අත්තා හොති අරොගො[3] පරම්මරණාති. ත්‍යාහං උපසඞ්කමිත්වා එවං වදාමි: සච්චං කිර තුම්හෙ ආයස්මන්තො එවංවාදිනො එවංදිට්ඨිනො: එකන්තසුඛී අත්තා හොති අරොගො පරම්මරණාති? තෙ චෙ මෙ එවං පුට්ඨා ආමාති[4] පටිජානන්ති. ත්‍යාහං එවං වදාමි: අපි පන තුම්හෙ ආයස්මන්තො එකන්තසුඛං ලොකං ජානං පස්සං විහරථාති? ඉති පුට්ඨා නොති වදන්ති. ත්‍යාහං එවං වදාමි: අපි[5] පන තුම්හෙ ආයස්මන්තො එකං වා රත්තිං එකං වා දිවසං උපඩ්ඪං වා රත්තිං උපඩ්ඪං වා දිවසං එකන්තසුඛිං අත්තානං සම්පජානාථාති?[6] ඉති පුට්ඨා නොති වදන්ති. ත්‍යාහං එවං වදාමි: අපි පන තුම්හෙ ආයස්මන්තො ජානාථ: අයං මග්ගො අයං පටිපදා එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියායාති? ඉති පුට්ඨා නොති වදන්ති. ත්‍යාහං එවං වදාමි: අපි පන තුම්හෙ ආයස්මන්තො යා තා දෙවතා එකන්තසුඛං ලොකං උපපන්නා[7] තාසං භාසමානානං සද්දං සුණාථ: සුපටිපන්නත්ථ[8] මාරිසා උජුපටිපන්නත්ථ[9] මාරිසා එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියාය. මයම්පි හි මාරිසා එවංපටිපන්නා එකන්තසුඛං ලොකං උපපන්නාති?[7] ඉති පුට්ඨා නොති වදන්ති.

---

1. පොට්ඨපාද මයා අත්ථ° S.
2. සන්ති ඛො S.
3. ආරොගො Pa.
4. ආමෙති W. ආමොංති P.
5. අපි ච පන S.
6. සඤ්ජානාථාති P. සම්පජානාථාති B. V.
7. උප්පන්නා P. W.
8. සුප්පටිපන්නාත්ථ P. සුපටිපන්නාත්ථ B. W.
9. උජුප්පටි° V. °පටිපන්නාත්ථ P.W.

"පොට්ඨපාදය, මවිසින් ඒකාන්ත කොට දේශනා කරන ලද, පණවන ලද ඒ ධර්මයෝ කවරහුද? පොට්ඨපාදය, මේ දුක්ඛය යැ යි මවිසින් ඒකාන්ත වූ ධර්මයක් දේශනා කරන ලදී, පණවන ලදී. පොට්ඨපාදය, මේ දුක්ඛ සමුදය යැයි මවිසින් ඒකාන්තකොට ධර්මයක් දෙසන ලදී, පණවන ලදී. පොට්ඨපාදය මේ දුක්ඛ නිරෝධය යැයි මවිසින් ඒකාන්ත කොට ධර්මයක් දෙසන ලදී, පණවන ලදී. පොට්ඨපාදය, මේ දුක්ඛනිරෝධ ගාමිනී පටිපදාව යැයි මවිසින් ඒකාන්ත වූ ධර්මයක් දේශනා කරන ලදී, පණවන ලදී.

"පොට්ඨපාදය, මවිසින් ඒ ධර්මයෝ කුමක් හෙයින් ඒකාන්ත කොට දේශනාකරන ලද්දහු, පණවන ලද්දහු වෙත්ද? පොට්ඨපාදය, මේ ධර්මයෝ අර්ථනිඃශ්‍රිතයහ, ධර්ම නිඃශ්‍රිතයහ, ආදිබ්‍රහ්මචර්‍ය්‍යකය, එසේම මොවුහු නිර්වේදය පිණිස, විරාගය පිණිස, නිරෝධය පිණිස, ව්‍යුපශමය පිණිස, අභිඥාව පිණිස, සම්‍යග්බෝධය පිණිස, නිර්වාණය පිණිස පවතිත්. පොට්ඨපාදය, එහෙයින් මේ ධර්මයෝ මවිසින් ඒකාන්තකොට දේශනාකරන ලදහ, පණවන ලදහ.

68. "පොට්ඨපාදය, 'ආත්මය තෙම මරණින් මතු ඒකාන්ත සැප ඇත්තේ සදාකාලික වේයැ'යි මෙබඳු වාද ඇති, මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහුය. මම ඔවුන් වෙත එළඹ මෙසේ කියමි: 'ආයුෂ්මතුනි, යුෂ්මත්හු ආත්මය තෙම මරණින් මතු ඒකාන්ත සැප ඇත්තේ සදාකාලික වේයැයි මෙබඳු වාද ඇත්තාහු, මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ය යනු සත්‍යයක්ද?' මෙසේ මවිසින් විචාරණ ලද්දවූ ඔවුහු ද 'එසේයැ'යි පිළිවදන් දෙත්ද, මම ඔවුන්ට මෙසේ කියමි: 'ආයුෂ්මතුනි, ඉදින් යුෂ්මත්හු ඒකාන්ත සැප ඇති ලොකයක් දනිමින්, දකිමින් වාසය කරවුද?' මෙසේ විචාරණ ලද්දහු 'නැතැ' යි පිළිවදන් දෙත් ඔවුන්ට මම මෙසේ කියමි, 'ආයුෂ්මතුනි, ඉදින් යුෂ්මත්හු එක රැයක් මුළුල්ලේ හෝ එක් දවාලක් මුළුල්ලේ හෝ එක් අඩ රැයක් මුළුල්ලේ හෝ එක් අඩ දවාලක් මුළුල්ලේ හෝ ඒකාන්ත සැප ඇති ආත්මයක් දත්තාහුද?' මෙසේ විචාරණ ලද්දහු 'නැතැ' යි කියත්. ඔවුන්ට මම මෙසේ කියමි: 'ආයුෂ්මතුනි, එසේ නම් යුෂ්මත්හු ඒකාන්ත සැප ඇති ලොකය සාක්ෂාත් කිරීමට මාර්ගය මේය, පිළිවෙත මේ යැයි දත්තාහුද?' මෙසේ අසන ලද්දහු 'නැතැ'යි පිළිතුරු දෙත්. නැවතත් ඔවුන්ට මම මෙසේ කියමි: 'ආයුෂ්මතුනි, එසේ නම් යුෂ්මත්හු, යම් දෙවතා කෙනෙක් ඒකාන්ත සැප ඇති ලොකයක උපන්නාහු නම් 'නිදුකාණෙනි, සුපිළිපන්නෝ වවූ. ඒකාන්ත සැප ඇති ලොකය සාක්ෂාත් කරණු පිණිස සෘජුව පිළිපදිවූ. නිදුකාණෙනි, අපිදු මෙසේ පිළිපන්නමෝ ඒකාන්ත සැප ඇති ලෝකයෙහි උපන්නෙමු'යි කියන්නාවූ ඔවුන්ගේ ශබ්දයක් ඇසූ විරූහුද?' මෙසේ පිළිවිස්නා ලද්දහු 'නැතැ'යි කියත්.

තං කිං මඤ්ඤසි පොට්ඨපාද? නනු එවං සන්තෙ තෙසං සමණබ්‍රාහ්මණානං අප්පාටිහීරකතං[1] භාසිතං සම්පජ්ජතීති?

අද්ධා ඛො භන්තෙ එවං සන්තෙ තෙසං සමණබ්‍රාහ්මණානං අප්පාටිහීරකතං[1] භාසිතං සම්පජ්ජතීති.[2]

69. සෙය්‍යථාපි පොට්ඨපාද[3] පුරිසො එවං වදෙය්‍ය: අහං යා ඉමස්මිං ජනපදෙ ජනපදකල්‍යාණී තං ඉච්ඡාමි තං කාමෙමීති. තමෙනං එවං වදෙය්‍යුං: අම්භො පුරිස යං ත්වං ජනපද-කල්‍යාණිං ඉච්ඡසි කාමෙසි ජානාසි තං ජනපදකල්‍යාණිං ඛත්තියී[4] වා බ්‍රාහ්මණී[5] වා වෙස්සී[6] වා සුද්දී[7] වාති? ඉති පුට්ඨො නොති වදෙය්‍ය.

තමෙනං එවං වදෙය්‍යුං: අම්භො පුරිස යං ත්වං ජනපදකල්‍යාණිං ඉච්ඡසි කාමෙසි ජානාසි තං ජනපදකල්‍යාණිං[8] එවංනාමා[9] එවංගොත්තාති[10] වා දීඝා වා රස්සා වා මජ්ඣිමා වා කාළී[11] වා සාමා වා මඞ්ගුරච්ඡවී වාති අමුකස්මිං ගාමෙ වා නිගමෙ වා නගරෙ වාති? ඉති පුට්ඨො නොති වදෙය්‍ය.

තමෙනං එවං වදෙය්‍යුං: අම්භො පුරිස යං ත්වං න ජානාසි න පස්සසි තං ත්වං ඉච්ඡසි කාමෙසීති? ඉති පුට්ඨො ආමාති[12] වදෙය්‍ය.

තං කිං මඤ්ඤසි පොට්ඨපාද? නනු එවං සන්තෙ තස්ස පුරිසස්ස අප්පාටිහීරකතං[13] භාසිතං සම්පජ්ජතීති?

අද්ධා ඛො භන්තෙ එවං සන්තෙ තස්ස පුරිසස්ස අප්පාටිහීරකතං[13] භාසිතං සම්පජ්ජතීති.

---

1. °හීරිකතං S. අපාටි° V. අපාටිහිර° B.
2. අයං ඡෙදො න දිස්සති P.
3. පොට්ඨපාදඉති නත්ථි P.
4. ඛත්ති P. ඛත්තිං W. ඛත්තියිං S.
5. බ්‍රාහ්මණිං S. W.
6. වෙස්සිං S. W.
7. සුද්දිං S. W.
8. °කල්‍යාණී W.
9. °නාමාවා S.
10. ඉතිකාරෙ නත්ථි B. S.
11. කණ්හා S.
12. ආමොති P.
13. අපටි° B. V.

"පොට්ඨපාදය, ඒ ගැණ නුඹ කුමක් සිතන්නෙහිද? මෙසේ ඇති කල්හි ඒ ශ්‍රමණබ්‍රාහමණයන්ගේ කීම් පිළිතුරු රහිත බවට නොහොත් අනෛශ්‍යානික බවට (නොවැදගත්) බවට පැමිණෙන්නේ නොවේද?"

"ස්වාමීනි, මෙසේ කල්හි ඒකාන්තයෙන්ම ඒ ශ්‍රමණ-බ්‍රාහමණයන්ගේ කථාව දියහැකි පිළිතුරක් නැති බවට පැමිණේ."

69. "පොට්ඨපාදය, යම්සේ පුරුෂයෙක් 'මේ ජනපදයෙහි යම් තැනැත්තියක් ජනපදවාසී සියලු ස්ත්‍රීන්ගෙන් අතිශය සුන්දර ස්ත්‍රිය හෙවත් ජනපදකල්‍යාණිය වූවාද, ඇ මම කැමැත්තෙමි, පතමි' යි මෙසේ කියන්නේද, ඔහුට අන්‍යයෝ මෙසේ කියන්නාහුය: 'එම්බා පුරුෂය, තෝ යම් ජනපද-කල්‍යාණියක් කැමැත්තෙහි නම්, පතන්නෙහි නම්, ඒ ජනපද-කල්‍යාණිය ක්ෂත්‍රියක කියා හෝ, බැමිණියක කියා හෝ, වෙළඳකුල ඇත්තියක කියා හෝ, පහත් කුල ඇත්තියක කියා හෝ දන්නෙහිද?' මෙසේ විචාරණ ලද්දේ 'නැතැ'යි කියන්නේය.

"ඔහුට (අන්‍යයෝ) මෙසේ කියත්: 'එම්බා පුරුෂය, තෝ යම් ජනපදකල්‍යාණියක් කැමැත්තෙහි නම් ඒ ජනපදකල්‍යාණිය මෙනම් ඇත්තිය කියා හෝ මෙනම් ගොත්‍ර ඇත්තිය කියා හෝ උස්ය කියා හෝ, මිටිය කියා හෝ, මධ්‍යමය කියා හෝ, කළුය කියා හෝ, ශ්‍යාමවර්ණ (කළු රත්වත්)ය කියා හෝ, මඟුරුවත්ය කියා හෝ, අසවල් ගමෙහිය කියා හෝ අසවල් නියම්ගමෙහිය කියා හෝ, අසවල් නුවරෙහිය කියා හෝ දනිහිද?' මෙසේ අසන ලද්දේ 'නැතැ'යි පිළිතුරු දෙන්නේය.

"එකල්හි (අන්‍යයෝ) ඔහුට මෙසේ කියත්: 'එම්බා පුරුෂය, තෝ නොදන්නක්, නොදක්නක් කැමැතිවන්නේ, පතන්නේ නොවේද?' මෙසේ අසන ලද්දේ 'එසේයැ'යි කියන්නේය.

"පොට්ඨපාදය, නුඹ කුමක් සිතන්නෙහිද? මෙසේ කල්හි ඒ පුරුෂයාගේ කථාව දියහැකි පිළිතුරු රහිත බවට (නොහොත් නොඇදහිය යුතු බවට) පැමිණෙන්නේ නොවේද?"

"ස්වාමීනි, ඒකාන්තයෙන්ම කරුණු එසේ ඇති කල්හි ඒ පුරුෂයාගේ කථාව පිළිතුරු රහිතබවට (නොඇදහිය යුතු බවට) පැමිණේ."

70. එවමෙව ඛො පොට්ඨපාද යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: එකන්තසුඛී අත්තා හොති අරොගො පරම්මරණාති. ත්‍යාහං උපසඞ්කමිත්වා[1] එවං වදාමි: සච්චං කිර තුම්හෙ ආයස්මන්තො එවංවාදිනො එවංදිට්ඨිනො: එකන්තසුඛී අත්තා හොති අරොගො පරම්මරණාති? තෙ චෙ[2] මෙ එවං පුට්ඨා ආමාති[3] පටිජානන්ති. ත්‍යාහං එවං වදාමි: අපි පන තුම්හෙ ආයස්මන්තො එකන්තසුඛං ලොකං ජානං පස්සං විහරථාති? ඉති පුට්ඨා නොති වදන්ති. ත්‍යාහං එවං වදාමි: අපි පන තුම්හෙ ආයස්මන්තො එකං වා රත්තිං එකං වා දිවසං උපඩ්ඪං වා රත්තිං උපඩ්ඪං වා දිවසං එකන්තසුඛිං අත්තානං සඤ්ජානාථාති[4]? ඉති පුට්ඨා නොති වදන්ති. ත්‍යාහං එවං වදාමි: අපි පන තුම්හෙ ආයස්මන්තො ජානාථ: අයං මග්ගො අයං පටිපදා එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියායාති? ඉති පුට්ඨා නොති වදන්ති. ත්‍යාහං එවං වදාමි: අපි පන තුම්හෙ ආයස්මන්තො යා තා දෙවතා එකන්තසුඛං ලොකං උපපන්නා[5] තාසං භාසමානානං සද්දං සුණාථ: සුපටිපන්නාත්ථ[6] මාරිසා උජුපටිපන්නාත්ථ[7] මාරිසා එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියාය. මයම්පි හි මාරිසා එවං පටිපන්නා[8] එකන්තසුඛං ලොකං උපපන්නාති?[5] ඉති පුට්ඨා නොති වදන්ති.

තං කිං මඤ්ඤසි පොට්ඨපාද? නනු එවං සන්තෙ තෙසං සමණබ්‍රාහ්මණානං අප්පාටිහීරකතං[9] භාසිතං සම්පජ්ජතීති?

අද්ධා ඛො භන්තෙ තෙසං සමණබ්‍රාහ්මණානං අප්පාටිහීරකතං[9] භාසිතං සම්පජ්ජතීති.

---

1. උප° ති නත්ථි W.
2. ච P.
3. ආමොති P.
4. සම්පජානථාති S. සඤ්ජානාථාති B. V.
5. උප්පන්නා P.
6. සුප්ප° V. සුපටිපන්නත්ථ P.W.
7. උජුප්ප° V °පන්නාත්ථ P. W. උජ්ජුප්ප° B. V.
8. පටිප්පන්නා W.
9. °හීරකතං S. අපාටිහීර° B. °අපාටි° V.

70. ''පොට්ඨපාදය, එපරිද්දෙන්ම යම් ඒ මහණ බමුණු කෙනෙක් 'ආත්මය තෙමේ මරණින් පසු එකාන්ත සැප ඇත්තේ සදුකාලික වේ' යන මෙබඳු වාද ඇත්තාහු, මෙබඳු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද, මම ඔවුන් වෙත එළඹ මෙසේ අසමි. සැබෑද? ආයුෂ්මතුනි, නුඹලා 'ආත්මය තෙමේ මරණින් පසු එකාන්ත සැප ඇත්තේ සදුකාලික වේ' යන මෙබඳු වාද ඇත්තාහුද? දෘෂ්ටි ඇත්තාහුද? මවිසින් මෙසේ විචාරණ ලද්දවූ ඔවුහු 'එසේයැ'යි පිළිතුරු දෙත් නම් ඔවුන්ට මම මෙසේ කියමි, 'ආයුෂ්මතුනි, නුඹලා එකාන්ත සැප ඇති ලොකයක් දනිමින් දකිමින් වාසය කරවුද?' මෙසේ විචාරණ ලද්දාහු 'නැතැ'යි පිළිවදන් දෙත්. නැවත ඔවුන්ට මම මෙසේ කියමි; 'ආයුෂ්මතුනි, නුඹලා එක් රැයක් හෝ එක් දවසක් හෝ එක් අඩ රැයෙක් එක් අඩ දවාලක් මුළුල්ලේ හෝ එකාන්ත සැප ඇති ආත්මයක් දක්නාහුද?' මෙසේ අසන ලද කල්හි ඔවුහු 'නැතැ'යි කියත්. නැවතත් ඔවුන්ට මම මෙසේ කියමි- 'ආයුෂ්මතුනි, නුඹලා එකාන්ත සැප ඇති ලෝකය සාක්ෂාත් කිරීමට මාර්ගය මේය, පිළිවෙත මේය කියා දන්නාහුද?' මෙසේ විචාරණ ලද්දෝ 'නැතැ'යි කියත්. ඔවුන්ට නැවතත් මම මෙසේ කියමි, 'ආයුෂ්මතුනි, නුඹලා, යම් ඒ දෙවතා කෙනෙක් එකාන්තසුඛ ලොකයක උපන්නාහු නම් 'නිදුකාණෙනි, සුපිළිපන්නෝ වවු. එකාන්ත සැප ඇති ලොකය සාක්ෂාත් කිරීම පිණිස ඍජුව පිළිපදිවු. අපිදු මෙසේ මැනවින් පිළිපැදීම හේතු කොටගෙණ එකාන්ත සැප ඇති ලොකයෙහි උපන්නෙමු'යයි කියනුලබන්නාවූ ඒ දෙවතාවන්ගේ ශබ්දයක් ඇසූවිරුහුද?' මෙසේ අසන ලද කල්හිත් ඔවුහු 'නැතැ'යි පිළිවදන් දෙත්.

''පොට්ඨපාදය, ඒ ගැණ නුඹගේ හැඟීම කෙසේද? මෙසේ කල්හි ඒ ශ්‍රමණබ්‍රාහ්මණයන්ගේ කථාව දිය හැකි පිළිතුරු රහිත වූවක් බවට (නොඇදහියයුත්තක් බවට) පැමිණෙන්නේ නොවේද?''

''ස්වාමීනි, එකාන්තයෙන්ම ඔවුන්ගේ කථාව දිය හැකි පිළිතුරු රහිත වූවක් බවට පැමිණේ.''

71. සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසො චාතුම්මහාපථෙ[1] නිස්සෙණිං කරෙය්‍ය පාසාදස්ස ආරොහණාය. තමෙනං එවං වදෙය්‍යුං: අම්භො පුරිස යස්ස[2] ත්වං පාසාදස්ස ආරොහණාය නිස්සෙණිං කරොසි ජානාසි තං පාසාදං පුරත්ථිමාය වා දිසාය දක්ඛිණාය වා දිසාය පච්ඡිමාය වා දිසාය උත්තරාය වා දිසාය උච්චො වා නීචො වා මජ්ඣිමො වාති? ඉති පුට්ඨො නොති වදෙය්‍ය. තමෙනං එවං වදෙය්‍යුං: අම්භො පුරිස යං ත්වං න ජානාසි න පස්සසි තස්ස ත්වං පාසාදස්ස ආරොහණාය නිස්සෙණිං කරොසීති? ඉති පුට්ඨො ආමාති[3] වදෙය්‍ය.

තං කිං මඤ්ඤසි පොට්ඨපාද? නනු එවං සන්තෙ තස්ස පුරිසස්ස අප්පාටිහීරකතං[4] භාසිතං සම්පජ්ජතීති?

අද්ධා ඛො භන්තෙ එවං සන්තෙ තස්ස පුරිසස්ස අප්පාටිහීරකතං[4] භාසිතං සම්පජ්ජතීති.

72. එවමෙව ඛො පොට්ඨපාද යෙ තෙ සමණබ්‍රාහ්මණා එවංවාදිනො එවංදිට්ඨිනො: එකන්තසුඛී අත්තා හොති අරොගො පරම්මරණාති. ත්‍යාහං උපසඞ්කමිත්වා එවං වදාමි: සච්චං කිර තුම්හෙ ආයස්මන්තො එවංවාදිනො එවංදිට්ඨිනො: එකන්තසුඛී අත්තා හොති අරොගො පරම්මරණාති? තෙ චෙ මෙ එවං පුට්ඨා ආමාති[5] පටිජානන්ති ත්‍යාහං එවං වදාමි: අපි[6] පන තුම්හෙ ආයස්මන්තො එකන්තසුඛං ලොකං ජානං පස්සං විහරථාති? ඉති පුට්ඨා නොති වදන්ති. ත්‍යාහං එවං වදාමි: අපි පන තුම්හෙ ආයස්මන්තො එකං වා රත්තිං එකං වා දිවසං උපඩ්ඪං වා රත්තිං උපඩ්ඪං වා දිවසං එකන්තසුඛිං අත්තානං සම්පජානාථාති[7]? ඉති පුට්ඨා නොති වදන්ති. ත්‍යාහං එවං වදාමි: අපි[6] පන තුම්හෙ ආයස්මන්තො ජානාථ: අයං මග්ගො අයං පටිපදා එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියායාති? ඉති පුට්ඨා නොති වදන්ති. ත්‍යාහං එවං වදාමි: අපි[6] පන තුම්හෙ ආයස්මන්තො යා තා දෙවතා එකන්තසුඛං ලොකං උපපන්නා[8] තාසං දෙවතානං[9] භාසමානානං සද්දං සුණාථ: සුප්පටිපන්නාත්ථ[10] මාරිසා උජුප්පටිපන්නාත්ථ[11] මාරිසා එකන්තසුඛස්ස ලොකස්ස සච්ඡිකිරියාය මයම්පි හි මාරිසා එවං පටිපන්නා[12] එකන්තසුඛං ලොකං උපපන්නාති? ඉති පුට්ඨා නොති වදන්ති.

---

1. චාතුම්මහා° B. V.
2. යං B. V. W.
3. අමොති P.
4. °හීරිකතං S. අප්පාටිහිර° B. °අප්පාටි° V.
5. ආමොති P.
6. අපි ච පන S.
7. සඤ්ජානාථාති P.
8. උප්පන්නා P.
9. දෙවතානං ති නත්ථි S.
10. සුප්ප° V. °පන්නාත්ථ P. W.
11. උජ්ජුප්ප° V. °පන්නාත්ථ P. W.
12. පටිප්පන්නා B.

71. "පොට්ඨපාදය, යම්සේ පුරුෂයෙක් ප්‍රාසාදයකට නැගීම පිණිස හිණිමගක් කරන්නේද, ඔහුට (අන්‍යයෝ) මෙසේ කියන්නාහ: 'එම්බා පුරුෂය, තෝ යම් ප්‍රාසාදයකට නැගෙනු සඳහා හිණිමගක් කරන්නෙහිද, ඒ ප්‍රාසාදය පෙරදිගය කියා හෝ දකුණුදිගය කියා හෝ පැදුම්දිගය කියා හෝ උතුරු දිගය කියා හෝ උස්ය කියා හෝ මිටිය කියා හෝ මධ්‍යමය කියා හෝ දනිහිද?' මෙසේ අසන ලද්දාවූ හෙතෙම 'නැතැ'යි පිළිතුරු දෙන්නේය. නැවත (අන්‍යයෝ) ඔහුට මෙසේ කියත්: 'එම්බා පුරුෂය, තෝ නොදන්නාවූ, නොදක්නාවූ ප්‍රාසාදයකට නැගීම පිණිස හිණක් කරනෙහිද?' මෙසේ විචාරණලද්දේ 'එසේයැ'යි පිළිතුරු දෙන්නේය.

"පොට්ඨපාදය, ඒ ගැණ තුඹගේ හැඟීම කෙබඳුද? කරුණු මෙසේ ඇති කල්හි ඒ පුරුෂයාගේ කථාව දිය හැකි පිළිතුරු නැති බවට පැමිණෙන්නේ නොවේද?"

"ස්වාමිනි, ඒ පුරුෂයාගේ කථාව ඒකාන්තයෙන්ම දියහැකි පිළිතුරු රහිත බවට පැමිණෙන්නේය."

72. "පොට්ඨපාදය, එසේම යම් ඒ මහණබමුණු කෙණෙක් 'ආත්මය මරණින් මතු ඒකාන්ත සැප ඇත්තේ සදාකාලික වේ' යන මෙබඳු වාද ඇත්තාහු, මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද, මම ඔවුන් වෙත එළඹ මෙසේ අසමි: 'ආයුෂ්මතුනි, ඇත්තෙන්ම යුෂ්මත්හු 'ආත්මය තෙමේ මරණින් පසු ඒකාන්ත සැප ඇත්තේ සදාකාලික වේ' යන මෙබඳු වාද ඇත්තාහුද, මෙබඳු දෘෂ්ටි ඇත්තාහුද?' මෙසේ ඇසූ කල්හි ඔවුහු 'එසේයැ'යි පිළිවදත් දෙත් නම් ඔවුන්ට මම මෙසේ කියමි. 'ආයුෂ්මතුනි, යුෂ්මත්හු ඒකාන්ත සැප ඇති ලොකයක් දනිමින්, දකිමින් වාසය කරවුද?' මෙසේ විචාරණ ලද්දාහු 'නැතැ'යි කියත්. නැවත ඔවුන්ට මම මෙසේ කියමි: 'ආයුෂ්මතුනි, යුෂ්මත්හු එක් රැයක් හෝ එක් දවසක් හෝ එක් අඩ රැයක් හෝ එක් අඩ දවාලක් හෝ ඒකාන්ත සැප ඇත්තාවූ ආත්මයක් දත්තහුද?' මෙසේ අසන ලද ඔවුහු 'නැතැ'යි පිළිතුරු දෙත්. නැවත ඔවුන්ට මම මෙසේ කියමි: 'ආයුෂ්මත්හු ඒකාන්ත සැප ඇති ලෝකය සාක්ෂාත් කිරීමට මාර්ගය මේය, පිළිවෙත මේය කියා දන්නහුද?' මෙසේ අසන ලද්දෝ 'නැතැ' යි කියත්. නැවත ඔවුන්ට මම මෙසේත් කියමි: 'ආයුෂ්මතුනි, යුෂ්මත්හු, යම් ඒ දේවතාකෙණෙක් ඒකාන්ත සැප ඇති ලොකයක උපන්නාහු නම්, 'නිදුකාණෙනි, ඒකාන්තසුඛ ලොකය සාක්ෂාත් කරණු සඳහා මැනවින් පිළිපදිවූ, සෘජුව පිළිපදිවූ. අපිදු මෙසේ මැනවින් පිළිපන්නමෝ ඒකාන්තසුඛ ලොකයට පැමිණියෙමු'යි කියනු ලබන්නාවූ ඒ දෙවියාවුන්ගේ ශබ්දයක් ඇසූවිරුහුද?' මෙසේ විචාරණ ලද්දාහු 'නැතැ'යි පිළිවදන් දෙත්.

තං කිම්මඤ්ඤසි පොට්ඨපාද? නනු එවං සන්තෙ තෙසං සමණබ්‍රාහ්මණානං අප්පාටීහීරකතං[1] භාසිතං සම්පජ්ජතීති?

අද්ධා ඛො භන්තෙ එවං සන්තෙ තෙසං සමණබ්‍රාහ්මණානං අප්පාටිහීරකතං[1] භාසිතං සම්පජ්ජතීති.

73. තයො ඛොමෙ පොට්ඨපාද අත්තපටිලාභා: ඔළාරිකො අත්තපටිලාභො මනොමයො අත්තපටිලාභො අරූපො අත්තපටිලාභො. කතමො ච පොට්ඨපාද ඔළාරිකො අත්තපටිලාභො? රූපී චාතුම්මහාභූතිකො[2] කබළීකාරභක්ඛො[3]: අයං ඔළාරිකො අත්තපටිලාභො.

කතමො මනොමයො අත්තපටිලාභො? රූපී මනොමයො සබ්බඞ්ගපච්චඞ්ගී අහීනින්ද්‍රියො අයං මනොමයො අත්තපටිලාභො.

කතමො ච අරූපො අත්තපටිලාභො? අරූපී සඤ්ඤාමයො: අයං අරූපො අත්තපටිලාභො.

74. ඔළාරිකස්සපි[4] ඛො අහං පොට්ඨපාද අත්තපටිලාභස්ස පහානාය ධම්මං දෙසෙමි යථාපටිපන්නානං[5] වො සංකිලෙසිකා ධම්මා පහීයිස්සන්ති වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච[6] දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සතීති.

75. සියා ඛො පන තෙ පොට්ඨපාද එවමස්ස: සංකිලෙසිකා ධම්මා පහීයිස්සන්ති වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච[6] දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සති දුක්ඛො ච ඛො[8] විහාරොති.

---

1. අප්පාටි° V. °හිරිකතං S. අප්පාටිහිර° B. 5. °පටිප්පන්නානං B. (සබ්බත්‍ථ)
2. චාතුමහා° B. V. 6. වෙපුල්ලතඤ්ච P.
3. කබළි° B. V. කබලිඞ්කාරාහාර° P. කබළිංකාරඞ්ග° W.
4. පිකාරො නත්‍ථි P. S. 7. විහරිස්සථාති P. W. (සබ්බත්‍ථ)
8. ඛොති නත්‍ථි S.

"පොට්ඨපාදය, මේ ගැණ තුඹගේ හැඟීම කෙසේද? මෙසේ ඇතිකල්හි ඒ ශ්‍රමණ බ්‍රාහමණයන්ගේ කථාව දිය හැකි පිළිතුරක් නැති කථාවක් බවට පැමිණෙන්නේ නොවේද?"

"ස්වාමීනි, කරුණු මෙසේ කල්හි එකාන්තයෙන්ම ඒ ශ්‍රමණ බ්‍රාහමණයන්ගේ කථාව දිය හැකි පිළිතුරු රහිත බවට පැමිණේ."

73. "පොට්ඨපාදය, ඖදාරික ආත්මප්‍රතිලාභය (කාම භවයෙහි ආත්මභාවප්‍රතිලාභය), මනොමය ආත්මප්‍රතිලාභය (රූපභවයෙහි ආත්මභාව ප්‍රතිලාභය), අරූප ආත්මප්‍රතිලාභය (අරූපභවයෙහි ආත්මභාව ප්‍රතිලාභය) යි කියා මේ ආත්මප්‍රති-ලාභයෝ තුන්දෙනෙක් වෙත්. එහි ඖදාරික ආත්මප්‍රතිලාභය නම් කවරේද යත්: චාතුර්මහාභූතයන්ගෙන් හටගත්, රූපයක් ඇති, කබලීකාරාහාරය අනුභව කරන්නේ ඖදාරික ආත්ම-ප්‍රතිලාභ නම් වේ.

"මනොමය ආත්මප්‍රතිලාභය නම් කවරේදයත්: මනොමය වූ රූපයක්ද සියලු අඟපසඟ හා නොපිරිහුණු ඉඳුරන්ද ඇත්තේ මනොමය ආත්මප්‍රතිලාභ නම් වේ.

"එහි අරූපී ආත්ම ප්‍රතිලාභ නම් කවරේදයත්: රූපයක් නැත්තේ, සංඥාමය වූයේ අරූප ආත්මප්‍රතිලාභ නම් වේ.

74. "පොට්ඨපාදය, යම් බඳු වූ ධර්මයක් අනුව පිළිපදින්න-වුන්ගේ සංක්ලෙශයෝ (අකුසල් සිත්) පහවෙත්ද, ව්‍යොදනීය ධර්මයෝ (සමථ-විදර්ශනාවෝ) වැඩෙත්ද, තෙමේ මාර්ග ඵල ප්‍රඥාවගේ පිරිපුන් බව හා මහත් බව ඉහාත්මයෙහිම විශිෂ්ට ඥානයෙන් දැන, සාක්ෂාත් කොට, ඊට පැමිණ (මාර්ගඵල උපදවා) වාසය කරන්නේද එබඳු වූ ධර්මයක් මම ඖදාරික ආත්මප්‍රති-ලාභයාගේ ප්‍රහාණය පිණිස ද දෙශනා කරමි.

75. "පොට්ඨපාදය, තුඹට මෙහිලා මෙබඳු සිතක් විය හැකිය: 'සංක්ලෙශධර්මයෝ පහවෙත්, ව්‍යොදනීය ධර්මයෝ වැඩෙත්, මාර්ග ඵල ප්‍රඥාවන්ගේ පරිපූර්ණත්වය හා විපුලත්වය මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන, ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය කෙරේ. එසේ කල්හි ඔහුගේ විහරණය දුක් සහිත නොවේදැ'යි කියාහි.

න ඛො පනෙතං පොට්ඨපාද එවං දට්ඨබ්බං. සඞ්කිලෙසිකා චෙව ධම්මා පහීයිස්සන්ති වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච[1] දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සති පාමුජ්ජඤ්චෙව භවිස්සති පීති ච පස්සද්ධි ච සති ච සම්පජඤ්ඤඤ්ච සුඛො ච විහාරො.

76. මනොමයස්ස පි ඛො අහං පොට්ඨපාද අත්තපටිලාභස්ස පහානාය ධම්මං දෙසෙමි යථාපටිපන්නානං වො සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සතීති.

77. සියා ඛො පන තෙ පොට්ඨපාද එවමස්ස: සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සති දුක්ඛො ච ඛො[2] විහාරොති[3]. න ඛො පනෙතං පොට්ඨපාද එවං දට්ඨබ්බං. සඞ්කිලෙසිකා චෙව ධම්මා පහීයිස්සන්ති වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සති පාමුජ්ජඤ්චෙව භවිස්සති පීති ච පස්සද්ධි ච සති ච සම්පජඤ්ඤඤ්ච සුඛො ච විහාරො.

78. අරූපස්සපි ඛො අහං පොට්ඨපාද අත්තපටිලාභස්ස පහානාය ධම්මං දෙසෙමි යථාපටිපන්නානං වො සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සතීති.

සියා ඛො පන තෙ පොට්ඨපාද එවමස්ස: සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සති දුක්ඛො ච ඛො විහාරොති. න ඛො පනෙතං පොට්ඨපාද එවං දට්ඨබ්බං. සඞ්කිලෙසිකා චෙව ධම්මා පහීයිස්සන්ති වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති පඤ්ඤාපරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සති පාමුජ්ජඤ්චෙව භවිස්සති පීති ච පස්සද්ධි ච සති ච සම්පජඤ්ඤඤ්ච සුඛො ච විහාරො.

---

1. වෙපුල්ලත්තඤ්ච P. (සබ්බත්ථ) - 2. ඛො ති නත්ථි S.
3. විහාරොවාති P. විහාරොච W.

“පොට්ඨපාදය, මේ කාරණය මෙලෙස නොසැලකිය යුතුයි (හෙවත් මෙය දුක් සහිත විහරණයකැයි නොසිතිය යුතුයි). සංක්ලේශ ධර්මයෝ පහවෙත්, වෝදානීය ධර්මයෝ වැඩෙත්, ප්‍රඥාවගේ පරිපූර්ණත්වය හා විපුලත්වය මේ ආත්මභාවයෙහිම තමාම විශිෂ්ටඥානයෙන් දැන, පසක් කොට, එට පැමිණ වාසය කෙරේ. එසේ කල්හි ප්‍රමොද්‍යය(තරුණ ප්‍රීතිය)ත්, ප්‍රීතිය(බලවත් සන්තෝෂය)ත්, ප්‍රශ්‍රබ්ධිය(නාම කායයාගේ සන්සිඳීම)ත්, සමාධියත්, සම්ප්‍රජන්‍යය (උතුම් වූ යහපත් නුවණ)ත්, ඇති වන්නේය. එහෙයින් ඔහුගේ විහරණය සැපවත් වන්නේය.

76. “පොට්ඨපාදය, යම් බඳු ධර්මයක් අනුව පිළිපදින්නවුන්ගේ සංක්ලේශයෝ පහවෙත්ද, සමථ විදර්ශනාවෝ වැඩෙත්ද, ඉහාත්මයෙහිම ප්‍රඥාවගේ මුහුකුරා යාමෙත්, ප්‍රත්‍යක්ෂව මාර්ගඵල ලාභය වන්නේද, එබඳු වූ ධර්මයක් මම මනොමය ආත්මභාවප්‍රතිලාභයාගේ ප්‍රහාණය පිණිසද දෙශනා කෙරෙමි.

77. “පොට්ඨපාදය, නුඹට මෙහිලා, ‘සංක්ලේශයෝ පහවෙත්, සමථ විදර්ශනාවෝ වැඩෙත්, ප්‍රඥාව මුහුකුරා යාමෙත් ඉහාත්මයෙහි ම මාර්ගඵලලාභය වේ. එසේ කල්හි ඔහුගේ විහරණය දුක් සහිත නොවේද’යි මෙබඳු අදහසක් ඇතිවිය හැකියි. පොට්ඨපාදය, මේ කාරණය ගැන මෙසේ නොසිතිය යුතුයි. සංක්ලේශයෝත් පහවෙත්, සමථ විදර්ශනාවෝත් වැඩෙත්, ප්‍රඥාව මුහුකුරායාමෙත් ඉහාත්මයෙහිම මාර්ගඵලලාභයත් වේ. එසේ කල ඔහුට ප්‍රමොද්‍යයත්, ප්‍රීතියත්, ප්‍රශ්‍රබ්ධියත්, සමාධිය හා සම්ප්‍රජන්‍යයත් වන්නේය. එහෙයින් ඔහුගේ විහරණයද සැපවත් වන්නේය.

78. “පොට්ඨපාදය, යම් බඳු ධර්මයක් අනුව පිළිපදින්නවුන්ගේ සංක්ලේශයෝ පහවෙත්ද, සමථ-විදර්ශනාවෝ වැඩෙත්ද, ප්‍රඥාව මුහුකුරා යාමෙත් ඉහාත්මයෙහිම මාර්ග ඵල ලාභයක් වන්නේද, එබඳු වූ ධර්මය මම අරූප ආත්මභාව ප්‍රතිලාභයාගේ ප්‍රහාණය පිණිසද දෙශනා කරමි.

“පොට්ඨපාදය, නුඹට මෙහි ලා, ‘සංක්ලේශයෝ පහවෙත්, සමථ විදර්ශනාවෝ වැඩෙත්, ප්‍රඥාව මුහුකුරා යාමෙත් ඉහාත්මයෙහිම මාර්ගඵල ලාභය වේ. එසේ කල්හි ඔහුගේ විහරණය දුක් සහිත නොවේද’යි මෙබඳු අදහසක් විය හැකියි. පොට්ඨපාදය, මේ කාරණය ගැන එබන්දක් නොසිතිය යුතුයි. සංක්ලේශයෝත් පහවෙත්, සමථ-විදර්ශනාවෝත් වැඩෙත්, ප්‍රඥාව මුහුකුරා යාමෙත් ඉහාත්මයෙහිම මාර්ගඵල ලාභයද වේ. එසේ කල්හි ඔහුට ප්‍රමොද්‍යයත්, ප්‍රීතියත්, ප්‍රශ්‍රබ්ධියත්, සමාධිය හා සම්ප්‍රජන්‍යයත් වන්නේය. එසේ හෙයින් ඔහුගේ විහරණයද සැපවත් වන්නේය.

79. පරෙ චෙ පොට්ඨපාද අම්හෙ එවං පුච්ඡෙය්‍යුං: කතමො පන සො ආවුසො ඔළාරිකො අත්තපටිලාභො යස්ස තුම්හෙ පහානාය[1] ධම්මං දෙසෙථ යථාපටිපන්නානං වො සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සතීති[2] තෙසං මයං එවං පුට්ඨා එවං බ්‍යාකරෙය්‍යාම[3]: අයං වා සො ආවුසො ඔළාරිකො අත්තපටිලාභො යස්ස මයං පහානාය ධම්මං දෙසෙම යථාපටිපන්නානං වො සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සතීති.

80. පරෙ චෙ පොට්ඨපාද අම්හෙ එවං පුච්ඡෙය්‍යුං: කතමො පන සො ආවුසො මනොමයො අත්තපටිලාභො යස්ස තුම්හෙ පහානාය ධම්මං දෙසෙථ යථාපටිපන්නානං වො සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සතීති[2] තෙසං මයං පුට්ඨා එවං බ්‍යාකරෙය්‍යාම: අයං වා සො ආවුසො මනොමයො අත්තපටිලාභො යස්ස මයං පහානාය ධම්මං දෙසෙම යථාපටිපන්නානං වො සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සතීති.

81. පරෙ චෙ පොට්ඨපාද අම්හෙ එවං පුච්ඡෙය්‍යුං: කතමො පන සො ආවුසො අරූපො අත්තපටිලාභො යස්ස තුම්හෙ පහානාය ධම්මං දෙසෙථ යථාපටිපන්නානං වො සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සතීති[2] තෙසං මයං එවං පුට්ඨා එවං බ්‍යාකරෙය්‍යාම: අයං වා සො ආවුසො අරූපො අත්තපටිලාභො යස්ස මයං පහානාය ධම්මං දෙසෙම යථාපටිපන්නානං වො සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සතීති.

---

1. පහාණාය V. W (සබ්බත්ථ) 2. විහරිස්සථාති P. V. (සබ්බත්ථ)
3. ව්‍යා° P. (සබ්බත්ථ)

79. “පොට්ඨපාදය, ඉදින් අන්‍යයෝ ‘ආයුෂ්මත්නි, යම්බඳු වූ ධර්මයක් අනුව පිළිපන්නවුන්ට සංක්ලේශයෝ පහවෙත්ද, සමථ-විදර්ශනාවෝ වැඩෙත්ද, ප්‍රඥාවගේ මුහුකුරායාමෙන් ඉහාත්මයෙහිම මාර්ගඵල ලාභය වන්නේද, එබඳු වූ ධර්මයක් ඔබ වහන්සේ යම් ඖදාරික ආත්මභාව ප්‍රතිලාභයක්හුගේ ප්‍රහාණය පිණිස දේශනා කරත්ද, ඒ ඖදාරික ආත්මභාව ප්‍රතිලාභය කුමක්ද?’යි කියා අපගෙන් විචාරන්නාහු නම්, මෙසේ විචාරණ ලද්දවූ අපි, ඔවුන්ට ‘යම්බඳු ධර්මයක් අනුව පිළිපන්නවුන්ට සංක්ලේශයෝ පහවෙත්ද, සමථ-විදර්ශනාවෝ වැඩෙත්ද, ප්‍රඥාව මුහුකුරා යාමෙන් ඉහාත්මයෙහිම මාර්ගඵල ලාභයක් වේද, එබඳු වූ ධර්මයක් යම් ඖදාරික ආත්මභාවප්‍රතිලාභයක්හුගේ ප්‍රහාණය පිණිස දේශනා කරමුද, ඒ ඖදාරික ආත්මභාවප්‍රතිලාභය මේ යැ’ යි ප්‍රකාශ කරන්නෙමු.

80. “පොට්ඨපාදය, ඉදින් අන්‍යයෝ ‘ආයුෂ්මත්නි, යම් බඳු වූ ධර්මයක් අනුව පිළිපන්නවුන්ට සංක්ලේශයෝ පහවෙත්ද, සමථ-විදර්ශනාවෝ වැඩෙත්ද, ප්‍රඥාවගේ මුහුකුරා යාමෙන් ඉහාත්මයෙහිම මාර්ගඵල ලාභය වන්නේද, එබඳු වූ ධර්මයක් ඔබ වහන්සේ යම් මනෝමය ආත්මභාව ප්‍රතිලාභයක්හුගේ ප්‍රහාණය පිණිස දේශනා කරත්ද, ඒ මනෝමය ආත්මභාව ප්‍රතිලාභය කුමක්ද’යි කියා අපගෙන් විචාරන්නාහු නම්, මෙසේ විචාරණ ලද්දවූ අපි ඔවුන්ට ‘යම් බඳු ධර්මයක් අනුව පිළිපන්නවුන්ට සංක්ලේශයෝ පහවෙත්ද, සමථ-විදර්ශනාවෝ වැඩෙත්ද, ප්‍රඥාවගේ මුහුකුරා යාමෙන් ඉහාත්මයෙහිම මාර්ගඵල ලාභයක් වන්නේද, එබඳු වූ ධර්මයක් යම් මනෝමය ආත්මභාව ප්‍රතිලාභයක්හුගේ ප්‍රහාණය පිණිස දේශනා කරමු නම්, ඒ මනෝමය ආත්මභාවප්‍රතිලාභය මේ යැ’යි ප්‍රකාශ කරන්නෙමු.

81. “පොට්ඨපාදය, ඉදින් ‘ආයුෂ්මත්නි, යම් බඳුවූ ධර්මයක් අනුව පිළිපන්නවුන්ට සංක්ලේශයෝ පහවෙත්ද, සමථ විදර්ශනාවෝ වැඩෙත්ද, ප්‍රඥාව මුහුකුරා යාමෙන් ඉහාත්මයෙහිම මාර්ගඵල ලාභයක් වේද, එබඳු වූ ධර්මයක් ඔබවහන්සේ ‘යම් අරූප ආත්මභාව ප්‍රතිලාභයක්හුගේ ප්‍රහාණය පිණිස දේශනා කරත්ද, ඒ අරූප ආත්මභාව ප්‍රතිලාභය කුමක්ද?’යි අන්‍යයෝ අපගෙන් අසන්නාහු නම්, එසේ අසන ලද්දවූ අපි ඔවුන්ට ‘යම් බඳු වූ ධර්මයක් අනුව පිළිපන්නවුන්ට සංක්ලේශ ධර්මයෝ පහවෙත්ද, සමථවිදර්ශනාවෝ වැඩෙත්ද, ප්‍රඥාව මුහුකුරා යාමෙන් ඉහාත්මයෙහිම මාර්ගඵල ලාභයක් වේද, එබඳු වූ ධර්මයක් යම් අරූප ආත්මභාව ප්‍රතිලාභයක්හුගේ ප්‍රහාණය පිණිස දේශනා කරමුද, ඒ අරූප ආත්මභාවප්‍රතිලාභය මේ යැ’යි ප්‍රකාශ කරන්නෙමු.

තං කිම්මඤ්ඤසි පොට්ඨපාද? නනු එවං සන්තෙ සප්පාටිහීරකතං[1] භාසිතං සම්පජ්ජතීති?

අද්ධා ඛො භන්තෙ එවං සන්තෙ සප්පාටිහීරකතං[1] භාසිතං සම්පජ්ජතීති.

82. සෙය්‍යථාපි[2] පොට්ඨපාද පුරිසො නිස්සෙණිං කරෙය්‍ය පාසාදස්ස ආරොහණාය තස්සෙව පාසාදස්ස හෙට්ඨා. තමෙනං එවං වදෙය්‍යුං: අම්භො පුරිස යස්ස ත්වං පාසාදස්ස ආරොහණාය නිස්සෙණිං කරොසි ජානාසි තං පාසාදං පුරත්ථිමාය වා දිසාය දක්ඛිණාය වා දිසාය පච්ඡිමාය වා දිසාය උත්තරාය වා දිසාය උච්චො වා නීචො වා මජ්ඣිමො[3] වාති? සො චෙ එවං වදෙය්‍ය: අයං[4] සො ආවුසො පාසාදො යස්සාහං ආරොහණාය නිස්සෙණිං කරොමි තස්සෙව පාසාදස්ස හෙට්ඨාති.

තං කිං මඤ්ඤසි පොට්ඨපාද? නනු එවං සන්තෙ තස්ස පුරිසස්ස සප්පාටිහීරකතං[1] භාසිතං සම්පජ්ජතීති?

අද්ධා ඛො භන්තෙ එවං සන්තෙ තස්ස පුරිසස්ස සප්පාටිහීරකතං[1] භාසිතං සම්පජ්ජතීති.

---

1. සපාටි° V. සපාටිහිර° B. සප්පාටිහිරි° S (සබ්බත්ථ)
2. සෙ° ඛො S.
3. මජ්ඣෙඛා P.
4. අයං වා P. S.

"පොඨ්ඨපාදය, මෙහි ලා තුඹේ හැඟීම කෙබඳුද? මෙසේ කල්හි අපගේ කීම දියහැකි පිළිතුරු සහිත වූවක් (ඇදහිය යුත්තක්) නොවත්තේද?"

"ස්වාමීනි, ඒකාන්තයෙන්ම කරුණු මෙසේ ඇති කල්හි ඒ ඔබවහන්සේගේ කීම ප්‍රතිපාක්ෂිකයින්ට දියහැකි පිළිතුරු සහිත වූවක් (ඇදහිය යුත්තක්) වන්නේමය."

82. "පොට්ඨපාදය, යම්සේ පුරුෂයෙක් ප්‍රාසාදයකට නගිනු සඳහා එම ප්‍රාසාදය යට හිණක් කරන්නේද, ඔහුට අන්‍යයෝ මෙසේ කියන්නාහ: 'එම්බා පුරුෂය, තෝ යම් පහයකට නැගෙනු සඳහා හිණක් කරයිද, ඒ පහය පෙරදිගය කියා හෝ, දකුණු දිගය කියා හෝ, පැදුම් දිගය කියා හෝ, උතුරු දිගය කියා හෝ, උසය කියා හෝ, මිටිය කියා හෝ, මධ්‍යමය කියා හෝ දනිහිද?' මෙසේ විචාරණු ලද්දවූ ඒ පුරුෂ තෙම, 'ඇවැත්නි, මම යම් පහයකට නගිනු සඳහා එම පහය යට හිණක් කෙරෙම්ද, ඒ මේ පහයයැ'යි මෙසේ කියන්නේය.

"පොට්ඨපාදය,ඒ ගැන තුඹේ හැඟීම කෙබඳුද? මෙසේ ඇති කල්හි ඒ පුරුෂයාගේ කථාව දියහැකි පිළිතුරු සහිත වූවක් (ඇදහිය යුත්තක්) වන්නේ නොවේද?"

"ස්වාමීනි, කරුණු මෙසේ කල්හි ඒ පුරුෂයාගේ කථාව ඒකාන්තයෙන් දියහැකි පිළිතුරු සහිත වූවක්ම වන්නේය."

83. එවමෙව ඛො පොට්ඨපාද පරෙ චෙ අම්හෙ එවං පුච්ඡෙය්‍යුං : කතමො පන සො ආවුසො ඔළාරිකො අත්තපටිලාභො?–පෙ–කතමො පන සො ආවුසො මනොමයො අත්තපටිලාභො? – පෙ – කතමො පන සො ආවුසො අරූපො අත්තපටිලාභො යස්ස තුම්හෙ පහාණාය ධම්මං දෙසෙථ යථාපටිපන්නානං වො සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සතීති තෙසං මයං එවං පුට්ඨා එවං බ්‍යාකරෙය්‍යාම : අයං වා සො ආවුසො අරූපො අත්තපටිලාභො යස්ස මයං පහානාය ධම්මං දෙසෙම යථාපටිපන්නානං වො සඞ්කිලෙසිකා ධම්මා පහීයිස්සන්ති වොදානියා ධම්මා අභිවඩ්ඪිස්සන්ති පඤ්ඤාපාරිපූරිං වෙපුල්ලත්තඤ්ච දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සතීති.

84. තං කිම්මඤ්ඤසි පොට්ඨපාද? නනු එවං සන්තෙ සප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතීති?

අද්ධා ඛො භන්තෙ එවං සන්තෙ සප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතීති.

85. එවං වුත්තෙ චිත්තො හත්ථිසාරිපුත්තො භගවන්තං එතදවොච : යස්මිං භන්තෙ සමයෙ ඔළාරිකො අත්තපටිලාභො හොති මොඝ'ස්ස තස්මිං සමයෙ මනොමයො අත්තපටිලාභො හොති මොඝො අරූපො අත්තපටිලාභො හොති. ඔළාරිකො වාස්ස[1] අත්තපටිලාභො තස්මිං සමයෙ සච්චො හොති.

1. අස්ස P. S.

83. "පොට්ඨපාදය, එපරිද්දෙන්ම 'ආයුෂ්මත්නි, යම්බඳුවූ ධර්මයක් අනුව පිළිපන්නවුන්ට සංක්ලේශයෝ පහ වෙත්ද, සමථවිදර්ශනාවෝ වැඩෙත්ද, ප්‍රඥාව මුහුකුරා යාමෙන් ඉහාත්මයෙහිම මාර්ගඵල ලාභය වන්නේද, එබඳු වූ ධර්මයක් ඔබ වහන්සේ යම් ඖදාරික ආත්මභාව ප්‍රතිලාභයක්හුගේ ප්‍රහාණය පිණිස දේශනා කෙරෙත් නම් ඒ ඖදාරික ආත්මභාව ප්‍රතිලාභය කවරේදැ? යම් බඳුවූ ධර්මයක් අනුව පිළිපන්නවුන්ට අකුසල් සිත් පහවෙති, සමථවිදර්ශනාවෝ වැඩෙති, මාර්ගඵල ප්‍රඥාවගේ පිරිපුන් බව හා මහත් බව ඉහාත්මයෙහිම විශිෂ්ට ඥානයෙන් දැන සාක්ෂාත්කොට ඊට පැමිණ වාසය කරන්නේයයි කියා යම් අරූප ආත්මප්‍රතිලාභයකගේ ප්‍රහාණය පිණිස අපි ධර්මයක් දේශනාකරමු නම් —පෙ— 'ඒ මනෝමය ආත්මභාව ප්‍රතිලාභය කවරේද? —පෙ— ඒ අරූප ආත්මභාව ප්‍රතිලාභය කවරේද'යි කියා අන්‍යයෝ අපගෙන් විචාරන්නාහුය. මෙසේ විචාරණ ලද්දවූ අපි ඔවුන්ට, 'යම් බඳුවූ ධර්මයක් අනුව පිළිපන්නවුන්ට අකුසල් සිත් පහවෙති, සමථවිදර්ශනාවෝ වැඩෙති, මාර්ගඵල-ප්‍රඥාවගේ පිරිපුන් බව හා මහත් බව ඉහාත්මයෙහිම විශිෂ්ට ඥානයෙන් දැන සාක්ෂාත්කොට ඊට පැමිණ වාසය කරන්නේයයි කියා යම් අරූප ආත්මප්‍රතිලාභයකගේ ප්‍රහාණය පිණිස අපි ධර්මයක් දේශනා කරමු නම් ඒ අරූප ආත්ම ප්‍රතිලාභය මේයැ'යි පවසන්නෙමු.

84. "පොට්ඨපාදය, මෙහි ලා තුඹගේ හැඟිම කෙබඳු ද? මෙසේ කල්හි අපගේ කීම ප්‍රතිපාක්ෂිකයන්ට දියහැකි පිළිතුරු සහිත වූවක් නොවන්නේද?"

"ස්වාමීනි, එසේ කල්හි එකාන්තයෙන් ඒ ඔබවහන්සේගේ කීම ප්‍රතිපක්ෂයන්ට දිය හැකි පිළිතුරු සහිත වූවක්ම වන්නේය."

85. මෙසේ කී කල්හි හස්ත්‍යාචාර්‍ය්‍ය පුත්‍ර වූ චිත්ත තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය: "ස්වාමීනි, යම් සමයෙක්හි ඖදාරික ආත්ම ප්‍රතිලාභයක් වේ ද, එසමයෙහි ඒ තැනැත්තාට මනෝමය ආත්මප්‍රතිලාභය මොඝවේ (නැත්තේ වේ), අරූප ආත්ම ප්‍රතිලාභය මොඝ වේ (නැත්තේ වේ). ඖදාරික ආත්ම-ප්‍රතිලාභයම ඔහුට එසමයෙහි සත්‍ය වේ හෙවත් ඇත්තේ වේ.

යස්මිං භන්තෙ සමයෙ මනොමයො අත්තපටිලාභො හොති මොඝ'ස්ස තස්මිං සමයෙ ඔළාරිකො අත්තපටිලාභො හොති මොඝො අරූපො අත්තපටිලාභො හොති. මනොමයො වා'ස්ස[1] අත්තපටිලාභො තස්මිං සමයෙ සච්චො හොති.

යස්මිං භන්තෙ සමයෙ අරූපො අත්තපටිලාභො හොති මොඝ'ස්ස තස්මිං සමයෙ ඔළාරිකො අත්තපටිලාභො හොති මොඝො මනොමයො අත්තපටිලාභො හොති. අරූපො වා'ස්ස[1] අත්තපටිලාභො තස්මිං සමයෙ සච්චො හොතීති.

86. යස්මිං චිත්ත සමයෙ ඔළාරිකො අත්තපටිලාභො හොති නෙව තස්මිං සමයෙ මනොමයො අත්තපටිලාභොති සඞ්ඛං[2] ගච්ඡති න[3] අරූපො අත්තපටිලාභොති සඞ්ඛං ගච්ඡති ඔළාරිකො අත්තපටිලාභො ත්වෙව තස්මිං සමයෙ සඞ්ඛං ගච්ඡති.

යස්මිං චිත්ත සමයෙ මනොමයො අත්තපටිලාභො හොති නෙව තස්මිං සමයෙ ඔළාරිකො අත්තපටිලාභොති සඞ්ඛං ගච්ඡති න[3] අරූපො අත්තපටිලාභොති සඞ්ඛං ගච්ඡති මනොමයො අත්තපටිලාභොත්වෙව තස්මිං සමයෙ සඞ්ඛං ගච්ඡති.

යස්මිං චිත්ත සමයෙ අරූපො අත්තපටිලාභො හොති නෙව තස්මිං සමයෙ ඔළාරිකො අත්තපටිලාභොති සඞ්ඛං ගච්ඡති න මනොමයො අත්තපටිලාභොති සඞ්ඛං ගච්ඡති අරූපො අත්තපටිලාභො ත්වෙව තස්මිං සමයෙ සඞ්ඛං ගච්ඡති.

87. සචෙ තං චිත්ත එවං පුච්ඡෙය්‍යුං: අහොසි ත්වං අතීතමද්ධානං න ත්වං නාහොසි[4]? භවිස්සසි ත්වං අනාගතමද්ධානං න ත්වං න භවිස්සසි? අත්ථි ත්වං එතරහි න ත්වං නත්ථීති? එවං පුට්ඨො ත්වං චිත්ත කින්ති බ්‍යාකරෙය්‍යාසීති?[5]

සචෙ මං භන්තෙ එවං පුච්ඡෙය්‍යුං: අහොසි ත්වං අතීතමද්ධානං න ත්වං න අහොසි? භවිස්සසි ත්වං අනාගතමද්ධානං න ත්වං න භවිස්සසි? අත්ථි ත්වං එතරහි න ත්වං නත්ථීති එවං පුට්ඨො අහං භන්තෙ එවං බ්‍යාකරෙය්‍යං[5]: අහොසාහං[6] අතීතමද්ධානං නාහං න අහොසිං භවිස්සාමහං අනාගතමද්ධානං නාහං න භවිස්සාමි අත්ථාහං එතරහි නාහං නත්ථීති. එවං පුට්ඨො අහං භන්තෙ එවං බ්‍යාකරෙය්‍යන්ති.

---

1. අස්ස P. S.
2. සඞ්ඛ්‍යං S. (සබ්බත්ථ)
3. න ච S.
4. න අහොසි P. S.
5. ව්‍යා° P. (සබ්බත්ථ)
6. අහොසහං P.

"ස්වාමීනි, යම් සමයෙක්හි අරූප ආත්ම ප්‍රතිලාභයෙක් වේ ද, එසමයෙහි ඒ තැනැත්තාට ඖදාරික ආත්ම ප්‍රතිලාභය නැත්තේ වේ, අරූප ආත්මප්‍රතිලාභයද නැත්තේ වේ, මනොමය ආත්ම-ප්‍රතිලාභයම එසමයෙහි ඇත්තේ වේ.

"ස්වාමීනි, යම් සමයෙක්හි අරූප ආත්ම ප්‍රතිලාභයෙක් වේ ද, එසමයෙහි ඒ තැනැත්තාට ඖදාරික ආත්මප්‍රතිලාභය නැත්තේ වේ, මනොමය ආත්මප්‍රතිලාභයද නැත්තේ වේ, අරූප ආත්ම-ප්‍රතිලාභයම එසමයෙහි ඇත්තේ වේ."

86. (එබසට බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළ සේක:) "චිත්තය, යම් සමයෙක්හි ඖදාරික ආත්මභාවප්‍රතිලාභයක් වේ ද, එසමයෙහි ඒ මනොමය ආත්මභාවප්‍රතිලාභය යන සඞ්ඛ්‍යාවට නොයේ (හෙවත් මනොමය ආත්මප්‍රතිලාභයයැයි නො ගැණේ). අරූපආත්මභාවප්‍රතිලාභය යන සඞ්ඛ්‍යාවට ද නොයේ (හෙවත් අරූප ආත්මප්‍රතිලාභයයැයි නොගැණේ). එසමයෙහි ඒ ඖදාරික ආත්මභාව සඞ්ඛ්‍යාවටම යේ.

"චිත්තය, යම් සමයෙක්හි මනොමය ආත්මභාවප්‍රතිලාභයක් වේ ද, එසමයෙහි ඒ ඖදාරික ආත්මභාවප්‍රතිලාභයයැයි නො ගැණේ, අරූප ආත්මභාවප්‍රතිලාභයැයි ද නොගැණේ. එසම-යෙහි ඒ මනොමය ආත්මභාව ප්‍රතිලාභයයැයි කියාම සැලැකේ.

"චිත්තය, යම් සමයෙක්හි අරූප ආත්මභාවප්‍රතිලාභයෙක් වේ ද, එසමයෙහි ඒ ඖදාරික ආත්මභාවප්‍රතිලාභයයැයි නො ගැණේ. මනොමය ආත්මභාවප්‍රතිලාභයයැයි ද නොගැණේ. අරූප ආත්මභාවප්‍රතිලාභයයැයි කියාම සැලැකේ.

87. "චිත්තය, ඉදින් කිසි කෙණෙක් තුඹගෙන් 'ඔබ අතීත කාලයෙහි වූයෙහි ද, අතීත කාලයෙහි නුවූයේ නොවෙහි ද? ඔබ අනාගත කාලයෙහි වන්නෙහිද? අනාගත කාලයෙහි නොවන්නේ නොවෙහි ද? ඔබ දැන් වර්තමානයෙහි ඇත්තේ වෙහි ද? වර්තමානයෙහි නැත්තේ නොවෙහිදැ?'යි මෙසේ විචාරන්නාහු නම්, එසේ විචාරණ ලද්දවූ තුඹ කුමක් ප්‍රකාශ කරන්නෙහි ද?"

"ස්වාමීනි, ඉදින් මාගෙන් කිසි කෙණෙක් 'ඔබ අතීතයෙහි වූයෙහි ද? නුවූයේ නොවෙහි ද? ඔබ අනාගතයෙහි වන්නෙහි ද? නොවන්නේ නොවෙහි ද? දැන් ඔබ ඇත්තේ වෙහ ද? නැත්තේ නොවෙහිදැ' යි මෙසේ විචාරන්නාහු නම්, ස්වාමීනි, එසේ විචාරණ ලද්දවූ මම ඔවුන්ට,'මම අතීත කාලයෙහි වූයෙමි, නුවූයේ නොවෙමි. මම අනාගත කාලයෙහි වන්නෙමි, නො වන්නේ නොවෙමි. දැන් මම ඇත්තේ වෙමි, නැත්තේ නො වෙමි'යි මෙසේ ප්‍රකාශ කරන්නෙමි."

88. සචෙ පන තං චිත්ත එවං පුච්ඡෙය්‍යුං: යො තෙ අහොසි අතීතො අත්තපටිලාභො ස්වෙව[1] තෙ අත්තපටිලාභො සච්චො මොඝො අනාගතො මොඝො පච්චුප්පන්නො? යො තෙ[2] භවිස්සති අනාගතො අත්තපටිලාභො ස්වෙව[1] තෙ අත්තපටිලාභො සච්චො මොඝො අතීතො මොඝො පච්චුප්පන්නො? යො තෙ එතරහි පච්චුප්පන්නො අත්තපටිලාභො ස්වෙව තෙ අත්තපටිලාභො සච්චො මොඝො අතීතො මොඝො අනාගතොති? එවං පුට්ඨො ත්වං චිත්ත කින්ති බ්‍යාකරෙය්‍යාසීති?

89. සචෙ පන මං භන්තෙ එවං පුච්ඡෙය්‍යුං: යො තෙ අහොසි අතීතො අත්තපටිලාභො ස්වෙව තෙ අත්තපටිලාභො සච්චො මොඝො අනාගතො මොඝො පච්චුප්පන්නො? යො තෙ භවිස්සති අනාගතො අත්තපටිලාභො ස්වෙව තෙ අත්තපටිලාභො සච්චො මොඝො අතීතො මොඝො පච්චුප්පන්නො? යො තෙ එතරහි පච්චුප්පන්නො අත්තපටිලාභො ස්වෙව තෙ අත්තපටිලාභො සච්චො මොඝො අතීතො මොඝො අනාගතොති? එවං පුට්ඨො අහං භන්තෙ එවං බ්‍යාකරෙය්‍යං:

යො මෙ අහොසි අතීතො අත්තපටිලාභො ස්වෙව මෙ අත්තපටිලාභො තස්මිං සමයෙ සච්චො අහොසි මොඝො අනාගතො මොඝො පච්චුප්පන්නො. යො[3] මෙ භවිස්සති අනාගතො අත්තපටිලාභො ස්වෙව මෙ අත්තපටිලාභො තස්මිං සමයෙ සච්චො භවිස්සති මොඝො අතීතො[4] මොඝො පච්චුප්පන්නො. යො මෙ එතරහි පච්චුප්පන්නො අත්තපටිලාභො ස්වෙව මෙ අත්තපටිලාභො සච්චො මොඝො අතීතො මොඝො අනාගතොති. එවං පුට්ඨො අහං භන්තෙ එවං බ්‍යාකරෙය්‍යන්ති.

---

1. සො යෙව S. සොව B. W. (සබ්බත්‍ථ)
2. යො වා තෙ P. (සබ්බත්‍ථ)
3. යො ච S. යො වා P.
4. අතීතො භවිස්සති P. W.

88. "ඉදින් චිත්‍රය, තුඹගෙන් මෙසේ විචාරන්නාහු නම් 'ඔබට යම් අතීත ආත්මභාවප්‍රතිලාභයක් වී නම්, ඔබේ ඒ අතීත ආත්ම-ප්‍රතිලාභය ම සත්‍ය ද? අනාගත ආත්මප්‍රතිලාභය හිස් ද? වර්ත-මාන ආත්මප්‍රතිලාභය හිස් ද? ඔබට යම් අනාගත ආත්මප්‍රති-ලාභයක් වන්නේ නම් එකල්හි ඒ අනාගත ආත්මභාවප්‍රති ලාභය ම සත්‍ය ද? අතීත ආත්මප්‍රතිලාභය හිස් ද? වර්තමාන ආත්මප්‍රතිලාභය හිස් ද? ඔබට දැන් මේ වර්තමාන ආත්මභාව-ප්‍රතිලාභයක් වේ ද, මේ ආත්මභාවප්‍රතිලාභය ම සත්‍ය ද? අතීත ආත්මප්‍රතිලාභය හිස්ද? අනාගත ආත්මප්‍රතිලාභය හිස් ද?' මෙසේ අසන ලද්දවූ තුඹ කෙසේ නම් පිළිතුරු දෙන් නෙහි ද?"

89. "ස්වාමීනි, ඉදින් 'ඔබට යම් අතීත ආත්මප්‍රති ලාභයක් වී නම්, ඔබේ ඒ අතීත ආත්මප්‍රතිලාභයම සත්‍ය ද? අනාගත ආත්මප්‍රතිලාභය හිස් ද? වර්තමාන ආත්මප්‍රතිලාභය හිස් ද? ඔබට යම් අනාගත ආත්මප්‍රතිලාභයක් වෙහොත් එකල්හි ඒ අනාගත ආත්මප්‍රතිලාභයම සත්‍ය ද? අතීත ආත්ම-ප්‍රතිලාභය හිස් ද? වර්තමාන ආත්මප්‍රතිලාභය හිස් ද? ඔබට දැන් මේ වර්තමාන ආත්මප්‍රතිලාභයක් වේ නම්, මේ වර්තමාන ආත්මප්‍රතිලාභය ම සත්‍ය ද? අතීත ආත්මප්‍රතිලාභය හිස් ද? අනාගත ආත්මප්‍රතිලාභ හිස්ද?'යි මෙසේ මගෙන් අසන්නාහු නම්, මම මෙසේ පිළිතුරු දෙන්නෙමි:

" 'මට යම් අතීත ආත්මභාවප්‍රතිලාභයෙක් වීනම් එසම-යෙහි මාගේ ඒ අතීත ආත්මභාවප්‍රතිලාභයම සත්‍යවේ හෙවත් විද්‍යමාන වේ. අනාගත ආත්මප්‍රතිලාභයත් වර්තමාන ආත්ම-ප්‍රතිලාභයත් නැත. මට යම් අනාගත ආත්මභාවප්‍රතිලාභයක් වන්නේ නම් එසමයෙහි මාගේ ඒ අනාගත ආත්මභාවප්‍රති-ලාභයම සත්‍යවේ. අතීත ආත්මප්‍රතිලාභයක් නැත, වර්තමාන ආත්මප්‍රතිලාභය ද නැත. මට දැන් යම් මේ වර්තමාන ආත්මභාව-ප්‍රතිලාභයක් වේ ද, මාගේ මේ වර්තමාන ආත්මප්‍රතිලාභයම මෙසමයෙහි සත්‍යවේ. අතීත ආත්ම ප්‍රතිලාභයෙක් නැත, අනාගත ආත්මප්‍රතිලාභයක් ද නැත.' ස්වාමීනි, අසන ලද ඒ ප්‍රශ්නයට මම මෙසේ පිළිතුරු දෙන්නෙමි."

90. එවමෙව ඛො චිත්ත යස්මිං සමයෙ ඔළාරිකො[1] අත්තපටිලාභො හොති, නෙව තස්මිං සමයෙ මනොමයො අත්තපටිලාභොති සඞ්ඛං[2] ගච්ඡති න අරූපො අත්තපටිලාභොති සඞ්ඛං ගච්ඡති. ඔළාරිකො අත්තපටිලාභොත්වෙව තස්මිං සමයෙ සඞ්ඛං ගච්ඡති. යස්මිං චිත්ත සමයෙ මනොමයො අත්තපටිලාභො හොති -පෙ- යස්මිං චිත්ත සමයෙ අරූපො අත්තපටිලාභො හොති නෙව තස්මිං සමයෙ ඔළාරිකො අත්තපටිලාභොති සඞ්ඛං ගච්ඡති න මනොමයො අත්තපටිලාභොති සඞ්ඛං ගච්ඡති අරූපො අත්තපටිලාභොත්වෙව තස්මිං සමයෙ සඞ්ඛං ගච්ඡති.

91. සෙය්‍යථාපි චිත්ත ගවා ඛීරං ඛීරම්හා දධි දධිම්හා නවනීතං නවනීතම්හා සප්පි සප්පිම්හා සප්පිමණ්ඩො යස්මිං සමයෙ ඛීරං හොති නෙව තස්මිං සමයෙ දධීති සඞ්ඛං ගච්ඡති න[3] නවනීතන්ති සඞ්ඛං ගච්ඡති න සප්පීති සඞ්ඛං ගච්ඡති න සප්පිමණ්ඩොති සඞ්ඛං ගච්ඡති ඛීරං ත්වෙව තස්මිං සමයෙ සඞ්ඛං ගච්ඡති. යස්මිං සමයෙ දධි හොති -පෙ- නවනීතං හොති -පෙ- සප්පි හොති -පෙ- යස්මිං සමයෙ සප්පිමණ්ඩො හොති නෙව තස්මිං සමයෙ ඛීරන්ති සඞ්ඛං ගච්ඡති න දධීති සඞ්ඛං ගච්ඡති න නවනීතන්ති සඞ්ඛං ගච්ඡති න සප්පීති සඞ්ඛං ගච්ඡති සප්පිමණ්ඩොත්වෙව තස්මිං සමයෙ සඞ්ඛං ගච්ඡති.

92. එවමෙව ඛො චිත්ත යස්මිං සමයෙ ඔළාරිකො අත්තපටිලාභො හොති -පෙ- යස්මිං චිත්ත සමයෙ මනොමයො අත්තපටිලාභො හොති -පෙ- යස්මිං චිත්ත සමයෙ අරූපො අත්තපටිලාභො හොති නෙව තස්මිං සමයෙ ඔළාරිකො අත්තපටිලාභොති සඞ්ඛං ගච්ඡති න මනොමයො අත්තපටිලාභොති සඞ්ඛං ගච්ඡති අරූපො අත්තපටිලාභොත්වෙව තස්මිං සමයෙ සඞ්ඛං ගච්ඡති.

ඉමා[4] ඛො චිත්ත ලොකසමඤ්ඤා ලොකනිරුත්තියො ලොකවොහාරා ලොකපඤ්ඤත්තියො යාහි තථාගතො වොහරති අපරාමසන්ති.

---

1. මනොමයො ඔළාරිකො V.
2. සඞ්ඛ්‍යං - ඊ. (සබ්බත්ථ)
3. න ච S.
4. ඉතිමා P.

90. “චිත්තය, එපරිද්දෙන්ම යම් කලෙක්හි ඖදාරික ආත්මභාවප්‍රතිලාභය වේද, එසමයෙහි ඒ මනෝමය ආත්ම-ප්‍රතිලාභයැයි නො ගැණේ, අරූප ආත්මප්‍රතිලාභයැයිද නො ගැණේ. එසමයෙහි ඒ ඖදාරික ආත්මභාවප්‍රතිලාභයැයි කියාම සැලැකේ. චිත්තය, යම් කලෙක්හි මනෝමය ආත්මභාවප්‍රතිලාභය වේද, -පෙ- එසමයෙහි ඒ මනෝමය ආත්මභාව-ප්‍රතිලාභයැයි කියාම සැලැකේ. යම් කලෙක්හි අරූප ආත්මභාව-ප්‍රතිලාභය වේද, -පෙ- එසමයෙහි ඒ අරූප ආත්මභාවප්‍රති-ලාභයැයි කියාම සැලැකේ.

91. “චිත්තය,යම්සේ දෙනඟගන් කිරිත්,කිරෙන් දීත්,දීයෙන් වෙඬරුත්, වෙඬරුයෙන් ගිතෙලුත්, ගිතෙලින් ගිතෙල් මඬත් වෙයිද, යම් සමයෙක්හි කිරිවේද, එසමයෙහි ඒ දීයැයි නො ගැණේ, වෙඬරුයැයි නො ගැණේ, ගිතෙලැයි නො ගැණේ, ගිතෙල් මඬැයිද නො ගැණේ. එසමයෙහි ඒ කිරියයි කියාම සැලැකේ. යම් කලෙක්හි දී වේ ද —පෙ—, යම් කලෙක්හි වෙඬරු වේද —පෙ—, යම් කලෙක ගිතෙල් වේද—පෙ—, යම් කලෙක ගිතෙල් මඬවේද එකල්හි ඒ කිරියැයි නො ගැණේ, දී යැයි වෙඬරු යැයි නො ගැණේ, ගිතෙල් යැයි නො ගැණේ, එකල්හි ඒ ගිතෙල්මඬැයි කියාම සැලැකේ.

92. “චිත්තය, එසේම යම් සමයෙක්හි ඖදාරික ආත්මභාව ප්‍රතිලාභය වේද—පෙ—, යම් සමයෙක්හි මනෝමය ආත්මභාව ප්‍රතිලාභය වේද —පෙ—, යම් සමයෙක්හි අරූප ආත්මභාවප්‍රති ලාභය වේද, එසමයෙහි ඒ ඖදාරික ආත්මප්‍රතිලාභයයි නො ගැණේ, ඒ මනෝමය ආත්මප්‍රතිලාභ යයි නො ගැණේ. එසමයෙහි ඒ අරූප ආත්මභාවප්‍රතිලාභයැයි කියාම සැලැකේ.

“චිත්තය, (ඖදාරික ආත්මප්‍රතිලාභය, මනෝමය ආත්ම-ප්‍රතිලාභය, අරූප ආත්මප්‍රතිලාභය යන) මොවුහු, තථාගතයන් වහන්සේ (තෘෂ්ණා - මාන - දෘෂ්ටීන්) පරාමර්ශනයක් නැතිව (යම් නාම සමූහයකින්) ව්‍යවහාර කෙරෙත් නම් (එබඳු වූ නාමයෝ) ලෝකයා විසින් හැඳින්වීම් පමණකට දී තිබෙන නාමයෝ වෙත්, ලෝකයාගේ නිර්වචනයෝ වෙත්, ලෝකයාගේ ව්‍යවහාරයෝ වෙත්, ලෝකයාගේ ප්‍රඥප්තීහු වෙත්. (මේ ඖදාරික ආත්මප්‍රතිලාභ ආදී නාමයෝ තෘෂ්ණා-මාන-දෘෂ්ටීන් පරාමර්ශනයක් නැතිව, සම්මුති සත්‍ය වශයෙන් ගෙණ තථාගත-යන් වහන්සේ විසිනුදු ව්‍යවහාර කරනු ලබන්නාවූ ලෝ වැස්සාගේ ප්‍රඥප්තිමාත්‍රයෝ වෙත්.)”

93. එවං වුත්තෙ පොට්ඨපාදෙ පරිබ්බාජකො භගවන්තං එතදවොච: අභික්කන්තං භන්තෙ අභික්කන්තං භන්තෙ. සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය: චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති[1] එවමෙව භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං[2] ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

94. චිත්තො පන හත්ථිසාරිපුත්තො භගවන්තං එතදවොච: අභික්කන්තං භන්තෙ අභික්කන්තං භන්තෙ. සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය: චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති[1] එවමෙව භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. ලභෙය්‍යාහං භන්තෙ භගවතො සන්තිකෙ පබ්බජ්ජං ලභෙය්‍යං උපසම්පදන්ති.

95. අලත්ථ ඛො චිත්තො හත්ථිසාරිපුත්තො භගවතො සන්තිකෙ පබ්බජ්ජං අලත්ථ උපසම්පදං. අචිරූපසම්පන්නො ඛො පනායස්මා චිත්තො[3] හත්ථිසාරිපුත්තො එකො[4] වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො න චිරස්සෙව යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං[5] පබ්බජන්ති තදනුත්තරං බ්‍රහ්මචරියපරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහාසි. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති අබ්භඤ්ඤාසි. අඤ්ඤතරො ඛො පනායස්මා[6] චිත්තො හත්ථිසාරිපුත්තො අරහතං අහොසීති.

පොට්ඨපාද සුත්තං නිට්ඨිතං නවමං.[7]

---

1. දක්ඛන්ති B.V.
2. භගවා ධාරෙතු S.
3 චිත්තොති නත්ථි S.
4. එකොති න දිස්සති B.
5. අනාගාරියං B.
6. ආයස්මා S.
7. පොට්ඨපාද සුත්තන්තං P.

93. මෙසේ වදාළ කල්හි පොට්ඨපාද පරිබ්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකෙළේය: "ස්වාමීනි, (දම්දෙසුම) ඉතා යහපති. ස්වාමීනි, (දම්දෙසුම) ඉතා යහපති. ස්වාමීනි, යටිකුරු වූවක් උඩුකුරු කරන්නේ හෝ යම්සේද, පිළිසන් වූවක් විවෘතකරන්නේ හෝ යම්සේද, මංමුළාවූවෙකුට මාර්ගය කියන්නේ හෝ යම්සේද, 'ඇස් ඇත්තෝ රූ දකිත්වා'යි අඳුරෙහි තෙල් පහනක් දල්වන්නේ හෝ යම්සේද, එසේම භාග්‍යවතුන් වහන්සේ විසින් නන් අයුරින් දහම් දෙසන ලද්දේය. ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේද, ධර්මයද, භික්ෂු සඞ්ඝයාද සරණ යමි. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් මා දිවිහිම්කොට සරණගත වූ උපාසකයෙකැයි සලකන සේක්වා."

94. හස්ත්‍යාචාර්‍ය්‍ය පුත්‍රවූ චිත්ත වනාහි භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකෙළේය: "ස්වාමීනි, (දම්දෙසුම) ඉතා යහපති. ස්වාමීනි (දම්දෙසුම) ඉතා යහපති. ස්වාමීනි, යටිකුරු වූවක් උඩුකුරු කරන්නේ හෝ යම්සේද, පිළිසන්වූවක් විවෘත කරන්නේ හෝ යම්සේද මංමුළාවූවෙකුට මාර්ගය කියන්නේ හෝ යම්සේද, 'ඇස් ඇත්තෝ රූ දකිත්වා'යි අඳුරෙහි තෙල් පහනක් දල්වන්නේ හෝ යම්සේද එසේම භාග්‍යවතුන් වහන්සේ විසින් නන් අයුරින් දහම් දෙසන ලද්දේය. මම භාග්‍යවතුන් වහන්සේද, ධර්මයද, භික්ෂුසඞ්ඝයාද සරණ යමි. මම භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි ප්‍රව්‍රජ්‍යාව ලබන්නෙමි, උපසම්පදාවද ලබන්නෙමි."

95. හස්ත්‍යාචාර්‍ය්‍ය පුත්‍රවූ චිත්ත තෙමේ භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි පැවිද්ද ලැබූයේය, උපසම්පදාව ද ලැබූයේය. උපසම්පදාව නොබෝ කල් ඇති ආයුෂ්මත් චිත්ත තෙමේ සමූහයාගෙන් වෙන්ව එකලා වූයේ, අප්‍රමාදී වූයේ, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, හරණලද ආත්මාලය ඇතිව වාසය කරන්නේ, යම්කිසි අර්ථයක් සඳහා මනාකොට ගිහිගෙන් නික්ම අනගාරිය සඞ්ඛ්‍යාත ශාසනයෙහි පැවිදි වෙත්ද, ඒ අනුත්තර වූ, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යය කෙළවර කොට ඇති නිර්වාණය ඉහාත්මයෙහිම තෙමේ යහපත් නුවණින් දැන, පසක්කොට, ලැබ වාසය කෙළේය. උත්පත්ති නොමෝ ක්ෂය වීය. මාර්ගබ්‍රහ්මචර්‍ය වාසය නිමවන ලදී. සිව්සස් පිළිබඳ සියලු කටයුතු කොට අවසන් කරන ලදී. මේ ස්කන්ධසන්තානය පිණිස මත්තෙහි කළයුත්තක් නැතැයි මැනැවින් දැනගත්තේය. මෙසේ වනාහි හස්ත්‍යාචාර්‍ය්‍ය පුත්‍රවූ ආයුෂ්මත් චිත්ත තෙමේත් රහතන් අතුරෙන් එක් නමක් වූයේයි.

නවවන පොට්ඨපාද සූත්‍රය නිමියේ ය.

10. සුභසුත්තං

1. එවං මෙ සුතං. එකං සමයං ආයස්මා ආනන්දො සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ අචිරපරිනිබ්බුතෙ භගවති. තෙන ඛො පන සමයෙන සුභො මාණවො තොදෙය්‍යපුත්තො සාවත්ථියං පටිවසති කෙනචිදෙව කරණීයෙන.

2. අථ ඛො සුභො මාණවො තොදෙය්‍යපුත්තො අඤ්ඤතරං මාණවකං[1] ආමන්තෙසි: එහි ත්වං මාණවක යෙන සමණො ආනන්දො තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා මම වචනෙන සමණං ආනන්දං අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡ: සුභො මාණවො තොදෙය්‍යපුත්තො භවන්තං ආනන්දං අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡතීති. එවං ච වදෙහි: සාධු කිර භවං ආනන්දො යෙන සුභස්ස මාණවස්ස තොදෙය්‍යපුත්තස්ස නිවෙසනං තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායාති.

3. එවං භොති ඛො සො මාණවකො සුභස්ස මාණවස්ස තොදෙය්‍යපුත්තස්ස පටිස්සුත්වා[2] යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා ආනන්දෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං[3] වීතිසාරෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො මාණවකො ආයස්මන්තං ආනන්දං එතදවොච: සුභො මාණවො තොදෙය්‍යපුත්තො භවන්තං ආනන්දං අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති. එවං ච වදෙති: සාධු කිර භවං ආනන්දො යෙන සුභස්ස මාණවස්ස තොදෙය්‍යපුත්තස්ස නිවෙසනං තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායාති.

---

1. මාණවං Pa.
2. පටිසුත්වා Pa.
3. සාරණීයං B. V.

10. සුභ සූත්‍රය

1. මා විසින් මේ සූත්‍රධර්මය මෙසේ අසන ලදී. එක් සමයක බුදුරජාණන් වහන්සේ පිරිනිවි නොබෝ දිනකින් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම අනේපිඬු මහසිටු විසින් කරවා පිළිගන්වන ලද සැවැත්නුවර සමීපයෙහි වූ ජේතවනාරාමයෙහි වෙසෙයි. ඒ කාලයෙහිම තොදෙය්‍ය පුත්‍ර සුභ මෙණෙවිතෙම කිසියම් කටයුත්තක් පිණිස සැවැත්නුවර වෙසෙයි.

2. එකල තොදෙය්‍ය පුත්‍ර සුභ මෙණෙවිතෙම එක් මාණවකයකු(මෙසේ)ඇමතියේ:“මාණවකය,මෙහි එව.තුඹ ශ්‍රමණවූ ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනකද, එතැනට එළඹෙව. එළඹ මගේ වචනයෙන් (මා වෙනුවෙන්) ශ්‍රමණවූ ආනන්ද ස්ථවිරයන් වහන්සේගෙන් අල්පාබාධබවද නීරෝගබවද සැහැල්ලු පැවතුම් ඇති බවද ශරීරශක්ති ඇති බවද සුව විහරණ ඇති බවද* විචාරව: ‘පින්වත් ආනන්ද ස්ථවිරයන්,වහන්සේ අල්පාබාධව නීරෝගව සැහැල්ලු පැවතුම් ඇතිව ශරීරශක්ති ඇතිව සුවවිහරණ ඇතිව (වෙසේදැයි) සුභ මෙණෙවියා විචාරයි’ (යි උන්වහන්සේට සැලකරව).මෙසේද කියව:—‘පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ අනුකම්පා පෙරදැරිකොට තොදෙය්‍ය පුත්‍ර සුභ මෙණෙවියාගේ නිවාසය යම් තැනකද එතැනට එළඹෙන සේක් නම් යහපති’ (කියායි)”.

3. ඒ මාණවකතෙම “එසේය, පින්වතැ” යි සුභ මෙණෙවියාගේ කථාව පිළිගෙණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එතැනට එළඹියේය. එළඹ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සමග සතුටුවිය. සතුටුවියයුතු වූද සිහිකටයුතු වූ ද කථාවන් කොට නිමවා එකත් පසෙක හුන්නේය. එකත් පසෙක හුන් මෙණෙවියා ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙසේ කීය: “තොදෙය්‍ය පුත්‍ර සුභ මෙණෙවිතෙමේ පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ අල්පාබාධ බවද නීරෝග බවද සැහැල්ලු පැවතුම් ඇති බවද ශරීර ශක්ති ඇති බවද සුවවිහරණ ඇති බවද විචාරයි. (හේ) මෙසේද කියයි: ‘පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ අනුකම්පා පෙරදැරිකොට තොදෙය්‍ය පුත්‍ර සුභ මෙණෙවියාගේ නිවාසය යම් තැනෙක ද එතැනට එළඹෙන සේක් නම් යහපති’ ”.

---

* මේ වචනවලින් දැක්වෙන්නේ ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ සුවදුක් ආදි තොරතුරු විමසිය යුතු බවයි.

4. එවං වුත්තෙ ආයස්මා ආනන්දො තං මාණවකං එතදවොච: අකාලො ඛො මාණවක. අත්ථි මෙ අජ්ජ භෙසජ්ජමත්තා පීතා. අප්පෙව නාම ස්වෙපි උපසඞ්කමෙය්‍යාම කාලඤ්ච සමයඤ්ච උපාදායාති.

එවං භොති ඛො සො මාණවකො ආයස්මතො ආනන්දස්ස පටිස්සුත්වා උට්ඨායාසනා[1] යෙන සුභො මාණවො තොදෙය්‍යපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සුභං මාණවං තොදෙය්‍යපුත්තං එතදවොච; අවොචුම්හා[2] ඛො මයං භොතො වචනෙන තං භවන්තං ආනන්දං: සුභො ඛො[3] මාණවො තොදෙය්‍යපුත්තො භවන්තං ආනන්දං අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති. එවං ච වදෙති: සාධු කිර භවං ආනන්දො යෙන සුභස්ස මාණවස්ස තොදෙය්‍යපුත්තස්ස නිවෙසනං තෙනුපසඞ්කමතු අනුකම්පං උපාදායාති. එවං වුත්තෙ භො සමණො ආනන්දො මං එතදවොච: අකාලො ඛො මාණවක. අත්ථි මෙ අජ්ජ භෙසජ්ජමත්තා පීතා. අප්පෙව නාම ස්වෙපි උපසඞ්කමෙය්‍යාම කාලඤ්ච සමයඤ්ච උපාදායාති. එත්තාවතාපි ඛො භො කතමෙව එතං යතො [4]ඛො භො භවං ආනන්දො ඔකාසමකාසි ස්වාතනායපි උපසඞ්කමනායාති.

5. අථ ඛො ආයස්මා ආනන්දො තස්සා රත්තියා අච්චයෙන පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය චෙතකෙන භික්ඛුනා පච්ඡාසමණෙන යෙන සුභස්ස මාණවස්ස තොදෙය්‍යපුත්තස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි.

අථ ඛො සුභො මාණවො තොදෙය්‍යපුත්තො යෙනායස්මා ආනන්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මතා ආනන්දෙන සද්ධිං සම්මොදි. සම්මොදනීයං කථං සාරාණීයං[5] වීතිසාරෙත්වා එකමන්තං නිසීදි.

---

1. අථ ඛො සො මාණවකො උට්ඨායාසනා P.
2. අවොචුම්හ P.
3. ඛොති තත්ථ P.
4. ඛො භවං W. ඛො සො භවං P.
5. සාරණීයං B. °ණීයං V. W.

4. මෙසේ කීකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ඒ මාණවකයාට මෙය කීය: "මාණවකය, (මේ එහි යාමට) නොකල් වෙයි. මා විසින් අද බෙහෙත් ස්වල්පයක් පානය කරණ ලදී. පැමිණියයුතු කල්වේලා සලකා බලා හෙටවත් එළඹෙන්නට බලන්නෙමු".

ඒ මාණවකතෙම "එසේය, පින්වතුන් වහන්සැ" යි ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ වචනය පිළිගෙණ අසුනෙන් නැගිට සුභ මෙණෙවියා යම් තැනකද එතැනට එළඹියේය. එළඹ තොදෙය්‍ය පුත්‍ර සුභ මෙණෙවියාට මෙසේ කීය:— "අපි පින්වත්හුගේ වචනයෙන් ඒ පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙසේ කීමු: 'තොදෙය්‍ය පුත්‍ර සුභ මෙණෙවිතෙම පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ අල්පාබාධ බවද නීරෝග බවද සැහැල්ලු පැවතුම් ඇති බවද ශරීර ශක්ති ඇති බවද සුව විහරණ ඇති බවද විචාරයි. (හේ) මෙසේ ද කියයි: 'පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ අනුකම්පා පෙරදැරි කොට තොදෙය්‍ය පුත්‍ර සුභ මෙණෙවියාගේ නිවාසය යම් තැනකද එතැනට එළඹෙන සේක් නම් යහපති'' (කියායි). එසේ කීකල ආනන්ද ස්ථවිරනුමා මට මෙසේ කීහ:– 'මෙණෙවිය, (මේ එහි යාමට) නොකල් වෙයි. මා විසින් අද බෙහෙත් ස්වල්පයක් පානය කරණ ලදී. පැමිණිය යුතු කල් වේලා සලකා බලා හෙටවත් පැමිණෙන්නට බලන්නෙමු' (යි කියායි). යම්හෙයකින් පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ (මෙහි) එළඹීමට සෙට දවස අවකාශ කළසේක් ද, පින්වත, එකරුණෙන්ම (උන්වහන්සේ විසින්) මේ ආරාධනය පිළිගන්නා ලද්දේමය".

5. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ඒ රාත්‍රියගේ ඇවෑමෙන් (පසුදා) පෙරවරු කාලයේ හැද පොරවා පා සිවුරු ගෙණ චේතක නම් භික්ෂුව පසුව (කැටුව) යන මහණකු කොට ඔහු හා සමග සුභ මෙණෙවියාගේ නිවාසය යම් තැනකද එතැනට එළඹිසේක. එළඹ පැනවූ අසුනෙහි වැඩහුන්සේක.

එකල සුභ මෙණෙවිතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ වෙත එළඹ උන්වහන්සේ හා සමග සතුටු සාමීචි කෙළේය. සතුටුවිය යුතු වූ ද සිහි කටයුතු වූ ද කථාවන් කොට නිමවා එකත් පසෙක හුන්නේ ය.

එකමන්තං නිසින්නො ඛො සුභො මාණවො තොදෙය්‍යපුත්තො ආයස්මන්තං ආනන්දං එතදවොච: භවං හි ආනන්දො තස්ස භොතො ගොතමස්ස දීඝරත්තං උපට්ඨාකො සන්තිකාවචරො සමීපචාරී. භවමෙතං[1] ආනන්දො ජානෙය්‍ය යෙසං සො භවං ගොතමො ධම්මානං වණ්ණවාදී අහොසි යත්ථ ච ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිට්ඨාපෙසි. කතමෙසානං ඛො භො ආනන්ද ධම්මානං සො භවං ගොතමො වණ්ණවාදී අහොසි? කත්ථ ච ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිට්ඨාපෙසීති?

6. තිණ්ණං ඛො මාණව[2] ඛන්ධානං සො භගවා වණ්ණවාදී අහොසි එත්ථ ච ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිඨාපෙසි. කතමෙසං තිණ්ණං? අරියස්ස සීලක්ඛන්ධස්ස අරියස්ස සමාධික්ඛන්ධස්ස අරියස්ස පඤ්ඤක්ඛන්ධස්ස[3]. ඉමෙසං ඛො මාණව[2] තිණ්ණං ඛන්ධානං සො භගවා වණ්ණවාදී අහොසි එත්ථ ච ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිට්ඨාපෙසීති.

7. කතමො පන සො භො[4] ආනන්ද අරියො සීලක්ඛන්ධො යස්ස සො භවං ගොතමො වණ්ණවාදී අහොසි යත්ථ ච ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිඨාපෙසීති?

---

1. භවං එතං P.
2. මාණවක B. S.
3. පඤ්ඤා° B. P. W.
4. භො ඛො W.

එකත් පසෙක හුන් සුභ මෙණෙවියා ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙසේ කීය: "පින්වත් ආනන්ද ස්ථවිරනුමා ඒ භවත් ගෞතමයාණන් වහන්සේට බොහෝ කලක් උවටැන් කරන්නෙක්ව සුවඳුක් සොයන්නෙක්ව සමීපයෙහි හැසිරෙන්නෙක්ව විසූහ. ඒ භවත් ගෞතමයාණන් වහන්සේ යම් ධර්මකෙනෙකුන්ගේ ගුණ වදුරණ සුලු වූසේක් ද, (උන්වහන්සේ) මේ ජනසමූහයා යම් දහමක සමාදන් කරවා (යොදවා) ලූසේක් ද, වාසය කරවා ලූ සේක් ද, පිහිටුවා ලූ සේක් ද ඒ ධර්මයන් පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ දන්නා සේක. පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, ඒ භවත් ගෞතමයාණන් වහන්සේ කවර නම් ධර්ම කෙනෙකුන්ගේ ගුණ වදුරණ සුලු වූ සේක් ද? (උන්වහන්සේ) මේ ජනසමූහයා කෙබඳු ධර්මයක සමාදන් කරවා (යොදවා) ලූ සේක් ද, වාසය කරවා ලූ සේක් ද, පිහිටුවා ලූ සේක් ද?"

6. "මෙණෙවිය, ඒ භාග්‍යවතුන් වහන්සේ තෙවැදෑරුම් (ධර්ම) ස්කන්ධයන් පිළිබඳ ගුණ වදුරණ සුලු වූ සේක, තෙවැදෑරුම් (ධර්ම) ස්කන්ධයෙහිම මේ ජනසමූහයා සමාදන් කරවා ලූ සේක, නිවේසනය කරවා ලූ සේක, පිහිටුවා ලූ සේක. කවර (ධර්ම) ස්කන්ධ තුනෙක්ද යත්: ආර්‍ය්‍ය ශීලස්කන්ධය, ආර්‍ය්‍ය සමාධි-ස්කන්ධය, ආර්‍ය්‍ය ප්‍රඥාස්කන්ධය (යන ත්‍රිවිධස්කන්ධයෝය) මෙණෙවිය, ඒ භාග්‍යවතුන් වහන්සේ මේ ත්‍රිවිධ ස්කන්ධයන් පිළිබඳ ගුණ වදුරණ සුලු වූ සේක, මේ (ත්‍රිවිධ) ස්කන්ධයෙහිම මේ ජනසමූහයා සමාදන් කරවා ලූ සේක, නිවේසනය කරවා ලූ සේක, පිහිටුවා ලූ සේක."

7. "පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, ඒ භාග්‍යවතුන් වහන්සේ යම් ශීලස්කන්ධයක ගුණ වදුරණ සුලු වූ සේක් ද යම් ශීලස්කන්ධයක මේ ජනසමූහයා සමාදන් කරවා ලූසේක් ද, නිවේසනය කරවා ලූසේක් ද, පිහිටුවා ලූ සේක් ද, ඒ ශීල-ස්කන්ධය කවරේද ?"

8. ඉධ මාණව තථාගතො ලොකෙ උපපජ්ජති[1] අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී[2] සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා.[3] සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති.

9. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ[4] පච්චාජාතො.[5] සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසංචික්ඛති: සම්බාධො ඝරාවාසො රජොපථො[6] අබ්භොකාසො පබ්බජ්ජා.

නයිදං[7] සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සංඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති.[8]

1. උපපජ්ජති B. V. උප්පජ්ජතිපි S.
2. °සාරථි B. S.
3. භගවාති S.
4. අඤ්ඤතරස්මිං වා පච්චා° W.
5. පච්ඡා° S; පච්චා Sa.
6. රජාපථො S. C. රජො° Sa.
7. න ඉදං C. P.
8. පබ්බජ්ජෙය්‍යන්ති P.

8. මාණවකය, අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, අෂ්ටවිද්‍යා පසළොස් චරණධර්මයන් ගෙන් යුක්තවූ, යහපත් ගති ඇත්තාවූ, සියලු ලෝකයන් දන්නා පුලුවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි ශ්‍රේෂ්ඨවූ රියැදුරෙකු වැනිවූ, දෙවිමිනිසුන්ට ශාස්තෘවූ, සිව්සස් දම් අවබෝධ කළාවූ, භාග්‍යවත් වූ, තථාගත කෙනෙක් මෙලොව උපදනාහ. ඒ තථාගත තෙමේ දෙවියන් සහිත වූ, මාරයන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ,දෙවිමිනිසුන් (රජුන් හා මිනිසුන්) සහිතවූ,සත්ත්වවර්ගයා සවකීය විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කෙරේ. ඒ (තථාගතයන් වහන්සේ) මුල යහපත්වූ, මැද යහපත්වූ, කෙළවර යහපත්වූ,(සතර සතිපට්ඨානාදිය ඇසුරු කළ හෙයින්) අර්ථ සහිතවූ, (දශවිධ ව්‍යඤ්ජන නොපිරිහෙළා වදාරණ හෙයින්) ව්‍යඤ්ජන සහිතවූ, සියලු ලෙසින් සම්පූර්ණවූ, පිරිසුදුවූ, සකල ශාසනමාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව ගෙන හැර දක්වති.

9. ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපතිපුත්‍රයෙක් හෝ අන් කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක් හෝ අසයි. හෙතෙම ඒ දහම් අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කෙරෙයි. හෙතෙම ඒ ශ්‍රද්ධාලාභයෙන් යුක්ත වූයේ මෙසේ සලකන්නේය: ගෘහවාසය පිඩා සහිතයි. රාගාදි රජස ගැවසි මාර්ගයෙකි. පැවිද්ද එනාහී අබ්භොකාසය මෙනි (කිසිවක් නොමැති අවකාශය මෙන් නිදහස්ය).

ගිහිගෙයි වසන්නහු විසින් සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, සියලු ආකාරයෙන් පිරිසිදුවූ, ලියවූ සකක් වැනි (සංඛලිඛිතවූ),මෙම බඹසර හැසිරෙන්නට නොහැක්කේය. මම කෙස් දැළිරැවුලු හරවා, කසාවත් හැඳ, ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවන්නෙම් නම් (ඒකාන්තයෙන්) ඉතා මැනවැයි කියායි.

10. සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති[1]. සො[2] එවං පබ්බජිතො සමානො පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු කායකම්මවචීකම්මෙන සමන්නාගතො කුසලෙන පරිසුද්ධාජීවො සීලසම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො සන්තුට්ඨො.

11. කථඤ්ච මාණව භික්ඛු සීලසම්පන්නො හොති? ඉධ මාණව භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බ-පාණභූතහිතානුකම්පී විහරති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති ඉදම්පිස්ස හොති සීලස්මිං. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී[3] විරතො මෙථුනා ගාමධම්මා. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. පබ්බජ්ජති P.
2. සො ඉති න දිස්සති P.
3. අනාචාරී B.

10. හෙතෙම පසු කාලයෙක ස්වල්පවූ හෝ බොහෝවූ භෝග රැශිය හැර, ස්වල්පවූ හෝ බොහෝවූ නෑපිරිස් හැර, කෙස් දැළිරැවුලු හරවා, කසාවිසත්‍රයන් හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වේ. මෙසේ පැවිදිවූ හෙතෙම ප්‍රාතිමොක්ඛසංවරයෙන් යුක්ත වූයේ, ආචාර ගොචර දෙකින් යුක්ත වූයේ, ස්වල්පවූත් අකුසල් විෂයෙහි භය දක්නාසුලු වූයේ, යහපත්වූ කාය වාක් කර්මයන් යුක්ත වූයේ, ශික්ෂාපද සමාදන්ව එහි මොනවට හික්මෙයි. පිරිසිදුවූ දිවි පැවැතුම් ඇත්තේ වෙයි. (ත්‍රිවිධ) ශීලයෙන් යුක්ත වූයේ වෙයි. ඉන්ද්‍රිය විෂයෙහි වැසූ දොරටු ඇත්තේ වෙයි. බොජුනෙහි පමණ දන්නේ වෙයි. මනා සිහි-යෙන් හා සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයි. (සිව්පසය පිළිබඳ යථාලාභ) සන්තොෂයෙන් යුක්ත වෙයි.

11. මාණවකය, මහණ තෙමේ කෙසේනම් සීලසම්පන්න වේද? මාණවකය, මේ සස්නෙහිවූ මහණතෙමේ ප්‍රාණවධය හැර ඉන් වැළැක්කේ වේ. බහා තබන ලද දඬු ඇත්තේ, බහා තබන ලද අවි ඇත්තේ, පව් කිරීමෙහි ලජ්ජා ඇත්තේ, කරුණාවත් වූයේ, සියලු ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පීව වෙසේ. මෙසේ මේ (ප්‍රාණ වධයෙන් වෙන්වීමේ සීලය) ද ඒ මහණහුගේ සීලය පිණිස වේ.

(හෙතෙම) නොදුන් දෙය ගැනීමෙන් වෙන්ව, එයින් විශෙෂයෙන් වැළැක්කේ, දුන් දෙයම ගන්නේ, දුන් දෙයම කැමැති (බලාපොරොත්තු) වන්නේ, සොර නොවූ, පිරි-සුදුවූ (ආත්මභාවයෙන්) සිතින් යුක්තව වාසය කෙරේ. මෙසේ ඒ (අදත්තාදානයෙන් වෙන්වීමේ සීලය) ද ඒ මහණහුගේ සීලය පිණිස වේ. අබ්‍රහ්මචර්‍ය්‍යාව හැර, බඹසර නොවන හැසිරී-මෙන් දුරුවූ පැවතුම් ඇත්තේ, සත්පුරුෂසංසර්ගය නම්වූ ග්‍රාම-ධර්මයෙන් වෙන් වූයේ බ්‍රහ්මචාරී වේ. මෙසේ ඒ (කාමාසවාද විරතිය පිළිබඳවූ සීලය) ද ඔහුගේ සීලය පිණිස වේ.

මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති[1] සච්චවාදී සච්චසන්ධො ථෙතො[2] පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. ඉදම්පිස්ස හොති සීලස්මිං. පිසුණං වාචං[3] පහාය පිසුණාය වාචාය පටිවිරතො හොති. ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය. අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා[4] සමග්ගාරාමො[5] සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති[6]. ඉදම්පිස්ස හොති සීලස්මිං.

ඵරුසං[7] වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති. යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා[8] හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා තථාරූපිං[9] වාචං භාසිතා හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා හොති[6] කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං[10]. ඉදම්පිස්ස හොති සීලස්මිං.

12. බීජගාමභූතගාමසමාරම්භා[11] පටිවිරතො හොති[12]. එකභත්තිකො හොති රත්තූපරතො[13] පටිවිරතො[14] විකාලභොජනා. නච්චගීතවාදිතවිසූකදස්සනා[15] පටිවිරතො හොති. මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතො හොති. උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ජාතරූපරජතපටිග්ගහණා[16] පටිවිරතො හොති.

---

1. පටිවිරතො සමණො ගොතමො P.
2. ඨෙතො S; ථෙතො Sa.
3. පිසුණාවාචං P. W.
4. අනුප්පා° P.
5. සමග්ගරාමො B. Ca.
6. හොතීති න දිස්සති P.
7. ඵරුසාවාචං P. W.
8. පෙමනීයා B.
9. °රූපිං P.
10. °සඤ්හිතං B.
11. °සමාරබ්භා B. V.
12. හොති—පෙ—එක° B. V.
13. රත්තූපරතො B.
14. විරතො P. S. C.
15. °විසූක° B.
16. °ප්පටිග්ගහණා V. (සබ්බත්ථ)

බොරු කීමෙන් දුරුව, ඉන් විශෙෂයෙන් වැළැක්කේ, සැබෑ තෙපුල් කියන්නේ, සැබැවින් සැබව ගළපන සුලුවූයේ, ස්ථිර කථා ඇත්තේ, ඇදහිය යුතු තෙපල් ඇත්තේ, ලෝකයා අතර විරුද්ධ කථා ඇති නොකෙරේ. මෙසේ (බොරු කීමෙන් වැළකීම) ද ඒ මහණහුගේ සීලය පිණිස වේ. පිසුණු බස් හැර, ඉන් වෙසෙසින් වැළැක්කේය. මෙතැනින් අසා මොවුන් බිඳවීම පිණිස එතැන නොකියන සුලුවූයේය. එතැනින් අසා ඔවුන් බිඳවීම පිණිස මෙතැන නොකියන සුලුවූයේය. මෙසේ හෙද වූවන් ගළපන්නේ, සමගිවූවන්ගේ සමගිය තහවුරු කිරීමට අනුබල දෙන්නේ, සමගියෙහි ඇලුම් බහුල කොට ඇත්තේ, සමගිකම්හි ඇලුනේ, සමගිකම්හි සතුටුවන සුලුවූයේ, සමගිය ඇති කරණ තෙපුල් කියන්නේය. මේ ද ඔහුගේ සීලය පිණිස වේ.

ඵරුෂ වචනය හැර, ඉන් වෙසෙසින් වැළැක්කේ, යම් වචනයක් නිදෙස් වේද, කන්කලු ද, අර්ථ වශයෙන් ප්‍රෙමණීයද, මනාසේ සිතට වදනා හෙයින් සිත්කලු ද, පුරවාසීන්ගේ කථා මෙන් යහපත් ද, බොහෝ දෙනාට ප්‍රිය ද, බොහෝ දෙනාගේ මන වඩන්නේ ද, එබඳු තෙපුල්ම කියන්නේ වේ. මෙසේ (ඒ රළුවචනයෙන් වෙන්වීම ද) ඒ මහණහුගේ සීලය පිණිස වේ. හිස්වූ ප්‍රලාප කථා හැර, ඉන් වෙසෙසින් වැළැක්කේ, කාලයට සුදුසු කථා කරන්නේ, සිදුවූ (සැබෑවූ) තෙපුල්ම කියන්නේ, අර්ථයෙන් යුක්තවූ, (නවලොවුතුරු) දහම් ඇසුරු කළ, විනය ඇසුරු කළ තෙපුල් කියන්නේ, සුදුසු කල්හි උපමා හා කරුණු සහිතවූ,(පරිච්ඡෙද) සීමා ඇති, අර්ථ හෙවත් අභිවෘද්ධියෙන් යුත්, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේ. මේ (හිස්කථාවෙන් වැළැක්ම) ද ඔහුගේ සීලය පිණිස වේ.

12. තණ, ගස්, වැල් සිඳීම් බිඳීම් ආදි විකොපනයෙන් වැළැක්කේ, එක් වේලේ වළඳන බොජුන් ඇත්තේ, රාත්‍රිභොජනයෙන් හා විකල් බොජුනෙන් වැළැක්කේය. නැටීම්, ගී කීම්, බෙර ආදිය වැයීම්, විසුලු දැකීම් යන මෙයින් වැළැක්කේය. මල්, ගඳ, විලවුන් පැළඳීම, ඉන් සැරසීම, ඌනුතැන් පිරවීමෙන් අලඞ්කාර කිරීම යන මෙයින් වැළැක්කේය. උස් අසුන් මහ අසුන් යන මෙයින් වැළැක්කේය. රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් වැළැක්කේය.[1]

1. දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ උපග්‍රන්ථයේ x වෙනි පිට බලනු.

ආමකධඤ්ඤපටිග්ගහණා[1] පටිවිරතො හොති. ආමකමංසපටිග්ගහණා[1] පටිවිරතො හොති. ඉත්ථිකුමාරිකපටිග්ගහණා[1] පටිවිරතො හොති. දාසිදාසපටිග්ගහණා පටිවිරතො හොති. අජෙළකපටිග්ගහණා[1] පටිවිරතො හොති. කුක්කුටසූකරපටිග්ගහණා[1] පටිවිරතො හොති. හත්ථිගවාස්සවළවාපටිග්ගහණා[2] පටිවිරතො හොති. ඛෙත්තවත්ථුපටිග්ගහණා[1] පටිවිරතො හොති. දූතෙය්‍යපහිණගමනානුයොගා[3] පටිවිරතො හොති. කයවික්කයා පටිවිරතො හොති. තුලාකූටකංසකූටමානකූටා[4] පටිවිරතො හොති. උක්කොටනවඤ්චනනිකතිසාචියොගා[5] පටිවිරතො හොති. ඡෙදනවධබන්ධනවිපරාමොසආලොපසහසාකාරා[6] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

13. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං බීජගාමභූතගාමසමාරම්භං[7] අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං[8] මූලබීජං ඛන්ධබීජං ඵළුබීජං[9] අග්ගබීජං බීජබීජමෙව[10] පඤ්චමං— ඉති[11] එවරූපා බීජගාමභූතගාමසමාරම්භා[12] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

14. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං සන්නිධිකාරපරිභොගං අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං අන්නසන්නිධිං[13] පානසන්නිධිං වත්ථසන්නිධිං යානසන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං— ඉති වා ඉති එවරූපා සන්නිධිකාරපරිභොගා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. °ජ්පටිග්ගහණ V. (සබ්බත්ථ)
2. °ගවස්ස°B.V.°වලව°V.W.°වළව°B.
3. °පහීණ° W.
4. °කූට° B.
5. °සාචි° B. V.
6. °සහස° B.
7. °සමාරබ්භං V.
8. සෙය්‍යථිදං B. V. (සබ්බත්ථ)
9. ඵල° S. ඵලු° C. P.
10. බීජබීජං එව B.S.V.
11. ඉති වා ඉති V. S.
12. °සමාරබ්භා V.
13. °නිධි S. (සබ්බත්ථ)

අමුවූ ධාන්‍යවර්‍ග පිළිගැන්මෙන් තොරවූයේ, අමුමස් පිළිගැන්මෙන් තොරවූයේ ද ස්ත්‍රීන් හා කුමරියන් පිළිගැන්මෙන් තොර වූයේ ද වේ. දාසිදාසුන් පිළිගැන්මෙන් තොර වූයේ, එළුවන් හා තිරළුවන් පිළිගැන්මෙන් තොර වූයේ, කුකුළන්, හූරන්, ඇතුන්, ගවයන්, අසුන්, වෙළඹුන්, කෙත්, වත්, යන මේ පිළිගැන්මෙන්ද තොර වූයේය. ගිහින්ගේ දූත මෙහෙවරය, ගෙන්ගෙට යන පගත් මෙහෙවරය යන මෙයින් වැළැක්කේය. ගනු දෙනු කිරීමය, තුලා ආදියෙන් වඤ්චා කිරීමය, රන් හා නොරන් මුසුකොට වඤ්චා කිරීමය, මී ආදිය මැනීමෙන් වඤ්චා කිරීමය, හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය, උපායෙන් අනුන් රැවටීමය, යකඩ ආදි ලෝහ රන් රිදී යයි අඟවා වඤ්චා කිරීමය, නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයෝගය යන මෙයින් වැළැක්කේය. කැපීමය, මැරීමය, බැඳීමය, සැඟවී සිට වස්තු පැහැර ගැන්ම (මංකොල්ල)ය, නියම්ගම් ආදිය පැහැරීමය, බලාත්කාරකමින් වස්තු පැහැරගැන්මය යන මෙයින් ද වැළැක්කේය. මේ (විරතිය) ද ඔහුගේ සීලය පිණිස වේ.

13. ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් අනුභව කොට මූලබීජය, ඛන්ධබීජය, එළු (පුරුක්) බීජය, දලු (අග්‍ර) බීජය, පස්වැනිවූ බීජබීජය යන මේ බීජගාමභූතගාමසමාරම්භයෙහි යෙදී වෙසෙත්. (මෙබඳු වූ බීජගාම භූතගාමයන් සිඳීම් බිඳීම් ආදියෙන් වැළැක්කේ වේ නම්) මෙද ඔහුගේ සීලය පිණිස වේ.

14. එසේම යම් ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් අනුභව කොට, ආහාර වර්‍ග දෙවෙනි දිනට තබා ප්‍රයොජන ගැන්මය, පාන වර්‍ග දෙවෙනි දිනට තබා ප්‍රයොජන ගැන්මය, නොඉටන ලද සිවුරු ආදිය එසේ තැන්පත් කොට තැබීමය, යාන සංඛ්‍යාත වහන් තබා එසේ ප්‍රයොජන ගැන්මය, දෙකකින් වැඩි සයන ලැබ පසුවට තබා ප්‍රයොජන ගැන්මය, සුගන්ධයන් ලැබ එලෙස තබා ප්‍රයොජන ගැන්මය, තල සහල් ආදි ආමිසයන් තැන්පත් කොට තබා ප්‍රයොජන ගැන්ම යයි කියන ලද. සන්නිධිකාරපරිභොගයෙහි යෙදී වෙසෙත්. මෙබඳුවූ සන්නිධිකාරපරිභොගයෙන් වැළකී වෙසේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

15. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං[1] අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීදං නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වෙතාලං[2] කුම්භථූනං[3] සොභනගරකං[4] චණ්ඩාලං වංසං ධොපනං[5] හත්ථියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං[6] උසභයුද්ධං අජයුද්ධං මෙණ්ඩයුද්ධං[7] කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යොධිකං බලග්ගං සෙනාබ්‍යූහං අනීකදස්සනං[8] — ඉති වා ඉති එවරූපා විසූකදස්සනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සම්සීලං.

16. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං ජූතප්පමාදට්ඨානානුයොගං[9] අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීදං[10] අට්ඨපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං[11] ඛලිකං ඝටිකං සලාකහත්ථං අක්ඛං පඞ්ගචීරං වඞ්කකං[12] මොක්ඛචිකං චිඞ්ගුලකං[13] පත්තාළ්හකං[14] රථකං ධනුකං අක්ඛරිකං මනෙසිකං[15] යථාවජ්ජං— ඉති වා ඉති එවරූපා ජූතප්පමාදට්ඨානානුයොගා[16] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. විසූක° B.
2. වෙතාළං B. S. V.
3. කුම්භථූණං B. S. °ථූණං V.
4. සොභනකරකං W. C.
   සොභනඝරකං V.
5. ධොවනං S.
6. මහිංස° B.
7. මෙණ්ඩක° B. P. W.
8. අනික° B.
9. ජූතප්පමාද° P.
10. සෙය්‍යථිදං B. V. (සබ්බත්ථ)
11. පන්ති° V.
12. වඞ්කං Va.
13. චිඞ්ගුලිකං B. V. P.
14. පත්ථා° B. V.
15. මානෙ° S; මනෙ°Sa.
16. ජූතප්පමාද° P.

15. එසේම යම් ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා, නැටීමය, ගී කීමය, බෙර ආදිය වැයීමය, රඟමඬුලු සැරසීමය, (රාමායනාදි) කථා ඇසීමය, කයිතාලම් හා අත්ලෙන් අත්ල ගැසීමය, මන්ත්‍ර පිරවීමෙන් මළමිනී නැංවීමය, සතරුස් හෝ කළබෙර ගැසීමය, ශොභන (ප්‍රතිභාන) චිත්‍ර විචිත්‍රය,[1] සණ්ඩෙවුන් කෙළිය, හුණ්ගස් ඔසවා නැටීමය, මිනීඇට සෝදා තැබීමය, ඇතුන් හා යුද කිරීමය, අසුන් හා යුද කිරීමය, මීවුන් හා යුද කිරීමය, උසභයන් හා යුද කිරීමය, අජයුද්ධය, මෙණ්ඩක යුද්ධය, කුක්කුට යුද්ධය, වට්ටක යුද්ධය, දණ්ඩ යුද්ධය, තොරතුරු ඇසීමය, මල්ලව යුද්ධය, (සාමාන්‍ය) යුද්ධය, ඇත් අස් ආදීන් ගණන් කිරීමය, සෙනා සන්නිවෙසය, ඇත් අස් ආදීන් දක්කීමය, යන විපරීත දර්ශනයෙහි යෙදී වෙසෙත්. මෙසේ මෙබඳුවූ විසුලු දැක්මෙන් වැළකේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

16. එසේම යම් ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා (දූ පෝරු ආදියෙහි කෙළිම්වූ) අට්ඨපද ක්‍රීඩාවය, දශපද ක්‍රීඩාවය, දූ පෝරු ආදියෙහි මෙන් ආකාශයෙහි ක්‍රීඩාකිරීමය, බිම මණ්ඩල වශයෙන් සාදා පැන පැන ක්‍රීඩා කිරීමය, දූ කැට නොසොල්වා නියෙන් ගසා ක්‍රීඩා කිරීමය, පසඇටින් දුදු කෙළීමය, සිං කෙළීමය, භිත්ති ආදියෙහි ඉරටමිටි ගසා ඇත් අස් ආදි රූප දක්වා කෙළීමය, පන්දු කෙළීමය, පත් කුලල් පිඹීමය, ගම් දරුවන් මෙන් ක්‍රීඩා නඟුල් ගෙන සීසෑම් ව්‍යාජයෙන් කෙළීමය, කරනම් ගැසීමය, තල්පත් ආදියෙන් කත්තන්ගුරුවා තනා ක්‍රීඩා කිරීමය, කොළ නැළියෙන් වැලි ආදිය මැන කෙළීමය, කුඩා රථයෙන් කෙළීමය, කුඩා දුන්නෙන් කෙළීමය, අහසෙහි හෝ පිටෙහි හෝ අකුරු ඇඳ කෙළීමය, සිතූ දේ කියවීම් කීම් ආදියෙන් කෙළීමය, (ගොළු බිහිරි ආදීන්ගේ) ඒ ඒ දෙෂ රූප දක්වා කෙළීමය, යන මෙබඳුවූ ප්‍රමාදයට කාරණාවූ දූ කෙළීමෙහි යෙදී වාසය කෙරෙත්. මෙසේ මෙබඳුවූ දූ කෙළියෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

1. දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ 15 වෙනි පිටේ අබොලිපිය බලනු.

17. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං උච්චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීදං ආසන්දිං පල්ලඞ්කං ගොනකං[1] චිත්තකං පටිකං පටලිකං තූලිකං[2] විකතිකං උද්දලොමිං එකන්තලොමිං කට්ඨිස්සං[3] කොසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං[4] අස්සත්ථරං[4] රථත්ථරං[4] අජිනප්පවෙණිං කාදලිමිගපවරපච්චත්ථරණං[5] සඋත්තරච්ඡදං උභතොලොහිතකූපධානං— ඉති වා ඉති එවරූපා උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

18. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං මණ්ඩනවිභූසනට්ඨානානුයොගං[6] අනුයුත්තා විහරන්ති-සෙය්‍යථීදං[7] උච්ඡාදනං පරිමද්දනං නහාපනං[8] සම්බාහනං ආදාසං අඤ්ජනං මාලා විලෙපනං[9] මුඛචුණ්ණකං[10] මුඛාලෙපනං[11] හත්ථබන්ධං[12] සිඛාබන්ධං දණ්ඩකං[13] නාළිකං[14] ඛග්ගං[15] ඡත්තං චිත්‍රූපාහනං උණ්හීසං මණිං වාලවීජනිං[16] ඔදාතානි වත්ථානි දීඝදසානි— ඉති වා ඉති එවරූපා මණ්ඩනවිභූසනට්ඨානානුයොගා[6] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

19. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං තිරච්ඡානකථං අනුයුත්තා විහරන්ති—සෙය්‍යථීදං[7] රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං පුරිසකථං [කුමාරකථං කුමාරිකථං][17] සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානකථාය පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ගොණකං S. C.
2. තුලිකං B.
3. කට්ටි° B. V. කටි° S.
4. °ත්ථරණං B. V.
5. කදලි° B.P.V. කාදල° W.
6. °විභූ° B. °විභූසණ° W.
7. සෙය්‍යථිදං B. V. (සබ්බත්ථ)
8. න්හාපනං B. V.
9. මාලාගන්ධවි° S. B.
10. මුඛචුණ්ණං S. B. V.
11. මුඛලෙපනං B. V.; °විලෙප° S. මුඛාලෙපං Sa
12. °බද්ධං W.
13. දණ්ඩං B. S. V.
14. නාලිකං W.; නාලකං V.
15. අසිං V; අසිං ඛග්ගං S.
16. වාල° P. W.
17. ඉදං මරම්මපොත්ථකෙසු යෙව දිස්සති

17. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, දික්හගලා පුටුය, පලස්ය, සතරඟුලෙන් දිග ලොම් ඇති ඇතිරිය, විසිතුරු එළු ලොම් ඇති ඇතිරිය, එළු ලොම්මුවා සුදු ඇතිරිය, එළු ලොම්මුවා ඝනපුප් ඇතිරිය, සිංහාදි රූපයෙන් විසිතුරු එළු ලොම් ඇතිරිය, එක් පිට ලොම් ඇති එළු ලොම් ඇතිරිය, දෙපිට ලොම් ඇති එළු ලොම් ඇතිරිය, රත්කසුකම් කොට කැටි තිඟිරි හුයින් කළ පසතුරුණුය, එක්විට නිළියන් සොළොස්දෙනා කෙළනා එළු ලොම් මුවා මහ ඇතිරිය, ඇතුන් පිට අතුරණ ඇතිරිය, අසුන් පිට අතුරණ ඇතිරිය, රථ පිට අතුරණ ඇතිරිය, අඳුන් දිවිසමින් කළ පසතුරුණුය, කදලිමුව සමින් කළ උතුම් පසතුරුණුය, දෙපස තබන ලද රත්කන්වයින් ඇති ආසනය, යන මෙබඳු උස් අසුන් මහ අසුන් පරිභොග කෙරෙත්. මෙසේ මෙබඳු වූ උසසුන් මහ අසුන්හි හිඳීම් ආදියෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.[1]

18. එසේම යම් ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා, ඇඟ සුවඳ ඉලීමය, පිරිමැදීමය, නෑවීමය, මැඩිමය, කැඩපත් පරිහරණය, අඳුන් තෙල් පරිහරණය, මල් හා විලවුන්, මූවසුණු, මුඛාලෙප, හස්තාභරණ යන මේ දේ දැරීම හා පැලඳීමය, රත් හු ආදියෙන් සිඛා (කුඩුම්බි) බැඳීමය, විසිතුරු දඬු ගෙන හැසිරීමය, බෙහෙත් තළ දසරු වෙහි එල්වාගෙන ඇවිදීමය, කඩු උරෙහි එල්වා ගෙන ඇවිදීමය, ඡත්‍රධාරීව ඇවිදීමය, විසිතුරු වහන් පයලා ඇවිදීමය, නළල්පට බැඳීමය, සිඛාමාණික්‍ය පැළඳීමය, වල්විදුනා දැරීමය, දික්වූ දහවලු ඇති සුදුවත් ඇඳීමය යි මෙසේ වූ සැරසීම් හා උතුතැන් පිරවීමෙහි නිතර නිතර යෙදෙත්. මෙබඳු වූ සැරසීම්, අලඞ්කාර කිරීම් ආදියෙහි යෙදීමෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

19. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ—මහ ඇමතියන් පිළිබඳ—සේනා පිළිබඳ—භය පිළිබඳ—යුද පිළිබඳ—ආහාර පිළිබඳ—පාන වර්‍ග පිළිබඳ—වස්ත්‍ර පිළිබඳ—සයන පිළිබඳ—මාලා, ගන්ධ ද්‍රව්‍යයන්—නෑයන්—යානාවන්—ගම්—නියම්ගම්-නුවර-දනව්—ස්ත්‍රීන්—පුරුෂයන්—[කුමරකුමරියන්]—යොධයන්—වීථි—ඝටචෙටිකාවන් හෝ තිත්ථයන්—මළ නෑයන් යන ආදීන් පිළිබඳ කථාය, නොයෙක් ආකාරවූ ව්‍යර්ථ කථාය, ලොකාඛ්‍යායික (විතණ්ඩ) කථාය, මුහුද පිළිබඳ කථාය, භවාභවකථාය යන මෙබඳු තිරිසන් කථාවෙහි යෙදී වෙසෙත්. මෙබඳු වූ තිරච්ඡානකථාවෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

1. මෙහි ඇතුළත් දේ ගැණ ඇතැම් තොරතුරු දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ බ්‍රහ්මජාල සූත්‍රයේත් බලා දත යුතුයි.

20. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විග්ගාහිකකථං අනුයුත්තා විහරන්ති— සෙය්‍යථීදං[1] න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි, අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡාපටිපන්නො ත්වමසි අහමස්මි සම්මාපටිපන්නො. සහිතං මෙ අසහිතං තෙ. පුරෙ වචනීයං පච්ඡා අවච පච්ඡාවචනීයං පුරෙ අවච. අවිචිණ්ණං[2] තෙ විපරාවත්තං ආරොපිතො තෙ වාදො නිග්ගහීතොසි[3] චර වාදප්පමොක්ඛාය නිබ්බෙඨෙහි වා සචෙ පහොසීති—ඉති වා ඉති එවරූපාය විග්ගාහිකකථාය පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

21. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං දූතෙය්‍ය-පහිණගමනානුයොගමනුයුත්තා විහරන්ති— සෙය්‍යථීදං[1] රඤ්ඤං රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං කුමාරානං: ඉධ ගච්ඡ අමුත්‍රාගච්ඡ ඉදං හර අමුත්‍ර ඉදං ආහරාති— ඉති වා ඉති එවරූපා දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

22. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ කුහකා ච හොන්ති ලපකා ච නෙමිත්තිකා[4] ච නිප්පෙසිකා ච ලාභෙන[5] ලාභං නිජිගීංසිතාරො[6] ච[7]— ඉති[8] වා ඉති එවරූපා කුහනලපනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. සෙය්‍යථිදං B. V.
2. ආවිණ්ණං W. C.
3. නිග්ගහීතො ත්වමසි B. V. නිග්ගහීතොසි P.W.
4. නිමිත්තකා Sa.
5. ලාභෙන ච ලාභං P.S.
6. නිජිගිසිතාරො B.
7. ච ඉති න දිස්සති P.S.W.
8. ඉති එවං P. W.

20. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා 'ඔබ මේ ධම්විනය නොදන්නෙහිය, මම මේ ධම්විනය දනිමි.' 'ඔබ මේ ධම්විනය කුමකැයි දන්නෙහි ද? ඔබ වරදවා පිළිපන්නෙහිය, මම මනාකොට පිළිපන්නේ වෙමි.' 'මාගේ වදන් සිලිටුය හෝ අර්ථ සහිතය, ඔබගේ වචනය එසේ නොවෙයි.' 'පළමු කිය යුත්ත පසුව කීයෙහිය, පසුව කිය යුත්ත පළමුව කීයෙහිය, යමක් ඔබ බොහෝ කල් පුරුදු කරණ ලද නම් ඒ සියල්ල ව්‍යර්ථ විය. ඔබට වාදාරොපනය කරණ ලදී; නිග්‍රහ කරණ ලද්දෙහිය (වාදයෙන් පැරදුනෙහිය). වාදයෙන් මිදෙනු පිණිස ක්‍රියා කරව. ඉදින් හැක්කෙහි නම් වාදයෙන් ගැලවෙව හෙවත් ඒ නිවේඨනය කරව' යන ආදි විග්‍රාහික හෙවත් දෝෂාරොපණ කථාවෙහි යෙදී වෙසෙත්. මෙසේ මෙබඳු විග්‍රාහික කථාවෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

21. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා රජුන්ගේ, රජමහ ඇමතියන්ගේ, ක්‍ෂත්‍රියයන්ගේ, බමුණන්ගේ, ගැහැවියන්ගේ සහ කුමරුන්ගේද හසුන් ගෙණ, 'මෙතනින් අසවල් තැනට යා, අසවල් තැනින් මෙහි එව, මෙය ගෙණ යා, එතැනින් අසවල් දෙය ගෙණෙව' යි (ඇණවන ලදුව) දූතභාවයෙහි හා හසුන් ගෙණ යෑමෙහි යෙදී වෙසෙත්. මෙබඳු දූත භාවය, හසුන් ගෙණයෑම යන මෙයින් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

22. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා කුහකයෝ ද, සිව්පසය උදෙසා කථා කරන්නෝ ද, නිමිතිකරන්නෝ නොහොත් ලාභ සත්කාර සඳහන් කරවන්නෝ ද, පරලාභාදිය උදෙසා කියන්නෝ ද,[1] ලාභයකින් ලාභයක් සොයන්නෝ ද වෙත්. මෙබඳු වූ කුහනලපනාදියෙන් වැළැක්කේ වේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

---

1. දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ 21 වෙනි පිටේ 1 වෙනි අධොලිපිය බලනු.

23. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති. සෙය්‍යථීදං[2] අඞ්ගං නිමිත්තං උප්පාදං[3] සුපිණං[4] ලක්ඛණං මූසිකච්ඡින්නං[14] අග්ගිහොමං දබ්බිහොමං ථුසහොමං කණහොමං තණ්ඩුලහොමං සප්පිහොමං තෙලහොමං මුඛහොමං ලොහිතහොමං අඞ්ගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා[5] සිවවිජ්ජා භූතවිජ්ජා භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා විච්ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං[6] සරපරිත්තානං මිගචක්කං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

24. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති. සෙය්‍යථීදං[2] මණිලක්ඛණං වත්ථලක්ඛණං[7] දණ්ඩලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං[8] ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරිලක්ඛණං දාසලක්ඛණං දාසිලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං[9] උසභලක්ඛණං ගොලක්ඛණං[10] අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං[11] කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං ගොධාලක්ඛණං කණ්ණිකාලක්ඛණං[12] කච්ඡපලක්ඛණං මිගලක්ඛණං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා[13] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

25. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති. සෙය්‍යථීදං[2] රඤ්ඤං නිය්‍යානං භවිස්සති රඤ්ඤං අනිය්‍යානං භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං ජයො භවිස්සති බාහිරානං රඤ්ඤං[15] පරාජයො භවිස්සති. බාහිරානං රඤ්ඤං ජයො භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං පරාජයො භවිස්සති. ඉති ඉමස්ස ජයො භවිස්සති ඉමස්ස පරාජයො භවිස්සති— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ජීවිතං B. V.
2. සෙය්‍යථිදං B. V.
3. උප්පාතං B. °පාටං S.
4. සුපිනං B. P. සුපිණකං C.
5. ඛෙත්ත° B. S. V.
6. පක්ඛ° W. C.
7. සාඨලක්ඛණං B. V.; දණ්ඩ° වත්ථ° P. W.
8. ආයුධ° B. P.
9. මහිංස° B.
10. ගොණ° B.
11. මෙණ්ඩක° V. W.
12. කණ්ණික° B. S.
13. මිච්ඡාජීවා ඉති න දිස්සති P.
14. මූසිකා° P. W.
15. රඤ්ඤං ඉති න දිස්සති B. V.

23. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, අඞ්ග (සාමුද්‍රිකා) ශාස්ත්‍රය, නිමිති ශාස්ත්‍රය, (අසනිපාතාදි මහ නිමිති බලා කියන) උත්පාද ශාස්ත්‍රය, ස්වප්න ශාස්ත්‍රය, ලක්‍ෂණ ශාස්ත්‍රය, (මීයන් කැපූ වස්ත්‍රාදිය බලා කියන) මූසික ශාස්ත්‍රය, අග්නිහෝමය, දබ්බිහෝමය, තුස හෝමය, තණ්ඩුල—කණ—සප්පි—තෙල—මුඛ—ලෝහිත හෝමය, අඞ්ග විද්‍යා, වාස්තු විද්‍යා, නීති ශාස්ත්‍රය, සොහොනෙහි ශාන්ති කරන්නාවූ විද්‍යාව හෝ සිවල්රුත විද්‍යා, භූත විද්‍යා, අහි විද්‍යා, විෂ විද්‍යා, විච්ඡික විද්‍යා, මූසික විද්‍යා, සකුණ විද්‍යා, වායස විද්‍යා, ජීවන කාලය කීම වූ පක්ඛජ්ඣානය, ශරපරිත්‍රාණය (ආයුධ වැළැක්ම), තිරිසන් සතුන්ගේ ශබ්ද දැනීම වශයෙන් පැවති මන්ත්‍රය යන තිරශ්චීන විද්‍යා[1] හෙතුකොට ගෙන මිථ්‍යාජීවයෙන් ජීවිකාව කෙරෙත්. මෙසේ මෙබඳු තිරශ්චීනවිද්‍යා හෙතුවෙන් කරණ ලාමකාජීවිකාවෙන් වැළැක්කේ වේද මෙද ඔහුගේ **සීලය පිණිස** වේ.

24. එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, මිණි ලක්‍ෂණය, වස්ත්‍ර ලක්‍ෂණය, දණ්ඩ—ඛඩ්ග—දුනු—ආයුධ—ඉත්ථි—පුරිස—කුමාර—කුමාරි—දාස—දාසි—හත්ථි—අස්ස—මහිස—උසභ—ගො—අජ—මෙණ්ඩ—කුක්කුට—වට්ටක—ගොධා—කණ්ණිකා—කච්ඡප—මිග ලක්‍ෂණය යන මෙබඳු තිරශ්චීන විද්‍යාවන්[1] කරණකොට ගෙණ වැරදි ජීවිකාව කෙරෙත්. මෙසේ වූ තිරශ්චීන විද්‍යාවන් නිසා කරණ වැරදි ජීවිකාවෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ **සීලය පිණිස** වේ.

25. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා ‘අසවල් දින රජුන්ගේ බැහැර යෑම වන්නේය, අසවල් දින රජුන්ගේ ඇතුළු නුවරට යෑම වන්නේය. අසවල් දින ඇතුළුනුවර රජුන්ගේ ආක්‍රමණය වන්නේය, බැහැර රජුන්ගේ බැහැරට යෑම වන්නේය. බැහැර රජුන්ගේ ඇතුළු නුවරට ඒම වන්නේය, ඇතුළුනුවර රජුන්ගේ ආපසු යෑම වන්නේය, ඇතුළුනුවර රජුන්ට ජය වන්නේය, බැහැර රජුන්ට පරාජය වන්නේය. බැහැර රජුන්ට ජය වන්නේය. ඇතුළුනුවර රජුන්ට පරාජය වන්නේය. මෙසේ මොහුට ජය වන්නේය, මෙසේ පරාජය වන්නේය’ යි කියා මෙසේ තිරශ්චීනවිද්‍යා හෙතුකොට ලාමක ජීවිකාව කෙරෙත්. මෙබඳු වූ තිරශ්චීන විජ්ජා හෙතුවෙන් කරණ මිථ්‍යාජීවයෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

---

1. දීඝනිකායේ පළමුවෙනි කාණ්ඩයේ 21 වෙනි පිට බලනු.

26. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති— සෙයථීදං[2] චන්දග්ගාහො භවිස්සති සුරියග්ගාහො[3] භවිස්සති නක්ඛත්තග්ගාහො භවිස්සති. චන්දිමසුරියානං[3] පථගමනං භවිස්සති චන්දිමසුරියානං[3] උප්පථගමනං භවිස්සති. නක්ඛත්තානං පථගමනං භවිස්සති නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති. උක්කාපාතො භවිස්සති. දිසාඩාහො[4] භවිස්සති. භූමිචාලො භවිස්සති. දෙවදුන්දුභි[5] භවිස්සති. චන්දිමසුරියනක්ඛත්තානං[3] උග්ගමනං ඔගමනං[6] සඞ්කිලෙසං වොදානං භවිස්සති. එවංවිපාකො චන්දග්ගාහො භවිස්සති. එවංවිපාකො සුරියග්ගාහො[3] භවිස්සති. එවංවිපාකො නක්ඛත්තග්ගාහො භවිස්සති. එවංවිපාකං[7] චන්දිමසුරියානං[3] පථගමනං භවිස්සති. එවංවිපාකං[7] චන්දිමසුරියානං[3] උප්පථගමනං භවිස්සති. එවංවිපාකං[7] නක්ඛත්තානං පථගමනං භවිස්සති. එවංවිපාකං[7] නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති. එවංවිපාකො උක්කාපාතො භවිස්සති. එවංවිපාකො දිසාඩාහො[4] භවිස්සති. එවංවිපාකො භූමිචාලො භවිස්සති. එවංවිපාකො දෙවදුන්දුභි[5] භවිස්සති. එවංවිපාකං චන්දිමසුරියනක්ඛත්තානං[3] උග්ගමනං ඔගමනං[6] සඞ්කිලෙසං වොදානං භවිස්සති— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

27. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති— සෙය්‍යථීදං[2] සුබ්බුඨිකා[8] භවිස්සති දුබ්බුඨිකා[9] භවිස්සති. සුභික්ඛං භවිස්සති දුබ්භික්ඛං භවිස්සති. ඛෙමං භවිස්සති භයං භවිස්සති. රොගො භවිස්සති ආරොග්‍යං භවිස්සති. මුද්දා ගණනා[10] සංඛානං කාවෙය්‍යං ලොකායතං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ජීවිතං B. V.
2. සෙය්‍යථිද° B. V.
3. °සූරිය° B.
4. °දාහො W.
5. °දුන්දුභි B. V.
6. ඔග්ගමනං B. S. V.
7. °විපාකො P.
8. සුවු° V.; සුවුඨිකා B.
9. දුබ්බුට්ඨිකං B.
10. ගණනං B.

26. එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා: චන්ද්‍රග්‍රහණය වන්නේය, සූර්‍ය්‍යග්‍රහණය—තාරකා සමාගමය—සඳහිරු දෙදෙනාගේ නියම මාර්‍ගගමන—සඳහිරු දෙදෙනාගේ අමාර්‍ගගමන—තාරකාවන්ගේ මාර්‍ගගමන—තාරකාවන්ගේ අමාර්‍ගගමන වන්නේය, උල්කාපාතය වන්නේය, දිසා දැවීම—පොළොව කම්පාව—අහස ගිගුරුම—සඳ, හිරු, තාරකා යන මොවුන්ගේ නැගීම හා අස්තයට යෑම ද කෙලෙසීම ද පිරිසිදු වීම ද වන්නේය. චන්ද්‍රග්‍රහණය මෙබඳු විපාක ඇතිවන්නේය, සූර්‍ය්‍යග්‍රහණය—තාරකා සමාගමය— චන්ද්‍රසූර්‍ය්‍යයන්ගේ මාර්‍ගයෙහි ගමන— ඔවුන්ගේ නොමග ගමන— තාරකාවන්ගේ මාර්‍ගයෙහි ගමන— තාරකාවන්ගේ නොමග ගමන — උල්කාපාතය — දිගුන් දැවීම — භූමි චලනය — අහස් ගිගුරුම — සඳ, හිරු, තාරකාවන්ගේ නැගීම, බැසීම, කිලිටිවීම හා පිරිසිදුවීම මෙබඳු විපාක ඇති වන්නේ යයි කියා මෙසේ තිරච්ඡානවිජ්ජා හෙතුවෙන් කරණ මිථ්‍යාජිවිකාවෙන් ජීවිකාව කෙරෙත්. මෙසේ වූ තිරශ්චීනවිද්‍යා හෙතුකොටගෙණ කරණ ලාමක ජිවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඔහුගේ සීලය පිණිස වේ.

27. එසේම ඇතැම් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා: මනා වැසි ඇතිවන්නේය, නපුරු වැසි—යහපත් භික්ෂා—දුර්භික්ෂා—නිර්භය—භය—රෝග—නීරෝගිබව ඇතිවන්නේයයි කීමද, ඇඟිලල ඇල්ලීමය, ගිණීමය, පුඩුගණනය, කාව්‍ය කිරීමය, විතණ්ඩ ශාස්ත්‍ර ඉගෙණීම යයි මෙසේ තිරශ්චීන විද්‍යාවන් කරණකොට මිථ්‍යා ජීවිකාව කෙරෙත්. මෙසේවූ තිරශ්චින විද්‍යා හෙතුවෙන් වන මිථ්‍යා ජිවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඔහුගේ සීලය පිණිස වේ.

28. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති — සෙය්‍යථීදං[2]: ආවාහනං[3] විවාහනං[3] සංවදනං[4] විවදනං සංකිරණං විකිරණං සුභගකරණං[5] දුබ්භගකරණං[6] විරුද්ධගබ්භකරණං ජිව්හානිබන්ධනං[7] හනුසංහනනං හත්ථාභිජප්පනං[8] කණ්ණජප්පනං ආදාසපඤ්හං කුමාරිපඤ්හං[9] දෙවපඤ්හං ආදිච්චුපට්ඨානං මහතුපට්ඨානං අබ්භුජ්ජලනං සිරිව්හායනං[10] —ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

29. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති — සෙය්‍යථීදං:[2] සන්තිකම්මං පණිධිකම්මං භූතකම්මං[11] භූරිකම්මං වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකිරණං[12] ආචමනං නහාපනං[13] ජුහනං[14] වමනං විරෙචනං උද්ධවිරෙචනං[15] අධොවිරෙචනං සීසවිරෙචනං කණ්ණතෙලං නෙත්තතප්පණං[16] නත්ථුකම්මං අඤ්ජනං පච්චඤ්ජනං[17] සාලාකියං සල්ලකත්තියං[18] දාරකතිකිච්ඡා[19] මූලභෙසජ්ජානං අනුප්පදානං[20] ඔසධීනං පටිමොක්ඛො[21] — ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ජීවිතං B. V.
2. සෙය්‍යථිද° B.V.
3. °හණං C.
4. °රණං B.V.; °රනං S.
5. සුභාගක° B.
6. දුබ්භාග°B.
7. °නිබන්ධනං B. V. S.
8. හත්ථා° හනුජප්පනං කණ්ණ° B. V.
9. කුමාරික° V. C.
10. සිරව්හායනං P. W.
11. භූරි°(භූතිකම්මං) P.
12. වත්ථුබලිකම්මං V., °වත්ථුපරිකම්මං B. °පවිකිරණං P.
13. න්හාපනං B. V.
14. ජූහනං Sa. ජුහණං C.
15. උද්ධංවි° B. V.
16. නෙත්තපානං B; නෙත්තප්පානං S.; නෙත්තතප්පනං Sa. C.
17. සච්ච° V.
18. °තිකං P. V. W.
19. °තිකිච්ජං S.
20. අනුප්පදනං B. S.
21. පති°B.V.

28. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා, ආවාහ කරවීමය, විවාහ කරවීමය, සමගිය පිළිබඳ කථා කිරීමය, වියොගය පිළිබඳ කථා කිරීමය, ධන රැස්කිරීමය, වියදම් කිරීමය, සුභග කරණය (යහපත් ශ්‍රී කිරීමය), දුර්භගකරණය, ගර්භවිශෝධි කරණය, දිව තද කිරීමය, හනු බැඳීමය, අත් පෙරළීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, ශබ්ද නොඇසීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, කැඩපතෙහි දෙවතාරොපණය කොට පැණ පිළිවිසීමය, කුමරියගේ සිරුරෙහි දෙවතාරොපණය කොට පැණ පිළිවිසීමය, දෙවදාසියගේ සිරුරෙහි යකුන් ආරොපණය කොට පැණ පිළිවිසීමය, හිරු වැඳීමය, මහබඹුට උවටැන් හෝ නැමදුම් කිරීමය, මුවින් ගිනි දැල් පිට කිරීමය, ශ්‍රී දෙවිය කැඳවීම යයි කියන මෙබඳු තිරශ්චීන විද්‍යාවෙන් මිථ්‍යාජීවිකාව කෙරෙත්. මෙබඳුවූ තිරශ්චීන විද්‍යාවෙන් කරණ මිථ්‍යාජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඔහුගේ සීලය පිණිස වේ.

29. එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා ශාන්ති ප්‍රතිඥත කර්මය,[1] කාර්‍ය්‍ය සමෘද්ධියෙන් පසු කළයුතු ප්‍රණිධිකර්මය, මන්ත්‍ර ප්‍රයොග කිරීමය, භූරිකර්මය, පණ්ඩකයා පුරුෂයකු කිරීමය, පුරුෂයා පණ්ඩකයකු කිරීමය, ගෙවල් නොකළ බිම ගෙවල් කිරීමය, ගෙට සුදුසු තැන බලිකර්ම විධානය, දියෙන් මුව සුද්ධ කිරීමය, නැහැවීමය, ගිනි පිදීමය, වමන කරවීමය, විරෙක කරවීමය, ඌර්ධ්ව විරෙකය, අධොවිරෙකය, සිරොවිරෙකය, කන් තෙලය, නෙත්‍රතර්පණය, නස්‍ය කිරීමය, ක්‍ෂාරවූ අඳුන් තැනීමය, සිසිල් බෙහෙත් අඳුන් සෑදීමය, සැත් කටුලා කටයුතු වෛද්‍යකර්මය, ශල්‍යකර්මය, ළදරුවන් පිළිබඳ වෛද්‍යකර්මය, මූලික බෙහෙත් දීමය (බෙහෙත් ද්‍රව්‍යයෙන් කටයුතු ශරීර චිකිත්සාය), සැර බෙහෙත් දී පසුව එහි බල හැරීමය යන මෙබඳු තිරශ්චීන විද්‍යා කරණකොට හෝ මිථ්‍යාජිවයෙන් ජීවිකාව කෙරෙත්. මෙබඳුවූ මිථ්‍යාජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඔහුගේ සීලය පිණිස වේ.

---

1. මේ ආදියෙහි විස්තර දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ බ්‍රහ්මජාල සූත්‍රයෙන් බලා දත යුතුයි.

30. අයං[1] ඛො සො මාණව භික්ඛු එවංසීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සෙය්‍යථාපි මාණව ඛත්තියො මුද්ධාභිසිත්තො[2] නිහතපච්චාමිත්තො, න කුතොචි භයං සමනුපස්සති යදිදං පච්චත්ථිකතො එවමෙව ඛො මාණව භික්ඛු එවංසීලසම්පන්නො න කුතොචි භයං සමනු-පස්සති යදිදං සීලසංවරතො. සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති. එවං ඛො මාණව භික්ඛු සීලසම්පන්නො හොති.

31. අයං ඛො සො මාණව අරියො සීලක්ඛන්ධො යස්ස සො භගවා වණ්ණවාදී අහොසි යත්ථ[3] ච ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිට්ඨාපෙසි. අත්ථි චෙවෙත්ථ උත්තරිං කරණීයන්ති.

අච්ඡරියං භො ආනන්ද අබ්භූතං භො ආනන්ද. සො චායං[4] භො ආනන්ද අරියො සීලක්ඛන්ධො පරිපුණ්ණො නො අපරිපුණ්ණො. එවං පරිපුණ්ණඤ්චාහං[5] භො ආනන්ද අරියං සීලක්ඛන්ධං ඉතො බහිද්ධා අඤ්ඤෙසු සමණබ්‍රාහ්මණෙසු න සමනුපස්සාමි. එවං පරිපුණ්ණඤ්ච භො ආනන්ද අරියං සීලක්ඛන්ධං ඉතො බහිද්ධා අඤ්ඤෙ සමණබ්‍රාහ්මණා අත්තනි සමනුපස්සෙය්‍යුං තෙ තාවතකෙනෙව අත්තමනා අස්සු: අලමෙත්තාවතා කතමෙත්තාවතා අනුප්පත්තො නො සාමඤ්ඤත්ථො නත්ථි නො කිඤ්චි උත්තරිං කරණීයන්ති.

අථ ච පන භවං ආනන්දො එවමාහ: අත්ථි චෙවෙත්ථ උත්තරිං කරණීයන්ති.

පඨමභාණවාරං.[6]

1. ස ඛො P. S. W.
2. මුද්ධාව° P. C.
3. එත්ථ P. W.
4. සොපායං W.
5. °පුණ්ණඤ්ච භො W. °පුණ්ණංවාහං P.
6. ඉදං න දිස්සති B. S. සුභසුත්තම්හි පඨමක-භාණවාරං P.

30. මාණවකය, මෙසේ සීලසම්පන්නවූ මහණහට (අසංවරය මුල්කොට උපදනාවූ) භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ඔහුගේ සීලසංවරය හෙතුකොටගෙණ කිසිතැනකදී නොඋපදනේය. කුමක් මෙන්ද යත්:— මාණවකය, ක්‍ෂත්‍රියාභිෂෙකයෙන් මුදුනෙහි අභිෂෙක ලද්දාවූ, නැසූ පසමිතුරන් ඇති, ක්‍ෂත්‍රිය රජෙක් කිසියම් සතුරෙකුගෙන් භයක් නොදක්නේද, එපරිද්දෙන්ම මාණවකය, සීලසම්පන්නවූ මහණතෙමේ (අසංවර හෙතුවෙන් උපදනාවූ) භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු සීලසංවරය හෙතුකොට කිසි තැනකදී නොදක්නේය (ඔහුට කිසිවකින් බියක් නැත). ආර්‍යවූ (ශ්‍රෙෂ්ඨවූ) මේ සීල රාශියෙන් යුක්තවූ ඒ මහණ තෙමේ, ස්වසන්තානයෙහි පිරිසිදුවූ (කායික චෛතසික) සැපය විඳියි. මාණවකය, මෙසේ දක්වූ (ත්‍රිවිධ) ශීලයෙන් යුක්තවූ මහණ තෙමේ සීලසම්පන්න නම් වේ.

31. මාණවකය, ඒ භාග්‍යවතුන් වහන්සේ යම් ශීල සමුදායයක ගුණ වදාරණ සුළුවූසේක් ද, මෙණෙවිය, යම් ශීල ස්කන්ධයෙක්හි මේ ජනසමූහයා සමාදන් කරවා ලූ සේක්ද, නිවේසනය කරවා ලූ සේක් ද, පිහිටුවා ලූ සේක් ද, මේ ඒ ආර්‍ය්‍ය ශීලස්කන්ධයයි. වැලි, මීට වඩා කළයුතු දේද ඇත්මැයි.

පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, ආශ්චර්‍ය්‍යයෙකි, පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, අද්භූතයෙකි, පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, ඒ මේ ආර්‍ය්‍යවූ ශීලස්කන්ධය තෙමේද සම්පූර්ණමය. අසම්පූර්ණ වූයේ නොවෙයි. පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, මෙසේ හාත්පසින් සම්පූර්ණ වූ ආර්‍ය්‍ය වූ ශීලස්කන්ධයක් මේ බුදුසස්නෙන් පිටත අන්‍ය වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් අතුරෙහි මම නොදකිමි. පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, මෙසේ සම්පූර්ණ වූ ආර්‍ය්‍ය වූ ශීලස්කන්ධයක් මේ බුදුසස්නෙන් බාහිර වූ අන්‍ය ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක්, තමා කෙරෙහි (පිහිටි බව) දක්නාහු නම් ඔව්හු, 'මෙපමණකින් ම සෑහෙයි, මෙපමණකින් ම කටයුතු (නිම) කරණ ලදී, අපගේ ශ්‍රමණභාවයෙහි අර්ථසිද්ධිය (මුදුන්) පැමිණියේය, අප විසින් මත්තෙහි කටයුතුවූ කිසිවකුත් නැතැ'යි එපමණකින්ම සතුටු සිත් ඇතිවන්නාහුය.

එහෙත්, පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ 'මෙහි මත්තෙහි ද (මීටත් වඩා) කළයුතු වූ අනිකෙක් ඇත්මැයි' කියන සේක.

පළමුවැනි බණවරයි.

32. කතමො පන සො භො ආනන්ද අරියො සමාධික්ඛන්ධො යස්ස සො භවං ගොතමො වණ්ණවාදී අහොසි යත්ථ ච ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිට්ඨාපෙසීති?

කථඤ්ච[1] **මාණව භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති?** ඉධ මාණව භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී[2]. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං[3] තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා—පෙ— ඝානෙන ගන්ධං ඝායිත්වා—පෙ—ජිව්හාය රසං සායිත්වා—පෙ— කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා—පෙ—මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී[2]. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං[3] තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති මනින්ද්‍රියං මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං[4] පටිසංවෙදෙති. එවං ඛො මාණව භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති.

1. කථංච පන S.
2. නානුව° P. W.
3. අන්වාස්ස° P. W.
4. අව්‍යා° P. W.

32. පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, ඒ පින්වත් ගෞතමයාණන් වහන්සේ යමෙකගේ ගුණ කියන සුලු වූ සේක් ද, යමක් කෙරෙහි මේ ජනසමූහයා සමාදන් කරවා ලූ සේක් ද, වාසය කරවා ලූ සේක් ද, පිහිටුවා ලූ සේක් ද, ඒ ආර්‍ය්‍ය සමාධිස්කන්ධය කවරේ ද?

මාණවකය, භික්ෂුතෙම කෙසේ නම් ඉන්ද්‍රියයන් කෙරෙහි වැසූ දොර ඇතිවේ ද? මාණවකය, මේ සස්නෙහි (මනාසේ පිළිපන්) මහණ තෙමේ, ඇසින් රූපයක් දැක නිමිත්තග්‍රාහී නොවේ (එහි නොඇලේ). අනුබ්‍යඤ්ජන වශයෙන් නො ගන්නේ එහි විස්තර සෙවීමට නොපෙළඹේ. චක්ඛුන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට යමක් හේතුකොටගෙණ අභිජ්ඣාදෞමනස්සාදි (දූෂි ආසාව හා කලකිරීමාදි) ලාමක වූ අකුශල ධර්‍මයෝ වහනය වන්නාහු ද (සවසන්තානයට ඇතුල් වන්නාහු ද), එබඳු දෙයින් වැලකීම පිණිස හෙතෙම පිළිපදී. හෙතෙම තමාගේ චක්ඛුන්ද්‍රිය රකී, චක්ඛුන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කනින් ශබ්දයක් අසා— [ඇස පිළිබඳ කී නයින් දත යුතුයි]—නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණයකොට —පෙ— දිවෙන් රසයක් විඳ —පෙ— කයින් ස්පර්ශකටයුත්තක් ස්පර්ශකොට —පෙ— සිතින් ධර්‍මයක් (කරුණක්) දැන එහි නිමිති නොගන්නේය (එහි නොඇලෙන්නේය), අනුබ්‍යඤ්ජන වශයෙන් නොගන්නේය (එහි නොපෙලඹෙන්නේය). මනෙන්ද්‍රියයෙහි (සිතෙහි) අසංවරව වසන්නහුට යමක් නිසා අභිජ්ඣා දෞමනස්සාදි ලාමක අකුශල ධර්‍මයෝ වහනය වෙත් ද (සවකීය සන්තානයට වදිත් ද), එබඳු දෙයින් වැලකීම පිණිස හෙතෙම පිළිපදී. හෙතෙම මනෙන්ද්‍රිය රකී, මනෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. එබඳුවූ මහණ තෙමේ ආර්‍ය්‍ය වූ (උතුම් වූ) ශීල රාශියෙන් යුක්ත වූයේ, අභ්‍යන්තරයෙහි පිරිසිදුවූ (අසම්මිශ්‍රවූ) අධිචිත්ත සුඛය විඳියි. මාණවකය, මෙසේ වූ මහණ තෙමේ ඉන්ද්‍රියයන්හි වසන ලද දොරටු ඇත්තේ වේ.

33. කථඤ්ච මාණව භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති?

ඉධ මාණව භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති සම්මිඤ්ජිතෙ[1] පසාරිතෙ සම්පජානකාරී හොති සඞ්ඝාටිපත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති අසිතෙ පීතෙ[2] ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති. එවං ඛො මාණව භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති.

34. කථඤ්ච මාණව භික්ඛු සන්තුට්ඨො හොති?

ඉධ මාණව භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන[3] චීවරෙන කුච්ඡිපරිහාරිකෙන[3] පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. සෙය්‍යථාපි මාණව පක්ඛී සකුණො යෙන යෙනෙව ඩෙති සපත්තභාරොව ඩෙති එවමෙව ඛො[4] මාණව භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන[3] චීවරෙන කුච්ඡිපරිහාරිකෙන[3] පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. එවං ඛො මාණව භික්ඛු සන්තුට්ඨො හොති.

---

1. සමිඤ්ජිතෙ B. V.
2. පිතෙ B.
3. °පරිහාරියෙන V.
4. ඛො ඉති න දිස්සති P.

33. මාණවකය, මහණ තෙමේ කෙසේ නම් සතිසම්පජඤ්ඤයෙන් (සිහියෙන් හා මනා ප්‍රඥාවෙන්) යුක්ත වූයේ වේද?

මාණවකය, මේ සස්නෙහි (මනාව පිළිපන්) මහණ තෙම ඉදිරියට යෑමෙහි ද, ආපසු යෑමෙහි ද, යහපත් වූ නුවණින් දැන ඒ ක්‍රියා කරන්නේය. ඉදිරි බැලීමෙහි ද, අනුදික් (වටපිට) බැලීමෙහි ද, නුවණින් දැන බලන්නේය. අත් පා හැකිලීමෙහි ද දිගු කිරීමෙහි ද මනා නුවණින් දැන එසේ කරන්නේය. සඟලය, පාත්‍රය, සිවුරුය යන මේ දේ දැරීමෙහිදී මනා නුවණින් දැන ඒ ඒ දැරීම් ආදිය කරන්නේය. අනුභව කිරීමය, පානය කිරීමය, කෑමය, රස විඳීමය යන මෙහි ද මනා නුවණින් යෙදී (දැන) ඒ ඒ අනුභව කිරීමාදිය කරන්නේය. මල මූත්‍ර පහකිරීම් ද නුවණින් (ආදීනව) සලකා කරන්නේය. යෑම්, සිටීම්, හිඳීම්, සැතපීම්, නිදි තොරකිරීම්, කථාකිරීම්, නිශ්ශබ්ද ව සිටීම් යන මේ දේ මනා නුවණින් දැන කරන්නේය. මාණවකය, මෙසේ කරන්නාවූ මහණ තෙමේ සිහියෙන් යුක්තවූයේ යහපත් නුවණින් යුක්ත වූයේ වෙයි. (මෙහි සියලු ඉරියව් පිළිබඳව ආදීනව හා ආනිසංසයන් ද, ශරීරය පිළිබඳ අනිත්‍යතාදි සවභාවයන්ද නුවණින් සලකා ඒ ඒ කෘත්‍යයන්හි යෙදේ යි සේයි.)

34. මාණවකය, මහණතෙමේ කෙසේ නම් (ප්‍රත්‍යයන් පිළිබඳ යථාලාභසන්තොෂයෙන්) සතුටු වූයේ වේද?

මාණවකය, මේ සස්නෙහි (මනාව පිළිපන්) මහණතෙමේ කායපරිහරණයට ප්‍රමාණවූ (යත්තම් කය වැසීමට තරම්වූ) සිවුරෙන් ද කුසපරිහරණයට ප්‍රමාණවූ පිණ්ඩපාත භොජනයෙන් ද සතුටු වූ සිත් ඇත්තේ වේ. ඒ මහණතෙමේ යම් යම් තැනකට යේ නම් අටපිරිකර (කය පිළිබඳ වූ දේ) පමණක් රැගෙණ යේ. මාණවකය, යම් සේ පියාපත් ඇති පක්ෂියෙක් යම් යම් තැනෙක පියාඹා යේ නම් ඒ සියලු තැන පියාපත් බර පමණකින් යුක්තව පියාඹා යේද, මෙණවිය, එපරිද්දෙන්ම භික්ෂු තෙමේ ද කාය පරිහරණයට ප්‍රමාණවූ සිවුරෙන් ද කුච්ඡි. පරිහරණයට ප්‍රමාණවූ පිණ්ඩපාත භොජනයෙන් ද සතුටු වන්නේ වේ. ඒ මහණ තෙමේ යම් යම් තැනක යේ නම් කායපටිබද්ධවූ අටපිරිකර පමණක් රැගෙණ බැහැර යේ. මාණවකය, මෙසේ වූ මහණ තෙමේ (යම්තම් ලත් දෙයින්) ඉතරීතරසන්තොෂයෙන් යුක්තවේ.

35. සො ඉමිනා ච[1] අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං[2] වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

36. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. බ්‍යාපාදපදොසං[3] පහාය අබ්‍යාපන්නචිත්තො[4] විහරති සබ්බපාණභූතහිතානුකම්පී බ්‍යාපාදපදොසා[3] චිත්තං පරිසොධෙති. ථිනමිද්ධං[5] පහාය විගතථිනමිද්ධො[5] විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො ථිනමිද්ධා[5] චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

37. සෙය්‍යථාපි මාණව පුරිසො ඉණං[6] ආදාය කම්මන්තෙ පයොජෙය්‍ය තස්ස තෙ කම්මන්තා සමිජ්ඣෙය්‍යුං. සො යානි ච පොරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තීකරෙය්‍ය[7]. සියා චස්ස[8] උත්තරිං අවසිට්ඨං දාරභරණාය[9]. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ ඉණං[6] ආදාය කම්මන්තෙ පයොජෙසිං[10]. තස්ස මෙ තෙ කම්මන්තා සමිජ්ඣිංසු. සොහං යානි ච පොරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තිඅකාසිං.[11] අත්ථි ච මෙ උත්තරිං අවසිට්ඨං දාරභරණායාති[9]. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං[12] අධිගච්ඡෙය්‍ය[13] සොමනස්සං.

---

1. චකාරො නත්ථි W.
2. සුසාණං C.
3. ව්‍යා° P. W.
4. අව්‍යා° P. W.
5. ථින° B.
6. ඉනං C.
7. ව්‍යත්ති° P.C. °ව්‍යත්ති° W. බ්‍යත්තිං° B
8. තස්ස Sa.
9. දාර° P. W.
10. පයොජෙමි B.
11. ව්‍යත්තිං අ° B. ව්‍යත්ති° P. W.
12. පාමුජ්ජං P. W. C.
13. අධිගච්ඡෙ C. P.

35. ආයුෂ්මවූ හෙවත් උතුම්වූ මේ සීලසමූහයෙන් යුක්තවූ ද, උතුම්වූ මේ ඉන්ද්‍රියසංවරයෙන් යුක්තවූ ද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවූ ද, මේ උතුම් ඉතරීතර-සන්තොෂයෙන් යුක්තවූ ද, ඒ (යොගාවචර) මහණ තෙමේ (මනුෂ්‍ය වාසයෙන් දුනු පන්සියයකින් ඔබ්බෙහිවූ) අරණ්‍යය ද, (ජනයාගෙන් තොරවූ) වෘක්ෂමූලය ද, පර්වත පෙදෙස් ද, කඳුරැලි ගිරිගුහාවන් හෝ මහා උමගද, සොහොන් ද, ඉතා දුරවූ වනසෙනසුන් ද, අභ්‍යාවකාශ (බොහෝ ඉඩකඩ ඇති) තැන් සහ පිදුරු ගුහා ද යන මේ (ජනයාගෙන් හිස්වූ) සෙනසුන් ඇසුරු කෙරෙයි. ඒ මහණ තෙමේ පසුබත්කාලයෙහි පිණ්ඩපාත භොජනයෙන් වැළැක්කේ, පර්‍යඞ්කය බැඳ, උඩුකය ඇද නොවන සේ තබා, නිවණෙහිම සිත එලවා, ඒ නිවණම අරමුණු වසයෙන් සිත ඉදිරියෙහි පිහිටුවා ගෙණ සිඳී.

36. ඒ මහණ තෙමේ ලොකයෙහි (පඤ්චුපාදානසකන්ධයන්හි) අභිධ්‍යාව (ලොභය) පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේ. ඒ අභිධ්‍යාවෙන් සිත (වෙන්කොට) පිරිසිදු කෙරේ. සිත කෙලසන්නාවූ ක්‍රොධය පහකොට, ක්‍රොධයෙන් දූෂිතවූ සිත් නැත්තේ, ප්‍රාණීවූ සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේව වෙසේ. ව්‍යාපාද දූෂණයෙන් සිත (වෙන් කොට) පිරිසිදු කෙරේ. කායචිත්ත දෙදෙනාගේ අලසබව යයි කියන ලද ථිනමිද්ධය දුරුකොට කය—සිත පිළිබඳ පහ වූ අලසබැව් ඇත්තේ, ආලොකසංඥ (පිරිසිදු හැඟීම්) ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥ ඇත්තෙක්ව වෙසේ. ථිනමිද්ධනීවරණයෙන් සිත පිරිසිදු කෙරේ. උඩඟු බව හා කුකුස (උද්ධච්චකුක්කුච්චය) දුරුකොට, සංසිඳුනු සිත් ඇතිව (අනුද්ධතව) වාසය කෙරේ. අධ්‍යාත්මයෙහි (ඇතුළත) සංසිඳුනු සිත් ඇත්තේ, උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසිදු කෙරේ. (බුද්ධාදි අටතැන්හි සැකකිරීම ලකුණුකොට ඇති) විචිකිච්ඡාව දුරුකොට, එතර කල (පහකල) විචිකිච්ඡා ඇත්තේ කුශලධම් විෂයෙහි 'ඒ කෙසේ ද මේ කෙබඳුද'යි යන සැක නැතිව වෙසේ, විචිකිච්ඡායෙන් සිත පිරිසිදු කෙරේ.

37. මාණවකය, යම්සේ පුරුෂයෙක් ණය ගෙණ කර්මාන්තයන්හි යොදන්නේ ද, ඔහුගේ ඒ කර්මාන්තයෝ දියුණු වන්නාහු නම් ඔහුගේ ඒ පරණ ණය මුදල් සියල්ලම ගෙවන්නේය. ඔහුගේ අඹුදරුවන් පොස්නා පිණිස වැඩි යමක් ඉතුරු වූයේ නම් ඔහට මෙබඳු අදහසක් වන්නේය. [කෙසේද යත්:] 'මම වනාහි පළමුවෙන් ණය ගෙණ කර්මාන්තයන්හි යෙදුවෙමි. ඒ මාගේ කර්මාන්තයෝ සමෘද්ධවූහ. ඒ මම පැරණි ණය ගෙවූයෙමි. අඹුදරුවන් පොෂ්‍යකිරීම පිණිස අතිරේක මුදලක් ද මට ඇත්තේය' කියායි. හෙතෙම ඒ ණය නැති බව මුල්කොට ගෙණ බලවත් සතුටක් ලබන්නේය, සොම්නසට ද පැමිණෙන්නේය.

38. සෙය්‍යථාපි මාණව පුරිසො ආබාධිකො අස්ස දුක්ඛිතො බාළ්හගිලානො භත්තං චස්ස නච්ඡාදෙය්‍ය[1] න චස්ස කායෙ බලමත්තා. සො අපරෙන සමයෙන තම්හා ආබාධා මුච්චෙය්‍ය භත්තඤ්චස්ස ඡාදෙය්‍ය සියා චස්ස කායෙ බලමත්තා. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ ආබාධිකො අහොසිං දුක්ඛිතො බාළ්හගිලානො භත්තං ච මෙ නච්ඡාදෙසි න චස්ස[2] මෙ ආසි කායෙ බලමත්තා. සොම්හි එතරහි තම්හා ආබාධා මුත්තො භත්තඤ්ච මෙ ඡාදෙති අත්ථි ච මෙ[3] කායෙ බලමත්තාති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය[4] සොමනස්සං.

39. සෙය්‍යථාපි මාණව පුරිසො බන්ධනාගාරෙ බද්ධො අස්ස. සො අපරෙන සමයෙන තම්හා බන්ධනාගාරා[5] මුච්චෙය්‍ය සොත්ථිනා අබ්බයෙන[6]. න චස්ස කිඤ්චි භොගානං වයො. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ බන්ධනාගාරෙ බද්ධො අහොසිං. සොම්හි එතරහි තම්හා බන්ධනාගාරා[5] මුත්තො සොත්ථිනා අබ්බයෙන[6]. නත්ථි ච මෙ කිඤ්චි භොගානං වයොති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය[4] සොමනස්සං.

40. සෙය්‍යථාපි මාණව පුරිසො දාසො අස්ස අනත්තාධීනො[7] පරාධීනො[7] න යෙනකාමඞ්ගමො. සො අපරෙන සමයෙන තම්හා දාසබ්‍යා[8] මුච්චෙය්‍ය අත්තාධීනො[7] අපරාධීනො[7] භුජිස්සො යෙනකාමඞ්ගමො. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ දාසො අහොසිං අනත්තාධීනො[7] පරාධීනො[7] න යෙනකාමඞ්ගමො. සොම්හි එතරහි තම්හා දාසබ්‍යා[8] මුත්තො අත්තාධීනො[7] අපරාධීනො[7] භුජිස්සො යෙනකාමඞ්ගමොති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය[4] සොමනස්සං.

---

1. න ඡාදෙය්‍ය S.
2. න ච මෙ P. W.
3. අත්ථි ච කායෙ P.
4. පාමුජ්ජං අධිගච්ඡෙය්‍ය P. W. C.
5. බන්ධාගාරා B. බන්ධනා P. S. W.
6. අව්‍යයෙන P. W.
7. °ධිනො B.
8. දාසව්‍යා P. W. C.

38. මාණවකය, යම්සේ වනාහි මහත් රෝගයෙන් පෙළෙන (ආබාධ ඇත්තාවූ), දුක් ඇත්තාවූ, දූඩි ගිලන්බව ඇති පුරුෂයෙක් වන්නේ ද, ඔහට බත් (ආහාර) රුචි නොවන්නේ ද, ඔහුගේ ශරීරයෙහි කිසි ශක්තියක් නැත්තේ ද වෙයි. ඒ පුරුෂ තෙම පසු කාලයක ඒ ආබාධයෙන් මිදෙන්නේ නම්, ඔහුට ආහාර රුචිය ඇති වන්නේ නම්, ඔහුගේ ශරීරබලය ඇති වන්නේ නම්, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. (කෙබඳු ද යත්:) 'මම වනාහි පෙර ආබාධ ඇත්තාවූ, දුක් ඇති, දූඩි ගිලන් බැව් ඇති කෙනෙක් වීමි. මට බත් රුචිය ද නොවීය. ශරීර-බලය ද නැතිවිය. ඒ මම පළමු තිබූ ආබාධයෙන් මිදුනෙමි. මට ආහාරරුචිය ද ඇත්තේය. කාය බලය ද තිබේය' කියායි. හෙතෙම ඒ කාරණය මුල්කොට බලවත් සතුටක් ලබන්නේය. සොම්නසට ද පැමිණෙන්නේය.

39. මාණවකය, යම්සේ පුරුෂයෙක් සිරගෙහි බැඳුනේ වේද, හෙතෙම පසු කලෙක වියදම් නැතිව (පීඩා රහිතව) සැපසේ ඒ සිරගෙයින් මිදෙන්නේය. ඔහුගේ භොගයන් පිළිබඳ කිසිත් වියදමක් ද නොවන්නේය. ඔහුට මෙබඳු අදහසක් වන්නේය (එනම්:) 'මම වූකලී පෙර සිරගෙහි බැඳුනෙක් වූයෙමි, ඒ මම දූන් වියදම් නැතිව (පීඩා රහිතව) සැපසේ ඒ සිරගෙයින් මිදුනෙමි. මගේ භොගයන් පිළිබඳ කිසි වියදමක් ද නොවූයේය' කියායි. ඒ පුරුෂ තෙම සිරගෙයින් මිදීම නිමිති කොට බලවත් සතුටක් ලබන්නේය, සොම්නසට ද පැමිණෙන්නේය.

40. මාණවකය, යම්සේ සිය කැමැත්තෙන් යමක් කරන්ට නොහැකි (අධිපති භාවයක් නැත්තාවූ), අනුන්ගේ කැමැති පරිදි පවත්නාවූ (අනුන්ට යටහත්වූ), තමා කැමැති ගමනක් ඒ වූ පරිදි යා නොහැකි, මැඩකරුවෙක් වන්නේ ද, හෙතෙම පසු කලෙක ඒ දාසභාවයෙන් මිදෙන්නේ, තමාම අධිපතිකොට ඇත්තේ, පරාධීන නො වූයේ, අනුන්ට යටත් නොව තමා-ගෙන්ම යැපෙන්නේ, සිය අදහස් පරිදි ඒ ඒ තැන යා හැකි වන්නේ ද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. (එනම්:) 'මම වනාහි පෙර සියකැමැති පරිදි යමක් කරන්ට නොහැකි, අනුන්ට යටත් පැවතුම් ඇති, මා අදහස් පරිදි කිසි තැනෙක යා නොහැකි දාසයෙක් වීමි. ඒ මම දූන් ඒ දාසභාවයෙන් මිදුනෙක්මි. ආත්මාධීන වූයෙමි, පරාධීන නොවූයෙමි, මෙරමා-හට යටත් නොව මා සපයාගත් දෙයින්ම යැපෙන්නෙමි, මා අදහස් පරිදි ඒ ඒ කැමැති තැනෙක යා හැක්කෙක් ද වෙමි'යි කියායි. හෙතෙම ඒ දාසභාවයෙන් මිදීම හෙතුකොට බලවත් සතුටක් ලබන්නේය, එසේ සොම්නසට ද පැමිණෙන්නේය.

41. සෙය්‍යථාපි මාණව පුරිසො සධනො සභොගො කන්තාරද්ධානමග්ගං[1]. පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං. සො අපරෙන සමයෙන තං කන්තාරං නිත්ථරෙය්‍ය සොත්ථිනා ගාමන්තං අනුපාපුණෙය්‍ය ඛෙමං අප්පටිභයං. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ සධනො සභොගො කන්තාරද්ධානමග්ගං[1] පටිපජ්ජිං දුබ්භික්ඛං සප්පටිභයං. සොම්හි එතරහි තං කන්තාරං නිත්තිණ්ණො[2] සොත්ථිනා ගාමන්තං අනුප්පත්තො ඛෙමං අප්පටිභයන්ති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං[3] අධිගච්ඡෙය්‍ය[4] සොමනස්සං.

42. එවමෙව ඛො මාණව භික්ඛු යථා ඉණං යථා රොගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං එවං[5] ඉමෙ පඤ්චනීවරණෙ අප්පහීනෙ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි මාණව යථා[6] ආනණ්‍යං යථා ආරොග්‍යං යථා බන්ධනාමොක්ඛං යථා භුජිස්සං යථා ඛෙමන්තභූමිං එවමෙව ඛො මාණව භික්ඛු ඉමෙ පඤ්ච නීවරණෙ පහීනෙ අත්තනි සමනුපස්සති.

43. තස්සිමෙ පඤ්ච නීවරණෙ පහීනෙ අත්තනි සමනුපස්සතො පාමොජ්ජං[3] ජායති පමුදිතස්ස පීති ජායති පීතිමනස්ස කායො පස්සම්භති පස්සද්ධකායො සුඛං වෙදෙති[7] සුඛිනො චිත්තං සමාධියති.

---

1. කන්තාරං අද්ධාන° B. S. Pa.
2. නිත්ථිණ්ණො P.W. නිච්ඡින්නො Pa.
3. පාමුජ්ජං P. W. C.
4. අධිගච්ඡෙ P. C.
5. එවං ති න දිස්සති P. W. S.
6. යථා ති නත්ථි B. (සබ්බත්ථ)
7. පටිසංවෙදෙති S.

41. මාණවකය, යම්සේ ධනවත්වූ, භොගසම්පත් ඇති පුරුෂයෙක් ආහාර දුලීභවූ, භය සහිතවූ, නිරුදකවූ දීඝීමාගීයකට (දුරුකතර මගකට) පැමිණෙන්නේ ද, හෙතෙම මඳ කලකින් ඒ කාන්තාරමාගීය ඉක්මවා යන්නේ, සැපවත්වූ, (සොර සතුරන් ගෙන්) ප්‍රතිභය රහිත වූ ගම්මානයකට ක්‍රමයෙන් පැමිණෙන්නේ ද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: 'මම වනාහි පෙර ධනවත් වූයෙම්, භොගසම්පත් සහිත වූයෙම්, දුලීභ භික්‍ෂා ඇති, භය සහිතවූ, දීඝීවූ කාන්තාරමාගීයකට පිළිපන්නෙක් වූයෙමි. එසේ වූ මම දැන් එම කාන්තාරමාගීය තරණය කෙළෙමි. සැපවත්වූ, ප්‍රතිභය රහිතවූ ගමකට සැපසේ ක්‍රමයෙන් පැමිණියෙමි'යි කියායි. ඒ පුරුෂ තෙමේ ඒ කතරමග එතර කිරීම නිමිතිකොට බලවත් සතුටක් ලබන්නේය, එසේම සොම්නසට ද පැමිණෙන්නේය.

42. මාණවකය, ණය යම්සේ ද, රෝගය යම්සේ ද, බන්ධනාගාරය යම්සේ ද, දාසභාවය යම්සේ ද, දුරුකතරමග යම්සේ ද, එපරිද්දෙන් මහණ තෙමේ ප්‍රහීණ නොවූ (පහ නොකළ) පඤ්චනීවරණයන් තමා කෙරෙහිලා නුවණින් දකී. මාණවකය, ණය නැති බව යම්සේ ද, නිරෝගි බව යම්සේ ද, සිරගෙන් මිදීම යම්සේ ද, මෙරමාහට යටත් නැති බව යම්සේ ද, අභය භූමිය යම්සේද, එපරිද්දෙන්ම මාණවකය, මහණ තෙමේ ප්‍රහීණවූ මේ පඤ්චනීවරණ ධම්යන් තමා විෂයෙහි ලා දක්නේය.

43. ප්‍රහීණවූ මේ පඤ්චනීවරණයන් තමා කෙරෙහි නැතැයි නුවණින් දක්නාවූ ඒ මහණහට සතුටු ආකාරය උපදී. සතුටු වූවහුට (සියල් සිරුර කලඹමින්) ප්‍රීතිය උපදී, ප්‍රීති සහගත සිත් ඇත්තහුගේ නාමකය (සන්තානය) සංසිඳෙයි, සංසිඳුනු කය ඇති (කය පිළිබඳ මැඩ ලූ දුහ ඇති) තැනැත්තේ කායික චෛතසික සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධියට (එකඟ බවට) එළඹෙයි.

44. සො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං[1] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො[2] කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං[3] හොති.

45. සෙය්‍යථාපි මාණව දක්ඛො න්හාපකො[4] වා න්හාපකන්තෙවාසී[4] වා කංසථාලෙ න්හානීයචුණ්ණානි[5] ආකිරිත්වා උදකෙන පරිප්ඵොසකං පරිප්ඵොසකං[6] සන්නෙය්‍ය[7] සායං[8] න්හානීයපිණ්ඩි[4] ස්නෙහානුගතා ස්නෙහපරෙතා සන්තරබාහිරප්ඵුටා[9] ස්නෙහෙන[10] න ච පග්ඝරණී.[11]

46. එවමෙව ඛො මාණව භික්ඛු ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො[2] කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං[3] හොති. යම්පි මාණව භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං[1] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං[3] හොති. ඉදම්පිස්ස හොති සමාධිස්මිං.

---

1. පඨමං ඣානං Pa.
2. සබ්බවතො V.
3. අප්පුටං, V.C. අප්පුතං, P. අප්ඵුටං B. V.
4. ස්නා° W. න්හා° P.
5. ස්නානිය° W. ත්හානීය° B. න්හානීය P.
6. සකිදෙව වුත්තං S.
7. සන්නෙය්‍ය P. W. C.
8. සාජ්ස P.
9. °ඵුටා B. V. °ඵුතා P.
10. සිනෙ° P. W.
11. පග්ඝරණී B.

44. ඒ මහණතෙමේ වස්තුකාම කෙලශකාමයන්ගෙන් වෙන් වූයේම, අකුශල ධර්මයන් කෙරෙන් ද වෙන් වූයේ ම, (අරමුණෙහි සිත පැමිණවීම නම්) විතර්ක සහිතවූ, (අරමුණ පිරිමැදීම්, එහි හැසිරීම් සංඛ්‍යාත) විචාර සහිතවූ, සිතෙහි විවෙකයෙන් (නීවරණයන් දුරුවීම් හේතුවෙන්) උපන් ප්‍රීතියම සැපකොට ඇති, පඨමජ්ඣාන කුසල චිත්තය තමාගේ සන්තාන-යෙහි ඉපදවීම් වසයෙන් ඊට පැමිණ එම ධ්‍යානයෙහි වාසය කෙරේ. ඒ මහණ තෙමේ විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ (සකල) ශරීරයම තෙමයි (සැපවත් කෙරෙයි සේයි), හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි (සැම තන්හි පතුරවයි). ඒ මහණහුගේ සම්පූර්ණ ශරීරයෙහි සවල්පවූ ස්ථානයක් වුව ද ප්‍රථමධ්‍යාන සැප-යෙන් (විවේකයෙන් උපන් ප්‍රීති සැපයෙන්) නොපහස්නා ලද්දේ නොවේ(සකල ශරීරයෙහිම පඨමජ්ඣාන සැපය පැතිරේයයි සේයි).

45. මාණවකය, යම්සේ වනාහි දක්‍ෂවූ ස්නාන ද්‍රව්‍ය සපයන්නෙක් හෝ ඔහුගේ අතවැස්සෙක් හෝ ස්නානයට ගන්නාවූ සුණු ලොහමය තලියෙක බහා දිය ඉසිමින් අතින් අනමින් (පිරිමදිමින්) පිඩුකරන්නේ ද, එවිට මේ ස්නාන චූර්ණපිණ්ඩය දියෙන් යුක්ත වේ, ජලය හාත්පසින් කාවැදුනේ වේ. එහි ඇතුළත හා පිටත ද සියලු තන්හිම ජලයෙන් පහස්නා ලද්දේ වේ. එහෙත් බිඳු වසයෙන් ජලය ඉන් නො වැගිරේ.

46. මාණවකය, එපරිද්දෙන් ඒ මහණ තෙමේ, විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ ශරීරය තෙමයි (පැතුරුණු සැප ඇත්තක් කරයි), හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි (සැමතන්හි පතුරුවයි). ඒ මහණහුගේ සියලු කොටස් ඇති ශරීරයෙහි සවල්පවූ තැනක් වත් විවෙකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් (ප්‍රථමධ්‍යානයෙන්) නොපහස්නා ලද්දේ නොවේ. මාණවකය, යම්සේ වනාහි මහණතෙමේ වස්තුකාම කෙලශකාමයන්ගෙන් වෙන් වූයේම, අකුශල ධර්මයන් කෙරෙන් ද වෙන් වූයේ ම, (අරමුණෙහි සිත පැණවීම නම්) විතර්ක සහිත වූ, (අරමුණ පිරිමැදීම්, එහි හැසිරීම් සංඛ්‍යාත) විචාර සහිත වූ, සිතෙහි විවේකයෙන් (නීවරණයන් දුරුවීම හේතුවෙන්) උපන් ප්‍රීතියම සැපකොට ඇති, පඨමජ්ඣාන කුශල චිත්තය තමාගේ සන්තානයෙහි ඉපදවීම් වශයෙන් ඊට පැමිණ එම ධ්‍යානයෙහි වාසය කෙරේ. ඒ මහණතෙමේ විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ (සකල) ශරීරයම තෙමයි (සැපවත් කෙරෙයි සේයි), හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි (සැම තන්හි පතුරවයි). ඒ මහණහුගේ සම්පූර්ණ ශරීරයෙහි සවල්පවූ ස්ථානයක් වුවද ප්‍රථමධ්‍යාන සැපයෙන් (විවේක යෙන් උපන් ප්‍රීති සැපයෙන්) නොපහස්නා ලද්දේ නොවේ. (සකල ශරීරයෙහිම පඨමජ්ඣාන සැපය පැතිරේ යයි සේයි). මෙද ඔහුගේ සමාධිය පිළිබඳ වේ.

47. පුනච පරං මාණව භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදීභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පිතිසුඛං දුතියජ්ඣානං[1] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං සමාධිජේන පිතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො[2] කායස්ස සමාධිජේන පිතිසුඛෙන අප්ඵුටං[3] හොති.

48. සෙය්‍යථාපි මාණව උදකරහදො ගම්භීරො[4] උබ්භිදොදකො[5] තස්ස නෙවස්ස පුරත්ථිමාය දිසාය උදකස්ස ආයමුඛං[6] න පච්ඡිමාය දිසාය උදකස්ස ආයමුඛං[6] න උත්තරාය දිසාය උදකස්ස ආයමුඛං[6] න දක්ඛිණාය දිසාය උදකස්ස ආයමුඛං[6] දෙවො[7] ච කාලෙන කාලං සම්මා ධාරං නානුපවෙච්ඡෙය්‍ය[8]. අථ ඛො තම්හා ච[9] උදකරහදා සීතා[10] වාරිධාරා උබ්භිජ්ජිත්වා තමෙව උදකරහදං සීතෙන වාරිනා අභිසන්දෙය්‍ය පරිසන්දෙය්‍ය පරිපූරෙය්‍ය පරිප්ඵරෙය්‍ය නාස්ස කිඤ්චි සබ්බාවතො[2] උදකරහදස්ස සීතෙන වාරිනා අප්ඵුටං[3] අස්ස.

49. එවමෙව ඛො මාණව භික්ඛු ඉමමෙව කායං සමාධිජේන පිතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො[2] කායස්ස සමාධිජේන පිතිසුඛෙන අප්ඵුටං[3] හොති. යම්පි මාණව භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදීභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පිතිසුඛං දුතියජ්ඣානං[1] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං සමාධිජේන පිතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො[2] කායස්ස සමාධිජේන පිතිසුඛෙන අප්ඵුටං[3] හොති. ඉදම්පිස්ස හොති සමාධිස්මිං.

---

1. දුතියං ඣානං P.
2. සබ්බවතො V.
3. අඵුටං W; අඵුතං B. අප්ඵුතං P.C.
4. ගම්භීරො ඉති න දිස්සති P.W.
5. උබ්භිතොදකො B. S. V.
6. උදකස්සාය° P. W.
7. දෙවො වා නං කා°S. දෙවො ච න කාලෙන කාලං B. V.
8. අනුපවෙච්ඡෙය්‍ය B. V. P. W. අනුප්පවෙ° S. නානුප° C.
9. තම්හා වා S.
10. සීතවාරි° P. C.

47. මාණවකය, නැවතද (අනිකක් කියමි). (යොගී)මහණ තෙමේ විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් අධ්‍යාත්මයෙහි මනා පැහැදීම කරන්නාවූ, සිත පිළිබඳ එකඟ බව ඇති, විතර්ක විචාර නැති, සමාධියෙන් හටගත් ප්‍රීතිසැපය ඇති ද්වතීයධ්‍යාන කුසල චිත්තයට පැමිණ වෙසේ. ඒ මහණ තෙමේ මේ කය සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් තෙමයි (සියලු තැන පතල සැප ඇත්තක් කෙරේ), හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කරයි. ඒ මහණහුගේ සියලු කොටස් ඇති ශරීරයෙහි සවල්පවූ තැනක් වුවද ද්විතියධ්‍යානයෙන් නො පහස්නා ලද්දේ නොවේ.

48. මාණවකය, යම්සේ ඇතුළතම හටගත් (පොළොව බිඳ නික්මෙන) ජලය ඇති දියවිලක් වේ ද, ඒ විල පිළිබඳ පෙර දිගින් ද, අපරදිගින් ද, උතුරු දිගින් ද, දකුණු දිගින් ද දිය එන මගක් නැත්තේ වේ ද, මෙඝය ද කලින් කල මනාසේ වැසි වර්ෂණය නො කරන්නේ ද, එසේ වූ ඒ විලෙන් සිහිල් දිය දහර පොළොව බිඳ නැගී ඒ මුළු විලම සිහිල් දියෙන් පතුරුවයි, හාත්පසින් වගුරුවයි, සම්පූර්ණයෙන් පුරවයි, එහි හැම තැන දියෙන් ස්පර්ශ කෙරෙයි. ඒ සියලු විලෙහිම සීත ජලය නො පැතිර පවත්නා තැනක් නම් නැත්තේය.

49. මාණවකය, එපරිද්දෙන් මේ මහණ තෙමේ මේ මුළු ශරීරයම සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් සියලු තැන පතුරුවන ලද්දක් කෙරේ, ප්‍රීති සැපයෙන් හාත්පසින් වගුරුවයි, සම්පූර්ණයෙන් පුරවයි, ඉන් සැමතැනම ස්පර්ශ කෙරෙයි. ඒ මහණහුගේ සම්පූර්ණ ශරීරයෙහි සවල්පවූ එක ස්ථානයකුදු (ද්විතියධ්‍යාන) සැපයෙන් නො පහස්නා ලද්දේ නොවේ. මාණවකය, යම්සේ වනාහි (යෝගි) මහණ තෙමේ විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් අධ්‍යාත්මයෙහි මනා පැහැදීම කරන්නාවූ, සිත පිළිබඳ එකඟ බව ඇති, විතර්ක විචාර නැති, සමාධියෙන් හටගත් ප්‍රීතිසැපය ඇති ද්වතීයධ්‍යාන කුසල චිත්තයට පැමිණ වෙසේ. ඒ මහණ තෙමේ මේ කය සමාධියෙන් හටගත් ප්‍රීතිසැපයෙන් තෙමයි (සියලු තැන පතල සැප ඇත්තක් කෙරේ), හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කරයි. ඒ මහණහුගේ සියලු කොටස් ඇති ශරීරයෙහි සවල්පවූ තැනක් වුවද ද්විතීයධ්‍යානයෙන් නො පහස්නා ලද්දේ නොවේ. මෙ ද ඔහුගේ සමාධිය පිළිබඳ වේ.

50. පුනච පරං මාණව භික්ඛු පීතියා ච විරාගා[1] උපෙක්ඛකො[2] ච විහරති සතො[3] සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො[2] සතිමා සුඛවිහාරීති තතියජ්ඣානං[4] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො[5] කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං[6] හොති.

51. සෙය්‍යථාපි මාණව උප්පලිනියං වා[7] පදුමිනියං වා[7] පුණ්ඩරීකිනියං වා[7] අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි[8] උදකානුග්ගතානි අන්තොනිමුග්ගපොසීනි[9] තානි යාව චග්ගා[10] යාව ච මූලා සීතෙන වාරිනා අභිසන්නානි[11] පරිසන්නානි[11] පරිපූරානි පරිප්ඵුටානි[12] නාස්ස කිඤ්චි සබ්බාවතං[5] උප්පලානං වා[13] පදුමානං වා පුණ්ඩරීකානං වා සීතෙන වාරිනා අප්ඵුටං[6] අස්ස.

52. එවමෙව ඛො මාණව භික්ඛු ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො[5] කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං[6] හොති. යම්පි මාණව භික්ඛු පීතියා ච විරාගා[1] උපෙක්ඛකො[2] ච විහරති සතො[3] සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො[2] සතිමා සුඛවිහාරීති තතියජ්ඣානං[4] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො[5] කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං[6] හොති. ඉදම්පිස්ස හොති සමාධිස්මිං.

---

1. විරාගා ච P.
2. උපෙඛකො P.
3. සතො ච P. S.
4. තතියං ඣානං V. W.
5. සබ්බවතො V.
6. අඵුටං B.V; අප්ඵුටං S.; අප්ඵුතං P.
7. වාති න දිස්සති P.
8. සංවුඩ්ඪානි B. V; සංවඩ්ඪානි S.
9. °පොසිනී B.
10. යාව ච අග්ගා S.
11. °සන්නානි P.W.
12. පරිප්ඵුට්ඨානි P.
13. වාති නත්ථි V.

50. මාණවකය, යලිදු, ඒ මහණ තෙමේ ප්‍රීතියෙහි නො ඇල්මෙන් මැදහත්බැව් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් නුවණ ඇත්තේ කයින්ද සැපයක් විඳියි. යම් ධ්‍යානයක් පිළිබඳව (ඒ ධ්‍යානයට සමවැදුනු තැනැත්තා) උපෙක්‍ෂා ඇත්තේය, සිහි ඇත්තේය, සැපවිහරණ ඇත්තේ යයි ආර්‍යයෝ කියත් ද, ඒ තෘතියධ්‍යාන කුසල චිත්තයට පැමිණ වාසය කෙරේ. ඒ මහණ තෙමේ මේ සකල ශරීරයම ප්‍රීතියෙන් මිදුණාවූ සැපයෙන් තෙමයි, හෙවත් සියලු තැන පැතිර පවත්නා සැප ඇත්තක් කෙරේ. ඒ සැපතින් හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, එයින් සැමතැනම ස්පර්‍ශ කෙරෙයි. ඒ මහණහුගේ සියලු ශරීරයෙහි සවල්පවූ එක තැනක් වූවද නිෂ්ප්‍රීතික සුඛයෙන් (හෙවත් තෘතිය ධ්‍යානසුඛයෙන්) නො පහස්නා ලද්දේ නොවේ.

51. මාණවකය, යම්සේ උපුල් විලක හෝ හෙල පියුම් විලක හෝ රත් පියුම් විලක හෝ දියෙහි හටගත්, දියෙහි වැඩුනු, දියෙන් උඩට නොනැගුනු, දියතුලම ගැලී වැඩෙන්නාවූ සමහර උපුල් හෝ සමහර හෙල පියුම් හෝ සමහර රත් පියුම් හෝ වෙද් ද, ඒ උප්පලාදීහු අග දක්වාත්, මුල දක්වාත්, සිහිල් ජලයෙන් තෙමුනාහු, හාත්පසින් තෙමුනාහු, සම්පූර්ණයෙන් වැගුරුණාහු, හාත්පසින් පහස්නා ලද්දාහු වෙත් ද, ඒ උපුල්, හෙල පියුම්, රත් පියුම් යන මොවුන්ගෙන් එකකුත් ජලයෙන් නො පහස්නා ලද්දේ නොවේ ද,

52. මාණවකය, එපරිද්දෙන් ඒ මහණ තෙමේ මේ සකල ශරීරයම නිෂ්ප්‍රීතික සුඛයෙන් සියලු තැන පැතිර පවත්නා සැප ඇත්තක් කෙරෙයි, ඉන් හාත්පසින් තෙමයි. සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්‍ශ කෙරෙයි. ඒ මහණහුගේ සම්පූර්ණ ශරීරයෙහි සවල්පවූ එක තැනක්වත් නිෂ්ප්‍රීතික (තෘතියධ්‍යාන) සුඛයෙන් නො පහස්නා ලද්දේ නොවේ. මාණවකය, යම්සේ මහණ තෙමේ ප්‍රීතියෙහි නො ඇල්මෙන් මැදහත් බැව් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් නුවණ ඇත්තේ කයින්ද සැපයක් විඳියි. යම් ධ්‍යානයක් පිළිබඳව (ඒ ධ්‍යානයට සමවැදුනු තැනැත්තා) උපෙක්‍ෂා ඇත්තේය, සිහි ඇත්තේය, සැපවිහරණ ඇත්තේය යි ආර්‍යයෝ කියත් ද, ඒ තෘතියධ්‍යාන කුසල චිත්තයට පැමිණ වාසය කෙරේ. ඒ මහණතෙමේ මේ සකල ශරීරයම ප්‍රීතියෙන් මිදුනාවූ සැපයෙන් තෙමයි. හෙවත් සියලු තැන පැතිර පවත්නා සැප ඇත්තක් කෙරේ. ඒ සැපතින් හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, එයින් සැමතැනම ස්පර්‍ශ කෙරෙයි. ඒ මහණහුගේ සියලු ශරීරයෙහි සවල්ප වූ එක තැනක් වූවද නිෂ්ප්‍රීතික සුඛයෙන් (හෙවත් තෘතියධ්‍යානසුඛයෙන්) නොපහස්නා ලද්දේ නොවේ. මෙ ද ඔහුගේ සමාධිය පිළිබඳ වේ.

53. පුනචපරං මාණව භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා[1] අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං[2] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති නාස්ස කිඤ්චි සබ්බාවතො[3] කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුට්ඨං[4] හොති.

54. සෙය්‍යථාපි මාණව පුරිසො ඔදාතෙන වත්ථෙන සසීසං පාරුපිත්වා නිසින්නො අස්ස නාස්ස කිඤ්චි සබ්බාවතො[3] කායස්ස ඔදාතෙන වත්ථෙන අප්ඵුට්ඨං[4] අස්ස;

55. එවමෙව ඛො මාණව භික්ඛු ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති නාස්ස කිඤ්චි සබ්බාවතො[3] කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුට්ඨං[4] හොති. යම්පි මාණව භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා[1] අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං[2] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති නාස්ස කිඤ්චි සබ්බාවතො[3] කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුට්ඨං හොති. ඉදම්පිස්ස හොති සමාධිස්මිං.

56. අයං ඛො සො මාණව අරියො සමාධික්ඛන්ධො යස්ස සො[5] භගවා වණ්ණවාදී අහොසි එත්ථ ච ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිට්ඨාපෙසි. අත්ථි චෙවෙත්ථ උත්තරිං[6] කරණීයන්ති.

---

1. අත්ථගමා P.
2. චතුත්ථං ඣානං B. V.W.
3. සබ්බවතො V.
4. අඵුටං B.V. අප්ඵුටං S. අප්ඵුතං P.
5. හොති නත්ථි W.
6. උත්තරි B.

53. මාණවකය, නැවත ද, ඒ මහණතෙමේ සැප දුරුකිරීමෙන් ද, දුක් දුරුකිරීමෙන් ද පළමුකොටම සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැතිව යාමෙන් දුක් නොවූ, සැප නොවූ, උපෙක්ඛා හා සති යන මොවුන්ගේ පිරිසිදු බැව් ඇති, චතුර්ථධ්‍යාන චිත්තයට පැමිණ වෙසේ. ඒ මහණ තෙමේ මේ සකල ශරීරයම (කෙලෙස් නැති බැවින්) පිරිසිදුවූ, (අතිශයින් බබලන හෙයින්) පරියොදාතවූ, (ධ්‍යාන) සිතින් පතුරුවා හුන්නේ වේ (පතුරුවන්නේය). ඒ ධ්‍යානලාභි මහණහුගේ සර්වාඞ්ගයෙහි සවල්පවූ එක තැනකුදු පිරිසිදුවූ, අතිශයින් බබලන්නාවූ (චතුර්ථ ධ්‍යාන) චිත්තයෙන් නො පහස්නා ලද්දේ නොවේ.

54. මාණවකය, යම්සේ පුරුෂයෙක් පිරිසිදුවූ සුදුවතකින් හිස සිට (දෙපා දක්වා) පොරවා උන්නේ වේද, ඔහුගේ සකල ශරීරයෙහි එකම තැනකුදු සුදුවතින් නො වසන (නොහොත් උණුසුම් නොකරණ) ලද්දේ නොවේ.

55. මාණවකය, එපරිද්දෙන්ම ධ්‍යානලාභී මහණ තෙමේ මේ සියලු ශරීරයම පිරිසිදුවූ, අතිශයින් බබලන්නාවූ (චතුර්ථධ්‍යාන) චිත්තයෙන් පතුරුවා හුන්නේ වේ. ඒ මහණහුගේ සර්වාඞ්ගයෙහි සවල්පවූද එක් තැනක්වත් පිරිසිදුවූ බබලන්නාවූ (චතුර්ථධ්‍යාන) චිත්තයෙන් නො පහස්නා ලද්දේ නොවේ (චතුර්ථධ්‍යාන චිත්තයෙන් සකල ශරීරයම පතුරුවන ලද්දේය කී සේයි.) මාණවකය, යම්සේ ධ්‍යානාභි මහණ තෙමේ සැප දුරුකිරීමෙන් ද, දුක් දුරුකිරීමෙන් ද පළමුකොටම සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැතිව යාමෙන් දුක් නොවූ, සැප නොවූ, උපෙක්ඛා හා සති යන මොවුන්ගේ පිරිසිදු බැව් ඇති, චතුර්ථධ්‍යාන චිත්තයට පැමිණ වෙසේද ඒ මහණ තෙමේ මේ සකල ශරීරයම (කෙලෙස් නැති බැවින්) පිරිසිදුවූ, (අතිශයින් බබලන හෙයින්) පරියොදාතවූ, (ධ්‍යාන) සිතින් පතුරුවා හුන්නේ වේ (පතුරුවන්නේය.) ඒ ධ්‍යානලාභි මහණහුගේ සර්වාඞ්ගයෙහි සවල්පවූ එකතැනකුදු පිරිසිදුවූ, අතිශයින් බබලන්නාවූ චතුර්ථ ධ්‍යාන චිත්තයෙන් නො පහස්නා ලද්දේ නොවේ. මෙ ද ඔහුගේ සමාධිය පිළිබඳ වේ.

56. මෙණෙවිය, ඒ භාග්‍යවතුන් වහන්සේ ආර්‍ය්‍ය වූ යම් සමාධිස්කන්ධයක ගුණ වදාරණ සුළුවූයේක් ද, යමක් කෙරෙහි මේ ජනසමූහයා සමාදන් කරවා ලූයේක් ද, නිවෙසනය කරවූයේක් ද, පිහිටි වූ යේක් ද, මේ වනාහි ඒ ආර්‍ය්‍ය වූ සමාධිස්කන්ධයයි.

අච්ඡරියං භො ආනන්ද අබ්භුතං භො ආනන්ද. සො වායං භො ආනන්ද අරියො සමාධික්ඛන්ධො පරිපුණ්ණො නො අපරිපුණ්ණො. එවං පරිපුණ්ණඤ්චාහං[1] භො ආනන්ද[2] අරියං සමාධික්ඛන්ධං ඉතො බහිද්ධා අඤ්ඤෙසු සමණබ්‍රාහ්මණෙසු න සමනුපස්සාමි. එවං පරිපුණ්ණඤ්ච භො ආනන්ද අරියං සමාධික්ඛන්ධං ඉතො බහිද්ධා අඤ්ඤෙ සමණබ්‍රාහ්මණා අත්තනි සමනුපස්සෙය්‍යුං තෙ තාවතකෙනෙව අත්තමනා අස්සු: අලමෙත්තාවතා කතමෙත්තාවතා අනුප්පත්තො නො[3] සාමඤ්ඤත්ථො නත්ථි නො කිඤ්චි උත්තරිං කරණීයන්ති.

57. අථ ච පන භවං ආනන්දො එවමාහ: අත්ථි චෙවෙත්ථ උත්තරිං කරණීයන්ති. කතමො පන සො භො ආනන්ද අරියො පඤ්ඤාක්ඛන්ධො[4] යස්ස සො භවං ගොතමො වණ්ණවාදී අහොසි යත්ථ ච ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිට්ඨාපෙසීති?[5]

58. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[6] ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො එවං පජානාති: අයං ඛො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදනපරිමද්දනභෙදනවිද්ධංසනධම්මො ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති.

---

1. °පුණ්ණං චාහං P.
2. භොතො ආනන්දස්ස S.
3. නො ති නත්ථි W.
4. පඤ්ඤ° Pa.
5. පතිට්ඨපෙසීති W; පතිට්ඨපෙසි B. S
6. ආනෙඤ්ජ° P.

පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, ආශ්චර්යයයි; පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්ස අද්භූතයි. පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, ඒ මේ ආර්ය වූ සමාධිස්කන්ධය පරිපූර්ණ වූවකි, අපරිපූර්ණ වූවක් නොවේ. පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, මෙසේ හැම පසින් පරිපූර්ණ වූ ආර්ය වූ සමාධිස්කන්ධයක් මේ බුදුසස්නෙහි හැර අන්‍ය වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් විෂයයෙහි මම නොදක්මි. පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, මෙසේ හැම පසින් පරිපූර්ණ වූ ආර්ය වූ සමාධිස්කන්ධයක් මේ බුදුසස්නෙන් බාහිර වූ අන්‍ය වූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ තමන් කෙරෙහි (පිහිටි බව) මනාව දක්නාහු නම් ඔවුහු එපමණකින්ම සතුටු වන්නාහුමය. 'මෙපමණක්ම අපට සෑහෙයි. මෙපමණකින්ම කටයුතු (නිමි) කරන ලදී. අපගේ ශ්‍රමණ භාවයෙහි අර්ථය (මුදුන්) පැමිණියේය. අප විසින් මතු කටයුතු කිසිත් නැත' (සි කියන්නාහුමය).

57. එහෙත් පින්වත් ආනන්ද ස්ථවිරතෙම යලිදු 'මේ බුදුසස්නෙහි මත්තෙහිදු කටයුතුවූ අතිකෙක් ඇත්මැයි' කියයි. පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, ඒ භවත් ගෞතමයාණන් වහන්සේ යම් ප්‍රඥාස්කන්ධයක ගුණ විදුරණ සුලු වූ සේක් ද. යම් ප්‍රඥාස්කන්ධයක මේ ජනසමූහයා සමාදන් කරවූසේක් ද, නිවෙසනය කරවූ සේක් ද, පිහිටුවූ සේක් ද, ඒ ආර්ය වූ ප්‍රඥාස්කන්ධය කවරේ ද?

58. ඒ මහණතෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි, උපකෙලශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි, (කර්මණ්‍යව) කර්මයට සුදුසුව සිටි කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි; විදර්ශනාඥානය ඉපදවීම පිණිස සිත එලවා තබයි, ඒ සඳහා වෙසෙසින් සිත නමයි. ඒ මහණ තෙමේ මෙසේ දැන ගණී (කෙසේ ද යත්): 'මාගේ මේ ශරීරය වනාහි ආකාර ඇත්තේය (රූපයෙන් යුක්තය), සතර මහාභූතයන්ගේ හේතුවෙන් හටගත්තේය, (මව්පියන් නිසා) මව් පිය දෙදෙනාගේ ශුක්‍ර ශ්‍රොණිතයෙන් හටගත්තේය, බත්කොමු (කුම්මාස) ආදී ආහාරයෙන් වඩනා ලද්දේය. අනිත්‍ය බවය, දුගඳ නැසීම පිණිස සුණු ආදිය ගැල්වීමෙන් ඉලීමය, අඟපසඟ ආබාධ දුරලීම පිණිස පිරිමැදීමය, බිඳීමය, විනාශය යන මේ දේ සවභාවකොට ඇත්තේය. මාගේ මේ විඤ්ඤාණය වනාහි කය ඇසුරු කෙළේ වෙයි, මෙහිම බැඳුනේ වෙයි' කියායි.

59. සෙය්‍යථාපි මාණව මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අච්ඡො විප්පසන්නො අනාවිලො සබ්බාකාරසම්පන්නො තත්‍රස්ස[1] සුත්තං ආවුතං නීලං[2] වා පීතං[3] වා ලොහිතං[4] වා ඔදාතං වා පණ්ඩුසුත්තං[5] වා. තමෙනං[6] චක්ඛුමා පුරිසො හත්ථෙ කරිත්වා පච්චවෙක්ඛෙය්‍ය: අයං ඛො මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අච්ඡො විප්පසන්නො අනාවිලො සබ්බාකාරසම්පන්නො තත්‍රිදං සුත්තං ආවුතං නීලං[2] වා පීතං[3] වා ලොහිතං[4] වා ඔදාතං වා පණ්ඩුසුත්තං[5] වාති.

එවමෙව ඛො මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ—පෙ—ඤාණදස්සනාය චිත්තං අභිනීහරති[7] අභිනින්නාමෙති. සො එවං පජානාති අයං ඛො මෙ කායො රූපී—පෙ—ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති.

යම්පි මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— එවං පජානාති —පෙ— ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති ඉදම්පිස්ස හොති පඤ්ඤාය.

60. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[8] මනොමයං කායං අභිනිම්මිනාය[9] චිත්තං අභිනීහරති[7] අභිනින්නාමෙති. සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං[10] අහීනින්ද්‍රියං[11].

61. සෙය්‍යථාපි මාණව පුරිසො මුඤ්ජම්හා ඊසිකං[12] පබ්බාහෙය්‍ය[13] තස්ස එවමස්ස: අයං මුඤ්ජො අයං ඊසිකා[12]. අඤ්ඤො මුඤ්ජො අඤ්ඤා ඊසිකා[12] මුඤ්ජම්හාත්වෙව ඊසිකා[12] පබ්බාළ්හාති[13].

---

1. තත්‍රසුත්තං P. W.
2. නිලං B.
3. පිතං B.
4. ලොහිතකං B.
5. පණ්ඩුරසු° S.
6. තමෙව ච° P.
7. °නිහරති B.
8. ආනෙජ්ජ° P. C.
9. මනොමයං අභිනිම්මිනනාය S.
10. °පච්චඞ්ගං S.
11. අභින්නින්ද්‍රියං C.
12. ඉසි° P. S. W. C.
13. පවා° P. W. S.

59. මෙෙණවිය, යම්සේ වනාහි යහපත්වූ, පිරිසිදු ආකාරයෙන් උපන්නාවූ, අටැස්වූ, (පාෂාණාදි දෙස් බැහැර කිරීමෙන්) මොනවට සකස් කරණ ලද්දවූ, නිර්මලවූ, විශෙෂයෙන් ප්‍රසන්නවූ, නොකැලැල්වූ, සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, වෛරෑඩිමිණක් (වෛඩූර්‍ය මැණිකක්) වේද, එහි නිල්වූ හෝ පීතවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ නූයක් (නූලක්) අමුණන ලද්දේද, ඒ මේ මැණික ඇස් ඇති පුරුෂයෙක් අතට ගෙණ මෙසේ සලකා බලන්නේය, (කෙසේද යත්:) 'මේ වෛඩූර්‍ය මැණික වනාහි මනාසේ කාන්තිමත් හෙයින් යහපත් වේ, පිරිසිදු ආකාරයෙන් උපන්නේය, අටැස් ඇත්තේය, (දෙස් දුරුකිරීමෙන්) මනාකොට සකස් කරණ ලද්දේය, නිර්මලය, විශෙෂයෙන් ප්‍රසන්නය, නොකැලැල්ය, සියලු ආකාරයෙන් සම්පූර්ණය. ඒ මැණිකෙහි මේ නීලවර්ණවූ හෝ පීතවර්ණවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ නූයක් අමුණන ලද්දේය' කියායි.

මෙෙණවිය, එපරිද්දෙන්ම යොගීවූ මේ මහණ තෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, —පෙ— විදර්ශනාඥානය පිණිස සිත එලවා තබයි, ඒ සඳහා විශෙෂයෙන් සිත නමයි. ඒ මහණ තෙමේ මෙසේ දන්නේය, (කෙසේද යත්:) 'මාගේ මේ ශරීරය වනාහි ආකාරවත් (රූපයෙන් යුක්ත) ය, —පෙ— මාගේ මේ විඥානය වනාහි මේ කය ඇසුරු කොළේ වෙයි, මෙහිම බැඳී සිටියේය' කියා යි.

මෙෙණවිය, යම්සේ මහණතෙමේ මෙසේ සිත එකඟවූ කල්හි —පෙ— 'මාගේ මේ විඥානය වනාහි මේ කය ඇසුරු කොළේ වෙයි, මෙහිම බැඳී සිටියේය'යි මෙසේ දන්නේද, මෙද ඔහුගේ ප්‍රඥාව පිණිස වේ.

60. ඒ මහණ තෙමේ මෙසේ ධ්‍යානයෙන් සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් නැතිවූ කල්හි, උපකෙලශ පහවූ කල්හි, මෘදුවූ කල්හි, යොග කර්මයට සුදුසුව සිටි කල්හි, නො සැලෙන බවට පැමිණි කල්හි, මනොමයවූ කයක් (රූපයක්) මනාකොට නිපදවීම පිණිස සිත එලවා තබයි, වෙසෙසින් නමයි. ඒ මහණ තෙමේ ආකාරවත්වූ, මනොමයවූ (ධ්‍යාන සිතින් නිපදවනලද), සියලු අඟපසඟ ඇති, අවිකලවූ ඉඳුරන් ඇති, මේ කයින් අන්‍යවූ කයක් මොනවට නිමවයි.

61. මෙෙණවිය, යම්සේ වනාහි පුරුෂයෙක් තෙම මුඳු තණගසින් තණබඩය උඩුරණය කරන්නේ ද, ඔහුට මෙම අදහස් වන්නේය: මේ තණගසය, මේ තණබඩයය; තණගස අනිකෙක, තණබඩය අනිකෙක, තණගසින්ම තණබඩය ඇදගන්නා ලද්දේය (යන වැටහීම ඔහට පහළ වන්නේය).

සෙය්‍යථා [1] වා පන මාණව පුරිසො අසිං [2] කොසියා පබ්බාහෙය්‍ය [3] තස්ස එවමස්ස: අයං අසි අයං කොසි අඤ්ඤො අසි අඤ්ඤො [4] කොසි. කොසියා ත්වෙව අසි පබ්බාළ්හොති [3].

සෙය්‍යථා වා [1] පන මාණව පුරිසො අහිං කරණ්ඩා උද්ධරෙය්‍ය තස්ස එවමස්ස: අයං අහි අයං කරණ්ඩො අඤ්ඤො අහි අඤ්ඤො කරණ්ඩො. කරණ්ඩා ත්වෙව අහි උබ්භතොති [5].

එවමෙව ඛො මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— ආනෙඤ්ජප්පත්තෙ [6] මනොමයං කායං [7] අභිනිම්මිනාය [8] චිත්තං අභිනීහරති [9] අභිනින්නාමෙති. සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං [10] අහීනින්ද්‍රියං [11].

යම්පි මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ග පච්චඞ්ගිං අහීනින්ද්‍රියං ඉදම්පිස්ස හොති පඤ්ඤාය.

62. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනීයෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ [6] ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති [9] අභිනින්නාමෙති. සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති එකොපි හුත්වා බහුධා හොති බහුධාපි හුත්වා එකො හොති ආවීභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ. පඨවියා [12] පි උම්මුජ්ජනිමුජ්ජං [13] කරොති සෙය්‍යථාපි උදකෙ. උදකෙපි අභිජ්ජමානො [14] ගච්ඡති සෙය්‍යථාපි පඨවියං [12]. ආකාසෙ පි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙපි චන්දිමසුරියෙ [15] එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරිමසති [16] පරිමජ්ජති යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.

---

1. සෙය්‍යථාපි පන P. W.
2. අසි කොසියං W. අසි කොසියා P. V.
3. පවා° P. W. S.
4. අඤ්ඤො P. W.
5. උද්ධරිතොති S.
6. ආනෙඤ්ජ° P.
7. කායං ති න දිස්සති S.
8. °නිම්මිනනාය S.
9. °නිහරති B.
10. °පච්චඞ්ගං S.
11. අභින්නින්ද්‍රියං C. අභි° P.
12. පඨ° B. V.
13. °නිම්මුජ්ජං P. W.
14. අභෙජ්ජ° W.
15. °සූරියෙ B.
16. පරා° B. V. W.

මෙණෙවිය, යම්සේ වනාහි පුරුෂයෙක් කඩුව කොපුවෙන් ඉවත් කරන්නේ ද ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: මේ කඩුවය, මේ (කඩු) කොපුවය, කඩුව අනිකෙක, කොපුව අනිකෙක, කොපුවෙන්ම කඩුව ඉවත්කරණ ලද්දේය කියායි.

මෙණෙවිය, යම්සේ හෝ පුරුෂයෙක් සර්පයකු සැවයෙන් පහකරන්නේද[1] (වෙන්කොට සලකන්නේද), ඔහට මේ සර්පයාය, මේ සැවය, සර්පයා එකෙකි, සැව අනිකකි, සැවයෙන්ම සර්පයා වෙන්කරණ ලද්දේය යි වැටහීමක් ඇතිවන්නේය.

මෙණෙවිය, එසේම භික්ෂුව මෙසේ සිත සමාධිගතවූ කල්හි, —පෙ— නොසැලෙනබවට පැමිණි කල්හි සිතින් උපදවන කයක් මැවීම පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට ඊට නමයි. හේතෙමේ මේ කයින් රූ ඇති, සිතින් මවන ලද, සියලු අඟපසඟ ඇති, නොපිරිහුනු ඉන්ද්‍රියයන් ඇති වෙන කයක් මවයි.

යම්සේ භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි —පෙ— මේ කයින් රූ ඇති, සිතින් මවන ලද, සියලු අඟපසඟ ඇති, නො පිරිහුනු ඉන්ද්‍රියයන් ඇති වෙන කයක් මවයිද, මෙ ද ඔහුගේ ප්‍රඥාව පිණිස වේ.

62. හේතෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත වූ කල්හි, උප-ක්ලේශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍ය භාවයට පැමිණි කල්හි, සෘද්ධිවිධි පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි (ඊට නැඹුරු කෙරෙයි). හේතෙමේ නොයෙක් අයුරු ඇති සෘද්ධිවිධි වෙන් වෙන් කොට අනුභව කෙරෙයි. එකෙක්ව බොහෝ සේ වෙයි. බොහෝ සේ ව එකෙක් වෙයි. ප්‍රකට බවට, මුවහ බවට, අහසෙහි මෙන් බිත්තිය සරසට, පවුර සර-සට, පව්ව සරසට නොගැටෙමින් යෙයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම් මතුවීම් කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබෙද ගමන් කෙරෙයි. පක්ෂියකු මෙන් අහසෙහි ද පලඟින් යෙයි. මේ මහත් සෘද්ධි ඇති, මහත් ආනුභාව ඇති සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි, බඹලොව තෙක් කයින් වසඟ බව පවත්වයි.

---

1. මෙසේ කරන්නේ සිතින් පමණකැයි අටුවායි.

63. සෙය්‍යථාපි මාණව දක්ඛො කුම්භකාරො වා කුම්භකාරන්තෙවාසී වා සුපරිකම්මකතාය මත්තිකාය යං යදෙව භාජනවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය. සෙය්‍යථා වා[1] පන මාණව දක්ඛො දන්තකාරො වා දන්තකාරන්තෙවාසී වා සුපරිකම්මකතස්මිං දන්තස්මිං යං යදෙව දන්තවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය. සෙය්‍යථා වා[1] පන මාණව දක්ඛො සුවණ්ණකාරො වා සුවණ්ණකාරන්තෙවාසී වා සුපරිකම්මකතස්මිං සුවණ්ණස්මිං යං යදෙව සුවණ්ණවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය[2].

එවමෙව ඛො මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනීයෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[3] ඉද්ධිවිධාය චිත්තං අභිනිහරති[4] අභිනින්නාමෙති. සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති එකොපි හුත්වා බහුධා හොති —පෙ— ඉමෙපි චන්දිමසුරියෙ[5] එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරිමසති[6] පරිමජ්ජති. යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.[7]

යම්පි මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති ඉදම්පිස්ස හොති පඤ්ඤාය.

64. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනීයෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[3] දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති[4] අභිනින්නාමෙති. සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය[8] උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච.

---

1. සෙය්‍යථාපි පන° P. W.
2. අභිනිප්පාදෙය්‍ය W.
3. ආනෙජ්ජ° P.
4. °නිහරති B.
5. සූරියෙ B.
6. පරා° B. V. W.
7. කායෙනෙව ස.° W
8. °මානුස° B. V. Pa.

63. මෙමාණවිය, දක්‍ෂ කුඹල්කරුවෙක් හෝ කුඹල්කරු-අතවැසියෙක් හෝ යහපත් සේ පදම්කළ මැටියෙන් කැමති කැමති බඳුන් වර්ගයන් යම්සේ කරන්නේ ද, නිපදවන්නේ ද, මෙමාණවිය, දළ කැටයම් කරුවෙක් හෝ දළකැටයම්කරුගේ අතවැසියෙක් හෝ සකස් කළ දළයෙහි යම්සේ කැමති කැමති දළකැටයම් වර්ගයක් කරන්නේද, නිපදවන්නේද, මෙමාණවිය, දක්‍ෂ රන්කරුවෙක් හෝ රන්කරුඅතවැසියෙක් හෝ පදම්කළ රණින් කැමති කැමති රන් අබරණ ජාතින් යම්සේ කරන්-නේද, නිපදවන්නේද,

මෙමාණවිය, එසේම භික්‍ෂුව සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත වූ කල්හි, කෙලශයන් පහ වූ කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්පයභාවයට පැමිණි කල්හි, ඍද්ධිවිධි පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ නොයෙක් ඍද්ධිවිධි වෙන් වෙන් කොට අනුභව කෙරෙයි: එකෙක්ව බොහෝ සේ වෙයි, —පෙ— මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභාව ඇති, සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි, බඹලොව තෙක් කයින් වසඟබව කෙරෙයි.

මාණවකය යම්සේ භික්‍ෂුව මෙසේ සිත එකඟවූ කල්හි —පෙ— බඹලොව තෙක් කයින් වසඟ බව කෙරෙයිද මෙ ද ඔහුගේ ප්‍රඥාව පිණිස වේ.

64. හේ තෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වරවූ කල්හි, අඞ්ගණ රහිතවූ කල්හි, උපකෙලශ-යන් පහව ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්පයභාවයට පැමිණි කල්හි, දිව්‍යශ්‍රොත්‍රාඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි (ඊට නැඹුරු කෙරෙයි). ඒ භික්‍ෂුව පිරිසුදු වූ, මිනිස්-බව ඉක්මවූ, දිව්‍ය ශ්‍රොත්‍රාඥානයෙන් දිව්‍යමය වූද, මනුෂ්‍යමය වූද, දුරෙහි වූ ද සමීපයෙහි වූ ද දෙවැද්දෑරුම් ශබ්දයන් අසයි.

65. සෙය්‍යථාපි මාණව පුරිසො අද්ධානමග්ගපටිපන්නො[1] සො සුණෙය්‍ය භෙරිසද්දම්පි මුදිඞ්ගසද්දම්පි[2] සඞ්ඛපණවදෙණ්ඩිම-සද්දම්පි[3] තස්ස එවමස්ස: භෙරිසද්දො ඉතිපි මුදිඞ්ගසද්දො[2] ඉතිපි සඞ්ඛපණවදෙණ්ඩිමසද්දො[4] ඉතිපි. එවමෙව බො මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— දිබ්බාය සොත-ධාතුයා චිත්තං අභිනීහරති[5] අභිනින්නාමෙති. සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච.

යම්පි මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච ඉදම්පිස්ස හොති පඤ්ඤාය.

66. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[6] චෙතොපරියඤාණාය චිත්තං අභිනීහරති[5] අභිනින්නාමෙති. සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති.

සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති වීතරාගං[7] වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති සඞ්ඛිත්තං වා චිත්තං සඞ්ඛිත්තං චිත්තන්ති පජානාති වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

---

1. °මග්ගප්පටි° B. V.
2. මුතිඞ්ග° P.W.
3. °දෙන්ඩිම° B; සඞ්ඛසද්දම්පි පණවසද්දම්පි දෙන්ඩිමස° S.
4. සංඛසද්දො ඉතිපි පණවසද්දො ඉතිපි දෙන්ඩිමස° S.
5. °නිහරති B.
6. ආනෙජ්ජ° P.
7. විත° B. (සබ්බත්ථ)

65. මාණවකය, දික් මගට පිවිසි පුරුෂයෙක් බෙර හඬද, මිහිඟු බෙර හඬද, සක්, පණාබෙර, ගැටබෙර හඬද යම්සේ අසාද, ඔහුට මේ බෙර හඬයයිද, මිහිඟුබෙර හඬයයිද, සක්, පණාබෙර, ගැටබෙර හඬ යයිද සිතෙන්නේය. මාණවකය, එලෙසින්ම භික්ෂුව මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදුවූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත වූ කල්හි, පහ වූ උපක්ලේශ ඇති කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍යභාවයට පැමිණි කල්හි, දිව්‍යශ්‍රොත්‍රඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට ඊට නමයි. හේ තෙමේ මෙසේ පිරිසිදුවූ මිනිස්කණ ඉක්ම වූ දිව්‍ය ශ්‍රොත්‍රඥානයෙන් දිව්‍යමය වූ ද, මනුෂ්‍යමය වූ ද, දුරෙහි වූ ද, සමීපයෙහි වූ ද දෙවැදෑරුම් ශබ්දයන් අසයි.

යම්සේ භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි —පෙ— දිව්‍යමය වූද, මනුෂ්‍යමයවූද, දුරෙහිවූද සමීපයෙහිවූද දෙවැදෑරුම් ශබ්දයන් අසයිද, මෙ ද ඔහුගේ ප්‍රඥාව පිණිස වේ.

66. හේ තෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත වූ කල්හි, පහවූ උපක්ලේශ ඇති කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍යභාවයට පැමිණි කල්හි, සිත් පිරිසිඳින ඥාණය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි (ඊට නැඹුරු කෙරෙයි). හේ තෙමේ අන්‍ය සත්ත්වයන්ගේ, අන්‍ය පුද්ගලයන්ගේ සිත (තමන් ගේ) සිතින් පිරිසිඳ දනියි.

රාග සහිත සිත සරාග සිත යයි දනියි. රාගය පහ වූ සිත වීතරාග සිත යයි දනියි. ද්වේෂ සහිත සිත සද්වේෂ සිත යයි දනියි. ද්වේෂය පහවූ සිත වීතද්වේෂ සිත යයි දනියි. මෝහ සහිත සිත සමෝහ සිත යයි දනියි, මෝහය පහ වූ සිත වීතමෝහ සිත යයි දනියි. හැකුළුනු සිත හැකුළුනු සිත යයි දනියි, විසුරුණු සිත විසුරුණු සිත යයි දනියි. මහත් බවට ගිය සිත මහත් බවට ගිය සිත යයි දනියි. මහත් බවට නොගිය සිත මහත් බවට නොගිය සිත යයි දනියි. උතුරුසහිත (කාමාවචර) සිත උතුරුසහිත සිත යයි දනියි. අනුත්තර (රූපාවචර අරූපාවචර) සිත අනුත්තර සිත යයි දනියි. සමාධිගත වූ සිත සමාධිගත වූ සිත යයි දනියි, සමාධිගත නො වූ සිත සමාධිගත නො වූ සිත යයි දැනගණී. (ක්ලේශයෙන්) මිදුනු සිත මිදුනු සිත යයි දැනගණී, නොමිදුනු සිත නොමිදුනු සිත යයි දැනගණී.

67. සෙය්‍යථාපි මාණව ඉත්ථී වා පුරිසො වා දහරො වා යුවා මණ්ඩනජාතිකො[1] ආදාසෙ වා පරිසුද්ධෙ පරියොදාතෙ අච්ඡෙ වා උදකපත්තෙ[2] සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො සකණිකං[3] වා සකණිකන්ති[3] ජානෙය්‍ය අකණිකං[4] වා අකණිකන්ති[4] ජානෙය්‍ය.

68. එවමෙව ඛො මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— ආනෙඤ්ජප්පත්තෙ[5] චෙතොපරියඤාණාය චිත්තං අභිනීහරති[6] අභිනින්නාමෙති. සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති —පෙ— අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

යම්පි මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ—පෙ—අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති ඉදම්පිස්ස හොති පඤ්ඤාය.

69. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[5] පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති[6] අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙ-නිවාසං අනුස්සරති සෙය්‍යථීදං[7] එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසම්පි[8] ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි[9] ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ: අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උදපාදිං[10]. තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසං-වෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නොති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

---

1. මණ්ඩනක° S. C.
2. උදප° W.
3. සකණි° B.
4. අකණි° B.
5. ආනෙජ්ජ° P.
6. °නීහති B.
7. සෙය්‍යථිදං° B. V.
8. වීසතිම්පි P. W.
9. සතම්පි ජාතියො සහස්සම්පි ජා° සතසහස්සම්පි ජා° අනෙකෙපි S.
10. උප්පාදිං W.

67. මාණවකය, සැරසෙන සුලු ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ දහරයෙක් හෝ තරුණයෙක් හෝ පිරිසිදු, නොකිලිටි කැඩපතෙක හෝ පිරිසිදු දිය බඳුනෙක්හි හෝ තමාගේ මුව නිමිත්ත (මුඛ ශොභාව) පරීක්‍ෂා කරන්නේ, යම්සේ සැලල් සහිත නම් කැලල් සහිත යයි දැනගණීද, කැලල් රහිත නම් කැලල් රහිත යයි දැනගණීද,

68. මාණවකය, එසේම භික්‍ෂුව මෙසේ සිත එකඟ වූ කල්හි, —පෙ— නොසැලෙනබවට පැමිණි කල්හි, සිත් පිරිසිඳින ඥාණය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ තෙමේ අන්‍ය සත්ත්වයන්ගේ, අන්‍ය පුද්ගලයන්ගේ සිත (තමන්ගේ) සිතින් පිරිසිඳ දනියි. සරාග සිත සරාග සිත යයි දනියි. —පෙ— නොමිදුනු සිත නොමිදුනු සිත යයි දැනගනියි.

මාණවකය, යම්සේ භික්‍ෂුව මෙසේ සිත එකඟවූ කල්හි —පෙ— නොමිදුනු සිත නොමිදුනු සිතයයි දැනගනීද මේ ද ඔහුගේ ප්‍රඥාව පිණිස වේ.

69. හේතෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත වූ කල්හි, උපක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කර්මණ්‍යවූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍ය භාවයට පැමිණි කල්හි, පූර්වේනිවාසානුස්මෘතිඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට (ඊට) නමයි. හේ තෙමේ නොයෙක් විදියේ පෙර විසීම් සිහි කෙරෙයි. කෙසේදයත්: එක් ජාතියක් ද, දෙ ජාතියක් ද, තුන් ජාතියක් ද, සිවු ජාතියක් ද, පස් ජාතියක් ද, දස ජාතියක් ද, විසි ජාතියක් ද, තිස් ජාතියක් ද, සතළිස් ජාතියක් ද, පණස් ජාතියක් ද, සියක් ජාතියක් ද, දහස් ජාතියක් ද, සියක් දහස් ජාතියක් ද, නොයෙක් සංවෘත කල්පයන් ද, නොයෙක් විවෘත කල්පයන් ද, නොයෙක් සංවෘත විවෘත කල්පයන් ද 'අසුවල් තැන වීමි, මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මේ පැහැ ඇත්තෙමි, මේ අහර ඇත්තෙමි, මේ සැපදුක් වින්දෙමි, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙමි වීමි. ඒ මම එයින් චුතවූයෙම් අසුවල් තැන උපන්මි. එහිදු මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මේ පැහැ ඇත්තෙමි, මේ අහර ඇත්තෙමි, මේ සැපදුක් වින්දෙමි, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙමි වීමි. ඒ මම එයින් චුතවූයෙම මෙහි උපන්මි'යි මෙසේ ආකාර සහිතව, උදෙසීම් සහිතව, නොයෙක් විදියේ පෙර විසීම් සිහිකෙරෙයි.

70. සෙය්‍යථාපි මාණව පුරිසො සකම්හා ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය තම්හාපි ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය. සො[1] තම්හා[2] ගාමා සකඤ්ඤෙව[3] ගාමං පච්චාගච්ඡෙය්‍ය.[4] තස්ස එවමස්ස: අහං ඛො සකම්හා ගාමා අමුං ගාමං අගච්ඡිං[5] තත්‍ර[6] එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හීඅහොසිං. තම්හාපි ගාමා අමුං ගාමං අගච්ඡිං[5]. තත්‍රාපි[6] එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හීඅහොසිං. සොම්හි තම්හා ගාමා සකඤ්ඤෙව[3] ගාමං පච්චාගතො[4] ති.

71. එවමෙව ඛො මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති[7] අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති—සෙය්‍යථීදං එකම්පි ජාතිං —පෙ— ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

යම්පි මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ—පෙ—අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති ඉදම්පිස්ස හොති පඤ්ඤාය.

72. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනීයෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[8] සත්තානං චුතූපපාතඤාණාය[9] චිත්තං අභිනීහරති[7] අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[10] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ[11] සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා.[12] ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති[12]. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[10] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ[11] සත්තෙ පජානාති.

---

1. සො ති න දිස්සති P. W.
2. තම්හාපි ගාමා P.
3. සකංයෙව B. P.
4. පච්ඡා° P.
5. අගඤ්ඡිං S, ආගඤ්ඡිං P. ආගච්ඡිං Pa.
6. තත්‍රාහං B. S. තත්‍රපි B. Pa. W.
7. °නීහරති B.
8. ආනෙඤ්ජ° P.
9. චුතූප° B.
10. උප්පජ්ජං W.
11. කම්මූපගෙ B.
12. උප්පන්නා W.

70. මාණවකය, පුරුෂයෙක් යම්සේ තම ගමින් අන් ගමකට යන්නේ ද, ඒ ගමිනුත් අන් ගමකට යන්නේ ද, ඒ ගමිනුත් තමන් ගමට එන්නේ ද, 'මම සිය ගමින් අසුවල් ගමට ගියෙමි, එහි මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි, මෙසේ බිණිමි, මෙසේ තුෂ්ණීම්භූත වීමි. එගමිනුදු අසුවල් ගමට ගියෙමි, එහි ද, මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි, මෙසේ බිණිමි, මෙසේ තුෂ්ණීම්භූත වීමි. ඒ මම ඒ ගමින් සිය ගමටම පැමිණියෙමි'යි හෙතෙම දන්නේ ද,

71. මාණවකය, එපරිද්දෙන්ම භික්ෂුව මෙසේ සිත එකඟ වූ කල්හි, —පෙ— නොසැලෙන බවට පැමිණි කල්හි පූර්වේනිවාසානුස්මෘතිඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට නමයි. හේ නොයෙක් පූර්වේනිවාස සිහි කෙරෙයි. කෙසේදයත්: එක් ජාතියක් ද,—පෙ—මෙසේ ආකාර සහිතව උද්දේසීම් සහිතව නොයෙක් ආකාරවූ පූර්වේනිවාස සිහි කෙරෙයි.

මාණවකය, යම්සේ භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි —පෙ— නොයෙක් ආකාරවූ පූර්වේනිවාසය සිහිකෙරෙයිද මෙ ද ඔහුගේ ප්‍රඥාව පිණිස වේ.

72. හෙතෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිතවූ කල්හි, උපක්ලේශ පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කර්මණ්‍යවූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්පාමානභාවයට පැමිණි කල්හි සත්ත්වයන්ගේ චුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි (ඊට නැඹුරු කෙරෙයි). හේ පිරිසුදු වූ, මිනිස් ඇස ඉක්මවූ, දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී. හීන ප්‍රණීත, සුවර්ණ දුර්වර්ණ, සුගත දුගීත, කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දනී: 'මේ පින්වත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්තය, වාග්දුශ්චරිතයෙන් යුක්තය, මනොදුශ්චරිතයෙන් යුක්තය, ආර්‍යයන්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය, මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන් වූවෝය. ඔවුහු කාබුන් මරණින් මතු අපාය වූ, දුගීතිය වූ, විනිපාතය වූ, නිරයට පැමිණියාහුය'. නැතහොත්, 'මේ පින්වත් සත්ත්වයෝ කායසුචරිතයෙන් යුක්තය, වාක්සුචරිතයෙන් යුක්තය, මනඃසුචරිතයෙන් යුක්තය, ආර්‍යයන්ට නොබණින්නෝ ය, සම්‍යග්දෘෂ්ටිකයෝ ය, සම්‍යග්දෘෂ්ටිකර්ම සමාදන් වූවෝය, කාබුන් මරණින් මතු සුගතිය වූ, ස්වර්ගී ලොකයට පැමිණියෝ'යි මෙසේ පිරිසුදු වූ මිනිස් ඇස ඉක්ම වූ දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී, හීන ප්‍රණීත, සුවර්ණ, දුර්වර්ණ, සුගත දුගීත, කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දනී.

73. සෙය්‍යථාපි මහාරාජ මජ්ඣෙ සිංඝාටකෙ පාසාදො[1] තත්‍ථ චක්ඛුමා පුරිසො ඨිතො පස්සෙය්‍ය මනුස්සෙ ගෙහං පවිසන්තෙපි නික්ඛමන්තෙපි රථියා[2] වීතිසඤ්චරන්තෙ[3] පි මජ්ඣෙ[4] සිංඝාටකෙ නිසින්නෙපි[5]. තස්ස එවමස්ස: එතෙ මනුස්සා ගෙහං පවිසන්ති එතෙ නික්ඛමන්ති එතෙ රථියා[2] වීතිසඤ්චරන්ති[6] එතෙ[7] මජ්ඣෙ සිංඝාටකෙ නිසින්නාති.

74. එවමෙව ඛො මහාරාජ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ—පෙ—සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති[8] අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[9] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචිදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචිසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති.

75. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[9] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

යම්පි මහාරාජ භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති ඉදම්පිස්ස හොති පඤ්ඤාය.

76. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[10] ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති.

---

1. පාසාදෙ Pa.
2. රථියාපි රථිං සඤ්චර° V. රථියාය පි B.
3. වීථි සං° P. W; විථිං සංරථිං B. S; සං°V. වීථි සං° Ce; විදිසංචරන්තෙ Ca. B.
4. මජ්ඣෙපි P. W.
5. නිසින්නෙ P. W.
6. වීථි° P. W. විථිං° B.S. රථිං සං° V.
7. එතෙ මනුස්සා B.
8. °නිහරාහි B.
9. උප්පජ්ජ° W
10. ආනෙඤ්ජ° B.

73. මාණවකය, යම්සේ මංසලක පහයක් වේ ද, එහි ඇස් ඇති පුරුෂයෙක් සිටියේ ගෙට පිවිසෙන, ගෙයින් නික්මෙන, වීථියෙහි හැසිරෙණ, මංසල හිඳින මනුෂ්‍යයන් දක්නේ ද, ඔහුට මෙසේ සිතෙයි: 'මේ මිනිස්සු ගෙට පිවිසෙති, මොහු නික්මෙති, මොහු වීථියෙහි හැසිරෙති, මොහු මංසල හිඳිති'යි කියායි.

74. මාණවකය, එසේ ම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, —පෙ— සත්ත්වයන්ගේ චුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ මිනිස් ඇස ඉක්ම වූ දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී. හීන ප්‍රණීත, සුවර්ණ දුර්වර්ණ, සුගත දුගීත, කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දකී: 'මේ පින්වත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්තය,වාග්දුශ්චරිතයෙන් යුක්තය,මනොදුශ්චරිතයෙන් යුක්තය, ආර්‍යයන්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය, මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන් වූවෝය. ඔවුහු කාබුන් මරණින් මතු අපාය වූ, දුර්ගතිය වූ, විනිපාතය වූ, නිරයට පැමිණියෝය'. නැත හොත්, 'මේ පින්වත් සත්ත්වයෝ කායසුචරිතයෙන් යුක්තය, වාක්සුචරිත යෙන් යුක්තය, මනඃ සුචරිතයෙන් යුක්තය, ආර්‍යයන්ට නොබණින්නෝ ය, සම්‍යග්දෘෂ්ටිකයෝය, සම්‍යග්දෘෂ්ටිකර්ම සමාදන් වූවෝය. ඔවුහු කාබුන් මරණින් මතු සුගතිය වූ, ස්වර්ග ලොකයට පැමිණියෝ'යි කියායි.

75. මෙසේ පිරිසුදු වූ, මිනිස් ඇස ඉක්ම වූ දිව ඇසින් චුතවන, උපදින සත්ත්වයන් දකී; හීන ප්‍රණීත, සුවර්ණ දුර්වර්ණ, සුගත දුර්ගත, කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දනී.

මාණවකය, යම්සේ භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි —පෙ— සුගත දුගීත, කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දකීද, මෙ ද ඔහුගේ ප්‍රඥාව පිණිස වේ.

76. හේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත කල්හි, උපක්ලෙශ යන් පහව ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍යමාන භාවයට පැමිණි කල්හි ආශ්‍රවයන්ගේ ක්‍ෂය ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට නමයි.

77. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛ-සමුදයොති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති යථාභූතං පජානාති. ඉමෙ ආසවා ති යථාභූතං පජානාති. අයං ආසවසමුදයොති යථාභූතං පජානාති. අයං ආසව-නිරොධොති යථාභූතං පජානාති. අයං ආසවනිරොධගාමිනී-පටිපදාති යථාභූතං පජානාති.

තස්ස එවං ජානතො[1] එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති භවාසවාපි චිත්තං විමුච්චති අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති.

78. සෙය්‍යථාපි මාණව පබ්බතසඞ්ඛෙපෙ උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො තත්ථ චක්ඛුමා පුරිසො තීරෙ ඨිතො පස්සෙය්‍ය සිප්පිසම්බුකම්පි සක්ඛරකඨලම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පි තස්ස එවමස්ස: අයං ඛො උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො තත්‍රිමෙ සිප්පිසම්බුකා පි සක්ඛර-කඨලාපි මච්ඡගුම්බාපි චරන්තිපි තිට්ඨන්තිපීති. එවමෙව ඛො මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති.

යම්පි මාණව භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති ඉදම්පිස්ස හොති පඤ්ඤාය.

අයං ඛො මාණව සො[2] අරියො පඤ්ඤාක්ඛන්ධො[3] යස්ස සො භගවා වණ්ණවාදී අහොසි යත්ථ ච ඉමං ජනතං සමාදපෙසි නිවෙසෙසි පතිඨාපෙසි[4]. නත්ථි චෙවෙත්ථ උත්තරිං[5] කරණීයන්ති.

79. අච්ඡරියං භො ආනන්ද අබ්භූතං භො ආනන්ද. සො චායං භො ආනන්ද අරියො පඤ්ඤාක්ඛන්ධො පරිපුණ්ණො නො අපරිපුණ්ණො. එවං පරිපුණ්ණඤ්චාහං භො ආනන්ද අරියං පඤ්ඤාක්ඛන්ධං ඉතො බහිද්ධා අඤ්ඤෙසු සමණබ්‍රාහ්මණෙසු න සමනුපස්සාමි. නත්ථිචෙවෙත්ථ[6] උත්තරිං[5] කරණීයන්ති.

1. පජානතො B.
2. සො ති නත්ථි W.
3. පඤ්ඤා° B.
4. පතිට්ඨපෙසි W.
5. උත්තරි B.
6. නත්ථි නො කිඤ්චි B. S.

77. හේතෙමේ මේ දුක යයි තතු ලෙස දැනගණී, මේ දුක් ඉපදීමේ හෙතුව යයි තතු ලෙස දැනගණී, මේ දුඃඛනිරොධ යයි තතු ලෙස දැනගණී, මේ දුඃඛනිරොධගාමී ප්‍රතිපදාව යයි තතු ලෙස දැනගණී. මේ ආශ්‍රවයෝ යයි තතු ලෙස දැනගණී, මේ ආශ්‍රවසමුදයයි තතු ලෙස දැනගණී, මේ ආශ්‍රවනිරොධ යයි තතු ලෙස දැනගණී, මේ ආශ්‍රවනිරොධගාමී ප්‍රතිපදාව යයි තතු ලෙස දැනගණී.

මෙසේ දක්නා මෙසේ දන්නා ඔහුගේ සිත කාමාශ්‍රවයන් කෙරෙන් ද මිදේ, භවාශ්‍රවයන් කෙරෙන් ද සිත මිදේ, අවිද්‍යාශ්‍රවයන් කෙරෙන් ද සිත මිදේ. මිදුනු කල්හි 'මිදුනේය' යන සිතවෙයි. 'ජාතිය ක්‍ෂය වීය, බ්‍රහ්මචර්‍ය්‍යය වැස නිමවන ලදී, කටයුතු කරණලදී, මේ අත්බැවින් පසු අනික් අත්බවෙක් නැතැ'යි ද දැනගණී.

78. මාණවකය, යම්සේ පර්වත මස්තකයෙක පිරිසුදු, පැහැදුනු, නොකැලඹුනු දියවිලක් වේද, එහි ඉවුරේ ඇස් ඇති පුරුෂයෙක් සිටියේ සිප්පි බෙල්ලන් හා සක් බෙල්ලන් ද, කැටකැබිලිති ද, එහා මෙහා යන්නාවූ හා නැවති සිටින මසුන් රැන් ද, හැසිරෙන්නවුන් ද, නැවති තිබෙන දෑද, දක්නේය. ඔහුට මෙසේ සිතේ: මේ දියවිල පිරිසුදුය, ඉතා පැහැදිලිය, නොකැලඹුනේය, එහි මේ සිප්පි බෙල්ලන් හා සක් බෙල්ලන් ද, කැටකැබිලිති ද, මසුන් රැන් ද හැසිරෙත්, නැවති සිටිත්ය කියායි. මාණවකය, එලෙසින් ම භික්‍ෂුව මෙසේ සිත එකඟ වූ කල්හි, —පෙ— කටයුතු කරණ ලදී, මේ අත් බැවින් පසු අනික් අත් බවෙක් නැතැයි ද දැනගණී.

මාණවකය, යම්සේ භික්‍ෂුව මෙසේ සිත එකඟවූ කල්හි —පෙ— කටයුතු කරණලදී, මේ අත් බැවින් පසු අනික් අත්බවෙක් නැතැයි දැනගණීද, මෙද ඔහුගේ ප්‍රඥාව පිණිස වේ.

මෙමණවිය, ඒ භාග්‍යවතුන් වහන්සේ යමකගේ ගුණ කියන සුලුවූ සේක් ද, යමක් කෙරෙහි මේ ජනසමූහයා සමාදන්කාරවූ සේක් ද, නිවෙසනය කරවූ සේක් ද, පිහිටුවූ සේක් ද, මේ එනාහි ඒ ආර්‍ය්‍ය වූ ප්‍රඥාස්කන්ධයයි. මෙයින් මතු කටයුතු වූ අනිකෙක් නැත්තේමය.

79. පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, ආශ්චර්‍ය්‍යයි, පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, අද්භූතයි. පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, ආර්‍ය්‍ය වූ ප්‍රඥාස්කන්ධය සම්පූර්ණ වූයේ වෙයි, අපරිපූර්ණ වූයේ නොවෙයි. මෙසේ හැම පසින් පරිපූර්ණවූ ආර්‍ය්‍ය වූ ප්‍රඥාස්කන්ධයක් මේ බුදුසස්නෙහි හැර අන්‍යවූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් අතුරෙහි මම නොදකිමි. මෙහි මෙයින් මතු කටයුතු වූ අනිකෙක් නැත්තේමය.

40. අභික්කන්තං භො ආනන්ද, අභික්කන්තං භො ආනන්ද. සෙය්‍යථාපි භො ආනන්ද නික්කුජ්ජිතං[1] වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛන්තීති.[2] එවමෙව භො[3] භොතා ආනන්දෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො.

එසාහං භො ආනන්ද භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ආනන්දො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

සුභසුත්තං නිට්ඨිතං දසමං[4]

1. නිකුජ්ජිතං B.
2. දක්ඛින්තිති B. S.
3. බො ති නත්ථි S.
4. සුභසුත්තන්තං P.

80. පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, (ඔබවහන්සේගේ දේශනාව) සුන්දරයි. පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, (දේශනාව) ඉතා මැනව. පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, යටිකුරු කරන ලද දෙයක් උඩුකුරු කරන්නේ යම්සේ ද, වසන ලද දෙයක් විවෘත කරන්නේ යම්සේ ද, මං මුළා වූවෙකුට මාර්ගය කියන්නේ යම්සේ ද, ඇස් ඇත්තෝ රූප දකිත්වා යි අඳුරෙහි තෙල් පහනක් දරන්නේ (දල්වන්නේ) යම්සේ ද, එපරිද්දෙන් පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය ප්‍රකාශ කරන ලදී.

පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, මේ මම ඒ භාග්‍යවත් ගෞතමයාණන් වහන්සේ ද, ධර්මය ද, භික්ෂුසඞ්ඝයා ද සරණ කොට යෙමි. අද පටන් දිවිහිම්කොට තෙරුවන් සරණ ගිය උපාසකයකු කොට පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ මා සලකන සේක්වා.

දසවැනි සුභ සූත්‍රය නිමියේය.

11. කෙවට්ට සුත්තං

1. එවං මෙ සුතං. එකං සමයං භගවා නාලන්දායං[1] විහරති පාවාරිකම්බවනෙ[2]. අථ ඛො කෙවට්ටො[3] ගහපතිපුත්තො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි.

එකමන්තං නිසින්නො ඛො කෙවට්ටො ගහපතිපුත්තො භගවන්තං එතදවොච: අයං භන්තෙ නාලන්දා ඉද්ධා චෙව ඵීතා ච බහුජනා ආකිණ්ණමනුස්සා භගවති අභිප්පසන්නා. සාධු භන්තෙ භගවා එකං භික්ඛුං සමාදිසතු යො උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරිස්සති. එවායං නාලන්දා භිය්‍යොසොමත්තාය භගවති අභිප්පසීදිස්සතීති.

2. එවං වුත්තෙ භගවා කෙවට්ටං ගහපතිපුත්තං එතදවොච: න ඛො අහං කෙවට්ට භික්ඛූනං එවං ධම්මං දෙසෙමි: එථ තුම්හෙ භික්ඛවෙ ගිහීනං ඔදාතවසනානං උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරොථාති.

3. දුතියම්පි ඛො කෙවට්ටො ගහපතිපුත්තො භගවන්තං එතදවොච: නාහං භන්තෙ භගවන්තං ධංසෙමි[4]. අපි ච එවං වදාමි: අයං භන්තෙ නාලන්දා ඉද්ධා චෙව ඵීතා ච බහුජනා ආකිණ්ණමනුස්සා භගවති අභිප්පසන්නා. සාධු භන්තෙ භගවා එකං භික්ඛුං සමාදිසතු යො උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරිස්සති. එවායං නාලන්දා භිය්‍යොසොමත්තාය භගවති අභිප්පසීදිස්සතීති.

දුතියම්පි ඛො භගවා කෙවට්ටං ගහපතිපුත්තං එතදවොච: න ඛො අහං කෙවට්ට භික්ඛූනං එවං ධම්මං දෙසෙමි: එථ තුම්හෙ භික්ඛවෙ ගිහීනං ඔදාතවසනානං උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරොථාති.

4. තතියම්පි ඛො කෙවට්ටො ගහපතිපුත්තො භගවන්තං එතදවොච: නාහං භන්තෙ භගවන්තං ධංසෙමි. අපි ච එවං වදාමි: අයං භන්තෙ නාලන්දා ඉද්ධා චෙව ඵීතා ච බහුජනා ආකිණ්ණමනුස්සා භගවති අභිප්පසන්නා. සාධු භන්තෙ භගවා එකං භික්ඛුං සමාදිසතු යො උත්තරිමනුස්සධම්මා ඉද්ධිපාටිහාරියං කරිස්සති. එවායං නාලන්දා භිය්‍යොසොමත්තාය භගවති අභිප්පසීදිස්සතීති.

---

1. නාලන්දා° W. S. C. (සබ්බත්ථ)
2. පවාරික Pa.
3. කෙවද්ධො P. (සබ්බත්ථ) කෙවඩ්ඩො Pa.
4. ධපෙසිං S. ධම්මං දෙසෙමි Pa.

11. කෙවට්ට සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලද්දේ ය. එක් කලෙක බුදුරජාණන් වහන්සේ නාලන්දාවෙහි වූ පාවාරික 'නම් අඹ උයන්හි වෙසෙන සේක. එකල්හි කෙවට්ට නම් ගැහැවි දරු–වෙක් බුදුරජාණන් වහන්සේ වෙත එළඹියේය. එළඹ භාග්‍ය-වතුන් වහන්සේට අභිවාදනය කොට එකත් පසෙක හුන්නේය.

එකත් පසෙක හුන් කෙවට්ට ගැහැවිදරු බුදුරජාණන් වහන්සේට මෙසේ කීය: වහන්ස, මේ නාලන්දාව සමෘද්ධය, දියුණුය, බොහෝ මිනිසුන්ගෙන් ආකීර්ණය. මිනිස්සු භගවත්හු කෙරෙහි අතිශයින් පැහැදුනෝය. වහන්ස, උතුරු මිනිස් දහ-මින් ප්‍රාතිහාර්‍ය පවත්වන තනතුරට භාග්‍යවතුන්වහන්සේ එක් භික්ෂුවක් පත්කරන්නේ නම් ඒ ඉතා මැනව. එසේ කළහොත් මේ නාලන්දාව වැඩිවැඩියෙන් භගවත්හු කෙරෙහි පහදින්නේය.

2. මෙසේ සැලකළ කල්හි කෙවට්ට ගැහැවිදරුවාට බුදුහු මෙසේ වදාළහ: කෙවට්ටය, මම වනාහි 'මහණෙනි, එවූ, තෙපි සුදුහඳින ගිහියන්ට උතුරු මිනිස් දහමින් සෘද්ධි පෙළහර කරවූ'යි භික්ෂූන්ට දහම් නොදෙසමි.

3. දෙවනවරට ද කෙවට්ට ගැහැවිදරු භගවත්හට මෙසේ කීය: වහන්ස, මම භාග්‍යවතුන්වහන්සේ ගුණ නැසු-මෙන් පහත හෙලනු කැමැත්තේ නොවෙමි. එහෙත් මෙසේ කියමි: 'වහන්ස, මේ නාලන්දාව සමෘද්ධය, දියුණුය, බොහෝ මිනිසුන්ගෙන් පිරිණි. බොහෝ මිනිස්සු භගවත්හු කෙරෙහි අතිප්‍රසන්නය. ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේ උතුරු මිනිස් දහමින් පෙළහර පවත්වන තනතුරට එක් භික්ෂුවක් පත් කරන සේක්වා. ඒ ඉතා මැනව. එසේ කළහොත් මේ නාලන්දාව වැඩි වැඩියෙන් භගවත්හු කෙරෙහි පහදින්නේය.'

දෙවනවරට ද භගවත්හු කෙවට්ට ගැහැවිදරුවාට මෙසේ කීය: කෙවට්ටය, මම වනාහි, 'මහණෙනි, එවූ, තෙපි සුදු හඳින ගිහියන්ට උතුරු මිනිස් දහමින් සෘද්ධිපෙළහර කරවූ'යි මෙසේ භික්ෂූන්ට දහම් නො දෙසමි.

4. තෙවෙනිවරට ද කෙවට්ට ගැහැවිදරු භගවත්හට මෙසේ සැලකෙළේය: "වහන්ස, මම භාග්‍යවතුන්වහන්සේ ගුණ නැසුමෙන් පහත හෙලනු කැමැත්තේ නොවෙමි. එහෙත් (එයට සෘජු විරුද්ධ අදහසින්) මෙසේ කියමි: 'වහන්ස, මේ නාලන්දාව සමෘද්ධය, දියුණුය, බොහෝ මිනිසුන්ගෙන් පිරිණි. බොහෝ මිනිස්සු භගවත්හු කෙරෙහි මහත්සේ පැහැදුනාහ. ස්වාමීනි, උතුරුමිනිස්දහමින් පෙළහර පවත්වන තනතුරට භාග්‍යවතුන් වහන්සේ එක් භික්ෂුවක් පත්කරන සේක්වා. ඒ ඉතා මැනව. එසේ කළහොත් මේ නාලන්දාව වැඩිවැඩියෙන් භගවත්හු කෙරෙහි පහදින්නේය.'

5. තීණි ඛො ඉමානි කෙවට්ට පාටිහාරියානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානි. කතමානි තීණි? ඉද්ධිපාටිහාරියං ආදෙසනාපාටිහාරියං අනුසාසනීපාටිහාරියං[1].

6. කතමඤ්ච කෙවට්ට ඉද්ධිපාටිහාරියං? ඉධ කෙවට්ට භික්ඛු අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති. එකොපි හුත්වා බහුධා හොති බහුධා පි හුත්වා එකො හොති ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ පඨවියාපි[2] උම්මුජ්ජනිමුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ උදකෙපි අභිජ්ජමානෙ[3] ගච්ඡති සෙය්‍යථාපි පඨවියං[4] ආකාසෙපි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො ඉමෙපි චන්දිමසූරියෙ එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරිමසති පරිමජ්ජති යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.

තමෙනං අඤ්ඤතරො සද්ධො පසන්නො පස්සති තං භික්ඛුං අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොන්තං එකොපි හුත්වා බහුධා හොන්තං බහුධාපි හුත්වා එකො හොන්තං ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානං ගච්ඡන්තං සෙය්‍යථාපි ආකාසෙ පඨවියාපි[5] උම්මුජ්ජනිමුජ්ජං කරොන්තං සෙය්‍යථාපි උදකෙ උදකෙපි අභිජ්ජමානෙ[6] ගච්ඡන්තං සෙය්‍යථාපි පඨවියං[4] ආකාසෙපි පල්ලඞ්කෙන කමන්තං සෙය්‍යථාපි පක්ඛී සකුණො ඉමෙපි චන්දිමසූරියෙ එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරිමසන්තං පරිමජ්ජන්තං යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙන්තං.

7. තමෙනං සො සද්ධො පසන්නො අඤ්ඤතරස්ස අස්සද්ධස්ස අප්පසන්නස්ස ආරොචෙති: අච්ඡරියං වත භො අබ්භුතං වත භො සමණස්ස මහිද්ධිකතා මහානුභාවතා. අමාහං භික්ඛුං අද්දසං අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොන්තං එකොපි හුත්වා බහුධා හොන්තං බහුධාපි හුත්වා එකො හොන්තං -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙන්තන්ති.

---

1. අනුසාසනී° P. (සබ්බත්ථ)
2. පඨ° B. V. (සබ්බත්ථ)
3. °මානො P .V. W.
4. පඨවියා S.
5. පිකාරො නත්ථි S.
6. °මානො W. °මානං P.

5. කෙවට්ටය, මා විසින් ම විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්‍ෂකොට දෙශනා කරන ලද මේ ප්‍රාතිහාර්‍ය්‍ය තුනෙකි. ඒ (පෙළහර) තුන කවරේද? ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍යය, ආදෙශනා ප්‍රාතිහාර්‍ය්‍යය, අනුශාසන ප්‍රාතිහාර්‍ය්‍යය (යන තුනයි.)

6. කෙවට්ටය, ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍යය යනු කවරයත්: කෙවට්ටය, මේ සස්නෙහි මහණෙක් නන් වැදෑරුම් ඍද්ධි විධි අනුභව කෙරෙයි. (කෙසේද?) එකෙක්ව ද බොහෝ දෙනෙක් වෙයි. බොහෝ දෙනෙක්ව ද එකෙක් වෙයි. ප්‍රකටබවට, මුවහ-බවට යෙයි. අහසෙහි මෙන් නොගැටෙමින් බිත්තියෙන් සරසට, ප්‍රාකාරයෙන් සරසට, පර්වතයෙන් සරසට යෙයි. දියෙහි මෙන් පොළොවෙහි ගිලීම් කිමිදීම් කෙරෙයි. පොළො-වෙහි මෙන් දියෙහි ද (දිය) නොබිඳිමින් යෙයි. පියාපත් විදහා ගත් පක්‍ෂියකු මෙන් අහසෙහිද පලක් බැඳ හිඳී. මෙපමණ මහත් ඍද්ධි ඇති මෙපමණ මහත් ආනුභාව ඇති මේ සඳහිරු පවා අත්ලෙන් අතගායි, පිරිමදියි. බඹලොව තෙක් කයින් වසඟබව පවත්වයි.

සැදැහැති, පැහැදුනාවූ එකෙක්, නොයෙක් ඍද්ධිවිධ බුක්ති විඳින, එකෙකු ව ද බොහෝ දෙනෙකු වන, බොහෝ දෙනෙකු ව ද එකෙකු වන, කලඑළියට යන, මුවහමට යන, නොගැටෙමින් අහසේ මෙන් බිත්ති අතරින් යන, පවුරු අතරින් යන, පර්වත අතරින් යන, පොළොවෙහි ද ජලයෙහි මෙන් ගිලීම් කිමිදීම් කරන, ජලයෙහි ද පොළොවෙහි මෙන් (දිය) නොබිඳිමින් යන, පියා විදහාගත් පක්‍ෂියකු මෙන් අහසෙහි ද පලක් බැඳ හිඳින, මෙතරම් මහත් ඍද්ධි ඇති මහත් ආනුභාව ඇති සඳ හිරු පවා අත්ලෙන් පිරිමසින, පිරිමදින, බඹලොව තෙක් කයින් වසඟබව පවත්වන මේ භික්‍ෂුව දකී.

7. ඒ සැදැහැති පැහැදුනු තැනැත්තෙක් මේ කාරණය සැදැහැ නැති නො පැහැදුනු ' එකකුට (මෙසේ) කියයි: 'භවත්, ශ්‍රමණයාගේ මහත් ඍද්ධි ඇති බව, මහත් ආනුභාව ඇති බව, එකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයි එකාන්තයෙන් අද්භූතයි. මම මේ භික්‍ෂුව, නන්වැදෑරුම් ඍද්ධිවිශෙෂ වළඳන්නහු, එකකු ව ද බොහෝ දෙනකු වන්නහු, බොහෝ දෙනකුව ද එකකු වන්නහු —පෙ— බඹලොව තෙක් කයින් වසඟබව පවත්-වන්නහු දිටිමි' (කියායි).

තමෙනං සො අස්සද්ධො අප්පසන්නො තං සද්ධං පසන්නං එවං වදෙය්‍ය: අත්ථි ඛො භො ගන්ධාරී නාම විජ්ජා. තාය සො භික්ඛු අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති එකොපි හුත්වා බහුධා හොති-පෙ[1]-යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙතීති.

තං කිං මඤ්ඤසි කෙවට්ට? අපි නු සො අස්සද්ධො අප්පසන්නො තං සද්ධං පසන්නං එවං වදෙය්‍යාති?

වදෙය්‍ය භන්තෙති.

ඉමං ඛො අහං කෙවට්ට ඉද්ධිපාටිහාරියෙ ආදීනවං[2] සම්පස්සමානො ඉද්ධිපාටිහාරියෙන අට්ටියාමි හරායාමි ජිගුච්ඡාමි.

8. කතමඤ්ච කෙවට්ට ආදෙසනාපාටිහාරියං?

ඉධ කෙවට්ට භික්ඛු පරසත්තානං පරපුග්ගලානං චිත්තම්පි ආදිසති චෙතසිකම්පි ආදිසති විතක්කිතම්පි ආදිසති විචාරිතම්පි ආදිසති: එවම්පි තෙ මනො ඉත්ථම්පි තෙ මනො ඉතිපි තෙ චිත්තන්ති.

තමෙනං අඤ්ඤතරො සද්ධො පසන්නො පස්සති තං භික්ඛුං පරසත්තානං පරපුග්ගලානං චිත්තම්පි ආදිසන්තං චෙතසිකම්පි ආදිසන්තං විතක්කිතම්පි ආදිසන්තං විචාරිතම්පි ආදිසන්තං: එවම්පි තෙ මනො ඉත්ථම්පි තෙ මනො ඉතිපි තෙ චිත්තන්ති.

තමෙනං සො සද්ධො පසන්නො අඤ්ඤතරස්ස අස්සද්ධස්ස අප්පසන්නස්ස ආරොචෙති: අච්ඡරියං වත භො අබ්භුතං වත භො සමණස්ස මහිද්ධිකතා මහානුභාවතා. අමාහං භික්ඛුං අද්දසං පරසත්තානං පරපුග්ගලානං චිත්තම්පි ආදිසන්තං චෙතසිකම්පි ආදිසන්තං විතක්කිතම්පි ආදිසන්තං විචාරිතම්පි ආදිසන්තං එවම්පි තෙ මනො ඉත්ථම්පි තෙ මනො ඉතිපි තෙ චිත්තන්ති.

තමෙනං සො අස්සද්ධො අප්පසන්නො තං සද්ධං පසන්නං එවං වදෙය්‍ය. අත්ථි ඛො භො මණිකා[3] නාම විජ්ජා. තාය සො භික්ඛු පරසත්තානං පරපුග්ගලානං චිත්තම්පි ආදිසති චෙතසිකම්පි ආදිසති විතක්කිතම්පි ආදිසති විචාරිතම්පි ආදිසති එවම්පි තෙ මනො ඉත්ථම්පි තෙ මනො ඉතිපි තෙ චිත්තන්ති.

---

1. පෙති නත්ථි S. 2. ආදීතවං B. (සබ්බත්ථ)

3. මණීකා P.

ඒ සැදැහැති නොපැහැදුනු තැනැත්තා, ඒ සැදැහැති ප්‍රසන්නයාට මෙසේ කියන්නේය: 'භවත, ගන්ධාරි නම් විජ්ජාවක් ඇත්තේය. ඒ විජ්ජාවෙන් ඒ භික්ෂුව නානාවැදෑරුම් සෘද්ධි විශේෂයන් වලඳයි. එකෙක්ව ද බොහෝ අයුරින් වෙයි, බොහෝ දෙනෙක් ව ද එකෙක් වෙයි. —පෙ— බඹලොව තෙක් කයින් වසඟබව පවත්වයි' (කියායි).

කෙවට්ටය, තුඹ කෙසේ සිතන්නෙහි ද? ඒ අශ්‍රද්ධාවත් අප්‍රසන්නයා ඒ ශ්‍රද්ධාවත් ප්‍රසන්නයාට එසේ නොකියන්නේ ද?

වහන්ස, කියන්නේය.

කෙවට්ටය, මම මනාහි සෘද්ධි ප්‍රාතිහාර්‍යයෙහි මේ දොෂය දක්නෙම් සෘද්ධිප්‍රාතිහාර්‍ය කෙරෙහි පිඩිත වෙමි, ලජ්ජිත වෙමි, ජුගුප්සිත වෙමි.

8. කෙවට්ටය, ආදෙශනාප්‍රාතිහාර්‍යය නම් කවරයයත්:

කෙවට්ටය, මෙලෙව්හි මහණෙක් අන්‍ය සත්ත්වයන්ගේ අන්‍ය පුද්ගලයන්ගේ සිත ද කියයි (ගෙනහැරපායි), සිතිවිල්ල ද කියයි, විතර්කය ද කියයි, විචාරිතය ද කියයි. (කෙසේද?) 'තාගේ සිත (සොම්නස් දොම්නස් ආදී වශයෙන්) මෙසේය, තාගේ සිත මේ අයුරු ය, තාගේ සිත (සිතීම ආදී වශයෙන්) මෙසේය' (කියායි).

එක්තරා සැදැහැති පැහැදුනු තැනැත්තෙක් ඒ භික්ෂුව 'තාගේ සිත මෙසේය, තාගේ සිත මේ අයුරුය, තාගේ සිත මේය'යි අන්‍ය සත්ත්වයන්ගේ අන්‍ය පුද්ගලයන්ගේ සිත කියන බව සිතිවිලි කියන බව, විතර්කය කියන බව, විචාරිතය කියන බව දකියි.

ඒ ශ්‍රද්ධාවත් ප්‍රසන්නයා අන්‍යතර අශ්‍රද්ධාවත් අප්‍රසන්නයකුට ඒ කරුණ කියයි: 'භවත, ශ්‍රමණයාගේ මහත් සෘද්ධි ඇති බව මහත් ආනුභාව ඇති බව එකාන්තයෙන් ආශ්චර්යය. භවත, එකාන්තයෙන් අද්භූත ය. මම අසුවල් භික්ෂුව 'තාගේ සිත මෙසේය, තාගේ සිත මේ අයුරුය, තාගේ සිත මේය'යි අන්‍ය සත්ත්වයන්ගේ අන්‍ය පුද්ගලයන්ගේ සිත කියනබව, සිතිවිලි කියන බව, විතර්ක කියන බව, විචාර කියන බව දිටිමි' කියායි.

එ අශ්‍රද්ධාවත් අප්‍රසන්නයා ශ්‍රද්ධාවත් ඒ ප්‍රසන්නයාට මෙසේ කියන්නේය. 'භවත, මණිකා නම් විජ්ජාවක් ඇත්තේය. ඒ භික්ෂුව ඒ විද්‍යාවෙන්, 'තාගේ සිත මෙසේය, තාගේ සිත මේ අයුරුය, තාගේ සිත මේය'යි අන්‍ය සත්ත්වයන්ගේ අන්‍ය පුද්ගලයන්ගේ සිත කියයි, චෛතසික කියයි, විතර්ක කියයි, විචාරිත කියයි' (යනුවෙනි).

තං කිං මඤ්ඤසි කෙවට්ට? අපි නු සො අස්සද්ධො අප්පසන්නො තං සද්ධං පසන්නං එවං වදෙය්‍යාති?

වදෙය්‍ය භන්තෙති.

ඉමං ඛො අහං කෙවට්ට ආදෙසනාපාටිහාරියෙ ආදීනවං සම්පස්සමානො ආදෙසනාපාටිහාරියෙන අට්ටියාමි හරායාමි ජිගුච්ඡාමි.

9. කතමඤ්ච කෙවට්ට අනුසාසනීපාටිහාරියං? ඉධ කෙවට්ට භික්ඛු එවමනුසාසති: එවං විතක්කෙථ මා එවං විතක්කයිත්ථ එවං මනසිකරොථ මා එවං මනසාකත්ථ ඉදං පජහථ ඉදං උපසම්පජ්ජ විහරථාති. ඉදං වුච්චති කෙවට්ට අනුසාසනීපාටිහාරියං.

10. පුන ච පරං කෙවට්ට ඉධ තථාගතො ලොකෙ උප්පජ්ජති[1] අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි[2] සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා.[3] සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති.

11. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ[4] පච්චාජාතො.[5] සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසංචික්ඛති: සම්බාධො ඝරාවාසො රජොපථො[6] අබ්භොකාසො පබ්බජ්ජා.

නයිදං[7] සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සංඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති.[8]

---

1. උපපජ්ජති B. V. උප්පජ්ජතිපි S.
2. °සාරථි B. S.
3. භගවාති S.
4. අඤ්ඤතරස්මිං වා පච්චා° W.
5. පච්ජා° S; පච්චා° Sa.
6. රජාපථො S. C. රජො° Sa.
7. න ඉදං C. P.
8. පබ්බජ්ජෙය්‍යන්ති P.

කෙවට්ටය, නුඹ කෙසේ සිතන්නෙහි ද? ඒ අශ්‍රද්ධාවත් අප්‍රසන්නයා ඒ ශ්‍රද්ධාවත් ප්‍රසන්නයාට මෙසේ නොකියන්නේ ද?

වහන්ස, කියන්නේ ය.

කෙවට්ටය, මම ආදේශනා ප්‍රාතිහාර්‍ය්‍යයෙහි මේ දෝෂය දක්නෙම් ආදේශනාප්‍රාතිහාර්‍ය්‍ය ගැන පීඩිත වෙමි, ලජ්ජිත වෙමි, ජුගුප්සිත වෙමි.

9. කෙවට්ටය, අනුශාසනාප්‍රාතිහාර්‍ය්‍යය නම් කවරයත්: කෙවට්ටය, මෙලෙව්හි මහණෙක් මෙසේ අනුශාසනාය කෙරෙයි: (කෙසේද?) මෙසේ කල්පනා කරවූ, මෙසේ කල්පනා නො කරවූ, මෙසේ මෙනෙහි කරවූ, මෙසේ මෙනෙහි නොකරවූ; මෙය දුරුකරවූ, මෙයට පැමිණ වසවූ' යනාදි වශයෙනි. කෙවට්ටය, මෙය අනුශාසනප්‍රාතිහාර්‍ය්‍යයයි කියනු ලැබේ.

10. කෙවට්ටය, නැවත අනිකක් ද කියමි. අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, අෂ්ටවිද්‍යා පසළොස් චරණධර්මයන් ගෙන් යුක්තවූ, යහපත් ගති ඇත්තාවූ, සියලු ලෝකයන් දන්නා සුළුවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි ශ්‍රේෂ්ඨවූ රියැදුරකු වැනිවූ, දෙවිමිනිසුන්ට ශාස්තෲවූ, සිව්සත් දම් අවබෝධ කළාවූ, භාග්‍යවත් වූ, තථාගත කෙනෙක් මෙලොව උපදනාහ. ඒ තථාගත තෙමෙ දෙවියන් සහිත වූ, මාරයන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, දෙවිමිනිසුන් (රජුන් හා මිනිසුන්) සහිතවූ, සත්ත්වවර්ගයා සවකීය විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කෙරේ. ඒ (තථාගතයන් වහන්සේ) මුල යහපත්වූ, මැද යහපත්වූ, කෙළවර යහපත්වූ, (සතර සතිපට්ඨානාදිය ඇසුරු කළ හෙයින්) අර්ථ සහිතවූ, (දශවිධ ව්‍යඤ්ජන නොපිරිහෙළා වදරණ හෙයින්) ව්‍යඤ්ජන සහිතවූ, සියලු ලෙසින් සම්පූර්ණවූ, පිරිසුදුවූ; සකල ශාසනමාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව ගෙන හැර දක්වති.

11. ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපතිපුත්‍රයෙක් හෝ අන් කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක් හෝ අසයි. හෙතෙම ඒ දහම් අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කෙරෙයි. හෙතෙම ඒ ශ්‍රද්ධාලාභයෙන් යුක්ත වූයේ මෙසේ සලකන්නේය: 'ගෘහවාසය පීඩා සහිතයි. රාගාදි රජස ගැවසි මාර්ගයෙකි. පැවිද්ද විනාහි අබ්භොකාසය මෙනි (කිසිවක් නොමැති අවකාසය මෙන් නිදහස්ය).

ගිහිගෙයි වසන්නහු විසින් සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, සියලු ආකාරයෙන් පිරිසිදුවූ, ලියවූ සකක් වැනි (සංඛලිඛිතවූ), මෙම බඹසර හැසිරෙන්නට නොහැක්කේය. මම කෙස් දැළි රැවුලු හරවා, කසාවත් හැඳ, ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවන්නෙම් නම් (ඒකාන්තයෙන්) ඉතා මැනවැයි' කියායි.

12. සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති[1]. සො[2] එවං පබ්බජිතො සමානො පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු කායකම්මවචීකම්මෙන සමන්නාගතො කුසලෙන පරිසුද්ධාජීවො සීලසම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො සන්තුට්ඨො.

13. කථඤ්ච මාණව භික්ඛු සීලසම්පන්නො හොති? ඉධ මාණව භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බ-පාණභූතහිතානුකම්පී විහරති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති. ඉදම්පිස්ස හොති සීලස්මිං. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී[3] විරතො මෙථුනා ගාමධම්මා. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. පබ්බජ්ජති P. 2. සො ඉති න දිස්සති P.

3. අනාචාරී B.

12. හෙතෙම පසු කාලයෙක ස්වල්පවූ හෝ බොහෝවූ හෝ භෝග රාශිය හැර, ස්වල්පවූ හෝ බොහෝවූ නෑපිරිස් හැර, කෙස් දැළිරැවුලු හරවා, කසාවස්ත්‍රයන් හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වේ. මෙසේ පැවිදිවූ හෙතෙම ප්‍රාතිමොක්ඛසංවරයෙන් යුක්ත වූයේ, ආචාර ගොචර දෙකින් යුක්ත වූයේ, ස්වල්පවූත් අකුසල් විෂයෙහි භය දක්නාසුලු වූයේ, යහපත්වූ කාය වාක් කර්මයන් යුක්ත වූයේ, ශික්ෂාපද සමාදන්ව එහි මොනවට හික්මෙයි. පිරිසුදුවූ දිවි පැවැත්ම් ඇත්තේ වෙයි. (ත්‍රිවිධ) ශීලයෙන් යුක්ත වූයේ වෙයි. ඉන්ද්‍රිය විෂයෙහි වැසූ දොරටු ඇත්තේ වෙයි. බොජුනෙහි පමණ දන්නේ වෙයි. මනා සිහියෙන් හා සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයි. (සිවුපසය පිළිබඳ යථාලාභ) සන්තොෂයෙන් යුක්ත වෙයි.

13. මාණවකය, මහණ තෙමේ කෙසේනම් සීලසම්පන්න වේද? මාණවකය, මේ සස්නෙහිවූ මහණතෙමේ ප්‍රාණවධය හැර ඉන් වැළැක්කේ වේ. බහා තබන ලද දඬු ඇත්තේ, බහා තබන ලද අවි ඇත්තේ, පව් කිරීමෙහි ලජ්ජා ඇත්තේ, කරුණාවත් වූයේ, සියලු ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පීව වෙසේ. මෙසේ මේ (ප්‍රාණ වධයෙන් වෙන්වීමේ සීලය) ද ඒ මහණහුගේ සීලය පිණිස වේ.

(හෙතෙම) නොදුන් දෙය ගැනීමෙන් වෙන්ව, එයින් විශෙෂයෙන් වැළැක්කේ, දුන් දෙයම ගන්නේ, දුන් දෙයම කැමැති (බලාපොරොත්තු) වන්නේ, සොර නොවූ, පිරිසුදුවූ (ආත්මභාවයෙන්) සිතින් යුක්තව වාසය කෙරේ. මෙසේ ඒ (අදත්තාදානයෙන් වෙන්වීමේ සීලය) ද ඒ මහණහුගේ සීලය පිණිස වේ. අබ්‍රහ්මචර්‍ය්‍යාව හැර, බඹසර නොවන හැසිරීමෙන් දුරුවූ පැවතුම් ඇත්තේ, ස්ත්‍රීපුරුෂසංසර්ගය නම්වූ ග්‍රාමධර්මයෙන් වෙන් වූයේ බ්‍රහ්මචාරී වේ. මෙසේ ඒ (කාමාසවාද විරතිය පිළිබඳවූ සීලය) ද ඔහුගේ සීලය පිණිස වේ.

මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති[1] සච්චවාදී සච්චසන්ධො ථෙතො[2] පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. ඉදම්පිස්ස හොති සීලස්මිං. පිසුණං වාචං[3] පහාය පිසුණාය වාචාය පටිවිරතො හොති. ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය. අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා[4] සමග්ගාරාමො[5] සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති[6]. ඉදම්පිස්ස හොති සීලස්මිං.

ඵරුසං[7] වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති. යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා[8] හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා තථාරූපං[9] වාචං භාසිතා හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති. කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා හොති[6] කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං[10]. ඉදම්පිස්ස හොති සීලස්මිං.

14. බීජගාමභූතගාමසමාරම්භා[11] පටිවිරතො හොති[12]. එකභත්තිකො හොති රත්තූපරතො[13] පටිවිරතො[14] විකාලභොජනා. නච්චගීතවාදිතවිසූකදස්සනා[15] පටිවිරතො හොති. මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතො හොති. උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ජාතරූපරජතපටිග්ගහණා[16] පටිවිරතො හොති.

1. පටිවිරතො සමණො ගොතමො P.
2. ඨෙතො S; ථෙතො Sa.
3. පිසුණාවාචං P. W.
4. අනුප්පා° P.
5. සමග්ගරාමො B. Ca.
6. හොතීති න දිස්සති P.
7. ඵරුසාවාචං P. W.
8. පෙමනීයා B.
9. °රූපිං P.
10. °සඤ්හිතං B.
11. °සමාරබ්භා B. V.
12. හොති—ප�ෙ—එක° B. V.
13. රත්තූපරතො B.
14. විරතො P. S. C.
15. °විසූක° B.
16. °ප්පටිග්ගහණා V. (සබ්බත්ථ)

බොරු කීමෙන් දුරුව, ඉන් විශේෂයෙන් වැළැක්කේ, සැබෑ තෙපුල් කියන්නේ, සැබැවින් සැබව ගළපන සුලුවූයේ, ස්ථිර කථා ඇත්තේ, ඇදහිය යුතු තෙපුල් ඇත්තේ, ලෝකයා අතර විරුද්ධ කථා ඇති නොකෙරේ. මෙසේ (බොරු කීමෙන් වැළකීම) ද ඒ මහණහුගේ සීලය පිණිස වේ. පිසුණු බස් හැර, ඉන් වෙසෙසින් වැළැක්කේය. මෙතැනින් අසා මොවුන් බිඳවීම පිණිස එතැන නොකියන සුලුවූයේය. එතැනින් අසා ඔවුන් බිඳවීම පිණිස මෙතැන නොකියන සුලුවූයේය. මෙසේ හෙද වූවන් ගළපන්නේ, සමගිවූවන්ගේ සමගිය තහවුරු කිරීමට අනුබල දෙන්නේ, සමගියෙහි ඇලුම් බහුල කොට ඇත්තේ, සමගිකම්හි ඇලුනේ, සමගිකම්හි සතුටුවන සුලුවූයේ, සමගිය ඇති කරණ තෙපුල් කියන්නේය. මේ ද ඔහුගේ සීලය පිණිස වේ.

ඵරුෂ වචනය හැර, ඉන් වෙසෙසින් වැළැක්කේ, යම් වචනයක් නිදෙස් වේද, කන්කලු ද, අර්ථ වශයෙන් ප්‍රෙමණීයද, මනාසේ සිතට වදනා හෙයින් සිත්කලු ද, පුරවාසීන්ගේ කථා මෙන් යහපත් ද, බොහෝ දෙනාට ප්‍රිය ද, බොහෝ දෙනාගේ මන වඩන්නේ ද, එබඳු තෙපුල්ම කියන්නේ වේ. මෙසේ (ඒ රළුවචනයෙන් වෙන්වීම ද) ඒ මහණහුගේ සීලය පිණිස වේ. හිස්වූ ප්‍රලාප කථා හැර, ඉන් වෙසෙසින් වැළැක්කේ, කාල-යට සුදුසු කථා කරන්නේ, සිදුවූ (සැබෑවූ) තෙපුල්ම කියන්නේ, අර්ථයෙන් යුක්තවූ, (නවලොවුතුරු) දහම් ඇසුරු කළ, විනය ඇසුරු කළ තෙපුල් කියන්නේ, සුදුසු කල්හි උපමා හා කරුණු සහිතවූ,(පරිච්ඡේද) සීමා ඇති, අර්ථ හෙවත් අභිවෘද්ධියෙන් යුත්, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේ. මේ (හිස්කථාවෙන් වැළැක්ම) ද ඔහුගේ සීලය පිණිස වේ.

14. තණ, ගස්, වැල් සිඳීම් බිඳීම් ආදි විකොපනයෙන් වැළැක්කේ, එක් වේලේ වළඳන බොජුන් ඇත්තේ, රාත්‍රි-භොජනයෙන් හා විකල් බොජුනෙන් වැළැක්කේය. නැටීම්, ගී කීම්, බෙර ආදිය වැයීම්, විසුලු දැකීම් යන මෙයින් වැළැක්-කේය. මල්, ගඳ, විලවුන් පැළඳීම, ඉන් සැරසීම, උනුනැන් පිරවීමෙන් අලඞ්කාර කිරීම යන මෙයින් වැළැක්කේය. උස් අසුන් මහ අසුන් යන මෙයින් වැළැක්කේය. රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් වැළැක්කේය.[1]

1. දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ උපග්‍රන්ථයේ x වෙනි පිට බලනු.

ආමකධඤ්ඤපටිග්ගහණා[1] පටිවිරතො හොති. ආමකමංසපටිග්ගහණා[1] පටිවිරතො හොති. ඉත්ථිකුමාරිකපටිග්ගහණා[1] පටිවිරතො හොති. දාසිදාසපටිග්ගහණා පටිවිරතො හොති. අජෙළකපටිග්ගහණා[1] පටිවිරතො හොති. කුක්කුටසූකරපටිග්ගහණා[1] පටිවිරතො හොති. හත්ථිගවස්සවළවාපටිග්ගහණා[2] පටිවිරතො හොති. ඛෙත්තවත්ථුපටිග්ගහණා[1] පටිවිරතො හොති. දූතෙය්‍යපහිණගමනානුයොගා[3] පටිවිරතො හොති. කයවික්කයා පටිවිරතො හොති. තුලාකූටකංසකූටමානකූටා[4] පටිවිරතො හොති. උක්කොටනවඤ්චනනිකතිසාචියොගා[5] පටිවිරතො හොති. ඡෙදනවධබන්ධනවිපරාමොසආලොපසහසාකාරා[6] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

15. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං බීජගාමභූතගාමසමාරම්භං[7] අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං[8] මූලබීජං ඛන්ධබීජං ඵළුබීජං[9] අග්ගබීජං බීජබීජමෙව[10] පඤ්චමං— ඉති[11] එවරූපා බීජගාමභූතගාමසමාරම්භා[12] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

16. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං සන්නිධිකාරපරිභොගං අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං අන්නසන්නිධිං[13] පානසන්නිධිං වත්ථසන්නිධිං යානසන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං— ඉති වා ඉති එවරූපා සන්නිධිකාරපරිභොගා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. °ප්පටිග්ගහණ V. (සබ්බත්ථ)
2. °ගවස්ස°B.V. °වලව°V.W. °වළව°B.
3. °පහීණ° W.
4. °කූට° B.
5. °සාචි° B. V.
6. °සහස° B.
7. °සමාරබ්භං V.
8. සෙය්‍යථිදං B. V. (සබ්බත්ථ)
9. ඵල° S. ඵළු° C. P.
10. බීජබීජං එව B.S.V.
11. ඉති වා ඉති V. S.
12. °සමාරබ්භා V.
13. °නිධි S. (සබ්බත්ථ)

අමුවූ ධාන්‍යවර්‍ගී පිළිගැන්මෙන් තොරවූයේ, අමුමස් පිළිගැන්මෙන් තොරවූයේ ද ස්ත්‍රීන් හා කුමරියන් පිළිගැන්මෙන් තොර වූයේ ද වේ. දාසිදාසුන් පිළිගැන්මෙන් තොර වූයේ, එළුවන් හා තිරළුවන් පිළිගැන්මෙන් තොර වූයේ, කුකුළන්, හූරන්, ඇතුන්, ගවයන්, අසුන්, වෙළඹුන්, කෙත්, වත්, යන මේ පිළිගැන්මෙන්ද තොර වූයේය. ගිහින්ගේ දූත මෙහෙවරය, ගෙන්ගෙට යන පහත් මෙහෙවරය යන මෙයින් වැළැක්මෙක්ය. ගනු දෙනු කිරීමය, තුලා ආදියෙන් වඤ්චා කිරීමය, රන් හා නොරන් මුසුකොට වඤ්චා කිරීමය, වී ආදිය මැනීමෙන් වඤ්චා කිරීමය, හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය, උපායෙන් අනුන් රැවටීමය, යකඩ ආදි ලෝහ රන් රිදී යයි අඟවා වඤ්චා කිරීමය, නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයෝගය යන මෙයින් වැළැක්කේය. කැපීමය, මැරීමය, බැඳීමය, සැඟවී සිට වස්තු පැහැර ගැන්ම (මංකොල්ල)ය, නියම්ගම් ආදිය පැහැරීමය, බලාත්කාරකමින් වස්තු පැහැරගැන්මය යන මෙයින් ද වැළැක්කේය. මේ (විරතිය) ද ඔහුගේ සීලය පිණිස වේ.

15. ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් අනුභව කොට මූලබීජය, ඛන්ධබීජය, එළි (පුරුක්) බීජය, දලු (අග්‍ර) බීජය, පස්වැනිවූ බීජබීජය යන මේ බීජගාම-භූතගාමසමාරම්භයෙහි යෙදී වෙසෙත්. (මෙබඳු වූ බීජගාම භූතගාමයන් සිඳීම් බිඳීම් ආදියෙන් වැළැක්කේ වේ නම්) මෙද ඔහුගේ සීලය පිණිස වේ.

16. එසේම යම් ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් අනුභව කොට, ආහාර වර්ගී දෙවෙනි දිනට තබා ප්‍රයොජන ගැන්මය, පාන වර්ගී දෙවෙනි දිනට තබා ප්‍රයොජන ගැන්මය, නොඉටන ලද සිවුරු ආදිය එසේ තැන්පත් කොට තැබීමය, යාන සංඛ්‍යාත වහන් තබා එසේ ප්‍රයොජන ගැන්මය, දෙකකින් වැඩි සයන ලැබ පසුවට තබා ප්‍රයොජන ගැන්මය, සුගන්ධයන් ලැබ එලෙස තබා ප්‍රයොජන ගැන්මය, තල සහල් ආදි ආමිසයන් තැන්පත් කොට තබා ප්‍රයොජන ගැන්ම යයි කියන ලද සන්නිධිකාරපරිභොගයෙහි යෙදී වෙසෙත්. මෙබඳුවූ සන්නිධිකාරපරිභොගයෙන් වැළකී වෙසේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

17. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූක-දස්සනං[1] අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීදං නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වෙතාලං [2] කුම්භථූනං [3] සොභ-නගරකං [4] චණ්ඩාලං වංසං ධොපනං [5] හත්ථියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං [6] උසභයුද්ධං අජයුද්ධං මෙණ්ඩකයුද්ධං [7] කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යොධිකං බලග්ගං සේනාබ්‍යූහං අනීකදස්සනං[8] — ඉති වා ඉති එවරූපා විසූකදස්සනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

18. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං ජූතප්පමා-දට්ඨානානුයොගං[9] අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීදං[10] අට්ඨපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං [11] ඛලිකං ඝටිකං සලාකහත්ථං අක්ඛං පඞ්ගචීරං වඞ්කකං [12] මොක්ඛචිකං චිඞ්ගුලකං[13] පත්තාළ්හකං[14] රථකං ධනුකං අක්ඛරිකං මනෙසිකං[15] යථාවජ්ජං— ඉති වා ඉති එවරූපා ජූතප්පමාදට්ඨානානුයොගා[9] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. විසූකං° B.
2. වෙතාලං B. S. V.
3. කුම්භථූණං B. S. °ථූණං V.
4. සොභනකරකං W. C.
   සොභනගරකං V.
5. ධොවනං S.
6. මහිංසං° B.
7. මෙණ්ඩං° S. V.
8. අනිකං° B.
9. ජූතපමාද° P.
10. සෙය්‍යථිදං B. V. (සබබත්‍ථ)
11. පත්තිකං V.
12. වඞකං Va.
13. චිඞ්ගුලිකං B. V. P.
14. පත්ථං° B. V.
15. මානෙ° S; මනෙ°Sa.

17. එසේම යම් ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා, නැටීමය, ගී කීමය, බෙර ආදිය වැයීමය, රඟමඬුලු සැරසීමය, (රාමායනාදි) කථා ඇසීමය, කයිතාලම් හා අත්ලෙන් අත්ල ගැසීමය, මන්ත්‍ර පිරවීමෙන් මළමිනී නැංවීමය, සතරැස් හෝ කළබෙර ගැසීමය, ශොභන (ප්‍රතිභාන) චිත්‍ර විචිත්‍රය,[1] සණ්ඩෙවුන් කෙළිය, හුණගස් ඔසවා නැටීමය, මිනීඇට සෝදා තැබීමය, ඇතුන් හා යුද කිරීමය, අසුන් හා යුද කිරීමය, මීවුන් හා යුද කිරීමය, උසභයන් හා යුද කිරීමය, අජයුද්ධය, මෙණ්ඩක යුද්ධය, කුක්කුට යුද්ධය, වට්ටක යුද්ධය, දණ්ඩ යුද්ධය, තොරතුරු ඇසීමය, මල්ලව යුද්ධය, (සාමාන්‍ය) යුද්ධය, ඇත් අස් ආදීන් ගණින් කිරීමය, සෙනා සන්‍යාභිවෙසය, ඇත් අස් ආදීන් දැකීමය, යන විපරීත දර්ශනයෙහි යෙදී වෙසෙත්. මෙසේ මෙබඳුවූ විසුලු දැක්මෙන් වැළකේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

18. එසේම යම් ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා (දූ පෝරු ආදිගෙහි කෙළීම්වූ) අට්ඨපද ක්‍රීඩාවය, දශපද ක්‍රීඩාවය, දූ පෝරු ආදියෙහි මෙන් ආකාශයෙහි ක්‍රීඩාකිරීමය, බිම මණ්ඩල වශයෙන් සාදා පැන පැන ක්‍රීඩා කිරීමය, දූ කැට නොසොල්වා නියෙන් ගසා ක්‍රීඩා කිරීමය, පසඇටින් දදු කෙළීමය, සිං කෙළීමය, භිත්ති ආදියෙහි ඉරටම්ටි ගසා ඇත් අස් ආදි රූප දක්වා කෙළීමය, පන්දු කෙළීමය, පත් කුලල් පිඹීමය, ගම් දරුවන් මෙන් ක්‍රීඩා නඟුල් ගෙන සීසෑම් ව්‍යාජයෙන් කෙළීමය, කරනම් ගැසීමය, තල්පත් ආදියෙන් කත්තන්ගුරුවා තනා ක්‍රීඩා කිරීමය, කොළ නැළියෙන් වැලි ආදිය මැන කෙළීමය, කුඩා රථයෙන් කෙළීමය, කුඩා දුන්නෙන් කෙළීමය, අහසෙහි හෝ පිටෙහි හෝ අකුරු ඇඳ කෙළීමය, සිතූ දේ කියවීම් කීම් ආදියෙන් කෙළීමය, (ගොළු බිහිරි ආදීන්ගේ) ඒ ඒ දෙෂ රූප දක්වා කෙළීමය, යන මෙබඳුවූ ප්‍රමාදයට කාරණාවූ දූ කෙළීමෙහි යෙදී වාසය කෙරෙත්. මෙසේ මෙබඳුවූ දූ කෙළියෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

---

1. දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ 15 වෙනි පිටේ අඩොලිපිය බලනු.

19. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං උච්චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීදං ආසන්දිං පල්ලඞ්කං ගොනකං[1] චිත්තකං පටිකං පටලිකං තූලිකං[2] විකතිකං උද්දලොමිං එකන්තලොමිං කට්ඨිස්සං[3] කොසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං[4] අස්සත්ථරං[4] රථත්ථරං[4] අජිනප්පවෙණිං කාදලිමිගපවරපච්චත්ථරණං[5] සඋත්තරච්ඡදං උභතොලොහිතකූපධානං— ඉති වා ඉති එවරූපා උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

20. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං මණ්ඩනවිභූසනට්ඨානානුයොගං[6] අනුයුත්තා විහරන්ති-සෙය්‍යථීදං[7] උච්ඡාදනං පරිමද්දනං නහාපනං[8] සම්බාහනං ආදාසං අඤ්ජනං මාලා විලෙපනං[9] මුඛචුණ්ණකං[10] මුඛාලෙපනං[11] හත්ථබන්ධං[12] සිඛාබන්ධං දණ්ඩකං[13] නාළිකං[14] ඛග්ගං[15] ඡත්තං චිත්‍රූපාහනං උණ්හීසං මණිං වාලවීජනිං[16] ඔදාතානි වත්ථානි දීඝදසානි— ඉති වා ඉති එවරූපා මණ්ඩනවිභූසනට්ඨානානුයොගා[6] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

21. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං තිරච්ඡානකථං අනුයුත්තා විහරන්ති—සෙය්‍යථීදං[7] රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං පුරිසකථං [කුමාරකථං කුමාරිකථං][17] සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානකථාය පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ගොණකං S. C.
2. තූලිකං B.
3. කට්ථි° B. V. කට්ටි° S.
4. °ත්ථරණං B. V.
5. කදලි° B.P.V. කාදල° W.
6. °විභු° B. °විභූසණ° W.
7. සෙය්‍යථිදං B. V. (සබ්බත්ථ)
8. න්හාපනං B. V.
9. මාලාගන්ධවි° S. B.
10. මුඛචුණ්ණං S. B. V.
11. මුඛලෙපනං B. V.; °විලෙප° S. මුඛාලෙප° Sa
12. °බද්ධං W.
13. දණ්ඩං B. S. V.
14. නාලිකා W.; නාලකා V.
15. අසිං V; අසිං ඛග්ගං S.
16. වාල° P. W.
17. ඉදං මරම්මපොත්ථකෙසු යෙව දිස්සති

19. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, දික්හගලා පුටුය, පලස්ය, සතරඟුලෙන් දිග ලොම් ඇති ඇතිරිය, විසිතුරු එළු ලොම් ඇති ඇතිරිය, එළු ලොම්මුවා සුදු ඇතිරිය, එළු ලොම්මුවා ඝනපුප් ඇතිරිය, සිංහාදි රූපයෙන් විසිතුරු එළු ලොම් ඇතිරිය, එක් පිට ලොම් ඇති එළු ලොම් ඇතිරිය, දෙපිට ලොම් ඇති එළු ලොම් ඇතිරිය, රත්කසුකම් කොට කැටි නිහිරි හුයින් කළ පසතුරුණුය, එක්විට නිළියන් සොළොස්දෙනා කෙළනා එළු ලොම් මුවා මහ ඇතිරිය, ඇතුන් පිට අතුරණ ඇතිරිය, අසුන් පිට අතුරණ ඇතිරිය, රථ පිට අතුරණ ඇතිරිය, අඳුන් දිවිසමින් කළ පසතුරුණුය, කදලිමුව සමින් කළ උතුම් පසතුරුණුය, දෙපස තබන ලද රත්කන්වයින් ඇති ආසනය, යන මෙබඳු උස් අසුන් මහ අසුන් පරිභොග කෙරෙත්. මෙසේ මෙබඳු වූ උසසුන් මහ අසුන්හි හිඳීම් ආදියෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.[1]

20. එසේම යම් ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා, ඇඟ සුවඳ ඉලීමය, පිරිමැදීමය, නෑවීමය, මැඩීමය, කැඩපත් පරිහරණය, අඳුන් තෙල් පරිහරණය, මල් හා විලවුන්, මූවසුණු, මුඛාලෙප, හස්තාභරණ යන මේ දේ දැරීම හා පැළඳීමය, රන් හු ආදියෙන් සිබා (කුඩුම්බි) බැඳීමය, විසිතුරු දඬු ගෙන හැසිරීමය, බෙහෙත් නළ දසරුවෙහි එල්වාගෙන ඇවිදීමය, කඩු උරෙහි එල්වා ගෙන ඇවිදීමය, ඡත්‍රධාරිව ඇවිදීමය, විසිතුරු වහන් පයලා ඇවිදීමය, නළල්පට බැඳීමය, සිබාමාණික්‍ය පැළඳීමය, වල්විදුනා දැරීමය, දික්වූ දහවලු ඇති සුදුවත් ඇඳීමය යි මෙසේ වූ සැරසීම් හා උතුතැන් පිරවීමෙහි නිතර නිතර යෙදෙත්. මෙබඳු වූ සැරසීම්, අලඞ්කාර කිරීම් ආදියෙහි යෙදීමෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

21. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ—මහ ඇමතියන් පිළිබඳ—සේනා පිළිබඳ—භය පිළිබඳ—යුද පිළිබඳ—ආහාර පිළිබඳ—පාන වර්ග පිළිබඳ—වස්ත්‍ර පිළිබඳ—සයන පිළිබඳ—මාලා, ගන්ධ ද්‍රව්‍යයන්—නෑයන්—යානාවන්—ගම්—නියම්ගම්-නුවර-දනව්—ස්ත්‍රීන්—පුරුෂයන්—[කුමරකුමරියන්]—යොධයන්—වීපී—ඝටවෙටිකාවන් හෝ තීර්ථයන්—මළනෑයන් යන ආදීන් පිළිබඳ කථාය, නොයෙක් ආකාරවූ ව්‍යර්ථ කථාය, ලොකාඛ්‍යායිකා (විතණ්ඩ) කථාය, මුහුද පිළිබඳ කථාය, භවාභවකථාය යන මෙබඳු තිරිසන් කථාවෙහි යෙදී වෙසෙත්. මෙබඳු වූ තිරච්ඡානකථාවෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

---

1. මෙහි ඇතුළත් දේ ගැණ ඇතැම් තොරතුරු දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ බ්‍රහ්මජාල සූත්‍රයෙන් බලා දත යුතුයි.

22. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විග්ගාහිකකථං අනුයුත්තා විහරන්ති— සෙය්‍යථීදං[1] න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි, අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡාපටිපන්නො ත්වමසි අහමස්මි සම්මාපටිපන්නො. සහිතං මෙ අසහිතං තෙ. පුරෙ වචනීයං පච්ඡා අවච පච්ඡාවචනීයං පුරෙ අවච. අවිචිණ්ණං[2] තෙ විපරාවත්තං ආරොපිතො තෙ වාදො නිග්ගහිතොසි[3] චර වාදප්පමොක්ඛාය නිබ්බෙඨෙහි වා සචෙ පහොසීති— ඉති වා ඉති එවරූපාය විග්ගාහිකකථාය පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

23. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං දූතෙය්‍යපහිණගමනානුයොගමනුයුත්තා විහරන්ති— සෙය්‍යථීදං[1] රඤ්ඤං රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං කුමාරානං: ඉධ ගච්ඡ අමුත්‍රාගච්ඡ ඉදං හර අමුත්‍ර ඉදං ආහරාති— ඉති වා ඉති එවරූපා දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

24. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ කුහකා ච හොන්ති ලපකා ච නෙමිත්තිකා[4] ච නිප්පෙසිකා ච ලාභෙන[5] ලාභං නිජිගිංසිතාරො[6] ච[7]— ඉති වා ඉති[8] එවරූපා කුහනලපනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. සෙය්‍යථිදං B. V.
2. ආචිණ්ණං W. C.
3. නිග්ගහීතො ත්වමසි B. V. නිග්ගහීතොසි P.W.
4. නිමිත්තකා Sa.
5. ලාභෙන ච ලාභං P.S.
6. නිජිගිසිතාරො B.
7. ච ඉති න දිස්සති P.S.W.
8. ඉති එවං P. W.

22. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා ‘ඔබ මේ ධම්මවිනය නොදන්නෙහිය, මම මේ ධම්මවිනය දනිමි.’ ‘ඔබ මේ ධම්මවිනය කුමකැයි දන්නෙහි දැ? ඔබ වරදවා පිළිපන්නෙහිය, මම මනාකොට පිළිපන්නේ වෙමි.’ ‘මාගේ වදන් සිලිටුය හෝ අර්ථ සහිතය, ඔබගේ වචනය එසේ නොවෙයි.’ ‘පළමු කිය යුත්ත පසුව කීයෙහිය, පසුව කිය යුත්ත පළමුව කීයෙහිය, යමක් ඔබ බොහෝ කල් පුරුදු කරණ ලද නම් ඒ සියල්ල ව්‍යර්ථ විය. ඔබට වාදාරොපනය කරණ ලදී; නිග්‍රහ කරණ ලද්දෙහිය (වාදයෙන් පැරදුනෙහිය). වාදයෙන් මිදෙනු පිණිස ක්‍රියා කරව. ඉදින් හැක්කෙහි නම් වාදයෙන් ගැලවෙව හෙවත් ඒ නිෂේධනය කරව’ යන ආදි විග්‍රාහික හෙවත් දෝෂාරෝපණ කථාවෙහි යෙදී වෙසෙත්. මෙසේ මෙබඳු විග්‍රාහික කථාවෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

23. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා රජුන්ගේ, රජමහ ඇමතියන්ගේ, ක්‍ෂත්‍රියයන්ගේ, බමුණන්ගේ, ගැහැවියන්ගේ සහ කුමරුන්ගේද හසුන් ගෙණ, ‘මෙතනින් අසවල් තැනට යා, අසවල් තැන්න් මෙහි එව, මෙය ගෙණ යා, එතැනින් අසවල් දෙය ගෙණෙව’ යි (අණවන ලදුව) දූතභාවයෙහි හා හසුන් ගෙණ යෑමෙහි යෙදී වෙසෙත්. මෙබඳු දූත භාවය, හසුන් ගෙණයෑම යන මෙයින් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

24. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා කුහකයෝ ද, සිව්පසය උදෙසා කථා කරන්නෝ ද, නිමිතිකරන්නෝ නොහොත් ලාභ සත්කාර සඳහන් කරවන්නෝ ද, පරලාභාදිය උදෙසා කියන්නෝ ද,[1] ලාභයකින් ලාභයක් සොයන්නෝ ද වෙත්. මෙබඳු වූ කුහනලපනාදියෙන් වැළැක්කේ වේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

---

1. දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ 21 වෙනි පිටේ 1 වෙනි අධොලිපිය බලනු.

25. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති. සෙය්‍යථීදං[2] අඞ්ගං නිමිත්තං උප්පාදං[3] සුපිණං[4] ලක්ඛණං මූසිකච්ඡින්නං[14]. අග්ගිහොමං දබ්බිහොමං ථුසහොමං කණහොමං තණ්ඩුලහොමං සප්පිහොමං තෙලහොමං මුඛහොමං ලොහිතහොමං අඞ්ගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා[5] සිවවිජ්ජා භූතවිජ්ජා භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා විච්ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං[6] සරපරිත්තානං මිගචක්කං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

26. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති. සෙය්‍යථීදං[2] මණිලක්ඛණං වත්ථලක්ඛණං[7] දණ්ඩලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං[8] ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරිලක්ඛණං දාසලක්ඛණං දාසිලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං[9] උසභලක්ඛණං ගොලක්ඛණං[10] අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං[11] කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං ගොධාලක්ඛණං කණ්ණිකාලක්ඛණං[12] කච්ඡපලක්ඛණං මිගලක්ඛණං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා[13] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

27. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති. සෙය්‍යථීදං[2] රඤ්ඤං නිය්‍යානං භවිස්සති රඤ්ඤං අනිය්‍යානං භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං ජයො භවිස්සති බාහිරානං රඤ්ඤං[15] පරාජයො භවිස්සති. බාහිරානං රඤ්ඤං ජයො භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං පරාජයො භවිස්සති. ඉති ඉමස්ස ජයො භවිස්සති ඉමස්ස පරාජයො භවිස්සති— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ජීවිතං B. V.
2. සෙය්‍යථිදං B. V.
3. උප්පාතං B. °පාටං S.
4. සුපිනං B. P. සුපිණකං C.
5. ඛෙත්ත° B. S. V.
6. පක්ඛ° W. C.
7. සාඨලක්ඛණං B. V.; දණ්ඩ° වත්ථ° P. W.
8. ආයුධ° B. P.
9. මහිංස° B.
10. ගොණ° B.
11. මෙණ්ඩක° V. W.
12. කණ්ණික° B. S.
13. මිච්ඡාජීවා ඉති න දිස්සති P.
14. මූසිකා° P. W.
15. රඤ්ඤං ඉති න දිස්සති B. V.

25. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, අඞ්ග (සාමුද්‍රිකා) ශාස්ත්‍රය, නිමිති ශාස්ත්‍රය, (අසනිපාතාදි මහ නිමිති බලා කියන) උත්පාද ශාස්ත්‍රය, ස්වප්න ශාස්ත්‍රය, ලක්ෂණ ශාස්ත්‍රය, (මීයන් කැපූ වස්ත්‍රාදිය බලා කියන) මූසික ශාස්ත්‍රය, අග්නිහෝමය, දබ්බිහෝමය, ථුස හෝමය, තණ්ඩුල—කණ—සප්පි—තෙල—මුඛ—ලොහිත හෝමය, අඞ්ග විද්‍යා, වාස්තු විද්‍යා, නීති ශාස්ත්‍රය, සොහොනෙහි ශාන්ති කරන්නාවූ විද්‍යාව හෝ සිවල් රුත විද්‍යා, භූත විද්‍යා, අහි විද්‍යා, විෂ විද්‍යා, විච්ඡික විද්‍යා, මූසික විද්‍යා, සකුණ විද්‍යා, වායස විද්‍යා, ජීවන කාලය කීම වූ පක්කජ්ඣානය, ශරපරිත්‍රාණය (ආයුධ වැළැක්ම), තිරිසන් සතුන්ගේ ශබ්ද දැනීම වශයෙන් පැවති මන්ත්‍රය යන තිරශ්චීන විද්‍යා[1] හෙතුකොට ගෙන මිථ්‍යාජීවයෙන් ජීවිකාව කෙරෙත්. මෙසේ මෙබඳු තිරශ්චීනවිද්‍යා හෙතුවෙන් කරණ ලාමකජීවිකාවෙන් වැළැක්කේ වේද මෙද ඔහුගේ **සීලය පිණිස** වේ.

26. එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, මිණි ලක්ෂණය, වස්ත්‍ර ලක්ෂණය, දණ්ඩ — ඛඩ්ග — ශර — දුනු — ආයුධ—ඉත්ථි—පුරිස—කුමාර—කුමාරි—දාස— දාසි—හත්ථි—අස්ස— මහිස—උසභ—ගො—අජ—මෙණ්ඩ— කුක්කුට—වට්ටක —ගොධා— කණ්ණිකා —කච්ඡප—මිග ලක්ෂණය යන මෙබඳු තිරච්ඡාන විද්‍යාවන්[1] කරණකොට ගෙණ වැරදි ජීවිකාව කෙරෙත්. මෙසේ වූ තිරශ්චීන විද්‍යාවන් නිසා කරණ වැරදි ජීවිකාවෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ **සීලය පිණිස** වේ.

27. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා ‘අසවල් දින රජුන්ගේ බැහැර යෑම වන්නේය, අසවල් දින රජුන්ගේ ඇතුළු නුවරට යෑම වන්නේය, අසවල් දින ඇතුළුනුවර රජුන්ගේ ආක්‍රමණය වන්නේය, බැහැර රජුන්ගේ බැහැරට යෑම වන්නේය. බැහැර රජුන්ගේ ඇතුළු නුවරට ඊම වන්නේය, ඇතුළුනුවර රජුන්ගේ ආපසු යෑම වන්නේය, ඇතුළුනුවර රජුන්ට ජය වන්නේය, බැහැර රජුන්ට පරාජය වන්නේය. බැහැර රජුන්ට ජය වන්නේය. ඇතුළුනුවර රජුන්ට පරාජය වන්නේය. මෙසේ මොහුට ජය වන්නේය, මෙසේ පරාජය වන්නේය’ යි කියා මෙසේ තිරශ්චීනවිද්‍යා හෙතුකොට ලාමක ජීවිකාව කෙරෙත්. මෙබඳු වූ තිරච්ඡාන විජ්ජා හෙතුවෙන් කරණ මිච්ඡාජීවයෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

---

1. දීඝනිකායේ පළමුවෙනි කාණ්ඩයේ 21 වෙනි පිට බලනු.

30. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති — සෙය්‍යථීදං[2]: ආවාහනං[3] විවාහනං[3] සංවදනං[4] විවදනං සංකිරණං විකිරණං සුභගකරණං[5] දුබ්භගකරණං[6] විරුද්ධගබ්භකරණං ජිව්හානිබන්ධනං[7] හනුසංහනනං හත්ථාභිජප්පනං[8] කණ්ණජප්පනං ආදාසපඤ්හං කුමාරිපඤ්හං[9] දෙවපඤ්හං ආදිච්චුපට්ඨානං මහතුපට්ඨානං අබ්භුජ්ජලනං සිරිව්හායනං[10] —ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

31. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති — සෙය්‍යථීදං:[2] සන්තිකම්මං පණිධිකම්මං භූතකම්මං[11] භූරිකම්මං වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකිරණං[12] ආචමනං නහාපනං[13] ජුහනං[14] වමනං විරෙචනං උද්ධවිරෙචනං[15] අධොවිරෙචනං සීසවිරෙචනං කණ්ණතෙලං නෙත්තතප්පණං[16] නත්ථුකම්මං අඤ්ජනං පච්චඤ්ජනං[17] සාලාකියං සල්ලකත්තියං[18] දාරකතිකිච්ඡා[19] මූලභෙසජ්ජානං අනුප්පදානං[20] ඔසධීනං පටිමොක්ඛො[21] — ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ජීවිතං B. V.
2. සෙය්‍යථිදං° B.V.
3. °හණං C.
4. °රණං B.V.; °රනං S.
5. සුභාගක° B.
6. දුබ්භාග°B.
7. °නිබන්ධනං B. V. S.
8. හත්ථා° හත්ථජප්පනං කණ්ණ° B. V.
9. කුමාරික° V. C.
10. සිරව්හායනං P. W.
11. භූරි°(භූතිකම්මං) P.
12. වත්ථුබලිකම්මං V., වත්ථුපරිකම්මං B. °පවිකිරණං P.
13. න්හාපනං B. V.
14. ජූහනං Sa. ජුහණං C.
15. උද්ධං° B. V.
16. නෙත්තපානං B; නෙත්තප්පානං S.; නෙත්තතප්පනං Sa. C.
17. පච්ච° V.
18. °තිකං P. V. W.
19. °තිකිච්ඡං S.
20. අනුප්පදනං B. S.
21. පති°B.V.

30. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා, ආවාහ කරවීමය, විවාහ කරවීමය, සමගිය පිළිබඳ කථා කිරීමය, වියොගය පිළිබඳ කථා කිරීමය, ධන රැස්කිරීමය, වියදම් කිරීමය, සුභග කරණය (යහපත් ශ්‍රී කිරීමය), දුර්භගකරණය, ගර්භවිරොධී කරණය, දිව තද කිරීමය, හනු බැඳීමය, අත් පෙරළීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, ශබ්ද නොඇසීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, කැඩපත්හි දෙවතාරොපණය කොට පැණ පිළිවිසීමය, කුමරියගේ සිරුරෙහි දෙවතාරොපණය කොට පැණ පිළිවිසීමය, දෙවදාසියගේ සිරුරෙහි යකුන් ආරොපණය කොට පැණ පිළිවිසීමය, හිරු වැඳීමය, මහබඹුට උවටැන් හෝ නැමදුම් කිරීමය, මුවින් ගිනි දැල් පිට කිරීමය, ශ්‍රී දෙවිය කැඳවීම යයි කියන මෙබඳු තිරශ්චීන විද්‍යාවෙන් මිථ්‍යාජීවිකාව කෙරෙත්. මෙබඳුවූ තිරච්ඡාන විජ්ජාවෙන් කරණ මිථ්‍යාජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඔහුගේ සීලය **පිණිස** වේ.

31. එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා ශාන්ති ප්‍රතිඥුත කර්මය,[1] කායයී සමෘද්ධියෙන් පසු කළයුතු ප්‍රණිධිකර්මය, මන්ත්‍ර ප්‍රයොග කිරීමය, භූරිකර්මය, පණ්ඩකයා පුරුෂයකු කිරීමය, පුරුෂයා පණ්ඩකයකු කිරීමය, ගෙවල් නොකළ බිම ගෙවල් කිරීමය, ගෙට සුදුසු තැන බලිකර්ම විධානය, දියෙන් මුව සුද්ධ කිරීමය, නැහැවීමය, ගිනි පිදීමය, වමන කරවීමය, විරෙක කරවීමය, ඌර්ධ්ව විරෙකය, අධොවිරෙකය, සිරොවිරෙකය, කන් තෙලය, නෙත්‍රතර්පණය, නස්‍ය කිරීමය, ක්‍ෂාරවූ අඳුන් තැනීමය, සිසිල් බෙහෙත් අඳුන් සෑදීමය, සැත් කමුලා කටයුතු වෙදකර්මය, ශල්‍යකර්මය, ළදරුවන් පිළිබඳ වෛදකර්මය, මූලික බෙහෙත් දීමය (බෙහෙත් ද්‍රව්‍යයෙන් කටයුතු ශරීර චිකිත්සාය), සැර බෙහෙත් දී පසුව එහි බල හැරීමය යන මෙබඳු තිරශ්චීන විද්‍යා කරණකොට හෝ මිථ්‍යාජීවයෙන් ජීවිකාව කෙරෙත්. මෙබඳුවූ මිථ්‍යාජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඔහුගේ සීලය **පිණිස වේ.**

1. මේ ආදියෙහි විස්තර දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ බ්‍රහ්මජාල සූත්‍රයෙන් බලා දත යුතුයි.

32. අයං[1] ඛො සො කෙවට්ට භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සෙය්‍යථාපි කෙවට්ට ඛත්තියො මුද්ධාභිසිත්තො[2] නිහතපච්චාමිත්තො න කුතොචි භයං සමනුපස්සති යදිදං පච්චත්ථිකතො එවමෙව ඛො කෙවට්ට භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති. එවං ඛො කෙවට්ට භික්ඛු සීලසම්පන්නො හොති.

33. කථඤ්ච[3] කෙවට්ට භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති? ඉධ කෙවට්ට භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී[4]. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං[5] තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා—පෙ—ඝානෙන ගන්ධං ඝායිත්වා—පෙ—ජිව්හාය රසං සායිත්වා—පෙ—කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා—පෙ—මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී[4]. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං[5] තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති මනින්ද්‍රියං මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං[6] පටිසංවෙදෙති. එවං ඛො කෙවට්ට භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති.

---

1. ස ඛො P. S. W.
2. මුද්ධාව° P. C.
3. කථංච පන S.
4. නානුව්‍ය° P. W.
5. අන්වාස්ස° P. W.
6. අව්‍යා° P. W.

32. කෙවට්ටය, මෙසේ සීලසම්පන්නවූ මහණහට (අසංවරය මුල්කොට උපදනාවූ) භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ඔහුගේ සීලසංවරය හෙතුකොටගෙණ කිසිතැනකදී නොඋපදනේය. කුමක් මෙන්ද යත්:— කෙවට්ටය, ක්‍ෂත්‍රියාභිෂේකයෙන් මුදුනෙහි අභිෂේක ලද්දාවූ, නැසූ පසමිතුරන් ඇති, ක්‍ෂත්‍රිය රජෙක් කිසියම් සතුරෙකුගෙන් භයක් නොදක්නේද, එපරිද්දෙන්ම කෙවට්ටය, සීලසම්පන්නවූ මහණතෙමේ (අසංවර හෙතුවෙන් උපදනාවූ) භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු සීලසංවරය හෙතුකොට කිසි තැනකදී නොදක්නේය (ඔහුට කිසිවකින් බියක් නැත). ආර්‍ය්‍යවූ (ශ්‍රෙෂ්ඨවූ) මේ සීල රාශියෙන් යුක්තවූ ඒ මහණ තෙමේ, ස්වසන්තානයෙහි පිරිසිදුවූ (කායික චෛතසික) සැපය විඳිහි. කෙවට්ටය, මෙසේ දක්වූ (ත්‍රිවිධ) ශීලයෙන් යුක්තවූ මහණ තෙමේ සීලසම්පන්න නම් වේ.

33. කෙවට්ටය, භික්‍ෂුතෙම කෙසේ නම් ඉන්ද්‍රියයන් කෙරෙහි වැසූ දොර ඇතිවේ ද? කෙවට්ටය, මේ සස්නෙහි (මනාසේ පිළිපන්) මහණ තෙමේ, ඇසින් රූපයක් දැක නිමිත්තග්‍රාහී නොවේ (එහි නොඇලේ). අනුව්‍යඤ්ජන වශයෙන් නොගන්නේ එහි විස්තර සෙවීමට නොපෙලඹේ. චක්ඛුන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට යමක් හෙතුකොටගෙණ අභිජ්ඣාදෞමනස්සාදි (දූෂි ආසාව හා කලකිරීමාදි) ලාමකවූ අකුශල ධර්මයෝ වහනය වන්නාහු ද (ස්වසන්තානයට ඇතුල් වන්නහු ද), එබඳු දෙයින් වැලකීම පිණිස හෙතෙම පිළිපදී. හෙතෙම තමාගේ චක්ඛුන්ද්‍රිය රකී, චක්ඛුන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කනින් ශබ්දයක් අසා— [ඇස පිළිබඳ කී නයින් දත යුතුයි]—නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණයකොට —පෙ— දිවෙන් රසයක් විඳ —පෙ— කයින් ස්පර්ශකටයුත්තක් ස්පර්ශකොට —පෙ— සිතින් ධර්මයක් (කරුණක්) දැන එහි නිමිති නොගන්නේය (එහි නොඇලෙන්නේය), අනුව්‍යඤ්ජන වශයෙන් නොගන්නේය (එහි නොපෙලඹෙන්නේය). මනෙන්ද්‍රියයෙහි (සිතෙහි) අසංවරව වසන්නහුට යමක් නිසා අභිජ්ඣා දෞමනස්සාදි ලාමක අකුශල ධර්මයෝ වහනය වෙත් ද (ස්වකීය සන්තානයට වදිත් ද), එබඳු දෙයින් වැලකීම පිණිස හෙතෙම පිළිපදී. හෙතෙම මනෙන්ද්‍රිය රකී, මනෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. එබඳුවූ මහණ තෙමේ ආර්‍ය්‍ය වූ (උතුම් වූ) ශීල රාශියෙන් යුක්ත වූයේ, අභ්‍යන්තරයෙහි පිරිසිදුවූ (අසම්මිශ්‍රවූ) අධිචිත්ත සුඛය විඳිහි. කෙවට්ටය, මෙසේ වූ මහණ තෙමේ ඉන්ද්‍රියයන්හි වසන ලද දොරටු ඇත්තේ වේ.

34. කථඤ්ච කෙවට්ට භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නා-ගතො හොති?

ඉධ කෙවට්ට භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති සම්මිඤ්ජිතෙ[1] පසාරිතෙ සම්පජානකාරී හොති සඞ්ඝාටි-පත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති අසිතෙ පීතෙ[2] ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති. එවං ඛො කෙවට්ට භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති.

35. කථඤ්ච කෙවට්ට භික්ඛු සන්තුට්ඨො හොති?

ඉධ කෙවට්ට භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන චීවරෙන කුච්ඡිපරිහාරිකෙන[3] පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. සෙය්‍යථාපි කෙවට්ට පක්ඛී සකුණො යෙන යෙනෙව ඩෙති සපත්තභාරොව ඩෙති එවමෙව ඛො[4] කෙවට්ට භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරි-කෙන[3] චීවරෙන කුච්ඡිපරිහාරිකෙන[3] පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. එවං ඛො කෙවට්ට භික්ඛු සන්තුට්ඨො හොති.

---

1. සමිඤ්ජිතෙ B. V.
2. පිතෙ B.
3. °පරිහාරියෙන V.
4. ඛො ඉති න දිස්සති P.

34. කෙවට්ටය, මහණ තෙමේ කෙසේ නම් සතිසම්පජඤ්ඤයෙන් (සිහියෙන් හා මනා ප්‍රඥාවෙන්) යුක්ත වූයේ වේද?

කෙවට්ටය, මේ සස්නෙහි (මනාව පිළිපන්) මහණ තෙම ඉදිරියට යෑමෙහි ද, ආපසු යෑමෙහි ද, යහපත් වූ නුවණින් දැන ඒ ක්‍රියා කරන්නේය. ඉදිරි බැලීමෙහි ද, අනුදික් (වටපිට) බැලීමෙහි ද, නුවණින් දැන බලන්නේය. අත් පා හැකිලීමෙහි ද දිගු කිරීමෙහි ද මනා නුවණින් දැන එසේ කරන්නේය. සඟලය, පාත්‍රය, සිවුරුය යන මේ දේ දැරීමෙහිදී මනා නුවණින් දැන ඒ ඒ දැරීම් ආදිය කරන්නේය. අනුභව කිරීමය, පානය කිරීමය, කෑමය, රස විඳීමය යන මෙහි ද මනා නුවණින් යෙදී (දැන) ඒ ඒ අනුභව කිරීමාදිය කරන්නේය. මල මූත්‍ර පහකිරීම් ද නුවණින් (ආදීනව) සලකා කරන්නේය. යෑම්, සිටීම්, හිඳීම්, සැතපීම්, නිදි තොරකිරීම්, කථාකිරීම්, නිශ්ශබ්ද ව සිටීම් යන මේ දේ මනා නුවණින් දැන කරන්නේය. කෙවට්ටය, මෙසේ කරන්නාවූ මහණ තෙමේ සිහියෙන් යුක්තවූයේ යහපත් නුවණින් යුක්ත වූයේ වෙයි. (මෙකී සියලු ඉරියව් පිළිබඳව ආදීනව හා ආනිසංසයන් ද, ශරීරය පිළිබඳ අනිත්‍යතාදි ස්වභාවයන්ද නුවණින් සලකා ඒ ඒ කෘත්‍යයන්හි යෙදේ යි සේයි.)

35. කෙවට්ටය, මහණතෙමේ කෙසේ නම් (ප්‍රත්‍යයන් පිළිබඳ යථාලාභසන්තොෂයෙන්) සතුටු වූයේ වේද?

කෙවට්ටය, මේ සස්නෙහි (මනාව පිළිපන්) මහණතෙමේ කායපරිහරණයට ප්‍රමාණවූ (යත්තම් කය වැසීමට තරම්වූ) සිවුරෙන් ද කුසපරිහරණයට ප්‍රමාණවූ පිණ්ඩපාත භොජනයෙන් ද සතුටු වූ සිත් ඇත්තේ වේ. ඒ මහණතෙමේ යම් යම් තැනකට යේ නම් අටපිරිකර (කය පිළිබඳ වූ දේ) පමණක් රැගෙණ යේ. කෙවට්ටය, යම් සේ පියාපත් ඇති පක්ෂියෙක් යම් යම් තැනෙක පියාඹා යේ නම් ඒ සියලු තැන පියාපත් බර පමණකින් යුක්තව පියාඹා යේද, කෙවට්ටය, එපරිද්දෙන්ම භික්ෂු තෙමේ ද කාය පරිහරණයට ප්‍රමාණවූ සිවුරෙන් ද කුච්ඡි-පරිහරණයට ප්‍රමාණවූ පිණ්ඩපාත භොජනයෙන් ද සතුටු වන්නේ වේ. ඒ මහණ තෙමේ යම් යම් තැනක යේ නම් කාය-පටිබද්ධවූ අටපිරිකර පමණක් රැගෙණ බැහැර යේ. කෙවට්ටය, මෙසේ වූ මහණ තෙමේ (යම්තම් ලත් දෙයින්) ඉතරීතර-සන්තොෂයෙන් යුක්තවේ.

36. සො ඉමිනා ච[1] අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං[2] වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

37. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. බ්‍යාපාදපදොසං[3] පහාය අබ්‍යාපන්නචිත්තො[4] විහරති සබ්බපාණභූතහිතානුකම්පී බ්‍යාපාදපදොසා[3] චිත්තං පරිසොධෙති. ථීනමිද්ධං[5] පහාය විගතථීනමිද්ධො[5] විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො ථීනමිද්ධා[5] චිත්තං පරිසොධෙති; උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

38. සෙය්‍යථාපි කෙවට්ට පුරිසො ඉණං[6] ආදාය කම්මන්තෙ පයොජෙය්‍ය තස්ස තෙ කම්මන්තා සමිජ්ඣෙය්‍යුං. සො යානි ච පොරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තීකරෙය්‍ය[7]. සියා චස්ස[8] උත්තරිං අවසිට්ඨං දාරභරණාය[9]. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ ඉණං[6] ආදාය කම්මන්තෙ පයොජෙසිං[10]. තස්ස මෙ තෙ කම්මන්තා සමිජ්ඣිංසු. සොහං යානි ච පොරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තිඅකාසිං.[11] අත්ථි ච මෙ උත්තරිං අවසිට්ඨං දාරභරණායාති[9]. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං[12] අධිගච්ඡෙය්‍ය[13] සොමනස්සං.

---

1. චකාරො නත්ථි W.
2. සුසාණං C.
3. ව්‍යා° P. W.
4. අව්‍යා° P. W.
5. ථිනා° B.
6. ඉනං C.
7. ව්‍යන්ති° P.C. °ව්‍යන්ති° W. බ්‍යන්තිං° B
8. තස්ස Sa.
9. දාරා° P. W.
10. පයොජෙමි B.
11. ව්‍යන්ති අ° B. ව්‍යන්ති° P. W.
12. පාමුජ්ජං P. W. C.
13. අධිගච්ඡෙ C. P.

36. ආර්‍ය්‍යවූ හෙමත් උතුම්වූ මේ සීලසමූහයෙන් යුක්තවූ ද, උතුම්වූ මේ ඉන්ද්‍රියසංවරයෙන් යුක්තවූ ද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවූ ද, මේ උතුම් ඉතරීතර-සන්තොෂයෙන් යුක්තවූ ද, ඒ (යොගාවචර) මහණ තෙමේ (මනුෂ්‍ය වාසයෙන් දුනු පන්සියයකින් ඔබ්බෙහි වූ) අරණ්‍යය ද, (ජනයාගෙන් තොරවූ) වෘක්‍ෂමූලය ද, පර්වත පෙදෙස් ද, කඳුරැලි ගිරිගුහාවන් හෝ මහා උමගද, සොහොන් ද, ඉතා දුරවූ වනසෙනසුන් ද, අභ්‍යාවකාශ (බොහෝ ඉඩකඩ ඇති) තැන් සහ පිදුරු ගුහා ද යන මේ (ජනයාගෙන් හිස්වූ) සෙනසුන් ඇසුරු කෙරෙයි. ඒ මහණ තෙමේ පසුබත්කාලයෙහි පිණ්ඩපාත භොජනයෙන් වැළැක්කේ, පර්‍ය්‍යඞ්කය බැඳ, උඩුකය ඇද නොවන සේ තබා, නිවණෙහිම සිත එලවා, ඒ නිවණම අරමුණු වසයෙන් සිත ඉදිරියෙහි පිහිටුවා ගෙණ හිඳී.

37. ඒ මහණ තෙමේ ලොකයෙහි (පඤ්චුපාදනස්කන්ධ-යන්හි) අභිධ්‍යාව (ලොභය) පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේ. ඒ අභිධ්‍යාවෙන් සිත (වෙන්කොට) පිරිසුදු කෙරේ. සිත කෙලසන්නාවූ ක්‍රොධය පහකොට, ක්‍රොධයෙන් දූෂිතවූ සිත් නැත්තේ, ප්‍රාණිවූ සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේව වෙසේ. ව්‍යාපාද දූෂණයෙන් සිත (වෙන් කොට) පිරිසුදු කෙරේ. කායචිත්ත දෙදෙනාගේ අලසබව යයි කියන ලද ථීනමිද්ධය දුරුකොට කය—සිත පිළිබඳ පහ වූ අලසබැව් ඇත්තේ, ආලොකසංඥ (පිරිසුදු හැඟීම්) ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥ ඇත්තෙක්ව වෙසේ. ථීනමිද්ධනීවරණයෙන් සිත පිරිසුදු කෙරේ. උඩඟු-බව හා කුකුස (උද්ධච්චකුක්කුච්චය) දුරුකොට, සංසිඳුනු සිත් ඇතිව (අනුද්ධතව) වාසය කෙරේ. අද්ධ්‍යාත්මයෙහි (ඇතුළත) සංසිඳුනු සිත් ඇත්තේ, උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසුදු කෙරේ. (බුද්ධාදි අටතැන්හි සැකකිරීම ලකුණුකොට ඇති) විචිකිච්ඡාව දුරුකොට, එතර කල (පහකල) විචිකිච්ඡා ඇත්තේ කුශලධර්ම විෂයෙහි 'ඒ කෙසේ ද මේ කෙබඳුද්ද'යි යන සැක නැතිව වෙසේ, විචිකිච්ඡායෙන් සිත පිරිසුදු කෙරේ.

38. **කෙවට්ටය**, යම්සේ පුරුෂයෙක් ණය ගෙණ කර්මාන්ත-යන්හි යොදන්නේ ද, ඔහුගේ ඒ කර්මාන්තයෝ දියුණු වන්නාහු නම් ඔහුගේ ඒ පරණ ණය මුදල් සියල්ලම ගෙවන්නේය. ඔහුගේ අඹුදරුවන් පුස්නා පිණිස වැඩි යමක් ඉතුරු වූයේ නම් ඕහට මෙබඳු අදහසක් වන්නේය. [කෙසේද යත්:] 'මම වනාහි පළමුවෙන් ණය ගෙණ කර්මාන්තයන්හි යෙදුවෙමි. ඒ මාගේ කර්මාන්තයෝ සමෘද්ධවූහ. ඒ මම පැරණි ණය ගෙවූයෙමි. අඹුදරුවන් පොෂ්‍යකිරීම පිණිස අතිරේක මුදලක් ද මට ඇත්තේය' කියායි. හෙතෙම ඒ ණය නැති බව මුල්කොට ගෙණ බලවත් සතුටක් ලබන්නේය, සොම්නසට ද පැමිණෙන්නේය.

39. සෙය්‍යථාපි කෙවට්ට පුරිසො ආබාධිකො අස්ස දුක්ඛිතො බාළ්හගිලානො භත්තං චස්ස නච්ඡාදෙය්‍ය[1] න චස්ස කායෙ බලමත්තා. සො අපරෙන සමයෙන තම්හා ආබාධා මුච්චෙය්‍ය භත්තඤ්චස්ස ඡාදෙය්‍ය සියා චස්ස කායෙ බලමත්තා. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ ආබාධිකො අහොසිං දුක්ඛිතො බාළ්හගිලානො භත්තං ච මෙ නච්ඡාදෙසි න චස්ස[2] මෙ ආසි කායෙ බලමත්තා. සොම්හි එතරහි තම්හා ආබාධා මුත්තො භත්තඤ්ච මෙ ඡාදෙති අත්ථි ච මෙ[3] කායෙ බලමත්තාති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය[4] සොමනස්සං.

40. සෙය්‍යථාපි කෙවට්ට පුරිසො බන්ධනාගාරෙ බද්ධො අස්ස. සො අපරෙන සමයෙන තම්හා බන්ධනාගාරා[5] මුච්චෙය්‍ය සොත්ථිනා අබ්බයෙන[6]. න චස්ස කිඤ්චි භොගානං වයො. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ බන්ධනාගාරෙ බද්ධො අහොසිං. සොම්හි එතරහි තම්හා බන්ධනාගාරා[5] මුත්තො සොත්ථිනා අබ්බයෙන[6]. නත්ථි ච මෙ කිඤ්චි භොගානං වයොති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය[4] සොමනස්සං.

41. සෙය්‍යථාපි කෙවට්ට පුරිසො දාසො අස්ස අනත්තාධීනො[7] පරාධීනො[7] න යෙනකාමඞ්ගමො. සො අපරෙන සමයෙන තම්හා දාසබ්‍යා[8] මුච්චෙය්‍ය අත්තාධීනො[7] අපරාධීනො[7] භුජිස්සො යෙනකාමඞ්ගමො. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ දාසො අහොසිං අනත්තාධීනො[7] පරාධීනො[7] න යෙනකාමඞ්ගමො. සොම්හි එතරහි තම්හා දාසබ්‍යා[8] මුත්තො අත්තාධීනො[7] අපරාධීනො[7] භුජිස්සො යෙනකාමඞ්ගමොති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය[4] සොමනස්සං.

---

1. න ඡාදෙය්‍ය S.
2. න ච මෙ P. W.
3. අත්ථි ච කායෙ P.
4. පාමුජ්ජං අධිගච්ඡෙ P. W. C.
5. බන්ධාගාරා B. බන්ධනා P. S. W.
6. අව්‍යයෙන P. W.
7. °ධීනො B.
8. දාසව්‍යා P. W. C.

39. කෙවට්ටය, යම්සේ වනාහි මහත් රෝගයෙන් පෙළෙන (ආබාධ ඇත්තාවූ), දුක් ඇත්තාවූ, දූසි ගිලන්බව ඇති පුරුෂයෙක් වන්නේ ද, ඔහට බත් (ආහාර) රුචි නොවන්නේ ද, ඔහුගේ ශරීරයෙහි කිසි ශක්තියක් නැත්තේ ද වෙයි. ඒ පුරුෂ තෙම පසු කාලයක ඒ ආබාධයෙන් මිදෙන්නේ නම්, ඔහුට ආහාර රුචිය ඇති වන්නේ නම්, ඔහුගේ ශරීරබලය ඇති වන්නේ නම්, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. (කෙබඳු ද යත්:) 'මම වනාහි පෙර ආබාධ ඇත්තාවූ, දුක් ඇති, දූසි ගිලන් බැව් ඇති කෙනෙක් වීමි. මට බත් රුචිය ද නොවීය. ශරීර-බලය ද නැතිවිය. ඒ මම පළමු තිබූ ආබාධයෙන් මිදුනෙමි. මට ආහාරරුචිය ද ඇත්තේය. කාය බලය ද තිබේය' කියායි. හෙතෙම ඒ කාරණය මුල්කොට බලවත් සතුටක් ලබන්නේය. සොම්නසට ද පැමිණෙන්නේය.

40. කෙවට්ටය, යම්සේ පුරුෂයෙක් සිරගෙහි බැඳුනේ වේද, හෙතෙම පසු කලෙක වියදම් නැතිව (පීඩා රහිතව) සැපසේ ඒ සිරගෙයින් මිදෙන්නේය. ඔහුගේ භොගයන් පිළිබඳ කිසිත් වියදමක් ද නොවන්නේය. ඔහුට මෙබඳු අදහසක් වන්නේය (එනම්:) 'මම වූකලී පෙර සිරගෙහි බැඳුනෙක් වූයෙමි, ඒ මම දූන් වියදම් නැතිව (පීඩා රහිතව) සැපසේ ඒ සිරගෙයින් මිදුනෙමි. මගේ භොගයන් පිළිබඳ කිසි වියදමක් ද නොවූයේය' කියායි. ඒ පුරුෂ තෙම සිරගෙයින් මිදීම නිමිති කොට බලවත් සතුටක් ලබන්නේය, සොම්නසට ද පැමිණෙන්නේය.

41. කෙවට්ටය, යම්සේ සිය කැමැත්තෙන් යමක් කරන්ට නොහැකි (අධිපති භාවයක් නැත්තාවූ), අනුන්ගේ කැමැති පරිදි පවත්නාවූ (අනුන්ට යටහත්වූ), තමා කැමැති ගමනක් ඒ වූ පරිදි යා නොහැකි වැඩකරුවෙක් වන්නේ ද, හෙතෙම පසු කලෙක ඒ දාසභාවයෙන් මිදෙන්නේ, තමාම අධිපතිකොට ඇත්තේ, පරාධීන නො වූයේ, අනුන්ට යටත් නොව තමා-ගෙත්ම යැපෙන්නේ, සිය අදහස් පරිදි ඒ ඒ තැන යා හැකි වන්නේ ද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. (එනම්:) 'මම වනාහි පෙර සියකැමැති පරිදි යමක් කරන්ට නොහැකි, අනුන්ට යටත් පැවතුම් ඇති, මා අදහස් පරිදි කිසි තැනෙක යා නොහැකි දාසයෙක් වීමි. ඒ මම දූන් ඒ දාසභාවයෙන් මිදුනෙක්මි. ආත්මාධීන වූයෙමි, පරාධීන නොවූයෙමි, මෙරමා-හට යටත් නොව මා සපයාගත් දෙයින්ම යැපෙන්නෙමි, මා අදහස් පරිදි ඒ ඒ කැමැති තැනෙක යා හැක්කෙක් ද වෙමි'යි කියායි. හෙතෙම ඒ දාසභාවයෙන් මිදීම හෙතුකොට බලවත් සතුටක් ලබන්නේය, එසේ සොම්නසට ද පැමිණෙන්නේය.

42. සෙය්‍යථාපි කෙවට්ට පුරිසො සධනො සභොගො කන්තාරද්ධානමග්ගං [1] පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං. සො අපරෙන සමයෙන තං කන්තාරං නිත්ථරෙය්‍ය සොත්ථිනා ගාමන්තං අනුපාපුණෙය්‍ය ඛෙමං අප්පටිභයං. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ සධනො සභොගො කන්තාරද්ධානමග්ගං [1] පටිපජ්ජිං දුබ්භික්ඛං සප්පටිභයං. සොම්හි එතරහි තං කන්තාරං තිණ්ණො [2] සොත්ථිනා ගාමන්තං අනුප්පත්තො ඛෙමං අප්පටිභයන්ති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං [3] අධිගච්ඡෙය්‍ය [4] සොමනස්සං.

43. එවමෙව ඛො කෙවට්ට භික්ඛු යථා ඉණං යථා රොගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං එවං [5] ඉමෙ පඤ්චනීවරණෙ අප්පහීනෙ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි කෙවට්ට යථා [6] ආනණ්‍යං යථා ආරොග්‍යං යථා බන්ධනාමොක්ඛං යථා භුජිස්සං යථා ඛෙමන්තභූමිං එවමෙව ඛො කෙවට්ට භික්ඛු ඉමෙ පඤ්ච නීවරණෙ පහීනෙ අත්තනි සමනුපස්සති.

44. තස්සිමෙ පඤ්ච නීවරණෙ පහීනෙ අත්තනි සමනුපස්සතො පාමොජ්ජං [3] ජායති පමුදිතස්ස පීති ජායති පීතිමනස්ස කායො පස්සම්භති පස්සද්ධකායො සුඛං වෙදෙති [7] සුඛිනො චිත්තං සමාධියති.

---

1. කන්තාරං අද්ධාන° B. S. Pa.
2. නිත්ථිණ්ණො P.W. නිත්ථින්නො Pa.
3. පාමුජ්ජං P. W. C.
4. අධිගච්ජෙ P. C.
5. එවං ති න දිස්සති P. W. S.
6. යථා ති නත්ථි B. (සබ්බත්ථ)
7. පටිසංවෙදෙති S.

42. කෙවට්ටය, යම්සේ ධනවත්වූ, භොගසම්පත් ඇති පුරුෂයෙක් ආහාර දුර්ලභවූ, භය සහිතවූ, නිරුදකවූ දීර්ඝමාර්ගය-කට (දුරුකතරමගකට) පැමිණෙන්නේ ද, හෙතෙම මඳ කලකින් ඒ කාන්තාරමාර්ගය ඉක්මවා යන්නේ, සැපවත්වූ, (සොර සතුරන් ගෙන්) ප්‍රතිභය රහිත වූ ගම්මානයකට ක්‍රමයෙන් පැමිණෙන්-නේ ද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: 'මම වනාහි පෙර ධනවත් වූයෙම්, භොගසම්පත් සහිත වූයෙම්, දුර්ලභ භික්‍ෂා ඇති, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාරමාර්ගයකට පිළිපන්නෙක් වූයෙමි. එසේ වූ මම දැන් එම කාන්තාරමාර්ගය තරණය කෙළෙමි. සැපවත්වූ, ප්‍රතිභය රහිතවූ ගමකට සැපසේ ක්‍රමයෙන් පැමිණියෙමි'යි කියාහි. ඒ පුරුෂ තෙමේ ඒ කතරමග එතර කිරීම නිමිතිකොට බලවත් සතුටක් ලබන්නේය, එසේම සොම්නසට ද පැමිණෙන්නේය.

43. කෙවට්ටය, ණය යම්සේ ද, රෝගය යම්සේ ද, බන්ධනා-ගාරය යම්සේ ද, දසභාවය යම්සේ ද, දුරුකතරමග යම්සේ ද, එපරිද්දෙන් මහණ තෙමේ ප්‍රහීණ නොවූ (පහ නොකළ) පඤ්චනීවරණයන් තමා කෙරෙහිලා නුවණින් දකී. කෙවට්ටය, ණය නැති බව යම්සේ ද, නීරෝගී බව යම්සේ ද, සිරගෙන් මිදීම යම්සේ ද, මෙරමාහට යටත් නැති බව යම්සේ ද, අභය භූමිය යම්සේද, එපරිද්දෙන්ම කෙවට්ටය, මහණ තෙමේ ප්‍රහීණවූ මේ පඤ්චනීවරණ ධර්මයන් තමා විෂයෙහි ලා දක්නේය.

44. ප්‍රහීණවූ මේ පඤ්චනීවරණයන් තමා කෙරෙහි නැතැයි නුවණින් දක්නාවූ ඒ මහණහට සතුටු ආකාරය උපදී. සතුටු වූවහුට (සියල් සිරුර කලඹමින්) ප්‍රීතිය උපදී, ප්‍රීති සහගත සිත් ඇත්තහුගේ නාමකය (සන්තානය) සංසිඳෙයි, සංසිඳුනු කය ඇති (කය පිළිබඳ මැඩ ලූ දහ ඇති) තැනැත්තේ කායික චෛතසික සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධියට (එකඟ බවට) එළඹෙයි.

45. සො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං[1] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො[2] කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං[3] හොති.

46. සෙය්‍යථාපි කෙවට්ට දක්ඛො න්හාපකො[4] වා න්හාපකන්තෙවාසී[4] වා කංසථාලෙ න්හානීයචුණ්ණානි[5] ආකිරිත්වා උදකෙන පරිප්ඵොසකං පරිප්ඵොසකං[6] සන්නෙය්‍ය[7] සායං[8] න්හානීයපිණ්ඩි[4] ස්නෙහානුගතා ස්නෙහපරෙතා සන්තරබාහිරඵුටා[9] ස්නෙහෙන[10] න ච පග්ඝරණී.[11] එවමෙව ඛො කෙවට්ට භික්ඛු ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො[2] කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං[3] හොති. ඉදම්පි වුච්චති කෙවට්ට අනුසාසනීපාටිහාරියං.

47. පුන ච පරං කෙවට්ට භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං[1] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො[2] කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්ඵුටං[3] හොති.

---

1. පඨමං ඣානං Pa.
2. සබ්බවතො V.
3. අප්ඵුටං, V.C. අප්ඵුතං, P. අඵුටං B. V.
4. ස්නා° W. නහා° P.
5. ස්නානීය° W. ත්හානීය° B. නහානීය P.
6. සකිදෙව වුත්තං S.
7. සන්නෙය්‍ය P. W. C.
8. සාජ්ස P.
9. °ඵුටා B. V. °ඵුතා P.
10. සිනෙ° P. W.
11. පග්ඝරණී B.

45. ඒ මහණතෙමේ වස්තුකාම ක්ලේශකාමයන්ගෙන් වෙන් වූයේම, අකුශල ධර්මයන් කෙරෙන් ද වෙන් වූයේ ම, (අරමුණෙහි සිත පැමිණවීම නම්) විතර්ක සහිතවූ, (අරමුණ පිරිමැදීම්, එහි හැසිරීම් සංඛ්‍යාත) විචාර සහිතවූ, සිතෙහි විවෙකයෙන් (නීවරණයන් දුරුවීම් හේතුවෙන්) උපන් ප්‍රීතියම සැපකොට ඇති, පඨමජ්ඣාන කුසල චිත්තය තමාගේ සන්තානයෙහි ඉපදවීම් වසයෙන් ඊට පැමිණ එම ධ්‍යානයෙහි වාසය කෙරේ. ඒ මහණ තෙමේ විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ (සකල) ශරීරයම තෙමයි (සැපවත් කෙරෙයි සේයි), හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි (සැම තන්හි පතුරවයි). ඒ මහණහුගේ සම්පූර්ණ ශරීරයෙහි සවල්පවූ ස්ථානයක් වුව ද ප්‍රථමධ්‍යාන සැපයෙන් (විවේකයෙන් උපන් ප්‍රීති සැපයෙන්) නොපහස්නා ලද්දේ නොවේ(සකල ශරීරයෙහිම පඨමජ්ඣාන සැපය පැතිරේයයි සේයි).

46. කෙවට්ටය, යම්සේ වනාහි දක්‍ෂවූ ස්නාන ද්‍රව්‍ය සපයන්නෙක් හෝ ඔහුගේ අතවැස්සෙක් හෝ ස්නානයට ගන්නාවූ සුණු ලෝහමය තලියෙක බහා දිය ඉසිමින් අතින් අනමින් (පිරිමදිමින්) පිඩුකරන්නේ ද, එවිට මේ ස්නාන චූර්ණපිණ්ඩය දියෙන් යුක්ත වේ, ජලය හාත්පසින් කාවැදුනේ වේ. එහි ඇතුළත හා පිටත ද සියලු තන්හිම ජලයෙන් පහස්නා ලද්දේ වේ. එහෙත් බිඳු වසයෙන් ජලය ඉන් නො වැගිරේ. කෙවට්ටය, එපරිද්දෙන් ඒ මහණ තෙමේ, විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ ශරීරය තෙමයි (පැතුරුණු සැප ඇත්තක් කරයි), හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි (සැමතන්හි පතුරුවයි). ඒ මහණහුගේ සියලු කොටස් ඇති ශරීරයෙහි සවල්පවූ තැනක් වත් විවෙකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් (ප්‍රථමධ්‍යානයෙන්) නොපහස්නා ලද්දේ නොවේ. කෙවට්ටය මෙයද අනුසාසනී පාටිහාරියයි කියනු ලැබේ.

47. කෙවට්ටය, නැවතද (අනිකක් කියමි). (යෝගී)මහණ තෙමේ විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් අධ්‍යාත්මයෙහි මනා පැහැදීම කරන්නාවූ, සිත පිළිබඳ එකඟ බව ඇති, විතර්ක විචාර නැති, සමාධියෙන් හටගත් ප්‍රීතිසැපය ඇති දුතියජ්ඣාන කුසල චිත්තයට පැමිණ වෙසේ. ඒ මහණ තෙමේ මේ කය සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් තෙමයි (සියලු තැන පතළ සැප ඇත්තක් කෙරේ), හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කරයි. ඒ මහණහුගේ සියලු කොටස් ඇති ශරීරයෙහි සවල්පවූ තැනක් වුවද ද්විතීයධ්‍යාන සැපයෙන් නො පහස්නා ලද්දේ නොවේ.

48. සෙය්‍යථාපි කෙවට්ට උදකරහදො ගම්භීරො[1] උබ්භිදොදකො[2] තස්ස නෙවස්ස පුරත්ථිමාය දිසාය උදකස්ස ආයමුඛං[3] න පච්ඡිමාය දිසාය උදකස්ස ආයමුඛං[3] න උත්තරාය දිසාය උදකස්ස ආයමුඛං[3] න දක්ඛිණාය දිසාය උදකස්ස ආයමුඛං[3] දෙවො[4] ච කාලෙන කාලං සම්මා ධාරං නානුප්පවෙච්ඡෙය්‍ය[5]. අථ ඛො තම්හා ච[6] උදකරහදා සීතා[7] වාරිධාරා උබ්භිජ්ජිත්වා තමෙව උදකරහදං සීතෙන වාරිනා අභිසන්දෙය්‍ය පරිසන්දෙය්‍ය පරිපූරෙය්‍ය පරිප්ඵරෙය්‍ය නාස්ස කිඤ්චි සබ්බාවතො[8] උදකරහදස්ස සීතෙන වාරිනා අප්ඵුටං[9] අස්ස.

49. එවමෙව ඛො කෙවට්ට භික්ඛු ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො[8] කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්ඵුටං[9] හොති.

50. පුන ච පරං කෙවට්ට භික්ඛු පීතියා ච විරාගා[10] උපෙක්ඛකො[11] ච විහරති සතො[12] සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො[11] සතිමා සුඛවිහාරීති තතියජ්ඣානං[13] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො[8] කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං[9] හොති.

---

1. ගම්භීරො ඉති න දිස්සති P.W.
2. උබ්භිතොදකො B. S. V.
3. උදකස්සාය° P. W.
4. දෙවො වා නං කා°S. දෙවො ච න කාලෙන කාං B. V.
5. අනුපවෙච්ඡෙය්‍ය B. V. P. W. අනුප්පවෙ° S. නානුප° C.
6. තම්හා වා S.
7. සීතවාරි° P. C.
8. සබ්බවතො V.
9. අඵුට්ඨං W; අඵුටං B. අප්ඵුතං P. C.
10. විරාගා ච P.
11. උපෙඛකො P.
12. සතො ච P. S.
13. තතියං ඣානං V. W.

48. කෙවට්ටය, යම්සේ ඇතුළතම හටගත් (පොළොව බිඳ නික්මෙන) ජලය ඇති දියවිලක් වේ ද, ඒ විල පිළිබඳ පෙර දිගින් ද, අපරදිගින් ද, උතුරු දිගින් ද, දකුණු දිගින් ද දිය එන මගක් නැත්තේ වේ ද, මෙඝය ද කලින් කල මනාසේ වැසි වර්ෂණය නො කරන්නේ ද, එසේ වූ ඒ විලෙන් සිහිල් දිය දහර පොළොව බිඳ නැගී ඒ මුළු විලම සිහිල් දියෙන් පතුරුවයි, හාත්පසින් වගුරුවයි, සම්පූර්ණයෙන් පුරවයි, එහි හැම තැන දියෙන් සපශී කෙරෙයි. ඒ සියලු විලෙහිම සීත ජලය නො පැතිර පවත්නා තැනක් නම් නැත්තේය.

49. කෙවට්ටය, එපරිද්දෙන් මේ මහණ තෙමේ මේ මුළු ශරීරයම සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් සියලු තැන පතුරුවන ලද්දක් කෙරේ, ප්‍රීති සැපයෙන් හාත්පසින් වගුරුවයි, සම්පූර්ණයෙන් පුරවයි, ඉන් සෑම තැනම සපශී කෙරෙයි. ඒ මහණහුගේ සම්පූර්ණ ශරීරයෙහි සවල්පවූ එක සථානයකුදු (ද්වීතියධ්‍යාන) ප්‍රීති සැපයෙන් නො පහස්නා ලද්දේ නොවේ.

50. කෙවට්ටය, යලිදු ඒ මහණ තෙමේ ප්‍රීතියෙහි නො ඇල්මෙන් මැදහත්බැව් ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් නුවණ ඇත්තේ කයින්ද සැපයක් විඳියි. යම් ධ්‍යානයක් පිළිබඳව (ඒ ධ්‍යානයට සමවැදුනු තැනැත්තා) උපෙක්ෂා ඇත්තේය, සිහි ඇත්තේය, සැපවිහරණ ඇත්තේ යයි ආයසීයෝ කියත් ද, ඒ තෘතියජඣාන කුසල චිත්තයට පැමිණ වාසය කෙරේ. ඒ මහණ තෙමේ මේ සකල ශරීරයම ප්‍රීතියෙන් මිදුණාවූ සැපයෙන් තෙමයි, හෙවත් සියලු තැන පැතිර පවත්නා සැප ඇත්තක් කෙරේ. ඒ සැපතින් හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, එයින් සෑමතැනම සපශී කෙරෙයි. ඒ මහණහුගේ සියලු ශරීරයෙහි සවල්පවූ එක තැනක් වුවද නිප්පීතික සුඛයෙන් (හෙවත් තෘතීය ධ්‍යානසුඛයෙන්) නො පහස්නා ලද්දේ නොවේ.

51. සෙය්‍යථාපි කෙවට්ට උප්පලිනියං වා[1] පදුමිනියං වා[1] පුණ්ඩරීකිනියං වා[1] අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි[2] උදකානුග්ගතානි අන්තොනිමුග්ගපොසීනි[3] තානි යාව චග්ගා[4] යාව ච මූලා සීතෙන වාරිනා අභිසන්නානි[5] පරිසන්නානි[5] පරිපූරානි පරිප්ඵුටානි[6] නාස්ස කිඤ්චි සබ්බාවතං[7] උප්පලානං වා[8] පදුමානං වා පුණ්ඩරීකානං වා සීතෙන වාරිනා අප්ඵුටං[9] අස්ස.

52. එවමෙව ඛො කෙවට්ට භික්ඛු ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්නෙති පරිසන්නෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො[10] කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං[9] හොති.

53. පුනචපරං කෙවට්ට භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා[11] අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං[12] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති නාස්ස කිඤ්චි සබ්බාවතො[10] කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුටං[9] හොති.

---

1. වාති න දිස්සති P.
2. සංවුඩ්ඪානි B. V; සංවඩ්ඪානි S.
3. °පොසීනි B.
4. යාව ච අග්ගා S.
5. °සන්නානි P. W.
6. පරිප්ඵුට්ඨානි P.
7. සබ්බවතං V.
8. වාති නත්ථි V.
9. අඵුටං B.V; අප්ඵුටං S.; අප්ඵුතං P.
10. සබ්බවතො V.
11. අත්ථගමා P.
12. චතුත්ථං ඣානං B. V.W.

51. කෙවට්ටය, යම්සේ උපුල් විලක හෝ හෙල පියුම් විලක හෝ රත් පියුම් විලක හෝ දියෙහි හටගත්, දියෙහි වැඩුනු, දියෙන් උඩට නොනැගුනු, දියතුළම ගැලී වැඩෙන්නාවූ සමහර උපුල් හෝ සමහර හෙල පියුම් හෝ සමහර රත් පියුම් හෝ වෙද් ද, ඒ උප්පලාදීහු අග දක්වාත්, මුල දක්වාත්, සිහිල් ජලයෙන් තෙමුනාහු, හාත්පසින් තෙමුනාහු, සම්පූර්ණයෙන් වැගුරුණාහු, හාත්පසින් පහස්නා ලද්දාහු වෙත් ද, ඒ උපුල්, හෙල පියුම්, රත් පියුම් යන මොවුන්ගෙන් එකකුත් ජලයෙන් නො පහස්නා ලද්දේ නොවේ ද,

52. කෙවට්ටය, එපරිද්දෙන් ඒ මහණ තෙමේ මේ සකල ශරීරයම නිප්පීතික සුඛයෙන් සියලු තැන පැතිර පවත්නා සැප ඇත්තක් කෙරෙයි, ඉන් හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි. ඒ මහණහුගේ සම්පූර්ණ ශරීරයෙහි සවල්පවූ එක තැනක්වත් නිප්පීතික(තෘතියජ්ඣාන)සුඛයෙන් නො පහස්නා ලද්දේ නොවේ.

53. කෙවට්ටය, නැවත ද, ඒ මහණතෙමේ සැප දුරුකිරී-මෙන් ද, දුක් දුරුකිරීමෙන් ද පළමුකොට සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැතිව යාමෙන් දුක් නොවූ, සැප නොවූ, උපෙක්ඛා හා සති යන මොවුන්ගේ පිරිසිදු බැව් ඇති, චතුර්ථජ්ඣාන චිත්‍තයට පැමිණ වෙසේ. ඒ මහණ තෙමේ මේ සකල ශරීරයම (කෙලෙස් නැති බැවින්) පිරිසිදුවූ, (අතිශයින් බබලන හෙයින්) පරියොදාතවූ, (ධ්‍යාන) සිතින් පතුරුවා හුන්නේ වේ (පතුරුවන්නේය). ඒ ධ්‍යානලාභී මහණහුගේ සර්වාඞ්ගයෙහි සවල්පවූ එක තැනකුදු පිරිසිදුවූ, අතිශයින් බබලන්නාවූ (චතුර්ථධ්‍යාන) චිත්‍තයෙන් නොපහස්නා ලද්දේ නොවේ.

54. සෙය්‍යථාපි කෙවට්ට පුරිසො ඔදාතෙන වත්ථෙන සසීසං පාරුපිත්වා නිසින්නො අස්ස නාස්ස කිඤ්චි සබ්බාවතො[1] කායස්ස ඔදාතෙන වත්ථෙන අප්ඵුටං[2] අස්ස;

55. එවමෙව ඛො කෙවට්ට භික්ඛු ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති නාස්ස කිඤ්චි සබ්බාවතො[1] කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුටං[2] හොති. ඉදම්පි වුච්චති කෙවට්ට **අනුසාසනීපාටිහාරියං.**

56. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[3] ඤාණදස්සනාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො එවං පජානාති: අයං ඛො මෙ කායෙ රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදනපරිමද්දනභෙදනවිද්ධංසනධම්මො ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති.

---

1. සබ්බවතො V. 2. අඵුට° B.V. අප්ඵුට° S. අප්ඵුත° P.

3. ආනෙජ්ජ° P.

54. කෙවට්ටය, යම්සේ පුරුෂයෙක් පිරිසිදුවූ සුදුවතකින් හිස සිට (දෙපා දක්වා) පොරවා උන්නේ වේද, ඔහුගේ සකල ශරීරයෙහි එකම තැනකුදු සුදුවතින් නො වසන (නොහොත් උණුසුම් නොකරණ) ලද්දේ නොවේ.

55. කෙවට්ටය, එපරිද්දෙන්ම ධ්‍යානලාභී මහණ තෙමේ මේ සියලු ශරීරයම පිරිසිදුවූ, අතිශයින් බබලන්නාවූ (චතුර්ථජ්ඣාන) චිත්තයෙන් පතුරුවා හුන්නේ වේ. ඒ මහණහුගේ සර්වාඞ්ගයෙහි සවල්පවූද එක් තැනක්වත් පිරිසිදුවූ බබලන්නාවූ (චතුර්ථජ්ඣාන) චිත්තයෙන් නො පහස්නා ලද්දේ නොවේ (චතුර්ථධ්‍යාන චිත්තයෙන් සකල ශරීරයම පතුරුවන ලද්දේය කී සේයි). කෙවට්ටය, මෙයද අනුසාසනී පාටිහාරියයි කියනු ලැබේ.

56. ඒ මහණතෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි, උපකෙලශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි, (කම්මණ්‍ය) කර්මයට සුදුසුව සිටි කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය ඉපදවීම පිණිස සිත එලවා තබයි, ඒ සඳහා මෙසෙයින් සිත නමයි. ඒ මහණ තෙමේ මෙසේ දැනගණී, කෙසේ ද යත්: 'මාගේ මේ ශරීරය වනාහි ආකාර ඇත්තේය (රූපයෙන් යුක්තය), සතර මහාභූතයන්ගේ හේතුවෙන් හටගත්තේය, (මව්පියන් නිසා) මව් පිය දෙදෙනාගේ ශුක්‍ර ශ්‍රොණිතයෙන් හටගත්තේය, බත්කොමු (කුම්මාස) ආදී ආහාරයෙන් වඩනා ලද්දේය. අනිත්‍ය බවය, දුගඳ නැසීම පිණිස සුණු ආදිය ගැල්වීමෙන් ඉලීමය, අඟපසඟ ආබාධ දුරලීම පිණිස පිරිමැදීමය, බිඳීමය, විනාශය යන මේ දේ සවභාවකොට ඇත්තේය. මාගේ මේ විඥානය වනාහි කාය ඇසුරු කෙළේ මෙයි, මෙහිම බැඳුනේ ඉවයි' කියායි.

57. සෙය්‍යථාපි කෙවට්ට මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අච්ඡො විප්පසන්නො අනාවිලො සබ්බාකාරසම්පන්නො තත්‍රස්ස[1] සුත්තං ආවුතං නීලං[2] වා පීතං[3] වා ලොහිතං[4] වා ඕදාතං වා පණ්ඩුසුත්තං[5] වා. තමෙනං[6] චක්ඛුමා පුරිසො හත්ථෙ කරිත්වා පච්චවෙක්ඛෙය්‍ය: අයං ඛො මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අච්ඡො විප්පසන්නො අනාවිලො සබ්බාකාර-සම්පන්නො තත්‍රිදං සුත්තං ආවුතං නීලං[2] වා පීතං[3] වා ලොහිතං[4] වා ඕදාතං වා පණ්ඩුසුත්තං[5] වාති.

58. එවමෙව ඛො කෙවට්ට භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— ඤාණදස්සනාය චිත්තං අභිනීහරති[7] අභිනින්නාමෙති. සො එවං පජානාති අයං ඛො මෙ කායො රූපී—පෙ—ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති. ඉදම්පි වුච්චති කෙවට්ට අනුසාසනීපාටිහාරියං.

59. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[8] මනොමයං කායං අභිනිම්මිනාය[9] චිත්තං අභිනීහරති[7] අභිනින්නාමෙති. සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං[10] අභීනින්ද්‍රියං[11].

60. සෙය්‍යථාපි කෙවට්ට පුරිසො මුඤ්ජම්හා ඊසිකං[12] පබ්බාහෙය්‍ය[13] තස්ස එවමස්ස: අයං මුඤ්ජො අයං ඊසිකා[12]. අඤ්ඤො මුඤ්ජො අඤ්ඤා ඊසිකා[12] මුඤ්ජම්හාත්වෙව ඊසිකා[12] පබ්බාළ්හාති[13].

---

1. තත්‍රසුත්තං P. W.
2. නිලං B.
3. පිතං B.
4. ලොහිතකං B.
5. පණ්ඩුරසු° S.
6. තමෙව ච° P.
7. °නිහරති B.
8. ආනෙජ්ජ° P. C.
9. මනොමයං අභිනිම්මිනනාය S.
10. °පච්චඞ්ගං S.
11. අභින්නින්ද්‍රියං C.
12. ඉසි° P. S. W. C.
13. පවා° P. W. S.

57. කෙවට්ටය, යම්සේ වනාහි යහපත්වූ, පිරිසිදු ආකරයෙන් උපන්නාවූ, අටැස්වූ, (පාෂාණාදි දෙස් බැහැර කිරීමෙන්) මොනවට සකස් කරණ ලද්දාවූ, නිර්මලවූ, විශෙෂයෙන් ප්‍රසන්නවූ, නොකැලැල්වූ, සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, වෙරළුමිණක් (වෛඩූර්‍ය මැණිකක්) වේද, එහි නිල්වූ හෝ පීතවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ හුයක් (නූලක්) අමුණන ලද්දේද, ඒ මේ මැණික ඇස් ඇති පුරුෂයෙක් අතට ගෙණ මෙසේ සලකා බලන්නේය, (කෙසේද යත්:) ‘මේ වෛඩූර්‍ය මැණික වනාහි මනාසේ කාන්තිමත් හෙයින් යහපත් වේ, පිරිසිදු ආකරයෙන් උපන්නේය, අටැස් ඇත්තේය, (දෙස් දුරුකිරීමෙන්) මනාකොට සකස් කරණ ලද්දේය, නිර්මලය, විශෙෂයෙන් ප්‍රසන්නය, නොකැලැල්ය, සියලු ආකාරයෙන් සම්පූර්ණය. ඒ මැණිකෙහි මේ නීලවර්ණවූ හෝ පීතවර්ණවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ හුයක් අමුණන ලද්දේය’ කියායි.

58. කෙවට්ටය, එපරිද්දෙන්ම යොගීවූ මේ මහණ තෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, —පෙ— විදර්ශනාඥානය පිණිස සිත එලවා තබයි, ඒ සඳහා විශෙෂයෙන් සිත නමයි. ඒ මහණ තෙමේ මෙසේ දන්නේය, (කෙසේද යත්:) ‘මාගේ මේ ශරීරය වනාහි ආකාරවත් (රූපයෙන් යුක්ත) ය, —පෙ— මාගේ මේ විඥානය වනාහි මේ කය ඇසුරු කෙළේ වෙයි, මෙහිම බැඳී සිටියේය’ කියා යි. කෙවට්ටය, මෙයද අනුශාසනිප්‍රාතිහාර්‍යයයි කියනු ලැබේ.

59. ඒ මහණ තෙමේ මෙසේ ධ්‍යානයෙන් සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් නැතිවූ කල්හි, උපක්ලෙශ පහවූ කල්හි, මෘදුවූ කල්හි, යොග කර්මයට සුදුසුව සිටි කල්හි, නො සැලෙන බවට පැමිණි කල්හි, මනෝමයවූ කයක් (රූපයක්) මනාකොට නිපදවීම පිණිස සිත එලවා තබයි, වෙසෙසින් නමයි. ඒ මහණ තෙමේ ආකාරවත්වූ, මනොමයවූ (ධ්‍යාන සිතින් නිපදවනලද), සියලු අඟපසඟ ඇති, අවිකලවූ ඉඳුරන් ඇති, මේ කයින් අන්‍යවූ කයක් මොනවට නිමවයි.

60. කෙවට්ටය, යම්සේ වනාහි පුරුෂයෙක් තෙම මුදු තණගසින් තණබඩය උද්ධරණය කරන්නේ ද, ඔහුට මේ අදහස් වන්නේය: මේ තණගසය, මේ තණබඩයය; තණගස අනිකෙක, තණබඩය අනිකෙක, තණගසින්ම තණබඩය ඇදගන්නා ලද්දේය (යන වැටහීම ඔහට පහළ වන්නේය).

සෙය්‍යථා[1] වා පන කෙවට්ට පුරිසො අසිං[2] කොසියා පබ්බාහෙය්‍ය[3] තස්ස එවමස්ස: අයං අසි අයං කොසි අඤ්ඤො අසි අඤ්ඤා[4] කොසි. කොසියා ත්වෙව අසි පබ්බාළ්හොති[3].

සෙය්‍යථා වා[1] පන කෙවට්ට පුරිසො අහිං කරණ්ඩා උද්ධරෙය්‍ය තස්ස එවමස්ස: අයං අහි අයං කරණ්ඩො අඤ්ඤො අහි අඤ්ඤො කරණ්ඩො. කරණ්ඩා ත්වෙව අහි උබ්භතොති[5].

එවමෙව ඛො කෙවට්ට භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ—පෙ— ආනෙඤ්ජප්පත්තෙ[6] මනොමයං කායං[7] අභිනිම්මිනාය[8] චිත්තං අභිනීහරති[9] අභිනින්නාමෙති. සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං[10] අහීනින්ද්‍රියං[11].

61. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනීයෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[6] ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති[9] අභිනින්නාමෙති. සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති එකොපි හුත්වා බහුධා හොති බහුධාපි හුත්වා එකො හොති ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ. පඨවියා[12] පි උම්මුජ්ජනිමුජ්ජං[13] කරොති සෙය්‍යථාපි උදකෙ. උදකෙපි අභිජ්ජමානො[14] ගච්ඡති සෙය්‍යථාපි පඨවියං[12]. ආකාසෙ පි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙපි චන්දිමසූරියෙ[15] එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරිමසති[16] පරිමජ්ජති. යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.

---

1. සෙය්‍යථාපි පන P. W.
2. අසි කොසියං W. අසි කොසියා P. V.
3. පවා° P. W. S.
4. අඤ්ඤො P. W.
5. උද්ධරිතොති S.
6. ආනෙජ්ජ° P.
7. කායං ති න දිස්සති S.
8. °නිම්මිනනාය S.
9. °නිහරති B.
10. °පච්චඞ්ගං S.
11. අභින්නින්ද්‍රියං C. අභි°P.
12. පථ° B. V.
13. °නිම්මුජ්ජං P. W.
14. අභෙජ්ජ° W.
15. °සූරියෙ B.
16. පරා° B. V. W.

කෙවට්ටය, යම්සේ මනාඞී පුරුෂයෙක් කඩුව කොපුවෙන් ඉවත් කරන්නේ ද ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: මේ කඩුවය, මේ (කඩු) කොපුවය, කඩුව අනිකෙක, කොපුව අනිකෙක, කොපුවෙන්ම කඩුව ඉවත්කරණ ලද්දේය කියාහි.

කෙවට්ටය, යම්සේ හෝ පුරුෂයෙක් සපියකු සැවයෙන් පහකරන්නේද[1] (වෙන්කොට සලකන්නේද), ඔහට මේ සපියාය, මේ සැවය, සපියා එකෙකි, සැව අනිකකි, සැවයෙන්ම සපියා වෙන්කරණ ලද්දේය යි වැටහීමක් ඇතිවන්නේය.

කෙවට්ටය, එසේම භික්ෂුව මෙසේ සිත සමාධිගතවූ කල්හි, —පෙ— නොසැලෙනබවට පැමිණි කල්හි සිතින් උපදවන කයක් මැවීම පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට ඊට නමයි. හේතෙමේ මේ කයින් රූ ඇති, සිතින් මවන ලද, සියලු අඟපසඟ ඇති, නොපිරිහුනු ඉන්ද්‍රියයන් ඇති වෙන කයක්මවයි.

61. හේතෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞගණ රහිත වූ කල්හි, උපක්ලේශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍ය භාවයට පැමිණි කල්හි, සෘද්ධිවිධි පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි (ඊට නැඹුරු කෙරෙයි). හේතෙමේ නොයෙක් අයුරු ඇති සෘද්ධිවිධි වෙන් වෙන් කොට අනුභව කෙරෙයි. එකෙක්ම බොහෝ සේ වෙයි. බොහෝ සේ ව එකෙක් වෙයි. ප්‍රකට බවට, මුවහ බවට, අහසෙහි මෙන් බිත්තිය සරසට, පවුර සරසට, පව්ව සරසට නොගැටෙමින් යෙයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම් මතුවීම් කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබෙදා ගමන් කෙරෙයි. පක්ෂියකු මෙන් අහසෙහි ද පලඟින් යෙයි. මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභාව ඇති සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි, බඹලොව තෙක් කයින් වසඟ බව පවත්වයි.

---

1. මෙසේ කරන්නේ සිතින් පමණකැයි අටුවාහි.

64. සෙය්‍යථාපි කෙවට්ට පුරිසො අද්ධානමග්ගපටිපන්නො[1] සො සුණෙය්‍ය හෙරිසද්දම්පි මුදිඞ්ගසද්දම්පි[2] සඞ්ඛපණවදෙණ්ඩිමසද්දම්පි[3] තස්ස එවමස්ස: හෙරිසද්දො ඉතිපි මුදිඞ්ගසද්දො[2] ඉතිපි සඞ්ඛපණවදෙණ්ඩිමසද්දො[4] ඉතිපි. එවමෙව ඛො කෙවට්ට භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති[5] අභිනින්නාමෙති. සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච.

65. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[6] චෙතොපරියඤාණාය චිත්තං අභිනීහරති[5] අභිනින්නාමෙති. සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති.

සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති වීතරාගං[7] වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති සඞ්ඛිත්තං වා චිත්තං සඞ්ඛිත්තං චිත්තන්ති පජානාති වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

---

1. °මග්ගප්පටි° B. V.
2. මුතිඞ්ග° P.W.
3. °දෙන්ඩිම° B; සඞ්ඛසද්දම්පි පණවසද්දම්පි දෙන්ඩිමස° S.
4. සඞ්ඛසද්දො ඉතිපි පණවසද්දො ඉතිපි දෙන්ඩිමස° S.
5. °නීහරති B.
6. ආනෙජ්ජ° P.
7. වීත° B. (සබ්බත්‍ථ)

64. කෙවට්ටය, දික් මගට පිවිසි පුරුෂයෙක් බෙර හඬද, මිහිඟු බෙර හඬද, සක්, පණාබෙර, ගැටබෙර හඬද යම්සේ අසාද, ඔහුට මේ බෙර හඬයයිද, මිහිඟුබෙර හඬයයිද, සක්, පණාබෙර, ගැටබෙර හඬ යයිද සිතෙන්නේය. කෙවට්ටය, එලෙසින්ම භික්ෂුව මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත වූ කල්හි, පහ වූ උපක්ලේශ ඇති කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍යභාවයට පැමිණි කල්හි, දිව්‍යශ්‍රොත්‍රඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට ඊට නමයි. හේ තෙමේ මෙසේ පිරිසිදුවූ මිනිස්කණ ඉක්ම වූ දිව්‍ය ශ්‍රොත්‍රඥානයෙන් දිව්‍යමය වූ ද, මනුෂ්‍යමය වූ ද, දුරෙහි වූ ද, සමීපයෙහි වූ ද දෙවැදෑරුම් ශබ්දයන් අසයි.

65. හේතෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත වූ කල්හි, පහවූ උපක්ලේශ ඇති කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍යභාවයට පැමිණි කල්හි, සිත් පිරිසිඳින ඥාණය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි (ඊට නැඹුරු කෙරෙයි). හේතෙමේ අන්‍ය සත්ත්වයන්ගේ, අන්‍ය පුද්ගලයන්ගේ සිත (තමන් ගේ) සිතින් පිරිසිඳ දනියි.

රාග සහිත සිත සරාග සිත යයි දනියි. රාගය පහ වූ සිත වීතරාග සිත යයි දනියි. ද්වෙෂ සහිත සිත සද්වෙස සිත යයි දනියි. ද්වෙෂය පහවූ සිත වීතද්වෙෂ සිත යයි දනියි. මොහ සහිත සිත සමොහ සිත යයි දනියි, මොහය පහ වූ සිත වීතමොහ සිත යයි දනියි. හැකුලුනු සිත හැකුලුනු සිත යයි දනියි; විසුරුණු සිත විසුරුණු සිත යයි දනියි. මහත් බවට ගිය සිත මහත් බවට ගිය සිත යයි දනියි. මහත් බවට නොගිය සිත මහත් බවට නොගිය සිත යයි දනියි. උතුරුසහිත (කාමාවචර) සිත උතුරුසහිත සිත යයි දනියි. අනුත්තර (රූපාවචර අරූපාවචර) සිත අනුත්තර සිත යයි දනියි. සමාධිගත වූ සිත සමාධිගත වූ සිත යයි දනියි, සමාධිගත නො වූ සිත සමාධිගත නො වූ සිත යයි දැනගණී. (ක්ලේශයෙන්) මිදුනු සිත මිදුනු සිත යයි දැනගණී, නොමිදුනු සිත නොමිදුනු සිත යයි දැනගණී.

66. සෙය්‍යථාපි කෙවට්ට ඉත්ථී වා පුරිසො වා දහරො වා යුවා මණ්ඩනජාතිකො[1] ආදාසෙ වා පරිසුද්ධෙ පරියොදාතෙ අච්ඡෙ වා උදකපත්තෙ[2] සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො සකණිකං[3] වා සකණිකන්ති[3] ජානෙය්‍ය අකණිකං[4] වා අකණිකන්ති[4] ජානෙය්‍ය.

67. එවමෙව ඛො කෙවට්ට භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— ආනෙඤ්ජප්පත්තෙ[5] චෙතොපරියඤාණාය චිත්තං අභිනීහරති[6] අභිනින්නාමෙති. සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති —පෙ— අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

68. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[5] පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති[6] අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති සෙය්‍යථීදං[7] එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසම්පි[8] ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි[9] ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ: අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උදපාදිං[10]. තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නොති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

---

1. මණ්ඩනක° S. C.
2. උදප° W.
3. සකනි° B.
4. අකනි° B.
5. ආනෙජ්ජ° P.
6. °නීහරති B.
7. සෙය්‍යථිද° B. V.
8. වීසතිම්පි P. W.
9. සතංපි ජාතියො සහස්සංපි ජා° සතසහස්සංපි ජා° අනෙකෙපි S.
10. උප්පාදිං W.

66. කෙවට්ටය, සැරසෙන සුලු ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ දහරයෙක් හෝ තරුණයෙක් හෝ පිරිසිදු, නොකිලිටි කැඩපතෙක හෝ පිරිසිදු දිය බඳුනෙක්හි හෝ තමාගේ මුව නිමිත්ත (මුඛ ශොභාව) පරීක්‍ෂා කරන්නේ, යම්සේ කැලල් සහිත නම් කැලල් සහිත යයි දැනගණ්ද, කැලල් රහිත නම් කැලල් රහිත යයි දැනගණ්ද,

67. කෙවට්ටය, එසේම භික්‍ෂුව මෙසේ සිත එකඟ වූ කල්හි, —පෙ—නොසැලෙනබවට පැමිණි කල්හි, සිත් පිරිසිඳින ඥාණය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ තෙමේ අන්‍ය සත්ත්වයන්ගේ, අන්‍ය පුද්ගලයන්ගේ සිත (තමන්ගේ) සිතින් පිරිසිඳ දනියි. සරාග සිත සරාග සිත යයි දනියි. —පෙ— නොමිදුනු සිත නොමිදුනු සිත යයි දැනගනියි.

68. හේතෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඩගණ රහිත වූ කල්හි, උපකෙලශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කර්මණ්‍යවූ කල්හි, ස්ථිරයට පැමිණි කල්හි, අකම්ප්‍ය භාවයට පැමිණි කල්හි, පූර්වේනිවාසානුස්මෘතිඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට (ඊට) නමයි. හේ තෙමේ නොයෙක් විදියේ පෙර විසීම් සිහි කෙරෙයි. කෙසේදයත්: එක් ජාතියක් ද, දෙ ජාතියක් ද, තුන් ජාතියක් ද, සිවු ජාතියක් ද, පස් ජාතියක් ද, දස ජාතියක් ද, විසි ජාතියක් ද, තිස් ජාතියක් ද, සතළිස් ජාතියක් ද, පණස් ජාතියක් ද, සියක් ජාතියක් ද, දහස් ජාතියක් ද, සියක් දහස් ජාතියක් ද, නොයෙක් සංවෘත කල්පයන් ද, නොයෙක් විවෘත කල්පයන් ද, නොයෙක් සංවෘත විවෘත කල්පයන් ද 'අසුවල් තැන වීමි, මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මේ පැහැ ඇත්තෙමි, මේ අහර ඇත්තෙමි, මේ සැපදුක් වින්දෙමි, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙමි වීමි. ඒ මම එයින් චුතවූයෙම් අසුවල් තැන උපන්මි. එහිදු මෙනම් ඇත්තෙම්, මේ ගොත්‍ර ඇත්තෙම්, මේ පැහැ ඇත්තෙම්, මේ අහර ඇත්තෙම්, මේ සැපදුක් වින්දෙම්, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතවූයෙම් මෙහි උපන්මි'යි මෙසේ ආකාර සහිතව, උදෙසීම් සහිතව, නොයෙක් විදියේ පෙර විසීම් සිහිකෙරෙයි.

69. සෙය්‍යථාපි කෙවට්ට පුරිසො සකම්හා ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය තම්හාපි ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය. සො[1] තම්හා[2] ගාමා සකඤ්ඤෙව[3] ගාමං පච්චාගච්ඡෙය්‍ය.[4] තස්ස එවමස්ස: අහං ඛො සකම්හා ගාමා අමුං ගාමං අගච්ඡිං[5] තත්‍ර[6] එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හීඅහොසිං. තම්හාපි ගාමා අමුං ගාමං අගච්ඡිං[5]. තත්‍රාපි[6] එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හීඅහොසිං. සොම්හි තම්හා ගාමා සකඤ්ඤෙව[3] ගාමං පච්චාගතො[4] ති.

70. එවමෙව ඛො කෙවට්ට භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති[7] අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති—සෙය්‍යථීදං එකම්පි ජාතිං —පෙ— ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

71. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[8] සත්තානං චුතූපපාතඤාණාය[9] චිත්තං අභිනීහරති[7] අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[10] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ[11] සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා.[12] ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති[12]. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[10] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ[11] සත්තෙ පජානාති.

---

1. සො ති න දිස්සති P. W.
2. තම්හාපි ගාමා P.
3. සකංයෙව B. P.
4. පච්ජා° P.
5. අගඤ්ඡිං S. ආගඤ්ඡිං P. ආගච්ඡිං Pa.
6. තත්‍රාහං B. S. තත්‍රාපි B. Pa. W.
7. °නිහරති B.
8. ආනෙඤ්ජ° P.
9. චූතූප° B.
10. උප්පජ්ජං W.
11. කම්මූපගෙ B.
12. උප්පන්නා W.

69. කෙවට්ටය, පුරුෂයෙක් යම්සේ තම ගමින් අන් ගමකට යන්නේ ද, ඒ ගමිනුත් අන් ගමකට යන්නේ ද, ඒ ගමිනුත් තමන් ගමට එන්නේ ද, 'මම සිය ගමින් අසුවල් ගමට ගියෙමි, එහි මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි, මෙසේ බිණීමි, මෙසේ තුෂ්ණීම්භූත වීමි. එගමිනුදු අසුවල් ගමට ගියෙමි, එහි ද, මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි, මෙසේ බිණීමි, මෙසේ තුෂ්ණීම්භූත වීමි. ඒ මම ඒ ගමින් සිය ගමටම පැමිණියෙමි'යි හෙතෙම දන්නේ ද,

70. කෙවට්ටය, එපරිද්දෙන්ම භික්‍ෂුව මෙසේ සිත එකඟ වූ කල්හි, —පෙ— නොසැලෙන බවට පැමිණි කල්හි පූර්වේනිවාසානුස්මෘතිඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට නමයි. හේ නොයෙක් පූර්වේනිවාස සිහි කෙරෙයි. කෙසේදයත්: එක් ජාතියක් ද,—පෙ—මෙසේ ආකාර සහිතව උද්දෙසීම් සහිතව නොයෙක් ආකාරවූ පූර්වේනිවාස සිහි කෙරෙයි.

71. හෙතෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිතවූ කල්හි, උපක්ලේශ පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කර්මණ්‍යවූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්පනමානභාවයට පැමිණි කල්හි සත්ත්වයන්ගේ චුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි (ඊට නැඹුරු කෙරෙයි). හේ පිරිසුදු වූ, මිනිස් ඇස ඉක්මවූ, දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී. හීන ප්‍රණීත, සුවර්ණ දුර්වර්ණ, සුගත දුගීත, කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දනී: 'මේ පින්වත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්තය, වාග්දුශ්චරිතයෙන් යුක්තය, මනෝදුශ්චරිතයෙන් යුක්තය, ආර්‍යයන්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය, මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන් වූවෝය. ඔවුහු කාබුන් මරණින් මතු අපාය වූ, දුගීතිය වූ, විනිපාතය වූ, නිරයට පැමිණියාහුය'. නැතහොත්, 'මේ පින්වත් සත්ත්වයෝ කායසුචරිතයෙන් යුක්තය, වාක්සුචරිතයෙන් යුක්තය, මනඃසුචරිතයෙන් යුක්තය, ආර්‍යයන්ට නොබණින්නෝ ය, සම්‍යග්දෘෂ්ටිකයෝ ය, සම්‍යග්දෘෂ්ටිකර්ම සමාදන් වූවෝය, කාබුන් මරණින් මතු සුගතිය වූ, ස්වර්ග ලොකයට පැමිණියෝ'යි මෙසේ පිරිසුදු වූ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී, හීන ප්‍රණීත, සුවර්ණ, දුර්වර්ණ, සුගත දුගීත, කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දනී.

72. සෙය්‍යථාපි කෙවට්ට මජ්ඣෙ සිංඝාටකෙ පාසාදෙ[1] තත්‍ථ චක්ඛුමා පුරිසො ඨිතො පස්සෙය්‍ය මනුස්සෙ ගෙහං පවිසන්තෙපි නික්ඛමන්තෙපි රථියා[2] වීතිසඤ්චරන්තෙ[3] පි මජ්ඣෙ[4] සිංඝාටකෙ නිසින්නෙපි[5]. තස්ස එවමස්ස: එතෙ මනුස්සා ගෙහං පවිසන්ති එතෙ නික්ඛමන්ති එතෙ රථියා[2] වීතිසඤ්චරන්ති[6] එතෙ[7] මජ්ඣෙ සිංඝාටකෙ නිසින්නාති.

73. එවමෙව ඛො කෙවට්ට භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ—පෙ—සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති[8] අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[9] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචිදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති.

74. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[9] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

75. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනීයෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[10] ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති.

---

1. පාසාදෙ Pa.
2. රථියාපි රථිං සඤ්චර° V. රථියායපි B.
3. වීථි සං° P. W; වීථිං සංචරිං B. S; සං°V. වීතිසං° Ce; වීදිසංචරන්තෙ Ca. B.
4. මජ්ඣෙපි P. W.
5. නිසින්නෙ P. W.
6. වීථි° P. W. වීථිං° B.S. රථිං සං° V.
7. එතෙ මනුස්සා B.
8. °නිහරන්ති B.
9. උප්පජ්ජ° W.
10. ආනෙඤ්ජ° B.

72. කෙවට්ටය, යම්සේ මංසලක පහයක් වේ ද, එහි ඇස් ඇති පුරුෂයෙක් සිටියේ ගෙට පිවිසෙන, ගෙයින් නික්මෙන, වීථියෙහි හැසිරෙණ, මංසල හිඳින මනුෂ්‍යයන් දක්නේ ද, ඔහුට මෙසේ සිතෙයි: 'මේ මිනිස්සු ගෙට පිවිසෙති, මොහු නික්මෙති, මොහු වීථියෙහි හැසිරෙති, මොහු මංසල හිඳිති'යි කියායි.

73. කෙවට්ටය, එසේ ම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, —පෙ— සත්ත්වයන්ගේ චුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ මිනිස් ඇස ඉක්ම වූ දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී. හීන ප්‍රණීත, සුවණ් දුවණ්, සුගත දුගීත, කම්ය ලෙස පැමිණි සත්ත්වයන් දකී: 'මේ පින්වත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්තය,වාග්දුශ්චරිතයෙන් යුක්තය,මනොදුශ්චරිතයෙන් යුක්තය, ආය්‍ෂීයන්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය, මිථ්‍යාදෘෂ්ටිකම් සමාදන් වූවෝය. ඔවුහු කාබුන් මරණින් මතු අපාය වූ, දුගීතිය වූ, විනිපාතය වූ, නිරයට පැමිණියෝය'. නැත හොත්, 'මේ පින්වත් සත්ත්වයෝ කායසුචරිතයෙන් යුක්තය, වාක්සුචරිත යෙන් යුක්තය, මනඃ සුචරිතයෙන් යුක්තය, ආය්‍ෂීයන්ට නොබණින්නෝ ය, සම්‍යග්දෘෂ්ටිකයෝය, සම්‍යග්දෘෂ්ටිකම් සමාදන් වූවෝය. ඔවුහු කාබුන් මරණින් මතු සුගතිය වූ, ස්වගී ලොකයට පැමිණියෝ'යි කියායි.

74. මෙසේ පිරිසුදු වූ, මිනිස් ඇස ඉක්ම වූ දිව ඇසින් චුතවන, උපදින සත්ත්වයන් දකී; හීන ප්‍රණීත, සුවණ් දුවණ්, සුගත දුගීත, කම්ය ලෙස පැමිණි සත්ත්වයන් දනී.

75. හේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත කල්හි, උපක්ලෙශ යන් පහව ගිය කල්හි, මෘදු වූ කල්හි, කම්ණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්පයමාන භාවයට පැමිණි කල්හි ආශ්‍රවයන්ගේ ක්‍ෂය ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට නමයි.

සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති යථාභූතං පජානාති. ඉමෙ ආසවාති යථාභූතං පජානාති. අයං ආසවසමුදයොති යථාභූතං පජානාති. අයං ආසවනිරොධොති යථාභූතං පජානාති. අයං ආසවනිරොධගාමිනීපටිපදාති යථාභූතං පජානාති.

76. තස්ස එවං ජානතො[1] එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති භවාසවාපි චිත්තං විමුච්චති අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති.

77. සෙය්‍යථාපි කෙවට්ට පබ්බසඞ්ඛෙපෙ උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො තත්ථ චක්ඛුමා පුරිසෙ තීරෙ ඨිතො පස්සෙය්‍ය සිප්පිසම්බුකම්පි සක්ඛරකඨලම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පි තස්ස එවමස්ස: අයං ඛො උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො තත්‍රිමෙ සිප්පිසම්බුකා පි සක්ඛරකඨලාපි මච්ඡගුම්බාපි චරන්තිපි තිට්ඨන්තිපීති. එවමෙව ඛො කෙවට්ට භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති. ඉදං වුච්චති කෙවට්ට අනුසාසනීපාටිහාරියං.

ඉමානි ඛො කෙවට්ට තීණි පාටිහාරියානි මයා සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදිතානි.

---

1. පජානතො B.
2. සොති තස්ස W.
3. පඤ්ඤ° B.
4. පතිට්ඨපෙසි W.
5. උත්තරි B.
6. තත්වි තො කිඤ්චි B. S.

හේතෙමේ මේ දුක යයි තතු ලෙස දැනගණී, මේ දුක් ඉපදීමේ හෙතුව යයි තතු ලෙස දැනගණී, මෙ දුඃඛනිරොධ යයි තතු ලෙස දැනගණී, මේ දුඃඛ-නිරොධගාමී ප්‍රතිපදාව යයි තතු ලෙස දැනගණී. මේ ආශ්‍රවයෝ යයි තතු ලෙස දැනගණී, මේ ආශ්‍රවසමුදයයි තතු ලෙස දැනගණී, මේ ආශ්‍රවනිරොධ යයි තතු ලෙස දැනගණී, මේ ආශ්‍රවනිරොධගාමී ප්‍රතිපදාව යයි තතු ලෙස දැනගණී.

76. මෙසේ දක්නා මෙසේ දන්නා ඔහුගේ සිත කාමාශ්‍රවයන් කෙරෙන් ද මිදේ, භවාශ්‍රවයන් කෙරෙන් ද සිත මිදේ, අවිද්‍යාශ්‍රවයන් කෙරෙන් ද සිත මිදේ. මිදුනු කල්හි 'මිදුනේය' යන සිතවෙයි. 'ජාතිය ක්‍ෂය වීය, බ්‍රහමචර්‍ය්‍යය වැස නිමවන ලදී, කටයුතු කරණලදී, මේ අත්බැවින් පසු අනික් අත්බවෙක් නැතැ'යි ද දැනගණී.

77. කෙවට්ටය, යම්සේ පර්‍වත මස්තකයෙක පිරිසුදු, පැහැදුනු, නොකැළඹුනු දියවිලක් වේද, එහි ඉවුරේ ඇස් ඇති පුරුෂයෙක් සිටියේ සිප්පි බෙල්ලන් හා සක් බෙල්ලන් ද, කැටකැබිලිති ද එහා මෙහා යන්නාවූ හා නැවති සිටින මසුන් රැන් ද, හැසිරෙන්නවුන් ද, නැවති තිබෙන දෑද, දක්නේය. ඔහුට මෙසේ සිතේ: මේ දියවිල පිරිසුදුය, ඉතා පැහැදිලිය, නොකැළඹුනේය, එහි මේ සිප්පි බෙල්ලන් හා සක් බෙල්ලන් ද, කැටකැබිලිති ද, මසුන් රැන් ද හැසිරෙත්, නැවති සිටිත්ය කියායි. කෙවට්ටය, එලෙසින් ම භික්‍ෂුව මෙසේ සිත එකඟ වූ කල්හි, —පෙ— කටයුතු කරණ ලදී, කෙවට්ටය, මෙයද අනුසාසනීපාටිහාරියයි කියනු ලැබේ. මේ අත් බැවින් පසු අනික් අත් බවෙක් නැතැයි ද දැනගණී.

කෙවට්ටය, මෙයද අනුශාසනප්‍රාතිහාර්‍ය්‍යයි යයි කියනු ලැබේ.

කෙවට්ටය, මේ ප්‍රාතිහාර්‍ය්‍ය තුන මා විසින් ම උසස් ඥාන යෙන් දැන ප්‍රත්‍යක්‍ෂකොට මා විසින් ප්‍රකාශ කරන ලදී.

78. භූතපුබ්බං කෙවට්ට ඉමස්මිංයෙව භික්ඛුසඞ්ඝෙ අඤ්ඤතරස්ස භික්ඛුනො එවං චෙතසො පරිවිතක්කො උදපාදි: කත්ථ[1] නු ඛො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං[2] පඨවීධාතු[3] ආපොධාතු තෙජොධාතු වායොධාතූති? අථ ඛො සො කෙවට්ට භික්ඛු තථාරූපං සමාධිං සමාපජ්ජි යථා සමාහිතෙ චිත්තෙ දෙවයානියො මග්ගො පාතුරහොසි.

79. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන චාතුම්මහාරාජිකා[4] දෙවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා චාතුම්මහාරාජිකෙ දෙවෙ එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති?

එවං වුත්තෙ කෙවට්ට චාතුම්මහාරාජිකා දෙවා තං භික්ඛුං එතදවොචුං: මයම්පි ඛො භික්ඛු න ජානාම යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති[5]. අත්ථි ඛො භික්ඛු චත්තාරො මහාරාජානො අම්හෙහි අභික්කන්තතරා ච පණීතතරා ච. තෙ ඛො එතං[6] ජානෙය්‍යුං යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති.

80. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන චත්තාරො මහාරාජානො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා චත්තාරො මහාරාජෙ එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති?

---

1. කථං S. (සබ්බත්ථ)
2. සෙය්‍යථිදං B. V. (සබ්බත්ථ)
3. පඨ° B. V. (සබ්බත්ථ)
4. චාතුමහා° B. V. (සබ්බත්ථ)
5. ඉතිහි තත්ථ P.
6. එවං P. (සබ්බත්ථ)

78. කෙවට්ටය, පෙර වූවක් කියමි. මේ භික්ෂුසඞ්ඝයා අතර ම එක්තරා මහණක්හුගේ සිත්හි මේ විතර්කය උපන්නේ ය: මේ පෘථිවී, අප්, තේජස්, වායු යන චතුර්විධ මහාභූතයෝ නිරවශේෂයෙන් කොතැන්හි නම් ප්‍රහීණ වේද් ද? (කියාහි). කෙවට්ටය, එයින් පසු ඒ භික්ෂුව යම් සමාධියකට සිත සමවැදුනු කල දෙව්ලොවට යන මග පහළවේ ද, එබඳු චිත්තසමාධියකට සමවැදුනේ ය.

79. කෙවට්ටය, ඉක්බිති ඒ භික්ෂුව චාතුර්මහාරාජික දෙවියන් වසන දෙව්ලොව යම් තැනෙක්හිද එහි එළඹ ඒ දෙවියන්ගෙන් මෙසේ විචාළේය: 'ඇවැත්නි, මේ පෘථිවී, අප්, තේජස්, වායු යන මහාභූතයෝ සතර දෙන නිරවශේෂයෙන් කොහිදී නම් ප්‍රහීණ වේද් ද?' (කියාහි.)

කෙවට්ටය, මෙසේ විචාළ කල්හි ඒ චාතුර්මහාරාජික සුරයෝ ඒ භික්ෂුවට මෙසේ කීහ: 'මහණ, පෘථිවී, අප්, තේජස් වායු යන මේ මහාභූතයෝ සිවු දෙන නිරවශේෂයෙන් නිරුද්ධ වන තැන අපිද නොදනුම්හ. අපට වඩා අතිශයින් කාන්ත වූ අතිශයින් ප්‍රණීත වූ සිවුවරම් මහරජ නම් කෙනෙක් ඇත්තාහ. පෘථිවි, අප්, තේජස්, වායු යන මේ මහාභූතයෝ සතර දෙන නිරවශේෂයෙන් කො තැනෙක්හි නිරුද්ධ වේද්ද යන මේ කරුණ ඔහු නම් දන්නාහු ය' (කියාහි).

80. කෙවට්ටය, එයින් පසු ඒ භික්ෂුව සිවුවරම් මහ රජුන් යම් තැනෙකද එහි එළඹියේය. එළඹ සිවුවරම් මහරජුන්ට මෙසේ කීය: 'ඇවැත්නි, පෘථිවී, අප්, තේජස්, වායු යන මහාභූතයෝ සතර දෙන නිරවශේෂයෙන් කොහිදී නිරුද්ධවේද්ද?' (කියාහි).

එවං වුත්තෙ කෙවට්ට චාතුම්මහාරාජිකා දෙවා තං භික්ඛුං එතදවොචුං: මයම්පි ඛො භික්ඛු න ජානාම යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති. අත්ථි ඛො භික්ඛු තාවතිංසා නාම දෙවා අම්හෙහි අභික්කන්තතරා ච පණීතතරා ච. තෙ ඛො එතං ජානෙය්‍යුං යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති.

81. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන තාවතිංසා දෙවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තාවතිංසෙ දෙවෙ එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ[1] චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති?

එවං වුත්තෙ කෙවට්ට තාවතිංසා දෙවා තං භික්ඛුං එතදවොචුං: මයම්පි ඛො භික්ඛු න ජානාම යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති. අත්ථි ඛො භික්ඛු සක්කො නාම දෙවානමින්දො අම්හෙහි අභික්කන්තතරො ච පණීතතරො ච. සො ඛො එතං ජානෙය්‍ය යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති.

82. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන සක්කො දෙවානමින්දො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සක්කං දෙවානමින්දං එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ[1] චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති?

එවං වුත්තෙ කෙවට්ට සක්කො දෙවානමින්දො තං භික්ඛුං එතදවොච: අහම්පි ඛො භික්ඛු න ජානාමි යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති. අත්ථි ඛො භික්ඛු යාමා නාම දෙවා අම්හෙහි අභික්කන්තතරා ච පණීතතරා ච. තෙ ඛො එතං ජානෙය්‍යුං යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති.

---

1. ඉමෙති නත්ථි S.

කෙවට්ටය, මෙසේ කීකල්හි සිවුවරම් මහරජහු ඒ භික්‍ෂුවට මෙසේ කීහු: 'මහණ, පොළෝ, දිය, ගිනි, වා යන මේ මහා භූතයෝ සතර ඉදන නිරව ශෙෂයෙන් කොහිදී නිරුඬ වන්නාහුදැයි අපිදු නො දනුම්හ. මහණ, අපට වඩා අතිශයින් කාන්ත වූ, අතිශයින් ප්‍රණීතවූ තාවතිංස නම් දෙව් කෙනෙක් ඇත්තාහ. පඨවි, ආපො, තෙජෝ වායෝ, යන මේ සතර මහා භූතයෝ නිරව- ශෙෂයෙන් යම් තැනෙක නිරුඬ වෙද්ද, ඔවුහු නම් ඒ තැන දන්නාහු යි' (කියායි).

81. කෙවට්ටය, එයින් පසු ඒ මහණ තාවතිංස දෙවියන් යම් තැනකද එතැන එළඹියේය. එළඹ තව්තිසා දෙවියන්ට මෙසේ කීය: 'ඇවැත්නි, පඨවි, ආපො, තෙජෝ, වායො යන සතර මහාභූතයෝ නිරවශෙෂයෙන් කොහිදී නිරුඬ වෙද්දැ' (කියායි)

කෙවට්ටය, මෙසේ කී කල්හි තව්තිසා දෙවියෝ ඒ භික්‍ෂුවට මෙය කීහ: 'මහණ, පෘථිවි, ආපො, තෙජො, වායො යන සතර මහාභූතයෝ නිරවශෙෂයෙන් යම්තැනෙක ප්‍රහීණ වෙද්ද, ඒ තැන අපිදු නොදනුම්හ. මහණ, අපට වඩා අතිශයින් කාන්තවූ, අතිශයින් ප්‍රණීත වූ, ශක්‍ර නම් වූ දෙවියන්ගේ අධිපතියෙක් ඇත්තේය. පෘථිවි, ආපො, තෙජෝ, වායො යන සතර මහාභූතයෝ නිරවශෙෂයෙන් යම් තැනෙක්හි නිරුඬ වෙද්ද, ඒ තැන හේ නම් දන්නේය' (කියායි.)

82. කෙවට්ටය, ඉක්බිති ඒ මහණ තෙමේ ශක්‍ර දෙවෙන්ද්‍රයා වෙත එළඹියේය. එළඹ ශක්‍රදෙවෙන්ද්‍රයාට මෙසේ කීය: 'ඇවැත්නි, පෘථිවි, අපො, තෙජෝ, වායො යන සතර මහා භූතයෝ නිරවශෙෂයෙන් කොහිදී නිරුඬ වෙද්දැ' (කියායි).

කෙවට්ටය, මෙසේ කී කල්හි ශක්‍රදෙවෙන්ද්‍ර තෙමේ ඒ භික්‍ෂු- වට මෙය කීය. 'මහණ, පෘථිවි, ආපො, තෙජො, වායො යන සතර මහාභූතයෝ යම් තැනෙක නිරවශෙෂයෙන් නිරුඬ වෙද්ද, ඒ තැන මම ද නොදනිමි. මහණ, අපට වඩා අති- ශයින් කාන්තවූ අතිශයින් ප්‍රණීත වූ යාම නම් දෙව් කෙනෙක් ඇත. පෘථිවි, ආපො, තෙජො, වායො යන සතර මහාභූතයෝ යම් තැනෙක්හි නිරවශෙෂයෙන් නිරුඬ වෙද්ද, ඒ තැන ඔහු නම් දන්නාහුය' (කියායි).

83. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන යාමා දෙවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා යාමෙ දෙවෙ එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති?

එවං වුත්තෙ කෙවට්ට යාමා දෙවා තං භික්ඛුං එතදවොචුං: මයම්පි ඛො භික්ඛු න ජානාම යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති. අත්ථි ඛො භික්ඛු සුයාමො නාම දෙවපුත්තො අම්හෙහි අභික්කන්තතරො ච පණීතතරො ච. සො ඛො එතං ජානෙය්‍ය යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති.

84. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන සුයාමො දෙවපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සුයාමං දෙවපුත්තං එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති?

එවං වුත්තෙ කෙවට්ට සුයාමො දෙවපුත්තො තං භික්ඛුං එතදවොච: අහම්පි ඛො භික්ඛු න ජානාමි යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති. අත්ථි ඛො භික්ඛු තුසිතා නාම දෙවා අම්හෙහි අභික්කන්තතරා ච පණීතතරා ච. තෙ ඛො එතං ජානෙය්‍යුං යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති.

85. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන තුසිතා දෙවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තුසිතෙ දෙවෙ එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති?

83. කෙවට්ටය, ඉක්බිති ඒ භික්ෂුව යාම දෙවියන් වෙත එළඹියේය. එළඹ යාම දෙවියන්ට මෙසේ කීය: 'ඇවැත්නි, පෘථිවී, ආපො, තෙජො, වායො යන සතර මහාභූතයෝ කොහි දී නිරවශෙෂයෙන් නිරුඬ වන්නාහු දැ?' (කියායි).

කෙවට්ටය, මෙසේ කීකල්හි, යාම දෙවියෝ ඒ භික්ෂුවට මෙය කීහ: 'මහණ, පෘථිවී, ආපො, තෙජො, වායො යන සතර මහාභූතයෝ යම් තැනෙක නිරවශෙෂයෙන් නිරුඬ වෙද්ද, ඒ තැන අපි ද නොදනුම්හ. මහණ, අපට වඩා අතිශයින් කාන්තවූ අපට වඩා අතිශයින් ප්‍රණීත වූ සුයාම නම් දෙවපුත්‍රයෙක් ඇත. පෘථිවී, ආපො, තෙජො, වායො යන සතර මහාභූතයෝ යම් තැනෙක නිරවශෙෂයෙන් නිරුඬ වෙද්ද, ඒ තැන ඒ දෙවපුත්‍රයා නම් දන්නේය' (කියායි).

84. කෙවට්ටය, ඉක්බිති ඒ භික්ෂු තෙමේ සුයාම දෙව-පුත්‍රයා වෙත එළඹියේ ය. එළඹ සුයාම දෙවපුත්‍රයාට මෙසේ කීය: 'ඇවැත්නි, පෘථිවී, ආපො, තෙජො, වායො යන සතර මහා භූතයෝ නිරවශෙෂයෙන් කොහිදී නිරුඬ වෙද්දැ?'(කියායි)

කෙවට්ටය, මෙසේ කීකල්හි සුයාම දෙවපුත්‍ර තෙමේ ඒ භික්ෂුවට මෙය කීය: 'මහණ, පෘථිවී, ආපො, තෙජො, වායො යන සතර මහාභූතයෝ නිරවශෙෂයෙන් යම් තැනෙක්හි නිරුඬවෙද්ද, මම ද එතැන නොදනිමි. අපට වඩා අතිශයින් කාන්තවූ ද, අතිශයින් ප්‍රණීත වූ ද, තුසිත නම් දෙවි කෙනෙක් ඇත. පෘථිවී, ආපො, තෙජො, වායො යන සතර මහාභූතයෝ යම් තැනෙක නිරවශෙෂයෙන් නිරුඬ වෙද්ද, ඔහු නම් ඒ තැන දන්නාහු ය' (කියායි).

85. කෙවට්ටය, ඉන්පසු ඒ භික්ෂු තෙමේ තුසිත දෙවියෝ යම් තැනෙක්හිද එහි එළඹියේය. එළඹ තුසිත දෙවියන්ට මෙසේ කීය: ඇවැත්නි, පෘථිවී, ආපො, තෙජො, වායො යන සතර මහාභූතයෝ නිරවශෙෂයෙන් කොහිදී නිරුඬ වෙද්දැ?'(කියායි).

එවං වුත්තෙ කෙවට්ට තුසිතා දෙවා තං භික්ඛුං එතදවොචුං: මයම්පි ඛො භික්ඛු න ජානාම යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති. අත්ථි ඛො භික්ඛු සන්තුසිතො[1] නාම දෙවපුත්තො අම්හෙහි අභික්කන්තතරො ච පණීතතරො ච. සො ඛො එතං ජානෙය්‍ය යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති.

86. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන සන්තුසිතො[1] නාම දෙවපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සන්තුසිතං දෙවපුත්තං එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති.

එවං වුත්තෙ කෙවට්ට සන්තුසිතො[1] දෙවපුත්තො තං භික්ඛුං එතදවොච: අහම්පි ඛො භික්ඛු න ජානාමි යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති. අත්ථි ඛො භික්ඛු නිම්මානරතී නාම දෙවා අම්හෙහි අභික්කන්තතරා ච පණීතතරා ච. තෙ ඛො එතං ජානෙය්‍යුං යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති.

87. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන නිම්මානරතී දෙවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා නිම්මානරතී දෙවෙ එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති?

එවං වුත්තෙ කෙවට්ට නිම්මානරතී දෙවා තං භික්ඛුං එතදවොචුං: මයම්පි ඛො භික්ඛු න ජානාම යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති. අත්ථි ඛො භික්ඛු සුනිම්මිතො නාම දෙවපුත්තො අම්හෙහි අභික්කන්තතරො ච පණීතතරො ච. සො ඛො එතං ජානෙය්‍ය යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති.

---

1. සංතුස්සිතො B.

කෙවට්ටය, මෙසේ කීකල්හි තුසිත දෙවියෝ ඒ භික්ෂුවට මෙසේ කීහ: 'මහණ, පෘථිවි, ආපො, තෙජො, වායො යන සතර මහාභූතයෝ යම්තැනෙක නිරවශෙෂයෙන් නිරුද්ධ වෙද්ද, අපි ද ඒ තැන නොදනුම්හ. මහණ, අපට වඩා අතිශයින් කාන්තවූ අපට වඩා අතිශයින් ප්‍රණීත වූ සන්තුසිත නම් දෙවපුත්‍රයෙක් ඇත. පෘථිවි, ආපො, තෙජො, වායො යන සතර මහාභූතයෝ යම්තැනෙකදී නිරවශෙෂයෙන් නිරුද්ධ වන්නාහුද, හේ යෙමේ නම් එය දන්නේය' (කියාහි).

86. කෙවට්ටය, එයින් පසු ඒ භික්ෂු තෙමේ සන්තුසිත නම් දෙව්පුත්‍රයා වෙත එළඹියේය. එළඹ සන්තුසිත දෙවපුත්‍රයාට මෙසේ කීය: 'ඇවත, පෘථිවි, ආපො, තෙජො, වායො යන සතර මහාභූතයෝ කොහි දී නිරවශෙෂයෙන් නිරුද්ධ වන්නාහු ද?' (කියාහි).

කෙවට්ටය, මෙසේ කීකල්හි සන්තුසිත දෙවපුත්‍ර තෙමේ ඒ භික්ෂුවට මෙය කීය: 'මහණ, පෘථිවි, ආපො, තේජො, වායො යන සතර මහාභූතයෝ යම් තැනක දී නිරවශෙෂයෙන් නිරුද්ධ වන්නාහුද, මම ද ඒ තැන නොදනිමි. මහණ, අපට වඩා අතිශයින් කාන්තවූ අතිශයින් ප්‍රණීත වූ නිර්මාණරති නම් දෙවිකෙනෙක් ඇත. පෘථිවි, ආපො, තෙජෝ, වායො යන සතර මහාභූතයෝ යම් තැනෙකදී නිරවශෙෂයෙන් නිරුද්ධ වන්නාහුද, ඔහු ඒ තැන දන්නාහුය' (කියාහි).

87. කෙවට්ටය, ඉක්බිත්තෙන් ඒ භික්ෂුතෙමේ නිර්මාණරති නම් දෙවියන් වෙත එළඹියේය. එළඹ නිර්මාණරති දෙවියන්ට මෙසේ කීය: 'ඇවැත්නි, පෘථිවි, ආපො, තෙජො, වායො යන සතර මහාභූතයෝ කොහිදී නිරවශෙෂයෙන් නිරුද්ධ වන්නාහුද?' (කියාහි).

කෙවට්ටය, මෙසේ කී කල්හි නිර්මාණරති දෙවියෝ ඒ භික්ෂුවට මෙසේ කීහ: මහණ, පෘථිවි, ආපො, තෙජො, වායො, යන සතර මහාභූතයෝ යම් තැනෙකදී නිරවශෙෂයෙන් නිරුද්ධ වන්නාහුද, ඒ තැන අපිද නොදනුම්හ. මහණ, අපට වඩා ඉතාම විශිෂ්ට වූ ඉතාම ප්‍රණීත වූ සුනිර්මිත නම් දෙව පුත්‍රයෙක් වෙයි. පෘථිවි, ආපො, තෙජො වායො යන සතර මහාභූතයෝ යම් තැනෙකදී නිරවශෙෂයෙන් නිරුද්ධ වන්නාහුද, ඒ දෙවපුත්‍රයා නම් එතැන දන්නේය' (කියාහි).

88. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන සුනිම්මිතො දෙවපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා සුනිම්මිතං දෙවපුත්තං එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති?

එවං වුත්තෙ කෙවට්ට සුනිම්මිතො දෙවපුත්තො තං භික්ඛුං එතදවොච: අහම්පි ඛො භික්ඛු න ජානාමි යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති. අත්ථි ඛො භික්ඛු පරනිම්මිතවසවත්තී නාම දෙවා අම්හෙහි අභික්කන්තතරා ච පණීතතරා ච. තෙ ඛො එතං ජානෙය්‍යුං යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති.

89. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන පරනිම්මිතවසවත්තී දෙවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පරනිම්මිතවසවත්තී දෙවෙ එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති?

එවං වුත්තෙ කෙවට්ට පරනිම්මිතවසවත්තී දෙවා තං භික්ඛුං එතදවොචුං: මයම්පි ඛො භික්ඛු න ජානාම යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති. අත්ථි ඛො භික්ඛු වසවත්තී[1] නාම දෙවපුත්තො අම්හෙහි අභික්කන්තතරො ච පණීතතරො ච. සො ඛො එතං ජානෙය්‍ය යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති.

90. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන වසවත්තී[1] දෙවපුත්තො[1] තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා වසවත්තිං[2] දෙවපුත්තං එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති?

---

1. පරනිම්මිතවසවත්තී S. 2. වසවත්තිදෙව° Pa.

88. කෙවට්ටය, ඉක්බිති ඒ මහණ තෙමේ සුනිර්මිත දෙව පුත්‍රයා වෙත එළඹියේය. එළඹ සුනිර්මිත දෙවපුත්‍රයාට මෙය කීය: 'ඇවත, පෘථිවි, ආපො, තෙජො, වායො යන සතර මහා භූතයෝ කොහි දී නිරවශෙෂයෙන් නිරුඬ වෙද්ද?' (කියායි).

කෙවට්ටය, මෙසේ කී කල්හි සුනිර්මිත දෙව පුත්‍ර තෙමේ ඒ භික්ෂුවට මෙසේ කීය: 'මහණ, පෘථිවි, ආපො, තෙජො, වායො යන සතර මහා භූතයෝ යම් තැනෙක දී නිරවශෙෂයෙන් නිරුඬ වේද්ද, එතැන මම ද නොදනිමි. මහණ, අපට වඩා අතිශයින් විශිෂ්ට වූ අතිශයින් ප්‍රණීත වූ පරනිර්මිත වශවර්ති නම් දෙවි කෙනෙක් ඇත. පෘථිවි, ආපො, තෙජො, වායො යන සතර මහාභූතයෝ යම් තැනෙකදී නිරවශෙෂයෙන් නිරුඬ වෙද්ද, ඒ තැන ඔහු දන්නාහුය' (කියායි).

89. කෙවට්ටය, එයින් පසු ඒ භික්ෂු තෙමේ පරනිර්මිත වශවර්ති දෙවියන් වෙත එළඹියේය. එළඹ පරනිර්මිත වශවර්ති දෙවියනට මෙසේ කීය: 'ඇවැත්නි, පෘථිවි, ආපො, තෙජො, වායො යන සතර මහාභූතයෝ කොහිදී නිරවශෙෂයෙන් නිරුඬ වන්නාහුද?' (කියායි).

කෙවට්ටය, මෙසේ කී කල්හි පරනිර්මිතවශවර්ති දෙවියෝ ඒ භික්ෂුවට මෙසේ කීහ: 'මහණ, පෘථිවි, ආපො, තෙජො, වායො යන සතර මහාභූතයෝ යම් තැනෙකදී නිරවශෙෂයෙන් නිරුඬ වන්නාහුද, අපි ද ඒ තැන නොදනුම්හ. මහණ, අපට වඩා අතිශයින් කාන්ත වූ අතිශයින් ප්‍රණීත වූ වශවර්ති නම් දෙවපුත්‍රයෙක් ඇත. පෘථිවි, ආපො, තෙජො, වායො යන සතර මහාභූතයෝ යම් තැනෙක නිරවශෙෂයෙන් නිරුඬ වන්නාහුද, හේ තෙමේ නම් ඒ තැන දන්නේය' (කියායි).

90. කෙවට්ටය, ඉක්බිති ඒ භික්ෂු තෙමේ වශවර්ති දෙව පුත්‍රයා වෙත එළඹියේය. එළඹ වශවර්ති දෙව්පුත්‍රයාට මෙසේ කීය. 'ඇවත, පෘථිවි, ආපො, තෙජො, වායො යන සතර මහා භූතයෝ කොහිදී නිරවශෙෂයෙන් නිරුඬ වන්නාහුද?' (කියායි).

එවං වුත්තෙ කෙවට්ට වසවත්ති දෙවපුත්තො තං භික්ඛුං එතදවොච: අහම්පි බො භික්ඛු න ජානාමි යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති. අත්ථි බො භික්ඛු බ්‍රහ්මකායිකා නාම දෙවා අම්හෙහි අභික්කන්තතරා ච පණීතතරා ච. තෙ බො එතං ජානෙය්‍යුං යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති.

91. අථ බො සො කෙවට්ට භික්ඛු තථාරූපං සමාධිං සමාපජ්ජි යථාසමාහිතෙ චිත්තෙ බ්‍රහ්මයානියො මග්ගො පාතුරහොසි. අථ බො සො කෙවට්ට භික්ඛු යෙන බ්‍රහ්මකායිකා දෙවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා බ්‍රහ්මකායිකෙ දෙවෙ එතදවොච: කත්ථ නු බො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති?

එවං වුත්තෙ කෙවට්ට බ්‍රහ්මකායිකා දෙවා තං භික්ඛුං එතදවොචුං: මයම්පි බො භික්ඛු න ජානාම යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති. අත්ථි බො භික්ඛු බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථුදසො වසවත්ති[1] ඉස්සරො කත්තා නිම්මාතා[2] සෙට්ඨො සඤ්ජිතා[3] වසී පිතා භූතභව්‍යානං[4] අම්හෙහි අභික්කන්තතරො ච පණීතතරො ච. සො බො එතං ජානෙය්‍ය යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති.

92. කහං පනාවුසො එතරහි සො මහාබ්‍රහ්මාති?

මයම්පි බො භික්ඛු න ජානාම යත්ථ වා බ්‍රහ්මා යෙන වා බ්‍රහ්මා යහිං වා බ්‍රහ්මා. අපි ච භික්ඛු යථා නිමිත්තා දිස්සන්ති ආලොකො සඤ්ජායති ඔභාසො පාතුභවති බ්‍රහ්මා පාතුභවිස්සති. බ්‍රහ්මුනො හෙතං පුබ්බනිමිත්තං පාතුභාවාය යදිදං ආලොකො සඤ්ජායති ඔභාසො පාතුභවතීති.

1. වසවත්ති S.
2. නිම්මිතා S.
3. සජිතා B. V. සජ්ජිතා S.
4. භූතභබ්‍යානං B. V

කෙවට්ටය, එසේ කීකල්හි වශවර්ති දෙවපුත්‍ර තෙමේ භික්ෂුවට මෙසේ කීය: 'මහණ, පෘථිවි, ආපො, තෙජො, වායො යන සතර මහාභූතයෝ යම් තැනෙක නිරවශෙෂයෙන් නිරුද්ධ වන්නාහුද, මම ද එතැන නොදනිමි. මහණ, අපට වඩා අතිවිශිෂ්ට වූ අතිප්‍රණීත වූ බ්‍රහ්මකායික නම් දෙවි කෙනෙක් ඇත. පෘථිවි, ආපො, තෙජො, වායො යන සතර මහාභූතයන් යම් තැනෙක නිරවශෙෂයෙන් නිරුද්ධ වන්නාහුද, ඔහු ඒ තැන දන්නාහුය' (කියාහි).

91. කෙවට්ටය, එකල්හි ඒ මහණ තෙමේ සිත යම් සමාධියකට පැමිණි කල බ්‍රහ්මලොකයට යන මාර්ගය පහළ වන්නේද, ඒ සමාපත්තියට සමවැදුනේය. කෙවට්ටය, ඉක්බිති ඒ මහණ තෙමේ බ්‍රහ්මකායික දෙවියන් වෙත එළඹියේය. එළඹ බ්‍රහ්මකායික දෙවියන්ට මෙසේ කීය: 'ඇවැත්නි, පෘථිවි, ආපො, තෙජො, වායො යන සතර මහාභූතයෝ කොහි දී නිරවශෙෂයෙන් නිරුද්ධ වන්නාහුද?' (කියාහි).

කෙවට්ටය, එසේ කීකල, බ්‍රහ්මකායික දෙවියෝ ඒ භික්ෂුවට මෙසේ කීහ: 'මහණ, පෘථිවි, ආපො, තෙජො, වායො යන සතර මහාභූතයෝ යම් තැනෙක නිරවශෙෂයෙන් නිරුද්ධ වන්නාහුද, අපි ද ඒ තැන නොදනුම්හ. මහණ, අපට වඩා අති ශ්‍රෙෂ්ඨවූ අති ප්‍රශස්තවූ බ්‍රහ්මයෙක් ඇත. (හේතෙමේ) මහා බ්‍රහ්මය, සියල්ලන් අභිභවනය කරන්නේ ය, තෙමේ කිසිවකු විසිනුත් නො මැඩපවත්වන ලද්දේය, සියල්ල දක්නේය, සියල්ලන් තමා වසඟයෙහි පවත්වන්නේය, ඊශ්වරය, සියල්ල කරන්නාය, සියල්ල මවන්නාය, ශ්‍රෙෂ්ඨයාය, සියල්ලන් කොටස්වලට බෙදන්නාය, වසඟයෙහි පවත්වන්නාය; උපන්නවුන්ගේ ද උපදින්නන්ගේ ද පියාය. පෘථිවි, ආපො, තෙජො, වායො යන සතර මහා භූතයෝ යම් තැනෙක නිරුද්ධ වන්නාහු ද, හේ වනාහි එතැන දන්නේ ය.' (කියාහි)

92. 'ඇවැත්නි, ඒ බ්‍රහ්ම තෙමේ දැන් කොහි ද?'

'මහණ, අපිද බ්‍රහ්මයා යම් තැනෙක වෙසෙසි හෝ යම් දිශාවකින් පැමිණෙයි හෝ යම් තැනෙක ප්‍රාදුර්භූත වෙයි හෝ නොදනුම්හ. එහෙත්, මහණ, යම්විට නිමිති පැණේ ද, ආලෝකයක් උපදීද, රශ්මියක් ප්‍රාදුර්භූත වේද, එවිට බ්‍රහ්මයා ප්‍රාදුර්භූත වෙයි. මෙකී ආලෝකය ඉපදීමය, රශ්මිය පහළවීමය යනු බ්‍රහ්මයාගේ පහළවීමට පූර්වනිමිතිය' (යි ඔහු කීවාහුය).

අථ ඛො සො කෙවට්ට මහාබ්‍රහ්මා න චිරස්සෙව පාතුරහොසි. අථ ඛො සො කෙවට්ට භික්ඛු යෙන[1] මහාබ්‍රහ්මා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං මහාබ්‍රහ්මානං[2] එතදවොච: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති?

එවං වුත්තෙ කෙවට්ට සො මහාබ්‍රහ්මා තං භික්ඛුං එතදවොච: අහමස්මි භික්ඛු බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථුදසො වසවත්තී[3] ඉස්සරො කත්තා නිම්මාතා[4] සෙට්ඨො සඤ්ජිතා[5] වසී පිතා භූතභව්‍යානන්ති[6].

93. දුතියම්පි ඛො සො කෙවට්ට භික්ඛු තං මහාබ්‍රහ්මානං එතදවොච: න ඛොහං[7] තං ආවුසො එවං පුච්ඡාමි: ත්වංසි බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථුදසො වසවත්තී[3] ඉස්සරො කත්තා නිම්මාතා[4] සෙට්ඨො සඤ්ජිතා[5] වසී පිතා භූතභව්‍යානන්ති?[6] එවඤ්ච ඛො අහං තං ආවුසො පුච්ඡාමි: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති?

දුතියම්පි ඛො කෙවට්ට සො මහාබ්‍රහ්මා තං භික්ඛුං එතදවොච: අහමස්මි භික්ඛු බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථුදසො වසවත්තී[3] ඉස්සරො කත්තා නිම්මාතා[4] සෙට්ඨො සඤ්ජිතා[5] වසී පිතා භූතභව්‍යානන්ති.[6]

තතියම්පි ඛො සො කෙවට්ට භික්ඛු තං මහාබ්‍රහ්මානං එතදවොච: න ඛොහං[7] තං ආවුසො එවං පුච්ඡාමි: ත්වමසි බ්‍රහ්මා මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථුදසො වසවත්තී[3] ඉස්සරො කත්තා නිම්මාතා[4] සෙට්ඨො සඤ්ජිතා[5] වසී පිතා භූතභව්‍යානන්ති?[6] එවඤ්ච ඛො අහං තං ආවුසො පුච්ඡාමි: කත්ථ නු ඛො ආවුසො ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති?

---

1. යෙන සො මහා° P. W.
2. °මාණං P. W.
3. වසවත්ති S. W.
4. නිම්මිතා S.
5. සජිතා B. V. සජ්ජිතා S.
6. °භබ්‍යානන්ති B. V.
7. ඛො අහං P.W.

කෙවට්ටය, එකල නොබෝ වේලාවකින් මහාබ්‍රහ්මයා ප්‍රාදුර්භූත විය. කෙවට්ටය, ඉක්බිති ඒ මහණතෙමේ මහා බ්‍රහ්මයා වෙත එළඹියේය. එළඹ ඒ මහාබ්‍රහ්මයාට මෙසේ කීය: 'ඇවැත, පෘථිවි ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතර මහාභූතයෝ කොහිදී නිරවශේෂයෙන් නිරුද්ධ වන්නාහුද?' (කියායි).

කෙවට්ටය, මෙසේ කී කල්හි මහාබ්‍රහ්ම තෙමේ ඒ භික්ෂුවට මෙසේ කීය: 'මහණ, මම බ්‍රහ්මයා වෙමි, මහාබ්‍රහ්මයා වෙමි, සියල්ලන් අභිභවනය කරන්නෙමි, සාවරක්හු විසින්වත් නොමඩනා ලද්දෙමි, සියල්ල දකිමි, සියල්ලන් (මාගේ) වසඟ යෙහි පවත්වමි, ඊශ්වර වෙමි, (ලෝකයෙහි) කර්තෘ වෙමි, නිර්මාතෘ (මවන්නා) වෙමි, ශ්‍රෙෂ්ඨයා වෙමි, සියල්ලන් බෙදන්නෙමි, වසීතා ඇත්තෙමි, උපන්නවුන්ගේද උපදින්නන්ගේද පියා වෙමි' (කියායි).

93. කෙවට්ටය, දෙවෙනි වරද ඒ භික්ෂුව මහා බ්‍රහ්මයාට මෙසේ කීය: 'ඇවැත, මම තොපගෙන් තෝ බ්‍රහ්මයා වෙහිද, මහා බ්‍රහ්මයා වෙහිද, අභිභූවෙහිද, අනභිභූත වෙහිද, සියල්ල දක්නේ වෙහිද, වශවර්තී වෙහිද, ඊශ්වර වෙහිද, කර්තෘ වෙහිද, නිර්මාතෘ වෙහිද, ශ්‍රෙෂ්ඨ වෙහිද, සියල්ලන් බෙදන්නා වෙහිද, වසීතා ඇත්තේ වෙහිද, උපන්නවුන්හට හා උපදින්නන්හටත් පියා වෙහිදැයි නො විචාරමි. ඇවැත, මම තොපගෙන් මෙසේ විචාරමි: ඇවැත, පෘථිවි ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන සතර මහාභූතයෝ කොහිදී නිරවශේෂයෙන් නිරුද්ධ වන්නාහුද?' (යනුයි).

කෙවට්ටය, දෙවෙනි වරද ඒ මහාබ්‍රහ්ම තෙමේ ඒ භික්ෂුවට මෙසේ කීය: 'මහණ, මම බ්‍රහ්මයා වෙමි, මහා බ්‍රහ්මයා වෙමි, සියල්ලන් මැඩපවත්වන්නා වෙමි, කිසිවකු විසිනුත් නොමඩනා ලද්දේ වෙමි, සියල්ල දක්නා වෙමි, සියල්ලන් වසඟයෙහි පවත්වන්නා වෙමි, ඊශ්වරයා වෙමි, සියල්ල කරන්නා වෙමි, සියල්ලන් මවන්නා වෙමි, ශ්‍රෙෂ්ඨයා වෙමි, සියල්ලන් බෙදන්නෙමි, වසීතා ඇත්තා වෙමි, උපන්නවුන්ට ද උපදින්නවුන්ට ද පියාවෙමි' (කියායි).

කෙවට්ටය, තුන්වෙනි වරද ඒ භික්ෂු තෙමේ ඒ මහා බ්‍රහ්මයාට මෙසේ කීය: 'ඇවැත, මම තොපගෙන් තෝ බ්‍රහ්මයා වෙහි ද, මහා බ්‍රහ්මයා වෙහිද, අභිභූ වෙහිද, අනභිභූත වෙහි ද, සියල්ල දක්නා වෙහි ද, වශවර්තී වෙහි ද, ඊශ්වර වෙහි ද, කර්තෘ වෙහි ද, නිර්මාතෘ වෙහි ද, ශ්‍රෙෂ්ඨ වෙහි ද, බෙදන්නා වෙහි ද, වසීතා ඇත්තේ වෙහි ද, උපන්නවුන්ට හා උපදින්න වුන්ට පියා වෙහිදැයි නොවිචාරමි. මම තොපගෙන් මෙසේ විචාරමි. ඇවැත, පෘථිවි ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු යන මහාභූතයෝ කොහිදී නිරවශේෂයෙන් නිරුද්ධ වන්නාහුද?' (කියායි).

94. අථ ඛො සො කෙවට්ට මහාබ්‍රහ්මා තං භික්ඛුං බාහායං[1] ගහෙත්වා එකමන්තං අපනෙත්වා තං භික්ඛුං එතදවොච: ඉමෙ ඛො මං භික්ඛු[2] බ්‍රහ්මකායිකා දෙවා එවං ජානන්ති: නත්ථි[3] කිඤ්චි බ්‍රහ්මුනො අඤ්ඤාතං[3] නත්ථි කිඤ්චි බ්‍රහ්මුනො අදිට්ඨං නත්ථි කිඤ්චි බ්‍රහ්මුනො අවිදිතං නත්ථි කිඤ්චි බ්‍රහ්මුනො අසච්ඡිකතන්ති. තස්මාහං[4] තෙසං සම්මුඛා න බ්‍යාකාසිං[5] අහම්පි ඛො භික්ඛු න ජානාමි යත්ථිමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති.

තස්මාතිහ භික්ඛු තුම්හෙවෙතං[6] දුක්කටං තුම්හෙවෙතං අපරද්ධං යං ත්වං තං භගවන්තං අතිධාවිත්වා[7] බහිද්ධා පරියෙට්ඨිං ආපජ්ජසි ඉමස්ස පඤ්හස්ස වෙය්‍යාකරණාය. ගච්ඡ ත්වං භික්ඛු තමෙව භගවන්තං උපසඞ්කමිත්වා ඉමං පඤ්හං පුච්ඡ යථා ච[8] තෙ භගවා බ්‍යාකරොති[5] තථා නං ධාරෙය්‍යාසීති.

95. අථ ඛො සො කෙවට්ට භික්ඛු සෙය්‍යථාපි නාම බලවා පුරිසො සම්මිඤ්ජිතං[9] වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය[9] එවමෙව ඛො[10] බ්‍රහ්මලොකෙ අන්තරහිතො මම පුරතො පාතුරහොසි. අථ ඛො සො කෙවට්ට භික්ඛු මං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො කෙවට්ට සො භික්ඛු මං එතදවොච: කත්ථ නු ඛො භන්තෙ ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථීදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති?

---

1. බාහාය W.
2. ඉධ භික්ඛු P.
3. නත්ථි...අඤ්ඤාතන්ති න දිස්සති P.W.
4. තස්මා අහං P.
5. ව්‍යා° P. W.
6. තුය්හෙවෙතං B. V.
7. අතිසිත්වා P. W. අතිමුඤ්චිත්වා S.
8. වකාරො නත්ථි S.
9. සමි° B. V.
10. ඛො ති නත්ථි B. S.

94. කෙවට්ටය, එකල්හි ඒ මහාබ්‍රහ්ම තෙමේ ඒ භික්ෂුව බාහුවෙන් ගෙණ එකත් පසෙකට ගෙණ ගොස් ඔහට මෙසේ කීය: ‘මහණ, මේ බ්‍රහ්මකායික දෙවියන් (මා ගැණ) දන්නේ මෙසේය: (කෙසේ ද?) බ්‍රහ්මයා විසින් නොදන්නා ලද කිසිවක් නැත, බ්‍රහ්මයා විසින් නොදක්නා ලද කිසිවක් නැත, බ්‍රහ්මයා විසින් අවබෝධ නොකරණ ලද කිසිවක් නැත, බ්‍රහ්මයා විසින් ප්‍රත්‍යක්ෂ නොකරණ ලද කිසිවක් නැත (කියායි). එහෙයින් මම ඔවුන් ඉදිරියෙහි (මගේ නොදැනීම) ප්‍රකාශ නොකෙළෙමි. මහණ, මමද පෘථිවි ධාතු, ආපෝ ධාතු, තෙජෝ ධාතු, වායෝ ධාතු යන සතර මහාභූතයෝ යම් තැනෙක නිරවශෙෂයෙන් නිරුද්ධ වන්නාහුද ඒ තැන නොදනිමි.

‘මහණ, එසේ හෙයින් තා විසින් ම මේ කරුණෙහි වැරැද්දක් කරණ ලද්දේ ය. තා විසින් ම අපරාධයක් කරණ ලද්දේ ය. මේ ප්‍රශ්නය විසඳීම පිණිස ඒ භාග්‍යවතුන් වහන්සේ ඉක්මවා පිටතින් සෙවීමට පැමිණියෙහි වේද ඒ වරදකි (මුළාවකි). මහණ, යව මැනව. ඒ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ මේ පැණය අසනු මැනව. භාග්‍යවතුන් වහන්සේ යම්සේ ඔබට ප්‍රකාශ කරණසේක් ද, එය එසේ පිළිගත මැනව’ (කියායි).

95. කෙවට්ටය, එකල්හි ඒ මහණ තෙමේ බලවත් පුරුෂයෙක් යම්සේ වක්කළ අත දිගහරින්නේ ද, දික්කළ අත වක්කරන්නේද, එසෙයින් ම බඹලොව අතුරුදහන් වූයේ මාගේ ඉදිරියෙහි පහළ විය. කෙවට්ටය, ඉක්බිති ඒ මහණ තෙමේ මා වැඳ එකත්පසෙක හුන්නේය. කෙවට්ටය, එකත්පසෙක හුන්නාවූ ඒ මහණ මට මෙසේ කීය: ‘ස්වාමීනි, පෘථිවි ධාතු, ආපෝ ධාතු, තෙජෝ ධාතු, වායෝ ධාතු යන සතර මහාභූතයෝ කොහිදී නිරවශෙෂයෙන් නිරුද්ධ වන්නාහුද?’ (කියායි).

96. එවං වුත්තෙ අහං කෙවට්ට තං භික්ඛුං එතදවොචං: භූතපුබ්බං භික්ඛු සාමුද්දිකා වාණිජා[1] තීරදස්සිං සකුණං ගහෙත්වා නාවාය සමුද්දං[2] අජ්ඣොගාහන්ති. තෙ අතීරදක්ඛිණියා[3] නාවාය තීරදස්සිං සකුණං මුඤ්චන්ති. සො ගච්ඡතෙව[4] පුරත්ථිමං දිසං ගච්ඡති දක්ඛිණං දිසං ගච්ඡති පච්ඡිමං දිසං ගච්ඡති උත්තරං දිසං ගච්ඡති උද්ධං[5] ගච්ඡති අනුදිසං. සචෙ සො සමන්තා තීරං පස්සති තථාගතකො[6] ච හොති. සචෙ පන සො සමන්තා තීරං න පස්සති තමෙව නාවං පච්චාගච්ඡති. එවමෙව ඛො ත්වං භික්ඛු යතො යාව[7] බ්‍රහ්මලොකා පරියෙසමානො ඉමස්ස පඤ්හස්ස වෙය්‍යාකරණං[8] නාජ්ඣගා අථ මමඤ්ඤෙව[9] සන්තිකෙ පච්චාගතො.

97. න ඛො එසො භික්ඛු පඤ්හො එවං පුච්ඡිතබ්බො: කත්ථ නු ඛො භන්තෙ ඉමෙ චත්තාරො මහාභූතා අපරිසෙසා නිරුජ්ඣන්ති සෙය්‍යථිදං පඨවීධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතූති? එවඤ්ච ඛො එසො භික්ඛු පඤ්හො පුච්ඡිතබ්බො:

කත්ථ ආපො ච පඨවී[10] තෙජො වායො න ගාධති?
කත්ථ දීඝඤ්ච රස්සඤ්ච[11] අණුං[12] ථූලං සුභාසුභං
කත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣතීති?

තත්‍ර වෙය්‍යාකරණං භවති.

විඤ්ඤාණං අනිදස්සනං අනන්තං සබ්බතොපභං
එත්ථ ආපො ච පඨවී[10] තෙජො වායො න ගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච අණුං[12] ථූලං සුභාසුභං
එත්ථ නාමඤ්ච රූපඤ්ච අසෙසං උපරුජ්ඣති
විඤ්ඤාණස්ස නිරොධෙන එත්ථෙතං උපරුජ්ඣතීති.

98. ඉදමවොච භගවා. අත්තමනො කෙවට්ටො ගහපතිපුත්තො භගවතො[13] භාසිතං අභිනන්දීති.

කෙවට්ටසුත්තං[14] නිට්ඨිතං එකාදසමං.

---

1. බාණිජා B. S.
2. සමුද්දං ති නත්ථි S.
3. °දස්සිනියා S.
4. ගච්ඡති S.
5. උද්ධං දිසං S.
6. තථාපක්කන්තොව S.
7. යාව යතො P.
8. °කාරණන්ත අජ්ඣගමා S.
9. මංයෙව P. මමඤ්ඤෙව W. අථ ඛො මය්හමෙව S.
10. පඨවී ච S. පඨවි V.
11. දීඝරස්සං ච C.
12. අනුං W.
13. භගවතොති න දිස්සති P.
14. කෙවඩ්ඪසුත්තන්තං P.

96. කෙවට්ටය, මෙසේ කීකල්හි ඒ භික්ෂුවට මම මෙසේ කීමි: 'මහණ, පෙර වූවක් කියමි. මුහුදු වෙළෙන්දෝ තෙර දක්නා පක්ෂියකු ගෙන නැවෙන් මුහුදු වදිති. ඔහු නැවෙන් තෙර නොපෙණෙන කල තෙර දක්නා පක්ෂියා මුදත්. ඒ පක්ෂියා පෙරදිගට ද යෙයි, දකුණු දිගට ද යෙයි, පැලදිගට ද යෙයි, උතුරු දිගටද යෙයි, උඩට ද යෙයි, අනුදිගට ද යෙයි. ඉදින් හේ හාත්පස තෙරක් දක්නේද, ඒ දෙසටම යෙයි. හේ හාත්පස තෙරක් නොදක්නේ වේද, ඒ නැවටම පෙරළා එන්නේය. මහණ, එලෙසින්ම තෝ බඹලොව තෙක් සොයනුයේ මේ ප්‍රශ්නයේ විසඳීමක් නොලද්දෙහිය. එහින් පසු මා සමීපයටම පැමිණියෙහි ය.

97. 'මහණ, මේ ප්‍රශ්නය මෙසේ (එනම්) 'වහන්ස, පෘථිවි ධාතු, ආපෝ ධාතු, තෙජෝ ධාතු, වායො ධාතු යන සතර මහාභූතයෝ කොහිදී නිරවශෙෂයෙන් නිරුද්ධවන්නාහුද'යි නොපිළිවිසිය යුතුය. මහණ, මේ ප්‍රශ්නය මෙසේ (එනම්)

කොහි දිය පොළෝ—ගිනි වා නො පිහිටන්නේ
කොහි දිග-කොටත්—අණු-මහත්-සුබ-අසුබද,

කොහි නම් රූ (දෙක) — නොසෙස් උපරුදු වේදෝ යි ඇසිය යුතුය.

එහි විසඳීම (මෙසේ) වෙයි:

නිවණ නිදසුන් නැති—නො අන් හැම පස තොට වේ

එහි දිය පොළොව ගිනි—වා මෙය නොපිහිටන්නේ

එහි දිග-කොට-බවත්—අනු-මහත්-සුබ-අසුබ ද

එහි නම් රූ දෙක ද—නොසෙස් උපරුදු වන්නේ

අග විඤ්ඤාන නිරුදෙන්—එහි ම එය උපරුදු වේ.

98. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. සතුටු සිත් ඇති කෙවට්ට ගහපතිපුත්‍රයා භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට සතුටු වීය.

එකොළොස්වන කෙවට්ට සූත්‍රය නිමියේය.

12. ලොහිච්චසුත්තං

1. එවං මෙ සුතං. එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි යෙන සාලවතිකා තදවසරි. තෙන ඛො පන සමයෙන ලොහිච්චො බ්‍රාහ්මණො සාලවතිකං අජ්ඣාවසති සත්තුස්සදං සතිණකට්ඨොදකං සධඤ්ඤං රාජභොග්ගං රඤ්ඤා පසෙනදිකොසලෙන[1] දින්නං රාජදායං බ්‍රහ්මදෙය්‍යං.

2. තෙන ඛො පන සමයෙන ලොහිච්චස්ස බ්‍රාහ්මණස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං හොති: ඉධ සමණො වා බ්‍රාහ්මණො වා කුසලං ධම්මං අධිගච්ඡෙය්‍ය කුසලං ධම්මං අධිගන්ත්වා න පරස්ස ආරොචෙය්‍ය කිං හි පරො පරස්ස කරිස්සති? සෙය්‍යථාපි නාම පුරාණං බන්ධනං ඡින්දිත්වා අඤ්ඤං නවං බන්ධනං කරෙය්‍ය එවංසම්පදමිදං පාපකං ලොභධම්මං වදාමි. කිං හි[2] පරො පරස්ස කරිස්සතීති.[3]

3. අස්සොසි ඛො ලොහිච්චො බ්‍රාහ්මණො: සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි සාලවතිකං අනුප්පත්තො. තං ඛො පන භවන්තං[4] ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතීති.

---

1. පස්සෙනදිනා කො° B. V.
2. කිඤ්හි B. S.
3. ඉතිති නත්ථි W.
4. භගවන්තං P. W.

12. ලොහිච්ච සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් පන්සියයක් පමණ වූ මහත් භික්ෂු සඞ්ඝයා සමඟ කොසොල් රටෙහි සැරිසරා වඩනාසේක් සාලවතිකා නම් ගමට පැමිණි සේක. එසමයෙහි වනාහි ලොහිච්ච බ්‍රාහමණ තෙමේ පසේනදි කොසොල් රජු විසින් දෙනලද, මිනිසුන්ගෙන් හා නොයෙක් සතුන්ගෙන් ගැවසීගත්තාවූ, තණ දැවදඬු දිය සහිතවූ, ධාන්‍ය සහිතවූ, රජභොග්‍යයක් වූ, රජහු විසින් දෙන ලද දායාද්‍යයක් වූ ශ්‍රෙෂ්ඨ වශයෙන් දෙන ලද්දක් වූ සාලවතිකා නම් ගමෙහි අධිපතිව වාසය කෙරෙයි.

2. ඒ කාලයෙහි දී වනාහි ලොහිච්ච බමුණාහට මතු සඳහන් අයුරු ලාමක මිථ්‍යාදෘෂ්ටියක් උපන්නේය. (එනම්) මේ ලෝකයෙහි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහමණයෙක් හෝ කුසල ධර්මයකට කොහොත් විඛමාක්ෂ ධර්මයකට පැමිණෙන්නේ ද, කුසල ධර්මයට පැමිණ අනිකකුට (ඒ බව) නොමදන්වන්නේය (නොදැන්විය යුතුය). එකෙක් අනිකකුට කුමක් කරන්නේද?[1] යම්සේ පැරණි බැම්මක් සිඳ අනිත් අළුත් බැම්මක් බඳින්නේද, මේ(අනුශාසනා කිරීම) එබඳු.ලාමක වූ ලොභ ධර්මය කැයි කියමි එකෙක් අනිකකුට කුමක් කරන්නේද? (කියායි)

3. ලොහිච්ච බමුණුතෙම, ශාක්‍යපුත්‍රවූ, ශාක්‍ය කුලයෙන් නික්ම පැවිදි වූ, ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ පන්සියයක් පමණ වූ මහත් භික්ෂු සඞ්ඝයා සමග කොසොල් දනව්වෙහි සැරිසරා වඩනා සේක් සාලවතිකා නම් ගමට වැඩිසේකැයිද, ඒ භාග්‍යවත් ගෞතමයන් වහන්සේ පිළිබඳ මෙබඳු මනොඥ වූ කීර්ති ශබ්දයක් පැනනැංගේයයිද ඇසූයේය. (එනම්:)— ඒ භාග්‍යවතුන් වහන්සේ සංසාරචක්‍රයාගේ අර කැපූ සේක. සකල ඥෙයධර්මයන් මනාකොට තෙමේ ම දත්සේක. අෂ්ටවිද්‍යා පසළොස්චරණ ධර්මයෙන් සම්පූර්ණ සේක. ශොභන ගමන් ඇති සේක. තුන්ලොව දත්සේක. සීලසමාධ්‍යාදි ගුණයෙන් ශ්‍රෙෂ්ඨ-තම වූසේක. පුරුෂයන් දමනය කිරීමෙහි දක්ෂවූ සේක. (සියලු දෙව් මිනිසුන්ට අනුශාසනා කරණ බැවින්) ශාස්තෘ නම් වන සේක. චතුස්සත්‍යාවබොධය කළ සේක. සකල ක්ලේශයන් භග්න කළ සේක. ඒ භාග්‍යවතුන් වහන්සේ දෙවියන් සහිතවූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ මේ ලෝකයද, ශ්‍රමණ බ්‍රාහමණ සහිත වූ, දෙව් මිනිසුන් සහිත වූ සත්ත්ව වර්ගයාද, විශිෂ්ට ඥාන-යෙන් දැන, පසක් කොට ප්‍රකාශකරණසේක. ඒ භාග්‍යවතුන් වහන්සේ මුල මැද අග යහපත් වූ, අර්ථ සහිත වූ, ව්‍යඤ්ජන සහිත වූ, සියල්ල සම්පූර්ණ වූ, ධර්මය දෙශනාකරණ සේක. පිරිසිදු බඹසර ප්‍රකාශකරණ සේක. එබඳුවූ රහතුන් වහන්සේ-ලාගේ දර්ශනය යහපති (යනුයි).

---

1. අනිකකුට අනුශාසනා කිරීමෙන් කවර වැඩක් වන්නේද යනු මෙහි අදහස යයි අටුවායි.

4. අථ ඛො ලොහිච්චො බ්‍රාහ්මණො භෙසිකං[1] නහාපිතං[2] ආමන්තෙසි: එහි ත්වං සම්ම භෙසිකෙ[3]. යෙන සමණො ගොතමො තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා මම වචනෙන සමණං ගොතමං අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡ: ලොහිච්චො භො ගොතම බ්‍රාහ්මණො භවන්තං ගොතමං අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡතීති. එවඤ්ච වදෙහි: අධිවාසෙතු කිර භවං ගොතමො ලොහිච්චස්ස බ්‍රාහ්මණස්ස ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනාති.

5. එවං භන්තෙති ඛො භෙසිකො[4] නහාපිතො ලොහිච්චස්ස බ්‍රාහ්මණස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො භෙසිකො[4] නහාපිතො භගවන්තං එතදවොච: ලොහිච්චො භන්තෙ බ්‍රාහ්මණො භගවන්තං අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති. එවඤ්ච වදෙති. අධිවාසෙතු කිර භන්තෙ භගවා ලොහිච්චස්ස බ්‍රාහ්මණස්ස ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනාති.

අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන.

6. අථ ඛො භෙසිකො[4] නහාපිතො[5] භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා යෙන ලොහිච්චො බ්‍රාහ්මණො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ලොහිච්චං බ්‍රාහ්මණං එතදවොච: අවොචුම්හා[6] මයං භන්තෙ තව වචනෙන තං භගවන්තං: ලොහිච්චො භන්තෙ බ්‍රාහ්මණො භගවන්තං අප්පාබාධං අප්පාතඞ්කං ලහුට්ඨානං බලං ඵාසුවිහාරං පුච්ඡති. එවඤ්ච වදෙති: අධිවාසෙතු කිර භන්තෙ භගවා ලොහිච්චස්ස බ්‍රාහ්මණස්ස ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනාති. අධිවුත්ථඤ්ච[7] පන තෙන භගවතාති.

---

1. රොසිකං B. S. V.
2. න්හා° B. S. V. (සබ්බත්ථ)
3. රොසිකෙ B. S. V.
4. රොසිකා B. V, රොසිකො S. භෙසිකො P. (සබ්බත්ථ)
5. න්හාපිතො B. S. V.
6. අවොචුම්හා ඛො මයං භොතො වචනෙන S. අවොචුම්හ භො P.
7. අධිවත්ථං P.

4. ඉක්බිති ලොහිච්ච බමුණුතෙමේ හෙසිකා[1] නම් කරනැවැමියා ඇමැතිය: 'හෙසිකා යහළුව, තෝ මෙහි එව. ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ යම්තැනෙක්හිද, එතැනට එළඹෙව. එළඹ මාගේ වචනයෙන් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පිළිබඳ වූ ආබාධ රහිත බවද, රෝග රහිත බවද, සැහැල්ලු පැවතුම් ඇති බවද, ශරීර ශක්තියද, සැප විහරණයද විචාරව. (මෙසේද කියව:) භවත් ගෞතමයන් වහන්ස, ලොහිච්ච බමුණුතෙමේ ඔබවහන්සේගේ ආබාධ රහිත බවද, රෝග රහිත බවද, සැහැල්ලු පැවතුමද, ශරීර ශක්තියද, පහසු විහරණයද පිළිවිසියි කියායි. තවද ලොහිච්ච බ්‍රාහමණයාගේ බත සෙට දවසට භවත් ගෞතමයන් වහන්සේ භික්ෂු සංඝයා සමග ඉවසනසේක්වා හිද සැළකරව' (යි කීයේය.)

5. ''සවාමීනි, යහපතැ''යි කියා හෙසිකා නම් කරනැවැමි තෙම ලොහිච්ච නම් බ්‍රාහමණයාගේ වචනය සතුටින් පිළිගෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සයාසා වැද එකත් පසෙක උන්නේය. එකත් පසෙක හුන්නාවූ හෙසිකා නම් කරනැවැමි තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකෙළේය. ''සවාමීනි, ලොහිච්ච නම් බමුණුතෙමේ ආබාධරහිතවූ රොගරහිතවූ සැහැල්ලු පැවතුම් ඇත්තාවූ ශරීර ශක්ති ඇත්තා වූ භාග්‍යවතුන් වහන්සේ සම්බන්ධ සැප විහරණය පිළිවිසියි. 'සවාමීනි, භාග්‍ය වතුන් වහන්ස, ලොහිච්ච බමුණුහුගේ බත සෙට දවසට භික්ෂු සංඝයා සමග ඉවසා වදාරණ සේක්වා'යි කියාද සැලකෙරෙයි.''

භාග්‍යවතුන් වහන්සේ නිශශබ්ද භාවයෙන් ඒ ඉවසා වදාළසේක.

6. එකල්හි හෙසිකා නම් කරනැවැමිතෙම භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැද පැදකුණුකොට ලොහිච්ච නම් බ්‍රාහමණතෙම යම් තැනෙක්හිද එතැනට එළඹියේය. එළඹ ලොහිච්ච නම් බ්‍රාහමණයාට මෙසේ කීවේය: ''පිංවත, ඔබගේ වචනයෙන් ඒ භාග්‍යවතුන් වහන්සේට, 'සවාමීන් වහන්ස, සවල්පාබාධ ඇත්තාවූ, සවල්පරොග ඇත්තාවූ, සැහැල්ලු පැවතුම් ඇත්තාවූ, ශරීර ශක්තිය ඇත්තාවූ, භාග්‍යවතුන් වහන්සේ පිළිබඳ වූ සැප විහරණය ලොහිච්ච නම් බමුණුතෙම පිළිවිසියි. සවාමීනි, භාග්‍යවතුන් වහන්ස, ලොහිච්ච බ්‍රාහමණයාගේ බත සෙට දවසට භික්ෂු සංඝයා සමග ඉවසා වදාරණ සේක්වා'යි මෙසේ ද දූත්වියයි අපි සැලකෙළෙමු. ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ ඉවසා වදාරණ ලද්දේය'' (කියායි).

---

1. මේ තැනැත්තාගේ නම හෙසිකාය යනු අටුවායි.

7. අථ ඛො ලොහිච්චො බ්‍රාහ්මණො තස්සා රත්තියා අච්චයෙන සකෙ නිවෙසනෙ පණීතං ඛාදනීයං[1] භොජනීයං[1] පටියාදාපෙත්වා භෙසිකං නහාපිතං ආමන්තෙසි: එහි ත්වං සම්ම භෙසිකෙ යෙන සමණො ගොතමො තෙනුපසඞ්කම. උපසඞ්කමිත්වා සමණස්ස ගොතමස්ස කාලං ආරොචෙහි: කාලො භො ගොතම නිට්ඨිතං භත්තන්ති.

එවං භන්තෙති[2] ඛො භෙසිකා නහාපිතො ලොහිච්චස්ස බ්‍රාහ්මණස්ස පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො භෙසිකා නහාපිතො භගවතො කාලං ආරොචෙසි: කාලො භන්තෙ නිට්ඨිතං භත්තන්ති.

අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සද්ධිං භික්ඛුසඞ්ඝෙන යෙන සාලවතිකා තෙනුපසඞ්කමි.

8. තෙන ඛො පන සමයෙන භෙසිකා නහාපිතො භගවන්තං පිට්ඨිතො පිට්ඨිතො අනුබන්ධො[3] හොති. අථ ඛො භෙසිකා නහාපිතො භගවන්තං එතදවොච: ලොහිච්චස්ස භන්තෙ[4] බ්‍රාහ්මණස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං: ඉධ සමණො වා බ්‍රාහ්මණො වා කුසලං ධම්මං අධිගච්ඡෙය්‍ය කුසලං ධම්මං අධිගන්ත්වා න පරස්ස ආරොචෙය්‍ය කිං හි පරො පරස්ස කරිස්සති. සෙය්‍යථාපි නාම පුරාණං බන්ධනං ඡින්දිත්වා අඤ්ඤං නවං බන්ධනං කරෙය්‍ය එවංසම්පදමිදං පාපකං ලොභධම්මං වදාමි කිං හි පරො පරස්ස කරිස්සතීති? සාධු භන්තෙ භගවා ලොහිච්චං බ්‍රාහ්මණං එතස්මා පාපකා දිට්ඨිගතා විවෙචෙතූති.

අප්පෙවනාම සියා භෙසිකෙ අප්පෙවනාම සියා භෙසිකෙති.

9. අථ ඛො භගවා යෙන ලොහිච්චස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො ලොහිච්චො බ්‍රාහ්මණො බුද්ධප්පමුඛං[5] භික්ඛුසඞ්ඝං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙසි සම්පවාරෙසි.

---

1. °නීයං B. (සබ්බත්ථ)
2. භොති S.
3. අනුබද්ධොP.
4. භන්තෙති න දිස්සති P.
5. බුද්ධපමුඛං P.

7. ඉක්බිති ලෝහිච්ච නම් බ්‍රාහ්මණතෙම ඒ රාත්‍රීහුගේ ඇවෑමෙන් සිය නිවසෙහි ප්‍රණීත වූ කෑයුතු ද බුදිය යුතු ද පිළියෙළ කරවා හෙසිකා නම් කරනැවැමියා ඇමතුවේය: "හෙසිකාවෙනි, තෝ මෙහි එව. ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට එළඹෙව. එළඹ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේට, 'භවත් ගෞතමයන් වහන්ස, බත නිමවන ලද්දේය. ඊට කාලය'යි කාලය සැලකරව."

"ස්වාමීනි, යහපතැ"යි කියා හෙසිකා නම් කරනැවැමි තෙම ලෝහිච්ච බ්‍රාහ්මණයාගේ වචනය පිළිගෙන භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හි ද එතැනට එළඹියේය. එළඹ භාග්‍ය-වතුන් වහන්සේට නමස්කාර කොට එකත් පසෙක සිටියේය. එකත් පසෙක සිටියා වූ හෙසිකා නම් කරනැවැමිතෙම, "ස්වාමීන් වහන්ස; බත නිමවින, ලද්දේය. ඊට කාලය"යි භාග්‍යවතුන් වහන්සේට කාලය සැලකෙළේය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාසිවුරු ගෙණ භික්ෂු සංඝයා සමග සාලවතිකා නම් ගම යම් තැනෙක්හිද එතැනට එළඹියේය.

8. ඒ වේලෙහි හෙසිකා නම් කරනැවැමිතෙම භාග්‍යවතුන් වහන්සේ පසුපස්සෙන් ගමන් කෙළේය. ඉක්බිති හෙසිකා නම් කරනැවැමිතෙම භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැල කෙළේය. "ස්වාමීන් වහන්ස, ලෝහිච්ච බ්‍රාහ්මණයාට ලාමකවූ මෙබඳු ලබ්ධි මාත්‍රයක් උපන. (එනම්) මේ ලෝකයෙහි ශ්‍රමණ-යෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ කුශල ධර්මයට පැමිණෙන්නේද, කුශල ධර්මයට පැමිණ (ඒ බව) පරහට නොසැලකරන්නේය (නොකිය යුත්තේය). කෙනෙක් පරහට කුමක් කරන්නේද?[1] පැරණි බැම්මක් සිඳ අන්‍යවූ අළුත් බැම්මක් කරන්නේ යම්සේද, මේ (අනුශාසනාකිරීම) වනාහි එබඳු ලාමකවූ ලෝභධර්මය-කැයි කියමි. යමෙක් පරහට කුමක් කරන්නේද? (යනුවෙනි.) ස්වාමිනි, භාග්‍යවතුන් වහන්ස, ලෝහිච්ච නම් බ්‍රාහ්මණයා ලාමක වූ මේ ලබ්ධිමාත්‍රයෙන් මුදවන සේක් නම් ඉතා යහපත."

"හොඳයි, හෙසිකාවෙනි, යහපති, හෙසිකාවෙනි" (යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක).

9. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ ලෝහිච්ච නම් බ්‍රාහ්මණයාගේ නිවේසය යම් තැනෙක්හිද එතැනට එළඹි සේක. එළඹ පණවන ලද අස්නෙහි වැඩහුන් සේක. එකල්හි ලෝහිච්ච නම් බ්‍රාහ්මණ තෙම බුදුන් ප්‍රමුඛ වූ භික්ෂු සඞ්ඝයා ප්‍රණීත වූ ඛාද්‍ය භොජ්‍යයෙන් සියතින් සන්තර්පණය කෙළේය, මනාකොට පැවරූයේය.

---

1. කුසල් කළ යුතුයයි අනුශාසනා කිරීමෙන් පල කිම්ද?

අථ ඛො ලොහිච්චො බ්‍රාහ්මණො භගවන්තං භුත්තාවිං ඔනීතපත්තපාණිං අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි: එකමන්තං නිසින්නං ඛො ලොහිච්චං බ්‍රාහ්මණං භගවා එතදවොච: සච්චං කිර තෙ ලොහිච්ච එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං: ඉධ සමණො වා බ්‍රාහ්මණො වා කුසලං ධම්මං අධිගච්ඡෙය්‍ය කුසලං ධම්මං අධිගන්ත්වා න පරස්ස ආරොචෙය්‍ය කිං හි [1] පරො පරස්ස කරිස්සති? සෙය්‍යථාපි නාම පුරාණං බන්ධනං ඡින්දිත්වා අඤ්ඤං නවං බන්ධනං කරෙය්‍ය එවංසම්පදමිදං පාපකං ලොභධම්මං වදාමි. කිං හි [1] පරො පරස්ස කරිස්සතීති?

එවං භො ගොතම.

10. තං කිං මඤ්ඤසි ලොහිච්ච? නනු ත්වං සාලවතිකං අජ්ඣාවසසීති? [2]

එවං ඛො [3] භො ගොතම.

යො නු ඛො ලොහිච්ච එවං වදෙය්‍ය: ලොහිච්චො බ්‍රාහ්මණො සාලවතිකං අජ්ඣාවසති. යා සාලවතිකාය සමුදයසඤ්ජාති [4] ලොහිච්චො ව තං බ්‍රාහ්මණො එකකො පරිභුඤ්ජෙය්‍ය න අඤ්ඤෙසං දදෙය්‍යාති. එවංවාදී සො යෙ තං උපජීවන්ති තෙසං අන්තරායකරො වා හොති නො වාති?

අන්තරායකරො භො ගොතම.

අන්තරායකරො සමානො [5] හිතානුකම්පී වා තෙසං හොති අහිතානුකම්පී වාති?

අහිතානුකම්පී භො ගොතම.

---

1. කිඤ්හි B. S. (සබ්බත්‍ථ)
2. °වසීති P. °වසතීති Pa.
3. ඛො ති නත්‍ථි P.
4. සමුදයං සඤ්ජාතිං S. (සබ්බත්‍ථ)
5. සමානො ලොහිච්ච P.

ඉක්බිත්තෙත් ලොහිච්ච නම් බ්‍රාහ්මණතෙම වළඳා නිම කරණ ලද්දාවූ, පාත්‍රයෙන් ඉවත්කරන ලද අත් ඇත්තාවූ භාග්‍යවතුන් වහන්සේ දක එක්තරා නීචාසනයක් ගෙන එකත් පසෙක උන්නේය. එකත් පසෙක උන්නාවූ ලෝහිච්ච බ්‍රාහ්මණයාට භාග්‍යවතුන් වහන්සේ මෙපවත් වදාළසේක: "ලොහිච්චය, 'මේ ලොකයෙහි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ කුශල ධර්මයට පැමිණෙන්නේද, කුශල ධර්මයට පැමිණ (ඒ බව) පරහට නොකියයුත්තේය. යමෙක් (අනිකකුට අනුශාසනා කිරීමෙන්) පරහට කුමක් කරන්නේද? පැරණි බැම්මක් සිඳ අන්‍ය වූ අළුත් බැම්මක් කරන්නේ යම්සේද, මේ (අනුශාසනා කිරීම) එනාහි එබඳුම වූ ලාමක වූ ලොභ ධර්මය කැයි කියමි. යමෙක් (අනුශාසනා කිරීමෙන්) පරහට කුමක් කරන්නේද?' යන මෙබඳු වූ ලාමක ලබ්ධි මාත්‍රයක් තුඹට උපන්නේය යනු සැබෑද?"

"භවත් ගෞතමයන් වහන්ස, ඒ සැබෑය"යි (පිළිවදන් දුන්නේය).

10. "ලොහිච්චය, තුඹ මේ ගැන කුමක් සිතන්නෙහි ද? තුඹ සාලවතිකා නම් ගම අධිපතිව වාසය කරන්නේ නොවෙහිද?"

"භවත් ගෞතමයන් වහන්ස, එසේය."

"ලොහිච්චය, යමෙක් මෙසේ (එනම්:) 'ලොහිච්ච බ්‍රාහ්මණ තෙම සාලවතිකා නම් ගම අධිපතිව වෙසෙයි. සාලවතිකා නම් ගමෙහි යම් පමණ භෝග හටගනීද, එය ලොහිච්ච නම් බ්‍රාහ්මණ තෙම හුදකලාවම පරිභොග කරන්නේය (කළයුත්තේය), අනුන්ට නොදෙන්නේය (නොදියයුත්තේය)'යි කියාත්, මෙසේ කියන් නාවූ තැනැත්තා තුඹ නිසා ජීවත්වන්නාවුන්ගේ යහපතට අන්තරාය කරන්නෙක්ද, නැද්ද?"

"භවද් ගෞතමයන් වහන්ස, (ඔවුන්ගේ යහපතට) අන්තරාය කරන්නෙකි."

"යහපතට අන්තරායකාරීවූ හෙතෙම ඔවුන්ගේ හිතවැඩ කැමැත්තෙක් වේද, නැද්ද?"

"භවද් ගෞතමයන් වහන්ස, හිතවැඩ නොකැමැත්තෙක් වේ."

අහිතානුකම්පිස්ස මෙත්තං වා තෙසු චිත්තං පච්චුපට්ඨිතං හොති සපත්තකං වා'ති?

සපත්තකං භො ගොතම.

සපත්තකෙ චිත්තෙ පච්චුපට්ඨිතෙ මිච්ඡාදිට්ඨි වා හොති සම්මාදිට්ඨි වා'ති?

මිච්ඡාදිට්ඨි භො ගොතම.

මිච්ඡාදිට්ඨිස්ස ඛො අහං ලොහිච්ච ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි නිරයං වා තිරච්ඡානයොනිං වා.

11. තං කිම්මඤ්ඤසි ලොහිච්ච? නනු රාජා පසෙනදි[1] කොසලො කාසිකොසලං අජ්ඣාවසතීති?

එවං භො ගොතම.

යො නු ඛො ලොහිච්ච එවං වදෙය්‍ය: රාජා පසෙනදි[1] කොසලො කාසිකොසලං අජ්ඣාවසති. යා කාසිකොසලෙ සමුදයසඤ්ජාති රාජා ව තං පසෙනදි කොසලො එකකො පරිභුඤ්ජෙය්‍ය න අඤ්ඤෙසං දදෙය්‍යා'ති. එවංවාදී සො යෙ රාජානං පසෙනදිං[2] කොසලං උපජීවන්ති තුම්හෙ චෙව අඤ්ඤෙ ච තෙසං අන්තරායකරො වා හොති නො වා'ති?

අන්තරායකරො භො ගොතම.

අන්තරායකරො සමානො හිතානුකම්පී වා තෙසං හොති අහිතානුකම්පී වා'ති?

අහිතානුකම්පී භො ගොතම.

අහිතානුකම්පිස්ස මෙත්තං වා තෙසු චිත්තං පච්චුපට්ඨිතං හොති සපත්තකං වා'ති?

සපත්තකං භො ගොතම.

සපත්තකෙ චිත්තෙ පච්චුපට්ඨිතෙ මිච්ඡාදිට්ඨි වා හොති සම්මාදිට්ඨි වා'ති.

මිච්ඡාදිට්ඨි භො ගොතම.

මිච්ඡාදිට්ඨිස්ස ඛො අහං ලොහිච්ච ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි නිරයං වා තිරච්ඡානයොනිං වා.

---

1. පස්සෙනදි B. V. (සබ්බත්ථ) 2. පසෙනදි P.

"හිතවැඩ නොකැමැත්තාවූ ඔහුගේ සිතෙහි ඔවුන් කෙරෙහි පිහිටියේ මෙත් සිත ද, නොහොත් ක්‍රොධ සිතද?"

"ක්‍රොධ සිතය, භවද් ගෞතමයන් වහන්ස."

"ක්‍රොධ සිත එළඹ සිටි කල්හි, මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ හෝ වේද, සම්‍යක් දෘෂ්ටි ඇත්තේ හෝ වේද?"

"භවද් ගෞතමයන් වහන්ස, මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වේ."

"ලොහිච්චය, මිථ්‍යාදෘෂ්ටි ඇත්තහුට ලැබෙන්නේ නරක ගතිය හෝ තිරිසන් ගතිය යන ද්විප්‍රකාර ගති අතුරෙන් එක් තරා ගතියක් යයි මම වදාරමි.

11. "ලෝහිච්චය, මේ ගැන තුඹ කුමක් සිතන්නෙහි ද? පසෙනදි කොසොල් රජතෙම කසී-කොසොල් දෙරටෙහි අධිපතිව වසන්නේ නොවේද?"

"එසේ වසන්නේය, භවද් ගෞතමයන් වහන්ස."

"ලොහිච්චය, යමෙක් මෙසේ (එනම්:) 'පසෙනදි කොසොල් රජතෙම කසී-කොසොල් දෙරටෙහි අධිපතිව වෙසෙයි. කසී-කොසොල් දෙරටෙහි යම් වස්තුවක් හටගණීද (හෙවත් භොගොත්පත්තියක් ඇද්ද) එය පසෙනදි කොසොල් රජතෙම තනිවම පරිභොග කරන්නේය(කළයුත්තේය),අනුන්ට නොදෙන්නේය (නොදියයුත්තේය)'යි කිවොත් මෙසේ කියන්නාවූ තැනැත්තා ඒ රජහු නිසා ජීවත්වන්නාවූ තුඹගේ හෝ අන්‍යයන්ගේ හෝ ලාභයන්ට අන්තරාය කරන්නෙක්ද, නැද්ද?"

"භවද් ගෞතමයන් වහන්ස, ලාභාන්තරාය කරන්නෙකි."

"ලාභාන්තරාය කරන්නා ඔවුන්ගේ හිතවැඩ කැමැත්තෙක්ද, නොහොත් හිතවැඩ නොකැමැත්තෙක්ද?"

"භවද් ගෞතමයන් වහන්ස, හිතවැඩ නොකැමැත්තෙකි."

"හිතවැඩ නොකැමැති තැනැත්තාගේ සිතෙහි පිහිටියේ ඔවුන් කෙරෙහි මෙත් සිතද නොහොත් ක්‍රොධ සිතද?"

"ක්‍රොධ සිතය, භවද් ගෞතමයන් වහන්ස."

"ක්‍රොධ සිත එළඹ සිටි කල්හි මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වේද නොහොත් සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වේද?"

"භවද් ගෞතමයන් වහන්ස, මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වේ."

"ලොහිච්චය, මිථ්‍යාදෘෂ්ටි ඇත්තහුට ලැබෙන්නේ නරක ගතිය හෝ තිරිසන් ගතිය යන ද්විප්‍රකාර ගති අතුරෙන් එක්තරා ගතියක් යයි මම කියමි.

12. ඉති කිර ලොහිච්ච යො එවං වදෙය්‍ය: ලොහිච්චො බ්‍රාහ්මණො සාලවතිකං අජ්ඣාවසති යා සාලවතිකාය සමුදයසඤ්ජාති ලොහිච්චො ච තං බ්‍රාහ්මණො එකකො පරිභුඤ්ජෙය්‍ය න ච අඤ්ඤෙසං දදෙය්‍යාති එවංවාදී සො යෙ තං උපජීවන්ති තෙසං අන්තරායකරො හොති අන්තරායකරො සමානො අහිතානුකම්පී හොති අහිතානුකම්පිස්ස සපත්තකං චිත්තං පච්චුපට්ඨිතං හොති සපත්තකෙ චිත්තෙ පච්චුපට්ඨිතෙ මිච්ඡාදිට්ඨි හොති.

13. එවමෙව ඛො ලොහිච්ච යො එවං වදෙය්‍ය: ඉධ සමණො වා බ්‍රාහ්මණො වා කුසලං ධම්මං අධිගච්ඡෙය්‍ය කුසලං ධම්මං අධිගන්ත්වා න පරස්ස ආරොචෙය්‍ය කිං හි පරො පරස්ස කරිස්සති? සෙය්‍යථාපි නාම පුරාණං බන්ධනං ඡින්දිත්වා අඤ්ඤං නවං බන්ධනං කරෙය්‍ය එවංසම්පදමිදං පාපකං ලොභධම්මං වදාමි. කිං හි පරො පරස්ස කරිස්සතීති?— එවංවාදී සො යෙ තෙ කුලපුත්තා තථාගතප්පවෙදිතං ධම්මවිනයං ආගම්ම එවරූපං උළාරං විසෙසං අධිගච්ඡන්ති සොතාපත්තිඵලම්පි සච්ඡිකරොන්ති සකදාගාමිඵලම්පි සච්ඡිකරොන්ති අනාගාමිඵලම්පි සච්ඡිකරොන්ති අරහත්තම්පි සච්ඡිකරොන්ති යෙ චිමෙ[1] දිබ්බා ගබ්භා පරිපාචෙන්ති දිබ්බානං භවානං අභිනිබ්බත්තියා තෙසං අන්තරායකරො හොති අන්තරායකරො සමානො අහිතානුකම්පී හොති. අහිතානුකම්පිස්ස සපත්තකං චිත්තං පච්චුපට්ඨිතං හොති. සපත්තකෙ චිත්තෙ පච්චුපට්ඨිතෙ මිච්ඡාදිට්ඨි හොති. මිච්ඡාදිට්ඨිස්ස ඛො අහං ලොහිච්ච ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි නිරයං වා තිරච්ඡානයොනිං වා.

---

1. යෙ කෙචිමෙ P.

12. "ලෝහිච්චය, යමෙක් මෙසේ (එනම්:) 'ලොහිච්ච බ්‍රාහමණ තෙමේ සාලවතිකා නම් ගම අධිපතිව වෙසෙසි, සාලවතිකා නම් ගම හටගත්තා යම් පමණ භොග වේද ඒ සියල්ල ලොහිච්ච බ්‍රාහමණතෙම හුදකලාව පරිභොග කරත්තේය (කලයුත්තේය), අනුන්ට නොදෙන්නේය (නොදියයුත්තේය)යි කීවොත්, එසේ කියන තැනැත්තා ලොහිච්ච නම් බ්‍රාහමණයා නිසා ජිවත්වන්නවුගේ ලාභයට අනතරාය කරන්නෙක් වේ. ලාභානනතරාය කරන්නා වනාහි හිතවැඩ නොකැමැත්තෙකි. හිතවැඩ නොකැමැත්තහුට එළඹ සිටියේ ක්‍රොධ සිතයි. ක්‍රොධ සිත එළඹ සිටි කල්හි මිථ්‍යාදෘෂ්ටි ඇත්තේයයි (මෙතෙකින් වැටහී යායුතුයි).

13. "ලොහිච්චය, එපරිද්දෙන්ම යමෙක් මෙසේ කීවොත් (එනම්:) 'මේ ලෝකයෙහි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහමණයෙක් හෝ කුශල ධර්මයට පැමිණෙන්නේද කුශල ධර්මයට පැමිණ (ඒ පිළිබඳව) පරහට නොම කියයුත්තේය. යමෙක් (අනුශාසනා කිරීමෙන්) පරහට කුමක් කරන්නේද? පුරාණ බන්ධනයක් සිඳ අන්‍යවූ අභිනව බන්ධනයක් කරන්නේ යම්සේද මේ (අනුශාසනා කිරීම) එසේම ලාමක වූ ලොභ ධර්මයක් යයි කියමි. යමෙක් (අනුශාසනා කිරීමෙන්) පරහට කුමක් කරන්නේද'යි (කීවොත්) මෙසේ කියන්නාවූ තැනැත්තා වනාහි තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශකරන ලද ධර්ම විනය ඇති ශාසනයට පිවිස මෙබඳු වූ මහත් වූ විශිෂ්ටත්වයට පැමිණෙන්නාවූ (එනම්:) ශ්‍රොතාපත්ති ඵලය සාක්ෂාත් කරන්නාවූද, සකෘදාගාමි ඵලය සාක්ෂාත් කරන්නාවූද, අනාගාමි ඵලය සාක්ෂාත් කරන්නාවූද, අර්හත් ඵලය සාක්ෂාත් කරන්නාවූද දිව්‍යගර්භයෙහි ඉපදීමෙන් මේ දිව්‍ය ගර්භයෙහි මුහුකිරීමට පැමිණෙන්නාවූද යම් කුලපුත්‍රයෝ වෙත් නම් (ඉහත කී දෘෂ්ටිය ප්‍රකාශකරන තැනැත්තා) එබඳු කුලපුත්‍රයන්ට අනතරායකරවේ. අනතරාය කරන්නා හිතවැඩ නොකැමැත්තෙක් වේ. හිතවැඩ නොකැමැත්තහුට එළඹ සිටියේ ක්‍රොධ සිතය. ක්‍රොධ සිත එළඹ සිටි කල්හි මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වේ. ලොහිච්චය, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහට ලැබෙන්නේ නරක ගතිය හෝ තිරිසන් ගතිය යන ද්විප්‍රකාර ගති අතුරෙන් එක්තරා ගතියකැයි මම වදාරමි.

14. ඉති කිර ලොහිච්ච යො එවං වදෙය්‍ය: රාජා පසෙනදි කොසලො කාසිකොසලං අජ්ඣාවසති. යා කාසිකොසලෙ සමුදයසඤ්ජාති රාජා ව තං පසෙනදිකොසලො එකකො පරිභුඤ්ජෙය්‍ය න අඤ්ඤෙසං දදෙය්‍යාති. එවංවාදී සො යෙ රාජානං පසෙනදිං කොසලං[1] උපජීවන්ති තුම්හෙ චෙව අඤ්ඤෙ ච තෙසං අන්තරායකරො හොති. අන්තරායකරො සමානො අහිතානුකම්පී හොති. අහිතානුකම්පිස්ස සපත්තකං චිත්තං පච්චුපට්ඨිතං හොති. සපත්තකෙ චිත්තෙ පච්චුපට්ඨිතෙ මිච්ඡාදිට්ඨි හොති.

15. එවමෙව ඛො ලොහිච්ච යො එවං වදෙය්‍ය: ඉධ සමණො වා බ්‍රාහ්මණො වා කුසලං ධම්මං අධිගච්ඡෙය්‍ය කුසලං ධම්මං අධිගන්ත්වා න පරස්ස ආරොචෙය්‍ය. කිං හි පරො පරස්ස කරිස්සති. සෙය්‍යථාපි නාම පුරාණං බන්ධනං ඡින්දිත්වා අඤ්ඤං නවං බන්ධනං කරෙය්‍ය එවංසම්පදමිදං පාපකං ලොභධම්මං වදාමි කිං හි පරො පරස්ස කරිස්සතීති. එවංවාදී සො යෙ තෙ කුලපුත්තා තථාගතප්පවෙදිතං ධම්මවිනයං ආගම්ම එවරූපං උළාරං විසෙසං අධිගච්ඡන්ති සොතාපත්තිඵලම්පි සච්ඡිකරොන්ති සකදාගාමිඵලම්පි සච්ඡිකරොන්ති අනාගාමිඵලම්පි සච්ඡිකරොන්ති අරහත්තම්පි සච්ඡිකරොන්ති යෙ චිමෙ[2] දිබ්බා ගබ්භා පරිපාචෙන්ති දිබ්බානං භවානං අභිනිබ්බත්තියා තෙසං අන්තරායකරො හොති. අන්තරායකරො සමානො අහිතානුකම්පී හොති. අහිතානුකම්පිස්ස සපත්තකං චිත්තං පච්චුපට්ඨිතං හොති. සපත්තකෙ චිත්තෙ පච්චුපට්ඨිතෙ මිච්ඡාදිට්ඨි හොති. මිච්ඡාදිට්ඨිස්ස ඛො අහං ලොහිච්ච ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදාමි: නිරයං වා තිරච්ඡාන-යොනිං වා.

---

1. පසෙනදිකොසලං P. 2. යෙ·කෙචිමෙ P.

14. “ලොහිච්චය, යමෙක් මෙසේ කීමොත් (එනම්:) ‘පසෙනදි කොසොල් රජ තෙම කසී-කොසොල් දෙරටෙහි අධිපතිව වෙසෙයි. කසී කොසොල් දෙරටෙහි යම් හොගොත්පත්තියක් ඇද්ද, එය පසෙනදි කොසොල් රජතෙම හුදකලාවම පරිභොග කළයුත්තේය, අනුන්ට නොදියයුත්තේය’යි (කීමොත්) මෙසේ කියන්නාවූ හෙතෙම පසෙනදි කොසොල් රජු නිසා ජීවත්වන්නාවූ නුඹටද අන්‍යයන්ටද අන්තරායකරයයි (මෙතෙකින් වැටහි යායුතුය). අන්තරායකර වූයේ හිතවැඩ නොකැමැත්තේ වේ. හිතවැඩ නොකැමැත්තහුට එළඹ සිටියේ සතුරු සිතයි. සතුරු සිත එළඹ සිටි කල්හි මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වේ.

15. “ලොහිච්චය, එපරිද්දෙන්ම යමෙක් මෙසේ කීමොත් (එනම්:) [1]මේ ලොකයෙහි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහමණයෙක් හෝ කුශල ධර්මයට පැමිණෙන්නේද, කුශල ධර්මයට පැමිණ (ඒ පිළිබඳව) පරහට නොම සැලකළ යුත්තේය. යමෙක් (අනුන්ට අනුශාසනා කෙරේද, අනුශාසක වූ හෙතෙම) පරහට කුමක් කරන්නේද? පැරණි බන්ධනයක් සිඳ අන්‍යවූ අභිනව බන්ධනයක් කරන්නේ යම්සේද, මේ (අනුශාසනා කිරීම) එනාහි එසේම ලාමකවූ ලොභධර්මයකැයි කියමි. යමෙක් (අනුශාසනා කෙරේද, අනුශාසක වූ හෙතෙම) පරහට කුමක් කරන්නේද’යි මෙසේ කියන්නාවූ තැනැත්තා වූකලී තථාගතයන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලද ධර්මවිනය ඇති ශාසනයට පැමිණ, මෙබඳුවූ මහත්වූ විශිෂ්ටත්වයකට පැමිණෙන්නා වූද ශ්‍රොතාපත්ති ඵලය සාක්ෂාත් කරන්නාවූද සකෘදාගාමි ඵලය සාක්ෂාත් කරන්නාවූද, අනාගාමි ඵලය සාක්ෂාත් කරන්නාවූද, අර්හත්වය සාක්ෂාත් කරන්නාවූද, දිව්‍ය භවයෙහි ඉපදීමෙන් දිව්‍යාත්මභාවය මුහුකුරවන්නාවූද යම් කුලපුත්‍රයෝ වෙත්නම් (ඉහතකී දෘෂ්ටිය ඇති තැනැත්තා) ඔවුන්ට අන්තරායකාරී වේ. අන්තරායකර වූයේම හිත වැඩ නොකැමැත්තේ වේ. හිතවැඩ නොකැමැත්තහුට සතුරු සිත එළඹ සිටියේ වේ. සතුරුසිත එළඹසිටි කල්හි මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වේ. ලොහිච්චය, මිථ්‍යාදෘෂ්ටි ඇත්තහුට ලැබෙන්නේ නරක ගතිය හෝ තිරිසන් ගතිය යන විප්‍රකාර ගති අතුරෙන් එක්තරා ගතියක්යයි මම වදාරමි.

16. තයො ඛො මෙ ලොහිච්ච සත්ථාරො යෙ ලොකෙ චොදනාරහා. යො[1] ච පනෙවරූපෙ සත්ථාරො චොදෙති සා චොදනා භූතා තච්ඡා ධම්මිකා අනවජ්ජා. කතමෙ තයො? ඉධ ලොහිච්ච එකච්චො සත්ථා යස්සත්ථාය අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති ස්වාස්ස[2] සාමඤ්ඤත්ථො අනනුප්පත්තො හොති. සො තං සාමඤ්ඤත්ථං අනනුපාපුණිත්වා සාවකානං ධම්මං දෙසෙති: ඉදං වො හිතාය ඉදං වො සුඛායාති. තස්ස[3] සාවකා න සුස්සූසන්ති[4] න සොතං ඔදහන්ති න අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති වොක්කම්ම ච සත්ථුසාසනා වත්තන්ති. සො එවමස්ස චොදෙතබ්බො: ආයස්මා ඛො යස්සත්ථාය අගාරස්මා අනගාරියං පබ්බජිතො සො තෙ සාමඤ්ඤත්ථො අනනුප්පත්තො[5] තං ත්වං සාමඤ්ඤත්ථං අනනුපාපුණිත්වා සාවකානං ධම්මං දෙසෙසි: ඉදං වො හිතාය ඉදං වො සුඛායාති. තස්ස තෙ සාවකා න සුස්සූසන්ති න සොතං ඔදහන්ති න අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති වොක්කම්ම ච සත්ථුසාසනා වත්තන්ති.

සෙය්‍යථාපි නාම ඔසක්කන්තියා වා උස්සුක්කෙය්‍ය[6] පරම්මුඛිං වා ආලිඞ්ගෙය්‍ය එවංසම්පදමිදං පාපකං ලොභධම්මං වදමි කිං හි පරො පරස්ස කරිස්සතීති?

අයං ඛො[7] ලොහිච්ච පඨමො සත්ථා යො ලොකෙ චොදනාරහො යො[8] ච පනෙවරූපං සත්ථාරං චොදෙති සා චොදනා භූතා තච්ඡා ධම්මිකා අනවජ්ජා.

---

1. යෙ B. S. V.
2. සවස්ස B.
3. තස්ස තෙ P. W.
4. සුස්සන්ති S. (සබ්බත්ථ)
5. නානුප්පත්තො P.
6. උස්සක්කෙය්‍ය B. S.
7. ඛොති නත්ථි P.
8. සො B V.

16. "ලොහිච්චය, මේ ලෝකයෙහි චෝදනා ලැබීමට සුදුසු වූ මේ ශාස්තෘවරයෝ තිදෙනෙක් වෙත්. යම් කෙණෙක් මෙබඳු වූ ශාස්තෘවරයන්ට චෝදනා කෙරේද, ඒ චෝදනා තොමෝ සත්‍ය වන්නීය, සැබෑ වන්නීය, ධාර්මික වන්නීය, නිරවද්‍ය වන්නීය. කවර (ශාස්තෘවරයින්) තිදෙනෙක්ද යත්: ලොහිච්චය, මේ ලෝකයෙහි ඇතැම් ශාස්තෘ කෙණෙක් යම් අභිත්ඵල ලාභයක් පිණිස ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි පැවිදිවූයේ වේද, ඒ ඔහු විසින් ශ්‍රාමණ්‍යාර්ථය (අභිත්ඵලය) නොලබන ලද්දේද, ශ්‍රාමණ්‍යාර්ථයට නොපැමිණ, 'තොපට මේ හිත පිණිසය, යොපට මේ සැප පිණිසය'යි ශ්‍රාවකයන්ට ධර්මදේශනා කෙරෙයිද, ඔහුගේ ශ්‍රාවකයෝ ඒ නො අසති, ඒ ධර්මය ඇසීම පිණිස කන් නොනමති, ඒ ධර්මය දැනගැණීම පිණිස සිත එළඹ නොසිටවති, ශාස්තෘ ශාසනයෙන් බැහැරව පවතිත්. හෙතෙම (එබඳු ශාස්තෘවරයා) මෙසේ චෝදනා කටයුතු වන්නේය. (කෙසේද?) 'ආයුෂ්මත් තෙම යම් (අභිත්ඵල) ලාභයක් පිණිස ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි පැවිදි වූයේද, ආයුෂ්මතුන් විසින් ඒ අභිත් ඵලය නොලබන ලද්දේය. ආයුෂ්මත් තෙමේ ඒ ශ්‍රාමණ්‍යාර්ථයට නොපැමිණ, 'තොපට මේ හිත පිණිසය, තොපට මේ සැප පිණිසය'යි ශ්‍රාවකයන්ට ධර්මදේශනා කෙරේද ආයුෂ්මතුන්ගේ ශ්‍රාවකයෝ ඒ ධර්මය නොඅසති, ඒ ධර්මශ්‍රවණයට කන් නො නමති, ඒ ධර්මය දැණගැනීම පිණිස සිත එළඹ නොසිටුවති, ඔවුහු ශාස්තෘ ශාසනයෙන් බැහැරවද පවතිත්.

"යම්සේ (මිනිසෙක්) තමන් වෙතින් බැහැර යන්නියක් ලුහුබැඳ යන්නේ හෝ වේද, පරාඞ්මුඛ වූ තැනැත්තියක් වැළඳ ගන්නේ හෝ වේද, මේ (ආයුෂ්මතුන්ගේ අනුශාසනා කිරීම) එබඳු වූ ලාමක වූ ලෝභකර්මයකැයි කියමි. (එබඳු) යමෙක් (අනු ශාසනා කිරීමෙන්) අන්‍යයකුට කුමක් කරන්නේද?' කියායි.

"ලොහිච්චය, යමෙක් මේ ලොකයෙහි චෝදනා කිරීමට සුදුස්සෙක් වේද, මේ දක්වන ලද්දේ ඒ පළමුවෙනි ශාස්තෘ තෙමේයි. යමෙක් මෙබඳු ශාස්තෘවරයාට චෝදනා කෙරේද, ඒ චෝදනා තොමෝ සත්‍ය වන්නීය, සැබෑ වන්නීය, ධාර්මික වන්නීය, නිරවද්‍ය වන්නීය.

17. පුනචපරං ලොහිච්ච ඉධෙකච්චො සත්ථා යස්සත්ථාය අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති ස්වාස්ස සාමඤ්ඤත්ථො අනනුප්පත්තො හොති. සො තං සාමඤ්ඤත්ථං අනනුපාපුණිත්වා සාවකානං ධම්මං දෙසෙති: ඉදං වො හිතාය ඉදං වො සුඛායාති. තස්ස තෙ සාවකා සුස්සූසන්ති සොතං ඔදහන්ති අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති න ච වොක්කම්ම සත්ථුසාසනා වත්තන්ති.

සො එවමස්ස චොදෙතබ්බො: ආයස්මා ඛො යස්සත්ථාය අගාරස්මා අනගාරියං පබ්බජිතො සො තෙ සාමඤ්ඤත්ථො අනනුප්පත්තො. තං ත්වං සාමඤ්ඤත්ථං අනනුපාපුණිත්වා සාවකානං ධම්මං දෙසෙසි: ඉදං වො හිතාය ඉදං වො සුඛායාති. තස්ස තෙ සාවකා සුස්සූසන්ති සොතං ඔදහන්ති අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති න ච වොක්කම්ම සත්ථුසාසනා වත්තන්ති. සෙය්‍යථාපි නාම සකං ඛෙත්තං ඔහාය පරං[1] ඛෙත්තං නිද්දායිතබ්බං[2] මඤ්ඤෙය්‍ය එවංසම්පදමිදං පාපකං ලොභ-ධම්මං වදාමි කිං හි පරො පරස්ස කරිස්සතීති.

අයං ඛො ලොහිච්ච දුතියො සත්ථා යො ලොකෙ චොදනාරහො යො ච පනෙවරූපං සත්ථාරං චොදෙති සා චොදනා භූතා තච්ඡා ධම්මිකා අනවජ්ජා.

18. පුනචපරං ලොහිච්ච ඉධෙකච්චො සත්ථා යස්සත්ථාය අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති ස්වාස්ස සාමඤ්ඤත්ථො අනුප්පත්තො[3] හොති. සො තං සාමඤ්ඤත්ථං අනුපාපුණිත්වා[4] සාවකානං ධම්මං දෙසෙති: ඉදං වො හිතාය ඉදං වො සුඛායාති. තස්ස සාවකා න සුස්සූසන්ති න සොතං ඔදහන්ති න අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති වොක්කම්ම ච[5] සත්ථුසාසනා වත්තන්ති.

---

1. පරඛෙත්තං
2. නිඩ්ඩායිතබ්බං C,
3. අනනු° W.
4. අනනු° W.
5. න ච වොක්කම්ම P. චකාරෙ නත්ථි W,

17. "ලොහිච්චය, නැවතද අනිකක් කියමි. මේ ලෝකයෙහි ඇතැම් ශාස්තෘවරයෙක් යම් (අභීත්ඵල) ලාභයක් පිණිස ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි පැවිදිවූයේ වේද, හෙතෙම ඒ ශ්‍රාමණ්‍යාර්ථයට නොපැමිණියේ වේද, එසේ වූ හෙතෙම ඒ ශ්‍රාමණ්‍යාර්ථයට නොපැමිණ, 'තොපට මේ හිත පිණිසය, තොපට මේ සැප පිණිසය'යි ශ්‍රාවකයන්ට ධර්මදෙශනා කෙරෙයි. ඒ ශ්‍රාවකයෝ ඔහුගේ එ ධර්මය අසති, ඒ ධර්මය දැන ගැණීම පිණිස කන් නමති, ඒ ධර්මය දැනගැණීමට තමන්ගේ සිත් එළවා තබත්, ඒ ශාස්තෘ ශාසනයෙන් බැහැරව නොයත්.

"හෙතෙම මෙසේ චොදනා කටයුතු වන්නේය. (කෙසේද?) 'ආයුෂ්මත් තෙම වනාහි යම් (අභීත්ඵල) ලාභයක් පිණිස ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි පැවිදි වූයේද, යුෂ්මතා විසින් ඒ ශ්‍රාමණ්‍යාර්ථය නොලබන ලද්දේය. යුෂ්මත්තෙම ඒ ශ්‍රාමණ්‍යාර්ථයට නොපැමිණ, 'තොපට මේ හිත පිණිසය, තොපට මේ සැප පිණිසය'යි ශ්‍රාවකයන්ට ධර්ම දෙශනා කරන්නෙහිය. ඒ ශ්‍රාවකයෝ යුෂ්මතාගේ ධර්මය අසත්, (ඊට) කන් නමත්, ඒ ධර්මය දැනගැනීම පිණිස සිත එළවත්, (ඔවුහු) ඒ ශාස්තෘශාසනයෙන් බැහැරව නොපවතිත්. (යමෙක්) සිය කුඹුර හැර අනුන් සතු කුඹුරක් ශෂ්‍යදූෂක තෘණ උදුරා පිරිසිදු කටයුතුයයි සිතන්නේ යම්සේද, මේ (යුෂ්මතුන්ගේ අනුශාසනාකිරීම) එබඳුවූ ලාමකවූ ලොභ ධර්මයකැයි මම කියමි. (එබඳුවූ) යමෙක් (අනුශාසනා කිරීමෙන්) පරහට කුමක් කරන්නේද?යි (කුමනා යහපතක් සලසන්නේද?යි) කියායි.

"ලොහිච්චය, යමෙක් මේ ලොකයෙහි චෝදනා ලැබීමට සුදුස්සෙක් වේද, මේ දක්වන ලද්දේ ඒ දෙවෙනි ශාස්තෘවර තෙමේයි. යමෙක් මෙබඳුවූ ශාස්තෘවරයෙකුහට චෝදනා කෙරේද, ඒ චෝදනාතොමෝ සත්‍යවන්නීය, සැබෑ වන්නීය, ධාර්මික වන්නීය, වරද රහිත වන්නීය.

18. "ලොහිච්චය, නැවතද අනිකක් කියමි. මේ ලොකයෙහි ඇතැම් ශාස්තෘවරයෙක් යම් (අභීත්ඵල) ලාභයක් පිණිස ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි පැවිදිවූයේද, හෙතෙම ඒ ශ්‍රාමණ්‍යාර්ථයට පැමිණියේ වේද, හෙතෙම ඒ ශ්‍රාමණ්‍යාර්ථයට පැමිණ, 'තොපට මේ හිත පිණිසය, තොපට මේ සැප පිණිසය'යි ශ්‍රාවකයන්ට ධර්ම දේශනා කෙරේ. ශ්‍රාවකයෝ ඔහුගේ ඒ ධර්මය නො අසත්, ඒ ධර්මශ්‍රවනයට කන් නොනමත්, ඒ ධර්මය දැනගැණීම පිණිස සිත නො එළවත්, (ඔවුහු) ඒ ශාස්තෘ ශාසනයෙන් බැහැරව යෙත්.

සො එවමස්ස චොදෙතබ්බො: ආයස්මා බො යස්සත්ථාය අගාරස්මා අනගාරියං පබ්බජිතො සො තෙ සාමඤ්ඤත්ථො අනුප්පත්තො. තං ත්වං සාමඤ්ඤත්ථං අනුපාපුණිත්වා සාවකානං ධම්මං දෙසෙසි: ඉදං වො හිතාය ඉදං වො සුඛායාති. තස්ස තෙ සාවකා න සුස්සූසන්ති න සොතං ඔදහන්ති න අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති වොක්කම්ම ච සත්ථුසාසනා වත්තන්ති. සෙය්‍යථාපි නාම පුරාණං බන්ධනං ඡින්දිත්වා අඤ්ඤං නවං බන්ධනං කරෙය්‍ය එවංසම්පදමිදං පාපකං ලොභධම්මං වදාමි කිං හි පරො පරස්ස කරිස්සතීති.

අයං බො ලොහිච්ච තතියො සත්ථා යො ලොකෙ චොදනාරහො යො ච පනෙවරූපං සත්ථාරං චොදෙති සා චොදනා භූතා තච්ඡා ධම්මිකා අනවජ්ජා.

ඉමෙ බො ලොහිච්ච තයො සත්ථාරො යෙ ලොකෙ චොදනාරහා. යො ච පනෙවරූපෙ සත්ථාරො චොදෙති සා චොදනා භූතා තච්ඡා ධම්මිකා අනවජ්ජාති.

19. එවං වුත්තෙ ලොහිච්චො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: අත්ථි පන භො ගොතම කොචි සත්ථා යො ලොකෙ න චොදනාරහොති?

අත්ථි බො ලොහිච්ච සත්ථා යො ලොකෙ න චොදනාරහොති.

කතමො පන සො භො ගොතම සත්ථා යො ලොකෙ න චොදනාරහොති?

"ඔහුතෙම මෙසේ චෝදනා කටයුතු වන්නේය: (කෙසේද?) 'ආයුෂ්මත්‍ තෙම යම් (අභීප්ඵල) ලාභයක් පිණිස ගිහිගෙන් නික්ම අනගාරික ශාසනයෙහි පැමිදි වූයේද, ශුෂමතුන් විසින් ඒ ශ්‍රාමණ්‍යාර්ථය ලබන ලද්දේය. ශුෂමතා ඒ ශ්‍රාමණ්‍යාර්ථයට පැමිණ 'තොපට මේ හිත පිණිසය, තොපට මේ සැප පිණිසය',යි ශ්‍රාවකයන්ට ධම්දෙශනා කරන්නෙහිය. ඒ ශ්‍රාවකයෝ ශුෂමතුන්ගේ ඒ ධර්මය නො අසත්, එව කන් නො නමත්, ඒ ධර්මය දැනගැණීම පිණිස සිත පමුණුවා නොසිටුවත්, ඔවුහු මේ ශාසනාශාසනයෙන් බැහැරව යෙත්. (යමෙක්) පුරාණ බන්ධනයක් සිඳ අන්‍යවූ අභිනව බන්ධනයක් කරන්නේ යම්සේද, මේ (ශුෂමතාගේ අනුශාසනා කිරීම) එබඳු වූ ලාමක වූ ලෝභ ධර්මයකැයි මම කියමි. (එබඳු) යමෙක් (අනුශාසනා කිරීමෙන්) පරහට කුමක් කරන්නේ (කුමණ යහපතක් සල සන්නේ) දැ'යි කියායි.

"ලොහිච්චය, ලොකයෙහි යමෙක් චෝදනා ලැබීමට සුදුසු වේද, මේ දක්වන ලද්දේ ඒ තුන්වෙනි ශාස්තෘවර තෙමේයි. යමෙක් මෙබඳුවූ ශාස්තෘවරයාට චෝදනා කෙරේද, ඒ චෝදනා තොමෝ සත්‍ය වන්නීය, සැබෑ වන්නීය, ධාර්මික වන්නීය, වරද රහිත වන්නීය.

"ලොහිච්චය, යම් බඳුවූ ශාස්තෘවරයෝ ලොකයෙහි චෝදනා ලැබීමට සුදුසු වෙත්ද, මේ ඒ තුන්දෙනායි. යමෙක් මෙබඳුවූ ශාස්තෘවරයන්ට චෝදනා කෙරේ ද, ඒ චෝදනා තොමෝ සත්‍ය වන්නීය, සැබෑ වන්නීය, ධාර්මික වන්නීය, වරද රහිත වන්නීය."

19. මෙසේ වදාළ කල්හි ලොහිච්ච බ්‍රාහ්මණ තෙම භාග්‍ය-වතුන් වහන්සේට මෙපවත් සැලකළේය: "භවද් ගෞතමයන් වහන්ස, ලොකයෙහි යමෙක් චෝදනා ලැබීමට නුසුදුසු වේනම්, එබඳුවූ යම්කිසි ශාස්තෘවරයෙක් ඇත්තේද?"

"ලොහිච්චය, ලොකයෙහි යමෙක් චෝදනා ලැබීමට නුසුදුසු වේද, එබඳුවූ ශාස්තෘවරයෙක් ඇත්තේමය."

"භවද් ගෞතමයන් වහන්ස, ලොකයෙහි යමෙක් චෝදනා ලැබීමට නුසුදුසු වේනම්, ඒ ශාස්තෘ තෙම කවරේද?"

20. ඉධ ලොහිච්ච තථාගතො ලොකෙ උප්පජ්ජති[1] අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි[2] සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා.[3] සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති.

21. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ[4] පච්චාජාතො.[5] සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසංචික්ඛති: සම්බාධො ඝරාවාසො රජොපථො[6] අබ්භොකාසො පබ්බජ්ජා.

නයිදං[7] සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සංඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති.[8]

---

1. උපපජ්ජති B. V. උප්පජ්ජතිපි S.
2. °සාරථි B. S.
3. භගවාති S.
4. අඤ්ඤතරස්මිං වා පච්චා° W.
5. පච්ජා° S; පච්චා° Sa.
6. රජාපථො S. C. රජො° Sa.
7. න ඉදං C. P.
8. පබ්බජ්ජෙය්‍යන්ති P.

20. ලොහිච්චය, අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, අෂ්ටවිද්‍යා පසළොස් චරණධර්මයන් ගෙන් යුක්තවූ, යහපත් ගති ඇත්තාවූ, සියලු ලෝකයන් දන්නා සුලුවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි ශ්‍රෙෂ්ඨවූ රියැදුරකු වැනිවූ, දෙවිමිනිසුන්ට ශාස්තෘවූ, සිව්සස් දම් අවබොධ කළාවූ, භාග්‍යවත් වූ, තථාගත කෙනෙක් මෙලොව උපදනාහ. ඒ තථාගත තෙමේ දෙවියන් සහිත වූ, මාරයන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, දෙවිමිනිසුන් (රජුන් හා මිනිසුන්) සහිතවූ, සත්ත්වවර්ගයා සවකීය විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කෙරේ. ඒ (තථාගතයන් වහන්සේ) මුල යහපත්වූ, මැද යහපත්වූ, කෙළවර යහපත්වූ, (සතර සතිපට්ඨානාදිය ඇසුරු කළ හෙයින්) අර්ථ සහිතවූ, (දශවිධ ව්‍යඤ්ජන නොපිරිහෙළා වදාරණ හෙයින්) ව්‍යඤ්ජන සහිතවූ, සියලු ලෙසින් සම්පූර්ණවූ, පිරිසුදුවූ, සකල ශාසනමාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව ගෙන හැර දක්වති.

21. ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපතිපුත්‍රයෙක් හෝ අන් කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක් හෝ අසයි. හෙතෙම ඒ දහම් අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කෙරෙයි. හෙතෙම ඒ ශ්‍රද්ධාලාභයෙන් යුක්ත වූයේ මෙසේ සලකන්නේය: 'ගෘහවාසය පීඩා සහිතයි, රාගාදි රජස ගැවසි මාර්ගයෙකි. පැවිද්ද වනාහී අභ්‍යාකාශය මෙනි (කිසිවක් නොමැති අවකාසය මෙන් නිදහස්ය).

ගිහිගෙහි වසන්නහු විසින් සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, සියලු ආකාරයෙන් පිරිසිදුවූ, ලියවූ සකක් වැනි (සංඛ- ලිඛිතවූ), මෙම බඹසර හැසිරෙන්නට නොහැක්කේය. මම කෙස් දැළිරැවුලු හරවා, කසාවත් හැඳ, ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවන්නෙම් නම් (ඒකාන්තයෙන්) ඉතා මැනවැයි' කියායි.

22. සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති[1]. සො[2] එවං පබ්බජිතො සමානො පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු කායකම්මවචීකම්මෙන සමන්නාගතො කුසලෙන පරිසුද්ධාජීවො සීලසම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො සන්තුට්ඨො.

23. කථඤ්ච ලොහිච්ච භික්ඛු සීලසම්පන්නො හොති? ඉධ ලොහිච්ච භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පී විහරති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති. ඉදම්පිස්ස හොති සීලස්මිං. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී[3] විරතො මෙථුනා ගාමධම්මා. ඉදම්පිස්ස හොති සීලස්මිං.

1. පබ්බජ්ජති P. 2. සො ඉති න දිස්සති P.

3. අනාචාරී B.

22. හෙතෙම පසු කාලයෙක සවල්පවූ හෝ බොහෝවූ භෝග රාශිය හැර, සවල්පවූ හෝ බොහෝවූ නෑපිරිස් හැර, කෙස් දැළිරැවුලු හරවා, කසාවසත්‍රයන් හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වේ. මෙසේ පැවිදිවූ හෙතෙම පාතිමොක්ඛසංවරයෙන් යුක්ත වූයේ, ආචාර ගොචර දෙකින් යුක්ත වූයේ, සවල්පවූත් අකුසල් විෂයෙහි භය දක්නාසුලු වූයේ, යහපත්වූ කාය වාක් කර්මයෙන් යුක්ත වූයේ, ශික්ෂාපද සමාදන්ව එහි මොනවට හික්මෙයි. පිරිසුදුවූ දිවි පැවැතුම් ඇත්තේ වෙයි. (ත්‍රිවිධ) ශීලයෙන් යුක්ත වූයේ වෙයි. ඉන්‍ද්‍රිය විෂයෙහි වැසූ දොරටු ඇත්තේ වෙයි. බොජුනෙහි පමණ දන්නේ වෙයි. මනා සිහියෙන් හා සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයි. (සිව්පසය පිළිබඳ යථාලාභ) සන්තොෂයෙන් යුක්ත වෙයි.

23. ලොහිච්චය, මහණ තෙමේ කෙසේනම් සීලසම්පන්න වේද? ලොහිච්චය, මේ සස්නෙහිවූ මහණතෙමේ ප්‍රාණවධය හැර ඉන් වැළැක්කේ වේ. බහා තබන ලද දඬු ඇත්තේ, බහා තබන ලද අවි ඇත්තේ, පව් කිරීමෙහි ලජ්ජා ඇත්තේ, කරුණාවත් වූයේ, සියලු ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පිව වෙසේ. මෙසේ මේ (ප්‍රාණ වධයෙන් වෙන්වීමේ සීලය) ද ඒ මහණහුගේ සීලය පිණිස වේ.

(හෙතෙම) නොදුන් දෙය ගැනීමෙන් වෙන්ව, එයින් විශෙෂයෙන් වැළැක්කේ, දුන් දෙයම ගන්නේ, දුන් දෙයම කැමැති (බලාපොරොත්තු) වන්නේ, සොර නොවූ, පිරිසුදුවූ (ආත්මභාවයෙන්) සිතින් යුක්තව වාසය කෙරේ. මෙසේ ඒ (අදත්තාදානයෙන් වෙන්වීමේ සීලය) ද ඒ මහණහුගේ සීලය පිණිස වේ. අබ්‍රහ්මචර්‍ය්‍යාව හැර, බඹසර නොවන හැසිරීමෙන් දුරුවූ පැවතුම් ඇත්තේ, ස්ත්‍රීපුරුෂසංසර්ගය නම්වූ ග්‍රාමධර්මයෙන් වෙන් වූයේ බ්‍රහ්මචාරී වේ. මෙසේ ඒ (කාමාසවාද විරතිය පිළිබඳවූ සීලය) ද ඔහුගේ සීලය පිණිස වේ.

මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති[1] සච්චවාදී සච්චසන්ධො ථෙතො[2] පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. ඉදම්පිස්ස හොති සීලස්මිං. පිසුණං වාචං[3] පහාය පිසුණාය වාචාය පටිවිරතො හොති. ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය. අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා[4] සමග්ගාරාමො[5] සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති[6]. ඉදම්පිස්ස හොති සීලස්මිං.

ඵරුසං[7] වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති. යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා[8] හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා තථාරූපං[9] වාචං භාසිතා හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපපටිවිරතො හොති කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා හොති[6] කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං[10]. ඉදම්පිස්ස හොති සීලස්මිං.

24. බීජගාමභූතගාමසමාරම්භා[11] පටිවිරතො හොති[12]. එකභත්තිකො හොති රත්තූපරතො[13] පටිවිරතො[14] විකාලභොජනා. නච්චගීතවාදිතවිසූකදස්සනා[15] පටිවිරතො හොති. මාලාගන්ධවිලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතො හොති. උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ජාතරූපරජතපටිග්ගහණා[16] පටිවිරතො හොති.

---

1. පටිවිරතො සමණො ගොතමො P.
2. ඨෙතො S; ථෙතො Sa.
3. පිසුණාවාචං P. W.
4. අනුප්පා° P.
5. සමග්ගරාමො B. Ca.
6. හොතීති න දිස්සති P.
7. ඵරුසංවාචං P. W.
8. පෙමනීයා B.
9. °රූපිං P.
10. °සඤ්හිතං B.
11. °සමාරබ්භා B. V.
12. හොති—පෙ—එක° B. V.
13. රත්තූපරතො B.
14. විරතො P. S. C.
15. °විසූක° B.
16. °ප්පටිග්ගහණා V. (සබ්බත්ථ)

බොරු කීමෙන් දුරුව, ඉන් විශෙෂයෙන් වැළැක්කේ, සැබෑ තෙපුල් කියන්නේ, සැබැවින් සැබව ගළපන සුලුවූයේ, ස්ථිර කථා ඇත්තේ, ඇදහිය යුතු තෙපුල් ඇත්තේ, ලෝකයා අතර විරුද්ධ කථා ඇති නොකෙරේ. මෙසේ (බොරු කීමෙන් වැළකීම) ද ඒ මහණහුගේ සීලය පිණිස වේ. පිසුණු බස් හැර, ඉන් වෙසෙසින් වැළැක්කේය. මෙතැනින් අසා මොවුන් බිඳවීම පිණිස එතැන නොකියන සුලුවූයේය. එතැනින් අසා ඔවුන් බිඳවීම පිණිස මෙතැන නොකියන සුලුවූයේය. මෙසේ හෙද වූවන් ගළපන්නේ, සමගිවූවන්ගේ සමගිය තහවුරු කිරීමට අනුබල දෙන්නේ, සමගියෙහි ඇලුම් බහුල කොට ඇත්තේ, සමගිකම්හි ඇලුනේ, සමගිකම්හි සතුටුවන සුලුවූයේ, සමගිය ඇති කරණ තෙපුල් කියන්නේය. මේ ද ඔහුගේ සීලය පිණිස වේ.

ඵරුෂ වචනය හැර, ඉන් වෙසෙසින් වැළැක්කේ, යම් වචනයක් නිදොස් වේද, කන්කලු ද, අර්ථ වශයෙන් ප්‍රෙමණීයද, මනාසේ සිතට වදනා හෙයින් සිත්කලු ද, පුරවාසීන්ගේ කථා මෙන් යහපත් ද, බොහෝ දෙනාට ප්‍රිය ද, බොහෝ දෙනාගේ මන වඩන්නේ ද,එබඳු තෙපුල්ම කියන්නේ වේ. මෙසේ (ඒ රළුවචනයෙන් වෙන්වීම ද) ඒ මහණහුගේ සීලය පිණිස වේ. හිස්වූ ප්‍රලාප කථා හැර, ඉන් වෙසෙසින් වැළැක්කේ, කාල-යට සුදුසු කථා කරන්නේ, සිදුවූ (සැබෑවූ) තෙපුල්ම කියන්නේ, අර්ථයෙන් යුක්තවූ, (නවලොවුතුරු) දහම් ඇසුරු කළ, විනය ඇසුරු කළ තෙපුල් කියන්නේ, සුදුසු කල්හි උපමා හා කරුණු සහිතවූ,(පරිච්ඡෙද) සීමා ඇති, අර්ථ හෙවත් අභිවෘද්ධියෙන් යුත්, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේ. මේ (හිස්කථාවෙන් වැළැක්ම)ද ඔහුගේ සීලය පිණිස වේ.

24. තණ, ගස්, වැල් සිඳීම් බිඳීම් ආදි විකොපනයෙන් වැළැක්කේ, එක් වේලේ වළඳන බොජුන් ඇත්තේ, රාත්‍රි-භොජනයෙන් හා විකල් බොජුනෙන් වැළැක්කේය. නැටීම්, ගී කීම්, බෙර ආදිය වැයීම්, විසුලු දැකීම් යන මෙයින් වැළැක්-කේය. මල්, ගඳ, විලවුන් පැළඳීම, ඉන් සැරසීම, එනුතැන් පිරවීමෙන් අලඞ්කාර කිරීම යන මෙයින් වැළැක්කේය. උස් අසුන් මහ අසුන් යන මෙයින් වැළැක්කේය. රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් වැළැක්කේය.[1]

1. දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ උපග්‍රන්ථයේ x වෙනි පිට බලනු.

ආමකධඤ්ඤපටිග්ගහණා[1] පටිවිරතො හොති. ආමකමංසපටිග්ගහණා[1] පටිවිරතො හොති. ඉත්ථිකුමාරිකපටිග්ගහණා[1] පටිවිරතො හොති. දාසිදාසපටිග්ගහණා පටිවිරතො හොති. අජෙළකපටිග්ගහණා[1] පටිවිරතො හොති. කුක්කුටසූකරපටිග්ගහණා[1] පටිවිරතො හොති. හත්ථිගවාස්සවළවාපටිග්ගහණා[2] පටිවිරතො හොති. ඛෙත්තවත්ථුපටිග්ගහණා[1] පටිවිරතො හොති. දූතෙය්‍යපහිණගමනානුයොගා[3] පටිවිරතො හොති. කයවික්කයා පටිවිරතො හොති. තුලාකූටකංසකූටමානකූටා[4] පටිවිරතො හොති. උක්කොටනවඤ්චනනිකතිසාචියොගා[5] පටිවිරතො හොති. ඡෙදනවධබන්ධනවිපරාමොසආලොපසහසාකාරා[6] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

25. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං බීජගාමභූතගාමසමාරම්භං[7] අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං[8] මූලබීජං ඛන්ධබීජං ඵළුබීජං[9] අග්ගබීජං බීජබීජමෙව[10] පඤ්චමං— ඉති[11] එවරූපා බීජගාමභූතගාමසමාරම්භා[12] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

26. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං සන්නිධිකාරපරිභොගං අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං අන්නසන්නිධිං[13] පානසන්නිධිං වත්ථසන්නිධිං යානසන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං— ඉති වා ඉති එවරූපා සන්නිධිකාරපරිභොගා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. °ප්පටිග්ගහණ V. (සබ්බත්ථ)
2. °ගවස්ස°B.V.°වලව°V.W.°වළව°B.
3. °පහීණ° W.
4. °කූට° B.
5. °සාචි° B. V.
6. °සහස° B.
7. °සමාරබ්භං V.
8. සෙය්‍යථිදං B. V. (සබ්බත්ථ)
9. ඵල° S. ඵලු° C. P.
10. බීජබීජං එව B.S.V.
11. ඉති වා ඉති V. S.
12. °සමාරබ්භා V.
13. °නිධි S. (සබ්බත්ථ)

අමුවූ ධාන්‍යවර්ග පිළිගැන්මෙන් තොරවූයේ, අමුමස් පිළිගැන්මෙන් තොරවූයේ ද ස්ත්‍රීන් හා කුමරියන් පිළිගැන්මෙන් තොර වූයේ ද වේ. දසිදසුන් පිළිගැන්මෙන් තොර වූයේ, එළුවන් හා තිරළුවන් පිළිගැන්මෙන් තොර වූයේ, කුකුළන්, හූරන්, ඇතුන්, ගවයන්, අසුන්, වෙළඹුන්, කෙත්, වත්, යන මේ පිළිගැන්මෙන්ද තොර වූයේය. ගිහියන්ගේ දූත මෙහෙවරය, ගෙන්ගෙට යන පහන් මෙහෙවරය යන මෙයින් වැළැක්කේය. ගනු දෙනු කිරීමය, තුලා ආදියෙන් වඤ්චා කිරීමය, රන් හා නොරන් මුසුකොට වඤ්චාකිරීමය, වී ආදිය මැනීමෙන් වඤ්චා කිරීමය, හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය, උපායෙන් අනුන් රැවටීමය, යකඩ ආදි ලෝහ රන් රිදී යයි අඟවා වඤ්චා කිරීමය, නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයෝගය යන මෙයින් වැළැක්කේය. කැපීමය, මැරීමය, බැඳීමය, සැඟවී සිට වස්තු පැහැර ගැන්ම (මංකොල්ල)ය, නියම්ගම් ආදිය පැහැරීමය, බලාත්කාරකමින් වස්තු පැහැරගැන්මය යන මෙයින් ද වැළැක්කේය. මේ (විරතිය) ද ඔහුගේ සීලය පිණිස වේ.

25. ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් අනුභව කොට මූලබීජය, ඛන්ධබීජය, එළු (පුරුක්) බීජය, දලු (අග්‍ර) බීජය, පස්වැනිවූ බීජබීජය යන මේ බීජගාමභූතගාමසමාරම්භයෙහි යෙදී වෙසෙත්. (මෙබඳු වූ බීජගාම භූතගාමයන් සිඳීම් බිඳීම් ආදියෙන් වැළැක්කේ වේ නම්) මෙද ඔහුගේ සීලය පිණිස වේ.

26. එසේම යම් ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් අනුභව කොට, ආහාර වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයොජන ගැන්මය, පාන වර්ග දෙවෙනි දිනට තබා ප්‍රයොජන ගැන්මය, නොඉටන ලද සිවුරු ආදිය එසේ තැන්පත් කොට තැබීමය, යාන සංඛ්‍යාත වහන් තබා එසේ ප්‍රයොජන ගැන්මය, දෙකකින් වැඩි සයන ලැබ පසුවට තබා ප්‍රයොජන ගැන්මය, සුගන්ධයන් ලැබ එලෙස තබා ප්‍රයොජන ගැන්මය, තල සහල් ආදී ආමිසයන් තැන්පත් කොට තබා ප්‍රයොජන ගැන්ම යයි කියන ලද සන්නිධිකාරපරිභොගයෙහි යෙදී වෙසෙත්. මෙබඳුවූ සන්නිධිකාරපරිභොගයෙන් වැළකි වෙයෝ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

27. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං[1] අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීදං නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වෙතාලං[2] කුම්භථූනං[3] සොභනගරකං[4] චණ්ඩාලං වංසං ධොපනං[5] හත්ථියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං[6] උසභයුද්ධං අජයුද්ධං මෙණ්ඩකයුද්ධං[7] කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යොධිකං බලග්ගං සෙනාබ්‍යූහං අනීකදස්සනං[8] — ඉති වා ඉති එවරූපා විසූකදස්සනා[1] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

28. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං ජූතප්පමාදට්ඨානානුයොගං[9] අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීදං[10] අට්ඨපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං[11] ඛලිකං ඝටිකං සලාකහත්ථං අක්ඛං පඞ්ගචීරං වඞ්කකං[12] මොක්ඛචිකං චිඞ්ගුලකං[13] පත්තාළ්හකං[14] රථකං ධනුකං අක්ඛරිකං මනෙසිකං[15] යථාවජ්ජං— ඉති වා ඉති එවරූපා ජූතප්පමාදට්ඨානානුයොගා[9] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. විසූක° B.
2. වෙතාළං B. S. V.
3. කුම්භථූණං B. S. °ථූණං V.
4. සොභන්කරකං W. C.
   සොභනඝරකං V.
5. ධොවනං S.
6. මහිංස° B.
7. මෙණ්ඩ° S. V.
8. අනික° B.
9. ජූතපමාද° P.
10. සෙය්‍යථිදං B. V. (සබ්බත්ථ)
11. පත්තිකං V.
12. වඞ්කං Va.
13. චිඞ්ගුලිකං B. V. P.
14. පත්ථා° B. V.
15. මානෙ° S; මනෙ°Sa,

27. එසේම යම් ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා, නැටීමය, ගී කිමය, බෙර ආදිය වැයීමය, රඟමඬුලු සැරසීමය, (රාමායනාදි) කථා ඇසීමය, කයිතාලම් හා අත්ලෙන් අත්ල ගැසීමය, මන්ත්‍ර පිරවීමෙන් මළමිනී නැංවීමය, සතරැස් හෝ කළබෙර ගැසීමය, ශොභන (ප්‍රතිභාන) චිත්‍ර විචිත්‍රය,[1] සණ්ඩෙවුන් කෙළිය, හුණගස් ඔසවා නැටීමය, මිනීඇට සෝද නැබීමය, ඇතුන් හා යුද කිරීමය, අසුන් හා යුද කිරීමය, මීවුන් හා යුද කිරීමය, උසභයන් හා යුද කිරීමය, අජයුද්ධය, මෙණ්ඩක යුද්ධය, කුක්කුට යුද්ධය, වට්ටක යුද්ධය, දණ්ඩ යුද්ධය, තොරතුරු ඇසීමය, මල්ලව යුද්ධය, (සාමාන්‍ය) යුද්ධය, ඇත් අස් ආදීන් ගණන් කිරීමය, සෙනා සන්නිවෙසය, ඇත් අස් ආදීන් දැකීමය, යන විපරීත දර්ශනයෙහි යෙදී වෙසෙත්. මෙසේ මෙබඳුවූ විසුලු දැක්මෙන් වැළකේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

28. එසේම යම් ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා (දූ පෝරු ආදියෙහි කෙළිම්වූ) අට්ඨපද ක්‍රීඩාවය, දශපද ක්‍රීඩාවය, දූ පෝරු ආදියෙහි මෙන් ආකාශයෙහි ක්‍රීඩාකිරීමය, බිම මණ්ඩල වශයෙන් සාදා පැන පැන ක්‍රීඩා කිරීමය, දූ කැට නොසොල්වා තියෙන් ගසා ක්‍රීඩා කිරීමය, පසඇටින් දදු කෙළීමය, සිං කෙළීමය, භිත්ති ආදියෙහි ඉරටමිටි ගසා ඇත් අස් ආදි රූප දක්වා කෙළීමය, පන්දු කෙළීමය, පත් කුලල් පිඹීමය, ගම් දරුවන් මෙන් ක්‍රීඩා නගුල් ගෙන සීසෑම් ව්‍යාජයෙන් කෙළීමය, කරනම් ගැසීමය, තල්පත් ආදියෙන් කත්නත්ගුරුවා තනා ක්‍රීඩා කිරීමය, කොළ නැළියෙන් වැලි ආදිය මැන කෙළීමය, කුඩා රථයෙන් කෙළීමය, කුඩා දුන්නෙන් කෙළීමය, අහසෙහි හෝ පිටෙහි හෝ අකුරු ඇඳ කෙළීමය, සිතූ දේ කියවීම් කීම් ආදියෙන් කෙළීමය, (ගොළු බිහිරි ආදීන්ගේ) ඒ ඒ දෙෂ රූප දක්වා කෙළීමය, යන මෙබඳුවූ ප්‍රමාදයට කාරණාවූ දූ කෙළීමෙහි යෙදී වාසය කෙරෙත්. මෙසේ මෙබඳුවූ දූ කෙළියෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

1. අඞ්ගුත්තරනිකායේ පඨමුවන කාණ්ඩයේ 15 වෙනි පිටේ අඩොල්පිය බලනු.

29. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං උච්චාසයන-මහාසයනං අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීදං ආසන්දිං පල්ලඞ්කං ගොනකං[1] චිත්තකං පටිකං පටලිකං තූලිකං[2] විකතිකං උද්දලොමිං එකන්තලොමිං කට්ඨිස්සං[3] කොසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං[4] අස්සත්ථරං[4] රථත්ථරං[4] අජිනප්පවෙණිං කාදලිමිග-පවරපච්චත්ථරණං[5] සඋත්තරච්ඡදං උභතොලොහිතකූපධානං— ඉති වා ඉති එවරූපා උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

30. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං මණ්ඩන-විභූසනට්ඨානානුයොගං[6] අනුයුත්තා විහරන්ති-සෙය්‍යථීදං[7] උච්ඡාදනං පරිමද්දනං නහාපනං[8] සම්බාහනං ආදාසං අඤ්ජනං මාලා විලෙපනං[9] මුඛචුණ්ණකං[10] මුඛාලෙපනං[11] හත්ථබන්ධං[12] සිඛාබන්ධං දණ්ඩකං[13] නාළිකං[14] ඛග්ගං[15] ඡත්තං චිත්‍රූපාහනං උණ්හීසං මණිං වාලබීජනිං[16] ඔදාතානි වත්ථානි දීඝදසානි— ඉති වා ඉති එවරූපා මණ්ඩනවිභූසනට්ඨානානුයොගා[6] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

31. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං තිරච්ඡානකථං අනුයුත්තා විහරන්ති—සෙය්‍යථීදං[7] රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං පුරිසකථං [කුමාරකථං කුමාරිකථං][17] සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභව-කථං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානකථාය පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ගොණකං S. C.
2. තුලිකං B.
3. කට්ඨි° B. V. කට්ටි° S.
4. °ත්ථරණං B. V.
5. කදලි° B.P.V. කාදල° W.
6. °විභූ° B. °විභූසණ° W.
7. සෙය්‍යථිදං B. V. (සබ්බත්ථ)
8. න්හාපනං B. V.
9. මාලාගන්ධවි° S. B.
10. මුඛචුණ්ණං S. B. V.
11. මුඛලෙපනං B. V.; °විලෙපං S මුඛාලෙපං Sa
12. °බද්ධං W.
13. දණ්ඩං B. S. V.
14. නාලිකං W.; නාලකං V.
15. අසිං V; අසිං ඛග්ගං S.
16. වාල° P. W.
17. ඉදං මරම්මපොත්ථකෙසු යෙව දිස්සති

29. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, දික්හගලා පුටුය, පලඟ්ය, සතරඟුලෙන් දිග ලොම් ඇති ඇතිරිය, විසිතුරු එළු ලොම් ඇති ඇතිරිය, එළු ලොම්මුවා සුදු ඇතිරිය, එළු ලොම්මුවා ඝනපුප් ඇතිරිය, සිංහාදි රූපයෙන් විසිතුරු එළු ලොම් ඇතිරිය, එක් පිට ලොම් ඇති එළු ලොම් ඇතිරිය, දෙපිට ලොම් ඇති එළු ලොම් ඇතිරිය, රත්කසුකම් කොට කැටි තිඟිරි හුයින් කළ පසතුරුණුය, එක්විට නිළියන් සොළොස්දෙනා කෙළනා එළු ලොම් මුවා මහ ඇතිරිය, ඇතුන් පිට අතුරණ ඇතිරිය, අසුන් පිට අතුරණ ඇතිරිය, රථ පිට අතුරණ ඇතිරිය, අඳුන් දිවිසමින් කළ පසතුරුණුය, කදලිමුව සමින් කළ උතුම් පසතුරුණුය, දෙපස තබන ලද රත්කන්වයින් ඇති ආසනය, යන මෙබඳු උස් අසුන් මහ අසුන් පරිභොග කෙරෙත්. මෙසේ මෙබඳු වූ උසසුන් මහ අසුන්හි හිඳීම් ආදියෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.[1]

30. එසේම යම් ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා, ඇඟ සුවඳ ඉලීමය, පිරිමැදීමය, නෑවීමය, මැඩීමය, කැඩපත් පරිහරණය, අඳුන් තෙල් පරිහරණය, මල් හා විලවුන්, මුවසුණු, මුඛාලෙප, හස්තාභරණ යන මේ දේ දැරීම හා පැළඳීමය, රන් හු ආදියෙන් සිබා (කුඩුම්බි) බැඳීමය, විසිතුරු දඬු ගෙන හැසිරීමය, බෙහෙත් නළ දසරුවෙහි එල්වාගෙන ඇවිදීමය, කඩු උරෙහි එල්වා ගෙන ඇවිදීමය, ඡත්‍රධාරීව ඇවිදීමය, විසිතුරු වහන් පයලා ඇවිදීමය, නලල්පට බැඳීමය, සිබාමාණික්‍ය පැළඳීමය, වල්විදුනා දැරීමය, දික්වූ දහවලු ඇති සුදුවත් ඇඳීමය යි මෙසේ වූ සැරසීම් හා උනුතැන් පිරවීමෙහි නිතර නිතර යෙදෙත්. මෙබඳු වූ සැරසීම්, අලඞ්කාර කිරීම් ආදියෙහි යෙදීමෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

31. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ—මහ ඇමතියන් පිළිබඳ—සේනා පිළිබඳ—භය පිළිබඳ—යුද පිළිබඳ—ආහාර පිළිබඳ—පාන වර්ග පිළිබඳ—වස්ත්‍ර පිළිබඳ—සයන පිළිබඳ—මාලා, ගන්ධ ද්‍රව්‍යයන්—නෑයන්—යානාවන්—ගම්—නියම්ගම්-නුවර-දනව්—ස්ත්‍රීන්—පුරුෂයන්—[කුමරකුමරියන්]—යොධයන්—වීථි—ඝටචෙටිකාවන් හෝ තිත්ථයන්—මළ නෑයන් යන ආදීන් පිළිබඳ කථාය, නොයෙක් ආකාරවූ ව්‍යර්ථ කථාය, ලොකාඛ්‍යායික (විතණ්ඩ) කථාය, මුහුද පිළිබඳ කථාය, භවාභව කථාය යන මෙබඳු තිරිසන් කථාවෙහි යෙදී වෙසෙත්. මෙබඳු වූ තිරච්ඡානකථාවෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

1. මෙහි ඇතුළත් දේ ගැණ ඇතැම් තොරතුරු දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ බ්‍රහ්මජාල සූත්‍රයෙන් බලා දත යුතුයි.

32. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා, තෙ එවරූපං විග්ගාහිකකථං අනුයුත්තා විහරන්ති— සෙය්‍යථීදං[1] න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි, අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡාපටිපන්නො ත්වමසි අහමස්මි සම්මාපටිපන්නො. සහිතං මෙ අසහිතං තෙ. පුරෙ වචනීයං පච්ඡා අවච පච්ඡාවචනීයං පුරෙ අවච. අවිචිණ්ණං[2] තෙ විපරාවත්තං ආරොපිතො තෙ වාදො නිග්ගහිතොසි[3] චර වාදප්පමොක්ඛාය නිබ්බෙඨෙහි වා සචෙ පහොසීති— ඉති වා ඉති එවරූපාය විග්ගාහිකකථාය පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

33. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං දූතෙය්‍යපහිණගමනානුයොගමනුයුත්තා විහරන්ති— සෙය්‍යථීදං[1] රඤ්ඤං රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං කුමාරානං: ඉධ ගච්ඡ අමුත්‍රාගච්ඡ ඉදං හර අමුත්‍ර ඉදං ආහරාති— ඉති වා ඉති එවරූපා දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

34. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ කුහකා ච හොන්ති ලපකා ච නෙමිත්තිකා[4] ච නිප්පෙසිකා ච ලාභෙන[5] ලාභං නිජිගිංසිතාරො[6] ච[7]— ඉති වා ඉති[8] එවරූපා කුහනලපනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. සෙය්‍යථිදං B. V. (සබ්බත්ථ)
2. ආචිණ්ණං W. C.
3. නිග්ගහීතො ත්වමසි B. V. නිග්ගහීතොසි P.W.
4. නිමිත්තකා Sa.
5. ලාභෙන ච ලාභං P.S.
6. නිජිගිසිතාරො B.
7. ච ඉති න දිස්සති P.S.W.
8. ඉති එවං P. W

32. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා 'ඔබ මේ ධර්මවිනය නොදන්නෙහිය, මම මේ ධර්මවිනය දනිමි.' 'ඔබ මේ ධර්මවිනය කුමකැයි දන්නෙහි ද? ඔබ වරදවා පිළිපන්නෙහිය, මම මනාකොට පිළිපන්නේ වෙමි.' 'මාගේ වදන් සිලිටුය හෝ අර්ථ සහිතය, ඔබගේ වචනය එසේ නොවෙයි.' 'පළමු කිය යුත්ත පසුව කීයෙහිය, පසුව කිය යුත්ත පළමුව කීයෙහිය, යමක් ඔබ බොහෝ කල් පුරුදු කරණ ලද නම් ඒ සියල්ල ව්‍යර්ථ විය. ඔබට වාදාරොපනය කරණ ලදී; නිග්‍රහ කරණ ලද්දෙහිය (වාදයෙන් පැරදුනෙහිය). වාදයෙන් මිදෙනු පිණිස ක්‍රියා කරව. ඉදින් හැක්කෙහි නම් වාදයෙන් ගැලවෙව් හෙවත් ඒ නිවේධනය කරව' යන ආදි විග්‍රාහික හෙවත් දෝෂාරොපණ කථාවෙහි යෙදී වෙසෙත්. මෙසේ මෙබඳු විග්‍රාහික කථාවෙන් වැලැක්මෙක් නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

33. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා රජුන්ගේ, රජමහ ඇමතියන්ගේ, ක්‍ෂත්‍රියයන්ගේ, බමුණන්ගේ, ගැහැවියන්ගේ සහ කුමරුන්ගේද හසුන් ගෙණ, 'මෙතනින් අසවල් තැනට යා, අසවල් තැනින් මෙහි එව, මෙය ගෙණ යා, එතැනින් අසවල් දෙය ගෙණෙව' යි (අණවන ලදුව) දූතභාවයෙහි හා හසුන් ගෙණ යැමෙහි යෙදී වෙසෙත්. මෙබඳු දූත භාවය, හසුන් ගෙණයෑම යන මෙයින් වැලැක්මෙක් නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

34. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා කුහකයෝ ද, සිව්පසය උදෙසා කථා කරන්නෝ ද, නිමිතිකරන්නෝ නොහොත් ලාභ සත්කාර සඳහන් කරවන්නෝ ද, පරලාභාදිය උදෙසා කියන්නෝ ද,[1] ලාභයකින් ලාභයක් සොයන්නෝ ද වෙත්. මෙබඳු වූ කුහනලපනාදියෙන් වැලැක්මෙක් වේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

---

1. දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ 21 වෙනි පිටේ 1 වෙනි අධොලිපිය බලනු.

35. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති. සෙය්‍යථීදං[2] අඞ්ගං නිමිත්තං උප්පාදං[3] සුපිණං[4] ලක්ඛණං මූසිකච්ඡින්නං[14] අග්ගිහොමං දබ්බිහොමං ථුසහොමං කණහොමං තණ්ඩුලහොමං සප්පිහොමං තෙලහොමං මුඛහොමං ලොහිතහොමං අඞ්ගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා[5] සිවවිජ්ජා භූතවිජ්ජා භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා විච්ඡිකවිජ්ජා මූසිකවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං[6] සරපරිත්තානං මිගචක්කං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

36. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති. සෙය්‍යථීදං[2] මණිලක්ඛණං වත්ථලක්ඛණං[7] දණ්ඩලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං[8] ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරිලක්ඛණං දාසලක්ඛණං දාසිලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං[9] උසභලක්ඛණං ගොලක්ඛණං[10] අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං[11] කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං ගොධාලක්ඛණං කණ්ණිකාලක්ඛණං[12] කච්ඡපලක්ඛණං මිගලක්ඛණං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා[13] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

37. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති. සෙය්‍යථීදං[2] රඤ්ඤං නිය්‍යානං භවිස්සති රඤ්ඤං අනිය්‍යානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං ජයො භවිස්සති බාහිරානං රඤ්ඤං[15] පරාජයො භවිස්සති. බාහිරානං රඤ්ඤං ජයො භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං පරාජයො භවිස්සති. ඉති ඉමස්ස ජයො භවිස්සති ඉමස්ස පරාජයො භවිස්සති— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ජීවිතං B. V.
2. සෙය්‍යථිදං B. V.
3. උප්පාතං B. °පාටං S.
4. සුපිනං B. P. සුපිණකං C.
5. ඛෙත්ත° B. S. V.
6. පක්ඛ° W. C.
7. සංථලක්ඛණං B. V.; දණ්ඩ° වංථ° P. W.
8. ආයුධ° B. P.
9. මහිංස° B.
10. ගොණ° B.
11. මෙණ්ඩක° V. W.
12. කණ්ණික° B. S.
13. මිච්ඡාජිවා ඉති න දිස්සති P.
14. මූසික° P. W.
15. රඤ්ඤං ඉති න දිස්සති B. V.

35. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, අඞ්ග (සාමුද්‍රිකා) ශාස්ත්‍රය, නිමිති ශාස්ත්‍රය, (අසනිපාතාදි මහ නිමිති බලා කියන) උත්පාද ශාස්ත්‍රය, සවප්න ශාස්ත්‍රය, ලක්ෂණ ශාස්ත්‍රය, (මීයන් කැපූ වස්ත්‍රාදිය බලා කියන) මූසික ශාස්ත්‍රය, අග්නිහෝමය, දබ්බිහෝමය, ථුස හෝමය, තණ්ඩුල—කණ—සප්පි—තෙල—මුඛ—ලෝහිත හෝමය, අඞ්ග විද්‍යා, වාස්තු විද්‍යා, නීති ශාස්ත්‍රය, සොහොණෙහි ශාන්ති කරන්නාවූ විද්‍යාව හෝ සිවල් රුත විද්‍යා, භූත විද්‍යා, අහි විද්‍යා, විෂ විද්‍යා, විච්ඡික විද්‍යා, මූසික විද්‍යා, සකුණ විද්‍යා, වායස විද්‍යා, ජීවත කාලය කීම වූ පක්කජ්ඣානය, ශරපරිත්‍රාණය (ආයුධ වැළැක්ම), තිරිසන් සතුන්ගේ ශබ්ද දැනීම වශයෙන් පැවති මන්ත්‍රය යන තිරශ්චින විද්‍යා[1] හෙතුකොට ගෙන මිථ්‍යාජිවයෙන් ජීවිකාව කෙරෙත්. මෙසේ මෙබඳු තිරශ්චිනවිද්‍යා හෙතුවෙන් කරණ ලාමකජිවිකාවෙන් වැළැක්කේ වේද මෙද ඔහුගේ සීලය පිණිස වේ.

36. එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, මිණි ලක්ෂණය, වස්ත්‍ර ලක්ෂණය, දණ්ඩ — ඛඩ්ග — ශර — දුනු — ආයුධ —ඉත්ථි—පුරිස—කුමාර—කුමාරි—දාස— දාසි—හත්ථි—අස්ස— මහිස—උසභ—ගො—අජ—මෙණ්ඩ— කුක්කුට—වට්ටක —ගොධා— කණ්ණිකා —කච්ඡප—මිග ලක්ෂණය යන මෙබඳු තිරච්ඡාන විද්‍යාවන්[1] කරණකොට ගෙණ වැරදි ජිවිකාව කෙරෙත්. මෙසේ වූ තිරශ්චින විද්‍යාවන් නිසා කරණ වැරදි ජිවිකාවෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

37. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා 'අසවල් දින රජුන්ගේ බැහැර යෑම වන්නේය, අසවල් දින රජුන්ගේ ඇතුළු නුවරට යෑම වන්නේය, අසවල් දින ඇතුළුනුවර රජුන්ගේ ආක්‍රමණය වන්නේය, බැහැර රජුන්ගේ බැහැරට යෑම වන්නේය. බැහැර රජුන්ගේ ඇතුළු නුවරට ඊම වන්නේය, ඇතුළුනුවර රජුන්ගේ ආපසු යෑම වන්නේය, ඇතුළුනුවර රජුන්ට ජය වන්නේය, බැහැර රජුන්ට පරාජය වන්නේය. බැහැර රජුන්ට ජය වන්නේය. ඇතුළුනුවර රජුන්ට පරාජය වන්නේය. මෙසේ මොහුට ජය වන්නේය, මෙසේ පරාජය වන්නේය' යි කියා මෙසේ තිරශ්චිනවිද්‍යා හෙතුකොට ලාමක ජීවිකාව කෙරෙත්. මෙබඳු වූ තිරච්ඡාන විජ්ජා හෙතුවෙන් කරණ මිච්ඡාජිවයෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

---

1. දීඝනිකායේ පළමුවෙනි කාණ්ඩයේ 21 වෙනි පිට බලනු.

38. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති— සෙය්‍යථීදං[2] චන්දග්ගාහො භවිස්සති සුරියග්ගාහො[3] භවිස්සති නක්ඛත්තග්ගාහො භවිස්සති. චන්දිමසුරියානං[3] පථගමනං භවිස්සති චන්දිමසුරියානං[3] උප්පථගමනං භවිස්සති. නක්ඛත්තානං පථගමනං භවිස්සති නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති. උක්කාපාතො භවිස්සති. දිසාඩාහො[4] භවිස්සති. භූමිචාලො භවිස්සති. දෙවදුන්දුභි[5] භවිස්සති. චන්දිමසුරියනක්ඛත්තානං[3] උග්ගමනං ඔගමනං[6] සංකිලෙසං වොදානං භවිස්සති. එවංවිපාකො චන්දග්ගාහො භවිස්සති. එවංවිපාකො සුරියග්ගාහො[3] භවිස්සති. එවංවිපාකො නක්ඛත්තග්ගාහො භවිස්සති. එවංවිපාකං[7] චන්දිමසුරියානං[3] පථගමනං භවිස්සති. එවංවිපාකං[7] චන්දිමසුරියානං[3] උප්පථගමනං භවිස්සති. එවංවිපාකං[7] නක්ඛත්තානං පථගමනං භවිස්සති. එවංවිපාකං[7] නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති. එවංවිපාකො උක්කාපාතො භවිස්සති. එවංවිපාකො දිසාඩාහො[4] භවිස්සති. එවංවිපාකො භූමිචාලො භවිස්සති. එවංවිපාකො දෙවදුන්දුභි[5] භවිස්සති. එවංවිපාකං චන්දිමසුරියනක්ඛත්තානං[3] උග්ගමනං ඔගමනං[6] සංකිලෙසං වොදානං භවිස්සති—ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

39. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති— සෙය්‍යථීදං[2] සුබ්බුට්ඨිකා[8] භවිස්සති දුබ්බුට්ඨිකා[9] භවිස්සති. සුභික්ඛං භවිස්සති දුබ්භික්ඛං භවිස්සති. ඛෙමං භවිස්සති භයං භවිස්සති. රොගො භවිස්සති ආරොග්‍යං භවිස්සති. මුද්දා ගණනා[10] සංඛානං කාවෙය්‍යං ලොකායතං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ජීවිතං B. V.
2. සෙය්‍යථිදං° B. V. (සබ්බත්ථ)
3. °සූරිය° B.
4. °දාහො W.
5. °දුන්දුභි B. V
6. ඔග්ගමනං B. S. V.
7. °විපාකො P.
8. සුබ්බු° V.; සුවුට්ඨිකං B.
9. දුබ්බුට්ඨිකං B.
10. ගණනං B.

38. එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදූහැයෙන් දුන් බොජුන් වළඳා: චන්ද්‍රග්‍රහණය වන්නේය, සූර්‍ය්‍යග්‍රහණය--තාරකා සමාගමය—සඳහිරු දෙදෙනාගේ නියම මාර්‍ගගමන—සඳහිරු දෙදෙනාගේ අමාර්‍ගගමන—තාරකාවන්ගේ මාර්‍ගගමන—තාරකාවන්ගේ අමාර්‍ගගමන වන්නේය, උල්කාපාතය වන්නේය, දිසා දැවීම—පොළොව කම්පාව—අහස ගිගුරුම—සඳ, හිරු, තාරකා යන මොවුන්ගේ නැගීම හා අස්තයට යෑම ද කෙලෙසීම ද පිරිසිදු වීම ද වන්නේය. චන්ද්‍රග්‍රහණය මෙබඳු විපාක ඇතිවන්නේය, සූර්‍ය්‍යග්‍රහණය—තාරකා සමාගමය— චන්ද්‍රසූර්‍ය්‍යයන්ගේ මාර්‍ගයෙහි ගමන— ඔවුන්ගේ නොමග ගමන— තාරකාවන්ගේ මාර්‍ගයෙහි ගමන— තාරකාවන්ගේ නොමග ගමන — උල්කාපාතය — දිගුන් දැවීම — භූමි චලනය — අහස් ගිගුරුම — සඳ, හිරු, තාරකාවන්ගේ නැගීම, බැසීම, කිලිටිවීම හා පිරිසිදුවීම මෙබඳු විපාක ඇති වන්නේ යයි කියා මෙසේ තිරශ්චීනවිජ්ජා හෙතුවෙන් කරණ මිථ්‍යාජීවිකාවෙන් ජීවිකාව කෙරෙත්. මෙසේ වූ තිරශ්චීනවිද්‍යා හෙතුකොටගෙණ කරණ ලාමක ජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඔහුගේ සීලය පිණිස වේ.

39. එසේම ඇතැම් මහණ බමුණෝ සැදූහැයෙන් දුන් බොජුන් වළඳා: මනා වැසි ඇතිවන්නේය, නපුරු වැසි—යහපත් භික්‍ෂා—දුර්භික්‍ෂා—නිර්‍භය—භය—රෝග—නීරෝගීබව ඇතිවන්නේයයි කීමද, ඇඟිල්ල ඇල්ලීමය, ගිණීමය, පුඩුගණනය, කාව්‍ය කිරීමය, විතණ්ඩ ශාස්ත්‍ර ඉගෙණීම යයි මෙසේ තිරශ්චීන විද්‍යාවන් කරණකොට මිථ්‍යා ජීවිකාව කෙරෙත්. මෙසේවූ තිරශ්චීන විද්‍යා හෙතුවෙන් වන මිථ්‍යා ජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඔහුගේ සීලය පිණිස වේ.

40. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති — සෙය්‍යථීදං[2]: ආවාහනං[3] විවාහනං[3] සංවදනං[4] විවදනං සංකිරණං විකිරණං සුභගකරණං[5] දුබ්භගකරණං[6] විරුද්ධගබ්භකරණං ජිව්හානිත්ථද්ධනං[7] හනුසංහනනං හත්ථාභිජප්පනං[8] කණ්ණජප්පනං ආදාසපඤ්හං කුමාරිපඤ්හං[9] දෙවපඤ්හං ආදිච්චුපට්ඨානං මහතුපට්ඨානං අබ්භුජ්ජලනං සිරිව්හායනං[10] —ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

41. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති — සෙය්‍යථීදං:[2] සන්තිකම්මං පණිධිකම්මං භූතකම්මං[11] භූරිකම්මං වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකිරණං[12] ආචමනං නහාපනං[13] ජුහනං[14] වමනං විරෙචනං උද්ධවිරෙචනං[15] අධොවිරෙචනං සීසවිරෙචනං කණ්ණතෙලං නෙත්තතප්පණං[16] නත්ථුකම්මං අඤ්ජනං පච්චඤ්ජනං[17] සාලාකියං සල්ලකත්තියං[18] දාරකතිකිච්ඡා[19] මූලභෙසජ්ජානං අනුප්පාදනං[20] ඔසධීනං පටිමොක්ඛො[21] — ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ජීවිතං B. V.
2. සෙය්‍යථිද° B.V.
3. °හණං C.
4. °රණං B.V.; °රනං S.
5. සුභාගක° B.
6. දුබ්භාග°B.
7. °නිබන්ධනං B. V. S.
8. හත්ථා° හනුජප්පනං කණ්ණ° B. V.
9. කුමාරික° V. C.
10. සිරව්හායනං P. W.
11. භූරි°(භූතිකම්මං) P.
12. වත්ථුබලිකම්මං V., වත්ථුපරිකම්මං B. °පවිකිරණං P.
13. න්හාපනං B. V.
14. ජූහනං Sa. ජුහණං C.
15. උද්ධංවි° B. V.
16. නෙත්තපානං B; නෙත්තප්පානං S.; නෙත්තතප්පනං Sa. C.
17. පච්ච° V.
18. °තිකං P. V. W.
19. °තිකිච්ඡං S.
20. අනුප්පදානං B. S.
21. පති°B.V.

40. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා, ආවාහ කරවීමය, විවාහ කරවීමය, සමගිය පිළිබඳ කථා කිරීමය, වියොගය පිළිබඳ කථා කිරීමය, ධන රැස්කිරීමය, වියදම් කිරීමය, සුභග කරණය (යහපත් ශ්‍රී කිරීමය), දුර්භගකරණය, ගර්භවිශරාධී කරණය, දිව තද කිරීමය, හනු බැඳීමය, අත් පෙරළීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, ශබ්ද නොඇසීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, කැඩපතෙහි දෙවතාරොපණය කොට පැණ පිළිවිසීමය, කුමරියගේ සිරුරෙහි දෙවතාරොපණය කොට පැණ පිළිවිසීමය, දෙවදාසියගේ සිරුරෙහි යකුන් ආරොපණය කොට පැණ පිළිවිසීමය, හිරු වැඳීමය, මහබඹුට උවටැන් හෝ නැමදුම් කිරීමය, මුවින් ගිනි දුල් පිට කිරීමය, ශ්‍රී දෙවිය කැඳවීම යයි කියන මෙබඳු තිරශ්චීන විද්‍යාවෙන් මිථ්‍යාජීවිකාව කෙරෙත්. මෙබඳුවූ තිරච්ඡාන විජ්ජාවෙන් කරණ මිථ්‍යාජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඔහුගේ සීලය පිණිස වේ.

41. එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා, ශාන්ති ප්‍රතිඥාත කර්මය,[1] කාය්‍යී සමෘද්ධියෙන් පසු කළයුතු ප්‍රණිධිකර්මය, මන්ත්‍ර ප්‍රයොග කිරීමය, භූරිකර්මය, පණ්ඩකයා පුරුෂයකු කිරීමය, පුරුෂයා පණ්ඩකයකු කිරීමය, ගෙවල් නොකළ බිම ගෙවල් කිරීමය, ගෙට සුදුසු තැන බලිකර්ම විධානය, දියෙන් මුව සුද්ධ කිරීමය, නැහැවීමය, ගිනි පිදීමය, වමන කරවීමය, විරෙක කරවීමය, ඌර්ධ්ව විරෙකය, අධොවිරෙකය, සිරොවිරෙකය, කන් තෙලය, නෙත්‍රතර්පණය, නස්‍ය කිරීමය, ක්ෂාරවූ අඳුන් තැනීමය, සිසිල් බෙහෙත් අඳුන් සෑදීමය, සැත් කටු ලා කටයුතු වෛද්‍යකර්මය, ශල්‍යකර්මය, ළදරුවන් පිළිබඳ වෛද්‍යකර්මය, මූලික බෙහෙත් දීමය (බෙහෙත් ද්‍රව්‍යයෙන් කටයුතු ශරීර චිකිත්සාය), සැර බෙහෙත් දී පසුව එහි බල හැරීමය යන මෙබඳු තිරශ්චීන විද්‍යා කරණකොට හෝ මිථ්‍යාජීවයෙන් ජීවිකාව කෙරෙත්. මෙබඳුවූ මිථ්‍යාජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඔහුගේ සීලය පිණිස වේ.

---

1. මේ ආදියෙහි විස්තර දීඝනිකායෙ පළමුවන කාණ්ඩයේ බ්‍රහ්මජාල සූත්‍රයෙන් බලා දත යුතුයි.

42. අයං[1] ඛො සො ලොහිච්ච භික්ඛු එවංසීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සෙය්‍යථාපි ලොහිච්ච ඛත්තියො මුද්ධාභිසිත්තො[2] නිහතපච්චාමිත්තො න කුතොචි භයං සමනුපස්සති යදිදං පච්චත්ථිකතො එවමෙව ඛො ලොහිච්ච භික්ඛු එවංසීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති. එවං ඛො ලොහිච්ච භික්ඛු සීලසම්පන්නො හොති.

43. කථඤ්ච[3] ලොහිච්ච භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති? ඉධ ලොහිච්ච භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී[4]. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං[5] තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා—පෙ—ඝානෙන ගන්ධං ඝායිත්වා—පෙ—ජිව්හාය රසං සායිත්වා—පෙ—කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා—පෙ—මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී[4]. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං[5] තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති මනින්ද්‍රියං මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං[6] පටිසංවෙදෙති. එවං ඛො ලොහිච්ච භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති.

---

1. ස ඛො P. S. W.
2. මුද්ධාව° P. C.
3. කථංච පන S.
4. නානුව්‍ය° P. W.
5. අන්වාස්සං° P. W.
6. අවිං° P. W.

42. ලෝහිච්චය, මෙසේ සීලසම්පන්නවූ මහණහට (අසංවරය මුල්කොට උපදනාවූ) භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ඔහුගේ සීලසංවරය හෙතුකොටගෙණ කිසිතැනකදී නොඋපදනේය. කුමක් මෙන්ද යත්:— ලෝහිච්චය, ක්‍ෂත්‍රියාභිෂේකයෙන් මුදුනෙහි අභිෂේක ලද්දාවූ, නැසූ පසමිතුරන් ඇති, ක්‍ෂත්‍රිය රජෙක් කිසියම් සතුරෙකුගෙන් කිසි භයක් නොදක්නේද, එපරිද්දෙන්ම ලෝහිච්චය, සීලසම්පන්නවූ මහණතෙමේ (අසංවර හෙතුවෙන් උපදනාවූ) භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු සීලසංවරය හෙතුකොට කිසි තැනකදී නොදක්නේය (ඔහුට කිසිවකින් බියක් නැත). ආර්‍ය්‍යවූ (ශ්‍රෙෂ්ඨවූ) මේ සීල රාශියෙන් යුක්තවූ ඒ මහණ තෙමේ, ස්වසන්තානයෙහි පිරිසිදුවූ (කායික චෛතසික) සැපය විඳියි. ලෝහිච්චය, මෙසේ දක්වූ (ත්‍රිවිධ) ශීලයෙන් යුක්තවූ මහණ තෙමේ සීලසම්පන්න නම් වේ.

43. ලෝහිච්චය, භික්‍ෂුතෙම කෙසේ නම් ඉන්ද්‍රියයන් කෙරෙහි වැසූ දොර ඇතිවේ දැ? කෙවට්ටය, මේ සස්නෙහි (මනාසේ පිළිපන්) මහණ තෙමේ, ඇසින් රූපයක් දැක නිමිත්තග්‍රාහී නොවේ (එහි නොඇලේ). අනුව්‍යඤ්ජන වශයෙන් නොගන්නේ එහි විස්තර සෙවීමට නොපෙළඹේ. චක්‍ෂුරින්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට යමක් හෙතුකොටගෙණ අභිජ්ඣාදෞමනස්සාදි (දැඩි ආසාව හා කලකිරීමාදි) ලාමකවූ අකුශල ධර්‍මයෝ වහනය වන්නාහු ද (ස්වසන්තානයට ඇතුල් වන්නාහු ද), එබඳු දෙයින් වැළැකීම පිණිස හෙතෙම පිළිපදී. හෙතෙම තමාගේ චක්‍ෂුරින්ද්‍රිය රකී, චක්‍ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කනින් ශබ්දයක් අසා— [ඇස පිළිබඳ කී නයින් දත යුතුයි]—නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණයකොට —පෙ— දිවෙන් රසයක් විඳ —පෙ— කයින් ස්පර්ශකටයුත්තක් ස්පර්ශකොට —පෙ— සිතින් ධර්‍මයක් (කරුණක්) දැන එහි නිමිති නොගන්නේය (එහි නොඇලෙන්නේය), අනුව්‍යඤ්ජන වශයෙන් නොගන්නේය (එහි නොපෙළඹෙන්නේය). මනින්ද්‍රියයෙහි (සිතෙහි) අසංවරව වසන්නහුට යමක් නිසා අභිජ්ඣා දෞමනස්සාදි ලාමක අකුශල ධර්‍මයෝ වහනය වෙත් ද (ස්වකීය සන්තානයට වදිත් ද), එබඳු දෙයින් වැළැකීම පිණිස හෙතෙම පිළිපදී. හෙතෙම මනින්ද්‍රිය රකී, මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. එබඳුවූ මහණ තෙමේ ආර්‍ය්‍ය වූ (උතුම් වූ) ශීල රාශියෙන් යුක්ත වූයේ, අභ්‍යන්තරයෙහි පිරිසිදුවූ (අසම්මිශ්‍රවූ) අබ්‍යාසේක සුඛය විඳියි. ලෝහිච්චය, මෙසේ වූ මහණ තෙමේ ඉන්ද්‍රියයන්හි වසන ලද දොරටු ඇත්තේ වේ.

44. කථඤ්ච ලෝහිච්ච භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති?

ඉධ ලෝහිච්ච භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති සම්මිඤ්ජිතෙ[1] පසාරිතෙ සම්පජානකාරී හොති සඞ්ඝාටි-පත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති අසිතෙ පීතෙ[2] ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති. එවං ඛො ලෝහිච්ච භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති.

45. කථඤ්ච ලෝහිච්ච භික්ඛු සන්තුට්ඨො හොති?

ඉධ ලෝහිච්ච භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන[3] චීවරෙන කුච්ඡිපරිහාරිකෙන[3] පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. සෙය්‍යථාපි ලෝහිච්ච පක්ඛී සකුණො යෙන යෙනෙව ඩෙති සපත්තභාරොව ඩෙති එවමෙව ඛො[4] ලෝහිච්ච භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරි-කෙන[3] චීවරෙන කුච්ඡිපරිහාරිකෙන[3] පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. එවං ඛො ලෝහිච්ච භික්ඛු සන්තුට්ඨො හොති.

---

1. සමිඤ්ජිතෙ B. V.
2. පීතෙ B.
3. °පරිහාරියෙන V.
4. ඛො ඉති න දිස්සති P.

44. ලොහිච්චය, මහණ තෙමේ කෙසේ නම් සතිසම්ප- ජඤ්ඤයෙන් (සිහියෙන් හා මනා ප්‍රඥාවෙන්) යුක්ත වූයේ වේද?

ලොහිච්චය, මේ සස්නෙහි (මනාව පිළිපන්) මහණ තෙම ඉදිරියට යෑමෙහි ද, ආපසු යෑමෙහි ද, යහපත් වූ නුවණින් දැන ඒ ක්‍රියා කරන්නේය. ඉදිරි බැලීමෙහි ද, අනුදික් (වටපිට) බැලීමෙහි ද, නුවණින් දැන බලන්නේය. අත් පා හැකිලීමෙහි ද දිගු කිරීමෙහි ද මනා නුවණින් දැන එසේ කරන්නේය. සඟලය, පාත්‍රය, සිවුරුය යන මේ දේ දැරීමෙහිදී මනා නුවණින් දැන ඒ ඒ දැරීම් ආදිය කරන්නේය. අනුභව කිරීමය, පානය කිරීමය, කෑමය, රස විඳීමය යන මෙහි ද මනා නුවණින් යෙදී (දැන) ඒ ඒ අනුභව කිරීමාදිය කරන්නේය. මල මූත්‍ර පහකිරීම් ද නුවණින් (ආදීනව) සලකා කරන්නේය. යෑම්, සිටීම්, හිඳීම්, සැතපීම්, නිදි තොරකිරීම්, කථාකිරීම්, නිශ්ශබ්ද ව සිටීම් යන මේ දේ මනා නුවණින් දැන කරන්නේය. ලොහිච්චය, මෙසේ කරන්නාවූ මහණ තෙමේ සිහියෙන් යුක්තවූයේ යහපත් නුවණින් යුක්ත වූයේ වෙයි. (මෙහි සියලු ඉරියව් පිළිබඳව ආදීනව හා ආනිසංසයන් ද, ශරීරය පිළිබඳ අනිත්‍යතාදි ස්වභාවයන්ද නුවණින් සලකා ඒ ඒ කෘත්‍යයන්හි යෙදේ යි සේයි.)

45. ලොහිච්චය, මහණතෙමේ කෙසේ නම් (ප්‍රත්‍යයන් පිළිබඳ යථාලාභසන්තොෂයෙන්) සතුටු වූයේ වේද?

ලොහිච්චය, මේ සස්නෙහි (මනාව පිළිපන්) මහණතෙමේ කායපරිහරණයට ප්‍රමාණවූ (යන්තම් කය වැසීමට තරම්වූ) සිවුරෙන් ද කුසපරිහරණයට ප්‍රමාණවූ පිණ්ඩපාත භොජන- යෙන් ද සතුටු වූ සිත් ඇත්තේ වේ. ඒ මහණතෙමේ යම් යම් තැනකට යේ නම් අටපිරිකර (කය පිළිබඳ වූ දේ) පමණක් රැගෙණ යේ. ලොහිච්චය, යම් සේ පියාපත් ඇති පක්ෂියෙක් යම් යම් තැනෙක පියාඹා යේ නම් ඒ සියලු තැන පියාපත් බර පමණකින් යුක්තව පියාඹා යේද, ලොහිච්චය, එපරිද්දෙන්ම භික්‍ෂු තෙමේ ද කාය පරිහරණයට ප්‍රමාණවූ සිවුරෙන් ද කුච්ඡි- පරිහරණයට ප්‍රමාණවූ පිණ්ඩපාත භොජනයෙන් ද සතුටු වන්නේ වේ. ඒ මහණ තෙමේ යම් යම් තැනක යේ නම් කාය- පටිබද්ධවූ අටපිරිකර පමණක් රැගෙණ බැහැර යේ. ලොහිච්චය, මෙසේ වූ මහණ තෙමේ (යම්තම් ලත් දෙයින්) ඉතරීතර- සන්තොෂයෙන් යුක්තවේ.

46. සො ඉමිනා ච[1] අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං[2] වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

47. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. බ්‍යාපාදපදොසං[3] පහාය අබ්‍යාපන්නචිත්තො[4] විහරති සබ්බපාණභූතහිතානුකම්පී බ්‍යාපාදපදොසා[3] චිත්තං පරිසොධෙති. ථීනමිද්ධං[5] පහාය විගතථීනමිද්ධො[5] විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො ථීනමිද්ධා[5] චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

48. සෙය්‍යථාපි ලොහිච්ච පුරිසො ඉණං[6] ආදාය කම්මන්තෙ පයොජෙය්‍ය තස්ස තෙ කම්මන්තා සමිජ්ඣෙය්‍යුං. සො යානි ච පොරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තීකරෙය්‍ය[7]. සියා චස්ස[8] උත්තරිං අවසිට්ඨං දාරභරණාය[9]. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ ඉණං[6] ආදාය කම්මන්තෙ පයොජෙසිං[10]. තස්ස මෙ තෙ කම්මන්තා සමිජ්ඣිංසු. සොහං යානි ච පොරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තිඅකාසිං.[11] අත්ථි ච මෙ උත්තරිං අවසිට්ඨං දාරභරණායාති[9]. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං[12] අධිගච්ඡෙය්‍ය[13] සොමනස්සං.

---

1. චකාරො නත්ථි W.
2. සුසාණං C.
3. ව්‍යා° P. W.
4. අව්‍යා° P. W.
5. ථින° B.
6. ඉනං C.
7. ව්‍යන්ති° P.C. °ව්‍යන්ති° W. බ්‍යන්තිං° B
8. තස්ස Sa.
9. දාර° P. W.
10. පයොජෙමි B.
11. ව්‍යන්තිං අ° B. ව්‍යන්ති° P. W.
12. පාමුජ්ජං P. W. C.
13. අධිගච්ඡෙ C. P.

46. ආයුෂ්මවූ හෙවත් උතුම්වූ මේ සීලසමූහයෙන් යුක්තවූ ද, උතුම්වූ මේ ඉන්ද්‍රියසංවරයෙන් යුක්තවූ ද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවූ ද, මේ උතුම් ඉතරීතර-සන්තොෂයෙන් යුක්තවූ ද, ඒ (යොගාවචර) මහණ තෙමේ (මනුෂ්‍ය වාසයෙන් දුනු පන්සියයකින් ඔබ්බෙහි වූ) අරණ්‍යය ද, (ජනයාගෙන් තොරවූ) වෘක්ෂමූලය ද, පර්වත පෙදෙස් ද, කඳුරැලි ගිරිගුහාවන් හෝ මහා උමගද, සොහොන් ද, ඉතා දුරවූ වනසෙනසුන් ද, අභ්‍යාවකාශ (බොහෝ ඉඩකඩ ඇති) තැන් සහ පිදුරු ගුහා ද යන මේ (ජනයාගෙන් හිස්වූ) සෙනසුන් ඇසුරු කෙරෙයි. ඒ මහණ තෙමේ පසුබත්කාලයෙහි පිණ්ඩපාත භොජනයෙන් වැළැක්කේ, පර්‍ය්‍යඞ්කය බැඳ, උඩුකය ඇද නොවන සේ තබා, නිවණෙහිම සිත එලවා, ඒ නිවණම අරමුණු වසයෙන් සිත ඉදිරියෙහි පිහිටුවා ගෙණ හිඳී.

47. ඒ මහණ තෙමේ ලොකයෙහි (පඤ්චුපාදනස්කන්ධ-යන්හි) අභිධ්‍යාව (ලොභය) පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේ. ඒ අභිධ්‍යාවෙන් සිත (වෙන්කොට) පිරිසුදු කෙරේ. සිත කෙලසන්නාවූ ක්‍රොධය පහකොට, ක්‍රොධයෙන් දූෂිතවූ සිත් නැත්තේ, ප්‍රාණිවූ සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේව වෙසේ. ව්‍යාපාද දූෂණයෙන් සිත (වෙන් කොට) පිරිසුදු කෙරේ. කායචිත්ත දෙදෙනාගේ අලසබව යයි කියන ලද ථීනමිද්ධය දුරුකොට කය—සිත පිළිබඳ පහ වූ අලසබැව් ඇත්තේ, ආලොකසංඥා (පිරිසුදු හැඟීම්) ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥා ඇත්තෙක්ව වෙසේ. ථීනමිද්ධනීවරණයෙන් සිත පිරිසුදු කෙරේ. උඩඟු-බව හා කුකුස (උද්ධච්චකුක්කුච්චය) දුරුකොට, සංසිඳුනු සිත් ඇතිව (අනුද්ධතව) වාසය කෙරේ. අධ්‍යාත්මයෙහි (ඇතුළත) සංසිඳුනු සිත් ඇත්තේ, උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසුදු කෙරේ. (බුද්ධාදි අටතැන්හි සැකකිරීම ලකුණුකොට ඇති) විචිකිච්ඡාව දුරුකොට, එතර කළ (පහකළ) විචිකිච්ඡා ඇත්තේ කුශලධර්ම විෂයෙහි 'ඒ කෙසේ ද මේ කෙබඳුද?'යි යන සැක නැතිව වෙසේ, විචිකිච්ඡායෙන් සිත පිරිසුදු කෙරේ.

48. ලොහිච්චය, යම්සේ පුරුෂයෙක් ණය ගෙණ කර්මාන්ත-යන්හි යොදන්නේ ද, ඔහුගේ ඒ කර්මාන්තයෝ දියුණු වන්නාහු නම් ඔහුගේ ඒ පරණ ණය මුදල් සියල්ලම ගෙවන්නේය. ඔහුගේ අඹුදරුවන් පොස්නා පිණිස වැඩි යමක් ඉතුරු වුයේ නම් ඔහට මෙබඳු අදහසක් වන්නේය. [කෙසේද යත්:] 'මම වනාහි පළමුවෙන් ණය ගෙණ කර්මාන්තයන්හි යෙදුවෙමි. ඒ මාගේ කර්මාන්තයෝ සමෘද්ධවූහ. ඒ මම පැරණි ණය ගෙවූයෙමි. අඹුදරුවන් පොෂ්‍යකිරීම පිණිස අතිරේක මුදලක් ද මට ඇත්තේය' කියායි. හෙතෙම ඒ ණය නැති බව මුල්කොට ගෙණ බලවත් සතුටක් ලබන්නේය, සොම්නසට ද පැමිණෙන්නේය.

49. සෙය්‍යථාපි ලොහිච්ච පුරිසො ආබාධිකො අස්ස දුක්ඛිතො බාළ්හගිලානො භත්තං චස්ස නච්ඡාදෙය්‍ය[1] න චස්ස කායෙ බලමත්තා. සො අපරෙන සමයෙන තම්හා ආබාධා මුච්චෙය්‍ය භත්තඤ්චස්ස ඡාදෙය්‍ය සියා චස්ස කායෙ බලමත්තා. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ ආබාධිකො අහොසිං දුක්ඛිතො බාළ්හගිලානො භත්තං ච මෙ නච්ඡාදෙසි න චස්ස[2] මෙ ආසි කායෙ බලමත්තා. සොම්හි එතරහි තම්හා ආබාධා මුත්තො භත්තඤ්ච මෙ ඡාදෙති අත්ථි ච මෙ[3] කායෙ බලමත්තාති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය[4] සොමනස්සං.

50. සෙය්‍යථාපි ලොහිච්ච පුරිසො බන්ධනාගාරෙ බද්ධො අස්ස. සො අපරෙන සමයෙන තම්හා බන්ධනාගාරා[5] මුච්චෙය්‍ය සොත්ථිනා අබ්බයෙන[6]. න චස්ස කිඤ්චි භොගානං වයො. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ බන්ධනාගාරෙ බද්ධො අහොසිං. සොම්හි එතරහි තම්හා බන්ධනාගාරා[5] මුත්තො සොත්ථිනා අබ්බයෙන[6]. නත්ථි ච මෙ කිඤ්චි භොගානං වයොති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය[4] සොමනස්සං.

51. සෙය්‍යථාපි ලොහිච්ච පුරිසො දාසො අස්ස අනත්තාධීනො[7] පරාධීනො[7] න යෙනකාමඞ්ගමො. සො අපරෙන සමයෙන තම්හා දාසබ්‍යා[8] මුච්චෙය්‍ය අත්තාධීනො[7] අපරාධීනො[7] භුජිස්සො යෙනකාමඞ්ගමො. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ දාසො අහොසිං අනත්තාධීනො[7] පරාධීනො[7] න යෙනකාමඞ්ගමො. සොම්හි එතරහි තම්හා දාසබ්‍යා[8] මුත්තො අත්තාධීනො[7] අපරාධීනො[7] භුජිස්සො යෙනකාමඞ්ගමොති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය[4] සොමනස්සං.

---

1. න ඡාදෙය්‍ය S.
2. න ච මෙ P. W.
3. අත්ථි ච කායෙ P.
4. පාමුජ්ජං අධිගච්ඡ P. W. C.
5. බන්ධාගාරා B. බන්ධනා P. S. W.
6. අව්‍යයෙන P. W.
7. °ධිනො B.
8. දාසව්‍යා P. W. C.

49. ලොහිච්චය, යම්සේ වනාහි මහත් රෝගයෙන් පෙළෙන (ආබාධ ඇත්තාවූ), දුක් ඇත්තාවූ, දුඩි ගිලන්බව ඇති පුරුෂයෙක් වන්නේ ද, ඔහට බත් (ආහාර) රුචි නොවන්නේ ද, ඔහුගේ ශරීරයෙහි කිසි ශක්තියක් නැත්තේ ද වෙයි. ඒ පුරුෂ තෙම පසු කාලයක ඒ ආබාධයෙන් මිදෙන්නේ නම්, ඔහුට ආහාර රුචිය ඇති වන්නේ නම්, ඔහුගේ ශරීරබලය ඇති වන්නේ නම්, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. (කෙබඳු ද යත්:) 'මම වනාහි පෙර ආබාධ ඇත්තාවූ, දුක් ඇති, දුඩි ගිලන් බැව් ඇති කෙනෙක් වීමි. මට බත් රුචිය ද නොවීය. ශරීර-බලය ද නැතිවිය. ඒ මම පලමු තිබූ ආබාධයෙන් මිදුනෙමි. මට ආහාරරුචිය ද ඇත්තේය. කාය බලය ද තිබේය' කියායි. හෙතෙම ඒ කාරණය මුල්කොට බලවත් සතුටක් ලබන්නේය. සොම්නසට ද පැමිණෙන්නේය.

50. ලොහිච්චය, යම්සේ පුරුෂයෙක් සිරගෙහි බැඳුනේ වේද, හෙතෙම පසු කලෙක වියදම් නැතිව (පීඩා රහිතව) සැපසේ ඒ සිරගෙයින් මිදෙන්නේය. ඔහුගේ භොගයන් පිළිබඳ කිසිත් වියදමක් ද නොවන්නේය. ඔහුට මෙබඳු අදහසක් වන්නේය (එනම්:) 'මම වූකලී පෙර සිරගෙහි බැඳුනෙක් වූයෙමි, ඒ මම දූන් වියදම් නැතිව (පීඩා රහිතව) සැපසේ ඒ සිරගෙයින් මිදුනෙමි. මගේ භොගයන් පිළිබඳ කිසි වියදමක් ද නො වූයේය' කියායි. ඒ පුරුෂ තෙම සිරගෙයින් මිදීම නිමිති කොට බලවත් සතුටක් ලබන්නේය, සොම්නසට ද පැමිණෙන්නේය.

51. ලොහිච්චය, යම්සේ සිය කැමැත්තෙන් යමක් කරන්ට නොහැකි (අධිපති භාවයක් නැත්තාවූ), අනුන්ගේ කැමැති පරිදි පවත්නාවූ (අනුන්ට යටහත්වූ), තමා කැමැති ගමනක් ඒ වූ පරිදි යා නොහැකි වැඩකරුවෙක් වන්නේ ද, හෙතෙම පසු කලෙක ඒ දාසභාවයෙන් මිදෙන්නේ, තමාම අධිපතිකොට ඇත්තේ, පරාධීන නො වූයේ, අනුන්ට යටත් නොව තමා-ගෙන්ම යැපෙන්නේ, සිය අදහස් පරිදි ඒ ඒ තැන යා හැකි වන්නේ ද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. (එනම්:) 'මම වනාහි පෙර සියකැමැති පරිදි යමක් කරන්ට නොහැකි, අනුන්ට යටත් පැවතුම් ඇති, මා අදහස් පරිදි කිසි තැනෙක යා නොහැකි දාසයෙක් වීමි. ඒ මම දූන් ඒ දාසභාවයෙන් මිදුනෙක්මි. ආත්මාධීන වූයෙමි, පරාධීන නොවූයෙමි, මෙරමා-හට යටත් නොව මා සපයාගත් දෙයින්ම යැපෙන්නෙමි, මා අදහස් පරිදි ඒ ඒ කැමැති තැනෙක යා හැක්කෙක් ද වෙමි'යි කියායි. හෙතෙම ඒ දාසභාවයෙන් මිදීම හෙතුකොට බලවත් සතුටක් ලබන්නේය, එසේ සොම්නසට ද පැමිණෙන්නේය.

52. සෙය්‍යථාපි ලොහිච්ච පුරිසො සධනො සභොගො කන්තාරද්ධානමග්ගං[1] පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං. සො අපරෙන සමයෙන තං කන්තාරං නිත්ථරෙය්‍ය සොත්ථිනා ගාමන්තං අනුපාපුණෙය්‍ය ඛෙමං අප්පටිභයං. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ සධනො සභොගො කන්තාරද්ධානමග්ගං[1] පටිපජ්ජිං දුබ්භික්ඛං සප්පටිභයං. සොම්හි එතරහි තං කන්තාරං තිණ්ණො[2] සොත්ථිනා ගාමන්තං අනුප්පත්තො ඛෙමං අප්පටිභයන්ති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං[3] අධිගච්ඡෙය්‍ය[4] සොමනස්සං.

53. එවමෙව ඛො ලොහිච්ච භික්ඛු යථා ඉණං යථා රොගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං එවං[5] ඉමෙ පඤ්චනීවරණෙ අප්පහීනෙ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි ලොහිච්ච යථා[6] ආනණ්‍යං යථා ආරොග්‍යං යථා බන්ධනාමොක්ඛං යථා භුජිස්සං යථා ඛෙමන්තභූමිං එවමෙව ඛො ලොහිච්ච භික්ඛු ඉමෙ පඤ්ච නීවරණෙ පහීනෙ අත්තනි සමනුපස්සති.

54. තස්සිමෙ පඤ්ච නීවරණෙ පහීනෙ අත්තනි සමනුපස්සතො පාමොජ්ජං[3] ජායති පමුදිතස්ස පීති ජායති පීතිමනස්ස කායො පස්සම්භති පස්සද්ධකායො සුඛං වෙදෙති[7] සුඛිනො චිත්තං සමාධියති.

---

1. කන්තාරං අද්ධාන° B. S. Pa.
2. නිත්ථිණ්ණො P.W. නිත්ථින්නො Pa.
3. පාමුජ්ජං P. W. C.
4. අධිගච්ඡෙ P. C.
5. එවං ති න දිස්සති P. W. S.
6. යථා ති නත්ථි B. (සබ්බත්ථ)
7. පටිසංවෙදෙති S.

52. ලෝහිච්චය, යම්සේ ධනවත්වූ, භොගසම්පත් ඇති පුරුෂයෙක් ආහාර දුර්ලභවූ, භය සහිතවූ, නිරුදකවූ දීර්ඝමාර්ගයකට (දුරුකතර මගකට) පැමිණෙන්නේ ද, හෙතෙම මඳ කලකින් ඒ කාන්තාරමාර්ගය ඉක්මවා යන්නේ, සැපවත්වූ, (සොර සතුරන්ගෙන්) ප්‍රතිභය රහිත වූ ගම්මානයකට ක්‍රමයෙන් පැමිණෙන්නේ ද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: 'මම වනාහි පෙර ධනවත් වූයෙම්, භොගසම්පත් සහිත වූයෙම්, දුර්ලභ භික්ෂා ඇති, භය සහිතවූ, දීර්ඝවූ කාන්තාරමාර්ගයකට පිළිපන්නෙක් වූයෙමි. එසේ වූ මම දූන් එම කාන්තාරමාර්ගය තරණය කෙළෙමි. සැපවත්වූ, ප්‍රතිභය රහිතවූ ගමකට සැපසේ ක්‍රමයෙන් පැමිණියෙමි'යි කියාහි. ඒ පුරුෂ තෙමේ ඒ කතරමඟ එතර කිරීම නිමිතිකොට බලවත් සතුටක් ලබන්නේය, එසේම සොම්නසට ද පැමිණෙන්නේය.

53. ලෝහිච්චය, ණය යම්සේ ද, රෝගය යම්සේ ද, බන්ධනාගාරය යම්සේ ද, දසභාවය යම්සේ ද, දුරුකතරමග යම්සේ ද, එපරිද්දෙන් මහණ තෙමේ ප්‍රහීණ නොවූ (පහ නොකළ) පඤ්චනීවරණයන් තමා කෙරෙහිලා නුවණින් දකී. ලෝහිච්චය, ණය නැති බව යම්සේ ද, නිරෝගී බව යම්සේ ද, සිරෙගෙන් මිදීම යම්සේ ද, මෙරමාහට යටත් නැති බව යම්සේ ද, අභය භූමිය යම්සේද, එපරිද්දෙන්ම ලෝහිච්චය, මහණ තෙමේ ප්‍රහීණවූ මේ පඤ්චනීවරණ ධර්මයන් තමා විෂයෙහි ලා දක්නේය.

54. ප්‍රහීණවූ මේ පඤ්චනීවරණයන් තමා කෙරෙහි නැතැයි නුවණින් දක්නාවූ ඒ මහණහට සතුටු ආකාරය උපදී. සතුටු වූවහුට (සියල් සිරුර කළඹමින්) ප්‍රීතිය උපදී, ප්‍රීති සහගත සිත් ඇත්තහුගේ නාමකය (සන්තානය) සංසිඳෙයි, සංසිඳුනු කය ඇති (කය පිළිබඳ මැඩ ලූ දුහ ඇති) තැනැත්තේ කායික චෛතසික සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධියට (එකඟ බවට) එළඹෙයි.

55. සො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං[1] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො[2] කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං[3] හොති.

56. සෙය්‍යථාපි ලොහිච්ච දක්ඛො න්හාපකො[4] වා න්හාපකන්තෙවාසී[4] වා කංසථාලෙ න්හානීයචුණ්ණානි[5] ආකිරිත්වා උදකෙන පරිප්ඵොසකං පරිප්ඵොසකං[6] සන්දෙය්‍ය[7] සායං[8] න්හානීයපිණ්ඩි[4] ස්නෙහානුගතා ස්නෙහපරෙතා සන්තරබාහිරාඵුටා[9] ස්නෙහෙන[10] න ච පග්ඝරණී.[11] එවමෙව ඛො ලොහිච්ච භික්ඛු ඉමමෙව කායං විවෙකජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො[2] කායස්ස විවෙකජෙන පීතිසුඛෙන අප්ඵුටං[3] හොති.

57. යස්මිං ඛො ලොහිච්ච සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති අයම්පි ඛො ලොහිච්ච සත්ථා යො ලොකෙ න චොදනාරහො. යො ච පනෙවරූපං සත්ථාරං චොදෙති සා චොදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

---

1. පඨමං ඣානං Pa.
2. සබ්බවතො V.
3. අප්ඵුටං, V.C. අප්ඵුතං, P. අඵුටං B. V.
4. ස්නා° W. නහා° P.
5. ස්නානීය° W. න්හානිය° B. නහානීය P.
6. සකිංදෙව වුත්තං S.
7. සන්නෙය්‍ය P. W. C.
8. සාජ්ස P.
9. °ඵුටා B. V. °ඵුතා P.
10. සිනෙ° P. W.
11. පග්ඝරණී B.

55. ඒ මහණතෙමේ වස්තුකාම ක්ලේශකාමයන්ගෙන් වෙන් වූයේම, අකුශල ධර්මයන් කෙරෙන් ද වෙන් වූයේ ම, (අරමුණෙහි සිත පැමිණවීම නම්) විතර්ක සහිතවූ, (අරමුණ පිරිමැදීම්, එහි හැසිරීම් සංඛ්‍යාත) විචාර සහිතවූ, සිතෙහි විවෙකයෙන් (නීවරණයන් දුරුවීම් හේතුවෙන්) උපන් ප්‍රීතියම සැපකොට ඇති, ප්‍රථමජ්ඣාන කුසල චිත්තය තමාගේ සන්තාන-යෙහි ඉපදවීම් වසයෙන් ඊට පැමිණ එම ධ්‍යානයෙහි වාසය කෙරේ. ඒ මහණ තෙමේ විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ (සකල) ශරීරයම තෙමයි (සැපවත් කෙරෙයි යේයි), හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි (සැම තන්හි පතුරවයි). ඒ මහණහුගේ සම්පූර්ණ ශරීරයෙහි සවල්පවූ ස්ථානයක් වුව ද ප්‍රථමධ්‍යාන සැප-යෙන් (විවේකයෙන් උපන් ප්‍රීති සැපයෙන්) නොපහස්නා ලද්දේ නොවේ(සකල ශරීරයෙහිම ප්‍රථමජ්ඣාන සැපය පැතිරේයයි යේයි).

56. ලෝහිච්චය, යම්සේ වනාහි දක්‍ෂවූ ස්නාන ද්‍රව්‍ය සපයන්නෙක් හෝ ඔහුගේ අතවැස්සෙක් හෝ ස්නානයට ගන්නාවූ සුණු ලෝහමය තලියෙක බහා දිය ඉසිමින් අතින් අනමින් (පිරිමදිමින්) පිඩුකරන්නේ ද, එවිට මේ ස්නාන චූර්ණපිණ්ඩය දියෙන් යුක්ත වේ, ජලය හාත්පසින් කාවැදුනේ වේ. එහි ඇතුළත හා පිටත ද සියලු තන්හිම ජලයෙන් පහස්නා ලද්දේ වේ. එහෙත් බිඳු වසයෙන් ජලය ඉන් නො වැගිරේ. ලෝහිච්චය, එපරිද්දෙන් ඒ මහණ තෙමේ, විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ ශරීරය තෙමයි (පැතුරුණු සැප ඇත්තක් කරයි), හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි (සැමතන්හි පතුරුවයි). ඒ මහණහුගේ සියලු කොටස් ඇති ශරීරයෙහි සවල්පවූ තැනක් වත් විවෙකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් (ප්‍රථමධ්‍යානයෙන්) නොපහස්නා ලද්දේ නොවේ. ඉමයද ඔහුගේ චිත්තසම්පත පිණිස වේ.

57 ලෝහිච්චය, යම් ශාස්තෘවරයෙකු නිසා ඔහුගේ ශ්‍රාවක තෙම මෙබඳු මහත් විශිෂ්ටත්වයකට පැමිණේද, ලෝහිච්චය, මේ ලෝකයෙහි යමෙක් චෝදනා කිරීමට සුදුසු නොවෙ නම්, මේ දක්වන ලද්දේ ඒ පළමුවෙනි ශාස්තෘ තෙමේයි. යමෙක් මෙබඳු ශාස්තෘවරයාට චෝදනා කෙරේද, ඒ චෝදනා තොමෝ සත්‍ය නොවන්නීය, සැබෑ නොවන්නීය, ධාර්මික නොවන්නීය. වරද සහිත වන්නීය.

58. පුනච පරං ලොහිච්ච භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො[8] කායස්ස සමාධිජෙන පිතිසුඛෙන අප්ඵුටං[9] හොති.

59. සෙය්‍යථාපි ලොහිච්ච උදකරහදො ගම්භිරො[1] උබ්භිදොදකො[2] තස්ස නෙවස්ස පුරත්ථිමාය දිසාය උදකස්ස ආයමුඛං[3] න පච්ඡිමාය දිසාය උදකස්ස ආයමුඛං[3] න උත්තරාය දිසාය උදකස්ස ආයමුඛං[3] න දක්ඛිණාය දිසාය උදකස්ස ආයමුඛං[3] දෙවො[4] ච කාලෙන කාලං සම්මා ධාරං නානුප්පවෙච්ඡෙය්‍ය[5]. අථ ඛො තම්හා ච[6] උදකරහදා සීතා[7] වාරිධාරා උබ්භිජ්ජිත්වා තමෙව උදකරහදං සීතෙන වාරිනා අභිසන්දෙය්‍ය පරිසන්දෙය්‍ය පරිපූරෙය්‍ය පරිප්ඵරෙය්‍ය නාස්ස කිඤ්චි සබ්බාවතො[8] උදකරහදස්ස සීතෙන වාරිනා අප්ඵුටං[9] අස්ස.

60. එවමෙව ඛො ලොහිච්ච භික්ඛු ඉමමෙව කායං සමාධිජෙන පීතිසුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති. නාස්ස කිඤ්චි සබ්බාවතො[8] කායස්ස සමාධිජෙන පීතිසුඛෙන අප්ඵුටං[9] හොති.

61. පුනච පරං ලොහිච්ච භික්ඛු පීතියා ච විරාගා[10] උපෙක්ඛකො[11] ච විහරති සතො[12] සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො[11] සතිමා සුඛවිහාරීති තතියජ්ඣානං[13] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්දෙති පරිසන්දෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො[8] කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං[9] හොති.

---

1. ගම්භීරො ඉති න දිස්සති P.W.
2. උබ්භිතොදකො B. S. V.
3. උදකස්සාය° P. W.
4. දෙවො වා නා° කා°S. දෙවො ච න කාලෙන කා° B. V.
5. අනුපවෙච්ඡෙය්‍ය B. V. P. W. අනුප්පවෙ° S. නානුප° C.
6. තම්භා වා S.
7. සීතවාරි° P. C.
8. සබ්බවතො V.
9. අඵුට්ඨං W; අඵුටං B. අප්ඵුතං P.C.
10. විරාගා ච P.
11. උපෙඛකො P.
12. සතො ච P. S.
13. තතියං ඣානං V. W.

58. ලොහිච්ච ය, නැවතද(අනිකක් කියමි). (යොගී)මහණ තෙමේ විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් අධ්‍යාත්මයෙහි මනා පැහැදීම කරන්නාවූ, සිත පිළිබඳ එකග බව ඇති, විතර්ක විචාර නැති, සමාධියෙන් හටගත් ප්‍රීතිසැපය ඇති ද්‍විතියධ්‍යාන කුසල චිත්තයට පැමිණ වෙසේ. ඒ මහණ තෙමේ මේ කය සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් තෙමයි (සියලු තැන පතළ සැප ඇත්තක් කෙරේ), හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කරයි. ඒ මහණහුගේ සියලු කොටස් ඇති ශරීරයෙහි සවල්පවූ තැනක් වුවද ද්‍විතියධ්‍යාන සැපයෙන් නො පහස්නා ලද්දේ නොවේ.

59. ලොහිච්චය, යම්සේ ඇතුළතම හටගත් (පොළොව බිඳ නික්මෙන) ජලය ඇති දියවිලක් වේ ද, ඒ විල පිළිබඳ පෙර දිගින් ද, අපරදිගින් ද, උතුරු දිගින් ද, දකුණු දිගින් ද දිය එන මගක් නැත්තේ වේ ද, මෙඝය ද කලින් කල මනාසේ වැසි වර්ෂණය නො කරන්නේ ද, එසේ වූ ඒ විලෙන් සිහිල් දිය දහර පොළොව බිඳ නැගී ඒ මුළු විලම සිහිල් දියෙන් පතුරුවයි, හාත්පසින් වගුරුවයි, සම්පූර්ණයෙන් පුරවයි, එහි හැම තැන දියෙන් ස්පර්ශ කෙරෙයි. ඒ සියලු විලෙහිම සීත ජලය නො පැතිර පවත්නා තැනක් නම් නැත්තේය.

60. ලොහිච්චය, එපරිද්දෙන් මේ මහණ තෙමේ මේ මුළු ශරීරයම සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් සියලු තැන පතුරුවන ලද්දක් කෙරේ, ප්‍රීති සැපයෙන් හාත්පසින් වගුරුවයි, සම්පූර්ණයෙන් පුරවයි, ඉන් සෑම තැනම ස්පර්ශ කෙරෙයි. ඒ මහණහුගේ සම්පූර්ණ ශරීරයෙහි සවල්පවූ එක ස්ථානයකුදු (ද්‍විතියධ්‍යාන) ප්‍රීති සැපයෙන් නො පහස්නා ලද්දේ නොවේ.

61. ලොහිච්චය, යලිදු ඒ මහණ තෙමේ ප්‍රීතියෙහි නො ඇල්මෙන් මැදහත්බැව ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් නුවණ ඇත්තේ කයින්ද සැපයක් විඳියි. යම් ධ්‍යානයක් පිළිබඳව (ඒ ධ්‍යානයට සමවැදුනු තැනැත්තා) උපෙක්‍ෂා ඇත්තේය, සිහි ඇත්තේය, සැපවිහරණ ඇත්තේ යයි ආර්‍යයෝ කියත් ද, ඒ තෘතියධ්‍යාන කුසල චිත්තයට පැමිණ වාසය කෙරේ. ඒ මහණ තෙමේ මේ සකල ශරීරයම ප්‍රීතියෙන් මිදුණාවූ සැපයෙන් තෙමයි, පෙළත් සියලු තැන පැතිර පවත්නා සැප ඇත්තක් කෙරේ. ඒ සැපතින් හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, එයින් සෑම්තැනම ස්පර්ශ කෙරෙයි. ඒ මහණහුගේ සියලු ශරීරයෙහි සවල්පවූ එක තැනක් වුවද නිෂ්ප්‍රීතික සුඛයෙන් (හෙවත් තෘතීය ධ්‍යානසුඛයෙන්) නො පහස්නා ලද්දේ නොවේ.

62. සෙය්‍යථාපි ලොහිච්ච උප්පලිනියං වා[1] පදුමිනියං වා[1] පුණ්ඩරීකිනියං වා[1] අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි[2] උදකානුග්ගතානි අන්තොනිමුග්ගපොසීනී[3] තානි යාව චග්ගා[4] යාව ච මූලා සීතෙන වාරිනා අභිසන්නානි[5] පරිසන්නානි[5] පරිපූරානි පරිප්ඵුටානි[6] නාස්ස කිඤ්චි සබ්බාවතං[7] උප්පලානං වා[8] පදුමානං වා පුණ්ඩරීකානං වා සීතෙන වාරිනා අප්ඵුටං[9] අස්ස.

63. එවමෙව ඛො ලොහිච්ච භික්ඛු ඉමමෙව කායං නිප්පීතිකෙන සුඛෙන අභිසන්නෙති පරිසන්නෙති පරිපූරෙති පරිප්ඵරති නාස්ස කිඤ්චි සබ්බාවතො[10] කායස්ස නිප්පීතිකෙන සුඛෙන අප්ඵුටං[9] හොති.

64. යස්මිං ඛො ලොහිච්ච සත්ථා සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති, අයම්පි ඛො ලොහිච්ච සත්ථා යො ලොකෙ න චොදනාරහො. යො ච පනෙවරූපං සත්ථාරං චොදෙති සා චොදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

65. පුනචපරං ලොහිච්ච භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා[11] අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං[12] උපසම්පජ්ජ විහරති. සො ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති නාස්ස කිඤ්චි සබ්බාවතො[10] කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුටං[9] හොති.

---

1. වාති න දිස්සති P.
2. සංවුඩ්ඪානි B. V; සංවඩ්ඪානි S.
3. °පොසීනි B.
4. යාව ච අග්ගා S.
5. °සන්නානි P. W.
6. පරිප්ඵුටානි P.
7. සබ්බවතං V.
8. වාති නත්ථි V.
9. අඵුටං B.V; අප්ඵුටං S.; අප්ඵුතං P.
10. සබ්බවතො V.
11. අත්ථගමා P.
12 චතුත්ථං ඣානං B. V.W.

62. ලොහිච්චය, යම්සේ උපුල් විලක හෝ හෙල පියුම් විලක හෝ රත් පියුම් විලක හෝ දියෙහි හටගත්, දියෙහි වැඩුනු, දියෙන් උඩට නොනැගුනු, දියතුළම ගැලී වැඩෙන්නාවූ සමහර උපුල් හෝ සමහර හෙල පියුම් හෝ සමහර රත් පියුම් හෝ වෙද් ද, ඒ උපපලාදීහු අග දක්වාත්, මුල දක්වාත්, සිහිල් ජලයෙන් තෙමුනාහු, හාත්පසින් තෙමුනාහු, සම්පූර්ණයෙන් මැගුරුණාහු, හාත්පසින් පහස්නා ලද්දාහු වෙත් ද, ඒ උපුල්, හෙල පියුම්, රත් පියුම් යන මොවුන්ගෙන් එකකුත් ජලයෙන් නො පහස්නා ලද්දේ නොවේ ද,

63. ලොහිච්චය, එපරිද්දෙන් ඒ මහණ තෙමේ මේ සකල ශරීරයම නිෂ්පීතික සුඛයෙන් සියලු තැන පැතිර පවත්නා සැප ඇත්තක් කෙරෙයි, ඉන් හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, හාත්පසින් ස්පර්ශ කෙරෙයි. ඒ මහණහුගේ සම්පූර්ණ ශරීරයෙහි සවල්පවූ එක තැනක්වත් නිෂ්පීතික (තතියජ්ඣාන) සුඛයෙන් නො පහස්නා ලද්දේ නොවේ.

64. ලොහිච්චය, යම් ශාස්තෘවරයෙකු නිසා ශ්‍රාවක තෙමේ මෙබඳු මහත්වූ විශේෂයකට පැමිණේද, ලොහිච්චය, මේ ශාස්තෘ තෙම ලොකයෙහි චෝදනා ලැබීමට සුදුසු නොවේ. යමෙක් මෙබඳුවූ ශාස්තෘවරයාහට චෝදනා කෙරේද ඒ චෝදනා තොමෝ අසත්‍ය වන්නීය, අභූත වන්නීය, අධාර්මික වන්නීය, වරද සහිත වන්නීය.

65. ලොහිච්චය, නැවත ද, ඒ මහණතෙමේ සැප දුරුකිරීමෙන් ද, දුක් දුරුකිරීමෙන් ද පලමුකොට සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැතිව යාමෙන්, දුක් නොවූ, සැප නොවූ, උපෙක්ඛා හා සති යන මොවුන්ගේ පිරිසිදු බැව් ඇති, චතුත්ථජ්ඣාන චිත්තයට පැමිණ වෙසේ. ඒ මහණ තෙමේ මේ සකල ශරීරයම (කෙලෙස් නැති බැවින්) පිරිසිදුවූ, (අතිශයින් බබලන හෙයින්) පරියොදාතවූ, (ධ්‍යාන) සිතින් පතුරුවා හුන්නේ වේ (පතුරුවන්නේය). ඒ ධ්‍යානලාභී මහණහුගේ සර්වාඞ්ගයෙහි සවල්පවූ එක තැනකුදු පිරිසිදුවූ, අතිශයින් බබලන්නාවූ (චතුර්ථධ්‍යාන) චිත්තයෙන් නොපහස්නා ලද්දේ නොවේ.

66. සෙය්‍යථාපි ලොහිච්ච පුරිසො ඔදාතෙන වත්ථෙන සසීසං පාරුපිත්වා නිසින්නො අස්ස නාස්ස කිඤ්චි සබ්බාවතො[1] කායස්ස ඔදාතෙන වත්ථෙන අප්ඵුටං[2] අස්ස. එවමෙව ඛො ලොහිච්ච භික්ඛු ඉමමෙව කායං පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන ඵරිත්වා නිසින්නො හොති නාස්ස කිඤ්චි සබ්බාවතො[1] කායස්ස පරිසුද්ධෙන චෙතසා පරියොදාතෙන අප්ඵුටං[2] හොති.

67. යස්මිං ඛො ලොහිච්ච සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති. අයම්පි ඛො ලොහිච්ච සත්ථා යො ලොකෙ න චොදනාරහො. යො ච පනෙවරූපං සත්ථාරං චොදෙති, සා චොදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

68. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[3] ඤාණදස්සනාය චිත්තං අභිනිහරති අභිනින්නාමෙති. [4]සො එවං පජානාති: අයං ඛො මෙ කායො රූපී චාතුම්මහාභූතිකො මාතාපෙත්තිකසම්භවො ඔදනකුම්මාසූපචයො අනිච්චුච්ඡාදනපරිමද්දනභෙදනවිද්ධංසනධම්මො ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති.

1. සබ්බවතො V. 2. අප්ඵුටං B.V. අප්ඵුටං S. අප්ඵුතං P.
3. ආනෙජ්ජ° P.
4. සො එවං.........පටිබද්ධන්ති අයං ඡෙදො න දිස්සති P. W.

66. ලොහිච්චය, යම්සේ පුරුෂයෙක් පිරිසිදුවූ සුදුවතකින් හිස සිට (දෙපා දක්වා) පොරවා උන්නේ වේද, ඔහුගේ සකල ශරීරයෙහි එකම තැනකුදු සුදුවතින් නො වසන (නොහොත් උණුසුම් නොකරණ) ලද්දේ නොවේ. ලොහිච්චය, එපරිද්දෙන්ම ධ්‍යානලාභී මහණ තෙමේ මේ සියලු ශරීරයම පිරිසිදුවූ, අතිශයින් බබලන්නාවූ (චතුර්ථජ්ඣාන) චිත්තයෙන් පතුරුවා හුන්නේ වේ. ඒ මහණහුගේ සර්වාඞ්ගයෙහි සවල්පවූද එක් තැනක්වත් පිරිසිදුවූ බබලන්නාවූ (චතුර්ථජ්ඣාන) චිත්තයෙන් නො පහස්නා ලද්දේ නොවේ (චතුර්ථධ්‍යාන චිත්තයෙන් සකල ශරීරයම පතුරුවන ලද්දේය කී සේයි).

67. **ලොහිච්චය, යම් ශාස්තෘවරයෙකු නිසා (ඔහුගේ) ශ්‍රාවක තෙම මෙබඳු වූ මහත් විශිෂ්ටත්වයකට පැමිණේද, ලොහිච්චය, මේ ශාස්තෘතෙම ලොකයෙහි චෝදනා කිරීමට සුදුසු නොවේ. යමෙක් තෙම මෙබඳු වූ ශාස්තෘවරයාහට චෝදනා කෙරේද ඒ චෝදනා තොමෝ සත්‍ය නොවන්නීය, සැබෑ නොවන්නීය, අධාර්මික වන්නීය, වරද සහිත වන්නීය.**

68. ඒ මහණතෙමේ මෙසේ සිත එකගවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි. උපකෙලශයන් පහවූ කල්හි, මෘදුවූ කල්හි, (කර්මණ්‍ය) කර්‍මයට සුදුසුව සිටි කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, විදර්ශනාඥානය ඉපදවීම පිණිස සිත එලවා නබයි, ඒ සඳහා වෙසෙසින් සිත නමයි. ඒ මහණ තෙමේ මෙසේ දැනගණී, කෙසේ ද යත්: 'මාගේ මේ ශරීරය වනාහි ආකාර ඇත්තේය (රූපයෙන් යුක්තය), සතර මහාභූතයන්ගේ හේතුවෙන් හටගත්තේය, (මව්පියන් නිසා) මව් පිය දෙදෙනාගේ ශුක්‍ර ශ්‍රොණිතයෙන් හටගත්තේය, බත්කොමු (කුම්මාස) ආදි ආහාරයෙන් වඩනා ලද්දේය. අනිත්‍ය බවය, දුගඳ නැසීම පිණිස සුණු ආදිය ගැල්වීමෙන් ඉලීමය, අඟපසඟ ආබාධ දුරලීම පිණිස පිරිමැදීමය, බිඳීමය, විනාශය යන මේ දේ සවභාවකොට ඇත්තේය. මාගේ මේ විඥානය වනාහි කය ඇසුරු කෙළේ වෙයි, මෙහිම බැඳුනේ වෙයි' කියාහි.

69. සෙය්‍යථාපි ලොහිච්ච මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අච්ඡො විප්පසන්නො අනාවිලො සබ්බාකාරසම්පන්නො තත්‍රස්ස[1] සුත්තං ආවුතං නීලං[2] වා පීතං[3] වා ලොහිතං[4] වා ඔදාතං වා පණ්ඩුසුත්තං[5] වා. තමෙනං[6] චක්ඛුමා පුරිසො හත්ථෙ කරිත්වා පච්චවෙක්ඛෙය්‍ය: අයං ඛො මණි වෙළුරියො සුභො ජාතිමා අට්ඨංසො සුපරිකම්මකතො අච්ඡො විප්පසන්නො අනාවිලො සබ්බාකාරසම්පන්නො තත්‍රිදං සුත්තං ආවුතං නීලං[2] වා පීතං[3] වා ලොහිතං[4] වා ඔදාතං වා පණ්ඩුසුත්තං[5] වාති.

එවමෙව ඛො ලොහිච්ච භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— ඤාණදස්සනාය චිත්තං අභිනීහරති[7] අභිනින්නාමෙති. සො එවං පජානාති අයං ඛො මෙ කායො රූපී—පෙ—ඉදං ච පන මෙ විඤ්ඤාණං එත්ථ සිතං එත්ථ පටිබද්ධන්ති.

70. යස්මිං ඛො ලොහිච්ච සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති, අයම්පි ඛො ලොහිච්ච සත්ථා යො ලොකෙ න චොදනාරහො. යො ච පනෙවරූපං සත්ථාරං චොදෙති සා චොදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජා.

71. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[8] මනොමයං කායං අභිනිම්මිනාය[9] චිත්තං අභිනීහරති[7] අභිනින්නාමෙති. සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං[10] අහීනින්ද්‍රියං[11].

72. සෙය්‍යථාපි ලොහිච්ච පුරිසො මුඤ්ජම්හා ඊසිකං[12] පබ්බාහෙය්‍ය[13]. තස්ස එවමස්ස: අයං මුඤ්ජො අයං ඊසිකා[12]. අඤ්ඤො මුඤ්ජො අඤ්ඤා ඊසිකා[12] මුඤ්ජම්හා ත්වෙව ඊසිකා[12] පබ්බාළ්හාති[13].

---

1. තත්‍රසුත්තං P. W.
2. නිලං B.
3. පිතං B.
4. ලොහිතකං B.
5. පණ්ඩුරසු° S.
6. තමෙව ච° P.
7. °නිහරති B.
8. ආනෙඤ්ජ° P. C.
9. මනොමයං අභිනිම්මිනනාය S.
10. °පච්චඞ්ගං S.
11. අභින්නින්ද්‍රියං C.
12. ඉසි° P. S. W. C.
13. පවා° P. W. S.

69. **ලොහිච්චය, යම්සේ වනාහි යහපත්වූ, පිරිසිදු ආකරයෙන් උපන්නාවූ, අටැස්වූ,** (පාෂාණාදි දෙස් බැහැර කිරීමෙන්) මොනවට සකස් කරණ ලද්දවූ, නිර්මලවූ, විශෙෂයෙන් ප්‍රසන්නවූ, නොකැලැල්වූ, සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, වෙරළුමිණක් (වෛඩූර්‍ය මැණිකක්) වේද, එහි නිල්වූ හෝ පීතවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ හුයක් (නූලක්) අමුණන ලද්දේද, ඒ මේ මැණික ඇස් ඇති පුරුෂයෙක් අතට ගෙණ මෙසේ සලකා බලන්නේය, (කෙසේද යත්:) 'මේ වෛඩූර්‍ය මැණික වනාහි මනාසේ කාන්තිමත් හෙයින් යහපත් වේ, පිරිසිදු ආකරයෙන් උපන්නේය, අටැස් ඇත්තේය, (දෙස් දුරුකිරීමෙන්) මනාකොට සකස් කරණ ලද්දේය, නිර්මලය, විශෙෂයෙන් ප්‍රසන්නය, නොකැලැල්ය, සියලු ආකාරයෙන් සම්පූර්ණය. ඒ මැණිකෙහි මේ නීලවර්ණවූ හෝ පීතවර්ණවූ හෝ රතුවූ හෝ සුදුවූ හෝ පඬුවන්වූ හෝ හුයක් අමුණන ලද්දේය' කියායි.

ලොහිච්චය, එපරිද්දෙන්ම යොගීවූ මේ මහණ තෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, —පෙ— විදර්ශනාඥානය පිණිස සිත එලවා තබයි, ඒ සඳහා විශෙෂයෙන් සිත නමයි. ඒ මහණ තෙමේ මෙසේ දන්නේය, (කෙසේද යත්:) 'මාගේ මේ ශරීරය වනාහි ආකාරවත් (රූපයෙන් යුක්ත) ය, —පෙ— මාගේ මේ විඥානය වනාහි මේ කය ඇසුරු කොළේ වෙයි, මෙහිම බැඳී සිටියේය' කියා යි. මෙද ඔහුගේ ප්‍රඥාසම්පත පිණිස වේ.

70. ලොහිච්චය, යම් ශාස්තෘවරයෙකු නිසා (ඔහුගේ) ශ්‍රාවක තෙම මෙබඳු වූ මහත් විශිෂ්ටත්වයකට පැමිණේද, ලොහිච්චය, මේ ශාස්තෘතෙම ලොකයෙහි චෝදනා කිරීමට සුදුසු නොවේ. යමෙක් තෙම මෙබඳුවූ ශාස්තෘවරයාහට චෝදනා කෙරේද ඒ චෝදනා තොමෝ සත්‍ය නොවන්නීය, සැබෑ නොවන්නීය, අධාර්මික වන්නීය, වරද සහිත වන්නීය.

71. ඒ මහණ තෙමේ මෙසේ ධ්‍යානයෙන් සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් නැතිවූ කල්හි, උපක්ලෙශ පහවූ කල්හි, මෑදුවූ කල්හි, යොග කර්මයට සුදුසුව සිටි කල්හි, නො සැලෙන බවට පැමිණි කල්හි, මනොමයවූ කයක් (රූපයක්) මනාකොට නිපදවීම පිණිස සිත එලවා තබයි, වෙසෙසින් නමයි. ඒ මහණ තෙමේ ආකාරවත්වූ, මනොමයවූ (ධ්‍යාන සිතින් නිපදවනලද), සියලු අඟපසඟ ඇති, අවිකලවූ ඉඳුරන් ඇති, මේ කයින් අන්‍යවූ කයක් මොනවට නිමවයි.

72. ලොහිච්චය, යම්සේ වනාහි පුරුෂයෙක් තෙම මුඳු තණගසින් තණබඩය උද්ධරණය කරන්නේ ද, ඔහුට මේ අදහස් වන්නේය: මේ තණගසය, මේ තණබඩය; තණගස අනිකෙක, තණබඩය අනිකෙක, තණගසින්ම තණබඩය ඇදගන්නා ලද්දේය (යන වැටහීම ඔහට පහළ වන්නේය).

73. සෙය්‍යථා[1] වා පන ලොහිච්ච පුරිසො අසිං[2] කොසියා පබ්බාහෙය්‍ය[3] තස්ස එවමස්ස: අයං අසි අයං කොසි අඤ්ඤො අසි අඤ්ඤො[4] කොසි. කොසියා ත්වෙව අසි පබ්බාළ්හොති[3]. සෙය්‍යථා වා[1] පන ලොහිච්ච පුරිසො අහිං කරණ්ඩා උද්ධරෙය්‍ය තස්ස එවමස්ස: අයං අහි අයං කරණ්ඩො අඤ්ඤො අහි අඤ්ඤො කරණ්ඩො. කරණ්ඩා ත්වෙව අහි උබ්භතොති[5].

එවමෙව ඛො ලොහිච්ච භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ—පෙ— ආනෙඤ්ජප්පත්තෙ[6] මනොමයං කායං[7] අභිනිම්මිනාය[8] චිත්තං අභිනීහරති[9] අභිනින්නාමෙති. සො ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගිං[10] අහීනින්ද්‍රියං[11].

74. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනීයෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[6] ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති[9] අභිනින්නාමෙති. සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති එකොපි හුත්වා බහුධා හොති බහුධාපි හුත්වා එකො හොති ආවිභාවං තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ. පඨවියා[12] පි උම්මුජ්ජනිමුජ්ජං[13] කරොති සෙය්‍යථාපි උදකෙ. උදකෙපි අභිජ්ජමානො[14] ගච්ඡති සෙය්‍යථාපි පඨවියං[12]. ආකාසෙ පි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො. ඉමෙපි චන්දිමසුරියෙ[15] එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරිමසති[16] පරිමජ්ජති යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.

---

1. සෙය්‍යථාපි පන P. W.
2. අසිං කොසියං W. අසි කොසියා P. V.
3. පවා° P. W. S.
4. අඤ්ඤො P. W.
5. උද්ධරිතොති S.
6. ආනෙජ්ජ° P.
7. කායං ති න දිස්සති S.
8. °නිම්මිනනාය S.
9. °නිහරති B.
10. °පච්චඞ්ගං S.
11. අහීනින්ද්‍රියං C. අභි° P.
12. පඨ° B. V.
13. °නිම්මුජ්ජං P. W.
14. අභෙජ්ජ° W.
15. °සූරියෙ B.
16. පරා° B. V. W.

73. ලොහිච්චය, යම්සේ වනාහි පුරුෂයෙක් කඩුව කොපුවෙන් ඉවත් කරන්නේ ද ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: මේ කඩුවය, මේ (කඩු) කොපුවය, කඩුව අනිකෙක, කොපුව අනිකෙක, කොපුවෙන්ම කඩුව ඉවත්කරණ ලද්දේය කියාහි. ලොහිච්චය, යම්සේ හෝ පුරුෂයෙක් සපියකු සැවයෙන් පහකරන්නේද[1] (වෙන්කොට සලකන්නේද), ඔහට මේ සපියාය, මේ සැවය, සපියා එකෙකි, සැව අනිකකි, සැවයෙන්ම සපියා වෙන්කරණ ලද්දේය යි වැටහීමක් ඇතිවන්නේය.

ලොහිච්චය, එසේම භික්ෂුව මෙසේ සිත සමාධිගතවූ කල්හි, —පෙ— නොසැලෙනබවට පැමිණි කල්හි සිතින් උපදවන කයක් මැවීම පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට ඊට නමයි. හේතෙමේ මේ කයින් රූ ඇති, සිතින් මවන ලද, සියලු අඟපසඟ ඇති, නොපිරිහුනු ඉන්‍ද්‍රියයන් ඇති වෙන කයක් මවයි.

74. හේතෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත වූ කල්හි, උප-ක්ලේශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍ය භාවයට පැමිණි කල්හි, ඍද්ධිවිධි පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි (ඊට නැඹුරු කෙරෙයි). හේතෙමේ නොයෙක් අයුරු ඇති ඍද්ධිවිධි වෙන් වෙන් කොට අනුභව කෙරෙයි. එකෙක්ව බොහෝ සේ වෙයි. බොහෝ සේ ව එකෙක් වෙයි. ප්‍රකට බවට, මුවහ බවට, අහසෙහි මෙන් බිත්තිය සරසට, පවුර සර-සට, පව්ව සරසට නොගැටෙමින් යෙයි. දියෙහි මෙන් පොළොවෙහි කිමිදීම් මතුවීම් කෙරෙයි. පොළොවෙහි මෙන් දියෙහි දිය නොබෙදා ගමන් කෙරෙයි. පක්ෂියකු මෙන් අහසෙහි ද පලඟින් යෙයි. මේ මහත් ඍද්ධි ඇති, මහත් ආනුභාව ඇති සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි, බඹලොව තෙක් කයින් වසඟ බව පවත්වයි.

---

1. මෙසේ කරත්තෙත් සිතින් පමණකැයි අටුවායි.

75. සෙය්‍යථාපි ලොහිච්ච දක්ඛො කුම්භකාරො වා කුම්භකාරන්තෙවාසී වා සුපරිකම්මකතාය මත්තිකාය යං යදෙව භාජනවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය. සෙය්‍යථා වා[1] පන ලොහිච්ච දක්ඛො දන්තකාරො වා දන්තකාරන්තෙවාසී වා සුපරිකම්මකතස්මිං දන්තස්මිං යං යදෙව දන්තවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය. සෙය්‍යථා වා[1] පන ලොහිච්ච දක්ඛො සුවණ්ණකාරො වා සුවණ්ණකාරන්තෙවාසී වා සුපරිකම්මකතස්මිං සුවණ්ණස්මිං යං යදෙව සුවණ්ණවිකතිං ආකඞ්ඛෙය්‍ය තං තදෙව කරෙය්‍ය අභිනිප්ඵාදෙය්‍ය[2]. එවමෙව ඛො ලොහිච්ච භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනීයෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[3] ඉද්ධිවිධාය චිත්තං අභිනීහරති[4] අභිනින්නාමෙති. සො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති එකො පි හුත්වා බහුධා හොති —පෙ— ඉමෙපි චන්දිමසුරියෙ[5] එවංමහිද්ධිකෙ එවංමහානුභාවෙ පාණිනා පරිමසති[6] පරිමජ්ජති. යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති.[7] ඉදම්පිස්ස හොති පඤ්ඤාසම්පදාය.

76. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනීයෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[3] දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති[4] අභිනින්නාමෙති. සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය[8] උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච.

---

1. සෙය්‍යථාපි පන° P. W.
2. අභිනිප්පාදෙය්‍ය W.
3. ආනෙඤ්ජ° P.
4. °නීහරති B.
5. සුරියෙ B.
6. පරා° B. V. W.
7. කායෙනෙව සං° W.
8. °මානුස° B. V. Pa.

75. ලොහිච්චය, දක්‍ෂ කුඹල්කරුවෙක් හෝ කුඹල්කරු-අතවැසියෙක් හෝ යහපත් සේ පදම්කල මැටියෙන් කැමති කැමති බඳුන් වගියක් යම්සේ කරන්නේ ද, නිපදවන්නේ ද, ලොහිච්චය, දළ කැටයම් කරුවෙක් හෝ දළකැටයම්කරුගේ අතවැසියෙක් හෝ සකස් කළ දළයෙහි යම්සේ කැමති කැමති දළකැටයම් වගියක් කරන්නේද, නිපදවන්නේද, ලොහිච්චය, දක්‍ෂ රන්කරුවෙක් හෝ රන්කරුඅතවැසියෙක් හෝ පදම්කල රණින් කැමති කැමති රන් අබරණ ජාතීන් යම්සේ කරන්නේද, නිපදවන්නේද, ලොහිච්චය, එසේම භික්‍ෂුව සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත වූ කල්හි, කෙලශයන් පහ වූ කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍යභාවයට පැමිණි කල්හි, සෘද්ධිවිධි පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ නොයෙක් සෘද්ධිවිධි වෙන් වෙන් කොට අනුභව කෙරෙයි: එකෙක්ව බොහෝ සේ වෙයි, —පෙ— මේ මහත් සෘද්ධි ඇති, මහත් ආනුභාව ඇති, සඳ හිරු දෙදෙන අතගායි, පිරිමදියි, බඹලොව තෙක් කයින් වසඟබව කෙරෙයි. මෙ ද ඔහුගේ ප්‍රඥසම්පත පිණිස වේ.

76. හේතෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වරවූ කල්හි, අඞ්ගණ රහිතවූ කල්හි, උපකෙලශයන් පහව ගිය කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍යභාවයට පැමිණි කල්හි, දිව්‍යශ්‍රොතඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි (ඊට නැඹුරු කෙරෙයි). ඒ භික්‍ෂුව පිරිසුදු වූ, මිනිස්-බව ඉක්මවූ, දිව්‍ය ශ්‍රොතඥානයෙන් දිව්‍යමය වූද, මනුෂ්‍යමය වූද, දුරෙහි වූ ද සමීපයෙහි වූ ද දෙවැද්‍රුම් ශබ්දයන් අසයි.

77. සෙය්‍යථාපි ලොහිච්ච පුරිසො අද්ධානමග්ගපටිපන්නො[1] සො සුණෙය්‍ය භෙරිසද්දම්පි මුදිඞ්ගසද්දම්පි[2] සඞ්ඛපණවදෙණ්ඩිමසද්දම්පි[3] තස්ස එවමස්ස: භෙරිසද්දො ඉතිපි මුදිඞ්ගසද්දො[2] ඉතිපි සඞ්ඛපණවදෙණ්ඩිමසද්දො[4] ඉතිපි. එවමෙව ඛො ලොහිච්ච භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— දිබ්බාය සොතධාතුයා චිත්තං අභිනීහරති[5] අභිනින්නාමෙති.

සො දිබ්බාය සොතධාතුයා විසුද්ධාය අතික්කන්තමානුසිකාය උභො සද්දෙ සුණාති දිබ්බෙ ච මානුසෙ ච යෙ දූරෙ සන්තිකෙ ච.

78. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනීයෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[6] චෙතොපරියඤාණාය චිත්තං අභිනීහරති[5] අභිනින්නාමෙති. සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති.

සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති වීතරාගං[7] වා චිත්තං වීතරාගං චිත්තන්ති පජානාති සදොසං වා චිත්තං සදොසං චිත්තන්ති පජානාති වීතදොසං වා චිත්තං වීතදොසං චිත්තන්ති පජානාති සමොහං වා චිත්තං සමොහං චිත්තන්ති පජානාති වීතමොහං වා චිත්තං වීතමොහං චිත්තන්ති පජානාති සඞ්ඛිත්තං වා චිත්තං සඞ්ඛිත්තං චිත්තන්ති පජානාති වික්ඛිත්තං වා චිත්තං වික්ඛිත්තං චිත්තන්ති පජානාති මහග්ගතං වා චිත්තං මහග්ගතං චිත්තන්ති පජානාති අමහග්ගතං වා චිත්තං අමහග්ගතං චිත්තන්ති පජානාති සඋත්තරං වා චිත්තං සඋත්තරං චිත්තන්ති පජානාති අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති සමාහිතං වා චිත්තං සමාහිතං චිත්තන්ති පජානාති අසමාහිතං වා චිත්තං අසමාහිතං චිත්තන්ති පජානාති විමුත්තං වා චිත්තං විමුත්තං චිත්තන්ති පජානාති අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

---

1. °මග්ගප්පටි° B. V.
2. මුතිඞ්ග° P.W.
3. °දෙන්දිම° B; සඞ්ඛසද්දම්පි පණවසද්දම්පි දෙන්දිමස° S.
4. සංඛසද්දො ඉතිපි පණවසද්දො ඉතිපි දෙන්දිමස° S.
5. °නිහරති B.
6. ආනෙජ්ජ° P.
7. විත° B. (සබ්බත්ථ)

77. ලොහිච්චය, දික් මගට පිවිසි පුරුෂයෙක් බෙර හඬද, මිහිඟු බෙර හඬද, සක්, පණාබෙර, ගැටබෙර හඬද යම්සේ අසාද, ඔහුට මේ බෙර හඬයයිද, මිහිඟුබෙර හඬයයිද, සක්, පණාබෙර, ගැටබෙර හඬ යයිද සිතෙන්නේය. ලොහිච්චය, එලෙසින්ම භික්ෂුව මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදුවූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත වූ කල්හි, පහ වූ උපකෙලශ ඇති කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්පයභාවයට පැමිණි කල්හි, දිව්‍යශ්‍රොත්‍රඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට ඊට නමයි.

හේ තෙමේ මෙසේ පිරිසිදුවූ මිනිස්කණ ඉක්ම වූ දිව්‍ය ශ්‍රොත්‍රඥානයෙන් දිව්‍යමය වූ ද, මනුෂ්‍යමය වූ ද, දුරෙහි වූ ද, සමීපයෙහි වූ ද දෙවැදෑරුම් ශබ්දයන් අසයි.

78. හේතෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත වූ කල්හි, පහවූ උපකෙලශ ඇති කල්හි, මෘදු වූ කල්හි, කර්මණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්පයභාවයට පැමිණි කල්හි, සිත් පිරිසිඳින ඥාණය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි (ඊට නැඹුරු කෙරෙයි). හේතෙමේ අන්‍ය සත්ත්වයන්ගේ, අන්‍ය පුද්ගලයන්ගේ සිත (තමන් ගේ) සිතින් පිරිසිඳ දනියි.

රාග සහිත සිත සරාග සිත යයි දනියි. රාගයෙ පහ වූ සිත වීතරාග සිත යයි දනියි. ද්වෙෂ සහිත සිත සද්වෙෂ සිත යයි දනියි. ද්වෙෂය පහවූ සිත වීතද්වෙෂ සිත යයි දනියි. මොහ සහිත සිත සමොහ සිත යයි දනියි, මොහය පහ වූ සිත වීතමොහ සිත යයි දනියි. හැකුළුනු සිත හැකුළුනු සිත යයි දනියි, විසුරුණු සිත විසුරුණු සිත යයි දනියි. මහත් බවට ගිය සිත මහත් බවට ගිය සිත යයි දනියි. මහත් බවට නොගිය සිත මහත් බවට නොගිය සිත යයි දනියි. උතුරුසහිත (කාමාවචර) සිත උතුරුසහිත සිත යයි දනියි. අනුත්තර (රූපාවචර අරූපාවචර) සිත අනුත්තර සිත යයි දනියි. සමාධි-ගත වූ සිත සමාධිගත වූ සිත යයි දනියි, සමාධිගත නො වූ සිත සමාධිගත නො වූ සිත යයි දැනගණී. (කෙලශයෙන්) මිදුනු සිත මිදුනු සිත යයි දැනගණී, නොමිදුනු සිත නොමිදුනු සිත යයි දැනගණී.

79. සෙය්‍යථාපි ලොහිච්ච ඉත්ථි වා පුරිසො වා දහරො වා යුවා මණ්ඩනජාතිකො[1] ආදාසෙ වා පරිසුද්ධෙ පරියොදාතෙ අච්ඡෙ වා උදකපත්තෙ[2] සකං මුඛනිමිත්තං පච්චවෙක්ඛමානො සකණිකං[3] වා සකණිකන්ති[3] ජානෙය්‍ය අකණිකං[4] වා අකණිකන්ති[4] ජානෙය්‍ය.

එවමෙව ඛො ලොහිච්ච භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— ආනෙඤ්ජප්පත්තෙ[5] චෙතොපරියඤාණාය චිත්තං අභිනීහරති[6] අභිනින්නාමෙති. සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති සරාගං වා චිත්තං සරාගං චිත්තන්ති පජානාති —පෙ— අවිමුත්තං වා චිත්තං අවිමුත්තං චිත්තන්ති පජානාති.

80. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[5] පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති[6] අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති සෙය්‍යථීදං[7] එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසම්පි[8] ජාතියො තිංසම්පි ජාතියො චත්තාරීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි[9] ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ: අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උපපාදිං[10]. තත්‍රාපාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසං-වෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූපපන්නොති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

---

1. මණ්ඩනක° S. C.
2. උදප° W.
3. සකනි° B.
4. අකනි° B.
5. ආනෙජ්ජ° P.
6. °නීහරති B.
7. සෙය්‍යථිද° B. V.
8. වීසතිම්පි P. W.
9. සතංපි ජාතියො සහස්සංපි ජා° සතසහස්සංපි ජා° අනෙකෙපි S.
10. උප්පාදිං W.

79. ලොහිච්චය, සැරසෙන සුලු ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ දහරයෙක් හෝ තරුණියෙක් හෝ පිරිසිදු, නොකිලිටි කැඩපතෙක හෝ පිරිසිදු දිය බඳුනෙක්හි හෝ තමාගේ මුව නිමිත්ත (මුඛ ශොභාව) පරීක්‍ෂා කරන්නේ, යම්සේ කැලල් සහිත නම් කැලල් සහිත යයි දැනගණීද, කැලල් රහිත නම් කැලල් රහිත යයි දැනගණීද,

ලොහිච්චය, එසේම භික්‍ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, —පෙ—නොසැලෙනබවට පැමිණි කල්හි, සිත් පිරිසිඳින ඥාණය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ තෙමේ අන්‍ය සත්ත්වයන්ගේ, අන්‍ය පුද්ගලයන්ගේ සිත (තමන්ගේ) සිතින් පිරිසිඳ දනියි. සරාග සිත සරාග සිත යයි දනියි. —පෙ— නොමිදුනු සිත නොමිදුනු සිත යයි දැනගනියි.

80. හේතෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත වූ කල්හි, උපක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කර්මණ්‍යවූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍ය භාවයට පැමිණි කල්හි, පූර්වේනිවාසානුස්මෘතිඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට (ඊට) නමයි. හේ තෙමේ නොයෙක් විදියේ පෙර විසීම් සිහි කෙරෙයි. කෙසේදයත්: එක් ජාතියක් ද, දෙ ජාතියක් ද, තුන් ජාතියක් ද, සිවු ජාතියක් ද, පස් ජාතියක් ද, දස ජාතියක් ද, විසි ජාතියක් ද, තිස් ජාතියක් ද, සතළිස් ජාතියක් ද, පණස් ජාතියක් ද, සියක් ජාතියක් ද, දහස් ජාතියක් ද, සියක් දහස් ජාතියක් ද, නොයෙක් සංවෘත කල්පයන් ද, නොයෙක් විවෘත කල්පයන් ද, නොයෙක් සංවෘත විවෘත කල්පයන් ද ‘අසුවල් තැන වීමි, මෙනම් ඇත්තෙම්, මේ ගොත්‍ර ඇත්තෙම්, මේ පැහැ ඇත්තෙම්, මේ අහර ඇත්තෙම්, මේ සැපදුක් වින්දෙම්, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතවූයෙම් අසුවල් තැන උපන්මි. එහිදු මෙනම් ඇත්තෙම්, මේ ගොත්‍ර ඇත්තෙම්, මේ පැහැ ඇත්තෙම්, මේ අහර ඇත්තෙම්, මේ සැපදුක් වින්දෙම්, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතවූයෙම් මෙහි උපන්මි’යි මෙසේ ආකාර සහිතව, උදෙසීම් සහිතව, නොයෙක් විදියේ පෙර විසීම් සිහිකෙරෙයි.

81. සෙය්‍යථාපි ලොහිච්ච පුරිසො සකම්හා ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය තම්හාපි ගාමා අඤ්ඤං ගාමං ගච්ඡෙය්‍ය. සො[1] තම්හා[2] ගාමා සකඤ්ඤෙව[3] ගාමං පච්චාගච්ඡෙය්‍ය.[4] තස්ස එවමස්ස: අහං ඛො සකම්හා ගාමා අමුං ගාමං අගච්ඡිං[5] තත්‍ර[6] එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හීඅහොසිං. තම්හාපි ගාමා අමුං ගාමං අගච්ඡිං[5]. තත්‍රාපි[6] එවං අට්ඨාසිං එවං නිසීදිං එවං අභාසිං එවං තුණ්හීඅහොසිං. සොම්හි තම්හා ගාමා සකඤ්ඤෙව[3] ගාමං පච්චාගතො[4] ති.

එවමෙව ඛො ලොහිච්ච භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ —පෙ— ආනෙඤ්ජප්පත්තෙ පුබ්බෙනිවාසානුස්සතිඤාණාය චිත්තං අභිනීහරති[7] අභිනින්නාමෙති. සො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති—සෙය්‍යථීදං එකම්පි ජාතිං —පෙ— ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

82. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනීයෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[8] සත්තානං චුතූපපාතඤාණාය[9] චිත්තං අභිනීහරති[7] අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[10] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ[11] සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා.[12] ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති[12]. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[10] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ[11] සත්තෙ පජානාති.

---

1. සො ති න දිස්සති P. W.
2. තම්හාපි ගාමා P.
3. සකංයෙව B. P.
4. පච්ඡා° P.
5. අගඤ්ඡිං S. ආගඤ්ඡිං P. ආගච්ඡිං Pa.
6. තත්‍රාහං B. S. තත්‍රපි B Pa. W.
7. °නිහරති B.
8. ආනෙජ්ජ° P.
9. චූතූප° B.
10. උප්පජ්ජං W.
11. කම්මුපගෙ B.
12. උප්පන්නා W.

81. ලොහිච්චය, පුරුෂයෙක් යම්සේ තම ගමින් අන් ගමකට යන්නේ ද, ඒ ගමිනුත් අන් ගමකට යන්නේ ද, ඒ ගමිනුත් තමන් ගමට එන්නේ ද, 'මම සිය ගමින් අසුවල් ගමට ගියෙමි, එහි මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි, මෙසේ බිණිමි, මෙසේ තුෂ්ණිම්භූත වීමි. එගමිනුදු අසුවල් ගමට ගියෙමි, එහි ද, මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි, මෙසේ බිණිමි, මෙසේ තුෂ්ණිම්භූත වීමි. ඒ මම ඒ ගමින් සිය ගමටම පැමිණියෙමි'යි හෙතෙම දන්නේ ද,

ලොහිච්චය, එපරිද්දෙන්ම භික්ෂුව මෙසේ සිත එකඟ වූ කල්හි, —පෙ— නොසැලෙන බවට පැමිණි කල්හි පූර්වේ නිවාසානුස්මෘතිඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ නොයෙක් පූර්වේනිවාස සිහි කෙරෙයි. කෙසේදයත්: එක් ජාතියක් ද,—පෙ—මෙසේ ආකාර සහිතම උද්දෙසීම් සහිතම නොයෙක් ආකාරවූ පූර්වේනිවාස සිහි කෙරෙයි.

82. හෙතෙමේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිතවූ කල්හි, උපක්ලේශ පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කර්මණ්‍යවූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි,අකම්ප්‍යමානභාවයට පැමිණි කල්හි සත්ත්වයන්ගේ චුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි (ඊට නැඹුරු කෙරෙයි). හේ පිරිසුදු වූ, මිනිස් ඇස ඉක්මවූ, දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී. හීන ප්‍රණීත, සුවර්ණ දුර්වර්ණ, සුගත දුර්ගත, කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දනී: 'මේ පින්වත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්තය, වාග්දුශ්චරිතයෙන් යුක්තය, මනොදුශ්චරිතයෙන් යුක්තය, ආර්‍ය්‍යයන්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය, මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන් වූවෝය. ඔවුහු කාබුන් මරණින් මතු අපාය වූ, දුර්ගතිය වූ, විනිපාතය වූ, නිරයට පැමිණියාහුය'. නැතහොත්, 'මේ පින්වත් සත්ත්වයෝ කායසුචරිතයෙන් යුක්තය, වාක්සුචරිතයෙන් යුක්තය,මනඃසුචරිතයෙන් යුක්තය,ආර්‍ය්‍යයන්ට නොබණින්නෝ ය, සම්‍යග්දෘෂ්ටිකයෝ ය, සම්‍යග්දෘෂ්ටිකර්ම සමාදන් වූවෝය, කාබුන් මරණින් මතු සුගතිය වූ, ස්වර්ග ලොකයට පැමිණියෝ'යි මෙසේ පිරිසුදු වූ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී, හීන ප්‍රණීත, සුවර්ණ, දුර්වර්ණ, සුගත දුර්ගත, කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දනී.

83. සෙය්‍යථාපි ලොහිච්ච මජ්ඣෙ සිංඝාටකෙ පාසාදො[1] තත්‍ථ චක්ඛුමා පුරිසො ඨිතො පස්සෙය්‍ය මනුස්සෙ ගෙහං පවිසන්තෙපි නික්ඛමන්තෙපි රථියා[2] වීථිසඤ්චරන්තෙ[3] පි මජ්ඣෙ[4] සිංඝාටකෙ නිසින්නෙපි[5]. තස්ස එවමස්ස: එතෙ මනුස්සා ගෙහං පවිසන්ති එතෙ නික්ඛමන්ති එතෙ රථියා[2] වීථිසඤ්චරන්ති[6] එතෙ[7] මජ්ඣෙ සිංඝාටකෙ නිසින්නාති.

84. එවමෙව ඛො ලොහිච්ච භික්ඛු එවං සමාහිතෙ චිත්තෙ—පෙ—සත්තානං චුතූපපාතඤාණාය චිත්තං අභිනීහරති[8] අභිනින්නාමෙති. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජ-මානෙ[9] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා. තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති.

85. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ[9] හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.

86. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ[10] ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති.

---

1. පාසාදෙ Pa.
2. රථියාපි රථිං සඤ්ච° V. රථියායපි B.
3. වීථි සං° P. W; වීථිං සංරථිං B. S; සං°V. වීතිසං° Ce; වීදිසංචරන්තෙ Ca. B
4. මජ්ඣෙපි P. W.
5. නිසින්නෙ P. W.
6. වීථි° P. W: වීථිං° B.S. රථිං සං° V.
7. එතෙ මනුස්සා B.
8. °නිහරන්ති B.
9. උප්පජ්ජ° W.
10. ආනෙඤ්ජ° B.

83. ලොහිච්චය, යම්සේ මංසලක පහයක් වේ ද, එහි ඇස් ඇති පුරුෂයෙක් සිටියේ ගෙට පිවිසෙන, ගෙයින් නික්මෙන, වීපියෙහි හැසිරෙණ, මංසල හිඳින මනුෂ්‍යයන් දක්නේ ද, ඔහුට මෙසේ සිතෙයි: 'මේ මිනිස්සු ගෙට පිවිසෙති, මොහු නික්මෙති, මොහු වීපියෙහි හැසිරෙති, මොහු මංසල හිඳිති'යි කියායි.

84. ලොහිච්චය, එසේ ම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, —පෙ— සත්ත්වයන්ගේ චුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත් කොට නමයි. හේ මිනිස් ඇස ඉක්ම වූ දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී. හීන ප්‍රණීත, සුවණ් දුවණ්, සුගත දුගීත, කම්ය ලෙස පැමිණි සත්ත්වයන් දකී: 'මේ පින්වත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්තය,වාග්දුශ්චරිතයෙන් යුක්තය,මනොදුශ්චරිතයෙන් යුක්තය, ආයර්‍යයන්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය, මිථ්‍යාදෘෂ්ටිකම් සමාදන් වූවෝය. ඔවුහු කාබුන් මරණින් මතු අපාය වූ, දුගීතිය වූ, විනිපාතය වූ, නිරයට පැමිණියෝය'. නැත හොත්, 'මේ පින්වත් සත්ත්වයෝ කායසුචරිතයෙන් යුක්තය, වාක්සුචරිත යෙන් යුක්තය, මනඃ සුචරිතයෙන් යුක්තය, ආයර්‍යයන්ට නොබණින්නෝ ය, සම්‍යග්දෘෂ්ටිකයෝය, සම්‍යග්දෘෂ්ටිකම් සමාදන් වූවෝය. ඔවුහු කාබුන් මරණින් මතු සුගතිය වූ, ස්වර්ග ලොකයට පැමිණියෝ'යි කියායි.

85. මෙසේ පිරිසුදු වූ, මිනිස් ඇස ඉක්ම වූ දිව ඇසින් චුතවන, උපදින සත්ත්වයන් දකී; හීන ප්‍රණීත, සුවණ් දුවණ්, සුගත දුගීත, කම්ය ලෙස පැමිණි සත්ත්වයන් දනී.

86. හේ මෙසේ සිත එකඟ වූ කල්හි, පිරිසුදු වූ කල්හි, ප්‍රභාස්වර වූ කල්හි, අඞ්ගණ රහිත කල්හි, උපක්ලෙශ යන් පහව ගිය කල්හි, මෘදු වූ කල්හි, කම්ණ්‍ය වූ කල්හි, ස්ථිතියට පැමිණි කල්හි, අකම්ප්‍යමාන භාවයට පැමිණි කල්හි ආශ්‍රවයන්ගේ ක්ෂය ඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට නමයි.

සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති. අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති. අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති යථාභූතං පජානාති. ඉමෙ ආසවාති යථාභූතං පජානාති. අයං ආසවසමුදයොති යථාභූතං පජානාති. අයං ආසවනිරොධොති යථාභූතං පජානාති. අයං ආසවනිරොධගාමිනීපටිපදාති යථාභූතං පජානාති.

තස්ස එවං ජානතො[1] එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති භවාසවාපි චිත්තං විමුච්චති අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති.

87. සෙය්‍යථාපි ලොහිච්ච පබ්බතසඞ්ඛෙපෙ උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො තත්ථ චක්ඛුමා පුරිසො තීරෙ ඨිතො පස්සෙය්‍ය සිප්පිසම්බුකම්පි සක්ඛරකඨලම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පි තස්ස එවමස්ස: අයං ඛො උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො තත්‍රිමෙ සිප්පිසම්බුකා පි සක්ඛරකඨලාපි මච්ඡගුම්බාපි චරන්තිපි තිට්ඨන්තිපීති. එවමෙව ඛො භික්ඛු සමාහිතෙ චිත්තෙ —පෙ— ආසවානං ඛයඤාණාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති. සො[2] ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති—පෙ—අයං ආසවනිරොධගාමිනීපටිපදාති යථාභූතං පජානාති.

තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති භවාසවාපි චිත්තං විමුච්චති අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති වුසිතං බ්‍රහ්මචරියං කතං කරණීයං නාපරං ඉත්ථත්තායාති පජානාති.

---

1. පජානතො B. 2. සො ති නත්ථි W.

හේතෙමේ මේ දුක යයි තතු ලෙස දැනගණී, මේ දුක් ඉපදීමේ හෙතුව යයි තතු ලෙස දැනගණී, මෙ දුඃඛනිරොධ යයි තතු ලෙස දැනගණී, මේ දුඃඛනිරොධගාමී ප්‍රතිපදාව යයි තතු ලෙස දැනගණී. මේ ආශ්‍රවයෝ යයි තතු ලෙස දැනගණී, මේ ආශ්‍රවසමුදයයි තතු ලෙස දැනගණී, මේ ආශ්‍රවනිරොධ යයි තතු ලෙස දැනගණී, මේ ආශ්‍රවනිරොධගාමී ප්‍රතිපදාව යයි තතු ලෙස දැනගණී.

මෙසේ දක්නා මෙසේ දන්නා ඔහුගේ සිත කාමාශ්‍රවයන් කෙරෙන් ද මිදේ, භවාශ්‍රවයන් කෙරෙන් ද සිත මිදේ, අවිද්‍යාශ්‍රවයන් කෙරෙන් ද සිත මිදේ. මිදුනු කල්හි 'මිදුනේය' යන සිතවෙයි. 'ජාතිය ක්‍ෂය වීය, බ්‍රහමචය්‍යීය වැස නිමවන ලදී, කටයුතු කරණලදී, මේ අත්බැවින් පසු අනික් අත්බවෙක් නැතැ'යි ද දැනගණී.

87. ලොහිච්චය, යම්සේ පර්වත මස්තකයෙක පිරිසුදු, පැහැදුනු, නොකැළඹුනු දියවිලක් වේද, එහි ඉවුරේ ඇස් ඇති පුරුෂයෙක් සිටියේ සිප්පි බෙල්ලන් හා සක් බෙල්ලන් ද, කැටකැබිලිති ද එහා මෙහා යන්නාවූ හා නැවති සිටින මසුන් රැන් ද, හැසිරෙන්නවුන් ද, නැවති තිබෙන දෑද, දක්නේය. ඔහුට මෙසේ සිතේ: මේ දියවිල පිරිසුදුය, ඉතා පැහැදිලිය, නොකැළඹුනේය, එහි මේ සිප්පි බෙල්ලන් හා සක් බෙල්ලන් ද, කැටකැබිලිති ද, මසුන් රැන් ද හැසිරෙත්, නැවති සිටිත්ය කියායි. ලොහිච්චය, එලෙසින් ම භික්‍ෂුව මෙසේ සිත එකඟ වූ කල්හි, —පෙ— ආශ්‍රවක්‍ෂයඥානය පිණිස සිත ඉදිරිපත් කෙරෙයි, ඉදිරිපත්කොට නමයි- හේ තෙමේ මේ දුකයයි තතු ලෙස දැනගණී. —පෙ— මේ ආශ්‍රවනිරොධගාමී ප්‍රතිපදාවයයි තතු ලෙස දැනගණී.

මෙසේ දක්නා, මෙසේ දන්නා ඔහුගේ සිත කාමාශ්‍රවයන් කෙරෙන් ද, භවාශ්‍රවයන් කෙරෙන් ද මිදේ, අවිද්‍යාශ්‍රවයන් කෙරෙන්ද සිත මිදේ. මිදුනු කල්හි 'මිදුනෙය' යන සිත වෙයි. 'ජාතිය ක්‍ෂයවීය, බ්‍රහමචය්‍යීය වැස නිමවන ලදී. කටයුතු කරණ ලදී, මේ අත්බැවින් පසු අනික් අත්බවෙක් නැත'යිද දැනගණී.

88. යස්මිං ඛො ලොහිච්ච සත්ථරි සාවකො එවරූපං උළාරං විසෙසං අධිගච්ඡති අයම්පි ඛො ලොහිච්ච සත්ථා යො ලොකෙ න චොදනාරහො. යො ච පනෙවරූපං සත්ථාරං චොදෙති, සො චොදනා අභූතා අතච්ඡා අධම්මිකා සාවජ්ජාති.

89. එවං වුත්තෙ ලොහිච්චො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච: සෙය්‍යථාපි භො ගොතම පුරිසො පුරිසං නරකප්පපාතං[1] පපතන්තං[2] කෙසෙසු ගහෙත්වා උද්ධරිත්වා ථලෙ පතිට්ඨාපෙය්‍ය[3] එවමෙවාහං[4] භොතා ගොතමෙන නරකප්පපාතං[5] පපතන්තො උද්ධරිත්වා ථලෙ පතිට්ඨාපිතො.

අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම. සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛන්තීති[6] එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො.

එසාහං භවන්තං ගොතමං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

ලොහිච්චසුත්තං නිට්ඨිතං ද්වාදසමං[7].

---

1. නරකපපාතං P. පපාතෙ W.
2. පතන්තං B.
3. පතිඨ්ඨපෙය්‍ය. P. W.
4. එවමෙවං භොතා P.
5. °පපාතෙ W.
6. දක්ඛින්තීති P.
7. ලොහිච්චසුත්තන්තං P.

88. ලොහිච්චය, යම් ශාස්තෘවරයෙකු නිසා ශ්‍රාවක තෙමේ මෙබඳු මහත් විශිෂ්ටත්වයකට පැමිණේද, ලොහිච්චය, මේ ශාස්තෘ තෙම ලොකයෙහි චෝදනා ලැබීමට සුදුසු නොවේ. යමෙක් මෙබඳු ශාස්තෘවරයාට චෝදනා කෙරේද ඒ චෝදනා තොමෝ අසත්‍ය වන්නීය, අභූත වන්නීය, අධාර්මික වන්නීය, වරද සහිත වන්නීය.

89. මෙසේ වදාල කල්හි ලොහිච්ච බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට මෙපවත් සැලකළේය: "භවත් ගෞතමයෙනි, නරක ප්‍රපාතයෙක්හි වැටෙන්නාවූ පුරුෂයකු යම් ශක්තිමත් පුරුෂයෙක් කෙස්වැටියෙන් අල්වාගෙණ ගොඩ නගා පෘථිවී-තලයෙහි පිහිටුවන්නේ යම්සේද, එපරිද්දෙන්ම, නරක ප්‍රපාතයෙහි වැටෙන්නාවූ මම ඉන් උපුටා (හෙවත් වළකා-භාග්‍යවතුන් වහන්සේ විසින් (දෙව්ලොවට යන මාර්ගී) තලයෙහි පිහිටුවන ලද්දේ වෙමි.

භවත් ගෞතමයන් වහන්ස, (දම්දෙසුම) ඉතාමැනව. භවත් ගෞතමයන් වහන්ස, (දම්දෙසුම) ඉතා මැනව. පින්වත් ගෞතමයන් වහන්ස, මුනින් තබන ලද භාජනයක් උඩුකුරු කොට තබන්නේ හෝ යම්සේද, වැසී තිබුණ යමක් විවෘතකොට දක්වන්නේ හෝ යම්සේද, මංමුලා වූවකුට මග කියන්නේ හෝ යම්සේද, 'ඇස් ඇත්තෝ රූපයක් දකිත්වා'යි අඳුරෙහි තෙල් පහනක් දරන්නේ හෝ යම් සේද, එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ප්‍රකාර යෙන් ධර්මය දෙශනා කරන ලද්දේය.

"මේ මම භාග්‍යවතුන් වහන්සේද ධර්මයද භික්ෂු සංඝයාද පිහිටකොට යමි. භාග්‍යවතුන් වහන්සේ අද පටන් දිවිහිම් කොට සරණ ගිය උපාසකයෙකැයි මා සලකන සේක්වා."

දොළොස්වැනි ලොහිච්ච සූත්‍රය නිමියේය.

13. තෙවිජ්ජසුත්තං

1\. එවං මෙ සුතං. එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං පඤ්චමත්තෙහි භික්ඛුසතෙහි යෙන මනසාකටං[1] නාම කොසලානං බ්‍රාහ්මණගාමො[2] තදවසරි. තත්‍ර සුදං භගවා මනසාකටෙ විහරති උත්තරෙන මනසාකටස්ස අචිරවතියා නදියා තීරෙ අම්බවනෙ.

2\. තෙන ඛො පන සමයෙන සම්බහුලා අභිඤ්ඤාතා අභිඤ්ඤාතා බ්‍රාහ්මණමහාසාලා[3] මනසාකටෙ පටිවසන්ති සෙය්‍යථිදං: චඞ්කි[4] බ්‍රාහ්මණො තාරුක්ඛො බ්‍රාහ්මණො පොක්ඛරසාති බ්‍රාහ්මණො ජානුස්සොණි[5] බ්‍රාහ්මණො තොදෙය්‍යබ්‍රාහ්මණො[6] අඤ්ඤෙ ච අභිඤ්ඤාතා අභිඤ්ඤාතා බ්‍රාහ්මණමහාසාලා[3].

3\. අථ ඛො වාසෙට්ඨභාරද්වාජානං මාණවානං[7] ජඞ්ඝාවිහාරං අනුචඞ්කමන්තානං අනුවිචරන්තානං මග්ගාමග්ගෙ කථා උදපාදි. වාසෙට්ඨො[8] මාණවො එවමාහ: අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යානිකො[9] නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතාය[10] ය්වායං අක්ඛාතො බ්‍රාහ්මණෙන පොක්ඛරසාතිනාති.

භාරද්වාජොපි[11] මාණවො එවමාහ: අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යානිකො[9] නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතාය[10] ය්වායං අක්ඛාතො බ්‍රාහ්මණෙන තාරුක්ඛෙනාති.

නෙව ඛො අසක්ඛි වාසෙට්ඨො මාණවො භාරද්වාජං මාණවං සඤ්ඤාපෙතුං න පන අසක්ඛි භාරද්වාජො මාණවො[12] වාසෙට්ඨං මාණවං සඤ්ඤාපෙතුං.

---

1. මානසකතං° S.
2. බ්‍රහ්මණ° B. (සබ්බත්ථ)
3. °සාලා V.
4. චඞ්කී S.
5. ජානුසොණි B. S.
6. තොදෙය්‍යො බ්‍ර° B. V.
7. මාණවානං ඉති න දිස්සති P. W.
8. අථ ඛො වා° V.
9. °නිකො B. V.
10. °සහබ්‍යතාය B. S. V.
11. පිකාරො නත්ථි P. W.
12. °මාණවොපි B. V.

13. තෙවිජ්ජ සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ පන්සියයක් පමණවූ මහත් භික්‍ෂු සමූහයක් සමග කොසොල් දනව්වෙහි සැරිසරා වඩිනාසේක් මනසාකට නම් වූ කොසොල් දනව් වැස්සන්ගේ බමුණු ගමට එළඹිසේක. භාග්‍යවතුන්වහන්සේ එහි මනසාකට ගමට සමීප වූ උතුරු පසෙහි අචිරවතී නදී තීරයෙහි වූ අඹවෙනෙහි වාසය කරණසේක.

2. ඒ කාලයෙහි වනාහි චඞ්කී බමුණුය, තාරුක්ඛ බමුණුය, පොක්ඛරසාති බමුණුය, ජානුසොණි බමුණුය, තොදෙය්‍ය බමුණුය යන ආදීහුද, (කුලචාරිත්‍රාදි සම්පත්තියෙන් අතිප්‍රසිඞ වූ) මහාසාර කුලවත් තවත් බොහෝ බ්‍රාහමණයෝද මනසාකට ගමෙහි වාසය කරති.

3. එක් දවසක් (පොක්ඛරසාති බමුණාගේ අතවැසි) වාසෙට්ඨ හා (තාරුක්ඛ බමුණාගේ අතවැසි) භාරද්වාජ යන මාණවකයන් දෙදෙනා ශරීරව්‍යායාම පිණිස ඔබමොබ සක්මන් කරමින් සිටියදී "මාර්ගී—අමාර්ගී" යන් ගැන කථාවක් ඔවුන් අතර පහළවිය. පොක්ඛරසාති බමුණා විසින් ප්‍රකාශිත මාර්ගය ඍජු බවත් නොවරදින බවත් නෛර්‍යාණික බවත් එහි පිළිපදින්නවුන්ට බ්‍රහ්මසහව්‍යතාව හෙවත් බ්‍රහ්මාත්ම ලාභය වන බවත් වාසෙට්ඨ මාණවකයා පැවසීය.

භාරද්වාජ මාණවකයා ද තාරුක්ඛ බමුණා විසින් දෙශිත මාර්ගය නොවරදින බවත්, ඍජු බවත් නෛර්‍යාණික බවත් එහි පිළිපදින්නවුන්ට බ්‍රහ්මයා සමග එකතැන්හි පහළවීම හෙවත් බ්‍රහ්මාත්ම ලාභය වන බවත් පැවසීය.

මෙසේ වාසෙට්ඨමාණවකයාට සවකීය කථාව භාරද්වාජ මාණවකයාට පිළිගන්වන්නට හෝ භාරද්වාජ මාණවකයාගේ කථාව වාසෙට්ඨ මාණවකයාට පිළිගන්වන්නට හෝ නොහැකි විය.

4. අථ ඛො වාසෙට්ඨො මාණවො භාරද්වාජං මාණවං ආමන්තෙසි: අයං ඛො භාරද්වාජ සමණො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො මනසාකටෙ විහරති උත්තරෙන මනසාකටස්ස අචිරවතියා නදියා තීරෙ අම්බවනෙ. තං ඛො පන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො: ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති. ආයාම භො[1] භාරද්වාජ යෙන සමණො ගොතමො තෙනුපසඞ්කමිස්සාම[2]. උපසඞ්කමිත්වා එතමත්ථං සමණං ගොතමං පුච්ඡිස්සාම. යථා නො සමණො ගොතමො බ්‍යාකරිස්සති[3] තථා නං ධාරෙස්සාමාති.

එවං භොති ඛො භාරද්වාජො මාණවො වාසෙට්ඨස්ස මාණවස්ස පච්චස්සොසි.

5. අථ ඛො වාසෙට්ඨභාරද්වාජා[4] මාණවා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදිංසු සම්මොදනීයං කථං සාරාණීයං[5] වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නො ඛො වාසෙට්ඨො මාණවො භගවන්තං එතදවොච: ඉධ භො ගොතම අම්හාකං ජඞ්ඝාවිහාරං[6] අනුචඞ්කමමානානං අනුවිචරමානානං මග්ගාමග්ගෙ කථා උදපාදි. අහං එවං වදාමි: අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යානිකො නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්මසහබ්‍යතාය ය්වායං අක්ඛාතො බ්‍රාහ්මණෙන පොක්ඛරසාතිනාති.

භාරද්වාජො මාණවො එවමාහ: අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යානිකො නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්මසහබ්‍යතාය ය්වායං අක්ඛාතො බ්‍රාහ්මණෙන තාරුක්ඛෙනාති.
එත්ථ භො ගොතම අත්ථෙව විග්ගහො අත්ථි විවාදො අත්ථි නානාවාදොති.

---

1. භොති නත්ථි S.
2. °කමාම W.
3. ව්‍යා° P. W.
4. °ද්වාජමාණවා P. B.
5. °සාරණීයං V. °සාරණියං B.
6. ජඞ්ඝම්° B. S.

4. එවිට වාසෙට්ඨ මාණවක තෙමේ භාරවාජ මාණවකයා ඇමතීය. (අමතා මෙසේ කීයේය:) "භාරද්වාජය, ශාක්‍යපුත්‍රවූ, ශාක්‍යකුලයෙන් නික්ම පැවිදිවූ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මනසාකට නම් බමුණු ගමට සමීප වූ ඊට උතුරෙන් පිහිටි අචිරවති ගඞ්ගාතීරයේ අඹවනෙහි වාසයකරණ සේක. ඒ භගවත් ගෞතමයන් වහන්සේ සම්බන්ධව මෙසේ යහපත් කීර්ති ඝෝෂාවක් උස්ව නැංගේය. (කෙසේද?) 'ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත්සේක, සම්‍යක් සම්බුද්ධ සේක, අෂ්ටවිද්‍යා පසළොස් චරණ, ධර්මයන්ගෙන් සම්පූර්ණ සේක, ශෝභන ගමන් ඇතිසේක-ලෝකත්‍රය දත්තාසේක, ශ්‍රෙෂ්ඨවූ චණ්ඩ පුරුෂයන් දමනය කිරීමෙහි දක්‍ෂසේක, දෙවි මිනිසුන්ට අනුශාසනා කරණ සේක, සම්‍යක් සම්බුද්ධසේක, භාග්‍යවත්සේකැ' (යි කියායි.) භවත් භාරද්වාජය, අපි උන්වහන්සේ හමුවීමට යමු. එහි ගොස් මේ කාරණය ශ්‍රමණ ගෞතමයන්ගෙන් විචාරමු. ශ්‍රමණ ගෞතමයෝ ඒ යම්ලෙසකින් විසඳත් ද අපි එසේ පිළිගනිමු" (යනුයි).

"එසේ යහපති, පින්වතැ"යි භාරවාජ මාණවකයා වාසෙට්ඨ මාණවකයාට පිළිතුරු දුන්නේය.

5. ඉක්බිති වාසෙට්ඨ-භාරද්වාජ මාණවකයෝ දෙදෙන භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹුනාහ. එළඹ උන්වහන්සේ සමග සතුටු සාමීචි කළහ. සතුටුවියයුතුවූ සිහිකටයුතුවූ කථාකොට නිමවා එකත්පසෙක හුන්නාහුය. එකත්පසෙක හුන්නාවූ වාසෙට්ඨ මාණවක තෙම භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැළකෙළේය: "භවද් ගෞතමයන් වහන්ස, මෙහි ජඞ්ඝාවිහරණයෙහි ඔබමොබ හැසිරෙන්නා වූ සක්මන් කරන්නාවූ අප අතර මාර්ගා—අමාර්ගයන් අරබයා කථාවක් උපන්නේය. මම මෙසේ කීමි (කෙසේදයත්:) 'පොක්ඛරසාති බ්‍රාහ්මණයා විසින් යම් මේ මාර්ගයක් කියනලද්දේද, මෙයම සෘජු මාර්ගයය, මෙයම නොවරදින මාර්ගය වේ. මේ මාර්ගයම නෛර්‍යාණිකවූයේ ඒ මාර්ගයෙහි පිළිපදින්නාහුට බ්‍රහ්මයා සමග එකතැන්හි පහළවීම හෙවත් බ්‍රහ්මාත්මලාභය ඇතිවන්නේය' යනුයි.

"භාරවාජ මාණවක තෙමේ මෙසේ කියයි. (කෙසේද?) 'තාරුක්ඛ බ්‍රාහ්මණයා විසින් යම් මේ මාර්ගයක් කියනලද්දේ නම්, මෙයම සෘජු මාර්ගය වේ, මෙයම නොවරදින මාර්ගය වේ. මේ මාර්ගයම නෛර්‍යාණිකවූයේ ඒ මාර්ගයෙහි පිළිපදින්නාහුට බ්‍රහ්මයා සමග එකතැන්හි පහළවීම හෙවත් බ්‍රහ්මාත්මලාභය වන්නේය' යනුයි.

"භවද් ගෞතමයන් වහන්ස, මේ කරුණ අරබයා විරුද්ධභාවයක්ම ඇත්තේය, විවාදයක්ම ඇත්තේය, නානා වාදයක්ම ඇත්තේය."

6. ඉති කිර වාසෙට්ඨ ත්වං එවං වදෙසි: අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යානිකො නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්ම-සහබ්‍යතාය ය්වායං අක්ඛාතො බ්‍රාහ්මණෙන පොක්ඛරසාතිනාති. භාරද්වාජො මාණවො එවමාහ: අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යානිකො නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්ම-සහබ්‍යතාය ය්වායං අක්ඛාතො බ්‍රාහ්මණෙන තාරුක්ඛෙනාති. අථ කිස්මිං පන වො වාසෙට්ඨ විග්ගහො? කිස්මිං විවාදො? කිස්මිං නානාවාදොති?

මග්ගාමග්ගෙ භො ගොතම. කිඤ්චාපි භො ගොතම බ්‍රාහ්මණා නානාමග්ගෙ පඤ්ඤපෙන්ති[1] අද්ධරියා බ්‍රාහ්මණා තිත්තිරියා බ්‍රාහ්මණා ඡන්දොකා[2] බ්‍රාහ්මණා බව්හාරිජ්ඣා[3] බ්‍රාහ්මණා. අථ ඛො සබ්බානි තානි නිය්‍යානිකානි නිය්‍යන්ති තක්කරස්ස බ්‍රහ්ම-සහබ්‍යතාය?

සෙය්‍යථාපි භො ගොතම ගාමස්ස වා නිගමස්ස වා අවිදූරෙ බහූනි චෙපි නානාමග්ගානි භවන්ති. අථ ඛො සබ්බානි තානි ගාමසමොසරණානි භවන්ති. එවමෙව ඛො භො ගොතම කිඤ්චාපි බ්‍රාහ්මණා නානාමග්ගෙ පඤ්ඤපෙන්ති අද්ධරියා බ්‍රාහ්මණා තිත්තිරියා[2] බ්‍රාහ්මණා ඡන්දොකා බ්‍රාහ්මණා[2] බව්හාරිජ්ඣා[3] බ්‍රාහ්මණා. අථ ඛො සබ්බානි තානි නිය්‍යානිකානි නිය්‍යන්ති තක්කරස්ස බ්‍රහ්මසහබ්‍යතායාති?

1. පඤ්ඤාපෙන්ති S. V. 2. ඡන්දොකා බ්‍රාහ්මණ ඡන්දවා බ්‍රාහ්මණ P. W

3. බ්‍රාහ්මචරියා බ්‍රා° P. W. බව්හරිධා S. බව්හාරිජ්ජිකා Pa.

6. වාසෙඨය, ඉදින් 'පොක්ඛරසාති බ්‍රාහමණයා විසින් යම්මේ මාර්ගයක් කියන ලද්දේ නම් මෙයම ඍජු මාර්ගය වේ, මෙයම නොවරදින මාර්ගය වේ, මේ මාර්ගයම නෛර්‍යාණික වූයේ ඒ මාර්ගයලෙස පිළිපදින්නාහුගේ බ්‍රහමසහභාවය පිණිස ඒ පවතියි'යි තෝ මෙසේ කියහි. භාරවාජ මාණවක තෙමේද 'තාරුක්ඛ බ්‍රාහමණයා විසින් යම් මාර්ගයක් කියන ලද්දේ නම් මෙයම ඍජු මාර්ගය වේ, මෙයම නොවරදින මාර්ගය වේ; මේ මාර්ගයම නෛර්‍යාණික වේ, ඒ මාර්ගය ලෙස පිළිපදින්නහුගේ බ්‍රහමාතම ලාභය පිණිස ඒ පවතියි'යි කියයි. වාසෙට්ඨය, එසේ ඇතිකල්හි කවරකරුණක් නිසා තොප දෙදෙනා අතර විවාදයෙක්ද, විග්‍රහයෙක්ද, නානා වාදයෙක් ද?

භවද් ගෞතමයන් වහන්ස, (අපේ විවාදය) මාර්ග—අමාර්ග දෙක්හිය, නොහොත් කවරක් ඍජු මාර්ගය ද කවරක් වඞ්ක මාර්ගද යන්න ගැනයි. භවද් ගෞතමයන්වහන්ස, බ්‍රාහමණයෝ වූකලී—(එනම්) අඞරිය බ්‍රාහමණයෝය, තිත්තිරිය බ්‍රාහමණයෝය, ඡන්දොක බ්‍රාහමණයෝය, බවහාරිජ්ඣා බ්‍රාහමණයෝය, යනාදීහු—නානා මාර්ගයන් පණවත් නොහොත් ඔවුන් පිළිබඳ නානාවිධ මාර්ගයෝ ඇත්තාහ. ඒ සියලු මාර්ගයෝම නෛර්‍යාණික වූවෝද? ඒ ඒ මාර්ගයෙහි පිළිපදින්නහු බ්‍රහමාතමලාභයට පැමිණෙත්ද?

ගෞතමයන් වහන්ස, ගමකට හෝ නියම්ගමකට හෝ නුදුරු තන්හි බොහෝ වූ නොයෙක් මාර්ගයෝ වෙත්ද, එසේ ඇතිකල්හි ඒ සියලු මාර්ගයෝම ගමට ඇතුලත් වන්නාහු වෙති. භවත් ගෞතමයන් වහන්ස, එපරිද්දෙන්ම ඒ ඒ බ්‍රාහමණයෝ — (එනම්:) අද්ධරිය බ්‍රාහමණයෝය, තිත්තිරිය බ්‍රාහමණයෝය, ඡන්දොක බ්‍රාහමණයෝය, බව්හාරිජ්ඣා බ්‍රාහමණයෝය යන මොවුහු — නානා මාර්ග පණවති. එසේ ඇතිකල්හි ඒ සියලු මාර්ගයෝම නෛර්‍යාණික වූවෝද? ඒ සියලු මාර්ගයෝම ඒ ඒ මාර්ගයෙහි පිළිපදින්නවුන්ගේ බ්‍රහමාතමලාභය පිණිස පවතිත්ද?

7. නිය්‍යන්තීති වාසෙට්ඨ වදෙසි?

නිය්‍යන්තීති භො ගොතම වදාමි[1].

නිය්‍යන්තීති වාසෙට්ඨ වාදෙසි?[2]

නිය්‍යන්තීති භො ගොතම වදාමි[4].

නිය්‍යන්තීති වාසෙට්ඨ වදෙසි?[3]

නිය්‍යන්තීති භො ගොතම වදාමි.

8. කිං පන වාසෙට්ඨ අත්ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං එකබ්‍රාහ්මණොපි යෙන බ්‍රහ්මා සක්ඛිදිට්ඨොති?

නොහිදං භො ගොතම.

කිං පන වාසෙට්ඨ අත්ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං එකාචරියොපි යෙන බ්‍රහ්මා සක්ඛිදිට්ඨොති?

නොහිදං භො ගොතම.

කිං පන වාසෙට්ඨ අත්ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං එකාචරියපාචරියොපි[5] යෙන බ්‍රහ්මා සක්ඛිදිට්ඨොති?

නොහිදං භො ගොතම.

කිං පන වාසෙට්ඨ අත්ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං යාව සත්තමා ආචරියමහායුගා[6] යෙන බ්‍රහ්මා සක්ඛිදිට්ඨොති?

නොහිදං භො ගොතම.

9. කිං පන වාසෙට්ඨ[7] යෙපි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයො මන්තානං කත්තාරො මන්තානං පවත්තාරො යෙසමිදං එතරහි තෙවිජ්ජා බ්‍රාහ්මණා පොරාණං[8] මන්තපදං ගීතං පවුත්තං සමිහිතං[9] තදනුගායන්ති තදනුභාසන්ති භාසිතමනුභාසන්ති වාචිතමනුවාචෙන්ති. සෙය්‍යථීදං[10] අට්ඨකො වාමකො වාමදෙවො වෙස්සාමිත්තො යමතග්ගි[11] අඞ්ගීරසො[12] භාරද්වාජො වාසෙට්ඨො කස්සපො භගු තෙපි[13] එවමාහංසු: මයමෙතං ජානාම මයමෙතං පස්සාම යත්ථ වා බ්‍රහ්මා යෙන වා බ්‍රහ්මා යහිං වා බ්‍රහ්මාති?

නො හිදං භො ගොතම.

---

1. භො ගොතම වදාමි නිය්‍යන්තීති B.
2. වාසෙට්ඨ වදෙසි නිය්‍යන්තීති B.
3. කිං නිය්‍යන්තීති වාසෙට්ඨ වදෙසි W.
4. වදාමීති S.
5. ආචරියපා° S.
6. ආචරියා මහායුගා V. සත්තමාචරිය° B. S. (සබ්බත්ථ)
7. අත්ථි යෙ කෙ තෙවි° S.
8. පුරාණං S. (සබ්බත්ථ)
9. සමිහිතං S. (සබ්බත්ථ)
10. සෙය්‍යථිදං B. V.
11. යමදග්ගි B.
12. අඞ්ගිරසො V.
13. තෙපි නං S.

7. කිමෙක් ද වාසෙට්ඨය, තෝ ඒ සියල්ල නෛර්‍යාණික යැයි කියහි ද?

භවත් ගෞතමයන් වහන්ස, නෛර්‍යාණිකයැයි කියමි.

වාසෙට්ඨය, කිමෙක්ද, නෛර්‍යාණිකයැයි කියහ ද?

භවත් ගෞතමයන් වහන්ස, නෛර්‍යාණික යැයි කියමි.

වාසෙට්ඨය, කිමෙක්ද? නෛර්‍යාණික යැයි කියහිද?

භවත් ගෞතමයන් වහන්ස, නෛර්‍යාණික යැයි කියමි.

8. වාසෙට්ඨය, කිමෙක්ද? ත්‍රිවිද්‍යක (වේදත්‍රය දත්තාවූ) බ්‍රාහ්මණයන් අතුරෙන් බ්‍රහ්මයා ඇසින් දුටු කිසියම් බ්‍රාහ්මණයෙක් ඇත්තේ ද?

භවත් ගෞතමයන් වහන්ස, එබන්දෙක් නැත.

කිමෙක්ද වාසෙට්ඨය, ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන් අතුරෙන් බ්‍රහ්මයා ඇසින් දුටු කිසියම් ආචාර්‍ය්‍යබ්‍රාහ්මණයෙක් වත් ඇත්ද?

භවත් ගෞතමයන් වහන්ස, එබන්දෙක් නැත.

කිමෙක්ද වාසෙට්ඨය, ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන් අතුරෙන් බ්‍රහ්මයා ඇසින් දුටු කිසියම් ආචාර්‍ය්‍යප්‍රාචාර්‍ය්‍යබ්‍රාහ්මණයෙක් වත් ඇත්ද?

භවත් ගෞතමයන් වහන්ස, එබන්දෙක් නැත.

කිමෙක්ද? වාසෙට්ඨය, ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන් අතුරෙන් සත්වෙනි ආචාර්‍ය්‍ය මහායුගලය දක්වා බ්‍රහ්මයා ඇසින් දුටු කිසියම් බ්‍රාහ්මණයෙක්වත් ඇත්ද?

භවත් ගෞතමයන් වහන්ස, එබන්දෙක් නැත.

9. වාසෙට්ඨය, කිමෙක්ද? මන්ත්‍ර කර්තෘ වූ, මන්ත්‍ර පැවැත්තුවා වූ නොහොත් මන්ත්‍ර ප්‍රකාශකළාවූ ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන්ගේ යම් ඒ පූර්ව ඍෂිහු වෙත්ද, දැන් ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයෝ ඔවුන්ගේ පුරාණ වූ මන්ත්‍රපදයද ගීතයද උච්චස්වරාදියෙන් කියන ලද්දද ද සංහිතාව දැයි (යන මෙතෙක් දෑ ඒ පුරාණ ඍෂීන්ගේ) ගැයුම අනුව ගයති, කියුම අනුව කියති, ඔවුන් විසින් කියන ලද්දට අනුව කියති. (ඔවුහු) කවරහුද යත්, අට්ඨකය, වාමකය, වාමදෙව්‍ය, වෙස්සාමිත්තය, යමතග්ගීය, අඞ්ගීරසය, භාරද්වාජය, වාසෙට්ඨය, කස්සපය, භගුය (යන මොව්හුය). ඔවුහු වුවද 'බ්‍රහ්මතෙමේ යම් තැනෙක වේද, යමක් කාරණකොට ගෙණ බ්‍රහ්මවේ ද, යම් ලොකයෙක්හි බ්‍රහ්ම තෙමේ වේද, අපි මෙය දනිමුය, අපි මෙය දකිමුය'යි කීවාහුද?

භවත් ගෞතමයන් වහන්ස, මෙසේ නොකීවාහුමය.

---

1. උපග්‍රන්ථය බලනු.

10. ඉති කිර වාසෙට්ඨ නත්ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං එකබ්‍රාහ්මණොපි යෙන බ්‍රහ්මා සක්ඛිදිට්ඨො[1] නත්ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං එකාචරියොපි යෙන බ්‍රහ්මා සක්ඛිදිට්ඨො[1] නත්ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං එකාචරියපාචරියොපි යෙන බ්‍රහ්මා සක්ඛිදිට්ඨො[1] නත්ථි කොචි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං යාව සත්තමා ආචරියමහායුගා යෙන බ්‍රහ්මා සක්ඛිදිට්ඨො[2].

යෙපි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයො මන්තානං කත්තාරො මන්තානං පවත්තාරො යෙසමිදං එතරහි තෙවිජ්ජා බ්‍රාහ්මණා පොරාණං මන්තපදං ගීතං පවුත්තං සමිහිතං තදනුගායන්ති තදනුභාසන්ති භාසිතමනුභාසන්ති වාචිතමනුවාචෙන්ති සෙය්‍යථිදං අට්ඨකො වාමකො වාමදෙවො වෙස්සාමිත්තො යමතග්ගි අඞ්ගිරසො භාරද්වාජො වාසෙට්ඨො කස්සපො භගු තෙපි න එවමාහංසු: මයමෙතං ජානාම මයමෙතං පස්සාම යත්ථ වා බ්‍රහ්මා යෙන වා බ්‍රහ්මා යහිං වා බ්‍රහ්මාති.

තෙ වත[3] තෙවිජ්ජා බ්‍රාහ්මණා එවමාහංසු: යං[4] න ජානාම යං[4] න පස්සාම තස්ස සහව්‍යතාය[5] මග්ගං දෙසෙම: අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යානිකො නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතායාති.

තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ? නනු එවං සන්තෙ තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අප්පාටිහීරකතං[6] භාසිතං සම්පජ්ජතීති?

අද්ධා ඛො භො ගොතම එවං සන්තෙ තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතීති.

---

1. °දිට්ඨොති නොහිදං භො ගොතම නත්ථි කොචි S.
2. දිට්ඨොති නොහිදං භො ගොතම යෙපි කිර S.
3. තෙ ච B.V.S. P.W. තෙව B.
4. යං මයං B. S.
5. සහබ්‍යතාය B. S. V.
6. අපාටි° V. අපාටිහිර° B. අපාටිහීරි° S. (සබ්බත්ථ)

10. වාසෙඨය, එබැවින් යමකු විසින් බ්‍රහ්මතෙමේ සියැසින් දක්නා ලද්දේද, ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන් අතුරෙන් එබඳු කිසි බ්‍රාහ්මණයෙක් නැත්තේය. ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන් අතුරෙන් බ්‍රහ්මයා සියැසින් දුටු කිසි ආචාර්‍ය බ්‍රාහ්මණයෙක් වත් නැත්තේය. ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන් අතුරෙන් බ්‍රහ්මයා සියැසින් දුටු කිසි ආචාර්‍යප්‍රාචාර්‍ය බ්‍රාහ්මණයෙක්වත් නැත්තේය. ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන්ගේ සත්වෙනි ආචාර්‍ය මහා යුගලය දක්වා පැවැත්තවුන් අතරද බ්‍රහ්මයා සියැසින් දුටු කිසිවෙක් නැත්තේය.

මන්ත්‍රකර්තෘ වූ, මන්ත්‍ර පැවැත්තුවා වූ නොහොත් (ශ්‍රැතානුගතව) මන්ත්‍ර ප්‍රකාශ කළාවූ, ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන්ගේ යම් ඒ පූර්ව ඍෂිහු වූවාහු නම් දැන් ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයෝ ඔවුන්ගේ පුරාණ වූ මන්ත්‍ර පදයද ගීතයද උච්චස්වරාදියෙන් කියන ලද සංහිතාවදැයි යන මෙතෙක් දෑ ඒ පූර්ව ඍෂීන් විසින් ගයන ලද්දට අනුව ගායනා කෙරෙති, ඔවුන්ගේ කියුම අනුව කියති, ඔවුන් විසින් කියන ලද්දට අනුව කියවති. ඔවුහු කවරහුද යත්: අට්ඨකය, වාමකය, වාමදෙවය, වෙස්සාමිත්තය, යමතග්ගිය, අඞ්ගිරසය, භාරද්වාජය, වාසෙඨය, කස්සපය, භගුය යන මොවුහුය. ‘බ්‍රහ්ම තෙමේ යම් තැනෙක වේද, යමක් කරණකොට ගෙණ බ්‍රහ්ම වේද, යම් ලොකයෙක්හි බ්‍රහ්මතෙමේ වේද, අපි මෙය දනිමු, අපි මෙය දකිමු’යි ඔවුහු පවා නොකීවාහුය.

එකාන්තයෙන් ඒ ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයෝ කියන්නේ මෙබන්දකි. (එනම්:) ‘අපි යමකු නොදනිමු ද, යමකු නොදක්නෙමු ද, ඔහුගේ සහභාවය පිණිස මාර්ගයක් ප්‍රකාශකරමු. (කෙසේද)? මේ ම ඍජු මාර්ගයය, මේ නොවරදින මාර්ගය ය, මේ මාර්ගයම නෛර්‍යාණික වූයේ එහි පිළිපදින්නාහුගේ බ්‍රහ්මාත්ම ලාභය පිණිස පමුණුවයි’යි (කියතී.)

වාසෙඨය, මේ කුමකැයි හඟනෙහි ද (මේ ගැන තොප අදහස් කෙසේද)? මෙසේ ඇති කල්හි ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන්ගේ භාෂිතය නොවැදගත් කීමක් බවට නොපැමිණේද?

භවත් ගෞතමයන් වහන්ස, ඒකාන්තයෙන් මෙසේ ඇති කල්හි ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන්ගේ භාෂිතය නොපිළිගත හැක්කක් බවට පැමිණේමය.

11. [1]සාධු වාසෙට්ඨ. තෙ වත[8] වාසෙට්ඨ තෙවිජ්ජා බ්‍රාහ්මණා යං න ජානන්ති යං න පස්සන්ති තස්ස සහබ්‍යතාය මග්ගං දෙසෙස්සන්ති: අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යානිකො නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්මසහබ්‍යතායාති නෙතං ඨානං විජ්ජති.

සෙය්‍යථාපි වාසෙට්ඨ අන්ධවෙණි පරම්පරසංසත්තා[2] පුරිමො පි න පස්සති මජ්ඣිමො පි න පස්සති පච්ඡිමො පි න පස්සති එවමෙව ඛො වාසෙට්ඨ අන්ධවෙණූපමං මඤ්ඤෙ[3] තෙවිජ්ජානං බ්‍රාහ්මණානං භාසිතං. පුරිමො පි න පස්සති මජ්ඣිමො පි න පස්සති පච්ඡිමො පි න පස්සති. තෙසමිදං තෙවිජ්ජානං බ්‍රාහ්මණානං භාසිතං හස්සකඤ්ඤෙව සම්පජ්ජති නාමකඤ්ඤෙව සම්පජ්ජති රිත්තකඤ්ඤෙව සම්පජ්ජති තුච්ඡකඤ්ඤෙව සම්පජ්ජති.

12. තං කිං මඤ්ඤසි වාසෙට්ඨ? පස්සන්ති තෙවිජ්ජා බ්‍රාහ්මණා චන්දිමසුරියෙ අඤ්ඤෙ චාපි බහුජනා[4] යතො ච[5] චන්දිමසුරියා උග්ගච්ඡන්ති යත්ථ ච ඔග්ගච්ඡන්ති[6] ආයාචන්ති ථොමයන්ති පඤ්ජලිකා නමස්සමානා අනුපරිවත්තන්තීති.

එවං භො ගොතම. පස්සන්ති තෙවිජ්ජා බ්‍රාහ්මණා චන්දිමසුරියෙ අඤ්ඤෙ චාපි බහුජනා[4] යතො ච චන්දිමසුරියා උග්ගච්ඡන්ති යත්ථ ච ඔග්ගච්ඡන්ති[6] ආයාචන්ති ථොමයන්ති පඤ්ජලිකා නමස්සමානා අනුපරිවත්තන්තීති.

13. තං කිං මඤ්ඤසි වාසෙට්ඨ? යං පස්සන්ති තෙවිජ්ජා බ්‍රාහ්මණා චන්දිමසුරියෙ අඤ්ඤෙ චාපි බහුජනා[4] යතො ච චන්දිමසුරියා උග්ගච්ඡන්ති යත්ථ ච ඔග්ගච්ඡන්ති[6] ආයාචන්ති ථොමයන්ති පඤ්ජලිකා නමස්සමානා අනුපරිවත්තන්ති පහොන්ති තෙවිජ්ජා බ්‍රාහ්මණා[7] චන්දිමසුරියානං සහබ්‍යතාය මග්ගං දෙසෙතුං: අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යානිකො නිය්‍යාති තක්කරස්ස චන්දිමසුරියානං සහබ්‍යතායාති?

---

1. සාධු වා° ති නත්ථි P. W.
2. පරම්පර සංසත්තා P. පරම්පරං°C.
3. අන්ධවෙණූපමං මඤ්ඤෙව W. °පමං යෙව P.
4. අඤ්ඤෙ වාපි බහුජනා P.W.
5. චකාරො නත්ථි C.
6. ඔග° P.S.
7. තෙ° බ්‍රා° ති න දිස්සති P.
8. තෙ ව වා° B. S.

11. ගෘහපති, වාසෙට්ඨ. ඒකාන්තයෙන් ඒ ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයෝ යමක් නොදනිත්ද, යමක් නොදකිත්ද එබන්දක් ලැබීම පිණිස 'මේම සෘජු මාර්ගය, මේම යොවරදින මාර්ගය, මේ මාර්ගය නෛර්‍යාණික වූයේ මේ මාර්ග ලෙස පිළිපදින්නහුට බ්‍රහ්මාත්මලාභය ඇතිවන්නේ ය'යි කියා ඔවුහු දේශනා කරති. (එහෙත්) ඔවුන්ට එබඳු මගක් දෙසිය හැකිය යන මේ කාරණය වූකලී නොවිය හැක්කකි (අසත්‍යයකි).

වාසෙට්ඨය, (එක් අන්ධයකු විසින් ගන්නාලද සැරයටිකොණ තවත් අන්ධයෙක්දැයි යන වශයෙන් පණසක් සැටක් පමණ වූ) අන්ධ පරම්පරාව යම්සේ අන්‍යෝන්‍ය සම්බන්ධනා ඇත්තී පෙරටුව යන තැනැත්තේත් නොදකිද, මැද යන තැනැත්තේත් නොදකිද, පසුව යන තැනැත්තේත් නොදකිද, වාසෙට්ඨය, එපරිද්දෙන්ම ඒ ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන්ගේ භාෂිතය අන්ධපරම්පරාවකට බඳු උපමා ඇත්තේවේ. ඒ පළමුවැන්නා ද නොදකී, මධ්‍යමයා ද නොදකී, පශ්චිමයාද නොදකී. ඒ ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයන්ගේ භාෂිතය සිනාසිය යුතු බවටම පැමිණේ, ලාමක බවටම පැමිණේ, නිරර්ථක බවටම පැමිණේ, එහෙයින් සිස් බවටම පැමිණේ.

12. වාසෙට්ඨය, මේ කුමකැයි හඟනෙහි ද? යම් කලෙක්හි චන්ද්‍ර සූර්‍යයෝ උදාවීට යෙත් ද, යම් කලෙක්හි අස්තයට යෙත්ද, (මිනිස්සු) ඔවුන්ට යාඥා කෙරෙත්ද, ඔවුන්ට ස්තුති කෙරෙත්ද, ඇදිලි බැඳගෙන නමස්කාර කරමින් ඔබමොබ පෙරළෙත්ද එබඳු චන්ද්‍රසූර්‍යයන් ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයෝත් අන්‍ය බොහෝ ජනයෝත් දකිත් ද?

එසේය, භවද් ගෞතමය. ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයෝ ද, අන්‍ය බොහෝ දෙනා ද, චන්ද්‍රසූර්‍යයන් දකිත්. යම් කලෙක්හි සඳහිරු නැගෙත් ද, යම් කලෙක්හි අස්තයට යෙත් ද, (මිනිස්සු) ඔවුන්ට යාච්ඤාකෙරෙත් ද, ස්තුති කෙරෙත් ද, ඇදිලි බැඳගෙණ නමස්කාර කරමින් ඔබමොබ පෙරළෙත් ද, එබඳු චන්ද්‍රසූර්‍යයන් ඔවුහු දකිති.

13. වාසෙට්ඨය, තෝ කුමක් සිතනෙහිද? යම් හෙයකින් ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයෝත් අන්‍ය බොහෝ ජනයෝත් යම් කලෙක්හි සඳහිරු උදාවට යෙත් ද, යම් කලෙක්හි අස්තයට යෙත් ද (යම් කලෙක්හි මිනිස්සු ඔවුනට) යාච්ඤා කෙරෙත් ද, ස්තුති කෙරෙත් ද, ඇදිලි බැඳගෙණ නමස්කාර කරමින් ඔබ මොබ පෙරළෙත් ද, එබඳු චන්ද්‍රසූර්‍යයන් දකිති, එහෙත් 'මෙයම සෘජු මාර්ගය මේම නොවරදින මගය, මේ මාර්ගය නෛර්‍යාණිකවූයේය, ඒ මාර්ග ලෙස පිළිපැදීම චන්ද්‍රසූර්‍යයන්ගේ සහභාවය පිණිස පවතිය'කියා, එම චන්ද්‍රසූර්‍යයන්ගේ සහභාවය පිණිස මාර්ගයක් දේශනාකරන්නට ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයෝ පොහොසත් වෙත් ද?

නොහිදං භො ගොතම.

14. ඉති කිර වාසෙට්ඨ යං පස්සන්ති තෙවිජ්ජා බ්‍රාහ්මණා චන්දිමසුරියෙ අඤ්ඤෙ චාපි බහුජනා යතො ච චන්දිමසුරියා උග්ගච්ඡන්ති යත්ථ ච ඔග්ගච්ඡන්ති ආයාචන්ති ථොමයන්ති පඤ්ජලිකා නමස්සමානා අනුපරිවත්තන්ති-තෙසම්පි නප්පහොන්ති[1] චන්දිමසුරියානං සහව්‍යතාය මග්ගං දෙසෙතුං: අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යානිකො නිය්‍යාති තක්කරස්ස චන්දිමසුරියානං සහව්‍යතායාති. කිං පන[2] න කිර තෙවිජ්ජෙහි බ්‍රාහ්මණෙහි බ්‍රහ්මා සක්ඛිදිට්ඨො න පි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං ආචරියෙහි බ්‍රහ්මා සක්ඛිදිට්ඨො න පි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං ආචරියපාචරියෙහි බ්‍රහ්මා සක්ඛිදිට්ඨො න පි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං යාව සත්තමා-ආචරියමහායුගෙහි බ්‍රහ්මා සක්ඛිදිට්ඨො යෙ පි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයො මන්තානං කත්තාරො මන්තානං පවත්තාරො යෙසමිදං එතරහි තෙවිජ්ජා බ්‍රාහ්මණා පොරාණං මන්තපදං ගීතං පවුත්තං සමිහිතං තදනුගායන්ති තදනුභාසන්ති භාසිතමනුභාසන්ති වාචිතමනුවාචෙන්ති-සෙය්‍යථීදං අට්ඨකො වාමකො වාමදෙවො වෙස්සාමිත්තො යමතග්ගි අඞ්ගීරසො භාරද්වාජො වාසෙට්ඨො කස්සපො භගු-තෙපි න[3] එවමාහංසු: මයමෙතං ජානාම මයමෙතං පස්සාම යත්ථ වා බ්‍රහ්මා යෙන වා බ්‍රහ්මා යහිං වා බ්‍රහ්මාති. තෙ වත[4] තෙවිජ්ජා බ්‍රාහ්මණා එවමාහංසු: යං න ජානාම යං න පස්සාම තස්ස සහව්‍යතාය මග්ගං දෙසෙම: අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යානිකො නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතායාති.[5]

තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ? නනු එවං සන්තෙ තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතීති?

---

1. න පහොන්ති S.
2. ඉති පන B.V.
3. නං S.
4. තෙ ච B.V.S.
5. තක්කරස්ස සහබ්‍යතායාති B.

භවද් ගෞතමයන් වහන්ස, ඔවුහු එසේ පොහොසත් නොවෙති.

14. වාසෙඨය, මෙසේ ඒ ත්‍රිවිද්‍යක බ්‍රාහමණයෝත් අන්‍යවූ බොහෝ ජනයෝත් සඳහිරු නැගෙන කල්හිද සඳහිරු අස්තයට යන කල්හිද, ‘පින්වත් චන්‍ද්‍රය, උදාවනු මැනව, පින්වත් සූර්‍යය උදාවනු මැනව’ යනාදීන් ආයාචනා කරන කල්හිද, ස්තුති කරන කල්හිද, ඇඳිලි බැඳගෙන නමස්කාර කරමින් ඔබ්බෙමොබ පෙරළෙනවිටද ඒ චන්ද්‍රසූර්‍යයන් දකිති. එහෙත් ඒ චන්ද්‍රසූර්‍යයන්ගේ සහභාවය පිණිස ‘මේම සෘජු මාර්ගය, මෙම නොවරදින මාර්ගය, මේ මාර්ගයම නෛර්‍යාණිකවූයේ ඒ මාර්ගය ලෙස පිළිපැදීම චන්ද්‍රසූර්‍යයන්ගේ සහභාවය පිණිස පවතීය’ කියා මාර්ගයක් දේශනා කරන්නට අපොහොසත් වෙති. කිමෙක්ද? ත්‍රිවිද්‍යක බ්‍රාහමණයන් විසින් බ්‍රහ්මතෙමේ ඇසින් නො දක්නා ලද්දේය, ත්‍රිවිද්‍යක බ්‍රාහමණයන්ගේ ආචාර්‍යයන් විසින් ද බ්‍රහමතෙමේ ඇසින් නො දක්නාලද්දේය, ත්‍රිවිද්‍යක බ්‍රාහමණයන්ගේ ආචාර්‍ය ප්‍රාචාර්‍යයන් විසින් ද බ්‍රහමතෙමේ ඇසින් නො දක්නාලද්දේ ය, ත්‍රිවිද්‍යක බ්‍රාහමණ-යන්ගේ සත්වෙනි ආචාර්‍ය මහායුගලය දක්වා පැවැත්තවුන් විසින් ද බ්‍රහමතෙමේ ඇසින් නො දක්නා ලද්දේය. මන්ත්‍ර කර්තෘවූ, මන්ත්‍ර ප්‍රකාශකවූ, ත්‍රිවිද්‍යක බ්‍රාහමණයන්ගේ යම් ඒ පූර්වාචාර්‍යවූවාහු නම් දැන් ත්‍රිවිද්‍යක බ්‍රාහමණයෝ ඔවුන්ගේ පුරාණවූ මන්ත්‍රපදය ද ගීතයද ප්‍රකාශයෙන් කියන ලද්ද ද සංහිතාව ද ඒ අනුව ගායනා කෙරෙති, ඒ අනුව භාෂණය කෙරෙති, කියන ලද්දට අනුව කියති, කියවන ලද්දට අනුව කියවති. ඔවුහු නම්: අට්ඨකය, වාමකය, වාමදෙවය, වෙස්සාමිත්‍රය, යමතග්ගිය, අඞගීරසය, භාරද්වාජය, වාසෙඨය, කාස්සපය, භගුය යන මොහුයි. ඔවුහු ද ‘බ්‍රහමතෙමේ යම් තැනෙක්හිවේ ද, යමක් කරණකොට බ්‍රහම නම් වේද, යම් ලෝකයෙක්හි බ්‍රහමතෙමේ වේද, මෙය අපි දනිමු, මෙය අපි දකිමු’ය යි නොකීහ. එකාන්තයෙන් ඒ ත්‍රිවිද්‍යක බ්‍රාහමණයෝ කියන්නේ මෙවැන්නකි (එනම්:) ‘අපි යමක් නොදනිමුද, යමක් නොදකිමුද, එහි සහභාවය පිණිස මාර්ගය දේශනා කරමු. මෙය ඍජු මාර්ගය වේ, නොවරදින මාර්ගය වේ. මේ මාර්ගයම නෛර්‍යාණිකවූයේ ඒ නෛර්‍යාණික මාර්ගය ලෙස පිළිපදින්න හුට බ්‍රහමාත්මලාභය ඇතිවේය’යි (යන මෙවැන්නකි).

වාසෙඨය, තෝ කුමක් හඟනෙහි ද? මෙසේ ඇතිකල්හි ත්‍රිවිද්‍යක බ්‍රාහමණයන්ගේ භාෂිතය නොවැදගත් බවට පැමිණියේ නොවේ ද?

අද්ධා ඛො භො ගොතම එවං සන්තෙ තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතීති.

15. සාධු වාසෙට්ඨ. තෙ වත වාසෙට්ඨ තෙවිජ්ජා බ්‍රාහ්මණා යං න ජානන්ති යං න පස්සන්ති තස්ස සහබ්‍යතාය මග්ගං දෙසෙස්සන්ති: අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යානිකො නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්මසහබ්‍යතායාති නෙතං ඨානං විජ්ජති.

16. සෙය්‍යථාපි වාසෙට්ඨ පුරිසො එවං වදෙය්‍ය: අහං ඛො[1] යා ඉමස්මිං ජනපදෙ ජනපදකල්‍යාණී තං ඉච්ඡාමි තං කාමෙමීති. තමෙනං එවං වදෙය්‍යුං: අම්භො පුරිස යං ත්වං ජනපදකල්‍යාණිං ඉච්ඡසි කාමෙසි ජානාසි තං ජනපදකල්‍යාණිං ඛත්තියී[2] වා වෙස්සී[3] වා බ්‍රාහ්මණී[4] වා සුද්දී[5] වාති?[6] ඉති පුට්ඨො නොති වදෙය්‍ය.

තමෙනං එවං වදෙය්‍යුං: අම්භො පුරිස යං ත්වං ජනපදකල්‍යාණිං ඉච්ඡසි කාමෙසි ජානාසි තං ජනපදකල්‍යාණිං එවංනාමා[7] එවංගොත්තාති[8] වා දීඝා වා රස්සා වා මජ්ඣිමා වා[9] කාළි[10] වා සාමා වා මඞ්ගුරච්ඡවී වාති අමුකස්මිං ගාමෙ වා නිගමෙ වා නගරෙ වා ති? ඉති පුට්ඨො නොති වදෙය්‍ය.

තමෙනං එවං වදෙය්‍යුං: අම්භො පුරිස යං ත්වං න ජානාසි න පස්සසි තං ත්වං ඉච්ඡසි කාමෙසීති? ඉති පුට්ඨො ආමොති[11] වදෙය්‍ය.

තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ? නනු එවං සන්තෙ තස්ස පුරිසස්ස අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතීති?

අද්ධා ඛො භො ගොතම එවං සන්තෙ තස්ස පුරිසස්ස අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතීති.

1. අයං ඛො B. ඛොති නත්ථි S.P.W.
2. ඛත්තියිං S.
3. වෙස්සිං S.
4. බ්‍රාහ්මිනිං S.
5. සුද්දිං S.
6. ඉතිති නත්ථි P.
7. °නාමා වා S.
8. °ගොත්තා වා S.
9. ම° වාති න දිස්සති P.
10. කාළි S.
11. ආමොති S.

භවද් ගෞතමයන් වහන්ස, ඒකාන්තයෙන් මෙසේ ඇති කල්හි ත්‍රිවිද්‍යක බ්‍රාහමණයන්ගේ භාෂිතය නොවැදගත් බවට පැමිණියේය.

15. යහපති, වාසෙඨය, ඒකාන්තයෙන් ඒ ත්‍රිවිද්‍යක බ්‍රාහමණයෝ තමන් නොදත්නාවූ තමන් නොදක්නාවූ දෙයක් ලැබීම පිණිස 'මෙම සෘජු මාර්‍ගය ය, නොවරදින මාර්‍ගයය, මේ මාර්‍ගයම නෛර්‍යාණිකවූයේය, එය කරන්නහුට බ්‍රහමාතම- ලාභය වේය'යි මෙසේ මාර්‍ගයක් දේශනා කරති යනු අවිද්‍යමාන වූවකි (නොවිය හැක්කකි).

16. වාසෙඨය, යම් පුරුෂයෙක් 'මේ ජනපදයෙහි යම් ඒ ජනපදකල්‍යාණියක් වේ ද මම ඈ කැමැත්තෙමි, රුචිකෙරෙ- මි'යි කියන්නේ ද, ඒ පුරුෂයාට (මිනිස්සු) මෙසේ කියන්නා- හුය. (කෙසේද?) 'එම්බල පුරුෂය, තෝ යම් ජනපදකල්‍යාණියක් රුචි කෙරෙහි ද, කැමැත්තෙහි ද, ඕ නොමෝ කැත්කුල හෝ බමුණුකුල හෝ වෛශ්‍යකුල හෝ ශුද්‍රකුල හෝ ඇත්තිය කියා දන්නෙහි ද?' මෙසේ විචාරණලද්දේ 'නැතැ'යි කියන්නේය.

එවිට ඕහට මෙසේ කියන්නාහුය. 'එම්බල පුරුෂය, තෝ යම් ඒ ජනපදකල්‍යාණියක් රුචි කෙරෙහි ද, කැමැත්තෙහි ද ඕ තොමෝ මෙබඳු නම් ඇත්තිය, මෙබඳු ගොත් ඇත්තිය කියා හෝ උස්ය, මිටිය කියා හෝ, මධ්‍යමය කියා හෝ කළුය කියා හෝ ස්‍යාමවණී ඇත්තිය කියා හෝ මඟුරුවන් සැව ඇත්තිය කියා හෝ අසවල් ගමෙහිය කියා හෝ අසවල් නියම්ගමෙහිය කියා හෝ අසවල් නුවරය කියා හෝ දන් නෙහිද?' මෙසේ විචාරණ ලද්දේ 'නැතැ'යි කියන්නේය.

එවිට ඕහට මෙසේ කියන්නාහුය: 'එම්බා පුරුෂය, තෝ නො දන්නාවූ නොදක්නාවූ ස්ත්‍රියක් රුචිකෙරෙහි ද? කැමැත්තෙහි ද?'. මෙසේ විචාරණලද්දේ 'එසේය'යි කියන්නේය.

වාසෙඨය තෝ කුමකැයි සිතන්නෙහි ද? මෙසේ ඇති කල්හි ඒ පුරුෂයාගේ භාෂිතය නොපිළිගතහැකි බවට නොපැමිණියේ නොවේද?

භවද් ගෞතමයන් වහන්ස, ඒකාන්තයෙන් මෙසේ ඇති කල්හි ඒ පුරුෂයාගේ භාෂිතය නොපිළිගත හැකි බවට පැමිණියේය.

17. එවමෙව ඛො වාසෙට්ඨ න කිර තෙවිජ්ජෙහි බ්‍රාහ්මණෙහි බ්‍රහ්මා සක්ඛිදිට්ඨො. නපි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං ආචරියෙහි බ්‍රහ්මා සක්ඛිදිට්ඨො. නපි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං ආචරියපාචරියෙහි බ්‍රහ්මා සක්ඛිදිට්ඨො. නපි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං යාව සත්තමා-ආචරියමහායුගෙහි බ්‍රහ්මා සක්ඛිදිට්ඨො. යෙපි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයො මන්තානං කත්තාරො මන්තානං පවත්තාරො යෙසමිදං එතරහි තෙවිජ්ජා බ්‍රාහ්මණා පොරාණං මන්තපදං ගීතං පවුත්තං සමිහිතං තදනුගායන්ති තදනුභාසන්ති භාසිතමනුභාසන්ති වාචිතමනුවාචෙන්ති සෙය්‍යථීදං අට්ඨකො වාමකො වාමදෙවො වෙස්සාමිත්තො යමතග්ගි අඞ්ගීරසො භාරද්වාජො වාසෙට්ඨො කස්සපො භගු තෙපි න එවමාහංසු: මයමෙතං ජානාම මයමෙතං පස්සාම යත්ථ වා බ්‍රහ්මා යෙන වා බ්‍රහ්මා යහිං වා බ්‍රහ්මාති. තෙ වත තෙවිජ්ජා බ්‍රාහ්මණා එවමාහංසු: යං න ජානාම යං න පස්සාම තස්ස සහව්‍යතාය මග්ගං දෙසෙම: අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යානිකො නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතායාති.

තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ? නනු එවං සන්තෙ තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතීති?

අද්ධා ඛො භො ගොතම එවං සන්තෙ තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතීති.

18. සාධු වාසෙට්ඨ. තෙ වත[1] වාසෙට්ඨ තෙවිජ්ජා බ්‍රාහ්මණා යං න ජානන්ති යං න පස්සන්ති තස්ස සහව්‍යතාය මග්ගං දෙසෙස්සන්ති:[2] අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යානිකො නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්මසහව්‍යතායාති නෙතං ඨානං විජ්ජති.

---

1. තෙව B. S. V. 2. දෙසිස්සන්ති B. V.

17. වාසෙඨය, එපරිද්දෙන්ම ත්‍රිවිද්‍යක බ්‍රාහමණයන් විසින් බ්‍රහමතෙමේ ඇසින් නොදක්නා ලදී. ත්‍රිවිද්‍යක බ්‍රාහමණයන්ගේ ආචාය්‍යී බ්‍රාහමණයන් විසින් ද බ්‍රහමතෙමේ ඇසින් නොදක්නා ලදී. ත්‍රිවිද්‍යක බ්‍රාහමණයන්ගේ ආචාය්‍යී ප්‍රාචාය්‍යීයන් විසින් ද බ්‍රහමතෙමේ ඇසින් නොදක්නා ලදී. ත්‍රිවිද්‍යක බ්‍රාහමණයන්ගේ සත්වෙනි ආචාය්‍යී මහායුගලය දක්වා පැවැත්තවුන් විසින් ද බ්‍රහමතෙමේ ඇසින් නො දක්නා ලදී. මන්ත්‍රකර්තෘවූ මන්ත්‍ර පැවැත්තුවාවූ ත්‍රිවිද්‍යක බ්‍රාහමණයන්ගේ යම් ඒ පූර්ව ඍෂිහු වෙත්නම්, දැන් ත්‍රිවිද්‍යක බ්‍රාහමණයෝ පුරාණවූ මන්ත්‍ර පදයද, ගීතයද, උච්චස්වරාදි වශයෙන් ප්‍රකාශයෙන් කියන ලද්දද සංහිතාව දැයි යන (මෙතෙක් දැ) ඒ පූර්වඍෂීන් අනුව ගායනා කෙරෙති, අනුව භාෂනය කෙරෙති කියන ලද්දට අනුව කියති, කියවන ලද්දට අනුව කියවති, (එනම්:) අට්ඨකය, වාමකය, වාමදෙවය, වෙස්සාමිත්‍රය, යමතග්ගිය, අඞ්ගිරසය, භාරද්වාජය, වාසෙඨය, කාස්සපය, භගුය යන මොව්හුය. 'බ්‍රහමතෙමේ යම් තැනෙකවේ ද, යමක් කරණකොටගෙණ බ්‍රහමවේ ද, යම් ලොකයෙක්හි බ්‍රහමතෙමේ වේද යන මෙය අපි දනිමු, අපි දකිමුය'යි ඒ පූර්වකාලීන ඍෂිහු පවා නොකීහ. එකාන්තයෙන් ඒ ත්‍රිවිද්‍යක බ්‍රාහමණයෝ කියන්නේ මෙවැන්නක (එනම්:) 'අපි යමකු නොදනිමු ද, නොදකිමු ද, එවැන්නකුගේ සහභාවය පිණිස මේම ඍජුමගය, මේම නොවරදින මගය, මෙයම නෛය්‍යාණික වූයේ මෙලෙස පිළිපදින්නහුට බ්‍රහමාත්මලාභය අත්වේය මාර්ගයක් දෙසමු' (යන්නකි).

වාසෙඨය, තෝ කුමක් හඟතෙහි ද? මෙසේ ඇතිකල්හි ත්‍රිවිද්‍යක බ්‍රාහමණයන්ගේ භාෂිතය නොවැදගත් බවට පැමිණෙන්නේ නොවේ ද?

භවද් ගෞතමයන් වහන්ස, එකාන්තයෙන් මෙසේ ඇති කල්හි ත්‍රිවිද්‍යක බ්‍රාහමණයන්ගේ භාෂිතය නොවැදගත් බවට පැමිණේමය.

18. මැනව, වාසෙඨය. එකාන්තයෙන් ඒ ත්‍රිවිද්‍යක බ්‍රාහමණයෝ යමක් නොදනිත් ද නොදකිත් ද එවැන්නකගේ සහභාවය පිණිස 'මේම ඍජු මාර්ගය, මේම නොවරදින මගය, මෙයම නෛය්‍යාණිකවූයේ, මෙලෙස පිළිපදින්නහුට බ්‍රහමාත්ම-ලාභය අත්වේය' කියා මාර්ගයක් දෙසත්නහුය. ඒ මේ දේ අවිද්‍යමාන වූවකි (එබන්දක් ඔවුන්ට නොකළහැකි වන්නේය).

19. සෙය්‍යථාපි වාසෙට්ඨ පුරිසො චාතුම්මහාපථෙ[1] නිස්සෙණිං කරෙය්‍ය පාසාදස්ස ආරොහණාය. තමෙනං එවං වදෙය්‍යුං: අම්භො පුරිස යස්ස[2] ත්වං පාසාදස්ස ආරොහනාය නිස්සෙණිං කරොසි ජානාසි[3] තං පාසාදං පුරත්ථිමාය වා[4] දිසාය දක්ඛිණාය වා[4] දිසාය පච්ඡිමාය වා[4] දිසාය උත්තරාය වා[4] දිසාය උච්චො වා නීචො වා මජ්ඣිමො[5] වාති?

ඉති පුට්ඨො නොති වදෙය්‍ය. තමෙනං එවං වදෙය්‍යුං: අම්භො පුරිස යං ත්වං න ජානාසි න පස්සසි තස්ස ත්වං පාසාදස්ස ආරොහණාය නිස්සෙණිං කරොසීති? ඉති පුට්ඨො ආමාති[6] වදෙය්‍ය.

තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ? නනු එවං සන්තෙ තස්ස පුරිසස්ස අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතීති?

අද්ධා ඛො භො ගොතම එවං සන්තෙ තස්ස පුරිසස්ස අප්පාටිහිරකතං භාසිතං සම්පජ්ජතීති.

20. එවමෙව ඛො වාසෙට්ඨ න කිර තෙවිජ්ජෙහි බ්‍රාහ්මණෙහි බ්‍රහ්මා සක්ඛිදිට්ඨො නපි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං ආචරියෙහි බ්‍රහ්මා සක්ඛිදිට්ඨො නපි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං ආචරියපාචරියෙහි බ්‍රහ්මා සක්ඛිදිට්ඨො නපි තෙවිජ්ජානං බ්‍රාහ්මණානං යාව සත්තමා ආචරියමහායුගෙහි බ්‍රහ්මා සක්ඛිදිට්ඨො. යෙ පි කිර තෙවිජ්ජානං බ්‍රාහ්මණානං පුබ්බකා ඉසයො මන්තානං කත්තාරො මන්තානං පවත්තාරො යෙසමිදං එතරහි තෙවිජ්ජා බ්‍රාහ්මණා පොරාණං මන්තපදං ගීතං පවුත්තං සමිහිතං තදනුගායන්ති තදනුභාසන්ති භාසිතමනුභාසන්ති වාචිතමනුවාචෙන්ති සෙය්‍යථීදං අට්ඨකො වාමකො වාමදෙවො වෙස්සාමිත්තො යමතග්ගි අඞ්ගීරසො භාරද්වාජො වාසෙට්ඨො කස්සපො භගු තෙ පි න එවමාහංසු: මයමෙතං ජානාම මයමෙතං පස්සාම යත්ථ වා බ්‍රහ්මා යෙන වා බ්‍රහ්මා යහිං වා බ්‍රහ්මාති.

---

1. චාතුමහා° V.
2. යස්ස පා° P. W. 'යං ත්වං' S.
3. ජානාසීති නත්ථි W.
4. වාති නත්ථි P.
5. මජ්ඣෙ P.
6. ආමොති S.

19. වාසෙඨය, යම් පුරුෂයෙක් සතරමංසලක පහය-කට නැඟීම පිණිස හිණක් කරන්නේ වේද ඔහට (මිනිස්සු) මෙසේ කියන්නාහුය: 'එම්බා පුරුෂය, තෝ යම් පහයකට නැඟීම පිණිස හිණක් කෙරෙහි ද, ඒ පහය පෙරදිගය කියා හෝ දකුණුදිගය කියා හෝ අපරදිගය කියා හෝ උතුරුදිගය කියා හෝ, උස්ය කියා හෝ මිටිය කියා හෝ මධ්‍යමය කියා හෝ දන්නෙහිද?' (කියාහි).

මෙසේ විමසනලද්දේ ඔහු 'නැතැ'යි කියන්නේ නම් ඔහට (මිනිස්සු) මෙසේ කියන්නාහුය: 'එම්බල පුරුෂය, තෝ යම් පහයක් නොදන්නේ ද නො දක්නේ ද, ඒ පහයකට නැඟීම පිණිස හිණක් කෙරෙහි ද?' මෙසේ විමසන ලද්දේ 'එසේය'යි හෙතෙම කියයි.

වාසෙඨය, තෝ කුමකැයි හඟනෙහි ද? මෙසේ ඇතිකල්හි ඒ පුරුෂයාගේ භාෂිතය නොවැදගත් බවට නොපැමිණේ ද?

භවද් ගෞතමයන් වහන්ස, ඒකාන්තයෙන් මෙසේ ඇති කල්හි ඒ පුරුෂයාගේ භාෂිතය නොවැදගත් බවට පැමිණේමය.

20. වාසෙඨය, එපරිද්දෙන්ම ත්‍රිවිද්‍යක බ්‍රාහමණයන් විසින් බ්‍රහමතෙමේ ඇසින් නොදක්නා ලදී. ත්‍රිවිද්‍යක බ්‍රාහමණ-යන්ගේ ආචාර්‍ය්‍යයන් විසින් ද බ්‍රහමතෙමේ ඇසින් නො දක්නා ලදී. ත්‍රිවිද්‍යක බ්‍රාහමණයන්ගේ ආචාර්‍ය්‍යප්‍රාචාර්‍ය්‍යයන් විසින් ද බ්‍රහමතෙමේ ඇසින් නොදක්නා ලදී. ත්‍රිවිද්‍යක බ්‍රාහමණයන්ගේ සත්වෙනි මහා ආචාර්‍ය්‍යයුගලය දක්වා පැවැත්ත-වුන් විසින් ද බ්‍රහමතෙමේ ඇසින් නොදක්නා ලදී. මන්ත්‍රකර්තෘවූ, මන්ත්‍රපැවැත්තුවාවූ ත්‍රිවිද්‍යක බ්‍රාහමණයන්ගේ යම් ඒ පූර්ව ඍෂීහු වෙත් ද, යම් කෙනෙකුන්ගේ පුරාණවූ මන්ත්‍රපදය ද, ගීතය ද, උච්චස්වරාදි වශයෙන් ඔවුන් විසින් කියන ලද්ද ද, සංහිතාවයයි (යන මෙතෙක් ද්‍රව්‍ය) දැන් ත්‍රිවිද්‍යක බ්‍රාහමණයෝ ඊට අනුව ගායනා කෙරෙත් ද, ඊට අනුව භාෂනාය කෙරෙත් ද, ඔවුන් විසින් කියන ලද්දට අනුව කියත් ද කියවන ලද්දට අනුව කියවත් ද, අට්ඨකය, වාමකය, වාමදේවය, වෙස්සාමිත්‍රය, යමතග්ගිය, අඞ්ගිරසය, භාරද්වාජය, වාසෙඨය, කස්සපය, භගුය යන ඒ මේ පූර්වඍෂීහු පවා 'යම් තැනෙක්හි බ්‍රහ්මතෙමේ වේනම්, යමක් කාරණකොට බ්‍රහම වේ නම්, යම් ලොකමයෙක්හි බ්‍රහමතෙමේ වේ නම් මේ කාරණය අපි දනිමු, අපි මෙය දකිමුය'යි නොකීවාහ.

තෙ වත[1] තෙවිජ්ජා බ්‍රාහ්මණා එවමාහංසු: යං න ජානාම යං න පස්සාම තස්ස බ්‍රහ්මසහබ්‍යතාය මග්ගං දෙසෙම අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යානිකො නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්මසහබ්‍යතායාති.

තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ? නනු එවං සන්තෙ තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතීති?

අද්ධා ඛො භො ගොතම එවං සන්තෙ තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතීති.

21. සාධු වාසෙට්ඨ. තෙ වත[1] වාසෙට්ඨ තෙවිජ්ජා බ්‍රාහ්මණා යං න ජානන්ති යං න පස්සන්ති තස්ස සහබ්‍යතාය මග්ගං දෙසෙස්සන්ති[2] අයමෙව උජුමග්ගො අයමඤ්ජසායනො නිය්‍යානිකො නිය්‍යාති තක්කරස්ස බ්‍රහ්මසහබ්‍යතායාති නෙතං ඨානං විජ්ජති.

22. සෙය්‍යථාපි වාසෙට්ඨ අයං අචිරවතී නදී පූරා උදකස්ස සමතිත්තිකා[3] කාකපෙය්‍යා. අථ[4] පුරිසො ආගච්ඡෙය්‍ය පාරත්ථිකො [5]පාරගවෙසී පාරගාමී පාරං [6]තරිතුකාමො. සො ඔරිමෙ[7] තීරෙ ඨිතො පාරිමං තීරං අව්හෙය්‍ය: එහි පාරාපාරං එහි පාරාපාරන්ති. තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ? අපි නු තස්ස පුරිසස්ස අව්හායනහෙතු[8] වා ආයාචනහෙතු වා පත්ථනහෙතු වා අභිනන්දනහෙතු වා අචිරවතියා නදියා පාරිමං තීරං ඔරිමං තීරං ආගච්ඡෙය්‍යාති?

---

1. තෙ ව B. S. V.
2. දෙසි° B. V.
3. °තිත්තිකා Pa. S.
4. අථ ඛො S.
5. පාරගාමී පාරගවෙසී B. පාරගාමීති නත්ථි V.
6. පාරපාරා V.
7. ඔරිම° P.
8. අව්හාන° Pa.

එබැවින් ඒ ත්‍රිවිද්‍යක බ්‍රාහමණයෝ කියන්නේ මෙපමණකි (එනම්:) මෙම සෘජු මාර්ගය වේ. මෙම නොවරදින මාර්ගය වේ. මේ මාර්ගයම නෛර්යාණිකවූයේ, මෙලෙස පිළිපදින්නහුට බ්‍රහ්මාත්මලාභය වේ. යමක් අපි නොදනිමු ද නොදකිමු ද අප දෙශනා කරන්නේත් එබඳු දේකට යන මාර්ගයකි (කියාහි).

වාශෙෂ්ඨය, තෝ කුමක් සිතනෙහි ද? මෙසේ ඇති කල්හි ත්‍රිවිද්‍යක බ්‍රාහමණයන්ගේ භාෂිතය නොවැදගත් බවට නො පැමිණේ ද?

භවද් ගෞතමයන් වහන්ස, එකාන්තයෙන් මෙසේ ඇති කල්හි ත්‍රිවිද්‍යක බ්‍රාහමණයන්ගේ භාෂිතය නොවැදගත් බවට පැමිණේමය.

21. වාසෙෂ්ඨය, මැනව. වාසෙෂ්ඨය, ඒ ත්‍රිවිද්‍යක බ්‍රාහමණයෝ තමන් නොදන්නාවූ ද, නොදක්නාවූ ද යමක සහභාවය පිණිස 'මෙම සෘජුමාර්ගයය, මෙම නොවරදින මාර්ගයය, මේ මාර්ගයම නෛර්යාණිකවූයේ මේ මාර්ගය ලෙස පිළිපදින්නහුට බ්‍රහ්මාත්මලාභය ලැබේය'යි දෙශනාකරන්නාහු නම් ඒ මේ කාරණය විද්‍යමාන නොවේ (මේ දේ නො සිදුවිය හැක්කකි).

22. වාසෙෂ්ඨය, මේ අචිරවතී ගඞ්ගානොමෝ ජලයෙන් පිරුණි, ජලයෙන් වැසුනු තීර්ථයන් ඇත්තී, ගංතෙර සිට කවුඩන් විසින් බොන්නට හැකි ජලය ඇති වන්නී ද, එකල්හි පරතෙර යාමෙන් වැඩක් ඇති, පරතෙර සොයන, පරතෙරට යන, පරතෙරට තරණය කරණු කැමති පුරුෂයෙක් එනනේය. ඒ පුරුෂතෙමේ මෙතෙර සිටිමින්, "එම්බා පරතෙර, මෙතෙරට එව, පරතෙර මෙතෙරට එව"යි අඩගා කියන්නේය. වාසෙෂ්ඨය, තෝ කුමක් සිතන්නෙහි ද? කිම, ඒ පුරුෂයාගේ කැඳවීම නිසා හෝ යාච්ඤාකිරීම නිසා හෝ, ප්‍රාර්ථනාකිරීම නිසා හෝ ඔහු වැඩියක් සතුටුකිරීම නිසා හෝ අචිරවතී ගඞ්ගාවගේ පරතෙර මෙතෙරට එන්නේ ද?

නොහිදං භො ගොතම.

23. එවමෙව ඛො වාසෙට්ඨ තෙවිජ්ජා බ්‍රාහ්මණා යෙ ධම්මා බ්‍රාහ්මණකරණා[1] තෙ ධම්මෙ පහාය වත්තමානා යෙ ධම්මා අබ්‍රාහ්මණකරණා[1] තෙ ධම්මෙ සමාදාය වත්තමානා එවමාහංසු: ඉන්දමව්හයාම සොමමව්හයාම වරුණමව්හයාම ඊසානමව්හයාම පජාපතිමව්හයාම බ්‍රහ්මමව්හයාම[2] මහිද්ධිමව්හයාම[3] යමමව්හයාමාති[4]. තෙ වත වාසෙට්ඨ තෙවිජ්ජා බ්‍රාහ්මණා යෙ ධම්මා බ්‍රාහ්මණකරණා[1] තෙ ධම්මෙ පහාය වත්තමානා යෙ ධම්මා අබ්‍රාහ්මණකරණා[1] තෙ ධම්මෙ සමාදාය වත්තමානා අව්හායනහෙතු වා ආයාචනහෙතු වා පත්ථනහෙතු වා අභිනන්දනහෙතු වා කායස්ස භෙදා පරම්මරණා බ්‍රහ්මානං සහව්‍යූපගා[5] භවිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

24. සෙය්‍යථාපි වාසෙට්ඨ අයං අචිරවතී නදී පූරා උදකස්ස සමතිත්තිකා කාකපෙය්‍යා. අථ පුරිසො ආගච්ඡෙය්‍ය පාරත්ථිකො පාරගවෙසී පාරගාමී පාරං තරිතුකාමො. සො ඔරිමතීරෙ[6] දළ්හාය අන්දුයා[7] පච්ඡාබාහං ගාළ්හබන්ධනං බද්ධො[8] තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ? අපි නු සො පුරිසො අචිරවතියා නදියා ඔරිමතීරා[9] පාරිමං තීරං ගච්ඡෙය්‍යාති?

නොහිදං භො ගොතම.

25. එවමෙව ඛො වාසෙට්ඨ පඤ්චිමෙ කාමගුණා අරියස්ස විනයෙ අන්දූතිපි[10] වුච්චන්ති බන්ධනන්තිපි වුච්චන්ති. කතමෙ පඤ්ච? චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. සොතවිඤ්ඤෙය්‍යා සද්දා —පෙ— ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා —පෙ— ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා —පෙ— කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. ඉමෙ ඛො වාසෙට්ඨ පඤ්ච කාමගුණා අරියස්ස විනයෙ අන්දූතිපි[10] වුච්චන්ති බන්ධනන්තිපි වුච්චන්ති. ඉමෙ ඛො වාසෙට්ඨ පඤ්ච කාමගුණෙ තෙවිජ්ජා බ්‍රාහ්මණා ගථිතා[11] මුච්ඡිතා අජ්ඣාපන්නා[12] අනාදීනවදස්සාවිනො[13] අනිස්සරණපඤ්ඤා පරිභුඤ්ජන්ති.

---

1. °කාරණ B. °කාරකා V. (සබ්බත්ථ)
2. බ්‍රාහ්මාණං අව්හ° S.
3. මහින්දං S.
4. යම° ඉති නත්ථි S.
5. °බ්‍යූපගා B.
6. ඔරිමෙ තීරෙ V.
7. රජ්ජුයා S. (සබ්බත්ථ)
8. බද්ධො B. S.
9. ඔරිමා තීරා V. (සබ්බත්ථ)
10. අද්දූත්තිපි S.
11. ගසිතා B. V. (සබ්බත්ථ)
12. අජ්ඣො° B. V. (සබ්බත්ථ)
13. °දස්සාවී P.

භවද් ගෞතමයන් වහන්ස, එබන්දක් නොවේමය.

23. වාසෙට්ඨය, එපරිද්දෙන්ම ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයෝ බ්‍රාහ්මණභාවය ඇතිකරණ ධර්මයන්[1] දුරුකොට ජීවත්වෙමින් බ්‍රාහ්මණභාවය ඇති නොකරණ ධර්මයන් සමාදන්ව ජීවත්වෙමින් මෙසේ කීවාහුය. (කෙසේද?) 'අපි ඉන්ද්‍රයා හෝ සක්දෙව් හෝ කැඳවමු, සෝම හෙවත් චන්ද්‍රයා කැඳවමු, වරුණයා කැඳවමු, ඊසාන දෙවියා කැඳවමු, ප්‍රජාපතියා කැඳවමු, බ්‍රහ්මයා කැඳවමු, මහිද්ධිදෙවියා කැඳවමු, යමදෙවියා කැඳවමු' (යි කියාති). වාසෙට්ඨය, ඒ ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයෝ බ්‍රාහ්මණ භාවය ඇති කරණ ධර්මයන් දුරුකොට, බ්‍රාහ්මණ භාවය ඇති නොකරණ ධර්මයන් සමාදන්ව පවත්නාහු, (දෙවියන්) සැඳවීම් හේතුවෙන් හෝ යාච්ඤාකිරීම් හේතුවෙන් හෝ ප්‍රාර්ථනාකිරීම් හේතුවෙන් හෝ අතිශය සන්තුෂ්ටි හේතුවෙන් හෝ කාබුන් මරණින් මතු බ්‍රහ්මයාගේ සහභාවයට පැමිණෙන්නාහුය යන මේ කාරණය විද්‍යමාන නොවේ (ඒ නොවිය හැක්කකි).

24. වාසෙට්ඨය, යම්සේ මේ අචිරවතී ගඞ්ගාතොමෝ ජලයෙන් පිරුණී, ජලයෙන් වැසුනු තීර්ථයන් ඇත්තී, ගංතෙර සිට කවුඩන් විසින් බොන්නට හැකි ජලය ඇතිවන්නී ද, එකල්හි පරතෙර යාමෙන් වැඩක් ඇති, පරතෙරට යන සවභාව ඇති, පරතෙර සොයන, පරතෙරට තරණය කරණු කැමති පුරුෂයෙක් එන්නේය. ඒ පුරුෂතෙම මෙතෙරෙහි දැඩිවූ දමකින් පිටිතලාකොට බඳනාලද්දේවේ නම්, වාසෙට්ඨය, තෝ කුමක් සිතන්නෙහි ද? ඒ පුරුෂතෙමේ අචිරවතී ගඞ්ගාවගේ මෙතෙරින් එතෙරට යන්නේ ද (යා හැක්කේ ද)?

භවද් ගෞතමයන් වහන්ස, ඒ නම් සිදුනොවේමය.

25. වාසෙට්ඨය, එපරිද්දෙන්ම මේ කාමගුණපස ආර්‍ය්‍ය විනයෙහි අන්දූයයි ද (දම්වැලයයි ද), බන්ධනයයි ද කියනු ලැබෙත්. ඒ පස කවරහුදයත්: කැමැතිවන්නාවූ, යහපත්වූ, මනවඩන්නාවූ, ප්‍රිය සවභාව ඇත්තාවූ, කාමයන්ගෙන් යුක්තවූ, ඇලුම්කටයුතුවූ, ඇසින් බලා දතයුතුවූ රූපයෝ ය — පෙ — කණින් අසා දතයුතුවූ ශබ්දයෝ ය — පෙ — නාසයෙන් දතයුතුවූ ගන්ධයෝ ය, දිවෙන් දතයුතුවූ රසයෝ ද, ඉෂ්ටවූ, යහපත්වූ, මනවඩන්නාවූ, ප්‍රිය සවභාව ඇත්තාවූ, කාමයන්ගෙන් යුක්තවූ, ඇලුම්කටයුතුවූ කායවිඥානයෙන් දතයුතුවූ සප්‍රෂ්ටව්‍යයෝ ය (යන මොව්හුයි). වාසෙට්ඨය, මේ පස්කම්ගුණයෝ ආර්‍ය්‍යයන්ගේ විනයෙහි දම්වැල් යයිද බන්ධන යයිද කියනු ලැබෙත්. ඒ පස්කම්ගුණයෙහි ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයෝ බැඳුණාහු, එහින් මුසපත්වූවාහු, ඊට ඇතුළත්වූවාහු. එහි දෝෂ නොදක්නා සවභාව ඇත්තාහු, දුක් කෙළවර කිරීමෙන් සසරින් නික්මයාමේ ප්‍රඥා නැත්තාහු ඒ (කාමගුණයන්) පරිභොග කෙරෙත්.

1. බ්‍රාහ්මකරණ ධර්මයෝ නම් පන්සිල් හා දසකුසල් වෙතැයි අටුවාසි.

26. තෙ වත වාසෙට්ඨ තෙවිජ්ජා බ්‍රාහ්මණා යෙ ධම්මා බ්‍රාහ්මණකරණා තෙ ධම්මෙ පහාය වත්තමානා යෙ ධම්මා අබ්‍රාහ්මණකරණා තෙ ධම්මෙ සමාදාය වත්තමානා පඤ්චකාමගුණෙ ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා අනාදීනවදස්සාවිනො අනිස්සරණපඤ්ඤා පරිභුඤ්ජන්තා කාමන්දුබන්ධනබද්ධා[1] කායස්ස භෙදා පරම්මරණා බ්‍රහ්මානං සහබ්‍යූපගා භවිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

27. සෙය්‍යථාපි වාසෙට්ඨ අයං අචිරවතී නදී පූරා උදකස්ස සමතිත්තිකා කාකපෙය්‍යා. අථ පුරිසො ආගච්ඡෙය්‍ය පාරත්ථිකො පාරගවෙසී පාරගාමී පාරං[2] තරිතුකාමො. සො ඔරිමෙ තීරෙ සසීසං පාරුපිත්වා නිපජ්ජෙය්‍ය. තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ? අපි නු සො[3] පුරිසො අචිරවතියා නදියා ඔරිමා තීරා[4] පාරිමං තීරං ගච්ඡෙය්‍යාති?

නොහිදං භො ගොතම.

28. එවමෙව ඛො වාසෙට්ඨ පඤ්චිමෙ නීවරණා අරියස්ස විනයෙ ආවරණාතිපි වුච්චන්ති නීවරණාතිපි වුච්චන්ති ඔනහාතිපි[5] වුච්චන්ති පරියොනහාතිපි[6] වුච්චන්ති. කතමෙ පඤ්ච? කාමච්ඡන්දනීවරණං ව්‍යාපාදනීවරණං ථිනමිද්ධනීවරණං උද්ධච්චකුක්කුච්චනීවරණං විචිකිච්ඡානීවරණං. ඉමෙ ඛො වාසෙට්ඨ පඤ්ච නීවරණා අරියස්ස විනයෙ ආවරණාතිපි වුච්චන්ති නීවරණාතිපි වුච්චන්ති ඔනහාතිපි[5] වුච්චන්ති. පරියොනහාතිපි[6] වුච්චන්ති. ඉමෙහි ඛො වාසෙට්ඨ පඤ්චහි නීවරණෙහි තෙවිජ්ජා බ්‍රාහ්මණා ආවුටා නිවුතා ඔඵුතා[7] පරියොනද්ධා.

තෙ වත[8] වාසෙට්ඨ තෙවිජ්ජා බ්‍රාහ්මණා යෙ ධම්මා බ්‍රාහ්මණකාරණා තෙ ධම්මෙ පහාය වත්තමානා යෙ ධම්මා අබ්‍රාහ්මණකාරණා තෙ ධම්මෙ සමාදාය වත්තමානා පඤ්ච නීවරණෙහි ආවුටා නිවුතා ඔඵුතා[7] පරියොනද්ධා කායස්ස භෙදා පරම්මරණා බ්‍රහ්මානං සහබ්‍යූපගා භවිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

---

1. කාම අනු° P. කාම ඡන්ද° S.
2. පාරිමං P.
3. ඛො සො S.
4. ඔරිම තීරා P.
5. ඔනාහනා° B. V.
6. පරියොනාහනා° B. V.
7. ඔඵුටා B. V.
8. තෙම S. තෙච B. V.

26. වාසෙඨය, ඒ ත්‍රිවිද්‍යක බ්‍රාහමණයෝ බ්‍රාහමණභාවය ඇතිකරණ ධර්මයන් දුරුකොට, බ්‍රාහමණභාවය ඇති නො කරණ ධර්මයන් සමාදන්ව පවත්නාහු පස්කම් නමැති රූහැන් වලින් බැඳුනාහු, එහින්ම මූසපත්වූවාහු, ඊට ඇතුළත්වූවාහු, එහි දෙෂ නොදක්නා සවභාව ඇත්තාහු, පඤ්චකාමබන්ධන-යන් කපා දුක් කෙළවර කිරීම් වශයෙන් සසරින් නික්මයාමේ ප්‍රඥ නැතිව ඒ කාමගුණයන් පරිභොග කරන්නාහු කාමබන්ධන නමැති දම්වැලින් බඳනා ලද්දෙව කාබුන් මරණින් මතු බ්‍රහමඃනමලාභය පිණිස පැමිණෙන්නය යන මේ කාරණය විද්‍යමාන නොවේ (ඒ නොසිදුවිය හැක්කකි).

27. වාසෙඨය, යම්සේ මේ අචිරවති ගඞ්ගානොමෝ ජලයෙන් පිරුණි, ජලයෙන් වැසුනු තිණ්ඩයන් ඇත්ති, ගංතෙර සිට කවුඩන් විසින් බොන්නට හැකි ජලය ඇති වන්නී ද, එකල්හි පරතෙර යාමෙන් මැඩක් ඇති, පරතෙරට යන සවභාව ඇති, පරතෙර සොයන, පරතෙරට එතරවනු කැමති, පුරුෂයෙක් එන්නේය. ඒ පුරුෂතෙමේ හිස සිට පොරවාගෙණ මෙතෙර සයනය කරන්නේය. වාසෙඨය, තෝ කුමක් සිතන්නෙහි ද? එසේ ඇති කල්හි ඒ පුරුෂතෙම අචිරවති ගඞ්ගාවගේ මෙතෙරින් එතෙරට යන්නේද?

භවද් ගෞතමයන් වහන්ස, ඒ නම් සිදුනොවන්නේමය.

28. වාසෙඨය, එපරිද්දෙන්ම මේ නීවරණ ධර්ම පස ආයර්‍ය විනයෙහි ආවරණයෝ යයි ද, නීවරණයෝ යයි ද, (ඔනහ නම්) බන්ධනයෝයයි ද, හාත්පසින් වෙළීමට යොදන බන්ධනයෝ යයි ද කියනු ලැබෙත්. ඒ පස කවරහුදයත්: කාමච්ඡන්ද නීවරණය, ව්‍යාපාද නීවරණය, ථිනමිද්ධ නීවරණය, උද්ධච්චකුක්කුච්ච නීවරණය, විචිකිච්ඡා නීවරණය යන මේහි. වාසෙඨය, මේ පඤ්ච නීවරණයෝ ආයර්‍ය විනයෙහි ආවරණයෝ යයිද නීවරණයෝ යයි ද බන්ධනයෝ යයි ද, සර්වප්‍රකාරයෙන් වෙළන බන්ධනයෝ යයිද කියනු ලැබෙත්. වාසෙඨය, ත්‍රිවිද්‍යක බ්‍රාහමණයෝ මේ නීවරණ පසින් ආවරණය කරණ ලද්දාහු, සර්වප්‍රකාරයෙන් වසන ලද්දාහු එහින් යටකරණ ලද්දාහු, එහින් හාත්පසින් වෙළන ලද්දාහු වෙත්.

වාසෙඨය, ඒ ත්‍රිවිද්‍යක බ්‍රාහමණයෝ ද බ්‍රාහමණභාවය ඇති කරන ධර්මයන් දුරුකොට, බ්‍රාහමණභාවය ඇති නො කරණ ධර්මයන් සමාදන්ව පවත්නාහු පඤ්චනීවරණයන්ගෙන් ආවරණය කරණ ලද්දෙව, නිරවශෙෂයෙන් වසන ලද්දෙව හාත්පසන් යටකරණ ලද්දෙව, සර්වප්‍රකාරයෙන් වසන ලද්දෙව, මරණින් මතු බ්‍රහමයන්ගේ සහභාවයට පැමිණෙන්-නෝ වන්නාහුය යන මේ කාරණය විද්‍යමාන නොවේ (ඒ වියහැක්කක් නොවේ).

29. තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ? කින්ති[1] තෙ සුතං බ්‍රාහ්මණානං වුද්ධානං[2] මහල්ලකානං ආචරියපාචරියානං භාසමානානං සපරිග්ගහො වා බ්‍රහ්මා අපරිග්ගහො වාති?

අපරිග්ගහො භො ගොතම.

සවෙරචිත්තො වා අවෙරචිත්තො වාති?

අවෙරචිත්තො භො ගොතම.

සව්‍යාපජ්ඣචිත්තො[3] වා අව්‍යාපජ්ඣචිත්තො[4] වාති?

අව්‍යාපජ්ඣ[4] චිත්තො භො ගොතම.

සඞ්කිලිට්ඨචිත්තො වා අසඞ්කිලිට්ඨචිත්තො වාති?

අසඞ්කිලිට්ඨචිත්තො භො ගොතම.

වසවත්ති වා අවසවත්ති වාති?

වසවත්තී භො ගොතම.

30. තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ? සපරිග්ගහා වා තෙවිජ්ජා බ්‍රාහ්මණා අපරිග්ගහා වාති?

සපරිග්ගහා භො ගොතම.

සවෙරචිත්තා වා අවෙරචිත්තා වාති?

සවෙරචිත්තා භො ගොතම.

සව්‍යාපජ්ඣචිත්තා වා අව්‍යාපජ්ඣචිත්තා වාති?

සව්‍යාපජ්ඣචිත්තා භො ගොතම.

සඞ්කිලිට්ඨචිත්තා වා අසඞ්කිලිට්ඨචිත්තා වාති?

සඞ්කිලිට්ඨචිත්තා භො ගොතම.

වසවත්තී වා අවසවත්තී වාති?

අවසවත්තී භො ගොතම.

---

1. කිංචි P.
2. වුඩ්ඪානං B.
3. සබ්‍යාපජ්ජ° B, V.
4. අබ්‍යාපජ්ජ° B. V.

29. වාසෙඨය, තෝ කුමක් සිතන්නෙහි ද? බ්‍රහ්ම තෙමේ සත්‍රී පරිහරණය ඇත්තේ ද? සත්‍රී පරිහරණය නැත්තේද? වැඩිසිටියාවූ මහලුවූ ආචාර්‍ය්‍යප්‍රාචාර්‍ය්‍යවූ බ්‍රාහමණයන් විසින් කියනලද කිනම් කථාවක් (තොප විසින්) අසන ලද්දේද?

භවද් ගෞතමයන් වහන්ස, සත්‍රී පරිහරණය නැත්තේය.

වෛර සහිත සිත් ඇත්තේද? වෛර රහිත සිත් ඇත්තේ ද?

භවද් ගෞතමයන් වහන්ස, වෛර රහිත සිත් ඇත්තේය.

ව්‍යාපාද සහිත සිත් ඇත්තේ ද ව්‍යාපාද රහිත සිත් ඇත්තේ ද?

භවද් ගෞතමයන් වහන්ස, ව්‍යාපාද රහිත සිත් ඇත්තේය.

කිලිටුවූ සිත් ඇත්තේ හෝ අසංක්ලිෂ්ට (නොකිලිටි) සිත් ඇත්තේ ද?

භවද් ගෞතමයන් වහන්ස, අසංක්ලිෂ්ට සිත් ඇත්තේය.

වසයෙහි පැවතුම් (හික්මීම) ඇත්තේ ද? වසයෙහි පැවතුම් නැත්තේද?

භවද් ගෞතමයන් වහන්ස වසයෙහි පැවතුම් ඇත්තේය.

30. වාසෙඨය, තෝ කුමක් සිතන්නෙහි ද? ත්‍රිවිද්‍යක බ්‍රාහමණයෝ සත්‍රී පරිහරණය ඇත්තෝ ද, සත්‍රී පරිහරණය නැත්තෝ ද?

භවද් ගෞතමයන් වහන්ස, සත්‍රී පරිහරණය ඇත්තෝය.

වෛර සහිත සිත් ඇත්තෝද වෛර රහිත සිත් ඇත්තෝ ද ?

භවත් ගෞතමයන් වහන්ස, වෛර සහිත සිත් ඇත්තෝය.

ව්‍යාපාද සහිත සිත් ඇත්තෝද ව්‍යාපාද රහිත සිත් ඇත්තෝ ද?

භවත් ගෞතමයන් වහන්ස, ව්‍යාපාද සහිත සිත් ඇත්තෝය.

කිලිටි සිත් ඇත්තෝද? නොකිලිටි සිත් ඇත්තෝ ද?

භවද් ගෞතමයන් වහන්ස, සංක්ලිෂ්ට සිත් ඇත්තෝය.

වසයෙහි පැවතුම් (හික්මීම්) ඇත්තෝ ද, වසයෙහි පැවතුම් නැත්තෝද?

භවද් ගෞතමයන් වහන්ස, වසයෙහි පැවතුම් (හික්මීම) නැත්තෝය.

31. ඉති කිර වාසෙට්ඨ සපරිග්ගහා තෙවිජ්ජා බ්‍රාහ්මණා අපරිග්ගහො බ්‍රහ්මා. අපි නු ඛො සපරිග්ගහානං තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අපරිග්ගහෙන බ්‍රහ්මුනා සද්ධිං සංසන්දති සමෙතීති?

නොහිදං භො ගොතම.

සාධු වාසෙට්ඨ. තෙ වත[1] වාසෙට්ඨ සපරිග්ගහා තෙවිජ්ජා බ්‍රාහ්මණා කායස්ස භෙදා පරම්මරණා අපරිග්ගහස්ස බ්‍රහ්මුනො සහව්‍යූපගා[2] භවිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

32. ඉති කිර වාසෙට්ඨ සවෙරචිත්තා තෙවිජ්ජා බ්‍රාහ්මණා අවෙරචිත්තො බ්‍රහ්මා. අපි නු ඛො සවෙරචිත්තානං තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අවෙරචිත්තෙන බ්‍රහ්මුනා සද්ධිං සංසන්දති සමෙතීති?

නොහිදං භො ගොතම.

සාධු වාසෙට්ඨ. තෙ වත වාසෙට්ඨ සවෙරචිත්තා තෙවිජ්ජා බ්‍රාහ්මණා කායස්ස භෙදා පරම්මරණා අවෙරචිත්තස්ස බ්‍රහ්මුනො සහව්‍යූපගා භවිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

33. ඉති කිර වාසෙට්ඨ සව්‍යාපජ්ඣචිත්තා[3] තෙවිජ්ජා බ්‍රාහ්මණා අව්‍යාපජ්ඣචිත්තො[3] බ්‍රහ්මා. අපි නු ඛො සව්‍යාපජ්ඣචිත්තානං තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අව්‍යාපජ්ඣචිත්තෙන බ්‍රහ්මුනා සද්ධිං සංසන්දති සමෙතීති?

නොහිදං භො ගොතම.

සාධු වාසෙට්ඨ. තෙ වත[1] වාසෙට්ඨ සව්‍යාපජ්ඣචිත්තා තෙවිජ්ජා බ්‍රාහ්මණා කායස්ස භෙදා පරම්මරණා අව්‍යාපජ්ඣචිත්තස්ස බ්‍රහ්මුනො සහව්‍යූපගා භවිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

34. ඉති කිර වාසෙට්ඨ සංකිලිට්ඨචිත්තා තෙවිජ්ජා බ්‍රාහ්මණා අසංකිලිට්ඨචිත්තො බ්‍රහ්මා. අපි නු ඛො සංකිලිට්ඨචිත්තානං තෙවිජ්ජානං බ්‍රාහ්මණානං අසංකිලිට්ඨචිත්තෙන බ්‍රහ්මුනා සද්ධිං සංසන්දති සමෙතීති?

නොහිදං භො ගොතම.

සාධු වාසෙට්ඨ. තෙ වත[1] වාසෙට්ඨ සංකිලිට්ඨචිත්තා තෙවිජ්ජා බ්‍රාහ්මණා කායස්ස භෙදා පරම්මරණා අසංකිලිට්ඨචිත්තස්ස බ්‍රහ්මුනො සහව්‍යූපගා භවිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

---

1. තෙ ච S. තෙ ච B. V. (සබ්බත්ථ) 2. °බ්‍යූපගා B. V. (සබ්බත්ථ)
3. °බ්‍යාපජ්ජ° B. V. (සබ්බත්ථ)

31. වාසෙඨය, මෙසේ වූකලී, ත්‍රිවිද්‍යක බ්‍රාහමණයෝ ස්ත්‍රී පරිග්‍රහණය ඇත්තෝය, බ්‍රහ්මයාමේ ස්ත්‍රී පරිග්‍රහණය නැත්තේය. කිම? ස්ත්‍රී පරිග්‍රහණය කරන්නාවූ ත්‍රිවිද්‍යක බ්‍රාහමණයෝ ස්ත්‍රී පරිග්‍රහණය නැත්තාවූ බ්‍රහමයා සමග සංසන්දනය වෙත්ද? සමභාවයට පැමිණෙත්ද?

ඒකාන්තයෙන්ම නැත, භවද් ගෞතමයන් වහන්ස.

වාසෙඨය, මැනව. වාසෙඨය, (කාමච්ඡන්දය පවත්නා හෙයින්) ස්ත්‍රී පරිග්‍රහණය කරන්නාවූ ඒ ත්‍රිවිද්‍යක බ්‍රාහමණයෝ කාබුන් මරණින් මතු (කාමච්ඡන්දය නැති හෙයින්) ස්ත්‍රී පරිග්‍රහණයක් නැත්තාවූ බ්‍රහමයාගේ සහභාවයට පැමිණෙන්නෝ වන්නාහුය යන මේ කාරණය විද්‍යමාන නොවේ (ඒ නොසිදුවිය හැක්කකි).

32. වාසෙඨය, මෙසේ වූකලී ත්‍රිවිද්‍යක බ්‍රාහමණයෝ වෛරී සිත් ඇත්තෝය, බ්‍රහමයා අවෛරී සිත් ඇත්තේය. කිම? වෛරී සිත් ඇත්තාවූ ත්‍රිවිද්‍යක බමුණෝ අවෛරී සිත් ඇති බ්‍රහමයා සමග සංසන්දනය වෙත්ද? සමභාවයට පැමිණෙත්ද?

ඒකාන්තයෙන්ම නැත, භවත් ගෞතමයන් වහන්ස.

මැනව, වාසෙඨය. වාසෙඨය, වෛරී සිත් ඇති ඒ බමුණෝ කාබුන් මරණින් මතු අවෛරී සිත් ඇති බ්‍රහමයාගේ සහභාවයට පැමිණෙන්නාහුය යන මේ නොසිදුවිය හැක්කකි.

33. වාසෙඨය, මෙසේ වූකලී ත්‍රිවිද්‍යක බමුණෝ ක්‍රොධ සහිත සිත් ඇත්තෝය, බ්‍රහ්මයා ක්‍රොධ රහිත සිත් ඇත්තේය. කිම? ක්‍රොධ සිත් ඇත්තාවූ ත්‍රිවිද්‍යක බමුණෝ ක්‍රොධ සිත් නැති බ්‍රහමයා සමග සංසන්දනය වෙත්ද? සමභාවයට පැමිණෙත්ද?

ඒකාන්තයෙන්ම නැත, භවත් ගෞතමයන් වහන්ස.

මැනව, වාසෙඨය. වාසෙට්ඨය, ක්‍රොධ සිත් ඇති ඒ ත්‍රිවිද්‍යක බමුණෝ කාබුන් මරණින් මතු ක්‍රොධ සිත් නැති බ්‍රහමයාගේ සහභාවයට පැමිණෙන්නාහුය යන මේ නොසිදුවිය හැක්කකි.

34. වාසෙට්ඨය, මෙසේ වූකලී ත්‍රිවිද්‍යක බමුණෝ කිළිටි සිත් ඇත්තෝය, බ්‍රහමයා නොකිළිටි සිත් ඇත්තේය. කිම? කිළිටි සිත් ඇති ත්‍රිවිද්‍යක බමුණෝ නොකිළිටි සිත් ඇති බ්‍රහමයා සමග සංසන්දනය වෙත්ද? සමභාවයට පැමිණෙත්ද?

ඒකාන්තයෙන්ම නැත, භවත් ගෞතමයන් වහන්ස.

මැනව වාසෙට්ඨය. වාසෙට්ඨය, කිළිටි සිත් ඇති ඒ ත්‍රිවිද්‍යක බමුණෝ කාබුන් මරණින් මතු කිළිටි සිත් නැති බ්‍රහමයාගේ සහභාවයට පැමිණෙන්නාහුය යන මේ නොසිදුවිය හැක්කකි.

35. ඉති කිර වාසෙට්ඨ අවසවත්තී තෙවිජ්ජා බ්‍රාහ්මණා වසවත්තී බ්‍රහ්මා. අපි නු ඛො අවසවත්තීනං තෙවිජ්ජානං බ්‍රාහ්මණානං වසවත්තිනා බ්‍රහ්මුනා සද්ධිං සංසන්දති සමෙතීති?

නො හිදං භො ගොතම.

සාධු වාසෙට්ඨ. තෙ වත වාසෙට්ඨ අවසවත්තී තෙවිජ්ජා බ්‍රාහ්මණා කායස්ස භෙදා පරම්මරණා වසවත්තිස්ස බ්‍රහ්මුනො සහව්‍යූපගා භවිස්සන්තීති නෙතං ඨානං විජ්ජති.

36. ඉධ ඛො පන තෙ[1] වාසෙට්ඨ තෙවිජ්ජා බ්‍රාහ්මණා ආසීදිත්වා[2] සංසීදන්ති සංසීදිත්වා විසාදං[3] වා පාපුණන්ති සුක්ඛතරං[4] මඤ්ඤෙ පතරන්ති[5]. තස්මා ඉදං තෙවිජ්ජානං බ්‍රාහ්මණානං තෙවිජ්ජාඉරිණන්ති[6] පි වුච්චති[7] තෙවිජ්ජාවිපිනන්තිපි[8] වුච්චති තෙවිජ්ජාව්‍යසනන්තිපි[9] වුච්චතීති.

37. එවං වුත්තෙ වාසෙට්ඨො මාණවො භගවන්තං එතදවොච: සුතං මෙතං භො ගොතම, සමණො ගොතමො බ්‍රහ්මානං සහව්‍යතාය මග්ගං ජානාතීති.

තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ? ආසන්නො ඉතො මනසාකටං[10] නයිතො දූරෙ මනසාකටන්ති?

එවං භො ගොතම ආසන්නො ඉතො මනසාකටං නයිතො දූරෙ මනසාකටන්ති.

38. තං කිම්මඤ්ඤසි වාසෙට්ඨ? ඉධස්ස පුරිසො මනසාකටෙ ජාතවද්ධො[11]. තමෙනං මනසාකටතො[12] තාවදෙව අවසටං[13] මනසාකටස්ස මග්ගං පුච්ඡෙය්‍යුං[14]. සියා නු ඛො වාසෙට්ඨ තස්ස[15] පුරිසස්ස මනසාකටෙ ජාතවද්ධස්ස[16] මනසාකටස්ස මග්ගං පුට්ඨස්ස දන්ධායිතත්තං වා විත්ථායිතත්තං වාති?

---

1. තෙ ති නත්ථි P. W.
2. ආදිසිත්වා B. V.
3. විසාරං B. විසත්තං S.
4. °තරණං B. V.
5. තරන්ති B. S. V.
6. °ඉරි° B.S.V. °ඊරිකං W.C.
7. වුච්චන්ති B. V. (සබ්බත්ථ)
8. විවනන්තිපි S.; විපනන්තිB.
9. °බ්‍යසනන්තිපි B. S. V.
10. මානසාකත° S. (සබ්බත්ථ)
11. ජාතසංවද්ධො B.V. °වඩ්ඪො S. ජාතො වඩ්ඩො W. P.
12. මනසාකතා S.
13. තාවදෙවස්ස තං W.; අවසතං S. අවස්සටං P.
14. පුච්ඡෙය්‍යං S.
15. තස්ස ඉති නත්ථි S.
16. °සංවද්ධස්ස B.V. °සංවඩ්ඪස්ස S.

35. "වාසෙඨය, ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයෝ වසිතා (භික්මීම) නැත් තෝය බ්‍රහ්මතෙමේ වසිතා ඇත්තේය. කිම? වසයෙහි පැවැතුම් නැත්තාවූ ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයෝ වසයෙහි පැවැතුම් ඇත්තාවූ බ්‍රහ්මයා සමග ගැළපෙත්ද? සමභාවයට පැමිණෙත්ද?

ඒකාන්තයෙන්ම නැත, භවත් ගෞතමයන් වහන්ස.

වාසෙඨය, මැනව. වාසෙඨය, වසයෙහි පැවතුම් නැත්තාවූ ඒ ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයෝ මරණින් මතු වසයෙහි පැවතුම් ඇත්තාවූ බ්‍රහ්මයාගේ සහභාවයට පැමිණෙත්තෝ වන්නාහුය යන මේ නොසිදුවිය හැක්කකි.

36. වාසෙඨය, ත්‍රිවිද්‍යක බ්‍රාහ්මණයෝ මාර්ගය නුවූවක් මාර්ගයයි ගෙණ, වරදවා පිළිපැදීම් වශයෙන් ඊට පැමිණ, එහි ගැලෙත්, ගැලී මහත් පීඩාවට පැමිණෙත්, වියලි ගඩනාවක් තරණය කරත්තවුත් මෙත් මෙත්. එහෙයින් මේ බ්‍රාහ්මණයන්ගේ ප්‍රවචනය (ධර්මය) ත්‍රිවිද්‍යක අරණ්‍යයයි ද, ත්‍රිවිද්‍යක විපිනයයි (නිරුදක කාන්තාරය) සිද, ත්‍රිවිද්‍යක ව්‍යසනයයි ද කියනු ලැබේ.

37. මෙසේ වදාළ කල්හි වාසෙඨ මාණවක තෙමේ භාග්‍ය-වතුන් වහන්සේට මේ කාරණය සැලකෙළේය: භවත් ගෞතමයන් වහන්ස, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ බ්‍රහ්මයාගේ සහභාවය පිණිස මාර්ගය දන්නා සේකැයි මා විසින් අසන ලදී.

වාසෙඨය, තෝ කුමක් සිතන්නෙහි ද? මනසාකට ගම පිහිටියේ මීට සමීපව වේද, මීට නොදුරුව නොවේ ද?

භවත් ගෞතමයන් වහන්ස, එසේය, මනසාකට ගම මීට සමීපයි. මනසාකට ගම මීට දුර නොවේ.

38. වාසෙඨය, තෝ කුමක් සිතන්නෙහි ද? මේ මනසාකට ගමෙහි ඉපිද එහි වැඩි, ඉනා මෑතදී (නොහොත් එවේලෙහිම) ගමෙන් පිටවූනාවූ පුරුෂයෙකුගෙන් කිසිවෙක් මනසාකටට යන මාර්ගය විචාරන්නාහු නම් මනසාකටෙහි ඉපදී, එහි වැඩුනු ඒ පුරුෂයාට (ඒ ගැන) විස්තර කටයුතු බවක් හෝ (ඒ පිළිබඳ) මූළා බවක් හෝ වන්නේ ද?

නොහිදං භො ගොතම. තං කිස්ස හෙතු? අසු[1] හි භො ගොතම පුරිසො මනසාකටෙ ජාතවද්ධො තස්ස සබ්බානෙව මනසාකටස්ස මග්ගානි සුවිදිතානීති.

39. සියා ඛො වාසෙට්ඨ තස්ස පුරිසස්ස මනසාකටෙ ජාතවද්ධස්ස මනසාකටස්ස මග්ගං පුට්ඨස්ස දන්ධායිතත්තං වා විත්ථායිතත්තං වා. නත්වෙව[2] තථාගතස්ස බ්‍රහ්මලොකෙ වා බ්‍රහ්මලොකගාමිනියා වා පටිපදාය පුට්ඨස්ස දන්ධායිතත්තං වා විත්ථායිතත්තං වා. බ්‍රහ්මානඤ්චාහං[3] වාසෙට්ඨ පජානාමි බ්‍රහ්මලොකඤ්ච බ්‍රහ්මලොකගාමිනිඤ්ච පටිපදං යථාපටිපන්නො ච[4] බ්‍රහ්මලොකං උපපන්නො[5] තඤ්ච පජානාමීති.

40. එවං වුත්තෙ වාසෙට්ඨො මාණවො භගවන්තං එතදවොච: සුතං මෙතං භො ගොතම සමණො ගොතමො බ්‍රහ්මානං සහබ්‍යතාය මග්ගං දෙසෙතීති. සාධු නො භවං ගොතමො බ්‍රහ්මානං සහබ්‍යතාය මග්ගං දෙසෙතු[6]. උල්ලුම්පතු භවං ගොතමො බ්‍රාහ්මණිං පජන්ති.

තෙන හි වාසෙට්ඨ සුණාහි සාධුකං මනසිකරොහි භාසිස්සාමීති.

එවං භොති ඛො වාසෙට්ඨො මාණවො භගවතො පච්චස්සොසි. භගවා එතදවොච:

---

1. අමු B.
2. නො ත්වෙව P. W.
3. බ්‍රහ්මානං පහං P. W.
4. යථා ච පටිපන්නො W.
5. උප්පන්නො P. W.
6. දෙසෙතූති V.

භවත් ගෞතමයන් වහන්ස, එබන්දක් නොවේමය. මක්නිසාදයත්: භවත් ගෞතමයන් වහන්ස, මේ පුරුෂතෙම වූකලී මනසාකට ගමෙහි උපන්නේය, එහිම වැඩුනේය. ඔහු විසින් මනසාකට ගම පිළිබඳ සියලු මාර්ගයන් යහපත් ලෙස දැනගන්නා ලද්දේය (එහෙයිනි).

39. වාසෙඨය, මනසාකට ගමෙහි උපන්, එහිම වැඩුනු, මනසාකට ගමට මාර්ග විචාරණ ලද ඒ පුරුෂයාට ප්‍රමාද භාවයක් හෝ විස්තර කටයුතු බවක් ඇති වුවත්, බ්‍රහ්මලොකයෙහි (තොරතුරු) හෝ බ්‍රහ්මලොකයට පමුණුවන ප්‍රතිපදාව ගැණ හෝ විචාරණලද තථාගතයන් වහන්සේට මූලාබවක් හෝ ප්‍රමාද බවක් හෝ නොවේමය. වාසෙඨය, මම බ්‍රහ්මයන්ද දනිමි, බ්‍රහ්මලොකයද දනිමි, බ්‍රහ්මලොකයට පමුණුවන සුලුවූ ප්‍රතිපදාවද දනිමි. යම්බදු මාර්ගයකින් පිළිපන් තැනැත්තේ බ්‍රහ්ම ලොකයෙහි උපදින්නේද ඔහු (ඒ තැනැත්තා හෝ ඒ මාර්ගය හෝ) දනිමි.

40. මෙසේ වදාළ කල්හි වාසෙඨ මාණවක තෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකෙළේය: භවත් ගෞතමයන් වහන්ස, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ බ්‍රහ්මයන්ගේ සහභාවය පිණිස මාර්ගය දේශනාකරණ සේකැයි මා විසින් අසන ලදී. භාග්‍යවතුන් වහන්සේ බ්‍රහ්මයන්ගේ සහභාවය පිණිස මාර්ගය අපට දේශනාකරණ සේක්වා. භවද් ගෞතමයන් වහන්සේ බ්‍රහ්මපුත්‍ර වූ (බමුණු දරුවූ) මා අපාය මාර්ගයෙන් ගොඩනගනු සේක්වා.

වාසෙඨය, එසේ නම් අසව, මනාකොට මෙනෙහි කරව, (තොපට) කියන්නෙමි (යි වදාළේය).

එසේය, පින්වතුන් වහන්සයි වාසෙඨ මාණවක තෙමේ භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවචන දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

41. ඉධ වාසෙට්ඨ තථාගතො ලොකෙ උප්පජ්ජති[1] අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි[2] සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා.[3] සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං[8], කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති.

42. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ[4] පච්චාජාතො.[5] සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසංචික්ඛති: සම්බාධො ඝරාවාසො රජොපථො[6] අබ්භොකාසො පබ්බජ්ජා. නයිදං[7] සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සංඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති.

---

1. උප්පජ්ජති B. V. උප්පජ්ජතිපි S.
2. °සාරථි B. S.
3. භගවාති S.
4. අඤ්ඤතරස්මිං වා පච්චා° W.
5. පච්ඡා° S; පච්චා° Sa.
6. රජාපථො S. C. රජො,° Sa.
7. න ඉදං C.
8. සව්‍ය° P. (සබ්බත්‍ර)

41. වාසෙට්ඨය, අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, අෂ්ටවිද්‍යා පසළොස් චරණධර්මයන් ගෙන් යුක්තවූ, යහපත් ගති ඇත්තාවූ, සියලු ලෝකයන් දන්නා සුලුවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි ශ්‍රේෂ්ඨවූ රියැදුරකු වැනිවූ, දෙවිමිනිසුන්ට ශාස්තෘවූ, සිව්සස් දම් අවබෝධ කළාවූ, භාග්‍යවත් වූ, තථාගත කෙනෙක් මෙලොව උපදනාහ. ඒ තථාගත තෙමේ දෙවියන් සහිත වූ, මාරයන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, දෙවිමිනිසුන් (රජුන් හා මිනිසුන්) සහිතවූ,සත්ත්වවර්ගයා ස්වකීය විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කෙරේ. ඒ (තථාගතයන් වහන්සේ) මුල යහපත්වූ, මැද යහපත්වූ, කෙළවර යහපත්වූ,(සතර සතිපට්ඨානාදිය ඇසුරු කළ හෙයින්) අර්ථ සහිතවූ, (දශවිධ ව්‍යඤ්ජන නොපිරිහෙළා වදාරණ හෙයින්) ව්‍යඤ්ජන සහිතවූ, සියලු ලෙසින් සම්පූර්ණවූ, පිරිසුදුවූ, සකල ශාසනමාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව ගෙන හැර දක්වති.

42. ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපතිපුත්‍රයෙක් හෝ අන් කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක් හෝ අසයි. හෙතෙම ඒ දහම් අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කෙරෙයි. හෙතෙම ඒ ශ්‍රද්ධාලාභයෙන් යුක්ත වූයේ මෙසේ සලකන්නේය: ‘ගෘහවාසය පීඩා සහිතයි, රාගාදි රජස ගැවසී මාර්ගයෙකි. පැවිද්ද විවෘත අභ්‍යවකාශය මෙනි (කිසිවක් නොමැති අවකාශය මෙන් නිදහස්ය). ගිහිගෙහි වසන්නහු විසින් සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, සියලු ආකාරයෙන් පිරිසිදුවූ, ලියවූ සකක් වැනි (සංඛ-ලිඛිතවූ),මේ බඹසර හැසිරෙන්නට නොහැක්කේය. මම කෙස් දැළිරැවුලු බහා, කසාවත් හැඳ, ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවන්නෙම් නම් (ඒකාන්තයෙන්) ඉතා මැනවැයි’ කියායි.

43. සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. සො එවං පබ්බජිතො සමානො පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු කායකම්මවචිකම්මෙන සමන්නාගතො කුසලෙන පරිසුද්ධාජීවො සීලසම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො සන්තුට්ඨො.

44. කථඤ්ච වාසෙට්ඨ භික්ඛු සීලසම්පන්නො හොති? ඉධ වාසෙට්ඨ භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූතහිතානුකම්පි විහරති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරති. ඉදම්පිස්ස හොති සීලස්මිං. අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති ආරාචාරී[1] විරතො මෙථුනා ගාමධම්මා. ඉදම්පිස්ස හොති සීලස්මිං.

43. හෙතෙම පසු කාලයෙක සවල්පවූ හෝ බොහෝවූ භෝග රාශිය හැර, සවල්පවූ හෝ බොහෝවූ නෑපිරිස් හැර, කෙස් දැලිරැවුලු හරවා, කසාවසත්‍රයන් හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වේ. මෙසේ පැවිදිවූ හෙතෙම පාතිමොක්ඛසංවරයෙන් යුක්ත වූයේ, ආචාර ගොචර දෙකින් යුක්ත වූයේ, සවල්පවූත් අකුසල් විෂයෙහි භය දක්නාසුලු වූයේ, යහපත්වූ කාය වාක් කර්මයන් යුක්ත වූයේ, ශික්ෂාපද සමාදන්ව එහි මොනවට හික්මෙයි. පිරිසුදුවූ දිවි පැවැතුම් ඇත්තේ වෙයි. (ත්‍රිවිධ) ශීලයෙන් යුක්ත වූයේ වෙයි. ඉන්ද්‍රිය විෂයෙහි වැසූ දොරටු ඇත්තේ වෙයි. බොජුනෙහි පමණ දන්නේ වෙයි. මනා සිහියෙන් හා සම්‍යක් ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයි. (සිව්පසය පිළිබඳ යථාලාභ) සන්තොෂයෙන් යුක්ත වෙයි.

44. වාසෙට්ඨය, මහණ තෙමේ කෙසේනම් සීලසම්පන්න වේද? වාසෙට්ඨය, මේ සස්නෙහිවූ මහණතෙමේ ප්‍රාණවධය හැර ඉන් වැළැක්කේ වේ. බහා තබන ලද දඬු ඇත්තේ, බහා තබන ලද අවි ඇත්තේ, පව් කිරීමෙහි ලජ්ජා ඇත්තේ, කරුණාවත් වූයේ, සියලු ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පිව වෙසේ. මෙසේ මේ (ප්‍රාණ වධයෙන් වෙන්වීමේ සීලය) ද ඒ මහණහුගේ සීලය පිණිස වේ.

(හෙතෙම) නොදුන් දෙය ගැනීමෙන් වෙන්ව, එයින් විශෙෂයෙන් වැළැක්කේ, දුන් දෙයම ගන්නේ, දුන් දෙයම කැමැති (බලාපොරොත්තු) වන්නේ, සොර නොවූ, පිරිසුදුවූ (අඃනවභාවයෙන්) සිතින් යුක්තව වාසය කෙරේ. මෙසේ ඒ (අදත්තාදානයෙන් වෙන්වීමෙ සීලය) ද ඒ මහණහුගේ සීලය පිණිස වේ. අබ්‍රහ්මචර්‍ය්‍යාව හැර, බඹසර නොවන හැසිරීමෙන් දුරුවූ පැවතුම් ඇත්තේ, සත්පුරුෂසංසර්ගය නම්වූ ග්‍රාම්‍ය ධර්මයෙන් වෙන් වූයේ බ්‍රහ්මචාරී වේ. මෙසේ ඒ (කාමාසවාද විරතිය පිළිබඳවූ සීලය) ද ඔහුගේ සීලය පිණිස වේ.

මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති[1] සච්චවාදී සච්චසන්ධො ථෙතො[2] පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. ඉදම්පිස්ස හොති සීලස්මිං. පිසුණං වාචං[3] පහාය පිසුණාය වාචාය පටිවිරතො හොති. ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය. අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා[4] සමග්ගාරාමො[5] සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති[6]. ඉදම්පිස්ස හොති සීලස්මිං.

ඵරුසං[7] වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති. යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා[8] හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා තථාරූපං[9] වාචං භාසිතා හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාප-පටිවිරතො හොති කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා හොති[6] කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං[10]. ඉදම්පිස්ස හොති සීලස්මිං.

45. බීජගාමභූතගාමසමාරම්භා[11] පටිවිරතො හොති[12]. එකභත්තිකො හොති රත්තූපරතො[13] පටිවිරතො[14] විකාලභොජනා. නච්චගීතවාදිතවිසූකදස්සනා[15] පටිවිරතො හොති. මාලාගන්ධ-විලෙපනධාරණමණ්ඩනවිභූසනට්ඨානා පටිවිරතො හොති. උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ජාතරූපරජත-පටිග්ගහණා[16] පටිවිරතො හොති.

---

1. පටිවිරතො සමණො ගොතමො P.
2. ඨෙතො S; ථෙතො Sa.
3. පිසුණාවාචං P. W.
4. අනුප්පා° P.
5. සමග්ගරාමො B. Ca.
6. හොතීති න දිස්සති P.
7. ඵරුසාවාචං P. W.
8. පෙමනීයා B.
9. °රූපිං P.
10. °සඤ්හිතං B.
11. °සමාරබ්භා B. V.
12, හොති—පෙ—එක° B. V.
13. රත්තූපරතො B.
14. විරතො P. S. C.
15. °විසූක° B.
16. °ප්පටිග්ගහණා V. (සබ්බත්ථ)

බොරු කීමෙන් දුරුව, ඉත් විශේෂයෙන් වැළැක්කේ, සැබෑ තෙපුල් කියන්නේ, සැබැවින් සැබව ගලපන සුලුවූයේ, ස්ථිර කථා ඇත්තේ, ඇදහිය යුතු තෙපුල් ඇත්තේ, ලෝකයා අතර විරුද්ධ කථා ඇති නොකෙරේ. මෙසේ (බොරු කීමෙන් වැලකීම) ද ඒ මහණහුගේ සීලය පිණිස වේ. පිසුණු බස් හැර, ඉත් වෙසෙසින් වැළැක්කේය. මෙතැනින් අසා මොවුන් බිඳවීම පිණිස එතැන නොකියන සුලුවූයේය. එතැනින් අසා ඔවුන් බිඳවීම පිණිස මෙතැන නොකියන සුලුවූයේය. මෙසේ භේද වූවන් ගලපන්නේ, සමඟිවූවන්ගේ සමඟිය තහවුරු කිරීමට අනුබල දෙන්නේ, සමඟියෙහි ඇලුම් බහුල කොට ඇත්තේ, සමඟිකම්හි ඇලුනේ, සමඟිකම්හි සතුටුවන සුලුවූයේ, සමඟිය ඇති කරණ තෙපුල් කියන්නේය. මේ ද ඔහුගේ සීලය පිණිස වේ.

ඵරුෂ වචනය හැර, ඉත් වෙසෙසින් වැළැක්කේ, යම් වචනයක් නිදෙස් වේද, කන්කලු ද, අර්ථ වශයෙන් ප්‍රෙමණියද, මනාසේ සිතට වදනා හෙයින් සිත්කලු ද, පුරවාසීන්ගේ කථා මෙන් යහපත් ද, බොහෝ දෙනාට ප්‍රිය ද, බොහෝ දෙනාගේ මන වඩන්නේ ද, එබඳු තෙපුල්ම කියන්නේ වේ. මෙසේ (ඒ රළුවචනයෙන් වෙන්වීම ද) ඒ මහණහුගේ සීලය පිණිස වේ. හිස්වූ ප්‍රලාප කථා හැර, ඉත් වෙසෙසින් වැළැක්කේ, කාලයට සුදුසු කථා කරන්නේ, සිදුවූ (සැබෑවූ) තෙපුල්ම කියන්නේ, අර්ථයෙන් යුක්තවූ, (නවලොවුතුරු) දහම් ඇසුරු කල, විනය ඇසුරු කල තෙපුල් කියන්නේ, සුදුසු කල්හි උපමා හා කරුණු සහිතවූ, (පරිච්ඡේද) සීමා ඇති, අර්ථ හෙවත් අභිවෘද්ධියෙන් යුත්, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේ. මේ (හිස්කථාවෙන් වැළැක්ම) ද ඔහුගේ සීලය පිණිස වේ.

45. තණ, ගස්, වැල් සිඳීම් බිඳීම් ආදි විකොපනයෙන් වැළැක්කේ, එක් වේලේ වළඳන බොජුන් ඇත්තේ, රාත්‍රිභොජනයෙන් හා විකල් බොජුනෙන් වැළැක්කේය. නැටීම්, ගී කීම්, බෙර ආදිය වැයීම්, විසුලු දැකීම් යන මෙයින් වැළැක්කේය. මල්, ගඳ, විලවුන් පැළඳීම, ඉත් සැරසීම, උනුතැන් පිරවීමෙන් අලඞ්කාර කිරීම යන මෙයින් වැළැක්කේය. උස් අසුන් මහ අසුන් යන මෙයින් වැළැක්කේය. රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් වැළැක්කේය.[1]

1. දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ උපග්‍රන්ථයේ x වෙනි පිට බලනු.

ආමකධඤ්ඤපටිග්ගහණා[1] පටිවිරතො හොති. ආමකමංසපටිග්ගහණා[1] පටිවිරතො හොති. ඉත්ථිකුමාරිකපටිග්ගහණා[1] පටිවිරතො හොති. දාසිදාසපටිග්ගහණා පටිවිරතො හොති. අජෙළකපටිග්ගහණා[1] පටිවිරතො හොති. කුක්කුටසූකරපටිග්ගහණා[1] පටිවිරතො හොති. හත්ථිගවාස්සවළවාපටිග්ගහණා[2] පටිවිරතො හොති. ඛෙත්තවත්ථුපටිග්ගහණා[1] පටිවිරතො හොති. දූතෙය්‍යපහිණගමනානුයොගා[3] පටිවිරතො හොති. කයවික්කයා පටිවිරතො හොති. තුලාකූටකංසකූටමාණකූටා[4] පටිවිරතො හොති. උක්කොටනවඤ්චනනිකතිසාචියොගා[5] පටිවිරතො හොති. ඡෙදනවධබන්ධනවිපරාමොසආලොපසහසාකාරා[6] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

46. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං බීජගාමභූතගාමසමාරම්භං[7] අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං[8] මූලබීජං ඛන්ධබීජං ඵළුබීජං[9] අග්ගබීජං බීජබීජමෙව[10] පඤ්චමං — ඉති[11] එවරූපා බීජගාමභූතගාමසමාරම්භා[12] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

47. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං සන්නිධිකාරපරිභොගං අනුයුත්තා විහරන්ති සෙය්‍යථීදං අන්නසන්නිධිං[13] පානසන්නිධිං වත්ථසන්නිධිං යානසන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං — ඉති වා ඉති එවරූපා සන්නිධිකාරපරිභොගා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. °ප්පටිග්ගහණ V. (සබ්බත්ථ)
2. °ගවස්ස°B.V. °වලවා°V.W. °වළව°B.
3. °පහීණ° W.
4. °කූට° B.
5. °සාචි° B. V.
6. °සහස° B.
7. °සමාරබ්භං V.
8. සෙය්‍යථිදං B. V. (සබ්බත්ථ)
9. ඵල° S. ඵලු° C. P.
10. බීජබීජං එව B.S.V.
11. ඉති වා ඉති V. S.
12. °සමාරබ්භා V.
13. °න්නිධි S. (සබ්බත්ථ)

අමුවූ ධාන්‍යවගී පිළිගැන්මෙන් තොරවූයේ, අමුමස් පිළිගැන්මෙන් තොරවූයේ ද ස්ත්‍රීන් හා කුමරියන් පිළිගැන්මෙන් තොර වූයේ ද වේ. දාසිදාසුන් පිළිගැන්මෙන් තොර වූයේ, එළුවන් හා තිරළුවන් පිළිගැන්මෙන් තොර වූයේ, කුකුළන්, හූරන්, ඇතුන්, ගවයන්, අසුන්, වෙළඹුන්, කෙත්, වත්, යන මේ පිළිගැන්මෙන්ද තොර වූයේය. ගිහින්ගේ දූත මෙහෙවරය, ගෙන්ගෙට යන පහත් මෙහෙවරය යන මෙයින් වැළැක්කේය. ගනු දෙනු කිරීමය, තුලා ආදියෙන් වඤ්චා කිරීමය, රන් හා තොරන් මුසුකොට වඤ්චා කිරීමය, වී ආදිය මැනීමෙන් වඤ්චා කිරීමය, හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය, උපායෙන් අනුන් රැවටීමය, යකඩ ආදි ලෝහ රන් රිදී යයි අඟවා වඤ්චා කිරීමය, නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයෝගය යන මෙයින් වැළැක්කේය. කැපීමය, මැරීමය, බැඳීමය, සැඟවී සිට වස්තු පැහැර ගැන්ම (මංකොල්ල)ය, නියම්ගම් ආදිය පැහැරීමය, බලාත්කාරකමින් වස්තු පැහැරගැන්මය යන මෙයින් ද වැළැක්කේය. මේ (විරතිය) ද ඔහුගේ සීලය පිණිස වේ.

46. ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදූහැයෙන් දෙන ලද බොජුන් අනුභව කොට මූලබීජය, ඛන්ධබීජය, එළු (පුරුක්) බීජය, දලු (අග්ග) බීජය, පස්වැනිවූ බීජබීජය යන මේ බීජගාමභූතගාමසමාරම්භයෙහි යෙදී වෙසෙත්. (මෙබඳු වූ බීජගාම භූතගාමයන් සිඳීම් බිඳීම් ආදියෙන් වැළැක්කේ වේ නම්) මෙද ඔහුගේ සීලය පිණිස වේ.

47. එසේම යම් ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදූහැයෙන් දෙන ලද බොජුන් අනුභව කොට, ආහාර වගී දෙවෙනි දිනට තබා ප්‍රයොජන ගැන්මය, පාන වගී දෙවෙනි දිනට තබා ප්‍රයොජන ගැන්මය, නොඉටන ලද සිවුරු ආදිය එසේ තැන්පත් කොට තැබීමය, යාන සංඛ්‍යාත වහන් තබා එසේ ප්‍රයොජන ගැන්මය, දෙකකින් මැඩි සයන ලැබ පසුමට තබා ප්‍රයොජන ගැන්මය, සුගන්ධයන් ලැබ එලෙස තබා ප්‍රයොජන ගැන්මය, තල සහල් ආදී ආමිසයන් තැන්පත් කොට තබා ප්‍රයොජන ගැන්ම යයි කියන ලද සන්නිධිකාරපරිභොගයෙහි යෙදී වෙසෙත්. මෙබඳුවූ සන්නිධිකාරපරිභොගයෙන් වැළකී වෙශේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

48. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං[1] අනුයුත්තා විහරන්ති – සෙය්‍යථීදං නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වෙතාලං[2] කුම්භථූනං[3] සොභනගරකං[4] චණ්ඩාලං වංසං ධොපනං[5] හත්ථියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං[6] උසභයුද්ධං අජයුද්ධං මෙණ්ඩකයුද්ධං[7] කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යොධිකං බලග්ගං සෙනාබ්‍යූහං අනීකදස්සනං[8] — ඉති වා ඉති එවරූපා විසූකදස්සනා[1] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

49. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං ජූතප්පමාදට්ඨානානුයොගං[9] අනුයුත්තා විහරන්ති – සෙය්‍යථීදං[10] අට්ඨපදං දසපදං ආකාසං පරිහාරපථං සන්තිකං[11] ඛලිකං ඝටිකං සලාකහත්ථං අක්ඛං පඞ්ගචීරං වඞ්කකං[12] මොක්ඛචිකං චිඞ්ගුලකං[13] පත්තාළ්හකං[14] රථකං ධනුකං අක්ඛරිකං මනෙසිකං[15] යථාවජ්ජං — ඉති වා ඉති එවරූපා ජූතප්පමාදට්ඨානානුයොගා[9] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. විසුක° B.
2. වෙතාළං B. S. V.
3. කුම්භථූණං B. S. °ථූණං V.
4. සොභනකරකං W. C.
   සොභනඝරකං V.
5. ධොවනං S.
6. මහිංස° B.
7. මෙණ්ඩ° S. V.
8. අනික° B.
9. ජූතපමාද° P.
10. සෙය්‍යථිදං B. V. (සබ්බත්ථ)
11. සන්තිකං V.
12. වඞ්කං Va.
13. චිඞ්ගුලිකං B. V. P.
14. පත්තා° B. V.
15. මානෙ° S; මනෙ°Sc.

48. එසේම යම් ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා, නැටීමය, ගී කීමය, බෙර ආදිය වැයීමය, රඟමඬුලු සැරසීමය, (රාමායනාදි) කථා ඇසීමය, කයිතාලම් හා අත්ලෙන් අත්ල ගැසීමය, මන්ත්‍ර පිරවීමෙන් මළමිනී නැංවීමය, සතරැස් හෝ කළබෙර ගැසීමය, ශෝභන (ප්‍රතිභාන) චිත්‍ර විචිත්‍රය,[1] සණ්ඩෙවුන් කෙළිය, හුණගස් ඔසවා නැටීමය, මිනීඇට සෝදා තැබීමය, ඇතුන් හා යුද කිරීමය, අසුන් හා යුද කිරීමය, මීවුන් හා යුද කිරීමය, උසභයන් හා යුද කිරීමය, අජයුද්ධය, මෙණ්ඩක යුද්ධය, කුක්කුට යුද්ධය, වට්ටක යුද්ධය, දණ්ඩ යුද්ධය, තොරතුරු ඇසීමය, මල්ලව යුද්ධය, (සාමාන්‍ය) යුද්ධය, ඇත් අස් ආදීන් ගණන් කිරීමය, සේනා සන්නිවෙසය, ඇත් අස් ආදීන් දැකීමය, යන විපරීත දර්‍ශනයෙහි යෙදී වෙසෙත්. මෙසේ මෙබඳුවූ විසූලූ දැක්මෙන් වැළකේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

49. එසේම යම් ඇතැම් පින්වත් මහණබමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා (දූ පෝරු ආදියෙහි කෙළීම්වූ) අට්ඨපද ක්‍රීඩාවය, දශපද ක්‍රීඩාවය, දූ පෝරු ආදියෙහි මෙන් ආකාශයෙහි ක්‍රීඩාකිරීමය, බිම මණ්ඩල වශයෙන් සාදා පැන පැන ක්‍රීඩා කිරීමය, දූ කැට නොසොල්වා නියෙන් ගසා ක්‍රීඩා කිරීමය, පසඇටින් දදු කෙළීමය, සිං කෙළීමය, භිත්ති ආදියෙහි ඉරටම්ටි ගසා ඇත් අස් ආදි රූප දක්වා කෙළීමය, පන්දු කෙළීමය, පත් කුලල් පිඹීමය, ගම් දරුවන් මෙන් ක්‍රීඩා නගුල් ගෙන සීසෑම් ව්‍යාජයෙන් කෙළීමය, කරනම් ගැසීමය, තල්පත් ආදියෙන් කත්තත්ගුරුවා තනා ක්‍රීඩා කිරීමය, කොළ නැළියෙන් වැලි ආදිය මැන කෙළීමය, කුඩා රථයෙන් කෙළීමය, කුඩා දුන්නෙන් කෙළීමය, අහසෙහි හෝ පිටෙහි හෝ අකුරු ඇඳ කෙළීමය, සිතූ දේ කියවීම් කීම් ආදියෙන් කෙළීමය, (ගොළු බිහිරි ආදීන්ගේ) ඒ ඒ දෝෂ රූප දක්වා කෙළීමය, යන මෙබඳුවූ ප්‍රමාදයට කාරණාවූ දූ කෙළීමෙහි යෙදී වාසය කෙරෙත්. මෙසේ මෙබඳුවූ දූ කෙළියෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

---

1. දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ 15 වෙනි පිටේ අඩොලිපිය බලනු.

50. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං උච්චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති - සෙය්‍යථීදං ආසන්දිං පල්ලඞ්කං ගොනකං[1] චිත්තකං පටිකං පටලිකං තූලිකං[2] විකතිකං උද්දලොමිං එකන්තලොමිං කට්ටිස්සං[3] කොසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං[4] අස්සත්ථරං[4] රථත්ථරං[4] අජිනප්පවෙණිං කාදලිමිගපවරපච්චත්ථරණං[5] සඋත්තරච්ඡදං උභතොලොහිතකූපධානං— ඉති වා ඉති එවරූපා උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

51. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං මණ්ඩනවිභූසනට්ඨානානුයොගං[6] අනුයුත්තා විහරන්ති-සෙය්‍යථීදං උච්ඡාදනං පරිමද්දනං නහාපනං[8] සම්බාහනං ආදාසං අඤ්ජනං මාලා විලෙපනං[9] මුඛචුණ්ණකං[10] මුඛාලෙපනං[11] හත්ථබන්ධං[12] සිඛාබන්ධං දණ්ඩකං[13] නාළිකං[14] ඛග්ගං[15] ඡත්තං චිත්‍රූපාහනං උණ්හීසං මණිං වාලවීජනිං[16] ඔදාතානි වත්ථානි දීඝදසානි— ඉති වා ඉති එවරූපා මණ්ඩනවිභූසනට්ඨානානුයොගා[6] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

52. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං තිරච්ඡානකථං අනුයුත්තා විහරන්ති—සෙය්‍යථීදං[7] රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං පුරිසකථං [කුමාරකථං කුමාරිකථං][17] සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං— ඉති වා ඉති එවරූපාය තිරච්ඡානකථාය පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ගොණකං S. C.
2. තූලිකං B.
3. කට්ථි° B. V. කට්ටි° S.
4. °ත්ථරණං B. V.
5. කදලි° B.P.V. කාදල° W.
6. °විභූ° B. °විභූසණ° W.
7. සෙය්‍යථිදං B. V. (සබ්බත්ථ)
8. න්හාපනං B. V.
9. මාලාගන්ධවි° S. B.
10. මුඛචුණ්ණං S. B. V.
11. මුඛලෙපනං B. V.; °විලෙපං S. මුඛාලෙපං Sa
12. °බද්ධං W.
13. දණ්ඩං B. S. V.
14. නාලිකං W.; නාලකං V.
15. අසිං V; අසිං ඛග්ගං S.
16. වාල° P. W.
17. ඉදං මරම්මපොත්ථකෙසු යෙව දිස්සති

50. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, දික්හගලා පුටුය, පලඟ්ය, සතරඟුලෙන් දිග ලොම් ඇති ඇතිරිය, විසිතුරු එළු ලොම් ඇති ඇතිරිය, එළු ලොම්මුවා සුදු ඇතිරිය, එළු ලොම්මුවා ඝනපුප් ඇතිරිය, සිංහාදි රූපයෙන් විසිතුරු එළු ලොම් ඇතිරිය, එක් පිට ලොම් ඇති එළු ලොම් ඇතිරිය, දෙපිට ලොම් ඇති එළු ලොම් ඇතිරිය, රත්කසුකම් කොට කැටි තිහිරි හුයින් කළ පසතුරුණුය, එක්විට නිළියන් සොළොස්දෙනා කෙළනා එළු ලොම් මුවා මහ ඇතිරිය, ඇතුන් පිට අතුරණ ඇතිරිය, අසුන් පිට අතුරණ ඇතිරිය, රථ පිට අතුරණ ඇතිරිය, අඳුන් දිවිසමින් කළ පසතුරුණුය, කදලිමුව සමින් කළ උතුම් පසතුරුණුය, දෙපස තබනලද රත්කන්වයින් ඇති ආසනය, යන මෙබඳු උස් අසුන් මහ අසුන් පරිභොග කෙරෙත්. මෙසේ මෙබඳු වූ උසසුන් මහ අසුන්හි හිඳීම් ආදියෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.[1]

51. එසේම යම් ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා, ඇඟ සුවඳ ඉලීමය, පිරිමැදීමය, නෑවීමය, මැඩීමය, කැඩපත් පරිහරණය, අඳුන් තෙල් පරිහරණය, මල් හා විලවුන්, මූවසුණු, මූබාලෙප, හස්තාභරණ යන මේ දේ දැරීම හා පැළඳීමය, රත් හූ ආදියෙන් සිබා (කුඩුම්බි) බැඳීමය, විසිතුරු දඬු ගෙන හැසිරීමය, බෙහෙත් නළ දසරුමෙහි එල්වාගෙන ඇවිදීමය, කඩු උරෙහි එල්වා ගෙන ඇවිදීමය, ඡත්‍රධාරීව ඇවිදීමය, විසිතුරු වහන් පයලා ඇවිදීමය, නලල්පට බැඳීමය, සිබාමාණික්‍ය පැළඳීමය, වල්විදුනා දැරීමය, දික්වූ දහවලු ඇති සුදුවත් ඇඳීමය යි මෙසේ වූ සැරසීම් හා උතුතැන් පිරවීමෙහි නිතර නිතර යෙදෙත්. මෙබඳු වූ සැරසීම්, අලඞ්කාර කිරීම් ආදියෙහි යෙදීමෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

52. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ—මහ ඇමතියන් පිළිබඳ—සේනා පිළිබඳ—භය පිළිබඳ—යුද පිළිබඳ—ආහාර පිළිබඳ—පාන වර්ග පිළිබඳ—වස්ත්‍ර පිළිබඳ—සයන පිළිබඳ—මාලා, ගන්ධ ද්‍රව්‍යයන්—නෑයන්—යානාවන්—ගම්—නියම්ගම්-නුවර-දනව්—ස්ත්‍රීන්—පුරුෂයන්—[කුමරකුමරියන්]—යොධයන්—වීථි—ඝටචෙටිකාවන් හෝ තීර්ථයන්—මළ නෑයන් යන ආදීන් පිළිබඳ කථාය, නොයෙක් ආකාරවූ ව්‍යර්ථ කථාය, ලොකාඛ්‍යායික (විතණ්ඩ) කථාය, මුහුද පිළිබඳ කථාය, භවාභවකථාය යන මෙබඳු තිරිසන් කථාවෙහි යෙදී වෙසෙත්. මෙබඳු වූ තිරච්ඡානකථාවෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

1. මෙහි ඇතුළත් දේ ගැණ ඇතැම් තොරතුරු දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ බ්‍රහ්මජාල සූත්‍රයෙන් බලා දත යුතුයි.

53. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විග්ගාහිකකථං අනුයුත්තා විහරන්ති — සෙය්‍යථීදං[1] න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි, අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡාපටිපන්නො ත්වමසි අහමස්මි සම්මාපටිපන්නො. සහිතං මෙ අසහිතං තෙ. පුරෙ වචනීයං පච්ඡා අවච පච්ඡාවචනීයං පුරෙ අවච. අවිචිණ්ණං[2] තෙ විපරාවත්තං ආරොපිතො තෙ වාදො නිග්ගහිතොසි[3] චර වාදප්පමොක්ඛාය නිබ්බෙඨෙහි වා සචෙ පහොසීති—ඉති වා ඉති එවරූපාය විග්ගාහිකකථාය පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

54. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං දූතෙය්‍ය-පහිණගමනානුයොගමනුයුත්තා විහරන්ති— සෙය්‍යථීදං[1] රඤ්ඤං රාජමහාමත්තානං ඛත්තියානං බ්‍රාහ්මණානං ගහපතිකානං කුමාරානං: ඉධ ගච්ඡ අමුත්‍රාගච්ඡ ඉදං හර අමුත්‍ර ඉදං ආහරාති— ඉති වා ඉති එවරූපා දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

55. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ කුහකා ච හොන්ති ලපකා ච නෙමිත්තිකා[4] ච නිප්පෙසිකා ච ලාභෙන[5] ලාභං නිජිගිංසිතාරො[6] ච[7]— ඉති වා ඉති[8] එවරූපා කුහනලපනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. සෙය්‍යථිදං B. V. (සබ්බත්‍ථ)
2. ආචිණ්ණං W. C.
3. නිග්ගහීතො ත්වමසි B. V. නිග්ගහීතොසි P.W.
4. නිමිත්තකා Sa.
5. ලාභෙන ච ලාභං P.S.
6. නිජිගිසිතාරො B.
7. ච ඉති න දිස්සති P.S.W.
8. ඉති එවං P. W.

53. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා 'ඔබ මේ ධර්මවිනය නොදන්නෙහිය, මම මේ ධර්මවිනය දනිමි.' 'ඔබ මේ ධර්මවිනය කුමකැයි දන්නෙහි ද? ඔබ වරදවා පිළිපන්නෙහිය, මම මනාකොට පිළිපන්නේ වෙමි.' 'මාගේ වදන් සිලිටුය හෝ අර්ථ සහිතය, ඔබගේ වචනය එසේ නොවෙයි.' 'පළමු කිය යුත්ත පසුව කීයෙහිය, පසුව කිය යුත්ත පළමුව කියෙහිය, යමක් ඔබ බොහෝ කල් පුරුදු කරණ ලද නම් ඒ සියල්ල ව්‍යර්ථ විය. ඔබට වාදාරොපනය කරණ ලදී, නිග්‍රහ කරණ ලද්දෙහිය (වාදයෙන් පැරදුනෙහිය). වාදයෙන් මිදෙනු පිණිස ක්‍රියා කරව. ඉදින් හැක්කෙහි නම් වාදයෙන් ගැළවෙව හෙවත් ඒ නිවේධනය කරව' යන ආදි විග්‍රාහික හෙවත් දෝෂාරොපණ කථාවෙහි යෙදී වෙසෙත්. මෙසේ මෙබඳු විග්‍රාහික කථාවෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

54. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා රජුන්ගේ, රජමහ ඇමතියන්ගේ, ක්ෂත්‍රියයන්ගේ, බමුණන්ගේ, ගැහැවියන්ගේ සහ කුමරුන්ගේද හසුන් ගෙණ, 'මෙතනින් අසවල් තැනට යා, අසවල් තැනින් මෙහි එව, මෙය ගෙණ යා, එතැනින් අසවල් දෙය ගෙණෙව' යි (අණවන ලදුව) දූතභාවයෙහි හා හසුන් ගෙණ යැමෙහි යෙදී වෙසෙත්. මෙබඳු දූත භාවය, හසුන් ගෙණයෑම යන මෙයින් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

55. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා කුහකයෝ ද, සිව්පසය උදෙසා කථා කරන්නෝ ද, නිමිතිකරන්නෝ නොහොත් ලාභ සත්කාර සඳහන් කරවන්නෝ ද, පරලාභාදිය උදෙසා කියන්නෝ ද,[1] ලාභයකින් ලාභයක් සොයන්නෝ ද වෙත්. මෙබඳු වූ කුහනලපනාදියෙන් වැළැක්කේ වේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

---

1. අඞ්ගුත්තරයේ පළමුවන කාණ්ඩයේ 21 වෙනි පිටේ 1 වෙනි අධෝලිපිය බලනු.

56. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති. සෙය්‍යථීදං[2] අඞ්ගං නිමිත්තං උප්පාදං[3] සුපිණං[4] ලක්ඛණං මූසිකච්ඡින්නං[14] අග්ගිහොමං දබ්බිහොමං ථුසහොමං කණහොමං තණ්ඩුලහොමං සප්පිහොමං තෙලහොමං මුඛහොමං ලොහිතහොමං අඞ්ගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා[5] සිවවිජ්ජා භූතවිජ්ජා භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා විච්ඡිකවිජ්ජා මූසිකාවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං[6] සරපරිත්තාණං මිගචක්කං — ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

57. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති. සෙය්‍යථීදං[2] මණිලක්ඛණං වත්ථලක්ඛණං[7] දණ්ඩලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං[8] ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරිලක්ඛණං දාසලක්ඛණං දාසිලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං[9] උසභලක්ඛණං ගොලක්ඛණං[10] අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං[11] කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං ගොධාලක්ඛණං කණ්ණිකාලක්ඛණං[12] කච්ඡපලක්ඛණං මිගලක්ඛණං — ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා[13] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

58. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති. සෙය්‍යථීදං[2] රඤ්ඤං නිය්‍යානං භවිස්සති රඤ්ඤං අනිය්‍යානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං ජයො භවිස්සති බාහිරානං රඤ්ඤං[15] පරාජයො භවිස්සති. බාහිරානං රඤ්ඤං ජයො භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං පරාජයො භවිස්සති. ඉති ඉමස්ස ජයො භවිස්සති ඉමස්ස පරාජයො භවිස්සති — ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ජීවිතං B. V.
2. සෙය්‍යථිදං B. V.
3. උප්පාතං B. °පාටං S.
4. සුපිනං B. P. සුපිණකං C.
5. ඛෙත්ත° B. S. V.
6. පක්ඛ° W. C.
7. සත්ථලක්ඛණං B. V.; දණ්ඩ° වත්ථ° P. W.
8. ආයුධ° B. P.
9. මහිංස° B.
10. ගොණ° B.
11. මෙණ්ඩක° V. W.
12. කණ්ණික° B. S.
13. මිච්ඡාජීවා ඉති න දිස්සති P.
14. මූසිකා° P. W.
15. රඤ්ඤං ඉති න දිස්සති B. V.

56. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, අඞ්ග (සාමුද්‍රිකා) ශාස්ත්‍රය, නිමිති ශාස්ත්‍රය, (අසනිපාතාදි මහ නිමිති බලා කියන) උත්පාද ශාස්ත්‍රය, ස්වප්න ශාස්ත්‍රය, ලක්‍ෂණ ශාස්ත්‍රය, (මීයන් කැපූ වස්ත්‍රාදිය බලා කියන) මූසික ශාස්ත්‍රය, අග්නිහෝමය, දබ්බිහෝමය, ථුස හෝමය, තණ්ඩුල—කණ—සප්පි—තෙල—මුඛ—ලෝහිත හෝමය, අඞ්ග විද්‍යා, වාස්තු විද්‍යා, නීති ශාස්ත්‍රය, සොහොණෙහි ශාන්ති කරන්නාවූ විද්‍යාව හෝ සිවල් රුත විද්‍යා, භූත විද්‍යා, අහි විද්‍යා, විෂ විද්‍යා, විච්ඡික විද්‍යා, මූසික විද්‍යා, සකුණ විද්‍යා, වායස විද්‍යා, ජීවන කාලය කීම වූ පක්කජ්ඣානය, ශරපරිත්‍රාණය (ආයුධ වැළැක්ම), තිරිසන් සතුන්ගේ ශබ්ද දැනීම වශයෙන් පැවති මන්ත්‍රය යන තිරශ්චීන විද්‍යා[1] හෙතුකොට ගෙන මිථ්‍යාජීවයෙන් ජීවිකාව කෙරෙත්. මෙසේ මෙබඳු තිරශ්චීනවිද්‍යා හෙතුවෙන් කරණ ලාමකජීවිකාවෙන් වැළැක්කේ වේද මෙද ඔහුගේ සීලය පිණිස වේ.

57. එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, මිණි ලක්‍ෂණය, වස්ත්‍ර ලක්‍ෂණය, දණ්ඩ — බඩන — ශර — දුනු — ආයුධ—ඉත්ථි—පුරිස—කුමාර—කුමාරි—දාස— දාසි—හත්ථි—අස්ස— මහිස—උසභ—ගො—අජ—මෙණ්ඩ— කුක්කුට—වට්ටක —ගොධා— කණ්ණිකා —කච්ඡප—මිග ලක්‍ෂණය යන මෙබඳු තිරච්ඡාන විද්‍යාවන්[1] කරණකොට ගෙණ වැරදි ජීවිකාව කෙරෙත්. මෙසේ වූ තිරශ්චීන විද්‍යාවන් නිසා කරණ වැරදි ජීවිකාවෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

58. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා 'අසවල් දින රජුන්ගේ බැහැර යෑම වන්නේය, අසවල් දින රජුන්ගේ ඇතුළු නුවරට යෑම වන්නේය, අසවල් දින ඇතුළුනුවර රජුන්ගේ ආක්‍රමණය වන්නේය, බැහැර රජුන්ගේ බැහැරට යෑම වන්නේය. බැහැර රජුන්ගේ ඇතුළු නුවරට එම වන්නේය, ඇතුළුනුවර රජුන්ගේ ආපසු යෑම වන්නේය, ඇතුළුනුවර රජුන්ට ජය වන්නේය, බැහැර රජුන්ට පරාජය වන්නේය. බැහැර රජුන්ට ජය වන්නේය. ඇතුළුනුවර රජුන්ට පරාජය වන්නේය. මෙසේ මොහුට ජය වන්නේය, මෙසේ පරාජය වන්නේය' යි කියා මෙසේ තිරශ්චීනවිද්‍යා හෙතුකොට ලාමක ජීවිකාව කෙරෙත්. මෙබඳු වූ තිරච්ඡාන විජ්ජා හෙතුවෙන් කරණ මිච්ඡාජීවයෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

1. දීඝනිකායේ පළමුවෙනි කාණ්ඩයේ 21 වෙනි පිට බලනු.

56. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති. සෙය්‍යථීදං[2] අඞ්ගං නිමිත්තං උප්පාදං[3] සුපිණං[4] ලක්ඛණං මූසිකච්ඡින්නං[14] අග්ගිහොමං දබ්බිහොමං ථුසහොමං කණහොමං තණ්ඩුලහොමං සප්පිහොමං තෙලහොමං මුඛහොමං ලොහිතහොමං අඞ්ගවිජ්ජා වත්ථුවිජ්ජා ඛත්තවිජ්ජා[5] සිවවිජ්ජා භූතවිජ්ජා භූරිවිජ්ජා අහිවිජ්ජා විසවිජ්ජා විච්ඡිකවිජ්ජා මූසිකාවිජ්ජා සකුණවිජ්ජා වායසවිජ්ජා පක්කජ්ඣානං[6] සරපරිත්තානං මිගචක්කං — ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

57. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති. සෙය්‍යථීදං[2] මණිලක්ඛණං වත්ථලක්ඛණං[7] දණ්ඩලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං[8] ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරලක්ඛණං කුමාරිලක්ඛණං දසලක්ඛණං දසිලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං[9] උසභලක්ඛණං ගොලක්ඛණං[10] අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං[11] කුක්කුටලක්ඛණං වට්ටකලක්ඛණං ගොධාලක්ඛණං කණ්ණිකා-ලක්ඛණං[12] කච්ඡපලක්ඛණං මිගලක්ඛණං — ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා[13] පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

58. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති. සෙය්‍යථීදං[2] රඤ්ඤං නිය්‍යානං භවිස්සති රඤ්ඤං අනිය්‍යානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං උපයානං භවිස්සති බාහිරානං රඤ්ඤං අපයානං භවිස්සති. බාහිරානං රඤ්ඤං උපයානං භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං අපයානං භවිස්සති. අබ්භන්තරානං රඤ්ඤං ජයො භවිස්සති බාහිරානං රඤ්ඤං[15] පරාජයො භවිස්සති. බාහිරානං රඤ්ඤං ජයො භවිස්සති අබ්භන්තරානං රඤ්ඤං පරාජයො භවිස්සති. ඉති ඉමස්ස ජයො භවිස්සති ඉමස්ස පරාජයො භවිස්සති — ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ජීවිතං B. V.
2. සෙය්‍යථිදං B. V.
3. උප්පාතං B. °පාතං S.
4. සුපිනං B. P. සුපිණකං C.
5. ඛෙත්ත° B. S. V.
6. පක්ඛ° W. C.
7. සත්ථලක්ඛණං B. V.; දණ්ඩ° වත්ථ° P. W.
8. ආයුධ° B. P.
9. මහිංස° B.
10. ගොණ° B.
11. මෙණ්ඩක° V. W.
12. කණ්ණික° B. S.
13. මිච්ඡාජීවා ඉති න දිස්සති P.
14. මූසිකා° P. W.
15. රඤ්ඤං ඉති න දිස්සති B. V.

56. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, අඞ්ග (සාමුද්‍රිකා) ශාස්ත්‍රය, නිමිති ශාස්ත්‍රය, (අසනිපාතාදි මහ නිමිති බලා කියන) උත්පාද ශාස්ත්‍රය, ස්වප්න ශාස්ත්‍රය, ලක්‍ෂණ ශාස්ත්‍රය, (මීයන් කැපූ වස්ත්‍රාදිය බලා කියන) මූසික ශාස්ත්‍රය, අග්ගිහෝමය, දබ්බිහෝමය, ථුස හෝමය, තණ්ඩුල—කණ—සප්පි—තෙල—මුඛ—ලොහිත හෝමය, අඞ්ග විද්‍යා, වාස්තු විද්‍යා, නීති ශාස්ත්‍රය, සොහොණෙහි ශාන්ති කරන්නාවූ විද්‍යාව හෝ සිවල්රුත විද්‍යා, භූත විද්‍යා, අහි විද්‍යා, විෂ විද්‍යා, විච්ඡික විද්‍යා, මූසික විද්‍යා, සකුණ විද්‍යා, වායස විද්‍යා, ජීවන කාලය කීම වූ පක්කජ්ඣානය, ශරපරිත්‍රාණය (ආයුධ වැළැක්ම), තිරිසන් සතුන්ගේ ශබ්ද දැනීම වශයෙන් පැවති මන්ත්‍රය යන තිරශ්චීන විද්‍යා[1] හෙතුකොට ගෙන මිථ්‍යාජීවයෙන් ජීවිකාව කෙරෙත්. මෙසේ මෙබඳු තිරශ්චීනවිද්‍යා හෙතුවෙන් කරණ ලාමකජීවිකාවෙන් වැළැක්කේ වේද මෙද ඔහුගේ සීලය පිණිස වේ.

57. එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙනලද බොජුන් වළඳා, මිණි ලක්‍ෂණය, වස්ත්‍ර ලක්‍ෂණය, දණ්ඩ — ඛඩ්ග — ශර — දුනු — ආයුධ — ඉත්ථි — පුරිස — කුමාර — කුමාරි — දාස — දාසි — හත්ථි — අස්ස — මහිස — උසභ — ගො — අජ — මෙණ්ඩ — කුක්කුට — වට්ටක — ගොධා — කණ්ණිකා — කච්ඡප — මිග ලක්‍ෂණය යන මෙබඳු තිරච්ඡාන විද්‍යාවන්[1] කරණකොට ගෙණ වැරදි ජීවිකාව කෙරෙත්. මෙසේ වූ තිරශ්චීන විද්‍යාවන් නිසා කරණ වැරදි ජීවිකාවෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

58. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා 'අසවල් දින රජුන්ගේ බැහැර යෑම වන්නේය, අසවල් දින රජුන්ගේ ඇතුළු නුවරට යෑම වන්නේය, අසවල් දින ඇතුළුනුවර රජුන්ගේ ආක්‍රමණය වන්නේය, බැහැර රජුන්ගේ ආපසු යෑම වන්නේය, බැහැර රජුන්ගේ ඇතුළු නුවරට ඒම වන්නේය, ඇතුළුනුවර රජුන්ගේ බැහැරට යෑම වන්නේය. ඇතුළුනුවර රජුන්ට ජය වන්නේය, බැහැර රජුන්ට පරාජය වන්නේය. බැහැර රජුන්ට ජය වන්නේය. ඇතුළුනුවර රජුන්ට පරාජය වන්නේය. මෙසේ මොහුට ජය වන්නේය, මෙසේ පරාජය වන්නේය' යි කියා මෙසේ තිරශ්චීනවිද්‍යා හෙතුකොට ලාමක ජීවිකාව කෙරෙත්. මෙබඳු වූ තිරච්ඡාන විජ්ජා හෙතුවෙන් කරණ මිච්ඡාජීවයෙන් වැළැක්කේ නම් මෙද ඔහුගේ සීලය පිණිස වේ.

1. දීඝනිකායේ පළමුවෙනි කාණ්ඩයේ 21 වෙනි පිට බලනු.

59. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති — සෙය්‍යථීදං[2] චන්දග්ගාහො භවිස්සති සූරියග්ගාහො[3] භවිස්සති නක්ඛත්තග්ගාහො භවිස්සති. චන්දිමසූරියානං[3] පථගමනං භවිස්සති චන්දිමසූරියානං[3] උප්පථගමනං භවිස්සති. නක්ඛත්තානං පථගමනං භවිස්සති නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති. උක්කාපාතො භවිස්සති. දිසාඩාහො[4] භවිස්සති. භූමිචාලො භවිස්සති. දෙවදුන්දුභි[5] භවිස්සති. චන්දිමසූරියනක්ඛත්තානං[3] උග්ගමනං ඔගමනං[6] සඞ්කිලෙසං වොදානං භවිස්සති. එවංවිපාකො චන්දග්ගාහො භවිස්සති. එවංවිපාකො සූරියග්ගාහො[3] භවිස්සති. එවංවිපාකො නක්ඛත්තග්ගාහො භවිස්සති. එවංවිපාකං[7] චන්දිමසූරියානං[3] පථගමනං භවිස්සති. එවංවිපාකං[7] චන්දිමසූරියානං[3] උප්පථගමනං භවිස්සති. එවංවිපාකං[7] නක්ඛත්තානං පථගමනං භවිස්සති. එවංවිපාකං[7] නක්ඛත්තානං උප්පථගමනං භවිස්සති. එවංවිපාකො උක්කාපාතො භවිස්සති. එවංවිපාකො දිසාඩාහො[4] භවිස්සති. එවංවිපාකො භූමිචාලො භවිස්සති. එවංවිපාකො දෙවදුන්දුභි[5] භවිස්සති. එවංවිපාකං චන්දිමසූරියනක්ඛත්තානං[3] උග්ගමනං ඔගමනං[6] සඞ්කිලෙසං වොදානං භවිස්සති—ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

60. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති — සෙය්‍යථීදං[2] සුබ්බුට්ඨිකා[8] භවිස්සති දුබ්බුට්ඨිකා[9] භවිස්සති. සුභික්ඛං භවිස්සති දුබ්භික්ඛං භවිස්සති. ඛෙමං භවිස්සති භයං භවිස්සති. රොගො භවිස්සති ආරොග්‍යං භවිස්සති. මුද්දා ගණනා[10] සංඛානං කාවෙය්‍යං ලොකායතං — ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ජීවිතං B. V.
2. සෙය්‍යථිදං° B. V. (සබ්බත්ථ)
3. °සුරිය° B.
4. °දාහො W.
5. °දුදුභි B. V
6. ඔග්ගමනං B. S. V.
7. °විපාකො P.
8. සුවු° V.; සුවුට්ඨිකා B.
9. දුබ්බුට්ඨිකං B.
10. ගණන B.

59. එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා: චන්ද්‍රග්‍රහණය වන්නේය, සූර්‍ය්‍යග්‍රහණය--තාරකා සමාගමය—සඳහිරු දෙදෙනාගේ නියම මාර්‍ගගමන—සඳහිරු දෙදෙනාගේ අමාර්‍ගගමන—තාරකාවන්ගේ මාර්‍ගගමන—තාරකාවන්ගේ අමාර්‍ගගමන වන්නේය, උල්කාපාතය වන්නේය, දිසා දැවීම—පොළොව කම්පාව—අහස ගිගුරුම—සඳ, හිරු, තාරකා යන මොවුන්ගේ නැගීම හා අස්තයට යෑම ද කෙලෙසීම ද පිරිසිදු වීම ද වන්නේය. චන්ද්‍රග්‍රහණය මෙබඳු විපාක ඇතිවන්නේය, සූර්‍ය්‍යග්‍රහණය—තාරකා සමාගමය — චන්ද්‍රසූර්‍ය්‍යයන්ගේ මාර්ගයෙහි ගමන — ඔවුන්ගේ නොමග ගමන — තාරකාවන්ගේ මාර්ගයෙහි ගමන — තාරකාවන්ගේ නොමග ගමන — උල්කාපාතය — දිගුන් දැවීම — භූමි චලනය — අහස් ගිගුරුම — සඳ, හිරු, තාරකාවන්ගේ නැගීම, බැසීම, කිලිටිවීම හා පිරිසිදුවීම මෙබඳු විපාක ඇති වන්නේ යයි කියා මෙසේ තිරශ්චානවිජ්ජා හෙතුවෙන් කරණ මිථ්‍යාජීවිකාවෙන් ජීවිකාව කෙරෙත්. මෙසේ වූ තිරශ්චීනවිද්‍යා හෙතුකොටගෙණ කරණ ලාමක ජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඔහුගේ සීලය පිණිස වේ.

60. එසේම ඇතැම් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා: මනා වැසි ඇතිවන්නේය, නපුරු වැසි—යහපත් භික්ෂා—දුර්භික්ෂා—නිර්භය—භය—රෝග—නීරෝගිබව ඇතිවන්නේයයි කිමද, ඇඟිල්ල ඇල්ලීමය, ගිණීමය, පුඩුගණනය, කාව්‍ය කිරීමය, විතණ්ඩ ශාස්ත්‍ර ඉගෙණීම යයි මෙසේ තිරශ්චීන විද්‍යාවන් කරණකොට මිථ්‍යා ජීවිකාව කෙරෙත්. මෙසේවූ තිරශ්චීන විද්‍යා හෙතුවෙන් වන මිථ්‍යා ජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඔහුගේ සීලය පිණිස වේ.

61. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති — සෙය්‍යථීදං:[2] ආවාහනං[3] විවාහනං[3] සංවදනං[4] විවදනං සංකිරණං විකිරණං සුභගකරණං[5] දුබ්භගකරණං[6] විරුද්ධගබ්භකරණං ජිව්හානිත්ථද්ධනං[7] හනුසංහනනං හත්ථාභිජප්පනං[8] කණ්ණජප්පනං ආදාසපඤ්හං කුමාරිපඤ්හං[9] දෙවපඤ්හං ආදිච්චුපට්ඨානං මහතුපට්ඨානං අබ්භුජ්ජලනං සිරිව්හායනං[10] —ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

62. යථා වා පනෙකෙ හොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං[1] කප්පෙන්ති — සෙය්‍යථීදං:[2] සන්තිකම්මං පණිධිකම්මං භූතකම්මං[11] භූරිකම්මං වස්සකම්මං වොස්සකම්මං වත්ථුකම්මං වත්ථුපරිකිරණං[12] ආචමනං නහාපනං[13] ජුහනං[14] වමනං විරෙචනං උද්ධවිරෙචනං[15] අධොවිරෙචනං සීසවිරෙචනං කණ්ණතෙලං නෙත්තතප්පණං[16] නත්ථුකම්මං අඤ්ජනං පච්චඤ්ජනං[17] සාලාකියං සල්ලකත්තියං[18] දාරකතිකිච්ඡා[19] මූලභෙසජ්ජානං අනුප්පදානං[20] ඔසධීනං පටිමොක්ඛො[21] — ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

---

1. ජීවිතං B. V.
2. සෙය්‍යථිද° B.V.
3. °හණං C.
4. °රණං B.V.; °රනං S.
5. සුභාගක° B.
6. දුබ්භාග°B.
7. °නිබන්ධනං B. V. S.
8. හත්ථා° හනුජප්පනං කණ්ණ° B. V.
9. කුමාරික° V. C.
10. සිරව්හායනං P. W.
11. භූරි°(භූතිකම්මං) P.
12. වත්ථුබලිකම්මං V., වත්ථුපරිකම්මං B. °පටිකිරණං P.
13. න්හාපනං B. V.
14. ජූහනං Sa. ජුහණං C.
15. උද්ධංවි° B. V.
16. නෙත්තපානං B; නෙත්තප්පානං S.; නෙත්තතප්පනං Sa. C.
17. පච්ච° V.
18. °තිකං P. V. W.
19. °තිකිච්ඡං S.
20. අනුප්පදනං B. S.
21. පති°B.V.

61. එසේම ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා, ආවාහ කරවීමය, විවාහ කරවීමය, සමගිය පිළිබඳ කථා කිරීමය, වියොගය පිළිබඳ කථා කිරීමය, ධන රැස්කිරීමය, වියදම් කිරීමය, සුභග කරණය (යහපත් ශ්‍රී කිරීමය), දුර්භගකරණය, ගර්භවිරොධී කරණය, දිව තද කිරීමය, හනු බැඳීමය, අත් පෙරළීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, ශබ්ද නොඇසීම පිණිස මන්ත්‍ර ජප කිරීමය, කැඩපත්හි දෙවතාරොපණය කොට පැණ පිළිවිසීමය, කුමරියගේ සිරුරෙහි දෙවතාරොපණය කොට පැණ පිළිවිසීමය, දෙවදාසියගේ සිරුරෙහි යකුන් ආරොපණය කොට පැණ පිළිවිසීමය, හිරු වැඳීමය, මහබඹුට උවටැන් හෝ නැමදුම් කිරීමය, මුවින් ගිනි දල් පිට කිරීමය, ශ්‍රී දෙවිය කැඳවීම යයි කියන මෙබඳු තිරශ්චීන විද්‍යාවෙන් මිථ්‍යාජීවිකාව කෙරෙත්. මෙබඳුවූ තිරශ්චාන විජ්ජාවෙන් කරණ මිථ්‍යාජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඔහුගේ සීලය පිණිස වේ.

62. එසේම, ඇතැම් පින්වත් මහණ බමුණෝ සැදැහැයෙන් දෙන ලද බොජුන් වළඳා, ශාන්ති ප්‍රතිඥත කර්මය,[1] කායික සමාධියෙන් පසු කළයුතු ප්‍රණිධිකර්මය, මන්ත්‍ර ප්‍රයොග කිරීමය, භූරිකර්මය, පණ්ඩකයා පුරුෂයකු කිරීමය, පුරුෂයා පණ්ඩකයකු කිරීමය, ගෙවල් නොකළ බිම ගෙවල් කිරීමය, ගෙට සුදුසු තැන බලිකම් විධානය, දියෙන් මුව සුද්ධ කිරීමය, නැහැවීමය, ගිනි පිදීමය, වමන කරවීමය, විරෙක කරවීමය, ඌර්ධ්ව විරෙකය, අධොවිරෙකය, සිරොවිරෙකය, කන් තෙලය, නෙත්‍රතර්පණය, නස්‍ය කිරීමය, ක්ෂාරවූ අඳුන් තැනීමය, සිසිල් බෙහෙත් අඳුන් සෑදීමය, සැත් කටු ලා කටයුතු වෛද්‍යකර්මය, ශල්‍යකර්මය, ළදරුවන් පිළිබඳ වෛද්‍යකර්මය, මූලික බෙහෙත් දීමය (බෙහෙත් ද්‍රව්‍යයෙන් කටයුතු ශරීර චිකිත්සාය), සැර බෙහෙත් දී පසුව එහි බල හැරීමය යන මෙබඳු තිරශ්චීන විද්‍යා කරණකොට හෝ මිථ්‍යාජීවයෙන් ජීවිකාව කෙරෙත්. මෙබඳුවූ මිථ්‍යාජීවිකාවෙන් වැළැක්කේ නම් මෙ ද ඔහුගේ සීලය පිණිස වේ.

---

1. මේ ආදියෙහි විස්තර දීඝනිකායේ පළමුවන කාණ්ඩයේ බ්‍රහ්මජාල සූත්‍රයෙන් බලා දත යුතුයි.

63. අථ[1] ඛො සො වාසෙට්ඨ භික්ඛු එවංසීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සෙය්‍යථාපි වාසෙට්ඨ ඛත්තියො මුද්ධාභිසිත්තො[2] නිහතපච්චාමිත්තො න කුතොචි භයං සමනුපස්සති යදිදං පච්චත්ථිකතො එවමෙව ඛො වාසෙට්ඨ භික්ඛු එවංසීලසම්පන්නො න කුතොචි භයං සමනුපස්සති යදිදං සීලසංවරතො. සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති. එවං ඛො වාසෙට්ඨ භික්ඛු සීලසම්පන්නො හොති.

64. කථඤ්ච[3] වාසෙට්ඨ භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති? ඉධ වාසෙට්ඨ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී[4]. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාසවෙය්‍යුං[5] තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා—පෙ—ඝාණෙන ගන්ධං ඝායිත්වා—පෙ—ජිව්හාය රසං සායිත්වා—පෙ—කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා—පෙ—මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී[4]. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාසවෙය්‍යුං[5] තස්ස සංවරාය පටිපජ්ජති රක්ඛති මනින්ද්‍රියං මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං[6] පටිසංවෙදෙති. එවං ඛො වාසෙට්ඨ භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති.

---

1. ස ඛො P. S. W.
2. මුද්ධාව° P. C.
3. කථංච පන S.
4. නානුව්‍ය° P. W.
5. අන්වාස්ස° P. W.
6. අව්‍යා° P. W.

63. වාසෙට්ඨය, මෙසේ සීලසම්පන්නවූ මහණහට (අසංවරය මුල්කොට උපදනාවූ) භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු ඔහුගේ සීලසංවරය හෙතුකොටගෙණ කිසිතැනකදී නොඋපදනේය. කුමක් මෙන්ද යත්:— වාසෙට්ඨය, ක්‍ෂත්‍රියාභිෂේකයෙන් මුදුනෙහි අභිෂේක ලද්දවූ, නැසූ පසමිතුරන් ඇති, ක්‍ෂත්‍රිය රජෙක් කිසියම් සතුරෙකුගෙන් කිසි භයක් නොදක්නේද, එපරිද්දෙන්ම වාසෙට්ඨය, සීලසම්පන්නවූ මහණතෙමේ (අසංවර හෙතුවෙන් උපදනාවූ) භය කාරණයන් අතුරෙන් එකක් පමණකුදු සීලසංවරය හෙතුකොට කිසි තැනකදී නොදක්නේය (ඔහුට කිසිවකින් බියක් නැත). ආර්‍ය්‍යවූ (ශ්‍රෙෂ්ඨවූ) මේ සීල රාශියෙන් යුක්තවූ ඒ මහණ තෙමේ, ස්වසන්තානයෙහි පිරිසිදුවූ (කායික චෛතසික) සැපය විඳියි. වාසෙට්ඨය, මෙසේ දක්වූ (ත්‍රිවිධ) ශීලයෙන් යුක්තවූ මහණ තෙමේ සීලසම්පන්න නම් වේ.

64. වාසෙට්ඨය, භික්‍ෂුතෙම කෙසේ නම් ඉන්ද්‍රියයන් කෙරෙහි වැසූ දොර ඇතිවේ ද? වාසෙට්ඨය, මේ සස්නෙහි (මනාසේ පිළිපන්) මහණ තෙමේ, ඇසින් රූපයක් දැක නිමිත්තග්‍රාහී නොවේ (එහි නොඇලේ). අනුබ්‍යඤ්ජන වශයෙන් නොගන්නේ එහි විස්තර සෙවීමට නොපෙළඹේ. චක්ඛුන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට යමක් හෙතුකොටගෙණ අභිජ්ඣාදෞමනස්සාදි (දූසී ආසාව හා කලකිරීමාදි) ලාමක වූ අකුශල ධර්මයෝ වහනය වන්නාහු ද (ස්වසන්තානයට ඇතුල් වන්නාහු ද), එබඳු දෙයින් වැළකීම පිණිස හෙතෙම පිළිපදී. හෙතෙම තමාගේ චක්ඛුන්ද්‍රිය රකී, චක්ඛුන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. කනින් ශබ්දයක් අසා— [ඇස පිළිබඳ කී නයින් දත යුතුයි]—නාසයෙන් ගන්ධයක් ආඝ්‍රාණයකොට —පෙ— දිවෙන් රසයක් විඳ —පෙ— කයින් ස්පර්ශකටයුත්තක් ස්පර්ශකොට —පෙ— සිතින් ධර්මයක් (කරුණක්) දැන එහි නිමිති නොගන්නේය (එහි නොඇලෙන්නේය), අනුබ්‍යඤ්ජන වශයෙන් නොගන්නේය (එහි නොපෙළඹෙන්නේය). මනෙන්ද්‍රියයෙහි (සිතෙහි) අසංවරව වසන්නහුට යමක් නිසා අභිජ්ඣා දෞමනස්සාදි ලාමක අකුශල ධර්මයෝ වහනය වෙත් ද (ස්වකීය සන්තානයට වදිත් ද), එබඳු දෙයින් වැළකීම පිණිස හෙතෙම පිළිපදී. හෙතෙම මනෙන්ද්‍රිය රකී, මනෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. එබඳුවූ මහණ තෙමේ ආර්‍ය්‍ය වූ (උතුම් වූ) ශීල රාශියෙන් යුක්ත වූයේ, අභ්‍යන්තරයෙහි පිරිසිදුවූ (අසම්මිශ්‍රවූ) අධිචිත්ත සුඛය විඳියි. වාසෙට්ඨය, මෙසේ වූ මහණ තෙමේ ඉන්ද්‍රියයන්හි වසන ලද දොරටු ඇත්තේ වේ.

65. කථඤ්ච වාසෙට්ඨ භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති?

ඉධ වාසෙට්ඨ භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති සම්මිඤ්ජිතෙ[1] පසාරිතෙ සම්පජානකාරී හොති සඞ්ඝාටි-පත්තචීවරධාරණෙ සම්පජානකාරී හොති අසිතෙ පීතෙ[2] ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොති. එවං ඛො වාසෙට්ඨ භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති.

66. කථඤ්ච වාසෙට්ඨ භික්ඛු සන්තුට්ඨො හොති?

ඉධ වාසෙට්ඨ භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන[3] චීවරෙන කුච්ඡිපරිහාරිකෙන[3] පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. සෙය්‍යථාපි වාසෙට්ඨ පක්ඛී සකුණො යෙන යෙනෙව ඩෙති සපත්තභාරොව ඩෙති එවමෙව ඛො[4] වාසෙට්ඨ භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරිකෙන[3] චීවරෙන කුච්ඡිපරිහාරිකෙන[3] පිණ්ඩපාතෙන. සො යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. එවං ඛො වාසෙට්ඨ භික්ඛු සන්තුට්ඨො හොති.

1. සමිඤ්ජිතෙ B. V.
2. පිතෙ B.
3. °පරිහාරියෙන V.
4. ඛො ඉති න දිස්සති P.

65. වාසෙට්ඨය, මහණ තෙමේ කෙසේ නම් සතිසම්පජඤ්ඤයෙන් (සිහියෙන් හා මනා ප්‍රඥාවෙන්) යුක්ත වූයේ වේද?

වාසෙට්ඨය, මේ සස්නෙහි (මනාව පිළිපන්) මහණ තෙම ඉදිරියට යෑමෙහි ද, ආපසු යෑමෙහි ද, යහපත් වූ නුවණින් දැන ඒ ක්‍රියා කරන්නේය. ඉදිරි බැලීමෙහි ද, අනුදික් (වටපිට) බැලීමෙහි ද, නුවණින් දැන බලන්නේය. අත් පා හැකිලීමෙහි ද දිගු කිරීමෙහි ද මනා නුවණින් දැන එසේ කරන්නේය. සඟලය, පාත්‍රය, සිවුරුය යන මේ දේ දැරීමෙහිදී මනා නුවණින් දැන ඒ ඒ දැරීම් ආදිය කරන්නේය. අනුභව කිරීමය, පානය කිරීමය, කෑමය, රස විඳීමය යන මෙහි ද මනා නුවණින් යෙදී (දැන) ඒ ඒ අනුභව කිරීමාදිය කරන්නේය. මල මූත්‍ර පහකිරීම් ද නුවණින් (ආදීනව) සලකා කරන්නේය. යෑම්, සිටීම්, හිඳීම්, සැතපීම්, නිදි තොරකිරීම්, කථාකිරීම්, නිශ්ශබ්ද ව සිටීම් යන මේ දේ මනා නුවණින් දැන කරන්නේය. වාසෙට්ඨය, මෙසේ කරන්නාවූ මහණ තෙමේ සිහියෙන් යුක්තවූයේ යහපත් නුවණින් යුක්ත වූයේ වෙයි. (මෙකී සියලු ඉරියව් පිළිබඳව ආදීනව හා ආනිසංසයන් ද, ශරීරය පිළිබඳ අනිත්‍යතාදි ස්වභාවයන්ද නුවණින් සලකා ඒ ඒ කෘත්‍යයන්හි යෙදේ යි සේයි.)

66. වාසෙට්ඨය, මහණතෙමේ කෙසේ නම් (ප්‍රත්‍යයන් පිළිබඳ යථාලාභසන්තොෂයෙන්) සතුටු වූයේ වේද?

වාසෙට්ඨය, මේ සස්නෙහි (මනාව පිළිපන්) මහණතෙමේ කායපරිහරණයට ප්‍රමාණවූ (යත්තම් කය වැසීමට තරම්වූ) සිවුරෙන් ද කුසපරිහරණයට ප්‍රමාණවූ පිණ්ඩපාත භොජනයෙන් ද සතුටු වූ සිත් ඇත්තේ වේ. ඒ මහණතෙමේ යම් යම් තැනකට යේ නම් අටපිරිකර (කය පිළිබඳ වූ දේ) පමණක් රැගෙණ යේ. වාසෙට්ඨය, යම් සේ පියාපත් ඇති පක්ෂියෙක් යම් යම් තැනෙක පියාඹා යේ නම් ඒ සියලු තැන පියාපත් බර පමණකින් යුක්තව පියාඹා යේද, වාසෙට්ඨය, එපරිද්දෙන්ම භික්ෂු තෙමේ ද කාය පරිහරණයට ප්‍රමාණවූ සිවුරෙන් ද කුච්ඡිපරිහරණයට ප්‍රමාණවූ පිණ්ඩපාත භොජනයෙන් ද සතුටු වන්නේ වේ. ඒ මහණ තෙමේ යම් යම් තැනක යේ නම් කායපටිබද්ධවූ අටපිරිකර පමණක් රැගෙණ බැහැර යේ. වාසෙට්ඨය, මෙසේ වූ මහණ තෙමේ (යම්තම් ලත් දෙයින්) ඉතරීතරසන්තොෂයෙන් යුක්තවේ.

67. සො ඉමිනා ච[1] අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං[2] වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

68. සො අභිජ්ඣං ලොකෙ පහාය විගතාභිජ්ඣෙන චෙතසා විහරති අභිජ්ඣාය චිත්තං පරිසොධෙති. බ්‍යාපාදපදොසං[3] පහාය අබ්‍යාපන්නචිත්තො[4] විහරති සබ්බපාණභූතහිතානුකම්පී බ්‍යාපාදපදොසා[3] චිත්තං පරිසොධෙති. ථීනමිද්ධං[5] පහාය විගතථීනමිද්ධො[5] විහරති ආලොකසඤ්ඤී සතො සම්පජානො ථීනමිද්ධා[5] චිත්තං පරිසොධෙති. උද්ධච්චකුක්කුච්චං පහාය අනුද්ධතො විහරති අජ්ඣත්තං වූපසන්තචිත්තො උද්ධච්චකුක්කුච්චා චිත්තං පරිසොධෙති. විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

69. සෙය්‍යථාපි වාසෙට්ඨ පුරිසො ඉණං[6] ආදාය කම්මන්තෙ පයොජෙය්‍ය තස්ස තෙ කම්මන්තා සමිජ්ඣෙය්‍යුං. සො යානි ච පොරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තීකරෙය්‍ය[7]. සියා චස්ස[8] උත්තරිං අවසිට්ඨං දාරභරණාය[9]. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ ඉණං[6] ආදාය කම්මන්තෙ පයොජෙසිං[10]. තස්ස මෙ තෙ කම්මන්තා සමිජ්ඣිංසු. සොහං යානි ච පොරාණානි ඉණමූලානි තානි ච බ්‍යන්තිඅකාසිං.[11] අත්ථි ච මෙ උත්තරිං අවසිට්ඨං දාරභරණායාති[9]. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං[12] අධිගච්ඡෙය්‍ය[13] සොමනස්සං.

---

1. චකාරො නත්ථි W.
2. සුසාණං C.
3. ව්‍යා° P. W.
4. අව්‍යා° P. W.
5. ථින° B.
6. ඉනං C.
7. ව්‍යන්ති° P.C. °ව්‍යන්ති° W. බ්‍යන්තිං° B
8. තස්ස Sa.
9. දුර° P. W.
10. පයොජෙමි B.
11. ව්‍යන්තිං අ° B. ව්‍යන්ති° P. W.
12. පාමුජ්ජං P. W. C.
13. අධිගච්ඡෙ C. P

67. ආර්‍ය්‍යවූ හෙවත් උතුම්වූ මේ සීලසමූහයෙන් යුක්තවූ ද, උතුම්වූ මේ ඉන්ද්‍රියසංවරයෙන් යුක්තවූ ද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවූ ද, මේ උතුම් ඉතරීතරසන්තොෂයෙන් යුක්තවූ ද, ඒ (යෝගාවචර) මහණ තෙමේ (මනුෂ්‍ය වාසයෙන් දුනු පන්සියයකින් ඔබ්බෙහි වූ) අරණ්‍යය ද, (ජනයාගෙන් තොරවූ) වෘක්ෂමූලය ද, පර්වත පෙදෙස් ද, කඳුරැලි ගිරිගුහාවන් හෝ මහා උමගද, සොහොන් ද, ඉතා දුරවූ වනසෙනසුන් ද, අභ්‍යාවකාශ (බොහෝ ඉඩකඩ ඇති) තැන් සහ පිදුරු ගුහා ද යන මේ (ජනයාගෙන් හිස්වූ) සෙනසුන් ඇසුරු කෙරෙයි. ඒ මහණ තෙමේ පසුබත්කාලයෙහි පිණ්ඩපාත භොජනයෙන් වැලැක්කේ, පර්‍ය්‍යඞ්කය බැඳ, උඩුකය ඇද නොවන සේ තබා, නිවණෙහිම සිත එලවා, ඒ නිවණම අරමුණු වසයෙන් සිත ඉදිරියෙහි පිහිටුවා ගෙණ හිඳී.

68. ඒ මහණ තෙමේ ලොකයෙහි (පඤ්චුපාදානස්කන්ධයන්හි) අභිධ්‍යාව (ලොභය) පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේ. ඒ අභිධ්‍යාවෙන් සිත (වෙන්කොට) පිරිසුදු කෙරේ. සිත කෙලසන්නාවූ ක්‍රොධය පහකොට, ක්‍රොධයෙන් දූෂිතවූ සිත් නැත්තේ, ප්‍රාණිවූ සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේව වෙසේ. ව්‍යාපාද දූෂණයෙන් සිත (වෙන් කොට) පිරිසුදු කෙරේ. කායචිත්ත දෙදෙනාගේ අලසබව යයි කියන ලද ථීනමිද්ධය දුරුකොට කය—සිත පිළිබඳ පහ වූ අලසබැව් ඇත්තේ, ආලොකසංඥ (පිරිසුදු හැනීම්) ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥ ඇත්තෙක්ව වෙසේ. ථීනමිද්ධනීවරණයෙන් සිත පිරිසුදු කෙරේ. උඩඟුබව හා කුකුස (උද්ධච්චකුක්කුච්චය) දුරුකොට, සංසිඳුනු සිත් ඇතිව (අනුද්ධතව) වාසය කෙරේ. අධ්‍යාත්මයෙහි (ඇතුලත) සංසිඳුනු සිත් ඇත්තේ, උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසුදු කෙරේ. (බුද්ධාදි අටතැන්හි සැකකිරීම ලකුණුකොට ඇති) විචිකිච්ඡාව දුරුකොට, එතර කල (පහකල) විචිකිච්ඡා ඇත්තේ කුශලධම් විෂයෙහි 'ඒ කෙසේ ද මේ කෙබඳුද්ද'යි යන සැක නැතිව වෙසේ, විචිකිච්ඡායෙන් සිත පිරිසුදු කෙරේ.

69. වාසෙට්ඨය, යම්සේ පුරුෂයෙක් ණය ගෙණ කර්මාන්තයන්හි යොදන්නේ ද, ඔහුගේ ඒ කර්මාන්තයෝ දියුණු වන්නාහු නම් ඔහුගේ ඒ පරණ ණය මුදල් සියල්ලම ගෙවන්නේය. ඔහුගේ අඹුදරුවන් පුස්නා පිණිස වැඩි යමක් ඉතුරු වූයේ නම් ඔහට මෙබඳු අදහසක් වන්නේය. [කෙසේද යත්:] 'මම වනාහි පළමුවෙන් ණය ගෙණ කර්මාන්තයන්හි යෙදුවෙමි. ඒ මාගේ කර්මාන්තයෝ සමෘද්ධවූහ. ඒ මම පැරණි ණය ගෙවූයෙමි. අඹුදරුවන් පොෂ්‍යකිරීම පිණිස අතිරේක මුදලක් ද මට ඇත්තේය' කියායි. හෙතෙම ඒ ණය නැති බව මූල්කොට ගෙණ බලවත් සතුටක් ලබන්නේය, සොම්නසට ද පැමිණෙන්නේය.

70. සෙය්‍යථාපි වාසෙට්ඨ පුරිසො ආබාධිකො අස්ස දුක්ඛිතො බාළ්හගිලානො භත්තං චස්ස නච්ඡාදෙය්‍ය [1] න චස්ස කායෙ බලමත්තා. සො අපරෙන සමයෙන තම්හා ආබාධා මුච්චෙය්‍ය භත්තඤ්චස්ස ඡාදෙය්‍ය සියා චස්ස කායෙ බලමත්තා. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ ආබාධිකො අහොසිං දුක්ඛිතො බාළ්හගිලානො භත්තං ච මෙ නච්ඡාදෙසි න චස්ස [2] මෙ ආසි කායෙ බලමත්තා. සොම්හි එතරහි තම්හා ආබාධා මුත්තො භත්තඤ්ච මෙ ඡාදෙති අත්ථි ච මෙ [3] කායෙ බලමත්තාති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය [4] සොමනස්සං.

71. සෙය්‍යථාපි වාසෙට්ඨ පුරිසො බන්ධනාගාරෙ බද්ධො අස්ස. සො අපරෙන සමයෙන තම්හා බන්ධනාගාරා [5] මුච්චෙය්‍ය සොත්ථිනා අබ්බයෙන [6]. න චස්ස කිඤ්චි භොගානං වයො. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ බන්ධනාගාරෙ බද්ධො අහොසිං. සොම්හි එතරහි තම්හා බන්ධනාගාරා [5] මුත්තො සොත්ථිනා අබ්බයෙන [6]. නත්ථි ච මෙ කිඤ්චි භොගානං වයොති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය [4] සොමනස්සං.

72. සෙය්‍යථාපි වාසෙට්ඨ පුරිසො දාසො අස්ස අනත්තාධීනො [7] පරාධීනො [7] න යෙනකාමඞ්ගමො. සො අපරෙන සමයෙන තම්හා දාසබ්‍යා [8] මුච්චෙය්‍ය අත්තාධීනො [7] අපරාධීනො [7] භුජිස්සො යෙනකාමඞ්ගමො. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ දාසො අහොසිං අනත්තාධීනො [7] පරාධීනො [7] න යෙනකාමඞ්ගමො. සොම්හි එතරහි තම්හා දාසබ්‍යා [8] මුත්තො අත්තාධීනො [7] අපරාධීනො [7] භුජිස්සො යෙනකාමඞ්ගමොති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං අධිගච්ඡෙය්‍ය [4] සොමනස්සං.

---

1. න ඡාදෙය්‍ය S.
2. න ච මෙ P. W.
3. අත්ථි ච කායෙ P.
4. පාමුජ්ජං අධිගච්ඡෙ P. W. C.
5. බන්ධාගාරා B. බන්ධනා P. S. W.
6. අව්‍යයෙන P. W.
7. °ධීනො B.
8. දාසව්‍යා P. W. C.

70. වාසෙට්ඨය, යම්සේ වනාහි මහත් රෝගයෙන් පෙළෙන (ආබාධ ඇත්තාවූ), දුක් ඇත්තාවූ, දූසි ගිලන්බව ඇති පුරුෂයෙක් වන්නේ ද, ඔහට බත් (ආහාර) රුචි නොවන්නේ ද, ඔහුගේ ශරීරයෙහි කිසි ශක්තියක් නැත්තේ ද වෙයි. ඒ පුරුෂ තෙම පසු කාලයක ඒ ආබාධයෙන් මිදෙන්නේ නම්, ඔහුට ආහාර රුචිය ඇති වන්නේ නම්, ඔහුගේ ශරීරබලය ඇති වන්නේ නම්, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. (කෙබඳු ද යත්:) 'මම වනාහි පෙර ආබාධ ඇත්තාවූ, දුක් ඇති, දූසි ගිලන් බැව් ඇති කෙනෙක් වීමි. මට බත් රුචිය ද නොවීය. ශරීර-බලය ද නැතිවිය. ඒ මම පළමු තිබූ ආබාධයෙන් මිදුනෙමි. මට ආහාරරුචිය ද ඇත්තේය. කාය බලය ද තිබේය' කියායි. හෙතෙම ඒ කාරණය මුල්කොට බලවත් සතුටක් ලබන්නේය. සොම්නසට ද පැමිණෙන්නේය.

71. වාසෙට්ඨය, යම්සේ පුරුෂයෙක් සිරගෙයි බැඳුනේ වේද, හෙතෙම පසු කලෙක වියදම් නැතිව (පීඩා රහිතව) සැපසේ ඒ සිරගෙයින් මිදෙන්නේය. ඔහුගේ භොගයන් පිළිබඳ කිසිත් වියදමක් ද නොවන්නේය. ඔහුට මෙබඳු අදහසක් වන්නේය (එනම්:) 'මම වූකලී පෙර සිරගෙයි බැඳුනෙක් වූයෙමි, ඒ මම දැන් වියදම් නැතිව (පීඩා රහිතව) සැපසේ ඒ සිරගෙයින් මිදුනෙමි. මගේ භොගයන් පිළිබඳ කිසි වියදමක් ද නොවූයේය' කියායි. ඒ පුරුෂ තෙම සිරගෙයින් මිදීම නිමිති කොට බලවත් සතුටක් ලබන්නේය, සොම්නසට ද පැමිණෙන්නේය.

72. වාසෙට්ඨය, යම්සේ සිය කැමැත්තෙන් යමක් කරන්ට නොහැකි (අධිපති භාවයක් නැත්තාවූ), අනුන්ගේ කැමැති පරිදි පවත්නාවූ (අනුන්ට යටහත්වූ), තමා කැමැති ගමනක් ඒ වූ පරිදි යා නොහැකි වැඩකරුවෙක් වන්නේ ද, හෙතෙම පසු කලෙක ඒ දාසභාවයෙන් මිදෙන්නේ, තමාම අධිපතිකොට ඇත්තේ, පරාධීන නො වූයේ, අනුන්ට යටත් නොව තමා-ගෙන්ම යැපෙන්නේ, සිය අදහස් පරිදි ඒ ඒ තැන යා හැකි වන්නේ ද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. (එනම්:) 'මම වනාහි පෙර සියකැමැති පරිදි යමක් කරන්ට නොහැකි, අනුන්ට යටත් පැවතුම් ඇති, මා අදහස් පරිදි කිසි තැනෙක යා නොහැකි දාසයෙක් වීමි. ඒ මම දැන් ඒ දාසභාවයෙන් මිදුනෙක්මි. ආත්මාධීන වූයෙමි, පරාධීන නොවූයෙමි, මෙරමා-හට යටත් නොව මා සපයාගත් දෙයින්ම යැපෙන්නෙමි, මා අදහස් පරිදි ඒ ඒ කැමැති තැනෙක යා හැක්කෙක් ද වෙමි'යි කියායි. හෙතෙම ඒ දාසභාවයෙන් මිදීම හෙතුකොට බලවත් සතුටක් ලබන්නේය, එසේ සොම්නසට ද පැමිණෙන්නේය.

73. සෙය්‍යථාපි වාසෙට්ඨ පුරිසො සධනො සභොගො කන්තාරද්ධානමග්ගං[1] පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං. සො අපරෙන සමයෙන තං කන්තාරං නිත්ථරෙය්‍ය සොත්ථිනා ගාමන්තං අනුපාපුණෙය්‍ය ඛෙමං අප්පටිභයං. තස්ස එවමස්ස: අහං ඛො පුබ්බෙ සධනො සභොගො කන්තාරද්ධානමග්ගං[1] පටිපජ්ජිං දුබ්භික්ඛං සප්පටිභයං. සොම්හි එතරහි තං කන්තාරං තිණ්ණො[2] සොත්ථිනා ගාමන්තං අනුප්පත්තො ඛෙමං අප්පටිභයන්ති. සො තතොනිදානං ලභෙථ පාමොජ්ජං[3] අධිගච්ඡෙය්‍ය[4] සොමනස්සං.

74. එවමෙව ඛො වාසෙට්ඨ භික්ඛු යථා ඉණං යථා රොගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං එවං[5] ඉමෙ පඤ්චනීවරණෙ අප්පහීනෙ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි වාසෙට්ඨ යථා[6] ආනණ්‍යං යථා ආරොග්‍යං යථා බන්ධනාමොක්ඛං යථා භුජිස්සං යථා ඛෙමන්තභූමිං එවමෙව ඛො වාසෙට්ඨ භික්ඛු ඉමෙ පඤ්ච නීවරණෙ පහීනෙ අත්තනි සමනුපස්සති.

75. තස්සිමෙ පඤ්ච නීවරණෙ පහීනෙ අත්තනි සමනුපස්සතො පාමොජ්ජං[3] ජායති පමුදිතස්ස පීති ජායති පීතිමනස්ස කායො පස්සම්භති පස්සද්ධකායො සුඛං වෙදෙති[7] සුඛිනො චිත්තං සමාධියති.

---

1. කන්තාරං අද්ධාන° B. S. Pa.
2. නිත්ථිණ්ණො P.W. නිත්ථින්නො Pa.
3. පාමුජ්ජං P. W. C.
4. අධිගච්ඡෙ P. C.
5. එවං ති න දිස්සති P. W. S.
6. යථා ති නත්ථි B. (සබ්බත්ථ)
7. පටිසංවෙදෙති S.

73. වාසෙට්ඨය, යම්සේ ධනවත්වූ, භොගසම්පත් ඇති පුරුෂයෙක් ආහාර දුලීභවූ, භය සහිතවූ, නිරුදකවූ දීඝීමාගීයකට (දුරුකතරමගකට) පැමිණෙන්නේ ද, හෙතෙම මඳකලකින් ඒ කාන්තාරමාගීය ඉක්මවා යන්නේ, සැපවත්වූ, (සොර සතුරන් ගෙන්) ප්‍රතිභය රහිත වූ ගම්මානයකට ක්‍රමයෙන් පැමිණෙන්නේ ද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. එනම්: ‘මම වනාහි පෙර ධනවත් වූයෙමි, භොගසම්පත් සහිත වූයෙමි, දුලීභ භික්‍ෂා ඇති, භය සහිතවූ, දීඝීවූ කාන්තාරමාගීයකට පිළිපන්නෙක් වූයෙමි. එසේ වූ මම දැන් එම කාන්තාරමාගීය තරණය කෙළෙමි. සැපවත්වූ, ප්‍රතිභය රහිතවූ ගමකට සැපසේ ක්‍රමයෙන් පැමිණියෙමි’යි කියාහි. ඒ පුරුෂ තෙමේ ඒ කතරමග එතර කිරිම නිමිතිකොට බලවත් සතුටක් ලබන්නේය, එසේම සොම්නසට ද පැමිණෙන්නේය.

74. වාසෙට්ඨය, ණය යම්සේ ද, රෝගය යම්සේ ද, බන්ධනාගාරය යම්සේ ද, දසභාවය යම්සේ ද, දුරුකතරමග යම්සේ ද, එපරිද්දෙන් මහණ තෙමේ ප්‍රහීණ නොවූ (පහ නොකළ) පඤ්චනීවරණයන් තමා කෙරෙහිලා නුවණින් දකී. වාසෙට්ඨය, ණය නැති බව යම්සේ ද, නීරෝගී බව යම්සේ ද, සිරගෙන් මිදීම යම්සේ ද, මෙරමාහට යටත් නැති බව යම්සේ ද, අභය භූමිය යම්සේද, එපරිද්දෙන්ම වාසෙට්ඨය, මහණ තෙමේ ප්‍රහීණවූ මේ පඤ්චනීවරණ ධම්යන් තමා විෂයෙහි ලා දක්නේය.

75. ප්‍රහීණවූ මේ පඤ්චනීවරණයන් තමා කෙරෙහි නැතැයි නුවණින් දක්නාවූ ඒ මහණහට සතුටු ආකාරය උපදී. සතුටු වූවහුට (සියල් සිරුර කලඹමින්) ප්‍රීතිය උපදී, ප්‍රීති සහගත සිත් ඇත්තහුගේ නාමකය (සන්තානය) සංසිඳෙයි, සංසිඳුනු කය ඇති (කය පිළිබඳ මැඩ ලූ දුහ ඇති) තැනැත්තේ කායික චෛතසික සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධියට (එකඟ බවට) එළඹෙයි.

76. සො මෙත්තාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති තථා දුතියං තථා තතියං තථා චතුත්ථං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය[1] සබ්බාවන්තං[2] ලොකං මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අව්‍යාපජ්ඣෙන[3] ඵරිත්වා විහරති.

77. සෙය්‍යථාපි වාසෙට්ඨ බලවා සඞ්ඛධමො[4] අප්පකසිරෙනෙව චාතුද්දිසා විඤ්ඤාපෙය්‍ය [5]එවමෙව ඛො වාසෙට්ඨ එවං භාවිතාය මෙත්තාය චෙතොවිමුත්තියා යං පමාණකතං කම්මං න තං තත්‍රාවසිස්සති න තං තත්‍රාවතිට්ඨති. අයම්පි ඛො වාසෙට්ඨ බ්‍රහ්මානං සහව්‍යතාය මග්ගො.

78. පුනචපරං වාසෙට්ඨ භික්ඛු කරුණාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති තථා දුතියං තථා තතියං තථා චතුත්ථං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං කරුණාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අව්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති. සෙය්‍යථාපි වාසෙට්ඨ බලවා සඞ්ඛධමො අප්පකසිරෙනෙව චාතුද්දිසා විඤ්ඤාපෙය්‍ය එවමෙව ඛො වාසෙට්ඨ එවං භාවිතාය කරුණාය චෙතොවිමුත්තියා යං පමාණකතං කම්මං න තං තත්‍රාවසිස්සති න තං තත්‍රාවතිට්ඨති. අයම්පි ඛො වාසෙට්ඨ බ්‍රහ්මානං සහව්‍යතාය මග්ගො.

---

1. සබ්බත්තාය B. S. V.
2. සබ්බවන්තං B.S.V. (සබ්බත්ථ)
3. අබ්‍යාපජ්ජෙන B. V. (සබ්බත්ථ)
4. °ධම්මො Pa.
5. එවං භාවිතාය ඛො වාසෙට්ඨ මෙත්තාය P. W.

76. හෙතෙම මෛත්‍රී සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසයකෙරේ. එසේ දෙවන දිගද, තුන්වන දිගද, සතරවන දිගද්‍රුයි මෙසේ උඩද යටද සරසද්‍රුයි හාත්පස සියලු තන්හි පැතිර පවත්නා හෙයින් සියල්ලන් සහිත ලොකය මෛත්‍රිය සමග පැවැත්තා වූ, මහත්වූ, ධ්‍යාන වශයෙන් මහත් බවට පැමිණියාවූ, ප්‍රමාණ රහිතවූ, වෛර රහිතවූ ව්‍යාපාද රහිතවූ සිතින් පතුරුවා වාසය කෙරේ.

77. වාසෙඨය, බලසම්පන්නවූ සක්පිඹින්නෙක් නිදුකින් (පහසුවෙන්) ම සිව් දිගුත් යම්සේ අඟවිත්තේද (සිව් දිගුන් හිම සක්හඬ පතුරුවන්නේද), වාසෙඨය, එපරිද්දෙන්ම මෛත්‍රීයෙන් ලත් චිත්තවිමුක්තියෙන් සීමා කරන ලද කිසිවක් අවශේෂයට (ඉතිරි බවට) නොපැමිණේ. අවශේෂව එහි නොසිටී.[1] වාසෙඨය, මේ මාර්ගයද බ්‍රහ්මයන්ගේ සහභාවය පිණිස පවතී.

78. වාසෙඨය, නැවත අනිකක් නම්. භික්ෂුතෙමේ කරුණාසහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කෙරේ. දෙවන දිගද එසේම තුන්වන දිගද එසේම සතරවන දිගද්‍රුයි මෙසේ උඩද යටද සරසද්‍රුයි සියලු කල්හි සියලු තන්හි පැතිර පවත්නා බැවින් සියල්ල සහිතවූ ලෝකය කරුණාව සමග පැවැත්තාවූ,මහත්වූ, ධ්‍යාන වශයෙන් මහත් බවට පැමිණියාවූ, ප්‍රමාණ රහිත වූ, වෛර රහිත වූ, ව්‍යාපාද රහිතවූ සිතින් පතුරුවා වාසය කෙරේ. වාසෙඨය, බලසම්පන්නවූ සක්පිඹින්නෙක් නිදුකින් (පහසුවෙන්) ම සිව් දිගුත් යම්සේ අඟවන්නේද සිව් දිගුන්හිම සක්හඬ පතුරුවන්නේද, එපරිද්දෙන්ම වාසෙඨය, කරුණාවෙන් ලත් චිත්තවිමුක්තියෙන් ප්‍රමාණ කරණ ලද කිසිවක් අවශේෂයට (ඉතිරි බවට) නො පැමිණේ, අවශේෂව එහි නොසිටී. වාසෙඨය, මේ මාර්ගයද බ්‍රහ්මයන්ගේ සහභාවය පිණිස පවතී.

---

1. මෛත්‍රී සහගත සිතින් බාහිර වූ එට අසුනොවූ කිසිවක් සියලු ලෝක යෙහිම නැත, යන මෙහි තේරුමයි.

79. පුනචපරං වාසෙට්ඨ භික්ඛු මුදිතාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති තථා දුතියං තථා තතියං තථා චතුත්ථං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං මුදිතාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අව්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති.

80. සෙය්‍යථාපි වාසෙට්ඨ බලවා සඞ්ඛධමො අප්පකසිරෙනෙව චාතුද්දිසා විඤ්ඤාපෙය්‍ය එවමෙව ඛො වාසෙට්ඨ එවං භාවිතාය මුදිතාය චෙතොවිමුත්තියා යං පමාණකතං කම්මං න තං තත්‍රාවසිස්සති න තං තත්‍රාවතිට්ඨති. අයම්පි ඛො වාසෙට්ඨ බ්‍රහ්මානං සහව්‍යතාය මග්ගො.

81. පුනචපරං වාසෙට්ඨ භික්ඛු උපෙක්ඛාසහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති තථා දුතියං තථා තතියං තථා චතුත්ථං. ඉති උද්ධමධො තිරියං සබ්බධි සබ්බත්තතාය සබ්බාවන්තං ලොකං උපෙක්ඛාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ඣෙන ඵරිත්වා විහරති.

82. සෙය්‍යථාපි වාසෙට්ඨ බලවා සඞ්ඛධමො අප්පකසිරෙනෙව චාතුද්දිසා විඤ්ඤාපෙය්‍ය එවමෙව ඛො වාසෙට්ඨ එවං භාවිතාය උපෙක්ඛාය චෙතොවිමුත්තියා යං පමාණකතං කම්මං න තං තත්‍රාවසිස්සති න තං තත්‍රාවතිට්ඨති. අයම්පි ඛො වාසෙට්ඨ බ්‍රහ්මානං සහව්‍යතාය මග්ගො.

83. තං කිං මඤ්ඤසි වාසෙට්ඨ? එවංවිහාරී භික්ඛු සපරිග්ගහො වා අපරිග්ගහො වා ති?

79. වාසෙඨය, නැවත අනිකක් කියමි. භික්ෂුතෙමේ මුදිතා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසයකෙරේ. දෙවන දිගද, එසේම තුන්වන දිගද එසේම සතරවන දිගදූහි මෙසේ උඩද යටද සරසදූහි සියලු කල්හි සියලු තන්හි පැතිර පවත්නා බැවින් සියල්ල ඇත්තාවූ ලෝකය මුදිතාව සමග පැවැත්තාවූ, මහත්වූ, ධ්‍යාන වශයෙන් මහත් බවට පැමිණියා වූ, ප්‍රමාණ රහිතවූ, වෛර රහිතවූ, ව්‍යාපාද රහිත වූ සිතින් පතුරුවා වාසය කෙරේ.

80. වාසෙඨය, බලසම්පන්නවූ සක් පිඹින්නෙක් නිදුකින් (පහසුවෙන්) ම සිව් දිගුන් යම් සේ අගවන්නේ ද සිව් දිගුන්හි සක්හඬ පතුරුවන්නේද, වාසෙඨය, එපරිද්දෙන්ම වඩනා ලද්දාවූ මුදිතාවෙන් ලත් චිත්ත විමුක්තියෙන් ප්‍රමාණ කරණ ලද කිසිවක් අවසේකයට (ඉතිරි බවට) නොපැමිණේ. අවශේෂව එහි නොසිටී. වාසෙඨය, මේ මාගීයද බ්‍රහමයන්ගේ සහභාවය පිණිස පවතී.

81. වාසෙඨය, නැවත අනිකක් කියමි. භික්ෂුතෙමේ උපෙක්ෂා සහගත සිතින් එක්දිසාවක් පතුරුවා වාසය කෙරේ, දෙවන දිගද, එසේම තුන්වන දිගද, එසේම සතරවන දිගදූහි මෙසේ උඩද යටද සරසදූහි හාත්පස සියලු තන්හි පැතිර පවත්නා බැවින් සියල්ල ඇත්තාවූ ලෝකය උපෙක්ෂාව සමග පැවැත්තාවූ, මහත්වූ, ධ්‍යාන වශයෙන් මහත් බවට පැමිණියාවූ, ප්‍රමාණ රහිතවූ, වෛර රහිතවූ ව්‍යාපාද රහිතවූ සිතින් පතුරුවා වාසය කෙරේ.

82. වාසෙඨය, බලසම්පන්නවූ සක් පිඹින්නෙක් නිදුකින් (පහසුවෙන්) ම සිව් දිගුන් යම් සේ අගවන්නේ ද සිව් දිගුන්හි සක්හඬ පතුරුවන්නේද, වාසෙඨය, එපරිද්දෙන්ම වඩනා ලද්දාවූ උපෙක්ෂාවෙන් ලත් චිත්ත විමුක්තියෙන් ප්‍රමාණ කරණ ලද කිසිවක් අවසේකයට (ඉතිරි බවට) නොපැමිණේ. අවසේකව එහි නොසිටී. වාසෙටඨය, මේ මාගීයද බ්‍රහමයන්ගේ සහභාවය පිණිස පවතී.

83. වාසෙඨය, තෝ කුමක් සිතන්නෙහිද, මෙසේ වසන්නාවූ (සතර බ්‍රහම විහරණ ඇත්තාවූ) ඒ භික්ෂුතෙමේ ස්ත්‍රී පරිග්‍රහණය ඇත්තේද? නැත්තේද?

අපරිග්ගහො භො ගොතම.

සවෙරචිත්තො වා අවෙරචිත්තො වා ති?

අවෙරචිත්තො භො ගොතම.

සව්‍යාපජ්ඣචිත්තො [1] වා අව්‍යාපජ්ඣ චිත්තො වා ති?

අව්‍යාපජ්ඣචිත්තො [2] භො ගොතම.

සංකිලිට්ඨචිත්තො වා අසංකිලිට්ඨචිත්තො වා ති?

අසංකිලිට්ඨචිත්තො භො ගොතම.

වසවත්ති වා අවසවත්ති වා ති?

වසවත්ති භො ගොතම.

84. ඉති කිර වාසෙට්ඨ අපරිග්ගහො භික්ඛු අපරිග්ගහො බ්‍රහ්මා. අපි නු ඛො අපරිග්ගහස්ස භික්ඛුනො අපරිග්ගහෙන බ්‍රහ්මුනා සද්ධිං සංසන්දති සමෙතීති?

එවං භො ගොතම.

සාධු වාසෙට්ඨ. සො වත වාසෙට්ඨ අපරිග්ගහො භික්ඛු කායස්ස භෙදා පරම්මරණා අපරිග්ගහස්ස බ්‍රහ්මුනො සහව්‍යූපගො[3] භවිස්සතීති ඨානමෙතං විජ්ජති.

85. ඉති කිර වාසෙට්ඨ අවෙරචිත්තො භික්ඛු අවෙරචිත්තො බ්‍රහ්මා. අපි නු ඛො අවෙරචිත්තස්ස භික්ඛුනො අවෙරචිත්තෙන බ්‍රහ්මුනා සද්ධිං සංසන්දති සමෙතීති?

එවං භො ගොතම.

සාධු වාසෙට්ඨ. සො වත වාසෙට්ඨ අවෙරචිත්තො භික්ඛු කායස්ස භෙදා පරම්මරණා අවෙරචිත්තස්ස බ්‍රහ්මුනො සහව්‍යූපගො භවිස්සතීති ඨානමෙතං විජ්ජති.

86. ඉති කිර වාසෙට්ඨ අව්‍යාපජ්ඣචිත්තො භික්ඛු අව්‍යාපජ්ඣචිත්තො බ්‍රහ්මා. අපි නු ඛො අව්‍යාපජ්ඣචිත්තස්ස භික්ඛුනො අව්‍යාපජ්ඣචිත්තෙන බ්‍රහ්මුනා සද්ධිං සංසන්දති සමෙතීති?

එවං භො ගොතම.

සාධු වාසෙට්ඨ. සො වත වාසෙට්ඨ අව්‍යාපජ්ඣචිත්තො භික්ඛු කායස්ස භෙදා පරම්මරණා අව්‍යාපජ්ඣචිත්තස්ස බ්‍රහ්මුනො සහව්‍යූපගො භවිස්සතීති ඨානං මෙතං විජ්ජති.

---

1. සබ්‍යාපජ්ජ° B. V. 2. අබ්‍යා° P. W. අබ්‍යාපජ්ජ° B. V. (සබ්බත්ථ)
3. සහබ්‍යූපගො B. S. V. (සබ්බත්ථ)

භවත් ගෞතමයන් වහන්ස, ස්ත්‍රී පරිග්‍රහණය නැත්තේය.

වෛර සහිත සිත් ඇත්තේද වෛර රහිත සිත් ඇත්තේද?

භවත් ගෞතමයන් වහන්ස, වෛර රහිත සිත් ඇත්තේය.

ව්‍යාපාද සහිත සිත් ඇත්තේද? ව්‍යාපාද රහිත සිත් ඇත්තේද?

භවත් ගෞතමයන් වහන්ස, ව්‍යාපාද රහිත සිත් ඇත්තේය.

සංක්ලිෂ්ට (කිලිටි) සිත් ඇත්තේද? අසංකලිෂ්ට (නොකිලිටි) සිත් ඇත්තේද?

භවත් ගෞතමයන් වහන්ස, අසංක්ලිෂ්ට (නොකිලිටි) සිත් ඇත්තේය.

චිත්තවසිතා ඇත්තේ ද? චිත්තවසිතා නැත්තේද?

භවත් ගෞතමයන් වහන්ස, චිත්තවසිතා ඇත්තේය.

84. වාසෙඨය, මෙසේ වනාහි භික්ෂුතෙමේ සත්‍රී පරිග්‍රහණය නැත්තේය, බ්‍රහම තෙමේද සත්‍රීපරිග්‍රහණය නැත්තේය. කිම? සත්‍රීපරිග්‍රහ නැති බ්‍රහ්මයා සමග සත්‍රීපරිග්‍රහ නැති භික්ෂුහුගේ පැවැත්ම ගැලපේද? සමභාවයට පැමිණේ ද?

භවත් ගෞතමයන් වහන්ස, එසේය.

වාසෙඨය, මැනව. වාසෙඨය, සත්‍රීපරිග්‍රහ නැත්තාවූ භික්ෂුතෙමේ මරණින් මතු ස්ත්‍රීපරිග්‍රහණය නැත්තාවූ බ්‍රහමයාගේ සහභාවයට පැමිණෙන්නෙක් වන්නේය යන මේ කාරණය ඇත්තේමය (සිදුවිය හැක්කකි).

85. වාසෙඨය, මෙසේ වනාහි භික්ෂුතෙමේ වෛර රහිත සිත් ඇත්තේය, බ්‍රහම තෙමේද වෛර රහිත සිත් ඇත්තේය. අවෛරී සිත් ඇති භික්ෂුහුගේ පැවැත්ම අවෛරී සිත් ඇති බ්‍රහමයා සමග ගැලපේද? සමභාවයට පැමිණේද?

එසේය, භවත් ගෞතමයන් වහන්ස.

මැනව, වාසෙඨය. වාසෙඨය, අවෛරී සිත් ඇත්තාවූ භික්ෂුතෙමේ කාබුන් මරණින් පසු අවෛරී සිත් ඇති බ්‍රහමයාගේ සහභාවයට පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවිය හැක්කකි.

86. වාසෙඨය, මෙසේ වූ කල්හි, භික්ෂුතෙමේ ක්‍රොධරහිත සිත් ඇත්තේය, බ්‍රහමයාද ක්‍රොධ රහිත සිත් ඇත්තේය. කිම? ක්‍රොධ රහිත සිත් ඇති භික්ෂුව ක්‍රොධ රහිත සිත් ඇති බ්‍රහමයා සමග ගැලපේද, සමභාවයට පැමිණේද?

එසේය, භවත් ගෞතමයන් වහන්ස.

මැනව වාසෙඨය. වාසෙඨය, ක්‍රොධ රහිත සිත් ඇති භික්ෂුව කාබුන් මරණින් මතු ක්‍රොධරහිත සිත් ඇති බ්‍රහමයාගේ සහභාවයට පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවිය හැක්කකි.

87. ඉති කිර වාසෙට්ඨ අසංකිලිට්ඨචිත්තො භික්ඛු අසංකිලිට්ඨචිත්තො බ්‍රහ්මා. අපි නු ඛො අසංකිලිට්ඨචිත්තස්ස භික්ඛුනො අසංකිලිට්ඨචිත්තෙන බ්‍රහ්මුනා සද්ධිං සංසන්දති සමෙතීති?

එවං භො ගොතම.

සාධු වාසෙට්ඨ. සො වත වාසෙට්ඨ අසංකිලිට්ඨචිත්තො භික්ඛු කායස්ස භෙදා පරම්මරණා අසංකිලිට්ඨචිත්තස්ස බ්‍රහ්මුනො සහබ්‍යූපගො භවිස්සතීති ඨානමෙතං විජ්ජති.

88. ඉති කිර වාසෙට්ඨ වසවත්තී භික්ඛු වසවත්තී බ්‍රහ්මා. අපි නු ඛො වසවත්තිස්ස භික්ඛුනො වසවත්තිනා බ්‍රහ්මුනා සද්ධිං සංසන්දති සමෙතීති?

එවං භො ගොතම.

සාධු වාසෙට්ඨ. සො වත වාසෙට්ඨ වසවත්තී භික්ඛු කායස්ස භෙදා පරම්මරණා වසවත්තිස්ස බ්‍රහ්මුනො සහබ්‍යූපගො භවිස්සතීති ඨානමෙතං විජ්ජතීති.

89. එවං වුත්තෙ වාසෙට්ඨභාරද්වාජා මාණවා[1] භගවන්තං එතදවොචුං:[2] අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම. සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං[3] ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛන්තීති. එවමෙව[4] භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එතෙ මයං භගවන්තං ගොතමං සරණං ගච්ඡාම ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච. උපාසකෙ නො භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතෙ සරණං ගතෙති.

තෙවිජ්ජසුත්තං නිට්ඨිතං තෙරසමං[5]

*බ්‍රහ්ම[6]-සාමඤ්ඤ-අම්බට්ඨ-සොණ-කූට-මහා-ජාලියා[7]
සීහ-පොට්ඨ-සුභ[8]-කෙවට්ට[9] ලොහිච්ච තෙවිජ්ජ තෙරසාති

සීලක්ඛන්ධවග්ගො නිට්ඨිතො පඨමො[10].

---

1. °භාරද්වාජො මාණවො Pa.
2. එතදවොච Pa.
3. තෙලප්ප° S.
4. එවමෙව ඛො S.
5. ඉදං න දිස්සති B.
6. බ්‍රහ්මා S.
7. ජාලිනී B. ජාලා P. ජාල W.
8. පොට්ඨපාද සුභො B.
9. කෙවට්ටො S. කෙවඩ්ඩ P.
10. නිට්ඨිතො පඨමොති න දිස්සති P.

* බ්‍රහ්මජාලං ච - සාමඤ්ඤං - අම්බට්ඨං - සොණදණ්ඩකං
කූටදන්තං ච - මහාලි - ජාලියං - සීහනාදකං
පොට්ඨපාදො තථා සුභමාණවො කෙවඩ්ඩො පි ච
ලොහිච්චො - තෙවිජ්ජො චෙති ඉධ සුත්තානි තෙරසාති. Pa.

87. වාසෙට්ඨය, මෙසේ වූකල්හි, භික්ෂුව නොකිලිටි සිත් ඇත්තේය, බ්‍රහ්මයාද නොකිලිටි සිත් ඇත්තේය. කිම? නොකිලිටි සිත් ඇති භික්ෂුව නොකිලිටි සිත් ඇති බ්‍රහ්මයා සමග ගැලපේද? සමභාවයට පැමිණේද?

එසේය, භවත් ගෞතමයන් වහන්ස.

මැනවි, වාසෙට්ඨය. වාසෙට්ඨය, නොකිලිටි සිත් ඇති භික්ෂුව කාබුන් මරණින් මතු නොකිලිටි සිත් ඇති බ්‍රහ්මයාගේ සහභාවයට පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවිය හැක්කකි.

88. වාසෙට්ඨය, මෙසේ වූකල්හි භික්ෂුතෙමේ චිත්තවසිතා ඇත්තේය, බ්‍රහ්මතෙමේද චිත්තවසිතා ඇත්තේය. කිම? චිත්තවසිතා ඇති බ්‍රහ්මයා සමග චිත්තවසිතා ඇති භික්ෂුවගේ පැවැත්ම ගැලපේද, සමභාවයට පැමිණේද?

භවත් ගෞතමයන් වහන්ස, එසේය.

මැනවි, වාසෙට්ඨය. වාසෙට්ඨය, චිත්තවසිතා ඇති භික්ෂුතෙමේ මරණින් මතු චිත්තවසිතා ඇති බ්‍රහ්මයාගේ සහභාවයට පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවිය හැක්කකි.

89. මෙසේ වදාළකල්හි වාසෙට්ඨභාරද්වාජ මාණවකයෝ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය සැලකළෝය: "භවත් ගෞතමයන් වහන්ස, දම් දෙසුම ඉතා මැනවි. භවත් ගෞතමයන් වහන්ස, දම් දෙසුම ඉතා මැනවි. භවත් ගෞතමයන් වහන්ස, යටිකුරුකොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ යම්සේද, වැසුනු දෙයක් විවෘතකොට දක්වන්නේ යම්සේද, මංමුළාවූවෙකුට මගකියන්නේ හෝ යම්සේද, ඇස් ඇත්තෝ රූපයන් දකිත්වායි අඳුරෙහි තෙල් පහනක් දරන්නේ හෝ යම්සේද, එපරිද්දෙන්ම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය ප්‍රකාශ කරණ ලද්දේය. මේ අපි භවත් ගෞතමයන් වහන්සේද ධර්මයද භික්ෂු සඞ්ඝයාද සරණකොට යමු. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවිහිම්කොට සරණගිය උපාසකයන් සේ අප පිළිගන්නා සේක්වා.

තෙලෙස්වන තෙවිජ්ජ සූත්‍රය නිමියේය.

පළමුවන සීලක්ඛන්ධ වර්ගය නිමියේය.

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ත්‍රිපිටක භාරය වෙනුවෙන් කොළඹ ලේක්හවුස්හි පිහිටි සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් දිනමිණ මුද්‍රණාලයෙහි මුද්‍රණය කරවන ලදී.